අට්ඨකථාචාර්ය බුද්ධඝොෂ ස්ථවිරපාදයන් විසින් විරචිත

# ජාතකට්ඨ කථා

## පළමුවෙනි කොටස

## (සිංහල පරිවර්තනය)

## I



ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

අර්ථකථාචාර්ය බුද්ධඝෝෂ ස්ථවිර පාදයන් විසින් විරචිත

# ජාතකට්ඨ කථා

## ප්‍රථම භාගය

## (සිංහල පරිවර්තනය)

## ඒකක නිපාතය

බුද්ධ ශාසන අරමුදලේ භාරකාර මණ්ඩලයේ අනුග්‍රහයෙනි

පාලි අට්ඨකථා සිංහල පරිවර්තන - 17

අර්ථකථාචාර්ය බුද්ධඝෝෂ ස්ථවිර පාදයන් විසින් විරචිත

# ජාතකට්ඨ කථා

## පළමු වැනි කොටස

(සිංහල පරිවර්තනය)

(ඒකක නිපාතය)


සිංහල පරිවර්තනය

පානදුර වළපොල ශ්‍රී සද්ධර්මෝදය පරිවේනාධ්‍යක්ෂක

**රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති**

**යාලේගම චන්දකිත්ති හිමි**

අධීක්ෂණය

**රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රවේදී (පේරාදෙනිය)**

**දයා ගුණසේකර**



ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.

අර්ථකථාචාර්ය බුද්ධඝෝෂ ස්ථවිර පාදයන් විසින් විරචිත

# ජාතකට්ඨ කථා

පළමු වැනි කොටස
(සිංහල පරිවර්තනය)

**ප්‍රථම මුද්‍රණය - 2007**

ISBN 978 - 955 - 1604 - 19 - 6

*පරිගණක අකුරුකරණය*
**බුද්ධික විජේසිංහ**

*පිටකවරය*
**සුසිල් ජයශාන්ත පෙරේරා - මහරගම**

*මුද්‍රණය*
අජිත් ප්‍රින්ටර්ස් - නුගේගොඩ
අංක 342, පරණ කැස්බෑව පාර, රත්තනපිටිය, බොරලැස්ගමුව

*ප්‍රකාශනය*

**බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය**
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස 2736737
විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk
www.buddhistcc.com

# ප්‍රස්තාවනා

පාලි භාෂාව මධ්‍යතන ඉන්දු ආර්යය පූර්ව අවධියට අයත් ප්‍රාකෘත විශේෂයක් බවත් එම ප්‍රාකෘතය වූ කලී එකල උත්තර භාරතයේ ඒ ඒ ප්‍රදේශවල පැවැති පොදු ජනයාගේ කථා ව්‍යවහාරය බවත් පිළිගත් විද්වත් මතයයි. ප්‍රාකෘත ව්‍යවහාරය පොදු ජනතාවගේ හා ශ්‍රමණ සම්ප්‍රදාය ගරු කළ චින්තකයන්ගේ ද භාෂා මාධ්‍යය විය. එය උත්තර භාරතයේ පැතිරී ගිය ඉන්දු යුරෝපීය භාෂා ව්‍යවහාරයෙන් ජනිත වූවක් සේ සැලකිය යුතුය. මෙම ප්‍රාකෘත ව්‍යවහාරයේ ලිඛිත සාධක අනුව මූල අවස්ථාවක් සේ පෙනෙන පාලි භාෂාව උත්තර භාරතයේ කිසියම් විශේෂ ප්‍රදේශයක කථා ව්‍යවහාරයේ මාධ්‍යයක් විය.

1. පාලි භාෂාව ක්‍රි.පූ. 6 වැනි 7 වැනි සියවස්වල කොසොල් රට පැවැති කථා ව්‍යවහාරය පදනම්කොට ඇති වූවෙකැ යි ද එය නොයෙක් ජනපදවල ජනයාගේ පොදු භාෂා මාධ්‍යය වීයැ යි ද මහාචාර්ය රීස් ඩේවිඩ්ස්තුමා පවසයි.

2. පාලිය උජ්ජයිනී ප්‍රදේශයේ භාෂාවයැ යි වෙස්ටර් ගාඩ් ඊ කුක් සහ ඔටෝ ෆ්‍රොන්කේ වැනි විචාරකයෝ පවසති.

3. පාලිය මගධයේ කථා ව්‍යවහාරයයි, යන බුද්ධඝෝෂ හිමියන්ගේ මතය මහාචාර්ය ගෛගර්තුමා අනුමත කරයි.

4. බුදුරජාණන් වහන්සේ මුලදී කොසොල් රට බසින් දහම් දෙසන්නට ඇතැ යි සලකන වින්ටර්නීස්, පාලි ත්‍රිපිටකයේ භාෂාව පැරැණි මගධ ව්‍යවහාරය පදනම්කොට වෙනත් ප්‍රදේශ ව්‍යවහාරයන්ගේ සම්මිශ්‍රනය ද ඇතිව ගොඩනැඟුණු බෞද්ධයන්ගේ සාහිත්‍යයික භාෂාවයැ යි පවසයි.

5. බුදුරජාණන් වහන්සේ ධර්ම ප්‍රචාරයේ යෙදුනු පන්සාළිස් වසින් වැඩි කොටසක් කොසොල්, මගධ ප්‍රදේශවල සැරිසැරූ බව බෞද්ධ සාහිත්‍යයයේ පෙනෙන බැවින් පාලි භාෂාව කොසොල්, මගධ දෙරට කථා ව්‍යවහාරය පදනම්කොට ගෙන බිහි වූවාක් සේ සැලකීමට පුළුවන් බව ඊ කූන් නම් විචාරකයා පෙන්වාදෙයි.

මෙම විග්‍රහයයන් ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වන අතර විශේෂයෙන් සැලකිය යුත්තේ බුදුරජාණන් වහන්සේගේ මතයයි. බුදුරජාණන් වහන්සේ දක්වා වදාළ ආකල්ප විග්‍රහ වන්නේ මජ්ඣිම නිකායේ අරණ විභඞ්ග සූත්‍රයෙහිය. මෙම සූත්‍රයෙන් පෙන්වන්නේ උන්වහන්සේ භාෂා මාධ්‍යයෙහි අනවශ්‍යය ලෙස දැඩි ව එල්බ ගත් ශාස්තෘවරයකු නො වන බවයි. එක ම දෙය විවිධ ජනපදවල නාම කීපයකින් හඳුන්වනු ලබන කල ඒ එක් නාමයක් දැඩි ව අල්වා නො ගෙන ඒ ඒ ලෙසට ව්‍යවහාර කළ යුතු බවත් ලෝක ව්‍යවහාරය නො ඉක්මවිය යුතු බවත් අරණ විභඞ්ග සූත්‍රයෙහි උගැන්වෙයි.

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ත්‍රිපිටකය සංගීත වූ භාෂාව වන පාලි භාෂාව ථේරවාදීන්ගේ ආගමික භාෂාව විය. එය සමස්ත ත්‍රිපිටකය පුරා රැඳී ගියේය. ථේරවාදීන්ගෙන් බිඳී ගිය මහායානිකයෝ බුද්ධ ධර්මය සංස්කෘතයට පෙරලා ගත්හ. ඔවුන්ගේ සංස්කෘත සාහිත්‍යය දියුණුවීමත් මුස්ලිම් ආක්‍රමණ වැනි ආක්‍රමණත් මහායාන දර්ශනය විශ්ව විiාල මඟින් රට මුළුල්ලෙහි බෙදා හැරීමත් මහායානිකයන් ආමිෂ පූජා, යන්ත්‍ර, මන්ත්‍ර ආදියෙන් පෘථග්ජන ජනතා ප්‍රසාදය දිනාගැනීමත් භික්ෂු විනය නීති ලිහිල් ලෙස මහායානිකයන් විසින් සකස් කිරීමත් ආදිය නිසා බුද්ධ ධර්මයත් පාලි භාෂාවත් බුද්ධ ජන්ම භූමියෙන් අතුරුදහන් විය. එය ශ්‍රී ලංකාද්පයේ තහවුරු විය.

**හෙළ අටුවා**

සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙසිය පන්තිස් වැන්නෙහි අශෝක අධිරාජයාගේ දායකත්වයෙන් පැලලුප් නුවර දී තුන් වැනි සංගායනාව පැවැත්වීය. මොග්ගලීපුත්තතිස්ස මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන්

රහතන් වහන්සේලා දහසක් සම්බන්ධ වෙමින් මෙම සංගායනාව පවත්වා ඇත. සාහස්සිකා නමින් හඳුන්වන මෙම සංගායනාව නව මසකින් සම්පූර්ණ විය.

තෘතීය සංගායනාවසානයේ දඹදිව ථේරවාදාචරිය පරම්පරාවේ අවසන් පුරුෂයා වූ මොග්ගලීපුත්තතිස්ස මහා රහතන් වහන්සේගේ ශිෂ්‍යය මිහිඳු මහා රහතන් වහන්සේ විසින් තෘතීය සංගායනාවේ දී තෝරා බේරා ගෙන සංග්‍රහ කළ ථේරවාදී ත්‍රිපිටකය ශ්‍රී ලංකාවට ගෙන එන ලදී. මිහිඳු හිමියන් විසින් ලක්දිවට ගෙන එන ලද පාලි ත්‍රිපිටකය මහා අරිට්ඨ රහතන් වහන්සේ ප්‍රමුඛකොට ඇති සිංහල භික්ෂූන් වහන්සේලා උගත්හ. පාලියෙන් තිබූ ත්‍රිපිටකයේ ගැටලු තැන් සිංහල ජනතාවට පැහැදිලි කැර දීම අවශ්‍යය විය. බුද්ධ කාලයේ සිට වාචන මාර්ගයෙන්, ආචාර්ය පරම්පරාවලින් පැවැත ආ අර්ථ විවරණ ක්‍රම මිහිඳු හිමියන්ගෙන් සිංහල භික්ෂූන් වහන්සේලා උගෙන පාලි ත්‍රිපිටකයේ ගැටලු තැන් හෙළ බසින් අරුත් විවරණ කළහ. හෙළටුවා නමින් මේවා හඳුන්වයි.

අටුවා වනාහි ත්‍රිපිටකයට අයත් පොත්වලට ලියා ඇති ව්‍යාඛ්‍යාන සංග්‍රහ ස්මූහයයි. අටුවාවල පරමාර්ථය පෙළෙහි ඇති දුරවබෝධ වචන සහ ධර්මයේ ගැඹුරු තැන් විස්තර කිරීමත් අවශ්‍යය තැන්වල දී විස්තරාර්ථ සැපයීමත්ය. මෙම පරමාර්ථයෙන් ලියන ලද හෙළටුවා නම්,

**මහා අට්ඨ කථා**
**කුරුන්දි අට්ඨ කථා**
**පච්චරිය අට්ඨ කථා** නම් වේ.

හෙළ අටුවා අතුරින් ප්‍රමුඛ ස්ථානය දරුවේ මහා අට්ඨ කථාව හෙවත් මූල අට්ඨ කථාවයි. බුද්ධඝෝෂ හිමියන්ගේ අට්ඨ කථා සියල්ලට ම පාහේ ශරීරය කැර ගෙන ඇත්තේ මෙම අටුවාවයි. තුන් පිටකයට ම අයත් අට්ඨ කථාවන්හි මහා අට්ඨ කථාව ගැන සඳහන් වන බැවින් එය තුන් පිටකය ම අළලා සකස් වුණු හෙළටුවාවක් වශයෙන් සැලකිය හැකිය. වස්තු විෂයය අතින් සෙසු හෙළටුවාවන්ට වඩා පරිපූර්ණ වී තිබුණු මහා අට්ඨ කථාවේ, ලක්දිව සිදු වූ දේ පිළිබඳ ව බොහෝ වෘතාන්ත ද සඳහන් ව තිබුණු බව සිතා ගත හැකිය.

මහා පච්චරිය අට්ඨ කථාවට එම නම ලැබුණේ පච්චරියක් හෙවත් පහුරක් උඩ දී ලියන ලද බැවිනි. කුරුන්දිවේලු විහාරයේ දී ලියන ලද හෙයින් කුරුන්දි අටුවා නම් විය.

මෙම ප්‍රධාන හෙළටුවාවන්ට අමතර ව තවත් අටුවා කීපයක් දක්නට ඇත. අන්ධ අට්ඨ කථාව එයින් එකකි. දකුණු ඉන්දියාවේ සාඤ්චිපුර (කොන්ජිවරම්) යෙහි පැවැති අටුවාවයි. එය ආන්ධ්‍රා භාෂාවෙන් ලියා ඇතැ යි සැලකේ.

## බුද්ධඝෝෂ හිමි

දඹදිව බෝමැඩට නුදුරු ඝෝෂ නම් ග්‍රාමයේ බමුණු කුලයක උපත ලද බුද්ධඝෝෂ, වාදයෙහි දක්ෂ වූ රේවත නම් මහා තෙරපාණන් වෙත පැවිදි වූ බව ප්‍රචලිත මතයයි. බුද්ධඝෝෂ මහා බෝධි මණ්ඩපයට දකුණු දිග බමුණුගම උපන් බව සද්ධම්ම සංගහ නම් පොතෙහි සඳහන් වේ. බෝමැඩට නුදුරෙහි ඝෝෂ නම් වූ ගමේ උපන් බව බුද්ධඝෝෂුප්පත්ති නම් කථාවේ ද සඳහන් වේ. මෙවැනි විවිධ කරුණු විමර්ශනයෙන් පසුව බුද්ධඝෝෂ ජන්ම භූමිය මොරණ්ඩඛේටක නම් ගම බව පිළිගෙන ඇත. ආන්ධ්‍ර දේශයේ ගුන්ටූර් දිස්ත්‍රික්කයේ පාල්නාඩ් තලුත් පෙදෙසේ කෝටනේමලී, පුරිගුන්ඩ්ලුපල්ලි යන ළඟ පිහිටි ගම් දෙක මොරණ්ඩඛේටකයැ යි පැවසේ. උන් වහන්සේ උපන් පෙදෙස මොරණ්ඩඛේටකයැ යි විසුද්ධි මග්ගයෙන් පෙනේ. මජ්ඣිම නිකායට්ඨ කථාවේ කතීඃ සංදර්ශක ගාථාවක මයූර සුත්ත පට්ඨාන හෝ මයූර රූප පට්ඨන සඳහන් වන බැවින් එතුමා එහි විසූ බව ද සිතිය හැකිය.

ව්‍යාකරණ විෂයයෙහි ද දර්ශන ශාස්ත්‍රයෙහි ද වෛදික ග්‍රන්ථ විෂයයෙහි ද ඉතිහාස පුරා විද්‍යා විෂයයෙහි ද කාය ව්‍යවච්ඡේද විාවන්හි ද ලක්ෂණ ශාස්ත්‍රයෙහි ද පැතිරී ගිය බුද්ධි ප්‍රභාවයක් එතුමා කෙරෙහි පැවැති බව පැහැදිලිය. බුද්ධඝෝෂ හිමියන් ලංකාවට පැමිණීමට පෙර ඤාණෝදය නම් ධර්ම ප්‍රකරණයත් අත්ථසාලිනී අටුවාවත් දඹදිව දී කළ බව සඳහන්ය. බුද්ධඝෝෂ හිමියන් කලින් සර්වාස්ති වාදියකු ව සිට පසුව ථේරවාදී වූ බව ඇතැම් විචාරකයන්ගේ පිළිගැනීමයි.

බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට පැමිණියේ අනුරාධපුරය රාජධානිය කැර ගත් මහානාම රජු දවසය. බුද්ධ වර්ෂ 953 - 975 අතර කාලයේය. උන් වහන්සේ ලංකාවට වඩින විට අට්ඨ කථා සංහිතා කීපයක් ම මේ දිවයිනේ පැවැති බවත් ඒවා හෙළ බසින් ම උගත් බවත් මෙයින් සමහරක් ග්‍රන්ථ ස්වරූපයෙන් ද සමහරක් පූර්වාචාරීන්ගේ මතවාද ඇතුළත් වූ සාහිත්‍යයක් වශයෙන් ද පැවැති බවත් ආචාර්ය අදිකාරම් මහතා පවසයි.

මිහිඳු හිමියන් දවස ම ආරම්භ වූ සිංහල අටුවා කථා වසර 700 ක පමණ කාලයක් සිංහල ත්‍රිපිටකය හෙළි පෙහෙළි කැරමින් පැවැතිණි. ත්‍රිපිටක පාළියට සිංහල අටුවා ලියා ඇති බව දඹදිව විසූ රේවත හිමියන් විසින් දැන ගැනීමෙන්, සිංහල අටුවා පාලියට පරිවර්තනය කිරීම, බුදුදහම චිරස්ථායි වීමට හේතුවක්යැ යි උන්වහන්සේ සලකා හෙළටුවා පාලියට පරිවර්තනය කිරීම සඳහා බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට එවන්න ඇතැ යි සැලකිය හැකිය.

බුද්ධඝෝෂ හිමියන් මෙහි පැමිණ බුදුරජුන් වදාළ දෙලක්‍ෂ පන්සැත්තෑ දහස් දෙසිය පනසක ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ආගමයෙහි තුන් ලක්‍ෂ එක්සැට දහස් සත්සිය පනසක ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණ අටුවා කථා ලියා නැගූ සේකැ යි, දත යුතුයැ යි පූජාවලියේ සඳහන් ව තිබේ.

සංස්කාරවරයකු හා අනුවාදකයකු වශයෙන් බුද්ධඝෝෂ හිමියන්ගේ කාර්යය වූයේ තමන් ඉදිරියෙහි වූ හෙළටුවාවන්හි අන්තර්ගත වූ විවරණ වෙනස් කිරීම නොව, ඒවා සකස් කිරීම සහ අවශ්‍යය ස්ථාන පිඬු කරමින්, අවශ්‍යය ස්ථානවලට විස්තරාර්ථ දක්වමින්, විධිමත් ව, සුගම ව පාලි භාෂාවට නැඟීමයි. බුද්ධඝෝෂ හිමියන්ට අට්ඨ කථා සකස් කරන්න මහා විහාරයෙන් ඉඩ ලැබී ඇත්තේ මහා විහාර වාචනා මාර්ගයට විරුද්ධ මත ඒවායේ ඇතුළත් නො විය යුතුය යන කොන්දේසිය ද සහිත වය.

මහා අට්ඨ කථාව ශරීරයකොට ගෙන මහාපච්චරිය, කුරුන්දි ආදී විශ්‍රුත අර්ථ කථාවන්හි යම් විනිශ්චයක් වේ ද, එහි යුක්තාර්ථ සහ ඇතුළත් වන්නා වූ ස්ථවිර වාදය ද අත් නො හරිමින් සංවර්ධනය හොඳින් ආරම්භ කරන්නෙමු.

තව ද, එම අර්ථ කථාවලින් භාෂාන්තරය පමණක් අත්හැර විස්තර තැන් පිඬුකොට සියලු ම විනිශ්චයන් ඇතුළත්කොට කිසි ම තන්හි යුත්අත් නො ඉක්මවා සංවර්ධනය කරන්නෙමු යි, බුදුගොස් හිමියෝ පවසති.

බුද්ධඝෝෂ හිමියන් විසින් කරන ලද අට්ඨ කථා සියල්ලම මිහිඳු මාහිමියන් විසින් ලක්දිවට ගෙන එන ලදුව මහා විහාරිකයන් විසින් ආරක්ෂා කරනු ලැබූ හෙළටුවාවන්හි පාලි අනුවාද බවත් මහා අට්ඨ කථාවේ සාරය ගෙන පාලි අට්ඨ කථා රචිත බවත් මෙම අට්ඨ කථාවල සඳහන් වේ.

මේ අනුව බුදුගොස් හිමියන්ගේ කාර්යය වූයේ බුදු සමය පිළිබඳ ව අමුතුවෙන් පොත් ලිවීම නොව, එතෙක් හෙළටුවාවන්හි ආ කරුණු විධිමත් ව හා සුගම ව පාලි භාෂාවට නැඟීම වෙයි. පාලි අටුවා පොත්වලින් අඩකටත් වඩා සපයා ඇත්තේ බුදුගොස් හිමියන් විසිනි. බෞද්ධ අට්ඨකථාචාරීන් අතුරෙන් එතුමා ශ්‍රේෂ්ඨතමයායි. එතුමාගේ ජීවන චරිතය වටා විවිධ ජනප්‍රවාද ගෙතී ඇත්තේ ඒ නිසා මය. එතුමා මෙලොව පහළ වූයේ බුදුරජුන්ගේ පර්යාප්ති ශාසනය දීර්ඝ කාලයක් නිර්මල ව පවත්වාගෙන යාම සඳහා පාලි අට්ඨ කථා ලිවීමටය යන ජනප්‍රවාදයක් ද ඇත.

## අටුවා විස්තරය

### විනය පිටකය

| | පෙළ | | අටුවාව | කර්තෘ | කාලය |
|---|---|---|---|---|---|
| උභය විභඞ්ග | 1. පාරාජිකා පාළි | 1. ආණා දේසනා | සමන්තපාසාදිකා | බුද්ධඝෝෂ හිමි | 5 වැනි ශ.ව. |
| | 2. පාචිත්තිය පාළි | 2. යථාපරාධ ශාසන | විනය අට්ඨ කථා | | |
| ඛන්ධක | 3. චුල්ලවග්ග පාළි | 3. සංවරාසංවර කථා | | | |
| | 4. මහාවග්ග පාළි | | | | |
| පරිවාර | 5. පරිවාර පාළි | | | | |
| | | භික්ඛු පාතිමොක්ඛ | කඞ්ඛා විතරණී | බුද්ධඝෝෂ හිමි | 5 වැනි ශ.ව. |
| | | භික්ඛුණී පාතිමොක්ඛ | මාතිකංග කථා | | |

**අභිධර්ම පිටකය**

| | | | | |
|---|---|---|---|---|
| 1. ධම්මසංගණිප්පකරණ | 1. පරමාත්ථ දෙසනා | අත්ථසාලිනී | බුද්ධඝෝෂ හිමි | 5 වැනි ශ.ව. |
| 2. විභඞ්ගප්පකරණ | 2. යථාධම්ම සාසන | සම්මොහ විනොදනී | බුද්ධඝෝෂ හිමි | 5 වැනි ශ.ව. |
| 3. නාමරූප පරිච්ඡෙද කථා | | | | |
| 3. කථාවත්ථුප්පකරණ | | | බුද්ධඝෝෂ හිමි | 5 වැනි ශ.ව. |
| 4. පුග්ගලපඤ්ඤත්තිප්පකරණ | | | | |
| 5. ධාතුකථාප්පකරණ | | පරමත්ථදීපනී | | |
| 6. යමකප්පකරණ | | පඤ්චප්පකරණට්ඨකථා | | |
| 7. පට්ඨානප්පකරණ | | | | |

**සූත්‍ර පිටකය**

| | | | | |
|---|---|---|---|---|
| 1. දීඝ නිකාය | 1. වොහාර දෙසනා | සුමඞ්ගල විලාසිනී | බුද්ධඝෝෂ හිමි | 5 වැනි ශ.ව. |
| 2. මජ්ඣිම නිකාය | 2. යථානුලොමසාසන | පපඤ්ච සූදනී | බුද්ධඝෝෂ හිමි | 5 වැනි ශ.ව. |
| 3. සංයුත්ත නිකාය | 3. දිට්ඨි විනිවෙඨන කථා | සාරත්ථප්පකාසිනී | බුද්ධඝෝෂ හිමි | 5 වැනි ශ.ව. |
| 4. අංගුත්තර නිකාය | | මනොරථපූරණී | බුද්ධඝෝෂ හිමි | 5 වැනි ශ.ව. |
| 5. ඛුද්දක පාඨ | | පරමත්ථ ජොතිකා | බුද්ධඝෝෂ හිමි | 5 වැනි ශ.ව. |
| 1. ඛුද්දකපාඨ | | පරමත්ථ ජොතිකා | බුද්ධඝෝෂ හිමි | 5 වැනි ශ.ව. |
| 2. ධම්ම පද | | ධම්මපදට්ඨ කථා | බුද්ධඝෝෂ හිමි | 5 වැනි ශ.ව. |
| 3. උදාන | | පරමත්ථ දීපනී | ධම්මපාල හිමි | 5 වැනි ශ.ව. |
| 4. ඉතිවුත්තක | | පරමත්ථ දීපනී | ධම්මපාල හිමි | 5 වැනි ශ.ව. |
| 5. සුත්තනිපාත | | පරමත්ථ ජොතිකා | බුද්ධඝෝෂ හිමි | 5 වැනි ශ.ව. |
| 6. විමානවත්ථු | | පරමත්ථ දීපනී | ධම්මපාල හිමි | 5 වැනි ශ.ව. |
| 7. පෙතවත්ථු | | පරමත්ථ දීපනී | ධම්මපාල හිමි | 5 වැනි ශ.ව. |
| 8. ථෙර ගාථා | | පරමත්ථ දීපනී | ධම්මපාල හිමි | 5 වැනි ශ.ව. |
| 9. ථෙරී ගාථා | | පරමත්ථ දීපනී | ධම්මපාල හිමි | 5 වැනි ශ.ව. |
| 10. ජාතක | | ජාතකට්ඨ කථා | බුද්ධඝෝෂ හිමි | 5 වැනි ශ.ව. |
| 11. නිද්දෙස (චුල්ල - මහා) | | සද්ධම්ම ජොතිකා | උපසේන හිමි | 6 වැනි ශ.ව. |
| 12. අපදාන (ථෙර - ථෙරී) | | විසුද්ධජනවිලාසනී | මහානාම හිමි | 7 වැනි ශ.ව. |
| 13. පටිසම්භිදා මග්ග | | සද්ධම්මප්පකාසිනී | ධම්මපාල හිමි | 5 වැනි ශ.ව. |
| 14. බුද්ධවංස | | මධුරත්ථප්පකාසිනී | බුද්ධදත්ත හිමි | 5 වැනි ශ.ව. |
| 15. චරියාපිටක | | පරමත්ථ දීපනී | ධම්මපාල හිමි | 5 වැනි ශ.ව. |
| | | විසුද්ධි මග්ග | බුද්ධඝෝෂ හිමි | 5 වැනි ශ.ව. |
| නෙත්තිප්පකරණ | | නෙත්ති අට්ඨ කථා | ධර්මපාල හිමි | 5 වැනි ශ.ව. |
| චතුභාණවාරපාළි | | චතුභාණවාරට්ඨ කථා | ආනන්ද වනරතන | 8 වැනි ශ.ව. |

බුද්ධඝෝෂ හිමියන් විසින් පාලියට නො නඟන ලද අට්ඨ කථා පාලියට නඟන ලද්දේ බුද්ධදත්ත, ධම්මපාල, උපසේන සහ මහානාම තෙරණුන් විසින්ය.

### බුද්ධදත්ත හිමි

බුද්ධඝෝෂ හිමියන්ගේ සමකාලීනයෙකි. මධුරත්‍ථ විලාසිනී නම් බුද්‍ධවංස අටුවාව උන් වහන්සේ ලියා ඇත.

### උපසේන හිමි

සද්‍ධම්මජෝතිකා නම් නිද්‍දෙස අට්‍ඨ කථාව මහා පරිවේනවාසී උපසේන හිමියන් විසින් කරන ලදී.

### මහානාම හිමි

පරිසම්භිධාමග්‍ග අට්‍ඨ කථාව වන සද්ධම්මප්පකාසනිය මුන්වහන්සේ ලියා ඇත.

### ධම්මපාල හිමි

පරමත්‍ථදීපනී අට්ඨ කථා - උදාන - ඉතිවුත්‍ථක - විමානවත්‍ථු - පෙතවත්‍ථු - ථෙර ථෙරී ගාථා අට්‍ඨ කථා මුන්වහන්සේ ලියා ඇත.

මෙම අට්ඨ කථාවන් උගෙන ඒවා ආරක්‍ෂා කළ අය අට්‍ඨකථිකා නමින් හඳුන්වා ඇත. අට්‍ඨකථාචරියා යනු අට්ඨ කථා සම්පාදනය කළ ආචාර්යවරයන්ය. ආචරිය වාද, ආචරිය මත, ආචරියා වාද යන නම්වලින් කියැවෙන්නේ අට්ඨ කථාවන්මැ යි.

අට්ඨ කථාවන් පිළිබඳ විවිධ විවේචන හා මතවාද උගතුන් අතර පවතී. මෑත කාලීන වියතුන් අතුරින් අග්ග මහා පණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ එවැනි විවේචකයෙකි. උන්වහන්සේගේ අටුවා පරීක්‍ෂණ නම් පොතෙන් එවැනි විවේචන ඉදිරිපත් කැර ඇත. අටුවා කථා බුදුරජාණන් වහන්සේගේ දේශනා නො වන බව කවුරුත් පිළිගනිති. අටුවාචාරීන් වහන්සේලා අතර ද විවිධ මතභේද තිබූ බව දක්නට ඇත. වසර හත්අට සියයක් ගෙන ආ, ලිඛිත ව නො තිබූ අර්ථ කථා සාහිත්‍යයට

එවැනි දේ ඇතුළත් වන්නට පහසුකම් තිබේ. මිහිඳු හිමියන් විසින් ගෙන එන ලද පාලි විවරණ, මහා විහාරික භික්ෂූන් විසින් සිංහලට පරිවර්තනයකොට එම හෙළටුවා පස් වැනි සියවසේ බුද්ධඝෝෂ හිමියන් විසින් නැවත පාලි භාෂාවට පරිවර්තනය කළ බව පිළිගත් සම්ප්‍රදායයි. මේ තැන්වල දී එම මතිමතාන්තර ඇතුළත් වන්නට ඇති බව සිතිය යුතුය.

මහා විහාරීය සම්ප්‍රදාය එකකි. අභයගිරි, ජේතවන පරම්පරාවන්හි ද එවැනි සම්ප්‍රදායයන් පැවතුන බවට සැකයක් නැත. ස්වකීය පාරම්පරික මතවලට පටහැනි සූත්‍ර ධර්මයන් පෙළෙහි ඇති බව දැන දැනත් සිය මතය තහවුරු කැරණු සඳහා ඒවා මදකිනිදු වෙනස් නො කැර, ඉවත් නො කැර, සංගායනාවල දී පැවැති තත්ත්වයෙන් ම ත්‍රිපිටකය රැකගෙන ඒම ගැන මහා විහාරීය පරම්පරාවට බෞද්ධයාගේ ප්‍රණාම පූර්වක ගෞරවය හිමි විය යුතුය.

මේ අන්දමින් පැවැත ගෙන ආ අට්ඨ කථා අපේ හාමුදුරුවරු තවත් වර්ෂ සිය ගණනක් තම ආරාමවල, පොත්ගුල්වල තබා පුස්තකාලවල තැන්පත්කොට උදේ සවස සුවඳ දුම් අල්ලා ධර්ම ගෞරවයෙන් ධර්ම රත්නය රැක ගෙන ආහ. අනගාරික ධර්මපාලතුමාගේ ජාතික ආගමික වැඩපිළිවෙල ආරම්භ වීමෙන් පසු ව එතුමාගේ ම පවුලේ නෑයන් විසින් අට්ඨ කථා මුද්‍රණය කිරීමේ වැඩපිළිවෙල ආරම්භ කැර ඇත. ඒ ධර්මපාලතුමා විසින් ඇති කරන ලද ආගමික ප්‍රබෝධයේ එක් ආභාෂයකි. 1916 ජූලි 05 වැනි දින ත්‍රිපිටක මුද්‍රණ සභා නම් ආයතනයක් සයිමන් ඇලෙක්සැන්ඩර් හේවාවිතාරණ මහතාගේ මැදහත් වීමෙන් කොල්ලුපිටියේ ජ්ලාම්ස් හවුස්හි පිහිටුවා ඇත. 1929 ජූනි 29 වැනි දින මෙම ත්‍රිපිටක සභාවේ රැස්වීමක් කොළඹ ඩික්මන් පාරේ තක්සලාහි දී පවත්වා තිබේ. මෙම රැස්වීමට අති පූජ්‍යය හික්කඩුවේ ශ්‍රී සුමංගල මහා නාහිමියන් ද රත්මලානේ ශ්‍රී ධම්මානන්ද, ධර්මාලෝක නායක හිමියන් ද ප්‍රධාන පණ්ඩිත ධර්මධර භික්ෂූන් වහන්සේලා 25 නමක් සහභාගී වූ බව සඳහන් වේ. අනගාරික ධර්මපාලතුමා ප්‍රධාන සාසනමාමක පිරිස් ද මෙම රැස්වීමට සහභාගී වී ඇත. මෙම නායක පණ්ඩිත ස්වාමීන් වහන්සේලා එක් එක් අටුවා ග්‍රන්ථ සංස්කරණය බාර ගත් බව ද සඳහන් වේ.

සයිමන් හේවාවිතාරණ මහතාගේ අභාවයෙන් පසුව සෝමලතා හේවාවිතාරණ ළමාතැනී විසින් ත්‍රිපිටක මුද්‍රණය සඳහා අරමුදල පිහිටුවීය. ඒම අරමුදල මඟින් හේවාවිතාරණ අට්ඨ කථා ග්‍රන්ථ සමූහය මුද්‍රණය කැර ඇත. ආගම ධර්මය, ඉතිහාසය, පුරාවිද්‍යාව, සාහිත්‍යය ආදී ශ්‍රී ලංකා සංස්කරණ විවිධ ක්ෂේත්‍රයන් පරියේෂණාත්මක අධ්‍යයනවලට යොමු කරමින් ශාස්ත්‍රීය පොතපත සපයා සංස්කෘතිය පිළිබඳ ව අවබෝධයක් ජනතාවට ලබාදීමේ අරමුණින් 1845 දී ආරම්භ කළ ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ අට්ඨ කථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය මඟින් පොත් දහයක් මුද්‍රණය කිරීම මහඟු කාර්යයකි.

අභාවයට යන පැරණි බෞද්ධ පොත්පත් හා අලුතින් ලියැවෙන බෞද්ධ පොත්පත් මුද්‍රණය කැරවීමත් ඉංග්‍රීසි බෞද්ධ පොත්පත් සිංහලට පරිවර්තනය කැර මුද්‍රණය කිරීමත් පරපුරෙන් පරපුරට බුද්ධ ධර්මය ගෙනයාමත් බෞද්ධ සංස්කෘතියේ ආරක්ෂාවත් සඳහා පිහිටුවා ඇති අප ආයතනය වන බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මඟින් බුද්ධ ජයන්ති ත්‍රිපිටකයේ පුනර් මුද්‍රණය නිම කිරීමෙන් පසු ව අට්ඨ කථා සිංහලයට පරිවර්තනයකොට මුද්‍රණය කිරීමට ප්‍රතිපත්ති සකස් කළේය. සිංහලෙන් මුද්‍රණය අවසන්කොට අටුවා කථා ඉංග්‍රීසියට පරිවර්තනය කැර මුද්‍රණය කිරීම අපේ අදහසයි.

"කථා පවත්තිනී" නම් පාඨයක් ත්‍රිපිටකයේ අංගුත්තර නිකායේ සඳහන් වෙයි. ධර්ම දේශකයා පෙළත් අටුවාවත් දනී නම්, දහම් අසන්නා පෙළත් අටුවාවත් දනී නම්, දහම් දෙසන්නාත් අසන්නාත් දෙදෙනා ම පෙළත් අටුවාවත් දනී නම්, එම ධර්ම දේශනාව සාර්ථක දේශනාවක් වන බව මෙහි සාමාන්‍යය අදහසයි. තථාගත ධර්මය වඩාත් ප්‍රකට වීම, විවෘත වීම, එහි පැවැත්මට හා උත්තරීතර භාවයට හේතු වන බව සඳහන්ය. මෙම කරුණු පිළිබඳ විමසිලිවත් වන විට අට්ඨ කථා පරිවර්තනයේ හා මුද්‍රණයේ අවශ්‍යයතාවය වඩාත් පැහැදිලි වන්නේය. එයට අමතර ව විශ්ව විද්‍යාලවල පාලි හා බෞද්ධ අධ්‍යයනාංශවල උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට විෂයය නිර්දේශානුකූල අට්ඨ කථාවල සිංහල පරිවර්තන නොමැතිකමේ බාධාව ද එම ගුරු ශිෂ්‍යය දෙපිරිසට ම මේ මඟින් දුරු කිරීම ද අපේ පරමාර්ථයකි. අපගේ ඉල්ලීම ද පූජ්‍යය රාජකීය පණ්ඩිත වැලිමිටියාවේ කුසලධම්ම නාහිමියන්ගේ අනුශාසනාව ද අනුව අටුවා කථා සිංහලට පරිවර්තනය කැර මුද්‍රණය කැරවීමේ භාරදූර

කර්තව්‍යය ශ්‍රී ලංකා ජනරජයේ වර්තමාන ආගමික අමාත්‍යංශය මඟින් ඉතාම කෙටි කාලයක් තුළ අවසන් කිරීම සඳහා අපට පවරන ලදී. බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය මඟින් අප දක්වූ ආදර්ශයත් ගොඩනැඟූ විශ්වාසයත් මෙයට හේතු වූ බව නිසැකය. මෙම කාර්යය අපට පැවැරීම පිළිබඳ ව ශ්‍රී ලංකා ජනරජයේ අතිගරු ජනාධිපතිතුමන්ට, ගරු අගමැතිතුමන්ට, ගරු බුද්ධ ශාසන නියෝජ්‍යය ඇමැතිතුමන්ට, අමාත්‍යාංශයේ ලේකම්තුමන්ට, අමර හේවාමද්දුම මහතාට අපේ කෘතඥතාවය පුන්‍යානුමෝදනාපූර්වක ව පලකරමු.

අටුවා පරිවර්තනයේ දී ආමිෂ ලාභය ම නොව ශාසනික සේවය ම සලකා එක් එක් පොත බාර ගෙන මැනවින් සිංහලට පරිවර්තනය කැරදුන් පණ්ඩිත ස්වාමීන් වහන්සේලාට ද උගත් ගිහි මහතුන්ට ද අපගේ කෘතඥතාවය හිමිවේ. සිංහල අටුවා පරිවර්තන සමීක්ෂණය කළ උගත් ගිහි පැවිදි දෙපිරිසට ම අපගේ කෘතඥතාව හිමිවේ.

අටුවා කථා පරිවර්තන කාර්යය සම්බන්ධ කරමින් කටයුතු කළේ විජිතනන්ද සරත්චන්ද්‍ර මහතාය. එම ග්‍රන්ථාවලිය මුද්‍රණය කැරවීමේ කාර්යය බාරවූයේ අප ආයතනයේ මුද්‍රණ කටයුතු අධ්‍යක්ෂ පාලිත ලියනගේ මහතාටය. මෙම මහත්වරු දෙපල ම ඉතා උනන්දුවෙන් මෙම කටයුතුවල නියැලීම පිළිබඳ ව එම මහත්වරුන්ට ද මාගේ කෘතඥතාවය පල කරමි. මෙයට අමතර ව මෙම කාර්යයට හොඳ හිතින් අවංක ව සහාය දුන් සියලු දෙනාට ම පින් පුරවමින් ආසිරි පතම්හ.

මෙයට,

ශාසනස්තිථිකාමී,

**කිරම විමලජෝති ස්ථවිර,**
අධ්‍යක්ෂක, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,
නැදිමාල,
දෙහිවල.

# බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක මණ්ඩලය

පූජ්‍ය රාජකීය පණ්ඩිත අම්බලන්ගොඩ ශ්‍රී සුමංගල නායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යටගම ධම්මපාල අනුනායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත ආඳාවල දේවසිරි නායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත තුඹුල්ලේ ධම්මානන්ද නායක හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යාලේගම චන්දකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත වටගෙදර විමලබුද්ධි හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බලංගොඩ සෝභිත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත විදුරුපොල ආනන්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැස්ටියේ උපනන්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජක්ය පණ්ඩිත හත්තොටුවේ ඉන්දරතන හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පල්ලේගම සමිත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මාවනානේ සෝමින්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පඬිවෙල සෝරත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත ජුලම්පිටියේ සරණධම්ම හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බලපිටියේ සිරිසීවලී හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පැපිලියානේ සුමිත්ත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බඹුරුගම ධම්මවංස හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පන්නල සුමේධ හිමිපාණන් වහන්සේ

පණ්ඩිත කීර්ති නාරම්පනාව මහතා
ශාස්ත්‍රවේදී ඇස්. එච්. පෙරේරා මහතා
පණ්ඩිත ජේ. පී. නිමල්ලාල් රංජිත් මහතා
පණ්ඩිත ටී. ජී. ජයතිලක මහතා
පණ්ඩිත ජී. ඇම්. ඩී. වයි. සරත්චන්ද්‍ර අමරතුංග මහතා

පණ්ඩිත එච්. පී. ඇස්. නිශ්ශංක මහතා

පණ්ඩිත බී. ඇම්. පී. බාලසූරිය මහතා

පණ්ඩිත සෝමරත්න ගම්ලත් වෙලගෙදර මහතා

පණ්ඩිත දයා ගුණසේකර මහතා

පණ්ඩිත ඒ. නිශාන්ත පීරිස් මහතා

පණ්ඩිත ඩබ්ලිව්. ඇල්. පී. ධර්මදාස මහතා

පණ්ඩිත ජිනදාස ගොඩකන්ද මහතා

පණ්ඩිත ලසිත් නලන්ත මහතා

පණ්ඩිත පී. ඇල්. කේ. පෙරේරා මහතා

**සම්බන්ධීකරණය** : විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා

# බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ
# අට්ඨකථා පරිවර්තක සමීක්ෂණ මණ්ඩලය

1. පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
   (කථිකාචාර්ය, ශ්‍රී ලංකා විශ්ව විාලය, පේරාදෙනිය)

2. පූජ්‍ය කොටියාගල උපරතන හිමිපාණන් වහන්සේ
   (කථිකාචාර්ය, විාලXකාර විශ්ව විාලය)

3. පූජ්‍ය අම්පාරේ ධම්මෝදය හිමිපාණන් වහන්සේ (ශාස්ත්‍රපති)

4. පූජ්‍ය මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ (ශාස්ත්‍රපති)

5. පූජ්‍ය ඇස්වත්තේ රේවත හිමිපාණන් වහන්සේ (ශාස්ත්‍රපති)

6. හේමචන්ද්‍ර දිසානායක මහතා

7. පණ්ඩිත දයා ගුණසේකර මහතා (සිංහල ශබ්ද කෝෂය)

8. පණ්ඩිත ඒ. ලසිත් නලන්ත මහතා (සිංහල ශබ්ද කෝෂය)

9. පණ්ඩිත සිරිමෙවන් සේනක මහතා (ශාස්ත්‍රවේදී)

10. අභිධම්මාචාර්ය බුද්ධික විජේසිංහ මහතා (ශාස්ත්‍රවේදී, විාවේදී)

# පටුන


| විෂයය | පිටුව |
|---|---|
| සුමේධ කථාව | 1 |
| දූරේ නිදානය | 34 |
| අවිදූරේ නිදානය | 58 |
| සන්තිකෙ නිදානය | 90 |

නිදාන කථා නිමි.

1. පළමු වැනි අපණ්ණක වර්ගය

| | | |
|---|---|---|
| 1. | අපණ්ණක ජාතකය | 112 |
| 2. | වණ්ණුපථ ජාතකය | 123 |
| 3. | සේරිවාණිජ ජාතකය | 128 |
| 4. | චුල්ලසෙට්ඨි ජාතකය | 132 |
| 5. | තණ්ඩුලනාළි ජාතකය | 142 |
| 6. | දේවධම්ම ජාතකය | 145 |
| 7. | කට්ඨහාරි ජාතකය | 154 |
| 8. | ගාමිනී ජාතකය | 156 |
| 9. | මඛාදේව ජාතකය | 158 |
| 10. | සුඛවිහාරී ජාතකය | 161 |

2. දෙවැනි ශීල වර්ගය

| | | |
|---|---|---|
| 1. | ලක්ඛණමිග ජාතකය | 164 |
| 2. | නිග්‍රෝධමිග ජාතකය | 167 |
| 3. | කණ්ඩින ජාතකය | 176 |
| 4. | වාතමිග ජාතකය | 178 |
| 5. | ඛරාදිය ජාතකය | 182 |
| 6. | තිපල්ලත්ථමිග ජාතකය | 183 |
| 7. | මාලුත ජාතකය | 188 |
| 8. | මතකභත්ත ජාතකය | 189 |
| 9. | ආයාචිතභත්ත ජාතකය | 192 |
| 10. | නළපාණ ජාතකය | 193 |

## 3. තෙවැනි කුරුඞ්ග වර්ගය


| | | |
|---|---|---|
| 1. | කුරුඞ්ගමිග ජාතකය | 197 |
| 2. | කුක්කුර ජාතකය | 199 |
| 3. | භෝජාජානීය ජාතකය | 202 |
| 4. | ආජඤ්ඤ ජාතකය | 205 |
| 5. | තිත්ථ ජාතකය | 206 |
| 6. | මහිලාමුඛ ජාතකය | 211 |
| 7. | අභිණ්හ ජාතකය | 214 |
| 8. | නන්දිවිසාල ජාතකය | 217 |
| 9. | කණ්හ ජාතකය | 219 |
| 10. | මුනික ජාතකය | 222 |


## 4. සිව් වැනි කුලාවක වර්ගය


| | | |
|---|---|---|
| 1. | කුලාවක ජාතකය | 225 |
| 2. | නච්ච ජාතකය | 233 |
| 3. | සම්මෝදමාන ජාතකය | 235 |
| 4. | මච්ඡ ජාතකය | 237 |
| 5. | වට්ටක ජාතකය | 239 |
| 6. | සකුණ ජාතකය | 243 |
| 7. | තිත්තිර ජාතකය | 245 |
| 8. | බක ජාතකය | 248 |
| 9. | නන්ද ජාතකය | 253 |
| 10. | ඛදිරඞ්ගාර ජාතකය | 256 |


## 5. පස් වැනි අර්ථකාම වර්ගය


| | | |
|---|---|---|
| 1. | ලෝසක ජාතකය | 265 |
| 2. | කපෝත ජාතකය | 273 |
| 3. | වේළුක ජාතකය | 277 |
| 4. | මකස ජාතකය | 279 |
| 5. | රෝහිණී ජාතකය | 281 |
| 6. | ආරාමදූසක ජාතකය | 283 |
| 7. | වාරුණී ජාතකය | 285 |
| 8. | වේදබ්භ ජාතකය | 287 |
| 9. | නක්ඛත්ත ජාතකය | 291 |
| 10. | දුම්මේධ ජාතකය | 293 |


**පළමු පණ්ණාසකය නිමියේය.**

## 6. හය වැනි ආශංස වර්ගය


| | | |
|---|---|---|
| 1. | මහාසීලව ජාතකය | 296 |
| 2. | චූළජනක ජාතකය | 302 |
| 3. | පුණ්ණපාති ජාතකය | 302 |
| 4. | ඵල ජාතකය | 305 |
| 5. | පඤ්චායුධ ජාතකය | 307 |
| 6. | කඤ්චනක්ඛන්ධ ජාතකය | 311 |
| 7. | වානරින්ද ජාතකය | 313 |
| 8. | තයෝධම්ම ජාතකය | 316 |
| 9. | භේරිවාද ජාතකය | 319 |
| 10. | සඞ්ඛධමන ජාතකය | 320 |


## 7. සත් වැනි ස්ත්‍රී වර්ගය


| | | |
|---|---|---|
| 1. | අසාතමන්ත ජාතකය | 322 |
| 2. | අණ්ඩභූත ජාතකය | 327 |
| 3. | තක්ක ජාතකය | 334 |
| 4. | දුරාජාන ජාතකය | 338 |
| 5. | අනභිරති ජාතකය | 340 |
| 6. | මුදුලක්ඛණා ජාතකය | 342 |
| 7. | උච්ඡඞ්ග ජාතකය | 346 |
| 8. | සාකේත ජාතකය | 349 |
| 9. | විසවන්ත ජාතකය | 351 |
| 10. | කුද්දාල ජාතකය | 353 |


## 8. අට වැනි වරණ වර්ගය


| | | |
|---|---|---|
| 1. | වරණ ජාතකය | 358 |
| 2. | සීලවනාගරාජ ජාතකය | 362 |
| 3. | සච්චංකිර ජාතකය | 365 |
| 4. | රුක්ඛධම්ම ජාතකය | 371 |
| 5. | මච්ඡ ජාතකය | 373 |
| 6. | අසඞ්කිය ජාතකය | 377 |
| 7. | මහාසුපින ජාතකය | 379 |
| 8. | ඉල්ලීස ජාතකය | 393 |
| 9. | ඛරස්සර ජාතකය | 403 |
| 10. | භීමසේන ජාතකය | 405 |

### 9. නව වැනි අපායිම්හ වර්ගය


| | | |
|---|---|---|
| 1. | සුරාපාන ජාතකය | 410 |
| 2. | මිත්තවින්ද ජාතකය | 413 |
| 3. | කාලකණ්ණි ජාතකය | 415 |
| 4. | අත්ථස්සද්වාර ජාතකය | 417 |
| 5. | කිම්පක්ක ජාතකය | 420 |
| 6. | සීලවීමංස ජාතකය | 422 |
| 7. | මඞ්ගල ජාතකය | 425 |
| 8. | සාරම්භ ජාතකය | 429 |
| 9. | කුහක ජාතකය | 430 |
| 10. | අකතඤ්ඤු ජාතකය | 432 |


### 10. දස වැනි ලිත්ත වර්ගය


| | | |
|---|---|---|
| 1. | ලිත්ත ජාතකය | 435 |
| 2. | මහාසාර ජාතකය | 437 |
| 3. | විස්සාසභෝජන ජාතකය | 445 |
| 4. | ලෝමහංස ජාතකය | 447 |
| 5. | මහාසුදස්සන ජාතකය | 450 |
| 6. | තෙලපත්ත ජාතකය | 452 |
| 7. | නාමසිද්ධි ජාතකය | 462 |
| 8. | කූටවාණිජ ජාතකය | 465 |
| 9. | පරෝසහස්ස ජාතකය | 467 |
| 10. | අසාතරූප ජාතකය | 467 |


## මජ්ඣිම පණ්ණාසකය නිමියේය.

### 11. එකළොස් වැනි පරෝසත වර්ගය


| | | |
|---|---|---|
| 1. | පරෝසත ජාතකය | 473 |
| 2. | පණ්ණික ජාතකය | 473 |
| 3. | වේරි ජාතකය | 475 |
| 4. | මිත්තවින්ද ජාතකය | 477 |
| 5. | දුබ්බලකට්ඨ ජාතකය | 478 |
| 6. | උදඤ්චනි ජාතකය | 480 |
| 7. | සාලිත්ත ජාතකය | 482 |
| 8. | බාහිය ජාතකය | 484 |
| 9. | කුණ්ඩකපූව ජාතකය | 486 |
| 10. | සබ්බසංහාරකපඤ්හ (ප්‍රශ්නය) නිමයි | 489 |

## 12. දොළොස් වැනි හංසි වර්ගය


| | | |
|---|---|---|
| 1. | ගද්‍රභ පඤ්හ (ප්‍රශ්නය) නිමයි | 490 |
| 2. | අමරාදේවි පඤ්හ (ප්‍රශ්නය) නිමයි | 490 |
| 3. | සිගාල ජාතකය | 490 |
| 4. | මිතචින්තී ජාතකය | 492 |
| 5. | අනුසාසික ජාතකය | 494 |
| 6. | දුබ්බච ජාතකය | 496 |
| 7. | තිත්තිර ජාතකය | 498 |
| 8. | වට්ටක ජාතකය | 500 |
| 9. | අකාලරාවී ජාතකය | 503 |
| 10. | බන්ධනමොක්ඛ ජාතකය | 505 |


## 13. දහතුන් වැනි කුසනාළි වර්ගය


| | | |
|---|---|---|
| 1. | කුසනාළි ජාතකය | 510 |
| 2. | දුම්මේධ ජාතකය | 513 |
| 3. | නඞ්ගලීස ජාතකය | 516 |
| 4. | අම්බ ජාතකය | 519 |
| 5. | කටාහක ජාතකය | 521 |
| 6. | අසිලක්ඛණ ජාතකය | 525 |
| 7. | කලණ්ඩුක ජාතකය | 529 |
| 8. | බිළාරවත ජාතකය | 531 |
| 9. | අග්ගික ජාතකය | 533 |
| 10. | කෝසිය ජාතකය | 534 |


## 14. දාහතර වැනි අසම්පදාන වර්ගය


| | | |
|---|---|---|
| 1. | අසම්පදාන ජාතකය | 538 |
| 2. | පඤ්චගරුක ජාතකය | 541 |
| 3. | ඝතාසන ජාතකය | 544 |
| 4. | ඣානසෝධන ජාතකය | 546 |
| 5. | චන්දාභ ජාතකය | 547 |
| 6. | සුවණ්ණහංස ජාතකය | 549 |
| 7. | බබ්බු ජාතකය | 551 |
| 8. | ගෝධ ජාතකය | 555 |
| 9. | උභතෝභට්ඨ ජාතකය | 557 |
| 10. | කාක ජාතකය | 559 |

## 15. පහළොස් වැනි කකණ්ටක වර්ගය


| | | |
|---|---|---|
| 1. | ගෝධ ජාතකය | 562 |
| 2. | සිගාල ජාතකය | 564 |
| 3. | විරෝචන ජාතකය | 566 |
| 4. | නඞ්ගුට්ඨ ජාතකය | 569 |
| 5. | රාධ ජාතකය | 571 |
| 6. | කාක ජාතකය | 572 |
| 7. | පුප්ඵරත්ත ජාතකය | 575 |
| 8. | සිගාල ජාතකය | 577 |
| 9. | ඒකපණ්ණ ජාතකය | 581 |
| 10. | සඤ්ජීව ජාතකය | 585 |


### උපරිම පණ්ණාසකය නිමියේය.

### ඒකක නිපාත වර්ණනාව නිමි.

## සංඥාපනය

"ජාතංභූතං පුරාවුත්තං භගවතො පුබ්බචරිතං කායති පකාසෙතීති ජාතකං" මේ වූකලී සාරත්ථප්පකාසිනී නම් විනය ටීකාවේ ජාතක කථා පිළිබඳ කළ හැඳින්වීමයි. බුදුරජාණන් වහන්සේගේ අතීත උප්පත්ති කථා හා චරිත විශේෂ ප්‍රකාශ කිරීම ජාතක වේ යන තේරුම මෙහි දක්වේ. පූර්වේනිවාසානුස්මෘති ඥානයේ ප්‍රතිඵලයක් ලෙස මේ අතීත චරිත දක්වීමේ ශක්තිය ලබාගෙන ඇත. ජාතක, ඛුද්දක නිකායේ දස වැනි ග්‍රන්ථයයි. බුද්ධ වචනය අංග නවයකට බෙදීමේ දී ජාතකවලට සත් වැනි තැන ලැබී ඇත. ඒ නිසා ජාතක කථා සියලු ආකාරයෙන් ම පාලි සාහිත්‍යයේ වැදගත් හා අවශ්‍යය ම අංගයක් වේ. ජාතක අට්ඨ කථාව ආදී අට්ඨ කථාවල එන ගාථාවලින් බොහොමයක් "අභිසම්බුද්ධ ගාථා" නැතහොත් බුදුරජුන් විසින් ම දේසිත ගාථා වෙයි. ඒවා ත්‍රිපිටකයේ කොටස් වන අතර ජාතකවල පැරණි ම කොටස වෙයි. දෙවැනි සංගායනාව වන විට ජාතක සංග්‍රහය පැවැති බව දීපවංසයේ සඳහන් වේ. ජාතක පාළියේ එන ගාථා හය දහස් නවසිය පහක් සඳහා ලියන ලද විස්තර වර්ණනාව ජාතක අත්ථ වණ්ණනා නොහොත් ජාතකට්ඨ කථාව වේ. ඒ අනුව ජාතකට්ඨ කථාවේ (ජාතක අටුවාවේ) මූලාශ්‍රය වන්නේ ජාතක පාළියයි. සමන්තපාසාදිකාවේ නිදාන කථාවේ " **පණ්ණාසාධිකානි පඤ්ච ජාතකසතානි ජාතකන්ති වෙදිතබ්බං**"[1] යනුවෙන් සඳහන් වන කියමන අනුව ජාතක කථා පන්සිය පනහක් වේ. එ සේ වුවත් අප අතර පවත්නා ජාතක පොතේ ඇත්තේ ජාතක කථා පන්සිය හතලිස් හතක් පමණි. අට්ඨසාලිනී නිදාන කථාවේ ද "**පණ්ණාසාධිකානි පඤ්ච ජාතකසතානි**" යැයි දක්වේ. අපේ ජාතක පොතේ නැතත් අප අතර පවත්නා මාතුපෝසක, කලණ්ඩුක, ධම්මසොණ්ඩ ජාතක එකතු වූ විට ජාතක කථා පන්සිය පනස වන බව විදුරුපොල මහා නායක හිමියන් පවසා ඇත. සංස්කෘත ජාතක මාලාවේ එන ව්‍යාඝ්‍රී ජාතකය වැනි ජාතක ද අපේ ජාතක පොතේ නැත. සංස්කෘත භාෂාවෙන් ලියැවී ඇති පොත්වල ද බුරුම බසින් ලියවී ඇති පොත්වල ද ඇති සියලු ජාතක

* 1. භගවා පඤ්ච ජාතක සතානි භාසන්තො අත්තනොච පරෙසංච අතීත ආදියති - (චූලනිද්දෙස පොසාල සුත්තනිද්දෙස)

2. අපණ්ණක ජාතකාදීනි පඤ්ඤාසාධිකානි පඤ්ච ජාතක සතානි ජාතකන්ති වෙදිතබ්බං - (සුමඞ්ගලවිලාසිනී දීඝනිකායට්ඨ කථා)

තුන් දහසක් පමණ වන බව පාලි සාහිත්‍යය ඉතිහාසය නැමැති පොතේ සඳහන් ව ඇත. ජාතක අත්ථ වණ්ණනා නොහොත් ජාතකට්ඨ කථාව, අටුවා ග්‍රන්ථ අතරින් විශාල ම ග්‍රන්ථයයි. අත්ථදස්සී, බුද්ධමිත්ත, බුද්ධදේව යන මහා විහාරික හා මහිංසාසක නිකායික භික්ෂූන්ගේ ආරාධනාවෙන් මෙය ලියන ලද බව සඳහන් වේ. විවිධ දර්ශනවාදී සියලු නිකායන් විසින් පිළිගන්නා ලද මේ ජාතකට්ඨ කථාව, අටුවා ග්‍රන්ථ වැඩි ප්‍රමාණයක් රචනා කළ බුද්ධඝෝෂ මහා ස්වාමීන් විසින් ම රචනා කරන ලද බව ප්‍රවාදයකි. එහෙත් මේ ප්‍රවාදය නො පිළිගන්නා විද්වත්හු බොහෝ වෙති. එ සේ ජාතකට්ඨ කථාව භදන්ත බුද්ධඝෝෂ මහා ස්වාමීන්ගේ නො වේයැ යි දක්වන විද්වත්හු, විමර්ශනය සඳහා පහත සඳහන් කරුණු ඉදිරිපත් කරති.

අ. බුද්ධඝෝෂ හිමියන් විසින් කරන ලද සියලු ම අටුවා ග්‍රන්ථ කන්කළු ස්ත්‍රී ලිංග නාමවලින් හඳුන්වා ඇත. සුමංගල විලාසිනී, පපඤ්චසූදනී, සාරත්ථප්පකාසිනී, මනොරථපූරණී ආදී වශයෙනි. ජාතකට්ඨ කථාව එවැනි අපර නාමයකින් හඳුන්වා නො තිබීම.

ආ. බුද්ධඝෝෂ හිමියන්ගේ ඉන්දීය ආචාර්යවරයා රේවත හිමියෝය. සිංහල ආචාර්යවරයා සංඝපාල හිමියෝය. මේ ආචාර්යවරුන් පිළිබඳ ව කිසිඳු සඳහනක් නො තිබීම.

ඇ. ජාතකට්ඨ කථා කතුවරයා ග්‍රන්ථාවසානයේ දක්වන ප්‍රාර්ථනා ගාථාවන් පෞද්ගලික එකක් වීම. බුද්ධඝෝෂ හිමියන්ගේ අනෙක් කෘතිවල එවැන්නක් නො තිබීම.

ඈ. බුද්ධඝෝෂ ස්වාමීන්ගේ අනෙක් අටුවා ග්‍රන්ථ මෙන් ජාතකට්ඨ කථාව ප්‍රශස්ත රචනයක් නො වීම.

ජාතකට්ඨ කථාවේත් බුද්ධවංසට්ඨ කථාවේත් අපදාන අට්ඨ කථාවේත් නිදාන කථා ඇත. මේ නිදාන කථා සියල්ල සිද්ධාර්ථ චරිතය ද බුද්ධ චරිතය ද හෙළිදරව් කරයි. එහෙත් මේවායේ එන කරුණුවල එකිනෙකට වෙනස්කම් ඇත.

1. අ. බුද්ධවංස අට්ඨ කථාවේ දැක්වෙන්නේ සිදුහත් කුමරුන්ට පිය රජ සුදොවුන් විසින් විවාහ යෝජනා කළ විට, සිදුහත් කුමරු කිසි ශිල්පයක් නො දන්නා නිසා තම දූවරුන් දීමට නො හැකි බව ශාක්‍යය පවුල් කී නිසා සිදුහත් කුමරු ශිල්ප දැක්වූ බවයි.

   ආ. අපදානට්ඨ කථාවේ සඳහන් වන්නේ සිදුහත්, යශෝධරා විවාහය සිදුවීමෙන් පසු ව නෑයින් විසින් ඇති කළ කසු කුසු නිසා සිදුහත් කුමරු ශිල්ප දැක්වූ බවයි.

   ඇ. ජාතකට්ඨ කථාවේ සඳහන් වන්නේ සිදුහත් හා යශෝධරා අතර විවාහය සිදුවී විසි දිනකට පසු ව නෑයින්ගේ කසු කුසු නිසා ශිල්ප දැක්වූ බවයි.

   ඈ. බුද්ධවංසට්ඨ කථාවේ ශිල්ප දැක්වීම සඳහන් වන්නේ සිදුහත් කුමරු රජ මාලිගාව තුළ දී ම පර්යංකයෙන් සිට දුනු දිය ඇද ශිල්ප දැක්වූ බවයි.

   ඉ. අපදානට්ඨ කථාවේ හා ජාතකට්ඨ කථාවේ සඳහන් වන්නේ නුවර බෙර පියවි කැරවා මහජනයා පොදු ක්‍රීඩාංගනයට කැඳවා පුරවැසියන් ඉදිරිපිට දී දුනු දිය ඇද ශිල්ප දැක්වූ බවයි.

2. බුද්ධවංස අට්ඨ කථාවේ දැක්වෙන්නේ සුජාත බුදුරජුන්ට අනතුරු ව "**කප්පසතාධික කප්ප සහස්ස**" කල්ප සියයක් අධිකකොට ඇති කල්ප දහසකට පසු ව පියදස්සී, අත්ථදස්සී, ධම්මදස්සී බුදුවරුන් ලොව පහළ වූ වගයි. අපදානට්ඨ කථාවේ හා ජාතකට්ඨ කථාවේ දැක්වෙන්නේ සුජාත බුදුරජුන්ට අටළොස් කපකට පසුව පියදස්සී, අත්ථදස්සී, ධම්මදස්සී බුදුවරුන් ලොව පහළ වූ වගයි.

3. අපදානට්ඨ කථා, ජාතකට්ඨ කථා දෙකෙහි ම මහාමායා දේවිය ඓතිහාසික සිහිනය දැක ඇති හැටි විස්තර කරන්නේ මෙසේය. මහමායා දේවිය සත් වැනි දවසේ උදෙන් ම නැඟිට සුවඳ පැනින්

නා සාර ලක්ෂයක් වියදම්කොට මහා දන් දී සියලු ආකාරයෙන් සැරසී උතුම් භෝජනය වළඳා උපෝසථ අංග සිහි කරමින් මනරම් ව සරසන ලද ශ්‍රී යහන් ගබඩාවට පිවිස ශ්‍රී යහනේ හොත්තීය. මේ එහි එන විස්තරයයි. මේ අනුව උදෙන් ම නැඟිට දවල් දන් දී තමන් ද ආහාර ගෙන නිදා ගත් බව පෙනේ. මේ විස්තරය අනුව මහමායා දේවිය සිහිනය දුක ඇත්තේ දහවල් කාලයේ බව හැඟෙයි. බුද්ධවංසට්ඨ කථාවේ සිහිනයක් ගැන සඳහනක් ඇත්තේ ම නැත.

මේ අන්දමට මෙම ග්‍රන්ථ තුන පරිශීලනයේ දී මෙවැනි පරස්පර තැන් හමුවේ. ජාතකට්ඨ කථාවේ හා වෙනත් අටුවාවල එන මෙවැනි පරස්පර විරෝධී තැන් පිළිබඳ ව සමහර විද්වතුන් විවිධ කරුණු මතු කැර ඇත.

ජාතකට්ඨ කථාවේ අනුරූපව ගලා යන බුද්ධ චරිතයක් වෙයි. මහාවග්ග - චරියා පිටක, බුද්ධ වංස - අපදාන වැනි ත්‍රිපිටක ග්‍රන්ථවල බුද්ධ චරිතයේ මුල් යුගය ගැන තොරතුරු දක්වෙයි. මහා පරිනිබ්බාණ සූත්‍රයේ බුද්ධ ජීවිතයේ අග කොටස ගැන විස්තර සඳහන් වේ. අරිය පර්යේසන, මහා සච්චක වැනි සූත්‍රවලින් ද සමහර විස්තර ලැබේ. ජාතකට්ඨ කථාවේ ජේතවනාරාමය පිළිගන්නා තෙක් ඓතිහාසික බුද්ධ ජීවිත කථාව ඇත. එය දූරේ නිදාන, අවිදූරේ නිදාන, සන්තිකේ නිදාන වශයෙන් කොටස් කැර දක්වා ඇත.

සුමේධ තාපස චරිතයේ සිට තුසිත භවනයේ ඉපිද ලැබෙන දේවතාරාධනය දක්වා ජීවිත කථාව දූරේ නිදාන වශයෙන් ද,

මහමායා කුස පිළිසිඳ ගැනීමේ සිට බුද්ධත්වය දක්වා ජීවිත කථාව අවිදූරේ නිදාන වශයෙන් ද,

බුදුවීමේ සිට දෙව්රම් වෙහෙර පිළිගැනීම දක්වා වූ බුද්ධ කෘත්‍යය සන්තිකේ නිදාන වශයෙන් ද ගොනු කැර දක්වා තිබේ.

ත්‍රිපිටක ග්‍රන්ථවල ද ජාතකට්ඨ කථා බොහොමයක් දක්නට ලැබේ.

අපණ්ණක ජාතකය, මහා සුදස්සන ජාතකය, ලිත්ත ජාතකය, මහා ගෝවින්ද ජාතකය දීඝනිකායේ ද මඛාදේව ජාතකය, ඝටීකාර ජාතකය ආදී ජාතක මජ්ඣිම නිකායේ ද බකබ්‍රහ්ම ජාතකය සංයුක්ත නිකායේ ද දීඝතීකෝසල ජාතකය මහාවග්ග පාළියේ ද තිත්තර ජාතකය චුල්ලවග්ග පාළියේ ද මට්ටකුණ්ඩලී ජාතකය විමාන වත්ථුවේ ද දක්නට ලැබේ. මේ උදාහරණ කීපයකි. ධම්මපදට්ඨ කථාව, මිලින්ද ප්‍රශ්න ආදී පොත්වල ද ජාතක කථා ඇතුළත් ව ඇත.

ජාතක කථා නම් කිරීම විවිධාකාරයෙන් සිදු වී ඇත. අපණ්ණක ජාතකය වැනි සමහර ඒවා ජාතක ගාථාවේ එන මුල් පදය අනුව නම් කැර ඇත. බක ජාතකය වැනි සමහර ජාතක ප්‍රධාන පාත්‍රයාගේ ස්වරූපයෙන් නම් කැර ඇත. වණ්ණුපථ වැනි ජාතක වර්ණිත විෂයයට අනුව නම් කළ ජාතක කථාය. මචඡ වැනි ජාතක කිසියම් ජම්මයකට අනුව නම් කළ ඒවාය. මෙසේ නම් කරන ලද ජාතක කථා විවිධ ස්වරූපයෙන් විවිධ තේමාවන් යටතේ සකසා ඇති බව වින්ටනීස් පඬිතුමා පෙන්වා දෙයි. එතුමා මෙය කොටස් කීපයකට බෙදා දක්වයි.

1. ව්‍යවහාර නීති සම්බන්ධ කථා
2. තිරිසනුන් පිළිබඳ කථා
3. හාස්‍යය හා විනෝදය පිරි කථා
4. උපහාස නැතහොත් ලොමු ඩැහැගන්වන කථා
5. නෛතික වර්ණනා
6. කථන මාත්‍ර
7. ධාර්මික කථා

මෙසේ විවිධාකාර වූ සෑම-ජාතක කථාවක් ම කොටස් පහකට බෙදේ. වර්තමාන කථාව, අතීත කථාව, ගාථා, අර්ථ වර්ණනා, සමෝධාන යනුවෙනි. වර්තමාන කථාව නම් බුදුරජුන් දවස සජීවී ව සිදු වූ දෙයයි. අතීත කථාව නම් පූර්ව ජන්මයේ පැවැත්මයි. ජාතක කථාවේ දෘෂ්ටියෙන් වැදගත් වන්නේ අතීත කථාවයි. ගාථාව නම් ජාතක පාළියේ එන පැරණි ම කොටසයි. අභිසම්බුද්ධ ගාථායි. අර්ථ වර්ණනා නම් විස්තර කථාවයි. සමෝධානය නම් අතීත ජන්මයේ සිරිත් හා වර්තමානයේ චරිතත් ගැළපීමයි. අන්‍යෝන්‍යය සම්බන්ධතාවය හෙළි කිරීමයි.

මේ සෑම ජාතක කථාවක් ම ආරම්භ වන්නේ එක් සමයෙක්හි බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජකු රාජ්‍යය කරන කල්හි ආදී වශයෙනි. බුද්ධකාලීන භාරතයේ පැවැති සමාජ ධර්ම, දේශපාලනය, රාජ්‍යත්වය, ලෞකිකත්වය, විශ්වාස, ආර්ථික කටයුතු, අල්ලස් ගැනීම් ආදී දුර්ගුණ සියල්ල හෙළිවන ජාතක කථා ථේරවාදීහු මෙන් ම මහායානිකයෝ ද උසස් ලෙස පිළිගනිති.

ධර්ම, අර්ථ, කාම, මෝක්ෂ යන චතුර් වර්ග සම්පත් ලබාදීමට මඟ හෙළිකරන විශ්ව සාධාරණ කථාන්තර වන ජාතක කථා විදේශීය සාහිත්‍යයට ද බෙහෙවින් බලපා ඇත. බෞද්ධයකු වූ සෝමදේව විසින් රචිත කථා සරිත් සාගරය, ජාතක කථාවල ආභාෂය ලබා ඇත. විෂ්ණු ශර්මන්ගේ පඤ්ච තන්ත්‍රය, නාරායන ශර්මන්ගේ හිතෝපදේශය ආදී ග්‍රන්ථ ජාතකවලින් සැරසී ඇත. භාරතයෙන් පර්සියාවට ද එතැනින් සිරියාවට ද සිරියාවෙන් ග්‍රීසියට ද ගිය ජාතක කථා ඊසොප්ගේ උපමා කථා සැරසීමට බෙහෙවින් පිටුවහල් වී ඇති බව බටහිර විවිධ උගතුන් පිළිගෙන ඇත.

බොහෝවිට ජාතක කථාවල සතුන් කථා කිරීම, තිරිසන් සතුන් පවා ඤාති චරියාවේ හැසිරීම, විවිධ තිරිසන් ආත්මවල බෝසතුන් ඉපිද ධර්ම චරියාවෙහි හැසිරීම ආදිය දක්වේ. උපදේශ සාහිත්‍යයේ දී බොහෝ සෙයින් කථා කීමට තිරිසන් සතුන් උපයෝගී කැර ගෙන ඇත. එය ළමා මනසට සමීප වීමට ද එක් මඟකි.

"බ්‍රැසියස්" නම් උපමා ග්‍රන්ථ රචකයා සිය උපමා ග්‍රන්ථය ඉදිරිපත් කැරමින් පූර්විකාවේ මෙසේ සඳහන් කරයි. "පෘථුවියෙහි මුලින් ජීවත්වූවන් ස්වර්ණමයැ යි, මිනිසුන් වශයෙන් හඳුන්වනු ලබන යුක්ති ගරුක මනුෂ්‍යය සංහතියයි. ඔවුන්ට පසුව රජතමයැ යි කියා මෙසේ මනුෂ්‍යය වර්ගයක් ඇතිවූයේය. එයින් පසුව ඇති වූ තෙවැනි වර්ගය අයෝමය නම් වන අපි වෙමු. ස්වර්ණ යුගයේ දී මිනිසුන්ට පමණක් නොව අන් සෑම සජීවී සතකුට ම කථා කිරීමේ ශක්තිය - හැකියාව තිබිණි. දැන් අප එකිනෙකා කථා කරන බඳු වදන් එදා ඔවුන්ට හුරු පුරුදු වී තිබිණි."

ජාතක කථාවල එන රුරුමිහ, ස්වර්ණ මයූර, ජවනහංස, ස්වර්ණමිග ආදී ජාතක කියන්නේ ඒ ඒ සතුන් ඒ ඒ වකවානුවල රජකම්

කළ රජවරුන්ගේ බිසෝවරුන්ට උපන් දොළදුක් සංසිඳුවීම සඳහා මනුෂ්‍යය භාෂාවෙන් බණ කියූ බවයි. මෙසේ ඔවුන් තිරිසන් සතුන් වුව ද මනුෂ්‍යය වර්ගයාට අයත් සිතුම් පැතුම්, ආවේග හා වින්දන ශක්තීන් දක්වා ඇත. හිතාමතා බුද්ධිමත් ව කටයුතු කරන මිනිසා සේ ම ක්‍රියා කැර ඇත.

ලොව පුරා ජනතාවගේ ජන සාහිත්‍යයන්හි සත්ත්ව කථා ද එක් කොටසකි. සත්ත්ව කතන්දර පහළ කළ සිතිවිලි පරම්පරාව, වංස චිහ්න ඇදහීම, සත්ත්ව පරිණාමය, පුනර් ජන්මය පිළිබඳ විශ්වාසය ඉපිදවීය. සමාජ පරිණාමයේ මිනිසා සතුන් සමග වඩාත් සමීප සම්බන්ධතා පවත්වා ඇත. එහි එක් අංගයක් නම් මිනිසා හා තිරිසනා අතර ඥාතිත්වය මත පදනම් වූ මිත්‍රත්වයයි.

ජාතක කථාවලින් පිළිඹිබු වන්නේ එදත් අදත් කවදත් වලංගු ව පවත්නා මිනිස් ස්වභාවයන්ය. උදාහරණ කීපයක් ගෙන පිරික්සිය යුතු වේ. (1) සේරිවාණිජ ජාතකයෙන් කියැ වෙන්නේ වංක හා අවංක වෙළඳුන් දෙදෙනකුගේ කථා පුවතයි. වාණිජ ලෝකයේ මෙය කවදත් සාධාරණය. අද ද මෙවන් වෙළෙන්දෝ වෙති. (2) චුල්ල ධර්මපාල ජාතකයෙන් හෙළි වෙන්නේ පුද්ගල සන්තානයේ සැඟවී ඇති ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, නිමාවක් නැති රාගය යන මනුෂ්‍යය ස්වභාවයන්ය. (3) අසාතමන්ත්‍ර ජාතකයෙන් වයෝවෘද්ධ අයකුගේ පවා නිදිගත් රාගය උචිත අවස්ථාවක් එළැඹි විට උද්දීපනය වන අයුරු පැවසේ. (4) තක්ක ජාතකය, කෙළෙහි ගුණ නො සැලකීම, නැඟී සිටින්නට දුන් අත හපා කෑම, මිත්‍ර ද්‍රෝහී බව, එයින් මතුවන ජඩකම ආදී සිතේ ලක්ෂණ පවසයි. (5) පදමානවක ජාතකය, අම්මා යකින්නක වුව ද දරුවන් කෙරෙහි ඇති සෙනෙහසේ වෙනසක් නැති බව, ඕනෑ ම අම්මා කෙනකු සලකන්නේ දරුවන්ගේ සුරක්ෂිත බව සහ අනාගත දියුණුව බව කියයි. මෙහි එන අතුරු කථාවකින් නැන්දම්මා සහ ලේලි අතර ඇති ඓතිහාසික ගැටුමේ ආරම්භය හෙළි කරයි. (6) ස්ත්‍රීන් ලවා පතිවත රැක්කවීමට ගන්නා ආචීර්ණ කල්පිත උත්සාහය උපහාසයට ලක් කැරන්නේ අන්ධ භූත ජාතකයෙනි. (7) චුල්ල ධනුර්ධර ජාතකයේ එන මනමේ කුමරිය පෙන්වන්නේ ගැලවීම සඳහා, වාසිය සඳහා මිනිස් සිත ක්‍රියාකරන ආකාරයයි. (8) මාතංග ජාතකය රටේ ම සිටින පහත් ම කුල හීනයා රටේ ම සිටින උසස් ම කුල කාන්තාවක හා විවාහ වන බව පවසන අතර රටේ ම සිටින විරූපී

ම පුද්ගලයා රටේ ම සිටින ලස්සන ම රන් රුවක් හා සමාන ස්ත්‍රිය සමග විවාහ වන අයුරු කුස ජාතකය හෙළි කරයි. කුල මානයෙන් ද රූප මානයෙන් ද අධිමාන්නයට පත්වීමේ අහිතකර බව පැහැදිලි කරයි. මේ දෙකෙන් ම කියැ වෙන්නේ කුලයෙන් හා රූපයෙන් අහංකාර වීමේ මිනිස් ගතියයි. (9) උම්මදන්ති ජාතකයේ එන්නේ හොඳ නරක අතර ගැටුණු රජකු පිළිබඳ කථාවයි. රජුගේ මානසික ගැටුම, මිත්‍රත්වය, රාගී හැඟීම, ස්ත්‍රිය, රාජ ධර්ම, ස්ව චාරිත්‍ර රැකීම ආදී සියල්ල රජු රැක ගනී. රජු තුළ මනුෂ්‍යය ස්වභාවය මතු වූ අතර ක්ෂත්‍රියයකු වශයෙන් ඒ ස්වභාවය සංයමයෙන් සන්තර්පිත කළ ආකාරය එහි දැක්වේ. (10) එක් අන්තයකට ගිය පුද්ගලයා කවදා හෝ අනෙක් අන්තයට යන බව අනිත්ථිගන්ධ ජාතකය උගන්වයි. (11) වැරදි මඟ යන පුද්ගලයා රට, ජාති‍ය සියල්ල විනාශ කරන බව අපණ්ණක ජාතකයෙන් උගන්වා තිබේ. (12) දේවධර්ම ජාතකයෙන් උගන්වන්නේ වැරදි කිරීමට ඇති බය හා ලජ්ජාවයි. මේ සමාජ ධර්ම ද්වය නැති පාලකයා නිසා රට පිරිහෙයි. භික්ෂුව නිසා සසුන පිරිහෙයි. පුරවැසියා නිසා සමාජය පිරිහෙයි. (13) සත්තිගුම්බ ජාතකයෙන් ඉගැන්වෙන්නේ පුද්ගල චරියාව හැඩ ගැස්වීමට ආරයට වඩා පරිසරය බලපාන බවයි. (14) දරුවන්ගේ චරිත සංවර්ධනයේ දී දෙමාපියන්, නෑ හිතවතුන්, අසල්වැසියන්ගෙන් යුතු පරිසරය බලපායි. බාල දරුවන් දෙමාපියන් ඇසුරේ සුදුසු ප්‍රදේශයක වාසය කළයුතු බව චුල්ල සුතසෝම ජාතකය කියාදෙයි. (15) තේසකුණ, ගණ්ඩක ජාතක රජවරුන්ට - පාලකයන්ට අවශ්‍යය අපූරු රාජ්‍යය පාලන උපදෙස් ලබාදෙයි. (16) පති පතිනියන්ගේ අන්‍යෝන්‍යය බැඳීම චන්දකින්නර ජාතකය කියයි. (17) ගැහැනියකට රජ සැපතකට වඩා ස්වාමියාගේ සෙනෙහස අවශ්‍යය බවත් ගැහැනියක රැජිනියක වීමට වඩා යහපත් ස්වාමියකු ලැබ හොඳ පතිනියක වීම යහපත් බවක් සම්බුලා ජාතකය පෙන්වා දෙයි. (18) යම් යම් කිපිය යුතු කරුණුවල දී ද රජවරුන් - පාලකයන් තමතමන්ගේ හිතවත් ඇමැතිවරුන්ගෙන් පළිගැනීම, දඬුවම් දීම නුසුදුසු බවත් කේලම් අසා හිතවත් ඇමැතිවරුන්ට දඬුවම් දීම නුසුදුසු බවත් ඒකරාජ ජතකයෙන් ද සමහර ඇමැතිවරුන් කරන වැරදි ගණන් නො ගෙන ඉවත බලා ගැනීම රාජ්‍යයේ ස්ථිරත්වයට එලදායි බව පබ්බතුපත්ථර ජාතකයෙන් ද පෙන්වා දෙයි.

අපේ බෞද්ධ සංස්කෘතිය ගොඩනංවා පුරුෂාර්ථයන් ජනනය කළේ මේ ජාතක කථා මඟිනි. කණගාටුදායක හා ප්‍රීතිදායක අවස්ථා දෙකේදී ම බෞද්ධයෝ දන් දෙති. මසුරු මළ හැර පියති. මේ ගුණ

ධර්මය අපට පුරුදු කළේ ඉල්ලීස, සුධා භෝජන, වෙස්සන්තර, අතිත්ති, සසපණ්ඩිත වැනි ජාතක කථා මඟිනි. මහා ධම්මපාල වැනි ජාතක බෞද්ධයා ප්‍රාණ ඝාතයෙන් ඈත් කැරවූහ. සම්බුලා, චන්දකින්නර, වෙස්සන්තර වැනි ජාතක වනිතාවන්ට පති ව්‍රත දායාද කළේය. මාතු පෝසක, ගිජ්ඣ, මහා සුව වැනි ජාතකවලින් අප මව්පියන් රැක බලා ගැනීම උගෙන ඇත. සාලිකේදාර වැනි ජාතකවලින් වැඩිහිටියන්ට සැලකීමේ ගුණය බෞද්ධයා පුහුණු කැර ඇත. භූරි දත්ත, චම්පෙය්‍ය, සීලවනාග ආදී ජාතක ආභාෂයෙන් පන්සිල්, අටසිල් රකින්නට පුහුණු වී ඇත. බෞද්ධයා ලජ්ජා, බය දෙකින් යුක්ත වූයේ, දේවධර්ම ආභාෂය ලැබීමෙනි. නන්දිවිසාල ජාතකාදියෙන් ප්‍රිය වචන කථා කිරීමට උගෙන ඇත. උත්සාහයෙන් - ධෛර්යයෙන් ධනය ඉපයීමට චුල්ලසෙට්ඨි සිටුතුමා පුහුණුව දී ඇත. වට්ටක ජාතකය බෞද්ධයා සමගි කැර ඇත. බෞද්ධයාගේ මෙලොව හා පරලොව ජීවිත සුවපත් කළේ මේ ජාතක පොත මඟිනි. ඒ නිසා ම ජාතක පොත "ජාතක පොත් වහන්සේ" යැයි බෞද්ධ ජනතාවගේ උදාර පූජෝපහාරයට පාත්‍ර වී සදාතනික ව පවතී.

විජිතනන්ද සරත්චන්ද්‍ර

# ජාතක අටුවාව

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස///

ජාතිකොටි සහස්සෙහි පමාණරහිතං හිතං,
ලොකස්ස ලොකනාථෙන කතං යෙන මහෙසිනා.

තස්ස පාදෙ නමස්සිත්වා කත්වා ධම්මස්ස ච ඤ්ජලිං,
සඞ්ඝඤ්ච පතිමානෙත්වා සබ්බසම්මාන භාජනං.

නමස්සනාදිතො අස්ස පුඤ්ඤස්ස රතනත්තයෙ,
පවත්තස්සානුභාවෙන හෙත්වා සබ්බෙ උපද්දවෙ.

තිලෝ සරණ වූ යම් මහා ඉරිසින් වහන්සේ නමක් විසින් (බුදුරජුන්) කෙළ දහසක් අත්බැව්හි ලෝවැසියන්ට ප්‍රමාණ කළ නො හැකි යහපතක් කරන ලද ද,

උන් වහන්සේගේ සිරිපා යුවල නැමැද ධර්මයට ද ඇදිලි බැඳ (නැමඳ) සැමගේ බුහුමනට බඳුන් වූ සඟරුවන ද ගෞරවාදරයෙන් පුදා,

තෙරුවන විෂයයෙහි නැමදීම් ආදී වශයෙන් පවත්වන ලද ඒ පුණ්‍යය මහිමයෙන් සියලු උවදුරු නසා,

**තං තං කාරණමාගම්ම දෙසිතානි ජුතීමතා,**
**අපණ්ණකාදීනි පුරා ජාතකානි මහෙසිනා.**

**යානි යෙසු චිරං සත්ථා ලොකනිත්ථරණත්ථිකො,**
**අනන්තෙ බොධිසම්භාරෙ පරිපාචෙසි නායකො.**

**තානි සබ්බානි එකජ්ඣං ආරොපෙන්තෙහි සඞ්ගහං,**
**ජාතකං නාම සඞ්ගීතං ධම්මසඞ්ගාහකෙහි යං.**

ශෝභාමත් වූ මහාසෘෂි බුදු රජුන් විසින් පෙර දවස අර්ථෝත්පත්ති වසයෙන් එළැඹ සිටි කාරණය අනුව අපණ්ණකාදී යම් ඒ ජාතකයන් දෙසන ලද ද,

තිලොවට නායක වූ ලෝවැසියන් සසරින් එතැර කිරීම අරමුණු කොට ඇති, දෙව්මිනිසුන්ගේ අනුශාසක වූ බුදු රජහු, යම් ඒ ජාතකයන්හි බුද්ධත්වයට හේතු වූ පාරමී ධර්මයන් පූරණය කළේ වී ද,

ඒ සියලු ජාතකයන් එකට සංග්‍රහ කොට ප්‍රථම ධර්ම සංගායනාවේ දී මහ තෙරවරුන් විසින් ජාතක නමින් ප්‍රකරණයක් සංගායනා කරන ලද ද,

**බුද්ධවංසස්ස එතස්ස ඉච්ඡන්තෙන චිරට්ඨිතිං,**
**යාචිතො අභිගන්ත්වාන ථෙරෙන අත්ථදස්සිනා.**

**අසංසට්ඨ විහාරෙන සදා සද්ධිවිහාරිනා,**
**තථෙව බුද්ධමිත්තෙන සන්තචිත්තෙන විඤ්ඤුනා.**

**මහිංසාසකවංසම්හි සම්භූතෙන නයඤ්ඤුනා,**
**බුද්ධදෙවෙන ච තථා භික්ඛුනා සුද්ධබුද්ධිනා.**

අපණ්ණකාදී ජාතක මඟින් දක්වෙන බුදු රජුන්ගේ පරම්පරා කථා මාර්ගය වූ බුද්ධ වංසයෙහි දිගුකල් පැවැතීම කැමැති වූ අත්ථදස්සි මහතෙරුන් විසින් ගෞරව පූර්වක ව ළඟට අවුත් අයදනා ලද,

එ සේ ම දහර මහණ ආදීන් හා අමිශ්‍ර විහරණ ඇති හැම කල්හි සමග වාසය කරන සන්සුන් සිත් ඇති නුවණැති බුද්ධමිත්ත තෙරණුවන් විසින් ද,

මහිංසාසක රාජ වංසයෙහි හෝ එනම් පරපුරෙහි පහළ වූ ඒකන්තනය ආදී චතුර්විධ න්‍යාය ධර්මය ප්‍රගුණ කළ තියුණු ඤාණයෙන් යුත් බුද්ධදේව නම් යතිවරයන් විසින් ද එ සේ ම අයදනා ලද මම,

**මහාපුරිස චරියානං ආනුභාවං අචින්තියං,**
**තස්ස විජ්ජෝතයන්තස්ස ජාතකස්සත්ථවණ්ණනං.**

**මහාවිහාරවාසීනං වාචනාමග්ග නිස්සිතං,**
**භාසිස්සං භාසතො තමෙම සාධු ගණ්හන්තු සාධවොති.**

බෝසත්වරුන්ගේ පෙරුම් දම් චර්යාවන්ගේ මහිමය සිතිය නො හැකිය. ඒ බෝසත් චර්යාවන් ප්‍රකාශ කරන,

මහා විහාරවාසී තෙරවරුන්ගේ වදන් මඟ ඇසුරු කළ ඒ ජාතක කථාවන්ගේ ව්‍යාඛ්‍යානය ප්‍රකාශ කරමි. ඒ මාගේ භාෂිතය සූදීහු එකඟ සිතින් ගනිත්වා.

ඒ මේ ජාතක අර්ථ වණ්ණනාව දූරේ නිදාන - ඈත හේතුව, අවිදූරේ නිදාන - නුදුරු හේතුව, සන්තිකෙ නිදාන - ළඟ හේතුව යන

ත්‍රිවිධ හේතූන් දක්වා විස්තර කැරෙන කල්හි, යම් කෙනෙක් එය අසත් ද, ඔවුහු ආරම්භයේ පටන් දත් බැවින් හොඳින් දත් කෙනෙක් වෙත්. එහෙයින් ඒ ත්‍රිවිධ හේතූන් දක්වා වර්ණනා කරමු.

පළමු කොට ඒ නිදාන හෙවත් හේතූන්ගේ කාල පරිච්ඡේදය දත යුතුයි. දිවකුරු බුදු රජුන්ගේ පාමුල කළ ප්‍රාර්ථනා ඇති බෝසතුන්ගේ වෙසතුරු අත්බව දක්වාත් එයින් චුත ව තුසිත පුරයෙහි ඉපදීම දක්වාත් අතර කථා පුවත දූරේ නිදාන හෙවත් ඈත හේතුව නම්. තුසිත පුරයෙන් චුත ව බෝමැඩ බුද්ධත්වයට පැමිණීම දක්වා පැවැති කථා පුවත අවිදූරේ නිදාන හෙවත් නුදුරු හේතුව නම්. ළඟ හේතුව හෙවත් සන්තිකෙ නිදානය වනාහි යම් යම් තැනක බුදු රජනු වැඩ වෙසෙත් ද ඒ ඒ තැන්වල දී ලැබේ.

එහි දූරේ නිදාන - ඈත හේතුව නම් සාරාසංඛ්‍යය කල්ප ලක්‍ෂයක් මතුයෙහි අමරවතී නම් නගරයක් විය. එහි සුමේධ නම් බමුණෙක් වාසය කළේය. ඔහු මව්පිය දෙපසින් ම කුලවත්ය. පිරිසුදු මව් කුස ඇත්තේය. සත් කුල පරපුර දක්වා ම කුලය නිසා නින්දා නො ලද්දේය. පැහැපත්ය. දකුම්කළුය. රූපත්ය. පැහැපත් ඡවි වර්ණයෙන් යුක්තය. ඔහු අන් ශිල්පාදියක් නො ඉගෙන බමුණු දහම ම උගත්තේය. සුමේධ ළදරු වියේ සිටියදී ම මව්පියෝ මිය ගියහ. ඔහුගේ භාණ්ඩාගාරික ඇමැති, ලේකම් පොත ගෙනවුත් කුමරුනි, මෙපමණ මව්ට අයත් ධනය ය. මෙපමණ පියා සතු ධනය ය. මෙපමණ මුතුන් මීමුතුන් සතු ධනය ය. මේ මහත් ධනය පරිභෝග කරනු මැනවි යි කීය. සුමේධ පණ්ඩිතයෝ මෙසේ සිතී. මේ සා මහත් ධනය රැස් කළ මගේ මව්පිය මීමුත්තෝ පරලොව යන්නාහු, කහවණුක් පමණකුදු රැගෙන නො ගියාහුය. මා ඒ ධනය ගෙනයා හැකි ක්‍රමයක් කළ යුතුය යි රජුන් දැනුවත් කොට නුවර බෙර හසුරුවා මහජනයාට ධනය දන් දී තවුස් පැවිද්දෙන් පැවිදි විය. මේ සිද්ධිය වඩාත් පැහැදිලි කිරීම සඳහා මෙහි දී සුමේධ කථා පුවත කිය යුතුය. මේ කථා පුවත බුද්ධ වංසයෙහි සවිස්තර ව කීව ද ගාථාවලින් පමණක් කී නිසා මනාව ප්‍රකට නො වේ. එම නිසා අපි එපුවත අතරතුර ගාථා දක්වමින් කියමු.

සාරාසංඛ්‍යය කල්ප ලක්‍ෂයක් මතුයෙහි දශාකාර ශබ්දයෙන් තොර නො වූ අමරවතී නමින් ද අමර නමින් ද වූ නගරයක් විය.

ඒ සඳහා බුද්ධ වංසයෙහි කියන ලදී.

"සාරසංඛ්‍ය කල්ප ලක්ෂයක් මතුයෙහි සිත්කළු, දැකුම්කළු, දශවිධ ශබ්දයෙන් තොර නො වූ, ආහාර පාන සුලභ වූ අමර නම් නගරයක් විය."

එහි දශවිධ ශබ්දයෙන් තොර නො වූ යනු ඇත්, අස්, රිය, බෙර, මිහිඟු බෙර, වීණා ශබ්දය, ගීත ශබ්ද, හක් නාදය, තාලම් ශබ්දය හා කනු, බොනු, අනුභව කරනු යන මේ දශවිධ ශබ්දයෙන් තොර නො වීය. මේ ශබ්දයන්ගෙන් එක් කොටසක් පමණක් ගෙන බුද්ධ වංසයෙහි,

"ඇත් හඬ, අස් හඬ, බෙර හඬ, සක් හඬ, රථ හඬ හා කනු බොනු යි ආහාරපානයෙන් ඝෝෂිත වූයේය."

බුද්ධ වංසයෙහි මේ ගාථා කියා,

ඒ නගරය සියලු නගරාංගයෙන් යුක්තය. සියලු කැමැති දෙයින් පිරුනේය. සත් රුවනින් යුක්ත විය. නොයෙක් දෙයින් ගැවසුණි. දෙව් නුවරක් මෙන් පොහොසත් විය. පින් කළවුන්ට වාස භවනයක් විය.

ඒ අමරවතී නගරයෙහි නොයෙක් කෙළ ගණන් තැන්පත් ධනය ඇති, බොහෝ ධනය හා ධාන්‍යය ඇති සුමේධ නම් බමුණෙක් විය.

එහෙයින් බුද්ධ වංසයෙහි කියන ලදී.

"ධ්‍යාන වඩන්නකු විය. හේ වේද මන්ත්‍ර ධරන්නෙකි. ත්‍රිවේදයෙහි පරතෙරට ගියේය. ග්‍රන්ථ දසදහයකින් යුත් ලක්ෂණ ශාස්ත්‍රයෙහි ද පුරාවෘත පිළිබඳ ඉතිහාසයෙහි ද සියලු බමුණු දහමෙහි ද පරතෙරට ගියේය."

එක් දිනක් ඒ සුමේධ පණ්ඩිත තෙම උතුම් මතුමහළෙහි රහසිගත ව පලක් බැඳ හිඳ මෙසේ සිතීය. නැවත භවයක පිළිසිඳ

ගැනීම නම් දුකකි. ඉපදුණු භවයන්හි මරණය ද දුකකි. මම ද ඉපදීම ස්වභාව කොට ඇත්තෙමි. මහළු වීම ස්වභාව කොට ඇත්තේ වෙමි. රෝග ස්වභාව කොට ඇත්තේ වෙමි. මරණය ස්වභාව කොට ඇත්තේ වෙමි. එබඳු වූ මවිසින් ඉපදීමක් නැති, මහළු වීමක් නැති, ලෙඩ වීමක් නැති, සැපදුක දෙකින් තොර වූ, සිසිල් වූ අමාමහ නිවන සෙවිය යුතුය. ඒකාන්තයෙන් සසරින් මිදී නිවනට පමුණුවන ඒකායන මාර්ගයක් විය යුතුය. එහෙයින් බුද්ධ වංසයෙහි කියන ලදී.

> "එදා මම විවේකීව මෙසේ සිතීමි. පුනර්භවය දුකකි. එසේ ම මරණය ද දුකකි. මම ද නැවත ඉපදීම, මහළු වීම, ලෙඩ වීම ස්වභාව කොට ඇත්තෙමි. එම නිසා නො දිරන, නො මැරෙන, බිය නැති නිවන සොයන්නෙමි. නොයෙක් කුණු කසලින් පිරුණු මේ අසුබ ශරීරය පිළිබඳ ආසා බලාපොරොත්තු අතහැර යන්නෙහි නම් මැනවි. ඒ ඒකායන නිවන් මඟ ඇත. ඒ නිවන් මඟ මම සොයමි."

සුමේධ පණ්ඩිතයෝ වඩ වඩාත් ගැඹුරින් මෙසේ සිතූහ. ලොවෙහි දුකට ප්‍රතිපක්‍ෂ වූ සැප නම් සංකල්පයක් ඇත. එසේ ම භවය ඇති කල්හි විභවයක් - නිවනක් තිබිය යුතුය. උණුසුම ඇති කල්හි ප්‍රතිපක්‍ෂ සීතල ද පවතී. එ සේ ම රාගාදී ගිනි ඇති කල්හි සංසිඳවන නිවන ද විය යුතුය. ලෝකයෙහි පව්වු ලාමක ධර්මයන්ට විරුද්ධ වූ යහපත හා නිවරද ඇත්තේය. එමෙන් පව්වු පුනර්භවය ඇති කල්හි ඊට ප්‍රතිපක්‍ෂ වූ උපතක් නැති නිර්වාණය විය යුතුය.

එහෙයින් බුද්ධ වංසයෙහි කියන ලදී.

> "යම් සේ දුක ඇති කල්හි ඊට ප්‍රතිපක්‍ෂ සැපය ද වේ. සසර ඇති කල්හි නිවන ද කැමැති විය යුතුය. යම් සේ උණුසුම ඇති කල්හි ඊට විරුද්ධ වූ සීතල ද පවතී. එමෙන් ත්‍රිවිධ අග්නි ඇති කල්හි නිවන ද කැමැති විය යුතුය. යම් සේ පාපය ඇති කල්හි කුසලය ද ඇත. එමෙන් ඉපදීම ඇත්තේ නම්, එහි පැවැත්ම ද නිවන ද කැමැති විය යුතුයි"

සුමේධ පණ්ඩිතයෝ තව තවත් සිතූහ. යම් සේ අසූචියෙහි ගොඩක ගිලුණු මිනිසා පස්වන් පියුමෙන් ගැවැසුණු මහා විලක් දුර තිබෙනු දැක කවර මඟකින් එහි යා යුතුදැ යි, ඒ මහා විල සෙවිය යුතුය. ඔහු නො සොයන්නේ නම් මහා විලෙහි දොසක් නො වේ. ඔහුගේ ම දෝෂය යි. එමෙන් කෙලෙස් මළ සෝදා හරින අමා මහනිවන නම් මහා විල පවතිද්දීත් ඒ මඟ නො සොයා නම්, ඒ අමා මහනිවන් විලේ දෝෂයක් නොව, මිනිසාගේ ම දෝෂයයි. තව ද සොරුන් විසින් වට කැරගත් මිනිසකුට පැන යා හැකි මඟක් තිබියදීත් පැන නො යන්නේ නම්, ඒ මඟෙහි දොසක් නොව, මිනිසාගේ ම දෝෂකි. එමෙන් කෙලෙසින් පිරිවැරුණු මිනිසා ශාන්ත නිවන් මඟ ඇති කල්හිත් එය නො සෙවීම මඟෙහි දෝෂයක් නොව, මිනිසාගේ ම දෝෂයකි. යම් සේ රෝගයකින් පෙළෙන මිනිසා රෝගයට පිළියම් කළ හැකි වෙදකු සිටියදී ඔහු ළඟට ගොස් රෝගයට ප්‍රතිකාර කැරවා නො ගැනීම, වෛද්‍යවරයාගේ වරද නො වේ. එමෙන් කෙලෙස්වලින් පෙළෙන මිනිසා කෙලෙස් සංසිඳවීමේ මඟ දන්නා අයකු සිටින කල්හි ඒ ගුරුවරයා නො සෙවීම, ඔහුගේ ම දෝෂයයි.

එහෙයින් කියන ලදී.

> "යම් සේ අසූචි ගිලුණු මිනිසකු පිරුණු ජලාෂයක් දැක ඊට ළඟාවන මඟ නො සොයා ද, ඒ ජලාෂයේ දෝෂය නො වේ. එසේ ම කෙලෙස් මළ සෝදා හරින නිවන් ජලාශය නො සොයයි ද, ඒ ජලාශයේ වරද නො වේ. යම් සේ සතුරන් විසින් වට කරන ලද පුරුෂයා මාර්ගයක් ඇති කල්හි පලා නොයේ නම්, ඒ මාර්ගයේ වරද නො වේ. යම් සේ රෝගී වූ පුරුෂයා ඒ රෝගය සුව කළ හැකි වෛද්‍යවරයකු සිටියදී ඒ රෝගයට පිළියම් කැරවා නො ගනී ද, ඒ වරද වෛද්‍යවරයාගේ නො වේ. එමෙන් කෙලෙස් රෝග දුකින් පෙළෙන පුරුෂයා ඒ නිවන් මඟ දක්වන ගුරුවරයා නො සොයයි ද, ඒ වරද ගුරුවරයාගේ නො වේ."

සුමේධ පණ්ඩිතයන් තවදුරටත් මෙසේ සිතීය.

යම් සේ සිය සිරුර සරසනු කැමැති පුරුෂයකු ගෙල බැඳුණු මස් කැබැල්ල ඉවත දමා සුව සේ යයි ද, එසේ මවිසිනුදු මේ අපිරිසිදු ශරීරය අපේක්ෂා රහිත ව අතහැර නිවන් පුරට පිවිසිය යුතුය. යම් සේ ගැහැනු සහ මිනිස්සු මළපහ කැර ඒ මළ මූත්‍රා උතුරු සළුවෙන් දවටා හෝ ඇඳි රෙදි වතෙහි ගැට ගසාගෙන හෝ නො යති. පිළිකුළින් අනපේක්ෂිත ව හැරදමා යෙත්. එසේ මා විසිනුදු මේ අපිරිසිදු සිරුර ඇලුම් නැතිව අතහැර අමා මහනිවන් පුරට පිවිසිය යුතුය. යම් සේ නැවියන් දිරාගිය නැව අපේක්ෂා නැති ව හැරදමා යා ද, එසේ මම ද වණ මුඛ නවයකින් වැගිරෙන මේ කය හැර දමා නිවන් පුරට පිවිසෙමි. යම් සේ පුරුෂයකු නොයෙක් රන්රුවන් රැගෙන සොරුන් සමග යන්නේ, සොරුන් මඟහැර නිර්භය මාර්ගය ගනී ද එසේ ශක්‍ර ශ්‍රෝණිත දෙකින් සැදුණු මේ කය ද රන්රුවන් පැහැර ගන්නා සොරකු සමාන ය. ඉදින් මේ කය පිළිබඳ ව ආශා කරම් නම් නිවන් මඟට අදාළ කුසල ධර්ම නැමැති රුවන් විනාශ වන්නේය. එම නිසා මා මේ සොරකු සමාන කය හැරදමා නිවන් පුරට පිවිසීම වටිනේය.

එසේ හෙයින් කීය.

> "යම් සේ පුරුෂයකු ගෙල බැඳි කුණුපය පිළිකුලින් බැහැර කොට තම අභිමතය පරිදි සුව සේ යන්නේ ද, එසේ ම මේ අපිරිසිදු කය නොයෙක් කුණුපාදිය අපේක්ෂා රහිත ව ප්‍රයෝජන නැත්තකු කොට බැහැර යන්නේය. යම් සේ මළමුත්‍ර බැහැර කරන ස්ථානයෙහි සත් පුරුෂයෝ මළ පහ කොට නැවත අපේක්ෂා ප්‍රයෝජන නැත්තෝ ව යෙත් ද එමෙන් ම මම ද නොයෙක් කුණුපයෙන් පිරුණු මේ කය වැසිකිළියක වර්චස් කොට බැහැරවන්නාක් මෙන් හැර දමා යන්නෙමි. යම් සේ දිරාපත් ව පලුදු වූ දිය කාන්දු වන නැවක් නැව හිමියෝ බලාපොරොත්තු හා ආශා නැති ව අතහැර යත් ද එමෙන් මළ වැහෙන නව සිදුරක් ඇති මේ කය දිරුණු නැව අතහැර යන නැව හිමියන් සේ අතහැර යන්නෙමි. යම් සේ පුරුෂයකු වටිනා බඩු රැගෙන සොරුන් සමග යන්නේ, බඩු රැක ගනු පිණිස සොරුන් අතහැර යයි ද, එමෙන් මහා සොරකු සමාන මේ කය කුසල සිඳී යතැ යි යන බියෙන් අතහැර යමි."

,මසේ සුමේධ පණ්ඩිතයෝ නොයෙක් උපමානයින් නෙක්ඛම්ම - නික්ම යාමට සිතා තමා සතු ප්‍රමාණ කළ නො හැකි මහා සම්පත් යට කියන ලද පරිදි දුගී මඟී ආදීන්ට විසුරුවා හැර මහා දන් දී ධන ධාන්‍යාදී වස්තු කාමයන් ද රාගාදී ක්ලේෂ කාමයන් ද අතහැර අමර නුවරින් නික්මී හුදකලාව ධම්මික නම් පර්වතය ඇසුරු කොට පන්සලක් කොට සක්මන් මළුවක් ද මවා කාමච්ඡන්ද ආදී පස් නීවරණ දෝෂයෙන් වෙන් වූ **"එවං සමාහිතෙ චිත්තෙ"**, (මෙසේ සිත එකඟ වූ කල්හි) ආදී ක්‍රමයෙන් කියන ලද අභිඥා ගුණයන්ට කාරණ වූ අට වැදෑරුම් අභිඥා බලය ලබා ගැනීමට එම අසපුවෙහි බාධක නවයකින් යුත් වස්ත්‍රය හැරපියා දොළොස් ගුණාංගයන්ගෙන් යුත් වැහැරි සිවුරු හැඳ තවුස් පැවිද්දෙන් පැවිදි වූහ. මෙසේ පැවිදි වූ සුමේධ තවුසාණෝ අට දෝෂයකින් යුත් ඒ පන්සල හැර ආනිශංස දශයකින් යුත් රුක් මුල වෙත එළැඹ සියලු ධාන්‍යය වර්ග හැර ස්වයං පතිත ඵල අනුභව කරන්නේ, හිඳීම, සිටීම, සක්මන වසයෙන් ඉරියව් පවත්වමින් මහා වීර්යය කරන්නේ, සත් දවසක් ඇතුළත අට සමවත් හා පංච අභිඥා බල ලාභී වූහ. මෙසේ පතන ලද අභිඥා බල ලබා ගත්හ. එහෙයින් කියන ලදී.

> "මම මෙසේ සිතා නොයෙක් කෙළ ගණන් ධනය, ඇතිනැති අයට දන් දී හිමවතට පැමිණියෙමි. හිමවතට නුදුරින් ධම්මික නම් පර්වතයක් විය. එහි මා සඳහා අසපුවක් කරන ලද්දේය. පන්සලක් ද මවන ලද්දේය. එහි පස් දෝෂකින් තොර වූ සක්මන් මළුවක් ද මා සඳහා මවන ලද්දේය. අට ගුණයකින් යුත් දිබ්බචක්ඛු ආදී අභිඥාවන් ලබාගතිමි. දොස් නවයකින් යුත් සළුව අත්හළෙමි. දොළොස් ගුණයෙන් යුත් වැහැරි සිවුර පෙරවීමි. දෝෂ අටකින් යුත් පන්සල දුරලීමි. දශ ගුණයකින් යුත් රුක් මුල වෙත ගියෙමි. වපුළ හා පැල සිට වූ ධාන්‍යය කෑම අත්හළෙමි. නොයෙක් ගුණයෙන් යුත් ස්වයං පතිත ඵල වැළඳුයෙමි. ඒ රුක් මුල සිට හිඳීම, සිටීම, සක්මන යන ඉරියව්වලින් ප්‍රධන් වීර්යය කළෙමි. සත් දවසක් ඇතුළත පඤ්ච අභිඥාවන්ට පැමිණියෙමි."

මේ බුද්ධ වංස පාළියෙහි අසපුව, පන්සල, සක්මන තමා

විසින්ම නිර්මාණය කළාක් මෙන් කියන ලදී. එහි අදහස මෙසේ දතයුතු. බෝසතාණෝ හිමවතට වැද ධම්මික පර්වතයට පිවිසෙනු දූන සක් දෙවිඳු විස්කම් දෙව් පුත් අමතා දරුව, සුමේධ පණ්ඩිතයෝ පැවිදි වෙමි යි නික්මුණහ. ඔහුට වසන ස්ථානයක් මවන්නයැ යි කීවේය. විස්කම් දෙව් පුත් සක් දෙවිඳුගේ වචනය පිළිගෙන සිත්කළු අසපුවක් ද ආරක්‍ෂා සහිත පන්සලක් ද මනරම් සක්මන් මළුවක් ද මැවීය. බුදු රජහු එදා තම පින් බෙලෙන් නිපයුණු ඒ අසපුව සඳහා සාරිපුත්‍රය, ඒ ධම්මික පර්වතයෙහි,

"මවිසින් අසපුව මනාව කරන ලද්දෙමි. පන්සල මවන ලදී. දෝෂ පසකින් මිදුණු සක්මන් මළුව ද මවන ලදී."

එහි "සුකතො මයාං" මවිසින් මනාව කරන ලදී. "**පණ්ණසාලා** සුමාපිතා" කොළ සෙවිලි කළ ශාලාව ද මා විසින් මවන ලද්දේය. "**පඤ්චදොස විවජ්ජිතං**" සක්මන් මළුවෙහි දොස් පසක් ඇත. එනම්, තද බව හා විසම බවය. ඇතුළත ගස් ඇති බවය. කැලෑවෙන් වැසුණු බවය. ඉතා ලුහුඬු බවය. ඉතා විශාල බවය යනුයි. තද විසම සක්මනෙහි සක්මන් කරන්නාගේ පා රිදෙයි. පොළ නැගෙයි. සිතෙහි එකඟ බවක් නො ලබයි. කමටහන් සඵල නො වේ. මෘදු සමතලා සක්මනෙහි පහසු විහරණය නිසා කමටහන සඵල වෙයි. එම නිසා තද විසම භූමිය එක් දෝෂයක් වෙයි. සක්මනෙහි ඇතුළත හෝ මැද හෝ කෙළවර හෝ ගසක් ඇති කල්හි අමතක වීමෙන් නලල හෝ හිස ගසෙහි හැපීමෙන් කමටහනට බාධා ඇතිවිය හැකිය. මේ දෙවන දෝෂයයි. තණ ගස්වැල් ආදියෙන් ගැවසුණු සක්මනෙහි සක්මන් කිරීම නිසා උරග ආදී සත්තු පෑගීමෙන් මැරෙති. නැතහොත් ඒ සතුන් විසින් දෂ්ට කරන ලදුව දුකට පැමිණෙයි. මේ නිසා තෘණලතාවලින් වැසුණු බව තෙවැනි දෝෂයයි. රියනක් හෝ රියන් භාගයක් පමණ පළලින් යුත් සක්මනෙහි සක්මන් කරනහුගේ පය පැකිළීමෙන් නිය හෝ ඇඟිලි බිඳිය හැකි හෙයින් ඉතා ලුහුඬු බව සිව් වැනි දෝෂය වේ. ඉතා විශාල සක්මනෙහි සක්මන් කරන්නා ඔබමොබ දුවයි. එකඟ බවක් නො ලබයි. ඉතා විශාල බව පස් වැනි දෝෂයයි. පළලින් දෙරියන් හමාරක් හා දෙපස රියනක් පමණ වන උපචාර සක්මන ද දිගින් සැට රියනක් වූ සම පොළොව ඇති සම සේ විසුරුවන ලද වැලි ඇති සක්මන් මළුව ද සුදුසු ය. සෑගිරියෙහි ලක්බිම පැහැද වූ මහා මිහිඳු තෙරණුවන්ගේ සක්මන එබඳු විය. එම නිසා පස් දොසින් මිදුණු

සක්මනක් මැවීමයැ යි කීහ. "අට්ඨගුණ සමූපෙත" යනු අට වැදෑරුම් පැවිදි සැපයෙන් යුතු යන අර්ථය යි. අට වැදෑරුම් පැවිදි සැප නම් ධන ධාන්‍ය අයිතිය නැති බව, නිවැරදි පිඬු සිඟීමෙන් අහර සෙවීම, නිවුණු අහර වැළැඳීම, රජවරු රට වැසියන් පෙළා කහවුණු ලබා ගනිද්දී එවැනි රට වාසීන් පෙළීමේ ආශාවන් නැති බව, පරිභෝග වස්තුවල කැමැත්තත් නැති බව, සොරුන් පැහැර ගනිතැ යි බියක් නැති බව, රජ ඇමැති ආදීන් හා සබඳතාවය නැති බව, සිව් දිගින් ම නිර්බය බව යනු යි. මෙසේ බෝසතාණෝ මේ අට වැදෑරුම් පැවිදි සැප මේ අසපුවේ සිට ලැබීමට හැකියැ යි මේ අසපුව මැවීයැ යි කීහ. "අභිඤ්ඤා බලමාහරි" යනු පංච අභිඤ්ඤා ලාභී වීමයි. පසු ව මේ අසපුවේ වසන්නේ, කසිණය පිරියම් කොට පංච අභිඤ්ඤාවන් හා ධ්‍යාන සමාපත්තීන් ඉපදවීම පිණිස අනිත්‍යය, දුක්ඛ, වශයෙන් විදසුන් අරඹා ස්ථාවර භාවයට පත් ව විදසුන් බලය ලබාගතිමි. මෙම අසපුවෙහි වෙසෙමින් එකී බලය ලබාගැනීමට හැක්කෙමි යි සිතා අභිඤ්ඤා බලයට හා විපස්සනා බලයට සුදුසු වන ලෙස මැවීයැ යි, යන අර්ථයයි.

දෝෂ නවයකින් යුත් සළුව අත් හළෙමි. ඒ පිළිබඳ අනුපිළිවෙල කථාව නම්. එකල්හි තෘණ කුටි කටාරමින් යුත් ලෙන්, සක්මන ආදියට මලින් හා එලින් පිරුණු ගස් පෙළින් සැදුම්ලත් සිත්කළු මිහිරි ජලාශයෙන් යුත් දරුණු සිව්පා, බියජනක පක්ෂි ආදීන්ගෙන් තොර වූ කාය විවේකාදියට යෝග්‍යය විසිතුරු සක්මන් මළුවේ දෙකෙළවර එල්බ සිටින පුවරු, සකසා හිඳීම සඳහා සක්මන මැද සමතලා ශිලා පුවරුවක් ද මවා පන්සල ඇතුළෙහි දළ වැහැරි සිවුරු, ත්‍රිදණ්ඩය, කෙණ්ඩිය ආදී තවුස් පිරිකර මණ්ඩපයෙහි ද පැන් කල, පැන් සක්, පැන් මලාව ආදිය ද ගිනි හලෙහි අඟුරු, කබල්, දර ආදිය ද මවා, මෙසේ පැවිද්දන්ට උදව් වූ සියලු දෙය මවා පන්සල් බිත්තියෙහි යම් කිසි කෙනෙක් පැවිදි වනු කැමැත්තෝ නම් මේ තවුස් පිරිකර ගෙන පැවිදි වෙත්වා යි අකුරු සටහන් කොට විස්කම් දෙව් පුත් දෙව්ලොවට ගිය කල්හි, සුමේධ පණ්ඩිතයෝ හිමවත් පෙදෙසෙහි දිය වැල් අනුව සෙමින් තම නිවාසයට සුදුසු වූ පහසු තැනක් සොයමින් යන්නෝ, නදී නිවර්තනයෙහි සක් දෙවිඳු අණින් විස්කම් දෙව් පුත් විසින් මවන ලද රමණීය අසපුව දැක සක්මනේ කෙළවරට ගොස් පිය සටහනක් නො දැක ඒකාන්තයෙන් පැවිද්දෝ ළඟ ගමෙහි පිඬුසිඟා ගොස් විඩාව නිසා පන්සල ඇතුළෙහි සිටිතැ යි සිතා ටික වේලාවක් අපේක්ෂාවෙන්

සිට බොහෝ වේලා ගත වෙතැ යි දැන කුටි දොර හැර ඇතුළට පිවිස ඔබමොබ බලන්නාහු, ප්‍රධාන බිත්තියෙහි අකුරු කියවා මේ මට කැප පිරිකරය, මේවා ගෙන පැවිදි වන්නෙමි යි තමා ඇඳ පොරවා සිටි වස්ත්‍ර යුගලය අත්හළේය. එහෙයින් කීහ.

"එහි දී සාටකය හළෙමි. සාරිපුත්‍රය, පන්සලට පිවිසි මම නව දෝෂයක් ඇති සළුව අත්හළෙමි යි දක්වන්නේ, තවුස් පැවිද්දෙන් පැවිදි වූවන්ට සළුවෙහි දෝෂ නවයක් පෙනේ. වටිනා බව එක් දෝෂයකි. මෙරමා සම්බන්ධ ව ලැබෙන බව එකකි. පරිභෝගයෙන් ඉක්මනින් කිළිටි වන බව එකකි. කිළිටි වූ පසු සේදිය යුතු, පඬු පෙවිය යුතු වෙයි. පරිභෝගයෙන් දිරාපත් වන බව එකකි. දිරා ඉරුණු පසු මැසීම හෝ අණ්ඩ දැමීම කළ යුතු බව එකකි. නැවත සොයා ගැනීම අපහසු බව එකකි. තවුස් පැවිද්දාට නො සරුප් බව එකකි. සතුරන්ට සාධාරණ බව එකකි. සතුරන්ට නො ගත හැකි සේ ආරක්ෂා කළ යුතු වෙයි. සිරුරට ආභරණයක් වීම එකකි. උරහිසින් ගෙනයන කළ අධික බර බව එකකි. සාරිපුත්‍රය, එදා මම මේ නව දොස් දැක සළුව හැර වැහැරි සිවුර ඇන්දෙමි. මෘදු තණඉරු ඉරු කොට ගොතා කරන ලද වැහැරි සිවුර ඇඳීම හා පෙරවීම සඳහා ගත්තේය."

වාක චීවරය දොළොස් ගුණයකින් යුක්තයැ යි, වාක චීවරයෙහි ආනිශංස දොළසක් වේ. මිල අඩු බව, සුන්දර බව, කැප බව එක් ආනිසංසයකි. සිය අතින් කළ හැකි බව එකකි. පරිභෝගයේ දී සෙමින් කිළිටි වෙයි. සෝදන කල්හි ද ප්‍රමාදයක් නැත. මේ තෙවැන්නයි. පරිභෝගයේ දී දිරාගිය ද නො මැසිය යුතු බව සිව් වැන්න වේ. නැවත සෙවීමේ දී පහසුවෙන් කළ හැකි බව පස් වැන්නයි. තවුස් පැවිද්දාට සාරුප්‍යය බව සවැනි වේ. සතුරන්ට සුදුසු නො වන බව සත් වැන්නයි. පරිභෝගයේ දී ආභරණයක් නො වීම අට වැනි වේ. දැරීමේ දී සැහැල්ලු බව නව වැනි වේ. සිවුරු පසෙහි අපිස් බව දස වැනි වේ. වැහැරි ලබා ගැනීමේ දී දැහැමි බව නිවැරදි බව එකොළොස් වැනි වේ. වැහැරි සිවුර නැසී ගිය ද ආශාවක් නැති බව දොළොස් වැන්නයි. දෝෂ අටකින් යුත් පන්සල හළෙමි. සුමේධ පණ්ඩිතයෝ කෙසේ නම් එය අත්හළේ ද ? ඔහු වනාහි වටිනා සළු

යුවල මුණි වැලෙහි එල්බෙමින් තිබුණු කොටකරඬු මල් දමක් මෙන් රතු වූ වැහැරි සිවුර ගෙන හැඳ ඊමත්තෙහි රන්වන් වැහැරි සිවුරක් පොරවා දොඹ මල් ඇතිරියක් වැනි කුර සහිත අඳුන් මුව සම ඒකාංශ කොට ජටා මඬුල්ල මුදා කෙස් වැටිය සමග නිසල බව සඳහා හරහිද්ද ගසා මුතුලැල් සමග සාල්ලෙහි පබළුවන් කෙණ්ඩිය බහා තෙතැනකින් නැමුණු කද ගෙන කදෙහි එක් කොණක කෙණ්ඩිය ද අංකුශ පැස හා ත්‍රිදණ්ඩාදිය ද එල්ලා කද් බර දෙසරුවෙහි තබා දකුණු අතින් සැරයටිය ගෙන පන්සලින් නික්ම සැටරියන් මහා සක්මනෙහි ඔබමොබ සක්මන් කරමින් තමාගේ පැවිදි වේශය බලා මගේ මනදොළ සඵලය. මගේ පැවිද්ද ඉතාමත් පැහැපත්ය. මේ පැවිද්ද වනාහි බුද්ධාදී සියලු උතුමන් විසින් පසස්නා ලදය. මගේ ගිහි බන්ධන සිඳිණි. අභිනික්මන කළෙමි. මවිසින් උතුම් පැවිද්ද ලබන ලදී. මහණ දම් පුරුමි. මඟ ඵල ලබමි. මෙසේ උත්සාහවත් ම කද් බර බහාතබා සක්මන මැද ගල්තලාවෙහි රන් පිළිමයක් මෙන් හිඳ දවස් භාගය ගත කොට සවස් කාලයෙහි පන්සලට පිවිස වේවැල් ඇඳෙහි දූව අතිරියෙහි වැතිරී ශරීර විඩා හැර ඉතා අළුයම් වේලෙහි පිබිද තමාගේ ගමන සිහි කළහ. මම ගිහි ගෙහි ආදීනව දැක ප්‍රමාණ කළ නො හැකි ධනය හා යසස අත්හැර වනයට පිවිස නිවන් මඟ සොයන්නෙක් වී පැවිදි වූවෙමි. මෙතැන් පටන් ප්‍රමාද විහාරීව හැසිරෙන්ට සුදුසු නො වේ. කාය චිත්ත විවේකය හැර වසන්නහුගේ කාමාදී සිතුවිලි මැස්සෝ කා දමත්. දැන් මා ත්‍රිවිධ විවේකයන් වර්ධනය කරන්නට සුදුසුය. මම වනාහි ගිහි ගෙය බාධක වශයෙන් දූන එයින් නික්මුනෙමි. මේ පන්සල ද බෙලි ඵල වණින් පිරියම් කරන ලද්දේ ය. රිදී මෙන් බිත්ති සුදුය. කොළ සෙවිලි කළ පියැස්ස පරෙවි පිය වර්ණ ඇත්තේය. වේවැල් ඇතිරුම විසිතුරු ඇතිරියක පැහැය ගනී. නිවාස ස්ථාන සැප පහසු ඇත්තේ ය. මගේ ගිහි සැපතටත් වඩා මේ වැඩියැ යි හැඟේ. මෙසේ පන්සලෙහි දොස් දකින්නාහු, දෝෂ අටක් දුටහ. මහත් උත්සාහයෙන් දූව ආදී ද්‍රව්‍ය රාශියක් සෙවිය යුතු බව එකකි. තණ කොළ, මැටි ආදිය වැටුණු පසු නැවත නැවත ප්‍රතිසංස්කරණය කළ යුතු බව එකකි. සෙනසුන් වනාහි වැඩිමහල්ලන්ට ලැබිය යුතුය. අවේලාවන්හි නැඟිටු වන කල්හි සිතේ එකඟ බවක් නැති වෙයි. මෙසේ නො කල්හි නැඟිටිය යුතු බව එකකි. ශීතෝෂ්ණ වැළකීම නිසා සිරුරෙහි ඇති වන සුකුමාල බව එකකි. ගෙය තුළ සිටින්නාට දොස් සහිත දෙය කිරීමට පහසුය. මෙසේ වරද සැඟවිය හැකි බව පස් වැනි දෝෂයයි. මමත්වයෙන්

අල්ලා ගැනීම සවැනි වරදයි. ගෙයක හිමි බව දෙවැන්නකු සමග විසීමකි. මේ සත් වැනි දෝෂයයි. උකුණ, මකුණ, හිකනළු ආදීන්ව දැක මහසත් පන්සල අත්හැර දැමීය. එම නිසා කීහ.

"දෝෂ අටකින් යුත් පන්සල හළෙමි. ආනිශංස දශයකින් යුත් රුක් මුල වෙත ගියෙමි."

දශ ගුණයෙහි, සුළු ඇරඹුමක් පමණක් ඇති බව එකකි. (රුක් මුල වෙත පැමිණීම පමණකි.) සම වුව ද නො සම වුව ද පරිභෝගයට නුසුදුසුය. මේ නිසා පිළිදැගුම් අඩුය. මේ දෙවැනි ආනිශංසයයි. අනුන් විසින් නැඟිට විය නො හැකි බව තෙවැන්නයි. තම වරද නො සැඟවිය හැකි බව සිව් වැන්නයි. රුක් මුල දී එළිමහනේ දී මෙන් කය රූක්ෂ නො වෙයි. මේ පස් වැනි ගුණයයි. මමත්වයෙන් අල්ලා නො ගන්නා බව සවැනි ගුණයයි. ගෙවල් පිළිබඳ ආලය අත්හැරීම සත් වැනි ගුණයයි. බොහෝ දෙනෙකුට සාධාරණ වූ ගෘහයෙහි මෙන් ප්‍රතිසංස්කරණ සඳහා නික්මෙව යි, බැහැර කිරීමක් නැති බව අට වැනි ආනිශංසයයි. රුක් මුල වඩන්නාට ප්‍රීති සහිත ව විසිය හැකි බව නව වැනියි. රුක් මුල් සෙනසුන් ගිය ගිය තැන සුළඟ බැවින් එක රුක් මුලක් ගැන අපේක්ෂාවක් නැති බව දශ වැනි ආනිශංසයයි. මේ දශ ආනිශංස දැක රුක් මුලට ගියේය.

බෝසත්හු මේ සියලු කරුණු සලකා බලා දෙවැනි දවස්හි පිඬු සිඟනු පිණිස පිවිසියහ. ගම් වැසියෝ මහත් ගෞරවයෙන් භික්ෂාව දුන්හ. එතුමෝ භක්තිය සම කොට අසපුවට පැමිණ විවේකීව හිඳ මෙසේ සිතූහ. මම ආහාර ලැබීම සඳහා පැවිදි නො වීමි. මේ ප්‍රණීත ආහාර මානය හා පුරුෂ මද වඩවයි. ආහාරය මුල් කොට ඇති වන දුක්වල ද කෙළවරක් නැත. මම සියලු ම වපුල ධාන්‍යය හා පැල සිට වූ ධාන්‍යයෙන් නිපයූ ආහාර අත්හැර ස්වයං පතිත ඵල අනුභවයෙන් ජීවත්වන්නේ නම් මැනවි යි, එතුමෝ එතැන් පටන් එසේ ජීවත් වෙමින් ප්‍රධන් වීර්යය කරන්නාහු, සත් දවසක් ඇතුළත ධ්‍යාන අට සමාපත්ති හා පඤ්ච අභිඤ්ඤා ඉපදවූහ.

එහෙයින් කීහ,

"වපුල හෝ සිට වූ සියලු ධාන්‍යය සම්පූර්ණයෙන් අත්හළෙමි. විවිධ ආනිශංසයෙන් යුත් ස්වයං පතිත ඵල ආහාර පිණිස ගතිමි. එහි දී ඉඳීම, සිටීම, සක්මන් කිරීම යන ඉරියව්වලින් ප්‍රධන් වීර්යය කෙළෙමි. සත් දවසක් ඇතුළත ම ධ්‍යාන හා අභිඤ්ඤා බලය ලබා ගතිමි."

සුමේධ තාපසයෝ මෙසේ ධ්‍යාන, අභිඤ්ඤා බල ලබාගෙන සමවත් සුවෙන් කල්ගත කරන කල්හි දීපංකර බුදු රජාණෝ ලොව පහළ වූහ. ඒ බුදු රජුන්ගේ පිළිසිඳ ගැනීම, ඉපදීම, බුදු බවට පත්වීම, දම්සක් පැවැත්වීම යන අවස්ථාවල දී සියලු දසදහසක් සක්වල කම්පා විය. වෙවුලීය. මහ හඬින් ශබ්ද නැඟීය. එසේ ම දෙතිස් පෙර නිමිති පහළ විය. එහෙත් සුමේධ තවුසාණන් සමවත් සුවෙන් සිටි හෙයින් ඒ ශබ්ද නො ඇසූහ. ඒ පෙර නිමිති ද නුදුටුහ.

එහෙයින් කීහ,

"තවුස් සස්නෙහි මා ධ්‍යාන බලයෙන් හා පඤ්චාභිඤ්ඤා බලයෙන් යුක්ත ව සිටින කල්හි තුන් ලොව නායක වූ දීපංකර බුදු රජාණෝ පහළ වූහ. උන් වහන්සේ පිළිසිඳ ගන්නා කල්හි ද උපදින කල්හි ද බුදු බවට පත්වන කල්හි ද දම්සක් පවත්වන කල්හි ද යන සිවු නිමිතියෙහි දී ධ්‍යානයෙහි ඇලී සිටි මම නුදුටු වෙමි."

ඒ කාලයෙහි දශ බලධාරී දීපංකර බුදුහු සාරලක්‍ෂයක් රහතුන් පිරිවරන ලදුව පිළිවෙලින් චාරිකාවෙහි වඩින්නාහු, රම්මක නම් නුවරට වැඩ සුදස්සන මහා වෙහෙරෙහි වැඩවසන්නාහ. මෙම නගර වාසීහු ශ්‍රමණ නායක දීපංකර බුදු රජහු උතුම් බුදු බවට පත්ව දම්සක් පවත්වා පිළිවෙලින් චාරිකාවෙහි හැසිරෙන්නාහු, මෙම නගරයට වැඩමවා සුදස්සන මහා වෙහෙරෙහි වැඩ වෙසෙති යි අසා ගිතෙල්, වෙඬරු ආදිය ද බෙහෙත් ද හඳනා, පොරෝනා වස්ත්‍රාදිය ද රැගෙන සුවඳ මල් ආදිය අතැතිව බුදුන්, දහම්, සඟුන් වැඩසිටි දිශාවට නැඹුරුව ළං ළං වෙත් ම වඩවඩාත් ගෞරව නමස්කාර කැරමින්

බුදු රජුන් වෙත එළැඹ වැඳ සුවඳ මල් ආදියෙන් පුදා එකත්පසෙව හිඳ දම් දෙසුම් අසා සෙට දවසට භික්‍ෂාව පිණිස ආරාධනා කොට හුනස්නෙන් නැගී ගියාහුය. ඒ ගම් වැසියෝ දෙවැනි දවස්හි මහා දානයක් පිළියෙළ කොට නගරය අලංකාර කොට බුදු රජුන් වඩිනා මඟ සරසමින් දිය දහරින් බිඳී ගිය තැන් පස් ගෙනවුත් පුරවමින් බිම සමතලා කොට රිදී පට වැනි වැලි විසුරුවමින් විළඳ හා මල් දමත්. නන් විසිතුරු වර්ණයෙන් කළ කොඩි ඔසවත්. කෙසෙල් පුන් කලස් පෙළ තබත්. එවේලෙහි සුමේධ තාපසයෝ සිය අසපුවෙන් අහසට නැගී ඒ මිනිසුන්ගේ උඩින් යන්නාහු, ඉතා ප්‍රීතියෙන් සිටි ඔවුන් දැක හේතුව කුමක්ද යි දැනගනු පිණිස අහසින් බැස පසෙක සිට මෙසේ විචාළහ. පින්වතුනි, කවරකු සඳහා ඔබ මේ මඟ සරසන්නහු ද ? එහෙයින් කීහ.

> "පිටිසර ගම් වැසියෝ දීපංකර බුදු රජුන්ට ආරාධනා කොට සතුටු සිතින් එතුමාණන් වඩනා මඟ පිරි පිවිතුරු කරත්. මම එවේලෙහි සිය අසපුවෙන් නික්ම, වැහැරි සිවුරු සුළඟින් ලෙල දෙද්දී අහසින් යමින් සිටියෙමි. එකෙණෙහි සැදැහැයෙන් තුටුපහටු ව ප්‍රීති ඝෝෂා කැරමින් සිටි ජනයා දැක අහසින් බැස මම මිනිසුන්ගෙන් විචාළෙමි. තුටුපහටු ප්‍රීතිමත් බැති බර මහජනයා විසින් කවරකු හට මාගී පරියාය නම් වූ අඤ්ජස වටුමායන මාර්ගය පිරිසිදු කරනු ලැබේ ද ?"

මිනිස්සු මෙසේ පිළිතුරු දුන්හ. සුමේධ හිමිපාණෙනි, දීපංකර බුදු රජාණෝ බුද්ධත්වයට පැමිණ උතුම් දම්සක් පවත්වා චාරිකාවෙහි හැසිරෙන්නාහු, අපගේ නුවරට පැමිණ වැඩමවා සුදස්සන මහා වෙහෙරෙහි වැඩ වෙසෙන බව ඔබ නො දන්නහු ද ? අපි ඒ බුදු රජුන්ට දානය සඳහා ආරාධනා කෙළෙමු. දැන් අපි ඒ බුදු රජුන්ට මඟ සරසමු. සුමේධ තවුසාණෝ සිතූහ. බුද්ධ යන වචනය පවා ලොව ඉතා දුලභය. එතුමාණන්ගේ පහළ වීම ගැන කියනු කිමක් ද ? මා ද මේ මිනිසුන් සමග වඩිනා මඟ සරසන්න වටිනේය. පින්වතුනි, ඉදින් ඔබ මේ මඟ බුදු රජාණන්ට සරසන්නාහු නම්, මට ද එක් මාර්ග කොටසක් දෙනු මැනව. මම ද ඔබ හා එක්ව මඟ සරසමි යි කීහ. ජනයා ද සතුටින් පිළිගෙන, සුමේධ තවුසා මහා ඍද්ධිමතකු බව දත් ජනයා ජලයෙන් කැඩී බිඳී ගිය මඩ වගුරක්

තවුසාණන්ට දුන්හ. එතුමා බුද්ධාලම්භන ප්‍රීතියෙන් මෙසේ සිතී. මම මේ මඟ කොටස ඉඳු බලයෙන් බිම කැපීමට පොහොසත් වෙමි. එසේ කිරීමෙන් සතුටු විය නො හැකිය. අද මම කය වෙහෙසා වතාවතක් කිරීම සුදුසුයැ යි පස් ගෙනවුත් එපෙදෙස පුරවමින් සිටියහ. එහෙත් අවසන් වීමට පෙර දශ බලධාරී දීපංකර බුදු රජාණෝ මහානුභාසම්පන්න අභිඤ්ඤා ලාභී සාරලක්‍ෂයක් මහා රහතුන් වහන්සේ පිරිවරන ලදුව, දෙවියන් දෙව් මල් සුවඳින් පුදද්දී නිම්නැති බුදු සිරියෙන්, රත්ගල් තලාවක සීහනාද දෙන සිංහයකු මෙන් ඒ සැදුම් ලද මඟට පිළිපන්හ. සුමේධ තව්සාණෝ ඇස් ඇර විසිතුරු කළ මඟින් වඩින්නා වූ දීපංකර බුදු රජුන්ගේ දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණයෙන් අලංකෘත වූ අසූ අනුව්‍යඤ්ජනයෙන් සැදුම් ලත් බඹයක් පමණ වූ ද ඇස් දහරින් වට වූ නිල්වන් අහසෙහි විදුලිය මෙන් ද අක්බඹරු වූ ද යුගල වී නික්මෙන්නා වූ ද සවණක් බුදු රැස් විහිදුවමින් රූසපුවෙන් අගතැන්පත් බුදු සිරුර බලා මවිසින් අද බුදු රජුන්ට දිවි පිදිය යුතුයැ යි සිතා බුදු රජාණෝ මඩ නො පාගා, මිනී හෙයක් බඳු මගේ පිට මඩිමින් වඩිත්වා. ඒ මට බොහෝ කලක් හිත සුව පිණිස වන්නේයැ යි කෙස් කළඹ මුදා අඳුන් දිවි සම හා ජටා වැහැරි සිවුරු ආදිය කලුවන් කලලයෙහි අතුරා මිනී හෙයක් මෙන් කලල මත වැද හොත්හ.

එහෙයින් කීහ.

> "මවිසින් විචාරන ලද ඒ ජනයෝ මෙසේ ප්‍රකාශ කළහ. ලෝකයෙහි අති උතුම් ලොවට නායක දීපංකර බුදු රජාණෝ උපන්හ. උන් වහන්සේට අඤ්ජස වටුමායන යන පරියාය නම් ඇති මාර්ගය සරසමු. බුද්ධ යන වචනය අසත් ම මට මහත් ප්‍රීතියක් උපන. බුද්ධ යන වචනය නැවත නැවතත් කියමින් මගේ සතුට පළ කෙළෙමි. මම එහි සිට සතුටින් පිනාගිය සිත් ඇති ව මෙසේ සිතීමි. මම මේ මේ සසුන් කෙතෙහි සැදූහැ බිජුවට රෝපණය කරමි. මේ ක්‍ෂණය ඉක්මවා නො යාවා, ඉදින් ඔබ බුදු රජුන් සඳහා මඟ සරසන්නහු නම්, මට එක් මඟ කොටසක් දෙත්වා. මම ද මඟ සරසන්නෙමි යි කීය. ඔහු ද මට කොටසක් සැරසීම

> සඳහා දුන්නේය. බුද්ධ යනුවෙන් සිතමින් මම එදා මඟ සරසමින් සිටියෙමි. දීපංකර මහා මුනීහු සවැදෑරුම් අභිඥාඥා ගුණ ලාභී තෙදවත් නිර්මල සාරලක්ෂයක් මහා රහතුන් සමග මඟට පිළිපන්හ. පෙරගමන් පවතිත්. බොහෝ බෙර වාදනය කරත්. සතුටු වූ දෙව් මිනිස්සු සාධු හඬ පැවැත්වූහ. දෙවියෝ මිනිසුන් දකිත්. මිනිස්සු ද දෙවියන් දකිත්. දෙපිරිස ම බඳැදිලි ව බුදු රජුන් අනුව යෙත්. අහසෙහි සිටි දෙවියෝ දිව, මදාරා මල්, පියුම් හා පරසතු මල් ඒ මේ අත විසුරුවත්. බිම සිටි මිනිස්සු සපු, සල්ල, බක්මී, නා, දොඹ මල් ඒ ඒ දිසාවෙහි සිට උඩට දමත්. මම කෙස් වැටිය මුදා වැහැරි සිවුර සහ සම් කඩ කලල මතුයෙහි අතුරා එහි යටිකුරු ව හෙවීමි. බුදු රජාණෝ සිසුන් සමග මා මැඩගෙන වඩිත්වා. කලල නො මඩිත්වා. ඒ බොහෝ කලත් හිත පිණිස වන්නේය."

සුමේධ තවුසාණෝ කලල මත වැතිර සිටිමින් ම ඇස් හැර දීපංකර බුදු රජුන්ගේ සම්බුදු සිරිය බලමින් මෙසේ සිතූහ. ඉදින් මම කැමැති වන්නේ නම් සියලු කෙළෙස් නසා රහත් බවට පත් ව සඟ පිටියේ නවකයකු වී රම්ම නරගයට පිවිසෙන්නෙමි. එසේ අප්‍රසිද්ධ වෙසින් කෙළෙසුන් නසා නිවනට පැමිණීම ප්‍රමාණවත් නො වේ. දීපංකර බුදු රජුන් මෙන් උතුම් සම්මා සම්බුදු බවට පැමිණ මහා ජනයා දහම් නැවට නංවා සංසාර සාගරයෙන් එතැර කොට පසු ව පිරිනිවෙන්නේ නම් මට සුදුසු වන්නේය. ඉක්බිති, අෂ්ට ධර්මයන් සම්පූර්ණ කොට බුදු බව පිණිස ප්‍රාර්ථනා කොට වැඳහොත්හ.

එහෙයින් කියන ලදී.

> "පොළොවෙහි සැතපී සිටි මහිතට මෙබඳු අදහසක් විය. මම කැමැති වන්නේ නම් අද සියලු කෙළෙස් නසා රහත් වන්නෙමි. එසේ අප්‍රසිද්ධ වේෂයෙන් නිවන අවබෝධ කිරීමෙන් ප්‍රයෝජනය කුමක් ද ? දෙවියන් සහිත ලෝතලයෙහි සියල්ල දන්නා නුවණට පැමිණ බුදු වන්නෙමි. තම ශක්තිය දන්නා පුරුෂයකු වශයෙන්

එකලාව සසර එතැර කිරීමෙන් කවර ප්‍රයෝජනයක් ද? සර්වඥ බවට පැමිණ දෙවියන් සහිත ලෝකයා එතැර කරන්නෙමි. පුරුෂ ශ්‍රේෂ්ඨ බුදු රජුන් විෂයයෙහි කරන ලද මේ විශේෂ කාර්යය හෙවත් ජීවිත පරිත්‍යාගයෙන් සියල්ල දත්බවට පැමිණෙමි. බොහෝ ජනයා සසරින් එතැර කරමි. සසර නැමැති සැඩ පහර සිඳ දමා කාම, රූප, අරූප තුන් භවය වනසා දමා දහම් නැවට නැඟ දෙවියන් සහිත ලෝකයා එතැර කරමි."

බුදු බව පතන්නාහු, අෂ්ට ධර්මයකින් යුක්ත විය යුතුය. එනම් මිනිසත් බව, ලිඞ්ග සම්පත්තිය හේතු සම්පන්න වීම, බුදු කෙනකු හමුවීම, පැවිදි වීම, අධිමානසික ගුණයෙන් යුක්ත වීම, ජීවිත පරිහරණය, කැමැත්ත හා සම්බන්ධ වීර්යය යන මේ අටඟින් යුක්ත වූවහුගේ ප්‍රාර්ථනය සඵල වේ.

මිනිසත් භවයෙහි සිට බුදු බව පතන්නහුගේ ම ප්‍රාර්ථනාව සඵල වේ. නාගයකු, ගුරුළකු, දෙවියකු විසින් කරනු ලබන බුදු බව ප්‍රාර්ථනාව සඵල නො වේ. මිනිසත් භවෙහි ද පුරුෂයකු කරන ප්‍රාර්ථනාව ම සඵල වේ. ස්ත්‍රිය, පණ්ඩක, නපුංසක, උභතෝ ව්‍යාඤ්ජනකයන් කරන බුදු බව ප්‍රාර්ථනා සඵල නො වේ. පුරුෂයා වුව ද එම අත් බැව්හි රහත් බවට හේතු සම්පත් ඇත්තහුගේ ප්‍රාර්ථනාව ම සඵල වේ. එයින් අන් අයකුගේ ප්‍රාර්ථනාව සඵල නො වේ. රහත් වීමට හේතු සම්පත් ඇත්තා වූ ද ජීවමාන බුදු රජාණන් වහන්සේගේ සමීපයෙහි ප්‍රාර්ථනා කරන්නහු හට සඵල වේ. බුදු රජුන් පිරිනිවි කල්හි චෛත්‍යය, බෝධි මූල ළඟ ප්‍රාර්ථනා කරන්නා හට සඵල නො වේ. බුදු රජුන් සමීපයෙහි බුදු බව පැතුව ද පැවිදි වේශයෙන් සිටියහුට ම සඵල වේ. ගිහි වේශයෙන් සිටියහුගේ ප්‍රාර්ථනා සඵල නො වේ. පැවිද්දකු වුව ද පඤ්ච අභිඥා, අෂ්ට සමාපත්ති ලාභියකු ම විය යුතුය. ධ්‍යාන ගුණයෙන් වියුක්ත වූවහුගේ ප්‍රාර්ථනා සඵල නො වේ. ධ්‍යාන ගුණයෙන් යුක්ත වුව ද සිය ජීවිතය බුදු රජුන්ට පරිත්‍යාග කළ කෙනකු හෙවත් අධිකාරය විශේෂ පරිත්‍යාග කළ අයකු විය යුතුය. මේ අධිකාරය කළහුගේ ම ප්‍රාර්ථනා සඵල වේ. ජීවිත පරිත්‍යාගය කළ ද බුද්ධ කාරක ධර්ම හෙවත් පෙරුම් දම් පිරීම සඳහා මහත් කැමැත්තක්, මහත් උත්සාහයක්, මහත් පරිශ්‍රමයක්, මහත් ගවේෂණයක් ඇත්තා හට ම ප්‍රාර්ථනා

සමෘද්ධිය වේ. මේ කරුණෙහිලා ඡන්ද අභිලාෂ මහත් බවට උපමාවකි. බුදු බව පතන්නා හට මෙබඳු සිතක් තිබිය යුතුය. සම්පූර්ණ සක්වල ගැබ එක ම ජලාශයක් වුවත් තම බාහු බලයෙන් පිහිනා එතැරට යන්නට යමකු සමත් වේ ද, ඔහු බුදු බවට පත් වේ. මුළු සක්වල ගැබ එක ම උණ පඳුරක් වූයේ නම් යමකු උණ ගස් මැඩගෙන දෙපසට කොට පාගමනින් එතැරට පැමිණේ ද, ඔහු ම බුදු බවට පත් වේ. සියලු සක්වල ගැබ තුළ අඬයටි හෙවත් උල් ආයුධ අතරත් නැති සේ සිටුවා තිබේ ද, යමකු ඒ අඬයටි තල දෙපසින් මඩිමින් එතැරට යන්නට සමත් වේ ද, ඔහු බුදු වීමට සමත්ය. එසේ ම මුළු සක්වල ගිනිදැල් රහිත ගිනි අඟුරු පිරුණේ වේ ද, යමකු එම ගිනි අඟුරු දෙපසින් මඩිමින් එතැරට යන්නට සමත් වේ ද, ඔහු ම බුදු බව ලැබීමට සමත්ය. යමෙක් මේ උපමාවලින් දක්වූ එකක්වත් දුෂ්කර වශයෙන් නො සිතයි ද, මම මේවා තරණය කොට පරතෙරට යමි යි මහත් කැමැත්තකින් උත්සාහය කරත්. මහත් පරිශ්‍රමයකින් යුක්ත වෙත්. ඔහුගේ ප්‍රාර්ථනාව ම සඵල වේ. සුමේධ තවුසාණෝ මේ අෂ්ට ධර්මයන් සම්පූර්ණ කොට බුදු බව පිණිස ප්‍රාර්ථනා පිහිටුවා කලල මත හොත්හ.

දීපංකර බුදු රජාණෝ ද එහි වැඩ තවුසාණන්ගේ හිස ළඟ වැඩසිට මැණික්මය සිහිමැදුරක් විවෘත කරන්නාක් මෙන් පස් පැහැයෙන් පැහැවත් ඇස් යුවල හැර කලල මතුයෙහි වැදහොත් තාපසයන් දැක මේ තවුසා බුදු බව ප්‍රාර්ථනා කොට හොවී. මොහුගේ ප්‍රාර්ථනාව සඵල වේදෝ නො වේදෝ යි අනාගතය දැනගන්නා නුවණින් බලන සේක්, මෙයින් සාර අසංඛ්‍ය කල්ප ලක්ෂයක් ඉක්ම ගිය පසු ගෞතම නමින් බුදු වන්නේයැ යි දැන වැඩසිටි පියවරෙහි ම පිරිස් මැද වදාළ සේක. උතුම් තපෝ ගුණයෙන් යුත් කලලයෙහි වැතිරී සිටින මේ තවුසා ඔබ දකින්නහු ද ? ස්වාමීනි, එසේ ය. මොහු බුදු බව පතා සිටියි. මොහුගේ ප්‍රාර්ථනාව සඵල වන්නේය. සාර අසංඛ්‍ය කල්ප ලක්ෂයක් මතුයෙහි ගෝතම නමින් බුදු වන්නේය. එම අත්බැව්හි කපිලවත්පු නම් නගරය නිවාස වන්නේය. මායා දේවිය මව වන්නීය. සුද්ධෝදන මහා රජතුමා පියාය. අගසව් වනුයේ උපතිස්සය. දෙවැනි සව් කෝලිතය. බුද්ධ උපස්ථායක ආනන්දය. අග්‍ර ශ්‍රාවිකාව ඛේමා වන්නීය. දෙවැනි ශ්‍රාවිකාව උප්පලවණ්ණාය. මේ තාපස තෙම නුවණ මුහුකුරා යත් ම මහබිනික්මන කොට ප්‍රධන් වීර්යය කොට නුග රුක් මුල කිරි බත් පිළිගෙන නේරඤ්ජනා ගං

තෙරදී වළඳා ඇසතු රුක් මුල බෝමළුවට වැඩ බුද්ධත්වය අවබෝධ කරන්නේය. එහෙයින් කීහ.

> "සියලු ලෝකයන් තත්ත්වාකාරයෙන් අවබෝධ කළ දක්ෂිණා පිළිගැනීමට සුදුසු දීපංකර බුදු රජාණෝ මගේ හිස්දොර සිට මේ වචන වදාළහ. ජටා මඬුළු දරණ තපෝ ගුණයෙන් තෙදවත් වූ මේ තවුසා බලව්. ප්‍රමාණ කළ නො හැකි කල්ප ඉක්ම ගිය කල්හි ලෝකයෙහි බුදු බවට පත් වන්නේය. කපිල නම් නුවර මොහුට නිවාස වන්නේය. එයින් නික්මුණු ගෞතම බුදු රජහු ප්‍රධන් වීර්යය කොට දුෂ්කර ක්‍රියා කොට ඒ බුදු රජහු අජපාල රුක් මුල්හි වැඩහිඳ පිළියෙල කළ උතුම් මඟින් බෝමැඩ වෙත පැමිණෙත්. මහා යසස් ඇති ගෞතම බුදු රජහු ඇසතු ගස මුල පැදකුණු කොට බෝ මැඩ දී බුදු වන්නේය. මොහුගේ ජනිත (වැදූ) මව මායා නම් වන්නීය. පියා සුද්ධෝදන නමි. මේ තෙම ගෝතම නම් වන්නේය. ආශ්‍රව ධර්ම දුරු කළ, රාගය දුරු කළ, එකඟ සන්සුන් සිත ඇති උපතිස්ස, කෝලිත දෙදෙන අග්‍ර ශ්‍රාවකයෝ වන්නාහ. ආනන්ද නම් උපස්ථායකයා බුදු රජුන්ට උවටැන් කරන්නේය. ඛේමා, උප්පවණ්ණා දෙදෙනා අග්‍ර ශ්‍රාවිකාවෝ වන්නාහ. ඒ බුදු රජුන්ගේ බෝධි වෘක්ෂය ඇසතුයැ යි කියනු ලැබේ."

සුමේධ තවුස් තෙම, උසස් ප්‍රාර්ථනාව සමෘද්ධි වන්නේයැ යි මහත් සොම්නසට පැමිණියේය. මහා ජනයා දීපංකර බුදු රජුන්ගේ විවරණය අසා සුමේධ තවුසාත් බුදු බිජුවටක් - බුදු පැළයක් වෙතැ යි සතුටු විය. ඔවුන්ට මෙසේ ද සිතිනි. යම් සේ පුරුෂයකු ගඟක් තරණය කරන විට ළඟ ම පිහිටි තොටින් එතැරවන්ට නො හැකි වූ විට පහළ පිහිටි තොටින් එතර වේ ද, එමෙන් අපි ද දීපංකර බුදු රජුන්ගේ සසුනෙහි මඟඵල නො ලබන්නෝ නම් අනාගතයෙහි යම් දවසක ඔබ බුදු වන්නහු ද, එදවස ඔබගේ හමුවෙහි මඟඵල ලබන්න සමත් වෙමු යි ප්‍රාර්ථනා කළහ. දීපංකර බුදු රජහු ද බෝසතුන්ට ප්‍රශංසා කොට මල් අට මිටකින් පූජා කොට පැදකුණු කොට වැඩියහ. ඒ සිව් සුවහසක් රහත්හු ද ගඳ මල් ආදියෙන් පූජා

කොට පැදකුණු කොට වැඩියහ. දෙව් මිනිස්සු ද පූජා කොට වැඳ ගියහ. බෝධි සත්ත්වයෝ සියල්ලෝ ම නික්ම ගිය කල්හි සයනයෙන් නැඟිට පාරමී ධර්ම සම්මර්ශනය සඳහා මල්රැස මතුයෙහි පර්යංකයෙන් වැඩසිටියහ. එකල්හි දශදහසක් සක්වල දෙවියෝ සාධු නාද පවත්වමින් උතුමාණන් - සුමේධ තාපසතුමන් පෙර බෝසත්වරු පාරමී ධර්ම විමර්ශනය සඳහා පර්යංකයෙන් වැඩසිටි කල්හි යම් පූර්ව නිමිති පහළ වී ද අදත් ඒ සියල්ල පහළ විය. නිසැකයෙන් ම ඔබ බුදු වන්නාහ. යමකු සඳහා මේ පෙර නිමිති පහළ වී ද එතුමණන් ඒකාන්තයෙන් බුදු වන බව අපි දනිමු. ඔබ වීර්යය දැඩි කරනු මැනවි යි, බෝසතුන්ට නන් අයුරින් ස්තුති කෘතඥතා කළහ.

එහෙයින් කියන ලදී.

"දසදහසක් සක්වල දෙරමිනිස්සු අසම වූ දීපංකර බුදු රජුන්ගේ මේ විවරණය අසා මේ බුද්ධාංකුරයකැ යි සතුටු වූවාහු, මහා ශබ්ද පවත්වත්. අත්පොළසන් නාද පවත්වත්. ප්‍රීති නාද පවත්වත්. බඳැදිළි ව නමස්කාර කරත්. මේ දීපංකර බුදු රජුන්ගේ ශාසනය වැරදුනේ නම් අනාගත කාලයෙහි මේ උතුමාණන් හමුවෙමු. යම් සේ මිනිස්සු ගඟින් එතැර වන්නාහු, ඉදිරි තොට වැරදුනේ නම් යට තොටින් ගඟ එතැර වෙත්. එමෙන් අපි සියල්ලෝ ම මේ බුදු රජුන් මිදුණේ නම් අනාගත කාලයෙහි මෙතුමාණන් හමුවෙමු. ලෝකය දත්, දක්ෂිණ පිළිගැනීමට සුදුසු දීපංකර බුදු රජාණෝ මගේ ප්‍රනිටිය විවරණය කොට දකුණු පාදය එසවූහ. (වැඩියහ) එහි සිටි බුදු පුත් මහා රහත්හු ද මා පැදකුණු කොට වැඩියහ. මිනිස්සු, නාග, ගන්ධර්වයෝ ද මට වැඳ ගියහ. සඟුන් සමග බුදු රජහු ද මගේ දර්ශනයෙන් ඉක්ම ගිය කල්හි සතුටු සිත් ඇති ව අසුනෙන් නැඟී සිටියෙමි. මම සැපෙන් සැප ඇත්තෙක් වීමි. ප්‍රීතියෙන් ප්‍රීති වූවෙක් වීමි. එවේලෙහි ප්‍රීතියෙන් පිනාගියේ, පළඟ බැන්දේ, මෙසේ ද සිතීමි. මම ධ්‍යාන සමාපත්ති විෂයයෙහි ප්‍රගුණයෙක් වෙමි. ෂඩ් අභිඥා ඥාණ විෂයයෙහි පරතෙරට ගියේ වෙමි. දසදහසක් ලෝක ධාතුවෙහි මා සමාන බුදු සසුනෙන් බැහැර තවුසකු නැත. ඍද්ධි බලයෙන් අසම

වෙමි. මේ නිසා මෙවැනි සැපයක් ලැබීමි. මා බද්ධ පර්යංකයෙන් හිඳිත් ම දහදහසක් සක්වල වාසීහු ඒකාන්තයෙන් බුදු වන්නේ යි, ප්‍රීති නාද පැවත්වූහ. පෙර බෝසත්වරුන් පරියංකයෙන් වැඩ සිටිත් ම යම් පෙර නිමිති පහළ වී ද, අද ද ඒ නිමිති දක්නා ලැබේ. අධි ශීත, අධි උෂ්ණ සම වේ. දසදහසක් සක්වල නිශ්ශබ්ද හා ප්‍රභාමත් වේ. සුළං කුණාටු ඇති නො වේ. ගංගාවෝ ගලා නො යත්. එකෙණෙහි සියලු ගොඩ දිය පිපෙන මල් පිපේ. තුරු ලිය එලබර වේ. ආකාශ ගත වූ ද පොළොවෙහි වූ ද සියලු රුවන් දිලිසේ. මිනිස් හා දිව්‍යය තූර්ය භාණ්ඩ වාදනය වේ. නා නා වර්ණ මල් වරුසා අහසින් වසී. මහා මුහුදු රළ සංසිඳේ. දසදහසක් සක්වල කම්පා වේ. එහි නිරයවල ගිනි නිවේ. හිරු වඩාත් බබලයි. සියලු තාරකාවෝ පෙනෙත්. වැසි නො වැස ම පොළොවෙන් ජල දහර උඩට නගී. තරු සමූහය සහ නැකැත් තරු අහසෙහි බබලයි. සඳ විසාවේ නැකැත් හා යෙදේ. බිමේ සිදුරුවල හා ගුහාවල වාසය කරන සත්ත්වයෝ එකපැහැර නික්මෙති. සියලු සත්ත්වයන්ගේ උකටලි බව නැති වී සතුටු වූවන් වේ. සත්ත්වයන්ගේ රෝග හා සාගිනි දුරු වේ. බය නැති වේ. දූහුවිලි ඉහළට නො නැඟේ. අමිහිරි දුගඳ නැති වී සුවඳ හමා එයි. එකෙණෙහි අරූපි බඹුන් හැර සියලු දෙවියෝ පෙනෙත්. සියලු නිරය, මිනිසුන්ට පෙනේ. බිත්ති, ජනෙල්, පර්වත අනාවරණ වී අහස මෙන් විය. එක්ෂණයෙහි සත්ත්වයන්ගේ චූති, ප්‍රතිසන්ධි නො වේ. පෙර බෝසතුන් පළක් බැඳ සිටි අවස්ථාවල සිදු වූ මෙකී සියලු දෑ අද ද දක්නට ලැබේ. එම නිසා මම ඒකාන්තයෙන් බුදු බවට පත් වන්නහුය. වීර්යය දැඩි කරන්න. නො නැවතී ඉදිරියට ම යන්න. අපි මේ සරණ දකිමු. ඔබ එකාන්යෙන් බුදු වන්නහුය."

බෝසත්හු දීපංකර බුදු රජුන්ගේ සහ දස දහසක් සක්වල දෙවියන්ගේ ද වචන අසා වඩාත් උත්සාහවත් වුවාහු, මෙසේ සිතූහ. බුදුවරයා නම් නො සිස් කථා ඇත්තාහුය. වෙනස් නො වන්නේය. යම් සේ අහසට විදි ගලක් බිම වැටීම වේ ද, උපන්නාගේ මරණය

යම් සේ නියත වේ ද, අරුණාලෝකයට අනතුරු ව සූර්යෝදාව මෙන් ද ගුහාවෙන් නික්මුණු සිංහයා නාද කිරීම මෙන් ද ගැබ්බර ස්ත්‍රිය එම බරින් නිදහස් වීම මෙන් ද බුදුවරුන්ගේ වචනය නො සිස්ය. ඒකාන්තය. මම ද නියතයෙන් බුදු වන්නෙමි.

එහෙයින් කියන ලදී.

> "බුදු රජුන්ගේ ද දසදහස් සක්වල දෙවියන්ගේ ද යන දෙපාර්ශ්වයේ ම වචන ඇසූ මම ප්‍රීතියෙන් පිනා ගියේ, මෙසේ සිතීමි. බුදුවරයෝ සත්‍යය අසත්‍යය වශයෙන් දෙයාකාර වදන් ඇත්තාහු නො වෙති. මුනිවරයෝ හිස් වචන ඇත්තාහු නො වෙති. බුදුවරයන්ගේ බොරුවක් නැත. නිසැකයෙන් මම බුදු වන්නෙමි. යම් සේ අහසට විසි කළ ගල් කැටය නිසැක ව බිම වැටේ ද, එසේ ම සියලු සත්ත්වයන්ට මරණය නියතය. රාත්‍රිය පහව ගිය කල ඉරු උදාවීම නියතමැ යි. ගුහාවෙන් නික්මුණු සිංහයා නාද කිරීම අනිවාර්යය. ගර්භනීන් දරු බර බහා තැබීම සිදුවිය යුතු මය. එමෙන් බුදුවරුන්ගේ වචනය ඒකාන්ත සත්‍යයයි."

සුමේධ තවුසාණන් මෙසේ නන් අයුරින් විමසා බලා මම ඒකාන්තයෙන් බුදු වෙමි යි ස්ථිර අධිෂ්ඨානයක් කොට බුද්ධ කාරක ධර්ම - පාරමී ධර්ම විමසීමට උඩ යට දශ දිසාවන් සහ භවත්‍රයට අයත් සියලු ධර්මයන් විමසන්නේ, පෙර බෝසත්වරුන් විසින් පුරුදු පුහුණු කළ පළමු වැනි දාන පාරමිතාව දක මෙසේ තමාට ම අවවාද දුනි. සුමේධ පණ්ඩිතය, ඔබ මෙතැන් පටන් පළමු වැනි දාන පාරමිතාව පිරිය යුතුයි. යම් සේ යටිකුරු කළ දිය පිරවූ කළයක් ඉතිරි නො කොට පිටකරයි. පිටකළ ජලය නැවත ඇතුළට නො ගනී. එමෙන් ධනය, කීර්තිය, අඹුදරුවන්, අඟපසඟ ආශා නැති ව පැමිණි යාචකයන්ට කැමැති කැමැති දේ ඉතිරි නො කොට දෙන්නේ, බෝරුක් මුල හිඳ බුද්ධත්වය ලබන්නෙහිය. පළමු වැනි දාන පාරමිතාව දැඩි කොට ඉටාගත්හ.

එහෙයින් කියන ලදී.

"බුද්ධකාරක ධර්මයන් කොහි ඇත්ද යි ඔබිමොබ උඩයට දශ දිසා පමණක් නොව කාමරූප, අරූප, භවාත්‍රයට අයත් සියලු ධර්මයන් ඒකාන්තයෙන් විමසා බලමි. එදා එසේ සොයන විට පෙර බුදුවරුන් විසින් පුරුදු කරන ලද බෝධියට මහා මඟක් වූ පළමු වැනි දාන පාරමිතාව දුටිමි. සුමේධ පණ්ඩිතය, ඔබ සතර බෝධියට පැමිණෙන්න කැමැත්තෙහි නම් මේ පළමු වැනි දාන පාරමිතාව දෘඪ කොට සමාදන් ව ඒ පුරුදු කරව. යම් සේ යම් කිසිවකු විසින් යටිකුරු කරන ලද පිරිණු දිය කළයක් ඉතිරි නො කොට ජලය බැහැර කරයි. කිසිවක් ඉතිරි කැර නො ගනී. එසේ ම හීන, මැදුම්, උසස් යන යාචකයන් හමු වූ විට යටිකුරු කළ දිය කළයක් මෙන් ඉතිරි නො කොට දන් දෙව."

නැවතත් සුමේධ තවුසාණෝ සිතන්නාහු බුද්ධකාරක ධර්ම පමණක් නො විය යුතුය. තවත් මතුවට සිතන්නාහු, දෙවැනි ශීල පාරමිතාව දුක සිතුහ. සුමේධ පණ්ඩිතය, ඔබ මෙතැන් සිට ශීල පාරමිතාව ද පිරිය යුතුය. යම් සේ චමරී මුවා ජීවිතය ද නො බලා තමාගේ වලිගය ම රකී. එ සේ ඔබ ද ජීවිතය නො බලා ශීලය රකින්නේ නම් බුදු වන්නෙහියැ යි ශීල පාරමිතාව රැකීමට දෘඪ කොට ඉටා ගත්හ.

එහෙයින් කියන ලදී.

"බුද්ධකාරක ධර්ම මෙපමණක් ම නො වේ. බෝධි ඥාණය මුහුකුරා වන තවත් ධර්ම ඇත්ද යි විමසීමි. මෙසේ විමසන විට පෙර බුදුවරුන් විසින් පුරණ ලද දෙවැනි ශීල පාරමිතාව දුටුවෙමි. සුමේධ පණ්ඩිතය, ඔබ සම්බෝධිය අවබෝධ කරනු කැමැති නම් මේ ශීල පාරමිතාව දෘඪ ව සමාදන් ව එම ශීල පාරමිතාව අනුගමනය කරව. මෙසේ සෙමර මුව දෙන සිය වාලධිය යම් කිසිවක පැටලුණු විට එතැන ම මැරෙන්නේය. වලිගයට හානි කැර නො ගන්නීය. ඒ අයුරින් සිව් භූමිය

> හෙවත් ප්‍රාතිමෝක්ෂ සංවර ආදී සිව් සිල් සෙමර මුව දෙන වලිගය රකින්නාක් මෙන් ආරක්ෂා කරන්න."

ඉක්බිති, සුමේධ තවුසාණෝ බුද්ධකාරක ධර්ම මෙපමණක් ම නො විය යුතුයැ යි තවත් සොයනුයේ, තෙවැනි නෙක්ඛම්ම පාරමිතාව ද සම්පූර්ණ කරව. යම් සේ බොහෝ කලක් සිට ගෙයක වසන පුරුෂයා එහි ඇලීමක් නො කරයි. උකටලී බව හා නො වසනු කැමැත්ත ම වෙයි. එමෙන් ඔබ ද සියලු කාමලෝකාදී භව හිර ගෙදරක් කොට සලකා සියලු භවයන්ට කලකිරී එයින් මිදෙනු කැමැත්තේ වී නෙක්ඛම්මාභිමුඛ වනු. එවිට ඔබ බුදුවන්නෙහියැ යි තෙවැනි නෙක්ඛම්මාභිමුඛ දැඩි කොට ඉඩ ගත්හ.

එහෙයින් කියන ලදී.

> "සංබෝධි චින්තය වර්ධනය කැරවන තවත් බුද්ධකාරක ධර්ම විමසූ මම තෙවැනි නෙක්ඛම්ම පාරමිතාව හෙවත් භාවනාව අත්හැරීම දුටුවෙමි. යම් සේ හිර ගෙයක දුකින් විසූ පුරුෂයකු එයට ආශා නො කරයි ද එයින් මිදී යාමට මඟක් සොයයි ද එසේ ම සියලු භවයන් සිර ගෙවල් මෙන් සලකා භවයෙන් එතැර වීමට නෙක්ඛම්ම පාරමිය සම්පූර්ණ කරව."

බුද්ධකාරක ධර්ම තවත් තිබිය යුතුයැ යි සිතූ සුමේධ තවුසාණෝ සිව් වැනි පඤ්ඤා පාරමිතාව දැක සුමේධ පණ්ඩිතය, ඔබ මෙතැන් සිට පඤ්ඤා පාරමිතාව ද පිරිය යුතුය. අවම, මැදුම්, උතුම් යන සියලු නුවණැත්තන් වෙත ගොස් ප්‍රශ්න කිරීමෙන් දැනීම ලබාගත යුතුය. යම් සේ පිණ්ඩධාරී භික්ෂුවක් අවම, මධ්‍යම ආදී වශයෙන් බෙදුණු කිසි කුලයක් අත් නො හැර පිඬු පිණිස හැසිරෙන්නේ, තම යැපීම සඳහා ආහාර ලබා ගනී. එමෙන් ඔබට ද සියලු නැණවතුන් කරා එළැඹ ප්‍රශ්න විචාරීමෙන් බුද්ධත්වය ලබාගත හැකි වේ.

එහෙයින් කියන ලදී.

"තවදුරටත් බුද්ධකාරක ධර්මයන් විමසන සුමේධ තවුසාණෝ පෙර බුදුවරුන් විසින් පුරුදු පුහුණු කළ සිවු වැනි පඤ්ඤා පාරමිතාව දුටහ. යම් සේ පිඬු පිණිස වඩින භික්ෂුව හීන, මධ්‍යම, උත්තමයැ යි සම්මත හැම කුලයක් ම අත් නො හැර තම ආහාරය ලබා ගන්නාක් මෙන් සුමේධ පණ්ඩිතය, ඔබ ද හැමකල්හි ම නැණවතුන් ඇසුරු කරමින් පඤ්ඤා පාරමිතාව පුරන්නේ නම් සම්බෝධිය ලබන්නෙහිය."

බුද්ධකාරක ධර්ම මෙතෙක් පමණක් නො වේ. තවදුරටත් විමසන සුමේධ තාපසයෝ පස් වැනි විරිය පාරමිතාව දුටහ. පණ්ඩිතය, ඔබ මෙතැන් සිට විරිය පාරමිතාව ද පිරිය යුතු ය. යම් සේ සිව්පා සතුන්ගේ රජ වූ සිංහයා සියලු ඉරියව්වල දී දැඩි වීර්යය ඇත්තකු වේ ද එසේ ඔබ ද නො පසුබස්නා වීර්යය ඇත්තෙක් වන්නේ නම් බුදු බව ලබන්නාහ යි, පස් වැනි වීර්යය පාරමිතාව ස්ථිර වශයෙන් අධිෂ්ඨාන කළහ.

එහෙයින් කියන ලදී.

"එදා සුමේධ බෝසතාණෝ පෙර බුදුවරයන් විසින් ද පුරන ලද විරිය පාරමිතාව දැඩි ව අධිෂ්ඨාන කොට යම් සේ සිව්පා සතුන්ගේ රජ වූ සිංහයා හිඳීම, සිටීම, ගමන යන අවස්ථාවන්හි නො පසුබස්නා වීර්යයෙන් එඩිතර සිත් ඇත්තේ වේ ද, එසේ ම ඔබ ද සියලු භවවල දී විරිය පාරමිතාව පුරන්නේ නම් සම්බෝධියට පැමිණෙන්නෙහිය."

අනතුරු ව බෝසතාණෝ තවත් බුද්ධකාරක විමසන්නාහු, සවැනි ඛන්ති පාරමිතාව දැක පණ්ඩිතය, ඔබ මෙතැන් පටන් ඛන්ති පාරමිතාව ද පිරිය යුතුය. සම්මාන, අවමාන යන දෙකෙහි ඉවසීම ඇත්තකු විය යුතුය. යම් සේ මහා පොළොවට පිරිසිදු දෙයක් දැමුව ද අපිරිසුදු දෙයක් දැමුව ද එයට කැමැත්තක් හෝ අකැමැත්තක් නො දක්වයි. කම්පාවට පත් නො වේ. එමෙන් ඔබ ද සම්මාන, අවමාන දෙකෙහි

ම ඉවසන්නකු වන්නේ නම් බුදු වන්නෙහියැ යි, සවැනි ඛන්ති පාරමිතාව දැඩි කොට ඉටාගත්හ.

එහෙයින් කියන ලදී.

"බුද්ධකාරක ධර්ම විමසන බෝසතාණෝ පෙර බුදුවරුන් විසින් සෙවුනා ලද සවැනි ඛන්ති පාරමිතාව සමාදන්ව, පණ්ඩිතය, යම් සේ පොළොව පිරිසුදු අපිරිසිදු දෙක ම ඉවසයි. ප්‍රතික්ෂේප නො කරයි. ආදරය හෝ ක්‍රෝධ නො කරයි. එමෙන් ඔබ ද හැමදෙනාගේ ම සම්මාන, අවමාන දෙක්හි දී ම දෙයාකාරයක් නොමැති මනසින් හෙවත් දයා ක්‍රෝධ දෙකට නො පැමිණ සියල්ල ඉවසන්නේ නම් බුදු වන්නෙහිය."

නැවතත් බෝසතාණෝ බුද්ධකාරක ධර්ම සොයන්නාහු, සත් වැනි සච්ච පාරමිය දැක පණ්ඩිතය, ඔබ මෙතැන් සිට සච්ච - ඇත්ත කථා කිරීමේ පාරමිය පිරිය යුතුය. තම හිස මත හෙන පාත්වුව ද එන අධි ලාබ සඳහා ද නැත්නම් ඡන්ද ආදී සතර අගතියෙන් හෝ දැන දැන බොරු නො කියව. ඕෂධී තරුව සියලු ම සතුන්ගේ ගමන් මග හැර වෙනත් ගමන් මගක නො යයි. තමාට අයත් වීථියෙහි ම යයි. එමෙන් ඔබ ද සත්‍යය අත්හැර බොරු නො කියන්නේ, බුදු වන්නෙහියැ යි සත් වැනි සච්ච පාරමිය දැඩි කොට ඉටාගත්හ.

එහෙයින් කියන ලදී.

"තවදුරටත් බුද්ධකාරක ධර්ම විමසන බෝසතාණෝ සත් වැනි සච්ච පාරමිය සමාදන් ව වෙනස් නො වන වචන ඇත්තේ, සංබෝධියට පැමිණෙන්නෙහිය. යම් සේ ඕෂධී තාරකාව දෙවියන් සහිත ලෝකයෙහි තුලාවක් මෙන් විය. ග්‍රීෂ්ම, වර්ෂා, හේමන්ත යන සෑම ඍතුවක ම තම වීථියෙන් හෙවත් මාර්ගයෙන් බැහැර නො වෙයි. එසේ ම ඔබ ද සත්‍යය මඟින් බැහැර නො වූයේ සම්බෝධියට පැමිණෙන්නෙහිය."

බුද්ධකාරක ධර්ම සෙවීමේ නිරත වූ බෝසතාණෝ අට වැනි අධිෂ්ඨාන පාරමිය ද සොයා ගත්හ. ඔබ විසින් සිත්හි පිහිටුවා ගත්තේ නම් එහි නිශ්චල ව සිටුව. යම් සේ පර්වතයක් සතර දිගින් මහා වාතය හමද්දීත් කම්පා නො වේ ද, නො සෙලවේ ද, පිහිටි තැන ම සිටී ද, එමෙන් ඔබ ද තමා කළ අධිෂ්ඨානයෙහි නිශ්චල ව සිටින්නේ, බුදු වන්නෙහිය. මෙසේ අට වැනි අධිෂ්ඨාන පාරමිය ද දැඩි කොට ඉටා ගත්හ.

එහෙයින් කියන ලදී.

> "මතු මත්තෙහි බුදකුරු දම් සොයන සුමේධ තවුසාණෝ අට වැනි අධිෂ්ඨාන පාරමිය ද දුටහ. පණ්ඩිතය, මේ අට වැනි අධිෂ්ඨාන පාරමිය ද සම්බෝධිය සඳහා පිරිය යුතුය. යම් සේ මනාව පිහිටි ගල් පර්වතයක් සිවු දිගින් හමන මහා වාතයෙන් කම්පා නො වී හිමි තැන ම සිටී ද, එමෙන් ඔබ ද සිය අදහසෙහි නො සෙල්වී සිටින්නේ, සම්බෝධියට පැමිණෙන්නෙහිය."

බුද්ධකාරක ධර්ම සිතන සුමේධ තවුසාණෝ නව වැනි මෙත්තා පාරමිය දැක සුමේධ පණ්ඩිතය, ඔබ මෙතැන් සිට හිත අහිත රූපය කෙරෙහි ම එක සිතකින් පැවැතිය යුතුය. ජලය දුදනාට ද සුදනාට ද එක ම සීතලක් දෙයි. එමෙන් ඔබ ද සියලු සත්ත්වයන් කෙරෙහි එකට මෙත් සිත් ඇත්තෙක් ව වසන්නේ නම් බුදු වන්නෙහියැ යි, මෙත්තා පාරමිය ද අදිටන් කළහ.

එහෙයින් කියන ලදී.

> "බුද්ධකාරක ධර්ම තවත් තිබේදැ යි සොයන තවුසාණන්ට නව වැනි මෙත්තා පාරමිය පෙනිණ. පණ්ඩිතය, බුදු වනු කැමැත්තේ නම් පෙර බුදුවරුන් විසින් අනුගමනය කළ මෙත්තා පාරමිය පුරනු මැනව. යම් සේ ජලය පවිටු ජන හා හුදී ජනයා හට සිසිල්

> ගුණ සම ව විහිදුවයි. එසේ දූවිලි ආදී අපවිත්‍ර දේ සම ව සෝදා හරී. එසේ ම ඔබ ද හිත අහිත හැමදෙනා කෙරෙහි මෙත් සිත සම ව පතුරුවන්නේ, බුදු බව ලබන්නෙහිය."

දශ වැනි පාරමිය වශයෙන් බෝසතාණන් දුටුරේ උපේක්ඛා පාරමියයි. සුමේධ පණ්ඩිතයෝ තමාට ම, ඔබ මෙතැන් සිට සැප දුක් දෙකෙහි මැදහත් විය යුතුයි. පිරිසිදු සුචි අසුචි දෙකෙහි ම පොළොව කම්පාවක් නැත. එසේ ඔබ ද සැප දුක් දෙකෙහි ම මැදහත් බව වඩන්නේ නම් සම්බෝධිය ලබන්නෙහිය.

> "ඔබ මේ දශ වැනි උපේක්ඛා හෙවත් මැදහත් බව දැඩි කොට සමාදන් ව සියල්ලෙහි තුලාවක් මෙන් අටලෝ දහමෙහි හා හිතාහිතයන් කෙරෙහි කෝපානුවර්ත ව සමබර ව සිටී නම් උපේක්ඛා පාරමිතාව අනුගමනය කිරීමෙන් සම්බෝධියට පැමිණිය හැකිය."

බෝසතාණෝ නැවතත් සිතන්නහු, මේ ලෝකයෙහි බෝසත්වරුන් විසින් පිරිය යුතු සම්බෝධිය මුහුකුරා යන බුද්ධකාරක ධර්මයන් මෙපමණක් මය. දශ පාරමී හැර අනිකක් නැත. මේ දශ පාරමිතාවන් උඩ අහසෙහි නැත. යට පොළොවෙහි ද නැත. සිව් දිසාවෙහි ද නැත. පාරමී පිහිටා ඇත්තේ මගේ හෘදය තුළය. මෙසේ දශ පාරමී ධර්ම තම හදවතෙහි පිහිටි බව දැක ඒ දැඩි කොට සිතින් අධිෂ්ඨාන කොට නැවත නැවත මෙනෙහි කරන්නාහු, අනුලෝම පටිලෝම වශයෙන් විමසූහ. තව ද අග සිට මුලට ද මුල සිට අගට ද විමසූහ. පාරමිතාවන් මැද සිට දෙකෙළවරට ද ගෙන නිමවූහ. දෙකෙළවරින් ගෙන මැදින් නිමවූහ.

පාරමී වනාහිඃ අංග පරිත්‍යාගය පාරමිතා නම්. බාහිර භාණ්ඩ පරිත්‍යාගය උපපාරමිතා නම්. ජීවිත පරිත්‍යාගය පරමත්ථ පාරමිතා නම් යි, පාරමී ධර්ම, දශ පාරමී, දශ උපපාරමී, දශ පරමත්ථ පාරමී වශයෙන් ගිතෙල්, මීතෙල් ආදී දෙතෙලක් එක් රස කොට අනන්නාක් මෙන් මහා මෙරු පර්වතය මහා සමුද්‍රය කලඹන්නාක් මෙන් ද

විමර්ෂණය කළේය. මෙසේ නන් අයුරින් දශ පාරමී ධර්ම විමර්ෂණය කරන කල්හි දහම් තෙදින් සිව් නහුතයක් අධික කොට ඇති යොදුන් දෙලක්‍ෂයක් ගණ වූ මේ මහා පොළොව ඇතකු විසින් මඩනා ලද බට දඬු මිටියක් මෙන් ද උක් දඬු යන්ත්‍රයක් මෙන් ද මහා ශබ්ද නංවමින් කම්පා විය. කුඹල් සකක් මෙන් ද තෙල් යන්ත්‍රයක් මෙන් ද භ්‍රමණය විය.

එහෙයින් කියන ලදී.

> "සම්බෝධිය මුහුකුරු වන යම් ධර්මයෝ වෙත් ද ඒවා මෙපමණය. අන් තැනක හෝ මෙයට අධික ව නැත. දැඩි ව එහි පිහිටන්න. මේ පාරමී ධර්මයන් තත්ත්වාකාරයෙන් කෘත්‍යය හා ආකාර වශයෙන් සලකන කල්හි පාරමී දහම් තෙදින් දශ දහසක් සක්වල කම්පා විය. ඇඹරෙන උක් යන්ත්‍රයක් මෙන් පොළොව සෙලවිණි. රැව්දිණි. තෙල් යන්ත්‍රයෙහි සක මෙන් කැරකිණි."

මහ පොළොව කම්පාවන කල්හි රම්ම නගර වාසී ජනයෝ පොළොවෙහි සිටින්නට නො හැකි ව ප්‍රලය වාතයෙන් පහර ලැබූ මහා වෘක්‍ෂයන් මෙන් ඒ ඒ තැන මුසපත්ව වැටුනහ. කළ ආදී කුඹල් මැටි භාණ්ඩ බිම වැටී එකිනෙක හැපී සුණු විසුණු වූහ. බිය පත් වූ මහා ජනයා දීපංකර බුදු රජුන් වෙත එළැඹ කිමෙක් ද භාග්‍යවතුන් වහන්ස, භූත, යක්‍ෂ, දේවතාදීන්ගේ අවේෂයක්දැ යි අපි නො දනිමු. සියලු ජනයෝ බියපත් ව සිටිති. ස්වාමීනි, මෙයින් ලෝකයට අයහපතක් වේ ද ? නැතිනම් යහපතක් වේ ද ? අපට මෙම කාරණය පැහැදිලි කොට දෙනු මැනවි. බුදු රජහු ඔවුන්ගේ කථාව අසා තොපි බය නො වව්. ඒ ගැන නො සිතව්. තොපට මෙය අයහපතක් නො වේ. අද මවිසින් යම් ඒ සුමේධ පණ්ඩිත කෙනකු අනාගතයෙහි ගෞතම නමින් බුදු වන්නාහ යි ප්‍රකාශ කරන ලද ද ඔහු දැන් පාරමී ධර්ම විමසයි. ඒ දම් තෙදින් දස දහසක් සක්වල එකවරට කම්පා වෙයි. රැව්දෙයි.

එහෙයින් කියන ලදී.

"දීපංකර බුදු රජුන්ගේ දාන ශාලායෙහි යම් පමණ පිරිසක් වූවාහු ද ඒ සියල්ලෝම වෙවුලමින් මුසපත් ව බිම වැතුරුනාහ. එසේ ම දහස් ගණන් කුඹල් කළ ද සැළි ද එකිනෙක හැපී සුණු වී කැළඹී ගියේය. බියෙන් තැති ගත් භ්‍රාන්තියෙන් ආකුල සිත් ඇති ජනතාව දීපංකර බුදු රජුන් වෙත එළැඹියහ. පසැස් ඇති බුදු රජාණන් වහන්ස ලෝකයට කුමක් වන්නේ ද ? හැමදෙනා ම බියෙන් ඇළලී සිටිති. ලෝකයට යහපතක් වේ ද ? අයහපතක් වේ ද ? මේ උපද්‍රවය දුරු කරනු මැනවි. දීපංකර බුදු රජාණෝ එදා ඔවුන් සනසාලූහ. මේ පෘථුවි කම්පාවෙන් බය නො වව්. උවදුරු රහිත වව්. අද මම යම් කෙනකු ලොව බුදු වන්නේ යි ප්‍රකාශ කළෙමි ද හෙතෙම පෙර බුදුවරුන් සිත් සෙවුනා ලද පෙරුම් දම් විමසයි. බුද්ධත්වයට පාදක වන්නා වූ සියලු ධර්ම විමසන කල්හි දස දහසක් සක්වල කම්පා වෙයි."

මහා ජනයා බුදුරදුන්ගේ කථාව අසා තුටුපහටු වූවාහු ගඳමල් ආදිය රැගෙන රම්ම නගරයෙන් නික්ම බෝසතුන් වෙත එළඹ මල් ආදියෙන් පුදා වැඳ පැදකුණුකොට රම්ම නගරයට ම පිවිසියහ. බෝසත්හු ද දශ පාරමී ධර්ම විමර්ෂණයකොට වීර්යය දෘඩිකොට අධිෂ්ඨානකොට වැඩසිටි ආසනයෙන් නැඟී සිටියහ.

එහෙයින් කියන ලදී.

"එකනෙහි බුදු රජුන්ගේ වචනය ඇසූ ජනතාවගේ සිත් සංසිඳිණි. ඒ සියල්ලෝම මා වෙත පැමිණ නමස්කාර කළහ. මම ද බුදු ගුණ මෙනෙහි කොට සිත දෘඩි කොට ආසනයෙන් නැඟී සිටියෙමි."

බෝසතාණෝ ආසනයෙන් නැඟී සිටිත් ම දස දහසක් සක්වල දෙවියෝ රැස්වී දිව්‍යය මය ගඳ මල් ආදියෙන් පුදා සුමේධ තාපස උතුමාණෙනි, ඔබ අද දීපංකර බුදු රජුන්ගේ පාමුල උතුම් ප්‍රාර්ථනයක් කළහ. ඒ ප්‍රාර්ථනය නිරපද්‍රිත ව සඵල වෙත්වා. ඔබට බියක් හෝ

නැති ගැන්මක් නො වෙත්වා. ඔබ සිරුරෙහි ස්වල්ප වූ හෝ රෝගයක් නො වැළදෙත්වා. වහා ම පෙරුම් සපුරා බුද්ධත්වය අවබෝධ කරත්වා. මල් හා ගෙඩි හටගන්නා ගස් නියමිත කාලය පැමිණි කල්හි මල් පිපේ. ගෙඩි හටගනී. එමෙන් ඔබ ද කාලය නො ඉක්මවා බුද්ධත්වයට පත්වෙත්වා යි මංගල ස්තුති ගී පවත්වා තම තමන්ගේ දේව ස්ථාන කරා ගියහ. සුමේධ තවුසාණෝ ද මම දශ පාරමී දම් පුරා සාරසංඛ්‍යය කල්ප ලක්‍ෂයක් මතුයෙහි බුදු වන්නෙමි යි වීර්යය දැඩි කොට අහසට නැඟී හිමවතට ම වැඩියහ.

එහෙයින් කියන ලදී.

> "මා ආසනයෙන් නැඟිටින විට ම දෙවියෝ සහ මනුෂ්‍යයෝ දෙව් ලොව හා මිනිස් ලොව මල් විසුරුවත්. ඒ දෙපිරිස ම ඔබ විසින් පතන ලද ඔබගේ ප්‍රාර්ථනය සිතූ පරිදි ම ලබත්වා යි තුති ඝෝෂා පවත්වති. සියලු උවදුරු දුරු වෙත්වා. කණගාටු හා රෝග. පීඩා නැති වෙත්වා. ඔබට කිසි අනතුරක් නො වෙත්වා. උතුම් සම්බෝධිය ලබත්වා. මල් පිපෙන ගස් සුදුසු කාලය පැමිණි කල්හි මල් පිපේ. එසේ ම වීරයාණෙනි, ඔබ ද බුද්ධ ඤාණ නැමැති මලෙහි පිපෙන්නෙහිය. පෙර බුදුවරු දශ පාරමී ධර්ම පිරූහ. එසේ ම ඔබ ද දශ පාරමී ධර්ම පුරනු මැනවි. පෙර බුදුවරු බෝමැඩෙහි බුද්ධත්වය අවබෝධ කළහ. වීරයාණෙනි, ඔබ ද බුදුවරුන්ට පොදු බෝමැඩහි දී බුද්ධත්වය අවබෝධ කරනු මැනවි. පෙර බුදුවරු යම් සේ දම්සක් පැවැත්වූවාහු ද එසේ ම ඔබ ද දම්සක් පවත්වනු මැනවි. පසළොස්වක පොහෝ දින යම් සේ චන්ද්‍රයා ඉතා පිරිසිදු ව බබලයි ද එමෙන් ඔබ ද පිරුණු මනදොළ ඇති ව දශ දහසක් සක්වල බබලනු මැනවි. රාහුගෙන් මිදුණු සූර්යයා ආලෝකයෙන් වඩාත් බබලා ද එමෙන් ඔබ ද ලෝකයා සසරින් මුදවා මහා වීරයකු සේ ශ්‍රීයෙන් බබලනු මැනවි. සියලු ගංගාවෝ මහා මුහුදට ගලන්නා සේ දෙවියන් සහිත ලෝකයා ඔබ වෙතට මුළු දෙත්වා. ඒ දෙව් මිනිසුන් විසින් ස්තුති

ප්‍රශංසා ලද ඒ සුමේධ පණ්ඩිත තවුසාණෝ දශ පාරමී ධර්ම සමාදන් ව ඒ ධුරයන් සම්පූර්ණ කරමින් මහා වනයට පිවිසියහ."

**සුමේධ කථාව නිමි.**

රම්ම නගර වැසි ජනයෝ ද ආපසු නගරයට පැමිණ බුදු රජුන් ප්‍රමුඛ මහසඟනට මහා දන් දුන්හ. දීපංකර බුදු රජාණෝ ද ඔවුන්ට දම් දෙසා මහා ජනයා සරණ සීලාදී ගුණ ධර්මයන්හි පිහිටුවා රම්ම නගරයෙන් නික්ම වැඩියහ. උන් වහන්සේ මෙසේ ආයු ඇති තෙක් ම වැඩ සිට සියලු බුදු කිස නිම කොට පිරිනිවීමෙන් පිරිනිවන්පා වදාළහ. මෙහි දී මේ පිළිබඳ විස්තර කථාව බුද්ධ වංසයෙහි කී අයුරින් දත යුතුයි.

එහෙයින් කියන ලදී.

"එදින ඒ රටවැසියෝ සඟුන් සහිත ලෝකනාථයන් වහන්සේට දන් පිළිගන්වා තෙරුවන් සරණ ගියහ. එසේ ම සමහරු පන්සිල්හි ද දස සිල්හි ද පිහිටවූහ. සමහරු ශ්‍රමණ භාවය ද ආර්ය ඵල ද ලබාගත්හ. සමහරු හට උසස් ධර්ම වූ සිව් පිළිසිඹියා දුන්හ. නර ශ්‍රේෂ්ඨ බුදු රජාණෝ උතුම් අෂ්ට සමාපත්ති ද ත්‍රිවිද්‍යා හා අභිඥා ගුණයන්හි ද සමහරු පිහිටවූහ. මෙයාකාරයෙන් මහා ජනයාට අවවාද කළහ. මේ අයුරින් උන් වහන්සේගේ සසුන පැතිරී ගියේය. පරිපූර්ණ කපොල (කම්මුල්) ඇති වෘෂභ රාජයකුට බඳු කඳ ඇති දීපංකර නම් බුදු රජාණෝ බොහෝ දෙනා සසරින් එතැර කරති. දුගතියෙන් මුදවති. ඒ මුනි උතුමාණෝ සත්‍යාවබෝධ කළයුතු අයකු දැක යොදුන් සුවහසක් ඈත සිටිය ද ඇසිල්ලකින් වැඩ ඔහුට ධර්මාවබෝධ දෙති. උන් වහන්සේගේ පළමු ධර්මාවබෝධ අවස්ථාවෙහි කෙළ

සියයක් සත්ත්වයන් ධර්මාවබෝධ කැරවූහ. දෙවැනි ධර්මාවබෝධ අවස්ථාවෙහි සුවහසක් සත්ත්වයන් ධර්මාවබෝධ කැරවූහ. යම් දවසක උන් වහන්සේ දෙව්ලොව දහම් දෙසූ සේක් ද, ඒ ධර්මාවබෝධ අවස්ථාවෙහි අනූ කෙළ දහසක් සත්ත්වයෝ ධර්මාවබෝධය කළහ. තිලෝ අනුශාසක වූ දීපංකර බුදු රජුන්ට ශ්‍රාවක සන්නිපාත හෙවත් රැස්වීම් තුනක් විය. ප්‍රථම සමාගමෙහි කෙළ ලක්‍ෂයක් ශ්‍රාවකයෝ වූහ. බුදු රජහු නාරද පර්වතයෙහි විවේකීව වැඩ වසන කාලයෙහි කෙළසියයක් මහරහත්හු දෙවැනි සංඝ සමාගමට රැස්වූහ. වශී ප්‍රාප්ත දීපංකර මහා මුනිහු සුදර්ශන පර්වතයෙහි විසූහු ද, එදින නව කෙළක් රහතුන් සමග පවාරණය කළහ. මම එසමයෙහි තපෝ ගුණයෙන් උග්‍ර වූ අභිඥා බලයෙන් පරතෙරට ගිය අහසෙහි ගමන් කරන ජටා දරන තවුසෙක් වීමි. දස දහසක්, විසි දහසක් වශයෙන් සමූහ වශයෙන් ධර්මාවබෝධ කළහ. කෙනකු දෙදෙනකු වශයෙන් ධර්මාවබෝධ කළ වාර ගණන සංඛ්‍යා රහිතය. අතිපාරිශුද්ධ වූ දීපංකර බුදු රජුන්ගේ ශාසනය පැතිරිණි. බොහෝ ජනයා විසින් පිළිගන්නා ලද්දේ විය. එසේ ම සමෘද්ධිමත් විය. මහත් ඍද්ධි බල ඇති අභිඥා ලාභී සාරලක්‍ෂයක් රහත්හු ලෝකය මනා ව දත් දීපංකර බුදු රජුන් පිරිවරා සිටිති. ඒ කාලයෙහි යම් කෙනෙක් රහත් බවට නො පැමින සෝවාන් ආදී මාර්ග ඵල ලාභී වූවාහු ද, ඔවුහු ගරු කටයුත්තෝ නො වෙත්. කෙළෙස් මළ රහිත, නැති කළ ආශ්‍රව ධර්ම ඇති, ස්ථිර ගති පැවතුම් ඇති හෙරණුන් විසින් මනාව පුබුදු කළ බුදු සසුන දෙවියන් සහිත ලෝකයෙහි මනාව බබළයි. දීපංකර බුදු රජුන් උපන් නගරය රම්මවතී නම් විය. සුමේධා නම් දේවිය සහ සුදේව නම් රජ, මව්පියෝ වූහ. සුමංගල හා තිස්ස තෙරණුවෝ අග්‍ර ශ්‍රාවක වූහ. නන්දා සුනන්දා යන තෙරණියෝ අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. ඒ බුදු රජුන්ගේ බෝධි වෘක්‍ෂය පුලිල වෘක්‍ෂයැ යි කියයි. දීපංකර මහා මුනිහු උසින් අසූ රියනකි. මල් පිපුණු තල් ගසක් මෙන් ද පහන් ගසක් මෙන් ද සෝබමාන වූහ. උන් වහන්සේගේ ආයු ප්‍රමාණය අවුරුදු ශත සහස්‍රයකි. මෙපමණ කලක් වැඩ සිටිමින් ජනයා සසරින් එතැර

කළ සේක. ශ්‍රාවකයන් සමග උන් වහන්සේ සදහම්
බබුළුවා මහ ජනයා සසරින් එතැර කොට ගිනි කඳක්
මෙන් බැබලෙමින් සිට පිරිනිවි සේක."

ඒ උන් වහන්සේගේ අනුපමය ඍද්ධි බලය ද කීර්තිය ද ශ්‍රී පාදයන්හි සක් රුවන් සලකුණු ද යන සියල්ලම අතුරුදහන් විය. සියලු ම හේතු ප්‍රත්‍යය සමුත්පතිත ධර්ම හිස් නො වේ ද ?

භාග්‍යවත් දීපංකර බුදු රජුන්ට පසු කාලයෙහි එක් අසංඛ්‍යයක් ඉක්මවා කොණ්ඩඤ්ඤ නම් බුදු රජාණෝ ලොව පහළ වූහ. උන් වහන්සේට ද ශ්‍රාවක සමාගම් තුනක් විය. පළමු සමාගමෙහි කෙළ ලක්ෂයකි. දෙවැනි සමාගමෙහි කෙළ දහසකි. තුන් වැන්නෙහි අනූ කෝටියකි. එදවස බෝසතාණෝ විජිතාවී නම් සක්විති රජ ව ඉපිද බුදු රජුන් ප්‍රමුඛ කොට කෙළ ලක්ෂයක් මහා සංඝයාට මහදන් පැවැත්වීය. කොණ්ඩඤ්ඤ බුදු රජාණන් වහන්සේ ද අනාගතයේ බුදු වන්නේයැ යි විවරණ දී දම් දෙසූහ. බෝසත්හු බුදු රජුන්ගේ වචනය අසා රාජ්‍යය අතහැර පැවිදි විය. එතුමෝ තුන් පිටක ධර්මය උගෙන ධ්‍යාන උපදවා එයින් නො පිරිහී බඹලොව උපන්හ. කොණ්ඩඤ්ඤ බුදු රජුන් වනාහි රම්මවතී නම් නුවර විය. සුජාතා දේවිය හා සුනන්ද රජ මව්පියෝ වූහ. භද්ද, සුභද්ද දෙතරුණුවෝ අගසව් වූහ. උපස්ථායක අනුරුද්ධ තෙරුණුවෝය. තිස්සා, උපතිස්සා දෙතෙරණියෝ අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. බෝධිය, සල් ගස විය. ශරීර උස ප්‍රමාණය අටඅසූ රියන් විය. ආයු ප්‍රමාණය ලක්ෂයකි.

එහෙයින් කියන ලදී.

"දීපංකර බුදු රජුන්ට අපර භාගයෙහි අනන්ත තෙද ඇති
පමණ කළ නො හැකි කීර්ති ඇති නො මිනිය හැකි
ගුණ ඇති ළංවිය නො හැකි ලොවට නායක
කොණ්ඩඤ්ඤ නම් බුදු රජහු පහළ වූහ."

කොණ්ඩඤ්ඤ බුදු රජුන්ට මෑත භාගයෙහි එක් අසංඛ්‍යයක් ඉක්මවා එක ම කපෙක බුදුවරු සතර නමක් පහළ වූහ. එනම්

මංගල, සුමන, රේවත, ශෝභිත නමිනි. එයින් මංගල බුදු රජුන්ට සාවක සන්නිපාත තුනකි. පළමු සමාගමෙහි කෙළ සියයක් ශ්‍රාවකයෝ වූහ. දෙවැනි සමාගමෙහි කෙළ දහසකි. තුන් වැන්නෙහි අනූ කෙළකි. ඒ බුදු රජුන්ගේ සුළු මවුන්ගේ පුත්, සොහොයුරු ආනන්ද කුමාරයා නව කෙළක් පමණ පිරිස සමග දහම් ඇසීම සඳහා බුදු රජුන් වෙත එළැඹියේය. උන් වහන්සේ ඔවුන්ට අනුපිළිවෙල කථාව දෙසූහ. අනන්ද කුමරු පිරිස මඟ පිළිසිඹියා සමග රහත් බවට පැමිණියේය. බුදු රජහු ඒ කුල පුතුන්ගේ පෙර අත්බැව් බලා ඍධිමය පාසිවුරු ලැබීමේ පින දැක දකුණු අත දිගු කොට මහණෙනි, එව යි වදාළහ. ඒ සියල්ලන් ම එකණෙහි ම ඉඳුමය පාසිවුරු දරා සැට වස් පිරුණු මහා තෙරවරුන් මෙන් විය. ඔවුහු ශ්‍රමණ ආකල්පයෙන් යුතු ව බුදු රජුන් වැඳ පිරිවරා සිටියහ. මේ උන් වහන්සේගේ තෙවැනි ශාවක සන්නිපාතය විය.

මේ බුදු රජුන්ගේ විශේෂයක් නම්, අනෙක් බුදුවරුන්ගේ ශරීරාලෝකය අසූ රියනක් පමණ පැතිරුණ ද, මේ බුදු රජුන්ගේ ශරීරාලෝකය වනාහි දශ දහසක් සක්වල පැතිර සිටියේය. ගස්, පොළොව, මුහුද ආදිය පමණක් නොව හැලි, වලං ආදිය පවා රන් පටකින් වැසුවාක් මෙන් විය. බුදු රජුන්ගේ ආයු ප්‍රමාණය අනූ දහසකි. මේ කාලය තුළ ම සඳ, හිරු ආදියට තම ආලෝකයෙන් බැබලෙන්නට නො හැකි විය. රෑ දවල් පිරිසිඳීමක් නො වීය. ජනයා බුද්ධාලෝකයෙන් ම දවල් කාර්යය කළේය. සවස පුබුදින මලින් ද අළුයම කුරුළු නාදයෙන් ද ජනයා රෑ දවල් පිරිසිඳ දත්තේය. අනෙක් බුදුවරුන්ට මෙවැනි ආනුභාවයක් නැත්තේ ද ? නැත්තේ නො වෙයි. උන් වහන්සේලා කැමැති වන්නාහු නම් දශ දහසක් සක්වල හෝ ඊට වඩා හෝ ආලෝකය පතුරුවන්ට සමත් විය. මංගල බුදු රජුන්ට වනාහි පෙර කළ ප්‍රාර්ථනා වශයෙන් අනෙක් බුදුවරුන්ගේ බඹයක් පමණ පැතිරී යන ශරීර ප්‍රභාව වෙනුවට මේ ශරීර ප්‍රභාව දශ දහසක් සක්වල පැතිරිණි.

ඒ මංගල බුදු රජාණෝ බෝසත් කල වෙස්සන්තර සමාන අත් බැව්හි වංකගිරිය සමාන පර්වතයක අඹුදරුවන් සමග වාසය කළහ. එකල එක් ඛරදාඨික නම් යක්‍ෂයකු බෝසතුන්ගේ දන් දීමේ ආශාව දැන බමුණු වෙසින් පැමිණ දරු දෙදෙනා ඉල්ලීය. බෝසත්හු බමුණාට දරුවන් දන් දෙමි යි තුටුපහටු ව ජලය කෙළවර කොට මහා

පොළොව කම්පා කොට දරු දෙදෙනා දන් දිනි. යක්ෂයා සක්මන් කෙළවර පුවරුව ළඟ සිට බෝසතුන් බලා සිටියදී ම නෙළුම් අල මිටියක් මෙන් දරු දෙදෙනා කෑවේය. යක්ෂයා මුව විවර කරත් ම ගිනි ජාලයක් මෙන් වැගිරෙන ලේ ධාරාව දක බෝසතුන්ට කෙසඟක් පමණ වූ හෝ දොම්නසක් නො වීය. මවිසින් දෙන ලද දානය ඉතා යහපතැ යි සිතත් ම ප්‍රීතියෙන් පිනා ගියේය. බෝසත්හු මේ පිනින් මේ ආකාරයෙන් ම ශරීරයෙන් මේ ආලෝක ධාරා නික්මෙවා යි පැතීය. බෝසතුන්ගේ මේ ප්‍රාර්ථනය නිසා බුද්ධත්වයට පත් කල්හි රශ්මිය නිකුත්ව මෙපමණ දුරක් පැතිරිණි. ඒ බෝසතුන් පිළිබඳ ව තවත් පූර්ව චරිතයක් ඇත. හෙතෙම බෝසත් කල එක් බුදුන් වහන්සේ නමකගේ සෑයක් දවා මේ බුදු රජුන්ට මවිසින් ජීවිතය පරිත්‍යාග කළ යුතුයැ යි සිතා මුළු සිරුර දඬුවැට පහණක් මෙන් වෙළා රියනක් පමණ ඇති ලක්ෂයක් අගනා පාත්‍රයක් ගිතෙලින් පුරවා එහි දහසක් පහන් වැටි දල්වා එම පාත්‍රය හිසින් ගෙන සිරුරට ගිනි දල්වා සෑය පැදකුණු කරමින් මුළු රාත්‍රිය ම ගත කළේය. මෙසේ අරුණෝදය දක්වා උත්සාහ කළ ද රෝම කූපයක් පමණදු උණුසුමක් නො දුනුණේය. පියුම් ගැබකට පිවිසි මලක් මෙන් විය. ධර්මය වනාහි තමා රකින්නකි. එහෙයින් බුදු රජහු වදාළහ. ධර්මය වනාහි ධර්මයෙහි හැසිරෙන්නා රකී. ධර්මය පුරුදු පුහුණු කළේ, සැප ගෙන දෙයි. ධර්මයෙහි හැසිරීමෙහි ආනිශංසයයි. මෙම කර්ම විපාක බලයෙන් ද ඒ මංගල බුදු රජුන්ගේ ශරීරාලෝකය දශ දහසක් ලෝක ධාතුවෙහි පැතිර සිටියේය.

එදවස අප බෝසතාණෝ සුරුචි නම් බමුණකු ව ඉපිද බුදු රජුන්ට ආරාධනා කරමි යි ගොස් මිහිරි කථා අසා ස්වාමීනි, හෙට දවසට මගේ දානය පිළිගනු මැනවැ යි කීය. බුදු රජහු බමුණ, ඔබට කොතෙක් භික්ෂූන් ප්‍රමාණවත් ද ? ස්වාමීනි, ඔබ වහන්සේගේ පිරිවර සංඝයා කොතෙක් ද ? එදින ඒ බුදු රජුන්ගේ ප්‍රථම සංඝ සන්නිපාත දිනය විය. බමුණ, භික්ෂු ගණන කෙළ ලක්ෂයකි. ස්වාමීනි, ඒ සියලු භික්ෂූන් සමග හෙට දවසෙහි භික්ෂාව පිළිගනු මැනව. බුදු රජහු බමුණු ආරාධනය පිළිගත්හ. බමුණා ආරාධනා කොට ගෙට යමින් සිතන්නට විය. මම මෙපමණ භික්ෂු සංඝයාට කැඳ, බත්, වස්ත්‍ර ආදිය දීමට නො හැක්කේ නො වෙමි. එහෙත් වැඩ සිටින ස්ථානයක් කෙසේ නම් දෙන්නේදැ යි සිතන්නේ, බමුණාගේ මේ සිතිවිල්ල යොදුන් අසූහාර දහසක් උස මෙර මුදුනෙහි තව්තිසාවෙහි සිටි සක් දෙව්දුගේ පඬු

ඇඟිල් අස්නට උණුසුමක් දැනවීය. සක් දෙවිඳු කවරකු මා මේ දිව්‍යය රාජ්‍යයෙන් පහ කරනු කැමැත්දෝ යි දිවසින් බලන්නේ, බෝසතුන් දැක සුරුචි බ්‍රාහ්මණයා බුදුන් ප්‍රමුඛ භික්‍ෂු සංඝයාට ආරාධනා කොට වැඩ සිටිනා තැනක් පිළිබඳ ව සිතයි. මා ද එහි ගොස් පුණ්‍යය කර්මයට සහභාගී වීම වටීයැ යි වඩුවකුගේ වේෂය ගෙන වැපොරෝ ගත් අත් ඇති ව මහසත්හුගේ ඉදිරියෙහි පෙනී සිටියේය. කිසිවකු හට බැලයකුගෙන් ප්‍රයෝජන ඇත්දැ යි ඇසීය. බෝසත්හු ඔහු දැක ඔබ කවර නම් වැඩ දන්නෙහි ද ? මා නො දන්නා ශිල්පයක් නැත. ගෙයක් හෝ මණ්ඩපයක් හෝ යමක් අවශ්‍යය නම් ඒ කිරීමට මම දනිමි. එසේ නම් මට අවශ්‍යය එක කාර්යයක් ඇත. උතුමාණෙනි, ඒ කුමක් ද ? හෙට දිනයේ දානය සඳහා මවිසින් කෝටි ලක්‍ෂයක් භික්‍ෂූහු ආරාධනා කරන ලදහ. උන් වහන්සේලාට වැඩ සිටීමට මණ්ඩයක් කරන්නෙහිදැ යි ඇසීය. ඉඳින් මට චේතනය දියහැකි නම් කරන්නෙමි. දරුව, චේතන දීමට හැකිවෙමි යි වඩු වේශධාරී සක් දෙවිඳු, එසේ නම් කරන්නෙමි යි ගොස් එක් ප්‍රදේශයක් දෙස බැලීය. එකෙණෙහි දොළොස් කෙළක් යොදුනක් ප්‍රමාණ භූමිය කසින මණ්ඩලපයක් මෙන් සමතලා විය. අනතුරු ව සක් දෙවිඳු මෙතෙක් භූමි ප්‍රදේශයක සත් රුවනින් සැදුණු මණ්ඩපයක් පැන නගීවා යි සිතා එදෙස බැලීය. එකෙනෙහි ම පොළොව දෙබෑ කොට මණ්ඩපයක් පැන නැංගේය. එහි රන් ටැඹවල රිදීමය කළ වැට විය. රිදී ටැඹවල රන් කළ විය. මැණික් ටැඹවල මැණික කළ ද නත්රුවන් ටැඹවල සත් රුවන් මය කළ ද විය. ඉන්පසු මණ්ඩපයෙහි අතරතුර කිකිණි දැල් එල්වේවා යි එදෙස බැලීය. මාරුතයෙන් සෙලවෙන කිකිණි දැල්වලින් පඤ්ච තූර්ය නාදය නිකුත් විය. දිව්‍යය සංගීතයක් පවතින කාලයක් මෙන් මෙනි. අතරතුර සුවඳ මල් දම් එල්වේවා යි සිතීය. ඒ සමග ම මල් දම් එල්විණි. අනතුරු ව කෙළ ලක්‍ෂයක් භික්‍ෂූන් වහන්සේට අසුන් හා පාත්‍රාධාර පොළොව බිඳගෙන පැන නගීවා යි සිතී. කොන් කොන්වල දිය සුළි පැණ නැගුණි. සක් දෙවිඳු මෙතෙක් දේ මවා බමුණු වෙත ගොස් උතුමාණනි, ඔබගේ මණ්ඩපය බලා මගේ චේතනය දෙනු මැනවැ යි කීය.

බෝසත්හු මණ්ඩපය දකිත් ම පස්වණක් ප්‍රීතියෙන් පිනා ගියහ. මෙසේ ද සිතූහ. මේ මණ්ඩපය මනුෂ්‍යයකු විසින් කරන ලද්දක් නො වේ. එකාන්තයෙන් මගේ දාන චේතනාව නිසා සක් දෙවිඳුගේ භවනය උණුසුම් වූවා විය යුතුයි. ඒ නිසා ඔහු විසින් කළ මණ්ඩපයක්

විය යුතුය. මෙවැනි මණ්ඩපයක එක් දවසක් දන් දීම තරම් නො වේ. සත් දවසක් ම දන් දෙමි යි සිතීය. බෝසත්වරුන්ට කෙත් වතු ආදි බාහිර දාන කොතෙක් වුව ද තෘප්තියක් ඇති නො වේ. අලංකාර කළ හිස සිඳ හෝ අඳුන් ගෑමෙන් සැරසූ ඇස් උගුලා හෝ හෘදය මාංශ ගලවා හෝ දන් දුන් කල සතුට ඇති වේ. සිවි ජාතකයෙහි අප බෝසතුන් දිනපතා කහවණු පස් අමුණක් වියදම් කොට නගරයෙන් සතර දොරටුවේ සහ මැද දන් දෙද්දීත් පරිත්‍යාගය පිළිබඳ සතුටක් උපදවීමට නො හැකි විය. යම් දවසක බමුණු වෙසින් ආ සක් දෙවිඳු ඇස් ඉල්ලී ද එදින ඇස් උගුලා දන් දෙන බෝසතුන්ට සතුට ඇති විය. කෙසඟක් පමණ වුව ද සිතෙහි වෙනස් බවක් ඇති නො වීය. මේ අනුව පරිත්‍යාගයෙන් බෝසතුන්ට තෘප්තියක් ඇති නො වේ. මේ අනුව බෝසතාණෝ මවිසින් කෙළ ලක්‍ෂයක් භික්‍ෂූන් වහන්සේට දන් දිය යුතුයැ යි සිතා ඒ මණ්ඩපයෙහි වඩා හිඳුවා ගවපාන නම් දානය දුන්හ. ගවපාන නම් මහත් හැළිවල කිරි පුරවා ලිප තබා සණ ව පිසුණු කල්හි පිසින ලද මී සකුරුසුණු ගිතෙලින් අනන ලද භෝජනය වෙයි. මිනිස්සු පමණක් භික්‍ෂූන් වහන්සේ වැළඳවීමට නො හැකි වූහ. දෙවියෝ ද අතරට පිවිස වැළඳූහ. දොළොස් කෙළක් භූමිය ද භික්‍ෂූන් වහන්සේට ප්‍රමාණවත් නො වීය. උන් වහන්සේලා තමන්ගේ ඍද්ධි බලයෙන් වැඩ සිටියහ. අවසන් දිනයෙහි සියලු භික්‍ෂූන්ගේ පාත්‍ර සෝදා බෙහෙත් පිණිස ගිතෙල්, වෙඬරු, මීපැණි ආදිය පුරවා තුන් සිවුරු සමග පූජා කළහ. සංඝ නවක භික්‍ෂූව විසින් ලද චීවර වස්ත්‍රය ලක්‍ෂයක් වටිනේ විය. බුදු රජාණෝ අනුමෝදනා කරන්නහු, මේ මහා පුරුෂයා මෙබඳු මහා දානයක් දෙන්නේ, කවරකු වන්නේදැ යි බලන්නාහු, දෙඅසංඛ්‍යය කල්ප ලක්‍ෂයකින් මතුයෙහි ගෞතම නමින් බුදුවන බව දැක මහා පුරුෂයන් අමතා ඔබ මෙතෙක් කාලයක් ඉක්ම ගිය පසු ගෞතම නමින් බුදු වන්නෙහි යි විවරණය කළහ. බෝසතාණෝ විවරණය අසා මම අනාගතයෙහි බුදු වන්නෙමි. එසේ නම් මට ගිහි ගෙයින් ඇති ප්‍රයෝජනය කුමක් ද ? පැවිදි වන්නෙමි යි සිතා ඒ තරම් මහත් වූ සැපත කෙළ පිඩක් මෙන් හැර බුදු රජුන් වෙත පැවිදි ව බුද්ධ වචනය උගෙන අභිඥා සහ සමාපත්තීන් උපදවා ආයු කෙළවර බඹ ලොව උපන්හ.

මංගල බුදු රජුන්ගේ නගරය උත්තර නම් විය. උත්තර උත්තරා දෙදෙන මව්පියෝ වූහ. සුදෙව් ධම්මසේන යන තෙරවරු දෙඅග

සච්චෝ වූහ. පාලිත තෙරහු උපස්ථායක වූහ. සීවලී අශෝකා දෙතෙරණියෝ අග්‍ර ශ්‍රාවිකා වූහ. නා රුක බෝධිය විය. ශරීරයේ උස ප්‍රමාණය අටඅසූ රියනක් විය. අනූ දහසක් වැඩ සිට පිරිනිවි කල්හි දශ දහසක් සක්වල එකවර ම ඝනාන්ධකාරය විය. සියලු සක්වල මිනිස්සු එක පැහැර හැඬූහ.

> "කොණ්ඩඤ්ඤ බුදු රජුන්ට මෑත භාගයෙහි මංගල නම් බුදු රජුන් ලෝකයෙහි මෝහාන්ධකාරය නසා දහම් නැමැති ප්‍රදීපය දැරූහ."

දශ දහසක් ලෝක ධාතු අඳුරු කොට පිරිනිවි මංගල බුදු රජුන්ට මෑත භාගයෙහි සුමන බුදු රජාණෝ ලොව පහළ වූහ. උන් වහන්සේට ද ශ්‍රාවක සමාගම් තුනකි. ප්‍රථම සමාගමෙහි කෙළ ලක්‍ෂයකි. කඤ්චන පර්වතයෙහි දෙවැනි සමාගමෙහි අනූ කෙළ දහසකි. තෙවැන්නෙහි අසූ කෙළ දහසකි. එදවස බෝසතාණෝ මහත් සෘද්ධි ආනුභාව ඇති අතුල නම් නාග රාජ ව උපන්හ. ඔහු බුදු රජුන් ලොව උපන්හැ යි අසා ඥාති සමූහයා පිරිවරා නාග භවනයෙන් නික්ම කෙළ ලක්‍ෂයක් භික්‍ෂූන් පිරිවරන ලද බුදු රජුන්ට දිව්‍යමය තූර්ය නාදයෙන් උපහාර දක්වා මහදන් දී වෙන වෙන ම පිළි සඟල දී සරණයෙහි පිහිටියේය. ඒ බුදු රජාණෝ ද මොහු අනාගතයෙහි බුද්ධත්වය ලබන බව ප්‍රකාශ කළහ. ඒ බුදු රජුන්ගේ නගරය ඛේම නම් විය. සුදත්ත රජ පිය වූයේය. සිරිමා දේවිය මව් වූවාය. සරණ සහ භාවිතත්ත තෙරවරු අගසව් වූවෝය. උදේන තෙරණුවෝ උපස්ථායක වූහ. සෝණා සහ උපසෝණා යන තෙරණියෝ අග්‍ර ශ්‍රාවිකා වූහ. නා ගස බෝධිය විය. ශ්‍රී ශරීරයේ උස අනූ රියනකි. ආයු කාලය වසර අනූ දහසකි.

> "මංගල බුදු රජුන්ට මෑත භාගයෙහි සියලු ධර්මයන්හි අසම වූ සියලු සත්ත්වයන්ට උතුම් වූ සුමන බුදු රජහු ලොව පහළ විය."

ඒ බුදු රජුන්ට මෑත භාගයෙහි රේවත නම් බුදු රජාණෝ පහළ වූහ. උන් වහන්සේට ද ශ්‍රාවක සන්නිපාත තුනකි. ප්‍රථමයෙහි

ගණනෙහි ප්‍රමාණයක් නැත. දෙවැන්නෙහි කෙළ ලක්‍ෂයක් භික්‍ෂූහු වූහ. තෙවැන්නෙහි ද එපමණ මය. බෝසතාණෝ අතිදේව නම් බ්‍රාහ්මණයකුව ඉපිද බුදු රජුන්ගෙන් දහම් අසා සරණ ශිලයෙහි පිහිටා හිසෙහි ඇඳලි බැඳ ඒ බුදු රජුන්ගේ කෙළෙස් ප්‍රහානය පිළිබඳ ගුණ වණමින් උතුරු සළුවෙන් පූජා කොට සිටියේය. ඒ බුදු රජහු ද මොහු මතු බුදු වන බව වදාළහ. ඒ බුදු රජුන්ගේ නගරය ධඤ්ඤවතී නම් විය. විපුල නම් රජ පියා විය. විපුලා නම් දේවිය මව වූවාය. වරණ, බ්‍රහ්මදේව තෙරවරු අග සව් වූහ. සම්භව තෙරණුවෝ උපස්ථායක විය. භද්‍රා සහ සුභද්‍රා තෙරණියෝ අග්‍ර ශ්‍රාවිකා වූහ. නාග වෘක්‍ෂය බෝධිය විය. ශ්‍රී ශරීරය අසූ රියනක් උස් විය. ආයු ප්‍රමාණය හැට දහසකි.

"සුමන බුදු රජුන්ට මෑත භාගයෙහි ලොවට නායක උපමා කළ නො හැකි සම කෙනකු නො දක්විය හැකි මැනීමෙන් දක්විය නො හැකි ගුණ ඇති රේවත බුදු රජාණෝ ලොව පහළ වූහ."

ඒ බුදු රජුන්ට මෑත භාගයෙහි ශෝභිත නම් බුදු රජාණෝ පහළ වූහ. උන් වහන්සේට ද ශ්‍රාවක සමාගම් තුනක් විය. පළමු සමාගමෙහි කෙළ සියයක් ශ්‍රාවකයෝ වූහ. එදවස බෝසතාණෝ අජිත බ්‍රාහ්මණ නමින් ඉපිද බුදු රජුන්ගෙන් බණ අසා බුදු රජුන් ප්‍රමුඛ භික්‍ෂු සංඝයාට මහදන් දුන්නේය. ඒ බුදු රජහු ද මතු බුදු වන්නේයැ යි විවරණ දුන්හ. ඒ බුදු රජුන්ගේ නගරය සුධම්ම නම් විය. පියා සුධම්ම නම් රජ වූයේය. මව සුධම්මා නම් වූවාය. අසම සහ සුනෙත්ත තෙරවරු අග සව් වූහ. අනෝම තෙරණුවෝ උපස්ථායක වූහ. නකුලා හා සුජාතා තෙරණියෝ අග සැවියෝ වූහ. නාග වෘක්‍ෂය බෝධිය විය. ශ්‍රී ශරීරය අටපණක් රියනක් විය. අනූ දහසක් ආයු ප්‍රමාණය විය.

"තෙවන බුදු රජාණන්ට මෑත භාගයෙහි ලෝක නායක,
සමාධියෙන් යුත්, සන්සුන් සිත් ඇති, සමාන වෙනත්
අයකු නැති ශෝභිත බුදු රජාණෝ ලොව පහළ වූහ."

උන් වහන්සේට අපර භාගයෙහි කල්ප අසංඛ්‍යයක් ඉක්ම ගිය

පසු එක් පසෙක අනෝමදස්සී, පදුම, නාරද නමින් බුදුන් වහන්සේ තෙනමක් පහළ වූහ. අනෝමදස්සී භාග්‍යවතුන් වහන්සේට සංඝ සන්නිපාත තුනක් විය. පළමු සන්නිපාතයෙහි ශ්‍රාවකයන් අට ලක්‍ෂයකි. දෙවැන්නෙහි සත් ලක්‍ෂයකි. තෙවැන්නෙහි සය ලක්‍ෂයකි. එකල බෝසතාණෝ මහත් ඍද්ධි මහත් ආනුභාව ඇති කෙළ ලක්‍ෂයක් යක්‍ෂයින්ට අධිපති යක්‍ෂ සේනාධිපතියකු ව ඉපිද බුදු රජුන් උපන්නේයැ යි අසා බුදු රජුන් වෙත පැමිණ මහදන් පැවැත්වීය. ඒ බුදු රජාණෝ ද මොහු අනාගතයෙහි බුදු වන්නේයැ යි විවරණ දුන්හ. අනෝමදස්සී බුදු රජුන්ගේ නගරය චන්දවතී නම් විය. යසවා නම් රජ පිය විය. යසෝදරා දේවිය මව වූවාය. නිසභ සහ අනෝම තෙරවරු අග සව්වෝය. වරුණ තෙරණුවෝ උපස්ථායක වූහ. සුන්දරී, සුමනා තෙරණියෝ අග සැව්යෝ වූහ. කුඹුක් ගස බෝධි විය. බුදු සිරුරෙහි උස අටසතස් රියනකි. ආයු ප්‍රමාණය වසර ලක්‍ෂයකි.

> "ශෝභිත බුදු රජුන්ට මෑත භාගයෙහි දෙපා ලාභීන්ගෙන් උතුම් වූ, පමණ කළ නො හැකි, කීර්ති හා තෙද ඇති, නො මැඩිය හැකි අනෝමදස්සි බුදු රජාණන් ලොව පහළ වූහ."

උන් වහන්සේට මෑත භාගයෙහි පදුම බුදු රජාණෝ ලොව පහළ වූහ. පදුම බුදු රජාණන්ට ශ්‍රාවක සන්නිපාත තුනකි. ප්‍රථමයෙහි කෙළ ලක්‍ෂයකි. දෙවැන්නෙහි තුන් ලක්‍ෂයකි. තුන් වැන්නෙහි ගමෙන් ඈත් වූ ආරණ්‍යය වාසී ශ්‍රාවකයෝ දෙලක්‍ෂයක් වූහ. පදුම බුදු රජාණෝ ඒ ඝන වනයෙහි වැඩ වසන කල්හි බෝසතාණෝ සිංහ යෝනියෙහි ඉපිද, නිරෝධ සමාපත්තියට සමවන් බුදු රජුන් දැක පැහැදුණු සිතින් වැඳ පැදකුණු කොට මහත් ප්‍රීතියෙන් තෙවරක් සිංහ නාද පවත්වා සත් දිනක් බුද්ධාලම්භන ප්‍රීතිය අත් නො හැර ප්‍රීති සැපයෙන් ම ගොදුරු පිණිස ද නො ගොස් විසුවෝය. බුදු රජුන්ට පූජා කොට ළඟ ම සිටියහ. බුදු රජාණන් වහන්සේ සත් දිනක් ඇවෑමෙන් සමාධියෙන් නැඟී සිටි සේක්, සිංහයා දැක සංඝයා කෙරෙහි ද සිත පහදවා වඳිතැ යි සංඝයා පැමිණීමට ඉටූහ. එකෙණෙහි ම සංඝයා ද වැඩියහ. සිංහයා සංඝයා කෙරෙහි ද සිත පහදවා ගත්තේය. බුදු රජාණෝ ඔහුගේ චිත්ත සත්කාරය බලා අනාගතයෙහි බුද්ධත්වය ලබන්නේ යි විවරණ දුන්හ. පදුම බුදු රජුන්ගේ නගරය චම්පක නම් විය. අසම හා අසමා රජ සහ දේවිය මව්පියෝ වූහ.

සාල, උපසාල තෙරවරු අගසව් වූහ. වරුණ තෙරණුවෝ උපස්ථායක වූහ. රාමා, සුරාමා තෙරිණියෝ අග සැවියෝ වූහ. මූණමල් ගස බෝධිය විය. බුදු සිරුර අටපණස් උස විය. ආයු කාලය වසර ලක්‍ෂකි.

"අනෝමදස්සි බුදු රජුන්ට මැත භාගයෙහි දෙපා ලාභීන් ගෙන් උත්තම වූ, ප්‍රති පුද්ගලයෙක් නැති, එහෙයින් ම අසම වූ පදුම බුදු රජාණෝ පහළ වූහ."

ඒ භාග්‍යවතුන් වහන්සේට මැත භාගයෙහි නාරද බුදු රජාණන් වහන්සේට ශ්‍රාවක සමාගම් තුනක් විය. ප්‍රථමයෙහි කෙළ ලක්‍ෂයකි. දෙවන සමාගමෙහි නව කෝටියකි. තෙවැන්නෙහි අසූ කෝටියකි. එදවස බෝසතාණෝ තාපස පැවිද්දෙන් පැවිදි ව පංච අභිඥා, අෂ්ඨ සමාපත්ති ලාභී ව සිට බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට මහදන් දී හඳුන් පූජා කළහ. ඒ බුදු රජාණන් වහන්සේ බෝසතුන් අනාගතයෙහි බුදු වන බවට විවරණ දුන්හ. ඒ බුදු රජුන්ගේ නගරය ධඤ්ඤවතී නම් විය. සුදේව පිය රජ විය. මව අනෝමා නම් වූවාය. භද්දසාල ජිතමිත්ත තෙරවරු අග සව් වූහ. වාසෙට්ඨ තෙරණුවෝ උපස්ථායක වූහ. උත්තරා සහ එග්ගුණී තෙරණියෝ අග සැවියෝ වූහ. මුහුණමල් ගස බෝධි විය. බුදු සිරුර අටඅසූ රියනක් විය. ආයු කාලය අසූ දහසක් විය.

"පදුමු බුදු රජුන්ට පසු කාලයෙහි තමන් වහන්සේට සමාන කෙනෙක් නැති හෙයින් අසම හා අප්පටිපුද්ගල වූ, දෙපා ලාභීන්ට උත්තම වූ, නාරද නම් බුදුන් වහන්සේ පහළ වූ සේක."

නාරද බුදු රජුන්ට අපර භාගයෙහි මෙහි කල්ප ලක්‍ෂයකට පෙර කපෙක එක ම පදුමුත්තර බුදු රජුන් වහන්සේ පහළ විය. උන් වහන්සේට ද ශ්‍රාවක සමාගම් තුනක් විය. පළමු වැන්නෙහි කෙළ ලක්‍ෂයකි. දෙවැන්න වෙභාර පර්වතයෙහි විය. ඒ අසූ කෙළ දහසකි. තුන් වැනි සමාගමෙහි අසූ කෝටියකි. එකල්හි බෝසත්හු ජටිල නම් ප්‍රදේශාධිපතියෙක් වී බුදුපාමොක් මහ සඟනට තිචීවර තුන් සිවුරු පරිත්‍යාග කළෝය. උන් වහන්සේ අනාගතයෙහි බුදු වන බව ප්‍රකාශ කළ සේක. පදුමුත්තර බුදු රජුන් කල තීර්ථකයෝ නො වූහ. සියලු

දෙව් මිනිස්සු, බුදුන් වහන්සේ ම සරණ ගියහ. උන් වහන්සේගේ නගරය හංසවතී නම් විය. ආනන්ද රජ පියා වූයේය. මව සුජාතා නම් වූවාය. මංගල හා සුජාත තෙරවරු අග සව් වූහ. සුමන තෙරණුවෝ උපස්ථායක වූහ. අස්බා සහ අමිතා තෙරණියෝ අග සැවියෝ වූහ. සල් ගස බෝධි වෘක්ෂය විය. බුද්ධ ශරීරය අසූ අට රියන් විය. ශරීරාලෝකය දොළොස් යොදුනක් විය. ආයු ප්‍රමාණය ලක්ෂයක් විය.

"නාරද බුදුන් වහන්සේට අපර භාගයෙහි දෙපා ලාභීන්ගෙන් උතුම් වූ නො මැඩිය හැකි සාගරයට උපමා ගුණ ඇති පදුමුත්තර බුදු රජාණන් වහන්සේ ලොව පහළ වූ සේක."

පදුමුත්තර බුදුන් වහන්සේගෙන් පසු කල්ප තිස් ලක්ෂයක් ඉක්ම ගිය පසු සුමේධ, සුජාත නමින් බුදුන් වහන්සේලා දෙනමක් එක ම කපෙක උපන්හ. සුමේධ බුදු රජුන්ට සමාගම් තුනකි. ප්‍රථමයෙහි සුදස්සන නගරයෙහි කෙළ සියයක් රහතන් වහන්සේ සිටියහ. දෙවැන්නෙහි අනූ කොටියකි. තුන් වැන්නෙහි අසූ කෝටියකි. එදවස බෝසත්හු උත්තර නම් මානවකයෙක් වී නිධාන කොට තිබූ අසූ කෙළක් ධනය වියදම් කොට බුදුපාමොක් මහා සඟනට දන් දී දහම් ඇති සරණෙහි පිහිටා ගිහිගෙන් නික්ම පැවිදි විය. උන් වහන්සේ ද බුදු වන්නේ යි විවරණ දුන්හ. සුමේධ බුදුන් වහන්සේට සුදස්සන නම් නගරයක් විය. සුදත්ත නම් රජ පියා විය. මව සුත්තා දේවිය වූවාය. සරණ, සබ්බකාම දෙදෙනා වහන්සේ අග සව් වූහ. සාගර තෙරණුවෝ උපස්ථායක වූහ. රාමා, සුරාමා තෙරණියෝ අග සැවියෝ වූහ. බක්මී ගස බෝධිය විය. ශ්‍රී සරීරය අටඅසූ රියනක් උස් විය. ආයු ප්‍රමාණය වසර අනූ දහසක් විය.

"පදුමුත්තර බුදුන් වහන්සේට අපර භාගයෙහි ළංවිය නො හැකි මහත් තෙද ඇති, සකල ලෝකයට ම උතුම්, ලොවට නායක සුමේධ නම් මුනීන්ද්‍රයන් වහන්සේ උපන්හ."

සුමේධ බුදුන් වහන්සේට පසු කාලයේ සුජාත නම් බුදුන්

වහන්සේ ලොව උපන්හ. උන් වහන්සේට ද ශ්‍රාවක සමාගම් තුනකි. ප්‍රථමයෙහි භික්ෂූන් සැට දහසකි. දෙවැන්නෙහි පනස් දහසකි. තුන් වැන්නෙහි සතලිස් දහසකි. එදවස බෝසතාණෝ සක්විති රජ ව බුදු රජුන් උපන් බව අසා එළැඹ දහම් අසා සත් රුවන් සමග සතර මහා දිවයිනට ම අධිපති රාජ්‍යය ද බුදුපාමොක් මහා සඟනට දන් දී බුදු රජුන් සමීපයෙහි පැවිදි වූහ. සියලු රට වැසියෝ අය බදු ගෙන ආරාමයෙහි වතාවත් කරමින් බුදුන් ප්‍රමුඛ මහා සංඝයාට මහදන් දුන්හ. ඒ සුජාත බුදුන් වහන්සේ ද අනාගතයෙහි බුදු වන බව ප්‍රකාශ කළහ. ඒ බුදු රජුන්ගේ නගරය සුමංගල නම් විය. උග්ග නම් රජ පියා විය. පභාවතී දේවිය මව වූවාය. සුදස්සන හා දේව දෙදෙනා වහන්සේ අගසව් වූහ. නාරද තෙරණුවෝ උපස්ථායක වූහ. නාගා සහ නාගසමාලා තෙරණිවරු අග සැවියෝ වූහ. මහා උණ ගස බෝධිය විය. මේ වෘක්ෂය කුඩා සිදුරකින් යුත් මහත කඳකින් යුත් මොණර පිල් කලඹක් මෙන් අතු විහිදී ගිය ගසකි. ඒ බුදු රජුන්ගේ ශ්‍රී ශරීරය පණස් රියනක් උස විය. ආයු කාලය වසර අනූ දහසකි.

> "බුදුවරුන් දෙදෙනකු උපදිනා එම මණ්ඩ කල්පයෙහි ම සිංහයෙක් බඳු හණු (හකු) ඇති, වෘෂභයෙක් බඳු කඳ ඇති, ප්‍රමාණ කළ නො හැකි ගුණ ඇති, ළං විය නො හැකි තෙද ඇති සුජාත නම් බුදුන් වහන්සේ ලොව උපන්හ."

එයින් මෑත භාගයෙන් කල්ප අටළොස් සියයක් මතුයෙහි එක ම කපෙක පියදස්සී, අත්ථදස්සී, ධම්මදස්සී නමින් බුදුන් වහන්සේ තෙනමක් පහළ වූහ. පියදස්සී බුදුන් වහන්සේට ශ්‍රාවක සමාගම් තුනක් විය. ප්‍රථමයෙහි කෙළ ලක්ෂයකි. දෙවැනි සමාගමෙහි අනූ කෙළක් ශ්‍රාවකයෝ සිටියහ. තෙවැන්නෙහි ශ්‍රාවකයෝ අසූ දහසක් වූහ. එදවස බෝසතාණෝ කස්සප නමින් ඉපිද ත්‍රිවේදයේ පරතෙරට ගියෝ, බුදුන් වහන්සේගෙන් දහම් අසා කෙළ ලක්ෂයක් ධන පරිත්‍යාගයෙන් සංඝාරාමයක් කැරවා සරණ සිල්හි පිහිටියෝය. ඉක්බිති, බුදුන් වහන්සේ කප් අටළොස් සියයක් ඇවෑමෙන් බුදු වන්නාහුයැ යි විවරණය කළහ. ඒ බුදුන් වහන්සේට අනෝම නම් නගරය විය. සුදින්න නම් රජ පියා විය. චන්‍ද්‍රා දේවිය මව වූවාය. පාලිත සහ සබ්බදස්සී තෙරවරු අගසව් වූහ. ශෝභිත තෙරණුවෝ උපස්ථායක වූහ. සුජාතා සහ ධම්මදින්නා තෙරණියෝ අග සැවියෝ වූහ. පුවඟු රුක බෝධි විය. ශ්‍රී ශරීරය

අසූ රියනක් උස් විය. අනූ දහසක් ආයු කාලය විය.

> "සුජාත බුදුන් වහන්සේට අපර භාගයෙහි තමා විසින් ම මුළු ලොව දත්, ළං විය නො හැකි තෙද ඇති, අසම වූ බුදුවරුන්ට සම වූ, මහත් කීර්ති ඇති පියදස්සි නම් බුදුන් වහන්සේ ලොව පහළ වූහ."

පියදස්සි බුදු රජුන්ට අපර භාගයෙහි අත්ථදස්සි නම් බුදුන් වහන්සේ ලොව පහළ වූහ. උන් වහන්සේට ද ශ්‍රාවක සමාගම් තුනකි. ප්‍රථමයෙහි අටඅනූ ලක්‍ෂයක් ශ්‍රාවකයෝ වූහ. දෙවැන්නෙහි අටඅසූ ලක්‍ෂයකි. තෙවැන්නෙහි ද එපමණය. එදවස බෝසතාණෝ සුසීම නම් මහත් සෘද්ධි ඇති තවුසෙක් වී දෙව්ලොවින් මදාරා මල් සතක් බුදුන් වහන්සේට පූජා කළහ. ඒ බුදුන් වහන්සේ ද බෝසතාණන් මතු බුදු වන බව ප්‍රකාශ කළහ. උන් වහන්සේගේ නගරය ශෝභිත නම් විය. සාගර නම් රජ පියා විය. මව සුදස්සනා නම් වූවාය. සන්ත සහ උපසන්ත තෙරවරු අග සව් වූහ. අභය තෙරණුවෝ උපස්ථායක වූහ. ධම්මා සහ සුධම්මා තෙරණියෝ අග සැව්යෝ වූහ. සපු වෘක්‍ෂය බෝධිය විය. ශ්‍රී ශරීරය අසූ රියනක් උස විය. උන් වහන්සේගේ ශරීරාලෝකය හැම කල්හි යොදුනක් පමණ පැතිරිණි. ආයු කාලය වසර ලක්‍ෂයකි.

> "එම මණ්ඩ කල්පයෙහි ම මිනිසුන්ට ශ්‍රේෂ්ඨ වූ අත්ථදස්සී බුදුන් වහන්සේ මෝහාන්ධකාරය නසා උතුම් බුද්ධත්වයට පැමිණියහ."

අත්ථදස්සි බුදුන් වහන්සේට මෑත භාගයෙහි ධම්මදස්සී බුදුන් වහන්සේ ලොව පහළ වූහ. උන් වහන්සේට ද ශ්‍රාවක සමාගම් තුනකි. කෙළ සියයක්, සත්තෑ කෙළක්, අසූ කෙළක් පිළිවෙලින් සමාගම් රැස්වූහ. එදවස බෝසතාණෝ සක් දෙව් රජ ව ඉපිද දිව මල් සුවඳින් හා සංගීතයෙන් පූජා කළෝය. උන් වහන්සේ ද බෝසතුන්ට විවරණ දුන්හ. උන් වහන්සේට සරණ නම් නගරය විය. සරණ රජ හා සුනන්දා දේවිය මව්පියෝ වූහ. අගසව් වූවෝ පදුම සහ ඵුස්සදේව තෙරුවරුය. අග සැව්යෝ ඛේමා සහ සබ්බසාමා තෙරණියෝය. රත්කරව් ගස බෝධිය විය. එය බිම්බිජාල ගස්යැ යි ද කියති. ශ්‍රී

ශරීරය අසූ රියනක් උස් විය. ලක්‍ෂයක් වසර ආයු විය.

"එම මණ්ඩ කල්පයෙහි ම මහත් කීර්ති ඇති ධම්මදස්සි බුදුන් වහන්සේ ලොව පහළ වූහ. උන්වහන්සේ මෝහාන්ධකාරය නසා දෙවියන් සහිත ලෝකයෙහි බැබලුණහ."

ධම්මදස්සි බුදුන් වහන්සේට මෑත භාගයෙහි එක් කපෙක එක ම සිද්ධාර්ථ බුදුන් වහන්සේ ලොව පහළ වූහ. උන් වහන්සේගේ ශ්‍රාවක සමාගම් තුනෙකි. කෙළ ලක්‍ෂයක්, අනූ ලක්‍ෂයක්, අසූ ලක්‍ෂයක් ශ්‍රාවකයෝ වූහ. එදවස බෝසතාණෝ මහත් තෙද බල ඇති අභිඥා බලයෙන් යුත් මංගල නම් තාපසයෙක් ව මහත් අඹ ඵලයක් ගෙනවුත් බුදුන් වහන්සේට පූජා කළහ. අඹ ඵලය වැළඳූ බුදුන් වහන්සේ බුද්ධත්වය පිණිස විවරණ දුන්හ. උන් වහන්සේගේ නගරය වේභාර නම් විය. ජයසේන රජ හා සුඵස්සා දේවිය මව්පියෝ වූහ. අගසව් වූවෝ සම්බහුල සහ සුමිත්ත තෙරවරුය. රේවත තෙරණුවෝ උපස්ථායක වූහ. සීවලී සහ සුරාමා තෙරණියෝ අග සැවියෝය. කිණිහිරි ගස බෝධිය විය. ශ්‍රී ශරීරය හැට රියනක් උස විය. ආයු කාලය ලක්‍ෂයකි.

"ධම්මදස්සී බුදුන් වහන්සේට අපර භාගයෙහි අහස් මැදට පත් හිරු ගණඳුර නසන්නාක් මෙන් මොහඳුර නසා සිද්ධාර්ථ බුදුන් වහන්සේ ලොව පහළ වූසේක."

සිද්ධාර්ථ බුදුන් වහන්සේට මෑත භාගයෙහි මෙයින් දෙඅනු කපකට පසු එක ම කපෙක තිස්ස හා ඵුස්ස නමින් බුදුවරු දෙනමක් පහළ වූහ. තිස්ස බුදු රජුන්ගේ ශ්‍රාවක සමාගම් තුනකි. පිළිවෙලින් කෙළ සියයක්, අනූ කෙළක්, අසූ කෙළක්, ශ්‍රාවකයෝ රැස්වූහ. එදවස බෝසතාණෝ මහත් ධනය ඇති, මහත් කීර්ති ඇති සුජාත නම් ක්‍ෂත්‍රියෙක් ව ඉපිද තාපස පැවිද්දෙන් පැවිදි ව මහත් ආනුභාව ඇත්තෙක් බවට පත් ව බුදු රජුන් උපන් බව අසා දිව මදාරා පියුමක් ද පරසතු මල් ද සිව් පිරිස් මැද වඩින බුදු රජුන්ට පූජා කළහ. එම මල් අහසෙහි මල් වියනක් මෙන් පිහිටියේය. ඒ බුදුන් වහන්සේ ද එයින් අනූ කපකට පසු බුදු වන බවට විවරණ දුන්හ. ඒ බුදුන්ගේ

නගරය ඛේම නම් විය. ජනසන්ධ රජ හා පදුමා දේවිය මව්පියෝ වූහ. අගසව් වූවෝ බ්‍රහ්මදේව සහ උදය යන තෙරවරුය. සම්භව තෙරණුවෝ උපස්ථායක වූහ. ඵුස්සා හා සුදත්තා තෙරණියෝ අග සැවියෝ වූහ. පියා ගස බෝධි විය. බුදු සිරුර සැට රියනක් විය. ආයු කාලය ලක්‍ෂයක් විය.

> "සිද්ධාර්ථ බුදු රජුන්ට මෑත කාලයෙහි තමා හට සමාන පුද්ගලයෙක් නැති, ශීලයෙන් හා යසසින් අනන්ත වූ තිස්ස නම් බුදුන් වහන්සේ පහළ වූහ."

තිස්ස බුදුන් වහන්සේට අපර භාගයෙහි ඵුස්ස බුදුන් වහන්සේ පහළ වූහ. උන් වහන්සේගේ ශ්‍රාවක සමාගම් ත්‍රයට පිළිවෙලින් සැට දහස, පණස් දහස, දෙතිස් දහස වශයෙන් ශ්‍රාවකයෝ සිටියහ. එකල බෝසතාණෝ විජතාවි නම් ක්‍ෂත්‍රියව ඉපිද මහා රාජ්‍යය හැර පැවිදි ව තුන් පිටකය ඉගෙන මහජනයාට දහම් දෙසූහ. ශීල පාරමිතාව ද පිරූහ. ඒ බුදුන් වහන්සේ ද බෝසතුන්ට විවරණ දුන්හ. උන් වහන්සේට කාසි නම් නගරය විය. ජයසේන රජ හා සිරිමා දේවිය මව්පියෝ වූහ. සුරක්ඛිත සහ ධම්මසේන තෙරවරු අගසව් වූහ. සභිය තෙරණුවෝ උපස්ථායක වූහ. චාලා සහ උපචාලා තෙරණියෝ අග සැවියෝ වූහ. නෙල්ලි ගස බෝධිය විය. බුදු සිරුර අටපණස් රියන් විය. ආයු කාලය වසර අනූ දහසකි.

> "එම මණ්ඩ කල්පයෙහි ම ලොවට නායක, බුදුවරුන්ට සම වූ, උපමා කළ නො හැකි ගුණ ඇති, දෙව් මිනිසුන්ට අනුශාසක වූ, තමාට වඩා උසස් පුද්ගලයෙක් නැති ඵුස්ස බුදුන් වහන්සේ ලොව පහළ වූහ."

ඵුස්ස බුදුන් වහන්සේට අපර භාගයෙහි මෙයින් එක් අනූ කපෙහි විපස්සී බුදුන් වහන්සේ ලොව පහළ වූහ. උන් වහන්සේගේ ශ්‍රාවක සමාගම් තුනකි. පිළිවෙලින් අටසැට ලක්‍ෂයක්, ලක්‍ෂයක්, අසූ දහසක් ශ්‍රාවකයෝ වූහ. එදවස බෝසතාණෝ මහත් ඍද්ධි හා ආනුභාව ඇති අතුල නම් නා රජ ව කැටයම් කළ රන්මුවා පුටුවක් පූජා කළහ. ඒ බුදු රජාණෝ ද මෙයින් එක් අනූ කපෙහි බුදු වන්නේයැ යි විවරණ දුන්හ. ඒ බුදු රජුන්ට බන්ධුමතී නම් නුවර විය.

බන්ධුමා රජ හා බන්ධුමතී දේවිය මව්පියෝ වූහ. ඛණ්ඩ හා තිස්ස තෙරවරු අගසව් වූහ. අශෝක තෙරණුවෝ උපස්ථායක වූහ. චන්ද්‍රා, චන්දමිත්තා තෙරණියෝ අග සැවියෝ වූහ. පළොල් රුක බෝධිය විය. බුදු සිරුර අසූ රියනක් විය. ශරීර ප්‍රභාව හැම කල්හි සත් යොදුන් පැතිර සිටියේය. ආයු ප්‍රමාණය අසූ දහසක් විය.

"ඵුස්ස බුදුන් වහන්සේට මෑත භාගයෙහි සම්බෝධියට පැමිණි, දෙපා ලාභීන්ගෙන් ශ්‍රේෂ්ඨ වූ, සියල්ල දත් විපස්සී නම් බුදුන් වහන්සේ ලොව උපන්හ."

විපස්සී බුදුන් වහන්සේට අපර භාගයෙහි එක ම කපෙක සිඛී සහ වෙස්සභූ යන බුදුන් වහන්සේලා දෙනමක් උපන්හ. සිඛී බුදුන් වහන්සේට ද ශ්‍රාවක සමාගම් තුනකි. පිළිවෙලින් ලක්‍ෂය, අසූ දහස, සැත්තෑ දහසක් වූ ශ්‍රාවකයෝ රැස්වූහ. එදවස බෝසතාණෝ අරින්දම නම් රජෙක් ව බුදුපාමොක් මහ සඟනට සිවුරු සහිත මහදන් පවත්වා සත් රුවනින් සැරසූ හස්තියා ද රත්නය ද ඇතෙක් පමණට ම කැප භාණ්ඩ ද පූජා කළහ. උන් වහන්සේ ද බෝසතුන් එයින් එක් තිස් වැනි කල්පයෙහි බුදු වන බව ප්‍රකාශ කළහ. ඒ බුදු රජුන්ට අරුණවතී නම් නුවර විය. අරුණ රජ හා පභාවතී දේවිය මව්පියෝ වූහ. අභිභූ සම්භව තෙරවරු අගසව් වූහ. ඛේමංකර තෙරණුවෝ උපස්ථායක වූහ. මඛිලා සහ පදුමා තෙරණියෝ අග්‍ර ශ්‍රාවිකා වූහ. ඇටඹ ගස බෝධි විය. බුදු සිරුර තිස්හත් රියනක් විය. ශරීර ප්‍රභාව තුන් යොදුනක් පැතිරී පැවැතිණි. ආයු ප්‍රමාණය වසර සත්තිස් දහසකි.

"විපස්සී බුදුන් වහන්සේට අනතුරු ව තමාට වඩා උසස් පුද්ගලයෙක් නැති, දෙපා ලාභීන්ට අග්‍ර වූ සිඛී නම් බුදුන් වහන්සේ ලොව පහළ වූහ."

සිඛී බුදුන් වහන්සේට අනතුරු ව වෙස්සභූ බුදුන් වහන්සේ ලොව පහළ වූහ. අසූ ලක්‍ෂය, සැත්තෑ ලක්‍ෂය, සැට ලක්‍ෂය වශයෙන් උන් වහන්සේගේ ශ්‍රාවක සමාගම් තුන පැවැතිණි. මේ සමයෙහි බෝසතාණෝ සුදස්සන නම් රජ ව බුදුපාමොක් මහසඟනට සිවුරු සහිත මහදන් දී බුදුන් වෙත පැවිදි ව සිරිත් විරිත් ගුණයෙන් යුත් බුද්ධ රත්නය විෂයයෙහි අතිසය ගෞරවාදරයෙන් යුක්ත වූවෝ, ප්‍රීති

බහුල ව විසූහ. ඒ බුදුන් වහන්සේ ද එක් තිස් වැනි කපෙහි දී බුදු වන බවට විවරණ දුන්හ. ඒ බුදු රජුන්ට අනූපම නම් නුවර විය. සුප්පතීත රජ සහ යසවතී බිසව මව්පියෝ වූහ. සෝණ සහ උත්තර තෙරවරු අගසව් වූහ. උපසන්ත තෙරණුවෝ උපස්ථායක වූහ. දාමා සහ සමාලා තෙරණියෝ අග සැවියෝ වූහ. සල් ගස බෝධි විය. බුදු සිරුර සැට රියන් විය. ආයු කාලය සැට දහසකි.

"එම මණ්ඩ කල්පයෙහි ම අසම වූ, සමාන කෙනකු නැති, වෙස්සභූ නම් බුදුන් වහන්සේ ලොව උපන්හ."

වෙස්සභූ බුදු රජුන්ට අපර භාගයෙහි මේ භද්‍ර කල්පයෙහි බුදුවරු සතර නමක් පහළ වූහ. කකුසඳ, කෝණාගම, කස්සප යන බුදුවරු සහ අප ගෞතම බුදුන් වහන්සේය. කකුසඳ බුදුන් වහන්සේට එක ම ශ්‍රාවක සමාගමක් විය. එහි සතලිස් දහසක් ශ්‍රාවකයෝ වූහ. එදවස බෝසතාණෝ ඛේම නම් රජ ව ඉපිද බුදුපාමොක් මහසඟනට පාසිවුරු සහිත මහා දානයක් ද අඳුන් ආදී බෙහෙත් ද දී බුදු දහම අසා පැවිදි වූහ. උන් වහන්සේ ද බුදු වන බව ප්‍රකාශ කළහ. ඒ බුදු රජුන්ට ඛේම නම් නුවර විය. අග්ගිදත්ත නම් බමුණා ද විශාඛා නම් බැමිණිය ද මව්පියෝ වූහ. විධුර සහ සංජීව තෙරවරු අගසව් වූහ. බුද්ධිජ තෙරණුවෝ උපස්ථායක වූහ. සාමා සහ චම්පකා තෙරුණියෝ අග සැවියෝ වූහ. මහරි ගස බෝධි විය. බුදු සිරුර සතළිස් රියනකි. ආයු කාලය සතළිස් දහසකි.

"වෙස්සභූ බුදු රජුන්ට අපර භාගයෙහි දිපදුත්තම වූ, පමණ කළ නො හැකි ගුණ ඇති, ළංවිය නො හැකි තෙද ඇති කකුසඳ නම් බුදුන් වහන්සේ ලොව පහළ වූහ."

කකුසඳ බුදුන් වහන්සේට අනතුරුව කෝණාගමන බුදුන් වහන්සේ පහළ වූහ. උන් වහන්සේට එක ම ශ්‍රාවක රැස්වීමකි. එහි තිස් දහසක් ශ්‍රාවකයෝ වූහ. එකල බෝසතාණෝ පබ්බත නම් රජ ව ඇමැති ජනයා පිරිවරා බුදු රජුන් වෙත එළැඹ මහදන් පවත්වා පත්තුණ්ණ දේශයේ පිළි, චීන දේශයේ පිළී, තිහිර් පිළි, එම ලොම් ආදියෙන් කළ කම්බල, දුහුල් වස්ත්‍ර, රන් කම් කළ ආස්තරණ ද පූජා

කොට බුදු රජුන් සමීපයෙහි පැවිදි විය. උන් වහන්සේ ද බෝසතුන්ට විවරණ දුන්හ. ඒ බුදු රජුන්ගේ නුවර සෝභවතී නම් විය. යඤ්ඤදත්ත බමුණා සහ උත්තරා බැමිණිය මව්පියෝ වූහ. භීයස සහ උත්තර තෙරණුවෝ අගසව් වූහ. සොත්ථිජ නම් තෙරණුවෝ උපස්ථායක වූහ. සමුද්දා සහ උත්තරා තෙරණියෝ අග සැවියෝ වූහ. දිඹුල් රුක බෝධිය විය. සිරුර තිස් රියනක් උස් විය. ආයු ප්‍රමාණය තිස් දහසකි.

> "කකුසඳ බුදු රජුන්ට අපර භාගයෙහි සියල්ල දත්, ලොවට දෙටු වූ, මිනිසුන් අතරෙහි උතුම් වූ, දෙපා ලාභීන්ට ශ්‍රේෂ්ඨ වූ කෝණාගමන බුදුන් වහන්සේ පහළ වූහ."

කෝණාගමන බුදු රජුන්ට අපර භාගයෙහි කස්සප බුදුන් වහන්සේ පහළ වූහ. උන් වහන්සේගේ එක ම ශ්‍රාවක සමාගමයෙහි විසි දහසක් ශ්‍රාවකයෝ වූහ. එදවස බෝසතාණෝ ජෝතිපාල මානවක ව ත්‍රිවේදයේ පරතෙරට ගොස් මිනිස් ලොව පමණක් නොව දෙව් ලොව ද පහළ වූ කුඹල් කරු සමග මිත්‍ර විය. හේ තම යහළුවා සමග බුදුන් වෙත ගොස් දහම් අසා පැවිදි ව උත්සාහවත් ව තුන් පිටකය උගෙන සිරිත් විරිත්වලින් යුක්ත වූවෝ, සසුන බැබළවූයේය. ඒ බුදු රජුන්ගේ ජාත නගරය බරණැස විය. බ්‍රහ්මදත්ත නම් බමුණු තෙමේ පියා විය. ධනවතී නම් බැමිණිය මව වූවාය. තිස්ස සහ භාරද්වාජ තෙරවරු අගසව් වූහ. සබ්බමිත්ත තෙරණුවෝ උපස්ථායක වූහ. අනුලා සහ උරුවෙලා තෙරණියෝ අග සැවියෝ වූහ. නුග රුක බෝධිය විය. බුදු සිරුර විසි රියනකි. ආයු කාලය වසර විසි දහසකි.

> "කෝණාගමන බුදුන් වහන්සේට මෑත භාගයෙහි දෙපා ලාභීන්ගෙන් අති ශ්‍රේෂ්ඨ වූ, අඳුර දුරු කැරෙන්නා වූ, ධර්ම රාජ වූ කස්සප බුදුන් වහන්සේ ලොව පහළ වූහ."

යම් කල්පයක දීපංකර බුදුන් වහන්සේ ලොව පහළ වූ සේක් ද, එම කල්පයෙහි ම තවත් බුදුවරු තෙනමක් වූහ. උන් වහන්සේලාගෙන් අප බෝසතුන්ට විවරණ නො ලැබිණි. මෙහි දී උන් වහන්සේලා නො දක්වන ලද්දේ එහෙයිනි. අටුවාවෙහි එම කපෙහි පහළ වූ සියලු බුදුවරයන් වහන්සේලා දැක්වූහ.

උන් වහන්සේලා නම්,

"තණ්හංකර, මේධංකර, සරණංකර, දීපංකර, කොණ්ඩඤ්ඤ, මංගල, සුමන, රේවත, ශෝභිත, අනෝමදස්සී, පදුම, නාරද, පදුමුත්තර, සුමේධ, සුජාත, පියදස්සී, අත්ථදස්සී, ධම්මදස්සී, සිද්ධාර්ථ, තිස්ස, ඵුස්ස, විපස්සී, සිඛී, වෙස්සභූ, කකුසන්ධ, කෝණාගමන, කස්සප යන බුදුවරයන් වහන්සේලා ලොව පහළ වූහ. සූර්යයා මෙන් ගණ අඳුර නසා ගිනි කඳක් මෙන් බැබළුනාහු, ශ්‍රාවකයන් සහිත උන් වහන්සේලා පිරිනිවියහ."

අප බෝසතාණෝ දීපංකර බුදු රජුන් ආදී සූවිසි බුදුවරුන් හමුවෙහි පෙරුම් පුරමින් සාරාසංඛ්‍යය කල්ප ලක්‍ෂයක් පැමිණියහ. කස්සප බුදු රජුන්ගෙන් මෑත භාගයෙහි ගෞතම බුදු රජුන් හැර තවත් බුදුවරයෙක් නැත. මෙසේ දීපංකර ආදී සූවිසි බුදුවරයන්ගෙන් විවරණ ලැබූ බෝධි සත්ත්වයෝ බුද්ධත්වයක් සඳහා ද,

"මිනිසත් බව, පුරුෂයකු වීම, රහත් වීමට පෙර පින් ඇති බව, බුදුන් වහන්සේ නමක් හමුවීම, පැවිද්දකු වීම, ධ්‍යාන ලබා තිබීම, ප්‍රාර්ථනාව, අධික කැමැත්ත යන අෂ්ඨ ධර්මයන් එක්වීම ඇති කල්හි ප්‍රාර්ථනා ඉටුවේය."

මෙකී අෂ්ඨ ධර්මයන් සම්පූර්ණ කොට දීපංකර බුදු රජුන්ගේ පාමුල කරන ලද ප්‍රාර්ථනා ඇති බෝසතාණෝ, ඒකාන්තයෙන් මම බුද්ධ කාරක ධර්ම සොයමි යි, උත්සාහත් ව එසේ බුද්ධ කාරක ධර්ම සොයන්නේ, මම ප්‍රථමයෙන් දාන පාරමිතාව දුටුවෙමි යි, දානාදී බුද්ධ කාරක ධර්ම දුටුවේ ද, එතැන් සිට ඒ පාරමීන් පුරමින් වෙස්සන්තර අත්බව දක්වා පැමිණියෝය. මේ ගමන් මඟෙහි, බුදු බව ප්‍රාර්ථනා කැරෙමින් පෙරුම් දම් පුරණ බෝසත්වරුන්ට අත්විඳින්ට ලැබෙන ආනිශංස මෙසේ වර්ණනා කොට තිබේ.

"මෙසේ අෂ්ඨ ධර්ම ආදී සියලු අංග සම්පූර්ණ කොට බුද්ධත්වයට නියත විවරණ ලත් බෝසත්වරු කල්ප කෝටි

සියගණන් සංඛ්‍යා දීර්ඝ මාර්ගයෙහි සැරිසරන අතර අවීචි මහා නිරයෙහි නො උපදිත්. එසේ ම සක්වල තුනක් අතරෙහි ඇති වන ලොකාන්තර නිරයෙහි ද සාපිපාසා දෙකින් පීඩිත වූ නිජ්ඣාම තණ්හා නම් ප්‍රේත යෝනියෙහි ද කාලකඤ්ජන නම් අසුර යෝනියෙහි ද නො උපදිත්. තිරිසන් දුගතියෙහි ඉපදුන ද වටුවකුට කුඩා සතෙකු ව නො උපදිත්. ඒ බෝසත්වරු මිනිසත් භවයෙහි උපදනා කල්හි උපතින් අන්ධයෝ නො වෙති. එසේ ම බිහිරි ව හා ගොළු ව නො උපදිත්. එසේ ම ස්ත්‍රී භාවයට නො යත්. පුමඉතිරි දෙලකුණු ඇති උභතො බ්‍යඤ්ජන ව ද නපුංසකව ද එම වර්ගවලට ඇතුළත්ව ද නො වෙත්. සම්බෝධියට නියත වූ බෝසත්වරු ආනන්තරීය පාප කර්මයෙන් මිදුනාහු වෙත්. කර්මවාදී, ක්‍රියාවාදී, සම්දුටු දකුම් ඇති බෝසත්වරු මිසදුටුවෝ නො වෙත්. සුගති ලොව උපන්න ද අසඤ්ඤ නම් බඹලොව නො උපදිත්. සුද්ධාවාස බඹලොව ඉපදීමට හේතු නොමැත්තේ අනගැමි නො වන බැවිනි. ඥාණයට නැඹුරු වූ කුදුමහත් භවයන්හි නො ඇළුණු බෝසත්වරු පෙරුම් දම් පුරමින් ලෝකර්ථ චරියාවෙහි හැසිරෙත්."

අප බෝසතාණෝ මේ ආනිශංස ලබමින් ම සසර සැරසැරූහ. එසේ ම අකිත්ති බ්‍රාහ්මණ කල, සංඛ බ්‍රාහ්මණ කල, ධනංජය රජ කල, මහා සුදස්සන කල, මහා ගොවින්ද කල, නිමි මහා රජ කල, චන්ද කුමාර කල, විසය්හ සිටු කල, සිවි රජ කල, වෙස්සන්තර කල ආදී දාන පාරමිතාව පිරූ අත්බැව් ප්‍රමාණයක් නැත.බෝසතාණන් සසපණ්ඩිත ජාතකයෙහි සස හෙවත් හා යෝනියෙහි ඉපිද දාන පාරමිය පිරූ අයුරු,

"ආහාර සොයා තමා වෙත බමුණු වෙසින් පැමිණි සක් දෙවිඳුට සිය සිරුර පිරිනැමීය. දානයෙන් මා හා සමාන කෙනකු නැත. මේ මගේ දාන පාරමිතාවයි."

සිය ජීවිතය පරිත්‍යාග කැරෙන බෝසතුන්ගේ මේ දාන

පාරමිතාව දාන පරමත්ථ පාරමිතා නම් විය. එසේ ම සීලව නා රජ කල, චම්පෙය්‍ය නා රජ කළ, භූරිදත්ත නා රජ කල, ඡද්දන්ත නා රජ කල, ජයද්දිස රජ කල, අලීනසත්තු කුමාර කල ආදී ශීල පාරමිතාව පිරූ අත්බැව් ප්‍රමාණ නැත. ඒකාන්තයෙන් ම සංඛපාල ජාතකයෙහි ශීල පාරමිතාව පිරූ අයුරු,

"හුල්වලින් සිරුර විදින කල්හි ද අඩයටිවලින් කොටන කල්හි ද වැදි පුත්‍රයන් කෙරෙහි මම නො කිපීමි. මේ මගේ ශීල පාරමිතාවයි."

මෙසේ ජීවිතය පරිත්‍යාග කිරීම ශීල පරමත්ථ පාරමිතා නම් විය. එසේ ම සෝමනස්ස කුමාර කල, හත්ථිපාල කුමාර කල, අයෝඝර පණ්ඩිත කල මහා රාජ්‍යයන් අත්හැර නෙක්ඛම්ම පාරමිතාව පිරූ අත්බැව් ගණන් නැත. විශේෂයෙන් චූලසුතසෝම ජාතකයෙහි නෙක්ඛම්ම පරමත්ථ පාරමිතාව පිරූ අයුරු,

"අතට පත් මහා රාජ්‍යයන් මම කෙළ පිඬක් මෙන් ඉවත දැමීමි. එසේ ඉවත දමන මට ඒ පිළිබඳ ඇලීමක් ඇති නො වීය. මේ මගේ නෙක්ඛම්ම පාරමිතාවයි."

ඇලීමක් නැති බැවින් රාජ්‍යයන් අත්හැර නික්මෙන බෝසතුන්ගේ නෙක්ඛම්ම පරමත්ථ පාරමිතා නම් විය. එසේ ම, විධුර පණ්ඩිත කල, මහා ගෝවින්ද පණ්ඩිත කල, කුද්දාල පණ්ඩිත කල, අරක පණ්ඩිත කල, බෝධි පරිබ්බාජක කල, මහෞෂධ පණ්ඩිත කල ආදී පඤ්ඤා පාරමිතාව පිරූ ආත්ම භාව ප්‍රමාණ නැත. විශේෂයෙන් සත්තුභස්ත ජාතකයෙහි පඤ්ඤා පාරමිතාව පිරූ අයුරු,

"මම මගේ නුවණින් විමසා දුකට පත් බමුණා එම දුකින් මිදවීමි. නුවණින් මා හා සමාන කෙනකු නැත. මේ මාගේ පඤ්ඤා පාරමිතාවයි."

පසුම්බිය ඇතුළත සිටි නාගයා ගෙන හැර දැක්වූ පාරමිතාව, පඤ්ඤා පරමත්ථ පාරමිතා නම් විය. එසේ ම විරිය පාරමිතා ආදී

අනෙක් පාරමිතාවන් පිරූ ආත්ම භාව ප්‍රමාණ කළ නො හැක. විශේෂයෙන් මහා ජනක ජාතකයෙහි විරිය පරමත්ථ පාරමිතාව පිරූ අයුරු,

"පරතෙර නො පෙනෙන මහමුහුද මැද මා සමග සිටි සියලු මිනිස්සු මළහ. පරතෙරට යා නො හැකියැ යි දෙගිඩියාවක් මා සිත නො වීය. මේ මගේ වීරිය පාරමිතාවයි."

මෙසේ මහමුහුද තරණය කිරීමේ විරිය පාරමිතාව, විරිය පරමත්ථ පාරමිතාවයි. ඛන්තිවාද ජාතකයෙහි,

"කාසි රජ, මා සිත් නැති මළ සිරුරක් මෙන් තියුණු මුවහත් පොරොවෙන් කොටන කල්හි ඔහු කෙරෙහි නො කිපියෙමි. මේ මගේ ඛන්ති පාරමිතාවයි."

මෙසේ අචේතනිකයකු මෙන් මහා දුකක් විඳි බෝසතුන්ගේ පාරමිතාව, ඛන්ති පරමත්ථ පාරමිතාවයි. මහ සුතසෝම ජාතකයෙහි,

"මගේ ජීවිතය පරිත්‍යාග කොට සත්‍යය වචනය ආරක්ෂා කැරෙමින් එකසිය එකක් රජුන් මරණයෙන් මුදාලීය. මේ මගේ පරමත්ථ සත්‍යය පාරමිතාවයි."

මෙසේ ජීවිතය අත්හැර සත්‍යය වචනය ආරක්ෂා කිරීම සච්ච පරමත්ථ පාරමිතා විය. මූගපක්ඛ ජාතකයෙහි,

"මව්පියෝ මට අප්‍රිය වූවෝ නො වෙති. මහා සම්පත් ද මට අප්‍රිය නො වේ. බුද්ධත්වය මට ප්‍රියයි. එම නිසා දැඩි ව්‍රත අධිෂ්ඨාන කැර ගතිමි."

මෙසේ ජීවිතය ද අත්හැර බලවත් අධිෂ්ඨානයෙන් ව්‍රත ශීල ආරක්ෂා කිරීම අධිෂ්ඨාන පරමත්ථ පාරමී නම් විය. ඒකරාජ

ජාතකයෙහි,

"මා දුක කිසිවෙක් බය නො වන්නෝය. මම ද කිසිවකු දැක බය නො වෙමි. මෛත්‍රී බලයෙන් ශක්තිමත් වූ මම හැම කල්හි මහා වනයෙහි සතුටින් වෙසෙමි."

මෙසේ ජීවිතය ද නො බලා මෛත්‍රී වඩන බෝසතුන්ගේ පාරමිතාව මෙත්තා පරමත්ථ පාරමී නම් විය. ලෝමහංස ජාතකයෙහි,

"මම මිණී ඇට පොදියක් හිස කොට්ටය කොට තබාගෙන සොහොනෙහි සැතපෙමි. ගොපළු දරුවෝ අවුත් විවිධ කෙළ ගැසීම්, උසුළු විසුළු ආදී විරූප දර්ශන කරත්."

මෙසේ ගම්දරුවෝ සමහරු කෙළ ගැසීම් ආදිය කරද්දීත් සමහරු සුවඳ මල් ආදියෙන් උපහාර කරද්දීත් ඔවුන් කෙරෙහි මැදහත් බව නො ඉක්මවීම, බෝසතුන්ගේ උපේක්ෂා පරමත්ථ පාරමිතාව විය.

මේ දැක්වූයේ සංක්ෂේපයෙනි. මෙහි විස්තර චරියා පිටකයෙන් ගත යුතුයි. මෙසේ පෙරුම් පුරා වෙස්සන්තර භවයෙහි සිටි බෝසතාණෝ,

"සිත්පිත් නැති, සැපදුක් දැනීම් නැති, මහපොළොව පවා මාගේ දාන පාරමිතා බලයෙන් සත් වරක් කම්පා විය."

මෙසේ පොළොව කම්පා කරන මහා පින් කොට බෝසතාණෝ ආයු කෙළවර වෙසතුරු අත් බැවින් චුත ව තුසිත පුරයෙහි උපන්හ. මෙතෙක් දීපංකර පාද මූලයෙහි සිට තුසිත පුර ඉපදීම දක්වා පැවැති කථා පුවත දූරේ නිදාන නැමැයි දත යුතුයි.

දූරේ නිදානය නිමි.

බෝසතුන් තුසිත දෙව් ලොව වසන කල්හි බුදුන් වහන්සේ පහළ වීම පිළිබඳ ආන්දෝලනය ඇති විය. ලෝකයෙහි ආන්දෝලන තුනකි. කල්පය විනාශ වීමේදී ඇතිවන ආන්දෝලනය, බුදුන් වහන්සේ නමක් පහළ වීමේදී ඇතිවන ආන්දෝලනය, සක්විති රජ කෙනකු පහළ වීමේදී ඇතිවන ආන්දෝලනය වශයෙනි. ලෝක විනාශයට වසර ලක්ෂයක් තිබිය දී ලෝකබ්‍යුහ නම් කාමාවචර දෙවියෝ හිස කෙස් විසුරුවා හැඬූ මුහුණින් යුතුව අතින් කඳුළු පිසමින් රතු වස්ත්‍ර හැඳ ඉතා අප්‍රියජනක වෙස් ධරමින් මිනිසුන් අතර හැසිරෙමින් මෙසේ දන්වත්. නිදුකාවරුනි, මෙයින් වසර ලක්ෂයක් ඇවෑමෙන් ලෝක විනාශය වන්නේය. මහමුහුද සිඳී යන්නේය. මේ පොළොව හා මහා මේරු පර්වත රාජයා දැවී විනාශ වන්නේය. නිදුකාවරුනි, මෛත්‍රිය වඩව්. පීඩිතයන් කෙරෙහි දයාව දක්වව්. සුඛිතයන් කෙරෙහි සතුටු වව්. ලෝක ධර්මයෙහි මැදහත් වව්. නිදුකාවරුනි, මව්පියන්ට උවටැන් කරව්. කුල දෙටුවන්ට ගරු කරව්. මේ ලෝක විනාශයේ ආන්දෝලනයයි. බුදුන් වහන්සේ ලොව පහළ වීමට වසර ලක්ෂයක් තිබියදී ලෝක පාලක දෙවිවරු, නිදුකාවරුනි, මෙයින් ලක්ෂයක් අවුරුදු ගත වූ පසු බුදුන් වහන්සේ ලොව පහළ වන්නේයැ යි ඝෝෂා කැරෙමින් ලොව ඇවිදිත්. මේ බුද්ධ ආන්දෝලනයයි. සක්විති රජ ලොව පහළ වීමට සියවසක් තිබියදී දෙවියෝ, ජනයිනි, මෙයින් සියවසක් ගිය පසු සක්විති රජෙක් පහළ වන්නේයැ යි ඝෝෂා කැරෙමින් ඇවිදිත්. මේ සක්විති ඝෝෂණයයි.

මේ ත්‍රිවිධ ඝෝෂණ ඉතා මහත් වෙයි. මෙයින් බුද්ධ ඝෝෂණය ඇසූ දෙවියෝ එක්රැස් ව අසවල් සත්ත්වයා බුදු වන්නේයැ යි නියම වශයෙන් දැන ඔහු වෙත එළැඹ ආයාචනා කරත්. එසේ කරන්නේ ද පෙර නිමිති පහළ වූ පසුය. එක එක සක්වලට අයත් චතුර්මහාරාජ, සක්ක, සුයාම, සන්තුසිත, පරනිර්මිත වසවර්ති වැසි දෙවියෝ මහා බ්‍රහ්මයන් සමග එක් සක්වලකට රැස්වී තුසිත භවනයෙහි වෙසෙන බෝසතුන් වෙත ගොස් නිදුකාණෙනි, ඔබ විසින් දශ පෙරුම් දම් පුරන ලද්දේ, ශක්‍ර සම්පත්, මාර, බ්‍රහ්ම, සක්විති සම්පත් ආදීය සඳහා නො වේ. හුදෙක් ලෝකයා සසරින් එතැර කිරීමට බුද්ධත්වය පතමින් පුරන ලද්දේය. නිදුකාණෙනි, දැන් ඔබට බුදු බව සඳහා කාලය යි අයැද සිටියහ.

ඉක්බිති, බෝසතාණෝ දෙවියන්ට ප්‍රතිඥා නො දී කාලය,

දීපය, දේශය, කුලය, මව, ආයු කාලය යන පස් මහ බැලුම් බැලූහ. එහි දී පළමු කොට කාලය බැලූහ. මනුෂ්‍යය ආයුෂ ලක්‍ෂයකට වඩා වැඩි කාලය සුදුසු කාලය නො වේ. එකල්හි මිනිසුන්ට ඉපදීම, මහලු වීම, මරණය පිළිබඳ නො පෙනේ. බුදුවරුන්ගේ ධර්ම දේශනා අනිච්ච ආදී ත්‍රිලකුණෙන් නො මිදුනේ වෙයි. ඔවුහු ත්‍රිලකුණු නො හඳුනත්. එම නිසා තථාගත ධර්මය සැදැහැවෙන් ඇසිය යුතු දහමක් ලෙස නො සිතත්. එය ධර්මාවබෝධය පිණිස නො වේ. එම නිසා මේ සුදුසු කාලය නො වේ. වසර සියයට අඩු කාලය ද සුදුසු කාලය නො වේ. මක් නිසා ද යත්, එකල මිනිසුන්ට කෙළෙස් උත්සන්න වේ. කෙළෙස් උත්සන්න සත්ත්වයින්ට දෙන අවවාද සුදුසු සේ නො පිහිටයි. දියෙහි දඬුයෙන් ඇඳි ඉරක් මෙන් වහා අමතක වේ. එහෙයින් සිය වසින් අඩු කාලය ද සුදුසු කාලය නො වේ. මේ නිසා වසර ලක්‍ෂයට අඩු කාලයත් වසර සියයට වැඩි කාලයත් සුදුසු ආයු කාලය වේ. බෝසතුන් මෙලොව පහළ විය යුතු කාලය සියවස් ආයු කාලය බව දැනගත්හ. අනතුරු ව දීපය බලන බෝසතාණෝ පිරිවර දීප සහිත සතර මහාද්වීප බලා මහාද්වීප තුනෙක බුදුවරු නො උපදිති යි දැන ජම්බුද්වීපයෙහි ම උපදිය යුතුයැ යි දීපය දුටහ. දඹදිව වනාහි යොදුන් දශ දහසක් පමණය. කවර නම් පෙදෙසක සම්බුදුවරු උපදිත්ද යි ප්‍රදේශය බලන්නාහු, දඹදිව මධ්‍යම ප්‍රදේශය දුටහ. මධ්‍යම ප්‍රදේශය නම් පෙර දිගින් කජංගල නම් නියම් ගම විය. ඉන් ඔබ්බෙහි මහාසාල නම් විය. එතැන් පටන් ප්‍රත්‍යන්ත ජනපද හෙවත් පිටිසර ප්‍රදේශයි. එයින් මෑත මධ්‍යම ප්‍රදේශයයි. පුබ්බදක්ඛි දිශාවෙන් හෙවත් ගිනිකොණින් සළලවතී නම් ගඟ වෙයි. එතැන් සිට ප්‍රත්‍යන්ත ජනපදයි. ඉන් මෑත මධ්‍යම ප්‍රදේශයයි. දකුණු දිශාවෙහි සේතකණ්ණික නම් නියම්ගම වෙයි. එතැන් සිට ප්‍රත්‍යන්ත ජනපදයි. ඉන් මෑත මධ්‍යම ප්‍රදේශයයි. බටහිර දිසාවෙන් ථූන නම් බ්‍රාහ්මණ ගමයි. එතැන් සිට ප්‍රත්‍යන්ත ජනපදයයි. ඉන් මෑත මධ්‍යම ප්‍රදේශයයි. උතුරු දිශාවෙන් උසීරද්ධජ නම් පර්වතය වේ. එතැන් පටන් ප්‍රත්‍යන්ත ජනපදයයි. ඉන් මෑත මධ්‍යම ප්‍රදේශයයි. මේ විනයෙහි කියන ලද මධ්‍යම ප්‍රදේශයයි. එම ප්‍රදේශය දිගින් යොදුන් තුන්සියයකි. පළලින් දෙසිය පණස් යොදුනකි. වට ප්‍රමාණයෙන් නවසිය යොදුනකි. මේ දේශයෙහි බුදු, පසේබුදු, අගසව්, මහසව්, අසූමහසවු සහ සක්විති රජවරු ද අනෙක් මහේශාක්‍ය රජ, බමුණු, ගැහැවි ආදී ප්‍රභූ ජනයෝ ද උපදිත්. දැන් එහි කපිලවත්ථු නම් නුවරක් ඇත. මා එහි ඉපදිය යුතුයැ යි බෝසතාණෝ තීරණය කළහ. කුලය විමසන බෝසතාණෝ බුදුවරු වෙළඳ කුලයෙහි හෝ ශුද්‍ර ආදී හීන කුලයක නො උපදිත්.

උසස් වශයෙන් සම්මත රජ කුලයෙහි හෝ බමුණු කුලයෙහි උපදිත්. මෙකල රජ කුලය ලෝක සම්මතය. එම කුලයෙහි උපදිමි යි ද පියා ශුද්ධෝදන නම් රජ වන්නේයැ යි ද, කුලය දුටහ. අනතුරු ව මව බලන්නාහු, බුද්ධ මාතාවෝ කම් සැපතෙහි හෝ සුරාවෙහි ලොල් වූවාහු නො වෙති. කප් සුවහසක් පිරූ පාරමී ඇත්තාහු වෙත්. උපතෙහි පටන් නො කැඩූ පන්සිල් ඇත්තාහු වෙත්. මේ මහාමායා දේවි තොමෝ ද එම අංග සපුරා සිටින්නෝය. එතුමිය මාගේ මව වන්නේයැ යි ද දේවීන්ගේ ආයුෂ ද දස මස් සත් දිනක් බව ද දුටහ.

මෙසේ මේ පඤ්ච මහා විලෝකනය කොට නිදුකාණෙනි, මේ බුදු බවට කාලය යි, රැස්වූ දෙවියන්ට සංග්‍රහ කැරෙමින් ප්‍රතිඥා දී දෙවියන් යවා තුසිත පුර දෙවියන් පිරිවරා ගෙන නන්දන වනයට පිවිසියහ. සියලු දිව්‍යය ලෝකයන්හි ම නන්දන වනයක් තිබේ. දෙවියෝ, එහි දී බෝසතුන්ට පින්වත, මෙයින් චුත ව සුගතියට හෙවත් මිනිස් ලොවට යන්නැ යි, පෙර කළ කුසල කර්ම විපාක අවස්ථාව සිහි කැරෙවමින් හැසිරෙත්. මේ අතර බෝසතාණෝ දෙව් ලොවින් චුත ව මහාමායා දේවියගේ කුසෙහි පිළිසිඳ ගත්හ.

මේ සිද්ධිය ප්‍රකට කිරීම සඳහා මේ අනුපිළිවෙල කථාවයි. එදා කපිල වත්ථු පුරයෙහි ඇසළ නැකත් ක්‍රීඩා පැවැත්විණි. මහජනයා නැකැත් කෙළි පවත්වයි. මායා දේවිය පුන් පොහොයට පෙර සත් දිනක පටන් මදු පානයෙන් තොර මල්ගඳ විලවුන් හා සැරසීමෙන් අලංකෘත වූ නැකැත් කෙළි විඳින්නී, සත් වැනි දින අළුයම නැඟිට සුවඳ පැන් නා සාර ලක්‍ෂයක් වියදම් කොට මහදන් දී සර්වාභරණයෙන් සැරසී රස බොජුන් වළඳා උපෝසථ ශීලය සමාදන්ව අලංකාර සිරියහන් ගැබට පිවිස නිදන්නී, මේ සිහිනය දුටුවාය.

සතරවරම් මහරජවරු සැතපී සිටි යහන සමග ම ඔසවා හිමවත් පෙදෙසට ගෙනගොස් සැට යොදුන් පමණ රත් ගල් තලාවක තැබූහ. සත් යොදුන් මහ සල් ගසක් යට තබා ඉවත් ව සිටියහ. ඉක්බිති, ඔවුන්ගේ දේවිවරු අවුත් මායා දේවිය අනෝතප්ත විලට ගෙනගොස් මිනිස් මළ හරනු පිණිස නහවා දිව්‍යමය වස්ත්‍ර හඳවා සුවඳ උළා දිවමල් පළඳවා ඒ ළඟ තිබුණු රිදී පර්වතය තුළ රන් විමනෙහි පෙර දිගට හිසලා පනවන ලද දිව යහනෙහි සැතපවූහ.

එකෙණෙහි ම බෝසතාණන් සුදු උතුම් ඇත් හිසක් ගෙන ඒ ළඟ තිබුණු රන් පව්වෙහි සැරිසරා එයින් බැස පව්වට නැග උතුරු දිශාවෙන් අවුත් රිදී මල් දමක් බඳු හොඬින් සුදු වන් නෙළුම් මලක් ගෙන කුඤ්චනාද කොට රන් විමනට පිවිස මව සිටි යහනය තෙවරක් පැදකුණු කොට මවගේ දකුණු ඇළය ස්පර්ග කොට කුස තුළට පිවිසියාක් මෙන් විය. මෙසේ බෝසතාණෝ උතුරුසළ නැකතින් පිළිසිඳ ගත්හ.

පසුදින පිබිදුණු දේවිය මේ සිහිනය රජුට සැළකළාය. රජ සූසැටක් බමුණු පඬිවරුන් රජ මැඳුරට කැඳවා කොල පැහැයෙන් පිරිබඩ කළ විළඳ ආදියෙන් මංගලශ්‍රීයෙන් යුත් බිම මහඟු අසුන් පණවා එහි හුන් බමුණන්ට ගිතෙල් මී ආදියෙන් මිශ්‍ර වූ රසවත් කිරිබත් රන්, රිදී පාත්‍ර පුරවා රන්, රිදී බඳුනින් ම වඩා දුන්හ. තවත් අළුත් වස්ත්‍ර හා කිඹුල් වන් දෙනුන් ද දී ඔවුන් සතුටු කළේය. මෙසේ කැමැති දේ ලැබීමෙන් තෘප්තිමත් වූ බමුණන්ට හීනය සැළ කොට කුමක් වන්නේදැ යි ඵල විපාක විමසූහ. බමුණෝ මෙසේ කීහ. මහරජ නො සැළෙනු. ඔබ දේවියගේ කුසෙහි දරු ගැබක් පිහිටියේය. ඒ පිරිමි දරු ගැබකි. ස්ත්‍රී ගැබක් නො වේ. ඔබට පුතෙක් උපදින්නේය. ඔහු ගිහි ගෙයි වසන්නේ නම් සක්විති රජෙක් වන්නේය. ඉඳින් ගිහි ගෙන් නික්ම පැවිදි වන්නේ නම් කෙළෙස් පියසි දුරු කළ බුදු වන්නේය.

බෝසතුන් මව් කුසෙහි පිළිසිඳ ගත් කෙනෙහි ම එකවර දශ දහසක් සක්වල කම්පා විය. සෙළවිණි. වෙවුළිනි. දෙතිස් පෙර නිමිති පහළ විණි. දශ දහසක් සක්වල මහත් ආලෝකයක් පැතිරිණි. ඒ බෝසතුන්ගේ රූසපුව දකින්නට මෙන් අන්ධයෝ ඇස් ලැබූහ. බිහිරෝ ශබ්ද ඇසූහ. ගොළුවෝ කථා කළහ. කුදු අයගේ කුදු ගතිය නැති විය. පිල්හු දෙපයින් ගමන් කළහ. සිරගත අය එයින් මිදුණහ. සියලු අපායන්හි ගිනි නිවිණි. ප්‍රේත යෝනියෙහි සා පිපසා සංසිඳිණි. තිරිසන් සතුන්ට බයක් නො වීය. සියලු සත්ත්වයන්ගේ ම රෝග සුව විය. සියලු සත්ත්වයෝ ම ප්‍රිය තෙපුල් ඇත්තෝ වූහ. අශ්වයෝ මිහිරි හඬින් හේසාරව නාද කළහ. ඇත්තු කුංච නාද කළහ. සියලු තූර්යය භාණ්ඩ සිය නාද මුදා හළහ. මිනිසුන් පැළඳ සිටි ආභරණ එකිනෙක නො ගැටීම නාද විය. සියලු දිශා පැහැපත් විය. හැමදෙනාට ම සුව ගෙන දෙන සේ සිනිඳු සිසිල් වාතය හැමීය. අකල් වැසි නො වට,

පොළොවෙන් ජල ධාරා නැඟී ගලා ගියේය. පක්ෂීහු අහස් ගමන අත්හළහ. ඇල දොළ ගංගා නතර විය. මුහුදු ජලය මිහිරි විය. ගොඩ බිම සැමතැන පස්වන් මලින් වැසිණි. එකෙණෙහි ගොඩ බිම සියලු මල් පිපිණි. ගස් කඳෙහි පිපෙන මල් ද අතුවල පිපෙන මල් ද වැල්වල පිපෙන මල් ද ක්‍ෂණයෙහි පිපිණි. පොළොවෙහි ගල්තලා බිඳ එක එකක් මත්තෙහි සත සත සිටින සේ දණ්ඩපද්ම පිපිණි. අහසෙහි එල්බෙන පියුම් ද පිපිණි. හාත්පස මල් වරුෂා වැටිණි. අහසෙහි දිව්‍යය තූර්යය වාදනය විය. දශ දහසක් සක්වල වට කොට තබන ලද මල් ගුලියක් මෙන් ද තද කොට බඳින ලද මල් කළඹක් මෙන් ද අලංකාර කොට සාදන ලද මල් අසුනක් මෙන් ද එක ම මල් මාලාවක් මෙන් ද පොපියන් මල් විදුනාවක් මෙන් ද මල් සුවඳින් හා දුම් සුවඳින් සුවඳවත් ව අතිසය ශෝභාවෙන් අග තැන්පත් විය.

මෙසේ පිළිසිඳ ගත් බෝසතුන්ට හා බෝසත් මවට උවදුරු වැළක්වීම සඳහා කඩුගත් අත් ඇති ව දිව්‍යය පුත්‍රයෝ සතර දෙනෙක් ආරක්‍ෂාවට සිටියහ. බෝසතුන්ගේ පිළිසිඳ ගැනීමෙන් පසු බෝසත් මවට පුරුෂයන් කෙරෙහි අනුරාග සිතක් නො උපදී. ලාබයෙන් හා යසසින් අග තැන්පත් වූවාය. සැපවත් ව ගිලන් නො වූ සිරුරින් යුක්ත වූවා, කුස හොත් බෝසතුන් මිණි රුවනක ඇමිණූ පඬුවන් නූලක් මෙන් දකින්නීය. බෝසතුන් පිළිසිඳ ගත් මව් කුස සෑයක ඇතුල් ගැබ මෙන් පවිත්‍රය. වෙනත් සත්ත්වයකුට එම කුස තුළ පිළිසිඳ ගැනීමට හෝ විසීමට නො හැකිය. එම නිසා බෝසතුන් ඉපදී සත් දවසක් ගත වූ කල්හි බෝසත් මව කළුරිය කොට තුසිත පුරයෙහි උපදී. එසේ ම වෙනත් මව්වරු දශ මසට නො පැමිණි ද ඉක්මවා ද හුනාහු ද හොත්නාහුද දරුවන් වදත්. බෝසත් මව්වරු එසේ නො වෙත්. බෝසත් මව දශ මසක් කුසෙහි දරා නැඟිට සිටියදී ම බෝසත් පුතු බිහි කරන්නීය. බෝධි සත්ත්ව මාතාවන් පිළිබඳ ධර්මතාවෝ වෙති.

මහා මායා දේවි තොමෝ පිරුණු තෙල් පාත්‍රයක් ගෙනයන්නාක් මෙන් කුසෙහි බෝසතුන් පරිහරණය කොට දශ මසක් ඇවෑමෙන් පිරිපුන් ගැබ ඇත්තී, ස්වකීය ඥාති ගෘහයට යනු කැමැත්තී, දේවයිනි, මම දේව්දහ නුවර සිය කුල ගෙදරට යනු කැමැත්තෙමි යි, සුදවුන් මහරජාණන්ට සැලකළාය. රජතුමා ද මැනවැ යි පිළිගෙන කිඹුල්වත් පුර සිට දෙව්දහ නුවර දක්වා මග සම කොට කෙසෙල්,

පුන්කලස්, කොඩි ආදියෙන් අලංකාර කැරෙවා දේවිය රන් සිවිකාවක හිඳුවා ඇමැතියන් දහසක් ලවා සවි කොට ඔසවා මහත් පිරිවරින් යැවීය. කිඹුල්වත් සහ දෙව්දහ දෙනුවරට ම පොදු වූ ලුම්බිනි වන නම් මඟුල් සල් උයනක් ඇත. එදවස එහි සල් ගස් මුල පටන් අතු අග දක්වා එක පැහැර සුපිපියේ විය. අතු අතරත් මල් අතරත් පස්වන් බමරු සමූහයා ද විවිධ කුරුළු රංචු ද මිහිරි හඬ විහිදුවමින් ඒ මේ අත හැසිරෙත්. සියලු ලුම්බිනි සල් උයන දෙව් ලොව චිත්‍රලතා වනය මෙන් ද මහානුභාව ඇති රජුගේ සුසැදූ අවන්හලක් මෙන් ද විය. දේවිය සල් වනය දුක එහි සිරි නරඹනු රිසි වූවාය. ඇමැතියෝ දේවිය රැගෙන මල් වනයට පිවිසියහ. එහි මංගල සල් ගස ළඟට ගොස් සල් අත්ත ගනු කැමැති වූවාය. සල් අත්ත මනාව නවන ලද වේබඩක් මෙන් නැමී දේවියගේ අතට පත්විය. ඕ තොමෝ අත දිගු කොට අත්ත අතින් අල්ලා ගත්තාය. එකෙණෙහි ම දේවියගේ විළිවාතය සෙළවිණි. පිරිවර ජනයා දේවිය තිරයකින් වට කොට ඉවත්විය. සුද්ධාවාස බ්‍රහ්මයෝ සතර දෙනෙක් රන් දැලකින් බෝසතුන් පිළිගෙන මව් ඉදිරියෙහි තබා දේවියනි, ප්‍රීතිවනු මැනවි. ඔබට මහා පිනැති පුතෙක් උපන්නේයැ යි කීහ. වෙනත් සත්ත්වයෝ මව් කුසින් බිහිවන කල පිළිකුල් අපවිත්‍ර දෙයින් තැවරී බිහිවෙත්. බෝසත්වරු එසේ නො වෙත්. බෝසතාණෝ වනාහි ධර්මාසනයෙන් බසින ධර්ම කථිකයෙක් මෙන් ද හිනි මඟකින් බස්නා පුරුෂයෙක් මෙන් ද දෙඅත් දෙපා දිගු කොට නැඟී සිටියේ ම මව් කුසට අයත් කිසි අපවිත්‍ර දෙයකින් නො තැවරී පිරිසිදු ව පැහැදිලි ව කසී වස්ත්‍රයක තබන ලද මැණිකක් මෙන් බබලමින් මව් කුසින් නික්මුනහ. එසේ වුව ද බෝසතුන්ට ද බෝසත් මවට ද උවටැන් පිණිස අවටින් දිය දහර දෙකක් නික්ම බෝසතුන්ගේ ද බෝසත් මවගේ ද සිරුරෙහි සිසිල් බව ඇති කළේය.

ඉක්බිති, බෝසතුන් රන් දැලින් පිළිගෙන සිටි බ්‍රහ්මයන්ගේ අතින් සතර වරම් රජවරු මංගල සම්මත සුවපහස ඇති දෙතුන්පට කළ අඳුන් දිවි සමින් පිළිගත්හ. ඔවුන්ගේ අතින් මිනිස්සු දුහුල් පිළි සුඹුළුවකින් පිළිගත්හ. මිනිසුන්ගේ අතින් මිදුණු බෝසතාණෝ පොළොවෙහි සිට පෙරදිග බැලූහ. දහස් ගණන් සක්වල එක ම මිදුලක් මෙන් විය. එහි සිටි දෙව් මිනිස්සු මහා පුරුෂයාණෙනි, මෙහි ඔබ හා සමාන කෙනකු ද නැත. ඔබට වඩා උසස් කෙනකු කෙසේ ලැබෙයිදැ යි කීහ. මේ අයුරින් සිවු දිශා ද සිවු අනුදිශා ද යට දිශා

ද උඩ දිශා ද යන දශ දිශාව බලා තමා හා සමාන කෙනකු නො දැක උතුර දෙස බලා සත් පියවරක් ගමන් කළහ. මහබඹහු සේසත දරමින් ද සූයාම දෙව් පුත් මල් විදුනාව ද අනෙක් දෙවියෝ උණහිස ආදි සෙසු රාජ කුකුධ භාණ්ඩ ද දරමින් බෝසතුන් සමග ගමන් කළහ. සත් වැනි පියවරෙහි සිටි බෝසතාණෝ "මම ලොවට අග්‍ර වෙමි", ආදීනයින් සිංහ නාද කළහ.

බෝසතාණෝ ආත්ම භාව තුනක දී මව් කුසින් නික්මුණු ක්‍ෂණයෙහි ම බස් තෙපලූහ. එනම් මහෞෂධ අත්බැව්හි, වෙස්සන්තර අත්බැව්හි හා මෙම අත්බැව්හි දීය. මහෞෂධ අත්බැව්හි දී මව් කුසින් බිහිවෙත් ම සක් දෙව් රජ අවුත් හඳුන් හරයක් බෝසතුන් අත තබා ගියේය. ඔහු එය මිටෙහි තබාගෙන ම බිහිවූහ. මව, දරුව, මිටින් කුමක් රැගෙන ආවෙහිදැ යි විචාළාය. මෑණියනි, බෙහෙතක් රැගෙන ආවේයැ යි කීහ. ඖෂධ සැලියක බහා තබා පැමිණි අඳ බිහිරි ආදීන්ගේ රෝග සමනය සඳහා දුන්හ. මෙහි ඖෂධීය ගුණය මහත් බැවින් මහෞෂධ නාමය ව්‍යවහාර විණි. වෙසතුරු අත්බැව්හි බෝසත්හු මව් කුසින් බිහිවෙත් ම දකුණු අත දිගහැර මෑණියෙනි, දන් දෙනු කැමැත්තෙමි. දිය යුතු දෙයක් ගෙහි තිබේදැ යි කියමින් ම බිහිවූහ. ඒ ඇසූ මව දරුව, ඔබ පොහොසත් කුලයක උපන්නෙහි යි පුතුන් අත්ල තම අත්ලෙහි තබා දහසින් බැඳි පියල්ලක් පුතු අත තැබුවාය. මෙම අත්බැව්හි මව් කුසින් නික්මෙත් ම අභීත සිංහ නාද පැවැත්වූහ. මෙසේ බෝසත්හු තුන් අත්බැව්හි මව් කුසින් බිහිවෙත් ම වචන කථා කළහ.

බෝසතුන් මව් කුස පිළිසිඳ ගත් කෙණෙහි ම යම් සේ දෙතිස් පෙර නිමිති පහළ වී ද එසේ ම ඔවුන් උපන් කෙණෙහි ද පහළ විය. යම් දවසක අප බෝසතාණෝ ලුම්බිනි උයනේ දී උපන්නාහු ද, එදවස ම යශෝදරා දේවිය, ඡන්න ඇමැති, කාළුදායී ඇමැති, අජානීය හස්ති රාජයා, කන්ථක අශ්ව රාජයා උපන්හ. එසේ ම මහබෝ රුක ද සතර මහා නිධාන ද පහළ විය. නිධාන සතර ගව්ව, අඩ යොදුන, තුන් ගව්ව හා යොදුන යන ප්‍රමාණයෙන් යුක්ත විය. මෙකී සත සහජාත නමින් සැලකේ. දෙනුවර වැස්සෝ බෝසතුන් රැගෙන කිඹුල්වත් නුවරට ම ගියහ.

එදවස ම තවුතිසා වැසි දෙවියෝ කිඹුල්වත් පුර සුදොවුන්

මහරජුන්ට උපන් කුමරා බෝ මුල හිඳ බුදු වන්නේයැ යි සතුටු ව හිස වටා සළු සිසාරා ක්‍රීඩා පැවත්වූහ. ඒ වේලාවෙහි සුදොවුන් මහා රජුන්ගේ කුළුපග වූ අෂ්ඨ සමාපත්ති ලාභී කාලදේවල නම් තවුසාණෝ බත්කිස කොට තවුතිසා භවනට ගොස් දවල් කාලය ගත කරන්නාහු, සතුටින් ක්‍රීඩා කරන දෙවියන් දැක කුමක් නිසා ඔබ සතුටින් ක්‍රීඩා කරන්නහු ද, මට ඒ කරුණ කියනු මැනවැ යි ඇසූහ. නිදුකාණෙනි, සුදවුන් මහරජාණන්ට පුතකු උපණ. එතුමාණෝ බෝ මුල හිඳ බුද්ධත්වය ලබා දම්සක් පවත්වන්නාහ. එතුමාගේ බුද්ධ ශ්‍රීය දැකීමත් දහම් ඇසීමත් ලබන්නෙමු. මේ කාරණයෙන් අපි සතුටු වූවෝ වෙමු යි කීහ. දෙවියන්ගේ වදන් ඇසූ තවුසාණෝ වහා ම දෙව් ලොවින් බැස රජ මැඳුරට පිවිස පැනවූ අසුනෙහි වැඩ හිඳ මහරජ, ඔබට පුතකු උපන්නේ නො වේ ද ? ඔහු දකිනු කැමැත්තෙමි. රජ සුසැඳු කුමරුවන් ගෙන්වා තවුසාණන් වැඳවීමට අභිමුඛ කළේය. බෝසතුන්ගේ දෙපාදයෝ පෙරළී තවුසාණන්ගේ ජටා මඬුල්ලෙහි පිහිටියහ. එම අත්බැව්හි බෝසතුන් විසින් වැඳිය යුතු වෙනත් අයකු නැත්තේය. ඉදින් නො දැනීමෙන් බෝසතුන්ගේ හිස තවුසාණන්ගේ පාමුල තැබුවේ නම් ඔවුන්ගේ හිස සත් කඩකට පැළී යන්නේය. තවුසාණෝ නමස්කාර කළහ. රජ ද මේ අසිරිය දැක තම පුතුට වැන්දේය. තවුසාණෝ අතීතයෙන් කල්ප සතළිසක් ද අනාගතයෙන් කල්ප සතළිසක් ද වශයෙන් කල්ප අසූවක් සිහි කිරීමට සමත්වූහ. කුමරුන්ගේ අංග ලක්‍ෂණ දුටු තවුසාණෝ කුමරු බුදු වන්නේ ද නොහොත් නො වන්නේදැ යි දිවසින් බලන්නාහු, නිසැකව ම බුදු වන්නේයැ යි දැන සිනහ පහළ කළහ. අනතුරු ව එතුමෝ බුද්ධත්වයට පත් කළ මට දක්නට ලැබෙන්නේදෝ නො ලැබෙන්නේදෝ යි නැවතත් සිහි කරන්නෝ, නො ලබමි යැයි ද ඊට පෙර කළුරිය කොට බුදුවරුන් සියයක හෝ දහසක පහළ වන කාලයක දී වුව ද ධර්මාවබෝධය නො කළ හැකි අරූපී බඹ ලොව උපදිමි යැයි ද එහෙයින් බුදු සිරිය දකින්ට නො ලබන්නෙමි යි, මට වූයේ මහත් හානියකැ යි සිතා හැඬූහ. මේ දුටු මිනිස්සු අපගේ තවුස් උතුමාණෝ දැන් ම සිනාසී නැවත හඬන්ට වන්හ. ස්වාමීනි, අපගේ කුමරුවන්ට කිසියම් අනතුරක් වන්නේදැ යි විචාළහ. නැත. කුමරුවන්ට කිසි අනතුරක් නො වේ. නිසැකයෙන් ම එතුමෝ බුදු වන්නාහ. එසේ නම් ඔබ හැඬුවේ මන්ද ? මේ මහා පුරුෂයා මතු බුදු වනු දකින්ට නො ලබන්නෙමි. එයින් මට මහත් හානියක් වන්නේය. මා පිළිබඳව සිතා හඬමි යි කීහ.

ඉක්බිති, තවුසාණෝ මගේ කවර හෝ ඤාතියකු මෙතුමන් බුදු වනු දකින්නේද යි විමසන්නාහු, බෑනණුවන් වන නාලක දරුවා දුටහ. එතුමෝ වහා ම නැගනියගේ ගොට ගොස් තිගේ පුත් නාලක කොහි ද ? ස්වාමීනි, ගෙහි සිටී. එසේ නම් ඔහු කැඳවනු. ළඟට පැමිණි නාලක අමතා කීහ. දරුව, සුද්ධෝදන රජ කුලයෙහි පුතෙක් උපණ. එතුමා බුද්ධාංකුරයකි. හෙවත් බෝධි සත්ත්වයෙකි. පන්තිස් වසකින් පසු බුදු වන්නේය. ඔබ ඒ බුදුන් දකින්නෙහිය. අද ම පැවිදි වන්න. අසූහත් කෙළක් ධනය ඇති කුලයක උපන් නාලක කුමරුවෝ මගේ මයිලණුවෝ මා අවැඩක නො යොදවන්නේයැ යි සිතා කඩයෙන් කසාවත් ද මැටි පාත්‍රයක් ද ගෙන්වා ගෙන කෙස් රැවුල් බහා කසාවත් හැඳ මගේ පැවිද්ද ලෝකයෙහි උත්තම පුද්ගලයා උදෙසා යි, බෝසතුන් දෙසට මුහුණලා ඇඳළි බැඳ පාත්‍රය ථිවිකයෙන් බහා උරයෙහි එල්බගෙන හිමවතට පිවිස මහණ දම් පිරූහ.

නාලක තෙරණුවෝ පසුකාලයෙහි සම්බෝධියට පත් තථාගතයන් වහන්සේ වෙත එළැඹ නාලක ප්‍රතිපදාව අසා දනගෙන නැවත හිමවතට ගොස් රහත් බවට පැමිණ ඉතා දැඩි සසුන් පිළිවෙතෙහි පිළිපන්නාහු, සත් මසක් ආයු විඳ රන්වන් පව්වක් ඇසුරු කොට සිටි ඉරියව්වෙන් ම නිරුපදිසේස හෙවත් ස්කන්ධ ශේෂයක් නැති නිවනින් පිරිනිවන් පෑ සේක.

බෝසතුන් උපන් පස් වැනි දිනයෙහි කුමරුන්ගේ හිස නහවා නම් තැබීම සඳහා රජ මැදුර සිව් දෑ ගඳින් පිරිබඩ කොට ලදපස් මල් විසුරුවා දියනු මුසු කිරි බත් පිසවා ත්‍රිවේදය මනාව දත් අටෝරාශියක් බමුණන් රජ මැදුරට කැඳවා අසුන්හි වඩා හිඳවා මිහිරි බොජුන් වළඳවා මහත් සේ සම්මාන කොට කුමරුන්ට කුමක් සිදුවන්නේද යි ශරීරාංග ලක්‍ෂණ විමසූහ. ඔවුන් අතුරින් රාම, ධජ, ලක්ඛණ, මන්ති, කොණ්ඩඤ්ඤ, භෝජ, සුයාම, සුදත්ත යන බමුණන් අට දෙනා එදින සිටියහ. ඔවුහු සවැදෑරුම් වේදාංග මන්ත්‍ර අනුව ශරීර ලක්‍ෂණ විමසූහ.

මේ බමුණන් අට දෙනා ම අංග ලක්ෂණ පරීක්‍ෂා කරන්නෝ වූහ. බෝසතුන් පිළිසිඳ ගත් දිනයෙහි ද බෝසත් මව දුටු සිහිනය පරීක්‍ෂා කළෝ ද මොහුය. ඔවුනතුරින් සත් දෙනෙක් ඇඟලි දෙකක්

ඔසවා දෙවිදියකින් ප්‍රකාශ කළහ. මේ අංග සලකුණුවලින් යුක්ත වූවෝ, ගිහි ගෙයි වසන්නෝ නම් සක්විති රජ වන්නෝය. පැවිදි වන්නෝ නම් බුදු වන්නාහ. මෙසේ ප්‍රකාශ කළ බමුණෝ සක්විති රජුගේ ශ්‍රී විභූතිය වැණූහ. ඔවුනතුරින් හැමට ම ළාබාල ව සිටි කොණ්ඩඤ්ඤ නම් මානවකයා බෝසතුන්ගේ සර්වප්‍රකාරයෙන් උතුම් වූ ශරීර ලක්ෂණ විමසාබලා මේ උත්තමයාණන්ට ගෘහ ජීවිතයේ විසීමට හේතු කාරණා නැත. ඒකාන්තයෙන් කෙලෙස් ඉවත් කළ බුදු කෙනෙක් වන්නාහුයැ යි එක ම ඇඟිල්ලක් දිගු කොට එක ම ප්‍රකාශනයක් කළේය. මේ කොණ්ඩඤ්ඤ බමුණු වනාහි මේ අන්තිම අත්බව ඇත්තෙකි. නුවණින් ද අනෙක් සත් දෙනා අභිබවා සිටී. මේ ලකුණුවලින් යුක්ත මේ උත්තමයාණන් ගිහි ගෙයි විසීමට හේතු නැත. නිසැකව ම බුදු වන්නේයැ යි එක ම පැවැත්මක් දුටුවේය. එම නිසා එක ම ඇඟිල්ලක් දිගු කොට එසේ ප්‍රකාශ කළේය.

ඉක්බිති, ඒ බමුණෝ තමතමන්ගේ ගෙවලට ගොස් පුත්‍රයන් අමතා මෙසේ කීහ. අපි මහල්ලෝ වෙමු. සියල්ල දත් බුදු බවට පත්වන සුදවුන් මහරජාණන්ගේ පුත් කුමරා අපට මුණගැසීම හෝ නො වීම විය හැකිය. ඔබලා, එතුමා සියල්ල දත් බවට පැමිණි කල්හි එතුමාගේ සසුනෙහි පැවිදි වව්යැ යි පවසා ආයු ඇතිතාක් සිට කම් වූ පරිදි ගියෝය. කොණ්ඩඤ්ඤ මානවකයා නිරෝග විය. බෝසතුන් වැඩිවිය පත්ව මහබිනික්මන් කොට පිළිවෙළින් උරුවේලාවට ගොස් මේ භූමි භාගය ඉතා සිත්ගන්නා සුළුය. මහා වීර්යය කැරෙනු කැමැති කුල පුත්‍රයකු ව ප්‍රධන් වීර්යය කිරීමට ඉතා සුදුසුයැ යි එහි සිත් අලවා වාසයට පැමිණි කල්හි, කොණ්ඩඤ්ඤ බමුණු තෙම අනෙක් සත් බමුණන්ගේ පුතුන් වෙත ගොස් කීය. සිද්ධාර්ථ කුමරු පැවිදි වීය. එතුමාණෝ නිසැකයෙන් බුදු වන්නෝය. ඉදින් ඔබලාගේ පියවරු ජීවත් ව සිටියෝ නම් අද ම පැවිදි වන්නාහුය. ඉදින් ඔබලා කැමැත්තහු නම් එනු මැනව. මම ඒ උත්තමයාණන් අනුව පැවිදි වන්නෙමි. ඒ සියලු දෙන එක ම අදහස් ඇත්තන් වීමට නො හැකි වූහ. තිදෙනෙක් පැවිදි නො වූහ. ඉතිරි සතර දෙනා කොණ්ඩඤ්ඤ බමුණු දෙටු කොට පැවිදි වූහ. මොවුන් පස් දෙනා පසු කල පස්වග තෙරවරු වූහ.

එදින ම රජතුමා පුත් කුමරු කුමක් දැක පැවිදි වන්නේදැ යි විචාරා මහලු, රෝගී, මළ, පැවිදි යන සිව් පෙර නිමිති දැකයැ යි

අසා මෙතැන් සිට එවැනි අයට මගේ පුතු ළඟට එන්ට ඉඩ නො දෙව්. මගේ පුතුට බුදු බවෙන් කම් නැත. මම මගේ පුතු දෙදහසක් කොදෙව් පිරිවර කොට ඇති සතර මහා ද්වීපයන්ට අධිපති ව සතිසක් යොදුන් වට සිටීමට ප්‍රමාණවත් පිරිස පිරිවරා සක්විති රාජ්‍යය කරනු දකිනු රිසියෙමි. මෙසේ කියා එකී සිව් වැදෑරුම් පුරුෂයන්ට කුමරුන්ගේ ඇස් හමුවට පැමිණීම වැළක්වීම සඳහා සිව් දිශාවෙන් ගව්වක් පමණ තැන් ආරක්ෂා සැලසීය. එදින මංගල උත්සවයට පැමිණි අසූ දහසක් ඤාති කුල අතුරින් එක එක කුලය කුමරුන් බුදු වූවා හෝ රජ වූවා හෝ අපි එක එක පුත්‍රයා දෙමු. ඉදින් හේ බුදු වී නම් ක්ෂත්‍රිය ශ්‍රමණයන් පිරිවරා ගෙන හැසිරෙයි.

රජතුමා බෝසතුන්ට උතුම් රූසපුවෙන් යුත් සියලු දෝශයෙන් මිදුණු කිරි මව්වරුන් ද ලබාදුණි. මෙසේ බෝසතාණෝ පිරිවරින් ද සෞභාග්‍යයෙන් ද වැඩෙයි. එක් දිනක් රජුගේ වප් මඟුල එළැඹ තිබිණි. එදවස සියලු නුවර ම දෙව් විමනක් මෙන් සරසයි. සියලු දූසිදස්, කම්කරු ආදීහු ද ,නව වස්ත්‍ර හැඳ සුවඳ මල් ආදියෙන් සැරසී රාජ භවනට රැස් වෙත්. රජතුමාගේ වප් මංගල උත්සවය සඳහා නගුල් දහසක් යොදනු ලැබේ. එදවස වනාහි එකක් අඩු අටසියයක් නගුල් විය. ඒවා ගොනුන් රැහැන් යොත් සමග ම රිදියෙන් ආලේප කරන ලද්දේ විය. රජුන් සී සානා නගුල රන් ආලේපිතය. ගොනුන්ගේ අං සහ යොත් ද කෙවිටි ආදිය ද රනින් විසිතුරු විය. රජතුමා මහත් පිරිවරින් වප් උත්සවය සඳහා නික්මුණේ, පුත් කුමරු ද රැගෙන ගියේය. වප් මඟුල ආසන්නයෙහි ඝන ව වැඩුණු කොළ ඇති එනිසා ම සිසිල් සෙවන ඇති දඹ ගසක් විය. එම ගස මුල අසුනක් පනවා රන්වන් කැටයම් කළ උඩු වියනක් බැඳ වටකැර තිර ඇද රැකවරණ සලසා රජතුමා සර්වාභරණයෙහි සැරසී ඇමැතියන් පිරිවරා වප් මංගුල් ස්ථානයට ගියේය. එහි දී රජතුමා රන් නගුල ගනී. ඇමැතියෝ එකක් අඩු අටසියක් රිදී නගුල් ගනිති. ගොවියෝ සෙසු නගුල් ගනිති. ඔවුහු ඒවා ගෙන ඒ ඒ තැන සී සාත්. රජතුමා මෙතැන සිට එතැනට හෝ එතැන සිට මෙතැනට හෝ සී සාමින් එයි. එහි මහත් සම්පත් ඇති විය. බෝසතුන් පිරිවරා සිටි කිරි මව්වරු ද රජුගේ සම්පත් බැලීමට වට තිරයෙන් පිටතට ගියහ. බෝසත් කුමරුවෝ වටපිට බලා කිසිවකු නො දැක වහා නැඟිට පළක් බැඳ ආනාපාන සති කමටහන් වඩා පළමු ධ්‍යානය ලබාගත්හ. කිරි මව්වරු ආහාර පාන ගැනීම් සඳහා මදක් කල්ගත කළහ. ඒ අවස්ථාවෙහි සෙසු ගස්හි සෙවණැල්ල

හිරු හැරුණු ද නො වෙනස් ව දඹ ගස වට කොට සිටියේය. කිරි මව්වරු බෝසතුන් හුදකලා බව දැන අවුත් තිරය ඔසවා බලන්නාහු, සයනයෙහි පළක් බැඳ වැඩහුන් බෝසතුන් දැක රජතුමාට සැල කළහ. දේවයිනි, කුමාරයෝ මෙසේ බද්ධපරියංකයෙහි සිටිති. සෙසු ගස්වල සෙවණ හිරු අනුව නො වෙනස් ව තිබේ. දඹ ගසේ සෙවණ මණ්ඩලාකාරව සිටී. රජතුමා වේගයෙන් අවුත් ඒ පෙළහර දැක පුත, මේ මගේ දෙවන වැඳුම යැයි තම පුතුට වැන්දේය.

පිළිවෙලින් බෝසත්හු සොළොස් වියට පැමිණියහ. රජතුමා බෝසතුන් වෙනුවෙන් හේමන්ත, ග්‍රීෂ්ම, වර්ෂා යන ත්‍රිවිධ ඍතුන්ට සුදුසු පරිදි මාලිගා තුනක් කැරවීය. ඒවා නව මහල්, සත් මහල්, පස් මහල් විය. සතලිස් දහසක් තිළියෝ බෝසතුන් සතුටු කළහ. මෙසේ බෝසත්හු දෙව් ලොව අප්සරාවන් පිරිවරා ගත් දිව්‍යය රාජයෙක් මෙන් අලංකෘත නළඟනන් විසින් පිරිවරන ලදුව පිරිමි පහස නැති වාiයෙන් සතුටු කරනු ලබන්නේ, මහත් සම්පත් අනුභව කරමින් ඒ ඒ ඍතු අනුව ඒ ඒ පහයෙහි වාසය කරති. රාහුල මාතාව හෙවත් යශෝදරා දේවිය බෝසතුන්ගේ අග මෙහෙසිය වූවාය.

මෙසේ මහත් සම්පත් විඳිමින් කල්ගත කරන අතර එක් දවසක් ඥාති සමූහයා අතර මෙබඳු කථාවක් ඇතිවිය. සිදුහත් කුමරු ක්‍රීඩාලෝලී ව සිටියි. කිසි ශිල්පයක් නො හදාරයි. යුද්ධයක් එළැඹ සිටි කල්හි කුමක් කරන්නේ ද ? රජතුමා බෝසතුන් කැඳවා දරුව, ඔබ ඥාතීහු සිදුහත් කුමරු කිසි ශිල්පයක් නො හදාරා ක්‍රීඩාවෙහි නිරත ව සිටිතැ යි කියති. යුද්ධයක් පැමිණි කල්හි කුමක් කරන්ට සිතා සිටින්නෙහි ද ? පියාණෙනි, මට ශිල්ප හැදෑරීමේ අවශ්‍යතාවයක් නැත. මගේ ශිල්ප දැක්වීම සඳහා නුවර බෙර හසුරවනු මැනවි. මෙයින් සත් වැනි දවස ඥාතීන්ට ශිල්ප දක්වමි. රජතුමා එසේ කළේය. බෝසතාණෝ අක්‍ෂණවේදී හෙවත් විදුලි එළියෙන් ලක්‍ෂය විදිනා හා වාළවෙයී හෙවත් බටුඑලය එල්ලූ අස්ලොමට විදීමට සමත් ආදී දුනුවායන් රැස් කැරෙවා මහජනයා මැද අනෙක් දුනුවායන්ට සාධාරණ නො වූ දොළොස් ආකාර ශිල්පයක් ඥාතීන්ට පෙන්වීය. ඒ සියල්ල සරභංග ජාතකයෙහි සඳහන් ආකාරයෙන් දත යුතුයි. ඉන්පසු ඥාතීහු සැක නැත්තෝ වූහ.

එක් දවසක් බෝසත්හු උයන් බිමට යනු කැමැත්තෝ, රථය සරසන ලෙස රියදුරුට කීහ. හෙතෙම මැනවැ යි පිළිගෙන මාහැඟි උතුම් රථයක් සියලු අලංකාරයෙන් සරසා කුමුදු පත්‍ර වර්ණ ඇති මංගල සෛන්ධව අශ්වයන් සිව් දෙනකු යොදා බෝසතුන්ට දැන්වීය. බෝසත්හු දෙව් විමනක් සමාන රථයට නැඟී උයන දෙසට ගියහ. දෙවියෝ සිතූහ. සිදුහත් කුමරුගේ අභිංසා බෝධියට දැන් සුදුසු කාලයයි. පෙර නිමිති දක්වන්නෙමු යි, එක් දිව්‍යය පුත්‍රයෙක් මහළු දිරාපත් වූ, දත් වැටුණු, කෙස් පැසීගිය, ගෝනුස්සකු මෙන් වක් වූ කඳ, කටී, දණ යන තැන්වලින් නැමුණු, සැරයටියක් අතින් ගත් වෙවුලන ආකාරයෙන් පෙනී සිටියේය. එම රූපය බෝසතුන් සහ රියදුරා පමණක් දකිති. බෝසත්හු රියදුරා අමතා යහළුව, මේ පුරුෂයා කවරෙක් ද ? ඔහුගේ කෙස් ද අන් අය හා සමාන නො වෙයි මහාපදාන සූත්‍රයෙහි සඳහන් ක්‍රමයෙන් විචාරා රියදුරුගේ පිළිතුර අසා. මෙළොව ඉපදීමට නින්දා වේවා. උපන්නා හට මහළු බව පෙනෙන්නේ යි සංවේගයට පත් සිතැති ව එතැනින් ම ආපසු හැරී මාලිගයට පිවිසියහ. රජතුමා මගේ පුතු වහා ම ආපසු පැමිණියේ මන්ද යි විචාරා මහළු රුවක් දැකයැ යි අසා මහල්ලෙක් දැක පැවිදි වන්නේ යි පෙර ඇසූ වදන ම සිහි කළේය. මා නො නැසුව මැනවි. නාට්‍යය සංගීතාදිය පිළිවෙල කරව්. සැප සම්පත් විඳින විට පැවිද්ද සිහි නො වන්නේයැ යි ආරක්ෂා තර කොට සියලු දිශාවන්හි අඩ යොදුනක් තැන් රැකවරණ යෙදීය.

නැවත එක් දිනක් බෝසත්හු පෙර සේ ම උයනට යන්නාහු, දෙවියන් විසින් මවන ලද රෝගී පුරුෂයකු දැක පෙර සේ ම විචාරා කළකිරීමට පත් ව ආපසු පැමිණ මාලිගයට වන්නාහ. රජතුමා ද පෙර පරිදි ම අසා සංවිධාන තිගව්වක් ප්‍රදේශයෙහි තර කළේය.

නැවත එක් දවසක් උයනට යන බෝසත්හු දේව නිර්මිත මළ සිරුරක් දැක සංවේගයට පත්ව ආපසු අවුත් මාලිගයට පිවිසියහ. මෙවර රජතුමා යොදුනක් පමණ ආරක්ෂා තර කෙළේය.

වෙනත් දවසක බෝසත්හු උයනට යන අතරතුර දෙවියන් විසින් මවන ලද මනාව සිවුරු හැඳ පෙරවූ පැවිදි රුවක් දැක මේ

කවරෙක්දැ යි රියදුරුගෙන් විචාළහ. බුදු සසුන පවත්නා කාලයක් නො වන නිසා පැවිද්දකු හෝ පැවිදි ගුණ නො දන්නනා රියදුරා දෙවියන්ගේ අනුහසින් දේවයිනි, මේ පැවිද්දෙක්යැ යි හඳුන්වා පැවිදි ගුණ ද වැණීය. බෝසත්හු පැවිද්දට සිත නැමී එදවස උයනට ගියේය. දීඝභාණක තෙරවරු, සතර පෙර නිමිති එක දවසයෙහි ම දැක අබිනික්මන් කළ බව කියත්. එහි උයන් සිරි විඳිමින් මඟුල් පොකුණෙහි නා හිරු බැස යත් ම මඟුල් ගල් පුවරුවෙහි හුන්හ. බෝසතුන්ට එහි දී තමා අලංකාර කැරවා ගනු කැමැති වූහ. බෝසතුන්ගේ පිරිවර පිරිස නානා වර්ණ වස්ත්‍ර ද විවිධ ආභරණ ද මල් ගඳ විලවුන් ද රැගෙන පිරිවරා සිටියහ. එකෙණෙහි සක් දෙවිඳුගේ පඬු ඇඹුල් අස්න උණුසුම් විය. සක් දෙවිඳු කවරකු මා සක් පදවියෙන් ඉවත් කරනු කැමැත්තේ දෝ යි විමසන්නේ, සිදුහත් කුමරුන්ගේ අවසන් සරසන කාලය බව දැන විස්කම් දෙව්පුත් අමතා සගය, අද මධ්‍යම රාත්‍රියෙහි සිදුහත් කුමරා මහාභිනිෂ්ක්‍රමණය කරන්නේය. මේ මොහුගේ අවසන් සැරසීමයි. උයනට ගොස් බෝසතුන් දිව්‍යාභරණයෙන් සරසව යි, නියම කළේය. ඔහු ද මැනවැ යි පිළිගෙන දිව්‍යානුභාවයෙන් එකණෙහි ම උයනට ගොස් බෝසතුන්ගේ කපුවාගේ වේශයෙන් ගොස් කපුවාගේ අතින් හිස වෙලුම් පිළිගෙන බෝසතුන්ගේ හිස වෙලීය. බෝසත්හු අත ස්පර්ශ වූ කෙණෙහි ම මේ මිනිසකු නොව දිව්‍යය පුත්‍රයකැ යි දැන ගත්හ. හිස වෙලූ කෙණෙහි ම ඔටුන්නෙහි එබ්බූ මිණි කැට අයුරින් පිළි දහසක් පැන නැංගේය. නැවත හිස වෙළත් ම නැවතත් පිළි දහස බැගින් දශ වරක් වෙලූහ. මෙසේ හිස වෙළත් වෙළත් ම දශ දහසක් පිළි පැන නැංගේය. මෙහි දී හිස කුඩාය. පිළි බොහෝය. කෙසේ පැන නැංගේදැ යි නො සිතිය යුතුයි. ඔවුනතුරින් සියල්ලට ම වඩා මහත් පිලිය පූඩා මලක් පමණ විය. සෙසු පිළි මල් පමණ විය. බෝසතුන්ගේ හිස කෙසුරු ගැවසී ගත් බක්මී මලක් මෙන් විය. සියලු ආභරණයෙන් සැරසී සිටි බෝසතුන්ට සියලු වාද්‍යය විශේෂයන්හි දක්ෂවූවන් තම තමන්ගේ කුසල භාවයන් දක්වද්දී, බමුණන් ජය වේවා, සතුටු වේවා, ආදී වදන් කියද්දී වන්දිභට්ටයෝ නන් අයුරින් සුබ වචන කියද්දී, සතුන් නාදයෙන් බුහුමන් දක්වද්දී එතුමෝ සර්වාලංකාරයෙන් යුත් උතුම් රථයට නැංගාහ.

මෙම කාලය තුළ යශෝදරා අග බිසව පුතකු බිහිකළ බව ඇසූ සුදොවුන් මහරජාණෝ තම පුතුට සතුට දන්වනු පිණිස හසුනක් යැවූහ. බෝසත්හු ඒ අසා රාහුලයෙක් හෙවත් රඝුරාජ පුත්‍රයෙක්

උපන්නේය. එයින් බන්ධනය වීයැ යි කීහ. රජතුමා පුතුත්ගේ වචනය අසා මෙතැන් සිට තම මුනුබුරාණන්ට රාහුල යන නාමය ම වේවා යි කීයේය.

බෝසතාණෝ රථයට නැඟී මහත් යසසින් හා සිත්කළු රූසපුවෙන් යුතු ව නුවරට පිවිසියහ. මේ අවස්ථාවෙහි කිසාගෝතමී නම් රජ කුමරිය උඩු මහලෙහි සිටින්නී, නුවර පැදකුණු කරන බෝසතුන්ගේ රූසපුව දක සතුටින් පිනාගිය සිත් ඇත්තී, මේ ප්‍රීති වාක්‍යය පළ කළාය.

"මෙබඳු කුමරුකුට යම් කතක් මව් වූවා ද ඕ තොමෝ නිවුනා යි හඟිමි. යම් පුරුෂයෙක් පිය වූයේ ද හේ ද නිවුනේ යි හඟිමි. යම් ස්ත්‍රියකට මෙවැනි හිමියකු සිටී ද ඒ බිරිය ද නිවුනා යි හඟමි."

බෝසත්හු මේ උදාන වාක්‍යය අසා මෙසේ සිතුහ. ඇය විසින් කියන ලද්දේ මේ අදහස විය යුතුයි. මෙවැනි රූසපුවක් ඇති ආත්ම භාවයක් දකින මවකගේ හදවත නිවෙයි. පියෙක්ගේ හදවත ද නිවෙයි. බිරියගේ හදවත ද නිවෙයි. එහෙත් කුමක් නිවුණු කල්හි හදවතට නිවීමක් වේ ද ? බෝසතුන්ට මෙසේ ද සිතිණි. රාග ගින්න නිමුණු කල්හි හදවත නිමුණේ වෙයි. මාන දිට්ඨි ආදී කෙළෙස් ගින්දර නිවුණු කල්හි නියම වශයෙන් හදවත නිවුණේ වෙයි. එම නිසා ඇය මට අස්සවන ලද්දේ මා හැඟි දහමකි. මම ද නිවීම හෙවත් නිබ්බාණය සොයමින් සිටිමි. අද ම මම ගිහි ගෙය අතහැර නික්මී පැවිදි ව නිවීම හෙවත් නිර්වාණය සොයන්ට වටී. මේ ඇයට පඬුරු වේවා යි, ලක්ෂයක් වටිනා මුතුහර ගෙලෙන් මුදා යැවූහ. එය ලැබූ කිසාගෝතමී සිදුහත් කුමරු මා කෙරෙහි අනුරාගී හැඟීමෙන් එවන ලදූ යි සතුටු වූවාය.

බෝසතාණෝ මහත් ප්‍රීතියෙන් තම ප්‍රාසාදයට නැඟ සිරි යහනෙහි සැතපුණහ. එකෙණෙහි ම සියලු අලංකාරයෙන් සැරසුණු නැටුම්, ගැයුම් කලාවන්හි මනාව පුහුණු වූ දෙවඟනන් මෙන් රුවින් අග තැන්පත් වනිතාවෝ නොයෙක් තූර්යය භාණ්ඩ ගෙන පිරිවරා කුමරුන් සතුටු කැරවනු පිණිස නැටුම්, ගැයුම් ඇරඹූහ. බෝසත්හු

ක්ලේෂයන්ගෙන් නො ඇළුණු සිත් ඇති බැවින් නෘත්‍යය, ගීතාදියෙන් නො ඇළුණෝ, මද වේලාවක් නිදි සුව වින්දහ. ස්ත්‍රීහු ද අපි යමකු සඳහා නැටීම් ආදිය කරමු ද, ඔහු දැන් නිදිගත ව සිටී. අපි දූන් කුමකට වෙහෙසෙමුදැ යි සිතා අත තිබූ තූර්යය භාණ්ඩාදිය මැඩගෙන ම නින්දට වැටුනාහ. සුවඳ තෙල් පහන් දල්වේ. බෝසත්හු පිබිදී සිය යහනෙහි ම පළක් බැඳ හුන්නාහු, විප්‍රකාර වූ ඒ ස්ත්‍රීන් දුටහ. සමහර ගැහැනු කුණු කෙළ වගුරුවමින් සිටිති. සමහරු තතනන්නෝ වූහ. සමහරු දොඩවති. සමහරු අයාගත් මුඛ ඇත්තෝ වූහ. බෝසත්හු ඔවුන්ගේ විකාර රූප දකීමෙන් වඩවඩාත් කාමයෙහි නො ඇළුණු සිත් ඇත්තෝ වූහ. සර්වාලංකාරයෙන් පිළියෙල වූ සක් දෙවිඳු විමන හා සමාන වූ මාහැඟි පහය තැන තැන දමන ලද මළ කුණු ඇති අමු සොහොනක් මෙන් වැටහිණි. කාම, රූප, අරූප භවත්‍රය ම ගිනි ගත් ගෙවල් මෙන් දිනිණි. පින්වතුනි, මේ ලෝකය උවදුරුවලින් පිරී ඇත. පින්වතුනි, මේ ලෝකය පීඩාවලින් පිරී ඇත. හැඟීම්බර වාක්‍යය මුවෙන් පිටවිණි. වඩාත් පැවිද්දට සිත නැමිණි. අද ම මා මහබිනික්මන් කළ යුතු යි සිතිනි. බෝසතුන් සයනයෙන් නැඟිට දොර ළඟට ගොස් මෙහි නිදන්නේ කවුදැ යි විමසීය. එහි එළිපත හිස තබා නිදන තමා, ඡන්න බව හැඟවීය. අද තමා මහබිනික්මන් කරන බවත්, ඒ සඳහා අශ්වයකු සූදානම් කරන ලෙසත් අණ කළහ. සතුටින් පිළිගත් ඡන්න අශ්වයා සැදීමට අවශ්‍යය උපකරණ ගෙන අස් හළට ගොස් සුවඳ තෙල් පහන් දල්වෙද්දී සමන් මල් විසුරුණු වියන යට සිත්කළු බිම් පෙදෙසක කන්ථක අශ්ව රාජයා දැක අද මොහු ම සැකසිය යුතුයැ යි සිතූ හෙතෙම ඔහු ම සැකසූයේය. සැකසෙන අයුරින් ම කන්ථක අශ්ව රාජයාට කාරණය දිනිණි. අද සැකසීම ඉතා දැඩිය. අන් දිනවල උයන්කෙළි ආදිය සඳහා යන ගමනට සැකසීම මෙන් නො වේ. මගේ ආර්යය පුත්‍රයා අද මහබිනික්මන් කැමැත්තේ විය යුතුයැ යි සිතූ අශ්ව රාජයා සතුටු සිතින් මහා සිනාවක් පහළ කළේය. ඒ සිනා හඬ මුළු නුවර ම පැතිර ගියේය. එහෙත් දෙවියෝ එම ශබ්දය වළකා කිසිවකුට අසන්ට ඉඩ නො දුන්හ.

සිදුහත් බෝසතාණෝ ඡන්න ඇමැති අසු සැකසීමට යවා පළමුවරට තම පුතු දකිමි යි සිතා යශෝදරා දේවිය වෙසෙන ශ්‍රී යහන් ගැබ වෙත ගොස් දොර විවර කළහ. ඒ අවස්ථාවෙහි යහන් ගැබ තුළ සුවඳ තෙල් පහන දල්වෙයි. රහල් මව දෑ සමන්, සීනිද්ද

ආදී මල් අමුණක් පමණ අතුරා සැරසූ යහනෙහි පුතු මත අත තබා නිදන්නීය. බෝසත්හු එළිපතෙහි පය තබා සිටිවන ම සිට බලා ඉදින්, මම දේවියගේ අත ඉවත් කොට පුතු අතට ගන්නේ නම් දේවිය පිබිදෙන්නීය. එවිට මගේ අබිනික්මනට බාධා වන්නේය. සම්බෝධියට පැමිණ ම පුතු දකින්නෙමි යි, පහයෙන් බටහ. ජාතක අටුවාවෙහි රාහුල කුමරුන් ඉපිද සත් වැනි දවසෙහි අබිනික්මන් කළහ යි කියන ලදී. සෙසු අටුවාවල නැත. එම නිසා මෙය ම ගත යුතුය.

මෙසේ බෝසත්හු පහයෙන් බැස අසු ළඟට ගොස් මෙසේ කීහ. කන්ථකය, ඔබ මා මේ රැය එතැර කැරව. ඔබ නිසා මම බුදු වී දෙවියන් සහිත ලෝකයා එතැර කැරවන්නෙමි. අනතුරු ව බෝසත්හු උඩ පැන අසු පිටට නැංගාහ. කන්ථක අශ්ව රාජයා වනාහි දිගින් බෙල්ලෙහි පටන් අටළොස් රියනකි. ඊට අනුරූප වූ උසින් ද යුක්ත වූයේ වෙයි ශක්තියෙන් හා ජවයෙන් යුක්තය. මුළු සිරුර ම සුදුවන්ය. ඔපකළ හකක් සමානය. ඔහුගේ හේෂාරවය හෝ පිය ගැටෙන ශබ්දය මුළු නගරයෙහි ම පැතිරෙන්නේය. ඒ නිසා දෙවියෝ තමන්ගේ ආනුභාවයෙන් කිසිවකුට නො ඇසෙන සේ වළකා අසු තබන තබන පියවරෙහි අත්තල පිරිනැමූහ. බෝසත්හු අසු පිට සිටියදී ඡන්න ඇමැති අසු වලිගය අල්ලා ගත්තේ මැදියම් රැයෙහි නගර දොරටුව ළඟට පැමිණියය. එකල්හි පිය රජතුමා සිදුහත් කුමරුට යම් කිසි වේලාවක නගර දොරටුව හැර නික්මීමට නො හැකි වන පරිදි දොර පුවරු දෙක්හි එක එකක් පුරුෂයන් දහසකින් විවර කළ හැකි සේ තනවා තිබිණි. බෝසත්හු ද ඉතා ශක්තිමත් වූහ. ඇතුන් ගණනින් කෙළ දහසක් ඇතුන්ගේ බල දරයි. පුරුෂ ගණනින් දශ කෙළ දහසක් බල දරයි. එවිට බෝසත්හු සිතූහ. ඉදින්, දොර නො ඇරී නම් තමා අසු පිට සිටියදී ම ඡන්න අස් වලිගය ගෙන සිටියදී ම අසු දෙකලවයෙන් තද කොට ගෙන අටළොස් රියන් උස පවුරු උඩින් පැන යන්නෙමි. මේ අතර ඡන්න ඇමැති සිතීය. ඉදින්, දොර නො ඇරුණේ නම් බෝසතුන් උරහිසෙහි තබාගෙන කන්ථකගේ කුස දකුණු අතින් පෙළාගෙන කිසිලි අතරෙහි තබාගෙන පවුරු පැන යමි. කන්ථක ද සිතීය. දොර නො ඇරුණේ නම් තම ස්වාමියා පිට උඩ සිටියදී ම වලිගය ගෙන සිටින ඡන්න සමග ම උඩට පැන පවුරු ඉක්මවමි. දොර නො ඇරුණේ නම් තුන් ජනයන්ගෙන් එක් අයකු සිතූ පරිදි කාර්යය සිදුවන්නේය. දොරටුවෙහි අධිගෘහිත දෙවියා දොර විවෘත කළේය.

එකෙණෙහි ම මාර දෙව් පුත් අහසෙහි සිට බෝසතුන්ගේ ගමන වළක්වමි යි සිතා නිදුකාණනි, නො යනු මැනවි. මෙයින් සත් වැනි දවසෙහි ඔබට සක්විති රාජ්‍යය පහළ වන්නේය. දෙදහසක් කොදෙව් පිරිවර කොට ඇති සතර මහා ද්වීපයන්ට රජ වන්නෙහිය. නවතිනු මැනවි. ඔබ කවුද ? මම වසවර්තී මාරයා වෙමි. මාරය, සක්විති රාජ්‍යය පහළ වන බව මම දනිමි. මට රාජ්‍යයෙන් වැඩක් නැත. දශ දහසක් සක්වළ ඒකනාද කොට බුදුවන්නෙමි. හිංසා සහගත සිතුවිල්ලක් හෝ සිතුවේ නම් කළයුතු දෙය දනිමි යි, සිදුරු සොයමින් සෙවණැල්ල මෙන් ඉවත් නො වී බෝසතුන් ලුහුබැන්දේය.

මෙසේ බෝසතාණෝ අතට පත් සක්විති රාජ්‍යය කෙළ පිඩක් මෙන් අනපේක්ෂිත ව හැර දමා උතුරුසළ නැකත පවත්නා කල්හි නගරයෙන් නික්ම නැවත තම නුවර ආපසු හැරී බලනු කැමැත්තෝ වූහ. මේ සිතුවිල්ල උපන් කෙණෙහි ම මහා පුරුෂය, ඔබ පෙරුම් පිරුවේ නැවතී ආපසු හැරී බැලීම සඳහා නො වේයැ යි කියන්නාක් මෙන් මහපොළොව කුඹල් සකක් මෙන් කරකැවී සිටියේය. බෝසත්හු නගරයට මුහුණලා නුවර බලා එම ප්‍රදේශය කන්ථක අශ්වයා නැවතුනු සෑය වශයෙන් දක්වා අසු ගමන් මඟට අභිමුඛ කොට මහත් සිරිසොභාවෙන් ගියහ. එදින දෙවියෝ බෝසතුන්ට පෙරටුව සැට දහසක් ආලෝක වැටි දූරූහ. එසේ ම පිටුපස දකුණුපස වම්පස ද සැට සැට දහස බැගින් ආලෝක වැටි දූරූහ. සමහර දෙවිවරු සක්වල මුවවිට සිට අපමණ ආලෝක වැටි දූරූහ. සමහර දෙවිවරු හා නා, ගුරුළු ආදීහු ද දිව්‍යමය මල් සුවඳ සුණු ආදියෙන් පුදමින් යෙත්, ඝන වලාවකින් වැගිරෙන වැසි ධාරා මෙන් පරසතු, මදාරා මල්වලින් අහස වැසිණි. දිව්‍යමය සංගීත හඬ පැතිරිණි. හාත්පස අටවග බෙර, සැටවග බෙර වශයෙන් අටසැට දහසක් බෙර වාදනය විය. මහමුහුද ඇතුළත මේඝ නාද ඇති විය. යුගඳුරු කුස මුහුද ගිගුම් දෙන කල මෙන් විය. මෙසේ මහත් උපහාරයෙන් බෝසත්හු එක රැයකින් ම තුන් රජයක් ඉක්මවා තිස් යොදුනක් ගමන් කොට අනෝමා ගංතෙරට පැමිණියහ. කිම, අස් රජුට මෙපමණ දුරට වඩා යා නො හැක්කේ ද ? නො හැක්කේ නො වෙයි. ඔහු වනාහි එක සක්වල වටයක් මැද අක්ෂයෙන් තබනල ද රිය සකක නිම් වලල්ල වටා යන්නාක් මෙන් කෙළවරට ම ගොස් තමා සඳහා සැපයූ භෝජනය බුදීමට සමත්ය. එදවස වනාහි දෙවි, නා, ගුරුළු ආදීන් විසින් අහසෙහි සිට විසුරුවන ලද සුවඳ මල් ආදියෙහි, කළවා

පෙදෙස දක්වා ගිලුණු සිරුර ඔසවා මල්ගැට ආදිය ඉවත් කිරීමට ඉතා ප්‍රමාද විය. එම නිසා එක රැයට තිස් යොදුනක් ම ගමන් කළ හැකි විය.

ඉක්බිති, බෝසත්හු ගංතෙර සිට ඡන්න අමතා මේ ගඟ කිනම් ද ? දේවයිනි, අනෝමා නම් වේ. අපගේ පැවිද්ද? අනෝම වේ. ලාමක නො වේ යි පවසා විළුඹින් අසුට සන් කළේය. අශ්වයා ද උඩට නැග අට ඉස්බත් පළල් වූ ගඟෙහි පරතෙර සිටියේය. බෝසත්හු අසු පිටින් බැස රිදී පටක් සමාන වැලි තලාවෙහි සිට ඡන්න ඇමතුහ. යහළු ඡන්න, ඔබ මගේ ආභරණ ද අසු ද රැගෙන ආපසු යනු. මම පැවිදි වෙමි. දේවයිනි, මම ද පැවිදි වෙමි. ඡන්න කීය. තෙවරක් ම ඔහු වැළකූ බෝසත්හු ආභරණ ද අසු ද ඡන්නට දී ආපසු යන ලෙස අණ කළේය. අනතුරු ව බෝසත්හු සිතන්නාහු, කෙස් කළඹ පැවිද්දන්ට සරුප් නො වේ. බෝසතුන්, කෙස් කැපීමට සුදුසු කෙනකු නැති හෙයින් තමා ම දකුණතින් කඩුව ගෙන වමතින් සිළුමිණ සහිත කෙස් වැටිය ගෙන කපා දැමූහ. ඇඟුල් පමණ වූ කෙස් දකුණට කරකැවී හිස සමග ඇලී සිටියේය. රැවුල ද එපමණ ම විය. බුදු රජුන්ගේ ජීවිත කාලය තුළ කෙස් ද රැවුල ද එපමණ විය. නැවත කෙස් රැවුල් බා දැමීමේ කාර්යයක් නො වීය. අනතුරු ව බෝසතාණෝ සිළුමිණ සහිත කෙස් කළඹ ගෙන ඉදින්, මම බුදු වන්නේ නම් අහසෙහි සිටිවා, නො එසේ නම් බිම වැටේවා යි, අහසට විසි කළෝය. කෙස් කළඹ යොදුනක් පමණ අහසට ගොස් නැවතිණි. සක් දෙවිඳු දිවසින් දැක අවුත් යොදුනක් පමණ රුවන් කරඬුවකින් පිළිගෙන තව්තිසා දෙව් ලොව සිළුමිණි සෑය පිහිටුවීය.

> "ලොක නායක බෝසතාණන් උතුම් සුවඳ ගල්වන ලද
> කෙස් කළඹ සිඳ අහසට දැමීය. දහසක් නෙත් ඇති සක්
> දෙවිඳු රන් කරඬුවකින් හිසින් පිළිගත්තේය."

නැවත බෝසතාණෝ සිතූහ. මේ කිසිවක් ශ්‍රමණයන්ට සුදුසු නො වේ. ඒ සමග ම කසුප් සම්බුදු කල යහළු වූ ඝටීකාර මහා බඹහු බුද්ධාන්තරයක් ගෙවුන ද දැඩි මිත්‍ර භාවය නිසා මගේ යහළු බෝසත්හු අද මහබිනික්මන් කළහ. එතුමන්ට ශ්‍රමණයන්ට සුදුසු අට පිරිකර ගෙනයමි යි සිතා,

"තුන් සිවුර ද පාත්‍රය ද කඩකැත්ත ද හිඳිකටුව ද හින බඳිනා පටිය ද තුන්පෙරහන ද යන අට පිරිකර පැවිදි භික්ෂුවට සුදුසු වේ."

මෙකී ශ්‍රමණ අට පිරිකර බෝසතුන්ට පිළිගැන්වීය. රහතුන්ගේ කොඩිය වූ තුන්සිවරු හැඳ පෙරවා උතුම් පැවිදි වෙස් ගත් බෝසතාණෝ ඡන්නය, මගේ වචනයෙන් මව්පියන්ට සුව බව කියව යි, ඡන්නට ආපසු ගමන සඳහා සමු දුන්හ. ඔහු බෝසතුන් වැඳ පැදකුණු කොට පිටත්විය. කන්ථක අසු බෝසතුන් ඡන්න සමග කළ කථාව අසා මගේ හිමියාගේ දැකීමක් මට නැතැ යි බෝසතුන් දර්ශනයෙන් ඉවත් වෙත් ම හටගත් ශෝකය ඉවසාගත නො හැකි ව ලය පැළී කළුරිය කොට තව්තිසා දෙව්ලොව කන්ථක නමින් දෙව්පුත් ව උපන්නේය. ඡන්නට පළමු පැවැතියේ බෝසතුන් වෙන්වීමේ දුක පමණි. අසුගේ මරණයෙන් දෙවැනි ශෝකයක් ද හටගැනිණි. ඔහු හඬමින් වැළපෙමින් කිඹුල්වත් පුර ගියේය.

බෝසතාණෝ පැවිදි ව අනෝමා ගංතෙර අවට ම සත් දිනක් පැවිදි සුවයෙන් කල්ගෙවා එක් දවසින් ම තිස් යොදුන් මඟ ගෙවා රජගහ නුවරට පිවිස ගෙපිළිවෙලින් පිඬු පිණිස වැඩියහ. බෝසතුන්ගේ රූප ශෝභාව දැකීමෙන් මුළු නුවර ම ධනපාල හස්තියා පිවිසි රජගහ නුවර මෙන් ද අසුරිඳු පිවිසි දෙව් නුවර මෙන් ද කැළඹීමට පත්විය. රාජ පුරුෂයෝ රජු වෙත ගොස් දේවයිනි, මෙබඳු වූ පුරුෂයෙක් නුවර පිඬු පිණිස හැසිරෙයි. ඔහු දෙවියෙක් ද, මිනිසෙක් ද, නාගයෙක් ද, ගුරුළෙක් ද, හෙතෙම කවරෙක්දැ යි නො දනිමු යි සැළකළහ. රජ පහයෙහි සිට ම මහා පුරුෂයාණන් දැක පුදුමයට පත්වූයේ රාජ පුරුෂයන්ට අණ කළේය. සගයෙනි, යව්. විමසව්. ඉදින් අමනුෂ්‍යයෙක් නම් නුවරින් නික්ම අතුරුදහන් වන්නේය. දෙවියෙක් වන්නේ නම් අහසට නැඟී යන්නේය. නාගයෙක් වන්නේ නම් පොළොව කිමිදී යන්නේය. මනුෂ්‍යයෙක් වන්නේ නම් ලැබුණු අහර අනුභව කරන්නේය. බෝසතාණෝ ද ගෙපිළිවෙලින් ලැබුණු ආහාර ප්‍රමාණය දැන නුවරට පිවිසි දොරටුවෙන් ම පිටවී පණ්ඩව පව් සෙවෙනෙහි පෙරදිග බලා වැඩහිඳ ආහාර වැළඳීමට පටන් ගත්හ. එවිට උන් වහන්සේගේ අතුනුබහන් පෙරළී මුවෙන් නික්මෙන්නාක්

මෙන් විය. එතෙක් එවැනි අහරක් ඒ අත්බව තුළ නුදුටු හෙයිනි. ආහාරය පිළිකුල් වුව ද තමා ම තමාට අවවාද කළහ. සිද්ධාර්ථ තවුසාණෙනි, ඔබ තුන් මසකින් පැසෙන සුවඳ ඇල් සහල් බත නොයෙක් රස මසවුලෙන් යුක්ත ව අනුභව කරන සුලබ ආහාරපාන ඇති කුලයක උපත ලබා වරහැළි සිවුර පොරවාගත් පැවිදි කෙනෙක් දැක මම මෙබඳු කෙනෙක් වී පිඬු පිණිස හැසිර අහර වළඳම් යි, දැ සිතා රාජ්‍යය අතහැර පැමිණියෙමි. දැන් ඒ අහර පිළිකුල් කිරීම සුදුසුද යි තමාට ම අවවාද දී වෙනසක් නැති ව කෙණෙහි අහර වැළඳූහ. රාජ දූතයෝ බෝසතුන්ගේ මේ පිළිවෙත දැක රජුට දැන්වූහ. ඔහු වහා ම නුවරින් නික්ම බෝසතුන් වෙත ගොස් ඉරියව්වෙහි පැහැදී බෝසතුන් රාජ්‍යයෙන් පැවරීය. මහරජ, මට වස්තු කාම හෙවත් සම්පතින් හෝ ක්ලේෂ කාම හෙවත් කාමුක වින්දනයෙන් වැඩක් නැත. මම සම්බෝධිය ලබනු පිණිස පැමිණියෙමි. රජ තවතවත් ඇවටිළි කළ ද බෝසතුන්ගේ ප්‍රතිචාරයක් නො ලැබ එසේ නම් ඔබ බුදුවේවා. බුදු බවට පත් ඔබ පළමු කොට මගේ රාජ්‍යයට පැමිණිය යුතුයැ යි ප්‍රතිඥා ගත්තේය. මේ පුවත මෙහි දැක්වූයේ සංක්ෂේපයෙනි. විස්තර වශයෙන් වනාහි, **"පබ්බජ්ජං කිත්තයිස්සාමි යථා පබ්බජි චක්ඛුමා"**, පසැස් ඇති බුදුහු පැවිදි වූ අයුරු ප්‍රකාශ කරමි යි, පබ්බජ්ජ සූත්‍රය[1] හා එහි අටුවාව බලා දත යුතුයි.

බෝසතාණෝ රජුට පිළිණ දී පිළිවෙළින් චාරිකාවෙහි යන අතර ආළාර කාලාම, උද්දක රාමපුත්ත නම් තවුසන් වෙත එළැඹ ධ්‍යාන සමාපත්ති ලබාගෙන ඒ සත්‍යාවබෝධයට මඟ නො වේයැ යි ඒ සමාපත්ති ලාභය ප්‍රමාණ වශයෙන් නො පිළිගෙන දෙවියන් සහිත ලෝකයාට තමන්ගේ කායික හා මානසික ශක්තිය දැක්වීම සඳහා මහා වීර්යය කරනු පිණිස උරුවෙල් දනව්වට ගොස් සිත්කළු භූමි භාගයක් දැක එහි වෙසෙමින් ප්‍රධන් වීර්යය ඇරඹූහ.

කොණ්ඩඤ්ඤ තවුසන් ප්‍රධාන පස්වග මහණහු ගම්, නියම් ගම්, රජදහන්වල ඇවිද එහි දී බෝසතුන් හමුවූහ. ඔවුහු මහා ප්‍රධන් වීර්යය වඩනා බෝසතාණන් දැන් දැන් බුදු වෙතැ යි යන සිතින් පන්සල හැමදීම් ආදී වත් පිළිවෙතින් උවටැන් කැරෙමින් බෝසතුන් සමග ම විසූහ.

1 සූත්‍ර නිපාතයේ මහා වර්ගයේ පළමු වැනි සූත්‍රයයි.

බෝසතාණෝ ද දුෂ්කර ක්‍රියාවෙහි කෙළවරයට ම යම් යි එක තල ඇටයෙන් එක සහල් ඇටයෙන් කල් ගෙවූහ. සහමුලින් ම ආහාර වර්ජනය ද කළහ. දෙවියන් විසින් ලොම් සිදුරු මඟින් ආහාර සාරය ඇතුළු කිරීමට ප්‍රතික්ෂේප කළහ. ඒ නිරාහාර භාවය නිසා ඉතාමත් කෘෂ භාවයට පැමිණි ඔහුගේ රන්වන් සිරුර කළු පැහැ ගත්තේය. දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණ සැඟවිණි. සමහර දවසක අශ්වාස ප්‍රශ්වාස නතර කොට ධ්‍යාන වඩද්දී මහත් වේදනාවෙන් සිහි සුන් ව සක්මන් කෙළවර වැටෙති. ඒ දුටු සමහර දෙවියෝ ගෞතමයන් මළේයැ යි කියති. සමහරු රහතුන්ගේ එක්තරා විහරණයකි යි කීහ. එහි දී යම් දෙවි කෙනෙක් මළේයැ යි සිතා ගොස් සුද්ධෝදන රජුට තම පුතු මළ බව දැන්වූහ. එවිට රජතුමා මගේ පුතු කළුරිය කළේ බුදු බවට පත්ව ද නැතිව ද ? බුදුවන්ට නො හැකි විය. වීර්යය කරද්දී සක්මන් කෙළවර විසඤ්ඤව වැටී මළේය. මේ ඇසූ රජතුමා මම නො අදහමි. මගේ පුතු බුදු බවට නො පත් ව කළුරිය කිරීමක් නො වන්නේය. මක්නිසා සුදොවුන් රජ නො ඇදහුවේද යත්, කාලදේවල තවුසන් වැඳවීමේ දී කළ පෙළහරත් දඹ ගස මුල දී කළ පෙළහරත් දුටු බැවිනි. නැවත බෝසතුන් සිහි ලැබ නැඟී සිටි කල්හි ඒ දෙවියෝ ම මහරජ, ඔබගේ පුත්‍රයා නීරෝගී ව සිටිතැ යි කීහ. රජ ද මගේ පුත්‍රයා නො බුදු ව නො මියන බව දනිමි යි කීය. අනතුරු ව බෝසත්හු මේ සිරුරට දුක් දීම වනාහි නිවනට මඟ නො වේ යි සිතා බත් ආදී ඕලාරික ආහාර වැළඳීම සඳහා ගම්, නියම් ගම්හි පිඬු පිණිස හැසිර මිශ්‍ර ආහාර වැළඳූහ. නැවතත් සිරුරෙහි දෙතිස් පුරුෂ ලක්‍ෂණ ප්‍රකට ව පෙනිණි. සිරුර ද රන්වන් විය. පස්වග මහණහු මොහු සවසක් ශරීරයට දුක් දෙමින් වත් පිරුව ද සියල්ල දන්නා නුවණ ලැබීමට නො හැකි විය. ගම් දනව්වල පිඬු පිණිස හැසිර ඕලාරික ආහාර වළඳමින් කෙසේ නම් හැකි වන්නේ ද ? මොහු සිව්පස බහුල බවට පැමිණියේය. මොහු වීර්යයෙන් පිරිහුණේය. අප මොහු විශේෂාධිගමයක් ලබතැ යි සිතීම හිස පටන් නහනු කැමැති කෙනෙක් පිනි බිඳුයෙන් නහමි යි සිතීම වැනිය. මොහුගෙන් අපට ප්‍රතිඵලයක් නැතැ යි බෝසතුන් අතහැර තමතමන්ගේ පාසිවුරු ගෙන අටළොස් යොදුනක් මඟ ගෙවා ගොස් ඉසිපතනයට පිවිසියහ.

එසමයෙහි උරුවේලාහි සේනානී නම් නියම් ගම සේනානී කෙළඹියාගේ ගෙහි උපන් සුජාතා දැරිය සුදුසු වියට පත්වූ කල්හි එක්

නුගරුකක් වෙත ගොස් ප්‍රාර්ථනාවක් කළාය. ඉදින් මම සමජාතික කුල ගෙයක කුමරකු සමග විවාපත් ව පළමු ව පුතකු ලබයි නම් වසරක් පාසා ලක්‍ෂයක් පරිත්‍යාග කොට පූජාවක් කරමි යි, ඇගේ ප්‍රාර්ථනාව සඵල විය. බෝසතුන් දුෂ්කර ක්‍රියා කළ සය වස සම්පූර්ණ වූ වෙසක් මස පුණු පොහෝ දින දේව පූජාව කරනු කැමැති සුජාතාවෝ පළමු කොට ම දෙනුන් දහසක් වැල්මී වනයක කවා ඒ දෙනුන්ගේ කිරි පන්සියක් දෙනුන්ට පොවා ඒ දෙනුන්ගේ කිරි ඉන් අඩකට ආදී වශයෙන් දෙනුන් අට දක්වා පොවා කිරෙහි ඝන බව මිහිරි බව ඔදවත් බව ඇති කරමින් කිරෙහි කිරි මාරු කිරීම නම් ක්‍රියාව කළහ. ඉක්බිති ඕතොමෝ වෙසක් පුණුපොහෝ දින ඉතා අළුයම නැගිට ඒ දෙනුන් අටදෙන දෙවීය. වසුපැටව් දෙනුන්ගේ තනමුලට නොපැමිණියහ. අළුත් භාජන තන මුලට ළං කළවිටම ස්‍වභාවිකව කිරිදහර වැටිණි. මේ අසිරිය දුටු සුජාතාවෝ සියතින්ම කිරිගෙන අළුත් බඳුන්වල බහා සියතින්ම ගිනි අවුළුවා පිසීමට ඇරඹූහ. මේ කිරිබත පිසෙන කල්හි මහත් මහත් බුබුළු පැනනැගී දකුණට කැරකැවෙමින් ඒ මේ අත හැසිරිණි. එක බිඳුවක් පමණ දූ පිටතට නොවැගිරිණි. ලිපෙන් සුළු වූද දුමක් නො නැංගේය. එකණෙහි ලෝකපාලක සතර වරං දෙවියෝ උදුනට ආරක්‍ෂා ගත්හ. මහබඹහු සේසත දැරූහ. සක් දෙවිඳු ගිනි පෙහෙලි පෙරලමින් ගිනි දැල්වීය. දෙවියෝ දෙදහසක් දිවයින් පිරිවර වූ සතර මහා ද්වීපයෙහි දෙවි මිනිසුන්ගේ පරිභෝජනයට සුදුසු වූ ඕජාව තම දේවානුභාවයෙන් දඬුවැල් බෑ මීවදයක් මිරිකා මී පැණි ගන්නාක්මෙන් කැටිකොට ගෙන එම කිරිබතට දැමූහ. අන්දිනවල දෙවියෝ පිඬක් පාසා දිව්‍යය ඕජස බහාලත්. සම්බුදු බවට පත්වන දිනයෙහි සහ පිරිනිවන්පානා දිනයෙහි දිව්‍යය ඕජස සැලියේ දී ම බහාලති.

සුජාතාවෝ එක දවසක් තුළ තමාට ම ප්‍රකට වූ අසිරිමත් සිදුවීම් දැක සුජාතා, පුණ්ණා දාසිය ඇමතුවාය. දුව පුණ්ණාවෙනි, අද අපගේ දෙවියෝ වඩාත්ම පහන් වූ සේය. මම මෙතෙක් කල් මෙබඳු අසිරියක් නුදුටු විරිමි. වහා ම ගොස් දෙවොල පිළිදැගුම් කරව යි පුණ්ණා දේවියගේ වදන් සතුටින් පිළිගෙන රුක් මුල වෙත වහාම ගියාය. බෝසත්හු ද ඉකුත් රැයෙහි පස් මහා සිහින දැක විමසන්නාහු, අද මම බුදු වෙමි යි අධිෂ්ඨානයෙන් යුතුව අළුයම සිරුර පිළිබඳ කටයුතු අවසන් කොට පිණ්ඩපාත කාලය පැමිණෙන තුරු ඒ නුග රුක මුල වැඩ හුන්හ. එතුමන්ගේ ශරීරාලෝකයෙන් නුග රුක

ආලෝකවත් විය. පුණ්ණා අවුත් බලන්නී, පෙරදිග බලා වැඩහුන් සිරුරින් නික්මෙන රැස් දහරින් මුළු ගස ම රන්වන් කරමින් වැඩසිටි බෝසතුන් දැක රුක් දෙවියා ගසින් බැස සියතින් ම පූජාව පිළිගැනීමට සිටිනවා විය යුතුයැ යි ඕ සිතුවාය. බියට පත් පුණ්ණා වෙළෙවිව ගොස් සුජාතාවන්ට මෙපුවත සැලකළාය.

සුජාතාවෝ ඇගේ වදන් අසා සතුටුව අද පටන් මගේ දෙටු දියණිය වන්නීයැ යි දියණිකට සුදුසු සියලු ආභරණ දුන්හ. බෝසතාණන් බුදු බවට පත්වන දිනයෙහි ලක්‍ෂයක් අගනා රන් බඳුනක් ලැබිය යුතු නිසා එබඳු රන් බඳුනක් ගෙන කිරි බත එහි බහාලනු පිණිස පිසූ බඳුන යටිකුරු කළහ. එවිට සියලු කිරිබතින් රන් බඳුන පිරිණි. නැවත වෙනත් රන් බඳුනකින් වසා වස්ත්‍රයක ඔතා තමා ද සර්වාභරණයෙන් සැරසී රන් පාත්‍රය හිස මත තබාගෙන මහත් සිරියාවෙන් නුග රුක මුලට ගොස් බෝසතුන් බලා රුක් දෙවි යන හැඟීමෙන් සතුටු ව දුටුතැන් සිට නැමි නැමී ගොස් හිසින් පාත්‍රය ගෙන පියන විවෘත කොට රන් කෙණ්ඩියෙන් සුවඳ ගැල්වූ දිය ගෙන බෝසතුන් ඉදිරියෙහි සිටියාය. පැවිදි වන දින ඝටීකාර මහා බඹහු විසින් දෙන ලද මැටි පාත්‍රය එතෙක් කලක් අත් නො හැර තිබී ඒ මොහොතෙහි අතුරුදන් විය. බෝසත්හු පාත්‍රය නැති නිසා දකුණු අත දිගු කොට පැන් පිළිගත්හ. සුජාතා දේවිය රන්පත සමග ම කිරි බත බෝසතුන් අත තැබුවාය. උන් වහන්සේ සුජාතා දෙස බැලූ ආකාරයෙන් ම කාරණය වටහාගත් සුජාතා දේවිය උතුමාණෙනි, මා විසින් රන්පාත්‍රය ඔබ වහන්සේට පිරිනැමිණි. කැමැති සේ එය රැගෙන යනු මැනැවැ යි වැඳ මගේ මනාදොළ සපිරුණාක් මෙන් ඔබ වහන්සේගේ පැතුම් සඵල වේවා යි පවසා ලක්‍ෂයක් වටිනා රන්පත දිරාපත් පතක් මෙන් අපේක්‍ෂා රහිත ව ගියාය.

බෝසතාණෝ ද වැඩහුන් තැනින් නැඟිට ගස පැදකුණු කොට පාත්‍රය රැගෙන නේරඤ්ජනා ගං තෙරට වැඩ නොයෙක් ලක්‍ෂ ගණන් බෝසත්වරුන්ට බුදු බවට පත්වන දිනයෙහි ස්නානය කරන සුප්පතිට්ඨිත නම් නහන තොටක් ඇත. එහි ඉවුරෙහි පාත්‍රය තබා බැස නා නොයෙක් ශතසහශ්‍ර සංඛ්‍යාත බුදුවරුන්ගේ චීවරය වූ අරහත්ධජය පොරවා පෙරදිගට අභිමුඛ ව වැඩහිඳ එක තල් ඇටයක් පමණ වන පරිදි එකුන්පණස් පිඩක් කොට ඒ මධුර පායාසය වැළඳූහ.

එම ආහාරය ම උන් වහන්සේට බුද්ධත්වයට පත්වූ පසු සත් සතියක් බෝමැඩ වැඩ විසීමට ආහාරය විය. ඒ කාලය තුළ වෙනත් ආහාරයක් නො වීය. ස්නානය කිරීමක් ද නො වීය. ශරීර මළ බැහැර කිරීමක් ද නො වීය. ධ්‍යාන සුවයෙන් හා මග ඵල සුවයෙන් කල්ගත කළහ. ඒ කිරි බත් ආහාරය වැළඳූ බෝසතාණෝ රන් පාත්‍රය ගෙන මම අද බුද්ධත්වයට පත්වන්නේ නම් මේ පාත්‍රය උඩු ගං දහර අනුව යේවා. නො හැකි වන්නේ නම් ගඟ දිය පහර අනුව යේවා යි සිතා ගඟට දැමූහ. පාත්‍රය ද ගඟ සැඩ පහර සිඳිමින් ගඟ මැදට ගොස් ජවසම්පන්න අශ්වයකු මෙන් මැදින් ම අසූ රියනක් පමණ තැන් ගොස් දිය සුළියක ගිලී කාල නා රජුගේ භවනට පෙර තුන් බුදුරදුන්ගේ පරිත්‍යාග කළ පාත්‍රයන් කිටි කිටි ශබ්දය නංවමින් ඒ පත්‍ර තුනට යටින් පිහිටියේය. කාල නාග රාජයා ඒ ශබ්දය ආසා ඊයේ එක බුදුවරයෙකි. අද තවත් බුදුවරයෙක් උපන්හ යි නොයෙක් පද සිය ගණනින් තුටු ගී ගයමින් සිටියේය. ඔහුට වනාහි මහ පොළොව එක් යොදුන් තුන් ගව්වක් අහස පුරවා වැඩෙන කාලය අද හෝ ඊයේ හා සමාන වෙයි.

බෝසතාණෝ ගඟ අසබඩ මලින් ගැවසුණු සල්වනයෙහි දහවල් කාලය ගතකොට සවස මල් නැටුවෙන් බිඳෙන කාලයෙහි දෙවියන් විසින් සරසන ලද අට ඉස්බක් පමණ පැතිරී ගිය මගින් සිංහයකුමෙන් අභීතව ඇසතු බෝ රුක වෙත වැඩියහ. නා, යක්, ගුරුළු ආදීහු දිව්‍යමය සුවඳ මල් ආදියෙන් පූජා කළහ. දිව්‍යය සංගීතාදිය පැවත්වූහ. දශ දහසක් ලෝක සුවඳ මල් මාලාවක් මෙන් විය. සාධුකාර හඬ ද පැවත්විණි.

ඒ වේලාවෙහි සොත්ථිය නම් තණ වෙළෙන්දා තණ ගෙන ඉදිරියට එන්නේ බෝසතුන්ගේ ආකාරය දැන තණ අට මිටක් දුන්නේය. බෝසත්හු තණ අට මිට ගෙන බෝමැඩට නැග දකුණු දිශාවෙහි උතුරට මුහුණලා සිටියහ. එකෙණෙහි සක්වළෙහි දකුණු පැත්ත ගිලී අවීචි නිරය පැමිණියාක් මෙන් විය. උතුරු සක්වල භවාග්‍රයෙහි පිහිටියාක් මෙන් විය. බෝසත්හු මේ දිසාව සංබෝධියට සුදුසු දිසාව නො වේ' යී සලකා පැදකුණු කරමින් බටහිර දෙසට ගොස් පෙරදිගට මුහුණලා සිටියහ. එහිදී ද පෙර මෙන් බටහිර පැත්ත ගිලී අවීචියෙහි පිහිටියාක් මෙන් විය. පෙරදිග උඩට නැගී භාවාත්‍රයෙහි පිහිටියාක් මෙන් විය. බෝසතුන් සිටි සිටි තැන නැබින් තිබූ චක්‍රයක්

නේමියෙන් මඬනා කල මෙන් මහපොළොව උස් පහත් විය. එම දිශාව ද සම්බෝධි ස්ථාන නො වේයැ යි පැදකුණු කරමින් උතුරු දිශාවට ගොස් දකුණු දිසාවට මුහුණලා සිය පෙර පරිදි ම විය. ඒ දිශාව ද සම්බෝධි ස්ථානය නො වේයැ යි සිතූ බෝසතාණෝ පෙරදිගට ගොස් පැඳුම් දෙස බලා සිටියහ. පූර්ව දිශාව වනාහි සියලු බුදුවරයන්ගේ සම්බෝධි අසුන පිහිටන තැන වේ. ඒ උස් පහත් නො වේ. නො සැලේ.

බෝසතාණෝ මේ ස්ථානය සියලු බුදුවරයන්ගේ අත් නො හරින ලද නො සෙල්වන කෙළෙස් මැදිරි විනාශ කරන ස්ථානය යි දැන ඒ තණ අගින් ගෙන සෙලවීය. ඒ සමග ම තුදුස් රියන් වජ්රාසනය පැන නැඟිණි. ඒ තණ ඒ ආකාරයෙන් ම පිහිටියේය. ඉතා දක්ෂ සිත්කරුවකු හෝ පෙත්කරුවකු මේ ආසනය සිතුවම් කරන්ට සමත් නො වේ. බෝසතාණෝ ගසෙහි කඳට පිට දී පෙරදිගට අභිමුඛ ව දැඩි සිත් ඇති ව මගේ ශරීරයෙහි සම, නහර, ඇට විසි වේවා. මස්, ලේ වියලේවා. සම්මා සම්බුද්ධත්වයට නො පැමිණ මේ බද්ධාශනය නො හරින්නෙමි යි සිය ගණන් හෙන පාත් වුව ද නො බිඳිය හැකි, පරාජය කළ නො හැකි, පරියංකය බැඳ වැඩහුන්හ.

එකෙණෙහි මාර දෙව් පුත් සිදුහත් කුමරු මගේ බලය ඉක්මනු කැමැත්තේය. මම දැන් ඔහුට මා ඉක්මවන්නට ඉඩ නො දෙමි යි මර සෙනඟ වෙත ගොස් මෙම කරුණ කියා මර සෙනග සමග නික්මුණේය. ඒ මාර සේනාව මරු පෙරටුව දොළොස් යොදුනක් වෙයි. දකුණු හා වම් පසින් ද දොළොස් යොදුනක් ම විය. පිටුපසින් සක්වල කෙළවර කොට සිටියහ. උඩ දිශාවට නව යොදුනක් විය. මේ මාර සේනාවේ ගුගුරණ ශබ්දය පොළොව ගුගුරන කලක් මෙන් යොදුන් දහසක් ඇසේ. ඉක්බිති, මාර දෙව් පුත් අඩ සියයක් උස ගිරිමෙඛලා නම් ඇතු පිට නැඟී අත්දහසක් මවා නොයෙක් ආයුධ ගැන්වීය. අන් මර සෙනගට ද දෙදෙනකුට එක සමාන නො වන සේ විවිධ ආයුධ ගැන්වූහ. මර සෙනඟ නොයෙක් වර්ණයෙන් හා විවිධාකාර මුහුණුවලින් යුක්ත ව බෝසතුන් මැඩගෙන යන්නාක් මෙන් ඉදිරියට පැමිණියහ.

දශ දහසක් සක්වල දෙවියෝ බෝසතුන්ට තුති ගායනා කරමින් උන්හ. සක් දෙව් රජ විජයුත්තර නම් සංඛ පිඹමින් සිටියේය. ඒ සංඛ වනාහි එක්සිය විසි රියන් වෙයි. එක්වරක් පිඹිකල සිව් මසක් ඇව් දී නිහඬ වෙයි. එකල්හි මහා කෙළ නා රජ සියණින් ගීවලින් බෝසතුන් ගුණ වණමින් සිටියේය. මහබඹු සුදු කුඩය දරමින් සිටියේය. මර සෙනඟ බෝමැඩ ළඟට පැමිණෙත් ම ඔවුන්ගෙන් එක් අයකුට හෝ සිටින්ට නො හැකි විය. හිස් ලූ ලූ අත පලාගියහ. නා රජ පොළොව කිමිදී යොදුන් පන්සියයක් වූ මඤ්ජෙරික නාග භවනයට ගොස් දෙඅතින් මුහුණ වසාගෙන හොත්තේය. සක් දෙවිඳු විජයුත්තර සංඛය පිට තබාගෙන සක්වල මුවවිට සිටියේය. මහබඹු සේසත සක්වල කෙළවර තබා බඹ ලොවට ම ගියේය. එක දෙවියකු හෝ සිටින්ට සමත් නො වීය. බෝසතාණෝ තනි ව සිටියහ. මාරයා සිය පිරිස අමතා කීය. දරුවනි, සුද්ධෝදන පුත්‍ර සිද්ධාර්ථ සමාන අන් කෙනකු නැත. මුහුණට මුහුණලා යුද කිරීමට අපි සමත් නො වෙමු. පසු පසින් යුද කරමු.

බෝසතාණෝ තුන් පැති බලා සියලු දෙවියන් පලාගිය බැවින් හිස්ව ඇති බව දැන නැවත උතුරු දෙසින් මර සෙනඟ තමා මැඩීමට එන බව දැක මේ විශාල සෙනඟ එකලා මා සඳහා උත්සාහ කරති. මෙහි මා සඳහා මව්පිය සොහොයුරෝ හෝ අන් කිසිවකු හෝ නැත. මේ දශ පාරමිතාවෝ මවිසින් දිගුකලක් පෝෂණය කළ සේවකයෝ වැන්නාහ. එහෙයින් පාරමී ධර්ම පළිහක් කොට පාරමී නැමැති ආයුධයෙන් ම මේ මර පිරිස විසුරුවා හැරිය යුතු වන්නේය යි සිතා දශ පාරමිතාවන් සිහි කරමින් වැඩහුන්හ.

ඉක්බිති, මාර දෙව්පුත් මෙයින් ම සිදුහතුන් පලා පියමි යි සිතා මහා සුළඟක් මැවීය. එකෙණෙහි ම සියලු දිශාවෙන් වා මඬුලු හටගෙන යොදුන්, අඩ යොදුන්, තුන් යොදුන් පමණ වූ මහා පර්වත බිඳිමින් මහා ගස් මුලිනුපුටා සියලු ගම්, නියම් ගම් සුණුවිසුණු කරමින් පැමිණිය ද බෝසතුන්ගේ සිවුරු කොණක් හෝ සෙලවීමට සමත් නො වීය. නැවත මාරයා ජලයෙන් බෝසතුන් යට කොට මරමි යි ගණන් වළා පටල නැඟී මහා වරුෂා වට. වැසි ධාරා වේගයෙන් පොළොව සිදුරු විය. වන රුක් මතුපිටින් ගලා ආ මහා මේඝය බෝසතුන්ගේ සිවුර පිනි බිඳකින් තෙමෙන පමණකුදු තෙමීමට

අසමත් විය. අනතුරු ව ගල් වරුෂාවක් වැස්සවීය. මහත් වූ පර්වත මෙන් ගල් ගිනිගෙන දුම් දමමින් අහසින් අවුත් බෝසතුන් වෙත පැමිණ දිව මල් බවට පත්විය. අනතුරු ව ආයුධ වරුෂාවක් වැස්සවීය. එක් පැත්තක මුවහත් ඇති දෙපැත්තෙහි මුවහත් ඇති කඩු, අඩයටි, ඊතල ආදිය ගිනි ගෙන දිළිසෙමින් දුම් දමමින් අහසින් බෝසතුන් වෙත අවුත් දිව කුසුම් බව පත්විය. අනතුරු ව අඟුරු වර්ෂාවක් වැස්ස වීය. කිණිහිරි මල් වන් ගිනි අඟුරු අහසින් අවුත් බෝසතුන් පාමුල දිව කුසුම් මෙන් විසිරිණි. අනතුරු ව අළු වරුෂාවක් වැස්සවීය. ඉතා උණුම් වූ ගිනි ගත් අළු අහසින් අවුත් බෝසතුන්ගේ පාමුල සඳුන් සුණු මෙන් වැටිණි. අනතුරු ව වැලි වරුෂාවක් වැස්ස වීය. ඉතා සියුම් වැලි ගිනි ගෙන දුම් දමමින් අහසින් අවුත් දිව මල් බවට පත්විය. අනතුරු ව මඩ වරුෂාවක් වැස්සවීය. ගිනිගෙන දිළිසෙන මඩ අහසින් අවුත් බෝසතුන් පාමුල දිව විලවුන් බවට පත්විය. අනතුරු ව මෙයින් සිදුහත් බිය ගන්වා පළවා හරමි යි ගනඳුරක් මැවීය. සිව් අතකින් වුත් මහගනඳුර මෙන් ගනාන්ධකාරය බෝසතුන් වෙත පැමිණ සූර්යාලෝකයෙන් මෙන් අතුරුදන් විය.

මෙසේ මාරයා සුළඟ, වැස්ස, ගල්, ආයුධ, අඟුරු, අළු, වැලි, මඩ, අඳුර යන නව වරුෂාවෙන් බෝසතුන් පලවා හරින්ට නො හැකි ව මර සෙනඟ අමතා කොල බලා සිටින්නේ ඇයි ? සිදුහතුන් අල්ල ගනු. නසනු. පලවා හරිව් යි අණ කොට තමා ද ගිරිමේඛලා ඇතු පිට සිට චක්‍රායුධය ගෙන බෝසතුන් ළඟට අවුත් සිදුහත් කුමරිනි, පළඟින් නැඟිටිනු. එය ඔබට අයිති නැත. ඒ පැමිණිය යුත්තේ මා වෙතයැ යි කීය. එවිට බෝසත්හු ඔහුගේ වචනය අසා මෙසේ වදාළහ. මාරය, ඔබ දශ පාරමිතා නො පිරුවෙහි. දශ උප පාරමිතා ද නො පිරිවෙහි. දශ පරමත්ථ පාරමිතා ද නො පිරිවෙහි. එසේ ම ඔබ අංග, ධන, පුත්‍ර ආදී මහා පරිත්‍යාගයන් නො කළෙහිය. එසේ ම ඥාතිචරියා නම් වූ ඥාති වරිගයාගේ හිතසුව පිණිස හැසිරීම, ලොකිර්ථචරියා නම් ලෝකයාට හිතසුව පිණිස හැසිරීම, බුද්ධචරියා ඥාණය වර්ධනය කිරීම යන ත්‍රිවිධ චර්යාවෙහි ඔබ නො හැසුරුනෙහිය. එම නිසා මේ පළඟ මා සතුය. ඔබට අයත් නො වේ.

අනතුරු ව කිපුණු මාරයා තරහ වේගය දරාගත නො හැකි ව බෝසතුන් වෙත චක්‍රායුධය දමා ගැසීය. එය ද දශ පෙරුම් දම්

බලය සිහි කැරෙමින් සිටි බෝසතුන්ගේ හිස මතුයෙහි මල් වියනක් වී සිටියේය. එම සියුම් මුවහත් ඇති චක්‍රායුධය අන් දිනවල කිපුණු මරු විසින් විහිදූවා හලේ නම් කළු ගල් ටැඹක් වුව ද හුණබඩක් මෙන් සිඳීයන්නේය. එදින චක්‍රායුධය බෝසතුන්ගේ හිස මතුයෙහි මල් වියනක් මෙන් සිටි කල්හි මර සෙනඟ දූන් දූන් පළඟින් නැඟිට පලා යෙති යි මහත් ගල් කුළු පෙරළා හැරියහ. ඒවා ද පාරමී බලයෙන් මල් ගුලා බවට පත් ව බිම වැටිණි.

දෙවියෝ සක්වල ගැබ මුවවිටියෙහි සිට ගෙල ඔසවා හිස් උස් කොට සිදුහත් කුමරුන්ගේ රුවින් අගතැන් පත් ශරීරය දුටුයේය. දූන් කුමක් සිදුවන්නේදැ යි විමසමින් සිටිති. අනතුරු ව බෝසතාණෝ දශ පෙරුම් පිරූ බෝසත්වරුන් බුදුවන දවසෙහි ලැබෙන පළඟ අද මට හිමි වෙයි. මාරය, ඔබ දාන පාරමිතාව පිරූ බව කවරෙක් සාක්ෂිදැ යි ඇසූහ. එවිට මාරයා, මෙතෙක් දෙනා මට සාක්ෂියැ යි මර සෙනඟ දෙසට අත දිගු කළේය. මර සෙනඟ ද මම ශාක්ෂි වෙමි. මම ශාක්ෂි වෙමි යි ඔවුන් වෙන වෙන ම නැඟූ හඬ මහ පොළොව ගුගුරණ ශබ්දය මෙන් විය. මාරයා ද බෝසතුන්ට සිදුහත් කුමරුනි, ඔබ දාන පාරමිතාව පිරූ බවට කවරෙක් සාක්ෂි ද ? මාරය, ඔබට දාන පාරමිතාව පිරූ බවට සජීවී සාක්ෂි ඇත. මට මෙහි සජීවී සාක්ෂියක් නැත. නොයෙක් ආත්මවල දී පිරූ දාන පාරමිතාව තිබේ. වෙස්සන්තර ආත්මයේ දී සත්තසතක සත් සියය නම් මහා දානය දුන් බවට මේ සිත් පිත් නැති මහපොළොව සාක්ෂි වේයැ යි සිවුරු ගැබ අතරින් දකුණු අත දිගු කොට වෙස්සන්තර කාලයේ දුන් ඒ මහා දානයට ඔබ සාක්ෂි ද, නැද්දැ යි පොළොව දෙසට අත දික් කළහ. මහපොළොව මම ඔබ වහන්සේට සාක්ෂි වෙමි යි කියන්නාක් මෙන් ලක්ෂ සංඛ්‍යාත මහහඬ පතුරුවමින් මාර බලය යට කැරෙමින් රාවය පැතිරිණි.

මෙසේ බෝසතුන් ඒ මහා දානය නැවත නැවත සිහි කරන කල්හි ගිරිමේඛල හස්තියා බෝසතුන් ඉදිරියේ දණ ගැසිය. මාර පිරිස ඒ ඒ දිශාවට පලා ගියෝය. දෙදෙනෙක් එක මඟින් නො ගියෝය. හිස් වෙළුම් ද ඇඳි වස්ත්‍ර ද අතහැර ඒ ඒ දිශාවෙන් පැන දිවූහ. දේව සමූහයා පලායන මර සෙනඟ දැක මාරයා පරාජය වූයේය. සිදුහත් කුමරුවන්ට ජය වූයේය. ජය පූජා කරමු යි සුවඳ මල් අතැති ව බෝමැඩ වෙත පැමිණියහ. එසේ ම නාග, ගරුඬ, දේව සහ

බ්‍රහ්මයෝ ද බෝසතුන් වෙත පැමිණ පූජා කළහ. ඔවුන් ගිය කල්හි සෙසු දශ දහසක් සක්වල දෙවියෝ මල්, ගඳ විලවුන් ආදියෙන් පූජා කැරෙමින් මෙසේ ස්තුති ඝෝෂා කැරෙමින් සිටියහ.

"එදා මේ නාග සමූහයා බෝමළුවෙහි සතුටු වූවාහු, මෙසේ ප්‍රීති ඝෝෂා කළහ. මහා ඍෂිවරයාණන් වූ මනා රූසපුවෙන් යුත් බුදු රජුන් වහන්සේට ජය විය. පාපී වූ මරු හට පරාජය අත්විය."

"එදා මේ ගුරුළු සමූහයා බෝමළුවෙහි සතුටු වූවාහු, මෙසේ ප්‍රීති ඝෝෂා කළහ. මහා ඍෂිවරයාණන් වූ මනා රූසපුවෙන් යුත් බුදු රජුන් වහන්සේට ජය විය. පාපී වූ මරු හට පරාජය අත්විය."

"එදා මේ දේව සමූහයා බෝමළුවෙහි සතුටු වූවාහු, මෙසේ ප්‍රීති ඝෝෂා කළහ. මහා ඍෂිවරයාණන් වූ මනා රූසපුවෙන් යුත් බුදු රජුන් වහන්සේට ජය විය. පාපී වූ මරු හට පරාජය අත්විය."

"එදා මේ බ්‍රහ්ම සමූහයා බෝමළුවෙහි සතුටු වූවාහු, මෙසේ ප්‍රීති ඝෝෂා කළහ. මහා ඍෂිවරයාණන් වූ මනා රූසපුවෙන් යුත් බුදු රජුන් වහන්සේට ජය විය. පාපී වූ මරු හට පරාජය අත්විය."

මෙසේ බෝසතාණෝ හිරු බැසයාමට පෙර ම මාර බලය පරාජය කොට රන් පබළු දැලකින් පුදන්නාක් මෙන් සිවුර මත බෝ අංකුර වැටෙද්දී පළමු යාමයෙහි පෙර විසූ කඳ පිළිවෙළ දන්නා නුවණ ද දෙවැනි යාමයේ දී දිවැස් ඥාණය ද ලබා පැසුළු යාමයෙහි පටිච්චසමුප්පාදය - හේතු ප්‍රත්‍යය ඥාණය ද ලබාගත්හ. මෙහි දී උන් වහන්සේ අවිජ්ජා ආදී පද දොළසකින් යුත් පටිච්චසමුප්පාදය පැවත්ම නො පැවැත්ම වශයෙන් ද මුල සිට අගට ද අග සිට මුලට ද යන අනුලෝම ප්‍රතිලෝම වශයෙන් ද විමර්ශනය කැරෙද්දී ජලය කෙළවර කොට ඇති දශ දහසක් ලෝක ධාතුව දොළොස් වරක් ම කම්පා විය.

බුදුන් වහන්සේ දශ දහසක් ලෝක කම්පා කොට අළුයම් වේලෙහි සියල්ල දන්නා නුවණ හෙවත් සබ්බඤ්ඤුත ඥාණය අවබෝධ කරන කල්හි දශ දහසක් සක්වල සියලු අලංකාරයෙන් සැරසිණි. ඒ ඒ සක්වල පෙරදිග මුවවිටියෙහි එසවූ ධජ කෙළවරින් නිකුත්වන රැස් දහර බටහිර මුවවිටියෙහි වැදේ. එසේ ම බටහිර මුවවිටියෙහි එසවූ ධජ කෙළවරින් නිකුත්වන රැස් දහර පෙරදිග මුවවිටියෙහි වැදේ. මේ අයුරින් උතුරු දකුණු දිශාවල එසවූ ධජ කෙළවරරින් නිකුත්වන රැස් දහරවල් ද ප්‍රතිවිරුද්ධ දිශා මුවවිටියෙහි වැදේ. පොළොවෙහි ඔසවන ලද ධජ කෙළවර බඹ ලොව හැපේ. බඹ ලොව එසවූ ධජ කෙළවර පොළොවෙහි හැපේ. එසේ ම දශ දහසක් සක්වල මල්, ගෙඩි හට ගන්නා ගස්වල මල් ගෙඩි හටගැනිණි. රුක් කඳෙහි ද මල් පිපිණි. අතු, රිකිළි, ලියවැල්වල මල් පිපුනේය. අහසෙහි එල්බෙන පියුම් පිපිණි. ගල්තලා බිඳ මතු මතු සතක් වන සේ දඬු පියුම් පැන නැඟිණි.

දශ දහසක් සක්වල වට කොට ඇති මල් ගුලියක් මෙන් ද මනාව සකස් කළ මල් ඇතිරියක් මෙන් ද විය. සක්වල අතර ලෝකන්තරික අපාය ද ඉරු සත් දෙනකු උදාවූ කල මෙන් අලෝකවත් විය. යොදුන් අසූහාර දහසක් ගැඹුරු වූ මහා මුහුද මිහිරි රස ඇති විය. ගංගාවෝ ගලා නො බැස්සෝය. උපතින් අන්ධයෝ රූප දුටහ. උපතින් බිහිරෝ ශබ්ද ඇසූහ. උපතින් කොරු දෙපයින් ගමන් කළහ. සිරගත වූවෝ බන්ධන බිඳී නිදහස් වූහ. මෙසේ අපමණ සිරිසැපතින් පිදුම් ලබද්දී විවිධ අසිරිමත් දේ පහළ වෙද්දී සබ්බඤ්ඤුත ඥාණය හෙවත් සියල්ල දන්නා නුවණ අවබෝධ කොට සියලු බුදුවරයන් විසින් අත්නොහරින ලද ප්‍රීති වාක්‍යය පහළ කළ සේක.

"මම ශරීර නැමැති ගෙවල් සදන්නා සොයමින් ඔහු සොයාගත නො හැකි ව නොයෙක් ඉපදීම් ඇති සංසාරයෙහි ඇවිද්දෙමි. මක්නිසා ද යත්, නැවත නැවත ඉපදීම දුකක් බැවිනි."

"ශරීර නැමැති ගෙය සාදන වඩුව, මා විසින් ඔබ දක්නා ලද්දෙහිය. මා සඳහා ඔබ නැවත ගෙයක් නො තනන්නෙහිය. ඔබගේ සියලු ඉල ඇට බිඳින ලදී. ගෙයි

මුදුන විසුරුවා දමන ලද නිදහස වූ මගේ සිත නිවනට පැමිණියේය."

මෙසේ තුසිත පුරයෙහි පටන් බෝමැඩ දී සර්වඥතාවයට - සියල්ල දන්නා බවට පත්වන තුරු පැවැති කාල පරිච්ඡේදය අවිදූරෙ නිදාන නමැ යි දත යුතුය.

අවිදූරෙ නිදානය නිමි.

සන්තිකෙ නිදාන - ළඟ හේතුව වනාහි, භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම් අනේපිඬු සිටුගේ වෙහෙරෙහි වාසය කරන සේක. භාග්‍යවතුන් වහන්සේ විශාලා මහා නුවර කූටාගාර ශාලාවෙහි වාසය කරන සේක. මෙසේ ඒ ඒ තැන්වල බුදුන් වහන්සේ වාසය කරන කල්හි ඒ ඒ තැන් සන්තිකේ නිදානය යි කියන ලදී. එසේ කියන ලද නමුත් එය ද මුල පටන් මෙසේ දත යුතුය.

බෝ මැඩ දී උදාන වාක්‍යය පහළ කොට වැඩසිටි බුදුන් වහන්සේට මෙබඳු අදහසක් පහළ විය. මම මේ බෝමැඩ පළඟ සඳහා සාරසංඛ්‍යය කල්ප ලක්‍ෂයක් සසර ගමන් කළෙමි. ඒ කාලය තුළ මම මේ පළඟ සඳහා අලංකාර කළ හිස බොටුවෙන් සිඳ දුනිමි. අඳුනෙන් සැරසූ ඇස් සහ හෘදය මාංශ උපුටා දුනිමි. ජාලිය කුමරු වැනි පුතුන් කණ්හාජිනා කුමරිය වැනි දියණියන් මද්‍රී දේවි වැනි බිරියන් අනුන්ගේ බැල මෙහෙ සඳහා දුනිමි. මේ පළඟ මගේ නො පැරදුණු පළඟයි. බුදු බව ලබාගත් උතුම් පළඟයි. මෙහි වැඩහුන් මගේ සියලු ප්‍රාර්ථනා සඵල විය. තවදුරටත් මෙයින් නො නැඟිටිමි යි නොයෙක් කෙළ සිය ගණන් සමවත් සම වදිමින් සත් දිනක් එහි ම වැඩහුන්හ. ඒ සඳහා මෙසේ කියන ලදී.

"ඉක්බිති, භාග්‍යවතුන් වහන්සේ එම පළඟෙහි ම නිවන්
සුව විඳිමින් වැඩහුන් සේක."

ඉක්බිති, සමහර දෙවියන්ට බෝසතුන්ට තවමත් බුදු බව සඳහා කළයුතු දේ ඇත. එම නිසා පළඟෙහි ආශාව අත්නොහරිතැ යි සැකයක් ඇති විය. බුදුන් වහන්සේ ඔවුන්ගේ සිතුවිල්ල දැන ඔවුන්ගේ සැකය දුරු කරනු පිණිස අහසට නැඟී යමා මහපෙළහර දැක්වූ සේක. බෝමැඩ දී මේ කළ පෙළහර ද ඥාතීන් හමුවෙහි කළ පෙළහර ද පාටිකපුත්ත සමාගමයෙහි දැක්වූ පෙළහර ද මේ සියල්ල ගන්ඩම්බ රුක් මුල දී පෑ යමා මහපෙළහර හා සමාන විය. බුදුන් වහන්සේ මේ පෙළහරින් දෙවියන්ගේ සැක දුරු කොට බෝමැඩින් මදක් පෙරදිගට නැඹුරු ව උතුරු දිශාවෙහි සිට මේ රුක් මුල අසුනෙහි සිට මම සර්වඥ නුවණ ලැබුවෙමි. සාරසංඛ්‍යය කල්ප ලක්‍ෂයක් පිරූ පාරමී ඵල ලැබීමට ස්ථානය වියැ යි නො පියූ ඇසින් බෝරුක බලමින් සතියක් වැඩ සිටියහ. ඒ ස්ථානය අනිමිස චෛත්‍ය නම් විය.

අනතුරු ව බෝධි වෘක්ෂයටත් බුදුන් වැඩසිටි ස්ථානයටත් අතර පූර්ව දිශාවෙහි සිට පශ්චිම දිශාවට දික්වූ රුවන් සක්මන මවා එහි සක්මන් කැරෙමින් සතියක් ඉක්මවූහ. ඒ ස්ථානය රතනචංකම චෛතිය නම් විය.

සතර වැනි සතියෙහි බෝමැඩින් ඊසාන දිශාවෙහි රුවන් ගෙයක් මැවූහ. එහි පළඟින් වැඩ සිට අභිධර්ම පිටකය විශේෂයෙන් අනන්තනය සමන්තපට්ඨානය මෙනෙහි කරමින් සතියක් කල් ගෙවූහ. අභිධම්මිකයෝ මෙසේ කීහ.

> "රතනඝර නම් රනින් කළ ගෙයක් නො වේ. සත්ත ප්‍රකරණයන් මෙනෙහි කළ ස්ථානය නිසා රතනඝර නම් වීය."

මේ දෙයාකාරය ම සුදුසුය. එම නිසා දෙවිදිය ම ගත යුතුයි. මෙම ස්ථානය එතැන් පටන් රතනඝර චෛතිය නම් විය.

මෙසේ බුදුන් වහන්සේ බෝමළුව සමීපයෙහි ම සති හතරක් කල යවා පස් වැනි සතියෙහි බෝමැඩ සිට අජපල් නුග රුක වෙත වැඩ එහි දී ද ධර්මය මෙනෙහි කරමින් නිවන් සුව විඳිමින් වැඩ සිටියහ. එසමයෙහි මාර දෙව් පුත් මෙතෙක් කල් මොහුගේ සිදුරු සොයමින් ලුහු බැන්දේ වී නමුත් මොහුගේ කිසි දෝෂයක් නො දුටිමි. මොහු මගේ බලය ඉක්මවූයේයැ යි නො සතුටු ව මහමග හිඳ කරුණු සොළසක් මුල් කොට බිම රේඛා සොළසක් ඇන්දේය. මම මොහු මෙන් දාන පාරමිතාව නො පිරුවෙමි. එම නිසා මම මොහු සමාන කෙනෙක් නො වීමි යි පළමු වැනි රේඛාව ඇන්දේය. මම මොහු මෙන් ශීල පාරමිතාව, පඤ්ඤා, වීරිය, ඛන්ති, සච්ච, අධිෂ්ඨාන, මෛත්‍රා, උපේක්ෂා යන පාරමිතා නො පිරුවෙමි. එම නිසා මම ඔහු සමාන නො වීමි. ඒසේ ම මම මොහු මෙන් අන්‍යයන්ට පොදු නො වූ ඉන්ද්‍රියපරෝපරියත්ත ඥාණය, ආසයානුසය ඥාණය, මහා කරුණා සමාපත්ති ඥාණය, යමක ප්‍රාතිහාර්ය ඥාණය, අනාවරණ ඥාණය, සබ්බඤ්ඤුත ඥාණය ලැබීමට දශ පාරමිතාවන් නො පිරීමි. එම නිසා මම ඔහු හා සමාන නො වීමි යි, පිළිවෙලින් සොළොස් රේඛාව ද අඳිමින් හුන්නේය.

එවේලෙහි තණ්හා, රති, රගා යන මාර දියණියෝ තිදෙන අපගේ පියා පෙනෙන්ට නැත. ඔහු කොහි ගියේද යි බලන්නාහු, දොම්නසට පත් ව බිම ඉරි අඳිමින් සිටිනු දැක පියා ළඟට ගොස් නො සතුටට කාරණය විමසූහ. දියණියනි, මේ ශ්‍රමණ ගෞතමයෝ මගේ අණසක ඉක්මවා සිටිති. මෙතෙක් කල් ඔහු පසුපස ගිය මුත් ඔහුගේ වරදක් නුදුටිමි. එම නිසා දුකට පත්වීමි. එසේ නම් පියාණෙනි, ඒ ගැන නො සිතන්න. අපි ඔහු නතු කොට ගෙන එන්නෙමි. දියණිවරුනි, ඔහු කිසිවකුගේ වසඟයට ගත නො හැකිය. මේ මහා පුරුෂයා නො සෙලවෙන සැදැහැයෙන් යුක්ත වූයේය. පියාණෙනි, අපි ගැහැනු වෙමු. දැන් ම අපි ඔහු කාමාශා පුඬුවෙන් බඳින්නෙමු. ඒ ගැන ඔබ සැක නො සිතන්නැ යි, බුදුන් වහන්සේ වෙත එළැඹ ශ්‍රමණය, ඔබ පා මෙහෙවර කරමු යි කීහ. උන් වහන්සේ ඔවුන්ගේ වචනය සිතට නො ගත්හ. ඇස් ඇර බැලීමකුදු නො කළහ. අතිඋතුම් නිවන අරමුණු කොට කෙළෙසුන්ගෙන් මිදුණු සිත් ඇති ව ලෝකයෙන් වෙන්වීමේ සැපය ම විඳිමින් වැඩසිටි සේක. මාර දියණියෝ නැවතත් සිතන්නාහු, පුරුෂයන්ගේ රුචි අරුචි විවිධය. සමහර පුරුෂයෝ ලාබාල කුමරියන්ට පෙම් කරත්. සමහරු පළමු වයසෙහි සිටි කුමරියන්ට ද සමහරු මැදි වයසෙහි සිටි කුමරියන්ට ද සමහරු පැසුළු වයසෙහි සිටි ස්ත්‍රීන්ට පෙම් කරත්. අපි විවිධාකාර වෙස් ගෙන මොහු පොළොඹවමු යි එක එකී මාර දුව සිය ගණන් ආත්ම භාවයන් මවා ලාබාල, කුමරි, එකවරක් වැදූ, දෙවරක් වැදූ මැදි වයස්, පැසුළු වයස් වශයෙන් සයාකාරයකින් භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ ඔබ පා මෙහෙවර කරමු යි කීහ. උතුම් නිවනින් මිදීම ලැබූ උතුමෙක් යම් සේ ද උන් වහන්සේ ද එසේ ම ඔවුන් මෙනෙහි නො කළහ.

සමහර ආචාර්යවරු මෙසේ කියත්.

> "පැසුළු ස්ත්‍රීන් මෙන් බුදුන් වහන්සේ වෙත පැමිණියවුන් දැක ඔවුන් සියල්ලෝම දත්හැලී ගිය පැසුණු කෙස් ඇති ස්ත්‍රීහු වෙත්වා යි අධිෂ්ඨාන කළහ."

මේ පිළිගත යුතු නො වේ. උන් වහන්සේ එවැනි අධිෂ්ඨානයක් නො කරති. භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේ පිළිබඳ සිතා,

"ඉවත් වව්. තොපි කුමක් දැක මෙසේ වෙර වඩව් ද ? රාගාදී කෙළෙස් ප්‍රහීණ නො කළවුන් ඉදිරියෙහි මෙවැනි දේ කිරීම සුදුසු වේ. සම්බුදු වූ මාගේ ආශාව ප්‍රහීණය. තරහ ප්‍රහීණය. මුළාව ප්‍රහීනය."

ආදී වශයෙන් කියන ලද බව පිළිගත හැකිය. තමන් වහන්සේගේ කෙළෙස් සංසිඳීම අරබයා,

"යමකු විසින් දිනන ලද දෙය නැවත පරාජයට පත්කළ නො හැකි ද ඔහු විසින් පරදවන ලද හැම කිසි කලෙක ඔහු ලුහුබැඳ නො ඒ ද සියලු දේ දත් කෙළෙසුන්හි පිහිටීමක් නැති කල්හි කවර ආකාරකින් මරු වෙත ගෙන යව් ද ?"

"ජාලිනී (දැළක් වැනි වූ) නම් වූ ද විසත්තිකා (ඇලෙන සුළු වූ ද) නම් වූ තෘෂ්ණාව යමකුට නැද්ද සියලු දෙය පිරිසිඳ දත්, කෙළෙස් පිහිටීම් නැති ඒ බුදුහු කවරාකාරයකින් මරු වෙත ගෙන යව් ද ?"

ධම්ම පදයෙහි බුද්ධ වර්ගයෙහි මේ ගාථා දෙකින් දම් දෙසූහ. මාර දියණියෝ, අපගේ පියාණන් කී සේ ඇත්තක් මය. ලෝකයෙහි ශෝභන ගමන් ඇති රහතන් වහන්සේ රාගයෙන් තම වසඟයට පමුණුවා ගත නො හැකිය, ආදිය කියා පියා සමීපයට ම ගියෝය. බුදුන් වහන්සේ සතියක් එහි වැඩ මුචලින්ද - මිදෙල් රුක් මුලට වැඩියහ.

එහි සත් දවසක් නොකඩවා වස්නා කල්හි බුදුන් වහන්සේට ශීතාදී උවදුරු වළකනු සඳහා මුචලින්ද නා රජු විසින් සත් වරක් දරණවැලින් වටකොට ගෙන නො ඇහිරුණු ගඳකිළියෙහි වසන්නාක් මෙන් වැඩහිඳ නිවන් සුව විඳිමින් සත් දවසක් කල් ගෙවමින් වැඩ සිටියහ. අනතුරු ව උන් වහන්සේ රජායතනයට වැඩ එහි දී ද විමුත්ති සුව විඳිමින් වැඩ සිටියහ. මෙපමණකින් සත් සතිය හෙවත් නවසාළිස් දින සපිරිණි. මේ කාලය තුළ උන් වහන්සේට මුව දෙවීමක්

හෝ සිරුර පිළිදගුම් කිරීමක් හෝ අහර කිසක් නො වීය. ධ්‍යාන මග ඵල සුවයෙන් ම කල්ගත කළහ.

ඉක්බිති, උන් වහන්සේට මේ සතිය ඉකුත්වෙත් ම නවසාළිස් දිනයෙහි මුව දෙවීමට සිතක් උපන. එවේලෙහි සක් දෙවිඳු බෙහෙත් අරළු ගෙනවුත් පිළිගැන්වීය. ඒ වැළඳීමෙන් පසු සිරුරු මළ පහවිය. එවිට සක් දෙවිඳු ම නාලිය දැහැටි ද මුවදෝනා පැන් ද පිළිගැන්වීය. බුදුන් වහන්සේ එම දැහැටි වළඳා අනෝතත්ත විලේ දියෙන් මුව දෝවා එම රජායතන රුක් මුල ම වැඩසිටි සේක.

එදවස තපස්සු භල්ලික නම් වෙළෙඳ දෙබෑයෝ පන්සියයක් සමග උක්කලා ජනපදයේ සිට මැදුම් දෙසට එන්නාහු, තමන්ගේ පෙර අත් බවෙක ලේ නෑයකු වූ දෙවියකු විසින් ගැල් හිර කොට ගමන වළක්වා බුදුන් වහන්සේට ආහාර දානයෙහි උත්සාහවත් කරන ලද්දාහු, අත්සුණු සහ මී පිඬු ගෙන ස්වාමීනි, අනුකම්පා කොට මේ ආහාර පිළිගනු මැනවැ යි උන් වහන්සේ වෙත පැමිණ සිටියහ. එදින කිරිපිඬු පිළිගත් දිනයේ දී ම තමන් වහන්සේගේ පාත්‍රය අතුරුදහන් වූ බැවින් බුදුවරු අතට ආහාර නො පිළිගනිත්. කුමකින් පිළිගනිම්දැ යි සිතක් පහළ විය. උන් වහන්සේගේ සිත දැනගත් සතර වරම් දෙවියෝ ඉඳුනිල් මිණෙන් කළ පාත්‍ර සතරක් පිරිනැමූහ. බුදුන් වහන්සේ ඒ ප්‍රතික්ෂේප කළහ. ඔහු ම නැවත මුවෙන් ගලින් නිම වූ පාත්‍ර පිරිනැමූහ. උන් වහන්සේ ඒ සතර ම පිළිගෙන එකපිට එක තබා එක පාත්‍රයක් වන සේ ඉටූහ. ඒ සතරෙහි ම මුවවිට රේඛාවන් පෙනෙන සේ මධ්‍යය ප්‍රමාණයේ එක පාත්‍රයක් බවට පත්විය. බුදුන් වහන්සේ එකෙණෙහි ලැබුණු ශෛලමය පාත්‍රයෙන් ආහාර පිළිගෙන වළඳා අනුමෙවනි දම් දෙසූහ. වෙළඳ දෙබෑයෝ බුදුන් දහම් පමණක් සරණ ගනිමින් බුද්ධ, ධම්ම යන වදන් දෙක පමණක් තෙපලීමෙන් ද්වේවාචික උපාසකයෝ වූහ. ඉක්බිති, ඔවුහු ස්වාමීනි, අපට පූජනීය වස්තුවක් දෙනු මැනවැ යි අයදියහ. උන් වහන්සේ දක්ෂිණ හස්තයෙන් සිරස පිරිමැද කෙස් රොදක් දුන්හ. තම නුවරට පෙරලා ගිය වෙළෙඳ දෙබෑයෝ ඒ කේශ ධාතු නිධන් කොට සෑයක් පිහිට වූහ.

බුදුන් වහන්සේ ද රාජායතනයෙන් නැඟිට අජපල් නුග රුක

මුල වැඩ සිටියහ. එහි දී උන් වහන්සේ සෑම බුදුරදුන්ට ම ආවේණික වූ තමන් වහන්සේ අවබෝධ කළ ධර්මයෙහි ගැඹුරු බව විමසන්ට විමසන්ට මෙරමා හට දහම් නො දෙසීමට සිත නැමුරු විය. මේ අවස්ථාවෙහි සහම්පතී බ්‍රහ්ම රාජයා අහෝ පින්වත්නි. ලෝකය විනාශ වන්නේය. අහෝ පින්වත්නි. ලෝකය විනාශ වන්නේයැ යි දශ දහසක් සක්වල සක්ක, සුයාම, සන්තුසිත, සුනිම්මිත, වසවර්ති මහා බ්‍රහ්ම යන දෙව් බඹුන් රැගෙන බුදු රජුන් වෙත එළැඹ ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ධර්මය දේශනා කරන සේක්වා. සුගතයන් වහන්ස, ධර්මය දේශනා කරන සේක්වා යි, ආදී ක්‍රමයෙන් දම් දෙසීම සඳහා යච්ඤා කළේය.

බුදුන් වහන්සේ දම් දෙසන බවට ප්‍රතිඥා දී කවරකු හට මම පළමු කොට දහම් දෙසම්දැ යි සිතන සේක්, ආළාර තවුසා නුවණැති බවත් ඔහු වහා ම ධර්ම අවබෝධ කැර ගන්නා බවත් දැන් ඔහු සතියකට පෙර කළුරිය කළ බවත් දැන උද්දක තවුසා පිළිබඳ සිතූ සේක. ඔහු ද පෙර දින සන්ධ්‍යාවේ දී කළුරිය කළ බව දැන පස්වග තෙරවරුන් කළ උපකාර සිහි කොට මෙකල්හි ඔවුන් කොහි වසන්නාහුදැ යි බලන සේක්, බරණැස මිගදායෙහි වෙසෙන බව දැන එහි ගොස් දම්සක් පවත්වම් යි සිතා දින කීපයක් බෝමැඩ අවට පිඬු පිණිස හැසිරෙමින් වාසය කොට ඇසල පුණු පොහෝ දිනයෙහි බරණැසට යම් යි තුදුස්වක දිනයෙහි රාත්‍රිය ඉක්මවා ඉතා අළුයම් වේලෙහි පාසිවුරු ගෙන අටළොස් යොදුන් මඟට බැස අතරමඟ උපක නම් ආජීවක දැක ඔහුට තමන් වහන්සේ බුදු බව ප්‍රකාශ කොට එදවස ම සවස් කාලයෙහි ඉසිපතනයට වැඩියහ.

පස්වග තෙරහු දුර දී ම බුදු රජුන් දැක ඇවැත්නි, මේ ශ්‍රමණ ගෞතමයෝ සිව්පසයෙන් ඕලාරික බවට පත් ව පිරිපුන් සිරුරු ඇති ව පැහැපත් ඉඳුරන් ඇති ව රන්වන් පාටින් බබළමින් අප කරා එති. මොහුට අපි වැඳීම් ආදිය නො කරමු. මොහු සම්භාවණීය කුලයක උපන් නිසා අසුනක් පැණවීමෙන් ගරු කිරීමට සුදුසුය. එම නිසා අපි ඔහුට අසුනක් පැනවීම පමණක් කරමු යි තීරණ කළහ.

බුදුන් වහන්සේ දෙවියන් සහිත ලෝවැස්සන්ගේ සිත්සතන් දැන ගැනීමට සමත් වූ නුවණින් මොවුන් කුමක් සිතන්නහුදැ යි විමසන

විට ඔවුන් සිතූ දේ දැන ගත්හ. ඉක්බිති, බුදුන් වහන්සේ පුද්ගල භේදයෙන් තොර ව දෙව් මිනිස් හැමදෙනා කෙරෙහි එක සේ පැවැත්වීමට සමත් මෙත් සිත හකුළුවා පස්වග තෙරුන් කෙරෙහි පමණක් පැතිර වූහ. උන් වහන්සේගේ මෙත් සිතින් පිබිදුණු ඔවුහු බුදු රජුන් ළඟට වඩිත් ම සිය කතිකාවෙහි සිටීමට නො හැක්කාහු, වැඳීම්, නැඟී සිටීම් ආදී සියලු චාරිත්‍ර විධි කළහ. එහෙත් සම්බුද්ධ වූ බව නො දත් නිසා "ආවුසො" - ඇවැත්නි යන වචන ව්‍යවහාර කළහ.

බුදුන් වහන්සේ පස්වග තෙරුන් අමතා මහණෙනි, තථාගතයන් වහන්සේට නමින් හෝ ආවුසෝ වාදයෙන් නො අමතනු. මහණනි, මම රහත් ව සත්‍යයවාදී සම්බුදු බවට පැමිණියෙමි යි තමන් වහන්සේ සම්බුදු බව හඟවා පණවන ලද උතුම් බුද්ධාසනයෙහි වැඩ හිඳ උතුරුසළ නැකත පහන්ව ඇති කල්හි අටළොස් කෙළක් පිරිවරා පස්වග තෙරුන් අමතා දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කළ සේක. ඔවුනතුරින් කොණ්ඩඤ්ඤ තෙරණුවෝ දම් දෙසුම අනුව සිත මෙහෙයවා බඹුන් සහිත ව සෝවාන් ඵලයෙහි පිහිටියහ. බුදුන් වහන්සේ එහි ම වස් වසා දෙවැනි දවස් වප්ප තෙරණුවන්ට දම් දෙසමින් විහාරයෙහි ම වැඩ සිටියහ. ඉතිරි සතර දෙන පිඬු පිණිස වැඩියහ. වප්ප තෙරණුවෝ පෙරවරුයෙහි සෝවාන් ඵලයෙහි පිහිටියහ. මේ ක්‍රමය අනුව ඊළඟ දිනයෙහි භද්දිය තෙරණුවෝ ද ඊළඟ දිනයෙහි මහානාම තෙරණුවෝ ද ඊළඟ දිනයෙහි අස්සජි තෙරණුවෝ ද යන සියල්ලෝ ම සෝවාන් ඵලයෙහි පිහිටුවා විසේනිය දිනයෙහි තෙරණුවන් පස් නමම එකතු කොට අනත්ත ලක්ඛණ සූත්‍රය දේශනා කළහ. මේ දේශනාව කෙළවර පස් තෙරවරු ම රහත් බවට පැමිණියහ.

එම රාත්‍රියෙහි ම නින්දෙන් පිබිදී ගෙය අතහැර නික්මුණු යස කුල පුතුන්ගේ පුණ්‍යය හේතු සම්පත් දුටු බුදුන් වහන්සේ යස, මෙහි එන්නැ යි ළඟට කැඳවා එම රාත්‍රිය තුළ දී ම සෝවාන් ඵලයෙහි ද දෙවැනි දවසෙහි රහත් ඵලයෙහි පිහිටුවා එම යස කුල පුතුන්ගේ ම යහළුවන් සූපණස් කෙනෙක් එහි භික්ඛු පැවිද්දෙන් පැවිදි කොට රහත් බවට පත් කළහ.

මෙසේ ලෝකයෙහි එක් සැට නමක් රහතුන් ඇති වූ කල්හි බුදුන් වහන්සේ වස් පවාරණය කොට මහණනි, චාරිකාවෙහි යව් යි සැට නමක් භික්ෂූන් වහන්සේ ඒ ඒ දිශාවන්හි යවා තමන් වහන්සේ උරුවේලාවට වඩින සේක්, අතරමඟ කපු වනයෙහි දී භද්දවග්ගිය කුමරුන් තිස් දෙනා දැමූ සේක. ඔවුනතුරින් සියල්ලට ම ලාබාල ව සිටි කුමරු සෝවාන් ඵලයෙහි පිහිටි අතර වැඩිහිටි කුමරා අනාගාමී ඵලයෙහි පිහිටියේය. ඒ සියලු දෙන ම ඒහි භික්ඛු භාවයෙන් පැවිදි කොට විවිධ දිශාවන්හි යවා තමන් වහන්සේ උරුවෙලාවට වැඩ තුන්දහස් පන්සියයක් පෙළහර දක්වා දහසක් ජටිල පැවිද්දන් පිරිවර කොට ඇති උරුවෙල කස්සප ආදී සහෝදර වූ තුන්බෑ ජටිල පැවිද්දන් බුදු සසුනෙහි පහදවා ඒහි භික්ඛු පැවිද්දෙන් පැවිදි කොට ගයාසීස නම් ස්ථානයෙහි හිඳුවා ආදිත්තපරියාය සූත්‍ර දේනාවෙන් රහත් බවෙහි පිහිටුවා ඒ දහසක් රහතුන් විසින් පිරිවරන ලදුව බිම්සර රජුට දුන් පොරොන්දුව ඉටුකිරීම පිණිස රජගහ නුවර ආසන්නයෙහි පිහිටි වැල්මී වනයට වැඩි සේක.

උයන්පල්ලාගෙන් බුදුන් වහන්සේ වැඩි බව ඇසූ බිම්සර රජ එක් ලක්ෂ විසි දහසක් බමුණන් හා ගැහැවියන් පිරිවරන ලදුව බුදු රජුන් වෙත එළැඹ සක් ලකුණින් විසිතුරු වූ සිරිපා පතුලෙහි රන් සළු වියනක් මෙන් කාන්ති විහිදෙන උන් වහන්සේගේ පාදයන් හිසින් වැටී නැමැද පිරිස් සමග එකත්පසෙව සිටියේය. ඉක්බිති, එහි සිටි බමුණු ගැහැවියන්ට මෙසේ සිතිණි. කිම, ශ්‍රමණ ගෞතමයෝ උරුවේල කස්සපගේ සසුනෙහි සච්වෙක් ද ? නො එසේ නම් උරුවේල කස්සප ශ්‍රමණ ගෞතමයන්ගේ සසුනෙහි සච්වෙක් ද ? බුදුන් වහන්සේ ඔවුන් සිතු සිතුවිල්ල දැන තෙරුන්ට මේ ගාථාව වදාළහ.

> "තම සව්වන්ට අනුශාසනා කරන කස්සපයෙනි, ඔබ
> කිනම් ධර්මයක් දැන ගිනි පූජාව අත්හලෙහි ද ?
> ඔබගෙන් මේ කරුණ අසමි. ඔබ ගිනි පූජාව අත්හලේ
> කිනම් ධර්මයක් දැන ද ?"

කස්සප තෙරණුවෝ ද බුදු රජුන්ගේ අදහස දැන මේ ගාථාව ප්‍රකාශ කළහ.

"රූප, ශබ්ද හා රස ද ස්ත්‍රීන් යන ඇලුම් කළයුතු දේ
යාගයෙන් ලැබෙතැ යි කියති. මම ඒවා කෙළෙස් මළ
වශයෙන් දන ඒ නිසා ම යාගයෙහි හා ගිනි පූජාවෙහි
නො ඇලීමි." *

මෙසේ තමන් බුදු රජුන්ගේ ශ්‍රාවකයකු බව ප්‍රකාශ කිරීමට උන් වහන්සේගේ පාපුටුවෙහි හිස තබා මම තථාගතයන් වහන්සේගේ සව්වෙක් වෙමි යි ප්‍රකාශ කොට එක තල් ගසක ප්‍රමාණයේ සිට සත් තල් ගස් ප්‍රමාණය දක්වා සත්වරක් අහසට පැන නැඟී බැස බුදුන් වැඳ එකත්පසෙව සිටියහ. ඒ පෙළහර දුටු මහජනතාව බුදුවරුන්ගේ බලය අසිරිමත්ය. දැඩි මිසදුටුවකු වූ තමා රහත් වූවේයැ යි වරදවා සිතා සිටි උරුවෙල් කස්සපාදී ජටිලයන්ගේ මිසදිටු දළ බිඳ බුදු රජුන් විසින් දමනය කරන ලදැ යි බුදු ගුණ ගැයූහ. බුදුන් වහන්සේ පෙර භවයකදීත් උරුවේල කස්සපයන් දමනය කළ බව වදාරා මහා නාරදකස්සප ජාතකය ගෙනහැර දක්වා සිව්සස් වදාළහ. මගධ රජු එකොළොස් නහුතයක් හෙවත් එක් ලක්‍ෂ දශ දහසක් පිරිස සමග සෝවාන් ඵලයෙහි පිහිටියහ. දශ දහසක් උපාසක බවට පත්වූහ. රජ බුදු රජුන් සමීපයෙහි සිටියේ ම, තමා ලැබූ අස්වැසිලි පසක් ප්‍රකාශ කොට බුදුන් සරණ ගොස් සෙට දවසට ආරාධනා කොට පැදකුණු කොට ගියේය. දෙවැනි දවසෙහි බුදුන් දුටුවා වූ ද නො දුටු වූ ද සියලු රජගහ නුවර වැසියෝ අටලොස් කෝටියක් පමණ මිනිස්සු බුදුන් දකිනු පිණිස වැල්මී වනයට ගියහ. තුන්ගව් මාර්ගය පමණ නො වීය. මුළු වනය ම මිනිසුන්ගෙන් පිරී ඉතිරි ගියේය. මහජනතාව බුදු රජුන්ගේ අග තැන්පත් රූ සපුවෙන් යුත් ආත්ම භාවය දැකීමෙන් තෘප්තියට පත් වූහ. මේ බුදුරදුන්ගේ රූප සමාපත්තිය ම වණ්නා කටයුතුය.

මෙසේ බුද්ධ ශරීරය බලන්නා වූ මහජනයාගෙන් සියලු ම වැල්මී වනය ද මාර්ගය ද පිරීගිය කල්හි එක භික්ෂුවකට වත් ඇතුලු වීමට ඉඩ නො ලැබුණි. මේ නිසා එදින බුදුන් වහන්සේට සුන්බත්වන්ට තිබිණි. ඒ එසේ නො වේවා යි සක් දෙවිඳුගේ පඬුඇඹුල් අස්න උණුසුම් ආකාරයක් දක්වීය. ඔහු කාරණය දැන තරුණ වේෂයක් මවාගෙන රත්නත්‍රය පිළිබිඹු වන ස්තුති ගීතිකා ගයමින් බුදුරදුන් පෙරටුව බැස දේවානුභාවයෙන් මාර්ගයේ ඉඩ

* මේ ගාථාව ඉංග්‍රීසි පොතෙහි නැත. මේ ගාථාවට අටුවාවක් සිංහල පොත්වල ද නැත.

ලබාදෙමින්,

"රන්වන් පාටින් බබළන බුදුන් වහන්සේ තමා දමුණු සේක්, දමුණු පුරාණ ජටිල රහතුන් සමග රජගහ නුවරට වැඩි සේක."

"කෙලෙසුන්ගෙන් මිදුණා වූ බුදුන් වහන්සේ රන්වන් පාටින් බබළමින් රජගහ නුවරට වැඩි සේක."

"රන්වන් පාටින් බබළන බුදුන් වහන්සේ සසරින් එතැර වූ සේක්, සසරින් එතැර වූ පුරාණ ජටිල රහතුන් සමග රජගහ නුවරට වැඩි සේක."

"දශ විධ ආරිය වාස ඇති, කාය බල ආදී දශ බල ඇති, කුසලාකුසල ආදී දශ ධර්මයන් අවබෝධ කළා වූ, දශ අසේඛ අංගයෙන් යුක්ත වූ, දහසක් සඟුන් පිරිවැරූ බුදුන් වහන්සේ රජගහ නුවරට වැඩි සේක."

සක් දෙවිඳු මේ ගාථාවලින් බුදු ගුණ වණමින් බුදු රජුන් පෙරටුව ගියේය. මහජනතාව තරුණයාගේ රූසිරිය බලා මේ මානවක පෙර අප නුදුටු විරූයැ යි සිතා මොහු කවරෙක්ද යි විමසූහ. එවිට මානවකයා මෙසේ කීය,

"යමකු වීර්යයවත් ද සියලු ඉන්ද්‍රියන් විෂයයෙහි දමුණේ ද බුදු බවට පැමිණියේ ද තමා හට සමාන කෙනකු නොමැත්තේ ද රහත් වූයේ ද මහා වාංමාලාවෙන් යුක්ත ද මම ඒ බුදුන්ගේ සේවකයෙක් වෙමි."

ඉක්බිති, බුදුන් වහන්සේ සක් දෙවිඳු විසින් ඉඩ ලබාදුන් මඟින් මහසඟන පිරිවන ලදුව රජගහ නුවරට වැඩියහ. රජු බුදුපාමොක් මහා සඟනට මහදන් දී ස්වාමීනි, මම තෙරුවනින් ඈත්ව විසීමට නො හැක්කෙමි. වේලාවෙහි හෝ අවේලාවෙහි බුදුන් දක්මට පැමිණෙන්නෙමි. වැල්මී වන උයානය දුර වැඩිය. මගේ මේ

වේළුවන උයන වැඩි දුර නැත. ගමනාගමනයට පහසුය. එසේ ම බුදු රජුන්ට සුදුසු සෙනසුනක් ද වන්නේය. භාග්‍යවතුන් වහන්ස, මේ අරම පිළිගන්නා සේක්වා යි රන් කෙණ්ඩියෙන් මිණිවන් සුවඳ පැන් ගෙන බුදු රජුන් අත පැන් හෙළීමෙන් පිළිගැන්විණි. එකෙණෙහි බුදු සසුන මුල්බැස ගත්තේ යි මහපොළොව කම්පා විය. දඹදිව වේළුවනාරාමය හැර පොළොව කම්පා කොට පිළිගත් වෙනත් සෙනසුනක් නැත. ලක්දිව මහා විහාරය හැර පොළොව කම්පා කොට පිළිගත් වෙනත් සෙනසුනක් නැත. මෙසේ බුදු රජහු වේළුවනාරාමය පිළිගෙන රජුට අනුමෙවනි දම් දෙසා මහසඟන සමග වේළුවනයට වැඩියහ.

ඒ කාලයෙහි සාරිපුත්ත, මොග්ගල්ලාන නම් පිරිවැජි දෙදෙන නිවන් මඟ සොයමින් රජගහ නුවර ඇසුරු කොට වෙසෙත්. සාරිපුත්ත පරිබ්බාජක පිඬු පිණිස හැසිරෙන අස්සජි තෙරුණුවන් කෙරෙහි පැහැදී "යෙ ධම්මා හේතුප්පභවා" ආදී ගාථාව අසා සෝවාන් ඵලයෙහි පිහිටා යහළු වූ මොග්ගල්ලාන පරිබ්බාජකට ද එම ගාථාව ම කීය. ඔහු ද සෝවාන් ඵලයෙහි පිහිටියේය. ඔවුන් දෙදෙනා ම සඤ්ජය පිරිවැජියා හමුවී තමාගේ පිරිස ද සමග බුදුන් වෙත පැමිණ පැවිදි විය. මුගලන් තෙරුණුවෝ සත් දවසකින් රහත් බවට පැමිණියහ. සැරියුත් තෙරණුවෝ අටමසකින් රහත් බවට පැමිණියහ. බුදු රජහු ඒ තෙරුන් දෙදෙනා අගසව් තනතුරෙහි තැබූහ.

බුදුන් වහන්සේ එම වේළුවනාරාමයෙහි ම වැඩ වසන කල්හි සුද්ධෝදන මහරජතුමා මගේ පුත්‍රයා සය වසක් දුෂ්කර ක්‍රියා කොට බුද්ධත්වයට පැමිණ දම්සක් පවත්වා රජගහ නුවර ඇසුරු කොට වේළුවනයෙහි වෙසෙතැ යි අසා එක් ඇමැතියෙක් අමතා සගය, මේ අසනු. ඔබ දහසක් පුරුෂයන් පිරිවරා ගොස් මගේ වචනයෙන් පුතණුවන් දකිනු කැමැති බව පවසා වැඩමා ගෙන එන්නැ යි පවසා යැවීය. ඇමැති ද රජ අණ සිරසින් පිළිගෙන දහසක් පිරිවර සමග වහා ම සැට යොදුන් මඟ ගෙවා බුදු රජුන් සිව් පිරිස් මැද දම් දෙසන වේලෙහි විහාරයට පැමිණියේය. ඔහු රජුගේ දූත මෙහෙවර පසෙක තබා පිරිස් කෙළවර හිඳ දහම් ඇසූහ. සිටි පියවරේ දී ම ඔහු හැමදෙන රහත්බවට පත් වූහ. බුදුන් වහන්සේ ඒහි භික්ෂු පැවිද්දෙන් ඔවුන් පැවිදි කළේය. සෘද්ධිමය පාසිවුරු දරා සියවස්

පිරුණු තෙරවරු මෙන් වූහ. මඟ ඵල ලැබූ ආර්යය පුද්ගලයෝ මැදහත් වූවෝ වෙති. රහත් බවට පැමිණි මේ තෙරවරු ද රජුගේ හසුන බුදු රජුන්ට නො දන්වූහ. රජතුමා ගිය ඇමැතියා නො ආයේය. ආරංචියක් ද නැත. එම නිසා වෙනත් ඇමැතියකු පෙර මෙන් ම යැවීය. හේ ද බුදුන්ගෙන් දහම් අසා රහත් ව පැවිදි ව මැදහත් ව සිටියේය. මේ ආකාරයෙන් රජතුමා නව වාරයක් පුරුෂයන් දහස බැගින් පිරිවර දී ඇමැති නම දෙනෙක් යැවූහ. ඒ හැම දෙනම ආත්මාර්ථය ඉටු වූ පසු නිශ්ශබ්ද ව සිටියහ. හසුන් මාත්‍රයක්වත් නො ලැබූ රජු මේ හැමදෙනා මා කෙරෙහි ඇල්මක් නැත. මගේ වචනය කරන්නේ කවරෙක්දැ යි රාජ්‍යය සේනාව ම විමසන්නේ, කාලුදායි ඇමැති දුටුවේය. ඔහු රජුගේ සියලු කටයුතු ඉටුකරන ඇමැතිය. රජුට ඉතා විශ්වාසය. සිදුහත් කුමරු සමග එක දිනයෙහි ඉපදුණි. වැලි කෙළියෙහි සිට යහළුය. රජ ඔහු අමතා දරුව කාළුදායි, මම මගේ පුතණුවන් දකිනු කැමැති ව නව දහසක් පුරුෂයන් යැවීමි. එක් අයකුවත් හසුනකින්වත් තොරතුරක් නො දන්වීය. මගේ මරණය කෙදිනකදැ යි විශ්වාස නැත. මා ජීවත්ව සිටිය දී ම පුතු දකිනු කැමැත්තෙමි. ඔබට මපුතු පෙන්වන්ට හැකිදැ යි ඇසීය. දේවයිනි, මට පැවිදි වීමට ලැබෙන්නේ නම් හැකි වෙමි. දරුව, පැවිදි වී හෝ නො වී හෝ මගේ පුතු දක්වව්. රජුගේ දූත මෙහෙවර සතුටින් පිළිගත් කාළුදායි ඇමැති රජුගේ හසුන ද රැගෙන රජගහ නුවරට ගොස් බුදු රජුන් දම් දෙසන වේලාවෙහි පිරිස් කෙළවර සිට දහම් අසා පිරිවර සහිත ව රහත් ඵලයට පත් ව ඒහි භික්ඛු භාවයෙන් පැවිදි බව ලැබීය.

මේ වන විට බුදුන් වහන්සේ සම්බෝධියට පැමිණ ඉසිපතනයේ වස් කාලය ගත කොට උරුවෙලාවට වැඩමවා එහි තෙමසක් ගත කැරෙමින් තුන් බෑ ජටිලයන් පැවිදි කොට දහසක් සඟ පිරිස් පිරිවරා දුරුතු මස පුන් පොහෝ දින රජගහ නුවරට වැඩමවා එහි දෙමසක් විසූහ. මේ වනවිට බරණැසින් නික්මුණු තැන් පටන් පස් මසක් ඉකුත් වී තිබිණි. මේ අනුව හේමන්ත කාලය ඉකුත් විය. කාළුදායි තෙරුන් පැමිණ දින සිට සත් අට දවසකි. ඒ මැදින් මස පුණු පොහෝ දින තෙරණුවෝ සිතන්නාහු, දැන් ශීත කාලය ඉක්මී වසත් කාලය පැමිණ තිබේ. මින් පසු ශස්‍යය නෙළා ඉදිරි මාර්ගය හෙළි පෙහෙළි කොට තිබේ. පොළොව නිල් තණින් වැසී තිබේ. රුක් ලිය මලින් පිරී ඇත. මාර්ගය ගමනට සුදුසුය. බුදුන් වහන්සේට ඤාතීන්ට අනුග්‍රහ කිරීමට සුදුසු කාලයැ යි සිතා බුදුන් වෙත එළැඹ ගාථා සැටකින් බුදුන්

වහන්සේගේ කිඹුල්වත් පුර වැඩීම සඳහා ගමන් මඟ වැණූහ.

"ස්වාමීනි දැන් මේ වසන්ත කාලයෙහි වෘක්ෂයෝ පැරණි පත් හැර ගෙඩි හට ගැනීමට සුදුසු ව ළා දළු පත් නිසා කිහිරි අඟුරු රැසක් මෙනි. ඒ ගස් ගිනි දැල් හටගත්තාක් මෙන් ද බබළයි. මහා වීරයන් වහන්ස, දැන් ශාක්‍යය ඥාතීන් දැකීමට සුදුසු කාලයයි."

"යන මඟ වඩා ශීත නො වේ. වඩා උණුසුම් ද නො වේ. ආහාර පාන දුලබ නො වේ. භූමිය ඒතණින් තිල්වත් ව ඇත. මුනීන්ද්‍රයන් වහන්ස, මේ ඥාතීන් දැකීමට සුදුසු කාලයයි."

බුදුන් වහන්සේ, උදායි, මිහිරි ස්වරයෙන් ගමන් මඟ වණන්නේ මක්නිසාද යි ඇසූහ. ස්වාමීනි, සුද්ධෝදන මහරජතුමා බුදු රජුන් දකිනු කැමැත්තේ වෙයි. ඥාතීන්ට අනුග්‍රහ කරන්නේ නම් මැනවි. උදායි, මැනවි. ඥාතීන්ට අනුග්‍රහ කරමි. භික්ෂු සංඝයාට ගමික වත් සපුරුණු සඳහා දන්වනු. තෙරණුවෝ එසේ කළහ. ඉක්බිති, බුදුන් වහන්සේ අංග, මගධ දෙජනපදයෙන් ශ්‍රාවක බවට පැමිණි දශ දහසක් ද කිඹුල්වත් පුර වාසී ශ්‍රාවක දශ දහසක් ද යන සියල්ලම විසි දහසක් වූ රහතන් වහන්සේ පිරිවන ලදුව රජගහ නුවරින් නික්ම දිනපතා යොදුනක් දුර වඩිති. රජගහ නුවර සිට කපිලවත්ථු නුවරට යොදුන් සැටක් වූ මාර්ගය දෙමසකින් යමි යි නො ඉක්මන් ගමනින් වැඩියහ. කාළුදායි තෙරණුවෝ ද බුදු රජුන් නික්මුණු බව රජුට දැන්වීම සඳහා අහසට පැන නැඟී රජ මැඳුර අබියෙස පෙනී සිටියහ. රජ, තෙරුන් දැක සතුටු ව මා හැඟි පළඟක වඩා හිඳුවා තමා උදෙසා පිළියෙල කළ නොයෙක් අග්‍ර රසයෙන් යුත් භෝජනය පාත්‍රය පුරවා පිරිනැමීය. තෙරුණුවෝ නැඟිට යා යුතු ආකාරය දැක්වූහ. වැඩහිඳ වළඳන ලෙස රජ ඉල්ලීය. බුදු රජුන් වෙත ගොස් වළඳමි යි තෙරුණුවෝ පැවසූහ. එවිට රජ ස්වාමීනි, මපුතණුවෝ කොහි ද ? මහරජ විසි දහසක් මහසඟන පිරිවරා ඔබ දැකීම සඳහා ගමනට පිටත්වූහ. ඉතා සතුටු වූ රජතුමා ස්වාමීනි, මේ ආහාර ඔබ වහන්සේ වළඳනු මැනවි. යම්තාක් කලකින් මපුතණුවෝ මෙනුවරට වඩිත් ද ඒතාක් මෙහි සිට පිණ්ඩපාතය ගෙනයනු මැනවැ යි ආරාධනා කළේය. තෙරණුවෝ

පිළිගත්හ. රජතුමා තෙරණුවන් වළඳවා පාත්‍රය සුවඳ විලවුන් ගල්වා රසවත් අහර පුරවා බුදු රජුන්ට පිළිගැන්වීම සඳහා තෙරුන් අත තැබීය. තෙරණුවෝ සියල්ලන් බලා සිටිත් දී ම පාත්‍රය අහසට දමා තමන් ද අහසට පැන නැගී බුදු රජුන් වෙත අවුත් පිණ්ඩපාත පාත්‍රය උන් වහන්සේගේ අත තැබීය. බුදුන් වහන්සේ ඒ දානය වැළඳූහ. මේ ක්‍රමයෙන් තෙරණුවෝ දිනපතා පිණ්ඩපාතය ගෙන ආහ. බුදුන් වහන්සේ ද අතර මඟ කාලයේ දී රජුගේ ම පිණ්ඩපාත දානය වැළඳූහ. තෙරණුවෝ බත් කිස කෙළවර අද බුදු රජුන් මෙපමණ වැඩියහැ යි ගමන් මඟ සඳහන් කොට බුදු ගුණ සඳහන් කථාවෙන් බුදු රජුන් නො දැක ම රජ කුලය පැහැදවූහ. එම නිසා ම බුදු රජහු මහණෙනි, මගේ ශ්‍රාවකයන් අතුරින් කුල පහදවන්නන් අතුරින් මේ කාළුදායි පෙරමුණේ සිටිති යි අග තනතුරෙහි තැබූහ.

බුදු රජුන් කිඹුල්වතට පැමිණි කල්හි තම ශ්‍රේෂ්ඨ ඥාතියා දකිනු පිණිස සියලු ශාක්‍යයෝ රැස්ව බුදු රජුන්ට විසීමට තැනක් සොයන්නාහු, නිග්‍රෝධ ශාක්‍යයාගේ උයන සිත්කළු බව දැන එහි සියලු පිළිදගුම් කටයුතු කැරෙවා සුවඳ මල් අතැති ව උන් වහන්සේට පෙර ගමන් කරන්නාහු, සියලු අබරණින් සැරසුණු ළාබාල සාමාන්‍යය කුමර කුමරුවන් පළමු කොට යැවූහ. දෙවනු ව රජ කුමර කුමරියන් ද ඔවුන් අතරත වැඩහිටි ශාක්‍යයෝ මල් සුවඳ සුණු ආදියෙන් බුදුන් පුදමින් නිග්‍රෝධ උයනට ම ගියහ. එහි දී බුදුන් වහන්සේ විසි දහසක් රහතුන් පිරිවරා පණවන ලද බුදු අසුනෙහි වැඩ සිටියහ. ස්වභාවයෙන් ම ශාක්‍යයෝ කුල මානයෙන් උදම් වූවෝය. සිදුහත් කුමරු අපට වඩා වයසින් අඩුය. අපගේ බාල සොහොයුරුය. පුත්‍රයෙකි. මුනුපුරෙකි, ආදී වශයෙන් සිතා දහර රජ කුමර ආදීන්. පෙරටු ව සිටුවා ඔවුන් ලවා බුදු රජුන් වැඳීමට සලස්වා තුමූ පිටුපසින් නො වැඳ සිටියහ. ඔවුන්ගේ අදහස් දුටු බුදු රජහු මගේ ඥාතීහු මට නො වදිත්. මම දැන් ඔවුන් ලවා වන්දවමි යි අභිඥාපාදක ධ්‍යානයට සමවැද ඍද්ධි බලයෙන් අහසට නැගී ඒ මානාධික ශාක්‍යයන්ගේ හිසෙන් පස් විසුරුවමින් මෙන් ගණ්ඩ නම් අඹ රැක් මුල යමා මහපෙළහර මෙන් පෙළහරක් දැක්වූහ.

මේ අසිරිමත් පෙළහර දුටු පිය රජතුමා භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ උපන් දිනයෙහි කාලදේවල තවුසන් වැන්දවීම සඳහා

ඉදිරියට ගෙන ආ කල්හි ඔබ පා යුවල හැරී තවුසාගේ සිරසෙහි පිහිටනු දැක මා ඔබ වහන්සේට වැන්දෙමි. ඒ මගේ පළමු වැඳුමයි. වප්මඟුල දිනයෙහි ඔබ වහන්සේ දඹ ගස් සෙවෙණෙහි පළඟින් සිටීම ද රුක් සෙවණ නො වෙනස් ව තිබීම ද දැක මම වැන්දෙමි. ඒ මගේ දෙවැනි වැඳුමයි. දැන් නුදුටුවිරූ අසිරිමත් පෙළහර දැක ඔබ පා යුවළ වඳිමි. මේ මගේ තෙවැනි වැඳීමයි. රජතුමා බුදුන් වැඳ සිටි කල්හි, නො වැඳ සිටීමට සමත් එක ද ශාක්‍යයකු එහි නො සිටියේය. සියල්ලෝ ම වැන්දාහ. මෙසේ බුදුන් වහන්සේ ඥාතීන් වන්දවා අහසින් බැස, පැන වූ අසුනෙහි වැඩ සිටියහ. ඉන්පසු අතිවිශාල ඥාති සමාගමයක් විය. සියල්ලෝ ම එකඟ සිතින් සිටියහ. එවේලෙහි මහවලාවක් නැඟී කැමැත්තන් තෙමෙන අකමැත්තන් නො තෙමෙන පොකුරු වර්ෂාවක් වට. තඹවන් දියදහර රැව් දෙමින් වැටෙයි. මෙම වැස්සෙන් තෙමෙනු කැමැත්තෝ තෙමෙති. නො තෙමෙනු කැමැත්තෝ නො තෙමෙති. සිරුරෙහි වැහි බින්දුවකුදු නො වැටේ. මේ මහත් අසිරිමත් පෙර නො වූ සිද්ධිය දැක සියල්ලෝ ම පහන් සිත් ඇත්තෝ වූහ. මේ තත්ත්වය පසුබිම් කොට බුදු රජාණෝ මගේ ඥාති සමාගමයෙහි පොකුරු වැසි වටුණේ දැන් පමණක් නො වෙයි. පෙරත් පොකුරු වැසි වැටිණැ යි මහා වෙස්සන්තර ජාතකය දෙසූහ. අනතුරුව සියල්ලෝ ම නැඟිට ගියහ. රජ හෝ ඇමැති ආදී කිසිවෙක් හෙට දවසට බුදු රජුන්ට ආරාධනා නො කළහ.

බුදුන් වහන්සේ දෙවැනි දිනයෙහි විසි දහසක් සඟ පිරිස පිරිවරා කිඹුල්වත් නුවරට පිඬු සිඟා වැඩියහ. කිසිවෙක් ආරාධනා කළේ හෝ පාත්‍රය නො ගත්තේය. උන් වහන්සේ නගර දොරටුවෙහි සිට සිතූහ. පෙර බුදුවරු කෙසේ නම් කුල නුවරෙහි පිඬු පිණිස හැසුරුණාහු ද ? නුවර ඉසුරුමත් ගෙවලට පමණක් වැඩියාහු ද ? නො එසේ නම් ගෙපිළිවලින් වැඩියාහු ද ? එක ද බුදුන් වහන්සේ නමක් හෝ ගෙපිළිවෙලින් පිඬු සිඟා වැඩි බවක් දැක තමන් වහන්සේ ද ඒ බුදු පිළිවෙත ගතයුතු බව සිතූහ. ඉදිරියේ ද බුද්ධ ශ්‍රාවකයෝ උන් වහන්සේ අනුගමනය කැරෙමින් පිණ්ඩපාතික වත අනුගමනය කරන්නාහුයැ යි සිතූ බුදුන් වහන්සේ කෙළවරෙහි පිහිටි ගෙයි පටන් පිඬු පිණිස හැසුරුණහ. මහජනයා සිදුහත් කුමරු පිඬු සිඟා වඩිති යි දෙමහල්, තුන්මහල් ප්‍රාසාදවල සිව්මැදුරු කවුළු හැර බැලීමට යුහුසුළු වූහ.

යශෝදරා දේවිය ද සිදුහත් කුමරු මෙනුවර මහත් රාජ ශ්‍රියෙන් රන් ශිවිකාවෙන් හැසිර දන් කෙස් රැවුල් බහා කහවත් හැද අතින් පාත්‍රය ගෙන පිඬු සිඟා යන ගමන හොබනේද යි සිව්මැදුර හැර බලන්නී, සිරුරෙන් නික්මෙන රන්වන් පැහැයෙන් නගර වීථි ආලෝකමත් කැරෙමින් බඹයක් පමණ පැතිරෙන ආලෝකයෙන් මතුවී පෙනෙන අසූවක් පමණ කුඩා ශරීර ලක්‍ෂණයෙන් යුත් හා දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණයෙන් යුක්ත වූ උපමා රහිත බුදු සිරියෙන් බබළන බුදු රජුන් දැක නලල් තලයෙහි සිට සිරිපාතල දක්වා,

"සිනිඳු කළු අක්බඹරු කෙස් ඇත්තේය. හිරු මඬලට බඳු බබළන යහපත් නලල් තල ඇත්තේය. සුදුසු උස් සින්දු දික් නාසය ඇත්තේය. ඒ මිනිස් උතුමාණෝ රැස් වළල්ලෙන් වටවූහ."

මේ ආදී නරසීහ ගාථා අටකින් ගුණවනා ඔබ පුතණුවෝ ආහාර ගනිතැ යි රජුට සැලකළාය. රජතුමා සැලෙන හදවතින් ඇඳිවත අතින් සකස් කැරෙමින් වහවහා නික් ම බුදු රජුන් ඉදිරිපිට සිට ස්වාමීනි, අපට ලජ්ජා කැරෙමින් කුමකට පිඬු පිණිස හැසිරෙන්නහු ද ? මෙපමණ සඟ පිරිසකට ආහාර නො ලැබිය හැකියැ යි සිතුවහු ද ? මහරජ, මේ අපගේ පරම්පරා චාරිත්‍රයකි. ස්වාමීනි, අපගේ වංස පරම්පරාව මහා සම්මත ආදී රාජ පරම්පරාවයි. මේ මහා සම්මත රාජ පරපුරෙහි එක ද රජ කෙනෙක්වත් පිඬු සිඟා නො ගියහ. මහරජ, ඒ ඔබගේ රාජ වංසයයි. අපගේ වංසය එය නො වේ. දීපංකර කස්සප ආදී අපගේ වංසයෙහි - බුද්ධ වංසයෙහි නොයෙක් දහස් ගණන් බුදුවරු පිඬු පිණිස හැසුරුණහ. එයින් ම ජීවත්වූහ යි වීථිය තුළ දී ම බුදු රජාණෝ මේ ගාථා දෙසූහ.

"පිඬු සිඟීමෙන් ලැබෙන මිශ්‍ර ආහාරයෙහි පමා නො වන්නේය. සුචරිත දහමෙහි හැසිරෙන්නේය. දහම්හි හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහි ම සැප සේ ජීවත් වෙයි."

ගාථාව අවසානයෙහි රජතුමා සෝවාන් ඵලයෙහි පිහිටියේය.

"සුචරිත ධර්මයෙහි හැසිරෙන්නේය. ඒ දුසිරිතෙහි නො
හැසිරෙන්නේය. දහම්හි හැසිරෙන්නා මෙලොව,
පරලොව දෙක්හි ම සැප සේ ජීවත්වෙයි."

රජතුමා මේ ගාථාව අසා සකදාගාමී ඵලයෙහි පිහිටියේය. මහා ධර්මපාල ජාතකය අසා අනාගාමී විය. මරණාසන්න අවස්ථාවෙහි සේසත යට සිරියහනෙහි සැතපී සිටිය දී රහත් බව පැමිණියේය. වනගත ව භාවනානුයෝගී ව විසීමක් රජුට නො වීය. සෝවාන් ඵලයට පත් ව ම රජතුමා බුදු රජුන්ගේ පාත්‍රය ගෙන සඟ පිරිස සහිත බුදුන් වහන්සේ මහා ප්‍රාසාදයට වැඩමවා ප්‍රණීත ආහාර පානයෙන් වැළඳ වීය. බත් කිස අවසන සියලු ම අන්තඃපුර ස්ත්‍රීහු යශෝදරා දේවිය හැර බුදු රජුන් වැන්දාහ. පිරිවර ජනයා බුදු රජුන් වඳින ලෙස බල කැර සිටිය ද ඉඳින්, මා ගුණවත් නම් තමන් වහන්සේ ම මෙහි වඩිති. එසේ පැමිණි පසු වඳිමි යි කියා අනෙක් පිරිවර ජනයා සමග නො ගියාය.

බුදුන් වහන්සේ රජු අතට පාත්‍රය දී දෙඅගසව්වන් සමග රජ දියණියගේ සිරියහන් ගැබට වැඩමවා ඇය කැමැති වූ පරිදි බුදු රජුන් වඳින කල්හි කිසිවක් නො කිය යුතුයැ යි වදාරා පැන වූ අසුනෙහි වැඩ සිටියහ. එවිට යශෝදරා දේවිය වෙලෙව්ව අවුත් පාසාධියෙන් අල්ලාගෙන පාපුටුවෙහි හිස තබා සිත් වූ පරිදි තුමූ ම වැන්දාය. ඉක්බිති, රජතුමා රාජ දියණිය තුළ සිදුහත් කුමරුන් කෙරෙහි පැවැති සෙනෙහස හා ගරු බුහුමන ආදී ගුණ සමූහය ප්‍රකාශ කළේය. ස්වාමීනි, මාගේ දියණිය ඔබ වහන්සේ කසාවත් හඳින බව අසා තුමූ ද එතැන් පටන් කසාවත් හැන්දාය. ඔබ වහන්සේ එක වේලක් පමණක් වළඳන බව අසා තුමූ ද ඒක භත්තික වූවාය. උනුන් මහා අසුන් අත්හල බව අසා ඇය ද පටු ඇඳෙක සැතපුනාය. මල්, ගඳවිලවුන් අත්හල බව අසා ඒවා ප්‍රතික්ෂේප කළාය. තමාගේ ඥාතීන් අපි පෝෂණය කරමු යි අසුන්පත් එවූ කල්හි එක ඤාතියෙක් දෙස ද නො බැලුවාය. මෙසේ මගේ දියණිය ගුණවත් වූවාය. මහරජ, දැන් ඔබ විසින් ආරක්ෂා කරනු ලබන්නී, මුහුකුරා ගිය ඤාණය ඇත්තී, තමා ආරක්ෂා වීම පුදුමයක් නො වේ. පෙර අත් බවෙක ඤාණය මුහුකුරා නො ගිය රාජ දියණිය අනාරක්ෂිත පර්වත බෑවුමක කිසිවකුගේ රැකීමක් නැති ව සිටියදීත් තමා රැක ගත්තීයැ යි වදාරා සඳකින්දූරු ජාතකය වදාරා අසුනෙන් නැඟී වැඩියහ.

දෙවැනි දිනයෙහි නන්ද රජ කුමරුගේ රාජ්‍යාභිශේකය, ගෘහ ප්‍රවේශය, ආවාහය යන මංගල කරුණු තුනක් නියමිත ව තිබිණි. බුදු රජහු එදින නන්ද කුමරුගේ නිවසට වැඩමවා තම පාත්‍රය නන්ද කුමරුට දී පැවිදි කරුනු කැමැත්තේ, සෙත් වඩා වැඩියහ. ජනපද කල්‍යානී කුමරිය එසේ යන්නා වූ කුමරා දැක හිමියනි, වහා ම ආපසු එන්නැ යි කියා ගෙල දිගු කොට බැලුවාය. කුමරු ද පාත්‍රය ගනු මැනවැ යි කීමට අසමත් ව විහාරයට ම ගියේය. එහි දී බුදුන් වහන්සේ කුමරු නො කැමැත්තෙන් සිටිය දී ම පැවිදි කළහ. මෙසේ උන් වහන්සේ කපිල පුර වැඩි තුන් වැනි දිනයේ දී නන්ද කුමරුන් පැවිදි කළහ.

සත් වැනි දිනයෙහි රහල් මව රහල් කුමරු අලංකාර කොට බුදු රජුන් වෙත යැවීය. දරුව, බලන්න. විසි දහසක් සඟුන් පිරිවර කොට ඇති රන්වන් වූ බඹ රුවක් වැනි වූ ශ්‍රමණයන් වහන්සේ බලන්න. මේ තෙම ඔබගේ පියාණෝය. මෙතුමන්ට ධන නිධාන රාශියක් තිබිණි. මෙතුමන් නික්ම ගිය තැන් පටන් ඒවා පෙනෙන්ට නැත. යන්න දරුව, ගොස් තමන් සන්තක ධනය ඉල්ලන්න. පියාණෙනි, මම කුමාරයෙක්මි. අභිශේක කොට සක්විති රජ වන්නෙමි. මට ධනය අවශ්‍යයි. පියා සතු ධනයට පුතු හිමියාය. කුමරු ද බුදු රජුන් ළඟට ගොස් පිය සෙනෙහස ලබා සතුටු සිතින් පැවිදි පියාණෙනි, ඔබ වහන්සේගේ සෙවණැල්ල මට සැපයකැ යි තවත් තම වයසට සුදුසු වදන් පවසමින් සිටියේය.

බුදුන් වහන්සේ බත් කිස නිම කොට අනුමෙවෙනි දම් දෙසා අසුනෙන් නැගී වැඩියහ. රාහුල කුමරු ද පිය උරුමය ඉල්ලමින් බුදු රජුන් පසු පස ම ගියේය. බුදු රජහු කුමරුන් නො නැවැත්වූහ. ළඟ සිටි පිරිස ද කුමරුන් නැවැත්වීමට අසමත් වූහ. කුමරු බුදුන් සමග ම විහාරයට ම ගියේය. මේ කුමරු පියා සතු ධනය ඉල්ලයි. ඔහු ඉල්ලන ධනය සසර දික් කරයි. දුකට ම හේතු වේ. එම නිසා මම මොහුට මා බෝමැඩ දී ලබාගත් උතුම් ධනය දෙමි. ලොව්තුරා ධනයට මොහු හිමි වූවෙක් කරමි යි සිතූ බුදුහු සැරියුත් තෙරණුවන් අමතා එසේ නම් සාරිපුත්‍රය, කුමරුන් පැවිදි කරව යි පැවිදි කැරවූහ. රාහුල කුමරුන් පැවිදි කැර වූ පසු පිය රජුට බලවත් ශෝකයක් ඇතිවිය. ඒ ඉවසීමට නො හැකි රජු ස්වාමීනි, මව්පියන් විසින් නො අනුදක්නා ලද්දන් බුදු සසුනෙහි පැවිදි නො කරන්නේ නම් මැනවැ

යි බුදු රජුන්ගෙන් වරයක් ඉල්ලීය. රජතුමාට එම වරය ලැබිණි. දෙවැනි දවස්හි රජ මැදුරෙහි හීල් දානය වැළඳූ බුදු රජුන් ළඟ එකත්පසෙව සිටි රජතුමා ස්වාමීනි, දුෂ්කර ක්‍රියා කරන කාලයෙහි දෙවියකු මා වෙත අවුත් ඔබ වහන්සේ කළුරිය කළ බව කීය. එහෙත් මම එය නො පිළිගෙන මගේ පුත්‍රයා බුදු බවට නො පැමිණ මිය නො යන බව පවසා ප්‍රතික්ෂේප කළෙමි යි පැවසූ කල්හි මහරජ, දැන් ඔබ කෙසේ නම් පිළිගනියි ද ? පෙර භවයක දී තම මළ පුතුගේ මිනී ඇටයැ යි දක්වූ කල්හිත් නො පිළිගත්තේ නො වේද යි වදාරා මහා ධම්මපාල ජාතකය ගෙනහැර දක්වූහ. ඒ ඇසූ රජතුමා අනාගාමී ඵලයෙහි පිහිටියේය.

මෙසේ බුදුන් වහන්සේ පියාණන් සෝවාන් ආදී තුන් ඵලයෙහි පිහිටුවා මහසඟන පිරිවරා නැවත රජගහ නුවරට වැඩ සීතවන විහාරයෙහි වැඩ විසූහ. එසමයෙහි අනාථ පිණ්ඩික සිටුහු ගැල් පන්සියයකින් භාණ්ඩ ගෙන තමාගේ යහළු සිටුහුගේ නිවසට ගොස් සිටිය දී බුදු රජුන් උපන් බව අසා ඉතා අළුයම් වේලෙහි දෙවි අනුහසින් විවර වූ දොරින් බුදු රජුන් වෙත එළැඹ බණ අසා සෝවාන් ඵලයෙහි පිහිටා දෙවැනි දවසෙහි බුදුපාමොක් මහා සඟනට මහදන් දී සැවත් නුවරට වැඩමවීම සඳහා පොරොන්දු ගෙන රජගහ, සැවැත් අතර මඟ පන්සාළිස් යොදුනක් දුර ලක්‍ෂය බැගින් වැය කොට යොදුනක් පාසා විහාර කැරවා ජේතවන උයන අටළොස් කෙළක් රන් කහවණු අතුරා මිලට ගෙන විහාර කර්මාන්තය පටන් ගත්හ. උයන මැද බුදු රජුන්ගේ ගඳකිළිය විය. ඒ වටා අසූ මහසව්වන් උදෙසා වෙන වෙන ම නිවෙස් ද ආවාස කුටි ද එක බිත්ති, දෙබිත්ති ඇති නිවෙස් ද හස්වළලු නිවෙස් ද දික් ශාලා ද මණ්ඩප ආදි වශයෙන් අනෙක් සෙනසුන් අංග ද විය. පොකුණු, සක්මන් මළු, රාත්‍රියේ වසන ස්ථාන හා දවල් වසන ස්ථාන ද ඇතුළු අටළොස් කෙළක් ධන පරිත්‍යාගයෙන් සිත්කළු භූමි භාගයක මනරම් වෙහෙරක් කැරවා බුදු රජුන්ගේ ආගමනය සඳහා දූතයකු යැවීය. උන් වහන්සේ දූතයාගේ හසුන අසා මහබික් සඟණ විසින් පිරිවරණ ලදුව පිළිවෙළින් වැඩමවා සැවත් නුවරට වැඩියහ.

මහ සිටුහු ද විහාර පූජාව සූදානම් කොට බුදු රජුන් ජේතවනයට පිවිසෙන දිනයෙහි තම පුතු සිව් බරණින් සරසා එසේ

සරසන ලද කුමරුවන් පන්සියයක් සමග පෙරගමන් යැවීය. සිටුහුගේ පිරිවර ද පස්වණින් බබළන කොඩි රැගෙන බුදු රජුන් ඉදිරියට ගමන් කළහ. මහසිටුහුගේ මහා සුභද්දා, චූල සුභද්දා යන දියණියන් දෙදෙන පන්සියයක් කුමරියන් සමග පුන්කලස් ගෙන පසුපසින් ගමන් කළහ. ඔවුන් පසුපසින් සිටු බිරිය සිව් බරණින් සැරසී පන්සියයක් කාන්තාවන් සමඟ රන් තැටි ගෙන නික්මුණාය. සියල්ලන්ට ම පසුව මහසිටුහු අළුත් වස්ත්‍ර හැඳ එවැනි ම පන්සියයක් සිටුවරුන් සමඟ බුදුන් වහන්සේට පෙරගමන් ගියහ.

උන් වහන්සේ මේ උපාසක පිරිස පෙරටු කොට මහබික් සඟණ පිරිවරා තමන් වහන්සේගේ සිරුරින් නික්මෙන රැස් දහරින් අවට වනයන් රන් රසදිය ඉසින ලද පිහාටු මෙන් කැරෙමින් අපමණ වූ ද අසම වූ ද බුදු සිරියෙන් දෙව්රම් වෙහෙරට පිවිසියහ. ඉක්බිති, මහ සිටුහු ස්වාමීනි, මම මේ ආරාමය පිළිබඳ ව කෙසේ නම් පිළිපදිම්දැ යි විමසූහ. එසේ නම් ගෘහපතිය, මේ විහාරයට පැමිණි නො පැමිණි භික්ෂු සංඝයාට දෙව. මැනවැ යි පිළිගත් මහ සිටුහු රන් කෙණ්ඩිය ගෙන බුදුන් වහන්සේගේ අත මත ජලය වත්කොට,

"මේ ජේතවන විහාරය පැමිණියා වූ ද නො පැමිණියා වූ ද බුදු රජුන් ප්‍රමුඛ කොට ඇති මහා සංඝයාට දෙමි."

විහාරය පිළිගත් බුදුන් වහන්සේ අනුමෝදනා කරන්නාහු,

"විහාරය තුළ විසීමෙන් අධිශීත, අධිඋෂ්ණ නැති වෙයි. එසේ ම කුළු සිව්පාවුන්ගෙන් වන පීඩා ද සර්ප ජාති සහ මැසි මදුරුවන්ගෙන් වන පීඩා ද පින්නෙන් හා වැස්සෙන් වන හානි ද දුරුවෙයි."

"තව ද තද සුළං, අව්ව ඇති වූ කල්හි ඒවා දුරු කරයි. වාසය කිරීම සඳහා ද සළ විහරණය සඳහා ද සිත එකඟ බව ඇති කිරීම සඳහා ද විදසුන් වැඩීම සඳහා ද සංඝයාට විහාර දන් දීම බුදු රජුන් විසින් උසස්යැ යි පසස්නා ලදී."

එම නිසා තම යහපත කැමැති වන නුවණැත්තෝ සිත්කළු විහාර කැරවන්නෝය. එහි දූන උගත් භික්ෂූන් වාසය කැරවන්නෝය.''

"එහි වෙසෙන සත්‍යය ගති පැවතුම් ඇති උන් වහන්සේලාට පැහැදුණු සිතින් ආහාරපාන, වස්ත්‍ර, සෙනසුන් දෙන්නේය."

"එහි වෙසෙන භික්ෂූහු දහම් දෙසත්. ඒ සියලු දුක් දුරු කිරීමට හේතු වේ. ඔහු එම දහම අවබෝධ කොට සියලු කෙළෙස් නැති කොට පිරිනිවෙත්."

බුදුන් වහන්සේ මෙසේ විහාර පිදීමේ අනුසස් වදාළහ. අනේපිඬු මහා සිටුහු දෙවැනි දින පටන් විහාර පූජාව ඇරඹූහ. විශාඛා සිටු දේවියගේ (පුබ්බාරාම) ප්‍රාසාද පූජාව සාර මසකින් නිමා විය. අනේපිඬු සිටුහුගේ විහාර පූජාව නව මසකින් නිමියේය. විහාර පූජාවෙහි ද අටළොස් කෙළක් ම ධනය වියදම් විය. මෙසේ මේ ජේතවන විහාරය සඳහා සූපණස් කෙළක් ධනය පරිත්‍යාග කළහ.

පෙර විපස්සී බුදු රජුන්ගේ කාලයෙහි පුනබ්බසුමිත්ත නම් සිටු තෙම රන් උළු අතුරා මිලට ගෙන එම ස්ථානයෙහි ම යොදුනක් පමණ විහාරයක් කැරවීය. සිඛී බුදු රජුන්ගේ කාලයෙහි සිරිවඩ්ඪ නම් සිටු රන්පලු අතුරා මිලට ගෙන එම ස්ථානයෙහි ම තුන් ගව්වක් පමණ විහාරයක් කැරවීය. වෙස්සභූ බුදු රජුන්ගේ කාලයෙහි සොත්ථිය නම් සිටු තෙම රනින් කළ ඇත්පිය අතුරා අට යොදුනක් පමණ විහාරයක් කැරවීය. කකුසඳ බුදු රජුන්ගේ කාලයෙහි අච්චුත නම් සිටු රන් උළු අතුරා ගව්වක් පමණ විහාරයක් කැරවීය. කෝණාගමන බුදු රජුන්ගේ කාලයෙහි උග්ග නම් සිටු රනින් කළ ඉදිබුවන් අතුරා මිලට ගෙන අඩ ගව්වක් අපමණ විහාරයක් කැරවීය. කස්සප බුදු රජුන්ගේ කාලයෙහි සුමංගල සිටු රන් උළු අතුරා මිලට ගෙන සොළොස් කුටියක් සහිත විහාරයක් එම ස්ථානයෙහි ම කැරවීය. අප බුදු රජුන් දවස අනේපිඬු මහා සිටුහු කෙළක් කහවණු ඇතිරීමෙන් මිලට ගෙන එම ස්ථානයෙහි ම අට කිරියක් පමණ වූ විහාරයක් කැරවීය. මේ

විහාර භූමිය සියලු බුදුවරයන්ගේ අත් නො හළ ස්ථානයක් විය. මෙසේ බුදුහු බෝමැඩ සවිනේ දත් බවට පත්තැන් සිට පිරිනිවන් කයෙහි සැතපීම දක්වා යම් යම් තැනක වැඩ සිටියාහු ද ඒ සන්තිකේ නිදාන (ආසන්න හේතුව) නම්. ඒ අනුව සියලු ජාතක වර්ණනා කරන්නෙමු.

සන්තිකේ නිදානය නිමි.

ජාතක අටුවාවෙහි නිදාන කථාව නිමියේය.

1. 1. 1.

## අපණ්ණක ජාතකය

පළමු කොට මෙම අපණ්ණක ධර්ම දේශනාව භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩවසන කල්හි දේශනා කළ සේක. කවරකු අරබයා මෙම කථාව පැන නැගුනේ ද යත්, අනේ පිඬු මහා සිටුහුගේ යහළු පන්සියයක් තීර්ථක සව්වන් අරබයාය. එක් දවසක් අනේ පිඬු සිටු තෙමේ තමාගේ යහළු පන්සියයක් අන්තොටු සව්වන් රැගෙන මල්, ගඳ විලවුන්, තෙල්, මී පැණි, හකුරු, හඳිනා වස්ත්‍ර ගෙන්වා ගෙන දෙව්රමට ගොස් බුදු රජුන් වැඳ මල්දම් ආදියෙන් පුදා බෙහෙත් හා වස්ත්‍ර භික්ෂු සංඝයාට පිළිගන්වා හිඳීමේ සදෝෂයන් හැර එක්පසෙක හුන්නේය. අන්තොටු සව්වෝ ද තථාගතයන් මැද උන් වහන්සේගේ පුන් සඳ මඬල වැනි මුහුණ ද මහා ලකුණු, කුඩා ලකුණුවලින් සැදුම් ලත් බඹයක් පමණ පැහැයෙන් වට වූ උතුම් රූප කාය ද යුගල ව නික්මෙන බුදු රැස් මාලාව ද බලමින් අනේ පිඬු සිටුහුගේ ළඟින් ම හිඳගත්හ.

ඉක්බිති, ඔවුන්, රන් ගල් තලාවක සිට සිංහනාද කරන තරුණ සිංහයෙක් මෙන් ද ගෙරවුම් සහිත වැසි වලාකුළක් මෙන් ද අහස් ගඟ පහළට ගලා බස්නාක් මෙන් ද රුවන් දමක් ගොතන්නාක් මෙන් ද අටහින් යුත් අවර්ණීය වූ කමනීය වූ බ්‍රහ්මස්වරයෙන් නොයෙක් ක්‍රමයෙන් විසිතුරු මිහිරි දම් දෙසුමක් කළහ. ඔවුහු බුදු රජුන්ගේ දම් දෙසුම අසා පහන් සිතින් නැගී බුදු රජුන් වැඳ අන්‍යය තීර්ථක සරණ අත්හැර බුදු රජුන් සරණ ගියහ. ඔවුහු එතැන් සිට නිතර අනේ පිඬු සිටු සමග සුවඳ මල් ආදිය ගෙන වෙහෙරට ගොස් බණ අසත්. දන් දෙත්. සිල් රකිත්. පෙහෙවස් සමාදන් වෙත්.

පසු කලෙක බුදුන් වහන්සේ සැවැත් නුවර සිට නැවත රජගහ නුවරට වැඩි සේක. ඔවුහු බුදු රජුන් වැඩි තැන් පටන් බුදු සරණ අත්හැර නැවත තීර්ථකයන් සරණ ගොස් තමන්ගේ මුල් තැන ම පිහිටියහ. බුදුන් වහන්සේ ද සත් අට මසක් රජගහ නුවර ගත කොට නැවතත් දෙව්රමට වැඩි සේක. අනේපිඬු සිටුහු නැවත ඔවුන් රැගෙන

බුදු රජුන් වෙත එළැඹ සුවඳ ආදියෙන් බුදුන් වැඳ එකත්පසෙක හුන්හ. ඔවුහු ද වැඳ එකත්පසෙක හුන්හ. බුදු රජුන් චාරිකාවෙහි වැඩි කල්හි ඔවුන් ගත් බුදුසරණ හැර නැවත අනික් තීර්ථක සරණ ගෙන මුල්තන්හි පිහිටි බව බුදු රජුන්ට දැන්වූහ.

බුදුන් වහන්සේ අප්‍රමාණ කෙළ ගණන් කල්පවල නිරතුරු ව පුරුදු කළ වාක් සුචරිතයෙහි බලයෙන් දිව සුවඳින් සුවඳවත් වූ නොයෙක් සුවඳින් පිරුණු රන් කරඬුවක් විවර කරන්නාක් මෙන් මුව පියුම විවර කොට මිහිර හඬ නිකුත් කරමින් උපාසකවරුනි, ඔබ තුන් සරණ හැර තීර්ථකයන් සරණ ගියාහුදැ යි විචාළහ. ඔවුන් සැඟවීමට නො හැකි ව එසේය, භාග්‍යවතුන් වහන්ස යැයි කී කල්හි, උපාසකවරුනි, යටින් අවීචි නිරයත් උඩින් භවාග්‍රයත් පිරිසිඳ කොට සිරසට අපරිමාණ ලෝකධාතුන්හි ශීලාදී ගුණයෙන් බුදු රජුන් සමාන කෙනකු නැත. ඊට වඩා වැඩි කෙනකු කොයි ද ?

**"යාවතා භික්ඛවෙ සත්තා අපදා වා - පෙ - තථාගතො තෙසං අග්ගමක්ඛායති යං කිඤ්චි චිත්තං ඉධවා හුරං වා - පෙ - අග්ගතො වෙ පසන්නානන්ති."**

මේ ආදී සූත්‍රවලින් ප්‍රකාශිත පරිදි, මෙසේ උතුම් ගුණයන්ගෙන් යුත් රත්නත්‍රය සරණ ගිය උවැසි උවැසියෝ අපායෙහි උපදින්නෝ නම් නො වෙත්. ඔවුහු අපාය උපතින් මිදී දෙව්ලොව ඉපිද මහත් සැප විඳිත්. එම නිසා මෙබඳු සරණ හැර අන්‍ය තීර්ථකයන් සරණ යන ඔබ විසින් අයුත්තක් කරන ලද්දේයැ යි වදාළහ. මෙහි තෙරුවන් ප්‍රධාන වශයෙන් හා උසස් වශයෙන් සලකා සරණ යන්නවුන්ගේ අපායන්හි ඉපදීමක් නැති බව ප්‍රකට කිරීමට මෙම සූත්‍ර දැක්විය යුතුය.

**"යෙ කෙචි බුද්ධං සරණං ගතා සෙ න තෙ ගමිස්සන්ති අපායං පහාය මානුසං දෙහං දෙවකායං පරිපූරෙස්සන්ති"**

**"යෙ කෙචි ධම්මං සරණං ගතා සෙ න තෙ ගමිස්සන්ති අපායං පහාය මානුසං දෙහං දෙවකායං පරිපූරෙස්සන්ති"**

"යෙ කෙචි සඞ්ඝං සරණං ගතා සෙ න තෙ ගමිස්සන්ති අපායං පහාය මානුසං දෙහං දෙවකායං පරිපූරෙස්සන්ති"

"යම්කිසි කෙනෙක් බුදු රජුන් සරණ ගියාහු නම් ඔහු අපායෙහි නො උපදීත්. මිනිසත් බව හැර දෙව් ලොවට යෙත්."

"යම්කිසි කෙනෙක් දහම් සරණ ගියාහු නම් ඔහු අපායෙහි නො උපදීත්. මිනිසත් බව හැර දෙව් ලොවට යෙත්."

"යම්කිසි කෙනෙක් සඟ සරණ ගියාහු නම් ඔහු අපායෙහි නො උපදීත්. මිනිසත් බව හැර දෙව් ලොවට යෙත්."

"බහු වෙ සරණං යන්ති පබ්බතානි වනානි ච,
ආරාමරුක්ඛචෙත්‍යානි මනුස්සා භයතජ්ජිතා"

"නෙතං ඛො සරණං ඛෙමං නෙතං සරණමුත්තමං,
නෙතං සරණමාගම්ම සබ්බ දුක්ඛා පමුච්චති"

"යොච බුද්ධං ච ධම්මං ච සඞ්ඝං ච සරණං ගතො,
චත්තාරි අරිය සච්චානි සම්මප්පඤ්ඤාය පස්සති"

"දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස ච අතික්කමං,
අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛුපසමගාමිනං"

"එතං ඛො සරණං ඛෙමං එතං සරණමුත්තමං,
එතං සරණමාගම්ම සබ්බ දුක්ඛා පමුච්චතීති"

"බියෙන් තැතිගත් මිනිස්සු විවිධ පර්වත, වනාන්තර, අරාම, රුක්, දෙවොල් පිහිට පතත්."

"මේ සරණය නිරුපද්‍රව නො වේ. මේ සරණය උසස් ද නො වේ. මේ සරණයට පැමිණ සියලු දුකින් නො මිදෙත්."

"යම් කෙනෙක් බුදුන්, දහම්, සඟුන් සරණ ගියෝ ද චතුරාර්ය සත්‍යය ප්‍රඥාවෙන් දකී ද දුක, දුක හට ගැනීම, දුක නැති කිරීම, දුක නැති කිරීමේ මාර්ගය යන ආර්ය අෂ්ඨාංගික මාර්යට පිවිසෙත්."

"මේ සරණය බය රහිතය. මේ සරණය උතුම්ය. මේ සරණට පැමිණ සියලු දුකින් මිදෙත්."

බුදුන් වහන්සේ ඔවුන්ට දේශනා කළ ධර්මය මෙපමණක් ම නො වේ. තව ද, උපාසකවරුනි, බුද්ධානුස්සති කමටහන, (බුදු රජුන් පිළිබඳ නැවත නැවත සිතීම) දහම අරමුණු කැර ගත් කමටහන, සඟ අරමුණු කැර ගත් කමටහන සෝවාන් මඟ ලබාදෙයි. සෝවාන් ඵලය ලබාදෙයි. සකදාගාමී මඟ ලබාදෙයි. සකදාගාමී ඵලය ලබාදෙයි. අනාගාමී මඟ ලබාදෙයි. අනාගාමී ඵලය ලබාදෙයි. රහත් මඟ ලබාදෙයි. රහත් ඵලය ලබාදෙයි. මේ ආදී නයින් දහම් දෙසා මෙබඳු වූ පිහිටක් අත්හළ ඔබ විසින් නුසුදුසු දෙයක් කරන ලදැ යි වදාළහ.

මෙහි බුදුන් සිහි කිරීමේ කමටහන ආදිය සෝවාන් මඟ ආදිය ලබාදෙන බව මහණෙනි, එක ධර්මයක් වඩන ලද්දේ, වඩ වඩා වඩන ලද්දේ, ඒකාන්තයෙන් කළකිරීම පිණිස, නො ඇලීම පිණිස, දුක් නැති කිරීම පිණිස මානසික සහනය පිණිස, දැනගැනීම පිණිස, අවබෝධය පිණිස නිවණ පිණිස පවති. කවර නම් එක ධර්මයක් ද ? බුදුන් සිහි කිරීමය යන මේ ආදී සූත්‍රවලින් පැහැදිලි කළ යුතුයි. මෙසේ බුදු රජුන් නොයෙක් අයුරින් උපාසකවරුන්ට අනුශාසනා කොට උපාසකවරුනි, සමහර මිනිස්සු පිහිට නැති දෙය පිහිටයැ යි තර්ක ඥාණීව වරදවා ගෙන අමනුෂ්‍යයන් අරක්ගත් කතරෙහි යක්ෂයින්ට

බිලි වී මහත් විනාශයකට පැමිණියහ. ප්‍රශ්න නො තකා ගැනීම පමණක් නිසැක ගැනීමයි. අවිරුද්ධ ගැනීමයි. එය ගත් මිනිස්සු එම කතරෙහි ම සුවපත් බවට පැමිණියාහැ යි වදාරා නිශ්ශබ්ද වූ සේක.

ඉක්බිති, අනේ පිඬු මහා ගෘහපතියා අසුනෙන් නැගිට බුදු රජුන් නැමද ප්‍රශංසා කොට දොහොත් මුදුනේ තබා මෙසේ පැවසීය. ස්වාමීනි, දැන් මේ උවසුවන් උතුම් බුදු සරණ අත්හැර තර්ක ග්‍රහණය කිරීම අපට පැහැදිලිය. පෙර යක්ෂාධිපතිගේ කාන්තාර සහ කාර්මිකයන්ට විනාශයක් අප්‍රසන්න ග්‍රාහකයන්ට යහපතක් පැමිණි සැටි අපෙන් සැඟවී ඇත. ඔබ වහන්සේට පැහැදිලිය. එම නිසා භාග්‍යවතුන් වහන්ස, අහසෙහි පුන් සඳ මඬල මතු කොට පෙන්වන්නාක් මෙන් මේ කරුණු ප්‍රකට කරන සේක් නම් මැනවි.

ඉක්බිති, බුදු රජහු ගෘහපතිය, මවිසින් අපිරිමිත කාලයක් දශ පාරමිතාවන් සම්පූර්ණ කොට ලෝකයාගේ දුක දුරුකිරීම පිණිස ම සියල්ල දන්නා නුවණ ලබන ලද්දේය. සිංහ තෙලින් රන් බඳුනක් පුරවන්නාක් මෙන් මැනවින් කන් යොමා අසවයි. සිටුහුගේ සහය උපදවා වලා ගැබෙන් පුන් සඳ පෙන්වන්නාක් මෙන් භවයෙන් වැසුණු කරුණු හෙළිකළහ.

පෙර කසිරට බරණැස් නුවර බඹදත් නම් රජකු විය. එකල අප බෝසත්හු වෙළෙඳ කුලයෙහි පිළිසිඳ ගෙන ක්‍රමයෙන් වියපත් ව ගැල් පන්සියයකින් වෙළඳාම් කැරෙමින් හැසිරෙයි. ඔහු සමහර විටෙක නැගෙනහිර දෙස සිට බටහිර දෙසට ද සමහර විටෙක බටහිර දෙස සිට නැගෙනහිර දෙසට ද වෙළඳාම් පිණිස යයි. එම නුවර ම නුවණ අඩු වෙළඳ උපායෙහි අදක්ෂ තවත් වෙළඳ පුත්‍රයෙක් සිටියි. එකල බෝසත් වෙළඳා බරණැස් නුවරින් මහත් අගනා වෙළඳ බඩු ගෙන ගැල් පන්සියයක් පුරවා ගමනට සූදානම් කොට තැබීය. ඒ මෝඩ වෙළඳ පුත්‍රයා ද ගැල් පන්සියයක බඩු පුරවා ගමනට සූදානම් කොට තැබීය. බෝසත් වෙළඳා මෙසේ සිතීය. මේ මෝඩ වෙළඳ පුත්‍රයා මා සමග යන්නේ නම් ගැල් දහසකට මඟ ප්‍රමාණවත් නො වේ. මිනිසුන්ට දර දිය ද ගොනුන් හට තණ ද සුලබ නො වන්නේය. ඔහු හෝ මා පළමුවෙන් යාම වටී. මෙසේ සිතා ඒ වෙළඳ පුත්‍රය කැඳවා පැහැදිලි කොට ඔබ පළමු කොට යන්නේ ද, නැතිනම් පසුව

යන්නේද යි විමසීය. ඔහු පළමුවෙන් ගමනෙහි අනුසස් මෙසේ වන්නේය. අබලන් නො වූ මඟින් ම යන්නෙමි. ගොනුන්ට නො ඉඳුල් තණ කොළ වන්නේය. මිනිසුන්ට නො ඉඳුල් පළා කොළ ලැබෙන්නේය. නො කැළඹුණු ජලය වන්නේය. කැමැති පරිදි වෙළඳ බඩු මිල කළ හැකි වන්නේය. මෙසේ සිතූ ඔහු යහළුව, මම පෙරටුවට යන්නෙමි යි කීය. බෝසත් වෙළඳා පසු පසින් ගමනෙහි බොහෝ ආනිශංස දිටී. පෙරටුව යන්නෝ මඟෙහි නො සම තැන් සම කරන්නෝය. මම ඔවුන් ගිය මඟෙහි යන්නෙමි. පෙරටුව ගිය ගොනුන් මෝරා ගිය තණ කෑ කල්හි මගේ ගොන්නු නැවත හටගත් ළා තණ කන්නෝය. මිනිස්සුන්ට ද මිහිරි පළා කොළ ලැබෙන්නේය. ජලය නැති තැන්හි පෙරටුව යන්නෝ කැනීම් කොට ජලය ලබා ගත්තෝය. අපි ඔවුන් කළ වළවල්වලින් පැන් බොන්නෙමු. මේ හැර භාණ්ඩ මිල කිරීම දිවි තොර කිරීමක් වැනිය. මම පසු ව ගොස් ඔවුන් නියම කළ මිලට ම අපගේ බඩු විකුණන්නෙමි. බෝසත් වෙළඳා මේ ආනිශංස දක යහළුව, ඉතා මැනවි. ඔබ පෙරටුව යන්නැ යි කීය. මෝඩ වෙළඳා එය සතුටින් පිළිගෙන ගැල් යොදා ගෙන ක්‍රමයෙන් අමනුෂ්‍යය වාස කාන්තාරය ළඟට පැමිණියේය.

කාන්තාරය වනාහි චෝර කාන්තාර (සොරුන් ගැවසි) වාළ කාන්තාර (වන සතුන් ගැවසි) නිරුදක කාන්තාර (ජලය නැති) අමනුෂ්‍යය කාන්තාර (අමනුෂ්‍යයන් අරක්ගත්) අප්පභකඛ කාන්තාර (ආහාර අඩු) වශයෙන් පස් ආකාරය. එහි සොරුන් විසින් මඟ අවුරුන ලද්දේ, චෝර කාන්තාර ද සිංහාදීන් විසින් අවුරන ලද මඟ ඇත්තේ, වැලි කාන්තාර ද යම් තැනක නෑමට හෝ බීමට ජලය නැත්තේ ද, නිරුදක කාන්තාර ද අමනුෂ්‍යයින් විසින් අරක්ගන්නා ලද්දේ, අමනුෂ්‍යය කාන්තාර ද මුල් ආදී ආහාරයට සුදුසු දේ නැත්තේ, අප්පභක්ඛ කාන්තාර ද නම්. මේ පස් ආකාර කාන්තාර අතුරින් මේ කාන්තාරය නිරුදක හා අමනුෂ්‍යය කාන්තාරයක් විය. එම නිසා ඒ වෙළඳ පුත්‍රයා ගැල්වල මහත් සැළි තබා ජලය පුරවා සැට යොදුනක් පමණ කතර මඟට පිවිසියේය.

ඔහු කතර මැදට පිවිසි කල කතරෙහි අරක්ගත් යක්‍ෂයා මොවුන් විසින් ගෙනෙන ලද ජලය ඉවත දම්මවා ඔවුන් දුබල කොට ඔවුන් සියල්ල ම කන්නෙමි යි සිතා සම්පූර්ණයෙන් සුදු වූ යොවුන් ගොනුන් යොදා සිත්කළු ස්ථානයක් මවා දුනු, ඊතල, පලිස්

ආදි ආයුධ අතැති ව දහයක් දොළහක් පමණ අමනුෂ්‍යයන් පිරිවරා ගෙන උපුල්, කුමුදු මල් පැළඳ ගෙන තෙත් හිසින් හා වතින් යුක්ත ව අධිපතියකු මෙන් ඒ යානාවෙහි හිඳ මඩ තැවරුණු ගැල් සකින් යුතු ව ඉදිරියට ගියේය. ඔහුගේ පිරිවර මිනිස්සු ද පෙරටු ව හා පසුපසින් තෙත් කෙස් හා වස්ත්‍ර ඇති ව උපුල්, කුමුදු මල් දම් පැළඳ සුදු නෙළුම් මිටි අතැති ව නෙළුම් අල කමින් දිය බිඳු හා මඩ වගුරුවමින් ගියහ. වෙළඳ සාත්තු නායකයෙක් නම් යම් දවසක ඉදිරිපසින් සුළඟ හමායේ ද එදින යහනාවක හිඳ සේවකයින් පිරිවරා ගෙන දූවලි මඟ හරවමින් ඉදිරියෙන් යත්. යම් දවසක පසුපසින් සුළඟ හමයි ද ඒ අයුරින් ම පසුපසින් යත්. එදින ඉදිරියෙන් සුළඟ හැමීය. එම නිසා ඒ වෙළඳ පුත්‍රයා පෙරටු ව ගමන් කළේය.

යක්ෂයා ඔහු එනු දැක තම යානය මඟින් බැහැර කොට කොහි යන්නේද යි ඔහු සමග පිළිසඳර කථා කළේය. වෙළඳ පුත්‍රයා ද තම යානය මඟින් බැහැර කැර අනෙක් ගැල්වලට යන්නට ඉඩ දී පැත්තක සිටි යක්ෂයාට මෙසේ කීය. පින්වත, අපි මේ බරණැස් නුවර සිට එන්නෙමු. ඔබලා වනාහි උපුල්, කුමුදු පැළඳ රත්, සුදු නෙළුම් අතැති ව නෙළුම් අල කමින් මඩ තැවරුණු සිරුරු ඇති ව දිය බිඳු හෙළමින් එන්නාහුය. කිම, ඔබලා ආ මඟෙහි වර්ෂාව වසී ද ? උපුල් ආදියෙන් සැදුම් ලත් විල් ඇත්තේද යි විචාළේය. යක්ෂයා ඔහුගේ බස් අසා යහළුව, ඔබ කුමක් කියන්නෙහි ද ? නිල් වනරොද පෙනේ. එතැන් සිට මුළු වනය ම එක සේ බැඳගෙන වසී. දිය කඳුරු පිරී පවතී. තැනින් තැන නෙළුම් ආදිය පිපුණු විල් ද ඇත. මෙසේ කියා යක්ෂයා පිළිවෙළින් ගැල් යන කල්හි කොහි යන්නේද යි මෙහි මේ මේ බඩුය. අසවල් දනව්වට යමු. මේ ගැලෙහි කුමන බඩු ද ? මේ ගැලෙහි කුමන බඩු ද ? අසුවල් බඩුය. පසු පසින් ම එන ගැල ඉතා බර ව එයි. එහි කුමන බඩු ද ? එහි ජලයයි. ඈත සිට එන ඔබලා ජලය රැගෙන ඒම ඉතා හොඳයි. එහෙත් මෙතැන් සිට ජලය රැගෙන යාම අවශ්‍යය නො වේ. ඉදිරියෙහි ජලය සුලභය. සැළි බිඳ දමා ජලය ඉවත් කොට සැහැල්ලුවෙන් යනු මැනවැ යි කියා, ඔබලා යන්න. අපට පමා ඇතැ යි මඳක් ගොස්, ඔවුන්ට නො පෙනෙන දුරට ගොස් යක්ෂ නගරයට ම ගියේය.

ඒ නුවණ මඳ සාත්තු නායකයා ද තමාගේ මෝඩ බව නිසා යක්ෂයාගේ වචනය පිළිගෙන දිය පිරි සැළි බිඳුවා පතක් පමණක්වත්

ජලය ඉතිරි නො කොට සියලු ජලය බැහැර කොට ගැල් යෙදවීය. ඉදිරියෙහි ජලය බිඳක්වත් නො වීය. ජලය නො ලබන මිනිස්සු ක්ලාන්ත වූහ. හිරු උදාවන තුරු ගමන් කළ ගැල්කරුවෝ ගැල් මුදු වට කොට තබා ගොනුන් රිය සක්වල බැන්දහ. ගොනුන්ට ද ජලය නො වීය. මිනිසුන්ට කැඳවත් නො වීය. දුබල වූ මිනිස්සු ඒ ඒ තැන වැටී නිදා ගත්හ. රාත්‍රී කාලයෙහි යක්‍ෂයෝ යක්‍ෂ නගරයෙන් අවුත් සියලු ගොනුන් ද මිනිස්සුන් ද මරා මස් අනුභව කොට ඇට ඉතිරි කොට ගියහ. මෙසේ නුවණ මද වෙළඳ නායකයකු නිසා ඒ සියල්ලෝම විනාශ වූහ. ඇට කැබැලි ඒ ඒ තැන විසිරී තිබුණි. ගැල් පන්සියය භාණ්ඩ පිරවූ වන ම තිබිණ.

බෝසත් වෙළඳ නායකයාණෝ ද නුවණ මද වෙළඳ පුත්‍රයා නික්මුණු දින සිට මසක් හා අඩ මසක් ඉක්මවා ගැල් පන්සියයක් සමග සිය නුවරින් නික්ම පිළිවෙලින් කාන්තාරය අසලට පැමිණියේය. එහි දී දිය සැළි ජලයෙන් පුරවා බොහෝ ජලය ගෙන කඳවුර බෙර හසුරුවා මිනිසුන් රැස්කැරවා මෙසේ කීහ. මාගෙන් නො විමසා පතක් පමණවත් දිය පරිභෝජනය නො කළ යුතුයි. කාන්තාරයේ විෂ ගස් ඇත. මින් පෙර ඔබලා නො කෑ කොළ, මල්, ගෙඩි ආදි කිසිවක් මගෙන් නො විමසා පරිභෝජනය නො කළ යුතුය. මෙසේ පිරිවර ජනයාට වදන් දී කාන්තාරයට පිළිපන්නේය.

බෝසත් තෙම කතර මැදට පිවිසි කල්හි ඒ යක්‍ෂයා පෙර පරිදි ම බෝසතාණෝ ඉදිරියෙහි පෙනී සිටියේය. බෝසත්හු දුටු වනම යක්‍ෂයකු බව දැනගත්හ. මේ කාන්තාරයෙකි. ජලය නැත. මේ නිරුදක කාන්තාරයකි. ඔහු ද බිය රහිතය. රතු නෙත් ඇත්තේය. මොහුගේ සෙවණැල්ල ද නො පෙනේ. නිසැකව ම මොහු විසින් පෙරටුව ගිය නුවණ මද වෙළඳ පුත්‍රයා සියලු ජලය ඉවත්කැරවා ක්ලාන්ත කොට පිරිවර සහිත ව අනුභව කරන ලද්දේ විය හැකිය. මාගේ නැණවත් බව හා උපාය දක්‍ෂ භාවය නො දන්නේ වනැ යි සිතා තොපි යව්. අපි වෙළෙන්දෝ වෙමු. වෙනත් දියක් නො දැක ගෙන ආ දිය නො හරිමු. දුටු තැනක දී දිය බැහැර කොට ගැල් සැහැල්ලු කොට ගෙන යන්නෙමු යි කීහ.

යක්‍ෂයා මද දුරක් ගොස් නො පෙනී යක්‍ෂ පුරයට ම ගියේය.

යක්ෂයා ගිය කල්හි පිරිවර මිනිස්සු බෝසතුන්ට මෙසේ කීහ. ආර්යයෙනි, මේ මිනිස්සු මේ පෙනෙන නිල් වන රොදින් මතු නිබඳ ව වැසි වසින බව කියා උපුල්, කුමුදු මල් මාලා පැළඳ නෙළුම් මල් මිටි ගෙන නෙළුම් අල කමින් දිය බිඳ වැගිරෙන සේ තෙත් වස්ත්‍ර, තෙත් හිස් ඇති ව පැමිණියහ. ජලය බැහැර කොට සැහැල්ලු සහිත ව ඉක්මනින් යමු. බෝසතාණෝ ඔවුන්ගේ වචනය අසා ගැල් නවත්වා සියලු ම මිනිසුන් රැස්කැරවා ඔබලා මෙම කතරෙහි විලක්, පොකුණක් හෝ ඇති බවක් කවදා හෝ අසා තිබේදැ යි විචාළහ. නැත. මේ නිරුදක කාන්තාරයෙකි. දූන් මෙහි සරු නිල් වන රොදින් එහා වැසි වසිතැ යි කියයි. වැසි සුළං කොතක් දුර හමායේ ද ? ආර්යයෙනි, යොදුනක් පමණ හමයි. කිම, ඔබලාගේ සිරුරට වැසි සුළඟක් දූනේ ද ? නැත. වැසි වලාකුළක් කොපමණ දුර පෙනේ ද ? යොදුනක් පමණ පෙනේ. ඔබ කිසිවකු විසින් වැසි වලාකුළක් දකින ලද්දේ ද? නැත ආර්යාවෙනි, විදුලිය කොතෙක් තැන පෙනේ ද ? ආර්යයෙනි, සතර පස් යොදුනක් පෙනේ. ඔබ කිසිවකු විසින් විදුලිය එළියක් දක්නා ලද්දේ ද ? නැත ආර්යයෙනි. අකුණු හඬ කොතෙක් දුර ඇසේ ද ? යොදුනක් දෙකක් පමණ ඇසේ. ඔබ කිසිවකු අකුණු හඬක් අසන ලද්දේ ද ? නැත ආර්යයෙනි. මොවුහු මිනිස්සු නො වෙති. යක්ෂයෝය. අපගේ ජලය බැහැර කොට දුබල කැරවා අනුභව කිරීම සඳහා පැමිණියෝ වන්නාහුය. අපට පෙරටුව ගිය නුවණ මඳ වෙළඳ පුත්‍රයා උපායෙහි දක්ෂයෙක් නො වේ. නිසැකව ම මොවුන් විසින් ජලය බැහැර කොට ක්ලාන්ත කොට අනුභව කරන ලද්දේ වන්නේය. බඩු පුරවන ලද ගැල් පන්සිය තුබූ පරිදි ම අද අපි දකින්නෙමු. දිය පතක්වත් අපතේ නො යවා වහ වහා ගැල් පදවමුයැ යි පැදවීය.

හේ ඉදිරියට යන්නේ බඩු පුරවන ලද ගැල් පන්සියය ද ඒ ඒ තැන විසිරුණු ගොනුන්ගේ හා මිනිසුන්ගේ ඇට කැබලි ආදිය ද දූක සියලු ම ගැල් මුදවා චක්‍රාකාරව තබවා කඳවුරු බන්දවා මිනිසුන්ට ද ගොනුන්ට ද රාත්‍රී භෝජනය අනුභව කැරවා මිනිසුන්ට මැදි වන සේ ගොනුන් හොබවා තම බල නායකයන් ගෙන කඩුගත් අත් ඇති ව තුන් යම රැස්ව ආරක්ෂාව ගෙන සිටිය දී ම පහන් කළේය. පසු දින අලුයම සියලු කටයුතු නිමවා ගොනුන් කවා දුබල වූ ගැල් අත්හැර ශක්තිමත් ගැල් යොදවාගෙන ලාභ තැනට ගොස් සියලු භාණ්ඩ දෙගුණ තෙගුණ මිලට විකුණා සියලු පිරිස ගෙන ආපසු තම නගරයට ම පැමිණියේය.

බුදුහු මේ කථාව වදාරා තර්ක ඥානය ගත්තාහු පෙර ද මහා විනාශයකට පැමිණියහ. අපණ්ණක ඥාණය ගත්තාහු අමනුෂ්‍යයන්ගෙන් මිදී යහතින් කැමැති තැනට ගොස් තම තැනට ම ආපසු පැමිණියේයැ යි අතීත වර්තමාන කථා දෙක ගළපා මේ අපණ්ණක ධර්ම දේශනාවෙහි මෙම ගාථාව සම්බුදු බවට පැමිණ වදාළහ.

**"අපණ්ණකං ඨානමෙකෙ දුතියං ආහු තක්කිකා,**
**එතදඤ්ඤාය මෙධාවී තං ගණ්හෙ යදපණ්ණකන්ති."**

"ඇතැම් තාර්තිකයෝ අපණ්ණක ඥානය දෙවැනි තැන
තබති යි කියූහ. නුවණැත්තෝ මේ කරුණ දැන යමක්
අපණ්ණක ද එය ගත්තේය."

එහි **"අපණ්ණකං"** යනු ඒකාන්ත, නිවැරදි, නිවනට යොමු ස්ථානය යන කාරණයයි. කාරණය වනාහි යම් හෙයකින් ඊට ම අයත් පැවැත්ම අනුව සපයයි. එම නිසා "**ඨාන**" යැයි කියනු ලැබේ. "**ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො**" (හේතුව හේතුව වශයෙන් ද අහේතුව අහේතුව වශයෙන් ද) ආදියෙහි ද මෙම ප්‍රභේදය දත යුතුයි. මෙසේ "**අපණ්ණකං ඨානං**" යන පද දෙකෙන් ම ඒකාන්තයෙන් ම හිත සුව එළවන බැවින් නුවණැත්තන් විසින් අනුගමනය කරන ලද ඒකාන්ත, නො වරදින, නිවන පිණිස පවතින හේතුව මෙයැ යි ද දක්වයි. මේ මෙහි කෙටි තේරුමයි. විස්තර වශයෙන් තුන් සරණාගමනය, පන්සිල්, දශ සිල්, ප්‍රාතිමෝක්ෂ සංවරය, ඉන්ද්‍රිය සංවරය, යහපත් දිවි පෙවෙත, නිවැරදි සිවුපස පරිභෝජනය, සිවු පිරිසිදු සිල්, ආහාරයෙහි පමණ දැනීම, නිදි මැරීම, ධ්‍යාන වැඩීම, විදසුන් වැඩීම, විශේෂ ඤාණවලට (අභිඥාවලට) සමවැදීම, මාර්ග හා ඵල යන මේ සියල්ලම නිවැරදි "**අපණ්ණකං ඨානං**" නම් නිවන් මග පිළිවෙතයැ යි ද යන අර්ථයි. යම් හෙයකින් නෛර්යානික ප්‍රතිපදාව මෙනම් වේ ද එම නිසා ම බුදු රජහු නිවැරදි පිළිවෙත දෙසන්නාහු, මේ සූත්‍රය දෙසූහ. මහණෙනි, කරුණු දෙකකින් යුත් භික්ෂුව නිවැරදි පිළිවෙතට පිළිපන්නේ වෙයි. ආශ්‍රවයන් නැති කිරීම සඳහා භාවනාව අරඹන ලද්දේ වෙයි. කවර නම් කරුණු දෙකක් ද? මහණෙනි, මෙසසුනෙහි මහණ තෙම ඉඳුරන්හි වැසූ දොර ඇත්තේ

වෙයි. අහරෙහි පමණ දන්නේ වේ ද නිදි වැරුමෙහි යෙදේ ද මහණෙනි, මෙහි ඇසින් රූපය දැක නිමිති ලකුණු නො ගන්නේ වෙයි ද, - පෙ - මහණෙනි, මහණ තෙම මේ සසුනෙහි මහණ ඉඳුරන්හි වැසුණු දොර ඇත්තේ වෙයි. මහණෙනි, කෙසේ නම් භික්ෂුව අහරෙහි පමණ දන්නේ වෙයි ද ? මෙහි දී භික්ෂුව නුවණින් සලකා අහර වළඳයි. මේ ආහාරය ඡන්ද රාගය පිණිස නො වේ. මත් බව පිණිස නො වේ. - පෙ - මෙසේ මහණෙනි, භික්ෂුව ආහාරයෙහි පමණ දන්නේ වෙයි. මහණෙනි, කෙසේ නම් භික්ෂුව නිදි වැරුමෙහි යෙදුණේ වෙයි ද ? මහණෙනි, මේ සසුනෙහි භික්ෂුව දහවල් කල සක්මන් හා හිඳීමෙන් ද - පෙ - මහණෙනි, මෙසේ භික්ෂුව නිදි මැරීමෙහි යෙදුණේ වෙයි. මේ සූත්‍රයෙහි කරුණු තුනක් ම කියන ලදී.

මේ අපණ්ණක ප්‍රතිපදා රහත් ඵලය දක්වා ලැබේය. රහත් ඵලය ද ඵලසමවත් සහිත විය. ක්ලේෂ පරිනිර්වානයට ද පිළිවෙත් නම් වේ. "එකෙ" යනු සමහර නුවණැති මනුෂ්‍යයෝය. එහි අසුවලා අසුවලායැ යි නියමයක් නැත. මෙහි දී පිරිවර සහිත බෝසතුන් සඳහා ම කියන ලදැ යි දත යුතුයි. "**දුතියං ආහු තක්කිකා**", මෙහි "**දුතියං**" යනු පළමුවෙන් කියන ලද හා අපණ්ණක ඨානයෙන් නෛර්යාණික කාරණයෙන් දෙවැනි තර්ක ග්‍රාහ කාරණයයි. අනෛර්යාණික කාරණයයි. "**ආහු තක්කිකා**" මෙහි පළමු පදය සමග යෙදීමයි. අපණ්ණක ප්‍රතිපදාව නුවණැත්තෝ ගත්හ. බාල සාත්තු නායක පුත්‍රයා ප්‍රමුඛ තාර්කිකයන් යමෙක් කීවාහු ද ඔවුහු දෙවැනියව ගතයුතු සාපරාධී, ඒකාන්ත නො වන, අනෛර්යාණික කාරණය ගත්හ. ඔවුනතුරෙන් යමෙක් ඉදිරියෙහි ජලය විය යුතුයැ යි දෙවැනි තර්ක සාංඛ්‍යාත අනෛර්යාණික කාරණය ගත්තාහු ද ඔවුහු තෘෂ්ණා ප්‍රතිපදාව ගත්හ. මින් ශුක්ල ප්‍රතිපදාව අපරිහානි ප්‍රතිපදාවයි. ඒ නිසා යමෙක් ශුක්ල ප්‍රතිපදාවට පිළිපන්නෝ ද ඔවුහු නො පිරිහී යහපත් බවට පත්වූහ. යමෙක් තෘෂ්ණා ප්‍රතිපදාවට පිළිපන්නාහු ද ඔවුහු පිරිහී මහා ව්‍යසනයකට පත්වූහ යන අර්ථයැ යි, භාග්‍යවතුන් වහන්සේ අනාථ පිණ්ඩික ගෘහපතියාට වදාරා තවදුරටත් මෙසේ වදාළහ.

"**එතදඤ්ඤාය මෙධාවී තං ගණ්හෙ යදපණ්ණකන්ති**" යි වදාළහ. "**එතදඤ්ඤාය මෙධාවී**" මෙහි "**මෙධා**" නමින් හඳුන්වන පිරිසිදු, උසස් ප්‍රඥාවෙන් යුත් කුල පුත්‍රයා තර්කයෙන් නෙ ගැනීම හා තර්කයෙන් ගැනීම යන අපණ්ණක - සපණ්ණක යන දෙකරුණෙහි ගුණ, දොස්,

දියුණුව, පරිහානිය, යහපත හා අයහපත දැන යන අර්ථයි. "**තං ගණ්හ යදපණ්ණකන්ති**"යනුවෙන් යමක් නිවැරදි ද ඒකාන්තයෙන් යහපත් පිළිවෙත නො පිරිහෙන පිළිවෙත නම් වූ නිවනට කාරණ වේ ද එය ම ගත්තේය. කුමක් නිසා ද යත් ඒකාන්තයෙන් නිවැරදි බව නිසාය. අනික් තර්ක පිළිවෙත නො ගත්තේය. මක්නිසා ද යත් ඒකාන්ත බවක් නැති හෙයිනි. මේ අපණ්ණක ප්‍රතිපදාව වනාහි සියලු බුදු, පසේ බුදු බුද්ධ පුත්‍රයන්ගේ පිළිවෙතයි. බුදුවරයෝ වනාහි අපණ්ණක පිළිවෙතෙහි ම පිහිටා, දැඩි විර්යයෙන් පෙරුම් දම් පුරා බෝ මුල දී බුදුවරයෝ වෙති. පසේ බුදුවරු, පච්චේක සම්බෝධිය ම උපදවති. බුද්ධ පුත්‍රයෝ ශ්‍රාවක පාරමී ඥාණය (රහත් බව) අවබෝධ කරත්. මෙසේ බුදු රජහු ඒ උපාසකවරුන්ට ත්‍රිවිධ උසස් කුල සම්පත්තිය ද සැවැදෑරුම් (කාමාවචර) දෙව් ලොව ද බඹ ලොව ද සම්පත් ද ලබා දී අවසන රහත් මග ලබා දෙනසුළු අපණ්ණක ප්‍රතිපදාවයි. සතර අපායෙහි ද පස් වැදෑරුම් පහත් කුළ උපත ලබාදෙන සපණ්ණක ප්‍රතිපදා නැමැයි. මේ අපණ්ණක ධර්ම දේශනාව දක්වා තවදුරටත් සිව් සස් සොළොස් ආකාරයකින් වදාළහ. සිව් සස් දෙසුම අවසන ඒ පන්සියයක් උපාසකවරු සෝවාන් ඵලයෙහි පිහිටියහ.

බුදු රජහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා (අතීත, වර්තමාන) කථා දෙක එකට ගළපා ජාතක කතාව නිමවා පෙන්වූහ. එකල නුවණ මඳ වෙළඳ පුත් දෙව්දත් තෙරණුවෝය. ඔහුගේ පිරිස දෙව්දත් පිරිසය. නැණවත් වෙළඳ පුත්‍රයාගේ පිරිස බුදු පිරිස ම වූහ. නුවණැති වෙළඳ පුත්‍රයා නම් මම වෙමි යි දම් දෙසුම් නිමවූහ.

## 1. 1. 2.

## වණ්ණුපථ ජාතකය

"**අකිලාසුනො**" යන මෙම ධර්ම දේශනාව බුදු රජහු සැවැත් නුවර වෙසෙමින් දෙසූහ. කවරකු අරබයා ද යත්, එක්තරා අත්හළ

වීර්යය ඇති භික්ෂුවක් අරබයාය. බුදු රජුන් සැවැත් නුවර වෙසෙන කල සැවැත් නුවර වැසි කුල පුත්‍රයෙක් දෙව්රමට ගොස් බුදු රජුන් හමුවෙහි දහම් අසා පහන් සිතින් කාමාදීනව දැක පැවිදි ව උපසම්පදාවෙන් පස් වස් වී උභය මාතෘකාවන් ඉගෙන විදර්ශනා ක්‍රමය ඉගෙන බුදු රජුන් වෙතින් තමාගේ සිතට ගැළපෙන කමටහන් ගෙන එක් ආරණ්‍යයකට පිවිස වස් එළැඹ තෙමසක් උත්සහ කළ ද ආලෝක මාත්‍රයක් හෝ උපදවා ගන්නට නො හැකි විය.

ඉක්බිති, ඔහුට මෙබඳු සිතක් විය. බුදු රජුන් විසින් පුද්ගලයන් සතර දෙනකු ප්‍රකාශ කරන ලද්දේය. ඔවුන් අතුරෙන් මා පද පරමයකු විය යුතුය. මේ අත්බවෙහි මට මඟක් හෝ ඵලයක් නැතැ යි සිතමි. එම නිසා ආරණ්‍යය වාසයෙන් කුමක් කරම් ද ? බුදු රජුන් වෙත ගොස් රුවින් අග තැන්පත් බුදු සිරුර බලමින් මිහිරි දම් දෙසුම් අසමින් වසන්නෙමි යි නැවත දෙව්රම් වෙහෙරට ම පැමිණියේය. ඔහුගේ කුළුපඟ යහළුවෝ ඇවැත්නි, ඔබ බුදුන්ගෙන් කමටහන් ගෙන මහණ දම් පුරමි යි ගොස් දැන් පෙරළා අවුත් ජන සමාජයෙහි ඇලෙමින් හැසිරෙහිය. කිම, ඔබගේ පැවිදි කිස සඵල වූයේ ද ? නැවත ඉපදීමක් නැත්තෙක් වූයේ ද ? ඇවැත්නි, මා මඟඵල ලැබීමට නුසුදුසු පුද්ගලයකු විය යුතුයැ යි සලකා වීර්යය අත්හැර ආවෙමි. ඇවැත්නි, දළ වීර්යයෙන් යුත් බුදු රජුන්ගේ සසුනෙහි පැවිදි ව වීර්යය අත් හැරීමෙන් ඔබ විසින් නුසුදුස්සක් කරන ලදී. එන්න. බුදු රජුන්ට පෙන්වමු යි ඔහු රැගෙන බුදු රජුන් වෙත ගියහ. බුදු රජහු ඔහු දැක මහණෙනි, ඔබ අකැමැත්තෙන් මේ භික්ෂුව රැගෙන ආවේ මොහු විසින් කුමක් කරනා ලද ද ? ස්වාමීනි, මේ භික්ෂුව මෙබඳු සර්වඥගාමි ශාසනයෙහි පැවිදි ව මහණ දම් පුරමින් සිට වීර්යය අත්හැර ආවේය. එවිට බුදුහු මහණ, ඔබ වීර්යය අත්හැර දැමුවේ ඇත්තද යි ඇසූහ. එසේය, ස්වාමීනි. මහණ, ඔබ මෙවැනි සසුන් ගත පැවිදි ව තමා අල්පේච්ඡයැ යි ද තෘප්තිමත් වූවෙකැ යි ද හුදෙකලා වූවෙකැ යි ද වීර්යය තමා නො හඳුන්වා හළ වීර්යය ඇත්තැ යි හැඳින්වූවෙහි. ඔබ පෙර වීර්යයවත් වූයේ නො වේ ද ? ඔබ තමා ම කළ විරිය නිසා වැලි කතරක පන්සියයක් ගැල්හි සිටි මිනිස්සු ද ගොන්හු ද පැන් ලැබ සැපවත් වූහ. දැන් කුමක් නිසා හළ වීර්යය ඇත්තෙක් වූවෙහි ද ? ඒ භික්ෂුව මෙපමණකින් ම උත්සාහ ලැබුවෙක් වූයේය.

භික්ෂූහු මේ කථාව අසා ස්වාමීනි, දැන් මේ භික්ෂුව වීර්යය හළ බව අපට පැහැදිලිය. පෙර මොහුගේ තනි වීර්යය නිසා වැලි කතරෙහි ගොනුන්ට හා මිනිසුන්ට පැන් ලැබ සැපවත් වූ අයුරු අප්‍රකටය. ඔබ වහන්සේ සියල්ල දන්නා නුවණට ම ප්‍රකටය. අපට ද මේ කාරණය වදාළ මැනැවැ. මහණෙනි, එසේ නම් අසර්. භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ගේ සිහි උපදවා භවාන්තරයෙන් වැසුණු කරුණු ප්‍රකට කළහ.

පෙර කසී රට බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරවන කල්හි බෝසතාණෝ සාත්තු නායක කුලෙහි පිළිසිඳගෙන වියපත් ව පන්සියයක් ගැලින් වෙළඳම් කැරෙමින් හැසිරෙයි. ඔහු දිනක් සැට යොදුන් වැලි කතරට පිළිපන්නේය. ඒ කතරෙහි ඉතා සියුම් වැලි මිටින් ගත් කළ අතෙහි නො රඳයි. ඉරු උදාවෙහි පටන් ගිනි අඟුරු රැසක් මෙන් උණුසුම්ය. පා තබා යා නො හැකිය. මේ නිසා එහි යන්නන් දර, දිය, තල, සහල් ආදිය ගැලින් ගෙන රාත්‍රියෙහි ම ගොස් හිරු උදාවෙහි ගැල් වට කොට තබා ඒ මත්තෙහි මණ්ඩපයක් කොට වේලාසනින් ම අහර කිස නිමකොට (ගැල්) සෙවනෙහි දවල් කාලය නතර කොට හිරු බැස ගිය කල්හි රාත්‍රී භෝජනය අනුභව කොට බිම සිසිල් වූ කල්හි ගැල් යොදාගෙන යෙත්. මේ ගමන මුහුදු ගමනක් හා සමානය. මේ සඳහා ගොඩ නියමුවකු සිටිය යුතුය. හේ තරු සලකුණෙන් තවලම එතැර කළේය.

ඒ සාත්තු නායක එදවස මේ ආකාරයෙන් ම ඒ වැලි කාන්තාරය යමින් එකුන් සැට යොදුනක් ගොස් දැන් එක රැයකින් ම මරු කතරින් එතැර වීම වන්නේයැ යි රාත්‍රී භොජනය ගෙන සියලු දර, දිය අවසන් කොට ගැල් යොදා ගියේය. නියමුවා පළමු ගැලෙහි දික් සඟලා පුටුවක් අතුරුවා අහසෙහි තරු බලමින් මෙදෙසින් පදවනු, මෙදෙයින් පදවනු යි කියමින් වැතිර සිටියේය. ඔහු බොහෝ දිනක් නො නිඳා සිටි හෙයින් වෙහෙස නිසා නින්දට වැටුණේය. ගොනුන් ආපසු හැරී ආ මඟ ම ගනු (කිසිවෙක්) නො දන්නේය. ගොන්නු මුල රැය ගියහ. නියමුවා හිරු උදාවන කල්හි නැකැත් තරු බලා ගැල් නවතවු යි, ගැල් නවතා පිළිවෙළට තබා මේ අප ඊයේ විසූ කඳවුරු මය. අපගේ දර, දිය ද සිඳීගොස්ය. දැන් අපි නැසුණෝ වෙමු යි ගැල් මුදා වටකොට තබා මුදුනෙහි මණ්ඩපයක් කොට තම තමාගේ ගැල් යට තැවමින් නින්දට වන්හ.

බෝසතාණෝ මා වීර්යය අත්හළහොත් සියල්ලෝ ම නැසෙතැයි සිතා අලුය ම සිසිල් වෙලාවෙහි ම ඇවිදින්නේ හී තණ පඳුරක් දැක මෙය යට දිය සීරාව නිසා නැඟුණා විය යුතුයැ යි සිතා උදලු ලක් ගෙන්වා එපෙදෙස කණින්ට විය. සැට රියනක් කැණූහ. මෙතෙක් දුර කණිත් ම උදැල්ල යට ගලක හැපිණි. හැපුණු කෙණෙහි සියල්ලෝම විර්යය අත්හළහ. බෝසතාණෝ මේ ගලට යටින් ජලය තිබිය හැක. එහි ම බැස ගල උඩ සිට නැමී කන යොමා සිතන්නේ යට පවතින ශබ්දය අසා ගොඩට අවුත් සුලවටුවා අමතා දරුව, ඔබ විරිය අත් හළහොත් අප සියල්ලෝම නැසෙන්නෙමු. ඔබ වීර්යය අත්නොහැර මේ යකඩ කුළ ගෙන වළටබැස මේ කලුගලට පහරක් දෙව.

ඔහු බෝසතුන්ගේ වචනය පිළිගෙන සියල්ලන් උත්සාහය අත්හැර සිටිද්දීත් තමා වීර්යය අත්නොහැර වළට බැස ගලට පහරක් දුන්නේය. ගල් වළින් බිඳී පතුලට වැටි ජල පහර හිර කොට සිටියේය. එකෙණෙහි ම ජල කඳක් පැනනැඟිණි. සියල්ලෝම පැන් ස්නානය කළහ. වැඩිපුර ඇතිවිය. දඬු, පළා, කැඳබත් පිස අනුභව කොට ගොනුන්ට ද කවා හිරු බැසයත් ම දිය වළ ළඟ කොඩියක් බැඳ කැමැති තැනට ගියහ. එහි දී ඔවුහු භාණ්ඩ විකුණා දෙගුණ තෙගුණ ලාභ ලැබ තම වාසස්ථානවලට ගියහ.

ඔවුහු දිවි ඇතිතාක් සිට කම් වූ පරිදි ගියහ. බෝසතාණෝ දානාදී පින්කම් කොට කම් වූ පරිදි ම ගියහ. බුදු රජහු මේ දම් දෙසුම දෙසා සම්මා සම්බුදු වී මේ ගාථාව වදාළහ.

**"අකිලාසුනො වණ්ණුපථෙ ඛණන්තා,**
**උදඞ්ගණෙ තත්ථ පපං අවින්දුං**
**එවං මුනී විරියබලූපපන්නො,**
**අකිලාසු වින්දෙ හදයස්ස සන්තින්ති."**

"නොවලස් ව වැලි කතරෙහි සරන්නාහු එම පොළොවෙහි ම ජලය ලැබූහ. එසේ කායික වීර්යයෙන් හා ඥාණ බලයෙන් යුත් වෙහෙස නො දක්නා යෝගී තෙම ධ්‍යානාදී හෘදය ශාන්තිය ලබන්නේය."

එහි "අකිලාසුනොති" යනු කුසීත නො වූවෝ, ඇරඹූ වීර්යය ඇත්තෝය. "වණ්ණුපථෙති" හි "වණ්ණු" යනුවෙන් වැලි කියනු ලැබේ. වැලි මඟෙහි යන අර්ථයි. "ඛණන්තාති" යනු පොළව සාරන්නාහුය. "උදඞගණෙති" යන මෙහි "උද" යනු නිපාතයි. "අඞගණෙති" යනු මිනිසුන් සැරිසරන ප්‍රදේශයක වළවල් නැති බිම් කොටස යන අර්ථයි. "තත්‍ථ" යනු ඒ වැලි මඟෙහි, "පපං අවින්‍දුන්ති" ජලය ලැබුවාහුයි. ජලය වනාහි පානය කරන බැවින් "පාපති" යි කියනු ලැබේ. ගලායන ජලය "පාප" නම් ජලය යන අර්ථයි. "එවන්ති යනු උපමා සැසඳීමයි. "මුනීති" යනු මාන යන ඥාණයි. කාය සංවරය එකකින් හෝ යුක්ත පුද්ගලයා "මුනී" යැයි කියනු ලැබේ. ඔහු වනාහි අගාරිය මුනි, අනගාරිය මුනි සේඛ මුනි, අසේඛ මුනි, පච්චේක මුනි, මුනි මුනි යි විවිධ වේ. එහි අගාරිය මුනි නම් මඟඵල ලැබූ සසුන දැනගත් ගිහියාය. අනාගාරිය මුනි නම් එබඳු ම පැවිද්දාය. සේඛ මුනි නම් මතු හික්මිය යුතු සත් දෙනාය. අසේඛ මුනි නම් රහතන් වහන්සේය. පච්චේක මුනි නම් පසේ බුදුවරයාය. මුනි මුනි නම් සම්මා සම්බුදුය. මෙකරුණෙහි දී සියලු දෙනා ම එකට කැටි කොට මෝනෙය්‍ය නම් නුවණින් යුක්ත බැවින් "මුනී යැයි දත යුතුය. "විරියබලූපපන්නොති" යනු වීර්යෙන් හා කාය බලයෙන් ද ඥාණ බලයෙන් ද යුක්ත වූයේය. "අකිලාසු" යනු කුසීත බව නැත්තේ, සිරුරෙහි ඒකාන්තයෙන් එම නහර, ඇට ඉතිරි වේවායි. මස් ලේ වියලේවායි. මෙසේ කියන ලද සිවු අගින් යුත් වීර්යයෙන් යුක්ත බැවින් අලස බව නැත්තාය. "වින්‍දෙ හදයස්‍ස සන්තිත්ත", සිතෙහි ද හදවතෙහි ද සිසිල් බව ඇති කරන හෙයින් "සන්තිත්ත" නම් ලද ධ්‍යාන විපස්සනා රහත් මඟ නුවණයැ යි කියන ලද උසස් දහම් ලබයි යන අර්ථයි.

මහණෙනි, කුසීතයා පවිටු අකුසලවලින් යුක්ත වූයේ දුක සේ වාසය කරයි. ලගන්නා වූ තමාගේ යහපත පිරිහෙලා නම් මහණෙනි, පටන්ගත් වීර්යය ඇත්තේ, පවිටු අකුසල්වලින් වෙන්ව සැප සේ වාසය කරයි. මහත් වූ යහපත සම්පූර්ණ කරයි. මහණෙනි, හීන වූ වීර්යයෙන් උතුම් නිවනට පැමිණීමක් නො වේ. මෙසේ නොයෙක් සූත්‍රවලින් කුසීතයාගේ දුක සේ විසීමත් පටන්ගත් වීර්යය ඇත්තහුගේ සැප විහරණයත් බුදු රජුන් විසින් වර්ණනා කරන ලදී. මෙහි දී ඇරඹූ වීර්යය ඇති ආර්ය ධර්ම නො ලැබූ විදසුන් වඩන්නහුගේ වීර්යය බලයෙන් අවබෝධ කටයුතු එම සැප විහරණය දන්වන්නාහු, "එවං මුනී විරිය බලූපපන්නො අකිලාසු වින්‍දෙ හදයස්‍ස සන්ති" යි වදාළහ.

මෙහිදී ද මෙය කියන ලද්දේ වෙයි. යම් සේ ඒ වෙළෙන්දෝ නො අලසව වැලි තලාව හාරන්නාහු, ජලය ලැබුවාහු ද එසේ මේ සසුනෙහි ද නො අලසව වැයම් කරන නුවණැති භික්ෂුව මේ ධ්‍යානාදී වශයෙන් විභාග කළ හෘදය ශාන්තිය ලබයි. මහණෙනි, ඒ ඔබ පෙර දිය බිඳක් සඳහා වීර්යය කොට දූන් මෙබඳු මාර්ග ඵල පිණිස නෛර්යාණික සසුනෙහි කුමක් නිසා විරිය හරන්නේ ද ? මෙසේ මේ දම් දෙසුම දක්වා සිව්සස් දෙසූහ. සිව්සස් දෙසුම් කෙළවර විරිය අත්හළ භික්ෂුව අග්‍ර ඵලයෙහි හෙවත් රහත් ඵලයෙහි පිහිටියේය.

බුදු රජහු ඉකුත් වත වදාරා අනුසන්ධි ගළපා ජාතකය නිමවා වදාළහ. එසමයෙහි වීර්යය අත් නො හැර පොළොව හාරා ගල බිඳ මහජනයාට ජලය ලබාදුන් සුළුවටුවා මේ මෙකල වීර්යය අත්හළ භික්ෂුව විය. සෙසු පිරිස මෙකල බුදු පිරිස වූහ. සාත්තු නායක වනාහි මම ම වීම් යි දේශනාව නිමාකළහ.

1. 1. 3.

## සේරිවාණිජ ජාතකය

"ඉධ චෙහි නං විරාධෙසී" යනු මේ දම් දෙසුම බුදුරදහු සැවැත්නුවර වෙසෙමින් එක් හළ වීර්යය ඇති භික්ෂුවක් අරබයා වදාළහ. ඔහු ද පෙර මෙන් භික්ෂූන් විසින් පමුණුවනු ලද්දහු දැක "මහණ, ඔබ මෙබඳු මගඵල ගෙනදෙන සසුනෙහි පැවිදි ව වීර්යය අත්හරින්නේ ලක්ෂයක් වටිනා රන් තැටියෙන් පිරිහුණු සේරිවාණිජයා මෙන් බොහෝ කලක් ශෝක කරන්නේයැ" යි වදාළහ. භික්ෂූහු එකරුණු හෙළිදරවු කිරීම සඳහා බුදු රජුන්ගෙන් ඉල්ලූහ. භාග්‍යවතුන් වහන්සේ භවාන්තරයෙන් වැසීගිය මේ කරුණ ප්‍රකට කළහ.

පෙර මෙයින් පස් වැනි කප බෝසතාණෝ සේරිව නම් රට කච්ඡපූට (උරහිසේ දමා ගෙනයන (කිසිල්ලට යටින්) බඩු පොදිය)

වෙළෙන්දෙක් විය. ඔහු සේරිවා නම් ලෝභී කච්ඡපූට වෙළෙන්දෙක් සමග නීලවාහිනි නම් ගඟින් එතරව අන්ධපුර නම් නගරයට පිවිසෙන්නේ නගර වීථිවල හැසිරුණේය. බෙදාගෙන තම තමන්ට ලැබුණු වීථියෙහි බඩු විකුණමින් හැසිරුණේය. අනෙක් වෙළෙන්දා ද තමාට ලැබුණු වීථිය ගත්තේය. එම නගරයෙහි එක් සිටු කුලයක් පිරිහීමට පත්ව සිටියේය. එම කුලයෙහි පුත්‍රයාගේ සොහොයුරන් ද ධනය ද පිරිහී ගියේය. එක් දැරියක් මිත්තණිය සමග ඉතිරිවූවාය. ඒ දෙදෙනාම අනුන්ට බැල මෙහෙවරකොට ජීවත් වෙති. ඔවුන්ගේ ගෙදර මහා සිටුවරයා පරිභෝජනය කරන ලද රන්තැටිය භාජන අතරෙහි දමන ලදුව බොහෝ කලක් පරිභෝග නොකළ බැවින් මළ බැඳුණේ විය. ඔව්හු එය රන්බඳුනක් බව ද නොදනිති. ඒ ලෝභී වෙළෙන්දා එවෙලෙහිම "වළලු ගන්න වළලු ගන්න." යැයි කියමින් එම ගෙදරට පැමිණියේය. ඒ දැරිය ඔහු දැක මිත්තණියනි, මට පළඳනාවක් ගෙන දෙන්නයැ යි කීවාය. දියණිය, අපි දුප්පත් වෙමු. කුමක් දී ගන්නෙමු ද ? අපට මේ තැටියක් ඇත්තේය. එයින් අපට ප්‍රයෝජනයක් ද නැත. මෙය දී ගන්නෙමැ යි ඈ වෙළෙන්දා කැඳවා අසුනෙක හිඳුවා ඒ තැටිය දී මහතාණෙනි, මේ තැටිය ගෙන මේ ඔබගේ නැඟණියට කිසියම් දෙයක් දෙනු මැනවැ යි කීවාය. වෙළෙන්දා තැටිය අතින් ගෙන රන් බඳුනක් යැයි පෙරළා තැටියේ අඩියෙහි ඉඳිකටුවෙන් ඉරක් ඇඳ රන්බඳුනක් බව දැන මොවුන්ට කිසිවක් නොදීම රන්බඳුන ගෙනයන්නෙමි යි සිතා මෙහි කිසිම වටිනා කමක් නැත. මුදලින් අඩමසක් වත් නොවටී යි කියා බඳුන බිම දමා හුනස්නෙන් නැගී ගියේය.

එකකු පිවිස නික්මුණු වීථියට අනිකාට පිවිසීමට ඉඩ ඇතැ යි බෝසත්තු එම වීථියට පිවිස "වළලු ගන්න, වළලු ගන්න." යැයි කියමින් හැසිරෙන්නේ එම ගෙයට ම පැමිණියහ. නැවතත් ඒ දැරිය මිත්තණියට එපරිදි ම කීවාය. දරුව, පළමු පැමිණි වෙළෙන්දා තැටිය බිමදමා ගියේය. දැන් කුමක් දී ගන්නේද යි කීවාය. මිත්තණිය, පළමු වෙළෙන්දා රළු බස් ඇත්තේය. මේ වෙළෙන්දා වනාහි දැකුම්කළුය. මිහිරි තෙපුල් ඇත්තේය. ඔහු මෙය ගන්නේ නම් මැනවි. එසේ නම් ඔහු කැඳවන්න. ඈ වෙළෙන්දා කැඳවූවාය. ගේතුළට අවුත් හිඳගත් ඔහුට තැටිය දුන්හ.

ඔහු ඒ රන්බඳුනක් බව දැන මැණියනි, මේ තැටිය ලක්‍ෂයක් අගනේය. මෙයට පොහෝනා බඩු මා ළඟ නැතැ යි කීවේය. මහතාණෙනි, පළමු ආ වෙළෙන්දා මෙය අඩමසක්වත් නොවටනේයැ යි බිම දමා ගියේය. ඔබගේ පිනින් මෙය රන්වූවා වෙයි. මෙය අපි ඔබට දෙමු. අපට කිසියම් දෙයක් දී රැගෙන යනු මැනව. බෝසතාණෝ එවිට තමා අත තිබූ කහවණු පන්සියක් ද පන්සියයක් වටිනා සියලු භාණ්ඩ ද දී මට මේ තුලාව ද පසුම්බිය ද කහවණු අටක් ද දෙනුමැනවැ යි ඉල්ලාගෙන ගියේය. ඔහු ඉක්මනින් ම ගංතෙරට ගොස් නැවියාට කහවණු අට දී නැවට නැංගේය.

ඉක්බිති ලෝභී වෙළෙන්දා නැවත ගෙදරට ගොස් තැටිය ගෙන එනු. සුළු දෙයක් දෙමි යි කීවේය. ඇය, ඔහුට බැණ ඔබ අපගේ ලක්‍ෂයක් වටිනා රන් තැටිය අඩමස්සක් වත් අගය නොකළෙහිය. ඔබගේ ස්වාමියා හා සමාන දැහැමි වෙළෙන්දෙක් අපට දහසක් දී එය රැගෙන ගියේයැ යි කීවාය. ඒ අසා සුවහසක් වටිනා රන් පතින් පිරිහුනෙමි. මට මෙය මහත් හානියක්යැ යි හටගත් බලවත් සෝකයෙන් සිහි එළවා ගැනීමට නොහැකිව උමතුව, තමා අත තිබූ කහවණු ද භාණ්ඩ ද ගෙය ඉදිරිපිට විසුරුවා හැඳි පොරෝනා වස්ත්‍ර හැරදමා තුලා දඬුකඩ මුගුරක් කොටගෙන බෝසතුන් ගිය පියසටහන් අනුව පිටත්වූයේ ගංතෙරට ගොස් යන්නාවූ බෝසතුන් දැක එම්බා තොටිය, නැව ආපසු ගෙනෙන්නැ යි කීවේය. බෝසත්හු නොනවත්වනුයැ යි වැළැක්වීය.

අනෙක් වෙළෙන්දාට යන්නාවූ බෝසතුන් දකිත් ම බලවත් ශෝකයක් ඇති විය. ළය උණුසුම් විය. මුඛයෙන් රුධිරය නික්මිණි. වැවක මඩමෙන් හදවත පැළී ගියේය. ඔහු බෝසතුන් කෙරෙහි වෛර බැඳ එහිදී ම මරණයට පත්වීය. මෙය බෝසතුන් කෙරෙහි දෙව්දත් තෙරුන්ගේ පළමු වැනි වෛර බැඳීමයි. බෝසතාණෝ දානාදී පින්කම් කොට කම්වූ පරිදි පරලොව ගියේය. බුදුරදහු මේ දම් දෙසුම වදාරා සම්මා සම්බුදුව ම මේ ගාථාව දෙසූහ.

"ඉධ චෙ හි නං විරාධෙසි සද්ධම්මස්ස නියාමතං,
චිරං ත්වං අනුතපෙස්සසි සෙරිවා යංච වාණිජොති."

මේ ශාසනයෙහි සදහම් නියමය (සෝවාන් මඟ) අලස බව නිසා වරදාගත හොත් ඔබ බොහෝ කලක් සේරිව වෙළෙන්දා මෙන්ය. එහි "**ඉධ චෙ හි නං විරාධෙසි සද්ධම්මස්ස**" යනු මේ සසුනෙහි සද්ධර්මයෙහි නියමය නම් වූ සෝවාන් මඟ වැරදුවෙහි නම් වීර්යය අත්හැර නො ලැබුවෙහි නම් අවබෝධ නො කරන්නෙහිය" නො ලබන්නෙහිය යන අර්ථය යි. "**චිරං ත්වං අනුතපෙස්ස**" යනු එසේ ඇති කල්හි ඔබ බොහෝ කාලයක් ශෝක කරමින් විලාප දෙමින් තැවෙන්නෙහිය. නැතහොත් අත්හළ වීර්යය ඇති බැවින් ලොවුතුරා මඟ වරදවාගත් බැවින් බොහෝ කලක් නිරය ආදියේ ඉපදී නොයෙක් දුක් විඳිමින් පසු තැවෙන්නෙහිය. වෙහසට පත්වන්නේය යනු මෙහි අදහසයි. ඒ කෙසේද යත්, "**සෙරිවා යං ච වාණිජො**" යනු සේරිවා නම් ඇත්තෙකි. "**යං වා**" යනු යම් සේ මෙය කියන ලද්දේ වෙයි. යම් සේ පෙර සේරිවා නම් වෙළෙන්දා සුවහසක් වටිනා රන්බඳුනක් ලැබ එය තමා සතුකර ගැනීමට උත්සාහ නොකොට එයින් ද පිරිහුණේය. තැවුණේය. එමෙන් ම ඔබ ද මෙසසුනෙහි විසිතුරුව කළ රන් බඳුනක් වැනි ලොව්තුරු මඟ (සෝවාන් මඟ) වීර්යය හළ බැවින් පසක් නො කරන්නේ එයින් බොහෝ කලක් තැවෙන්නෙහිය. ඉදින් වීර්යය අත් නො හරින්නේ නම් නුවණැති වෙළෙන්ඳා රන් බඳුන ලබාගත්තාක් මෙන් මගේ සාසනයෙහි නව ලොව්තුරා දහම් ලබන්නෙහිය.

මෙසේ බුදු රජහු ඒ රහත් බව කුළුගන්වමින් මේ දම් දෙසුම දෙසා වදාරා සිව්සස් වදාළහ. සිව්සස් කෙළවර වීර්යය හළ භික්ෂුව අග්‍ර ඵලය වූ රහත් බවෙහි පිහිටියේය. බුදුරදහු ද දෙවස්තුව වදාරා අනුසන්ධි ගළපා ජාතකය නිමවා දැක්වූහ. එදා නුවණ මද වෙළෙන්දා නම් දෙව්දත් තෙරණුවෝ වූහ. නුවණැති වෙළෙන්දා නම් මම ම වූවෙමි යි දෙසුම නිම වූහ.

## 1. 1. 4.

# චුල්ලසෙට්ඨි ජාතකය

"අප්පකෙනපි මෙධාවී" යන මේ ධර්ම දේශනය බුදුරදහු රජගහ නුවර ඇසුරුකොට ජීවක අඹ වනයෙහි වැඩ වසන්නාහු චුල්ලපන්ථක තෙරුන් අරබයා වදාළහ.

එහි දී චුල්ලපන්ථක තෙරුන්ගේ උත්පත්ති කථාව කිය යුතුය. රජගහනුවර ධනසිටු කුලයෙහි දියණිය තම සේවකයා සමග මිත්‍ර වී අන්‍යයන් මෙය දැන ගනිතියැ යි බියපත් ව මෙසේ කීවාය. අපට මෙහි විසීමට නො හැකිය. මගේ මව්පියෝ මේ දෝෂය දනගන්නාහු නම් කැබලි කැබලි කරන්නාහුය. විදේශයකට ගොස් වසන්නෙමු යි අතින් ගෙන යා හැකි ධනය ගෙන ප්‍රධාන දොරටුවෙන් නික්ම කිසිවකු නො දන්නා තැනට ගොස් වසන්නෙමු යි දෙදෙනා ම ගියාහුය. එක්තැනක ඔවුන්ගේ සංවාසය නිසා ඇගේ කුසෙහි දරු ගැබක් පිහිටියේය. ඇය ගැබ මෝරායත් ම හිමියා සමග රහසින් කථා කොට මගේ දරු ගැබ මුහුකරා ගියේය. නෑසියන් නැති තැන දරු ප්‍රසූතිය අප දෙදෙනාට ම දුකක් මය. එම නිසා කුල ගෙයකට යමු යි කීවේය. ඔහු ද අද යමු යි හෙට යමු යි දවස් ඉක්මවීය. ඈ මෙසේ සිතුවාය. මේ නුවණ මද තැනැත්තේ තම වරද මහත් බැවින් ගමනට උනන්දු නො වේ. මව්පියෝ වනාහි ඒකාන්තයෙන් හිතැත්තෝය. මොහු ගියා හෝ නොගියා හෝ මා යා යුතුය. හිමියා ගෙයින් බැහැර වූ කල්හි ගෘහ භාණ්ඩ සකසා තබා තමා සිය ගෙදරට ගියබව අසල්වැසියන්ට දන්වා මඟට පිළිපන්නාය. ඉක්බිති ඒ පුරුෂයා ගෙට ආකල්හි ඇය නොදක අසල්වැසියන්ගෙන් විමසා සියගෙට ගියේයැ යි අසා වේගයෙන් லුහුබැඳ අතරමඟ දී මුණගැසුණි. එහි දී ම ඇයට දරු ප්‍රසූතිය විය. සොඳුර මේ කුමක්ද ? හිමියනි, පුතෙක් උපන. දූන් කුමක් කරන්නෙමු ද ? අපි යම් අරමුණුකින් සිය ගෙට යන්නමුද ? එම කරුණ අතරමඟ දී ම සිදුවිය. දූන් එහි යාමෙන් කවර ප්‍රයෝජනයක්ද ? ආපසු යමු යි දෙදෙනා ම එක්සිත් ව ආපසු ආවාහුය. එම දරුවාට මඟෙහි උපන් බැවින් පන්ථක යි නම් කළහ.

ඇයට නොබෝ කලකින් තවත් ගැබක් පිහිටියේය. සියල්ල පෙරමෙන් විස්තර කළ යුතුය. ඒ දරුවාට ද අතරමඟ උපන් බැවින් චුල්ල පන්ථක යි නම් කළහ. ඒ දරුවන් දෙදෙනා ද රැගෙන තම වාසස්ථානයට ම පැමිණියහ. මෙසේ ඔවුන් එහි වසන කල්හි අන් දරුවන් සුළු පියා, මුත්තා, මිත්තණිය ආදී කියනු අසා මවගෙන් විමසීය. මෑණියනි, අන් දරුවෝ සුළු පියා, මුත්තා, මිත්තණිය ආදී වශයෙන් තෙපලත්. අපට නෑයෝ නැද්ද ? එසේය දරුව, ඔබලාට මෙහි නෑයන් නැත. රජගහනුවර ධන සිටුවරයා නම් ඔබලාගේ මුත්තාය. එහි ඔබලාට බොහෝ නෑයන් ඇත. මෑණියනි, කුමක් නිසා එහි නොයමුද ? ඇය තමා නොයන කාරණය පුතණුන්ට කියා, දරුවන් නැවත නැවතත් ඇවිටිලි කරන්නේ සැමියා අමතා, මේ දරුවෝ බෙහෙවින් වෙහෙසට පත්වෙති. අප මව්පියෝ අප දැක අප මස් කත් ද ? එන්න, දරුවන්ට මුත්තාගේ ගෙය පෙන්වන්නෙමු යි කීවාය. එවිට සැමියා, මට ඔවුන් ඉදිරියේ සිටින්න නොහැක්කෙමි. ඔබ එතැනට පමුණුවන්නෙමි. මැනවි හිමියනි, කවර අයුරකින් හෝ මුත්තණුවන්ගේ ගෙය පෙන්වීම සුදුසුය. දෙදෙන දරුවන් රැගෙන පිළිවෙලින් රජගහනුවර පැමිණ නුවරදොර ශාලාවක නවාතැන් ගෙන, දරුවන්ගේ මව දරු දෙදෙනා සමග පැමිණි බව මව්පියන්ට දැන්වූවාය.

ඔවුහු ඒ හසුන අසා සසර සැරිසරන්නවුන්ට පුතා, දුව නොවන කෙනෙක් නැත. ඔවුහු අපට මහත් අපරාධයක් කළාහු වෙති. අප ඇස් පෙනෙන මානයේ ඔවුන්ට සිටිය නොහැකිය. මෙපමණ ධනය ගෙන ඒ දෙදෙනා පහසු තැනකට ගොස් ජීවත් වෙත්වා. දරුදෙදෙනා මෙහි එවත්වා. සිටුදුව මවුපියන් විසින් එවන ලද ධනය ගෙන දරු දෙදෙනා පැමිණි දූතයන් අතට දී යැව්වාය. දරුවෝ ඔවුන්ගේ ගෙහි වැඩෙති.

දරු දෙදෙනාගෙන් චූල්ලපන්ථක ඉතා ළදරුය. මහාපන්ථක මුත්තණුවන් සමග බුදුරදුන්ගේ දහම් ඇසීම සඳහා යයි. බුදුරදුන් හමුවෙහි නිතර බණ අසන ඔහුගේ සිත පැවිද්දට නැමුණි. මුත්තණුවන් අමතා ඔහු මුත්තණුවනි, ඔබ අනුමත කරන්නේ නම් මම පැවිදි වන්නෙමි. දරුව, කිමක් කියහිද ? සියලු ලෝවැස්සන්ගේ ම පැවිද්දට වඩා මට ඔබගේ පැවිද්ද අගනේය. දරුව, හැකිනම් පැවිදි වන්නැ යි පැවිද්ද අනුමතකොට බුදුරදුන් වෙත ගියේය. මහසිට, ඔබට දරුවෙක් ලැබුණේද ? එසේය ස්වාමීනි, මේ දරුවා මගේ මුනුපුරෙකි.

ඔහු ඔබවහන්සේ ළඟ පැවිදි වෙමිය කියයි. බුදුරදහු එක්තරා පිණ්ඩපාතික භික්ෂුවකට දරුවා පැවිදි කරන්නැ යි අණ කළහ. ඒ භික්ෂුව ඔහුට තචපඤ්චක කමටහන කියාදී පැවිදි කළේය.

ඒ මහාපන්ථක තෙරණුවෝ බුද්ධ වචනය බොහෝ සේ උගෙන පිරිපුන් වයස් ඇත්තේ උපසම්පදාව ලැබ නුවණින් මෙනෙහි කිරීමෙන් කටයුතු කරන්නාහු රහත් බවට පත්වූහ. අනතරුව සමාධි සුවයෙන් හා මගඵල සුවෙන් කල්ගත කරන්නෝ මෙසේ සිතීය. චූල්ලපන්ථකට ද මේ සැපය දිය හැක්කේද ? මුත්තණුවන් වෙත ගොස් මහසිටුතුමනී, ඔබ අනුදන්නේ නම් මම චූල්ලපන්ථක පැවිදි කරන්නෙමි. ස්වාමීනි, පැවිදි කරනු මැනවි. තෙරණුවෝ චූල්ලපන්ථක කුමරුවන් පැවිදි කරවා දස සිල්හි පිහිටවූහ. චූල්ලපන්ථක සාමණේරයෝ පැවිදි වුව ද නුවණ නැත්තෙක් වූහ.

"පදුමං යථා කොකනදං සුගන්ධං
පාතො සියා ඵුල්ලමවීතගන්ධං,
අඞ්ගීරසං පස්ස විරොචමානං
තපන්තමා දිච්චමිවන්තළික්ඛෙ"

"අළුයම පිපුණු සුවඳවත් වූ සුවඳ වහනය වන්නා වූ කෝකන ද නම් රත් පියුම යම් සේ ද එසේ ම අහසෙහි සූර්යයා මෙන් තේජසින් බබලන අඞ්ගීරස නම් බුදු රජුන් බලව."

මේ එකම ගාථාව සිවුමසක් තුළ ද වනපොත් කිරීමට නො හැකි වූයේය. හෙතෙම වනාහි කසුප් සම්බුදු කළ පැවිදි ව නැණවත් ව සිට එක්තරා මඳ නුවණැති භික්ෂුවක් පෙළ උගන්නා කළ අවඥාවෙන් සිනාසුණේය. එම භික්ෂුව අවඥාව නිසා ලජ්ජාවට පත්ව වනපොත් ද නොකළේය. ඒ පාප කර්මයෙන් මෙකල පැවිදිව ද නුවණ මඳ විය. පළමු වනපොත් කළ පදය ඊළඟ පදය වනපොත් කරත් ම අමතක වෙයි. ඔහු මේ එකම ගාථාව වනපොත් කිරීමට වෙහෙසෙන්නේ සිව් මසක් ගතවිය. එවිට මහාපන්ථක තෙරහු ඔහු අමතා පන්ථක, ඔබ මේ සසුනට නුසුදුසුය. සිව් මසකින් එක ගාථාවක්

ඉගෙනීමට නො හැකි වූ ඔබ කෙසේ නම් පැවිදි කිස සඵල කරගන්නෙහිද ? මෙතැනින් ඉවත්වන්නැ යි වෙහෙරින් බැහැර කළහ.

චූලපන්ථක බුදුසසුනෙහි ඇල්මෙන් ගිහිබව නොපතයි. එකල මහාපන්ථක තෙරුණුවෝ භත්තුද්දෙසක (සඟබත් නියමකරන්නෝ) වෙති. රජකුමරකු ලෙසින් පෝෂණය ලද ජීවකයෝ බොහෝ ගඳමල් ආදිය රැගෙන තමාගේ අඹවනයට ගොස් බුදුරදුන් පුදා බණ අසා හුනස්නෙන් නැගිට බුදුරදුන් වැඳ මහාපන්ථක තෙරණුවන් වෙත එළඹ ස්වාමීනි, බුදුරදුන් හමුවෙහි වෙසෙන සඟ පිරිස කොතෙක් දැ යි විචාළහ. පන්සියයක් පමණ වෙති. ස්වාමීනි, හෙට දවස බුදුරදුන් ප්‍රධාන පන්සියයක් භික්ෂූන් වහන්සේ රැගෙන අප නිවෙස්නෙහි දානය පිළිගනු මැනව. උපාසකය, නුවණ මඳ චූලපන්ථක මෙසසුනෙහි නොවඩන ගුණදම් ඇත්තෙකි. ඔහු හැර සෙස්සන්ට ආරාධනය පිළිගනිමි යි කීහ. චූල්ලපන්ථක මේ කථාව අසා මෙසේ සිතීය. තෙරණුවෝ මෙපමණ භික්ෂූන් උදෙසා ආරාධනය පිළිගන්නා විට මා බැහැර කොට පිළිගත්හ. නිසැකවම මගේ සොහොයුරුතුමන්ගේ සිත මා කෙරෙහි බිඳුනා විය යුතුයි. දැන් ඉතින් මට මේ සසුනේ කවර වැඩක්ද ? ගිහි වී දානාදී පින් කරමින් ජීවත් වන්නෙමි.

ඔහු පසුදා අළුයම ගිහි වන්නෙමි යි පිටත්විය. බුදුරදහු එදින ඉතා අලුයම් කාලයෙහි ලොව බලන්නාහු මේ කාරණය දැක පළමුකොට වැඩ චූල්ලපන්ථකගේ ගමන් මඟෙහි සක්මන් කරමින් දොරටුකඩ වැඩ සිටියහ. චූල්ලපන්ථක පන්සලෙන් නික්මෙන්නේ බුදුරදුන් දැක එළඹ වැඳ සිටියේය. බුදු රජහු ඔහු අමතා චුල්ලපන්ථකය, මේ වේලාවෙහි කොහි යන්නේදැ යි විමසූහ. ස්වාමීනි, මගේ සොහොයුරු තෙරණුවෝ මා බැහැර කළහ. එම නිසා මම සිවුරු හැරීම සඳහා යමි. චුල්ලපන්ථකය, ඔබගේ පැවිද්ද මා සතුවූවකි. සොහොයුරා විසින් බැහැර කරන ලද ඔබ මා වෙත නොපැමිණියේ මන්ද ? එන්න, ඔබට ගිහිබවෙන් සෙතක් නැත. චුල්ලපන්ථක රැගෙන වැඩම කළ බුදුරදහු ගඳකිළිය ඉදිරියෙහි ඔහු හිඳවා චුල්ලපන්ථක, පෙරදිගට මුහුණ ලා හිඳ මේ රෙදි කැබැල්ල "රජොහරණං රජොහරණං" යනුවෙන් පිරිමදිමින් මෙහිම සිටින්නැ යි ඉදු බලයෙන් මැවූ පිරිසිදු රෙදි කැබැල්ලක් දී කාලය දැන්වූ කල්හි භික්ෂු සංඝයා පිරිවරා ජීවකගේ නිවසට වැඩමවා පනවන ලද අසුනෙහි වැඩහුන්හ.

චුල්ලපන්ථක ද ඉර දෙස බලමින් ඒ රෙදි කැබැල්ල "රජොහරණං රජොහරණං" යි පිරිමදිමින් හුන්නේය. ඔහු එය පිරමදින්නේ, කිළිටි විය. ඔහු මෙසේ සිතී. මේ රෙදි කඩ ඉතාම පිරිසිදුය. මේ සිරුරේ පහස නිසා පෙර තත්ත්වය හැර මෙසේ කිළිටි විය. සසරදම අනිත්‍යයැ යි විදසුන් වැඩීය.

බුදු රජහු ද චුල්ලපන්ථකගේ සිත විදසුනට නැගුණු බව දැන චුල්ලපන්ථකය, මේ රෙදි කැබැල්ල පමණක් කිළිටි විය. දූවිලි තැවරුණේයැ යි හැඟීමක් ඇතිකර නො ගනුව. ඔබගේ ඇතුළත රාගාදී දූවිලි ඇත. ඒවා ද බැහැර කැරව යි ආලෝකයක් විහිදුවා ඉදිරියෙහි වැඩ සිටින්නාක් මෙන් පෙනෙන්නේ මේ ගාථාවන් වදාළහ.

"රාගො රජො න ච පන රෙණු වුච්චති
රාගස්සෙතං අධිවචනං රජොති,
එතං රජං විප්පජහිත්‍වා භික්ඛවො
විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ.

දොසො රජො න ච පන රෙණු වුච්චති
දොසස්සෙතං අධිවචනං රජොති,
එතං රජං විප්පජහිත්‍වා භික්ඛවො
විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ.

මොහො රජො න ච පන රෙණු වුච්චති
මොහස්සෙතං අධිවචනං රජොති,
එතං රජං විප්පජහිත්‍වා භික්ඛවො
විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ."

"රජස (දූලි) නම් රාගයයි. (සාමාන්‍ය) දූලි නො වේ. දූලි යනු රාගයට නමකි. මේ (කෙලෙස්) දූලි අත්හැර ඒ බුද්ධ ශ්‍රාවකයෝ කෙලෙස් රහිත බුදු රජුන්ගේ සසුනෙහි වාසය කරත්."

"රජස් (දූලි) නම් ද්වේශයයි. සාමාන්‍ය දූලි නොවේ. දූලි යනු ද්වේශයට නමකි. මේ දූලි අතහැර ඒ බුද්ධ ශ්‍රාවකයෝ කෙලෙස් රහිත බුදුරදුන්ගේ සසුනෙහි වාසය කරත්."

"රජස් (දූලි) නම් මෝහයයි (මුළා). සාමාන්‍ය දූලි නොවේ. දූලි යනු මෝහයට නමකි. මේ දූලි අතහැර ඒ බුද්ධ ශ්‍රාවකයෝ කෙලෙස් රහිත බුදුරදුන්ගේ සසුනෙහි වාසය කරත්."

ගාථා කෙළවර චුල්ලපන්ථක තෙරණුවෝ සිව් පිළිසිඹියා සහිත රහත් බවට පැමිණියහ. පිළිසිඹියා සමග ම මුළු තුන් පිටකය ම අවබෝධ විය.

එතුමෝ වනාහි පෙර භවයක රජෙක් වී නුවර සැරිසරන්නේ නළලින් දහඩිය වැගිරෙද්දී පිරිසිදු සළුවකින් නළල පිසින්නේ, සළුව කිළිටි විය. ඔහු මේ ශරීරය නිසා මෙබඳු පිරිසිදු සළුව ප්‍රකෘතිය හැර කිළිටි වූයේය. හේතු ප්‍රත්‍යයෙන් හටගත් දෙය අනිත්‍යයයි. අනිච්ච සඤ්ඤාව ලැබීය. මෙකරුණින් ඔහුට දූවිලි හරනා රෙදිකඩ ම ඉවහල් විය.

කොමාරභච්ච නම් (කුමරකු මෙන් වැඩුණු) ජීවක ද දක්ෂිණෝදකය (බතට පෙර පිරිනමන ජලය) පිරිනැමීය. බුදුරදහු ජීවකය, වෙහෙරෙහි ඉතිරිව භික්ෂූන් ඇත්තේ නොවේදැ යි අතින් පාත්‍රය වැසූහ. එවිට මහාපන්ථක තෙරණුවෝ ස්වාමීනි, වෙහෙරෙහි භික්ෂූන් නැතැ යි කීහ. බුදුරදහු ඇත ජීවකය යැයි වදාළහ. ජීවක පුරුෂයකු අමතා එසේ නම් කොල වෙහෙරෙහි භික්ෂූන් ඇති නැති බව දැනගෙන එව යි යැවීය. එකණෙහි චුල්ලපන්ථක තෙරණුවෝ මගේ සොහොයුරාණෝ වෙහෙරෙහි භික්ෂූන් නැතැ යි කියති. විහාරයෙහි භික්ෂූන් ඇතිබව එතුමන්ට පෙන්වන්නෙමි යි මුළු අඹ වනය ම භික්ෂූන්ගෙන් පිරවීය. සමහර භික්ෂූහු සිවුරු කඩ කරත්. සමහරු පඬු පෙවීම් කරත්. සමහරු පාඩම් කරත්. මෙසේ ඔවුනොවුන් අසමාන ක්‍රියා කරන භික්ෂූන් දහසක් මැවීය. ඒ පුරුෂයා ද වෙහෙරෙහි බොහෝ භික්ෂූන් දැක ආපසු ඇවිත් ආර්යයනි, මුළු අඹ වනය ම

භික්ෂූන්ගෙන් පිරී ඇතැ යි ජීවකට සැලකළේය.

චුල්ලපන්ථක තෙරණුවෝ ද එහි ම සිට,

"සහස්සක්ඛත්තුං අත්තානං නිම්මිණිත්වාන පන්ථකො,
නිසීදම්බවනෙ රම්මෙ යාව කාලප්පවෙදනා"

චුල්ලපන්ථක තමා දහස් වරක්කොට මවා (දක්ෂිණාවට) කල් දන්වන තුරු මනරම් අඹවනයෙහි හුන්නේය.

බුදු රජහු ඒ පුරුෂයාට මෙසේ කීහ. වෙහෙරට ගොස් චුලපන්ථකයන් කැඳවන බව කියවයි වදාළහ. පුරුෂයා ද ගොස් එසේ කී කල්හි, මම චුලපන්ථක වෙමි, මම චුලපන්ථක වෙමි යි මුවදහසකින් නික්මිණි. පුරුෂයා ද ආපසු ගොස් ස්වාමීනි, සියල්ලෝ ම චුලපන්ථක නම් ඇත්තෝ වෙති. එසේ නම් ඔබ ගොස් යමෙක් මම චුලපන්ථක වෙමි යි පළමුකොට කියත් ද ඔහු අතින් අල්ලාගන්න. එවිට සෙස්සෝ අතුරුදහන් වෙති. පුරුෂයා ද එසේ කළේය. එවිට ම දහසක් පමණ භික්ෂූහු අතුරුදන් වූහ. තෙරුණුවෝ ද ගිය පුරුෂයා සමග වැඩියහ. බුදුරදහු බත් කිස කෙළවර ජීවකයන් අමතා ජීවකය, චුලපන්ථකගේ පාත්‍රය ගන්න. ඔහු ඔබට අනුමෙව්නිදම් දෙසන්නේය. ජීවක ද එසේ කළේය. තෙරුණුවෝ ද හඬදෙන යොවුන් සිංහයකු ලෙස තුන්පිටකය ම කලත්වා අනුමෙවන්දම් දෙසූහ.

බුදු රජහු හුනස්නෙන් නැඟිට බික්සඟන පිරිවරා විහාරයට වැඩ භික්ෂූන් වත් දැක්වූ කල්හි ගඳකිළිය ඉදිරියෙහි වැඩසිට බික්සඟනට බුද්ධාවවාදය දී කමටහන් කියා දී බික්සඟන යවා මිහිරි සුවඳින් සුවඳවත් වූ ගඳ කිළියට පිවිස දකුණුපසින් සිංහ සෙය්‍යාවට පිවිසි සේක. ඉක්බිති, සවස් කාලයෙහි දම්සබාවෙහි භික්ෂූහූ එහෙන් මෙහෙන් එක් රැස්ව රත්පැහැ කඩතුරාවකින් වටකරන්නාක් මෙන් වැඩහිඳ බුදුරදුන්ගේ ගුණ කියන්ට පටන් ගත්හ. ඇවැත්නි, මහාපන්ථක තෙරණුවෝ චුලපන්ථකගේ අදහස් නොදැන සාරමසකින් එක් ගාථාවක් පාඩම් කිරීමට නොහැකි බාලයකු සේ සලකා විහාරයෙන් බැහැර කළහ. බුදු රජහු තමන් වහන්සේගේ අද්විතීය ධර්මාධිපත්‍යය නිසා

එක් බතක් අතරතුර පිළිසිඹියා සහිත රහත් බව ලබාදුන්හ. පිළිසිඹියා සමග ම තුන්පිටකය ම අවබෝධ විය. අනේ, බුදුරදුන්ගේ බලයක මහත.

ඉක්බිති, බුදු රජහු දම් සබාවෙහි පැවැති මේ කථා පුවත දැන අද මා යා යුතුමැ යි සිතා බුද්ධ සෙය්‍යාවෙන් නැගිට මනාකොට පඬු පෙවූ දෙපට සිවුර හැඳ විදුලියක්වන් පටිය බැඳ රත් කම්බිලියක් බඳු සුගත් මහාසිවුර පොරවා ගඳකිළියෙන් නික්ම මත්වූ රාජකීය හස්තියකු මැඬීම සඳහා සිංහයකු නික්මෙන්නාක් මෙන් අනුපමය බුදුසිරියෙන් දම් සබාවට වැඩ සරසන ලද වේදිකා පනවන ලද බුදු අසුන මත සවණක් බුදුරැස් විහිදුවමින් අහස් කුස ආලෝකවත් කරමින් යුගඳුරු පව්ව මත ළහිරු මෙන් අසුන් මැද වැඩසිටියහ. බුදු රජුන් වැඩි කෙණෙහි බික්සඟ කථාව නවතා නිහඬ වූහ. බුදු රජහු මුදු මෙත් සිතින් පිරිස බලා වදාරා මේ පිරිස ඉතා හොබනේය. එක් අයකුගේ හෝ අත් පා විපිළිසරක් හෝ සෙම්බහන හඬක් හෝ කිවිස්නා හඬක් හෝ නැත. සියල්ලෝ ම බුද්ධ ගෞරවයෙන් යුතුව බුද්ධ තේජසින් දපණය වී මා ජීවිත කාලය තුළ ම නිශ්ශබ්දව සිටියත් පළමු ව කථා නො කරන්නෝය. කථා ඇරඹීමේ වග මා විසින් ම දත යුතුය. පළමුවෙන් මම ම කථා කරමි යි මිහිරි බඹසරින් මහසඟන අමතා මහණෙනි, මෙහි දැන් කවර නම් කථාවක් කරමින් හුන්නහුද ? කවර නම් අතුරු කථාවක් තොප විසින් අඩාළ කරන ලද්දේද ? ස්වාමීනි, අපි මෙහි දී හිඳ නොසරුප් (තිරශ්චාන) කථාවක් නොකළෙමු. ඔබවහන්සේගේ ම ගුණ වනමින් සිටියෙමු. ඇවැත්නි, මහාපන්ථක චුල්ලපන්ථකගේ අදහස නොදන්නේ අහෝ, බුදුවරුන්ගේ බලය නම් මහත්ය.

බුදු රජහු භික්‍ෂූන්ගේ කථාව අසා මහණෙනි, මේ චුල්ලපන්ථක මා නිසා ධර්මයෙහි ධර්ම මහත්වයට පැමිණියෙහිය. පෙර මා නිසා ධනයෙහි ධන මහත්වයට පැමිණියේයැ යි වදාළහ. මහසඟන ඒ අර්ථය හෙළිකරන ලෙස අයදියහ. බුදු රජහු භවාන්තරයෙන් වැසුණු කරුණ ප්‍රකට කළහ.

පෙර කසීරට බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරන කල්හි බෝසතාණෝ සිටු කුලයක ඉපිද සුදුසු වියට පත්ව සිටු තනතුර ලැබ චූලසෙට්ඨී නම් වූහ. එතුමාණන් නැණවත්ය. ව්‍යක්තය. සියලු නිමිති

දන්නේ විය. ඔහු දිනක් රාජ්‍යය සේවය සඳහා යන්නේ මහා වීථියෙහි මළ මීයකු දැක එකෙනෙහි නැකැත් ගළපා මෙසේ කීය. නුවණැති කුල පුත්‍රයකුට මේ මළ මීයා ගෙන ගොස් අඹු දරුවන් පෝෂණය කිරීමට හෝ යම්කිසි කර්මාන්තයක යෙදවීමට හෝ හැක්කේය. දුගී කුල පුත්‍රයෙක් සිටුවරයාගේ ඒ කථාව අසා මේ සිටුවරයා නොදැන කියන්නෙක් නොවේයැ යි සිතා මළ මීයා ගෙන ගොස් එක් කඩයක බළලකු සඳහා විකුණන්නේ කාකණිකයක් (ඉතා කුඩා මිලක් / තුට්ටුවක්) ලැබීය. ඒ සුළු මිලෙන් හකුරු ද පැන් කළයක් ද ගත්තේය. අනතුරු ව වනයෙන් එන මල්කරුවන් දැක කුඩා කුඩා හකුරු කැබලි දී හැන්දෙන් පැන් ද දුන්නේය. මල්කරුවෝ ද ඔහුට එක එක මල්මිටිය බැගින් දුන්හ. ඒ මලින් ලැබුණු මුදලින් දෙවන දවසෙහි හකුරු ද පැන් කළය ද ගෙන මල් උයනට ම ගියේය. එදින මල්කරුවෝ ඔහුට අඩක් නෙළූ මල් පඳුරු දී ගියහ.

මෙයාකාරයෙන් මොහු නොබෝ කලකින් ම කහවණු අටක් ලැබීය. නැවත සුළං සහිත වැසි දිනයක රජ උයනෙහි බොහෝ වියළි දර හා කොළ අතුරිකිළි වැටී තිබිණි. උයන්පල්ලා මේවා ඉවත් කිරීමට උපායක් නොදකී. ඔහු එතනට අවුත් මේ දර කොළ මට දෙන්නේ නම් මම ඒවා සියල්ල බැහැර කරන්නෙමි යි උයන්පල්ලාට කීය. ඔහු ගනු මැනවැ යි සියල්ල පිළිගත්තේය. චුල්ලන්තෙවාසිකයා දරුවන්ගේ කෙළිමඬලට ගොස් හකුරු දී සුළු මොහොතකින් ඒ දර කොළ බැහැර කරවා උයන් දොරටුවෙහි ගොඩ ගැස්සීය. එදවස රජමැඳුරට මැටි බඳුන් සඳහා කුඹල්කරු දර සොයමින් යන්නේ උයන්දොර ඇති ඒ දර දැක ඒවා ඔහුගෙන් මිලට ගත්තේය. එදවස චුල්ලන්තේවාසිකය දර විකිණීමෙන් කහවණු සොළසක් ද සැළී ආදී බඳුන් පසක් ද ලැබුවේය. මෙසේ කහවණු සුවිස්සක් ලැබුණු පසු මට උපායක් ඇතැ යි ඔහු නගර දොරටුව අබියෙස පැන්සැළියක් තබා පන් සියයක් පමණ තණ කපන්නවුන්ට පැනින් සංග්‍රහ කළේය. ඔවුහූ යහළුව, ඔබ අපට මහත් උපකාරීය. අපි ඔබට කිනම් උදව්වක් කරමුද ? මට යම්කිසි අවශ්‍යතාවයක් ඇති වූ විට කරනු මැනවැ යි කියා ඔබමොබ හැසිරෙමින් ගොඩ යාත්‍රිකයකු හා ජල යාත්‍රිකයකු සමග මිතුරුදම් පැවැත්වීය.

ගොඩ යාත්‍රිකයා දිනක්, හෙට පන්සියයක් අසුන් ගෙන අස් වෙළෙන්දෙක් මේ නගරයට පැමිණෙන බව ඔහුට සැළ කළේය.

මෙබස් ඇසූ ඔහු තණ ගෙනෙන්නන් වෙත ගොස් මෙසේ කීවේය. අද මට එක් එක් තණ මිටිය බැගින් දෙන්න. මා තණ විකුණන තුරු තණ නොවිකුණන මැනැවැ යි ඔවුන් ගිවිස්සා ගත්තේය. ඔවුහු තණ මිටි පන්සියයක් ගෙනවුත් මොහුගේ ගෙදරට දැමූහ. අස් වෙළෙන්දා මුළු නුවර ම සොයා අසුන්ට ගොදුරු නොලැබ චුල්ලන්තේවාසිකට දහසක් දී ඒ තණ ගත්තේය. දින කීපයක් ඇවෑමෙන් මුහුදු වෙළෙන්දා යහළුව, විශාල වෙළඳ නැවක් නැව් තොටට පැමිණියැ යි කීවේය. උපායක් ඇතැ යි සිතාගත් ඔහු කහවණු අටක් වියදම්කොට පිරිවර ජනයා සමග තාවකාලික යානයක් ලබාගෙන මහත් හරසරින් නැව් තොටට ගොස් ඇඟිලි මුදුවක් නැවට අත්තිකාරම් දී නුදුරු තැනක තිරයකින් වටකරවා හිඳ බැහැරින් වෙළඳුන් ආ විට වට රවුමෙහි සිටින්නවුන් ලවා තමාට දැන්වන්නයැ යි සේවකයන්ට අණ කළේය. මේ අතර නැවක් පැමිණි බව අසා බරණැස් නුවරින් සියයක් පමණ වෙළෙන්දෝ භාණ්ඩ ගනුම්හ යි පැමිණියහ. ඔබලා භාණ්ඩ නොලබන්නහුය. අසවල් තැන සිටිනා මහ වෙළෙන්දා විසින් අත්තිකාරම් දෙන ලද්දේයැ යි අසා ඔහුවෙත යන්නේ තිල ඇඳුමෙන් සිටි තුන්වැනි වට රවුමේ සේවකයෝ ඔවුන් ආ බව දැන්වූහ.

ඒ සියයක් වෙළෙන්දෝ ද එක එක දහස බැගින් දී මහවෙළෙන්දා සමග නැවෙහි කොටස් කරුවන්ට නැවත තවත් දහස බැගින් දී කොටස් වෙන්කොට සියලු භාණ්ඩ තම තමන් අත්පත් කැර ගත්හ.

චුල්ලන්තේවාසික දෙලක්ෂයක් ගෙන බරණැසට අවුත් මා විසින් කෘතවේදී වියයුතුයැ යි ලක්ෂයක් ගෙන චුල්ල සිටාණන් වෙත ගියේය. සිටුවරයා දරුව, ඔබ කුමක්කොට මේ ධනය ලබන ලදදැ යි ඇසීය. ඔබතුමා විසින් කියන ලද උපායෙහි පිහිටා සිව් මසක් ඇතුළත ලබන ලද්දේය. මළමීයාගේ පටන් සියලු කථා පුවත කීය. චුල්ලක සිටුවරයා ඔහුගේ වදන් අසා, මෙවැනි දරුවකු අන්සතු කිරීම නොවටීයැ යි සිතා සුදුසු වියට පත්ව සිටි තම දියණිය ආවාහ කොට දී ඔහුගේ සියලු වස්තුවට හිමිකරු කළේය. චුල්ලන්තේවාසිකයා සිටුවරයාගේ ඇවෑමෙන් එනගරයෙහි සිටු තනතුර ලැබීය. සම්බුද්ධ වූ බුදු රජහු මේ ධර්ම දේශනාව වදාරා මේ ගාථාව වදාළහ.

"**අප්පකෙනපි මෙධාවී පාභතෙන විචක්ඛණො,**
**සමුට්ඨාපෙති අත්තානං අණුං අග්ගිංව සන්ධමන්ති**"

"වෙළඳාමෙහි දක්ෂ නුවණැත්තේ සුළු වූ මිලකින් තමන්
උසස් තැනට නංවාලයි. කෙසේ ද යත් මද ගින්නකට
පිඹ මහා ගින්නක් කරන්නාක් මෙනි."

එහි "**අප්පකෙනපි**" ස්වල්පයකින්, මදකින් යන්නයි. "**මෙධාවී**" යනු නුවණැත්තාය. "**පාභතෙන**" යි යනු බඩු මිල යන්නයි. "**විචක්ඛණො**" යනු වෙළඳාමෙහි දක්ෂයාය. "**සමුට්ඨාපෙති අත්තානං**" යනු මහ ධනය ද යසස ද උපදවා එහි තමා තබයි, පිහිටුවයි, යන්නය. "**අණුං අග්ගිංව සන්ධමන්ති**" යනු යම් සේ නුවණැති පුරුෂයා මද ගින්නක ක්‍රමයෙන් ගොම, සුණු ආදිය දමා, කටින් පිඹීමෙන් දියුණු කැර, මහත් ගිනි කඳක් බවට පත් කරයි. එ සේ ම නුවණැත්තා ද සුළු බඩු මිලක් ලැබ, නොයෙක් උපායන්හි යොදමින් ධනය ද කීර්තිය ද වඩවයි. එ සේ වඩවා ඒ ඒ තැන තමා පිහිටුවයි. ධනය හා යසස මහත් බව හේතුකොට නගා සිටුවයි. කවුරුත් දන්නා කෙනෙකු, ප්‍රකට වූවෙකු, කරයි යන අර්ථයි. මෙසේ බුදුරදහු මහණෙනි, චුල්ලපන්ථක මා නිසා දූන් ධර්මයන්හි ධර්ම මහත්වයට පැමිණියේය. පෙර ධනයෙහි ධන මහත්වයව හා කීර්ති මහත්වයට පැමිණියේයැ යි මෙ සේ මේ දහම් දෙසුම ගෙනහැර දක්වා, අතීත වර්තමාන දෙපුවත කියා, අනුසන්ධි ගළපා, එකල චුල්ලන්තෙවාසික චුල්ලපන්ථක වීයැ යි ද චුල්ලක සිටුතුමා මම ම වීමියැ යි දේශනාව අවසන් කළහ.

## 1. 1. 5.

## තණ්ඩුලනාළි ජාතකය

"**කිමග්ඝති තණ්ඩුලනාළිකා**" මෙය බුදු රජහු දෙව්රම් වෙහෙර වසන්නේ ලාලුදායි නම් තෙරුණුවන් අරබයා දේශනා කළහ. එකල්හි

ආයුෂ්මත් දබ්බමල්ල පුත්ත තෙරණුවෝ සංඝයාගේ භත්තුද්දේසක (සඟබත් නියම කරන) වූහ. උන්වහන්සේ උදය කාලයෙහි සලාකබත් නියම කරන කල්හි ලාලුදායි තෙරණුවන්ට දිනක උසස් බතක් ද දිනක පහත් බතක් ද ලැබෙයි. පහත් බතක් ලැබූ දිනයෙහි උන්වහන්සේ සලාක බෙදන ගෙය තුළ අවුල් ඇති කරයි. කිම, සලාක බෙදිය හැක්කෝ දබ්බමල්ල තෙරණුවෝද ? අපි නොහැකි වන්තයෝ වෙමුද ? උන්වහන්සේ සලාක බෙදන ගෙය ආකූල කරත් දී දබ්බමල්ල තෙරණුවෝ එ සේ නම් ඔබ ම සලාක බෙදවයි සලාක පැන් දුන්හ. එතැන් පටන් ලාලුදායි තෙරණුවෝ සංඝයාට සලාක බෙදති.

ඒ අසා බුදුන් වහන්සේ ආනන්ද තෙරුන් විමසූහ. ආනන්ද, සලාක බෙදන ගෙහි මහත් කෝලාහලයකි. මේ කිනම් ශබ්දයක්ද ? තෙරුන්වහන්සේ බුදුන් වහන්සේට ඒ අර්ථය දැන්වූහ. ආනන්ද, ලාලුදායි තමාගේ අඥානබව නිසා අනුන්ගේ ලාභයට හානි කරන්නේ දැන් පමණක් නොවේ. පෙර ද කළේයැ යි වදාළහ. තෙරුන්වහන්සේ ඒ බව හෙළිදරව් කරන ලෙස බුදුන්වහන්සේගෙන් අයැද සිටියහ. බුදුන්වහන්සේ භවාන්තරයෙන් වැසුණු කරුණ පැහැදිලි කළ සේක.

පෙර කසී රට බරණැස් නුවර බඹදත් නම් රජෙක් විය. එකල්හි අප මහ බෝසතාණන් ඒ රජුගේ තක්සේරුකරු විය. ඇත්, අස් ආදීන් මෙන් ම මැණික් රන් ආදිය ද අගය කරවීය. අගයකරුවා භාණ්ඩ හිමියන්ට භාණ්ඩානුරූපව ම මිල දෙවීය. රජ ලොභොබියෙකි. ලෝභ ස්වරූපය නිසාම මෙසේ සිතී. මේ තක්සේකරු මෙසේ අගයකරවන කල්හි මාගේ රජමැදුරෙහි ධනය නොබෝ කලකින් ම ක්‍ෂය වන්නේය. අනිකකු තක්සේරුකරු කරන්නෙමැ යි සිහමැදුර කවුළුව හැර රජමිදුල දෙස බලන්නේ එක් අඥබාල ගැමි මිනිසකු රජමිදුලෙන් යනු දැක, මොහු මගේ තක්සේරු කිරීමේ කාර්යය කිරීමට සමතකැ යි ඔහු කැඳවා, එම්බල, අපගේ තක්සේරු කිරීමේ කාර්යය කරන්න හැක්කේද යි ඇසීය. දේවයනි, හැකි වෙමි. රජතුමා තම ධනය ඉතිරි කැර ගැනීම පිණිස ඒ මෝඩයා තක්සේරු කිරීමේ කාර්යයෙහි තැබීය. එතැන් පටන් ඒ මෝඩ මිනිසා ඇත්, අස් ආදීන් අගය කරන විට අගය අඩුකොට තමා කැමැති පරිදි කරයි. ඔහු තනතුරෙහි සිටි නිසා ඔහු යමක් කියයි ද ඒ මිලම වෙයි.

එකල උතුරු දෙසින් අස් වෙළෙන්දෙක් අසුන් පන්සියයක් ගෙන ආවේය. රජතුමා ඒ මිනිසා ගෙන්වා අසුන්ට මිල නියම කරවීය. ඔහු අසුන් පන්සියය ම එක් සහල් නැළියකට මිල කරවා, අස් වෙළෙඳාට එක් සහල් නැළියක් දෙන ලෙස අණකොට, අසුන් අස්හල තැබීය. අස් වෙළෙන්දා පැරණි තක්සේරුකරු වෙත ගොස් මෙපුවත සැලකොට දැන් කුමක් කළ යුතුදැ යි විචාළේය. ඔහු මෙසේ කීය. තක්සේරුකරු වෙත ගොස් ඔහුට අල්ලසක් දී මෙසේ අසව. අපගේ අස් මිල සහල් නැළියක් මිල බව දන්නා ලද්දේය. ඒ සහල් නැළියේ අගය ඔබගෙන් දැනගනු කැමැත්තෙමු. එම සහල් නැළිය මෙතෙක් අගීයැ යි රජු ඉදිරියේ සිට ඒ සහල් නැළිය මෙපමණක් ඇගීයැ යි ප්‍රකාශ කිරීමට හැකිදැ යි අසනු. ඔහු හැකියැ යි කිවහොත් ඔහුත් සමග රජු වෙත යන්න. මම ද එහි එන්නෙමි. අස් වෙළෙන්දා යහපතැ යි බෝසතුන්ගේ වචනය පිළිගෙන තක්සේරුකරුට අල්ලසක් දී එපවත් දැන්වීය. තක්සේරුකරු අල්ලස ලැබී, සහල් නැළිය මිල කරන්ට හැකිබව කීය. එ සේ නම් රජ කුලයට යමු යි ඔහු රැගෙන රජු වෙත ගියේය. බෝසතාණෝ ද තවත් බොහෝ ඇමතියෝ ද ගියහ.

අස් වෙළෙන්දා රජුන් වැඳ දේවයනි, පන්සියයක් අසුන් එක් සහල් නැළියක් අගනා බව දන්නෙමි. ඒ සහල් නැළිය කොතෙක් අගීදැ යි තක්සේරුකරුගෙන් අසනු මැනැව. රජතුමා ඒ පුවත නොදන්නේ එම්බල තක්සේරුකරුව, අසුන් පන්සියය කොතෙක් අගී ද ? දේවයනි, සහල් නැළියකි. එම්බා තක්සේරුකරුව, අසුන් පන්සියයකගේ මිල සහල් නැළියක් වේවා, ඒ සහල් නැළියේ මිල කොතෙක්දැ යි කියව. ඒ මෝඩ පුරුෂයා ඇතුළත පිටත සහිත බරණැස් පුරවරය සහල් නැළියක් වටීයැ යි කීවේය. පළමු ඔහු රජුට පක්ෂපාතීව පන්සියයක් අසුන් සහල් නැළියට අගය කළේය. නැවත වෙළෙන්දාගෙන් අල්ලස් ලැබ සහල් නැළිය ඇතුළත පිටත සහිත බරණැස් නුවරට අගය කළේය.

"කිමග්ඝති තණ්ඩුලනාළිකාය
අස්සයානමූලාය වදෙහි රාජ
බාරාණසිං සන්තරබාහිරන්තං
අයමග්ඝති තණ්ඩුලනාළිකාති"

රජතුමනි, අශ්වයන්ගේ මිල වූ සහල් නැළිය කොපමණ අගීද යි කියනු මැනව. (අස් වෙළෙන්දා රජුට කීය.) රජු විසින් විමසනු ලැබූ තක්සේරුකරු මේ සහල් නැළිය ඇතුළත පිටත (නුවර ගම් නියංගම් සහිත) බරණැස් නුවරම අගනේයැ යි කීය. එකල බරණැස වටකොට බැඳි පවුර දෙළොස් යොදුනක් වේ. මේ එහි ඇතුළතයි. පිටත වනාහි තිස් යොදුන් රටකි. ඒ මෝඩයා මේසා මහත් ඇතුළත පිටත සහිත බරණැස එකම සහල් නැළිකට මිල කළේය. මේ ඇසූ ඇමැතියෝ අත් පහරා සිනා සෙමින් අපි මෙතෙක් පොළොවත් රාජ්‍යයත් මිල කළ නො හැකියැ යි සිතා සිටියෙමු. මෙතරම් විශාල රජුන් සහිත බරණැස් රාජ්‍යය සහල් නැළියක් වටී. අහෝ, තක්සේරුකරුගේ නුවණක තරම. මෙතෙක් කල් සිටියේ කොහි ද? අපගේ රජතුමාට ම සුදුසුයැ යි අවමන් කළහ. රජු ලජ්ජාවට පැමිණ මෝඩකම බැහැරකොට බෝසතුන්ට ම අගඝාපතික ධුරය පැවරීය. බෝසතාණෝ ද කම් වූ පරිදි ගියහ. බුදුරදහු මේ ධර්ම දේශනාව ගෙන හැර දක්වා, දෙකථා පුවත් කියා, අනුසන්ධි ගළපා, දේශනාව නිම කළහ. එදා අශිෂ්ට මෝඩ තක්සේරුකරු නම් මෙදවස ලාලුදායි වූයේය. නුවණැති තක්සේරුකරු නම් මම ම වූයෙමි යි දෙසුම නිම කළහ.

## 1. 1. 6.

## දේවධර්ම ජාතකය

**"හිරිඔත්තප්ප සමපන්නා"** යන මෙම ජාතකය බුදු රජහු දෙවුරම් වෙහෙර වැඩ වසමින් එක්තරා බහුභාණ්ඩික (බොහෝ සිවුරු, පිරිකර ඇති) භික්ෂුවක් අරබයා දේශනා කළහ. සැවත් නුවර වැසි කෙළඹියෙක් බිරිය මළ කල්හි පැවිදි විය. ඔහු පැවිදි වන විට ම තමා සඳහා පන්සලක් ද ගිනිහල් ගෙයක් ද බඩු ගබඩාවක් ද කරවා, එය ගිතෙල්, සහල් ආදියෙන් පුරවා තබා පැවිදි විය. පැවිදි වූ පසුත් තමාගේ දාසයන් කැඳවා කැමැති පරිදි ආහාර පිසවා වළඳයි. බොහෝ සිවුරු පිරිකර ඇත්තෙකු ද විය. රාත්‍රී කාලයෙහි එක්

අඳනයක් සහ සිවුරක් ද දවල් කල වෙනත් අඳන සිවුරු පරිභෝග කරයි. විහාර කෙළවර වෙසෙයි. දිනක් සිවුරු ඇතිරිලි ආදිය පිටතට ගෙන මළුවෙහි අතුරා වියලන කල්හි දනව් වැසි බොහෝ භික්ෂූහු සේනාසන චාරිකාවෙන් හැසිරෙන්නාහු එතනට පැමිණ, සිවුරු දැක මේවා කාගේද යි ඇසූහ. බහු භාණ්ඩික තෙරණුවෝ මගේයැ යි කීහ. ඇවැත්නි, මේ සිවුරත්, මේ සිවුරත්, මේ අඳනයත්, මේ අඳනයත්, මේ ඇතිරිල්ලත්, මේ ඇතිරිල්ලත් ඔබගේ මද ? එ සේය. මගේමැ යි ඇවැත්නි, බුදුරදුන් විසින් චීවරය (සිවුරු තුනක්) අනුදන්නා ලදී. ඔබ අපිස් බුදු සසුනෙහි පැවදි ව මෙසේ බොහෝ පිරිකර ඇත්තෙක් වූවෙහි. එනු මැනවි, ඔබ බුදුරදුන් වෙත ගෙනයමු යි ඔහුත් රැගෙන බුදුරදුන් වෙත ගියහ.

බුදුරදුන් ඔවුන් දැක මහණෙනි, අකැමැත්තෙන් ම මේ භික්ෂුව කැඳවා ගෙන ආවෝද ? ස්වාමීනි, මේ භික්ෂුව බහු භාණ්ඩිකය. බොහෝ පිරිකර ඇත්තේය. මහණ, ඔබ බහුබාණ්ඩික වූයේ ඇත්තද ? ස්වාමීනි, ඇත්තයි. මහණ, ඔබ කුමක් නිසා බහු භාණ්ඩික වූවෙහිද ? මම අලපේච්ඡ බවෙහි, ලද දෙයින් සතුටුවන බවෙහි - පෙ - බවුන් වැඩීමෙහි වීර්යය වැඩීමෙහි ගුණ වනන්නේ නොවෙම්ද ? බහු භාණ්ඩික භික්ෂුව එබස් අසා කිපුණේ, මම මේ අයුරින් සිටින්නෙම් යි පොරොවා සිටි සිවුරු හැරදමා පිරිස් මැද එක් සිවුරකින් පමණක් සිටියේය.

ඉක්බිති, බුදුරදහු භික්ෂුවට පිටිවහල් වෙමින් මහණ, ඔබ පෙර ලජ්ජා බය සොයන්නෙකු ව දිය රකුසෙකු ව සිටි කාලයේ පවා හිරිඔතප් සොයමින් දොළොස් අවුරුද්දක් විසුවේ නොවේද ? දැන් මෙවැනි උසස් බුදු සසුනෙහි පැවිදි ව සිවු පිරිස් මැද පොරවනා සිවුර ඉවත දමා ලජ්ජා බය හැර මක්නිසා සිටිහිද ? භික්ෂුව බුදුවදන් අසා, හිරිඔතප් උපදවා සිවුර පොරවාගෙන බුදුරදුන් වැඳ එකත් පසෙක් හුන්නේය. භික්ෂූහු එපුවත හෙළිදරවු කරනු පිණිස බුදුරදුන් අයදියහ. උන්වහන්සේ භවාන්තරයෙන් වැසුණු කරුණු හෙළිදරවු කළ සේක.

පෙර කසී රට බරණැස් නුවර බඹදත් නම් රජෙකු විය. එකල බෝසතාණෝ රජුගේ අග මෙහෙසිය කුස පිළිසිඳ ගත්හ. නම් තබන

දිනයෙහි ඔහුට මහිංසාස කුමාර යි නමක් තැබූහ. ඔහු ඈතමෑත දුවපැන ඇවිදින කල රජුට තවත් පුතෙක් උපන. ඔහුට චන්ද කුමාර යි නමක් තැබූහ. ඔහු ඔබිමොබ දුවපැන ඇවිදින කළ බෝසත් මව කලුරිය කළාය. රජ අන් කතක් අග මෙහෙසි තනතුරෙහි තැබීය. ඇය රජුට ඉතා ප්‍රිය මනාප වූවාය. ඇය හා ප්‍රිය සංවාසය නිසා තවත් පුතකු වැදුවාය. ඔහුට සූරිය කුමාර යි නමක් තැබූහ. රජ පුත්‍රයා දැක සතුටු වූයේ සොඳුර, ඔබගේ පුත්‍රයාට වරයක් දෙමි යි කීය. දේවිය වරය කැමැති කාලයක ගතයුතු දෙයක් කොට තැබුවාය. කුමරා සුදුසු වියට පත්වෙත්ම දේවයන් විසින් මපුතු උපන් කල වරයක් දෙන ලද්දේ නොවේද ? මගේ පුත්‍රයාට රාජ්‍යය දෙනු මැනවැ යි කීවාය. රජ මගේ පුත්‍රයෝ දෙදෙන ගිනිකඳන් මෙන් බබලමින් සිටිති. ඔබ පුතුට රාජ්‍යය දිය නොහැකියැ යි ප්‍රතික්ෂේප කොට ඇය නැවත නැවතත් ඇවිටිලි කරනු දැක මැය මාගේ පුතුන්ට නපුරක් කැරතැ යි සිතා, දරුවනි, මම සූරිය කුමරා උපන් කල වරයක් දුනිමි. දැන් ඔහුගේ මව තම පුතුට රාජ්‍යය ඉල්ලීය. මම සූරිය කුමරාට රාජ්‍යය දෙනු කැමැත්තේ නොවෙමි. මාගම්හු නම් පවිටුය. ඔබලාට නපුරක් විය හැකිය. ඔබලා වනයට ගොස් මා ඇවෑමෙන් කුල සන්තක රාජ්‍යය කරනු මැනවැ යි කියා හඬා වැලප, හිස සිඹ, පිටත් කැර හැරියේය.

ඔවුන් දෙදෙනා පියා වැඳ, පහයෙන් බසින කල්හි රජ මිදුලෙහි සෙල්ලම් කරමින් සිටි සූරිය කුමාරයා ද ඔවුන් යන බව දැන මමත් සොහොයුරන් සමග යමි යි ඔවුන් සමග නික්මුණේය. ඔවුහු හිමවතට පිවිසියහ. බෝසතාණෝ මඟින් පිටත ගසක් මුල හිඳ, සූරිය කුමරුන් අමතා, සූරිය සොහොයුර, තෙල විලට ගොස් නා පැන් බී නෙළුම් පතකින් අපට ද පැන් ගෙනෙන්න. ඒ විල එක්තරා දිය රකුසකු විසින් වෙසමුණි රජුගෙන් ලබන ලද්දේය. වෙසමුණි රජ දේව ධර්මය දන්නවුන් හැර විලට බස්නා සෙස්සන් කෑමටත් විලට නො බටුවන් කෑමට නො ලැබෙන බවටත් වරම් දී ඇතැ යි කීය. එතැන් පටන් ඒ දිය රකුසා යමකු ඒ විලට බසිත් ද ඔවුන්ගෙන් දේව ධර්මය විචාරා, යමෙකු නො දනී නම් ඔවුන් කා දමයි. ඉක්බිති, සූරිය කුමරා ඒ විලට ගොස් නො විමසා ම විලට බැස්සේය. රකුසා ඔහු අල්ලාගෙන දේව ධර්මය දන්නේද යි විචාළේය. කුමරා දේව ධර්මය නම් ඉර හඳයැ යි කීය. ඔබ දේව ධර්මය නොදනී යි දිය යට ගෙන ගොස් තමාගේ වාසස්ථානයෙහි තැබීය. බෝසතාණෝ ද කුමරු

පමාවනු දැක චන්ද කුමරුන් යැවීය. දිය රකුසා ඔහු ද අල්ලාගෙන දේව ධර්මය දනීද යි ඇසීය. එ සේය, දනිමි. දේව ධර්මය නම් සතර දිසාවෝය. රකුසා ඔබ දේව ධර්මය නොදනී යි ඔහු ද ගෙන එහි ම තැබීය.

බෝසතාණෝ ඔහු පමාවෙත්ම කිසියම් උවදුරක් විය යුතුයැ යි තෙමේ ම එහි ගොස් දෙකුමරුන්ගේ විලට බට පිය සටහන් දැක මේ විල රකුසකු විසින් අරක්ගන්නා විලක් විය යුතුයැ යි කඩුව දරා, දුන්න ගෙන සිටියේය. දිය රකුසා බෝසතුන් විලට නොබසින බව දැක වනකැමි මිනිසකු මෙන් පෙනී සිට බෝසතුන්ට මෙසේ කීය. පින්වත් පුරුෂය, ඔබ ගමන් විඩා ඇත්තේ මේ විලට බැස නා බී, නෙළුම් අල කා මල් පැළඳ සුව සේ නොයන්නේ ඇයි ? බෝසතාණෝ ඔහු දැක මේ ඒ රකුසා විය යුතුයැ යි දැන, ඔබ විසින් මාගේ සොහොයුරෝ ගන්නා ලද්දාහුදැ යි ඇසීය. එ සේය. මක්නිසාද ? මේ විලට බටුවන් අල්ලාගනිමි. විලට බස්නා සියල්ලන් අල්ලා ගන්නෙහිද ? යමෙකු දේව ධර්මය දනී ද ඔවුන් හැර සෙස්සන් අල්ලාගනිමි. ඔබට දේව ධර්මයෙන් වැඩක් තිබේද ? එ සේය. ඇත. ඔබට දේව ධර්මය මම ඔබට කියන්නෙමි. එ සේ නම් කියනු මැනවි. මම අසන්නෙමි. මම ඔබට දේව ධර්මය කියන්නෙමි. මම කිළිටි වූ සිරුරු ඇත්තේ වෙමි යි කීය. රකුසා බෝසතුන් නහවා, බොජුන් වළඳවා, පැන් පොවා, මල් පළඳවා, සුවඳ විලවුන් ගල්වා, විසිතුරු මණ්ඩපයක අසුනක් පනවා දුන්නේය. බෝසතාණෝ අසුනෙහි හිඳ රකුසා පාමුල හිඳුවා, එ සේ නම් කන් යොමා සකසා දේව ධර්මය අසව යි මේ ගාථාව දෙසූහ.

**"හිරිඔත්තප්ප සම්පන්නා සුක්කධම්ම සමාහිතා,**
**සන්තො සප්පුරිසා ලොකෙ දෙවධම්මාති වුච්චරෙ"**

"හිරිඔතප් දෙකින් යුත් පිරිසිදු දහමින් සිත දරාගත්, යම් ශාන්තවූ සත්පුරුෂ කෙනෙක් ලොව වෙත් ද ඒ දේව ධර්මයයි. ඔවුහු දේව ධර්මයෝයැ යි කියනු ලබත්."

ඒ ගාථාවෙහි **"හිරිඔත්තප්ප සම්පන්නා"** යනු ලජ්ජාවෙන් ද

බියෙන් ද යුක්ත වූවාහුය. කාය දුශ්චරිතාදියෙන් ලජ්ජා වීම, හිරි නම්. ලජ්ජාවට මේ නමකි. එම දුසිරිත් ආදියෙන් බිය වීම, ඔත්තප්ප නම්. පවට ඇති බියට මේ නමකි. එහි ලජ්ජාව ඇතුළතින් උපදී. බැහැරින් උපදින්නේ බියයි. ලජ්ජාව තමා අධිපතිකොට පවතී. බිය සත්ත්ව ලෝකය අධිපතිකොට පවතී. හිරි වනාහි ලජ්ජාව ස්වභාවකොට පවතී. ඔත්තප්ප බය ස්වභාවකොට පවතී. ලජ්ජාව අවනත ස්වභාවය ලක්ෂණකොට පවතී. බය වරදෙහි බව දක්නා ස්වභාවය ලක්ෂණකොට පවතී. මෙහි ද ඇතුළතින් හටගන්නා ලජ්ජාව කරුණු සතරකින් උපදී. ජාතිය ගැන සිතා, වයස ගැන සිතා, තම දක්ෂතාවය ගැන සිතා, බහුශ්‍රැත බව ගැන සිතා යනුවෙනි. ඒ කෙසේ ද යත්, පව් කිරීම උසස් කුලවතුන්ගේ ක්‍රියාවක් නොවේ. කේවට්ටාදී (මස් මරන්නන්) හීන ජාතිකයන්ගේ ක්‍රියාවකි. මෙවැනි උසස් කුලවතකුට මේ ක්‍රියාව කිරීමට සුදුසු නැතැ යි මෙසේ ජාතිය ගැන සිතා, පාණාතිපාතාදී පව් කම් නොකරන්නේ ලජ්ජාව උපදවා ගනී. එ සේ ම පාපක්‍රියා කිරීම නොදරුවන් විසින් කළයුතු ක්‍රියාවකි. ඔබ වැනි වයසෙහි සිටිනා අය විසින් කළයුතු දෙයක් නොවේ. මෙසේ වයස ගැන සිතා පාණාතිපාතාදී පව් කම් නොකොට ලජ්ජාව උපදවා ගනී. එ සේ ම මේ පව් කම් නම්, දුබලයන්ගේ ක්‍රියාවකි. එවැනි දක්ෂයකු හට මේ ක්‍රියාව කිරීම සුදුසු නැත. තම හැකියාව ගැන සිතා පව්කම් නොකොට ලජ්ජාව උපදවා ගනී. එ සේ ම මේ පව් කම් අඥ බාලයන්ගේ ක්‍රියාවකි. නැණවතුන්ගේ ක්‍රියාවක් නොවේ. මා වැනි නුවණැති බහුශ්‍රැතියකුට මේ ක්‍රියාව කිරීමට සුදුසු නො වේයැ යි බහුශ්‍රැත බව සලකා ප්‍රාණඝාතාදී පව් කම් නොකොට ලජ්ජාව උපදවා ගනී. මෙසේ ඇතුළතින් හට ගන්නා ලජ්ජාව කරුණු සතරක් නිසා උපදී. මෙසේ උපදවාගත් ලජ්ජාව තම සිතට පිවිසවා පව්කම් නොකරයි. මෙසේ ලජ්ජාව "අජ්ඣත්ත සමුට්ඨාන" නම් වෙයි.

කෙසේ නම් ඔත්තප්ප (බය) බැහැරින් හටගන්නේ නම් වෙයි ද ? ඉදින් ඔබ පව් කම් කරන්නේ නම්, සිව් පිරිස් මැද ගැරහිය යුත්තෙකු වන්නෙහිය.

"ගරහිස්සන්ති තං විඤ්ඤූ අසුචිං නාගරිකො යථා,
විවජ්ජිතො සීලවන්තෙහි කථං භික්ඛු කරිස්සසී"

"මහණ, නගර වැසියෙකු අසූචියට පිළිකුල් කරන්නේ යම් සේ ද ඔබ සිල්වතුන් විසින් බැහැර කරන ලද්දේ ශාසනික කටයුතු කෙසේ නම් කරන්නේ ද ?"

මෙසේ නුවණින් විමසමින් බැහැරින් හටගන්නා බය නිසා පව් කම් නොකරයි. මෙනයින් (ඔත්තප්ප) බය බැහැරින් හට ගන්නේ නම් වෙයි.

කෙසේ නම් (හිරි) ලජ්ජාව තමා අධිපතිකොට ඇත්තේ වේ ද ? මෙලොව කුල දරුවෙක් තමා අධිපතියෙක්, දෙටුවෙක් කොට සිතා ඔබ වැනි සැදැහැයෙන් පැවිදි වූ උගතකුට ධූත ගුණ දරන්නෙකුට පව් කම් කිරීම සුදුසු නොවේයැ යි සිතා, පව් කම් නොකරයි. මේ අයුරින් ලජ්ජාව තමා අධිපති කොට පවත්නේ වෙයි. එහෙයින් වදාළහ. බුදුහු හෙතෙම තමා ම අධිපති කොට අකුසල් අත්හරී. කුසල් වඩයි. වැරදි සහිත දෙය අත්හරී. නිවැරදි දෙය වඩයි. තමා පිරිසුදුව හැසිරෙයි. කෙසේ නම් (ඔත්තප්ප) බය ලෝකය අධිපති කොට පවතී ද ? මේ ලෝකයෙහි දැහැමි කුල පුත්‍රයෙක් ලෝකය අධිපති කොට, දෙටු කොට අකුසල් නොකරයි. එ හෙයින් කියන ලදී. මේ සමස්ත ලෝකය ඉතා විශාලය. ඒ සමස්ත ලෝකයෙහි ඍද්ධි ඇති, දිවැස් ඇති, මෙරමා සිත් දන්නා මහණ බමුණෝ සිටිත්. එතුමෝ දුර සිටිය ද මෙරමා දකිත්. ඔවුහු ළඟ සිටිය ද මෙරමා හට නොපෙනෙත්. තම සිතින් මෙරමා සිත දකිත්. එතුමෝ මා මෙසේ දනිත්. පින්වත, බලනු මැනවි. මේ කුල පුත්‍රයා සැදැහැයෙන් ගිහිගෙයින් නික්ම සසුනෙහි පැවිදි වූයේ, පවිටු අකුසලවලින් ගහණ ව වෙසෙයි. සමහර ඍද්ධි ඇති, දිවැස් ඇති, මෙරමා සිත් දන්නා දේවතාවෝ සිටිත්. ඔවුහු දුර සිට මෙරමා දකිත්. ළඟ සිට වුවද මෙරමා හට ඔවුහු නොපෙනෙත්. ඔවුහුගේ සිත් මෙරමා සිත දකිත්. ඔවුහු ද මා මෙසේ දනිත්. පින්වත, බලනු මැනවි. මේ කුල පුත්‍රයා සැදැහැයෙන් ගිහිගෙයින් නික්ම පැවිදි වූවත් පවිටු අකුසල ධර්මයන්හි ගහණ ව වෙසෙයි. ඔහු මෙසේ ලෝකය අධිපති කොට අකුසල් දුරලයි. කුසල් වඩයි. වැරදි දෙය දුරලයි. නිවැරදි දෙය වඩයි. පිරිසුදු ව ජීවත් වෙයි. මෙසේ (ඔත්තප්ප) බය, ලෝකය අධිපති කොට ඇත්තේ නම් වෙයි.

හිරි, ලජ්ජාව ස්වභාව කොට ඇත්තේය. ඔත්තප්පය, බය

ස්වභාව කොට ඇත්තේය, යන මෙහි ලජ්ජාව යනු ලජ්ජා වන ස්වභාවයයි. බය නම් අපාය බයයි. ඒ ස්වභාවයෙන් පිහිටියේය. මේ ලක්‍ෂණ දෙක ම අකුසල් දුරු කිරීමෙහි දී ප්‍රකට වේ. ඇතැම් කෙනෙක් මළමූත්‍ර කිරීමෙහි දී පවා ලජ්ජාවිය යුතු අයකු දැක ලජ්ජා වන්නෝය. ඒ අයුරින් සිත තුළ ලජ්ජාව ඇති වී පව්කම් නොකරයි. ඇතමෙක් අපායට බිය වී පව්කම් නොකරති. ඒ සඳහා මේ උපමාව දැක්විය හැකිය. ලෝ ගුලි දෙකකින් එකක් සීතලය. අසූචි තැවරී ඇත. අනෙක උණුසුම්ය. ගිනියම් වී ඇත. එහි දී නුවණැත්තා අසූචි තැවරුණු බැවින් ලෝගුලිය පිළිකුල් කරන්නේ, නොගනී. අනෙක තාප බයින් නොගනී. එහි සිසිල අසූචි තැවරුණු ලෝ ගුලිය පිළිකුලින් නොගන්නාක් මෙන් සිතෙහි ලජ්ජාව ඇති වී පාප ධර්ම නොකිරීම මෙනි. උණුසුම් ලෝ ගුලිය තාප බයින් නොගන්නාක් මෙන් අපායට බයින් පව්කම් නොකරන්නා මෙයැ යි දත යුතුය.

(හිරි) ලජ්ජාව අධිපති ස්වභාව ලක්ෂණකොට ඇත්තේය. (ඔත්තප්ප) බය වරදෙහි බිය දක්නා සියලු ස්වභාවය ලක්‍ෂණකොට ඇත. මේ ලජ්ජා, බය දෙක ම පාප කර්ම දුරු කිරීමෙහි දී ම ප්‍රකට වෙයි. මෙහි දී (හිරි) ලජ්ජාව, ජාති (කුල) මහත් බව සැලකීම, බුදුරදුන්ගේ උසස් බව සැලකීම, බුදු සසුනෙන් ලැබිය යුතු දායාද (මඟ ඵල) මහත් බව සැලකීම, සඟ මහත් බව සැලකීම, යන සිව් කරුණෙන් අවනත ගති ඇති ලජ්ජාව උපදින, පව්කම් නොකරයි. එ සේ ම තමා ම තමාට කරන අපවාද බය, මෙරමා කරන අපවාද බය, දඬුවම් බිය, දුගති බිය යන සිව් කරුණෙන් වරදෙහි බිය දක්නා ලක්ෂණ ඇති ඔත්තප්පය උපදවා පව් කම් නොකරයි. මෙහි දී ජාතිමහත් බව සැලකීම, ආදිය ද තමා ම තමාට කරන අපවාද ආදී බය ද විස්තරකොට කිය යුතුය. එහි විස්තර අංගුත්තර අටුවාවෙහි කියන ලදී.

**"සුක්ක ධම්ම සමාහිතා"** යනු මෙහි මෙම හිරි ඔතප් මුල්කොට කළ යුතු කුසල ධර්ම සක්ක ධම්ම (පිරිසිදු) නම්. ඒ සියල්ල එකට කැටිකොට ගත් කල කාමාවචරාදී චතුර්භූමික ලෞකික ලෝකෝත්තර ධර්මයෝය. මෙයින් යුක්ත පුද්ගලයෝ ගැනෙති. මෙයින් යුක්ත වූවෝ යන අර්ථයයි. **"සන්තො සප්පුරිසා ලොකෙ"** යන්නෙහි කයින් කැරෙන වැරදි ආදියෙන් සන්සිඳුණු හෙයින් සාන්ත නම්. කෙළෙහි ගුණ දන්නා

බැවින් සෝබන පුරුෂයෝ, සත්පුරුෂයෝ වෙති. ලෝකය වනාහි සංඛාර ලෝක, සත්ත්ව ලෝක, ඕකාස ලෝක (අවකාශ ලෝක), ඛන්ධ ලෝක, ආයතන ලෝක, ධාතු ලෝක වශයෙන් විවිධ වේ. එක ම ලෝකය සියලු සත්ත්වයෝ ආහාරය නිසා පවතින්නාහු වෙති. - පෙ - අටළොසක් ලෝකය අටළොසක් ධාතුය යන මෙතැන්හි සංඛාර ලෝකය කියන ලදී. ඛන්ධ ලෝක ආදිය ද මෙහි ම ඇතුළත් වේ. මෙලොව, පරලොව, දෙව්ලොව, මිනිස්ලොව ආදී තැන්හි සත්ත්ව ලෝකය කියන ලදී. යම්තාක් ප්‍රභාවත් සඳ, හිරු දෙදෙන භ්‍රමණය වෙයි ද දිසාවන් ආලෝක කරයි ද එතෙක් ලෝකය දහස් අයුරකින් ඔබගේ වසඟයෙහි පවතී.

මෙහි අවකාශ ලෝකය කියන ලදී. මේ ලෝක අතුරින් මෙහි දී සත්ත්ව ලෝකය අදහස් කරන ලදී. සත්ත්ව ලෝකයෙහි ම එබඳු සත්පුරුෂයෝ වෙති. ඔවුහු ම දේව ධර්ම ඇත්තෝයැ යි කියනු ලැබෙත්. එහි ද දෙවියෝ සම්මුති දේව, උප්පත්ති දේව, විසුද්ධි දේව වශයෙන් ත්‍රිවිධ වෙති. ඔවුනතුරෙන් ද මහා සම්මත කාලයේ පටන් දෙවියෝයැ යි සම්මත කොට ඇති හෙයින් රාජ රාජ කුමාරවරු ම සම්මුති දේව නම් වෙති. දෙව්ලොව උපන්නෝ උප්පත්ති දේව නම් වෙති. රහත්හු විසුද්ධි දේව නම් වෙති. මෙසේ ද කියන ලදී. සම්මුති දෙවියෝ නම් පොළොව ආශ්‍රිත දෙවියන්ගේ පටන් ඉන් මත්තෙහි සිටින දෙවියෝය. විසුද්ධි දෙවියෝ නම් බුදු, පසේ බුදු, මහ රහත්හු ය. මෙකී දෙවියන්ගේ ධර්මයන් දේව ධර්මයැ යි කියනු ලැබේ. කුසල ධර්ම වනාහි හිරි ඔතප් මුල්කොට පවතී. කුසල් සම්පත්තිය නිසා ම දෙව්ලොව ඉපදීමට ද රහත් බැවින් පිරිසුදු වීමට ද හේතුවන බැවින්, හේතු වන අරුතින් ත්‍රිවිධ දෙවියන්ගේ ධර්මය දේව ධර්ම නම්. ඒ දේව ධර්මයෙන් යුක්ත වූ පුද්ගලයෝ ද දේව ධර්ම වෙති. එම නිසා මේ දේශනාවෙහි පුද්ගල ප්‍රමුඛ කොට මේ ධර්ම දක්වන්නේ ලෝකයෙහි ශාන්ත සත්පුරුෂයෝ දේව ධර්මයැ යි කියනු ලැබෙතැ යි කීහ.

රාක්ෂයා මේ දම් දෙසුම අසා පැහැදී බෝසතුන්ට මෙසේ කීය. පණ්ඩිතය, මම ඔබට පැහැදුණෙමි. එම නිසා එක් සොහොයුරෙක් දෙමි. කවරෙකු ගෙන එම් ද ? කනිටු සොහොයුරා ගෙන එනු. පණ්ඩිතය, ඔබ හුදෙක් දේව ධර්මය දන්නෙක් වෙයි. ඒ

අනුව පිළිපදින්නෙක් නොවේ. දෙටු සොහොයුරා තබා කනිටු සොහොයුරු ගෙන්වා ගන්නේ කුමක් නිසා ද ? දෙටුවන්ට ගරු කිරීමේ කුසලය නො කරන්නේය. රාක්ෂය, මම දේව ධර්මය දන්නවා පමණක් නොව ඒ පිළිපදින්නෙක් ද වෙමි. අප වනගත වූයේ ද කනිටු සොහොයුරා නිසාය. මොහුගේ මව මොහුට රාජ්‍යය දෙන ලෙස අප පියාට ඇවිටිලි කළාය. අප පියා ඇයට එම වරය නොදී අප ආරක්ෂාව පිණිස වනවාසය අනුමත කළේය. එම කනිටු කුමරා නො නැවතී අප සමග පැමිණියේය. යක්ෂයකු විසින් වනයේ දී ඔහු කන ලදදේයැ යි කීව ද කිසිවෙක් ඒ නො පිළිගන්නෝය. එම නිසා මම නින්දාවට බියෙන් ඔහු ම ඉල්ලා සිටිමි. යහපති, යහපති, පණ්ඩිතයෙනි, ඔබ දේව ධර්මය දන්නේ පමණක් නොව, ඒ අනුව පිළිපදින්නෙහියැ යි පැහැදුනු යක්ෂයා බෝසතුන්ට සාධුකාර දී සොහොයුරන් දෙදෙනා ම ගෙනවුත් දුන්නේය.

ඉක්බිති, බෝසත්හු ඔහුට මෙසේ කීහ. යහළුව, ඔබ පෙර තමා විසින් කරන ලද පව්කම්න් මෙරමා ලේ, මස් බුදින රකුසකු වී ඉපද, දැනුදු පව් කම් ම කරන්නෙහිය. ඔබට මේ පව් කම් නිරය ආදියෙන් මිදෙන්ට නො දෙන්නේය. එම නිසා මෙතැන් පටන් පව් කම් අතහැර පින් කරව. බෝසතුන්ට ඔහු දමනය කරන්න හැකි විය. බෝසත්හු රාක්ෂයා දමනය කොට, ඔහු විසින් යොදන ලද රැකවරණ ඇතිව එහි ම වසමින් දිනක් නැකැත්තරු බලා පියරජු මළ බව දැන, රාක්ෂයා ද රැගෙන බරණැසට ගොස් රාජ්‍යය ගෙන චන්ද කුමරුට උපරජ පදවිය ද සූරිය කුමරුට සෙනෙවි පදවිය ද දී රාක්ෂයාට සිත්කළු බිම් පෙදෙසක ස්ථානයක් කරවා, උසස් මල් මාලා, මල්, බත් ලැබෙන සේ සැලැස්වූහ. බෝසත්හු දැහැමින් රාජ්‍යය කොට, කම් වූ පරිදි මිය පරලොව ගියහ.

බුදුරදහු මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා, සිව්සස් වදාළහ. දම් දෙසුම කෙළවර ඒ භික්ෂුව සෝවාන් ඵලයෙහි පිහිටියේය. බුදුරදහු ද මේ කථා පුවත් දෙක වදාරා, අනුසන්ධි ගළපා, ජාතක කථාව සමෝධාන කළ සේක. එකල ජල රකුසා නම් මේ බහු භාණ්ඩික භික්ෂුවය. සූරිය කුමරා අනඳ තෙරණුවෝය. චන්ද කුමරු සැරියුත් තෙරණුවෝය. දෙටු සොහොයුරු මහිංසාස කුමරුවෝ නම් මම ම වූවෙමි.

## 1. 1. 7.

## කට්ඨහාරි ජාතකය

"පුත්තො ත්‍යාහං මහාරාජා" යන මේ ජාතකය බුදුරදහු දෙව්රමෙහි වැඩ වසන්නෝ වාසභ ඛත්තියා නම් කුමරියගේ කථාව අරබයා දේශනා කළහ. වාසභඛත්තියාගේ කථා පුවත දොළොස් වැනි නිපාතයේ භද්දසාල ජාතක කථාවෙහි එන්නේය. ඕ වනාහි මහානාම ශාක්‍යය රජුගේ දියණියකි. නාගමුණ්ඩා නම් දාසියගේ කුස උපන්නීය. කොසල් රජුගේ අග මෙහෙසිය වූවාය. ඕ රජුට දාව පුතකු වැදූවාය. රජතුමා පසුව ඇයගේ දාසිභාවය දැන අග මෙහෙසි තනතුරින් පිරිහෙළීය. පුත් වූ විඩූඩභ කුමරුගේ ස්ථානය ද පිරිහෙළීය. දෙදෙනා ම රජමැදුර තුළ ම වෙසෙති. බුදු රජහු මේ කරුණ දැන, පෙරවරුයෙහි පන්සියයක් සඟුන් පිරිවරා රජ මැදුරට වැඩමවා, පනවනලද අසුනෙහි වැඩහිඳ, මහා රජ, වාසභඛත්තියා කොහි ද ? රජතුමා එපුවත් සැල කෙළේය. මහා රජ, වාසභ ඛත්තියා කවරකුගේ දියණියක් ද ? ස්වාමීනි, මහානාමගේය. කවරකු උදෙසා මෙහි පැමිණියා ද ? ස්වාමීනි, මා උදෙසාය. එසේ නම් මහ රජ, මෝ තොමෝ රාජ දියණියකි. රජකු උදෙසා ම පැමිණියාය. ඔබට ම දාව පුතකු ද ලැබූවාය. එම පුත්‍රයා පිය සතු රාජ්‍යයට හිමියෙකු නො වන්නේ කුමක් නිසා ද ? පෙර රජවරු එකණෙහි බිරිය බවට පත්, දර ගෙනයන්නියගේ කුසෙහි ඉපදුනු පුතුට ද රාජ්‍යය දුන්හ. කොසෙල් රජතුමා මෙම පුවත හෙළිදරව් කිරීම පිණිස බුදුරදහු අයැද සිටියේය. බුදුරදහු භවාන්තරයෙන් වැසුණු කරුණ ප්‍රකට කළ සේක.

පෙර බරණැස් නුවර බඹදත් රජ මහත් යසසින් උයනට ගොස් එහි මල් ගෙඩි කෙරෙහි ලොබින් උයන් වන ලැහැබෙහි හැසිරෙන්නේ උයන් වන ලැහැබෙහි ගී ගයමින් දර නෙළන ගැහැනියක දැක, ඇය පිළිබඳ සිත් ඇතිව සංවාසය කළේය. එකෙණෙහි ම බෝසතාණෝ ඇය කුස පිළිසිඳ ගත්හ. ඒ සමග ම ඇගේ කුස වීදුරු පිරුණාක් මෙන් බර විය. ඇය දරු ගැබක් පිහිටි බව දැන දේවයනි, මා කුස දරු ගැබක් පිහිටියේය. රජතුමා ඇඟිලි මුදුවක් දී, ඉඳින් දුවක් නම් මෙය වියදම් කොට පෝෂණය කරව. පුත්‍රයකු නම් මා වෙත ගෙන එවයි කියා ගියේය. ඕ තුමූ ද මුහුකුරා

ගිය ගැබ් ඇත්තී බෝසතුන් බිහි කළාය. ඔහු දුව පැන හැසිරෙන කල්හි කෙළි මඬලෙහි සෙල්ලම් කරන්නහුට මෙසේ කියන්නෝ වෙත්. පියා නැත්තා විසින් පහරන ලද්දෝ වෙමු. ඒ ඇසූ බෝසත්හු මව වෙත ගොස් මෑණියනි, මගේ පියා කවරෙක් ද ? දරුව, ඔබ බරණැස් රජුගේ පුත්‍රයාය. මෑණියනි, ඒ සඳහා කිසියම් සාක්ෂියක් ඇත්තේ ද ? රජ මේ මුද්ද දී ඉඳින් දුවක වූයේ නම් මෙය වියදම් කොට පෝෂණය කරන්නැ යි ද පුතෙක් වී නම් මේ මුදුව සමග තමා වෙත ගෙන එන්නැ යි ද කියා ගියේය. එසේ නම් මා පියා ළඟට නො පමුණුවන්නේ ඇයි ? පුතුගේ අදහස දැනගත් ඇය පුතු සමග රජ දොරටුව වෙත ගොස් තමා පැමිණි බව දන්වා සිටියාය. රජු විසින් කැඳවන ලද්දී, එවිට රජුන් වැඳ දේවයිනි, මේ ඔබතුමාගේ පුත්‍රයායැ යි කීවාය. රජතුමා දන්නේ නමුදු පිරිස් මැද ලජ්ජාවෙන් මගේ පුත්‍රයකු නො වේයැ යි කීය. දේවයිනි, මේ ඔබතුමන්ගේ ඇඟිලි මුදුවයි. එය හඳුනන්නහුද යි ඇසුවාය. මේ මුදුව ද මගේ නො වේ. දේවයිනි, දැන් මට සත්‍යය ක්‍රියාව හැර වෙන සාක්ෂියක් නැත. ඉඳින් මේ දරුවා ඔබතුමා නිසා උපන්නේ නම් අහසෙහි සිටීවා, එ සේ නො වේ නම් බිම වැටී මැරේවා යි බෝසතුන් පාදයෙන් ගෙන අහසට විසි කළාය. බෝසතාණෝ අහසෙහි පළක් බැඳ හුන්නේ මිහිරි හඬින් තම පියාට දම් දෙසන්නේ මේ ගාථාව දෙසූහ.

> **"පුත්තො ත්‍යාහං මහාරාජ ත්වං මං පොස ජනාධිප**
> **අඤ්ඤෙපි දෙවො පොසෙති කිඤ්ච දෙවො සකං පජන්ති"**

> "මහරජතුමනි, මම ඔබතුමාගේ පුත්‍ර වෙමි. ජන නායකතුමනි, ඔබතුමා මා පෝෂණය කරනු මැනවි. දේවයන්වහන්සේ සේවකාදී අන්‍යයන්ද පෝෂණය කරයි. සිය පුත්‍රයා පෝෂණය නො කරන්නේ මන් ද ?"

එහි **"පුත්තො ත්‍යාහං"** යනු, මම ඔබගේ පුත්‍රයා වෙමි. පුත්‍රයා වනාහි, අත්‍රජ, ඛෙත්තජ අන්තෙවාසික, දින්නක වශයෙන් සිව් ආකාරය. එහි, තමා නිසා උපන්නේ අත්‍රජ නමි. යහන මත, පළඟ මත, ළය මත ආදී තන්හි උපන්නේ ඛෙත්තජ නමි. ඇසුරෙහි සිප්සතර හදාරන්නේ අන්තෙවාසික නමි. පෝෂණය කරනු සඳහා දෙන ලද්දේ දින්නක නමි. මෙහි දී අත්‍රජ පුත්‍රයා සඳහා කියන ලදී. සතර සංග්‍රහ

වස්තුවෙන් ජනයා සතුටු කෙරේනුයේ රාජ නම්. මහත් වූ රාජයා, මහරාජ නමින් අමන්තේ මහා රාජයැ යි කීය. **"ත්වං මං පොස ජනාධිප"** යනු ජනපතිතුමනි, - දනදෙටුතුමනි, ඔබතුමා මා පෝෂණය කරනු මැනවි, නඩත්තු කැමැති නම් වර්ධනය කරනු මැනවි, යන්නයි. **"අඤ්ඤෙපි දෙවො පොසෙති"** යනු අනෙක් ඇත්ගොව් ආදී මිනිසුන් ද ඇත්, අස් ආදී තිරිසනුන් ද වෙනත් බොහෝ ජනයා ද පෝෂණය කරයි යන්නයි. **"කිඤ්ච දෙවො සකං පජං"** මෙහි **"කිඤ්ච"** යන්න නින්දා අරුතෙහි ද අනුග්‍රහ අරුතෙහි ද නිපාත පදයකි. ඔබතුමාගේ පුත්‍රයකු වූ මා දේවයන්වහන්සේ පෝෂණය නො කරතැ යි කියත් ම, ගර්හා කරයි. අනෙක් බොහෝ ප්‍රාණීන් පෝෂණය කරතැ යි කියත් ම, අනුග්‍රහ කැරේ, නම් වෙයි. බෝසත්හු මෙසේ නින්දා කැරෙමින් ද අනුග්‍රහ කැරෙමින් ද **"කිඤ්ච දෙවො සකං පජං"** යනුවෙන් කීහ.

බෝසතාණන් අහසෙහි සිට මෙසේ දහම් දෙසනු අසා රජතුමා දරුව, එනු මැන. මම ම ඔබ පෝෂණය කරමි යි අත දිගු කළේය. දහස් ගණන් අත් දිගු කෙරිණ. බෝසතාණෝ අනිකකුගේ අතට නොබැස රජුගේ අතට ම බැස ඇකයෙහි හිඳගත්හ. රජතුමා ඔහුට යුවරජ පදවිය දී මව අග මෙහෙසිය කළේය. හේ පියරජු ඇවෑමෙන් කට්ඨවාහන නමින් රජ වී දැහැමෙන් රාජ්‍යය කොට කම් වූ පරිදි මිය පරලොව ගියේය. බුදුරදහු කොසල් රජුට මේ කථාව ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා ජාතක කථාව නිම කළහ. එකල මව නම් මහාමායා වූවාය. පියතුමා සුද්ධෝදන මහ රජ විය. කට්ඨවාහන රජ මම ම වීමි.

## 1. 1. 8.

## ගාමිණී ජාතකය

**"අපි අතරමානාන"** යන මේ ජාතකය බුදු රජනු දෙව්රම් වෙහෙර වැඩ වසමින් වීර්යය අත්හළ භික්ෂුවක් අරබයා දේශනා

කළහ. මේ ජාතකයෙහි වත්මන් කථාව ද ඉකුත් කථාව ද එකොළොස් වැනි නිපාතයෙහි සංවර ජාතකයෙහි වන්නේය. කථාව එහි ද මෙහි ද එක සමානය. ගාථා පමණක් වෙනස් වේ. ගාමිණී කුමරා බෝසතුන්ගේ අවවාදයෙහි පිහිටා සොහොයුරන් සියයකට කනිටු වී ඒ සොහොයුරන් පිරිවරා සේසත යට උතුම් පළගෙහි හිඳ තම යසස හා සම්පත් බලා මගේ මේ සියලු යස සම්පත මගේ ගුරුතුමා සතුයැ යි සතුටු ව මේ උදානය (සතුටු වාක්‍යය) ප්‍රකාශ කළේය.

**"අපි අතරමානානං ඵලාසාව සමිජ්ඣති**
**විපක්කබ්‍රහමචරියොස්මි එවං ජානාහි ගාමණී"**

"නුවණැත්තන්ගේ අවවාදයෙහි පිහිටා නො ඉක්මන් ව කටයුතු කරන්නන්ගේ පවා ඵල ආශාව, ප්‍රාර්ථනා ඉටු වේ. මම මුහුකුරා ගිය බ්‍රහ්ම චර්යාව ඇත්තෙමි. ගාමිණිය, මෙසේ දනුව."

එහි "අපි" යනු නිපාත මාත්‍රයකි. "අතරමානානං" යනු පඬුවන්ගේ උපදෙසෙහි පිහිටා ඉක්මන් නොවී උපායෙන් කටයුතු කරන්නන්ය. **"ඵලාසාව සමිජ්ඣති"** යනු යම් සේ පතන ලද ඵලයෙහි ආශාව, එය ලැබීමෙන් ඉටුවේ ම ය. එහි **"ඵලාසාව"** යනු ආශා ඵලය පතන ලද පරිදි ඉටුවීම අර්ථයයි. **"විපක්ක බ්‍රහමචරියොස්මි"** යන මෙහි සතර සංග්‍රහ වස්තු, උසස් චර්යාව නිසා බ්‍රහ්මචරිය නමි. එය ද ඊට මුල් වූ සම්පත ලැබූ බැවින් මුහුකුරා ගියා වේ. ඔහුට යම් කීර්තියක් ලැබුණේ ද එය ද උසස් යන අර්ථයෙන් බ්‍රහ්මචරිය නමි. එහෙයින් කීය. මුහුකුරා ගිය බ්‍රහ්මචරිය ඇත්තේ වෙමි. **"එවං ජානාහි ගාමණී"** සමහර තැනක ගම් වැසියා ද ගම් දෙටුවා ද ගාමිණී නමි. මෙහි දී සියලු ජන නායක වූ තමා සඳහා කීය. එම්බා ගාමිණිය, ඔබ මේ කරුණු මෙසේ දනුව. ඔබ ඇදුරා නිසා සොහොයුරන් සියයක් ඉක්මවා මේ මහා රජ්‍යයට පැමිණියේ වෙමි යි උදන් ඇනීය. ඔහු රාජ්‍යයට පැමිණි කල්හි සත් අට දිනක් ඇවෑමෙන් සියලු සොහොයුරෝ තම තමන්ගේ වාසස්ථානයන්ට ගියාහුය. ගාමිණී රජ දැහැමෙන් රාජ්‍යය කොට කම් වූ පරිදි මිය පරලොව ගියේය. බෝසත්හු ද පින් කොට කම් වූ පරිදි මිය පරලොව ගියේය.

බුදු රජහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා සිව්සස් ප්‍රකාශ කළහ. ඒ කෙළවර හළ වීර්යය ඇති ඔහු රහත් ඵලයෙහි පිහිටියේය. බුදුරදහු දෙසුමක් කියා අනුසන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළ සේක.

## 1. 1. 9.

## මඛාදේව ජාතකය

"උත්තමඞ්ගරුහා මය්හං" යන මෙය බුදුරදහු දෙව්රමෙහි වැඩ වසනුයේ මහා අභිනිෂ්ක්‍රමණය අරබයා වදාළහ. ඒ පුවත යට නිදාන කථාවෙහි කියන ලදමය. ඒ කාලයෙහි භික්‍ෂූහු බුදුරදුන්ගේ ගිහිගෙන් නික්මීම වණමින් හුන්නාහුය. බුදුරදහු දම්සබාවට වැඩමවා බුදු අසුනෙහි හිඳ මහ සඟණ ඇමතුහ. මහණනි දැන් කවර කථාවක් කරමින් සිටියාහු ද? ස්වාමීනි අන් කථාවක් නොව ඔබවහන්සේගේ ගිහිගෙන් නික්මීම වණමින් හුන්නෙමු. මහණෙනි, තථාගතයන් වහන්සේ දැන් පමණක් මහබිනික්මන් කළාහු නො වෙති. පෙර ද නික්මුනාහුමයැ යි වදාළහ. භික්‍ෂූහු එම අරුත පැහැදිලි කරනු සඳහා බුදු රජුන් අයැදියහ. බුදු රජහු භවාන්තරයෙන් වැසුණු කරුණ ප්‍රකට කොට වදාළහ.

පෙර විදේහ රට මිථිලා නුවර මඛාදේව නම් රජකු විය. ඔහු දැහැමි රජෙකි. ඔහු වසර සූඅසු දහසක් කුමාර ක්‍රීඩා කළේය. එපමණ කලක් යුව රජය ද එපමණ කලක් ම මහරජය ද කොට දිගුකලක් ගෙවා දිනක් කරණවැමියා ඇමතීය. යහළුව, කපුව, යම් දවසක මගේ හිසෙහි පැසුණු කෙස් දක්නේ නම් මට දන්වනු. කපුවා ද දිගු කලක් ගෙවා එක් දවසක් අඳුන්වන් කෙස් අතර පැසුණු කෙසක් දැක ''දේවයනි, එක් පැසුණු කෙසක් පෙනේයැ යි සැලකළේය. එ සේ නම් යහළුව, ඒ නර කෙස උදුරා මාගේ අල්ලේ තබනු යි කියනු ලැබුයේ රන් අඬුවෙන් උදුරා රජුගේ අල්ලෙහි තැබීය. එතැන් සිට රජට සූඅසූදහසක් අවුරුදු ඉතිරි ව තිබුණේය. එ සේ තිබියදීත් නර

කෙස දැක, මරුවා අවුත් ඉදිරියෙහි සිටියාක් මෙන් ද ගිනිගත් පන්සලකට පිවිසියාක් මෙන් ද සිතමින් සංවේගයට පැමිණ, බොළඳ මඛාදේවයනි, කෙස් පැසෙන තුරුත් ඔබට කෙළෙස් අත්හරින්ට නො හැකි වූවෙහියැ යි සිතී. මෙසේ රජු නර කෙස් හටගත් බව සිතත් සිතත් ම ඇතුළත දාහය හටගනී. සිරුරින් ඩහදිය වැගිරිණි. ඇඳි පිළි මිරිකා ඉවත් කළ යුතු ආකාරයට පත්විය. අද ම නික්මී පැවිදි විය යුතුයැ යි කරණවෑමියාට ලක්ෂයක් උපදනා ගම්වරයක් දී දෙටු පුතු කැඳවා දරුව, මගේ හිසෙහි නර කෙස් පහළ විය. මම මහල්ලෙක් වීමි. මවිසින් මිනිස් ලොව කම් සැප විඳින ලදී. දැන් දෙව් ලොව කම් සැප සොයන්නෙමි. ගිහිගෙයින් නික්මීමට දැන් කාලයයි. ඔබ මේ රාජ්‍යය කරවන්න. මම පැවිදි වී මේ මඛාදේව අඹ වනයෙහි වෙසෙමින් මහණ දම් පුරන්නෙමි යි කීය. මෙසේ මහණ වනු කැමැති ඔහු වෙත ඇමැතියෝ පැමිණ දේවයන්වහන්ස, ඔබවහන්සේට පැවිදි වීමට කුමක් හේතු වීදැ යි විමසූහ. රජු පැසුණු කෙස් අතින් ගෙන ඇමැතියන්ට මේ ගාථාව කීය.

"උත්තමඞ්ගරුහා මයහං ඉමෙ ජාතා වයොහරා,
පාතු භූතා දෙවදූතා පබ්බජ්ජාසමයො මමාති"

"මගේ වයස පැහැර ගන්නා නරකෙස් හටගනී. මේ
දේවදූතයෝ පහළ වූහ. මට පැවිදි වීමට කාලයයි."

එහි **"උත්තමඞ්ගරුහා"** යනු කෙස්ය. කෙස් නම් අත් පා ආදි අනෙක් අඟපසඟයන්ට වඩා උසස් වූ හිසෙහි වැඩුණු බැවින් " **උත්තමඞ්ගරුහා**" යැයි කියනු ලැබේ. **"ඉමෙ ජාතා වයොහරා"** යනු දරුවනි, බලන්න. නර කෙස් පහළ වූ බැවින් ත්‍රිවිධ වයස් (බාල, තරුණ, මහලු) පැහැර ගන්නා හෙයින් මේ කෙස් **"වයොහරා"** නම්. **"පාතු භූතා"** යනු උපන්නේය. **"දෙවදූතා"** හි දේව නම් මරුවාය. ඔහුගේ දූතයා දේවදූත නම්. හිසෙහි නර කෙස් පහළ වූ කල්හි මරුවාගේ ළඟ සිටියාක් මෙන් වෙයි. එම නිසා නර කෙස් මාරයාගේ දූතයන්යැ යි කියනු ලැබේ. දෙවියන් වැනි දූතයන් දේවදූත නම්. මෙසේ සිව්බරණින් සැරසුණු දේවතාවියක අහසෙහි සිට අසවල් දවසෙහි මිය යන්නේයැ යි කී කල්හි ඒ එ සේ ම වෙයි. එ සේ හිසෙහි නරකෙස් පහළ වූ කල්හි එය දේවතාවියකගේ ප්‍රකාශනයක්

හා සමාන වෙයි. එම නිසා නරකෙස් දෙවියන් සමාන දූතයන්යැ යි කියනු ලැබේ. විසුද්ධි දෙවියන්ගේ දූත යන අරුතින් ද දේවදූත නම්. සියලු බෝසත්වරු මහල්ලකු, රෝගියකු, මළ සිරුරක්, පැවිද්දකු යන පෙරනිමිති දක සංවේගය පැමිණ යහනෙන් නික්ම පැවිදි වෙත්. එහෙයින් කීහ.

"ජිණ්ණකඤ්ච දිස්වා දුඛිතං ච ව්‍යාධිතං
මතඤ්ච දිස්වා ගතමායුසඞ්ඛයං
කාසාවවත්ථං පබ්බජිතඤ්ච දිස්වා
තස්මා අහං පබ්බජිතොම්හි රාජාති"

"මහරජ, මම මහල්ලකු ද රෝගයකින් දුකට පත් වූවෙකු ද දක එ සේ ම ආයු ගෙවී ගිය මළ සිරුරක් ද දක කසාවත් හැඳි පැවිද්දකු ද දක පැවිදි වූවෙමි."

මේ අයුරින් නර කෙස් විසුද්ධි දෙවියන්ගේ දූතයන් නිසා දේවදූතයැ යි කියනු ලැබේ. "පබ්බජ්ජාසමයො මමා" හි ගිහිබවින් නික්මුණු අරුතින් "පබ්බජ්ජ" පැවිද්ද යන නම් ලද ශ්‍රමණ ස්වරූපය ගැනීමට මට සුදුසු කාලයයැ යි දක්වේ. ඔහු මෙසේ කීහ. එදින ම රාජ්‍යය අතහැර තාපස පැවිද්දෙන් පැවිදිව මඛාදේව අඹ වනයෙහි ම වෙසෙමින් සුවාසූදහසක් අවුරුදු සිව් බඹ විහරණ වඩා නො පිරිහුණු දැහැනෙහි සිට කලුරිය කොට බඹලොව ඉපිද නැවත එයින් චුතව මිථිලා නුවර ම නිමි නම් රජව ඉපිද පිරිහෙමින් පැවැති තම රාජ වංසය ශක්තිමත් කොට එම අඹ උයනෙහි ම පැවිදි ව බඹ විහරණ වඩා නැවත බඹලොව ගියේ විය.

බුදු රජහු ද මහණෙනි, තථාගතයන් වහන්සේ දන් පමණක් මහබිනික්මන් කළාහු නො වෙති. පෙර ද නික්මුනාහුයැ යි මේ දම් දෙසුම ගෙනහැර දක්වා සිව්සස් වදාළහ. ඇතමෙක් සෝවාන් වූහ. ඇතැමෙක් සකදාගාමි වූහ. ඇතමෙක් අනාගාමී වූහ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මේ දෙපුවත් කියා අනුසන්ධි ගළපා ජාතකය නිමවා වදාළ සේක. එදා පනික්කියා (කරණවැමියා) ආනන්දය. පුත්‍රයා රාහුලය. මඛාදේව රජ මම ම වීමි.

## 1. 1. 10.

# සුඛවිහාරි ජාතකය

"යඤ්ච අඤ්ඤෙ න රක්ඛන්ති" යන මේ ජාතකය බුදු රජහු අනුපිය නගරය ඇසුරු කොට අනුපිය අඹ වනයෙහි වැඩ වසන සේක්, සැප විහරණ ඇති භද්දිය තෙරණුවන් අරබයා වදාළහ. සැප විහරණ ඇති භද්දිය තෙරණුවෝ, ක්ෂත්‍රියයන් සය දෙනාගේ සමාගමයෙහි උපාලි සත් වැනි කොට පැවිදි වූහ. ඔවුනතුරෙන් භද්දිය තෙර, කිම්බිල තෙර, භගු තෙර, උපාලි තෙර යන තෙරවරු රහත් වූහ. අනඳ තෙරණුවෝ සෝවාන් වූහ. අනුරුද්ධ තෙරණුවෝ දිවැස් ඇත්තෙක් වූහ. දෙව්දත් තෙර ධ්‍යාන ලාභියකු විය. මේ සය ක්ෂත්‍රියන්ගේ කථා පුවත අනුපිය නගරය දක්වා ඛණ්ඩහාල ජතකයෙහි පහළ වන්නේය. ආයුෂ්මක් භද්දිය තෙරණුවෝ රජ කරන කල්හි තමා රැකීම සඳහා ආරක්ෂක සංවිධාන යොදා තිබියදීත් බොහෝ රැකවලුන් විසින් තමා රකිනු ලබද්දීත් උඩු මහළෙහි මහා යහනෙහි පෙරළෙමින් සිටියදීත් තමා බියට පත් වූ බව ද දැන් රහත් බවට පැමිණ වන සෙනසුන් ආදියෙහි කොතැනක හැසිරෙන්නේ වුව ද පහ වූ බිය ඇති බව ද සම්මර්ෂණය කරන්නේ අහෝ සැපයි, අහෝ සැපයියැ යි උදන් ඇනූහ. මේ ඇසූ භික්ෂූහු භද්දිය තෙරණුවෝ විරුද්ධ දෙයක් ප්‍රකාශ කරතැ යි බුදුරදුන්ට සැලකළහ. බුදුරදහු මහණෙනි, භද්දිය සුඛවිහාරී වූයේ දැන් පමණක් නො වේ. පෙර ද සුඛවිහාරී වූයේයැ යි වදාළහ. භික්ෂූහු එඅරුත පැහැදිලි කරනු, බුදුරදුන් අයැදියහ. බුදුරදහු භවාන්තරයෙන් වැසී ගිය මෙපුවත ප්‍රකට කළහ.

පෙර බරණැස නුවර බඹදත් රජ රාජ්‍යය කරවන කල්හි බෝසතාණෝ උසස් බමුණු මහසල් කුලයෙහි ඉපිද කාමයන්හි ආදීනව ද පැවිද්දෙහි අනුසස් ද දැක හිමවතට පිවිස තවුස් පැවිද්දෙන් පැවිදිව අට සමවත් ඉපදවීය. ඔහුට පන්සියයක් පමණ තවුස් පිරිවර විය. ඔහු වැසි කාලයෙහි හිමවතින් නික්ම තවුස් සමූහයා පිරිවරාගෙන ගම් නියම්ගම් ආදියෙහි හැසිරෙමින් බරණැසට පැමිණ රජු ඇසුරුකොට රජ උයනෙහි වාසය කළේය. වැසි සාරමස එහි වැස රජු විමසීය. එවිට රජතුමා ස්වාමීනි, දැන් ඔබවහන්සේ මහළුය. හිමවතෙහි විසීමෙන් ප්‍රයෝජනය කුමක් ද ? අතවැස්සන් හිමවතට යවා

ඔබවහන්සේ මෙහි ම වසන්නැ යි අයැදීය. බෝසතාණෝ පන්සියයක් තවුසන් දෙටු අත වැසියාට පවරා යන්න. මොවුන් හිමවතෙහි වසන්න. මම මෙහි ම වසන්නෙමි යි ගුවනින් යවා එහි ම විසීය. ඒ දෙටු අතවැසියා රජ කුලයෙන් පැවිදි වූවෙකි. මහාරාජ්‍යයක් අතහැර කසිණ පිරියම් කොට අට සමවත් ලැබුවකු විය. ඔහු තවුසන් සමග හිමවතෙහි වසන්නේ එක් දවසක් ගුරුතුමන් දකිනු කැමැත්තැතිව තවුසන් අමතා ඔබලා උකටලී නොව මෙහි ම වසන්න. මම ගුරුතුමන් වැඳ ආපසු එන්නෙමි යි ගුරුන් වෙත ගොස් වැඳ පිළිසඳර කථා කොට තණ ඇතිරියක් අතුරා ගුරුන් සමීපයේ ම හොත්තේය.

එසමයෙහි ම රජතුමා තාපසයන් දකිමි යි උයනට ගොස් වැඳ එකත්පසෙක හුන්නේය. අතවැසි තවුසා රජු දැක නො නැගිට හුන් අයුරින් ම වැද හොත්තේ, ඉතා සැපයි. අනේ සැපයියැ යි උදන් ඇනීය. රජතුමා මේ තවුසා මා දැක නො නැගිට්ටේයැ යි නො සතුටුව බෝසතුන්ට කීය. ස්වාමීනි, මේ තවුසා හැකිතාක් කා උදන් අනන්නේ විය යුතුය. උදන් අනමින් සැප විහරණය ම කරන්නේය. මහරජ, මේ තවුසා පෙර ඔබ මෙන් රජකු විය. ඒ ඔහු පෙර ගිහි කල මම රජසිරි විඳිමින් අවිගත් බොහෝ දෙනා විසින් රකිනු ලබන්නේ වුව ද මෙබඳු සැපයක් නො ලැබුවෙමි යි තමාගේ පැවිදි සැපය අරබයා මේ උදන් අනතැ යි කියා බෝසත්හු රජුට ධර්ම කථාවක් කීමට මේ ගාථාව ප්‍රකාශ කළහ.

> "යඤ්ච අඤ්ඤෙ න රක්ඛන්ති යො ච අඤ්ඤෙ න රක්ඛති
> ස වෙ රාජ සුඛං සෙති කාමෙසු අනපෙක්ඛවාති"

> "අතපයෙන් යමකු රක්‍ෂා නො කැරේ ද ? යමෙක් අන්
> බොහෝ දෙනා නො රකිත් ද මහරජ, ඔහු කාමයන්හි
> අනපේක්‍ෂිතව සැප සේ හොවයි."

එහි "යඤ්ච අඤ්ඤෙ න රක්ඛන්ති" යනු යම් පුද්ගලයෙක් අන් බොහෝ පුද්ගලයෝ නො රකිත්. "යො ච අඤ්ඤෙ න රක්ඛති" යනු යමකු අන් බොහෝ අය නො රකී. "ස වෙ රාජ සුඛං සෙති" යනු මහරජ, ඒ දෙවැන්නකු නැති තනි පුද්ගලයා විවේකී වූයේ, කායික

මානසික සැපයෙන් යුක්ත වූයේ, සැප සේ නිදයි. මෙබඳු පුද්ගලයා හොවින්නේ පමණක් නොව සැප සේ යයි. සිටියි. හිඳියි. නිදයි. සියලු ඉරියව්වල දී සැපයට පැමිණියේම වෙයි. "කාමෙසු අනපෙක්ඛවාති" යනු වත්ථු කාම, කිලෙස කාම දෙකෙහි අපේක්ෂා රහිත වූයේ, පහ වූ ඡන්ද රාග ඇත්තෙක්, තෘෂ්ණා නැත්තෙක් වෙත්. පුද්ගලයා සියලු ඉරියව්වල දී සැපසේ වාසය කරයි. රජතුමා දම් දෙසුම අසා සතුටු සිතින් වැඳ සිය වාසස්ථානයට ම ගියේය. අතවැසියා ද ගුරුන් වැඳ හිමවතට ම ගියේය. බෝසත්හු වනාහි එහි ම වෙසෙමින් නො පිරිහුණු දැහැනින් කලුරිය කොට බඹලොව උපන්හ.

බුදු රජහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා කථා දෙපුවත කියා අනුසන්ධි ගළපා ජාතකය නිමවා වදාළ සේක. එකල්හි අතවැසියා නම් භද්දිය තෙරණුවන්ය. ගණ ඇදුරා මම ම වීමි.

## පළමු අපණ්ණක වර්ගයයි.

## 1. 2. 1.

## ලක්ඛණමිග ජාතකය

"හොති සීලවතං අත්ථො" යන මෙය බුදු රජහු රජගහ නුවර ඇසුරු කොට වේළුවනයෙහි වැඩවසන්නේ දෙව්දතුන් අරබයා දේශනා කළහ. දෙව්දතුන්ගේ කථා පුවත දූනුවායන් යෙදීම දක්වා ඛණ්ඩහාල ජාතකයෙහි එන්නේය. ධනපාල ඇතු මෙහෙයවීම දක්වා චුල්ල හංස ජාතකයෙහි වන්නේය. පොළොව ගිලීම දක්වා සොළොස් වන නිපාතයෙහි සමුද්දවාණිජ ජාතකයෙහි වන්නේය.

එක් කලෙක දෙව්දත් පස්‍වු වස්තුන් ඉල්ලා නො ලබන්නේ සංඝයා බේද කොට පන්සියයක් භික්‍ෂූන් රැගෙන ගයා සීසයෙහි වෙසෙයි. ඉක්බිති ඒ භික්‍ෂූන්ගේ නුවණ මුහුකුරා ගියේය. බුදුරදහු ඒ දැන දෑග සව්වන් අමතා සාරිපුත්‍රයෙනි, තොප ඇසුරු කළ පන්සියයක් භික්‍ෂූහු දෙව්දත්ගේ ලබ්ධිය රුචි කොට ඔහු සමග ගියාහුය. දූන් ඔවුන්ගේ නුවණ මුහුකුරා ගියේය. ඔබ බොහෝ භික්‍ෂූන් සමග එහි ගොස් ඔවුන්ට ධර්මය දේශනා කොට ඒ භික්‍ෂූන්ට මඟඵල අවබෝධ කැරවා ඔවුන් රැගෙන එනු මැනව. සව්වෝ ද වදාළ පරිදි එහි ගොස් ඔවුන්ට දම් දෙසා මඟඵලින් ඔවුන් අවබෝධ කැරවා දෙවන දවස්හි අරුණු නැගෙන වේලාවෙහි ඒ භික්‍ෂූන් ද රැගෙන වේළුවනයට ම පැමිණියහ. සැරියුත් තෙරුන් බුදුරදුන් වැඳ සිටිකල්හි භික්‍ෂූහු තෙරුන්ට පසසා බුදුරදුන්ට මෙසේ කීහ. ස්වාමීනි, අප දෙටු සොයුරු දම් සෙනෙවි සැරියුත් තෙරණුවෝ පන්සියයක් භික්‍ෂූන් පිරිවරා පැමිණෙන විට ඉතා හොබණේය. දෙව්දත් වනාහි පිරිහුණු පිරිවර ඇත්තෙක් වීය. මහණෙනි, සැරියුත් ඤාති සමූහයා පිරිවරාගෙන පැමිණෙන විට බැබලෙන්නේ දූන් පමණක් නොවෙයි. පෙරත් බැබලුණේය. දෙව්දත් ද සමූහයාගෙන් පිරිහුණේ දූන් පමණක් නොවෙයි. පෙරත් පිරිහුණේ මය. භික්‍ෂූහු මෙකරුණ හෙළිදරව් කිරීම පිණිස බුදුරදුන් අයැද සිටියහ. බුදුරදහු භවාන්තරයෙන් වැසුණු ඒ කරුණ ප්‍රකට කළහ.

පෙර මගධ රට රජගහනුවර එක් මගධ රජෙක් රාජ්‍යය කළේය.

එකල බෝසත්හු මුව ජාතියෙහි පිළිසිඳ වැඩිවිය පැමිණියේ මුවන් දහසක් පිරිවරාගෙන මහවනයෙහි වෙසෙති. ඔහුට ලක්ඛණ, කාල නමින් පුතුන් දෙදෙනෙක් වූහ. ඔහු මහලු කල දරුවනේ, මම දැන් මහලු වෙමි. තෙපි මේ මුව සමූහය රැකගනිවු යි පුතුන් දෙදෙනාට පන්සියය බැගින් පවරා දුන්නේය.

එතැන් පටන් ඒ දෙදෙනා මුව සමූහය රකිත්. මගධ රට ශස්‍යය සමයෙහි වනයෙහි වසන මුවන්ට උවදුරු වෙයි. මිනිස්සු ගොයම් කන මුවන් මරනු පිණිස තැන් තැන්වල වළවල් හාරත්. උල් සිටුවත්. ගල් උගුල් අටවත්. සොරමල ආදී උගුල් තබත්. බොහෝ මුවෝ විනාශයට පත්වෙති. බෝසත්හු කෘෂිකාර්මික කාලයයැ යි දැන පුතුන් කැඳවා දරුවනි, මේ කෘෂිකාර්මික කාලය යි. බොහෝ මුවෝ විනාශ වෙත්. දැන් අප මහලුය. අපි කෙසේ හෝ එක් තැනක හිඳ ජීවත්වෙමු. තෙපි තොපගේ මුව සමූහය ගෙන වනයෙහි පර්වත පාදයට ගොස් සස් නෙලූ කල ආපසු පැමිණෙවු. ඒ දෙදෙනා ද මැනවැ යි, පියාගේ වදන් අසා පිරිවර සහිත ව නික්මුණහ. මිනිස්සු ද මුවන්ගේ ගමන් මං දනිත්. මේ කාලයෙහි මුවන් පර්වතය නගිති යි, මේ කාලයෙහි බසිති යි දැන තැන්තැන්වල සැඟවී සිට බොහෝ මුවන් විද මරත්. කාල මුවා ද තමාගේ දන්ධ බව (මෝඩ බව) නිසා මේ වේලාවේ යා යුතුය. මේ වේලාවේ නො යා යුතුයැ යි නොදැන මුව රැළ ගෙන පෙරවරුවෙහි ද පස්වරුවෙහි ද සැඳෑ කාලයෙහි ද අළුයම ද ගම් දොරින් යයි. එමඟ පදිංචිකරුවෝ ද සැඟවී සිටියෝ බොහෝ මුවන් මරත්. මෙසේ ඔහු තම දන්ධ බව නිසා බොහෝ මුවන් විනාශයට පමුණුවා ටිකදෙනකු සමග වනයට ගියේය. ලක්ඛණ මුවා වනාහි පණ්ඩිතය. දක්ෂය. උපාය දන්නේය. මේ වෙලාවෙහි යා යුතුය. මේ වේලාවෙහි නො යා යුතුයැ යි දනී. ඔහු ගම්දොරින් ද නො යයි. දවල් කල ද නො යයි. සන්ධ්‍යාවෙහි ද නො යයි. අළුයම ද නො යයි. මුවරැළ පිරිවරාගෙන මැදියම් රැයෙහි ම යයි. එම නිසා එක් මුවකුවත් විනාශ නො කොට වනයට පිවිසියේය. මෙසේ ඔවුහු එහි සිව් මසක් පර්වත පාදයෙහි වැස සස් නෙලා ගත් පසු පව්වෙන් බැස්සාහ. කාල මුවා ආපසු එන්නේ පෙරකී පරිදි සෙසු මුවන් විනාශයට පමුණුවා එකලාව පැමිණියේය. ලක්ඛණ මුවා එක මුවකු ද මරණයට ඉඩ නො තබා පන්සියයක් මුවන් පිරිවරා මව් පියන් වෙත පැමිණියේය. බෝසත්හු එන්නා වූ දෙපුතුන් දැක මුව රැළ සමග මන්ත්‍රණය කරන්නේ මේ ගාථාව මතු කළහ.

**"හොති සීලවතං අත්‍ථො පටිසන්‍ථාර වුත්තිනං**
**ලක්‍ඛණං පස්‍ස ආයන්‍තං ඤාතිසංඝපුරක්‍ඛතං**
**අථ පස්‍සසි මං කාළං සුවිහීනං ච ඤාතිහීති"**

"සිල්වත් වූ සුහද පැවතුම් ඇත්තවුන්ට අභිවෘද්ධිය වේ. ඤාති සමූහයා විසින් පිරිවරන ලදුව පැමිණෙන ලක්ඛණ දෙස බලව. අනතුරුව වෙසෙසින් නෑයන්ගෙන් පිරිහුණු කාල දෙස බලව."

එහි "**සීලවතං**" යනු සැප ස්වභාවය ඇත්තේ බැවින්, සිල්වතුන්ටය. සදාචාර සම්පන්න වූවන්ටය. "**අත්‍ථො**" යනු වැඩීමය. "**පටිසන්‍ථාර වුත්තිනං**" ධර්ම ආමිස පිලිසඳර මොවුන්ගේ පැවැත්මයි. පිළිසඳර පැවැත්ම ඇත්තවුන්ට මෙහි ද පවින් වළක්වන අවවාද අනුසාසනා කිරීම් වශයෙන් ධම්ම පටිසන්ථාරය ද සිවුපස ලබාදීම, ගිලන් උවටන, දැහැමි .රැකවරණය වශයෙන් ආමිස පටිසන්ථාරය ද දත යුතු. මෙය කියන ලදී. මේ දෙවැදෑරුම් පිලිසඳරෙහි යෙදුණු සදාචාර සම්පන්න නැණවතුන් දියුණුව වෙයි යනුයි. දැන් ඒ දියුණුව පෙන්වීමට පුත්‍රයා සහ මව අමතා කියන්නාක් මෙන් "**ලක්‍ඛණං පස්‍ස**" ආදිය කීහ. මේ මෙහි ලුහුඬු අදහසයි. සිරිත්වලින් හා සුහද බැවින් යුත් තම පුත්‍රයා එක් මුවකුවත් නො නසා ඤාති සමූහයා පිරිවරා පෙරටු කොට එන අයුරු බලව. ඒ සිරිත්වලින් හා සුහද බැවින් තොර වූ නුවණ අඩු "**අථ පස්‍සසි මං කාළං**" මේ කාල එක ඤාතියකුවත් ඉතිරි නො කොට ඤාතීන්ගෙන් පිරිහී එකලා ව එන අයුරු බලන්න. මෙසේ සිය පුත්‍රයා සතුටින් පිළිගෙන බෝසතාණෝ ආයු ඇතිතාක් සිට කම් වූ පරිදි මිය පරලොව ගියහ.

බුදු රජහු මහණෙනි, සැරියුත් තෙරණුවෝ ඤාතීන් පිරිවරා බැබළුණෝ දැන් පමණක් නොවෙති. පෙරත් බැබළුණෝ ය. දෙව්දත් සිය පිරිවරින් පිරිහුණේ දැන් පමණක් නොවේ. පෙරත් පිරිහුණේමයැයි මෙම දම් දෙසුම දක්වා කථා දෙපුවත් ගළපා අනුසන්ධි ගළපා ජාතකය නිමවා වදාළ සේක. එකල්හි කාල, දේවදත්ත විය. ඔහුගේ පිරිස දේවදත්ත පිරිසම වූහ. ලක්ඛණ, සාරිපුත්‍ර විය. ඔහුගේ පිරිස බුදු පිරිසය. මව රාහුල මාතාව වූවාය. පියා වනාහි මම ම වීමි.

## 1. 2. 2.

# නිග්‍රෝධමිග ජාතකය

"නිග්‍රොධමෙව සෙවෙය්‍යා" යන මේ ජාතකය බුදු රජහු දෙව්රම් වෙහෙර වැඩවසමින් කුමාර කස්සප තෙරණුවන්ගේ මව අරබයා දේශනා කළහ. ඕ වනාහි බොහෝ වස්තු ඇති සිටුගේ දුවක් වූවාය. උත්සන්න වූ කුසල් මුල් ඇත්තී, මඩින ලද සංස්කාර ඇත්තී, අන්තිම අත්බවෙහි සිටින්නී වූවාය. කුළයෙහි (ගෙයක මුදුනෙහි) පහන මෙන් ඇගේ රහත් වීමේ හේතු සම්පත් දැල්වෙයි. තමා ගැන දන්නා කාලයේ සිට ගිහිගෙයි නො ඇලුණාය. පැවිදි වනු කැමැති වී ඕ මව් පියන් අමතා මෑණියනි, පියාණෙනි, ගිහිගෙයි සිත නො ඇලෙයි. නෛර්යානික බුදුසසුනෙහි පැවිදිවනු කැමැත්තෙමි. මා පැවිද කැරවනු මැනවැ යි කීවාය. දියණියනි, කුමක් කියන්නෙහි ද ? මේ කුලය බොහෝ වස්තු ඇත්තකි. ඔබ අපගේ එක ම දියණියයි. පැවිදිවීමට ඉඩ නො ලැබේ. ඕ නැවත නැවත ඇවිටිලි කළ ද මව්පියන් වෙතින් පැවිද්දට අවසර නො ලබන්නී මෙසේ සිතුවාය. එසේ නම් පතිකුලයට ගිය කල්හි සැමියාගේ සිත් ගෙන පැවිදි වන්නෙමි යි, ඒ සුදුසු වියට පත් කල්හි පතිකුලයට ගොස් හිමියා දෙවියකු කොට සලකා සිල්වත් ව කලණදම් ඇත්තීව ගිහිගෙයි විසුවාය. ඔවුන්ගේ සහවාසය නිසා ඇගේ කුසෙහි දරු ගැබක් පිහිටියේය. ඕ ගැබ පිහිටි බව නො දන්නීය. මේ අතර එනගරයෙහි නැකැත් කෙළියක් ප්‍රසිද්ධියට පත් කළහ. සියලු නගර වැස්සෝ නැකත් ක්‍රීඩා කළහ. නගරය දෙව් පුරයක් ලෙස අලංකාරව පිළියෙල කරන ලද්දෙය. ඕ මෙවැනි අති උදාර නැකැත් කෙළියක් පැවැත්වෙද්දීත් තම සිරුරෙහි සුවඳ විලවුන් නො ගල්වයි. සිරුර අලංකාර නො කරයි. සාමාන්‍යය පියවි ලෙසින් ම හැසිරේ.

ඇගේ හිමියා සොඳුර, මෙම පුරය ම නැකත් කෙළියෙහි බැඳුණේය. ඔබ ඔබගේ සිරුර කුමක් නිසා නො සරසන්නී ද ? හිමියනි, මාගේ සිරුර දෙතිස් කුණපයකින් පිරුණේය. මේ සිරුර සැරසීමෙන් ප්‍රයෝජනය කුමක් ද ? මේ කය වනාහි දේව නිර්මාණයක් නො වේ. බ්‍රහ්ම නිර්මාණයක් ද නො වේ. රනින්,

මිණියෙන්, සඳුනෙන් කළේ ද නො වේ. හෙළ පියුම්, රත් පියුම් හෝ උපුල් ගැබක උපන්නේ ද නො වේ. ඇතුළත අමා ඔසුයෙන් පිරුණේ ද නො වේ. හුදෙක් කසළෙහි උපන්නකි. මව්පියන් නිසා හට ගත්තකි. අනිස බව, ඉලීම, පිරිමැදීම, බිඳෙන බව, විසිරෙන බව ස්වභාව කොට ඇත්තකි. සොහොන් පොළොව වඩන්නකි. තණ්හාවෙන් දැඩිව අල්ලා ගත්තකි. ශෝකාදියට හේතුවකි. වැලපීම් ආදියට හේතුවකි. සියලු රෝගයන්ට හේතුවකි. සියලු ක්‍රියාවන් පිළිගන්නකි. ඇතුළත කුනු පිටතට නිතර වැගිරෙන සුලුය. පණු කැලට ගෙයකි. සොහොන පිහිට කොට ඇත්තකි. මරණය කෙළවර කොට ඇත්තකි. සියලු ලෝවැස්සන්ගේ ඇස් ඉදිරියෙහි ම සිටිය ද,

"ඇට හා නහරින් බැඳුනේය. හම සහිත මසින් ගල්වන ලද්දේය. සිවියෙන් ශරීරය වැසුණේය. එම නිසා යථා තත්ත්වය නො පෙනේ.

බඩවැලින් පිරුණේය. උදරයෙන් පිරුණේය. අක්මාවෙන් ද හෘදය මාංශයෙන් ද පපුගඩුවෙන් ද වකුගඩුවෙන් ද බඩදිවින් ද,

සොටුයෙන් ද කෙලින් ද දහඩියෙන් ද වසා තෙලින් ද ලෙයින් ද සඳ මිදුලෙන් ද පිතෙන් ද තෙලින් ද පිරුණේය.

තව ද සැමදා නව දොරකින් අපවිත්‍ර දෑ වැගිරෙයි. ඇස්වලින් කබ ද කනින් කන් කැදුරු ද,

නාසයෙන් සොටු ද කටින් වමනය ද පිත ද සෙම ද සමහරවිට සිරුරින් දහඩිය බිඳු ද වැගිරෙයි.

ඔහුගේ හිස් කුහරය මොළයෙන් පිරුණේය. අවිද්‍යාවෙහි උදම් වූ බාලයා, ඒ සිරුර සුබ වශයෙන් සිතයි.

විස සහිත ගසක් සමාන වූ මේ සිරුර නිමක් නැති ආදීනව ඇත්තේය. සියලු රෝගයන්ට නිවෙස් වූ මේ සිරුර හුදු දුක් ගොඩකි.

ඉදින්, මේ සිරුරෙහි ඇතුල් පැත්ත පිටතින් තිබුණේ නම් දඬුකඩක් ගෙන කපුටන් හා බල්ලන් එළවීමට සිදුවන්නේය.

මේ සිරුර දුගඳය. අපිරිසිදුය. පිළිකුල්ය. කසල ගොඩක් වැනිය. නුවණැත්තන් විසින් නින්දිත වූ මේ කය බාලයන්ට සතුට ගෙන දේ."

හිමියනි, මේ සිරුර සරසා කුමක් කරන්නෙහි ද ? මේ කය අලංකාර කිරීම අසූචි පිරුණු බඳුනක් පිටතින් කැටයම් කිරීමක් නො වන්නේ ද ? සිටු පුත් ඇගේ වදන් අසා සොඳුර, මේ සිරුරෙහි මෙබඳු ආදීනව දක දකත් මක්නිසා ඔබ පැවිදි නො වන්නෙහි ද ? හිමියනි, මට පැවිදිවීමට ලැබෙන්නේ නම් අද ම පැවිදි වන්නෙමි. සිටු පුත්, මැනවි. මම ඔබ පැවිදි කරවන්නෙමි යි කියා මහදන් පවත්වා මහත් පිරිවරින් මෙහෙණිවරට ගෙන පමුණුවා පැවිදි කරනු ලබන්නී, දෙව්දත් තෙරුන්ට පක්ෂපාතී භික්ෂුණීන් වෙත පැවිදි කරවීය. ඕ තුමූ පැවිද්ද ලැබ සිතැඟි ඉටුවීමෙන් සතුටු වූවාය. එහෙත් ඇයගේ දරු ගැබ මුහුකුරා යත් ම ඉඳුරන්ගේ වෙනස් බවත් අත්පා, පිට මහත් බවත් උදර පටලයෙහි මහත් බවත් දුටු මෙහෙණිවරු ඇගෙන් විමසූහ. නැගණිය, ඔබ ගැබිනියක මෙන් පෙනේ. මේ කිමෙක් ද ? සොහොයුරියනි, මම මේ කරුණක් නො දනිමි. මගේ සීලය පිරිපුන්ය.

මෙහෙණියෝ ඇය දෙව්දත් තෙරුන් වෙත ගෙන ගොස් විචාළහ. ස්වාමීනි, මේ කුල දුව ඉතා අපහසුවෙන් හිමියාගෙන් අවසර ලබා ගෙන පැවිදි වූවාය. දැන් මැයගේ කුස දරු ගැබක් ඇති බව පෙනීයයි. දරු ගැබ ගිහි කල හෝ පැවිදි කල පිහිටි බවක් අපි නො දනිමු. දැන් කුමක් කරමු ද ? දෙව්දත් තෙරණුවෝ තමා තුළ මුදු බවක් නැති බැවින් ද ඉවසීම, මෙත්තාව, කරුණාව, අනුකම්පාව ආදී

ගුණ නැති බැවින් ද මෙසේ සිතීය. දේවදත්ත පාක්ෂික භික්ෂුණීහු දරුගැබ් දරති. දෙව්දත් තෙරණුවෝ ද ඒ පිළිබඳ ව මැදහත්ව සිටිති. මට නින්දාවක් වන්නේයැ යි සිතා විමසීමක් නො කොට මවිසින් මැය උපැවිදි කළ යුතුයැ යි සිතා ගල්වටක් පෙරලන්නාක් මෙන් ඉදිරියට පැන යවු. මැය උපැවිදි කරවුයැ යි කීහ. ඕ ද ඔහු වචනය අසා වැඳ මෙහෙණවරට ගියාය.

ඉක්බිති, ඕ තරුණ මෙහෙණියන් අමතා සොහොයුරියනි, දෙව්දත් තෙරණුවෝ බුදු නො වෙති. මගේ පැවිද්ද ඔහු සතු නො වේ. ලෝක නායක සම්මා සම්බුදු හිමියන් ළඟ මම පැවිදි වූවෙමි. එය ද මා ලැබුවේ ඉතා දුක සේ ය. පැවිදි බව මා කෙරෙන් අතුරුදන් නො කරන්න. මා සමග එන්න. දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන බුදුරදුන් වෙත මා පමුණුවන්නැ යි කීවාය. මෙහෙණියෝ ඇය රැගෙන රජගහ නුවර සිට පන්සාළිස් යොදුන් මග ගෙවා පිළිවෙලින් දෙව්රම් වෙහෙරට පැමිණ බුදුරදුන් වැඳ එපුවත් සැලකළහ. බුදුරදහු මෙසේ සිතූහ. මැගේ දරු ගැබ ගිහි කල පිහිටි බව සත්‍යය වුව ද මහණ ගොයුම්හු දෙව්දතුන් විසින් බැහැර කරන ලද මෙහෙණක තම සසුනට ඇතුළත් කොට ඇතැ යි කීමට තීර්තකාදීන්ට ඉඩක් ලැබෙන්නේය. එම නිසා මේ කථාව බන්ධනය කිරීමට රජුන් සහිත පිරිස මැද මෙම චෝදනාව විසඳන්නට සුදුසුයැ යි සිතා දෙවන දවස් පසේනදී කොසල් රජතුමා ද අනේපිඬු මහ සිටු ද සුලු අනේපිඬු ද විසාඛා උවැසිය ද වෙනත් ප්‍රසිද්ධ මහා පවුල් ද කැඳවා සවස් භාගයෙහි සිව්පිරිස රැස් වූ කල්හි උපාලි තෙරුන් අමතා යව. සිව්පිරිස් මැද මේ තරුණ භික්ෂුණියගේ අධිකරණය සමථ කරව යි කීහ. උපාලි තෙරහු ද මැනව ස්වාමීනි යි සිව්පිරිස් මැදට වැඩමවා තමා හට පැමිණි අසුනෙහි වැඩහිඳ රජු ඉදිරියෙහි විසාඛා උවැසිය කැඳවා මේ අධිකරණය ඉදිරිපත් කළහ. යන්න විසාඛාවෙනි. මේ දහර මෙහෙණ අසවල් මස අසවල් දින පැවිදි වූවායැ යි තත්වූ පරිදි දැන මැයගේ දරුගැබ එදිනට පෙර හෝ පසුව පිහිටියේදැ යි දැන ගනුව යි කීහ. උපාසිකාව මැනවැ යි පිළිගෙන තිරයක් වටකොට තිරය ඇතුළත දහර මෙහෙණගේ අත්පා, නැබ, උදරය කෙළවර කොට සියලු අවයව බලා මාස දින ගණන් කොට ගිහි කල ගැබ පිහිටි බව තත්වූ පරිදි දැන තෙරුන් වෙත ගොස් ඒ බව සැලකළාය. තෙරණුවෝ සිව් පිරිස් මැද මෙහෙණ පිරිසුදු බවට පත් කළහ. ශීලයෙන් පිරිසුදු බව ලැබ බුදුරදුන් සහ මහසඟන වැඳ භික්ෂුණීන්

සමග මෙහෙණවරට ම ගියාය. ඇය ගැබ මුහුකුරා ගිය කල පියුමතුරා බුදුන් කල ප්‍රාර්ථනා කරන ලද මහානුභාව ඇති පුතකු බිහි කළාය.

ඉක්බිති, එක් දවසක් රජු මෙහෙණවර සමීපයෙන් යන්නේ ළදරු හඬක් අසා ඇමැතියන්ගෙන් විමසීය. ඇමතියෝ එම කරුණ දන දේවයිනි, ඒ තරුණ මෙහෙණ පුතකු බිහි කළාය. මේ ඔහුගේ ශබ්දයයැ යි කීවාහුය. සගයිනි, මෙහෙණවරුන්ට දරුවන් ඇති දැඩි කිරීම බාධා සහිතය. අපි ඔහු පෝෂණය කරන්නෙමු. රජ ඒ කුමරා නළඟනන්ට දෙවා රජ කුමර පෙරහරින් පෝෂණය කරවීය. නම් තබන දිනයෙහි ඔහුට කස්සප යි නමක් තැබූහ. මෙසේ දරුවා කුමර පෙරහරින් වැඩුණු හෙයින් පසු කල කුමාර කස්සප නමින් හැඳින්වූහ. කුමරා සත් අවුරුදු කල බුදුන් ළඟ පැවිදි වී පිරිපුන් වස් ඇත්තේ උපසපන් ව කල්යත් ම ධර්ම කථිකයන් අතුරින් කථිකයකු විය. බුදුරදහු ද මහණෙනි, මේ කස්සප මාගේ ශ්‍රාවක විචිත්‍ර ධර්ම කථික භික්ෂූන් අතුරින් යමෙක් අග්‍රවේ ද ඒ කුමාර කස්සප වෙත්යැ යි අගතන්හි තැබූහ. ඔහු ධම්මික සූත්‍රය අසා රහත් බවට පැමිණියේය. කස්සප තෙරණුවන්ගේ මව් මෙහෙණියෝ ද විදසුන් වඩා අග්‍රඵලයට පත්වූවාය. බුදු සසුනෙහි අහස් මැද පුන්සඳ මෙන් ප්‍රසිද්ධ වූහ.

එක් දවසක් බුදුරදහු පිඬු පිණිස වැඩ පසු බත්හි භික්ෂූන්ට ඔවදන් දී ගඳකිළියට වැඩියහ. භික්ෂූහු ද ඔවදන් ගෙන තම තමන්ගේ දිවා රාත්‍රී වාසස්ථානවල දහවල් කාලය ගතකොට සවස් භාගයෙහි දම් සබාවෙහි රැස්ව ඇවැත්නි, දෙව්දත් තමා බුදු නො වන බැවින් ද ක්ෂාන්තිය, මෛත්‍රීය ආදී ගුණ නැති බැවින් ද කුමර කසුප් තෙරුන් හා මව් තෙරණිය ඇසිල්ලකින් නසන ලද්දෝය. සම්බුදුරදහු වනාහි තමන්වහන්සේ ධර්මරාජ වන බැවින් ද ක්ෂාන්ති, මෛත්‍රී, අනුකම්පා ආදී ගුණ සම්පත්තියෙන් පිරිපුන් බැවින් ද ඒ දෙදෙනාට ම පිහිට වූහ. මෙසේ බුදුගුණ වණමින් හුන්නාහුය.

බුදුරදහු සම්බුදු සිරියෙන් දම් සබයට වැඩමවා පනවන ලද අසුනෙහි වැඩහිඳ මහණෙනි, දැන් ඔබලා කවර කථාවකින් හුන්නාහුදැ යි විචාලහ. ස්වාමීනි, අපි බුදු රදුන්ගේ ම ගුණ කථාවෙන් හුන්නෙමු යි සියලු පුවත් සැලකළහ. මහණෙනි, බුදුරදහු මේ දෙදෙනාට

ආධාරක වූයේ, පිහිට වූයේ දූන් පමණක් නො වෙත්. පෙරදී ද පිහිටවූහ යි කීහ. භික්ෂූහු මෙම පුවත හෙළිදරවු කරනු සඳහා අයැද සිටියහ. බුදුරදහු භවාන්තරයෙන් වැසීගිය පුවත හෙළිකළහ.

ඉකුත් දවස බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරවන කල්හි බෝසතාණෝ මුව යෝනියෙහි පිළිසිඳ ගත්හ. හේ මව් කුසින් නික්මෙන කල්හි ම රන්වන් විය. ඔහුගේ ඇස් මිණිකැට මෙන් විය. අං යුවල රිදීවන් විය. මුහුණ රත්පළස් හුය සමානය. අත්පා කෙළවර දක්වා ලාකඩ පිරියම් කළාක් මෙන් විය. වලිගය සෙමර මුවකුගේ මෙන් විය. ඔහුගේ සිරුර අස් පොව්වකුගේ පමණ මහත් විය. හේ පන්සියයක් මුවන් පිරිවරාගෙන වනයෙහි වාසය කළේය. නමින් නිග්‍රෝධ මිගරාජ විය. ඔහුට නුදුරු ව පන්සියක් මුවන් පිරිවරකොට ඇති සාඛ නම් තවත් මුවෙක් වෙසෙයි. ඔහු ද රන්වන් විය. එසමයෙහි බරණැස් රජු මුවන් මැරීමේ නිරත වූයේ වෙයි. මස් නැතිව ආහාර අනුභව නො කරයි. ජනතාවගේ රැකීරක්ෂා කටයුතු සිඳ දමා ගම්, නියම්ගම්, දනව් •වැසියන් රැස්කරවා දිනපතා මුව දඩයමේ යයි. ජනතාව මෙසේ සිතූහ. මේ රජ අපගේ ජීවන කටයුතු සිඳ දමයි. අපි උයන තුළ මුවගාලක් තනා එහි කෑ යුතු දේ වපුරා ජලය සපයා බොහෝ මුවන් එහි පිවිස්වා දොරක් යොදා රජුට පවරා දෙමු යි ඔවුහු සියල්ලෝ උයනෙහි මුවන්ට කෑ හැකි තණ වවා ජලය සපයා දොරක් යොදා මුගුරු ආදිය අතැතිව වනයට පිවිස මුවන් සොයමින් මැද පෙදෙසහි සිටින මුවන් අල්ලා ගනිමු යි යොදුනක් පමණ තැන් වටකොට මුවන් එක්තැන් කරමින් නිග්‍රෝධමිග, සාඛමිග දෙදෙනාගේ නිවාස ස්ථාන මැදිකොට පිරිකෙව් කළහ. ඉක්බිති ඔවුහු මුව සමූහය දූක ගස් අකුල් ආදියට ද පොළොවට ද මුගුරු ආදියෙන් ගසමින් මුවරැල සැඟවී සිටි තැනින් බැහැරට ගෙන කඩු, දුනු, අඩයටි ආදී අයුධ ඔසවා ඝෝෂා කරමින් මුවරැල උයනට ඇතුළුකොට දොර වසා රජු වෙත ගොස් දේවයිනි, ඔබ නිබඳ ව මුව දඩයමේ යන්නේ අපගේ කාර්යයන් නසන්නහුය. අප විසින් වනයෙන් මුවන් ගෙනවුත් උයනෙහි පුරවන ලදී. මෙතැන් පටන් ඔවුන්ගේ මස් කනු මැනවැ යි රජුට දන්වා ගියහ.

රජතුමා ඔවුන්ගේ කථාව අසා උයනට ගොස් ඔවුන් බලන්නේ රන්වන් මුවන් දෙදෙනකු දූක ඔවුන්ට අභය දානය දුන්නේය.

එතැන්පටන් ඔහු, තෙමේ ම ගොස් මුවකු විද මරා ගෙන එයි. සමහර විට ඔහුගේ අරක්කැමියා ගොස් මුවකු මරාගෙන එයි. මුවෝ දුන්න දැක මරණ බියෙන් තැතිගෙන පළායත්. සමහර මුවෝ දෙතුන් වරක් ඊපහර ලැබ ක්ලාන්ත වෙත්. ගිලන් වෙත්. මරණයට ද පැමිණෙත්. මුවෝ මෙකරුණ බෝසතුන්ට සැළකළහ. ඔහු සංඛ මුවා කැඳවා යහළුව, බොහෝ මුවෝ නැසෙත්. ඒකාන්තයෙන් අප මැරිය යුතු වූ විට මෙතැන් පටන් ඊයෙන් මුවන්ට නො විදිත්වා. වධක ස්ථානයෙහි මුවන්ට වාරය පැමිණේවා. වාරය පැමිණි මුවා දංගෙඩියට ගොස් හිස තබා වැදහොවා. මෙසේ ඇති කල මුවන්ට තුවාල සිදු නො වේ. සංඛ මුවා මැනවැ යි පිළිගනී. එතැන් පටන් වාරය පැමිණි මුවා දංගෙඩියෙහි ගෙල තබා හොවයි. අරක්කැමියා ඒ මුවා ම මරා ගෙනයයි.

එක් දිනක් සංඛ මුවාගේ රැලෙහි ගැබිණි මුව දෙනකට වාරය පැමිණියේය. ඈය සංඛ මුවා වෙත ගොස් හිමියනි, මම ගැබිනියක්මි. මා දරුවා වදා දෙදෙනාට ම වාරය අනුව යා හැකිය. එම නිසා මගේ වාරය ඉක්මවනු මැනවැ යි කීවාය. තිගේ වාරය අනිකකු හට පවරන්න නො හැකිය. තිගේ වාරය තීම ගනුව, යව යි කීවේය. ඈය ඔහු වෙතින් පිටිවහලක් නො ලබන්නී, බෝසතුන් වෙත එළඹ ඒ බව කීවාය. බෝසත් මුවා ඇගේ වචනය අසා එ සේ වේවා තී යව. තිගේ වාරය ඉක්මවන්නෙමි යි තමා ම ගොස් දංගෙඩියෙහි හිස තබා හෙවීය. අරක්කැමියා මුව රජු දැක අභයදානය ලත් මුව රජු මෙසේ දංගෙඩියට හිස තබා හෙවින්නේ මන්දැ යි යුහුව ගොස් රජතුමාට සැලකැර සිටියේය. රජතුමා ද එකෙණෙහි ම රියට නැගී මහත් පිරිවර සහිත ව අවුත් බෝසතුන් දැක යහළු මුව රජ, මා ඔබට ජීවිතදානය කළේ නො වේ ද ? මෙහි මෙසේ හොවින්නේ මක්නිසා ද ? මහ රජ, ගැබිනි දෙනක් අවුත් ඇගේ වාරය අනිකකුට පවරන ලෙස ඉල්ලා සිටියාය. එහෙත් කෙනකුගේ මරණ දුක අන් අයකු මත දැමීම මට කළ නො හැකිය. ඒ නිසා මම මගේ දිවිය ඇයට දී ඈ සතු මරණය ගෙන මෙහි හොවිමි. මහ රජ, මේ පිළිබඳ වෙන සැකයක් ඇතිකැර ගනු නො මැනවි. එවිට රජතුමා ස්වාමීනි, රන්වන් මුව රජතුමනි, මම ඔබ වැනි ක්ෂාන්තිය, මෛත්‍රිය, අනුකම්පාව ආදී ගුණවලින් යුත් අයකු මිනිසුන් අතර ද නො දක්නා වෙයි. මෙකරුණින් ඔබ ගැන පැහැදුනෙමි. නැඟිටිනු මැනවි. ඔබගේ ද ඇයගේ ද ජීවිත දෙමි. දේවයිනි, අප දෙදෙනා දිවි ලදුවන්

උයනෙහි අනෙක් මුවෝ කුමක් කරන්නෝ ද ? යහළුව, අනෙක් මුවන්ට ද අභය දෙමි. මහ රජ මෙසේ උයනෙහි මුවෝ අභය ලබන්නාහුය. සෙස්සන් කුමක් කරන්නාහු ද ? ඔවුන්ට ද අභය දෙමි. මෙසේ මුවෝ පමණක් ලබත්වා. වෙනත් සිව්පාවෝ කුමක් කරන්නෝ ද ? ස්වාමීනි, ඔවුන්ට ද අභය දෙමි. මහ රජ, සිව්පාවෝ මෙසේ අභය ලබත්වා. පක්ෂි සමූහයා කුමක් කරන්නෝ ද ? යහළුව, ඔවුන්ට ද අභය දෙමි. මහ රජ පක්ෂි සමූහයා අභය ලබත්වා. ජලයෙහි වසන මත්ස්‍යයෝ කුමක් කරන්නෝ ද ? ඔවුන්ට ද අභය දෙමි. මෙසේ බෝසත්හු රජුගෙන් සියලු සතුන්ට අභය ඉල්ලා නැගිට රජු පන්සිල්හි පිහිටුවා මහ රජ, ධර්මයෙහි හැසිරෙන්න. මව්පියන් කෙරෙහිත් දූපුතුන් කෙරෙහිත් බමුණු ගැහැවියන් කෙරෙහිත් ගම්, නියම්ගම්, දනව් වැසියන් කෙරෙහිත් දැහැමින් හා සෙමෙන් හැසිරෙමින් ශරීරය බිඳී යාමෙන් මරණය මතු සුගතිය නම් වූ දෙව්ලොව යන්නෙහියැ යි රජතුමාට බුදුරදුන් දෙසන අයුරින් දම් දෙසා දින කීපයක් උයනෙහි වැස රජුට ඔවදන් දී මුවරැල පිරිවරාගෙන වනයට පිවිසියේය. ඒ මුවදෙන ද මල් කිනිත්තක් බඳු පුතකු බිහිකළාය. ඔහු සෙල්ලම් කරමින් සංඛ මුවාගේ ළඟට යයි. මව් මුව දෙන සංඛ මුවා වෙත යන ඔහු දැක පුත, මෙතැන් සිට ඔහු ළඟට නො යනු. නිග්‍රෝධ මුව රජු වෙත යන්නැ යි ඔවදන් දෙන්නී, මේ ගාථාව කීවාය.

**"නිග්‍රොධමෙව සෙවෙය්‍ය න සාඛමුපසංවසෙ,**
**නිග්‍රොධස්මිං මතං සෙය්‍යො යඤ්චෙ සාඛස්මිං ජීවිතන්ති"**

"නිග්‍රෝධ මුව රජුව ඇසුරු කරන්නේය. සංඛ මුවා සමග නොවසන්නේය. සාඛ මුවා සමග ජීවත් වීමට වඩා නිග්‍රෝධ ළඟ මරණය උතුම්ය."

මෙහි **"නිග්‍රොධමෙව සෙවෙයයි"** යනු පුත, ඔබ හෝ අනිකකු හෝ තමහට වැඩ කැමැත්තේ නිග්‍රෝධ මුව රජු ම ඇසුරු කරන්නේය, භජනය කරන්නේය, ඔහු වෙත එලඹෙන්නේය, **"න සාඛමුපසංවසෙ"** යනු සංඛ මුවා ළඟ නො වසන්නේය, එළඹ ඇසුරු නො කරන්නේය, මොහු නිසා ජීවත් නො වන්නේය, **"නිග්‍රොධස්මිං මතං සෙය්‍යො"** යනු නිග්‍රෝධ මුව රජුගේ පාමුල මරණය ද වටිනේය, උතුම් වන්නේය, **"යඤ්චෙ සංඛස්මිං ජීවිතන්ත"** යනු යමකු

ඒ සංඛ මුවා සමග ජීවත් වෙයි ද, එය උතුම් නො වන්නේය, නො වටිනේය, යන අර්ථයයි.

එතැන් පටන් ජීවිත දානය ලැබූ මුවෝ මිනිසුන්ගේ ශස්‍යය කා දමත්. ඔවුන් රජුගෙන් ජීවිත දානය ලැබූ නිසා පහර දෙන්න හෝ පළවා හරින්න සමත් නො වෙත්. මිනිස්සු රජ මිදුලෙහි රැස්ව එපුවත් රජුට සැල කළහ. රජතුමා, නිග්‍රෝධ රජු කෙරෙහි පැහැදුණු මවිසින් වරයක් දෙන ලද්දේය. රාජ්‍යය අත්හැරිය ද එම ප්‍රතිඥාව නො කඩමි. තොපි යව්. මගේ විජිතයෙහි කිසිවකුගෙන් මුවන්ට පහර දීමක් නොලැබෙයි.

නිග්‍රෝධ මුවරජ ඒ පුවත අසා මුවරැල රැස් කරවා මින්මතු අන්සතු ශස්‍යය කෑමක් නොලබනුයැ යි මුවන් වළකා මිනිසුන්ට එපවත් දැන්වීය. මෙතැන් සිට ගොවියෝ ගොයම් රැකීම පිණිස වැට නො බැඳිත්. කෙත වටකොට කොළ සලකුණු බඳිත්. කෙත්වල කොළ බැඳීමේ සංඥාව ඇති විය. එවක්පටන් පණ්ණ සංඥාව (කොළ බැඳ කරනු ලබන සංඥාව) ඉක්මවන එක මුවකු හෝ නැත. මේ ඔවුන්ට බෝසතුන්ගෙන් ලැබුණු උපදේශයයි. මෙසේ බෝසත්හු මුවරැලට අවවාදකොට ආයු කෙළවර මුව සමූහයා සමග කම් වූ පරිදි මිය පරලොව ගියහ. රජතුමා ද බෝසතුන්ගේ ඔවදන්හි පිහිටා පින්කම් කොට කම් වූ පරිදි මිය පරලොව ගියේය.

බුදුරදහු මහණෙනි, මා තෙරණියටත් කුමාර කාශ්‍යපටත් පිළිසරණ වූයේ දැන් පමණක් නො වේ. පෙර ද පිළිසරණ වූවෙමි යි මේ දම් දෙසුම ගෙන හැර දක්වා සිව්සස් දෙසුම උඩුකුරු කැර කථා දෙපුවත් කියා අනුසන්ධි ගළපා ජාතකය නිමවූහ. එකල සාඛ මුවා දෙව්දත් විය. ඔහුගේ පිරිස ද දෙව්දත් පිරිසමය. මුව දෙන තෙරණිය වූවාය. පුතු කුමාර කාශ්‍යප විය. රජතුමා ආනන්ද විය. නිග්‍රෝධ මුව රජු මම ම වීමි.

1. 2. 3.

## කණ්ඩින ජාතකය

"ධිරත්ථු කණ්ඩිනං සල්ලං" යන මේ ජාතකය බුදුරදහු දෙව්රම් වෙහෙර වෙසෙමින් පෙර බිරිඳගේ පෙළඹවීම අරබයා මේ ජාතකය දේශනා කළහ. ඒ පුවත අටවන නිපාතයේ ඉන්ද්‍රිය ජාතකයෙහි වන්නේය. බුදුරදහු ඒ භික්ෂුවට මෙසේ වදාළහ. මහණ, ඔබ පෙරත් මේ ස්ත්‍රිය නිසා මරණයට පත්ව ගිනිදැල් රහිත ගිනි අඟුරු ගොඩක පැසුණෙහිය. භික්ෂූහු එම අර්ථය හෙළිදරවු කරනු පිණිස බුදුරදුන් අයැද සිටියහ. බුදුරදහු භාවාන්තරයෙන් වැසී ගිය එම පුවත ප්‍රකට කළහ.

මින්පසුව භික්ෂූන්ගේ ආයාචනය ද භවාන්තරයෙන් වැසීගිය බව ද නො කියා අතීත කථාව ගෙනහැර දක්වූහ, යන මෙපමණක් ම කියමු. මෙපමණක් කී කල්හි ද ආයාචනය වලාගැබකින් සඳ ගෙනහැර දක්වීමේ උපමාවෙන් භවාන්තරයෙන් පිළසන් වූ බව යන සියල්ල පෙර කී පරිදි ම යොදා දත යුතුය.

පෙර මගධ රට රජගහ නුවර මගධ රජ රාජ්‍යය කරවයි. මගධ වැසියන්ගේ අස්වනු කාලයෙහි මුවන්ට මහ උවදුරක් වෙයි. මුවෝ වනයෙහි පර්වත ජාලයට පිවිසෙත්. එහි ගිරිදුර්ග ආශ්‍රිත ව වනයෙහි වසන මුවෙක් ග්‍රාමාන්තවාසී මුව පැටිස්සියක සමග මිත්‍ර සබඳකම් පවත්වා මුවන් පර්වත පාදයෙන් බැස නැවත ගම්පියසට බසින කාලයෙහි මුවැත්තිය කෙරෙහි බැඳුණු සිත් ඇති බැවින් ඔවුන් සමග ම බැස්සේය. ඇය ඔහුට කියන්නී, මිත්‍රය, ඔබ කවරෙක් ද ? ගම් පියස සැක සහිතය. භය සහිතය. අප සමග නො බසින්න. පර්වතවාසී බාල මුවා ඇය පිළිබඳ සිත් ඇත්තේ බැවින් නො නැවතී ඔවුන් සමග ම ගියේය. මගධ වැසියෝ මුවන් පාර්වත පාදයෙන් බසින වේලාව මේයැ යි දැන මඟ සැඟවුණු කොටුවල සිටිත්. ඒ දෙදෙන එන මඟ එක් මුව වැද්දකු සැඟවුණු කොටුවක සිටියේ විය. මුවැත්තී මිනිස් ගඳ ආඝ්‍රාණය කොට එක් වැද්දකු සිටින්නේයැ යි බාල මුවා පෙරටු කොට තමා පසුපසින් ගියාය. මුව වැද්දා එක්

ඊපහරින් ම මුවා හෙළාලීය. මුවැත්තිය ඔහුට ඊපහර වැදුණු බව දැන උඩ පැන වායු වේගයෙන් පළා ගියාය. වැද්දා කොටුවෙන් නික්ම මුවා කපා ගිනි ගසා ගිනිදැල් නැති අඟුරු රැසක මිහිරි මස පිස අනුභව කොට පැන් බී ඉතිරි මස් ලේ බිඳු වැගිරෙද්දී ම කදින් ගෙන දරුවන් සතුටු කැරෙමින් සිය ගෙට ගියේය.

එදා බෝසතාණෝ ඒ වන ළැහැබෙහි දේවතාවෙක් වී උපන්නාහු වෙති. ඔහු මෙකරුණ දැක මේ මෝඩ මුවාගේ මරණය මව නිසා නො වේ. පියා නිසා ද නොවේ. හුදෙක් ආශාව නිසාමය. කාමය නිමිති කොට සත්ත්වයෝ සුගති භවයේ දී අත්පා කැපීම් ආදී දුකට පත් වෙත්. දුගති භවයේ දී පස් ආකාර බැඳුම් ආදී නොයෙක් දුකට පැමිණෙත්. මෙරමාහට මරණ දුක දීම මෙලොව නින්දිත වූවක් මය. එ සේ ම යම් දනව්වක් මාගමක් පාලනය කරයි ද අනුශාසනා කරයි ද ගැහැනියක ප්‍රධාන වූ ඒ දනව්ව ද නින්දිත මය. යම් කෙනෙක් මාගමකගේ වසඟයට යත් ද ඔවුහු ද නින්දිත වම්හ යි එක ම ගාථාවකින් නිඥා කටයුතු කරුණු තුනක් දක්වා වන දේවතාවන් සාධු හඬ දී ගඳමල් ආදියෙන් පුදද්දී මිහිරි හඬින් ඒ වන ළැහැබ ගුගුරවමින් මේ ගාථාවෙන් දහම් දෙසූහ.

"ධිරත්ථු කණ්ඩිනං සල්ලං පුරිසං ගාළ්හවෙධිනං
ධිරත්ථු තං ජනපදං යත්ථිත්ථී පරිනායිකා
තෙචාපි ධික්කිතා සත්තා යෙ ඉත්ථීනං වසං ගතාති"

"මෙරමා දැඩි කොට විදින්නා වූ හෙල්ල සහ ඊ දුනු දරන පුරුෂයාට නින්දා වේවා. යම් ජනපදයක වනිතාවක් නායක වූවා ද ඒ ජනපදයට නින්දා වේවා. එ සේ ම යම් කෙනකු ස්ත්‍රීන්ගේ වසඟයට ගියාහු ද ඔවුන් ද නින්දා කටයුතුය."

එහි "ධිරත්ථු" යනු නින්දා අර්ථයෙහි නිපාතයකි. එය මෙහි දී තැති ගැනීම්, බයවීම් වශයෙන් නින්දා කිරීමෙහියැ යි දත යුතුයි. මේ නිසා බිය, තැති ගැනීම දෙකින් යුත් බෝසත්හු මෙසේ කීහ. ඊතල ඇත්තේ කණ්ඩි නම්. එය "කණ්ඩිනං" වේ. "සල්ලං" යන

මෙය හෙල්ලෙන් හා ඊයෙන් යුත්තය යන අර්ථය දෙයි. වෙනත් ක්‍රමයකින් හෙල්ල ඇත්තා "සලල" නම්. හෙල්ල වනාහි මහත් වණමුඛයක් කොට දැඩිව විදිනා හෙයින් ගාළ්හවේධි නම්. කුමුදු පත් මෙන් සෘජුව ගමන් කරන හෙල්ලෙන් යුක්ත වූ පුරුෂයාට නින්දා වේවා. මේ මෙහි අර්ථයි. "පරිනායිකා" අධිපතිනිය, සංවිධායිකාවය. "ධික්කිතා" යනු නින්දා කරන ලද්දීය. මෙම ගාථාවේ ඉතිරිය නො ගැඹුරු අරුත් ඇත්තේ මය.

මින් මතු මෙපමණවත් අරුත් නො දක්වා යම් යම් ගැඹුරු දෙයක් වේ නම් එය ම වර්ණනා කරන්නෙමි. මෙසේ එක ම ගාථාවෙන් නින්දාවට හේතු තුනක් දක්වා බෝසත්හු වනය ගුගුරුවා බුද්ධ ලීලාවෙන් දම් දෙසූහ.

බුදුරදහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා සිව්සස් ප්‍රකාශ කළහ. ඒ කෙළවර උකටලී භික්ෂුව සෝවාන් ඵලයෙහි පිහිටියේය. බුදුරදහු අතීත වත්මන් පුවත් කථා කියා අනුසන්ධි ගළපා නිමවා වදාළහ. ජාතකය මින්පසු "දෙපුවත් කියා" නො කියා "අනුසන්ධි ගළපා" යනු පමණක් කියමු. නො කියන ලද්දේ යටකී අනුසාරයෙන් ම යොදා ගත යුතුය. එදා පර්වතවැසි මුවා උකටලී භික්ෂුව විය. එදා මුවැත්තිය පෙර බිරිය වූවාය. කාමාදීනව දක්වා දම් දෙසූ දේවතාවා වනාහි මම ම වීමි.

## 1. 2. 4.

## වාතමිග ජාතකය

"න කිරත්ථි රසෙහි පාපියො" යන මේ දෙසුම බුදු රජහු දෙව්රම් වෙහෙර වසන්නාහු, චුල්ල පිණ්ඩපාතික තිස්ස තෙරුන් අරබයා දේශනා කළහ. බුදු රජුන් රජගහ නුවර ඇසුරු කොට වේළුවන වෙහෙරෙහි වැඩ වසන කල්හි මහත් ධන සම්පත් ඇති

සිටු කුලයක පුත් වූ තිස්ස නම් සිටු කුමරකු එක් දවසක් වේළුවනාරාමයට ගොස් බුදු රදුන්ගෙන් දහම් අසා පැවිදිවනු කැමැති ව පැවිද්ද අයැද සිටිය ද මව්පියන් නො අනුදන්නා ලද හෙයින් ප්‍රතික්ෂේප කරන ලදුව සත් දවසක් උපවාස කොට රට්ඨපාල තෙරුන් මෙන් මව්පියන් අනුදන්වා බුදුරදුන් වෙත පැවිදි විය. බුදුරදහු ඔහු පැවිදි කැරවා අඩ මසක් පමණ වේළුවන වෙහෙරෙහි වැඩ සිට ජේතවන වෙහෙරට වැඩියහ. එහි දී මේ කුල පුත්‍රයා තෙළෙස් ධූතාංග සමාදන් ව සැවැත් නුවර ගෙපිළිවෙළින් පිඬු පිණිස හැසිරෙමින් කල්ගත කරයි. චුල්ල පිණ්ඩපාතික තිස්ස තෙරණුවෝ යි කී කල අහස් තලයෙහි සඳ මෙන් බුදු සසුනෙහි දන්නා ලද්දෝය. එකල රජගහ නුවර නැකැත් සැණකෙළිය පවත්නා කල්හි තෙරුන්ගේ මව්පියෝ ඔහු ගිහි කල පැළැඳි ආබරණ රිදී තැටියක තබා ලයෙහි තබාගෙන අප පුතණුවෝ පෙර නැකැත් සැණකෙළිවල දී මේ මේ අබරණින් සැරසී සැණකෙළි කැරෙති. අපගේ ඒ එක ම පුත්‍රයා රැ ගෙන මහණ ගොයුම්හු සැවැත් නුවරට වැඩියෝය. දැන් අප පුත්‍රයා කොහි හුන්නේදැ යි කොහි සිටිනේදැ යි කියමින් හඬති. එකල එක් වෙසඟනක් ඒ කුලයට ගොස් සිටු බිරිය හඬනු දැක ආර්යාව, කුමක් නිසා හඬහි ද ? ඈ ඒ කරුණ දැන්වූවාය. ආර්යාවනි, රුචි කරන්නේ කිනම් දේටදැ යි අසන්නේ, අසවල් අසවල් දේටය. ඉදින් ඔබ මෙම කුලයට අයත් සියලු සම්පත් මට දෙන්නේ නම්, මම ඔබ පුත් මෙහි ගෙන එන්නෙමි යි කීවාය. සිටු බිරිය මැනවැ යි පිළිගෙන ගමනට සුදුසු පිරිවැය දී මහත් පිරිවර සමග යව, තමාගේ බලයෙන් මගේ පුතා ගෙන එව යි, පිටත් කළාය. ඕ පිළිසන් යානයක හුන්නී, සැවැත් නුවරට ගොස් තෙරුන් පිඬු පිණිස හැසිරෙන වීථියෙහි නිවසක නැවතී සිටු කුලයෙන් පැමිණි මිනිසුන් නො පෙන්නා තම පිරිවරින් පිරිවරන ලද්දී, තෙරුන් පිඬු පිණිස වැඩි කල්හි පළමු ව හැන්දක් පමණ බත් ද පසුව බඳුනක් පමණ බත් ද පිළිගන්වා රස තෘෂ්ණාවෙන් බැඳ අනුක්‍රමයෙන් ගෙය තුළ වඩා හිඳුවා අහර දෙන්නී, තම වසඟයට පැමිණි බව දැන ගිලන් බවක් පෙන්වා යහන් ගැබ හොත්තීය. තෙරහු ද පිඬු සිඟන වේලෙහි ගෙපිළිවෙළින් හැසිරෙන්නෝ ඇගේ ගෙදොරට වැඩියහ. පිරිවර ජනයෝ තෙරුන්ගේ පාත්‍රය ගෙන තෙරුන් ඇතුළු ගෙහි වැඩ හිඳවූහ. තෙරණුවෝ හිඳගෙන ම උපාසිකාව කොහිදැ යි විමසූහ. ස්වාමීනි, ඈ ගිලන්ව සිටින්නීය. ඔබතුමන්ගේ දර්ශනය කැමැති වන්නීයැ. තෙරණුවෝ රස තෘෂ්ණාවෙන් බැඳන්නාහු, තමාගේ ධූත සමාදානය බිඳ ඇය හොත්තැනට වැඩියහ. ඈ තමා පැමිණි කාරණය ප්‍රකාශ කොට

පොළඹවා රස තෘෂ්ණාවෙන් බැඳ උපැවිදි කොට තම වසඟයට ගෙන යහනාවක හිඳුවා මහත් පිරිවරින් රජගහ නුවරට ම ගියාය. මෙපුවත ප්‍රකට විය. භික්ෂූහු දම් සබාවෙහි සිට වෙසඟනක් චුල්ල පිණ්ඩපාතික තිස්ස තෙරුන් රස තෘෂ්ණාවෙන් බැඳගෙන ගියාය, යන කථාවක් කළහ. බුදුරදහු දම් සබාවට වැඩ විසිතුරු අසුනෙහි වැඩහිඳ මහණෙනි, දැන් කිනම් කථාවක් කරමින් හුන්නාහුද යි විචාළහ. භික්ෂූහු එපවත් සැලකළහ. මහණෙනි, මේ භික්ෂුව රස තෘෂ්ණාවෙන් බැඳී ඇගේ වසඟයට ගියේ දැන්මතු නොවෙයි. පෙරත් ඇගේ වසඟයට ගියේමැ යි වදාරා ඉකුත් කථාව ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජුට සඤ්ජය නම් උයන්පල්ලකු සිටියේය එකල එක් පවනට සම ජව ඇති මුවෙක් (වාතමිග) උයනට අවුත් සඤ්ජය දැක පැන දුවයි. සඤ්ජය ද මුවා බියගන්වා පළවා නො හරියි. මුවා ද නැවත නැවත අවුත් උයනෙහි ම හැසිරෙයි. උයන්පල්ලා උයනෙහි නානාරස ඇති මල්එල ගෙන දිනපතා රජුට ගෙන යයි. දිනක් රජ, උයන්පල්ලා අමතා යහළු උයන් ගොව්වෙනි, උයනෙහි කිසියම් අසිරිමත් දෙයක් දක්නෙහිද යි විමසීය. දේවයිනි, වෙන යම්කිසි අමුතු දෙයක් නො දක්මි. එක් වාමුවෙක් උයනෙහි හැසිරෙයි. මෙපමණක් දකිමි. මුවා අල්ලාගැනීමට හැකි ද ? දේවයිනි, මී පැනි සුඟක් (ස්වල්පයක්) ලැබෙන්නේ නම් මුවා රජ මැදුරට ම ගෙනෙන්න හැක්කෙමි. රජ ඔහුට මී පැණි දෙවීය. උයන්පල්ලා ඒ ගෙන උයනට ගොස් වාමුවා හැසිරෙන තැන්හි තෘණවල මී තවරා සැඟවී සිටියේය. මුවා පැමිණ මී වැකුණු තෘණ කා රස තෘෂ්ණාවෙන් බැඳුණේ අන් තැනකට නො ගොස් උයනට ම එයි. උයන්පල්ලා, මුවා මී වැකුණු තණට ලොල් වූ බව දැන ක්‍රමයෙන් තමා දකින්න සැලැස්වීය.

මුවා උයන්පලු දැක කීප දිනක් පළා ගොස් නැවත නැවත දකින විට විශ්වාස බවට පැමිණ ක්‍රමයෙන් ඔහුගේ අත තිබූ තණ කැමට පටන් ගත්තේය. ඔහු මුවා තමා සමඟ විශ්වාසයට පැමිණි බව දැන රජ මැදුර දක්වා මඟ පැලලිවලින් ආවරණය කොට තැන් තැන්වල අතු කැබලි දමා මී පැණි කැටක් උරයෙහි එල්ලාගෙන තෘණ මිටියක් කිසිල්ලෙහි රුවාගෙන මී වැකුණු තෘණ මුවා ඉදිරියෙහි විසුරුවමින් රජ මැදුර තුළට ම ගියේය. මුවා ඇතුළටවත් කල්හි දොර වැසුවේය. මුවා මිනිසුන් දැක වෙවුලමින් මරණ බයින් බියපත් ව ඇතුළත

මිදුලෙහි ඔබිමොබ දුවයි. රජ පහයෙන් බැස වෙවුලමින් සිටි මුවා දැක සිතී. වාමුවෝ නම් මිනිසුන් දුටු තැනට සත් දිනක් නො යති. බය වූ තැනකට දිවිහිමියෙන් නො යති. එබඳු වූ මහ වන ඇසුර කරන පවනට බඳු ජව ඇති මුවා රස තෘෂ්ණාවෙන් බැඳී දැන් මෙබඳු තැනකට ආවේය. අහෝ ! ලෝකයෙහි රස තෘෂ්ණාවට වැඩි තරම් ළාමක පවක් නැතැ යි මේ ගාථාවෙන් දම් දෙසුම ඇරඹීය.

**"න කිරත්‍ථි රසෙහි පාපියො ආවාසෙහි වා සන්‍ථවෙහි වා**
**වාතමිගං ගෙහනිස්සිතං වසමානෙසි රසෙහි සඤ්ජයොති"**

"වාසස්ථාන පිළිබඳ ආශාව, මිතුරු සබඳතා පිළිබඳ ආශාව යන මේ ආශාවන්ට වඩා මධුර ඇඹුල් ආදී රස පිළිබඳ ආශාව වඩා ලාමක වේ. සඤ්ජය, වන ගහණය ඇසුරු කොට සිටි වාමුවා රසයෙන් වසඟ කොට ගෙන ආවේය."

එහි **"කිර"** යනු ශ්‍රැති, සවන අර්ථයෙහි නිපාත පදයකි. **"රසෙහි"** යනු ජිව්හා ඉන්ද්‍රියෙන් දතයුතු මධුර රස, ඇඹුල් රස ආදියයි. **"පාපියො"** යනු පාපතර ක්‍රියාවන්ය. **"ආවාසෙහි වා සන්‍ථවෙහි වා"** යනු නිබඳ වසන තැන් නම් වූ නිවාසයන්හි ද මිත්‍රසංවාසය ද ඡන්ද රාගය ද පවිටුය. එම තද ආශාවෙන් පරිභෝග කරන හෝ මිත්‍ර සංවාසයට වඩා දිනපතා අනුභව කරන අරුතින් ආහාරය හැර දිවිපැවැත්ම සඳහා නො වන බැවින් බලවත් ආශාවෙන් අනුභව කරන ජිව්හා රසය ම සියදහස් ගුණයෙන් පවිටුතර වේ. බෝසත්හු වනාහි මෙම කරුණ ශ්‍රැතිසුවනයෙන් (ආරංචියෙන්) දැනගත් දෙයක් මෙන් මෙය අර්ථ කොට ගෙන **"න කිරත්‍ථි රසෙහි පාපියො ආවාසෙහි වා සන්‍ථවෙහි වා"** යි කීහ. දැන් ඔවුන්ගේ පවිටු බව දක්වනු වස් **"වාතමිගං"** යි ආදිය කීහ. එහි **"ගෙහනිස්සිතං"** යනු වන ගහණය ඇසුරු කළ වගයි. මෙහි අදහස නම්, රසයන්ගේ පවිටු බව මෙයැ යි බලනු. මහා වනයෙහි වන ගහණය ඇසුරු කළ වාමුවා සඤ්ජය නම් උයන්ගොව්වා මී රසයෙන් තම වසඟයට පැමිණ වීය. හැම අයුරින් ම ස්වච්ඡන්ද රාගයෙන් අනුභව කරන රසයන් හා සමාන අන් පවිටුතර දෙයක්, ළාමකතර දෙයක් නැතැ යි රස තෘෂ්ණාවෙහි ආදීන ව ප්‍රකාශ කළහ. එ සේ කියා ඒ වාමුවා වනයට ම යැවීය.

බුදු රජහු, මහණෙනි, ඒ වෙසඟන එම තෘෂ්ණාවෙන් බැඳ මොහු තම වසඟයට ගත්තේ දැන් පමණක් නො වේ. පෙරත් එ සේ කළායැ යි, මේ ධර්ම දේශනය ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා ජාතකය නිමවා වදාළහ. එදා සඤ්ජය නම් මෙදා ඒ වෙසඟන වූවාය. වාමුවා චුල්ලපිණ්ඩපාතික ය. බරණැස් රජ වනාහි මම ම වීමි.

## 1. 2. 5

## බරාදිය ජාතකය

"අට්ඨුබුරං බරාදියෙ" යන මෙය බුදු රජහු දෙව්රම් වෙහෙර වසමින් දුර්වච මහණකු (නො කීකරු මහණකු) අරබයා දේශන කළහ. ඒ මහණ වනාහි නො කීකරුය. අවවාද නො පිළිගනී. බුදුරදහු, මහණ, ඔබ දූර්බච ව අවවාද නො පිළිගන්නා බව සැබෑ ද ? එ සේය ස්වාමීනි, ඔබ පෙරත් දූර්බච ව නුවණැත්තන්ගේ අවවාද නො ගෙන මළ පුඬුවට අසුවී මරණයට පත්වූයේ නො වේදැ යි වදාරා අතීතය ගෙනහැර දැක්වූහ.

අතීතයෙහි බරණැස් නුවර බඹදත් රජු රජ කරන කල්හි බෝසත්තෙම මුවෙක් වී මුවන් පිරිවරාගෙන කැලයෙහි වෙසෙයි. එකල්හි ඔහුගේ නැගනි මුවදෙන තම පුතු පෙන්වා සොහොයුර, මේ ඔබගේ බෑණාය. ඔහුට මුව මායම් උගන්වනු හැකිදැ යි පැවරුවාය. බෝසත් මුවා අසවල් වේලාවේ අවුත් ඉගෙන ගනුව යි කීය. ඔහු කී වේලාවට නො එයි. එක දවසක් නොව සත් දවසක් ම අවවාදයන් ඉක්මවන්නේ මුව මායම් නො ඉගෙන ම හැසිරෙන්නේ මළ පුඬුවක බැඳුණේය. ඔහුගේ මව සොහොයුරා වෙත පැමිණ, සොහොයුර බෑණාට මායම් ඉගැන්වූවාදැ යි විමසූවාය. එවිට බෝසත්හු, අවවාද නො පිළිගත් ඔහු ගැන නො සිතනු. ඔහු මායම් නො උගත්තේය. මේ ගාථාව කීහ. දැනුත් ඔහුට අවවාද නො දෙනු කැමැත්තේ, මේ ගාථාව කීහ.

"අට්ඨඛුරං බරාදියෙ මිගං වඞ්කාතිවඞ්කිනං
සත්තහි කලාහතික්කන්තං න නං ඔවදිතුස්සහෙති"

"බරාදිය නැඟණියනි, රළු වූ කුර අටක් ඇති වඩ වඩාත් නැමුණු අං ඇති අවවාද සඳහා දින සතත් ඉක්ම වූ ඒ මුවාට අවවාද කිරීමට මම උත්සාහ නො කරමි."

එහි "අට්ඨඛුරං" යනු එක් පාදයක දෙක බැගින් කුර අටක් ඇති යන්නය. "බරාදියෙ" නමින් ඇය අමතයි. "මිගං" යනු මුව සඳහා පොදු වචනයකි. "වඞ්කාතිවඞ්කිනං" යනු මුල ඇද වූ අග අතිශයින් ඇද වූ වංකාතිවංක නම් එවැනි අං ඔහුට ඇති බවයි. "සත්තහි කලාහතික්කන්තං" යනු අවවාද දෙන කාල හතක් ඉක්ම වූ යන්නය. "න නං ඔවදිතුස්සහෙ" මෙබඳු වාචාල මුවාට අවවාද කිරීමට මම උත්සාහ නො කරමි. මොහුට අවවාද කිරීමට මට සිතක්වත් නො උපදී යි දක්වයි. ඉක්බිති, වැද්දා පුඩුවෙහි බැඳුණු මුවා මරා මස් රැ ගෙන ගියේය.

බුදුරදහු මහණ, ඔබ දැන් පමණක් දුර්වච වූයේ නො වේ. පෙරත් දුර්වච වීයැ යි මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා ජාතකය නිමවා වදාළහ. එදා බැණ මුවා නො කීකරු භික්ෂුව විය. නැඟණිය උප්පලවණ්ණා වූවාය. අවවාද කළ මුවා මම ම වීමි.

## 1. 2. 6.

## තිපල්ලත්ථමිග ජාතකය

"මිගන්තිපල්ලත්ථ" යන මෙය බුදු රජහු කොසඹෑ නුවර බදරිකාරාමයෙහි වැඩ වසමින් ශික්ෂාකාමී රාහුල තෙරුන් අරබයා දෙසූහ. එක් කාලයක බුදුරදුන් අළව් නුවර අග්ගාළව චෛත්‍යයෙහි වසන කල්හි උපාසිකාවෝත් භික්ෂුණියෝත් බණ ඇසීම සඳහා

විහාරයට යත්. බණ දෙසීම දවල් කාලයෙහි විය. කල්යත් ම උපාසිකාවෝත් භික්ෂුණියෝත් නො ගියාහුය. උපාසකයෝ ද භික්ෂූහු ද පමණක් වූහ. එතැන් පටන් බණ ඇසීම රාත්‍රී කාලයෙහි විය. බණ ඇසීම කෙළවර ස්ථවිර භික්ෂූහු තම තමන්ගේ වසන තැන්වලට යති. ලාබාල භික්ෂූහු උපාසකයන් සමග උපස්ථාන ශාලාවෙහි නිදත්. ඔවුහු නිදිගත් කල්හි සමහරු සුරු සුරු හඬින් හුස්ම ගනිත්. සමහරු තතනමින් ද සමහරු දත් විකමින් ද නිදාගත්හ. සමහරු ටික වේලාවක් නිදා නැගිටිත්. ඔවුහු මේ විප්‍රකාරය බුදුරදුන්ට දැන්වූහ. බුදුරදහු "**යම් භික්ෂුවක් උපසපන් නොවූවකු සමග එකට නිදන්නේ නම්, පචිත් ඇවතක් වේ**" යි සික පදය පනවා කොසඹෑ නුවරට වැඩියහ.

එහිදී භික්ෂූහු රාහුල ආයුෂ්මතුන්ට කීහ. ඇවැත් රාහුලයනි, බුදුරදුන් විසින් සිකපදයක් පනවන ලදී. දැන් ඔබ තමුන්ගේ වසන ස්ථානය දැනගන්න. පෙරදී භික්ෂූහු, බුදුරදුන් කෙරෙහි ගෞරවය නිසාත්. රාහුල ආයුෂ්මතුන්ගේ ශික්ෂාකාමිත්වය නිසාත් තම වාසස්ථානය එන ඔහුට සැලකිලි දක්වත්. කුඩා ඇඳක් සකසා හිස තැබීම සඳහා සිවුරු දෙත්. එදින සිකපදයට බියෙන් විසීමට ඉඩක්වත් නුදුන්හ. රාහුල, මගේ පියායැ යි බුදුන් වෙත හෝ උපාධ්‍යායන්යැ යි සලකන සැරියුත් තෙරුන් වෙත හෝ ගුරුවරයායැ යි සලකන මහ මුගලන් තෙරුන් වෙත හෝ සුළු පියායැ යි සලකන ආනඳ තෙරුන් වෙත හෝ නොගොස් බඹවිමනකට පිවිසෙන්නාක් මෙන් බුදුරදුන්ගේ වැසිකිළියට පිවිස වාසය කළේය.

බුදුරදුන්ගේ වැසිකිළිය දොර මනාව වසා තිබේ. බිම සුවඳ පිරිමඩ ගෙන ඇත. ගඳ මල් දම් එල්ලා තිබේ. මුළු රාත්‍රියෙහි පහනක් දැල්වේ. රාහුල ඒ කුටියෙහි ඇති පහසුකම් සලකා එහි වාසයට පැමිණියේ නො වෙයි. භික්ෂූන් විසින් වසනා තැන දනුවයි කියන ලද බැවින් අවවාදයට ගරු කිරීමක් වශයෙන් ශික්ෂාකාමී බව නිසා හේ වාසයට පැමිණියේය. වරින්වර භික්ෂූහු රාහුල දුර එනු දැක විමසනු පිණිස ඉලපතක් හෝ කසල බඳුනකින් හෝ පිටතින් තබා ඔහු පැමිණි කල්හි ඇවැත්නි, ඉවත දමන ලද්දේ කවුරුන් විසින් දැයි කියත්. එහි සිටි කෙනකු මේ මඟින් රාහුල ගියේයැ යි කී කල්හි රාහුල ආයුෂ්මත්හු හිමියනි, මම දනිමි යි නො කියා එතැන තබා

හිමියනි, මට සමාවන්නැ යි භික්ෂූන් සමාකරවා ගෙන ඔහුගේ ශික්ෂාකාමිත්වය නිසා ම එහි වාසයට ගියේය.

ඉක්බිති බුදුහු අරුණ නැගීමට පෙර ම වැසිකිළි දොර ළඟ සිට උගුර පෑදූහ. ඒ ආයුෂ්මත්හු ද උගුර පෑදූහ. මේ කවුද ? මම රාහුල වෙමි යි අවුත් වැන්දේය. රාහුල, ඔබ මෙහි වැඳහොත්තේ ද ? විසීමට තැනක් නැති හෙයිනි. ස්වාමීනි, පෙර මට භික්ෂූහු සංග්‍රහ කරත්. දැන් ඇවැත් බිය නිසා වසන තැනක් නො දෙත්. ඒ මම අනුන් හා නො ගැටෙන තැනක්ය යන කරුණ නිසා මෙහි හොත්තෙමි. බුදුරදුන්ට ධර්ම සංවේගය පහළ විය. ඉක්බිති බුදුරදුන්, භික්ෂූහු රාහුල මෙසේ ප්‍රතික්ෂේප කරන්නාහු නම් අන් කුලදරුවන් පැවිදි කොට කුමක් කරන්නාහු දැයි උදෑසන ම භික්ෂූන් රැස්කරවා ඊයේ රාත්‍රිය රාහුල කිසියම් තැනක විසූ බව දන්නහුද යි සැරියුත් තෙරුන්ගෙන් ඇසූහ. නො දනිමි ස්වාමීනි, සාරිපුත්ත, රාහුල අද වැසිකිළියෙහි විසීය. සාරිපුත්ත, තොප රාහුල මෙසේ බැහැර කරනවිට අන් කුල දරුවන් පැවිදි කොට කුමක් කරන්න ද ? මෙසේ ඇතිකල්හි මේ සසුනෙහි පැවිදිවූවෝ පිහිටක් නැත්තෝ වන්නාහුය. මෙතැන් පටන් අනුපසම්පන්නයන් සමග එක් රැයක් දෙකක් තමා සමග වාසය කරවා තෙවන දවසෙහි ඔවුන්ව වාසස්ථානයක් දැන පිටත වාසය කැරවිය යුතුයැ යි දෙවන පැනවීමක් කොට නැවත සිකපදය පැනවූහ.

එකල්හි දම්සබාවෙහි රැස් වූ භික්ෂූහු රාහුලගේ ගුණ කථා කරමින් බලන්න ඇවැත්නි, රාහුල කොතරම් ශික්ෂාකාමී ද ? ඔබ වසන තැන දනුවයි කියා හෝ මම බුදුරදුන්ගේ පුත්‍රයා වෙමි. ඔබලා සෙනසුනෙහි වසන්න කවුරුහු ද ? ඔබලා ම නික්මෙනු ආදී වශයෙන් එක භික්ෂුවකටවත් අවලාද නො කියා වැසිකිළියෙහි වාසය කළේයැ යි මෙසේ ඔවුන් කථා කරමින් සිටියදී බුදුරදහු දම්සබාවට වැඩම කොට විසිතුරු අසුනෙහි හිඳ මහණෙනි, කුමන කථාවකින් හුන්නාහුදැ යි ඇසූහ. ස්වාමීනි, රාහුලගේ ශික්ෂාකාමී බව පිළිබඳ කථාවෙන් මිස අන් කථාවකින් නො වේ. මහණෙනි, රාහුල ශික්ෂාකාමී වූයේ දැන් පමණක් නො වේ. පෙර තිරිසන් යෝනියෙහි උපන්නේ ද ශික්ෂාකාමී වූයේ මයැ යි වදාරා ඉකුත්වත දෙසූහ.

පෙර රජගහ නුවර මගධ රජ රාජ්‍යය කරයි. එකල්හි බෝසත්හු මුව යෝනියෙහි ඉපිද මුව සමූහයා පිරිවරාගෙන මහ වනයෙහි වෙසෙයි. ඉක්බිති බෝසතුන්ගේ නැගනිය තම පුතා ගෙන්වා සොහොයුර, මේ ඔබගේ බෑණයි. මුවමායම් පුහුණු කරනු මැනවැ යි කීවාය. බෝසත්හු මැනවැ යි පිළිගෙන දරුව, යන්න අසවල් වෙලාවට අවුත් පුහුණු වන්නැ යි කීහ. ඔහු ද මයිලණුවන් කී වේලාව නො ඉක්මවා ඔහු වෙත එළඹ මුව මායම් හදාළේය. දිනක් ඔහු වනයෙහි හැසිරෙන විට මළ පුඩුවක බැඳී බැඳුණු හඬින් හැඬීය. මුව රැල පළා ගොස් ඇයගේ පුතා පුඩුවෙහි බැඳුණු බව ඔහුගේ මවට කීහ. ඕ බෑයා ළඟට ගොස් සොහොයුරාණනි, ඔබගේ බෑනාට මුව මායම් උගන්වන ලද්දේදැ යි විචාළාය. ඔබ පුත්‍රයා ගැන නපුරක් නො සිතනු. ඔහු විසින් මුව මායම් මනාව ඉගෙන ගන්නා ලදී. දැන් සිනා ගන්වමින් එන්නේයැ යි පවසා මේ ගාථාව කීය.

"මිගං තිපල්ලත්ථ මනෙකමායං
අට්ඨඛුරං අඩ්ඪරත්තාව පායිං
එකෙන සොතෙන ඡමාස්සසන්තො
ඡහි කලාහතිභොති භාගිණෙය්‍යොති"

"කුර අටක් ඇති, මැදියම් රැයෙහි පැමිණ ජලය බොන, තිපල්ලත්ථ මුවාට නොයෙක් මායම් ඉගැන්වීමි. ඒ බෑණා කලාවන් සය අතුරින් එකකින් (වැද්දා) වංචා කරන්නේය."

එහි "මිගං" යනු බෑණ මුවාය. "තිපල්ලත්ථ" හි පල්ලත්ථං යන්නෙන් සයනය කියවේ. දෙපසට නිදීම, හිටගෙන නිදීම සහ ගවයකු නිදන්නාක් මෙන් නිදීම වශයෙන් තුන් ආකාර නිදීම් ඇත්තේ යමකුට ද නිදීම් තුනම ඇත්තේ ඔහු තිපල්ලත්ථ නම් වේ. "අනෙක මායං" යනු බොහෝ මායා ඇති සහ කපටිකම් ඇති බවයි. "අට්ඨඛුරං" යනු එක් එක් පාදයක දෙක වශයෙන් කුර අටක් ඇති බවයි. "අඩ්ඪරත්තාවපායිං" පෙරයම ඉක්මවා මැදුම්යම වනයෙන් අවුත් පැන් බොන නිසා අඩ්ඪරත්තාවපායිං නම් වේ. මම මගේ බෑණ මුවාට මැනවින් මුව මායම් ඉගැන්වීමි. කෙසේද යත්, "එකෙන සොතෙන ඡමාස්සසන්තො ඡහි කලාහතිභොත භාගිණෙය්‍යො" මෙයින් කියන

ලද්දේ මෙම අදහසයි. මම තිගේ පුතාට මෙසේ ඉගැන්වීමි. උඩුපැත්තට සිට නාහු සිදුරෙන් වාතය තදකොට සයාකාරයකින් වැද්දා රවටයි. කවර සයකින් ද යත්, පාසතර දිගහැර එක පැත්තකට සිටීම, කුරවලින් තණ හා පස් කැණීම, දිව පිටට දැමීම, බඩ පුම්බාගෙන සිටීම, මළ මුත්‍ර බැහැර කිරීම, හුස්ම නො ගැනීම ය. තවත් ක්‍රමයකට සයාකාරය මෙසේය. අත්පා ඉදිරියට ඇදීමෙන්, ආපසු ඇදීමෙන්, දෙපසින් සෙලවීමෙන්, උඩට ඉස්සීමෙන් හා පහතට හෙළීමෙන් ය. මේ කලාවන් සයෙන් මූ මළේයැ යි හැඟීමක් ඇතිකොට රවටයි. මෙසේ ඔහු ම මුව මායම් ඉගැන්වීමෙන් පෙන්වයි. **"එකෙන සොතෙන ඡමාසසසතො ඡහි කලාහති"** පෙර කී දෙයාකාර කරුණුවලින් වැද්දා රවටයි යන අර්ථයයි. **"භොති"** නැගනිය අමතයි. **"භාගිණෙයෙයාති"**, මෙකී සය කරුණකින් රවටන බෝසත් බෑණා නිර්දේශ කරයි.

මෙසේ බෝසත්හු බෑණා මුව මායම් මැනවින් උගත් බව දක්වමින් නැගනිය අස්වැසූහ. මළ පුඩුවෙහි බැඳුණු ඒ මුවපොව්වා ද කලබල නො වී මහඉලඇට ඇති පැත්තෙන් පාදෙක දිග හැර, හොත්තේය. පාදයන්ට ළඟ භූමිය කුරවලින් ගසා තණද පස්ද විසුරුවා මළ මුත්‍ර බැහැරකොට හිස පහත්කොට දිව එළියට දමාගෙන ඇඟ හැමතැන කෙළ තවරා හුස්ම ගැනීමෙන් උදරය ඉදිමී ගිය සේ කොට, ඇස් පෙරළා, යට නාස් පුඩුවෙන් හුස්ම ගනිමින් උඩුනාස් පුඩුවෙහි හුස්ම තදකොට මුළු සිරුරම දරදඬුකොට මළ ආකාරයක් දැක්වීය. නිල මැස්සෝ ද ඔහු පිරිවැරූහ. කපුටෝ ද ඒ තැන සැඟවී සිටියහ. වැද්දා අවුත් උදරයට අතින් ගසා ඉතා අළුය ම බැඳුණා විය යුතුයි. කුණු වී අතැ යි බැඳි රැහැන මුදා මෙහිදී ම මුවා කපා මස් ගෙන යමි යි අතුර කොළ ඇහිදීමට පටන් ගත්තේය. මුවපොව්වා ද නැගිට පා සතරෙන් සිට ඇඟ පොළා ගෙල ඔසවා මහා සුළඟින් බිඳුණු වලා කඩක් මෙන් වේගයෙන් මව් වෙත ගියේය.

මහණෙනි, රාහුල ශික්ෂාකාමී වූයේ දැන් පමණක් නො වේ. පෙරත් එ සේ ම වූයේ යි මේ ධර්ම දේශනය ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා වදාරා ජාතකය නිමවූහ. එදා බෑණ මුවපොව්වා නම් රාහුලය. මව උපපලවණ්ණා වූවාය. මයිලණු මුවා නම් මම වූවෙමි.

## 1. 2. 7.

## මාලුත ජාතකය

"කාළෙ වා යදි වා ජුණ්හ" යන මෙය බුදු රජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් වයසට ගොස් පැවිදිවූවන් දෙදෙනකු අරබයා වදාළහ. ඔවුහු කොසොල් දනව්වෙහි එක් වනගත සෙනසුනක වෙසෙත්. එක්නමක් කාල නම් තෙර වූ අතර එක්නමක් ජුණ්හ නම් තෙර වූහ. එක් දවසක් ජුණ්හ තෙරණුවෝ කාළ තෙරුණ්ගෙන් ස්වාමීනි, සීතල ඇතිවන්නේ කවර කාලයෙද්ද යි ඇසීහ. අව පසෙහි යි කීහ. තවත් දවසක දී කාළ තෙරුණුවෝ ජුණ්හ තෙරුන්ගෙන් සීතල කවර කලෙක වේද්ද යි විමසූහ. ඔහු පුර පසදී සීතල ඇති වෙතැ යි කීයේය. මේ දෙදෙනා ම මේ සැකය සිඳීමට නොදන්නාහ. බුදුරදුන් වෙත ගොස් වැඳ ස්වාමීනි, සීතල ඇතිවන්නේ කවර කාලයකද්ද යි විචාළහ. බුදුරදහු ඔවුන්ගේ කථාව අසා මහණෙනි, ඔබ දෙදෙනා ම පෙර භවයක දීත් මේ ප්‍රශ්නය කීමි යි භවයෙන් ගෙවී ගිය බැවින් නො සලකා හැරයහුද වදාරා අතීත කථාව ගෙනහැර දක්වූහ.

පෙර එක් පර්වත පාදයක සිංහයෙක් හා ව්‍යාඝ්‍රයෙක් යාළුවෝ ලෙසින් එක ම ගුහාවක වසත්. බෝධිසත්ත්වයෝ ද තවුස් වෙසින් පැවිදි ව ඒ පර්වත පාදයෙහි ම වෙසෙති. එක් දවසක් යහළුවන් දෙදෙනාට සීතල පිළිබඳ විවාදයක් ඇතිවිය. ව්‍යාඝ්‍රයා කළුවර අවපස සීත ඇති වේයැ යි කීය. සිංහයා පුර පසෙහි සීත ඇතිවන බව කීය. දෙදෙනා ම මේ සැකය සිඳීන්න නො හැකි ව බෝසතුන්ගෙන් විමසූහ. එතුමෝ මේ ගාථාව කීහ.

**"කාළෙ වා යදි වා ජුණ්හ යදා වායති මාලුතො**
**වාතජානි හි සීතානි උභොත්ථමපරාජිතාති"**

"කළුවරපස හෝ පුරපස හෝ යම් කලෙක සුළඟ හමයි ද ඒ සීතල වාතයෙන් හටගන්නකි. මෙහි දී දෙදෙනා ම අපරාජිතයන්ය."

එහි "**කාළෙ වා යදි වා ජුණ්‍හ**" යනු අවපස හෝ පුරපසය. "**යදා වායති මාලුතො**" යම් කලෙක පෙර දිසාව ආදී වශයෙන් සුළඟ හමයි ද එවිට සීත ඇති වේ. මක්නිසා ද යත් "**වාතජානි හි සීතානි**" සුළඟ හමන කල්හිම සීත ඇතිවන හෙයිනි. අවපස කියා හෝ පුරපස කියා හෝ ප්‍රමාණ නො වේයැ යි කියන ලදී. "**උභොත්ථමපරාජිතාති**" තොප දෙදෙනා ම මේ ප්‍රශ්නයේ දී පරාජය වූවෝ නො වෙති. මෙසේ බෝසත්හු යහළුවන් දෙදෙනා දැනුවත් කළහ.

බුදුරදහු ද මහණෙනි, පෙරත් මා විසින් මේ ප්‍රශ්නය කියනු ලද්දේයැ යි මේ ධර්ම දේශනය ගෙනහැර දක්වා වදාරා සිව්සස් දෙසූහ. තෙරවරු දෙදෙනා ම සෝවාන් ඵලයෙහි පිහිටියහ. බුදුරදහු අනුසන්ධි ගළපා ජාතකය නිමවා වදාළහ. එදා ව්‍යාඝ්‍රයා කාළ තෙරය. සිංහයා ජුණ්හ තෙරය. ප්‍රශ්නය විසඳුන තවුසා මම ම වීමි.

1. 2. 8.

## මතකභත්ත ජාතකය

"**එවං චෙ සත්තා ජානෙය්‍යුන්ති**" යන මෙය බුදුරදුන් දෙව්රම් වෙහෙර වැඩ වසමින් මතක බතක් අරබයා දෙසූහ. ඒ කාලයෙහි මිනිස්සු බොහෝ එළු, බැටළුවන් මරා මැරුනු නෑයන් උදෙසා මළ බත් දෙති. භික්ෂූහු එසේ කරන මිනිසුන් දැක බුදුරදුන්ගෙන් විමසූහ. ස්වාමීනි, මෙකල මිනිස්සු බොහෝ ප්‍රාණීන් මරා මළබත් නම් දානයක් දෙත්. ස්වාමීනි, මෙහි යහපතක් තිබේ ද ? මහණෙනි, මළ බත් දෙමු යි පර පණ නැසීමෙන් කිසිම යහපතක් නම් නැත්තේමය. මහණෙනි, පෙර පඬිවරු අහසෙහි හිඳ දම් දෙසා මෙහි ආදීනව කියා සියලු දඹදිව වැසියන්ගෙන් මේ පාප කර්මය අත්හැර වූහ. භවයෙන් වැසීගිය නිසා නැවතත් පහළ වීයැ යි අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරවන කල්හි තුන් වේදයෙහි පරතෙරට ගිය දිසපාමොක් බ්‍රාහ්මණ ගුරුතුමන් මතක බතක් දෙන්නෙමැ යි බැටළුවකු ගෙන්වා අතවැස්සනට කීය. දරුවනි, මේ බැටළුවා ගඟට ගෙන ගොස් නහවා හෙළ මල් දමකින් වට කොට පසැඟිලි සලකුණු කොට සරසා ගෙන එවු. ඔවුහු ද මැනවැ යි පිළිගෙන ගඟට ගෙන ගොස් නහවා සරසා ගංතෙර තැබූහ. ඒ බැටළුවා තමාගේ පෙර අකුසල කර්මය දැක මෙවන් දුකින් අද මිදෙමි යි සතුටු ව කළයක් බිඳින්නක් මෙන් මහත් සිනාවක් පා නැවත මේ බමුණා මා මරා මවිසින් ලබන ලද දුක ලබන්නේයැ යි බමුණා කෙරෙහි කරුණා සිත් උපදවා මහත් හඬින් හැඬීය. ඉක්බිති මානවකයෝ විචාළහ. යහළු බැටළුව, ඔබ මහ හඬින් සිනාසී හැඬුවෙහිය. කවර කරුණකින් සිනාසුණේ ද ? කවර කරුණකින් හැඬුවෙහි ද ? ඔබලා මේ කරුණ තමන්ගේ ගුරුතුමා ඉදිරියේදී අසනු. මානවකයෝ බැටළුවා රැගෙන ගොස් ගුරුතුමාට සැල කළහ.

ගුරුතුමා ඔවුන්ගේ වචනය අසා බැටළුවාගෙන් විචාළේය. යහළු බැටළුව, ඔබ සිනාසුනේ ඇයි ? හැඬුවේ ඇයි ? බැටළුවා තමා කළ පව්කම පෙර ජාතිය දක්නා නුවණින් සිහි කොට බමුණාට කීය. බමුණ, මම පෙර ඔබ මෙන් ම මන්ත්‍ර උගන්වන බමුණෙක් වී මතක බතක් දෙමි යි බැටළුවකු මරා මළ බත දුනිමි. ඒ මම එක බැටළුවකු මැරූ බැවින් සාරසිය අනූනවයක් අත්බැව්වල හිස් සිඳුම්වලට ලක්වීමි. මේ මගේ කෙළවර ම වූ පන්සිය වැනි අත්බවයි. අද මම මෙබඳු දුකින් මිදෙමි යි සොම්නස් වීමි. මේ කරුණින් සිනාසීමි. හැඬුවේ වනාහි, මම එක බැටළුවකු මරා පන්සියයක් ආත්මවල හිස සිඳුම් දුකට පත් අද ඒ දුකින් මිදෙමි. මේ බමුණා මා මරා මා මෙන් පන්සියයක් ආත්මවල හිස් සිඳුම් දුක ලබන්නේය. ඔබ කෙරෙහි කරුණාවෙන් හැඬීමි. බැටළුව, බිය නො වෙනු. මම ඔබ නො මරමි. බමුණ කුමක් කියහි ද ? ඔබ මා මැරුවත් නො මැරුවත් අද මට මරණින් මිදෙන්න නො හැකිය. බැටළුව, බිය නො වන්න. අද මම ඔබ රැකගෙන ඔබ සමග ම හැසිරෙන්නෙමි. බමුණ, ඔබගේ ආරක්ෂාව ඉතා සුළුය. මවිසින් කරන ලද පාප කර්මය ඉතා බලවත්ය.

බමුණා බැටළුවා මුදා හැර කිසිවකුටත් මරන්න ඉඩ නො දෙමි යි අතවැස්සන් ගෙන බැටළුවා සමග ම හැසිරුණේය. බැටළුවා අත්හළ මොහොතෙහි ම ගල්තලාවක් ළඟ වැඩුණු ලැහැබක ගෙල

ඔසවා කොළ කැමට පටන්ගත්තේය. එකෙණෙහි ම ඒ ගල මතුපිටට හෙණයක් වැටිණි. එයින් එක් ගල් පතුරක් ගැළවී බැටළුවාගේ එසවූ ගෙල මත වැටී හිස සිඳී ගියේය. මහජනයා රැස්වූහ. එදවස බෝසත්හු එහි රුක් දෙවියෙක් ව උපන්හ. ඔහු මහජනයා බලා සිටිද්දී ම දේවානුභාවයෙන් අහසෙහි පළඟින් හිඳ මේ සත්ත්වයන් මෙසේ පව් එලවිපාක දැන පර පණ නැසීමක් නො කරන්නේ නම් මැනැවැ යි මිහිරි ස්වරයෙන් දම් දෙසමින් මේ ගාථාව කීහ.

**"එවං චෙ සත්තා ජානෙය්‍යුං දුක්ඛායං ජාති සම්භවො**
**න පාණො පාණිනං හඤ්ඤෙ පාණඝාතී හි සොචතී ති"**

"ඉදින් සත්ත්වයෝ මේ ආකාරයෙන් ඉපදීම හා වර්ධනය දුකයැ යි ද ප්‍රාණඝාතී පුද්ගලයා ශෝක කරන්නේයැ යි ද දන්නාහු නම් ප්‍රාණීන්ගේ ප්‍රාණය නැති නො කරන්නාහුය."

එහි "**එවං චෙ සත්තා ජානෙය්‍යුං**" යි මේ සත්ත්වයෝ මෙසේ දන්නාහු නම්, කෙසේ ද ? "**දුක්ඛායං ජාති සම්භවො**" යනු ඒ ඒ තැන්වල ඉපදීම ද උපන්නාහට වැඩීම නම් වූ සම්භවය ද මහලුවීම, ලෙඩවීම, මරණය, අකැමැති අය හා එක්වීම, ප්‍රියයන්ගෙන් වෙන්වීම, අත්පා සිඳීම් ආදී වූ දුක්වලට හේතු බැවින් ජාතිය දුකක්යැ යි දන්නාහු නම් "**න පාණො පාණිනං හඤ්ඤෙ**" මෙරමාහට ශාරීරික වද දෙන්නේ සත්ත්වයකු සත්ත්වයකු නො මරන්නේ යන අර්ථයි. කවර හෙයින් ද යත්, "**පාණඝාතී හි සොචතී**" යනු යම්හෙයකින් තමා අතින් මැරීම ආදී සවැදෑරුම් උපක්‍රමයකින් මෙරමා දිවිපෙවෙත සිඳ දමන පුද්ගලයා අටමහ නිරයෙහි ද සොළොස් උස්සද නම් පරිවාර නිරයන්හි ද විවිධාකාර තිරිසන් සත්ත්ව ගණයෙහි ද ප්‍රේත ලෝකයෙහි ද අසුර ලෝකයෙහි ද යන මේ සතර අපායන්හි මහත් දුක් විඳිමින් බොහෝ කාලයක්, ඇතුළත පැසෙන ලක්‍ෂණය වූ ශෝකයෙන් ශෝක කරයි. යම් සේ මේ බැටළුවා මරණ බියෙන් ශෝක කළේ ද එමෙන් බොහෝ කලක් ශෝක කරත්. දැනදැන කිසිම සතෙක් අන් සතකු නො නසන්නෝය. පාණාතිපාත කර්මය නො කරන්නෝය. මෝහයෙන් මුලාවූවෝ අවිදූ අඳුරින් අන්ධවූවෝ මේ අදීනවය නො දැන පරපණ නසත්.

මෙසේ බෝසත්හු අපාය බයින් තැතිගන්වා දහම් දෙසූහ. මිනිස්සු ඒ දම් දෙසුම අසා අපා බයින් තැති ගෙන පර පණ නැසීමෙන් වැළකුණහ. බෝසත්හු ද දම් දෙසා මහජනයා සීලයෙහි පිහිටුවා කම් වූ පරිදි මියපරලොව ගියෝය. මහජනයා ද බෝසතුන්ගේ අවවාදයෙහි පිහිටා දානාදී පින්කම් කොට දෙව්ලොව පිරවූහ. බුදුරදාණෝ මේ දම් දෙසුම ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා ජාතකය නිමවූහ. මම ඒ කාලයෙහි රුක්දෙව් වීමි.

## 1. 2. 9.

## ආයාචිතභත්ත ජාතකය

"සචෙ මුඤ්චෙ" යන මේ ජාතකය බුදුරදහු දෙව්රම් වෙහෙර වසමින් දේව කන්නලව් බිලි පූජාවක් අරබයා දේශනා කළහ. එදවස මිනිස්සු වෙළදාම් පිණිස යන්නාහු, සතුන් මරා දෙවියන්ට බලිපූජා කොට අපි අනතුරක් නැතිව බලාපොරොත්තු ඉටුකර ගෙන අවුත් නැවත ඔබට බලිපූජාවක් කරන්නෙමු යි භාරහාර වී යත්. අනතුරක් නැතිව අර්ථ සිද්ධියට පත්ව ආවාහු, දේවානුභාවයෙන් මෙය සිදුවූයේයැ යි පිළිගන්නාහු, බොහෝ සතුන් මරා භාරයෙන් මිදීම සඳහා බලිපූජා කරත්. භික්ෂූහු ඒ දැක ස්වාමීනි, මෙයින් යහපතක් ඇත්දැ යි බුදුරදුන්ගෙන් ඇසූහ. උන්වහන්සේ අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර කසීරට එක් කුඩා ගමක කෙළෙඹියෙක් ගම්දොර තිබුණු නුග රුකෙහි දෙවියාට බලිපූජාවක් කරන බවට පොරොන්දු වී අනතුරකින් තොරව අවුත් බොහෝ සතුන් මරා භාරයෙන් මිදෙන්නෙමියැ යි රුක් මුලට ගියේය. රුක්දෙවියා ගස් දෙබලෙහි සිට මේ ගාථාව කීය.

**"සචෙ මුඤ්චෙ පෙච්ච මුඤ්චෙ මුච්චමානො හි බජ්ඣති**
**නහෙවං ධීරා මුච්චන්ති මුත්ති බාලස්ස බන්ධනන්ති"**

"මිදෙනු කැමැත්තේ නම් පරලොවින් මිදින්නේය.
මිදුණෝද බැඳෙයි. නුවණැත්තෝ එ සේ නො මිදෙත්.
මොඩයාගේ මිදීම බැඳිමකි."

එහි **"සචෙ මුඤ්චෙ පෙච්ච මුඤ්චෙ"** පින්වත් පුරුෂය, ඉදින් ඔබ මිදෙනු කැමැත්තේ නම් පරලොවින් මිදෙන්නේය. පරලොවින් බැඳෙන්නේ නම් **"මුඤ්චමානො හි බජ්ඣති"** ඔබ මෙසේ සතුන් මරමින් මිදෙන්න කැමැති නම්, එ සේ මිදෙන්නේ ද පවින් බැඳේ. එනිසා **"නහෙවං ධීරා මුච්චන්ති"** නුවණැත්තේ ගිවිසුමෙන් මෙසේ නො මිදෙත්. කවර හෙයින් ද යත් **"මුත්ති බාලස්ස බන්ධනන්ති"** මේ සතුන් මැරීම කොටමිදීම නම් නුවණ නැත්තන්ගේ බැඳීම ම වේයැ යි දහම් දෙසීය.

එතැන් පටන් මිනිස්සු මෙබඳු පාණාතිපාත කර්මයෙන් මිදී ධර්මයෙහි හැසිර දේව නගරය පිරවූහ. බුදුරදහු මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා ජාතකය නිමවූහ. මම එසමයෙහි රුක්දෙවියා වීමි.

## 1. 2. 10.

## නළපාණ ජාතකය

**"දිස්වා පදමනුත්තිණ්ණං"** යන මේ ජාතක දේශනාව බුදුරදහු කොසල් දනව්වෙහි චාරිකාවෙහි වඩින්නාහු නළකපාන නම් ගමට වැඩ නළකපාණ පොකුණ අසබඩ දුනුකේ වනයෙහි වැඩවසන සේක් බටදඬු අරබයා වදාළහ. එදවස භික්ෂූහු නළකපාණ පොකුණින් නා ඉඳිකුලා (ඉඳිකටු දමන පෙට්ටිය) සඳහා හෙරණුන් ලවා බට දඬු

ගෙන්වාගෙන ඒවා මුල සිට අගට එක ම සිදුරක් බව දැක බුදුරදුන් වෙත එළඹ ස්වාමීනි, අපි ඉදිකුලා සඳහා බටදඬු ගෙන්වා ගතිමු. ඒවා මුලසිට අගට එකම සිදුරක් ඇත්තේය. මේ කිමෙක්ද යි විමසූහ. මහණෙනි, පෙර බවයක මගේ අධිෂ්ඨානයකැ යි අතීත කථාව ගෙනහැර දක්වූහ.

පෙර ඒ වන ළැහැබ ඝන වනාන්තරයක් විය. මේ පොකුණෙහි හිඳිනා ජල රකුසෙක් බට බට ප්‍රානීන් කයි. එදවස බෝසත්හු හෝලු මුවෙක් පමණ වඳුරු රජෙක් ව අසූදහසක් පමණ වඳුරන් පිරිවරණ ලදුව රැළ රැක ගනිමින් ඒ වනයෙහි වෙසෙයි. ඔහු වඳුරු රැළට අවවාද දුන්නේය. දරුවනි, මේ වනයෙහි විස සහිත ගස් ද අමනුස්සයන් අරක්ගත් පොකුණු ද ඇත. තොපි පෙර නො කැවිරූ ගෙඩි කන්නාහු නම් හෝ පෙර නො පීවිරූ ජලය බොන්නාහු නම් හෝ මගෙන් විමසනු. ඔවුහු ද මැනවැ යි පිළිගෙන, පෙර නො ගිය පෙදෙසකට ගියහ. ඔවුහු දවසෙහි බොහෝ වේලාවක් ඔබ්මොබ හැසිර ජලය සොයන්නාහු එක් පොකුණක් දැක පැන් නො බී බෝසතුන්ගේ පැමිණීම බලමින් හුන්හ. බෝසත්හු පැමිණ දරුවනි, තොපි පැන් නො බොන්නාහද යි ඇසූහ. අපි ඔබතුමන්ගේ පැමිණීම බලමින් සිටියෙමු යි කීහ. මැනවි දරුවනි. බෝසත්හු පොකුණ සිසාරා බලා පොකුණට බට පිය මිස නැගි පිය නො දුටහ. ඒකාන්තයෙන් මේ පොකුණ අමනුස්ස අධිගෘහිතයැ යි දැන දරුවනි, පැන් නො බීමෙන් තොප කළ දේ මැනවි. මෙහි නම් අමනුෂ්‍යය අධිගෘහිතය.

දියරකුසා ද ඔවුන් පොකුණට නො බස්නා බව දැක නිල්වන් බඩ, සුදු මුහුණ හා රන්වන් අත්පා ඇතිව පිළිකුල් දැකුමෙන් යුතුව දිය දෙබෑකොට පිටතට අවුත් බලා සිටින්නේ ඇයි ? පොකුණට බැස පැන් බොවු යි කීය. ඉක්බිති බෝසත්හු, මෙසේ ඇසූහ. ඔබ මෙහි උපන් ජල රකුසා ද ? එ සේය. මෙහි බට කුඩා කුරුල්ලකුගේ සිට කිසිවකු නො මුදමි. තොප හැම දෙනකු මම කන්නෙමි. බෝසත්හු, අපි කෑමට නො දෙමු. එ සේ නම් පැන් නො බොන්නේ ද ? පැන් ද බොන්නෙමු. එහෙත් ඔබගේ වසඟයට නො ගන්නෙමු. එ සේ නම් පැන් බොන්නේ කෙසේ ද ? පොකුණට බැස පැන් බොතැ යි ඔබ සිතුවෙහි ද ? අපි අසූදහස ම පොකුණට නො බැස එක් එක් බටදඬුවක් ගෙන උපුල් නළයකින් පැන් උරා බොන්නාක් මෙන්

ඔබගේ පොකුණින් පැන් බොන්නෙමු. එවිට අප ඔබට කැමට නො හැක්කේයැ යි දැන බෝසත්හු බුදු වී මේ ගාථාවෙහි පළමු පද දෙක වදාළහ.

"දිස්වා පද මනුත්තිණ්ණං දිස්වා නොතරිතං පදං
නළෙන වාරිං පිවිස්සාම නෙ ව මං ත්වං වධිස්සසීති"

පොකුණින් නො නැගුණු පිය සටහන් දැක දියට බට පිය සටහන් දැක මම බට නළයෙන් පැන් බොමි. ඔබ මා නෙ නසන්නෙහිය.

මෙහි අර්ථය නම් : මහණෙනි, ඒ වඳුරු රජ ඒ පොකුණෙන් ගොඩ නැගීමක් පිය සටහනක් නුදුටුවේය. ජලයට බසින පිය ම දැක්කේය. මෙසේ බට පිය දැක නැගි පිය නො දැක මේ පොකුණ ඒකාන්තයෙන් අමනුෂ්‍යයන් අරක්ගත් බව දැන ඔවුහු සමග කථා කරමින් වඳුරු පිරිස සමග ම මෙසේ කීය. "නළෙන වාරිං පිවිස්සාමා" මෙහි අර්ථය නම් අපි ඔබගේ පොකුණෙන් බට දඬුවෙන් පැන් බොන්නෙමු. නැවත බෝසත්හු ම කීහ. "නෙ ව මං ත්වං වධිස්සසීති" මෙසේ නළයෙන් පැන්බොන පිරිස සහිත මා නො නසන්නේය යන අර්ථයයි.

ඉක්බිති, බෝසත්හු මෙසේ කීහ. එක් බට දඬුවක් ගෙන්වා පාරමී සිහිකොට සත්‍යය ක්‍රියාකොට පිම්බේය. ඇතුළත සියලු ගැට නැතිවී එක ම සිදුරක් විය. මෙනයින් නැවත නැවත ගෙන්වාගෙන පිඹ පිඹ දුන්නේය. මෙසේ ඇතිකල කෙළවරක් කළ නො හැකි විය. ඒ නිසා මෙසේ නො ගත යුතුය. බෝසත්හු පොකුණ වට හටගත් සියලු බට එක සිදුරක් වේවා යි අධිෂ්ඨාන කළහ. බෝසතුන්ගේ පරහිතකාමී බව මහත් බැවින් අධිෂ්ටානය සඵල වේ. එතැන් පටන් පොකුණ වටා හටගත් සියලු බට එක ම සිදුරු ඇත්තේ විය.

මේ කල්පයෙහි කල්පය පවතින පෙළහර සතරකි. ඒ කවරේ ද යත්, සඳෙහි සස ලකුණ මේ මුළු කප ම සිටී. වට්ටක ජාතකයෙහි ගිනි නිමුණු තැන, මෙකප ගින්නෙන් නො දැවෙන්නේය. සවීකාර

ගෘහය මේ මුළු කප ම නො තෙමී සිටී. මේ පොකුණ වටා හටගන්නා බට එක් සිදුරක් වන්නේය. මේ කප පුරා පවතින පෙළහර සතරයි. බෝසත්හු මෙසේ අධිෂ්ඨාන කොට එක් නළයක් ගෙන හිඳගත්හ. අනෙක් අසූදහසක් වඳුරෝ ද එක එක බටය ගෙන පොකුණ වටා හුන්හ. බෝසතුන් බට නළයෙන් පැන් උරාබොන කල්හි සියලු වඳුරෝ ඉවුරෙහි හිඳ ම බීහ. මෙසේ ඔවුන් පැන් බී කල්හි, දියරකුසා කිසිවක් නො ලැබ නො සතුටු ව සිය නිවසට ම ගියේය. බෝසත්හු ද පිරිවර සහිතව වනයට ම පිවිසියෝය.

බුදු රජහු මහණෙනි, මේ බට ගස්වල එක් සිදුරක් වීම මගේ ම පැරණි අධිෂ්ඨානයෙකැ යි මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා ජාතකය නිමවූහ. එදා දියරකුසා දෙව්දත් විය. අසූදහසක් වඳුරු පිරිස මෙදා බුදුපිරිසය. උපායෙහි දක්ෂ වඳුරු රජ වනාහි මම ම වීමි.

## දෙවැනි ශීල වර්ගයයි.

## 1. 3. 1.

## කුරුඞ්ගමිග ජාතකය

"ඤාතමෙතං කුරුඞගසසාති" යන මේ දම් දෙසුම බුදු රජුන් වේළුවනයෙහි වැඩවසමින් දෙව්දත් අරබයා දේශනා කළහ. එක් සමයෙක්හි දම්සබාවට රැස්වූ භික්ෂූහු ඇවැත්නි, දෙව්දත් බුදුන් නසනු පිණිස දුනුවායන් යෙදවීය. ගලක් පෙරළීය. ධනපාල ඇත් විහිදවීය. හැම අයුරින් ම බුදු රදුන් නැසීම සඳහා උපක්‍රම කෙරේ යි දෙව්දත්ගේ නුගුණ කියමින් හුන්හ. බුදුරදුන් වැඩ පනවනලද අසුනෙහි වැඩහුන් සේක්, මහණෙනි, දැන් කවර කථාවකින් හුන්නාහුදැ යි විචාළ සේක. ස්වාමීනි, දෙව්දත් ඔබවහන්සේ නැසීමට උපක්‍රම කරයි. ඔහුගේ නුගුණ කථාකරමින් හුන්නෙමු. මහණෙනි, දෙව්දත් මා නැසීමට උපක්‍රම කරන්නේ දැන් පමණක් නො වේ. පෙරත් කළේය. එහෙත් නසන්න නො හැකි වීයැ යි ඉකුත් වත ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරන කල්හි බෝසතාණෝ තිත්මුවෙක්ව එක් වනයක ගෙඩි කමින් වෙසෙයි. එක් කලෙක ඔහු ජලයෙන් පිරුණු ඇත්දෙමට ගසක ගෙඩි කයි. එකල ගම්වැසි, අටළුවල සතුන් මරන වැද්දෙක් ගෙඩි ඇති ගස්මුල්වල මුවන්ගේ පියසටහන් පිරික්ෂා කොට ගස මත අටල්ලක් බැඳ එහි හිඳ ගෙඩි කෑමට ආ මුවන් අඩයටියෙන් විද ඔවුන්ගේ මස් විකුණමින් ජීවිකාව කළේය. දිනක් ඔහු ඒ ගසමුල බෝසතුන්ගේ පා සලකුණු දැක ඒ දෙමට ගසෙහි අටල්ලක් බැද උදෙන් ම කා අඩයටිය ගෙන වනයට පිවිස ඒ ගසට නැඟී අටල්ලෙහි හුන්නේය. බෝසත්හු ද අලුයම වසන තැනින් නික්ම දෙමට ගෙඩි කන්නෙමි යි අවුත් වහා ම රුක්මුලට නො පිවිස අටළු වැද්දෝ ගස්වල අටළු බඳිත්. එවැනි අනතුරක් ඇත්දැ යි විමසමින් පිටත සිටියේය. වැද්දා බෝසතුන් නො එන බව දැන අටල්ලෙහි හුන්නේ දෙමටගෙඩි කඩා ඔහු ඉදිරියෙහි හෙලුවේය. එවිට බෝසතුන්, මේ ගෙඩි අවුත් මා ඉදිරියෙහි වැටෙයි. ගස උඩ වැද්දකු සිටීදැ යි නැවත උඩ බලන්නාහු, වැද්දා දැක නො දුටුවාක් මෙන් සිට එම්බා ගස, පෙර තෝ ලඹය හෙලන්නාක් මෙන් එක එල්ලේ ගෙඩි හෙලුවේය. අද තෝ ගසෙහි රුක් දහම අත්හළෙහිය. මෙසේ තා විසින් රුක් දහම අත්හළ කල්හි

මම අන් ගසක් මුලට එළඹ මගේ අහර සොයා ගන්නෙමි යි කියා මේ ගාථාව කීවේය.

"ඤාතමෙතං කුරඞ්ගස්ස යං ත්වං සෙපණ්ණි සෙය්‍යසි
අඤ්ඤං සෙපණ්ණිං ගච්ඡාමි න මෙ තෙ රුච්චතෙ ඵලන්ති"

"එම්බා දෙමට ගස, තෝ යම් කරුණකින් ඉදිරියට ගෙඩි විසුරවන්නෙහි ද, ඒ කාරණය තිත් මුවාට පැහැදිලිය. මම වෙනත් දෙමට ගසක් වෙත යමි. තගේ ගෙඩි මට රුචි නො වේ."

එහි "ඤාතං" ප්‍රකට විය, "එතං" මේ කරුණ, "කුරුඞ්ගස්ස" තිත්මුවා හට, "යං ත්වං සෙපණ්ණි සෙය්‍යසි" එම්බල දෙමට ගස, තෝ පෙරට ගෙඩි විසුරුවන්නෙහිය, වඩා වඩාත් විසුරුවන්නෙහි ද ? මේ කරුණු සියල්ල තිත්මුවාට ප්‍රකට විය, "න මෙ තෙ රුච්චතෙ ඵලන්ති" මෙසේ ගෙඩි දෙන කල්හි තගේ ගෙඩි මට රුචි නො වේ. තෝ සිටු මම වෙන තැනකට යන්නෙමි යි, ගියේය.

ඉක්බිති, වැද්දා අටල්ලෙහි සිට ම අඩයවිය දමා ගසා යව, එය වරදාවා ගනිමි යි කීය. බෝසත්හු නැවතී සිටි කීහ. එම්බා පුරුෂය, දූන් තට වැරදුනා විය හැකිය. තට අට මහ නිරය, සොළොස් පිරිවාර නිරය හා පස් වැදෑරුම් බැඳුම් ද හා දුක් කම්කටුළු ද නො වරදින්නේමැ යි කියා පලා ගොස් කැමැති පරිදි ගියේය. වැද්දා ද බැස කැමැති සේ ගියේය.

මහණෙනි, දෙව්දත් මා නැසීමට තැත් කරනුයේ දූන් පමණක් නො වේ. පෙර ද තැත් කළේය. නැසීමට නො හැකි වීයැ යි මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා ජාතක කථාව නිමවූහ. එදා අටළු වැද්දා නම් දෙව්දත්ය. තිත් මුවා නම් මම ම වීමි.

## 1. 3. 2.

# කුක්කුර ජාතකය

**"යෙ කුක්කුරාති"** යන මේ ජාතක දේශනාව බුදුරදුන් දෙව්රම් වෙහෙරෙහි වසන සේක්, ඤාති සංග්‍රහය අරබයා දෙසූහ. එය දොළොස් වැනි නිපාතයෙහි භද්‍රසාල ජාතකයෙහි එන්නේය. ඒ කථා පුවත පදනම් කොට අතීත කථාව ගෙනහැර දක්වූහ.

පෙර බරණැස බඹදත් රජු රාජ්‍යය කැරවන කල්හි බෝසතාණෝ එබඳු කර්මයක් නිසා සුනඛ යෝනියෙහි ඉපිද නොයෙක් සිය ගණන් සුනඛයන් පිරිවරා මහ සොහොන් බිමෙහි වසත්. ඉක්බිති එක් දවසක් රජ සුදු සෛන්ධව අසුන් යෙදූ සියලු අලංකාරයෙන් යුත් රථයට නැඟී උයනට ගොස් දවල් කාලය එහි ක්‍රීඩා කොට හිරු බැස යන කල්හි නුවරට පිවිසියේය. රජුගේ රථය වරමඳු රැහැන් සමග බැඳුණු ලෙසින් ම රජ මිදුලෙහි තිබිණි. එදින රැයෙහි වැසිවට කල්හි රථය තෙමිණි. උඩුමහලෙහි සිටි උසස් ගණයෙහි සුනඛයෝ බැස අවුත් රථයෙහි සම් ද රැහැන් ද කෑහ. දෙවන දවස්හි රජුට සැල කළහ. දේවයනි, වතුර නික්මෙන කාණුවෙන් සුනඛයෝ අවුත් රථයෙහි සම් ද රැහැන් ද කෑහ. රජ සුනඛයන්ට කිපී දුටු දුටු තැන සුනඛයන් මරවු යි කීය. මරනු ලබන්නා සොහොනට ගොස් බෝසතුන් සමීපයට ගියහ. බෝසත්හු උඹලා බොහෝ දෙනෙක් රැස්වූයේ කුමන කරුණක් නිසාදැ යි විමසූහ. නගරය ඇතුළත සුනඛයන් විසින් සම් රැහැන් කන ලද බැවින් කිපුණු රජ සුනඛ වධය පැනවීය. බොහෝ සුනඛයෝ විනාශයට පත්වෙති. මහත් බයක් උපන් බව කීහ. බෝසතාණෝ සිතූහ. රැකවරණ යොදා ඇති පෙදෙසින් පිටත සුනඛයන්ට ඉඩක් නැත. රජමැදුර තුළ කොලෙය්‍යක (වංසවත්) සුනඛයන්ගේ ක්‍රියාවක් වන්නේය. දූන් සොරුන්ට කිසිවක් නැත. නො සොරු මරණය ලබත්. මම හොරුන් රජුට පෙන්වා මගේ නෑ පිරිසට ජීවිත දානය දෙන්නේ නම් මැනවි යි හේ බෝසත් ඤාතීන් අස්වසා ඔබලා බය නො වෙනු. මම ඔබ හැමට අභය ගෙන එන්නෙමි යි රජු හමුවන තුරු මෙහිම සිටිවූ යි පෙරුම් දම් සිහිකොට මෛත්‍රී භාවනාව පෙරදැරි කොට මා මතට ගල්මුගුරු හෙළීමට කිසිවෙක් උත්සාහ නො කරත්වා යි අධිෂ්ඨාන

කොට හුදකලාව ඇතුළු නුවරට පිවිසියහ. බෝසතුන් දක කිසිවකු කිපී බලන්නේ පමණකුදු නො වීය. රජ සුනඛ ඝාතනය අණ කොට තෙමේ විනිසුරු අසුනෙහි හුන්නේ විය. බෝසත්හු එතැනට ම ගොස් පැන රජුගේ අසුන යටට ගියහ. ඉක්බිති රාජ පුරුෂයෝ ඔහු බැහැර කිරීමට උත්සාහ කළහ. රජ ඒ වැළකීය. බෝසත්හු මඳ වේලාවක් ගිමන් හැර අසුන යටින් එළියට අවුත් රජුන් වැඳ ඔබ වහන්සේ සුනඛයන් මරවන්නේද යි ඇසූහ. එ සේය. මම වෙමි. මහරජ ඔවුන්ගේ වරද කුමක් ද ? සුනඛයෝ මාගේ රථයෙහි සම් සහ රැ හැන් කැවාහුය. මහරජ කෑ සුනඛයන් ඔබ දන්නේ ද ? නො දනිමි. දේවයිනි. සම් කෑ සොරුන් හරිහැටි නො දන ම දුටු දුටු තැන සුනඛයන් මරා දැමීම සුදුසු නො වේ. රියෙහි සම් සුනඛයන් විසින් කන ලද බැවින් දුටු දුටු තැන සුනඛයන් මරව යි සුනඛ වධය පැනවීමි. ඔබතුමාගේ මිනිස්සු සියලු සුනඛයන් මරත් ද ? නැතහොත් මරණය නො ලබන්නෝත් ඇත් ද ? එසේ ඇත. අප රජ මැඳුරෙහි කුලවත් සුනඛයෝ මරණය නො ලබත්. මහරජ. දන් සුනඛයන් රථ සම් කෑ නිසා සියලු ම සුනඛයින්ට මරණ වධය පැනවූ බව කීවා නො වේ ද ? දන් ඔබ අප ගෙදර කුලවත් සුනඛයන් මරණය නො ලබන බව කියයි. එ සේ නම් එය ඡන්ද ආදී වශයෙන් නො මඟ යෑමක් නො වේ ද ? අගති ගමන වනාහි යුක්ති සහගත නො වේ. රාජ ධර්මයක් ද නො වේ. හේතු සොයන්නකු විසින් තුලාවක් මෙන් වීම වටී. දන් කුලවත් සුනඛයෝ මරණය නො ලබත්. දුබල සුනඛයෝ ලබත්. මෙසේ ඇතිකල මේ සියලු සුනඛ ඝාතනයක් නො වේ. දුර්වලයන් ඝාතනයකි. මෙසේ පැවසූ බෝසත්හු මිහිරි ස්වරය පතුරමින් මහරජ ඔබ යමක් කරයි නම් එය දහමක් නො වේ යි රජුට දම් දෙසමින් මේ ගාථාව කීහ.

"යෙ කුක්කුරා රාජකුලම්හි වද්ධා
කොලෙය්‍යකා වණ්ණබලූපපන්නා
තෙමෙ න වජ්ඣා මයමස්ම වජ්ඣා
නායං සඝච්චා දුබ්බලඝාතිකායන්ති"

"රජ කුලයෙහි වැඩුණා වූ එහෙයින් ම කුලවත් වූ හැඩරුවින් හා කාය බලයෙන් යුත් යම් ඒ සුනඛයෝ වෙත් ද ඔවුහු මා විසින් නො නැසිය යුත්තෝය. අපි

ම නැසිය යුත්තෝ වෙමු. මේ සාධාරණ ඝාතනයක් නො වේ. දුර්වලයන් ඝාතනය කිරීමකි."

එහි, "**යෙ කුක්කුරා**" සුනඛයෝය. මුත්‍ර දහර උණුසුම් වුව ද ප්‍රතිමුත්ත කුණු මුත්‍රමය. එදවස උපන් හිවලා ද මහළු සිවල්ලුය. මොළොක්වූ රසකිඳ වැල ප්‍රතිලතා කුණුවැලය. රන්වන් වූ සිරුර කුණු කය යි කියති. එමෙන් සියවස් වූද සුනඛයා බල්ලෙකැ යි කියනු ලැබේ. එම නිසා මහළු වූ කාය බලයෙන් යුක්ත වු ද ඒ කුලවත් සුනඛයන් බල්ලන් නමින් හැඳින්විණි. "**වඩ්ඪා**" වැඩුණාවූ, "**කොලෙය්‍යකා**" රජකුලයෙහි උපන්, "**වණ්ණ බලූපපන්නා**" සිරුරු පැහැයෙන් ද කාය බලයෙන් ද යුත්, "**තෙමෙ න වජ්ඣා**" ඒ මේ හිමිකරුවන් ඇති ආරක්ෂා සහිත සුනඛයෝ නො නැසිය යුත්තෝය. "**මයමස්ම වජ්ඣා**" හිමිකරුවන් නැති ආරක්ෂා රහිත අපි නැසිය යුත්තෝ වෙමු. "**නායං සඝච්චා**" එ සේ ඇති කල්හි අවිභේදයෙන් සාධාරණ ඝාතනයක් නම් නො වේ. "**දුබ්බලඝාතිකායන්ත**" මේ ඝාතනය වනාහි දුබලයන් ම නසන හෙයින් දුබලයන් නැසීමකි. රජවරුන් විසින් සොරුන්ට දඬුවම්දිය යුතුය. නො සොරුන්ට නො වේ. මෙහි දී නියම සොරුන්ට කිසිවක් නැත. නො සොරු මරණය ලබත්. අනේ ලොව අසාධාරණය පවතී. අනේ අධර්මය පවතී.

බෝසතුන්ගේ වදන් අසා රජ මෙසේ කීය. පණ්ඩිතුමනි, අසවලුන් විසින් රථ සම් කන ලදැ යි ඔබ දන්නහු ද ? එ සේය, මම දනිමි. කවරුන් විසින් කන ලද ද ? මහරජ, ඔබගේ රජ මැදුරෙහි වෙසෙන කුලවත් සුනඛයන් විසිනි. ඔවුන් විසින් කන ලද බව අපි කෙසේ දතයුතු ද ? මම ඔවුන් විසින් කන ලද බව පෙන්වන්නෙමි. පෙන්වනු මැනවි පණ්ඩිතුමනි. මහරජ ඔබ ගෙහි කුලවත් සුනඛයන් ගෙන ඒමට අණ කොට කිරිමෝරු සුඟක් හා ඊතණ ගෙන්වනු මැනවි. රජ එ සේ කළේය. බෝසත්හු කිරිමෝරු හා ඊතණ එකට කොටා මේ සුනඛයින්ට පොවන්නැ යි රජුට කීහ. රජ එ සේ කොට පෙවීය. සුනඛයෝ සම් කැබලි සමග වමනය කළහ. රජ සියල්ලදත් බුදුවරයකුගේ ප්‍රකාශයක් මෙනැ යි. ඉතා සතුටු ව බෝසතුන්ට සේසතින් පිදීය. බෝසත්හු කාලත්‍රිය මහරජ, ඔබ දෙමාපියන් කෙරෙහි ධර්මයෙන් හැසිරෙන්න. ආදී තේසකුණ ජාතකයෙහි එන ධම්මචරිය ගාථා දහයකින් රජුට දම් දෙසා මහරජ, මෙතැන්පටන් අප්‍රමාද වන්නැ

යි රජු පන්සිල්හි පිහිටුවා සේසත රජුට ම ආපසු දුන්හ.

රජ බෝසතුන්ගේ බණ අසා සියලු සතුන්ට ජීවිත දානය දී බෝසතුන් ආදී කොට ඇති සුනඛයන්ට තමාගේ බොජුන් හා සමානවූ නිති බත් පිහිටුවා බෝසතුන්ගේ අවවාදයෙහි පිහිටා දිවි ඇතිතාක් දානාදී පින් කොට කලුරිය කොට දෙව්ලොව උපන්නේය. මේ කුක්කුරෝවාදය දසදහසක් අවුරුදු පැවැතියේය. බෝසත්හු ද දිවි ඇති තෙක් සිට කම් වූ පරිදි මිය පරලොව ගියහ. මහණෙනි, තථාගත තෙමේ ඤාති සංග්‍රහය කළේ දැන් පමණක් නො වේ. පෙර ද කළේයැ යි මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා ජාතකය නිමවූහ. එකල රජ ආනන්ද තෙරුණුවෝය. ඉතිරි පිරිස බුදු පිරිස මය. සුනඛයා මම ම වීමි.

## 1. 3. 3.

## භෝජාජානීය ජාතකය

"අපි පස්සෙන සෙමානො" යන මේ ජාතකය බුදුරදුන් දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, අත්හළ වීර්යය ඇති භික්‍ෂුවකු අරබයා දෙසූහ. එකල්හි බුදුරදහු ඒ භික්‍ෂුව අමතා මහණ, පෙර නුවණැත්තෝ අස්ථානෙහි පවා වීර්යය කළහ. පහර ලැබුවාහු ද පසු නො බැස්සහ යි අතීත කථාව ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු භෝජාජානීය සෛන්ධව කුලයෙහි ඉපිද සියලු අබරණින් යුතුව රජුගේ මංගල අශ්වයා විය. ඔහු ලක්‍ෂයක් වටිනා රන් තැටියෙහි නොයෙක් අග්‍ර රසයෙන් යුත් තුන් වස ඇල් සහලේ බොජුන් අනුභව කරයි. සිව් ගන්ධයන්ගෙන් පිරිමදින ලද බිම සිටියි. ඒ පෙදෙස රත් පළස් තිරයකින් වට කරන ලද්දේය. උඩ, රනින් කැටයම් කළ රෙදි වියනකි. එල්ලෙන සුවඳ මල් දම් ඇත්තේය. ඉවත් නො කළ සුවඳ තෙලින් දල්වෙන පහන් ඇත. බරණැස් රාජ්‍යය නො පතන කිසි ම රජකු

නැත. එක් කලෙක සත් රජවරු බරණැස වටකොට රාජ්‍යය අපට දෙනු, නැත්නම් යුද්ධ කරනු යි, බරණැස් රජුට අසුන්පත් යැවූහ. රජ ඇමැතියන් රැස් කරවා එපුවත කියා දරුවනි, දැන් කුමක් කරමුද යි විචාළේය. දේවයිනි, පළමුකොට ඔබතුමා යුද්ධයට නො යා යුතුය. අසවල් නම් ඇති අසරුවා යවා යුද්ධ කරවනු මැනවි. ඔහුට නො හැකි වුවහොත් පසුව දැන ගන්නෙමු යි රජ ඒ අසරුවා ගෙන්වා දරුව, සත් රජුන් සමග යුද්ධ කරන්න හැකිද යි ඇසීය. දේවයිනි, භොජාජානීය සෛන්ධවයා ලැබෙන්නේ නම් සත් රජුන් නොව දඹදිව සියලු රජුන් සමග වුව ද යුද්ධ කිරීමට හැකි වන්නෙමි. දරුව, හෝජාජානීය අසු හෝ කැමැති අන් අසකු ගෙන යුද්ධ කරව.

දේවයිනි, මැනවැ යි රජුන් වැඳ පහයෙන් බැස හෝජාජානීය සෛන්ධවයා ගෙන්වා ගෙන මනාකොට සන්නද්ධ ව අශ්වයා පිට නැඟී නගරයෙන් නික්ම විදුලිය මෙන් හැසිරෙමින් පළමු බල කොටුව බිඳ එක් රජකු ජීවග්‍රහනයෙන් ගෙනඅවුත් නුවර බලකායට බාරකොට නැවත ගොස් දෙවැනි බල කොටුව බිඳ දෙවැනියකු ද වශයෙන් පස්වැනි රජුත් ජීවග්‍රහනයෙන් ගෙන සවැනි බල කොටුව බිඳ සවැනි රජු ගත් කල්හි හෝජාජානීය අසු අවි පහරක් ලැබුවේ, ලේ වැගිරේ. වේදනාව බලවත් ව පවතී. අසුරුවා, අසුට පහර ලදබව දැන සෛත්ධවයා රජ දොරටුව අබියෙස හොවා යුද ඇඳුම ලිහිල්කොට වෙනත් අයකු සන්නද්ධ කිරීමට පටන් ගත්තේය. බෝසත්හු පහසු අතට හැරී නිදා සිටියේය. ඇස් ඇර බලන්නේ, අසුරුවා දැක මේ අසරුවා අන් අයකු සන්නද්ධ කරයි. මේ අසු හත්වැනි බල කොටුව බිඳ සත්වැනි රජු ගැනීමට සමත් නො වේ. මා කළ දෙය ද විනාශ වන්නේය. අනෙකකු හට සමාන කළ නො හැකි අසරුවා ද නසින්නේය. රජු ද සතුරන් අතට යන්නේය. මා හැර වෙනත් අශ්වයෙක් සත්වැනි බල කොටුව බිඳ සත්වැනි රජු ගැනීමට සමත් නො වන්නේය. වැද හොත්තේ ම අසුරුවා කැඳවා, යහළුව, සත්වැනි බල කොටුව බිඳ සත්වැනි රජු ගැනීමට මා හැර වෙනත් අශ්වයකු නැත. මම මා කළ දෙය නො නස්වමි. මා ම නැඟිටුවා සන්නද්ධ කරන්නැ යි කියා මේ ගාථාව කීහ.

**"අපි පස්සෙන සෙමානො සල්ලෙහි සල්ලලී කතො,**
**සෙය්‍යොව වළවා භොජ්ජො යුඤ්ජ මඤ්ඤෙව සාරථීති"**

"සිරුර එක්පසකට සිටින සේ නිදන්නේ නමුත් හුල්වලින් විදින ලද්දේ නමුත් වළවා නම් කුඩා අසුන්ට වඩා හොජාජානීය අශ්වයා උතුම්ය. අසරුව, මා ම යුද්ධයට යොදවන්න."

එහි "අපි පසෙසන සෙමානො" එක පසකින් හොත්තේ නමුත් "සලෙලහි සලලලී කතො" හුල්වලින් විදින ලද්දේ නමුදු "සෙයොාව වළවා හොජෙජා" එහි වළවා නම් සින්‍ධව කුලයේ නො උපන් කුඩා අශ්වයෝය. හොජ්ජා නම් හොජාජානීය කුලයෙහි උපන් අශ්වයෝය. හුල්වලින් විදින ලද්දේ නමුත් වෙනත් කුලවල අසුන්ට වඩා සින්‍ධවයා ම උසස්ය. උතුම්ය. "යුඤ්ජ මඤ්ඤෙව සාරථී" මෙබඳු තත්ත්වයේ සිටිය ද මම ම සුදුස්සෙක් වෙමි. ඒ නිසා මා යොදන්න. යුද්ධයට සන්නද්ධ කරන්නැ යි කියයි.

අසරුවා බෝසතුන් නැඟිටුවා වණය බැඳ මනාකොට යුද්ධයට සරසා ඔහුගේ පිට හිඳ සත්වැනි බල කොටුව බිඳ සත්වැනි රජු ජීවග්‍රහනයෙන් ගෙන රාජ බලකායට පාවාදුන්නේය. බෝසත් අසු ද රජ දොරටුව වෙත ගෙන ආවේය. රජ ඔහු දක්නා පිණිස නික්ම වන්නේය. බෝසත්හු රජු අමතා, මහරජ, සත් රජවරුන් නො නසන්න. ගිවිස්වා යවන්න. මට ද අසරුවාට ද දියයුතු සියලු යසඉසුරු අසුරුවාට දෙනු මැනවි. සත්රජුන් අල්ලා දුන් යෝධයා ආරක්ෂා කිරීම සුදුසු වේ. ඔබ ද දන් දෙන්න. සිල් රකින්න. දැහැමින් සෙමෙන් රජ කරන්න. මෙසේ බෝසතුන් රජුට අවවාද දුන්කල්හි අසුගේ සන්නාහය මිදූවේය. සන්නාහය මුදද්දී ම බෝසත්හු මිය ගියහ. රජ අසුගේ සිරුරු කිස අවසන්කොට අසරුවාට බොහෝ සම්පත් දී සත් රජුන් ද මතු තමාට සතුරු නො වන බවට සපථකොට සිය රටවලට ම යවා දැහැමෙන් සෙමෙන් රාජ්‍යයකොට දිවි කෙළවර කම් වූ පරිදි මියපරලොව ගියේය.

මහණ, මෙසේ පෙර නුවණැත්තෝ අස්ථානයෙහි පවා වීර්යය කළහ. මෙබඳු පහර ලැබ ද වීර්යය අත් නො හළහ. ඔබ මෙවැනි නෛසර්ගික ශාසනයෙහි පැවිදි ව මක්නිසා වීර්යය අතහරින්නේදැ යි සිව්සස් දෙසූහ. කෙළවර වීර්යය අතහළ භික්ෂුව රහත් ඵලයෙහි පිහිටියේය. බුදුරදහු මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා අනුසන්ධි

ගළපා ජාතකය නිමවූහ. එකල අසරුවා සැරියුත් තෙරුණුවෝය. රජ ආනන්ද තෙරණුවෝය. භෝජජානීය සෛන්ධවයා මම ම වීමි.

## 1. 3. 4.

## ආජඤ්ඤ ජාතකය

"යදා යදා" යන මේ ජාතකය බුදු රජහු දෙව්රම් වෙහෙර වසන සේක්, වීර්යය අත්හළ භික්ෂුවක් අරබයා දෙසූහ. බුදුරදහු ඒ භික්ෂුව අමතා මහණ, පෙර පඬිවරු අස්ථානගතයෙහි පවා පහර ලැබුව ද වීර්යය කළ හැකියැ යි කියා අතීත කථාව ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කරන කල්හි පෙර පරිද්දෙන් ම සත් රජහු නුවර වට කළහ. ඉක්බිති එක් රථයෙහි සිටි යුද්ධ කරන සෙබළෙක් ඔවුනොවුන් සොහොයුරු වූ අශ්වයන් දෙදෙනෙකු රථයෙහි යොදා නගරෙන් නික්ම බලකොටු සයක් බිඳ රජුන් සයදෙනකු අල්ලාගත්තේය. එකල්හි දෙටු අසු පහරක් ලැබූ හෙයින් සෙබලා රථය යොදා මෙහෙයවමින් රජ දොරටුව ළඟට අවුත් දෙටු සොයුරු රියෙන් මුදවා යුද ඇඳුම ළිහිල්කොට එක පසින් හොවා වෙනත් අසකු සදන්න පටන්ගත්තේය. බෝසත් අසු ඒ දැක පෙර පරිද්දෙන් සිතා රථිකයා කැඳවා වැදහොත්තේ ම මේ ගාථාව කීය.

"යදා යදා යත්ථ යදා යත්ථ යත්ථ යදා යදා
ආජඤ්ඤො කුරුතෙ වෙගං හායන්ති තත්ථ වාළවාහි"

"පෙරවරු ආදී යම් යම් කාලයක මඟ යුදබිම ආදී තැනක යම් මොහොතක යුද බලකොටු ආදී තැනක ආයුධ ප්‍රහාරයක් ලද හෝ නො ලද කල, ආජඤ්ඤ අශ්වයා ම වේග කරයි. වළවා ආදී සෙසු අස්හු පිරිහෙත්."

එහි "යදා යදා" යනු පෙරවරු ආදී යම් කාලයක, "යත්ථ" යි යම් තැනක, මඟෙහි හෝ යුද බිමෙහි හෝ "යදා" යම් මොහොතක, "යත්ථ යත්ථ" සත්ත්ව බලකොටු මෙන් බොහෝ යුදබිම්වල, "යදා යදා" යම් යම් කලෙක පහරක් ලද කල හෝ නො ලද කල, "ආජඤ්ඤො කුරුතෙ වෙගං" රියදුරුගේ සිත් කැමැත්ත දැනගන්නා ස්වභාව ඇත්තේ යන අරුත්හි ආජඤ්ඤ නම් වූ උසස් කුල අසු වේගවත් වේ. වීර්යය අරබයි. "හායන්ති තත්ථ වාළවා" කුලවත් අසු වේගවත් ව ක්‍රියා කරන කල්හි වළව නම් වූ දුබල අශ්වයෝ පිරිහෙත්. එම නිසා මේ රථයෙහි මා යොදව යි කීය. රියදුරු බෝසතුන් නැඟිටුවා රථයෙහි යොදා සත් වැනි බල කොටුව බිඳ සත් වැනි රජු ද ගෙන රිය පදවමින් රජ දොරටුව වෙත අවුත් සෛන්ධවයා මුදාහළේය. බෝසත්හු එක් පසකින් හොවින්නේ පෙර පරිද්දෙන් ම රජුට අවවාද දී මිය ගියහ. රජු අසුගේ මළ සිරුරු කිස කරවා රියදුරුට සම්මානකොට දැහැමින් රාජ්‍යය කරවා කම් වූ පරිදි මිය ගියේය.

බුදුරදහු දම් දෙසුම ගෙනහැර දක්වා සිව්සස් සමග මේ ජාතකය නිමවූහ. එ සේ කෙළවර භික්ෂුව රහත් ඵලයෙහි පිහිටියේය. එකල රජ ආනන්ද තෙරුණුවෝය. අශ්වයා බුදුරදාණෝය.

1. 3. 5.

## තිත්ථ ජාතකය

"අඤ්ඤමඤ්ඤෙහි තිත්ථෙහි" යන මේ දේශනය බුදු රජහු දෙව්රම් වෙහෙර වසන්නාහු, දම් සෙනෙවි හිමිගේ අතවැසි එක් රන්කරු පුතකු වූ භික්ෂුවක් අරබයා වදාළහ. කෙනකුගේ සිතැඟි වෙසෙස් දන්නා නුවණ බුදුවරුන්ට ම වේ. අන් අයට නො වේ. එම නිසා දම් සෙනෙවි සැරියුත් තෙරුණුවෝ තමාට ආසය අනුසය ඥානය නැති බැවින් සිතැඟි නො දැන අසුභ කමටහන ම කියා දුන්හ. එය ඔහුට සුදුසු නො වීය. මක්නිසා ද ? ඔහු වනාහි පිළිවෙළින් ආත්ම පන්සියක් රන්කරු ගෙයක ම පිළිසිඳ ගත්තේය.

ඔහුට මෙසේ බොහෝ කාලයක් රන් දැකීමෙන් හා භාවිතයෙන් අසුභ කමටහන යෝග්‍යය නො වූයේය. ඔහු එහි උපචාර නිමිති මාත්‍රයක් හෝ උපදවා ගනු නො හැකිව සිව් මසක් ගෙවීය. දම් සෙනෙවි තෙරුණුවෝ තම අතවැසි භික්ෂුවට රහත්බව ලබාදීමට නො හැකිව ඒකාන්තයෙන් මොහු බුදුන් විසින් හික්මවිය යුතු අයකු යි බුදුරදුන් වෙත ගෙනයන්නෙමැ යි සිතා අලුයම් වේලෙහි ඔහු ගෙන බුදුරදුන් වෙත වැඩියහ.

බුදුරදහු කිම සාරිපුත්‍රය, එක් භික්ෂුවක් රැගෙන ආවෙහි යි ඇසූහ. ස්වාමීනි, මම මොහුට කමටහන් දුනිමි. සිව් මසකින් නිමිති මාත්‍රයක් හෝ ඉපදවීමට නො හැකි විය. මොහු බුදුරදුන් විසින් හික්ම විය යුතු අයකු යි සිතා බුදුරදුන් වෙත ගෙන එමි. සාරිපුත්‍රය, ඔබ කිනම් කමටහනක් අතවැසි භික්ෂුවට දෙන ලද්දේ ද ? භාග්‍යවතුන් වහන්ස, අසුභ කමටහන දුනිමි. සාරිපුත්‍රය, ඔබගේ සන්තානයෙහි පුද්ගලයන්ගේ හැඟීම්වල විශේෂතා දන්නා ඥාණය නැත. දැන් යන්න. සවස් භාගයෙහි අවුත් ඔබ අතවැසියා රැගෙන යන්න. මෙසේ බුදුරදුන් සැරියුත් තෙරුන් යවා ඒ භික්ෂුවට කැමැති අඳන සිවුර දෙවා ඒ භික්ෂුව සමගම පිඬු පිණිස හැසිර රසවත් කන බොන දේ දෙවා මහසඟන පිරිවරන ලදුව නැවත විහාරයට වැඩමවා ගඳකිළියෙහි දවල් කාලය ගතකොට සවස් කාලයෙහි ඒ භික්ෂුව රැගෙන විහාර චාරිකාවෙහි හැසිරෙමින් අඹ උයනෙහි පොකුණක් මවා එහි නෙළුම් පඳුරක් ද එහි මහත් නෙළුම් මලක් ද මවා මහණ, මේ නෙළුම් මල දෙස බලා හිඳුව යි, ඔහු එහි රඳවා ගඳකිළියට වැඩියහ.

ඒ භික්ෂුව නෙළුම් මල නැවත නැවත බලයි. බුදුරදහු ඒ මල ක්‍රමයෙන් පරවුණු මලක් බවට පත් කළහ. ඔහු බලා සිටියදී ම පරවී විවර්ණ බවට පත්විය. මලෙහි පෙති සියල්ල ද මොහොතකින් වැටිණි. අනතුරුව මල් රේණු ද වැටී මල් කෙමිය පමණක් ඉතිරි විය. භික්ෂුව ඒ බලමින් සිතීය. මේ නෙළුම් මල දැන් ම ඉතා මනහර ලෙස පැවැතියේය. දැකුම්කළු විය. දැන් ඒ වර්ණය වෙනස් විය. පෙති ද රේණු ද වැටිණි. කෙමිය පමණක් ඉතිරි ව තිබේ. මේ පියුම පවා මහළු බවට පැමිණියේය. මගේ ශරීරයට නො එන්නේ ද ?හේතු ප්‍රත්‍යයෙන් හටගත් සියල්ල ම අනිත්‍යයැ යි සිත විදර්ශනාවෙහි පිහිටුවිය. බුදුරදහු ගඳකිලියේ ම වැඩ සිටියේ, ඔහුගේ සිත විදර්ශනාවට නැඟුණු බව දැක ආලෝකයක් විහිදුවා මේ ගාථාව වදාළහ.

"උච්ඡින්ද සිනෙහ මත්තනො කුමුදං සාරදිකං ව පාණිනා
සන්ති මග්ගමෙව බ්‍රෑහය නිබ්බාණං සුගතෙන දෙසිතන්ති"

"මහණ, සරත් කාලයෙහි හටගත් කුමුදු මලක් අතින් කඩන්නාක් මෙන් තමාගේ සිත හා බැඳි ආශාව සිඳ දමන්න. බුදුන් විසින් දෙසන ලද ශාන්ති මාර්ගය නම් වූ නිවන වඩන්න."

ඒ භික්ෂුව ගාථා කෙළවර රහත් බවට පත්ව මම සියලු භවයෙන් මිදුනෙමින් සිතා,

"සො වුත්ථවාසො පරිපුණ්ණ මානසො,
ඛීණාසවො අන්තිමදෙහධාරී,
විසුද්ධසීලො සුසමාහිතින්ද්‍රියො
චන්දො යථා රාහුමුඛා පමුත්තො

සමොතතං මොහ මහන්ධකාරං
විනොදයිං සබ්බමලං අසෙසං,
ආලොකමුප්පජාතකරො පභඞ්කරො
සහස්සරංසී විය භානුමා නභෙති"

"ඒ මම සසුන් බඹසර විසුවෙමි. පිරිපුන් සිත් ඇත්තේ වෙමි. ආශ්‍රව ධර්ම නැති කෙළෙමි. සසර කෙළවර සිරුර දරන්නේ වෙමි. පිරිසුදු සිල් ඇත්තේ වෙමි. සංවර වූ ඉඳුරන් ඇත්තේ වෙමි. රාහු මුඛයෙන් මිදුණු චන්ද්‍රයා මෙන් වීමි.

පැතිරී ගිය මෝහ නැමැති ගනඳුර දුරු කෙළෙමි. ඉතිරි නො කොට සියලු කෙළෙස් මළ දුරු කළෙමි. අහසෙහි ආලෝකය පතුරුවන, පැහැ විහිදුවන සූර්යයා මෙන් බබළමි."

ආදී ගාථාවලින් උදන් ඇනීය. උදන් අනා පළමුකොට ගොස් බුදුරදුන් වැන්දාහ. සැරියුත් තෙරණුවෝ ද පැමිණ බුදුරදුන් වැඳ තම අතවැසි භික්‍ෂුව රැගෙන ගියහ. මේ පුවත භික්‍ෂූන් අතර ප්‍රකට විය. භික්‍ෂූහු දම් සබාවෙහි බුදුරදුන්ගේ ගුණ වණමින් හුන්හ. සැරියුත් තෙරුණුවෝ ආසයානුසය ඥාණය නැති බැවින් තම අතවැසියාගේ සිතැඟි නො දනිති. බුදුහු දන එක දවසින් ම ඔහුට සිව් පිළිසිඹියා සමග රහත්බව දුන්හ. අහෝ බුදුවරු වනාහි මහත් ආනුභාව ඇත්තෝ වෙති.

බුදුරදහු පැමිණ පැනවූ අසුනෙහි වැඩහිඳ මෙහි කවර කථාවකින් හුන්නාහුදැ යි විචාළහ. ස්වාමීනි, වෙනත් කථාවකින් නො වේ. ඔබ වහන්සේගේ ම දම් සෙනෙවි ඥාණය පිළිබඳ කථාවෙනි. මහණෙනි, මා දූන් සම්බුදු ව ඔහුගේ සිතැඟි දනගැනීම පුදුම නො වේ. පෙර ද මම ඔහුගේ සිතැඟි දත්තෙමි යි අතීත කථාව ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජ රාජ්‍යය කළේය. එකල බෝසත්හු ඒ රජුට අර්ථයෙන් ද ධර්මයෙන් ද අනුශාසන කරති. එකල රජුගේ මගුල් අසු නාවන තොටෙහි බලුංක ගණයට අයත් වෙළඹ අසකු (පහත් වර්ගයකට අයත් අසකු) නැහැවූයේය. මගුල් අසු, බලුංක අශ්වයා නෑ තොටට බස්සවන කල්හි පිළිකුළින් බැසීමට නො කැමැති විය. අස්ගොව් ගොස් රජුට සැලකළේය. රජ බෝසතුන් යැවීය. පණ්ඩිතයෙනි, මගුලසු මක්නිසා දියට බස්නා කල නො බසින්නේදැ යි දනුව. බෝසත්හු දේවයිනි, මැනවැ යි, නහන තොටට ගොස් අසු බලා අසුගේ නීරෝග බව ද දූන කුමක් නිසා මොහු තොටට නො බසීදැ යි විමසන්නාහු, ප්‍රථමයෙන් අන් අසකු නහවන ලද්දේ විය යුතුයි. ඒ නිසා මේ අසු පිළිකුළින් නා තොටට නො බසිතැ යි සිතා අස් ගොව්වන්ගෙන් විමසීය. සගයිනි, මෙහි පළමුවෙන් නැහැවූයේ පෙර කුලවත් නො වූ කවරෙක් ද ? ස්වාමීනි, වෙනත් වෙළඹ අශ්වයකුයැ යි කීහ. මගුල් අසු තමාගේ ශුචිකාමීත්වය නිසා පිළිකුල් බැවින් මෙහි නාන්න කැමැති නො වෙයි. මොහු වෙනත් තොටක නාවන්න වටීයැ යි අසුගේ සිතැඟි දැන අස්ගොව්වනි, ගිතෙල් මී ආදිය යොදා පිළියෙල කළ කිරිබත වුව ද නැවත නැවත බුදින කල්හි තෘප්තියක් නො වෙයි. මේ අසු ද බොහෝ වාර මෙහි නාවන ලද්දේ

දූන් වෙනත් තොටකට බස්වා නහවනු, පැන් පොවනු, යි කියා මේ ගාථාව කීහ.

"අඤ්ඤමඤ්ඤෙහි තිත්ථෙහි අස්සං පායෙහි සාරථී
අච්චාසනස්ස පුරිසො පායාසස්සපි තප්පතීති"

"රියදුර, මගුල් අසුට වෙනත් තොටවලින් පැන් පොවන්න. පුරුෂයකු අධික ව ආහාර බුදීමෙන් මිහිරි කිරිබතට පවා රුචි නො කැරේ."

එහි "අඤ්ඤං මඤ්ඤෙහි" යනු වෙනත් පායෙහිය. මේ දේශනා ක්‍රමයෙහි නහවනු, පොවනු යන අර්ථයයි. "අච්චාසනස්සා" යනු කරණ හි අර්ථයෙහි සාමි විභක්ති අර්ථයයි. අධික ව බුදීමෙන්, අනුභවයෙන් යන අර්ථයයි. "පායාසස්සවි තප්පතීති" ගිතෙල් ආදිය යොදා සකස් කළ මිහිරි කිරිබත වුව ද රුචි නො කැරේ. මිහිරි නො වේ. නැවත අනුභව කිරීමේ කැමැත්ත ම නො එළැඹේ. ඒ අනුව මේ අශ්වයා ද මේ තොටින් නිතර නෑම නිසා රුචිකත්වයේ කෙළවරට පැමිණියේ වන්නේය. අසු වෙනත් තොටකින් නහවනුය.

අසරුවෝ බෝසතුන්ගේ වචනය අසා වෙනත් තොටකට බස්වා නැවූහ. පැන් පෙවූහ. බෝසත්හු අසු පැන් බී නාන කල්හි රජු වෙත ගියෙන්, දරුව අශ්වයා නැවේ ද ? පැන් බීවේ ද ? එ සේය දේවයිනි, දරුව, අසු පළමු ව නැමට හා පැන් බීමට අකැමැති වූයේ ඇයි ? බෝසත්හු කාරණා සියල්ල කීවේය. රජ, මෙබඳු තිරිසනකුගේ පවා සිතැඟි දැන ගන්නා ලදී. මහ පුදුමයකි යි, රජ බෝසතුන්ට මහත් ධන සම්පත් දී ආයු කෙළවර කම් වූ පරිදි මිය ගියේය. බෝසත්හු ද කම් වූ පරිදි ම මිය ගියහ.

මහණෙනි, මා මේ භික්ෂුවගේ සිතැඟි දන්නේ දූන් පමණක් නො වේ. පෙරත් දත්තේයැ යි දම් දෙසුම ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා ජාතක කථාව නිම කළහ. එකල මංගල අශ්වයා මේ භික්ෂුවය. රජ ආනන්ද තෙරණුවෝය. නුවණැති ඇමැතියා මම ම වීමි.

## 1. 3. 6

# මහිලාමුඛ ජාතකය

"පුරාණචොරාන වචො නිසම්මාති" යන මේ ජාතක දේශනය බුදුරදුන් වේළුවනයෙහි වසන සේක්, දෙව්දත් අරබයා වදාළහ. දෙව්දත් අජාතසත්ත කුමරා පහදවාගෙන ලාභ සත්කාර නිපදවා ගත්තේය. අජාසත් කුමරු දෙව්දතුන්ට ගයා ශීර්ෂයෙහි විහාරයක් කැරවා නොයෙක් රසවුලෙන් යුත් තුන්වස් සුවඳ ඇල් බොජුන් සැලි පන්සියයක් දිනපතා එළවීය. ලාභ සත්කාර නිසා දෙව්දත්ගේ පිරිවර ද මහත් විය. ඔහු පිරිවර සමග විහාරයෙහි වෙසෙයි. එකල රජගහ නුවර වැසි යහළුවෝ දෙදෙනෙක් වූහ. ඔවුන් අතුරින් එක් අයකු බුදුන් වෙත පැවිදි වූ අතර අනෙක් යහළුවා දෙව්දත් ළඟ පැවිදි විය. මේ දෙදෙනා ඔවුනොවුන් තැන් තැන්වල දී හමුවෙත්. විහාරයට ගොස් ද හමුවෙත්.

දිනක් දෙව්දත් ඇසුරු කරන භික්ෂුව, අනිකාට මෙසේ කීවේය. ඇවැත්නි, ඔබ දිනපතා දහඩිය වගුරුවමින් පිඬුපිණිස හැසිරෙන්නේ කුමට ද ? දෙව්දත් ගයා සීස විහාරයෙහි හිඳිමින් ම නොයෙක් රසයෙන් යුත් මිහිරි බොජුන් වළඳයි. මෙවැනි වෙන උපායක් නැත. ඔබ දුක් විඳින්නේ කුමට ද ? අළුයම ගයා සීසයට අවුත් අවුළු සහිත කැඳ බී අටළොස් වැදෑරුම් කැවිලි කා නොයෙක් රසයෙන් යුත් මිහිරි බොජුන් බුදින්න ඔබට නො වටී ද ? මෙසේ නිතර නිතර කියනු ලබන්නේ යනු කැමැති ව එතැන් පටන් ගයා සීසයට ගොස් ඇතිතාක් අනුභව කොට වේළුවනයට එයි. ඔහුට මෙකරුණ සැමදා සඟවා තබන්නට නො හැකි විය. ගයා සීසයට ගොස් දෙව්දත් පිරිනැමූ බොජුන් වළඳතැ යි නොබෝ දිනකින් ම ප්‍රකට විය. ඔහුගේ යහළු භික්ෂූහු, ඇවැත්නි, ඔබ දෙව්දත් පිරිනැමූ බොජුන් වළඳන්නේ සැබෑ දැ යි ඇසූහ. ඔබට කීවෝ කවුරු ද ? අසවල් අසවල් අයයැ යි කීහ. ඇවැත්නි, සත්‍යයකි. මම ගයා සීසයට ගොස් වළඳමි. එහෙත් දෙව්දත් මට අහර නො දෙයි. වෙනත් මිනිස්සු මට අහර දෙති. ඇවැත්නි, බුදුරදුන්ට විරුද්ධ වූවෙකි. එ සේ ම දුසිල්වත්ය. අජාසත් පහදාගෙන අකැප වශයෙන් තනිව ලාභ සත්කාර උපදවා ගත්තේය. ඔබ මෙවැනි නිවන් මඟට යොමු කරන සසුනෙහි පැවිදි ව

දෙව්දත්ගේ අධර්මයෙන් ලැබුණ බොජුන් වළඳන්නෙහි. එව, බුදු රදුන් වෙත, ඔබ පමුණුවන්නෙමි. ඒ භික්ෂුව ගෙන දම් සබාවට ගියහ.

බුදුන් වහන්සේ ඒ දැක, කිම මහණෙනි, නො කැමැත්තෙන් ම භික්ෂුවක් මෙහි රැගෙන එන්නහු ද ? එ සේය ස්වාමීනි, මේ භික්ෂුව ඔබවහන්සේ ළඟ පැවිදි ව දෙව්දත් අධර්මයෙන් උපදවා ගත් බොජුන් වළඳයි. මහණ, ඔබ දෙව්දත් අධර්මයෙන් උපදවාගත් බොජුන් වළඳන්නේ ඇත්තද? ස්වාමීනි, දෙව්දත් මට ආහාර නො දෙයි. මිනිස්සු මට දෙති. ඒ අහර මම වළඳමි. මහණ මේ කරුණෙහිදී ලෝස මාත්‍රයක් ගැනීම නො කළ යුතුයි. දෙව්දත් අනාචාරීය. දුසිල්වත්ය. මහණ, ඔබ මෙහි පැවිදි ව මාගේ සසුන ඇසුරු කරමින් ම දෙව්දත්ගේ අහර ගැනීම සුදුසු ද ? කවදත් අනුගාමිකයකු වූ ඔබ දුටුදුවන් ඇසුරු කරන්නෙහියැ යි කියා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කැරවන කල්හි බෝසතාණෝ ඒ රජුගේ ඇමැතියෙක් වූහ. එකල රජුගේ මගුලැතා මහිලාමුඛ නම් විය. සිල්වත්ය. ආචාර සම්පන්නය. කිසිවෙක්ට හිංසා නො කරයි. එක් දවසක් ඇත්හල ළඟ රාත්‍රී මැදියම්හි සොරු අවුත් මඟුලැතු නුදුරෙන් හිඳ කුමන්ත්‍රණය කළහ. මෙසේ උමං සෑරිය යුතුය. බිත්ති සන්ධි බිඳීම මෙසේ කළ යුතුය. උමග සහ ගෘහ සන්ධි මාර්ගයක මෙබඳුය. නැව් තොටක් වැන්නය. අවුල් බාදක නැතිකොට භාණ්ඩ පැහැර ගත යුතුය. පැහැර ගන්නා විට අනිකා මරා ම ගත යුතුය. එවිට විරුද්ධ ව එන්නන් නො වන්නේය. සොරු වනාහි ආචාර සම්පන්න නො විය යුත්තෝය. නපුරු සැර පුරුෂ දරුණු අයකු විය යුතුය. මෙසේ ඔවුනොවුන් කථාකොට ඔවුනොවුන් උගන්වා ගියහ. මෙසේ ඔවුහු බොහෝ දිනක් මේ සොරු එතනට අවුත් කුමන්ත්‍රණ කළහ. මගුලැතු ඔවුන්ගේ වදන් අසා මට උගන්වතැ යි යන හැඟීමෙන් දැන් මා ඔවුන් මෙන් ම නපුරු දරුණු සාහසිකයකු විය යුතුයැ යි සිතා එබන්දෙක් ම විය. අලුයම ඇතු ළඟට ආ ඇත්ගොව්වා සොඬින් ගෙන බිම ගසා මරා දැමීය. මෙසේ තවත් එකකු තවත් එකකු වශයෙන් ඔහු ළඟට පැමිණි හැම දෙනම මරා දමයි. මහිලාමුඛ උමතු වූයේය. දුටුදුටුවන් මරා දමතැ යි රජුට සැලකළහ. රජ බෝසතුන් යැවීය. පණ්ඩිතයෙනි, කුමක් නිසා ඇතු

දරුණු වූයේ ද ? බෝසත්හු ගොස් ඇතුගේ සිරුරෙහි රෝගයක් නැතැ යි දැන කුමක් නිසා ඔහු දරුණු වූයේදැ යි විමසන්නාහු, ඒකාන්තයෙන් යමකුගේ වදන් අසා මොවුන් මා හට උගන්වතැ යි යන හැඟීමෙන් දරුණු වූවා විය යුතුයැ යි සනිටුහන්කොට ඇත්ගොව්වන්ගෙන් විචාළේය. කවුරු හෝ රාත්‍රී කාලයෙහි ඇත්හළ ළඟ සිට කුමක් හෝ කථා කළෝ ද ? හිමියනි, එ සේය. සොරු අවුත් කථා කළහ යි කීහ. බෝසතුන් රජු වෙත ගොස් දේවයනි, ඇතුගේ ශරීරයෙහි කිසි වෙනසක් නැත. සොරුන්ගේ වචන ඇසීමෙන් දරුණු වූයේය. දැන් කුමක් කළ යුතු ද ? සිල්වත් මහණ බමුණන් ඇත්හළෙහි වඩා හිඳුවා ශීලාචාර කථා කරවන්න වටිනේය. දරුව, එ සේ කරව. බෝසත්හු ගොස් සිල්වත් මහණ බමුණන් ඇති සාලාවේ වඩා හිඳුවා ස්වාමීනි, ශීල කථා කරනු මැනවැ යි කීහ. ඔවුහු ඇතු නුදුරෙහි හුන්නාහු, කිසිවෙක් අනුන් නො රිදවිය යුත්තේය, නො මැරිය යුත්තේය, සදාචාරවත් විය යුතුය, ඉවසීම, මෛත්‍රිය, දයාව ඇත්තකු විය යුතුය, ආදී ශීල කථා කළහ. ඔහු ඒ අසා මොව්හු මා හික්මවති යි දැන මෙතැන් පටන් සිල්වත් විය යුතුයැ යි සිතා සිල්වතකු විය. රජ, බෝසතුන්ගෙන් කිම දරුව, ඇතා සිල්වත් වූයේ ද ? බෝසත්හු, එ සේය දේවයිනි, මෙබඳු දරුණු ඇතා පණ්ඩිතයන් නිසා පෙර සිටි තත්ත්වයෙහි ම පිහිටියේයැ යි කියා මේ ගාථාව කීහ.

"පුරාණචොරාන වචො නිසම්ම
මහිලාමුඛො පොථය මානු චාරි
සුසඤ්ඤතානං හි වචො නිසම්ම
ගජුත්තමො සබ්බ ගුණෙසු අට්ඨාති"

"මහිලාමුඛ ඇත් තෙම පළමු ව සොරුන්ගේ වදන් අසා අනුන්ට පහර දීමෙහි යෙදුණේය. සිල්වතුන්ගේ දහම් කථා ඇසීමෙන් ඒ ඇත් රජ තෙමේ සියලු ගුණයන්හි පිහිටියේය."

එහි "පුරාණ චොරාන" පෙර සොරුන්ගේ "නිසම්ම" අසා, එනම් පළමු ව සොරුන්ගේ වචන අසා යන අර්ථයයි. "මහිලාමුඛො" යි

ඇතින්නකගේ හා සමාන මුහුණු ඇත්තේ නැතහොත් යම් සේ ස්ත්‍රීහු ඉදිරියෙහි සිට බලන විට හොබනේ වෙත් ද පසුපසින් බලන විට එ සේ නො වෙත් ද මේ ඇතා ද ඉදිරියෙහි සිට බලන විට සුන්දරය. එම නිසා මේ ඇතාට මහිලාමුඛයැ යි හඬක් තැබූහ. " පොථය මානු චාරි" පහර දෙමින් මරමින් හැසුරුණේය. මෙහි " අනුචාරී" යනු පාඨාන්තරයකි. "සුසඤ්ඤතානං" මනා සේ හික්මුණු සිල්වතුන්ගේ "ගජුත්තමො" උසස් ඇතා, මංගල හස්තියාය. "සබ්බ ගුණෙසු අට්ඨා" පෙර තිබුණු සියලු ගුණයන්හි පිහිටියේය. රජ, තිරිසනාගේ පවා සිතැඟි දනිතැ යි බෝසතුන්ට මහත් ධනය දුන්නේය. දිවි ඇතිතාක් සිට බෝසතුන් සමග කම් වූ පරිදි මිය ගියේය.

බුදුරදහු, මහණ, ඔබ පෙර ද දුටුදුටුවන් ඇසුරු කළෙහිය. සොරුන්ගේ වචන ඇසුවේය. සොරුන් ඇසුර කළෙහිය. ධාර්මිකයන්ගේ වචන අසා ධාර්මිකයන් ඇසුරු කළෙහි. මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා ජාතකය නිමවූහ. එකල්හි මහිලාමුඛ විපක්ෂය සේවනය කළ භික්ෂුවය. රජ ආනන්දය. ඇමැතියා මම ම වීමි.

## 1. 3. 7.

## අභිණ්හ ජාතකය

"නාලං කබලං පදාතවෙ" යන මේ ජාතක දේශනාව බුදු රජහු ජේතවනයෙහි වසන සේක්, එක් උපාසකයකු ද මහළු භික්ෂුවකු ද අරබයා වදාළහ. සැවත් නුවර යහළුවෝ දෙදෙනෙක් වූහ. ඔවුනතුරින් එක යහළුවෙක් පැවිද වී දවස් පතා අනික් යහළුවාගේ ගෙදර යයි. ඔහු භික්ෂුවට දන් දී තමා ද අනුභවකොට ඔහු සමග ම විහාරයට පැමිණ හිරු බැස යන තුරු අල්ලාප සල්ලාපයෙහි පෙළෙමින් හිඳ නුවරට යයි. අනිකා ද නගර දොරටුව දක්වා පසු ගමන්කොට නවතී. මේ දෙදෙනාගේ මිත්‍රකම භික්ෂූන් අතර ප්‍රකට විය. එක් දිනක් භික්ෂූහු

දම් සබාවෙහි මේ දෙදෙනාගේ මිත්‍රබව පිළිබඳ කථා කරමින් හුන්හ. බුදුන් වහන්සේ දම් සභාවට වැඩ මහණෙනි, දැන් කිනම් කථාවකින් හුන්නහුදැ යි ඇසූහ. ස්වාමීනි, භික්ෂූහු මෙබඳු කථාවකිනැ යි කියහු. මහණෙනි, මොවුහු දැන් පමණක් යහළු වූවෝ නො වෙති. පෙර ද යහළුවෝ යි අතීත කථාව ගෙන හැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කරන කල්හි බෝසත්හු ඇමැති වූහ. එකල එක් සුනඛයකු මගුල් ඇත් හළට ගොස් මඟලැතු බොජුන් ගන්නා තැන වැටී තිබුන බත් තළු කයි. සුනඛයා ඒ අහරින් ම යැපෙන්නේ, මඟුලැතුගේ මිත්‍රයෙක් වූයේය. ඇතු සමග ම අහර ගනී. දෙදෙනා ම ඔවුනොවුන්ගෙන් වෙන්ව විසීමට නො හැක්කේය. ඇතා, සුනඛයා සොඬින් ගෙන ඔබිනොබ සොළවමින් සෙල්ලම් කරයි. දිනක් ගම් වැසි මිනිසෙක් ඇත් ගොව්වාට මිල දී සුනඛයා ගෙන තම ගමට ගියේය.

එතැන් පටන් ඒ ඇතු සුනඛයා නො දැක නො කයි. නො බොයි. නො නායි. මෙකරුණ රජුට සැලකළහ. රජ බෝසතුන් යැවීය. පඬිතුමනි, යන්න. කවර කරුණක් නිසා ඇතු මෙසේ කරනුදැ යි දැනගන්න. බෝසත්හු ඇත්හළට ගොස් ඇතුගේ දොම්නස් ස්වභාවය දැන මොහුගේ සිරුරේ කිසි රෝග ලක්ෂණයක් තිබෙන්නේ නැත. මොහු කිසිවකු සමග මිත්‍රත්වයෙන් වූයේ විය යුතුය. ඔහු නො දැකීමෙන් ඇති වූ ශෝකයෙන් මෙසේ වූවා විය යුතුයැ යි සිතා ඇත් ගොව්වන්ගෙන් විමසූහ. මොහුට කිසිවකු සමග විශ්වාසයක් ඇත් ද ? එ සේය ස්වාමීනි, එක් සුනඛයකු සමග බලවත් මිත්‍රකමක් තිබිණැ යි කීහ. දැන් ඒ සුනඛයා කොහි ද ? එක් මිනිසකු විසින් ගෙනයන ලද්දේය. ඔහුගේ නිවස දන්නේ ද ? නො දනිමි ස්වාමීනි, බෝසත්හු රජු සමීපයට ගොස් මහරජ, ඇතුට කිසි රෝගයක් නැත. එක් සුනඛයකු සමග සිල්වත් විශ්වාසයක් තිබිණි. ඌ නො දැකීම නිසා අහර නො බුදිතැ යි හඟිමි යි මේ ගාථාව කීහ.

"නාලං කබලං පදාතවෙ නච පිණ්ඩං න කුසේ න ඝංසිතුං
මඤ්ඤාමි අභිණ්හ දස්සනා නාගො සිනෙහමකාසි කුක්කුරෙති"

"මඟුලැතු අහර පිඬු ගැනීමට අසමත්ය. එ සේ ම බත් පිඬු හෝ දෙන ලද තණ හෝ ගැනීමට අසමත්ය. නහන විට සිරුර ඉලීම් ආදියට ද අසමත්ය. සුනඛයා නිතර දකීමෙන් ඔහු කෙරෙහි ආදරය කළේයැ යි සිතමි."

එහි "නාලං" නො සමතකු "කබලං" ආහාර වේලාවෙහි පළමුවෙන් දෙන කුළු අහර, "පදාතවෙ" යි මෙහි පාදාතවෙ, සිටිය යුතු තැනය අකාර ලෝපය දත යුතුය. ගැනීමට යන අර්ථයයි. "න ච පිණ්ඩං" කැම සඳහා ගුලි කොට දෙනු ලබන බත් පිඬ ගැනීමට අසමත්ය. "න කුසෙ" දෙන ලද තණ ද ගැනීමට අසමත්ය. "න සංසිතුං" නාවන කල්හි සිරුර ඉලීමට ද අසමත්ය. මෙසේ යමක් කිරීමට අසමත් ද, ඒ සියල්ල රජුට සැලකොට ඒ අසමත් වීමට හේතු වශයෙන් තමා සලකන කරුණ සැලකරන්නේ, "මඤ්ඤාමි" ආදිය කීහ.

රජ ඔහුගේ වදන් අසා පණ්ඩිතයිනි, දැන් කුමක් කළ යුතුදැ යි විචාළේය. අප මගුල් ඇතුගේ යහළු සුනඛයා එක් මිනිසෙක් ගෙන ගියේය යම් ගෙදරක සිටී නම් ඔහුට මෙපමණ දඩයැ යි බෙර හසුරුවන මැනවැ යි බෝසත්හු කීහ. රජ එ සේ කැරවීය. මේ පුවත අසා සුනඛයා ගෙනගිය මිනිඩා ඌ අත්හළේය. සුනඛයා වේගයෙන් ගොස් ඇතු සමීපයට ම ගියේය. ඇතු ඌ සොඬින් ගෙන කුඹෙහි තබා හඬා වැළපා කුඹින් බස්වා ඌ කෑ පසු තමා කෑවේය. තිරිසනාගේ සිතැගි දනිතැ යි බෝසත්හු හට මහත් සම්පත් දුන්නේය.

බුදුරදහු මහණෙනි, මොවුන් විශ්වාසවන්ත වූයේ දැන් පමණක් ම නො වේ. පෙර ද විශ්වාසිකයෝ වූහැ යි මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා සිව්සස් කථාවෙන් අවසන්කොට අනුසන්ධි ගළපා ජාතකය නිමවා වදාළ සේක. මේ සිව්සස් කථාවෙන් අවසන් කිරීම සියලු ජාතකයන්හි ඇත. අපි වනාහි යම් අරුතක ආනිශංසයක් පෙනේනම්, එහි දී ම දක්වන්නෙමු. එකල්හි සුනඛයා උපාසකයා විය. ඇතා මහලු තෙරය. ඇමැති පඬිවරයා මම ම වීම.

1. 3. 8.

## නන්දිවිසාල ජාතකය

"**මනුඤ්ඤමෙව භාසෙය්‍යා**" යන මෙම ජාතකය බුදු රදහු දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, සවග මහණුන්ගේ පරුෂ තෙපුල් අරබයා දෙසූහ. එකල සවග මහණහු සිල්වත් මහණුන්ට ගරහත්. හෙළා දකිත්. වදන් ඊයෙන් විදිත්. දශවිධ වස්තුවෙන් පරිභව කරත්. භික්ෂූහු බුදු රදුන්ට සැලකළහ. බුදු රදහු සවග මහණුන් කැඳවා මහණෙනි, සත්‍යයද යි විමසා සත්‍යයැ යි කී කල්හි, දෝෂාරෝපණයකොට මහණෙනි, පරොස් බස වනාහි තිරිසන් සතුන්ට වුව ද රුචි නො වේ. පෙර එක් තිරිසන් සතකු තමාට පරොස් බසින් කථා කරන්නකු දහසකින් පැරදවීයැ යි අතීත කථාව ගෙනහැර දක්වූහ.

පෙර ගන්ධාර රට තක්සලාවෙහි ගන්ධාර නම් රජෙක් රාජ්‍යය කළේය. එකල බෝසත්හු ගව යෝනියෙහි උපන්නේය. ඔහු තරුණ වසු කාලයෙහි ම එක බමුණෙක් ගෝ දානය දෙන මිනිසුන් වෙත ගොස් ගොනකු ලැබ නන්දි විසාල යැයි නම්කොට පුත් තනතුරෙහි තබා ඉතා ආදරයෙන් කැඳබත් ආදිය දී පෝෂණය කළේය. බෝසත්හු වියට පත්වෙත් ම සිතූහ. මා, මේ බමුණ විසින් දුක සේ පෝෂණය කරන ලද්දේය. මේ සියලු දඹදිව මා හා සමග බර ඇදීමට සමත් වෙනත් කෙනකු නැත. මම තම බලය පෙන්වා මේ බමුණාට මා පෝෂණය කිරීමේ වේතනය ලබාදෙන්නේ නම් මැනවි. ඔහු දිනක් බමුණාගෙන් මෙසේ ඇසීය. බමුණ, ගව සම්පත් ඇති එක් සිටුවරයකු වෙත ගොස් මාගේ ගොනා එකට බඳනා ලද ගැල් සියයක් අදී යි කියා දහසක් පරදුවට තබන්න. ඒ බමුණා ද සිටු වෙත ගොස් කථාව ඇරඹීය. මෙනුවර කාගේ ගොන්නු ශක්තිමත් ද ? ඉක්බිති සිටුවරයා අසවල් අසවල් අයගේයැ යි කියා මෙනුවර අප ගොනුන් සමාන ශක්තිමත් තවත් ගොනුන් නැතැ යි කීය. බමුණා, මගේ එක් ගොනකු එකට බැඳි ගැල් සියයක් එකවර ඇදීමට සමත්යැ යි කීය. සිටුවරයා ගැහැවියෙනි, එබඳු ගොනකු කොහි සිටීදැ යි ඇසීය. මාගේ ගෙහියැ යි බමුණා කීය. එසේ නම් පරදුවක් තබන්න. හොඳයි තබමි යි සිටු දහසකට පරඳු තැබීය. සිටුවරයා ගැල් සියයට වැලි,

බොරළු, ගල් ආදිය පුරවා පිළිවෙළින් තබා බන්ධන යොතින් එකට බැඳ නන්දිවිසාල නහවා සුවඳින් පසැඟිලි දී ගෙල මල් මාලා පළඳවා පෙරට තිබූ ගැලෙහි තනි ව යොදා තමා පෙර අසුනෙහි හිඳ කෙවිට ඔසවා කුළු ගොනා අඳුව, කුළු ගොනා ඔසව යි කීය. එවිට බෝසත් මේ බමුණා කුළු නො වූ මා කුළෙකු ලෙස කියයි. පාසතර ටැම් සතරක් ලෙස නිසලකොට සිටියේය. සිටුවරයා එකණෙහි ම දහසේ පරදුව ගෙන්වා ගත්තේය. බමුණා දහසකින් පැරදී ගොනා මුදා ගෙට ගොස් ශෝකානුකූලව හොත්තේය. නන්දිවිසාල අවුත් බමුණා ශෝකයෙන් මැඩී සිටිනු දැක කිම බමුණ, නිදන්නේ ද ? දහසකින් පැරදී මම කවර නිදීමක් ද ? බමුණ, මෙතෙක් කල් ඔබ ගෙදර වසන මා විසින් බිඳින ලද භාජනයක්වත් ඇත්තේ ද ? කිසිවක් පාගන ලද්දේ ද ? නුසුදුසු තැනක මළමුත්‍ර කළේ ද ? නැත දරුව. එ සේ නම්, මට මක්නිසා කුළු වාදයෙන් කථා කළේ ද ? වරද ඔබගේය. මගේ නො වේ. යව. සිටු සමග දෙදහසකින් ඔට්ටු තබව. එහෙත් කුළු නො වූ මට කුළු වාදයෙන් කථා නො කරනු. බමුණා ඔහුගේ වචනය අසා ගොස් දෙදහසකින් පරදු තබා පෙර පරිදි ම ගැල් සියය එකට බැඳ නන්දිවිසාල සනසා පළමු ගැලෙහි වියෙහි බැන්දේය. කෙසේ බැන්දේ ද යත් විය ගස කරෙහි නිසලකොට බැඳ එක් කෙළවරක නන්දිවිසාල බැඳ අනෙක් කෙළවර හීවැලෙන් වෙළා යුග ගස අක්ෂයෙහි බැඳ රැක් දඬුවක් දී යොතින් එය නිසලකොට බැඳ තැබීය. මෙසේ කළ කල්හි යුගය එහාමෙහා නො යයි. එවිට එක ගොනකුට ඇදීමට හැකි වෙයි. ඉක්බිති, බමුණා විය ගසෙහි හිඳ නන්දිවිසාලගේ පිට පිරිමැද සොඳුරු පුත, අදින්න. පුත උසුලන්න යි කීය. බෝසත්හු එකට බැඳි ගැල් සියය එක් වේගයෙන් ම ඇද පසු පසු ම තිබුණු ගැල පළමු ගැල තිබුණු තැනට ම ඇද තැබීය. ගෝධන සිටු ද පැරදී බමුණාට දෙදහසක් දුන්නේය. අන් මිනිස්සු ද බෝසතුන්ට බොහෝ ධනය දුන්හ. සියල්ල බමුණාට ම අයත් විය. මෙසේ බෝසතුන් නිසා බොහෝ ධනය ලැබීය.

මහණෙනි, පරොස් බස් කිසිවකුට රුචි නො වේ. ඒ සමග මහණුන්ට දොස් පවරා සික පදයක් ද පනවා සම්බුදු වූ සේක්, මේ ගාථාව වදාළහ.

"මනුඤ්ඤමෙව භාසෙය්‍ය නාමනුඤ්ඤං කුදාචනං
මනුඤ්ඤං භාසමානස්ස ගරුංභාරං උදද්ධරි
ධනඤ්ච නං අලබ්භෙසි තෙනචත්තමනො අහූති"

"මිහිරි වදන් ම තෙපලිය යුතුය. අමිහිරි තෙපුල කිසි දිනක නො කිය යුතුය. මිහිරි වදන් කී බමුණුගේ මහත් බර ඇද්දේය. ඔහුට ධනය ද ලබාදුන්නේය. එම නිසා ම ඔහු සතුටු සිත් ඇත්තකු විය."

එහි "මනුඤ්ඤමෙව භාසෙය්‍ය" මෙරමා සවග තෙපලන කල්හි බොරු ආදී සිව් දෝෂයෙන් තොර වූ මිහිරි මන වඩන සිනිඳු ප්‍රිය වචන ම කථා කරන්නේය. "ගරුංභාරං උදද්ධරි" නන්දිවිසාල ගොන් තෙම අමිහිරි වදන් කියන්නාහුගේ බර නො ඇදි. පසුව මිහිරි වදන් පැවසූ බමුණාගේ මහත් බර ඇද්දේය. "උද්ධරි" විය යුතු "උදද්ධරි" විය. 'ද' කාරය සන්ධි වශයෙන් පද සන්ධි වීමකි.

භාග්‍යවතුන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා සිව්සස් කථාවෙන් අවසන් කොට අනුසන්ධි ගළපා ජාතකය නිමවා වදාළ සේක. එකල්හි බ්‍රාහ්මණයා ආනන්ද තෙරණුවෝය. නන්දිවිසාල මම ම වීම.

## 1. 3. 9.

## කණ්හ ජාතකය

"යතො යතො ගරුංධුරන්ති" යන මේ ජාතකය බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වසන සේක්, යමා මහපෙළහර අරබයා දේශනා කළහ. බුදුරදහු දෙව්ලොව වැඩීම පිළිබඳ කථාපුවත තෙළෙස් වැනි නිපාතයෙහි සරභමිග ජාතකයෙහි එන්නේය. බුදුරදුන් යමා මහපෙළහරකොට දෙව්ලොව වැස් වැස මහා පවාරණය සඳහා

සංකස්ස නුවර දොර බැස මහත් පිරිවර සමග දෙව්රමට පිවිසි කල්හි, භික්ෂූහු දම් සබාවෙහි රැස්ව ඇවැත්නි, තථාගතයෝ වනාහි අන් අයට සම කළ නො හැකි භාර උසුලන්නාහ. උන්වහන්සේ ඉසුලූ භාරය උසුලන්න අන් සමතකු නැත. ෂට් ශාස්තෘවරු අවම පෙළහර පාන්නෝය. අපි ම පෙළහර පාන්නෙමු යි කියා එක ද පෙළහරක් නො පෑහ. එකාන්තයෙන් බුදුරදාණෝ අසමධුරයැ යි බුදුගුණ කියමින් සිටියහ. බුදුරදුන් දම් සබාවට වැඩ මහණෙනි, දැන් කවර කථාවකින් හුන්නාහුදැ යි විමසූහ. ස්වාමීනි, අනිකකින් නො වේ. ඔබවහන්සේගේ මෙබඳු වූ අසමධුර ගැන කථාවෙනි. මහණෙනි, මා දැන් උසුලන ධුරය කවරකු උසුලන්නෙහි ද ? පෙර තිරිසන් යෝනියෙහි ඉපද මා හා සමාන ධුර ඇති කිසිවකු නො වූයේයැ යි අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස නුවර බඹදත් රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු ගව යෝනියෙහි පිළිසිඳ ගත්හ. ඔහු තරුණ වසු කාලයෙහි ම ඔහුගේ හිමිකරුවෝ එක් මැහැලියකගේ ගෙහි වැස නිවාස වේතනය වශයෙන් සලකා ඇයට දුන්හ. මැහැලිය වසු, පුතකු වශයෙන් සලකා කැඳ බත් දීමෙන් පෝෂණය කළාය. මැහැලිය, ගොනා කාළක නමින් හැඳින්විය. වියට පැමිණෙත් ම කාළක අඳුන්වන්ව ගමෙහි ගොනුන් සමග හැසිරෙයි. සීලාචාරයෙන් යුක්ත විය. ගම් දරුවෝ අංවල ද කන්වල ද ගෙලෙහි ද එල්ලෙත්. නගුට ගෙන සෙල්ලම් කරති. පිටෙහි හිඳිත්. කාළක දිනක් සිතන්නේ, මගේ මව දුප්පත්ය. මා පුත් තනතුරෙහි තබා පෝෂණය කළාය. මම කිසියම් කුලියක්කොට මැය දුගී බවින් මුදවන්නේ නම් මැනවි. එතැන් සිට කාළක කුලියක් සොයමින් හැසිරෙයි. දිනක් ගැල් නායක පුතෙක් ගැල් පන්සියයක් ගෙන විසම (මට්ටම් නො වූ) තොටකට පැමිණියේය. ගොන්හු ගැල් එතර කිරීමට අසමත් වූහ. ගැල් පන්සියයේ ම ගොන්නු යුගල වශයෙන් යෙදුව ද එක් ගැලක් හෝ එතැර කිරීමට නො හැකි වූහ. බෝසත්හු ද ගම් ගොනුන් සමග තොට සමීපයෙහි හැසිරෙයි. ගැල් නායක පුත්‍රයා ද ගව ශාස්ත්‍රය දන්නෙකි. ඔහු ගොනුන් අතර මේ ගැල් එතර කිරීමට සමත් ආජානීය ගවයකු සිටීදැ යි විමසන්නේ බෝසතුන් දැක මේ ආජානීය ගොනෙකි. මගේ ගැල් එතැර කරන්න ඔහුට හැකි වන්නේයැ යි සිතා සගයෙනි, මොහුගේ අයිතිකරු කවුරුදැ යි විචාළේය. මම මොහු ගැල්වල යොදා එතර කළ කල්හි කුලිය දෙමි යි කීය. දැන් මෙහි ඔහුගේ හිමියා නැත.

ඌ යොදා ගන්න. ගැල්කරු නාසු ලණුවෙන් බැඳ අදින්නේ නමුත් සෙලවීමට නො හැකි විය. බෝසත්හු කුලිය නියම කළ කල්හි යම් යි නො ගියහ. ගැල් නායක පුත්‍රයා බෝසත්හුගේ අදහස දැන යහළුව, ඔබ ගැල් පන්සියය එතර කළ කල්හි එක ගැලකට කහවණු දෙක බැගින් කුලිය කොට දහසක් දෙමි යි කීය. එවිට බෝසත්හු තෙමේ ම ගියහ. ඉක්බිති මිනිස්සු කාළක ගැල්හි යෙදූහ. ඔහු එක වේගයෙන් ම ගැල ඔසවා ගොඩ තැබීය. මේ ක්‍රමයෙන් සියලු ම ගැල් තොටින් එතැර කළේය. අනතුරුව ගැල් නායක පුත්‍රයා එක ගැලකට එක කහවණු වන සේ කුලියකොට කාළකගේ ගෙල බැන්දේය. එවිට කාළක, මොහු තීරණය කැරගත් වේතනය නො දෙයි. මොහුට යන්න නො දෙමි යි එක සේ සියල්ලට පෙරටුව තිබූ ගැල ඉදිරියේ මඟ අවුරා සිටියේය. ඔහු එලවීමට තැත් කළ ද නො හැකි විය. ගැල් නායක පුත්‍රයා මොහු තමාගේ කුලිය අඩුබව දැනගත්තේයැ යි සිතා රෙදි කඩක දහසක් බැඳ මේ ඔබගේ ගැල එතර කිරීමේ කුලියයැ යි කාළකගේ ගෙල එලවීය. ඔහු දහසින් බැඳි සියල්ල ගෙන මව් වෙත යන්නේ, ගම් දරුවෝ මැහැලියගේ කාළකගේ ගෙලෙහි කුමක්දැ යි බෝසතුන් ළඟට එති. කාළක ඔවුන් ලුහුබැඳ දුරදී ම පලවා හැර මව් ළඟට ම ගියේය. ගැල් පන්සියක් එතැර කිරීම නිසා කාළකගේ ඇස් රතුවී විඩාවට පත් වූ සේ පෙනිණි. උපාසිකාව ඔහු ගෙල බැඳි දහසින් පිරි පොදිය දැක පුත, මේ ඔබ කොහින් ලැබුවේ ද ? ගම් දරුවන්ගෙන් විමසූහ. එපුවත අසා පුත, මම ඔබ ලත් කුලියෙන් ජීවත්වනු කැමැත්තී ද ? මෙතරම් දුක් වින්දේ කිමදැ යි කියා බෝසතුන් උණු දියෙන් නාවා මුළු ඇඟ තෙල් ගා පැන් පොවා පථ්‍යය අහර කවා දිවි කෙළවර බෝසතුන් සමග කම් වූ පරිදි මිය ගියාය.

බුදුරදහු, මහණෙනි, තථාගත තෙමේ අසමධුර වූයේ දැන් පමණක් නො වේ. පෙර ද අසමධුර වූයෙමි යි මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා අනුසන්ධි ගැළපූහ. සම්මා සම්බුද්ධ ව මේ ගාථාව වදාළහ.

**"යතො යතො ගරුධුරං යතො ගම්භීරවත්තනී**
**තදස්සු කණ්හං යුඤ්ජන්ති ස්වාස්සු තං වහතෙ ධුරන්ති"**

"යම් යම් තැනක මහත් බර ඉසිලීමක් වේ ද යම් තැනක විසම මඟක් වෙයි ද, එහි දී කණ්හ හෙවත් කාළක යොදයි. ඔහු ඒ බර උසුලයි."

එහි "යතො යතො ගරුධුරං" යම් තැනක මහත් බරක් ඉසිලීමට තිබේ ද, අන් ගොන්නු එසවීමට නො හැකි වෙත් ද, " යතො ගම්භීර වත්තනී" හි "වත්තනී" යනු මාර්ගයට නමකි. යම් තැනක දිය හා මඩ වැඩි බව නිසා හෝ කැඩී බිඳී ගිය ඉවුරු ඇති බැවින් හෝ මඟ ගැඹුරු වේ, යන අර්ථයයි. "**තදස්සු කණ්හං යුඤ්ජන්ති**" මෙහි "**අස්සු**" යනු නිපාත පදයකි. එකල්හි කණ්හයා හෙවත් කාළක වසු යොදයි, යන අර්ථයයි. යම් තැනක ඉසිලි යුතු බර මහත් වෙයි ද මඟ ද ගැඹුරු වේ ද, එකල්හි අන් ගොනුන් බැහැරකොට කණ්හයා ම යොදතැ යි කියන ලද්දේ වෙයි. "**ස්වාස්සු තං වහතෙ ධුරන්ති**" මෙහිද "**අස්සු**" යනු නිපාතයක් පමණි. ඔහු ඒ ධුරය උසුලයි යන අර්ථයයි.

මෙසේ බුදුරදහු මහණෙනි, කණ්හයා ඒ බර උසුලයි, දක්වා අනුසන්ධි ගළපා ජාතකය නිමවූහ. එදා මැහැල්ල උප්පලවණ්ණා මෙහෙණිය වූවාය. මැහැල්ලගේ කාලක මම ම වීමි.

## 1. 3. 10.

## මුනික ජාතකය

"**මා මුනිකස්සාති**" යන මේ ජාතකය බුදු රජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වසන්නාහු, මැදවියට පත් ගැහැනියකගේ පෙළඹවීමක් අරබයා දේශනා කළහ. මෙහි කථා පුවත තෙළෙස් වැනි නිපාතයෙහි චුල්ල නාරදකස්සප ජාතකයෙහි එන්නේය. බුදුරදහු ඒ භික්ෂුවගෙන් සැබෑද මහණ, ඔබ උකටලී වූයේ වෙහි ද ? එ සේය ස්වාමීනි, මක් නිසා ද ? ස්වාමීනි, ථුල්ල කුමාරිකාවක නිසාය. බුදුරදහු

මහණ, ඒ ගැහැනිය ඔබට අනර්ථකාරීය. පෙර ද ඔබ ඇගේ විවාහ දිනයේ දී මියගොස් ජනයාට කටගැස්මක් බවට පත්වූවෙහි යි කියා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරන කල්හි බෝසතාණෝ එක් කුඩා ගමක එක කෙළඹියකුගේ ගෙයි ගව යෝනියෙහි උපන්හ. නමින් මහා ලෝහිත විය. ඔහුට චුල්ල ලෝහිත නමින් සොහොයුරකු ද විය. ඒ ගෙහි සියලු කාර්යය භාරය දෙසොහොයුරන්ගෙන් සිදු වේ. ඒ ගෙයි එක් කුමරියක ද ඇත. ඇය එනුවර වැසි එක් මනුෂ්‍යය කුල පුත්‍රයකුට ආවාහ කැර දීමට තීරණය කළේය. ඇගේ මව්පියෝ ඇගේ විවාහ මඟුලේ දී පැමිණි අමුත්තන්ට කටගැස්මක් වන්නේයැ යි කැඳබත් දී එක් මුනික නම් ඌරකු ද ඇතිදැඩි කළහ. මේ දුටු චුල්ල ලෝහිත සොහොයුරුගෙන් විමසීය. අප සොහොයුරන් නිසා මෙගෙදර සියලු වැඩ කටයුතු ඉටුවේ. මේ මිනිස්සු තණ හා පිදුරුම දෙති. මේ ඌරා කැඳබත් ආදියෙන් පෝෂණය කරති. ඌරා කුමන කරුණකින් ඒවා ලබයි ද ? සොහොයුරු චුල්ලලෝහිතය, ඔබ ඌරාගේ භෝජනයට ආශා නො කරනු. මේ ඌරා මළබත් අනුභව කරයි. මෙ කුමරියගේ විවාමඟුලේ දී පැමිණි අමුත්තන්ට කටගැස්මක් වන්නේයැ යි මොවුහු ඌරා පෝෂණය කරති. තව දින කීපයකින් ඒ අමුත්තෝ පැමිණෙති. එවිට ඌරා පාවලින් අදිමින් ඇඳ යටින් ගෙන මරා අමුත්තන්ට සූප ව්‍යඤ්ජන වන අයුරු ඔබට දැක ගත හැකි යි මේ ගාථාව කීය.

**"මා මුනිකස්ස පිහයි ආතුරන්නානි භුඤ්ජති**
**අප්පොස්සුක්කො භුසං ඛාද එතං දීඝායු ලක්ඛණන්ති"**

"මුනිකගේ අහරට ආසා නො කරන්නේය. ඔහු බුදින්නේ
මළ බතය. නිරපේක්ෂව ලැබෙන පිදුරු කන්න. එය
දීර්ඝායුෂ ලැබීමට කරුණුය."

එහි **"මා මුනිකස්ස පිහයි"** මුනික ඌරාගේ අහරට ආසා නවත්වා දමනු. ඔහු කන්නේ මිහිරි බොජුනකැ යි ඔහුගේ අහරට ආසා නො කරනු. කවදා නම් මම ද ඔහු මෙන් සැපවත් වෙම්දැ යි මුනකගේ තත්ත්වය නො පතව. **"ආතුරන්නානි භුඤ්ජති"** මෙහි "

ආතුරන්නාති" නම් මළ බතයි. "අපොස්සුක්කො භුසං ඛාදා" ඔහුගේ භෝජනය ලැබීමට උත්සාහ නො කැර තමාට ලැබෙන පිදුරු කනු. "එතං දීඝායු ලක්ඛණන්ති" ඒ ආයු කාලය වැඩීමට හේතු වේ.

ඉක්බිති ටික දිනකින් ම අමුත්තෝ ආහ. එවිට මුනික මරා නන් අයුරින් මස් පිසූහ. බෝසත්හු චුල්ල ලෝහිතට මෙසේ කීය. සොයුර, ඔබ මුනික දුටුවෙහි ද ? එ සේය සොහොයුරාණෙනි, මුනිකගේ භෝජන ඵලය දුටිමි. ඔහුගේ ඒ බතට වඩා අපගේ තණ හා පිදුරු ආහාරය සිය ගුණයෙන් උසස් වේ. නිවැරදි වේ. දීර්ඝායුෂ ලක්ෂණයක් ද වේ.

බුදුන් වහන්සේ මහණ, ඔබ මෙසේ පෙර ද මේ කුමරිය නිසා ජීවිතක්ෂයට පත්ව මහජනයාගේ කටගැස්මක් බවට පැමිණියේ වනැයි මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා සිව්සස් දෙසූහ. සිව්සස් කෙළවර උකටලී භික්ෂුව සෝවාන් පෙළෙහි පිහිටියේය. බුදුරජාණන් වහන්සේ අනුසන්ධි ගළපා ජාතකය නිමවා වදාළ සේක. එකල්හි මුනික සූකරයා උකටලී භික්ෂුව විය. චුල්ල ලෝහිත ආනන්ද විය. මහා ලෝහිත වනාහි මම ම වීමි.

## තෙවැනි කුරුඞ්ග වර්ගයයි.

1. 4. 1.

## කුලාවක ජාතකය

"කුලාවකාති" යන මේ ජාතක කථාව බුදුරදුන් ජේතවනාරාමයෙහි වසන සේක්, නො පෙරන ලද ජලය පානය කළ භික්ෂුවක අරබයා දෙසූහ. යහළු භික්ෂු දෙනමක් සැවැත් නුවරින් ඈත දනව්වකට ගොස් බත් පහසු තැනක සිත් වූ පරිදි වැස බුදුරදුන් දකින්නෙමු යි, එයින් නික්ම දෙව්රම බලා ගියහ. එක භික්ෂුවක අත පැන් පෙරහනක් ඇත. අනික් භික්ෂුවට නැත. දෙදෙනා ම එකතුව පැන් පෙරා බොති. දිනක් ඔවුහු විවාද කළහ. පෙරහන හිමි භික්ෂුව අනික් භික්ෂුවට පෙරහන නො දී තමා ම පැන් පෙරා පානය කළේය. අනික් භික්ෂුව පෙරහන නො ලැබ දරා සිටීමට නො හැකි ව නො පෙරා ම පැන් පානය කළේය. ඒ දෙදෙනා ම පිළිවෙළින් දෙව්රම් වෙහෙරට අවුත් බුදුරදුන් වෙත පැමිණ වැඳ හුන්හ. උන්වහන්සේ ඔවුන්ගෙන් සුවදුක් විචාරා කොහේ සිට පැමිණියහුදැ යි ඇසූහ. ස්වාමීනි, අපි කොසොල් රට එක් කුඩා ගමක වැස එයින් නික්ම ඔබවහන්සේ දකිනු පිණිස පැමිණියෝ වෙමු. ඔබ දෙදෙන සමගියෙන් ආවහු ද ? පෙරහන නැති භික්ෂුව ස්වාමීනි, අතර මඟ දී මොහු මා සමග විවාදකොට මට පෙරහන්කඩය නො දුන්නේය. අනෙක් භික්ෂුව මෙසේ කීය. ස්වාමීනි, මේ භික්ෂුව නො පෙරා ම දූන දූන ප්‍රාණීන් සහිත පැන් පානය කළේය. මහණ සත්‍යය ද ? නො පෙරා දූන දූන ප්‍රාණීන් සහිත පැන් පානය කළෙහි ද ? ස්වාමීනි, එ සේය. මා විසින් නො පෙරා පැන් පානය කරන ලදී. මහණ, පෙර නුවණැත්තෝ දිව්‍යය නගරයක රාජ්‍යය කරවන්නාහු යුදයෙන් පැරදී මුහුද මතින් යන්නාහු, තම සම්පත් සඳහා ප්‍රාණ වධ නො කරෙන්නෙමු යි ඒ සා මහත් සම්පත් අතහැර ගුරුළු පැටවුන් වෙනුවෙන් තම ජීවිතය අතහැර රථය නැවත්වූහ යි වදාරා අතීත කථාව ගෙනහැර දක්වූහ.

පෙර මගධ රට රජගහ නුවර එක් මගධ රජෙක් රාජ්‍යය කළේය. එකල බෝසත්හු දැන් සක්දෙවිඳු පෙර අත්බවෙහි මගධ රට මචල නම් කුඩා ගමක උපන්නේ ද, බෝසත්හු ද එම මචල ගමෙහි ම උසස් කුලයක පුතකු වී උපන්නේය. නම් තබන දවසෙහි ඔහුට මඝකුමාර යි නම තැබූහ. ඔහු තරුණ වියට පැමිණියේ මඝ මානවක

නමින් හැඳින්විණි. ඉක්බිති ඔහුගේ මව්පියෝ සමාන ජාති ඇති කුලයකින් දැරියක ආවාහකොට දුන්හ. ඔහු දූපුතුන් සමග වැඩෙන්නේ දානපතියකු විය. පන්සිල් රකී. එම ගමෙහි කුල තිහක් වෙයි. ඒ තිස් කුලයට අයත් මිනිස්සු එක දවසක් ගම මැද එකතු ව ගමෙහි කටයුතු කරත්. බෝසත්හු තමා සිටි තැන පයින් පස් විසුරුවා ඒ පෙදෙස සිත් ගන්නක්කොට සිටියේය. ඉක්බිති වෙනත් අයෙක් අවුත් එතැන සිටියේය. බෝසත්හු වෙනත් තැනකට ගොස් එතැන ද සිත් ගන්නා තැනක්කොට සිටියේය. එතැන ද අනෙකෙක් සිටියේය. බෝසත්හු වෙනත් තැනක් රමණීය තැනක්කොට සිටියේය. එතැන ද අනෙකෙක් සිටියේය. මෙසේ සියල්ලන් සිටි තැන් ම රමණීයකොට පසු කලෙක එහි මණ්ඩපයක් කරවීය. මණ්ඩපය ඉවත්කොට ශාලාවක් කරවීය. එහි දැව අසුන් අතුරා පැන් සැළියක් තැබීය. පසු කලෙක ඒ තිස් ජනයෝ බෝසතුන් හා සමාන අදහස ඇත්තෝ වූහ. බෝසත්හු ඔවුන් පන්සිල්හි පිහිටුවා එතැන් සිට ඔවුන් සමග පින්කම් කරමින් හැසිරෙති. ඔවුහු ද ඔහු සමග පින් කරමින් අළුයම් වේලෙහි නැගිට වෑ, පොරෝ, මොහොල් ගත් අත් ඇති ව සිව්මං සැල් ආදියෙහි මොහොලෙන් ගල් උගුලා පෙරලත්. ගැල්හි අත්ල ගැටෙන ගස් බැහැර කරත්. විසම තැන් සම කරත්. හේදඬු අතුරත්. පොකුණු සාරති. ශාලා කරත්. දන් දෙත්. සිල් රකිත්. මෙසේ බෙහෙවින් ගම්වැසි සියලු දෙන බෝසතුන් අවවාදයෙහි පිහිටා සිල් රක්කෝය.

ඉක්බිති ඔවුන්ගේ ගම්පති තෙම සිතීය. පෙර මොවුන් සුරා බොන කල්හි ප්‍රාණ වධ ආදිය කරන කල්හි එක සුරා සැලියට කහවනුව ආදී වශයෙන් ද දඩ මුදල් වශයෙන් ද මම ධනය ලබමි. දැන් මඝ මානවක සිල් රක්වමි යි ඔවුන්ට ප්‍රාණ වධ ආදිය කරන්න ඉඩ නො දේයැ යි කිපී දැන් මම ඔවුන් ලවා පන්සිල් රක්කවමි යි රජු වෙත ගොස් දේවයිනි, බොහෝ සොරු ගමේ මිනී මැරුම් ආදිය කරමින් හැසිරෙති යි කීහ. රජු ඒ වචනය අසා යව, ගොස් ඔවුන් අල්ලාගෙන එව යි කීය. ගම් දෙටු ගොස් ඔවුන් සියල්ලන් ම බැඳගෙන අවුත් දේවයිනි, සොරුන් ගෙන එන ලද්දේයැ යි රජුට දැන්වීය. රජ ඔවුන් කළ දේ නො විමසා ම ඔවුන් ඇතු ලවා මඩව යි කීය. ඉක්බිති ඔවුන් සියල්ලන් ම රජ මිදුලෙහි හොවා ඇතා ගෙන ආවේය. බෝසත්හු ඒ සියලු දෙනාට ම අවවාද දුන්හ. තොපි සිල් සිහි කරවු. කේළම් කී අය කෙරෙහි ද රජු කෙරෙහි ද ඇතු කෙරෙහි ද තමා හා සමානකොට මෙත් සිත වඩවු. ඔවුහු ද එ සේ කළහ.

අනතුරුව ඔවුන් මැඩීම සඳහා ඇතු ළඟට ගෙනාවේය. ඔහු ඇදගෙන ආ නමුදු ළං නො වෙයි. මහත් සේ නාදකොට පලායති. එකිනෙකා ඇතකු බැගින් ගෙන ආවේය. ඔවුහු එ සේ ම පලාගියහ. රජ, මොවුන් අත යම් කිසි ඖෂධයක් විය යුතු යි සිතා පරීක්‍ෂා කරනු යි අණ කළේය. පරීක්‍ෂා කරන්නාහු එවැනි දෙයක් නැතැ යි කීහ. රාජ පුරුෂයෝ තොප ළඟ පිරිවහණ කිසි මන්ත්‍රයක් ඇත්ද යි ඇසූහ. බෝසත්හු ඇතැ යි කීහ. රාජ පුරුෂයෝ එවැන්නක් ඇතැ යි සැලකළහ. රජ ඔවුන් සියල්ලන් ම ගෙන්වා තොප දන්නා මන්ත්‍රය කියවු යි කීය. බෝසත්හු මෙසේ කීහ. දේවයිනි, අපගේ අන් මන්ත්‍රයක් නැත. අපි තිස් දෙනා ප්‍රාණ වධ නො කරමු. නුදුන් දේ නො ගනිමු. කාමයෙහි වරදවා නො හැසිරෙමු. බොරු නො කියමු. මත්පැන් නො බොමු. මෙත් වඩමු. දන් දෙමු. මඟ සම කරමු. පොකුණු කනිමු. ශාලා හදමු. මේ අපේ මන්ත්‍රයෙන් ආරක්‍ෂාව ද දියුණුව ද වේ. රජ ඔවුන්ට පැහැදී කේලම් කියූවහුගේ සියලු සම්පත් ද ඔවුන්ට ම දී ඔහු ද දාසකොට දිනි. ඒ ඇතු හා ගම ද ඔවුන්ට ම දුන්නේය. ඔවුහු එතැන් පටන් කැමැති පරිදි පින් කරන්නාහු, සිව් මංසලෙහි ශාලාවක් තනන්නෙමු යි වඩුවකු ගෙන්වා ශාලාව ස්ථාපනය කළහ. මාගමුන් කෙරෙහි කැමැත්තක් නැති හෙයින් ඔවුන්ට සහභාගිත්වයක් නුදුන්හ. එකල බෝසතුන්ගේ ගෙහි සුධම්මා, චිත්‍රා, නන්‍දා, සුජාතා නමින් කාන්තාවෝ සිව් දෙනෙක් වෙති. ඔවුනතුරෙන් සුධම්මා තුමෝ වඩුවන් හා එකතුව, සොහොයුර, මා මේ ශාලාවේ දෙටු තැනැත්තිය කරව යි කීවාය. අල්ලස් දුන්නාය. ඔහු ද මැනවැ යි පිළිගෙන කැණිමඬලට සුදුසු ගසක් වියලා සැස විද කැණිමඬල නිමවා වස්ත්‍රයකින් ඔතා තැබීය. ශාලාව නිමවා කැණිමඬල තබන දිනයෙහි මහත්වරුනි, එක කාර්යයක් අමතක වියැ යි කීය. ඒ කුමක් ද ? කර්ණිකාවක් අවශ්‍යය වේ. හොඳයි, ගෙනෙන්නෙමු. දූන් කැපූ ගසකින් එය කළ නො හැකිය. කලින් කපා සැස, විද තබන ලද කර්ණිකාවක් ලැබිය යුතුය. දූන් කුමක් කළ යුතු ද ? එ සේ සකස්කොට තුබූ මිලට ගතහැකි කර්ණිකාවක් ඇත්ද යි සොයා බැලිය යුතුය. ඔවුන් එ සේ සොයායන්නාහු සුධම්මාගේ ගෙහි දැක මිලට නො ලැබූහ. මා එම ශාලාවේ කොටස්කාරියක කරන්නේ නම් දෙමි යි කී කල්හි අපි මාගමුන් ශාලාවේ කොටස්කාරියන් නො කරම්හ යි කීහ. එවිට වඩුවා, මහත්වරුනි, කුමක් කියන්නහු ද ? බඹලොව හැර මාගමුන් නැති තැනක් නැත. කර්ණිකාව ගනු මැනවි. එවිට ශාලාවේ වැඩ නිමවන්නේය. ඔවුහු ද මැනවැ යි එය ගෙන ශාලාව නිමවා අසුන් පුවරු අතුරා පැන්සාලි තබා කැඳබත් නියම කළහ.

ශාලාව පවුරකින් වටකොට දොරක් යොදා පවුර ඇතුළත වැලි විසුරුවා පවුරෙන් පිට තල් ගස් පෙළක් සිටවූහ. චිත්තා ද එහි උයනක් කැරවූවාය. මල් ගෙඩි හටගන්නා අසවල් රුකක් එහි නැතැ යි කීමක් නැත. නන්‍දා ද එහි පස්වණක් පියුමින් ගැවසුණ පොකුණක් කරවූවාය. සුජාතා කිසිවක් නො කළාය. බෝසත්හු මව්පිය උවැටන, කුලදෙටුවන් පිදීම, බොරු නො කීම, රළු වචන නො කීම, කේළාම් නො කීම, මසුරු මල දුරු කිරීම යන මේ සත් සිරිත් පුරා,

"මාතා පෙත්තිභරං ජන්තුං කුලෙ ජෙට්ඨාපචායිනං
සණ්හ සඛිලසම්භාසං පෙසුණෙය්‍යප්පහායිනං
මච්ඡෙරවිනයෙ යුත්තං සච්චං කොධාභිභුං නරං
තං වෙ දෙවා තාවතිංසා ආහු සප්පුරිසො ඉති"

"මව්පියන් පෝෂණය කරන, කුලදෙටුවන් පුදන, සත්‍යය කථා කරන, රළුබස් නැති, පිසුණු වචන නො කියන, මසුරු මළ දුරු කිරීමෙහි යෙදුණු, ඉවසීමෙන් යුත් මිනිසා තව්තිසා වැසි දෙවියෝ, සත් පුරුෂයකුයැ යි කියති."

මෙසේ පැසසිය යුතු බවට පැමිණ දිවි කෙළවර තව්තිසා භවනෙහි සක් දෙව් රජව උපන්නේය. ඔහුගේ යහළුවෝ ද එහි ම උපන්හ. එකල තව්තිසාවෙහි අසුරයෝ වසති. සක් දෙව් රජ අසාධාරණ රාජ්‍යයෙන් අපට වැඩක් නැතැ යි අසුරයන්ට දිව්‍යය පාණ පොවා මත් වූ පසු පාවලින් ගෙන සිනේරු පර්වත පාදයට ඇද දැමුවේය. ඔවුහු අසුරු භවනයට ම ගියහ. අසුර භවනය වනාහි සිනේරු පර්වතයෙහි යට ම තලයෙහි පිහිටියේය. එය ද තව්තිසා දෙව් ලොව පමණ ම විය. එහි දෙවියන්ට පරසතු රුක මෙන් අසුරයන්ට කපක් පවත්නා චිත්තපාටලී නම් ගසක් වෙයි. ඒ චිත්තපාටලියෙහි මල් පිපුණු කල්හි මේ අපගේ දෙව්ලොව නො වේ. එහි පිපෙන්නේ පරසතු මල්යැ යි දනිති. මහලු ශක්‍රයා අප මත්කොට මහමුහුදට ම ඇද දමා අපගේ දේව නගරය අල්ලාගත්තේය. අප දැන් ඔහු හා යුධකොට ආපසු දේව නගර අල්ලා ගනිමු. කුහුඹුවන් මෙන් සිනේරු වැඹ මත ගමන් කරමින් උඩට නැංගාහුය. ශක්‍රයා

අසුරයෝ නැඟිණැ යි අසා මුහුද මතුපිටට පැනනැඟී යුද කරමින් ඔවුන් විසින් පරදවනු ලැබුවේ යොදුන් දෙසිය පණසක් පමණ වූ වෙජයන්ත නම් රථයෙන් දකුණු මුහුද මතුපිටින් පලායන්ට පටන් ගත්තේය. ඉක්බිති, ඔහුගේ රථය දිය මතුපිටින් වේගයෙන් යන්නේ ඉඹුල් වනයට පැමිණියේය. ඔහුගේ ගමන් මඟෙහි ඉඹුල් වනය තල්වනයක් මෙනි. කැඩි කැඩී මුහුද මත වැටෙයි. ගුරුළු පැටව් මුහුද මත පෙරෙළමින් මහ හඬින් හැඬූහ. ශක්‍රයා මාතලීගෙන් විමසීය. යහළු මාතලී, ඉතා බැගෑ හඬක් ඇසෙයි. ඒ කුමක් ද ? දේවයිනි, ඔබගේ රථ වේගයෙන් ඉඹුල් වනය සුණු විසුණු ව වැටෙන කල්හි ගුරුළු පැටව් මරණ බියෙන් තැතිගෙන මහ හඬින් හඬන්නේය. බෝසත්හු, යහළු මාතලී, අප නිසා මොව්හු නො මැරෙත්වා. සම්පත් නිසා අපි ප්‍රාණ වධ නො කරමු. මොවුන් සඳහා ජීවිත පරිත්‍යාගකොට අසුරයින්ට ජයදෙමු. රථය නවත්වනු යි කියා මේ ගාථාව කීහ.

**"කුලාවකා මාතලි සිම්බලිස්මිං**
**ඊසාමුඛෙන පරිවජ්ජයස්සු**
**කාමං චජාම අසුරෙසු පාණං**
**මායිමෙ දිජා විකුලාවා අහෙසුන්ති"**

"මාතලිය, ඉඹුල් වනයෙහි කැදලිවල වෙසෙන ගුරුළු පැටව් රථයේ හී කෙළවරින් මඟ හරවනු. ඒකාන්තයෙන් අසුරයින්ට ප්‍රාණ පරිත්‍යාග කරමු. මේ ගුරුළු පැටව් විනාශ වූ කැදැළි ඇත්තෝ නො වෙත්වා."

එහි, **"කුලාවකා"** ගුරුළු පැටව්, **"මාතලී"** රියදුරුට ඇමතීය. **"සිම්බලිස්මිං"** මේ ඉඹුල් ගස්වල එල්බෙන කැදලි ඇතැ යි පෙන්වයි. **"ඊසා මුඛෙන පරිවජ්ජයස්සු"** මේ ගුරුළු පැටව් රථයෙහි හී කෙළවරින් යම් සේ නො නැසේ ද, ඒ අයුරින් ඔවුන් වළක්වන්න. **"කාමං චජාම අසුරෙසු පාණං"** ඉදින් අප අසුරයින්ට ජීවිත අත්හරින කල්හි මොවුන්ට සෙතක් වේ නම් ඒකාන්තයෙන් අපි අසුරයින්ට ජීවිත දෙමු. **"මායිමෙ දිජා විකුලාවා අහෙසුන්ත"** මේ පක්ෂීහු, ගුරුළු පැටව් විසිවී ගිය, සුණු විසුණුවී ගිය කැදැළි ඇත්තෝ නො වෙත්වා. අපගේ දුක මොවුන් මත නො දමනු. රථය නවතනු.

මාතලී රියදුරු ඔහුගේ වචනය අසා රථය නවත්වා වෙනත් මඟකින් දෙව්ලොව බලා ගියේය. අසුරයෝ රථය නවත්වනු දැක, නිසැකව ම අනෙක් සක්වලවල ශක්‍රයෝ ද එන්නේය. ඔවුන්ගේ බලය ලැබ රථය නැවැත්වූවා විය යුතුයි. මරණ බයින් බියපත් ව අසුර භවනට ම පිවිසියහ. ශක්‍රයා ද දෙව් ලොවට ම ගොස් දෙදෙව්ලොව දෙවියන් පිරිවරා නුවර මැද සිටියේය. එකෙණෙහි පොළොව බිඳගෙන යොදුන් දහසක් උස වේජයන්ත නම් පහය පැන නැංගේය. ජයග්‍රහණය කෙළවර පැන නැඟුණු බැවින් වේජයන්ත යනුවෙන් ම නමක් තැබූහ. ශක්‍රයා නැවත අසුරයන්ගේ පැමිණීම වළක්වනු සඳහා ස්ථාන පසක ආරක්ෂා තැබූහ. ඒ සඳහා කියන ලදී.

"අන්තරා ද්විත්තං ආයුජ්ඣපුරානං
පංචවිධා ඨපිතා අභිරක්ඛා
උරග කරොටි පයස්ස ච හාරී
මදනයුතා චතුරො ච මහන්තා"

"යුදකොට ජය ගත නො හැකි, දේව අසුර දෙපුර අතර පඤ්චවිධ විශේෂ ආරක්ෂා තැබූහ. ඒවා නම්, උරග, කරෝටි, පයස්සහාරී, මදනයුත, සතරවරම් රජ යන පසයි."

දේව නගරය හා අසුර නගරය යන නගර දෙක යුදකොට ගැනීමට නො හැකි බැවින් අයුජ්ඣ පුර නම් විය. යම් කලෙක අසුරයෝ බලවත් වෙත් නම් දෙවියන් පලාගොස් දෙව් නුවරට ගොස් දොර වැසූ කල්හි ලක්ෂයක් අසුරයන් පැමිණිය ද කිසිවක් කළ නො හැකි වෙයි. යම් කලෙක දෙවියෝ බලවත් වෙත් ද, අසුරයන් පලාගොස් අසුර නගරයේ දොරටුව වැසූ කල්හි ශක්‍රයන් ලක්ෂයකට වුව ද කිසිවක් කිරීමට නො හැකි වෙයි. ඒ නිසා මේ නගර දෙක යුද්ධකොට අල්ලාගත නො හැකි නගර විය. ඒ නගර දෙක අතර පස් උරග නිදි තැනක ශක්‍රයා විසින් ආරක්ෂා තබන ලදී.

මෙහි උරග ශබ්දයෙන් නාගයෝ ගන්නා ලදහ. ඔවුහු ජලයේ බලවත් වෙති. එම නිසා සිනේරු පර්වතයෙහි පළමු වැනි වළල්ලෙහි

ඔවුන්ගේ ආරක්‍ෂාව ලැබේ. කරෝටි ශබ්දයෙන් ගුරුළෝ ගැනෙති. කරොටි නම්, ඔවුන් ගන්නා ආහාරයකි. ඒ නිසා ඔවුන්ට ඒ නම ලැබිණ. දෙවැනි වළල්ලෙහි ඔවුන්ගේ ආරක්‍ෂාව තිබේ. පයස්සහාරි ශබ්දයෙන් කුම්භාණ්ඩයෝ ගන්නා ලදහ. මොවුහු දානව නම් රාක්‍ෂයයෝය. තෙවැනි වළල්ලෙහි ඔවුන්ගේ ආරක්‍ෂාව තිබේ. මදනයුත ශබ්දයෙන් යක්‍ෂයෝ ගැනෙත්. සදාචාරයෙන් තොර ඔවුහු යුධ කැමැත්තෝය. ඔවුහු සතර වැනි වළල්ලට ආරක්ෂාව දෙති. චතුරෝ මහන්තා නම් සතරවරම් රජවරුය. ඔවුහු පස් වැනි වළල්ලෙහි ආරක්‍ෂාවෙහි නියුක්තය. මේ අසුරයෝ ඉදින් කිපී කැළැඹුණු සිතින් දේව පුරයට යත් ද පර්වතයේ පළමු වැනි වළල්ලට පැමිණියාහු ද එහි දී නාගයෝ ඔවුන් වළකාලති.

මෙසේ මේ පස්දෙනා රැකවරණයෙහි යොදා දෙවියන්ට ප්‍රධානියා වූ ශක්‍රයා දිව්‍යය සම්පත් විඳිද්දී සුධම්මා චුතව ඔහුගේ ම භාර්යාව වී උපන්නීය. කැණිමඬල දුන් පිනින් ඇයට සුධම්මා නමින් යොදුන් පන්සියක් පමණ වූ මැණික්මය දෙව් සබා ශාලාව පහළ විය. දිව්‍යයමය සුදු සේසත්, යට යොදුනක් පමණ රුවන් පළඟෙහි හුන්නේ දෙවියන්ට ප්‍රධාන වූ ශක්‍රයා දෙව් මිනිසුන් වෙනුවෙන් කළයුතු කටයුතු කරයි. චිත්තා ද චුතව ඔහුගේ ම බිරිය වී උපන්නාය. උයන කැර වූ පිනෙහි විපාක වශයෙන් ඇයට චිත්තලතා වන නම් උයන පහළ විය. නන්දා ද මියගොස් ඔහුගේ ම භාර්යා වශයෙන් උපන්නාය. පොකුණ කැර වූ පුණ්‍යය විපාකයෙන් නන්දාපොකුණ පහළ විය.

සුජාතා වනාහි පින්කම් නො කළ බැවින් එක කැළයක දිය කඳුරක කෙකිණියක් ව උපන්නාය. ශක්‍රයා සුජාතාව නො දක කොහි උපන්නීදැ යි බලන්නේ ඇය දක එහි ගොස් ඇය රැගෙන දෙව්ලොව ගොස් ඇයට සිත්කළු දේව නරගය ද සුධම්මා දේව සබාව ද චිත්තලතා වනය ද නන්දා පොකුණ ද පෙන්වා මොවුහු පින්කොට මගේ ම භාර්යාවන් වශයෙන් උපන්නාහ. ඔබ කිසි කුසලයක් නො කොට තිරිසන් යෝනියෙහි උපන්නෙහිය. මෙතැන් පටන් සිල් රකිවු යි ඔවදන් දී පන්සිල්හි පිහිටුවා ඒ විලට ම ගෙන ගොස් දැමීය. ඇය ද එතැන් සිට සිල් රකියි. ශක්‍රයා දින කීපයකින් ඇයට සිල් රැකිය හැකිදැ යි විමසනු සඳහා එහි ගොස් මත්ස්‍යයකුගේ වේෂය ගෙන උඩුකුරු ව ඇය ඉදිරියේ හොත්තේය. ඇය මළ මසකුයැ යි සිතා හියෙන් අල්ලාගත්තීය. එවිට මසු නගුට සෙලවීය. ඇය මසු ජීවත්ව

සිටියැ යි හැඟම් යි ඉවත දැමුවාය. ශක්‍රයා, සාධු, සාධු යි, ඇයට සිල් රකින්න හැකි යි ගියේය. ඇය එයින් චුතව බරණැස් නුවර කුඹල් ගෙයක උපන්නාය. ශක්‍රයා ඇය කොහි උපන්නීද යි බලන්නේ එහි උපන්බව දැන රන්කැකිරි යානයක් පුරවා මහළු වේශයකින් ගම මැද හිඳ කැකිරි ගන්නහු ද ? රන් කැකිරි ගන්නහු දැ යි ඝෝෂා කළේය. මිනිස්සු අවුත් පියාණෙනි, දෙනු මැනවැ යි ඉල්ලූහ. මම සිල් රකිනවුන්ට දෙමි. ඔබලා සිල් රක්නාහු ද ? අපි සිල් නො දනිමු. මිලට දෙන්න. මට මුදලින් වැඩක් නැත. සිල් රකින්වුන්ට ම දෙමි. මිනිස්සු මේ මෝඩයා කවරෙක්ද යි කියමින් ගියහ. සුජාතාව මේ පුවත අසා මා සඳහා ගෙනාවා විය යුතු යි සිතා ගොස් පියාණෙනි, දෙන්නැ යි කීවාය. දියණිය, සිල් රකින්නෙහිද යි ඇසීය. එ සේය. මම සිල්රකිමි. මවිසින් මේවා ඔබ සඳහා ම ගෙන එන ලදී. යානය සමග ම ගෙදර තබා ගියේය. ඇය දිවිහිමියෙන් සිල් රැක එයින් චුතව වේපචිත්ති නම් අසුරිඳුගේ දියණිය වී උපන්නාය. සිල් බලයෙන් රූමත් වූවාය. නිසි වයසට පැමිණි කල්හි, මාගේ දියණිය අබිමත හිමියකු තෝරා ගනීවා යි අසුරයන් රැස් කළේය. ශක්‍රයා ද කොහි උපන්නේද යි බලන්නේ එහි උපන්බව දැක ඇය අබිමත හිමියකු තෝරා ගන්නී, මා තෝරා ගනිතැ යි අසුර වේශක් මවාගෙන එහි ගියේය. අසුරිඳු දියණිය සරසා අසුරයන් රැස් වූ තැන ම ගෙනවුත් අබිමත හිමියකු තෝරාගන්නැ යි කීහ. ඕ අසුර පිරිස බලන්නී, ශක්‍රයා දැක පෙර සෙනහස නිසා මේ මාගේ සැමියා යි අල්ලා ගත්තාය. ශක්‍රයා ඇය දේව නගරයට ගෙනවුත් අඩතුන් කෙළක් නිළියන්ට දෙටුකොට ආයු ඇතිතාක් සිට කම් වූ පරිදි මියපරලොව ගියේය.

බුදුරදහු මේ දම් දෙසුම ගෙන හැර දක්වා මහණ, පෙර නුවණැත්තෝ දේව රාජ්‍යය කරන්නාහු, තමාගේ ජීවිතය අත් හරින්නාහු, ප්‍රාණ වධය නො කළහ. ඔබ මේ නෛසර්ගික බුදුසසුනේ පැවිදි ව නො පෙරා ප්‍රාණීන් සහිත පැන් බොන්නෙහි යි භික්ෂුවට ගරහා අනුසන්ධි ගළපා ජාතකය නිමවූහ. එදින මාතලී රියදුරු ආනන්ද තෙරණුවෝ වූහ. ශක්‍රයා මම ම වීමි.

## 1. 4. 2.

# නච්ච ජාතකය

"රුදං මනුඤ්ඤං‍ත්ති" යන මේ දම් දෙසුම බුදු රදහු දෙව්රම් වෙහෙර වසන්නාහු, බොහෝ පිරිකර ඇති භික්ෂුවක් අරබයා දේශනා කළහ. කථා පුවත යට දේව ධර්ම ජාතකයෙහි කී අයුරුමැ යි. බුදුරදහු මහණ, ඔබ බොහෝ පිරිකර ඇත්තෙක් වූයේ සැබෑ ද ? ස්වාමීනි, එසේය. මහණ, ඔබ කුමක් නිසා බහුභාණ්ඩික වූයෙහි ද ? ඔහු මෙපමණක් අඳන සිවුර අතහැර නග්න ව බුදුරදුන් ඉදිරියේ සිටියේය. මිනිස්සු චී චී යි කීහ. ඔහු එතනින් පලාගොස් ගිහිබවට පත්විය. භික්ෂූහු දම් සභාවෙහි හුන්නාහු, බුදුරදුන් ඉදිරියෙහි මෙසේ කරන්නේදැ යි ඔහුගේ අගුණ කථාකළහ. බුදුරදහු වැඩ මහණෙනි, දැන් කවර කථාවකින් හුන්නාහුදැ යි භික්ෂූන්ගෙන් ඇසූහ. ඒ භික්ෂුව ඔබ වහන්සේ ඉදිරියේ, සිව්පිරිස් මැද හිරි ඔතප් අතහැර ගම් දරුවකු මෙන් නග්න ව සිට මිනිසුන් විසින් පිළිකුල් කරනු ලබන්නේ, ගිහිබවට පෙරලී සසුනින් පිරිහුණේය. ඔහුගේ අගුණ කථා කරමින් හුන්නෙමු. මහණෙනි, ඒ භික්ෂුව විළිබිය නැති නිසා උසස් සසුනෙන් පිරිහුණේ දැන් පමණක් නො වේ. පෙර ද ස්ත්‍රී රත්නයක් නො ලැබීමෙන් පිරිහුණේයැ යි වදාරා ඉකුත් වත ගෙනහැර දැක්වූහ.

පෙර පළමු වැනි කල්පයෙහි සිව්පාවෝ සිංහයා රජබවට පත් කළහ. මත්ස්‍යයෝ ආනන්‍ද මත්ස්‍යයා ද පක්ෂීහු සුවර්ණ හංසයා ද රජ කළහ. ඒ හංස රජුගේ දියණිය වූ හංස පෝතාකාව අභිරූපවත් වූවාය. හංස රාජයා ඇයට වරයක් දුන්නේය. ඇය තමාට කැමැති හිමියකු තෝරා ගැනීමට කැමැති වූවාය. හංස රාජයා ඇයට වරය දී හිමවතෙහි සියලු පක්ෂීන් රැස්කැරවීය. නානාප්‍රකාර හස්, මොණර ආදී පක්ෂීහු එක්ව මහත් ගල්තලාවක රැස්වූහ. හස් රජු තමාට අබිමත හිමියකු පැමිණ තෝරා ගන්නැ යි දියණිය කැඳවීය. ඕ පක්ෂී සමූහය බලන්නී, මිණිවන් ගෙල ඇති විසිතුරු පිල් ඇති මොණරකු දැක මොහු මගේ ස්වාමියා වේවා යි කැමැති වූවාය. පක්ෂී සමූහයා මොණරා වෙත පැමිණ මෙසේ කීහ. යහළු මොණර, රජ දුව මෙපමණක් පක්ෂීන් මැද සැමියකු රුචිවන්නී ඔබ දැක්වූවාය. මොණරා අදවත් මගේ තරම නො පෙනෙත්දැ යි ඉතා සතුටින් විළිබිය හැර ඒ මහා

පක්ෂි සමාගමෙහි පිළිවිහිදා නටන්නේ නො වැසුණු තැන් ඇත්තකු විය. හස් රජ ලජ්ජාවට පත්ව මොහුට සිතෙහි ඇතිවන ලජ්ජාව හෝ බාහිරින් හටගන්නා බිය හෝ නැත. විලිබිය සිඳ දැමූ මොහුට මගේ දියණිය නො දෙමි යි පක්ෂි සමූහයා මැද මේ ගාථාව කීවේය.

"රුදං මනුඤ්ඤං රුචිරා ච පිට්ඨී
වෙළුරියවණ්ණූපනිභා ච ගීවා
ව්‍යාමමත්තානි ච පෙඛුණානි
නච්චෙන තෙ ධීතරං නො දදාමීති"

"හඬ මනෝඥය. පිට නානාවර්ණයෙන් හොබනේය. ගෙල පෙදෙස වෙරළුමිණි පැහැ ඇත්තේය. පිල් කළඹ බඹයක් පමණ දිගය. එහෙත් නැටීම නිසා මගේ දියණිය ඔබට නො දෙමි."

එහි "රුදං මනුඤ්ඤං" මෙහි 'ත' කාරයට 'ද' කාරය විය. රුතං විය යුතුයි. ස්වභාවයෙන් ලැබුණ නාදය මිහිරිය යන අර්ථයයි. "රුචිරා ච පිට්ඨී" ඔබගේ පිට පෙදෙස විසිතුරුය. පියකරුය. "වෙළුරියවණ්ණූපනිභා" ඔබගේ ගෙල බඳින ලද වෙළුරිය මිණිවන් වේ. "ව්‍යාමමත්තාන" බඹයක් පමණ වූ, "පෙඛුණානි" පිල්, "නච්චෙන තෙ ධීතරං නො දදාමීති" ලජ්ජා බය හැර නැටූ බැවින් ම මෙබඳු නිර්ලජ්ජිත වූ ඔබට දුව නො ලැබේ යි කියා ඒ පිරිස මැදට හොත් රජු තමාගේ ම බෑණාවන හස් පැටවකුට තම දියණිය පාවා දුන්නේය. මොණරා හස් දියණිය නො ලැබ ලජ්ජාවට පත්ව එතැනින් ඉගිලී පලා ගියේය. හස් රජු ද තම නිවහනට ම ගියේය. බුදුරදහු මහණෙනි, මොහු විලිබිය බිඳ ශාසනයෙහි පිරිහුනේ දැන් පමණක් නො වේ. පෙර ද ඒ නිසා ස්ත්‍රී රත්න ප්‍රතිලාභයෙන් පිරිහුණේය ම වීයැ යි වදාරා මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා නිමවූහ එකල මොණරා බහුභාණ්ඩික භික්ෂුව විය. හංස රාජයා මම ම වීමි.

## 1. 4. 3.

## සම්මෝදමාන ජාතකය

"සමෙමොදමානා" යන මේ දේශනාව බුදු රදහු කිඹුල්වත ඇසුරුකොට නිග්‍රෝධාරාමයෙහි වසන්නාහු, සුඹුළු කලහයක්[1] අරබයා දෙසූහ. ඒ පුවත කුණාල ජාතකයෙහි එන්නේය. එදා බුදුරදහු නෑයන් අමතා මහරජවරුනි, නෑයන් ඔවුනොවුන් අතර කලහය සුදුසු නො වේ. පෙර තිරිසන්නු පවා සමගි ව සිටි කාලයෙහි පසමිතුරන් අභිබවා සිටියහ. ඔවුනොවුන් අසමගි වූ කල්හි මහත් විනාශයකට පත්වූහ යි වදාරා නෑ රජුන් විසින් අයදනා ලදුව අතීත කථාව ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරවන කල්හි බෝසත්හු වටු යෝනියෙහි ඉපිද නොයෙක් දහස් ගණන වටුවන් පිරිවරා වනයෙහි වෙසෙති. එකල වටු වැද්දෙක් වටුවන් වසන ස්ථානයන්ට ගොස් වටු හඬකොට ඔවුන් රැස්වූ බව දැන ඔවුන් මතුයෙහි දැල එළා දැලේ කෙළවර මඬිමින් සියල්ලන් එක්තැන්කොට පැස පුරවාගෙන ගෙට ගොස් වටුවන් විකුණා ලැබෙන මිලෙන් දිවි ගෙවයි. දිනක් බෝසත්හු ඒ වටුවන්ට කීහ. මේ වටු වැද්දා අපගේ නෑයන් විනාශ කරයි. වැද්දාට අප අල්ලා ගැනීමට නො හැකි වන එක් උපායක් මම දනිමි. මින්මතු වැද්දා තොපල මතුපිට දැල දැමූ කල්හි එක එකා එක එක දැල් සිදුරෙහි හිස තබා දැල ඔසවා කැමැති තැනකට ගෙනගොස් කටු ලැහැබක දැල රඳවමු. මෙසේ ඇතිකල යටින් ඒ ඒ තැනින් පලා යන්නෙමු. වටු රැල ද මැනවැ යි පිළිගත්හ. දෙවැනි දවස්හි වැද්දා වටුවන් මතුපිට දැල එලූ කල බෝසතුන් කී පරිදි ම දැල ඔසවා එක් කටු ලැහැබක දමා දැල යටින් තැන් තැන්වලින් පලා ගියහ. කුරුළු වැද්දා කටු ලහැඹින් දැල මුදා ගන්නා විට ම සවස් විය. ඔහු හිස් අතින් ම ගියේය. දෙවැනි දවස් සිට ම වටුවෝ එ සේ කරත්. හිරු බැස යන තෙක් දැල පමණක් දෙන්නේ කිසිවක් නො ලැබ හිස් අතින් ම ගෙදර යයි. වටු වැද්දාගේ බිරිය කිපී හැම දින ම ඔබ එන්නේ හිස් අතිනි. පිටත, තවත් ඔබට පෝෂණය කළ යුතු තැනක් ඇතිබව හැඟෙයි, කීවාය. වටු වැද්දා සොඳුර, එවැනි තැනක් මට නැත. එසේ වුවත් වටුවෝ

1 සුඹුළු කලහ (චුම්බට කලහ) යන්න සුමඞ්ගල ශබ්ද කෝෂයෙහි දක්වන්නේ, ශාක්‍යය රජවරුන් ගැහැනුන් පිණිස කළ කලහය යනුවෙනි.

සමගිව හැසිරෙති. මා දැල දමූ කෙනෙහි ම ඔවුහු දැල ඔසවා ගෙනගොස් කටු ලැහැබක දමා ඉගිලී යත්. එහෙත් මොවුහු හැමදාම සමගිව සතුටින් නො හැසිරෙන්නෝය. එම නිසා දුක් නො වනු. ඔවුන් දබර වූ දාට සියල්ල ම රැගෙන තිගේ මුහුණ සිනහගන්වමින් එන්නෙමි කියා බිරියට මේ ගාථාව කීය.

"සමොදමානා ගච්ඡන්ති ජාලමාදාය පක්ඛිනො
යදා තෙ විවදිස්සන්ති තදා එහින්ති මෙ වසන්ති"

"පක්ෂීහු දැල රැගෙන සතුටින් යත්. යම් දවසක ඔවුහු වාදවිවාද කරත් ද එදා මගේ ගොදුර බවට පත්වන්නාහ."

"යදා තෙ විවදිස්සන්ති" යම් කලෙක ඒ වටුවෝ විවිධ මති මතාන්තර ඇත්තෝව වාද විවාද කෙරෙත් ද කලහ කරත් ද යන අර්ථයයි. "තදා එහින්ති මෙ වසං ති" ඒ කාලයෙහි ඒ සියල්ලෝම මගේ ගොදුර බවට එන්නාහ. එවිට මම ඔවුන් ගෙන තිගේ මුහුණ සන්තෝෂ කරමින් එන්නෙමි යි සිය බිරිය අස්වැස්සේය.

කීප දිනක් ඉක්ම යාමෙන් වටුවකු ගොදුරු බිමට බසින්නේ නො සැලිකිලිමත්ව අනෙකුගේ හිස පෑගීය. එවිට අනිකා කවරෙක් මගේ හිස පැගීදැ යි කිපියේය. මම නො සැලකිල්ල නිසා පෑගීමි. නො කිපෙනු යි කීව ද කිපියේමය. ඔහු පුන පුනා කියන්නාහු, ඔබ ම දැල ඔසවයි, ඔවුනොවුන් විවාද කළහ. මෙසේ මොවුන් දබර කරද්දී බෝසත්හු සිතූහ. දබර කිරීමෙහි යහපතක් නැත. දැන් ම ඔවුහු දැල නො උස්සන්නාහ. එයින් මහත් විනාශයකට පැමිණෙන්නාහුය. වටු වැද්දාට ඉඩක් ලැබෙන්නේය. අපි මෙහි විසීමට නො හැකි වන්නෙහි යි ඔහු තම පිරිස රැගෙන වෙන තා ගසකට ගියේය. වටු වැද්දා ද ටික දිනකට පසු අවුත් වටු හඬින් හඬා ඔවුන් රැස් වූ කල්හි මතුපිට දැල එලීය. එවිට එක් වටුවෙක් තා දැල ඔසවන විට පියාපත් දෙකෙන් පිහාටු වැටිණි. දැන් ඔබ ම ඔසවනු යි කීය. මෙසේ ඔවුන් තෝ ඔසවනු, තෝ ඔසවනු යි කියමින් වාද කරද්දී ම වටු වැද්දා දැල ඔසවා ඒ සියල්ලන්ම එකතුකොට පැස පුරවාගෙන බිරිය සිනහ ගන්වමින් ගෙට ගියේය.

බුදුරදහු මහරජවරුනි, ඥාතීන් අතර කලහය නම් සුදුසු නො වේ. කලහය විනාශයට මුලමයැ යි මේ ධර්ම දේශනාව වදාරා ජාතකය නිමවූහ. එදින මෝඩ වටුවා දෙව්දත් විය. නුවණැති වටුවා මම ම වීමි.

## 1. 4. 4.

## මච්ඡ ජාතකය

**"න මං සීතං න මං උණ්හන්ති"** යන මේ ජාතක දේශනාව බුදුරදුන් දෙව්රමෙහි වසන සේක්, පෙර කල බිරියගේ පෙළඹවීමක් අරබයා දෙසූහ. එකල බුදුරදහු ඒ භික්ෂුවගෙන් මහණ, ඔබ උකටලීවූවෙහි ඇත්ත ද ? ස්වාමීනි, එ සේය. ඔබ උකටලී කරන ලද්දේ කවරකු විසින් ද ? ස්වාමීනි, මා පෙර ගිහි කල බිරියයි. මිහිරි අත්පහස ඇති නිසා ඇය අත්හැරීමට නො හැක්කෙමි. ඉක්බිති, බුදුරදහු මහණ, මේ ස්ත්‍රිය අනර්ථකාරිය. පෙර ද ඔබ මේ ස්ත්‍රිය නිසා මරණයට කැපව සිටියදී මා වෙත පැමිණ මරණින් මිදුණේයැ යි අතීත කථාව ගෙනහැර දක්වූහ.

පෙර දඹදිව බඹදත් රජු රාජ්‍යය කරවන කල්හි බෝසත්හු ඔහුගේ පුරෝහිත විය. එදවස ධීවරයෝ නදියෙහි දල දැමූහ. එකල එක් මහා මත්ස්‍යයෙක් ඇල්ම නිසා තමාගේ මැසින්න සමග ක්‍රීඩා කරමින් යන්නේය. මැසින්න පෙරටුව යන්නී, දැලෙහි ගඳ දැනී එය මඟ හරිමින් ගියාය. රතියෙහි ඇළුණු ලොල් මසු දල තුළට ම පිවිසියේය. ධීවරයෝ මාළුවා එහි පිවිසි බව දැන දල ඔසවා මසු ගෙන නො මරාම වැලි මත දමා මූ කිහිරි අඟුරෙහි පිස කන්නෙමු යි අඟුරු බස්සවති. උල් තනති. මසු කිහිරි අඟුරෙහි තැබීම හෝ හුලින් ඇනීම හෝ වෙන යම් දුකක් හෝ මා නො පෙළයි. යම් කිසි විදියකින් ඒ මැසින්න මා වෙනත් මැසින්නක් කරා ගියේයැ යි සිතා මා කෙරෙහි දොම්නසට පත් වේ ද එය ම මා පෙළයී, හඬමින් මේ ගාථාව කීය.

"න මං සීතං න මං උණ්හං න මං ජාලස්මිං බාධනං
යං ච මං මඤ්ඤතෙ මච්ඡී අඤ්ඤං සො රතියා ගතොති"

"සීතල මා නො පෙළයි. උෂ්ණය නො පෙළයි. දැලෙහි බැඳීම ද මා නො පෙළයි. යම් හෙයකින් මා නො දකින මැසින්න හේ වෙන මැසින්නක සඳහා කාම රතිය පිණිස ගියේයැ යි සිතයි ද එය ම මා පෙළයි."

එහි "න මං සීතං න මං උණ්හං" මසුන් දියෙන් ගොඩගත් කල සිතල වේ. දියට ගිය කල්හි උණුසුම් වේ. මේ දෙක ම සඳහා මට සීත හෝ උණුසුම පීඩා නො කැරේ යි, වැලපෙයි. කිහිරතුරෙහි පැසීම මුල්කොට දුක් ඇතිවෙයි. ඒ සඳහා ද මට උණුසුම පීඩාවක් නො වේ යි, වැලපෙයි. "න මං ජාලස්මිං බාධනං" මා දැලෙහි බැඳීමක් වී ද එය ද මා නො පෙළයි. නො වැලපෙයි. මෙහි ලුහුඬු අදහස නම්, ඒ මැසින්න දැලෙහි බැඳුණු මා කෙවුලන් විසින් අල්ලා ගන්නා ලද බව නො දන්නී. මා නො දකින විට දැන් ඔහු වෙනත් මැසින්නක සමග කම් සුව පතා ගියේයැ යි සිතන්නී ද නො සතුටට පත් ඇගේ ඒ සිතුවිල්ල මා පෙළයි, වැලිතලාවෙහි වැතිරී සපමින් වැලපෙයි.

ඒ වෙලාවෙහි පුරෝහිතයා දස් පිරිස පිරිවරා නහනු පිණිස ගංතෙරට පැමිණියේය. ඔහු වනාහි සියල්ලන්ගේ හඬ දන්නෙකි. එහෙයින් ඔහු මසුගේ වැලපීම අසා මෙසේ සිතී ය. මේ මසු කෙලෙස් වසඟ ව හඬයි මෙසේ කැළඹුණු සිතින් මිය යන්නේ ද නිරයෙහි ම උපදින්නේ ය. මා මොහුට පිහිට වන්නෙමි. කෙවුලන් වෙත ගොස් එම්බල, අපට තොපි එක දවසක්වත් ව්‍යාඤ්ජන සඳහා මසකු නො දේවියැ යි කීය. ස්වාමීනි, කුමක් කියන්නහු ද ? ඔබට කැමැති මසකු ගෙන යනු මැනවැ යි කියූහ. අපට අන් මසකුගෙන් කම් නැත. මේ මසුම දෙනු. ස්වාමීනි, ගනු මැනව. බෝසත්හු මසු දෙඅතින් ගෙන ගංතෙර හිඳ එම්බල මත්ස්‍යය, අද මා තා නො දුක්කේ නම් මරණයට පත්වන්නේය. දැන් මෙතැන් පටන් කෙලෙස් වසඟ නො වෙනු යි අවවාදකොට ජලයට මුදාහැර නගරයට ගියේය.

බුදු රදහු මේ ජාතකය ගෙනහැර දක්වා සිව්සස් වදාළ සේක.

දෙසුම කෙළවර උකටලී භික්ෂුව සෝවාන් පෙලෙහි පිහිටියේය. බුදුරදහු පූර්වාපර සන්ධි ගළපා ජාතකය නිමවූහ. එකල මැසින්න ගිහි කල බිරිය වූවාය. මසු උකටලි භික්ෂුව විය. පුරෝහිත මම ම වීමි.

## 1. 4. 5.

## වට්ටක ජාතකය

**"සන්ති පක්ඛා"** යන මේ දේශනාව බුදු රජුන් මගධ ජනපදයෙහි සැරිසරන සේක්, ලැව් ගිනි නිවීමක් අරබයා දෙසූහ. එක් කලෙක බුදුරදහු මගධ ජනපදයෙහි සැරිසරමින් එක් කුඩා ගමක පිඬු පිණිස හැසිර බතින් පසු සඟ ගණ පිරිවරා මඟට පිළිපන්හ. එකල්හි මහත් ලැව් ගින්නක් හට ගැනිණි. ඉදිරියෙන් පසුපසින් බොහෝ භික්ෂූහු වූහ. ගින්න ද දුම් කඳකින් යුතුව එක ම ජාලාවක් වී පැතිරෙමින් එන්නේය. එහි සිටි සමහර පුහුදුන් භික්ෂූහු මරණ බියෙන් බියපත් ව ගින්න නැවත්වීම සඳහා විරුද්ධ ගිනි දෙමු යි ඉන් දූවුනු තැන වෙනත් ගින්නක් ඇති නො වේයැ යි ගිනි ගල ගෙන ගිනි දල්වති. සමහර භික්ෂූහු මෙසේ ඇසූහ. ඇවැත්නි, ඔබලා කුමක් කරන්නහු ද? අහස මැද සිටි චන්ද්‍රයා ද උදාගිරෙන් නැඟ එන දහසක් රැස් මඬලින් යුත් හිරු ද මුහුදු වෙරළ අසබඩ සිටියාහු මහ මුහුද ද මහමෙර ළඟ සිටියාහු මහ මෙර පව්ව ද නො දක්නවුන් මෙන් දෙවියන් සහිත ලෝකයෙහි අග පුඟුල් වූ බුදුරදුන් තමා සමග යන්නා වූ සම්මා සම්බුදුන් නොබලා විරුදු ගිනි දෙමැ යි කියාවු ද ? බුදු බල නො දන්නහු ද ? එන්න. බුදුරදුන් වෙත යමු. ඉදිරියෙන් යන්නාහු ද පසු පසින් යන්නාහු ද සියල්ලෝ එක්ව බුදුරදුන් වෙත ගියහ. බුදුරදහු මහ සඟන පිරිවරා එක් පෙදෙසක වැඩ සිටියහ. ලැව් ගින්න අභිබවන්නාක් මෙන් හඬ නංවමින් එයි. එසේ බුදු රජුන් වැඩ සිටි තැනට අවුත් දියෙහි පා කරන ලද තණ හුලක් මෙන් නිවී ගියේය. සොළොස් ගිනි නිවුණු තැන සිට දෙතිස් කිරියක් පමණ තැන ඇවිලීමට නො හැක්කේ දියෙහි වූ තණ හුලක් මෙන් නිවීයයි. භික්ෂූහු, අහෝ බුදු රජුන්ගේ ගුණ මහිමය. බුදු රජහු ඔවුන්ගේ කථාව අසා

මහණෙනි, මේ මගේ අන් බලයක් නො වෙයි. මේ පෙදෙසට ම අවුත් ඒ ගින්න නිවෙයි. මේ මාගේ පැරණි සත්‍යය බලයකි. මෙම පෙදෙසෙහි මේ කප පවතින තුරු ගිනි නො ඇවිලෙන්නේය. මේ කපක් පවතින පෙළහරකි. ඉක්බිතිදු ආනන්ද තෙරණුවෝ බුදුරදුන්ට වැඩ සිටීම සඳහා දෙපට සිවුර සිව් ගුණකොට පැනවූහ. බුදුරදහු පළඟ බැඳ වැඩ සිටියහ. මහසඟන ද බුදුරජුන් වැඳ පිරිවරා වැඩ සිටියහ. ස්වාමීනි, දැන් මේ අපට ප්‍රකටය අතීතය වනාහි වැසී තිබේ. ඒ අපට ප්‍රකට කරනු මැනවැ යි භික්ෂූන් විසින් අයදන ලද බුදුරජහු අතීත පුවත ගෙන හැර දැක්වූහ.

පෙර මගධ රට එම ප්‍රදේශයෙහි ම මහබෝසත්හු වටු යෝනියෙහි පිළිසිඳගෙන බිජුවට පලා නික්මෙන්නාහු, මහ පන්දුවක් පමණ වටු පොව්වෙක් වූයේය. ඉක්බිති, මව්පියෝ ඔහු කැදැල්ලෙහි හොවා මුව තුඩින් ගොදුරු ගෙනවුත් දී පෝෂණය කරත්. ඔහුට පියා දිග හැර අහසින් ගමන හෝ පා ඔසවා ගොඩබිමින් ගමන් කිරීමේ ශක්තියක් හෝ නැත. එම පෙදෙසේ ද වසරක් වසරක් පාසා ලැව් ගිනි හට ගනී. මෙවර ද ලැව් ගින්න මහ හඬ නංවමින් එම පෙදෙසෙහි හට ගත්තේය. පක්ෂී සමූහයා තම තමන්ගේ කැදළිවලින් නික්ම මරණ බයින් බියපත් ව හඬමින් පලායත්. බෝසතුන්ගේ මව්පියෝ ද මරණයෙන් බියපත් වූවෝ බෝසතුන් දමා පලාගියහ. බෝසත්හු කැදල්ලෙහි වැතිර සිටියෝ ම, ගෙල දිගුකොට බලන්නාහු, යටකැරගෙන එන ගින්න දැක සිතුහ. ඉදින්, මට පියා හඟා අහසින් වෙන තැනකට යාමේ බලය වේ නම්, උඩට පැන වෙන තැනකට යන්නෙමි. ඉදින්, පා ඔසවා පියවරෙන් යාමේ බලය ඇත්තේ නම් වෙනත් තැනකට යමි. මගේ මව්පියෝ ද මරණ බයින් බියපත් ව මා හුදකලාව අතහැර තමන්ගේ ආරක්ෂාව සඳහා පලාගියහ. දැන් මට වෙනත් පිළිසරණක් නැත. ආරක්ෂාව නැත්තෙක් වෙමි. අසරණ වෙමි. මා අද කුමක් කළ යුතු ද ? ඉක්බිති, බෝසතුන්ට මෙසේ සිතිණි. මේ ලෝකයෙහි සීල ගුණය ඇත. සත්‍යය ගුණය ද ඇත. අතීතයෙහි පෙරුම් දම් පුරා බෝමැඩ වැඩහිඳ සම්බුදු වූ සීල, සමාධි, ප්‍රඥා, විමුත්ති, විමුත්ති ඥාන දස්සන යනාදියෙන් හෙබි සත්‍යය, කරුණා, ක්ෂාන්ති ගුණයෙන් සපිරි සියලු සතුන් කෙරෙහි සමව පැවැති මෛත්‍රී භාවනා ඇති සියල්ල දත් බුදුවරුන් ද ලොව ඇත. ඔවුන් විසින් අවබෝධ කරන ලද දහම් ගුණ ද ඇත. ඒ කෙරෙහි ද එක ම සත්‍යය ගුණය ද ඇත. කැපී පෙනෙන එක් ස්වභාව ධර්මයක්

පෙනේ. එම නිසා අතීත බුදුරදුන් ද උන්වහන්සේලා විසින් අවබෝධ කරන ලද ගුණ ද සිහිකොට මා කෙරෙහි විද්‍යාමාන වන සත්‍යය ස්වභාව ධර්මය ද ගෙන සත්‍යය ක්‍රියාකොට ලැව් ගින්න පසුබාවා අද මා තමාට සෙසු පක්ෂීන්ට ද සෙත සැලසීම කළ යුතුයි. එහෙයින් කියන ලදී.

**"අත්‍ථි ලොකෙ සීලගුණො සච්චං සොචෙය්‍යානුද්දයා**
**තෙන සච්චෙන කාහාමි සච්චකිරියමනුත්තමං**
**ආවජ්ජිත්‍වා ධම්මබලං සරිත්‍වා පුබ්බකෙ ජිනෙ**
**සච්චබලමපස්සාය සච්චකිරියංඅකාසහන්ති"**

"ලොව සීල ගුණය ඇත. සත්‍යය වචනය, චිත්ත පාරිශුද්ධිය, අනුකම්පාව යන ගුණධර්ම ද ඇත. මේ සත්‍යයෙන් උසස් සත්‍යය ක්‍රියාව කරමි."

ධර්ම ශක්තිය සිහිකොට පෙර බුදුවරුන්ගේ ගුණ සමරා ධර්ම බලයෙහි පිහිටා මම සත්‍යය ක්‍රියා කළෙමි.

ඉක්බිති, බෝසත්හු පෙර පිරිනිව් බුදුවරුන්ගේ ගුණ සිහිකොට තමා තුළ දක්නට ඇති සත්‍යය ස්වභාවය අරබයා සත්‍යය ක්‍රියා කරන සේක්, මේ ගාථාව කීහ.

**"සන්ති පක්ඛා අපතනා සන්ති පාදා අවඤ්චනා**
**මාතා පිතා ච නික්ඛන්තා ජාතවෙද පටික්කමති"**

"නො සැලිය හැකි පියාපත් මට ඇත. අවසඟ පාදයෝ මට ඇත්තාහ. මව්පියෝ ද නික්ම ගියහ. එම්බා ගින්න, ආපසු හැරෙනු."

එහි **"සන්ති පක්ඛා අපතනා"** මට පියාපත් ඇත. එහෙත් එයින් ඉගිලී අහසින් යා නො හැකිය. එම නිසා "අපතනා" වේ. **"සන්ති පාදා අවඤ්චනා"** මට පා ඇත. එහෙත් එයින් පියවර තබා ගමන්

කළ නො හැකිය. එම නිසා "**අවඤ්චනා**" නම්. "**මාතා පිතා ච නික්ඛන්තා**" මා අන් තැනකට ගෙනයා හැකි මවුපියෝ ද මරණ බයින් නික්ම ගියාහුය. "**ජාතවේද**" ගින්නට අමතයි. ගින්න වනාහි උපන් කල්හි පෙනෙන බැවින් "**ජාතවේද**" කියයි. "**පටික්කම**" නවතිනු. ආපසු හැරෙනු යි ගින්නට අණ කරයි. මෙසේ බෝසත්හු ඉදින් මට පියාපත් ඇති බවද එවා විදහා අහසින් ගමන් කළ නො හැකි බව ද සත්‍යයකි. එ සේ ම පාද ඇති බව ද එහෙත් පිය ඔසවා යා නො හැකි බව ද මවුපියන් කැදැල්ලෙහි මා තනිකොට ගිය බව ද සත්‍යයකි. එම්බා ගින්න, මේ සත්‍යය බලයෙන් ඉවත්වන්නැ යි කැදැල්ලෙහි හොත්තේ ම සත්‍යය ක්‍රියා කළහ. බෝසතුන්ගේ සත්‍යය ක්‍රියාව සමග ම සොළොස් කිරියක් පමණ පෙදෙසෙහි ගින්න නිවිණි. ආපසු යන්නේ නො වරදවා ම වනයට ගිය ජලය පා කැර හරින ලද තණ සුලක් මෙන් එහි ම නිවිණ.

"**සහසච්චකතෙ මය්හං මහා පජ්ජලිතො සිඛී
වජ්ජෙසි සොළසකරීසානි උදකං පත්වා යථා සිඛී**"

"මා සත්‍යය ක්‍රියා කළ කල්හි ජලයට පැමිණි ගිනි මෙන්
සොළොස් කිරියක් පමණ තැන ගිනි නිවී ගියේය."

මේ බිම් පෙදෙස මේ කල්පය මුළුල්ලෙහි ගින්නෙන් නො මැඬිය හැකි බැවින් කල්පයක් පවත්නා පෙළහර නම් විය. මෙසේ බෝසත්හු සත්‍යය ක්‍රියාකොට දිවි කෙළවර කම් වූ පරිදි මිය ගියේය.

මහණෙනි, මේ වන පෙදෙසෙ ගින්නෙන් නො දැවීම්. මගේ ඇති බලයක් නො වේ. පෙර වටු පැටවා කළ මාගේ ම සත්‍යය බලයයි. මේ ධර්ම දේශනාව ගෙන හැර දක්වා සිව්සස් පැවසූහ. සිව්සස් කෙළවර කෙනෙක් සෝවාන් වූහ. ඇතැමෙක් සෙදගැමි වූහ. ඇතැමෙක් අනගැමි වූහ. තවත් කෙනෙක් රහත් වූහ. බුදුරදහු පූර්වාපර සන්ධි ගළපා ජාතකය නිමවූහ. එකල මවුපියෝ නම් මෙකල මවුපියෝ ම වූහ. වටු රජ වනාහි මම ම වීම්.

## 1. 4. 6.

# සකුණ ජාතකය

**"යං නිස්සිතා"** යන මේ දේශනාව බුදු රජහු දෙව්රම් වෙහෙර වසන්නාහු, දැවීගිය පන්සලක් ඇති භික්‍ෂුවක් අරබයා දෙසූහ. එක් භික්‍ෂුවක් බුදුරදුන් හමුවෙහි කමටහන් ලබාගෙන දෙව්රමින් නික්ම කොසල් දනව්වෙහි පසල් ගමක් ඇසුරුකොට වන වෙසෙයි. ඔහු වස් විසූ පළමු මසයෙහි ම පන්සල දැවී ගියේය. ඔහු මාගේ පන්සල දැවී ගියේය. දුන් දුක සේ වේයැ යි මිනිසුන්ට කීය. මිනිස්සු, දැන් අපගේ කුඹුරු වියලී ඇත. කුඹුරුවලට වතුර බැඳ කරන්නෙමු යි කීහ. වතුර බැඳි කල්හි බීජ වී පැළ වූ කල්හි වැටක් බැඳ කරමු යි ද ඉන්පසු ධාන්‍යය වැට බැඳි කල්හි කපා පාගා කරමු යි මෙසේ එක එක කාර්යය පෙන්වමින් තුන් මස ම ගත කළහ. ඒ භික්‍ෂුව ද තුන් මස ම එළිමහනෙහි දුක සේ වෙසෙන්නේ, කමටහන වඩා ගුණ විශේෂයක් ඉපදවීමට නො හැකි විය. වස් පවාරණයකොට භික්‍ෂුව, බුදුරදුන් වෙත ගොස් වැඳ එකත් පසෙක හුන්නේය. බුදුරජහු ඔහු සමග පිළිසඳර කථාකොට මහණ, වස් කාලය සුව සේ විසුවෙහි ද ? ඔබගේ කමටහන සඵල වූවෙහි දැ යි විමසූහ. මස්තකප්‍රාප්ත නො විණියැ යි කීය. මහණ, පෙර තිරිසන් සත්තු පවා සුදුසු නුසුදුසු කම් දැන සිටියහ යි සිතා කුමක් හෙයින් නො දත්තෙහි දැ යි කියා වදාරා ඉකුත් වත දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරවන කල්හි බෝසත්හු කුරුළු යෝනියෙහි ඉපිද කුරුළු සමූහයා පිරිවරා මහා වනයෙහි අතුරිකිළි කොළ ගහණ මහා ගසක් ඇසුරුකොට වසති. ඉක්බිති එක් දවසක් ඒ රුකෙහි අතු දෙකත් එකිනෙක ගැටෙන කල්හි දුම් නගී. මේ දැක බෝසත්හු සිතූහ. මෙසේ මේ අතු දෙක ගැටෙත් ම ගිනි පිට වන්නේය. ඒ ගින්න වැටී වියලි කොළ ඇවිලී ගිනි ගනී. එතැන්පටන් ගස ම දැවෙන්නේය. අපට මෙහි විසිය නො හැකිය. මෙතැනින් අන් තැනකට පලා යා යුතු වන්නේය. ඉක්බිති, බෝසත්හු කුරුළු සමූහයා අමතා මේ ගාථාව කීහ.

"යං නිස්සිතා ජගතිරුහං විහඞ්ගමා ස්වායං අග්ගිං පමුඤ්චති
දිසා භජථ වක්කඞ්ගා ජාතං සරණතො භයන්ති"

"කුරුල්ලන් යම් ගසක් ඇසුරුකොට විසුවාහු ද එය ම
ගිනි විහිදුවයි. කුරුල්ලන් ඒ ඒ දිසාවට පලා යනු. අපට
පිහිට වූ ස්ථානයෙන් ම බිය හටගැනිණි."

එහි "ජගතිරුහං" ජගති නම් පොළොවයි. එහි හටගත් බැවින් ගස ද "ජගතිරුහං" යි කියනු ලැබේ. "විහඞ්ගමා" හි "විහ" යනු අහසයි. එහි ගමන් කරන හෙයින් කුරුල්ලා "විහඞ්ගමා" යි කියනු ලැබේ. "දිසා භජථ" මේ ගස හැර මෙයින් පලා යාම සඳහා සිව්දිසා ඇසුරු කරවු. "වක්කඞ්ගා" යි කුරුල්ලන් අමතයි. ඔවුහු හිස සහ ගෙල අවශ්‍යය විට ඒ මේ අතට ඇද කරති. එම නිසා "වක්කඞ්ගා" යි කියති. ඔවුන්ගේ දෙපසෙහි පියාපත් ඇති බැවින් ද මෙනම් වේ. " ජාතං සරණතො භයන්ති" අපට පිහිට වූ ගසෙන් ම බිය හට ගැනිණි. එවු. වෙන තැනකට යමු.

බෝසතුන්ගේ කීකරු නුවණැති කුරුල්ලෝ ඔහු සමග ම එකවර ම ඉගිලී අන් තැනකට ගියහ. එහි සිටි අනුවණ කුරුල්ලෝ මොහු දිය බිඳෙහිත් කිඹුලන් දකිතැ යි බෝසත් වදනය නො පිළිගෙන එහි ම විසූහ. නොබෝ දිනකින් බෝසත් සිතූ අයුරින් ම ගිනි හටගෙන ඒ ගස දැවිණි. දුම් හා ගිනිදැල් නැගී කල්හි දුමින් අන්ධ වූ කරුල්ලෝ අන් තැනකට පලා යාමට අසමත් වූහ. ගින්නට වැටී විනාශ වූහ.

මහණ, පෙර තිරිසන්නු පවා ගස් මුදුන්වල වසන්නාහු, තමාට සුදුසු නුසුදුසු තැන් දනිති. ඔබ කුමක් නිසා නො දත්තෙහි ද ? බුදුරජහු මේ පුවත ගෙනහැර දක්වා සිව්සස් දෙසූහ. සිව්සස් කෙළවර ඒ භික්ෂුව සෝවාන් පෙලෙහි පිහිටියේය. බුදු රජහු පූර්වාපර සන්ධි ගළපා ජාතකය නිමා කළහ. කුරුල්ලෝ මේ බුදුපිරිස වූහ. නුවණැති කුරුල්ලා මම ම වීමි.

## 1. 4. 7.

# තිත්තිර ජාතකය

"යෙ වඩ්ඪමපචායන්ති" යන මේ ජාතකය බුදුරජුන් දෙව්රම් වෙහෙරට වඩින සේක්, සැරියුත් තෙරුණුවගේ සෙනසුන් වැළැකීම අරබයා දෙසූහ.

අනේපිඬු මහසිටුහු විසින් විහාරය කැරවා දූතයන් යවන ලද කල්හි බුදුරජහු රජගහ නුවරින් නික්ම විශාලා නුවරට වැඩ එහි කැමැති කල් වැස සැවැත් නුවරට යන්නෙමි යි මහමඟට පිළිපන්හ. එකල්හි සවග මහණුන්ගේ අතවැසියෝ පෙරටුව ගොස් තෙරවරුන් සෙනසුන් නො ගත් කල්හි මේ සෙනසුන අපගේ උපාධ්‍යායන්ටයැ, මෙය ආචාර්යන්ටයැ, මෙය අපට ම වන්නේ යි සෙනසුන් වෙන්කොට ගනිත්. පසුව පැමිණි තෙරවරු සෙනසුන් නො ලබත්. සැරියුත් තෙරණුවන්ගේ අතවැසියෝ ද තෙරුන් සඳහා සෙනසුනක් සොයන්නාහු නො ලැබූහ. සැරියුත් තෙරණුවෝ සෙනසුනක් නො ලබන්නාහු, බුදුරදුන්ගේ සෙනසුන ළඟ ගසක් මුල සක්මනින් හා වාඩිවීමෙන් ගත කළහ. බුදුරජහු අළුයම් කල්හි නික්ම උගුර පෑදූහ. තෙරණුවෝ ද උගුරු පෑදූහ. මේ කවරෙක් ද ? ස්වාමීනි, මම සාරිපුත්ත වෙමි. සාරිපුත්ත, මේ වේලාවේ මෙහි කුමක් කරහි ද ? තෙරණුවෝ සියලු පුවත් සැලකළහ. බුදුරජහු තෙරුන්ගේ කථාව අසා දැන් මා ජීවත් ව සිටියදී ම භික්ෂූහු ඔවුනොවුන් කෙරෙහි ගෞරවයක් සුවචබවක් නැතිව වෙසෙත්. මා පිරිනිවී කල්හි කුමක් කරන්නාහුදැ යි සිතත් ම ධර්ම සංවේගය පහළ විය. එම රැය ඉකුත් වූ කල්හි බුදුරජහු බික්සඟන රැස් කැරවා මෙසේ දෙසූහ. මහණෙනි, සවග මහණුන් පෙරටුව අවුත් මහතෙරුවරුන්ට සෙනසුන් වළක්වන බව සැබෑ ද ? ස්වාමීනි, සත්‍යයයි. ඉක්බිති, බුදුරජහු සවග මහණුන්ට දොස් පවරා දැහැමි කථා පවත්වා භික්ෂූන් ඇමතූහ. මහණෙනි, කවරෙක් ප්‍රථම ආසනයට, ජලයට, අහාරයට සුදුසු ද ? රජ කුලයෙන් පැවිදි වූ තැනැත්තෝයැ යි සමහරු කීහ. බමුණු කුලයෙන්, ගැහැවි කුලයෙන් පැවිදි වූ තැනැත්තේයැ යි සමහරු කීහ. සමහරු විනයධරයා, ධර්ම කථිකයා, පළමු, දෙවැනි, තෙවැනි, සතර වැනි ධ්‍යාන ලාභියා, ෂට් අභිඥාලාභී පුද්ගලයා සුදුසු බව කීහ. මෙසේ භික්ෂූහු තමතමන් සිතැඟි

පරිදි අග්‍ර ආසනාදියට සුදුසු පුද්ගලයා ප්‍රකාශ කළ කල්හි මහණෙනි, මගේ සසුනෙහි අග්‍ර ආසන ආදියට පත්වීමට රජ, බමුණු, ගැහැවි කුලයෙන් පැවිදි වීම ප්‍රමාණවත් නො වේ. විනයධර, සුත්තන්තික, ආභිධම්මික ආදී තනතුරු දැරීම හෝ ප්‍රථම ධ්‍යාන ආදී විශේෂ ගුණ ලාභී වීම හෝ සෝවාන් ආදී මගඵල ලැබීම හෝ ප්‍රමාණ නො වේ. මහණෙනි, මේ සසුනෙහි වැඩිමහලු පිළිවෙළින් වැඳීම, අසුනෙන් නැඟී සිටීම, ඇඳිළි බැඳීම, ගරු කිරීම කළ යුතුයි. අග්‍රාසන, අග්‍රෝදක, අග්‍රපිණ්ඩ ලැබිය යුතුය. සසුනෙහි සුදුසුබව එයයි. එම නිසා වැඩිමහලු තෙරුණුවෝ මේ සියල්ලට සුදුස්සෝ වෙති. මහණෙනි, සාරිපුත්ත තෙරණුවෝ මගේ අග්‍රශ්‍රාවක වෙති. මා අනුව දම්සක් පවත්වති. එම නිසා මට අනතුරු සෙනසුන ලැබීමට සුදුස්සෝ වෙති. එහෙත් ඔහු මේ රැය සෙනසුනක් නො ලැබ රුක් මුලක් අබියෙස රාත්‍රිය ගත කළහ. මහණෙනි, තොපි දැන්ම ම මෙසේ ගරු නැතිව, කීකරු නැතිව වසන්නහු, කල්යත් ම කුමක්කොට වසන්නහු ද ? මෙසේ බුදුරදහු ඔවුන්ට ඔවාදෙනු පිණිස මහණෙනි, පෙර තිරිසන් සත්තු පවා ඔවුනොවුන්ට ගරු නො කොට කීකරු නො වී අසමාන පැවතුම් ඇතිව නො වසන්නමු නම්, එය අපට සුදුසු නො වේ. වැඩිමහළු අය ඇත. ඔහුට වැඳීම් ආදිය අප අතර කරන්නෙමු යි මනාව විමසා මේ අපගේ වැඩිමහළු අය යි දැන ඔහුට වැඳුම් ආදියකොට දෙව්මග පුරවමින් ගියහ යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර හිමවත පෙදෙස මහා නුග ගසක් ඇසුරුකොට වටුවෙක්, වඳුරෙක්, ඇතෙක්යැ යි යහළුවෝ තිදෙනෙක් විසූහ. ඔවුහු ඔවුනොවුන්ට ගරුසරු නැතිව, කීකරු නැති,ව අසමාන ගති පැවතුම් ඇත්තෝ වූහ. ඉක්බිති ඔවුන්ට සිතිවිල්ලක් ඇතිවිය. අප මෙසේ විසීම සුදුසු නො වේ. අප අතුරින් වැඩිමහල්ලා යමකු ද ඔහුට වන්‍දනාමාන කැරෙමින් වෙසෙන්නෙමු යි. අපගේ වැඩිමහල්ලා කවරෙක්දැ යි සිතා දිනක් ඊට උපායක් ඇතැ යි තිදෙනා ම නුග ගස මුල හිඳ වටුවා ද වඳුරා ද ඇතාගෙන් විමසූහ. ඇත් යහළුව, ඔබ මේ නුග රුක කොපමණ කලක සිට දන්නේ ද ? යහළුවෙනි, මා ඇත් පොව් කල මේ නුග පැළය කළවා අතර තබා යමි. මා මේ නුග පැළය යටකොට සිටි කල්හි මෙහි කෙළවර අත්ත නාභියෙහි ගැටෙයි. මෙසේ මම මේ නුග ගස කුඩා පැළය කල සිට දනිමි. නැවත අනෙක් දෙදෙනා වඳුරාගෙන් පෙර මෙන් ම විමසූහ. යහළුවනි, මම වඳුරු පැටියකුව සිටි කාලයෙහි බිම හිඳ ගෙළ දිගු නො කොට ම මේ

නුග පැළයේ අග දළුව කමි. මේ අනුව මම මේ ගස පැළය කල සිට ම දනිමි යි කීය. අනතුරු ව ඉතිරි දෙදෙනා පෙර පරිදි ම වටුවාගෙන් ඇසූහ. යහළුවනි, පෙර අසවල් තැන මහත් නුග රුකක් විය. මම එම ගසෙහි ගෙඩි කා මෙතන වසුරු හෙළීමි. මේ නුග ගස එයින් හටගත්තේය. එම නිසා මම මේ ගස පැළවීමට පෙර සිට ම දනිමි. එම නිසා මම ඔබ දෙදෙනාට ම වඩා මහළු වෙමි. මෙසේ කී කල්හි වඳුරා සහ ඇතා යහළුව, ඔබ අප දෙදෙනාට වඩා මහළු වෙහි. මෙතැන් පටන් අපි ඔබට ගරු සත්කාර, වන්දනාමාන්න, ඇඳිළි කම්, ළැදි කම්, උවටැන් කරමු. අපි ඔබගේ අවවාදයෙහි පිහිටමු. එතැන්පටන් වටුවා ඔවුන්ට අවවාද දුන්නේය. සීලයෙහි පිහිටුවීය. තෙමේ ද සීලයෙහි පිහිටියේය. මෙසේ ඒ තිදෙන පන්සිල්හි පිහිටා ඔවුනොවුන්ට ගරු සැලකිලි ඇතිව, සමාන පැවතුම් ඇතිව ආදර සහිත ව දිවි කෙළවර දෙව්ලොව ගියෝ වූහ.

මේ තිදෙනාගේ සමගි වාසය "තිත්තිරිය බ්‍රහ්මචරියං" හෙවත් 'වටුබඹසර' නම් විය. මහණෙනි, මෙසේ තිරිසන් සත්තු පවා ඔවුනොවුන් ආදර, ගරු සරු සහිත ව කීකරු ව විසූහ. තෙපි වනාහි මනාව දෙසූ සසුනෙහි පැවිදි ව ඔවුනොවුන්ට ගරු සරු නැති ව කීකරු නැති ව කුමක් නිසා වසන්නාහු ද ? මහණෙනි, මෙතැන් පටන් මම තොපට වැඩිමහළු පිළිවෙළ අනුව වැඳුම් පිදුම්, ඇඳිළි කම් කීම, නිවරදි මග අනුදනිමි. මෙතැන් සිට මහළු පිළිවෙළ අනුව මුලසුන, අග්‍රෝදක, අග්‍රපිණ්ඩ අනුගමනය කිරීම කළ යුතුය. නවක භික්ෂුව තෙරවරුන් ආසනයෙන් නො වැළැක්විය යුතුය. යම් භික්ෂුවක් එ සේ වැළක්වීම කළහොත් දුකුලා ඇවැතක් වේයැ යි, මෙසේ බුදුරදහු ධර්ම දේශනාව ගෙනහැර දක්වා මේ ගාථාව වදාළහ.

"යෙ වද්ධමපචායන්ති නරා ධම්මස්ස කොවිදා
දිට්ඨෙව ධම්මෙ පාසංසා සම්පරායෙ ච සුගතීති"

"වැඩිහිටියන් සැලකීම නම් වූ ගුණ ධර්මයෙහි නිපුන
වූ යම් කෙනෙක් ගුණ නුවණින් වැඩිහිටියන් පුදහු ද
ඔවුහු මෙලොව පැසසිය යුත්තෝ වෙති. පරලොව
සුගතිය වෙත්."

එහි "**යෙ වඩ්ඪමපචායන්ති**" උපතින් වැඩිහිටි, වයසින් වැඩිහිටි, ගුණයෙන් වැඩිහිටි යි වැඩිහිටියෝ තිදෙනෙකි. එයින් උසස් කුලයෙන් යුක්ත වූයේ 'ජාතිවෘද්ධ' නම්. වයසින් වැඩි වූයේ 'වයෝවෘද්ධ' නම්. ගුණවත් වූයේ 'ගුණවෘද්ධ' නම්. මෙහි දී ගුණයෙන් හා වයසින් ඉදිරියෙන් සිටියාහු වැඩිහිටියෝ යි සලකනු ලැබේ. එහි "**අපචායන්ති**" කුලදෙටුවන් පිදීමේ කර්මයෙන් පුදත්. "**ධම්මස්ස කොවිදා**" වැඩිහිටියන්ට සැලකීම නම් වූ ධර්මයෙහි දක්ෂයෝ, "**දිට්ඨෙව ධම්මෙ**" මෙම අත්බවෙහි ම ප්‍රශංසා - පැසසීමට සුදුසු, "**පාසංසා සම්පරායෙ ච සුගතීති**" මතු යා යුතු හෙවත් මෙලොව හැර යා යුතු පරලොව ඔවුන්ට සුගතිය ම වෙයි. මෙහි පිඬුකොට ගතයුතු අරුතයි. රජ, බඹනු, වෙළඳ, ගොවි හෝ ගිහි පැවිදි හෝ තිරිසන් හෝ යම් සත්ත්වයෝ කුලදෙටුන් පිදීමෙහි දක්ෂ වූවෝ ද ගුණවතුන්ට හා වයසින් වැඩිහිටියන්ට බුහුමන් කරත් ද ඔවුහු මේ අත්බැව්හි ම වැඩිහිටියන් පුදන්නෙකැ යි වැඳුම් පැසසුම් ලබති. මරණින් පසු දෙව්ලොව උපදිත්.

මෙසේ බුදුරජහු දෙටුවන් පිදීමේ ගුණ වදාරා අනුසන්ධි ගළපා ජාතකය නිම වූ සේක. එදා ඇතා මුගලන් ය. වඳුරා සැරියුත්ය. වටු පඬුවෝ මම ම වීමි.

## 1. 4. 8.

## බක ජාතකය

"නාච්චන්ත නිකතිප්පඤ්ඤො" යන යන මේ දේශනාව බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, සිවුරු මසා පිළියෙල කරන භික්ෂුවකු අරබයා වදාළ සේක. එක්තරා දෙව්රම් වැසි භික්ෂුවකු සිවුරෙහි යම් කිසිවක් කළ යුතු ද ? කැපීම, මැදීම, අනුපිළිවෙලට මැසීම ආදී කටයුතුවල දක්ෂයෙකි. හෙතෙම ඒ දක්ෂතාවෙන් සිවුරු පිළියෙල කරයි. ඒ නිසා සිවුරු මසා පිළියෙල කරන්නායැ යි ප්‍රසිද්ධ විය. ඔහු කරන්නේ කුමක් ද යත්, දිරාගිය රෙදිවල අත්තම් දක්වා මනා පහස ඇති, දැකුම්කළු, ප්‍රිය උපදවන

සිවුරක්කොට පඬු පොවා අවසානයේ පිටි දියෙන් සායම් පොවා හක් ගෙඩියෙන් මැද බබළන මනෝඥ එකක්කොට බැහැර කරයි. සිවුරු සකස් කිරීම නො දන්නා භික්ෂූන් ලද අළුත් සළු ගෙන උන්වහන්සේ සමීපට අවුත්, අපි සිවුරු සකසන්න නො දනිමු. අපට සිවුරක් කැර දෙනු මැනවි යි කියති. ඔහු ඇවැත්නි, සිවුරක් කිරීමට බොහෝ කල් ගතවෙයි. මා විසින් කලින් නිම කළ සිවුරු ඇත. මේ සළුව තබා ඒ සිවුරු ගෙන යනු මැනවැ යි ගෙනහැර දක්වත්. ඔහු ඒ සිවුරුවල පැහැය පමණක් දැක වෙනස නො දැක හොඳ සිවුරකැ යි යන හැඟීමෙන් නො කැපූ සළු සිවුරු සකසන්නාට දී ගෙන යත්. ඔවුහු මදක් කිලිටි වූ කල ඒ සිවුර උණු දියෙන් සෝදන කල්හි සිවුරේ යථා තත්ත්වය පෙනේ. ඒ ඒ දිරුණු තැන් ද පෙනේ. එවිට ඔවුහු විපිළිසර වෙති. මෙසේ මේ භික්ෂුව පැමිණි පැමිණි භික්ෂූන් වස්ත්‍රවලින් වංචා කරන්නේ හැම තැන ම ප්‍රකට විය. ජේතවනාරාමයේ දී මේ භික්ෂුව යම් සේ ප්‍රසිද්ධ වූයේ ද එ සේ ම එක් කුඩා ගමක සිවුරු සකසන භික්ෂුවක් ලෝකයා රවටයි. ඔහුගේ යහළු භික්ෂූහු ස්වාමීනි, ජේතවනාරාමයේ දී සිවුරු සකසන භික්ෂුව මෙසේ ලෝකයා රවටතැ යි සැලකළහ.

ඉක්බිති, මොහුට මෙබඳු අදහසක් ඇතිවිය. කෙසේ හෝ මම ඒ නගර වැසි භික්ෂුව රවටන්නෙමැ යි දිරා ගිය සිවුරක් ඉතා මනා සේ සකස්කොට මනාව පඬු පොවා එය පොරවා ගෙන දෙව්රමට ගියේය. අනෙක් භික්ෂුව එය දැක ලෝභ උපදවා ස්වාමීනී, මේ සිවුර නුඹ වහන්සේ විසින් කරන ලද්දක්ද යි විචාළේය. ඇවැත්නි, එ සේය. ස්වාමීනි, මේ සිවුර මට දෙව. නුඹ වහන්සේට වෙන සිවුරක් ලැබෙන්නේය. ඇවැත්නි, අපි ගම් වැසියෝය. සිව්පසය ලැබීම දුර්වලයි. මෙය මම නුඹට දී මම කුමක් පොරවන්නෙම් ද ? ස්වාමීනි, මා ළඟ නො කැපූ වස්ත්‍ර ඇත. එවා ගෙන ඔබ සිවුරක් කරවු. ඇවැත්නි, මා විසින් මෙහි අතෙහි දස්කම් දක්වන ලදී. නුඹ මෙසේ කියන කල්හි වෙන කුමත් කළ හැකි ද ? එය ගන්නැ යි ඔහුට දිරාගිය කැබැලි සිවුර දී නො මැසූ රෙද්ද ගෙන ඔහු රවටා ගියේය. ජේතවනවාසී භික්ෂුව එය පොරවා කීප දිනකින් උණු දියෙන් සෝදන්නේ දිරාගිය කැබැලි සිවුරක් බව දැක ලජ්ජාවට පත්වූවේය. ගම් වැසි සිවුරු සකසන්නා විසින් දෙව්රම් වැසි භික්ෂුව රවටන ලදැ යි ඔහුගේ වංචනික භාවය සංඝයා මධ්‍යයෙහි ප්‍රකට විය.

ඉක්බිති, එක් දිනක් භික්ෂූහු දම් සබාවෙහි ඒ කථාව කියමින් හුන්හ. බුදුරජාණන් වහන්සේ වැඩමවා මහණෙනි, කවර කථාවකින් යුතුව මෙහි දුන්නාහුද යි විචාළ සේක. උන්වහන්සේලා ඒ කරුණ සැලකළාහුය. බුදුරජාණන් වහන්සේ මහණෙනි, දෙව්රම් වැසි සිවුරු සකසන්නා දැන් පමණක් අනුන් වංචා කළේ නො වේ. පෙරත් වංචා කළේමය. ගම් වැසි භික්ෂුව විසින් ද ජේතවනවාසී භික්ෂුව වංචා කරන ලද්දේ දැන් පමණක් නොව පෙරත් වංචා කරන ලද්දේයැ යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූ සේක.

යටගිය දවස එක් වනගත පෙදෙසක බෝසතාණන් වහන්සේ එක්තරා පියුම් විලක් ඇසුරුකොට පිහිටි ගසෙක රුක් දෙවියෙක් වී උපන්නේය. එහි එක්තරා ඉතා මහත් නො වූ විලක නියං කාලයේ ජලය මද විය. එහි බොහෝ මත්ස්‍යයෝ වෙති. ඉක්බිති, එක් කොකෙක් ඒ මසුන් දැක එක් උපායකින් මේ මසුන් වංචාකොට කන්නෙමි යි ගොස් ජලය කෙළවර සිතමින් හුන්නේය. ඉක්බිති මාලුවෝ ඌ දැක කුමක් සිතමින් සිටින්නේද යි විචාළහ. නුඹලා ගැන සිතමින් හුන්නෙමි. යාළුව, අපි ගැන කුමක් සිතන්නෙහි ද ? මේ විලේ ජලය ටිකය. ආහරත් අඩුය. පැවිල්ලත් විශාලය. දැන් මේ මත්ස්‍යයන් කුමක් කරන්නේද යි නුඹලා ගැන සිතමින් හුන්නෙමි යි කීවේය. යාළුව, ඉතින් කුමක් කරමු ද ? තොප ඉදින් මාගේ කීම කරන්නහු නම් මම තොප එකිනෙකා මුව තුඩින් ගෙන එක්තරා පස් පියුමෙන් ගැවසී ගත්තා වූ ලොකු විලකට ගෙන ගොස් මුදා හරින්නෙමි.

යාළුව, කල්පාරම්භයේ පටන් මසුන් ගැන සිතන කොකෙක් නම් නැත. නුඹ අපේ එකිනෙකා කනු කැමැත්තේ වෙහි ද? නුඹලා මා කෙරෙහි විශ්වාස ඇති කල්හි නො කන්නෙමි. ඉදින් වනාහි විලක් ඇති බැව් මගේ කීම අදහන්නේ නැති නම් එක් මසකු මා සමග විල බලන්න එවනු.

මාලුවෝ ඔහුගේ කීම අදහා මේ තෙමේ දිය ගොඩ දෙකෙහි ම සමර්ථයකු යි එක් කණ මසකු දුන්නාහුය. මොහු රැගෙන යව යි කීවාහුය. හෙතෙම ඒ කණ මත්ස්‍යයා රැගෙනවිත් විලට අතහැර සියලු විල පෙන්වා නැවත ගෙනවුත් ඒ මසුන් ඉදිරියේ අතහැරියේය.

උෟ ඔවුන්ට විලෙහි සම්පත් වර්ණනා කළේය. ඔවුහු උගේ කථාව අසා යනු කැමැති වී හොඳයි යාළුව, අප ගෙන යව යි කීවාහුය. කොකා පළමු ව ඒ කණ මත්ස්‍යයාව ගෙන විල් තෙරට පමුණුවා විල පෙන්වා විල් තෙර හටගත් ලුනුවරණ ගසෙහි සැඟවී උෟ දෙබලක දමා තුඩින් විදිමින් මරණයට පමුණුවා මස් අනුභවකොට කටු ගස මුල හෙලා නැවත ගොස් මා විසින් මාලුවා මුදා හරින ලදී. කවරෙක් එන්නේදැ යි, මේ ක්‍රමයෙන් එක එකා ගෙන සියලු මසුන් අනුභවකොට නැවත ආවේ එක් මසකු ද ඉතිරි ව නැති බව දුටුවේය.

එහි එක් කකුළුවකු පමණක් ඉතිරි විය. කොකා කකුළුවා ද කනු කැමැති ව, එම්බා කකුළුව, මා විසින් ඒ සියලු මාළුවෝ ගෙන ගොස් නෙළුම්වලින් ගැවසී ගත් මහ විලෙහි මුදා හරින ලදහ. එව. නුඹ ද පමුණු වන්නෙමි. මා ගෙන යන විට කෙසේ ගන්නෙහි ද ? ඩැහැගෙන යන්නෙමි. නුඹ එසේ ගෙන යන විට මා බිම හෙළන්නෙහිය. නුඹ සමග නො යන්නෙමි. බිය නො වන්න. මම නුඹ ආරක්ෂා සහිත ව ගෙන යන්නෙමි.

කකුළුවා සිතුවේය. මොහු මසුන් ගෙන ගොස් විලෙහි මුදා හැරීමක් නම් නැත. ඉදින්, මාව විලට මුදා හරින්නේ නම් එය යහපතකි. ඉදින්, එ සේ මුදා හරින්නේ නැති නම් මොහුගේ ගෙල සිඳ දිවිතොර කරන්නෙමි. ඉක්බිති, ඔහුට මෙසේ කීවේය. යහළුව, ආරක්ෂා ඇතිව නුඹ මා ගෙන යන්නට නො හැකි වන්නෙහි. අපට අල්ලා ගැනීමට ලැබෙන්නේ නම් නුඹේ ගෙල ආරක්ෂා සහිත ව අල්ලා ගෙන නුඹ සමග යන්නෙමි. හෙතෙම මා රවටනු කැමැත්තේයැ යි නො දන යහපතැ යි පිළිගත්තේය. කකුළුවා තමාගේ අඬු දෙකින් කතුරු අඬුවකින් මෙන් ඔහුගේ බෙල්ල ආරක්ෂා සහිත ව අල්ලාගෙන දැන් යව යි කීවේය. හෙතෙම ඔහු ගෙන ගොස් විල පෙන්වා ලුනුවරණ ගස දෙසට පියාසර කළේය. කකුළුවා කීවේය. මාමේ, මේ විල මෙතනයි. නුඹ වනාහි වෙන තැනකට ගෙනියන්නෙහි ද ? එවිට කොකා මට මාමේ කියන්නේ නුඹ මගේ නැගනියගේ පුතා ද ? මා නුඹ ඔසවාගෙන හැසිරෙන්නේ මම නුඹේ දාසයකුයැ යන හැඟීමෙන් ද ? මේ ලුනුවරණ ගස මුල කටු ගොඩ බලව. යම් සේ මා විසින් ඒ නියාලු මාළුවෝ කන ලද්දේ ද එසේ ම නුඹ ද කන්නෙමි යි කීවේය.

කකුළුවා මේ මාළුවෝ තමන්ගේ මෝඩකම නිසා නුඹ විසින් කන ලද්දෝය. මම වනාහි නුඹට මා කන්නට නො දෙන්නෙමි. නුඹ ම විනාශයට පමුණු වන්නෙමි. නුඹ ද මෝඩකම නිසා මා විසින් වංචා කරන ලද බව නො දන්නෙහි ද ? මැරෙනවා නම් අපි දෙන්නා ම මැරෙන්නෙමු. මා නුඹේ හිස සිඳ බිම දමන්නෙමි යි කියා අඬුවක අඬු මෙන් වූ අඬුවෙන් කොකාගේ ගෙල හිර කෙළේය. හෙතෙම අයාගත් මුවින් ඇස්වලින් කඳුළු පෙරා ගෙන මර බියෙන් තැතිගෙන ස්වාමීනි, මම නුඹ නො කන්නෙමි. මට ජීවිතය දෙන මැනවැ යි කීවේය. ඉදින් මෙසේ මා බස්වා විලට මුදා හරවැ යි කීවේය. කොකා ආපසුවිත් විලට ම බැස කකුළුවා විල කෙළවර මඩ මතුයෙහි තැබුවේය. කකුළුවා කතුරෙන් කුමුදු නලයක් කපන්නාක් මෙන් උගේ ගෙල සිඳ දියට පිවිසියේය. ඒ අසිරිය දැක ලුනුවරණ ගසෙහි අධිගෘහීත දේවතාවා සාධුකාර දෙමින් වනය දෙවනත් කරමින් මිහිරි හඬින් මේ ගාථාව කීවේය.

"නාච්චන්තනිකතිප්පඤ්ඤො නිකත්‍යා සුඛමෙධති
ආරාධෙති නිකතිප්පඤ්ඤො බකො කක්කටකාමිවාති"

"කපටි බුද්ධිය ඇත්තේ තමාගේ ම වංචාව හේතුවෙන් නිත්‍යයෙන් සැපෙහි නො පිහිටයි. (තමන් කළ වැරදිවල) කටුක විපාක ලබයි. කකුළුවාගෙන් (ගෙල) සිඳගත් කොකා මෙනි."

එහි "නාච්චන්තනිකතිප්පඤ්ඤො නිකත්‍යා සුඛමෙධති" හි "නිකති" නම් රැවටීමයි. "නිකතිප්පඤ්ඤො" යනු වංචා නුවණින් යුක්ත පුද්ගලයාය. එම වංචාවෙන් උසස් සැපයකට පත් නො වෙයි. නිතිපතා ඔහුට ඒ සැපයෙහි පිහිටීමට නො හැක්කේය. ඒකාන්තයෙන් විනාශයට පැමිණේ යන අර්ථයයි. "ආරාධෙති" ලබාගනී. "නිකතිප්පඤ්ඤාති" කපටි බැවින් පුහුණු කළ ප්‍රභව ඇති පව්ටු පුද්ගලයාය. තමා විසින් කරන ලද පාපයට විපාක ලබයි, යන අර්ථයයි. කෙසේ ද යත්, "බකො කක්කටකාමිවාති" යම් සේ කොකෙක් කකුළුවාගෙන් ගෙල සිඳීමට පැමිණෙන්නේය. එමෙන්, මෙසේ පව්ටු පුද්ගලයා තමා කළ පාප කර්මවලින් මෙලොව දී හෝ පරලොව දී දුකට පත්වෙයි. බෝසත්හු මේ අර්ථය ප්‍රකාශ කැරෙමින්

වනරොද නින්නාද කරමින් දම් දෙසූහ.

මහණෙනි, ගම් වැසි සිවුරු සකසන්නා විසින් මේ නගර වැසි භික්ෂුව දැන් පමණක් රවටන ලද්දේ නො වේ. පෙරදීත් රවටන ලද්දේමැ යි. බුදුරජහු මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා ජාතකය නිමවා වදාළහ. එකල කොකා දෙව්රම් වැසි සිවුරු සකසන භික්ෂුව විය. කකුළුවා ගම් වැසි සිවුරු සකසන්නා විය. රුක් දෙවියා වනාහි මම ම වීමි.

## 1. 4. 9.

## නන්ද ජාතකය

"මඤ්ඤෙ සොවණ්ණයො රාසීති" යන මෙය බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන සේක්, සැරියුත් මහතෙරුන් වහන්සේගේ එකට හැසිරෙන භික්ෂුවක් අරබයා වදාළ සේක. ඒ භික්ෂුව වනාහි කීකරුය. කියන දේ ඉවසන්නේය. තෙරුන් වහන්සේට මහත් උත්සාහයෙන් උපකාර කරයි. ඉක්බිති එක් කලෙක තෙරුන් වහන්සේ බුදුරජාණන් වහන්සේගෙන් විමසා චාරිකාවෙහි හැසිරෙන්නේ දක්ෂිණා ගිරි ජනපදනයට වැඩම කළ සේක. ඒ අතවැසි භික්ෂුව එහි ගිය තැන් පටන් මානයෙන් උදම් වූයේ සැරියුත් තෙරණුන්ගේ වචනය නො තකයි. ඇවැත්නි, මෙය කරව යි කී කල්හි තෙරුණුවන්ට විරුද්ධ ව සිටියි. තෙරහු ඔහුගේ අදහස් නො දනිති. උන්වහන්සේ එහි චාරිකාවෙහි හැසිර නැවත දෙව්රමට වැඩියහ. ඒ අතවැසි භික්ෂුව එතැන් සිට නැවත පෙර මෙන් කීකරු විය. තෙරහු බුදුරදුන්ට සැලකළහ. ස්වාමීනි, මගේ එක් අතවැසි භික්ෂුවක් එක තැනක දී සියයක් දී ගත් දාසයකු මෙන් විය. තවත් තැනක දී මානයෙන් උදම් ව මෙය කරව යි කී කල්හි විරුද්ධ වෙයි. සාරිපුත්‍රය, මේ භික්ෂුව මෙම ස්වභාවය ඇත්තකු වූයේ දැන් පමණක් නොව, පෙරදී ද මොහු එක් තැනකට ගියේ සියයට ගත් දාසයකු මෙන් වෙයි. තවත් තැනකට ගියේ විරුද්ධ සතුරකු මෙනැ යි වදාරා තෙරුන් විසින්

අයදින ලද්දේ අතීතය ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කරන කල්හි බෝසත්හු එක්තරා කෙළෙඹි කුලයක පිළිසිඳ ගත්හ. එ බෝසතුන්ට යහළු කෙළඹියකු ද සිටියේය. ඔහු මහලුය. ඔහුගේ බිරිය තරුණය. ඈ ඔහු නිසා පුතකු ලැබුවාය. කෙළඹියා මෙසේ සිතීය. මේ තරුණ ස්ත්‍රිය තරුණ කම නිසා මාගේ ඇවෑමෙන් යම් කිසි පුරුෂයකු ගෙන මේ ධනය විනාශ කරන්නීය. මගේ පුතාට නො දෙන්නීය. මම මේ ධනය නිදන්කොට තබන්නේ නම් මැනවැ යි එම නිවසෙහි සිටි නන්ද නම් දාසය රැගෙන වනයට ගොස් එක් තැනක ධනය නිදන්කොට දරුව නන්ද, මේ ධනය මගේ ඇවෑමෙන් මගේ පුතුට කියව. එ සේ ම මගේ පුතු අත් නො හරින්නැ යි අවවාදකොට කලුරිය කළේය.

ඔහුගේ පුතා ද පිළිවෙළින් වැඩිවියට පත්වූයේය. ඉක්බිති, ඔහුට මව කීවාය. දරුව, නුඹේ පියා නන්ද නම් දාසයා රැගෙන ගොස් ධනය නිදන් කළේය. ඒවා ගෙන්වාගෙන පවුල නඩත්තු කරව. හෙතෙම එක් දිනක් නන්දට කීවේය. මාමේ, මගේ පියා නිදන් කළ යම් කිසි ධනයක් තිබෙනවා ද ? එ සේය. ස්වාමීනි, එය නිදන් කරන ලද්දේ කොහි ද ? වනයෙහිය, ස්වාමීනි. එ සේ නම් එහි යමු යි උදැල්ල හා කුඩය රැගෙන නිදානය ඇති තැනට ගොස් මාමේ ඒ ධනය කොහිදැ යි ඇසීය. නන්ද එහි ගොඩවී නිදානය මත සිට ධනය නිසා මානය උපදවා එම්බල දාසියගේ පුත්‍රය, වැඩකාරයා, මේ ස්ථානයේ නුඹේ ධනයක් කොයින්දැ යි කුමාරයාට බැණ වදියි. කුමාරයා ඔහුගේ රළු වචන අසා නැසුනාක් මෙන් සිට එ සේ නම් යමු යි ඔහු රැගෙන ආපසු හැරී නැවත දෙතුන් දවසක් ඉක්මවා එතැනට ගියේය. නන්දයා එදින ද එ සේ බැණ වදියි. කුමාරයා ඔහු සමග නපුරු බස් නො කියාම ආපසු හැරී ආවේය. ඔහු මෙසේ සිතීය. මේ දාසයා මෙතැනට ධනය ඇති තැන කියමි යි යයි. ගිය පසු පරුෂ වචනයෙන් බැණ වදියි. මෙහි හේතුව නො දනිමි. මගේ පියාගේ යහළු කෙළඹියකු ඇත. ඔහුගෙන් අසා දැන ගනිමි යි. බෝසතුන් වෙත ගොස් ඒ සියලු පුවත් සැලකොට මෙහි හේතුව කුමක්දැ යි විචාළේය. බෝසත්හු දරුව නන්ද, යම්කිසි තැනක සිට ඔබට බැණ වදින්නේ ද ඔබ පියාගේ ධනය ඇත්තේ ද එතනමයි. එහෙයින් යම් දවසක නන්ද යම් තැනක සිට ඔබට බැණ වදී ද

එකල්හි, එම්බල දාසය, තෝ කුමකට මට ආක්‍රෝෂ කරහිද යි ඔහු බැහැරට ඇද දමා උදැල්ල ගෙන ඒ ස්ථානය හාරා කුල සතු ධනය ගෙන දාසයා ලවා එය ඔසවා ගෙන එව යි කියා මේ ගාථාව කීහ.

"මඤ්ඤෙ සොවණ්ණයො රාසි සොවණ්ණමාලා ච නන්‍දකො
යත්‍ථ දාසො ආමජාතො ඨිතො ථුල්ලානි ගජ්ජතීති"

"කුලජාත දාසියගේ පුත්‍ර වූ නන්‍දක දාස තෙමේ යම් තැනෙක්හි සිටියේ පරුෂ බැණ ගර්ජනා කැරේ ද ස්වර්ණ රාශිය ද ස්වර්ණ මාලා ද එතැන්හියැ යි හඟිමි."

එහි "මඤ්ඤෙති" මෙසේ මම දනිමි. "සොවණ්ණයොති" යහපත් වූ වර්ණයය. ඒ මොනවා ද ? රිදී, මැණික්, රන්, පබළු ආදී රත්නයි. මේ ස්ථානයේ ඒ සියල්ල රන්යැ යි අදහස් කැරේ. ඒවායේ සමූහය ස්වර්ණ රාශියයි. "සොවණ්ණ මාලාචාති" නුඹේ පියා සන්තක රන් මාල ද එහි ඇතැ යි සිතමි. "නන්‍දකො යත්‍ථ දාසොති" යම් තැනක නන්ද දාසයා සිටියේ ද ? "ආමජාතොති" එ සේය. මම ඔබගේ දාසි බවට පැමිණියා වූ ආමදාසි නමින් හැඳින්වෙන දාසියගේ පුත්‍රයා "ඨිතො ථුල්ලානි ගජ්ජතීති" ඔහු යම් තැනක සිට මහත් වූ පරුෂ වචන කියයි ද ඔබගේ කුල ධනය එතැනමයැ යි මම සිතමි.

බෝධිසත්ත්වයෝ මෙසේ කුමාරයාට ධනය ගැනීමේ උපාය ප්‍රකාශ කළහ. කුමාරයා ද බෝසතුන් වැඳ ගෘහයට ගොස් නන්‍දයා ද රැගෙන නිදානය තිබූ තැනට ගොස් ඔහුට උපදෙස් දුන් පරිදි පිළිපැද ඒ ධනය ගෙනවුත් ගෘහ ජීවිතය සකස්කොට ගෙන බෝසතුන්ගේ අවවාදයෙහි පිහිටා දානාදී පිංකොට දිවි කෙළවර කම් වූ පරිදි මිය ගියේය.

බුදු රජහු මේ දම් දෙසුම ගෙන හැර දක්වා අනුසන්ධි ගළපා මොහු පෙර ද මේ ස්වභාවයෙන් ම යුක්ත වූයේයැ යි වදාරා ජාතක කථාව නිම කළහ. එදා නන්ද, සැරියුත් තෙරුන්ගේ අතවැසියා විය. නුවණ ඇති කෙළැඹියා නම් මම වීමි.

## 1. 4. 10.

## ඛදිරඞ්ගාර ජාතකය

"කාමං පතාමි නිරයං" යන මේ ජාතකය බුදු රජුන් දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, අනේපිඬු මහසිටාණන් අරබයා වදාළහ. ඔහු වනාහි දෙව්රම් වෙහෙර සඳහා ම සූපණස් කෙළක් ධනය බුදුසසුනට පරිත්‍යාගකොට විසුරුවා බුදුන්, දහම්, සඟුන් තුන්රුවන හැර වෙනත් රුවනක් පිළිබඳ හැඟීමක් නූපදවා බුදුරජුන් දෙව්රම් වෙහෙර වසන කල්හි දිනපතා මහඋවැටැන් තුනකට යයි. උදෑසන ම එක් වරක් යයි. උදේ ආහාරය ගෙන එක් වරක් ද සවස් භාගයෙහි එක් වරක් ද යයි. මේ අතර උවැටන් ද ඇත්තේය. එ සේ යන්නේ ද ළදරු සාමණේර දරුවන් කුමක් ගෙනෙන ලද්දේදැ යි මගේ අත බලන්නාහු, හිස් අතින් නො යන විරූය. උදෑසන යන විට කැඳ ගෙන්වාගෙන යයි. උදේ ආහාරයෙන් පසු යන විට ගිතෙල්, වෙඬරු, මීපැණි ආදිය ද සවස් භාගයෙහි සුවඳ මල් වස්ත්‍රාදිය ගත් අත් ඇතිව යයි. මෙසේ සිටු පිරිනැමෙන ධනයෙහි ප්‍රමාණයක් නැත. මේ හැර බොහෝ වෙළෙඳ ජනයා ද ලියකියවිලි ඇතිව අටලොස් කෝටියක පමණ ධනය ණයට ගත්හ. මහසිටු ඒවා ද ගෙන්වා නො ගනී. තවත් ඔහුගේ කුල සන්තක අටළොස් කෙළක් ධනය ගං ඉවුරෙහි නිදන්කොට තිබිය දී සුළඟින් හා ජලයෙන් ඉවුර බිඳී ගිය කල මහමුහුදට ගියේය. ඒවා ලෝහ සැලිවල බහා පියන් වසා තිබූ සෙයින් ම මුහුද පතුලෙහි පෙරළෙමින් තිබේ. භික්ෂූන් පන්සියයකට නිබඳ දන් පවතී. සිටු ගෙදර මහසඟනට සතර මංහන්දියක කළ පොකුණක් සමාන විය. සිටුතුමා මහසඟනට මව්පිය තනතුරෙහි සිටියේය. මේ නිසා ඔහුගේ ගෙදරට බුදුරජාණන් වහන්සේ ද වඩිති. අසූ මහා සව්වෝ ද වඩිති. වඩනා සෙසු භික්ෂූන්ගේ පමණ නැත. ඔහුගේ ගෘහය සත් මහල්ය. දොරටු සතකින් යුක්තය. එයින් සතර වැනි දොරටුවෙහි මිසදිටු දෙවියෙක් වසයි. බුදුරජුන් ගෙට පිවිසෙන විට තම විමනෙහි සිටීමට නො හැකිය. දරුවන් ගෙන බිමට බැස සිටී. අසූ මහා සව්වන් ඇතුළු සෙසු භික්ෂූන් පිවිසෙන විට ද නික්මෙන විට ද එ සේ ම කරයි. දෙවියා සිතීය. ශ්‍රමණ ගෞතමයන් හා සෙසු මහණුන් මෙම ගෙට පිවිසෙන විට මට සැපයක් නම් නැත. නිබඳ ව බිමට බැස සිටීමට ද නො හැකිය. එම නිසා මොවුන් මේ ගෙට

නො පිවිසෙන ලෙස මාවිසින් කළ යුතු වන්නේයැ යි දිනක් ඔහු අයකැමියා සයනගතව සිටිය දී ඔහු වෙතට ගොස් ආලෝක පතුරුවා සිටියේය. මෙහි කවුද ? මම සිව් වැනි දොරටුවෙහි වෙසෙන දෙවියා වෙමි. මෙහි පැමිණියේ මක්නිසා ද ? ඔබට සිටුගේ ක්‍රියා කලාපය නො පෙනෙන්නේ ද ? තමාගේ පැස නො බලා ධනය ගෙනවුත් ශ්‍රමණ ගෞතමයන්ට ම පුදයි. වෙළඳාමට හෝ වෙනත් කර්මාන්තයකට ධනය නො යොදයි. ධනය තම කාර්යයන් සඳහා යොදන ලෙසත් අවවාද කරනු. යම් සේ ශ්‍රමණ ගෞතමයන් ඇතුළු සව්වන් මෙහි නො පිවිසෙද් ද එ සේ කරනු. ඔහු ඇයට මෙසේ කීය. මෝඩ දෙවිය, සිටුතුමා ධනය වියදම් කරන්නේ නෛසර්ගික බුදු සසුනේය. ඉදින් ඔහු මගේ කෙස් වැටිය ගෙන විකුණුවත් මම කිසිවක් නො කියන්නෙමි. ඔබ වහා යනු. නැවත දිනක දෙවියා සිටුගේ දෙටු පුත් වෙත එළැඹ එ සේ ම අවවාද කළේය. ඔහු ද පෙර සේ ම දෙවියාට තර්ජනය කළේය. එහෙත් සිටු සමග කථා කිරීමට අසමත් වෙයි.

මෙසේ නිබඳ ව දන් දීම නිසාත් ව්‍යාපාරාදිය නො කිරීම නිසාත් සිටුගේ ආදායම අඩුවද්දී ධනය පිරිහී ගියේය. මෙසේ ක්‍රමයෙන් දිළිඳු බවට පත්වෙත් ම සිටුහුගේ සළුපිළි, යහන්, බොජුන් ආදිය ද පෙර පරිදි නො වීය. මෙසේ වද්දීත් මහසඟනට දන් දෙයි. පෙර මෙන් ප්‍රණීතකොට දීමට නො හැකි විය. දිනක් බුදුරජුන් වැඳ හුන් මහසිටුහුට මහසිටු, ඔබ ගෙදර නිබඳ දානය දෙනු ලැබේ ද ? ස්වාමීනි, දෙනු ලැබේ. එහෙත් එය ඇඹුල් කැඳ දෙවැනිකොට නිවුඩු බත් පමණයි. මහසිටු, රළු ආහාරයක් දෙමි යි සිතෙහි පසුබැසීමක් ඇති කැර නො ගන්න. පහන් සිතින් බුදු, පසේ බුදු, බුදු සව්වන්ට දෙන දානය රළු නම් නො වේ. මක් නිසා ද මහත් විපාක ගෙන දෙන බැවිනි යි සිත පහන් කැර ගත හැක්කකුට රළු දානයක් නම් නැත. ඒ මෙසේ ද දත යුතුයි.

**"නත්‍ථි චිත්තෙ පසන්නම්හි අප්පිකා නාම දක්ඛිණා**
**තථාගතෙ වා සම්බුද්ධෙ අථ වා තස්ස සාවකෙ**

**න කිරත්‍ථි අනොමදස්සිසු පාරිචරියා බුද්ධෙසු අප්පිකා**
**සුක්ඛාය ආලොණිකාය ච පස්ස ඵලං කුම්මාසපිණ්ඩියා"**

"සිත පහන් කල්හි සම්බුදු තථාගතයන් වහන්සේට හෝ නැතිනම් උන්වහන්සේගේ සව්වන්ට හෝ පහන් සිතින් දෙනු ලබන දක්ෂිණාව (දානය) සුළු නො වේ."

නිවන දන්නා වූ බුදු රජුන් විෂයයෙහි පිරිනැමෙන දානය ස්වල්ප නො වේ. වියලුණු ලුණු නැති පිට්ටු පිඩක් දුන් ඵලය බලව. තවදුරටත් බුදුරජහු ඔහුට මෙසේ කීහ. ගැහැවිය, ඔබ රළු අහර දෙනු ලබන්නේ අට අරි පුගුලන් හටය. මම ප්‍රමාණයෙන් මුළු දඹදිව නගුලින් කැණ සත්රුවන් දෙන්නේ, පස් මහා ගංගා එක ම දිය දහරින් පිරුණක්කොට තමන් මහා දන් පවත්වන්නේ, තෙරුවන් සරණ ගිය හෝ පන්සිල් රකිනා වූ හෝ කිසිවකු නො ලැබුවෙමි. දක්ෂිණාර්හයෝ සුලභ නො වෙති. එම නිසා මගේ දානය රළුයැ යි පසුබට කැර නො ගන්නයැ යි කියා වේලාම සූත්‍රය දෙසූහ.

ඉක්බිති, සිටුහු පොහොසත් කාලයෙහි කථා කිරීමට පවා අසමත්ව සිටි දෙවියා, දැන් දුගීබවට පත්ව ඇති හෙයින් දැන් මාගේ වචනය පිළිගනිතැ යි සිතා මැදියම් රැයෙහි සිරි යහන් ගැබට පිවිස ආලෝකය පතුරුවා අහසෙහි සිටියේය. සිටුහු ඒ දැක ඔබ කවරෙක්දැ යි ඇසීය. මහා සිටුතුමනි, මම සිව් වැනි දොරටුවෙහි අරක්ගත් දෙවියා වෙමි. කුමකට ආවෙහි ද ? ඔබට අවවාද දෙනු කැමැති ව ආමි. එ සේ නම් කියව. මහා සිටුතුමනි, ඔබ ජීවිතයේ පැසුළු කල ගැන නො සිතුවේහුමය. දූදරුවන් නො බැලුවෙහිය. බොහෝ ධනය ශ්‍රමණ ගෞතමයන්ගේ සසුනෙහි විසුරුවා ඇත. මෙසේ ඔබ පමණ ඉක්මවා ධනය වියදම් කිරීම නිසා ද නව කම් නො කිරීම නිසා ද ශ්‍රමණ ගෞතමයන් නිසා දුගියකු වූවෙහිය. එ සේ වීත් ඔබ ශ්‍රමණ ගෞතමයන් අත් නො හරින්නෙහිය. අදත් ඒ ශ්‍රමණයෝ ඔබ නිවසට පිවිසෙන්නාහුමය. යම් දෙයක් ඔවුන් විසින් ගෙන එනු ලබයි ද ආපසු ගෙන යාමට නො හැකිය. ගත් දෙය පමණක් වේ. මෙතැන් පටන් ශ්‍රමණ ගෞතමයන් වෙත ඔබ ද නො යනු මැනවි. ඔහුගේ සව්වන්ට ද ගෙට පිවිසීමට ඉඩ නො දෙනු මැනවි. ශ්‍රමණ ගෞතමයන් හමුවුව ද හැරී නො බලා තමාගේ වෙළඳාම ද කර්මාන්ත ද කොට පවුල් ජීවිතය සකස් කරනු මැනවි.

මේ ඇසූ මහසිටු ඔබ මට දෙන අවවාදය මෙය ද ? එසේය,

මහ සිටුතුමා, දෙවිය, තා වැනි දෙවියන් සියයකටවත් දහසකටවත් ලක්‍ෂයකටවත් බුදුරජුන් විසින් මා නො සැලෙන්නකු කරනු ලැබ ඇත. මගේ ශ්‍රද්ධාව මහමෙර මෙන් නො සෙල්විය හැකිය. මනාව පිහිටියේය. සත්‍යය මාර්ගය හෙළිකරන බුදුසසුනෙහි මා විසින් වියදම්කොට ඇත. ඔබ කියූ දේ නුසුදුසුය. බුදුසසුනට දුන් පහරකි. එවැනි ආචාර ධර්ම නො දත් දුසිල් කාලකන්නියකු සමග මාගේ එක ගෙහි වාසයක් නැත. මෙතැනින් නික්ම වෙනත් තැනකට යව.

සෝවාන් මඟඵලෙහි පිහිටි අර්යය සච්චකු වූ මහසිටුහුගේ වචන අසා එතැන සිටීමට නො හැකි වී තමා වසන ස්ථානයට ගොස් දරුවන් අතින් ගෙන නික්මී ගියේය. නික්ම ගිය ද වෙනත් ස්ථානයක් නො ලැබ සිටුතුමන් කමා කැරවා ගෙන එහි ම වසමි යි සිතා නගරාරක්ෂක දෙව්පුත් වෙත ගොස් වැඳ සිටියේය. කුමක් නිසා පැමිණියේදැ යි විචාරණ ලදුව, ස්වාමීනි, මම අනවධානයෙන් අනේපිඬු සිටු සමග කථා කළෙමි. ඔහු මා කෙරෙහි කිපී වසන තැනින් ඇද දැමීය. මා සිටුවරයා වෙත ගෙන ගොස් සමා කැරවා වසන තැනක් දෙනු මැනවි. තා විසින් සිටුවරයාට කියන ලද්දේ කුමක් ද ? මෙතැන් පටන් බුදුරජුන්ට උවටැන් නො කරන්න. සඟුන්ට උවටැන් නො කරන්න. ශ්‍රමණ ගෞතමයන්ට ගෙට පිවිසීමට නො දෙන්න. මා විසින් කරන ලද්දේ එ සේය, ස්වාමීනි. තා විසින් කියන ලද්දේ නුසුදුසු වූවකි. සසුනට පහර දෙන ලද්දේය. මම තා රැගෙන සිටුවරයාගේ සමීපයට යාමට උත්සාහ නො කරමි. දෙවියා ඔහුගෙන් පිහිටක් නො ලැබ සිව්මහ රජුන් වෙත ගියේය. ඔවුන් විසින් ද එ සේ ම ප්‍රතික්ෂේප කරන ලදුව, සක්දෙවි රජුන් වෙත ගොස් ඒ සියලු පුවත් සැලකොට, දේවයනි, මම වාස ස්ථානයක් නො ලැබ දරුවන් අතින් ගෙන අසරණ ව සිටිමි. ඔබ වහන්සේගේ මහිමයෙන් මට වාස ස්ථානයක් ලබාදෙනු මැනවැ යි බැගෑපත් ව ඉල්ලා සිටියේය.

සක් දෙවිඳු ද ඔහුට මෙසේ කීය. ඔබ කළේ නුසුදුසු දෙයකි. බුදුසසුනට පහරක් දෙන ලදී. එම නිසා මට ද මේ පිළිබඳ ව සිටු සමග කථා කිරීමට නො හැක්කෙමි. එහෙත් සිටු කමා කැරවා ගැනීමට එක් උපායක් කියමි. දේවයිනි, මැනවි. කියනු මැනවි. මහ සිටුගෙන් මිනිසුන් විසින් ලියවිලි සහිත ව ගන්නා ලද අටළොස් කෝටියක් පමණ ධනය ඇත. ඔබ සිටුහුගේ අයකැමි වේෂය ගෙන කිසිවකුටත් නො දන්වා ඒ ලියවිලි රැගෙන තරුණ යකුන් කීප

දෙනෙකු පිරිවරා ගෙන එක අතකින් ලියවිලි ද අනිත් අතින් පන්හිඳ ද ගෙන ඔවුන්ගේ ගෙවලට ගොස් ගෙයි මැද සිට තම යක්ෂානුභාවයෙන් බිය ගන්වා ඒ සියලු අටළොස් කෙළක් කහවණු ලබාගෙන සිටුවරයාගේ හිස් කොටු පුරවා තවත් අචිරවතී ගංතෙර නිදන් කළ ධනය ගං ඉවුර බිඳී ගිය කල්හි මුහුදට ගොස් ඇත. එය ද තමාගේ ආනුභාවයෙන් ගෙනවුත් කොටුවෙහි පුරවා තව ද අසවල් තැන අයිතිකරුවකු නැති අටළොස් කෙළක් පමණ ධනය ඇත. එය ද ගෙනවුත් හිස් කොටු පුරව. මේ සිව් පණස් කෙළක් ධනයෙන් හිස් කොටු පිරවීමෙන් දඬුවම් විඳ මහසිටු සමා කැර ගන්න. දෙවියා ද මැනව, දේවයිනි යි ඔහුගේ වචනය පිළිගෙන කී අයුරින් සියලු ධනය ගෙනවිත් මැදියම් රැය සිරි යහන් ගැබට පිවිස එළිය පතුරුවා අහසෙහි සිටියේය. මහ සිටුතුමණි, මම සතර වැනි දොරටුව අධිගෘහිත දෙවියා වෙමි. මා විසින් මහා මුලාවකින් බුදු ගුණ නො දැන පෙර දවසක ඔබතුමා සමග කිසියම් කථාවක් කරන ලදී. එම වරදට සමාවනු මැනවි. සක්දෙවිඳුන්ගේ උපදෙස් අනුව ඔබගේ ණය ගෙන අටළොස් කෙළක් මුහුදට ගියා වූ ද අටළොස් කෙළක් අස්වාමිකව තිබුණා වූ ද යනුවෙන් සූ පණස් කෙළක් ධනය ගෙනවුත් හිස් භාණ්ඩාගාරය පිරවීමෙන් දඬුවම විඳගන්නා ලදී. දෙව්රම් වෙහෙර අරබයා වැය කළ සියලු ධනය එක්තැන් කළෙමි. වාස තැනක් නො ලැබ වෙහෙසට පත්වෙමි. මහා සිටුතුමනි, මා නො දැන කළ වරද නො සලකා මට සමාවනු මැනවැ.

අනේපිඬු මහ සිටුහු දෙවියාගේ කථාව අසා සිතුහ. මේ දෙවියා තමා දඬුවම් විඳිබව කියයි. තම වරද පිළිගනී. බුදුරජු මේ ගැන සිතා තමන්ගේ ගුණවත්බව දන්නා සේකැ යි උන්වහන්සේට මොහු පෙන්වමි. දෙවිය, ඔබ මා සමා කැරනු කැමැත්තේ නම් බුදුරජුන් ඉදිරියෙහි සමා කැරව. මැනවි, සිටුතුමනි. එ සේ කරමි. මා බුදුරජුන් වෙත රැගෙන යනු මැනවි. සිටු ඔහුගේ වචනය මැනවැ යි කියා රැය පහන් වූ කල්හි අළුයම ඔහු රැගෙන බුදු රජුන් වෙත පැමිණ ඔහු කළ සියලු දේ බුදුරජාණන් වහන්සේට සැලකළේය. බුදුරජහු ඔහුගේ වදන් අසා ගෘහපතිය, පාපී පුද්ගලයා ද යම් තාක් පාපය එල නො දෙයි ද එතෙක් යහපත් දේම දකී. යම් කලෙක ඔහුගේ පාපය එල දෙයි ද එකල පව් ම දකී යි කියා ධම්ම පදයෙහි ගාථා දෙක කීහ.

යම්තාක් කල් පව් විපාක නො දේ නම් ඒ තාක් පවිටු මිනිසා

යහපත දකී. පව යහපත් සේ දකී. යම් කලෙක පව විපාක දේ නම් එකල්හි පවිටු මිනිසා අයහපත දකී.

කුසල් කරන මිනිසා ද කුසලය විපාක දෙන තුරු අයහපත දකී. (පෙර කළ පව් නිසා දුක් විඳී.) යම් කලෙක කුසල විපාක දේ නම් එකල්හි සත් පුරුෂයා යහපත දකී.

මේ ගාථා කෙළවර දෙවියා සෝවාන් පෙලෙහි පිහිටියේය. ඉක්බිති දෙවියා බුදුරජුන්ගේ සක් ලකුණින් විසිතුරු පාමුල වැටී ස්වාමීනි, මම රාගයෙන් රත්ව, දෝෂයෙන් දූෂිතව, මෝහයෙන් මුළාව, අවිාාවෙන් අන්ධව, නොදන පවිටු වචන කීමි. මට සමාවනු මැනවැ යි බුදුරජුන් සමාකොට අනතුරුව සිටුතුමන් ද සමා කැරවීය.

එකල්හි මහසිටු බුදු රජුන් ඉදිරියෙහි තමන්ගේ ගුණ හෙළිකළේය. ස්වාමීනි, මේ දෙවියා බුද්ධ උපස්ථානාදිය නො කරන්නැ යි වළක්වා සිටියදීත් වැළැක්වීමට ඔහු අසමත් විය. දන් නො දිය යුතුයැ යි මොහු විසින් වළකනු ලබත්දීත් මම දන් දුනිමි. ස්වාමීනි, මේ මාගේ ගුණයක් නො වේ ද ? ගැහැවිය, දූන් ඔබ සෝවාන් ව අරිසච්බවට පත්ව නො සැලෙන සැදැහැ ඇත්තකු ව පිරිසුදු දැහැමි ඇත්තකු ව සිටියදී මේ අල්පේශාඛ්‍ය දෙවියකු විසින් වළක්වන ලදුව නො වැළකුණුබව පුදුම නො වේ. පෙර පඬිවරු අබුදොර්ත්පාද කාලයක මුහුකුරා නො ගිය නුවණින් යුතුව කාමාවචර ලෝකයට අධිපති මාරයා අහසෙහි සිට ඉදින්, දන් දුන්නේ නම් මේ ගිනි වලෙහි පැසෙන්නේයැ යි අසූ රියනක් ගැඹුරු ගිනි අඟුරු වලක් පෙන්වා දන් නො දෙව යි වැළකුව ද නෙළුම් කෙමිය මත සිට දන් දුන්නාහ. එය පුදුමයකි. අනේපිඬු සිටුහු විසින් අයදනා ලද බුදු රජහු ඉකුත් කථාව ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු බරණැස් සිටුගේ ගෙදර ඉපිද විවිධ සුඛෝපභෝගී උපකරණ ඇතිව දෙව් කුමරකු මෙන් වැඩෙන්නේ, ක්‍රමයෙන් නුවණැතිබවට පත්ව සොළොස් වියෙහි දී ම සියලු ශිල්පයන්හි පරතෙරට පැමිණියහ. හෙතෙම පියාගේ ඇවෑමෙන් සිටු තනතුරෙහි සිට නගරයේ සිව් දොරටුවෙහි දන් ශාලා සතරක් ද නගර මධ්‍යයේ එකක් ද තම

නිවස ඉදිරියෙහි එකක් ද වශයෙන් දන් ශාලා සයක් කැරවා මහදන් දෙයි. සිල් රකියි. පොහෝ කම් කරයි. දිනක් උදය ආහාර වේලාවෙහි නොයෙක් රසයෙන් යුත් මිහිරි අහර ලබන කල්හි එක් පසේ බුදුන් වහන්සේ නමක් සත් දවසක් ඇවෑමෙන් නිරෝධ සමවතින් නැගිට පිණ්ඩපාත වේලාවයැ යි සලකා අද මා බරණැස් සිටුගේ ගෙට පිඬු පිණිස යාම සුදුසුයැ යි සිතා නාලිය දැහැටි වළඳා අනෝතත් විලෙන් මුව දොවා රන් ගල් තලාවෙහි සිට සිවුරු හඳනය හැඳ පටිය බැඳ සිවුරු පොරවා ඉදූහයෙන් ලැබුණු මැටි පාත්‍රය ගෙන අහසින් අවුත් බෝසතුන්ට බොජුන් එළවූ කල්හි ම ගෙදොර වැඩ සිටියහ.

බෝසත්හු උන්වහන්සේ දැක අසුනෙන් නැගිට ගෞරව ආදර දක්වා සේවකයා දෙස බැලීය. ස්වාමීනි, කුමක් කරම්දැ යි කී කළ පසේ බුදුරජාණන් වහන්සේගේ පාත්‍රය ගෙනෙන ලෙස අණ කළේය. එකෙණෙහි ම පවිටු මාරයා කම්පිත වෙමින් නැගිට මේ පසේ බුදුරජහු ආහාර වැළඳුවෝ මීට සත් දවසකට පෙරය. අද අහර නො ලබන්නේ නම් නැසෙන්නාහ. උන්වහන්සේ ද විනාශ කරන්නෙමි. සිටුහුගේ දාන අන්තරායන් කරන්නෙමි යි එකෙණෙහි ම අවුත් මැදුර මැද මිදුලෙහි අසූ රියනක් ගැඹුර ගිනි අඟුරු වලක් මැවීය. කිහිරි අඟුරෙන් පිරිණු එම වල ගිනි දැලින් යුතු විය. ආලෝකමත් විය. අවීචි මහා නිරය මෙන් විය. මෙසේ අඟුරු වල මවා තෙමේ අහසෙහි සිටියේය. පාත්‍රය ගැනීමට පැමිණි පුරුෂයා එය දැක මහත් බයට පැමිණ ආපසු ආවේය. බෝසත්හු කිම දරුව, නැවතුණේයැ යි ඇසීය. ස්වාමීනි, මැද මිදුලෙහි මහත් අඟුරු වලක් ඇත. ගිනි දැල්වෙයි. ආලෝකය ඇත. එකකුට පසුව එකෙක් වශයෙන් මෙසේ පැමිණ සියල්ලෝ බියපත් ව වේගයෙන් පලා ගියහ.

බෝසත්හු මෙසේ සිතුහ. අද මගේ දානය වළකනු පිණිස වසවත් කුමරු උත්සුක වන්නේය. ඔහු මෙන් සියසක් දහසක් පැමිණියත් මා නො සැලිය හැකි බව ඔහු නො දනී. මගේ හෝ මරුගේ හෝ බල මහත්වය හා අනුභාව මහත්වය අද පෙන්වමි යි බෝසත්හු සකසා තිබූ බත් පත තමා ම ගෙන ගෙන් නික්ම අඟුරු වල අද්දර සිට අහස දෙස බලන්නාහු මාරයා දැක ඔබ කවරෙක්දැ යි අසූහ. මම මාරයා වෙමි. මේ අඟුරු වල ඔබ විසින් මවන ලද්දේ ද ? එ සේය. මවිසින් මවන ලදී. කුමක් සඳහා මැවී ද ? ඔබගේ දානය වැළැක්වීමටත් පසේ බුදුරජුන්ගේ ජීවිතය නැසීම පිණිසත්

මැවීමි. මගේ දානය වැළැක්මට හෝ පසේ බුදුරජුන්ගේ ජීවිත විනාශයට ඉඩ නො දෙමි. ඔබ බල මහත්වය හෝ මගේ බල මහත්වය අද දනිමි යි අඟුරු වල අද්දර සිට පසේ බුදුහිමියනි, මම හිස පහළට සිටින්නට මේ අඟුරු වලට වැටෙන්නේ වුව ද නො නැවතින්නෙමි. හුදෙක් ඔබ වහන්සේ මා දුන් බොජුන් පිළිගනු මැනවි යි මේ ගාථාව කීහ.

> "කාමං පතාමි නිරයං උද්ධපාදො අවංසිරො
> නානරියං කරිස්සාමි හන්ද පිණ්ඩං පටිග්ගහාති"

> "පා උඩ දෙසට ද හිස යට දෙසට ද සිටින සේ ඒකාන්තයෙන් අඟුරු වලෙහි (නිරයෙහි) වැටෙන්නේමුත් අනාර්ය ක්‍රියාවක් නො කරමි. ස්වාමීනි, පිණ්ඩපාතය පිළිගනු මැනවි."

මෙහි පිණ්ඩාර්ථය මෙසේයි. පසේ බුදුහිමියනි, ඉදින් මම ඔබ වහන්සේට පිණ්ඩපාතය පිරිනැමීම නිසා ඒකාන්තයෙන් මේ ගිනි අඟුරු වලට (නිරයට) පා උඩ දෙසට ද හිස පහතට ද සිටින සේ වැටෙමි. එ සේ වුවත් නො දීම, සිල් නො රැකීම වැනි ආර්යයන් විසින් නො කරනු ලබන අනාර්යයන් විසින් කරනු ලබන ක්‍රියා නො කරමි. ඒ නිසා ස්වාමීනි, මා පිරිනමනු ලබන පිණ්ඩය පිළිගනු මැනවි. මෙහි හෘදයානු නිශ්චයාර්ථයෙහි නිපාතයකි.

මෙසේ කියා බෝසත්හු දැඩි අධිෂ්ටානයෙන් බත් ගෙන ගිනි අඟුරු වල මතින් පැන්නේය. එකෙණෙහි ම රියන් අසූවක් ගැඹුරු අඟුරු වල මතින් එකක් මත එකක් සේ තමා සත් වැනිකොට සිටින සේ සත් තලක් ඇති මහා පියුමක් පැන නැගී බෝසතුන්ගේ පා පිළිගත්තේය. එයින් තුඹක් පමණ මල් රේණු උඩ නැගී බෝසතුන්ගේ හිස මුදුන සිට රන්වන් මල් රේණුයෙන් වැසී ගියාක් සේ විය. අනතුරුව එතුමෝ නෙළුම් මල් කෙමියෙහි සිට නානා රසයෙන් යුත් භෝජනය පසේ බුදුරජුන්ගේ පාත්‍රයෙහි තැබූහ. උන්වහන්සේ ඒ පිළිගෙන අනුමෙවිනි දම් දෙසා පාත්‍රය අහසට දමා මහජනයා බලා සිටිය දී ම තමන් වහන්සේ ද අහසට පැන නැගී නානාප්‍රකාර වලාපෙළ මඩින්නාක් මෙන් හිමවතට ම වැඩියහ. මාරයා ද පැරදී

දොම්නස් ව තමන් විසන තැනට ම ගියේය. බෝසත්හු පියුම් කෙම්යෙහි සිට ම මහජනයාට දන් සිල් වැණුමෙන් යුත් දම් දෙසූහ. මහජනයා පිරිවරා තම නිවසට ගොස් දිවි හිම්යෙන් දානාදී පින් දහම්කොට කම් වූ පරිදි මිය ගියහ.

ඉක්බිති බුදු රජහු ගැහැවිය, ඔබ දැන් මෙසේ දර්ශන සම්පන්නව දෙවියකුගෙන් නො සැලීම පුදුමයක් නො වේ. පෙර පඬිවරුන් කළ දෙය ම ප්‍රශස්ත වෙම් යි මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා පසේ බුදු රජාණන් වහන්සේ එහි ම පිහිනිවියහ. මරු පරදා එදා පියුම් කෙම්යෙහි සිට පසේ බුදු රජුන්ට පිඬු දුන් තැනැත්තා බරණැස සිටු වූ මම ම වීමි.

## සතර වැනි කුලාවක වර්ගයයි.

## 1. 5. 1.

## ලෝසක ජාතකය

"යො අත්ථකාමස්සා" යන මේ ජාතක ධර්ම දේශනාව බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙරෙහි වැඩ වාසය කරන සේක්, ලෝසකතිස්ස තෙරුන් අරබයා වදාළ සේක. මේ ලෝසක තෙරුන් වහන්සේ කවරෙක් ද ? කොසොල් රට එක් තමන්ගේ කුලය විනාශ කරන, ධීවර පුත්‍රයකු වූ, ලැබීමෙන් තොර භික්ෂුවකි. ඔහු වනාහි උපන් තැනින් චුත ව කොසොල් රට එක් ගෙවල් දහසක් ඇති ධීවර ගමක එක් ධිවරියකගේ කුසෙහි පිළිසිඳ ගත්තේය. ඔහු පිළිසිඳ ගන්නා දින ඒ කුල දහස දැල් ගත් අත් ඇතිව ගංගාවෙහි ද විල්වල ද මසුන් සොයන්නාහු, එක් කුඩා මසකුවත් නො ලැබූහ. එතැන් පටන් ඒ ධීවරයෝ පිරිහෙත්මය. ඔහු කුසට පැමිණි දින සිට ඔවුන්ගේ ගම සත් වරක් ගින්නෙන් දැවී ගියේය. සත් වරක් රජු විසින් දඬුවම් දෙන ලදී. මෙසේ පිළිවෙලින් දුප්පත් වූ ඔවුහු සිතූහ. පෙර අපට මෙබඳු දෙයක් සිදුවී නැත. දැන් වනාහි පිරිහෙමු. අප අතර එක් කාලකණ්නියකු විය යුතුය. කොටස් දෙකක් වෙමු. පන්සියයක් පන්සියයක් වශයෙන් කුල එක් වූහ. එයින් පසු යම් තැනක ඔහුගේ මව්පියවරු වෙත් ද ඒ කොටස පිරිහේ. අනිත් කොටස වැඩේ. ඔවුහු ඒ කොටසත් දෙකඩ විය. එය ද දෙකඩ විය. මෙසේ යම්තාක් එම ගෙදර එකක් වී ද ඒතාක් බෙදා ඔවුන්ගේ කාලකණ්නිකම දැන තලා බැහැර කළහ.

ඉක්බිති, ඔහුගේ මව අමාරුවෙන් ජීවත් වන්නී, ගැබ මෝරා ගිය කල එක් තැනක වැදුවාය. අන්තිම ජීවිතයේ වසන සත්ත්වයා නසන්න නො හැකිය. කලය තුළ පහනක් මෙන් ඔහුගේ හෘදයෙහි රහත්බවට හේතු සම්පත් දිලිහේ. ඕ තුමූ මේ දරුවා පෝෂණයකොට දුව පැන හැසිරෙන කාලයෙහි ඔහුට එක් කබලක් අතට දී පුත්‍රය, එක් ගෙයකට පිවිසේව යි යවා පලා ගියාය. හෙතෙම එතැන් පටන් තනිව ම එහි හිඟමන් සොයා එක් තැනක නො නිදයි. ස්නානය නො කරයි. ශරීරය පිළිදැගුම් නො කරයි. පාංසු පිසාචයෙක් මෙන් අමාරුවෙන් ජීවිකාව කරයි. හෙතෙම පිළිවෙලින් සත් හැවිරිදි වී එක්

ගෙදරක භාජන සේදූ වතුර දමන තැන කවුඩෙක් මෙන් එක එක බත් උල අහුලා කයි.

ඉක්බිති, සැරියුත් හිමි සැවැත් නුවර පිඬු පිණිස හැසිරෙද්දී දක මේ සත්ත්වයා ඉතා දුක්ඛිත තත්ත්වයට පත්වුයේය. කවර ගමක වැසියකුද යි ඔහු කෙරෙහි මෙත් සිත් වඩා බොල, එව යි කී සේක. ඔහු ගොස් තෙරුන් වහන්සේට වැඳ සිටියේය. ඉක්බිති, ස්ථවිර තෙමේ ඔහුගෙන් කවර ගමක වැසියෙක් ද ? මව්පිය කොහිද යි විචාළ සේක. ස්වාමීනි, මම පිහිටක් නොමැත්තෙකි. මගේ මව ද පියා ද මා නිසා වෙහෙසට පත් වූහ යි මා අත් හැර දමා පලා ගියහුය. එ සේ නම් පැවිදි වන්නේ ද ? ස්වාමීනි, මම පැවිදි වන්නම්, ඒත් මා වැනි දුගියකු කවරෙක් පැවිදි කරන්නෝ ද ? මම පැවිදි කරන්නෙමි. මැනවි. පැවිදි කරන සේක්වා. තෙරුන් වහන්සේ ඔහුට කෑ යුතු බිව යුතු දෑ දී ඔහු විහාරයට ගෙන ගොස් සියතින් ම නාවා පැවිදිකොට වයස් පිරුණු ඔහු උපසපන් කැරවූ සේක. හෙතෙම මහලු කල ලෝසකතිස්ස තෙරුන්යැ යි ප්‍රකට විය. පින් නැත්තේ ස්වල්ප ලාභ ඇත්තේය. ඔහු අසදෘශ දානයෙහි ද කුස පුරා නො ලදවීරූය. ජීවිතය ගැටගසා ගැනීමට පමණක් ම ලබයි. උන්වහන්සේගේ පාත්‍රයට එක් කැඳ හැන්දක් දුන් කල්හි පාත්‍රය පිරීගියාක් සේ පෙනිණි. ඉක්බිති, මිනිස්සු මොහුගේ පාත්‍රය පිරී ඇතැ යි ඊළඟට සිටි අයට කැඳ දෙති. උන්වහන්සේගේ පාත්‍රයෙහි කැඳ දෙන කල මිනිසුන්ගේ බඳුන්වල කැඳ අතුරුදහන් වෙති යි කියති. කැවිලි ආදියෙහි ද මෙම ක්‍රමයයි. හෙතෙම මෑත කාලයෙහි විදසුන් වඩා උසස් ඵලය වූ රහත් ඵලයෙහි පිහිටියේ නමුදු ස්වල්ප ලාභ ඇත්තේ ම වූ සේක. ඉක්බිති, උන්වහන්සේට පිළිවෙළින් ආයුෂ පිරිහුණු කල්හි, පිරිනිවන් පාන දවස පැමිණියේය.

දම් සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ කල්පනා කරන සේක්, උන්වහන්සේ පිරිනිවන්පානා බව දූන මේ ලෝසකතිස්ස ස්ථවිරයන් වහන්සේ අද පිරිනිවන් පාන්නේය. අද මා විසින් මොහුට ඇතිතාක් ආහාර දෙන්න වටීයැ යි ඔහුත් රැගෙන සැවැත් නුවරට පිඬු පිණිස වැඩි සේක. ස්ථවිරයන් වහන්සේ ඔහු නිසා බොහෝ මිනිසුන් ඇති සැවැත් නුවර තෙක් අත දිගුකොට වැඳුම් මාත්‍රයක්වත් නො ලැබූ සේක. ඉක්බිති, ඔහුට ස්ථවිරයන් වහන්සේ ඇවැත්නි, යව.

ආසන ශාලාවෙහි හිඳුවයි පිටත්කොට යවා මෙය ලෝසක තෙරුන්ට දෙවුයැ යි ලැබූ ආහාර යැවූ සේක. එය රැගෙන ගියා තැනැත්තෝ ලෝසක තෙරුන් සිහි නො කොට තුමු ම අනුභව කළහ.

ඉක්බිති, තෙරුන් වහන්සේ නැඟිට විහාරයට ගිය කල්හි ලෝසකතිස්ස ස්ථවිර තෙමේ ගොස් තෙරුන් වැන්දේය. තෙරුන් වහන්සේ නැවතී සිටියේ ම ඇවැත්නි, ඔබ වහන්සේට බත් ලැබුණේදැ යි විචාළ සේක. ස්වාමීනි, බත් නො ලබන්නා වූයැ යි කී සේක. තෙරුන් වහන්සේ සංවේගයට පත්ව කාලය බැලූ සේක. කල් ඉක්ම ගොස් තිබුණි. තෙරුන් වහන්සේ එ සේ වේවා, ඇවැත්නි, මෙහි ම හිඳුවයි ලෝසක තෙරුන් වහන්සේ ආසන ශාලාවෙහි හිඳුවා කොසොල් රජතුමාගේ මාලිගාවට වැඩම කළ සේක. රජතුමා තෙරුන් වහන්සේගේ පාත්‍රය ගෙන්වාගෙන බත් කාලය නො වේයැ යි පාත්‍රය පුරා චතුමධුර පිළිදෙවීය.

තෙරුන් වහන්සේ එය ගෙන වැඩමවා ඇවැත්නි තිස්සයෙනි, එව, මේ චතුමධුර වළඳව යි වදාරා පාත්‍රය අතෙහි තබාගෙන ම සිටි සේක. හෙතෙම තෙරුන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් ලජ්ජාවෙමින් නො වළඳයි. ඉක්බිති, ඔහුට තෙරුන් වහන්සේ ඇවැත්නි තිස්සයෙනි, එව, මම මෙම පාත්‍රය රැගෙන ම සිටිමි. නුඹ වහන්සේ හිඳගෙන වළඳනු. ඉදින්, මේ පාත්‍රය අතින් ඉවත් කෙළේ නම් කිසිවක් නො තිබෙන්නේයැ යි වදාළ සේක. ඉක්බිති, ආයුෂ්මත් ලෝසකතිස්ස තෙරුන් වහන්සේ අග ඉසුරු දම් සෙනෙවි සැරියුත් තෙරුන් වහන්සේ පාත්‍රයගෙන සිටි චතුමධුර වැළඳූ සේක. එය තෙරුන් වහන්සේගේ ආර්‍ය්‍ය සෘද්ධි බලයෙන් නිමාවකට පත් නො වීය. ඒදා ලෝසකතිස්ස තෙරුන් වහන්සේ ප්‍රමාණවත් ව බඩපුරා වැළඳූ සේක. එදින ම අනුපාදිසේස නිර්‍වාණ ධාතුවෙන් පිරිනිවන්පෑ සේක. සම්මා සම්බුදු රජාණන් වහන්සේ සමීපයෙහි සිට සිරුර බැහැර කිරීම කැරවූ සේක. ධාතුන් ගෙන චෛත්‍යයක් කළහුය.

එකල්හි භික්ෂූහු දම් සබාවෙහි රැස්ව ඇවැත්නි, ලෝසක තෙරුන් වහන්සේ පින් නැත්තේ ස්වල්ප ලාභ ඇත්තේය. මෙබඳු වූ පින් රහිත ව අල්ප ලාභ ඇතියකු විසින් ආර්‍ය්‍ය ධර්මය කෙසේ ලබන ලදදැ යි කියමින් හුන්නාහුය. බුදුරජාණන් වහන්සේ දම් සබාවට වැඩමවා

මහණෙනි, මෙහි කවර කථාවකින් යුක්ත ව දැන් හුන්නාහුද යි විචාළ සේක. උන් වහන්සේලා මෙනම් කථාවකිනි ස්වාමීනී යි සැලකළාහුය. බුදුරජාණන් වහන්සේ මහණෙනි, මේ භික්ෂුව තමාගේ නො ලැබීම ද අරිය ධර්ම ලාභය ද තමා විසින් කරන ලදී. මොහු වනාහි පෙර අනුන්ට ලැබීම් අවහිරකොට ස්වල්ප ලාභී විය. අනිත්‍ය, දුක්ඛ, අනත්ත යන විදර්ශනාවෙන් යුක්ත බැවින් එහි ප්‍රතිඵලයෙන් ආයර්‍ය ධම් ලාභී වූයේයැ යි වදාරා අතීතය ගෙන හැර දක්වූ සේක.

යටගිය දවස කාශ්‍යප සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි එක්තරා භික්ෂූන් වහන්සේ නමක් එක් කෙළඹි පුත්‍රයකු නිසා ගමේ ආවාසයක වාසය කළ සේක. ප්‍රකෘති සිල් ඇත්තේ විදශ්නාවෙහි යෙදී පැහැදී වසන සේක. ඉක්බිති, එක් රහත් තෙර කෙනෙක් වහන්සේ සම ව්‍රත වසන සේක්, අනුක්‍රමයෙන් ඒ භික්ෂූන් වහන්සේට උපස්ථාන කරන්නා වූ කෙළඹි පුත්‍රයා වසන ගමට වැඩම කළ සේක. කෙළඹි පුත්‍රයා තෙරුන් වහන්සේගේ ඉරියව් පැවැත්මෙහි පැහැදී පාත්‍රය ගෙන ගෙට වඩමවා සකසා වළඳවා කෙටි බණක් අසා තෙරුන් වැඳ ස්වාමීනි, අපගේ ආසන්න විහාරයට වඩිනු මැනවි. අපි සවස් කාලයේ අවුත් බලන්නෙමු යි කීවේය. ස්ථවිරයන් වහන්සේට වැඳ විචාරා එකත්පස ව වැඩහුන් සේක. උන් වහන්සේ ද ඔහු සමග පිළිසඳර කථාකොට ඇවැත්නි, දානය ලබන ලද්දේද යි විචාළ සේක. එ සේය, ලැබුණේය. කොහිදී ලබන ලද්දේ ද ? නුඹ වහන්සේගේ ආසන්න ගමෙහි කෙළඹියාගේ ගෙදරිනි. මෙසේ ද කියා තමන්ගේ සෙනසුන විචාරා පිළිදැගුම්කොට පා සිවුරු සකස්කොට තබා ධ්‍යාන සුවයෙන් ද ඵල සුවයෙන් ද ගතකරමින් වැඩහුන් සේක.

ඒ කෙළඹි පුත්‍රයා ද සවස් කාලයෙහි සුවඳ මල් ද පහන් හා තෙල් ද ගෙන්වා ගෙන විහාරයට ගොස් නේවාසික තෙරුන් වැඳ ස්වාමීනි, එක් ආගන්තුක ස්ථවිර නමක් ඇත්ද යි විචාළේය. එ සේය, පැමිණියේය. දැන් කොහි ද ? අසවල් සේනාසනයෙහිය. හෙතෙම උන් වහන්සේගේ සමීපයට ගොස් වැඳ එකත්පසෙක හුන්නේ ධර්ම කථාව අසා සිසිල් වේලාවෙහි චෛත්‍යය ද බෝධිය ද පුදා පහන් දල්වා දෙදෙනා වහන්සේට ම ආරාධනාකොට ගියේය. නේවාසික ස්ථවිරයන් වහන්සේ ද මේ කෙළඹි තෙමේ බිඳුණේමය. ඉදින්, මේ භික්ෂුව මේ විහාරයෙහි වාසය කරන්නේ නම්, හෙතෙම මා කිසිසේත් ගණන් නො ගන්නේය. තෙරුන් කෙරෙහි නො සතුටු සිත් ඇතිබවට පැමිණ

මේ විහාරයෙහි වාසය නො කරන ලෙස මා විසින් කරන්න වටීයැ යි, ඔහු උපස්ථාන කරන වේලාවෙහි ආවාහු සමග කිසිවක් කථා නො කළේය. ක්ෂීණාශ්‍රවයන් වහන්සේ ඒ භික්ෂුවගේ අදහස් දැනගෙන මේ ස්ථවිර තෙම මගේ කුලයෙහි හෝ ගණයා කෙරෙහි හෝ අවිරුද්ධබව නො දනී. තමන්ගේ වසන ස්ථානයට ගොස් ධ්‍යාන සැපයෙන් ද ඵල සැපයෙන් ද කල්ගත කළ සේක.

නේවාසික ස්ථවිරයන් වහන්සේ දෙවැනි දින නිය පිටින් ගෙඩිය ගසා නියෙන් දොරට තට්ටුකොට කෙළඹියාගේ ගෙට වැඩි සේක. හෙතෙම උන් වහන්සේගේ පාත්‍රය ගෙන පනවන ලද ආසනයෙහි හිඳුවා ආගන්තුක ස්ථවිරයන් වහන්සේ කොහිදැ යි විචාළේය. මම ඔබගේ කුළුපගයාගේ පුවත් නො දනිමි. ගෙඩිය ගසන්නේ දොරට තට්ටු කරන්නේ නමුදු පුබුදුවන්නට නො හැකි වූයෙමි. ඊයේ ඔබගේ ගෙයි ප්‍රණීත භෝජන අනුභවකොට දිරවන්න නො හැකි වන්නේ දැන් නින්දට බැස්සේ විය යුතුය. පහදින ඔබ මෙබඳු තැන්වලට ම පැහැදෙන්නෙහිය. ක්ෂිණාශ්‍රවයන් වහන්සේ ද තමන්ගේ පිඬුසිඟා හැසිරෙන වේලාව සලකා සිරුර පිළිදැගුම්කොට පා සිවුරු රැගෙන අහසෙහි පැන නැඟී අන් තැනකට වැඩි සේක.

ඒ කෙළඹි තෙම, නේවාසික ස්ථවිරයන්ට ගිතෙල්, මීපැණි, උක් සකුරුවලින් සකස් කළ කිරි බත් වළඳවා පාත්‍රය සුවඳ සුණෙන් උලා නැවත පුරවා ස්වාමීනි, ඒ ස්ථවිරයන් වහන්සේ මාර්ගයෙහි ක්ලාන්ත වූයේ වන්නේය. උන්වහන්සේට මේ කිරි බත ගෙනයනු මැනවැ යි දුන්නේය. අනිත් භික්ෂූන් වහන්සේ ප්‍රතික්ෂේප නො කොට ගෙන යන්නේ ඉදින්, ඒ භික්ෂු තෙම මේ කිරි බත බොන්නේ ද බෙල්ලෙන් අල්ලා බැහැර කරන්නේ නමුදු නො යන්නේය. ඉදින් වනාහි, මම මේ කිරි බත මිනිසකුට දෙන්නේ නම් මාගේ ඒ ක්‍රියාව ප්‍රකට වන්නේය. ඉදින්, ජලයෙහි පාකැර හරින්නෙම් නම් දිය පිට ගිතෙල් ප්‍රකට වන්නේය. ඉදින්, බිම අත් හරින්නේ නම් කවුඩන් එකතු වීමෙන් වැණෙන්නේය. මෙය කොහි හැර දමන්නෙම්දැ යි සලකන්නේ එක් දැවුණු කෙතක් දැක අඟුරු පහකොට එහි බහා මත්තෙහි අඟුරුවලින් වසා විහාරයට ගියේ ඒ භික්ෂුව නො දැක මෙසේ සිතීය. ඒකාන්තයෙන් ඒ භික්ෂු තෙම රහත් කෙනෙකි. මගේ අදහස් දැන අන් තැනකට ගියා වන්නේය. අනේ, මා විසින් බඩ නිසා අසාධාරණයක් කරන ලද්දේයැ යි එකෙණෙහිම ඔහුට මහත් වූ දොම්නසක් පහළ

විය. එතැන් පටන් ම මිනිස් ප්‍රේතයෙක්ව නොබෝ කලකින් ම කළුරියකොට අපායෙහි උපන්නේය.

හෙතෙම බොහෝ වර්ෂ ලක්‍ෂ ගණනක් නිරයෙහි පැසී ඉදිරි වූ පිළිවෙලින් පන්සියයක් ජාතිවල යකෙක් වී එක් දිනක්වත් බඩපුරා අහරක් නො ලැබුවේය. එක් දිනක් අසූචි බඩ පුරා ලැබුවේය. නැවත පන්සියයක් ජාතිවල බල්ලෙක් වූයේය. එකල ද එක් දිනක් බත් වමනයක් බඩ පුරා ලැබුවේය. ඉතිරි කාලයෙහි ඔහු විසින් බඩපුරා අහරක් නො ලදවිරූය. බලු යෝනියෙන් චුත වී කසීරට එක් ගමක දුප්පත් කුලයක උපන්නේය. ඔහු උපන් දින පටන් ඒ ගෙදර අතිසයින් ම දුප්පත් වූයේ ම නැබෙන් උඩට කැඳ වතුර ටිකක්වත් නො ලැබුවේය. එහුට මිත්තවින්දකයැ යි නමක් විය. මව්පිය බඩගිනි දුක ඉවසන්න නො හැක්කේ යව, කාලකණ්නියායැ යි ඔහුට තලා බැහැර කළහ. හෙතෙම පිළිසරණක් නැත්තේ, හැසිරෙන්නේ බරණැසට ගියේය.

එකල්හි බෝසත් තෙම බරණැස දිසාපාමොක් ඇදුරු වී පන්සියයක් තරුණයන්ට ශිල්පය හදාරවයි. එකල්හි බරණැස් නුවර වැසියෝ දුප්පතුන්ට වැටුප් දී ශිල්ප හික්මවත්. මේ මිත්තවින්දක තෙම බෝසතාණන්ගේ සමීපයෙහි පිනට ශිල්ප හදාරයි. හෙතෙම පරුෂය. අවවාදයට නො නැමේ. ඒ ඒ අයට පහර දෙමින් හැසිරේ. බෝසතාණන් විසින් අවවාද කැරනු ලබන්නේ නමුදු අවවාදය නො පිළිගනී. ඒ නිසා ඔහුට ලැබීම ද මද විය. ඉක්බිති, හෙතෙම මානවකයන් සමග කලහකොට අවවාද නො ගන්නේ එයින් පලාගොස් ඇවිදින්නේ, එක් පිටිසර ගමකට ගොස් කුලී වැඩකොට ජීවත් වේ. හෙතෙම එහි එක් දුප්පත් ස්ත්‍රියක සමග සංවාසය කළේය. ඕ තුමූ ඔහු නිසා දරුවන් දෙදෙනකු වැදුවාය. ගම් වැසියෝ අපට යහපත අයහපත සැලකරන්නැ යි මිත්තවින්දකට කුලිය දී ගම් දොර කුටියක ඔහු වැස්සූහ. ඒ මිත්තවින්දකයා නිසා පිටිසර ගම් වැසියෝ සත් වරක් රජ දඬුවම් වින්දෝය. සත් වරක් විල බිඳුණැ යි ඔවුහු සිතුවෝහුය. පෙර අපට මේ මිත්තවින්දකයා නො පැමිණි කල්හි මෙබඳු දෙයක් නැත. දැන් මොහු පැමිණි කාලයේ සිට පිරිහෙවු යි ඔහුට තලා බැහැර කළාහුය. හෙතෙම තමාගේ දරුවන් ගෙන අන් තැනකට යන්නේ, අමනුෂ්‍යයන් විසින් අරක් ගත් කැලෑවකට පිවිසියේය. එහි අමනුෂ්‍යයෝ දරුවන් ද බිරිය ද මරා මස් කෑහ.

හෙතෙම එයින් පලාගොස් ඒ ඒ තැන ඇවිදින්නේ, එක් ගම්භීර නම් පටුනු ගමට නැව දියත් කැරන දිනයෙහි ම පැමිණ කම්කරුවෙක් වී නැවට නැංගේය. නැව මුහුද මත සත් දවසක් ගොස් සත් වැනි දින මුහුද මැද තට්ටුකොට තැබුවා සේ සිටියේය. ඔවුහු කාලකණ්නි තුණ්ඩුව හෙවත් අවාසනාවන්තයා සෙවීමේ කුසපත් තේරූහ. සත් වරක් ම මිත්තවින්දකට ම පැමිණියේය. මිනිස්සු ඔහුට උණ දඬු මිටියක් දී අතින්ගෙන මුහුදට විසි කළහ. ඔහු දැමූ විගස නැව ගියේය. මිත්තවින්දක තෙමේ උණ මිටියෙහි දිග ඇදී මහා මුහුදෙහි යන්නේ කාශ්‍යප සම්බුදුරජුන්ගේ කාලයෙහි රකින ලද ශීල බලයෙන් මුහුද පට එක් පළිඟු මැණික් විමානයක දෙව් දූවරු සතර දෙනෙක ලැබ ඔවුන්ගේ සමීපයෙහි සැප විඳින්නේ සතියක් වාසය කළේය. ඒ විමාන ප්‍රේතියෝ සත් දිනක් සැප අනුභව කරත්. සත් දිනක් දුක් අනුභව කරත්. දුක් අනුභව කරන්නට යන කල්හි අපි යම්තාක් එමු ද ඒතාක් මෙහි ම වසව යි කියා ගියාහුය. මිත්තවින්දක තෙම ඔවුන් ගිය කල උණ කලාපයෙහි වැදහොවා වෙනතක යන්නේ රිදී විමානයක දේව දූවරුන් අට දෙනෙක ලැබුවේය. එයින් ද ඈත යන්නේ, මැණික් විමානයෙහි සොළොස් දෙනෙක ද රන් විමානයක තිස් දෙදෙනෙක ද ලැබුවේය. ඔවුන්ගේ වචනය නො කොට ඈත යන්නේ අතුර දිවයිනක එක් යක්ෂ නගරයක් දුටුවේය. එහි එක් යකින්නියක් එළු ස්වරූපයෙන් හැසිරෙයි. මිත්තවින්දක තෙමේ ඇගේ යක්ෂනීබව නො දන්නේ එළු මස් කන්නේ, ඇය පාවලින් අල්ලා ගත්තේය. ඕ තුමූ යක්ෂානුභාවය නිසා ඔහු ඔසවා විසි කළාය. හෙතෙම, ඇය විසින් විසි කැරන ලද්දේ මුහුද මතින් ගොස් බරණැස දිය අගල අසල එක් කටු ලැහැබක් මත වැටී පෙරළී බිම පිහිටියේය.

එසමයෙහි ඒ දිය අගල අසල රජුගේ එළු දෙන්නුන් හැසිරෙන්නේ, සොරු පැහැර ගනිති. එළු දෙනුන් බලන්නෝ සොරුන් අල්ලා ගනිමු යි එකත් පසෙක සැඟවී සිටියාහුය. මිත්තවින්දක තෙමේ පෙරළී බිම සිටියේ ඒ එළු දෙනුන් දැක සිතීය. මම මහ මුහුදෙහි එක් දිවයිනක එළු දෙනකගේ පා ගෙන ඈ විසින් විසිකරන ලද්දේ මෙහි වැටුණේය. ඉදින් වනාහි, දැන් එක් එළු දෙනකගේ පා ගන්නෙම් නම් ඕ තුමූ මා එහා මුහුදු පිට විමන් දෙවියන්ගේ සමීපයෙහි විසි කරන්නීය. හෙතෙම මෙසේ අනුවණින් මෙනෙහිකොට එළු දෙනකගේ පා ගත්තේය. ඕ තුමූ අල්ලාගත් විට ම කෑගැසුවාය. එළු දෙනුන් පාලකයෝ එහෙන් මෙහෙන් පැමිණ ඔහු අල්ලාගෙන මෙතෙක් කල්

රජ ගෙදර එළු දෙනුන් කන්නා මේ සොරායැ යි ඔහුට කොටා බැඳ රජුගේ සමීපයට ගෙන ගියෝය.

එකෙනෙහි බෝසත් තෙමේ පන්සියයක් තරුණයන් විසින් පිරිවරන ලද්දේ නුවරින් නික්ම නෑමට යන්නේ මිත්තවින්දක දැක හඳුනා ඒ මිනිසුන්ට කීවේය. දරුවනි, මේ තෙමේ අපගේ ශිෂ්‍යයෙකි. කුමක් නිසා ඔහු ගත්තාහු ද ? ආර්යය, එළු දෙනුන් සොරකම් කරන්නෙකි. එක් එළු දෙනකුගේ පා අල්ලා ගත්තේය. එහෙයින් අල්ලා ගන්නා ලද්දේ වෙයි. එ සේ නම් මොහු අපට දාසයකුකොට දෙවු. අප නිසා ජීවත් වන්නේය. ආර්යය, යහපතැ යි ඔහු අත්හැර ගියාහුය. ඉක්බිති, බෝධිසත්ත්ව තෙම මිත්තවින්දකය, තෝ මෙතෙක් කල් කොහි විසුවේදැ යි විචාළේය. හෙතෙම තමා විසින් කරන ලද සියළු කම් සැලකළේය. බෝසත් තෙමේ වැඩ කැමැතිවුන්ගේ වචනය විශ්වාස නො කරන්නෝ මේ දුකට පැමිණෙතැ යි කියා මේ ගාථාව කීවේය.

"යො අත්‍ථකාමස්‍ස හිතානුකම්පිනො
ඔවජ්ජමානො න කරොති සාසනං
අජියා පාදමොලුබ්භ
මිත්තකො විය සොචතීති"

"වැඩ කැමැති ව හිතවත් ව අනුකම්පා කරන්හුගේ වචනය, අවවාද කරන්නේ නමුදු යමෙක් නො කරයි ද එළු දෙනගේ පාදයෙහි එල්බ ගත් මිත්තක මෙන් ශෝක කරයි."

එහි, "අත්‍ථකාමස්‍සාති" අභිවෘද්ධිය කැමැතිවන්නාහුගේ, "හිතානුකම්පිනොති" හිතවත් ව අනුකම්පා කරන්නාගේ, "ඔවජ්ජමානොති" මොළොක් වූ හිතවත් සිතින් අවවාද දෙනු ලබන්නේ, "න කරොති සාසනං" උපදෙස් නො පිළිපදියි. නො කීකරු ව අවවාද නො රුස්සන්නකු වේ. "මිත්තකො විය සොචතීති" මේ මිත්තවින්දක තෙම එළු දෙනගේ පාදය ගෙන ශෝක කරන්නේ යම් සේ ද වෙහෙස වන්නේ යම් සේ ද, මෙසේ හැමදා ශෝක

කරන්නේයැ යි, මේ ගාථාවෙන් බෝසතාණෝ දහම් දෙසූහ.

මෙසේ ඒ තෙරුන් විසින් මෙතෙක් කාලයෙහි ආත්ම භාව තුනක ම කුස පිරීමක් නො ලදවිරූය. යක්ෂයකු වී එක් දිනක් ගබ්මල ලබන ලදී. සුනඛයකු වී එක් දිනක් බත් වමනය ද පිරිනිවන්පාන වෙසෙහි දම් සෙනවි සැරියුත් හිමියන්ගේ ආනුභාවයෙන් චතුමධුර ලබන ලදී. මෙසේ අනුන්ගේ ලාභ අනතුරු කිරීම මහා දෝෂයක්යැ යි දත යුතුයි.

ඒ කාලයෙහි ඒ ආචාර්ය තෙමේ ද මිත්තවින්දකයා ද කම් වූ පරිදි මිය පරලොව ගියෝය. බුදුරජාණන් වහන්සේ, මහණෙනි, මෙසේ තමා විසින් අල්ප ලාභී බවත් ආයඞ් ධම්ලාභී බවත් තෙමේ ම කළේයැ යි, මේ ධම් දේශනාව ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා ජාතක කථාව නිමවා වදාළ සේක. එකල්හි මිත්තවින්දක තෙම ලෝසකතිස්ස තෙරුන් විය. දිසාපාමොක් ඇදුරුතුමා මම ම වෙමි යි වදාළ සේක.

## 1. 5. 2.

## කපෝත ජාතකය

**"යො අත්ථකාමස්සාති"** යන මේ දේශනාව බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ වාසය කරන සේක්, එක්තරා කෑදර භික්ෂුවකු අරබයා වදාළ සේක. ඒ භික්ෂුවගේ කෑදරබව නව වැනි නිපාතයෙහි කාක ජාතකයෙහි මතු සඳහන් වන්නේය. එකල්හි වනාහි, භික්ෂූහු, ස්වාමීනි, මේ භික්ෂුව කෑදරයැ යි බුදුරජුන්ට සැලකළහ. ඉක්බිති, බුදුරජාණන් වහන්සේ ඒ භික්ෂුවගෙන් මහණ, නුඹ ලොල්ය යනු ඇත්තදැ යි විචාළේය. ස්වාමීනි, එ සේය. බුදුරජාණන් වහන්සේ මහණ, නුඹ පෙරත් ලොල්ය. ලොල්කම නිසා ම මරණයට පත්විය. නුවණ ඇත්තේ ද ඔබ නිසා තමන්ගේ වසන තැනින් පිරිහුණේයැ යි වදාරා අතීතය ගෙනහැර පෑසේක.

යටගිය දවස බරණැස් නුවර බඹදත් රජු රජ කරද්දී බෝසත් තෙමේ පරෙවි ජාතියෙහි උපන්නේය. එදා බරණැස් නුවර වැසියෝ පින් කැමැති නිසා ඒ ඒ ස්ථානයෙහි කුරුල්ලන්ට සැප සේ වාසය කිරීමට දහයියා පැස් එල්ලති. බරණැස් සිටුතුමාගේ අරක්කැමියා ද තමාගේ කුස්සියෙහි එක් දහයියා කූඩයක් එල්ලා තැබීය. බෝසත් තෙමේ එහි වාසය කළේය. හෙතෙම උදෑසන ම නික්මී ගොදුරු සඳහා හැසිර සවස අවුත් එහි වසන්නේ කාලය ගෙවයි. ඉක්බිති, එක් දිනක් එක් කපුටෙක් මුළුතැන් ගෙය උඩින් යන්නේ නො ඇඹුල් මත්ස්‍යය මාංශ සුවඳ ආඝ්‍රාහණයකොට ලෝභය උපදවා කෙසේ නම් මාළු ලබන්නෙහිදැ යි, නුදුරෙහි හිඳ අල්ලා ගැනීමට පරීක්ෂා කරන්නේ සවස බෝසතුන් අවුත් මුළුතැන් ගෙයට පිවිසෙනු දැක මේ පරෙවියා නිසා මේ මස් හා මාළු ලබන්නෙමි යි දෙවැනි දින උදෑසන ම අවුත් බෝසතුන් නික්මී ගොදුරු සඳහා යන කල පිටුපසින් ගියේය.

ඉක්බිති, ඔහුට බෝසත් තෙම මිත්‍රය, නුඹ කුමක් නිසා අප සමග හැසිරෙන්නහිදැ යි ඇසුවේය. ස්වාමීනි, නුඹ වහන්සේගේ ක්‍රියාව මට රුචි කැරේ. මෙතැන් පටන් තොපට උපස්ථාන කරන්නෙමි. මිත්‍රය, තෙපි අන්‍යය වූ ගොදුරු කුම ඇත්තෝය. අපි අන්‍යය ගොදුරු කුම ඇත්තෝමු නුඹ විසින් අපට උපස්ථාන කිරීම දුෂ්කරය. ස්වාමීනි, නුඹ වහන්සේ ගොදුරු ගන්නා කල්හි මමත් ගොදුරු ගෙන නුඹ වහන්සේලා සමග ම යන්නෙමි. මැනවි. හුදෙක් අප්‍රමාද විය යුතුය. මෙසේ බෝසත් තෙමේ කපුටාට අවවාදකොට ගොදුරෙහි හැසිරෙන්නේ, තණ ඇට ආදිය කයි. බෝසතාණන් වහන්සේ ගොදුරු ගන්නා කල්හි කපුටා ගොස් ගොම පිඩු පෙරළා කූඩා පණුවන් කා බඩ පුරවා බෝසතුන්ගේ සමීපයට පැමිණ ස්වාමීනි, නුඹ වහන්සේ කල්යවා හැසිරෙව්. බොහෝ කෑම කන්නකු වන්න නො වටීයැ යි කියා බෝසතාණන් වහන්සේ විසින් ගොදුරු ගෙන සවස තමන් එන්නාහු සමග මුළුතැන්ගෙට පිවිසියේය. අරක්කැමියා අපේ පරෙවියා අතිකකු ගෙන ආයේය. කපුටාට ද පැසක් තැබීය. එතැන් පටන් දෙදෙනා ම වාසය කරත්.

ඉක්බිති, එක් දිනක සිටාණන්ට බොහෝ මස් හා මාළු ගෙනාවාහුය. අරක්කැමියා ඒවා ගෙන ඒ ඒ තැන එල්ලීය. කපුටා ඒ දැක ලෝභ උපදවා හෙට ගොදුරු බිමට නො ගොස් මා විසින්

මෙය කෑ යුතුයැ යි රාත්‍රියෙහි තතනමින් වැද හොත්තේය. දෙවැනි දින බෝසත් තෙමේ ගොදුරු සඳහා යන්නේ, යහළු කපුට, එව යි කීවේය. ස්වාමීනි, තෙපි යවු. මට බඩේ අමාරුවක් ඇත. යහළුව, කපුටන්ට බඩේ රුජා කිසි දිනක නො වූ විරූය. රාත්‍රියෙහි යාම තුන අතර එක එක යාමෙහි මුසපත්වන්නේ වෙයි. පහන් වැටියක් ගිල්ල කාලයෙහි වනාහි මොවුන්ට මොහොතක් තෘප්තිය වෙයි. තෝ මෙසේ මාළු කනු කැමැත්තේ වන්නෙහිය. එව. මිනිසුන් පරිභෝග කරන දේ තොපට භාවිතය අපහසුය. මෙබඳු දෙයක් නො කැරව. මා සමග ම ගොදුරු සඳහා යව. ස්වාමීනි, නො හැකි වෙමි. එ සේ නම් සිය ක්‍රියාවෙන් ප්‍රකට වන්නෙහිය. ලෝභ වසඟයට නො ගොස් අප්‍රමාදී වෙහි යි. ඔහුට අවවාදකොට බෝසත් තෙමේ ගොදුරු සඳහා ගියේය. අරක්කැමියා නන් වැදෑරුම් මස් මාංශ විකෘතීන් පිළියෙලකොට උණුසුම පහවීමට බඳුන් විවරකොට රස පෙරන බඳුන් මත තබා පිටට ගොස් දහඩිය පිසිමින් සිටියේය.

එකෙණෙහි කපුටා පැසෙන් හිස ඔසවා බත් ගෙය බලන්නේ ඔහු නික්මුණු බව දැන දැන් මගේ මනදොළ පුරා මස් කන්න කාලයයි. කිමෙක් ද ? මහමස් කම් ද නැතිනම් ඇඹරූ මස්දැ යි සිතා ඇඹරූ මස්වලින් නම් වහා ම කුස පුරවන්න නො හැකිය. මහමස් කැල්ලක් ගෙන පැසෙහි තබාගෙන කමින් පැසින් පැන රස පෙරහණෙහි සැඟවිණි. ඒ පෙරහණ 'කිරි' යන ශබ්දයක් කළේය. අරක්කැමියා ඒ ශබ්දය අසා මේ ශබ්දය කුමක්දැ යි පිවිසියේ කපුටා දැක මේ දුෂ්ට කපුට මා විසින් සිටාණන්ට පිසූ මස් කනු කැමැත්තේය. මම වනාහි සිටුවරයා නිසා ජීවත් වෙමි. මේ බාලයා නිසා නො වේ. මුගෙන් මට කවර ප්‍රයෝජනයක්දැ යි දොර වසා කපුටා අල්ලා ගෙන මුළු සිරුරෙහි පියාපත් සලා අමු ඉඟුරු, ලුණු හා දුරු එක්කොට කොටා ඇඹුල් මෝරුවෙන් කලතා එයින් මොහුගේ මුළු සිරුර උලා ඒ කාක්කා පැසක දැම්මේය. ඒ කපුටා අධික වේදනාවෙන් වැඩුණේ තතනමින් වැදහොත්තේය. බෝසත් තෙම සවස පැමිණ ව්‍යසනයට පත් කපුටා දැක කෑදර කපුට, මගේ කීම නො අසා තගේ ආශාව නිසා මහා දුකකට පැමිණියේ වෙහියැ යි කියා මේ ගාථාව කීවේය.

"යො අත්ථකාමස්ස හිතානුකම්පිනො
ඔවජ්ජමානො න කරොති සාසනං
කපොතකස්ස වචනං අකත්වා
අමිත්තහත්ථත්ථගතොව සෙතීති"

"වැඩ කැමති ව හිතවත් ව අනුකම්පා කරන්නහුගේ වචනය, අවවාද කරනු ලබන්නේ නමුදු යමෙක් නො කරයි ද පරෙවියාගේ වචනය නො කොට සතුරන් අතට පැමිණ ශෝක කරයි."

එහි "කපොතකස්ස වචනං අකත්වාති" පරෙවියාගේ හිතවත් අවවාදය නො කොට, "අමිත්තහත්ථත්ථගතොව සෙතීති" අමිත්‍ර වූ අනර්ථයක් කරන්නා වූ දුක් උපදවන්නා වූ පුද්ගලයන් සතුරන් අතට පැමිණි මේ කපුටා මෙන් මහත් ව්‍යසනයට පැමිණ ශෝක කරමින් නිදයි.

බෝසත් තෙම මේ ගාථාව කියා දැන් මා මෙතැන වසන්න නො හැකියැ යි අන්තැනක ගියේය. කපුටා එහි ම මරණයට පත්විය. ඉක්බිති, අරක්කැමියා පැසත් සමග ගෙන කසල දමන ස්ථානයේ දැම්මේය.

බුදුරජාණන් වහන්සේ ද මහණ, නුඹ මෙකල පමණක් ලෝලයකු වූයේ නොව පෙරත් ලෝලවිය. නුඹේ ඒ ලොල්බව නිසා නුවණ ඇති අය ද සිය වාස ස්ථානයෙන් පිරිහුණේයැ යි මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා සිව්සස් ප්‍රකාශ කළ සේක. සිව්සස් දේශනාව කෙළවර ඒ භික්ෂු තෙම අනාගාමී ඵලයට පැමිණියේය. බුදුරජාණන් වහන්සේ අනුසන්ධි ගළපා ජාතකය නිමාකළ සේක. එකල්හි කපුටා ලොල් භික්ෂුව විය. පරෙවියා වනාහි මම ම වෙමි යි වදාළ සේක.

1. 5. 3.

## වේළුක ජාතකය

**"යො අත්ථකාමස්සාති"** යන මේ ජාතක කථාව බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙරෙහි වැඩ වාසය කරන සේක්, එක්තරා දුර්වච (නො කීකරු) භික්ෂුවක් අරබයා දේශනා කළ සේක. භාග්‍යවතුන් වහන්සේ ඔහුගෙන් මහණ, නුඹ දුර්වචයකු යනු ඇත්තද යි විචාරා ස්වාමීනි, සත්‍යයයැ යි කී කල්හි මහණ, නුඹ දැන් පමණක් නොව පෙරත් දුර්වචයකුය. දුර්වච බැවින් ම නුවණ ඇත්තන්ගේ කීම නො පිළිගෙන සර්ප මුඛයෙහි ජීවිත විනාශයට පැමිණියේයැ යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූ සේක.

යටගිය දවස බරණැස් නුවර බඹදත් රජු කරද්දී බෝසත් තෙම කසී රට මහා භෝග සම්පත් ඇති කුලයක උපන්නේ, බුද්ධිමත්බවට පැමිණ කාමයන්හි ආදීනව ද නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස් ද දැක පස් කම් සැප අත්හැර හිමාලයට පිවිස තවුස් පැවිද්දෙන් පැවිදි ව කසිණ පිරියම්කොට අභිඥා පස ද අටසමවත් ද උපදවා ධ්‍යාන සැපයෙන් කල්ගත කරන්නේ, මෑත කාලයක මහා පිරිවර ඇත්තේය. පන්සියයක් තාපසයන් විසින් පිරිවරන ලද්දේ, සමූහයාගේ ශාස්තෘ වී වාසය කළේය.

ඉක්බිති, එක් නයි පැටියෙක් තමාට පුරුදු පරිදි හැසිරෙන්නේ, එක්තරා තාපසයකුගේ ආශ්‍රමයට පැමිණියේය. තාපසයා ඌ කෙරෙහි දරු සෙනහස උපදවා ඌ එක් උණ පුරුකක තිදි කැරවා පෝෂණය කැරේ. ඌ උණ පුරුකේ නිදන බැවින් වේළුකයැ යි නමක් තැබවේය. ඌ දරු පෙමින් පිළිදැගුම් කරන නිසා තාපසයාට වේළුක පියායැ යි නම් කළේය. එකල්හි බෝසත් තෙමේ එක් තාපසයෙක් සර්පයකු පිළිදැගුම් කැරේයැ යි අසා කැඳවා නුඹ සර්පයකු පෝෂණය කරන්නේ ඇත්තක්ද යි විචාරා, ඇත්තයැ යි කී කල්හි සර්පයකු සමග විශ්වාසයක් නම් නැත. මෙසේ පිළිදැගුම් නො කැරව යි කීවේය. තාපසයා කීවේය. ඇදුරුතුමනි, හෙතෙම මගේ පුත්‍රය. ඔහුගෙන් තොරව පවතින්න නො හැක්කෙමි. එ සේ නම් ඌගේ සමීපයෙන් ම ජීවිත විනාශයට පැමිණෙන්නෙහිය. තාපස තෙමේ බෝසතුන්ගේ

වචනය නො ඇසීය. සර්පයා ද අත්හරින්නට නො හැකි විය.

ඉක්බිති, කීප දිනක් ඇවෑමෙන් සියලු තාපසයෝ ඵලවැල සඳහා ගිය තැන ඵලාඵලයන්ගේ සුලබ බව දැක දෙතුන් දිනක් ම එහි වාසය කළාහුය. වේළුක පියා ද ඔවුන් සමග යන්නේ සර්පයා උණ පුරුකෙහි ම නිදි කැරවා වසා ගියේය. හෙතෙම නැවත තාපසයන් සමග දෙතුන් දිනකින් අවුත් වේළුකට ගොදුරු දෙමි යි උණ පුරුක විවෘතකොට දරුව එව, බඩගිනි ඇත්තෙහිදැ යි අත දිගු කෙළේය. සර්පයා දින දෙක තුනක් නිරාහාරව සිටි බැවින් කිපී දික් කළ අත දෂ්ටකොට තාපසයා එහි ම ජීවිතක්‍ෂයට පමුණුවා කැලයට පිවිසියේය. තාපසයෝ ඔහු දැක බෝධිසත්ත්වයන් වහන්සේට සැලකළාහුය. බෝසත් තෙම, ඔහුගේ අවසන් කටයුතු කැරවා තාපස සමූහයා මැද වැඩ හිඳ තවුසන්ට අවවාද වශයෙන් මේ ගාථාව කීවේය.

**"යො අත්ථකාමස්ස හිතානුකම්පිනො**
**ඔවජ්ජමානො න කරොති සාසනං**
**එවං සො නිහතො සෙති**
**වෙළුකස්ස යථා පිතාති"**

"වැඩ කැමැත්තා හිතවත් ව අනුකම්පා කරන්නාහු වචනය - අවවාදය දෙනු ලබන්නේ වුව ද යමෙක් නො කැරේ ද හෙතෙම වේළුක නම් සර්පයාගේ පියා යම් සේ ද එපරිද්දෙන් මරණයට පත්වූයේ, ශෝක කරයි."

එහි, **"එවං සො නිහතො සෙතීති"** යමෙක් වනාහි තවුසන්ගේ අවවාද නො ගනී ද හෙතෙම යම් සේ මේ තාපසයා සර්ප කටෙහි නැසුණේ වෙයි යන අර්ථයයි. මෙසේ බෝසතාණන් වහන්සේ තාපස සමූහයාට අවවාද දී සිව් බඹ විහරණ වඩා ආයු කෙළවර බඹලොව උපන්නේය.

බුදු රජාණන් වහන්සේ, භික්‍ෂුව, ඔබ දුර්වච වූයේ දැන් පමණක් නොව පෙරත් දුර්වච වූයේය. අකීකරුකමින් ම සර්ප කටෙහි පූතිභාවයට පැමිණියේයැ යි මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා

පූර්වාපර සන්ධි ගළපා ජාතක කථාව නිමවා වදාළ සේක.

එකල රෙළුක පියා දූර්වච භික්ෂුව විය. සෙසු පිරිස බුදු පිරිසයි. පිරිස් නායක මම ම වෙමි යි වදාළ සේක.

## 1. 5. 4.

## මකස ජාතකය

"සෙයාසා අමිතෙතා" යන මේ දේශනාව බුදු රජාණන් වහන්සේ මගධ රජ චාරිකාවෙහි හැසිරෙන්නේ, එක්තරා කුඩා ගමක මෝඩ ගැමි මිනිසුන් අරබයා දේශනා කළ සේක.

බුදු රජාණන් වහන්සේ එක් කාලයක සැවත් නුවරින් මගධ රටට වැඩමවා එහි චාරිකාවෙහි හැසිරෙන්නේ, එක්තරා කුඩා ගමකට පැමිණි සේක. ඒ කුඩා ගම බොහෝ සෙයින් මෝඩ මිනිසුන්ගෙන් ම පිරුණේය. එහි එක් දිනක් ඒ අන්ධ බාල මිනිසුන් එක්රැස්ව පින්වත්නි, අප කැලයට පිවිස කර්මාන්ත කරන විට මදුරුවෝ කති. එයින් අපේ කර්මාන්තය නවතියි. සියල්ලෝ ම දුනු ද ආයුධ ද ගෙන ගොස් මදුරුවන් සමග යුද්ධකොට සියලු මදුරුවන් විද සිඳ මරමු යි කතිකාකොට ගෙන කැලයට ගොස් මදුරුවන් විදින්නෙමු යි ඔවුනොවුන් විද පහර දී දුකට පැමිණියෝ අවුත් ඇතුල් ගම ද ගම මැද ද ගම් දොර ද වැද හොත්තේය.

බුදුරජාණන් වහන්සේ සංඝයා විසින් පිරිවරන ලද්දේ, එගමට පිඬු පිණිස වැඩම කළ සේක. සෙසු නුවණ ඇති මිනිස්සු බුදුරජාණන් වහන්සේ දැක ගම් දොර මණ්ඩපයක්කොට බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට මහදන් දී බුදුරජුන් වැඳ හුන්නාහුය. බුදුරජාණන් වහන්සේ ඒ ඒ තැන වැටුණු මිනිසුන් දැක ඒ උවැසියන් විචාළ සේක. මේ බොහෝ දෙනා ගිලන් මිනිසුන්ද යි විචාළ සේක. මොවුන් විසින් කුමක් කරන ලද්දේ

ද ? ස්වාමීනි, ඒ මිනිස්සු මදුරු යුද්ධයක් කරන්නට ගොස් ඔවුනොවුන්ට විද තමා ම ගිලන් වූහ. බුදුරජාණන් වහන්සේ, දැන් පමණක් අන්ධ බාල මිනිස්සු මදුරුවන්ට පහර දෙමැ යි තම තමන්ට පහර දෙති. පෙරත් මදුරුවන්ට පහර දෙන්නෙමු යි අනුන්ට පහර දෙන මිනිස්සු වූවෝමැ යි වදාරා ඒ මිනිසුන් විසින් ඉල්ලන ලද්දේ අතීත කථාව ගෙන හැර දක්වූ සේක.

යටගිය දවස බරණැස් නුවර බඹදත් රජු රජ කරද්දී බෝසත් තෙමේ වෙළඳාමෙන් ජීවිකාව කරයි. එකල්හි කසී රට එක් පසල් ගමක බොහෝ වඩුවෝ වාසය කරති. එහි එක් හිස් කෙස් සුදු වූ එක් වඩුවෙක් ගසක් අහියි. ඉක්බිති, එක් මදුරුවකු තඹ ලෝ තලියක පිටක් සේ වූ හිසෙහි හිඳ අඩයටියෙන් පහර දෙන්නා සේ හිස මුව තුඩින් විද්දේය. හෙතෙම තමන් සමීපයෙහි හුන් පුතාට කීවේය. දරුව, මගේ හිස මදුරුවෙක් අඩයටියෙන් පහර දෙන්නාක් මෙන් විදියි. ඌ වළක්වනු. පියාණෙනි, ඉවසනු මැනවි. එක පහරින් ම ඌ මරන්නෙමි යි තියුණු ලොකු පොරව ගෙන පියාගේ පිටුපස සිට මදුරුවාට පහර දෙන්නෙමි යි පියාගේ හිස දෙකට පැලුවේය. වඩුවා එහි ම මරණයට පැමිණියේය. එකල බෝසතාණන් වහන්සේ ද තමන්ගේ භාණ්ඩ සොයමින් ඒ ගමට පැමිණ ඒ වඩුවාගේ ශාලාවෙහි හුන්නේ, ඔහුගේ ඒ ක්‍රියාව දැක සතුරා වුව ද නුවණ ඇත්තා ම ශ්‍රේෂ්ඨයැ යි ද ඔහු වනාහි දඬුවමට බියෙන් හෝ මිනිසුන් නො මරන්නේයැ යි ද කිතා මේ ගාථාව කිවේය.

"සෙය්‍යො අමිත්තො මතියා උපෙතො
තත්‍වෙව මිත්තො මතිවිප්පහීනො
මකසං වධිස්සන්ති හි එළමූගො
පුත්තො පිතු අබ්භිදා උත්තමඞ්ගන්ති"

"නුවණ ඇති සතුරා වුව ද උතුම් වේ. නුවණ නැති නම් මිතුරා වුව ද උතුම් නො වේමැ යි (කුමක් හෙයින් ද යත්) මූඪ (කෙලතොලු) පුත්‍ර තෙමේ මදුරුවා මරමි යි පියාගේ හිස පැළීය."

එහි, "**සෙය්‍යොති**" ශ්‍රේෂ්ඨ, උත්තම, "**මතියා උපෙතොති**" නුවණින් යුක්ත වූ, "**එළමූගොති**" කෙළ තොලු නලවන මුව ඇති බාලයා, "**පුත්තො පිතු අබ්භිදා උත්තමඞ්ගන්ති**" තමුන්ගේ මෝඩකම නිසා පුතකු වුව ද පියාගේ හිස මදුරුවකු මරන්නෙමි යි දෙපලු කළේය. ඒ නිසා මෝඩ නුවණ නැත්තා පස මිතුරු වුව ද ශ්‍රේෂ්ඨයැ යි, මේ ගාථාව වදාරා බෝසතාණන් වහන්සේ නැඟිට ගොස් කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියේය. වඩුවාගේ ඤාතීහු ඔහුගේ භූමදාන කටයුතු කළාහුය.

බුදුරජාණන් වහන්සේ, උපාසකවරුනි, පෙරත් මදුරුවන්ට පහර දෙන්නෙමු යි අන්‍යයන්ට පහර දුන් මිනිස්සු වූවාහු මයැ යි මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා පූර්වාපර සන්ධි ගළපා ජාතක කථාව නිමවා වදාළ සේක. එකල්හි ගාථාවක් කියා ගිය නුවණ ඇති වෙළෙන්දා වනාහි මම ම වෙමි යි වදාළ සේක.

1. 5. 5.

## රෝහිණී ජාතකය

"**සෙය්‍යො අමිත්තොති**" යන මේ දේශනාව බුදු රජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, අනේ පිඬු මහසිටුතුමාගේ එක් දාසියක අරබයා වදාළ සේක. අනේ පිඬු සිටුතුමාට වනාහි රෝහිණී නම් එක් දාසියක් වූවාය. ඈ වී කොටන තැනට අවුත් ඇගේ මහලු මව වැදහොත්තීය. මැස්සෝ ඈ පිරිවරා ඉදිකටුවෙන් විදින්නාක් මෙන් කති. ඕ තුමූ දුවට කීවාය. දරුව, මැස්සෝ මා කති. මොවුන් වළක්වවු. ඕ තුමූ මැණියනි, වළක්වමි යි මෝල් ගසක් ඔසවා මැණියන්ගේ සිරුරෙහි මැස්සන් මරා විනාශයට පමුණු වන්නෙමි යි මවට මොහොලෙන් පහර දී ජීවිතක්ෂයට පැමිණ වූවාය. එය දැක මව් තුමූ මැරුණෝයැ යි හඬන්නට පටන් ගත්තාය. මේ පුවත සිටාණන්ට සැලකළහ. සිටු තෙම ඇගේ අවසන් කටයුතු කැරවා විහාරයට ගොස් ඒ සියලු පුවත්

බුදුරජාණන් වහන්සේට සැලකළේය. බුදුරජාණන් වහන්සේ ගෘහපතිය, මෝ තුමූ මෑණියන්ගේ සිරුරෙහි මැස්සන් මරමි යි දූන් පමණක් මොහොලින් පහර දී මව නො මැරුවාය. පෙරත් මැරුවේමැ යි වදාරා ඔහු විසින් ඉල්ලන ලද්දේ ඉකුත් වත ගෙනහැර දක්වූ සේක.

යටගිය දවස බරණැස් නුවර බඹදත් රජු රජ කරද්දී බෝසතාණන් වහන්සේ සිටු කුලයෙහි ඉපදී පියාගේ ඇවෑමෙන් සිටු තනතුරට පැමිණියේය. ඔහුට ද රෝහිණී නම් දාසියක විය. ඈ ද තමන්ගේ වී කොටන තැනට පැමිණ හුන්නා වූ මව, දරුව, මා මැස්සන්ගෙන් වළක්වව යි කියන ලද්දී, මෙපරිද්දෙන් ම මොහොලින් පහර දී මව මරණයට පමුණුවා හඬන්නට පටන් ගත්තාය. බෝසත් තෙම ඒ ප්‍රවෘත්තිය අසා සතුරා වුව ද මේ ලෝකයෙහි නුවණ ඇත්තා ම ශ්‍රේෂ්ඨයැ යි සිතා මේ ගාථාව කීවේය.

"සෙය්‍යො අමිත්තො මෙධාවී යඤ්චෙ බාලානුකම්පකො
පස්ස රොහිණිකං ජම්මිං මාතරං හන්ත්වාන සොචතීති"

"අනුකම්පා කරන යම්බඳු බාලයෙක් ඇද්ද ? (ඔහුට වඩා) නුවණ ඇත්තා වූ පස මිතුරා උතුම් වේ. බාල වූ රෝහිණී නම් නුවණ නැත්තිය බලව, මව මරා ශෝක කරන්නීය."

එහි "මෙධාවීති" නුවණ ඇති, ඥානවන්ත, "යඤ්චෙ බාලානුකම්පකොති" මෙහි "යන්ති" යනු ලිඞ්ග විපර්‍යාසයක් කරන ලද්දේය.

"චෙති" නාමාර්ථයෙහි නිපාතයකි. යම් කිසි මෝඩයෙක් අනුකම්පා ඇත්තේ ද එයිට වඩා සිය දහස් ගුණයෙන් නුවණ ඇති පස මිතුරා ශ්‍රේෂ්ඨයැ යි යන අර්ථයයි. තව ද, "යන්ති" අතිශ්‍රේෂ්ඨ අර්ථයෙහි නිපාතයකි. නැතිනම් මෝඩ අනුකම්පා ඇත්තා යන තේරුමයි. " ජම්මිංති" පහත්, මෝඩ,"මාතරං හන්ත්වාන සොචතීති" මැස්සන් මරන්නෙමි යි මව මරා දූන් මේ මෝඩි තමා ම හඬයි. වැළපෙන්නීය. මේ කරුණින් මේ ලෝකයෙහි පස මිතුරා වුව ද නුවණ ඇති නම් ශ්‍රේෂ්ඨයි. බෝසතාණන් වහන්සේ නුවණ ඇත්තාට

පසසමින් මේ ගාථාවෙන් දහම් දෙසූ සේක.

බුදුරජාණන් වහන්සේ, ගෘහපතිය, මේ තැනැත්ති මැස්සන් මරමි යි මව මැරුවේ දැන් පමණක් නොව පෙරත් ඝාතනය කළේයැ යි මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා පූර්වාපර සන්‍ධි ගළපා ජාතක කථාව නිමවා වදාළ සේක. එකල මව මේ මව ම වූවාය. ඒ දුව ම මේ දුව වූවාය. මහ සිටුතුමා වනාහි මම ම වෙමි යි වදාළ සේක.

1. 5. 6.

## ආරාමදූෂක ජාතකය

"න වෙ අනත්‍ථ කුසලෙනාති" යන මේ ජාතකය කොසල් දනව්වෙහි එක්තරා කුඩා ගමක උයන් දූෂකයකු අරබයා දෙසූහ.

බුදුරජහු කොසල් රට සැරිසරමින් එක්තරා කුඩා ගමකට වැඩියහ. එහි එක් කෙළඹියක් බුදුරජුන්ට ආරාධනාකොට තම උයනෙහි වඩාහිඳුවා බුදුපාමොක් මහසඟනට දන් දී ස්වාමීනි, කැමැති සේ උයනෙහි හැසිරෙන ලෙස කීවේය. භික්‍ෂූහු නැඟිට උයන පාලක සමග උයනෙහි ඔබිනොබ හැසිරෙන්නාහු, මුඩු බිමක් දැක උපාසකය, මේ උයනෙහි අන් තැන් ගස් සෙවනින් යුක්තය. එහෙත් මෙතැන මුඩු බිමකි. ගස් පඳුරු ආදී කිසිවක් නැත. ඊට හේතුව කුමක් ද ? ස්වාමීනි, මේ උයන රෝපණය කරන කාලයෙහ. එක් ගම් දරුවෙක් ජලය ඉසින්නේ, කුඩා පැළ උදුරා මුලට ප්‍රමාණ වන සේ ජලය වත් කළේය. ඒ කුඩා පැළ මැලවී වියලිණි. මේ නිසා මේ ස්ථානය මුඩු බිමක් විය. අනතුරුව භික්‍ෂූහු බුදුරජුන්ට ඒ කරුණු සැලකළහ. මහණෙනි, එගම් දරුවා ආරාම දූෂක වූයේ දැන් පමණක් නො වේ. පෙරත් ආරාම දූෂකයකු වූයේමැ යි, ඉකුත් වත ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරන කල්හි බරණැස්

නුවර නැකැත් කෙළිය ප්‍රචාරය කළහ. නැකැත් බෙර හඬ ඇසුණු තැන් පටන් සියලු නුවර වැසියෝ නැකැත් කෙළියෙහි නියැළි හැසිරෙත්. එදා රජුගේ උයනෙහි බොහෝ වඳුරෝ වසති. උයන් පාලකයා මෙසේ සිතීය. නුවර නැකැත් ප්‍රචාරය කරන ලදී. වඳුරන්ට දිය ඉසුව යි කියා මම නැකැත් කෙළිමි යි, දෙටු වඳුරා වෙත ගොස් යහළු දෙටු වඳුරාණෙනි, මේ උයන ඔබලාට ද මහත් උපකාරය. ඔබලා මෙහි මල්, එල, දලු කන්නාහුය. අද නුවර නැකැත් කෙළි ප්‍රචාරය කරන ලදී. මම නැකැත් කෙළි කෙළිමි. මා එනතුරු මේ උයනෙහි ගස්, පැළවලට ජලය දැමීමට හැකිදැ යි විචාළේය. එ සේය, අපි දිය ඉසින්නෙමු. එ සේ නම් අප්‍රමාදී ව කරව යි කියා දිය ඉසීම පිණිස හම් මල්ල ද දිය නඟන දඬු කැබලි ද දී ගියේය. වඳුරෝ හම් මල්ල ද ලී කැබලි ද ගෙන පැළ ගස්වලට වතුර දමුත්. එවිට වඳුරු දෙටුවා ඔවුන් අමතා වඳුරනි, ජලය රැකගත යුතුය. තොපි ගස්, පැළවලට වතුර දමන කල්හි එක එක පැළය උගුලා මුල බලා මුල් ගැඹුරට ගිය තැනට වතුර වැඩියෙන් එක්කළ යුතුය. වැඩි කළ යුතුය. නො ගැඹුරු තැන්වලට වතුර ටිකක් දමනු. එ සේ නො කළ පසුව අපට වතුර හිඟ වන්නේය. වඳුරෝ ද මැනවැ යි පිළිගෙන එ සේ කළහ. එවෙලාවෙහි එක් නුවණැති මිනිසෙක් වඳුරන් එ සේ කරනු දැක යහළු වඳුරනි, තොපි මෙසේ පැළෑටි උදුර උදුරා මුල පමණට දිය ඉසින්නේ මක් නිසා ද ? අප දෙටු වඳුරා උපදෙස් දෙන්නේ ඒ අයුරිනි යි කීහ. ඔවුන්ගේ වචනය අසා අගේමැ යි බාලයෝ, නුවණ නැත්තේ යහපතක් කරමු යි අවැඩක් ම කරතැ යි සිතා මේ ගාථාව කීය.

"න වෙ අනත්ථ කුසලෙන අත්ථචරියා සුඛාවහා
හාපෙති අත්ථං දුම්මෙධො කපි ආරාමිකො යථාති"

"අයහපතෙහි දක්‍ෂයා විසින් කරන ලද යහපත ද හිත
සුව පිණිස නො වේ. නුවණ නැති බාලයා යහපත
පිරිහෙළයි. කෙසේ ද යත්, උයනෙහි වඳුරා මෙනි."

එහි "වෙ" යනු නිපාත මාත්‍රයකි. "අනත්ථ කුසලෙන" අනර්ථයෙහි නුසුදුසු දේ පිළිබඳ දක්‍ෂයා, සුදුසු දේ පිළිබඳ - යහපතෙහි අදක්‍ෂයා යනු අර්ථයි. "අත්ථචරියා" දියුණුවට අදාළ ක්‍රියා,

**"සුඛාවහා"** මෙබඳු අයහපතෙහි දක්‍ෂයා විසින් කායික, මානසික සැප සංඛ්‍යාත වූ සැපය ගෙන දීමට නො හැකි යන අර්ථයි. මක් නිසා ද යත්, **"හාපෙති අත්‍ථං දුම්මෙධො"** ඒකාන්තයෙන් අනුවණ පුඟුලා යහපතක් කරමි යි සිතා යහපත යටපත්කොට අයහපත ම කරයි. **"කපි ආරාමිකො යථා"** යම් සේ උයනෙහි නියුතු උයන රකින වඳුරා යහපතක් කැර අනර්ථයක් ම කරයි ද එ සේ යමකු අනර්ථයෙහි දක්ෂයකු වේ ද ඔහු විසින් යහපත් දෙයක් ගෙන දීමට නො හැකිය. ඔහු ඒකාන්තයෙන් යහපත පිරිහෙළයි.

මෙසේ ඒ නුවණැති මිනිසා මේ ගාථාවෙන් වඳුරු දෙටුවාට නින්දාකොට තම පිරිස ගෙන උයනින් නික්ම ගියේය. බුදුරජහු, මහණෙනි, මේ ගම් දරුවා උයන් පාලනය කළේ දැන් පමණක් නො වේ. පෙරත් උයන් පාළුවකු බව කියා මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා බුදුරජහු ජාතකය නිමා කළහ. එකල දෙටු වඳුරා දැන් ගම් දරුවාය. නුවණැති පුරුෂයා මම ම වීමි.

## 1. 5. 7.

## වාරුණි ජාතකය

"**න වෙ අනත්‍ථ කුසලෙනාති**" යන මේ ජාතකය බුදු රජුන් දෙව්රම් වෙහෙර වසන සේක්, සුරා දූතයකු අරබයා දෙසූහ. අනේපිඬු සිටුහුගේ යහළු සුරා වෙළෙන්දෙක් තියුණු මත සුරාවක් සාදා රන් රිදී ගෙන විකුණන්නේ මහජනයා රැස්වූ කල්හි අතවැසියා බණවා දරුව, මුදල් ගෙන සුරා දෙව යි තෙමේ නෑමට ගියේය. අතවැසියා මහජනයාට සුරා දෙන්නේ, මිනිසුන් අතරින්පතර ලුණු, සකුරු ගෙන්වා ගෙන කනු දැක සුරාවට ලුණු නැති සේයැ යි සිතා මෙහි ලුණු දමමි යි සුරා සැළෙහි නැලියක් පමණ ලුණු දමා ඔවුන්ට සුරා දුන්නේය. මිනිස්සු මුව පුරා ගෙන ඉවත දමා ඔබ කළේ කුමක්ද යි ඇසූහ. ඔබ සුරා බී ලුණු ගෙන්වා ගෙන ඇත. ලුණු යෙදීමි. මෝඩය, මෙතරම් මිහිරි පානය තෝ විනාශ කළේයැ යි නැඟිට ගියහ. සුරා

වෙළෙන්ඳා අවුත් එක සුරා බොන්නකු ද නො දැක සුරා බොන්නන් කොහි ගියාදැ යි විමසීය. අතවැසියා සියලු පුවත් කීය. සුරා වෙළෙන්ඳා මෝඩය, මෙබඳු දෙයින් තා විසින් විනාශ කරන ලද්දේදැ යි අතවැසියාට නින්දාකොට මෙපුවත අනේ පිඬු සිටාණන්ට සැල කළේය. සිටුතුමා මෙය බුදුරජුන්ට සැලකළ යුතු කථා පඬුරක්යැ යි දෙව්රම් වෙහෙරට ගොස් බුදුරජුන් වැඳ සැලකළේය. බුදුරජහු ගැහැවිය, මොහු සුරා දූෂකයකු වූයේ දැන් පමණක් නො වේ. පෙරදීත් මොහු සුරා දූෂකයකු වූයේමැ යි වදාරා ඔහු විසින් යාචිත වූයේ ඉකුත් කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කරන සමයෙහි බෝසත්හු බරණැස සිටුවරයා විය. ඔහු ඇසුරුකොට එක් සුරා වෙළන්දෙක්, මෙසේ තියුණු සුරාවක් සාදා මෙය විකුණුව යි අතවැසියාට කියා නෑමට ගියේය. අතවැසියා ඔහු ගිය කෙණෙහි ම සුරාවෙහි ලුණු දමා මේ ක්‍රමයෙන් සුරාව නැසීය. ඉක්බිති, ඔහුගේ ගුරුවරයා පැමිණ ඒ කරුණ දැන සිටුවරයාට දැන්වීය. මෝඩයෝ නම් අනර්ථ කිරීමෙන් දක්නෝය. යහපතක් කරන්නෙමි යි අයහපතක් ම කරතැ යි කියා මේ ගාථාව කීය.

"න වෙ අනත්ථ කුසලෙන අත්ථචරියා සුඛාවහා
හාපෙති අත්ථං දුම්මෙධො කොණ්ඩඤ්ඤො වාරුණිං යථාති"

එහි "කොණ්ඩඤ්ඤො වාරුණිං යථා" යනු යම් සේ කොණ්ඩඤ්ඤ නම් අතවැසියා යහපතක් කරමි යි ලුණු දැමීමෙන් සුරාව නැති කළේ ද මෙසේ සියලු අනර්ථයෙහි දක්ෂයා යහපත පිරිහෙළයි. විනාශ කරයි. බෝසත්හු මේ ගාථාවෙන් දම් දෙසූහ.

බුදු රජහු ගැහැවිය, මොහු සුරා දූෂකයකු වූයේ දැන් පමණක් නො වේ. පෙරත් සුරා දූෂකයකු වූයේ යි වදාරා අනුසන්ධි ගළපා ජාතකය නිමවූහ. එදා සුරා දූෂක දැනුත් සුරා දූෂක විය. බරණැස් සිටු මම ම වීමි.

1. 5. 8.

## වේදබ්භ ජාතකය

"අනුපායෙන යො අත්ථං්ති" යන මේ ජාතක දේශනාව බුදුරජුන් දෙව්රම් වෙහෙර වැඩ වසන්නාහු, අකීකරු භික්ෂුවක් අරබයා දෙසූහ. බුදුරජහු ඒ භික්ෂුව අමතා මහණ, ඔබ අකීකරු වූයේ දැන් පමණක් නො වේ. පෙරත් එ සේ ම වූවෙහිය. මේ කරුණින් ම නැණවතුන්ගේ වදන් නො පිළිගෙන තියුණු කඩුවෙන් දෙපළුකොට කැපී මඟ වැටුණෙහි. ඒ එක පුද්ගලයා නිසා පුරුෂයන් දහසක් මරණයට පත්වූහැ යි වදාරා ඉකුත් වත ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කැරවන කල්හි එක් කුඩා ගමක එක්තරා බමුණෙක් වෙදබ්භ නම් මන්ත්‍රයක් දනී. ඒ මන්ත්‍රය අගනේය. මහාර්ඝය. නැකැත් යෝගයක් අනුව ඒ මන්ත්‍රය ජපකොට අහස බැලූ කල්හි අහසින් සත් රුවන් වැසි වසී. එදවස බෝසත්හු එම බමුණා ළඟ සිප්සතර හදාරති. එක් දවසක් බමුණා බෝසතුන් රැගෙන කිසියම් කාර්යයක් සඳහා තම ගමින් නික්ම චේතිය රටට ගියේය. අතර මඟ වනබද පෙදෙසක පන්සියයක් පමණ පණිවිඩ යවා වස්තු ගෙන්වන සොරු (පෙසනක චොරා) මං පැහැරීම කරත්. ඔවුහු බෝසතුන් ද වේදබ්භ බමුණා ද අල්ලා ගත්හ. ඔවුන් යවා බඩු ගෙන්වන සොරුන් (පෙසනක චොරා) යැයි කියනු ලබන්නේ කෙසේ ද ? ඒ සොරු වනාහි දෙදෙනකු අල්ලාගෙන එකකු ධනය ගෙන ඒම පිණිස යවත්, එම නිසා මෙනමින් හඳුන්වනු ලබන පිය පුතුන් දෙදෙන ගත්විට පුතා තබාගෙන අපට ධනය ගෙනවුත් දී පුතා රැගෙන යව යි පියා යවත්. මේ අනුව මව හා දියණිය ගත්විට දියණිය රඳවාගෙන මව යවත්. දෙටු කනිටු සොහොයුරන් ගත්විට කනිටු සොහොයුරා තබා දෙටු සොහොයුරා යවත්. ගුරු අතවැසියන් ගත් විට අතවැසියා යවන්නෝය. එදින ද වෙදබ්භ බමුණා රඳවාගෙන බෝසතුන් යැවූහ.

බෝසත්හු ගුරුන් වැඳ ගුරුතුමනි, මම දිනකින් හෝ දෙකකින් ආපසු එමි. ඔබතුමා බය නො වන්න. එ සේ වුව ද මගේ වචනය

පිළිපදිනු මැනවි. අද දින ධන වස්සන නැකැත් යෝගය උදා වන්නේය. ඔබතුමා දුක ඉවසනු නො හැකිව මන්ත්‍රය ජපකොට ධනය නො වස්සනු මැනවි. ඉදින් එ සේ වස්සවන්නේ නම් ඔබතුමා ද විනාශ වන්නේය. මේ පන්සියයක් සොරු ද විනාශ වන්නාහ. මෙසේ ගුරුතුමන්ට අවවාද දී ධනය සෙවීම පිණිස ගියහ. සොරු ද ඉර බැස ගිය කල්හි බමුණා බැඳ දැමූහ. එකෙණෙහි ම පෙර දිගින් පිරිපුන් සඳ මඩල උදාවිය. බමුණා නැකැත් බලන්නේ ධන වස්සන නැකැත් යෝගය උදා වූ බව දැක මම දුක් විඳීමෙහි ඵලය කිම. මන්ත්‍රය ජපකොට ධනය වස්සවා සොරුන්ට දී සුව සේ යන්නෙමි යි සිතා පින්වත් සොරුනි, මා රඳවා ගත්තේ මක් නිසා ද ? පින්වත, ධනය සඳහාය. ඔබට ධනය අවශ්‍යම නම් මා බැම්මෙන් මුදා නාවා අළුත් වස්ත්‍ර අන්දවා, සුවඳ ගල්වා, මල් පළඳවා තබන්න. සොරු ඔහුගේ කථාව අසා එසේ කළාහුය.

බමුණා නැකැත් යෝගය දැන මන්ත්‍ර ජපකොට අහස දෙස බැලීය. එකණෙහි ම අහසින් රුවන් වරුසා වට සොරු ඒ ධනය උතුරු සලුවෙන් පොදි බැඳගෙන පැන ගියහ. බමුණා ද ඔවුන් පසුපස ම ගියේය. ඉක්බිති ව වෙනත් පන්සියයක් සොරු ඔවුන් අල්ලාගත්හ. අප අල්ලා ගත්තේ කුමකටදැ යි අසන ලද්දාහු ධනය සඳහායැ යි කීහ. ඉදින් තොපට ධනය අවශ්‍යය නම් මේ බමුණා අල්ලා ගනිවු. මොහු අහස බලා ධනය වැස්සවීය. අපට මේ ධනය ලබාදුන්නේ ද ඔහුය. සොරුන් අතහැර අපට ද ධනය දෙව යි බමුණා අල්ලා ගත්හ. එවිට බමුණා මම තොපට ධනය ලබා දෙන්නෙමි. ධනය වස්සන නැකැත් යෝගය මෙයින් වසරකින් පසු එළැඹෙන්නේය. ඉදින්, තොපි ධනය කැමැත්තාහු නම් ඉවසා සිටිනු. එදාට ධනය වස්සවමි යි කීය. සොරු කිපී එම්බල පවිටු බමුණ, දැන් අනික් සොරුන්ට ධනය වස්සවා දී අපට වසරක් සිටින්නට සැලැස්වීය. තියුණු කඩුවෙන් කපා දෙපලුකොට මඟ දමා වේගයෙන් ලුහුබැඳ ඒ සොරුන් සමග යුද්ධකොට ඒ සියල්ලන් මරා ධනය පැහැරගෙන නැවත ඔවුන් දෙකොටසක් වී ඔවුනොවුන් යුද්ධකොට දෙසිය පණසක් පුරුෂයන් මරා මේ ක්‍රමයෙන් දෙදෙනකු පමණක් ඉතිරි වන තුරු මරා ගත්හ.

මෙසේ වන විට පුරුෂයන් දහසක් මරණයට පත්වූහ. ඉතිරි වූ දෙදෙනා උපායෙන් ධනය ගෙනවුත් එක් ගමක් සමීපයෙහි වන

ලැහැබක ධනය සඟවා එකෙක් කඩුවක් ගෙන ධනය රකිමින් සිටියේය. අනිකා සහල් ගෙන බත් පිසවීම සඳහා ගමට ගියේය. මේ ලෝභය වනාහි විනාශයට මුල වේයැ යි ධනය රකිමින් සිටි පුරුෂයා සිතුවේය. අනිකා ආ කල මේ ධනය දෙකොටසට බෙදී යන්නේය. එම නිසා ඔහු ආ කෙණෙහි ම මේ කඩුවෙන් දෙපළු කරන්නෙමි යි. කඩුව දරා ඔහු එනතෙක් මඟ බලා හුන්නේය. අනිකා ද මෙසේ සිතීය. මේ දෙකොටසක් වන්නේය. බතට විෂ යොදා ඔහු මරා තමා ම ධනය අයත් කැර ගැනීම මැනවැ යි බතට විෂ දමා මිනිසාට කවා ඔහු මරා තනිව ම ධනය ගන්නෙමි යි බත් කා අවසන් වූ කල තමා ද කා ඉතිරියෙහි විෂ දමා එය රැගෙන එතැනට ගියේය. ඔහු ආ කෙණෙහි ම අනිකා කඩුවෙන් ඔහු දෙපලුකොට එය එහි ම දමා බත් කා තෙමේ ද එහි ම මරණයට පත්විය.

මෙසේ මේ ධනය නිසා සියල්ලෝ ම මරණයට පත්වූහ. බෝසත්හු ද දිනක් දෙකක් පසුකොට ධනය ද රැගෙන පැමිණියහ. එතැන ගුරුන් නො දක තැන තැන විසුරුණු ධනය දැක ගුරුතුමා මගේ වචනය නො පිළිගෙන ධනය වස්සවන ලද්දේ විය යුතුයි. සියල්ලෝම විනාශ වූවෝ විය යුතුයැ යි සිතා මහමඟින් ගමන් කළහ. එ සේ යන විට දෙකඩ වූ ගුරුන්ගේ මළ සිරුර දක තමාගේ වචනය නො පිළිපැද මළේයැ යි දව දඬු එක්තැන්කොට දර සෑයක් සකසා ගුරුතුමාගේ මළ සිරුර දවා වන මලින් පුදා ඉදිරියට යන්නාහු, මළා වූ පන්සියයක් පුරුෂයන් ද තවත් ඉදිරියට යනවිට දෙසිය පණසක් පුරුෂයන් ද ක්‍රමයෙන් අවසන දෙදෙනෙකුගෙන් අඩු දහසක් මිනිස්සු විනාශයට පත්වූහ. අනිත් සොරු දෙදෙන ඉතිරි විය යුතුය. ඔවුහු කොහි ගියෝද්ද යි සොයන්නාහු, ඒ දෙදෙනා ධනය රැගෙන වන ලැහැබට පිවිසි මඟ දක ඉදිරියට යන්නේ පොදි බඳින ලද ධන රාශිය දක එතැන ම බත් පත මත වැතිරී මිය ගිය මළ සිරුරක් ද දුටහ. බෝසත්හු ඉන් පසු මේ නම් ඒ දෙදෙනා විසින් කරන ලද්දේ විය යුතුයැ යි සියල්ල දන සොයන්නාහු, ඔහු පිළිසන් තැනක අත්හැර දමන ලද්දේ දක අපගේ ගුරුතුමා මගේ වචනය නො පිළිගෙන තමාගේ දුර්බව බව නිසා ඔහු ද විනාශ වූයේය. තවත් පුරුෂයන් දහසකුත් විනාශ කරන ලද්දේය. වැරදි මඟින් නිකරුණේ තමාගේ අභිවෘද්ධිය පතන්නන් අපගේ ගුරුතුමා මෙන් විනාශයට ම පැමිණෙන්නේයැ යි සිතා මේ ගාථාව කීහ.

"අනුපායෙන යො අත්ථං ඉච්ඡති සො විහඤ්ඤති
චෙතා හනිංසු වෙදබ්භං සබ්බෙ තෙ ව්‍යසනමජ්ඣගූති"

"යමෙක් වැරදි මඟින් අභිවෘද්ධිය කැමැති වේ ද හෙතෙම විනාශ වෙයි. චේතිය රට වැසියෝ වෙදබ්භ බමුණා නැසූහ. ඒ සොරු සියල්ලෝම විනාශ වූහ."

එහි "සො විහඤ්ඤති" හෙතෙම වැරදි මඟින් අභිවෘද්ධිය - යහපත කැමැති වෙමි යි නුසුදුසු කල උත්සාහ කරන පුද්ගලයා නැසෙයි. වෙහෙසෙයි. මහත් විනාශයකට පත්වෙයි. "චෙතා" චේතිය රට වාසී සොරු, "හනිංසු වෙදබ්භං" වෙදබ්භ මන්ත්‍රය නිසා එනම් ලැබූ බමුණා නැසූහ. "සබ්බෙ තෙ ව්‍යසනමජ්ඣගූ" ඒ සියල්ලෝ ද ඉතිරි නො වන සේ ඔවුනොවුන් මරා ගනිමින් මහත් විනාශයක් ලැබූහ.

මෙසේ බෝසත්හු යම් සේ අපගේ ගුරුතුමා වැරදි මඟින් නුසුදුසු තැන උත්සාහ කරමින් ධනය වස්සවා තමා ද මරණයට පත් වූයේය. අනුන්ගේ විනාශයට ද හේතුවක් වූයේය. මේ අයුරින් යමෙක් වැරදි මඟින් තමාගේ අභිවෘද්ධිය කැමැති ව උත්සාහ තරයි ද තමා ද විනාශ වෙයි. අනුන්ගේ විනාශයට ද හේතු වෙයි. වනය නින්නාද කරමින් දෙවියන් සාදු නාද කරද්දී මේ ගාථාවෙන් දම් දෙසා ඒ ධනය උපායෙන් තම නිවසට ගෙන්වා දානාදී පිං කම් කරන්නේ ආයු ඇතිතාක් ජීවත් ව දිවි කෙළවර ස්වර්ග මාර්ගය පුරවමින් ගියහ.

බුදු රජහු, මහණ, ඔබ දැන් පමණක් දුර්වච වූයේ නො වේ. පෙරත් දුර්වච මය. දුර්වච භාවය නිසා මහා විනාශයට පැමිණියෙහි යි මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා ජාතකය නිමවූහ. එකල වෙදබ්භ බමුණා අකීකරු භික්ෂුව විය. ඔහු අතවැසියා මම ම වීමි.

1. 5. 9.

## නක්ඛත්ත ජාතකය

**"නක්ඛත්තං පතිමානෙන්තන්ති"** යන මේ ජාතකය බුදුරජුන් දෙව්රම් වෙහෙර වසන සේක්, එක්තරා ආජීවකයකු අරබයා දේශනා කළහ. සැවැත් නුවර එක් කුල පුත්‍රයෙක් තමාගේ පුත්‍රයාට ජනපදයෙහි එක් කුල දුවක කැමැති කැරවා අසුවල් දින ගන්නෙමි යි දින නියමකොට නියම දිනය පැමිණි කල්හි, හේ තම කුලුපග ආජීවකයකුගෙන් විමසා ස්වාමීනි, අද අපි මඟුලක් කරන්නෙමු නැකත සුදුසුදැ යි විමසීය. ඔහු ද මොහු පළමු ව මගෙන් නො විමසා දිනය නියමකොට දැන් විමසයි. හොඳයි. මොහු හික්ම වන්නෙමි යි සිතා අද ඉතා අශුභ දිනයකි. අද විවාහ මංගලය සිදු කළහොත් මහත් විනාශයක් වන්නේයැ යි කීය. ඒ පවුලෙහි මිනිස්සු ඔහුගේ කටයුතු සූදානම්කොට ඔවුන් නො එන බව දැන ඔවුන් විසින් ම දිනය නියම කරන ලදී. එහෙත් නො ආවෝය. අපට ද බොහෝ මුදල් වියදම් විය. ඔවුන්ගෙන් ඇති වැඩය කුමක් ද ? අපේ දුව වෙන අයකු හට දෙමු යි පිළිවෙළ කළ උත්සවයෙන් ම දුව අන් අයකුට දුන්හ. අනෙක් අය දෙවැනි දවසෙහි අවුත් තොපගේ දුව දෙව යි කියා සිටියහ. සැවැත් නුවර වාසීහු දනව් වැසි ඔබ ගැහැවියෝය. පවිටු අදහස් ඇත්තෝය. දවස නියමකොට නො දන්වා නො පැමිණියෝය. ආගමනින් ම ආපසු යවු. අප විසින් දූරිය අනිකකු හට දෙන ලද්දීයැ යි අපහාස කළහ. ඔවුහු ඔවුන් සමග කලහකොට ආ මඟින් ම ආපසු ගියහ.

ආජීවකයා විසින් ඒ මිනිසුන්ගේ මංගල්‍යයට අනතුරක් කළබව භික්ෂූන් අතර පැතිර ගියේය. ඒ භික්ෂූහු දම් සබාවෙහි රැස්වුවාහු, ඇවත්නි, ආජීවකයා විසින් කුලයක මංගල අන්තරාය කරන ලද්දේයැ යි කථා කරමින් හුන්හ. බුදුරජහු වැඩ මහණෙනි, කවර කථාවෙකින් හුන්නාහුදැ යි විමසූහ. ඔවුහු මේ කථාවෙනැ යි කීහ. මේ ආජීවකයා මංගල අන්තරාය කළේ දැන් පමණක් නො වේ. පෙරත් මොහු ඔවුන්ට කිපී මංගල අන්තරාය කළේමැ යි වදාරා ඉකුත් වත දැක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කරන කල්හි නගර වාසීහු දනව් වාසීන්ට දියණියක කැමැති කැරවා ගෙන දිනය

නියමකොට තම කුළුපග ආජීවක පැවිද්දාගෙන්, ස්වාමීනි, අද අපගේ මංගල කාර්යයක් ඇත. නැකැත සුබද යි ඇසූහ. ඔහු මොවුහු තම කැමැත්තෙන් දිනය නියම කැර ගෙන දැන් මගෙන් විමසති යි කිපී මොවුන්ගේ මංගල්‍යයට අන්තරායක් කරන්නෙමි යි සිතා අද නැකත අසුබය. අද දින මංගල්‍යය සිදු කළහොත් මහත් විනාශයකට පැමිණෙන්නාහුයැ යි කීය. ඔවුහු ආජීවකගේ වචනය අදහා නො පැමිණියහ. දනව් වැසියෝ ඔවුන්ගේ නො පැමිණීම දැන ඔවුහු තුමූ ම දින නියමකොට නො පැමිණියෝය. අපට ඔවුන්ගෙන් කම් නැතැ යි වෙනත් අයකු හට දැරිය දුන්හ. නගර වැසියෝ දෙවැනි දින පැමිණ දැරිය ඉල්ලූහ. දනව් වැසියෝ ඔබලා නගර වැසියෝය. ලජ්ජා නැති ගැහැවියෝය. දිනය නියමකොට ඇවිත් නො ගත්තාහුය. ඔබලා නො පැමිණි බැවින් අපි අනිකකු හට දුනිමු. අපි ආජීවකයාගෙන් නැකත අසුබයැ යි අසා නො පැමිණියෙමු. අපට දැරිය දෙවු. අපි ඔබ නො පැමිණි බැවින් අනෙකකු හට දෙන ලද්දේය. දැන් දුන් දැරිය කෙසේ ආපසු ගෙන එන්නෙමුද යි, මෙසේ ඔවුනොවුන් කලහ කරද්දී එක් නගර වැසි නැණවත් පුරුෂයෙක් එක් කරුණක් සඳහා දනව් ජනපදයට ගියේය. නුවර වැසියන්ගේ නැකත අසුබ නිසා නො පැමිණියෙමු යි කියන වචනය අසා නැකතින් කවර වැඩක් වේ දැ, දැරිය ලැබීම ම නැකත නො වේද යි කියා මේ ගාථාව කීය.

**"නක්ඛත්තං පතිමානෙන්තං අත්ථො බාලං උපච්චගා**
**අත්ථො අත්ථස්ස නක්ඛත්තං කිං කරිස්සන්ති තාරකාති"**

"අභිමතාර්ථය සඳහා නැකැත් බලමින් සිටින බාලයා
ඉක්ම යයි අභිමතාර්ථය සඵල වීම ම නැකත වේ.
අහසෙහි තරු කුමක් කරන්න ද ?"

එහි **"පතිමානෙන්තං"** දැන් දැන් නැකැත් එති යි බලාපොරොත්තුවෙන් බලමින් සිටින්නා, **"අත්ථො බාලං උපච්චගා"** ඒ නගර වැසි බාලයා යුවතිය ලැබීම නම් වූ අභිමතාර්ථය ඉක්ම වූයේය. **"අත්ථො අත්ථස්ස නක්ඛත්තං"** යම් අභිවෘද්ධියක් පතමින් සිට එය සඵල වීම ම ඒ අභිවෘද්ධියට නැකත වේ. **"කිං කරිස්සන්ති තාරකාති"** ඉන් බැහැර අහසෙහි තරු කුමක් කරයි ද, කවර නම් යහපතක් කරයි ද, යන අර්ථයි. නගර වැසියෝ කලහකොට දැරිය

නො ලැබ ආපසු ගියහ.

බුදුරජහු මහණෙනි, මේ ආජීවකයා මේ කුලයට මංගල අන්තරායක් කළේ දැන් පමණක් නො වේ. පෙර ද අන්තරායක් කළේමැ යි බුදුරජහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා ජාතකය නිමවූහ. එදා ආජීවකයා දැන් ආජීවකයා ම විය. ඒ කුල දෙක ද දැන් කුල ම විය. ගාථාව කියූ නුවණැති පුරුෂයා මම ම වීමි.

## 1. 5. 10.

## දුම්මේධ ජාතකය

"දුමෙමධානං" යන මේ ජාතකය බුදු රජහු දෙව්රම් වෙහෙර වසන සේක්, ලෝකාර්ථ චර්යාව අරබයා වදාළහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කැර වන කල්හි බෝසත්හු ඒ රජුගේ අග මෙහෙසියගේ කුසෙහි පිළිසිඳ ගත්හ. මව් කුසින් නික්මුණු ඔහුට නම් තබන දවසෙහි බ්‍රහ්මදත්ත කුමාරා යි නම් කළහ. කුමරා සොළොස් වියට පත් ව තක්සලාවෙහි සිප්සතර හදාරා ත්‍රිවේදයෙහි පරතෙරට ගොස් අටළොස් විාාවන්හි කෙළවරට පත්වූහ. ඉක්බිති, ඔහුගේ පියා කුමරුන්ට යුව රජ පදවිය දුන්නේය.

එකල බරණැස් නුවර වැසියෝ දෙවියන් යදින්නෝ වූහ. දෙවියන් වදිත්. බොහෝ එළු, බැටළු, කුකුල්, ඌරු ආදී සතුන් මරා නන් වැදෑරුම් සුවඳ දුම් මල් ආදියෙන් ද මස් ලේවලින් ද බිලි පූජා කරත්. බෝසත්හු මෙසේ සිතූහ. දැන් මිනිස්සු දෙවියන් යදිත්. බොහෝ අන්ත වධ කරත්. මහජනයා බෙහෙවින් දුසිරිතෙහි ගැලී සිටී. මම පියා ඇවෑමෙන් රාජ්‍යය ලැබ එකකුවත් නො වෙහෙසා උපායෙන් ම ප්‍රාණ වධ කිරීමට ඉඩ නො දෙන්නෙමි. ඔහු දිනක්

රියට නැඟී නගරයෙන් නික්මෙන්නේ එක් නුග ගසක් අබියෙස මහජනයා රැස්ව සිටිනු දුටුවේය. එම ගසෙහි උපන් දෙවියාගේ ඉදිරියෙහි තමතමන් කැමැති දූපුතුන්, යසඉසුරු පතා බිලි පූජා කරන්නවුන් විය. කුමරා ද රියෙන් බැස ගස ළඟට ගොස් සුවඳ මලින් පුදා පැන් ඉස ගස පැදකුණුකොට දෙවියන් යදින්නකු වී දෙවියන් නැමැද රථයට නැඟී නගරයට ම ගියහ.

එතැන් පටන් බෝසත්හු මේ ආකාරයෙන් වරින්වර එහි ගොස් දෙවියන් යදිනකු මෙන් පූජා පවත්වති. පසු කලෙක බෝසත්හු පියාගේ ඇවෑමෙන් රජ පදවියෙහි පිහිටා සිව් අගතියෙන් තොරව දශරාජ ධර්ම නො ඉක්මවා දැහැමින් රාජ්‍යය කරවන්නාහු, මෙසේ සිතූහ. මගේ මනදොළ පිරිණි. රාජ්‍යයෙහි පිහිටමින් මම පෙර එක් කරුණක් ගැන සිතීමි. දැන් ඒ අදහස මුදුන් පමුණුවා ගන්නෙමි යි ඇමතියන්, බමුණන්, ගෘහපතියන් එක් රැස් කැරවා ඔවුන් ඇමතූහ. පින්වත්නි, මා රාජ්‍යයට පත් වූයේ කවර කරුණකින් ද යන්න දන්නහු ද ? දේවයිනි, නො දනිමි. මම අසවල් නුග ගස අබියෙස සුවඳ මලින් පුදා ඇඳිළි බැඳ වැඳීමෙන් සිටිනු දුටු විරූ ද ? එ සේය දේවයිනි, ඉදින්, මට රාජ්‍යය ලැබෙන්නේ නම් ඔබට බිලි පූජාවක් කරමි යි පැතීමක් කළෙමි. මා මේ රාජ්‍යය ලැබුවේ දෙවියාගේ බලයෙනි. දැන් ඔහුට බිලි පූජාව කරන්නට තොපි ප්‍රමාද නො වී බිලි පූජාව පිළියෙළ කරව්. දේවයිනි, ඒ සඳහා කවර කවර දේ ගනිමු ද ? පින්වත්නි, මම දේවතාවාට ආයාචනා කරන්නේ, යමකු මගේ රාජ්‍යයයෙහි සතුන් මැරීම ආදී පස් දුසිල් කම් කැරෙමින් දශ අකුසල මගෙහි යන්නේ නම් ඔවුන් මරා ඔවුන්ගේ අතුනුබහන්, ලේ, මස් ආදියෙන් බිලි පූජාවක් කරන්නෙමි යි දෙවියාට භාර වීමි. දැන් ඔබලා මෙසේ බෙර හසුරුවනු. අප රජු යුව රජ කල මෙබඳු භාරයක් විය. මම රජ වන්නෙම් නම් මගේ රාජ්‍යය තුළ දුසිල්හු වෙත් ද ඒ සියල්ලන් මරා බිලි පූජාවක් කරන්නෙමි. අප රජු දැන් පස් පව්, දශ අකුසල් කරන්නවුන් දහසක් මරා ඔවුන්ගේ හෘදය, මාංශාදිය ගෙන්වා බිලිපූජාවක් දේවතාවට කරනු කැමැත්තේය. නගර වැසියෝ මේ කරුණ දැන ගනිත්වා. එබන්දන් දහසක් මරා යාගයක්කොට භාරයෙන් මිදෙන්නෙමි. ඒ බව ප්‍රකාශ කරන්නේ මේ ගාථාව කීය.

"දුමෙමධානං සහසෙසන යඤ්ඤා මෙ උපයාචිතො
ඉදානි ඛො හං යජිස්සාමි බහූ අධම්මිකො ජනොති"

"නුවණ නැති මිනිසුන් දහසකින් යාගයක් කරමි යි
දෙවියන්ට මම භාර වීමි. මම දැන් යාගය කරන්නෙමි.
මක් නිසා ද යත්, බොහෝ ජනයා අධාර්මික බැවිනි."

එහි, "**දුමෙමධානං සහසෙසන**" මේ ක්‍රියා කරන්න වටී, මේ ක්‍රියාව කරන්න නො වටී යි නො දන්නා බැවින් හෝ දශ අකුසල් කර්ම මාර්ගයෙහි ගමන් කරන බැවින් හෝ දූෂිත ඥානය මොවුන්ට ඇත්තේ, "**දුමෙමධ**" නමි. එබඳු නුවණ නැත්තන් ගැණ ගන්නවුන් දහසකින්, "**යඤෙඤා මෙ උපයාචිතො**" මා විසින් දෙවියා වෙත එළැඹ මෙබඳු යාගයක් කරන්නෙමි යි යාගයක් ඉල්ලා සිටින ලදී. "**ඉදානි බො හං යජිස්සාමි**" ඒ මම බාර ගත් රාජ්‍යය ලබා ගත් නිසා දැන් ඒ බිලි පූජාව කරන්නෙමි. මක් නිසා ද යත්, දැන් ජනයා නො දැහැමිය. එම නිසා දැන් මම ඒ නො දැහැමියන් ගෙන බිලි පූජාව කරන්නෙමි. ඇමැතියෝ බෝසතුන්ගේ වචනය අසා දේවයිනි, ඉතා මැනවැ යි දොළොස් යොදුනක් වූ බරණැස් නුවර බෙර හැසිර වූහ. බෙරයෙහි ආඥාව අසා දුසිල් කම් කළ එක ද පුරුෂයකු නො වීය. යම් තාක් කලක් බෝසත්හු රාජ්‍යය කළෝ ද ඒ තාක් කල් එක් පුද්ගලයකුවත් පස් පව් හෝ දශ අකුසල් එකක් හෝ කළ පුද්ගලයකු නො වීය. මෙසේ බෝසත්හු එක පුද්ගලයකු හෝ නො වෙහෙසවා සියලු රට වැසියන් සිල් රක්කවා තුමූ ද දානාදී පිංකොට දිවි කෙළවර තමන්ගේ පිරිස රැගෙන දෙව් නුවර පුරවමින් ගියහ.

බුදු රජහු මහණෙනි, තථාගතයෝ ලෝකාර්ථයෙහි යෙදුණෝ දැන් පමණක් නො වෙති. පෙර ද යෙදුනාහුමැ යි ධර්ම දේශනාව ගෙනහැර අනුසන්ධි ගළපා ජාතක කථාව නිමවූහ. එදා පිරිස බුදු පිරිස මය. බරණැස් රජ වනාහි මම ම වීමි.

## පස් වැනි අර්ථකාම වර්ගයයි.

## පළමු පණ්ණස නිමියේය.

## 1. 6. 1.

## මහා සීලව ජාතකය

"ආසිංසෙථෙව පුරිසොති" යන මේ ජාතකය බුදු රජහු දෙව්රම් වෙහෙර වසන සේක්, හළ වීරිය ඇති භික්ෂුවක් අරබයා දේශනා කළහ. බුදුරජහු ඒ භික්ෂුව අමතා හළ වීර්යය ඇත්තෙහිදැ යි ඇසූහ. එ සේය ස්වාමීනි, කිමෙක් ද මහණ, මෙබඳු නෛර්යාණික සසුනෙහි පැවිදි ව වීර්යය අත්හළේ කුමක් නිසා ද ? පෙර පඬිවරු රාජ්‍යය පිරිහෙන්න හළ ද වීර්යයෙහි පිහිටා නැති වූ සම්පත් උපදවා ගත්තාහුමැ යි වදාරා අතීත කථාව ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු රජුගේ අග මෙහෙසිය කුස පිළිසිඳ ගත්හ. ඔහුට නම් තබන දිනයෙහි සීලව කුමරා යි නම් තැබූහ. එතුමා සොළොස් වියේදී ම සිප්සතරෙහි පරතෙරට පැමිණ පසු කල පියාගේ ඇවෑමෙන් රාජ්‍යයෙහි පිහිටියේ මහා සීලව කුමරු නම් වූයේය. දැහැමි රජෙක් වූයේය. නගරයෙහි සතර දිසාවෙහි සතරක් ද මැද එකක් ද තම රජ මැදුර ඉදිරියෙහි එකක් ද වශයෙන් දාන ශාලා සයක් කැරවා දුගී මඟීන්ට දන් දෙයි. සිල් රකියි. පොහොය කර්ම කරයි. ඉවසීම, මෙත, කරුණාදියෙන් යුත් රජතුමා තම ඇකෙහි හුන් පුතු සතුට කරන්නාක් මෙන් සියලු සතුන් සතුටු කරමින් දැහැමෙන් රාජ්‍යය කරයි. එතුමන්ගේ ඇමැතියෙක් අන්තඃපුරයෙහි වරදෙහි හැසිර පසු කාලයෙහි ප්‍රකට විය. ඇමැතියෝ රජුට මෙකරුණ සැලකළහ. රජතුමා පිරික්සා ප්‍රත්‍යක්ෂව දැන ඒ ඇමැතියා කැඳවා බාලය, ඔබ කළේ වරදකි. මගේ රාජ්‍යයෙහි විසීමට ඔබ සුදුසු නො වේ. තමාගේ ධනය ද අඹුරුවෝ ද ගෙන වෙනත් තැනකට යව යි රටින් පිටුවහල් කළේය. ඔහු කසී රට ඉක්මවා කොසොල් රජුට සේවය කරමින් ක්‍රමයෙන් රජුගේ අභ්‍යන්තර හිතවතකු විය. දිනක් ඔහු රජුට මෙසේ කීය. දේවයිනි, බරණැස් රාජ්‍යය මී මැස්සන් නැති මී වදයක් සමාන වේ. රජු ඉතා ලාමකය. සුළු හමුදාවක් යොදා බරණැස් රාජ්‍යය ගත හැකිය. රජ ඔහුගේ වචනය අසා මෙසේ සිතීය. බරණැස් රාජ්‍යය අති විශාලය. මොහු සුළු හමුදාවකින් ජය ගත හැකි බව කීය. මොහු ඔත්තුකරුවකු විය හැකියැ යි සිතා ඔබ චර පුරුෂයකුදැ යි ඇසීය. දේවයිනි, මම

චර පුරුෂයෙක් නොවෙමි. ඇත්ත ම කියමි. ඉදින්, මගේ වචනය නො අදහන්නේ නම්, මිනිසුන් යවා පිටිසර ගමක් විනාශ කරනු මැනවි. එවිට ඒ ගම් පහරන මිනිසුන් ගෙන තමන් වෙත ගෙන ආ විට කසී රට රජු ඔවුන්ට ධනය දී නිදහස් කරන්නේය.

කොසොල් රජ, මොහු ඉතා ශූර ලෙස කියයි. ඔහු විමසමි යි තමාගේ මිනිසුන් යවා පිටසර ගමක් විනාශ කැර වීය. මේ වැසියෝ කොල්ලකරුවන් අල්ලා රජුට දැක්වූහ. රජ ඔවුන් දැක දරුවනි, කුමක් නිසා ගම විනාශ කරනු ද ? දේවයිනි, ජීවත් වීමට මඟක් නැත. එ සේ නම් මා ළඟට නො පැමිණියේ මන් ද ? මෙතැන් පටන් එවැනි දේ නො කරනු යි පවසා ඔවුන්ට ධනය දී නිදහස් කළේය. ඔවුහු ගොස් කොසොල් රජුට මෙපුවත් සැලකළහ. රජ මෙපමණකින් නො සෑහී රට මැද දනව්වක් වැනසීය. ඒ මිනිසුන්ට ද රජ ධනය දී යැවීය. ඔහු මෙතෙකුනු නො සෑහී නැවත මිනිසුන් යවා මහා වීදිය කොල්ල කැව්වේය. රජ ඔවුන්ට ද ධනය දී යැවීය. ඉක්බිති, කොසොල් රජ මොහු ඉතා දැහැමි රජෙකැ යි සිතා බරණැස් රාජ්‍යය ගනු පිණිස බල සෙනග රැගෙන ගියේය.

එකල බරණැස් රජුට මතැතකු ඉදිරියට එන කල්හි පවා ආපසු නො හැරෙන හිසෙහි හෙණ පිපුරුන ද බිය නො වන, සීලව මහරජුගේ කැමැත්ත තිබේ නම් මුළු දඹදිව රාජ්‍යයන් නතු කැර ගැනීමට සමත් පරාජය කළ නො හැකි දක්‍ෂ දහසක් පමණ යුද සෙබළුන් වෙයි. ඔවුහු කොසොල් රජු එතැ යි අසා රජුන් වෙත එළැඹ දේවයිනි, කොසල් රජ බරණැස් රාජ්‍යය ගන්නෙමි යි පැමිණෙයි. අපි යමු. අපගේ රාජ්‍යය සීමාව ආක්‍රමණය කළ විගස ඔවුන්ට පහරදී අල්ලා ගනිමු යි කීහ. දරුවනි, මා නිසා අනුන් වෙහෙසන බවක් නැත. රාජ්‍යය කැමැත්තෝ රාජ්‍යය ම ගනිත්වා. නො යවු යි වැළැක්වීය. කොසොල් රජ රාජ්‍යය සීමාව ඉක්මවා දනව් මැදට පිවිසියේය. ඇමැතියෝ නැවතත් රජු වෙත එළැඹ පෙර සේ ම කීහ. රජ පෙර පරිදි ම වැළැක්වීය. කොසොල් රජ පිට නගරයේ සිට රාජ්‍යය දෙනු නැතිනම් යුද්ධය යි සීලව මහරජුට හසුන් යැවීය. රජ ඒ අසා මා සමග යුද්ධයක් නැත. රාජ්‍යය ගනු, යනුවෙන් පිළිහසුන් යැවීය. නැවතත් ඇමැතිවරු රජු වෙත එළැඹ දේවයිනි, අපි කොසොල් රජුට අප නුවරට පිවිසෙන්න ඉඩ නො දෙමු. පිට නුවර දී ම ඔවුන්ට පහර දී අල්ලා ගනිමු යි කීහ. රජු පෙර පරිදි ම වළකා

සියලු නගර දොරටු හැරදමා ඇමැතීන් දහස සමග මහවාසලෙහි සිහසුන මත හුන්නේය.

කොසොල් රජු මහත් බල සෙනගින් යුතු බරණැස් නුවරට පිවිසියේය. එක ද සතුරකු නුදුටු ඔහු රජ මැදුරට ගොස් දොරවල් නො වැසූ නිවසනයෙහි සරසන ලද අසුනෙහි ඇමැතියන් පිරිවරා හුන් නිදොස් වූ සීලව මහරජුන් දහසක් ඇමැතියන් සමග අල්ලාගෙන තම සේනාවට මෙසේ අණ කළේය. යවු, මේ රජුත් ඇමැතියනුත් සමග පිටිතල දැඩිව බැඳ අමු සොහොනට ගෙන ගොස් ගෙල පමණ සිටින සේ වළ කැන යම් සේ එකකුවත් අතක් පවා එසවිය නො හැකි වේ ද එ සේ පස් දමා වළ දමනු. රාත්‍රියෙහි සිවල්ලු අවුත් මොවුන්ට කළ යුතු දෙය කරන්නාහ.

මිනිස්සු රජුගේ අණ අසා රජුත් ඇමැතියන් සමග පිටතල බැඳ එක් කළහ. එකල්හි ද සීලව මහරජතුමා සතුරු රජුට වෛර මාත්‍රයක්වත් වෛර නො කළේය. ඇමැතියන් ද මෙසේ බැඳගෙන යන කල්හි එකකුවත් රජුගේ වචනය ඉක්මවීමට සමතකු නො වීය. සීලව රජුගේ පිරිස මනාව හික්මුණු අය වූහ. ඉක්බිති, රාජ පුරුෂයෝ සීලව රජු අමු සොහොනට ගෙන ගොස් ගෙල වටක් වළ කැන සීලව රජු මැද ද දෙපසෙහි සෙසු ඇමැතියන් ද සිටින සේ වළට බස්වා පස් දමා තද වන සේ කොටා ගියහ. සීලව රජ ඇමැතියන් අමතා දරුවනි, සතුරු රජු කෙරෙහි වෛර නො කොට මෙත් වඩව යි අවවාද කළේය.

ඉක්බිති, මැදියම් රැයෙහි මිනී මස් කන්නෙමි යි සිවල්ලු පැමිණියෝය. ඔවුන් දැක රජ ද ඇමැතියෝ ද එක්වර ම ශබ්ද කළහ. සිවල්ලු බිය වී පලා ගියහ. ඔවුහු නැවතී බලන්නාහු, පසු පසින් කිසිවකු නො එනු දැක නැවතත් පැමිණියහ. එවර ද පෙර සේ මහා ශබ්ද කළහ. මෙසේ තෙවරක් පලාගොස් නැවත බලන්නාහු, ඔවුන් එකකුවත් නො එන බව දැන මොවුන් වදයට පත් කළ වූහ. එය දැන නැවත ශබ්ද කළ ද පලා නො ගියහ. දෙටු සිවලා රජු වෙත ළඟා වූහ. සෙස්සෝ සෙස්සන් වෙත ළඟා වූහ. උපාය දක්ෂ රජතුමා ඔහු ළඟට පැමිණි බව දැන ඩැහැ ගැනීමට ඉඩ දෙන්නාක් මෙන් ගෙල ඔසවා ගෙල ඩැහැගන්නා සමග ම හකු ඇටයෙන් ඇද යන්ත්‍රයක

බහන්නාක් මෙන් ගත්තේය. ඇතකුගේ බලයෙන් රජ විසින් හකු ඇටයෙන් ඇද ගෙලෙන් දෑඩිව අල්ලාගත් සිවලා තමා මිදීමට නො හැක්කේ මරණ බියෙන් මහා හඬින් කෑගැසීය. සෙසු සිවල්ලු ඔහුගේ මර හඬ අසා එක් පුරුෂයකු විසින් ගන්නා ලද්දේයැ යි ඇමැතින් වෙත ළං විය නො හැකිව මරණ බයෙන් තැතිගෙන පලා ගියහ. රජතුමාගේ හකු ඇටයෙන් තදකොට ගත් සිවලා ඒ මේ අතට දඟලන විට පස් බුරුල් විය. ඒ හිවලා ද මරණ බියෙන් බියපත් ව රජුගේ ඉහළ කොටස පා සතරින් කනින්නේ පස් ඉවත්විය. පස බුරුල් වූ බව දැනගත් පසු රජතුමා හිවලා අතහැර තමාගේ ඇත් බල ඇති ශක්ති සම්පන්න අත ඒ මේ හරවමින් දෙ අත් ඔසවා වළෙහි මුවවිටෙහි එළැඹී සුළඟින් දෙකඩ වූ වලාකුළක් මෙන් පිටතට අවුත් ඇමැතියන් අස්වසා පස් මැත්කොට සියල්ලන් ගොඩගෙන ඇමැතියන් පිරිවරා අමු සොහොනෙහි සිටියේය.

ඒ වෙලාවෙහි මිනිස්සු මළ මිනියකු අමු සොහොනෙහි දමන්නාහු, යකුන් දෙදෙනකුට අයත් සීමා මැදට දැමූහ. ඒ යකුන් දෙදෙනා මළ සිරුර බෙදා ගැනීමට නො හැකිව අපට මෙය බෙදා ගැනීමට නො හැකිය. මේ සීලව රජු දැහැමිය. ඔහු අපට බෙදා දෙනු ඇතැ යි ඔහු ළඟට යමු යි මළ මිනිසා පාදයෙන් ගෙන අදින්නාහු, රජු වෙත ගොස්. දේවයිනි, මෙය අපට බෙදා දෙනු මැනවැ යි කීහ. පින්වත් යකුනි, මම මෙය ඔබට බෙදා දෙමි. එහෙත් මම අපිරිසුදු වෙමි. පළමුකොට ස්නානය කළ යුතු වෙමි. එවිට යකුන් දෙදෙන සතුරු රජුට පිළියෙල කළ සුවඳවත් කළ ජලය තමන් ආනුභාවයෙන් ගෙනවුත් රජුට නෑම සඳහා දුන්හ. ඔවුහු සතුරු රජුට හැඳ පැළඳ ගැනීමට සැකසූ දෑ ගඳ සුවඳ ගෙනවුත් දුන්හ. සුවඳ ආලේපකොට සිටි රජුට සිව් දුගඳ සුමුගුවක් ගැල්වූ පසු රන් සුමුගුවක තැබූ නානා විධි මල් ගෙනවුත් දුන්හ. මල් පැළඳ සිටි කල්හි තවත් කුමක් කළ යුතුදැ යි විමසූහ. රජ තමාට කුසගිනි බවක් දැක්වීය. ඔවුහු ගොස් සතුරු රජුට සැකසූ විවිධ අග්‍ර රසයෙන් යුත් භෝජන එළවූහ. රජතුමා ස්නානකොට පිවිත්‍ර ව සුවඳ ගල්වා නානාග්‍ර රස බොජුන් වැළඳීය. අනතුරුව යක්‍ෂයෝ සතුරු රජුට එළවූ සුවඳවත් කළ පැන් කෙණ්ඩිය හා බොන රන් බඳුනින් මුව දොවා අත් දොවා සිටි කල සතුරු රජුට සැකසූ සුවඳ බුලත් ගෙන ආහ. එය කා සිටි කල්හි වෙන කුමක් කරමුදැ යි ඇසූ කල්හි තොප ගොස් හිස ළඟ ඇති මඟුල් කඩුව ගෙන එව යි කීය. යක්‍ෂයෝ එය ද ගෙනවුත් දුන්හ. රජතුමා කඩුව

ගෙන ඒ මළ මිනිය සෑජුව තබවා හිස මැදින් කඩුවෙන් ගසා දෙපලුකොට සතුන් දෙදෙනාට සම ව බෙදා දුන්නේය. එ සේ දී කඩුව සෝදා සන්නද්ධව සිටියේය. යක්‍ෂයෝ මිනී මස් කා අහරින් සංතෘප්තව සතුටු සිතින් මහරජතුමනි වෙනත් කුමක් කරමුද යි විමසූහ. එ සේ නම් ඔබ ආනුභාවයෙන් මා සතුරු රජුගේ සිරියහන් ගැබෙහි තබවු. මේ ඇමැතියන් ද තම තමාගේ ගෙවලට ම ඇරලවු. යක්‍ෂයා මැනවි දේවයිනි යි සතුටින් පිළිගෙන එ සේ කළහ.

ඒ වෙලාවෙහි සතුරු රජු සිරියහන් ගැබෙහි මාහැඟි යහනෙහි වැඳහෙව නිදයි. බරණැස් රජු බමන මතින් නිදන සතුරු රජුගේ උදරයට කඩු තලයෙන් ගැසීය. ඔහු බයින් පිබිදී පහන් එළියෙන් සීලව රජු හැඳින සයනයෙන් නැගිට සිහි එළවා සිට රජුගෙන් මෙසේ ඇසීය. මහරජ මෙබඳු රැයෙහි රැකවල් යෙදූ වැසූ දොරවල් ඇති මැදුරෙහි ආරක්‍ෂක පුරුෂයන්ගෙන් තොර නො වූ මෙතැන කඩුව දරා සිව් බරණින් සැරසී මේ යහන් ගැබට කෙසේ නම් පැමිණියේ ද ? එවිට සීලව රජ තමා එතැනට පැමිණි ආකාරය සවිස්තරව කීය. ඒ ඇසූ සතුරු රජ සංවේගයට පත් සිත් ඇතිව මහරජතුමනි, මම මිනිසකුවත්ව ඔබතුමන්ගේ ගුණ නො දනිමි. මෙරමා මස් ලේ බුදන ඉතා රළු දරුණු යකුන් විසින් ඔබ ගුණ දන්නා ලද්දේය. රජතුමා දැන් මම මෙබඳු සිල්වත් ඔබ කෙරෙහි ද්‍රෝහී නො වන්නෙමි යි කඩුව ගෙන දිවුරා සීලව රජුන් කමා කැරවා මහා සයනෙහි සතපවා තමා කුඩා ඇඳක සැතපී රාත්‍රිය ගෙවී හිරු උදා වූ කල්හි බෙර හසුරුවා සියලු බල සෙනග ද ඇමැති බමුණු ගැහැවියන් රැස් කැරවා ඔවුන් ඉදිරියෙහි අහසෙහි පුන්සඳ වන්නාක් මෙන් සීලව රජුගේ ගුණ කියා පිරිස් මැද ම නැවත රජු කමා කැරවා රාජ්‍යය නැවත පිළිගන්වා මින් පසු ඔබට ඇතිවන සතුරු බිය මට භාරය. මා විසින් ආරක්‍ෂා කරනු ලබන රාජ්‍යය කැර ගෙන යනු මැනවැ යි කියා කේලාම් කී පුරුෂයාට රාජාඥාව පනවා තමාගේ බල සෙනග රැගෙන සිය රටට ම ගියේය.

සීලව මහරජතුමා ද සිව් බරණින් සැරසී, සේසත යට පනවන ලද ව්‍යාඝ්‍ර පාද යෙදූ රන්මුවා පළඟෙහි හිඳ තමාගේ මහත් සම්පත් බලා මා උත්සාහ නො කළේ නම් මේ මහා සම්පත ද දහසක් ඇමැතියන්ගේ ජීවිත ප්‍රතිලාභය ද යන කිසිවක් නො වන්න තිබිණි. උත්සාහය නිසා නැතිවී ගිය මේ මහා සම්පත නැවත ලැබීමි. දහසක්

ඇමැතියන්ගේ ජීවිත ද ලබා දුනිමි. එනිසා ඒකාන්තයෙන් ඉච්ඡාභංගය නො කොට උත්සාහ ම කළ යුතුයි. උත්සාහ කළ අයට ප්‍රතිඵල සඵල වන්නේමැ යි සිතා ප්‍රීති වාක්‍යය වශයෙන් මේ ගාථාව කීහ.

**"ආසිංසෙථෙව පුරිසො න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො**
**පස්සාමි වොහං අත්තානං යථා ඉච්ඡිං තථා අහූති"**

"පුරුෂ තෙමේ ක්‍රියාවෙහි ඵලය දක්වා ආශා කරන්නේය. නුවණැත්තේ උකටලී නො වන්නේය. මා යම් සේ කැමැති වී ද එ සේ ම සිදුවිය. එ සේ වූ මම දකිමි."

එහි, **"ආසිංසෙථෙව"** මා මෙසේ උත්සාහය ආරම්භ කරන්නේ මේ දුකින් මිදෙමි යි තමාගේ වීර්යය බලය පිළිබඳ ආශා කළයුතුමය. **"න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො"** උපායෙන් දක්ෂ නුවණැත්තා සුදුසු තැන වීර්යය කරමින් මම මේ උත්සාහයෙහි ප්‍රතිඵලය නො ලබමි යි පසුතැවිලි නො වන්නේය. උත්සාහය පිළිබඳ ආශාව අත් නො හරින්නේය, යන අර්ථයයි. **"පස්සාමි වොහං අත්තානං"** මෙහි "වො" යනු නිපාතයි. විශේෂ අරුතක් නැත. මම අද තමා දකිමි. "යථා **ඉච්ඡිං තථා අහූති"** මම වළෙහි ගිලී සිටිය ද ඒ දුකින් මිදී නැවත තමාට අයත් රාජ්‍යයට පැමිණීම කැමැති වීමි. මම ඒ සම්පතට පැමිණි තමා දකිමි. යම් සේ මම මුලින් කැමැති වී ද ඒ අයුරින් ම පැමිණියේය. මෙසේ බෝසත්හු අහෝ පින්වත්නි, සිල්වතුන්ගේ වීර්යය ඵලය නම් ඉටුවන්නේමැ යි මේ ගාථාවෙන් උදන්අනා දිවි ඇතිතාක් පිංකොට කම් වූ පරිදි මිය ගියහ.

බුදුරජහු මේ මේ ජාතක ධර්ම දේශනය ගෙනහැර දක්වා සිව්සස් වදාළහ. සිව්සස් කෙළවර විරිය හළ භික්ෂුව රහත් ඵලයෙහි පිහිටියේය. බුදුරජහු අනුසන්ධි ගළපා ජාතකය නිමවා වදාළ සේක. එදා දුෂ්ඨ ඇමැතියා දෙව්දත් විය. ඇමැතියන් දහස බුදුපිරිසය. සීලව මහරජ මම ම වීමි.

## 1. 6. 2.

## චූලජනක ජාතකය

"වායමෙථෙව පුරිසොති" යන මේ ජාතකය බුදුරජහු දෙව්රමෙහි වසන සේක්, වීරිය අත්හළ භික්ෂුවකු අරබයා දෙසූහ. මෙහි කිය යුතු යමක් වේ නම් එය මහා ජනක ජාතකයේ එන්නේය. ජනක රජ වනාහි සේසත යට හිඳ මේ ගාථාව කීය.

"වායමෙථෙව පුරිසො න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො
පස්සාමි වොහං අත්තානං උදකා ථලමුබ්භතන්ති"

"පුරුෂ තෙම වෑයම් කරන්නේ මය. නුවණැත්තේ උකටලී නො වන්නේය. මම වීර්යයෙන් දියෙන් ගොඩ නැංගා වූ තමා දකිමි."

එහි, "වායමෙථෙව" උත්සාහ කරන්නේ මය. "උදකා ථලමුබ්භතන්ති" මෙහි දී ද වීර්යය අත්හළ භික්ෂුව රහත් ඵලයෙහි පිහිටියේය. ජනක රජ සම්මා සම්බුදු ම විය.

## 1. 6. 3.

## පුණ්ණපාති ජාතකය

"තථෙව පුණ්ණාපාතියොති" යන මේ ජාතකය බුදු රජහු දෙව්රම් වෙහෙර වසන සේක්, විෂ සුරාවක් අරබයා දෙසූහ. එක් කලෙක සැවැත් නුවර සුරා සොඬහු රැස්ව කුමන්ත්‍රණ කළහ. අපගේ සුරා මුදල් අවසන් විනි. දැන් ඒ කොහෙන් ලබන්නෙමු ද ? එහි සිටි

සැර පරුෂ සොඬකු මෙසේ කීය. ඒ පිළිබඳ නො සිතවු. උපායක් ඇත. කවර උපයක් ද ? අනේ පිඬු මහසිටුහු රාජ්‍යය සේවයට යන්නාහු, ඇඟිලි මුදු පැළඳ මටසිළිටු වස්ත්‍ර ඇඳ යති. අපි රා බඳුනට සිහි නැතිවෙන බෙහෙතක් යොදා අවන්හලක් සදා සිටාණන් එන කල මහසිටුතුමනි, මෙහෙන් එන්නයැ යි කැඳවා ඒ සුරා පොවා සිහි නැති වූ කල ඇඟිලි මුදු හා සළු පැහැරගෙන අපගේ සුරා මුදල සොයා ගනිමු. අනෙක් සුරා සොඬහු ද ඒ පිළිගෙන එ සේ කොට සිටාණන් එන වේලෙහි පෙර ගමන්කොට සිටුතුමනි, මෙහෙන් එන්න. අපගේ ළඟ ඉමිහිරි සුරා ඇත. මඳක් බී යන්නැ යි කීවාහුය. කිම, සෝවාන් වීමෙන් අරී සච්චකු වූ සිටුතුමා රහමෙර බොන්නේ ද ? අවශ්‍යතාවක් නැතිව ද සිටුතුමා ඒ සුරා සොඬුන් නිග්‍රහ කරනු පිණිස අවන් බිමට ගොස් ඔවුන්ගේ කාර්යය ද බලා මේ සුරාව මොවුන් විසින් මෙවැනි කරුණකට යොදන ලද්දේයැ යි දැන මෙතැන් පටන් ඔවුන් මෙයින් පලවා හරින්නෙමි යි සිතා මෙසේ කීය. එම්බා කෲර ධූර්තයෙනි, තොපි සුරා බඳුනට බෙහෙත් යොදා පැමිණියවුන්ට පොවා සිහිසුන්කොට මිනිසුන් පහරන්නෙහු යි අවන්හලක් සදා හුන්නාහු, හුදෙක් සුරාව අගය කිරීම පමණක් කරන්නාහුය. තොපගෙන් එකෙක්වත් මඳක්වත් බීමට නො පෙළඹෙන්නෙහිය. ඉදින්, මෙහි එවැනි බෙහෙතක් නො යොදන ලද නම් තොපිත් බොවුහ යි ඔවුන් තැතිගන්වා පලවා හැර තමාගේ ගෙට ගොස් ධූර්තයන් කළ කරුණ බුදුරජුන්ට දන්වන්නෙමි යි අටියෙන් ගොස් දැන්වීය. එවිට බුදුරජහු මහසිට, මේ සුරා සොඬහු දැන් ඔබ වංචා කිරීමට කැමැත්තෝ මුත් පෙර නුවණැතුන් පවා වංචා කිරීමට කැමැත්තෝ වූහ යි වදාරා ඔහු විසින් අයදනා ලද්දාහු, අතීත කථාව ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කැරවන සමයෙහි බෝසත්හු බරණැස් සිටුහු වූහ. එදා ද මේ ධූර්තයෝ එපරිද්දෙන් ම කුමන්ත්‍රණ කොට විෂ සුරා සකසා බරණැස් සිටු එන විට පෙර මඟට ගොස් පෙර මෙන් ම කීහ. එවිට සිටුතුමා නො කැමැති ව ඔවුන්ට පරිභව කරනු පිණිස ගොස් ඔවුන්ගේ කාර්යය ද බලා මේ සුරාව මොවුන් විසින් මෙවැනි කරුණකට යොදන ලද්දේයැ යි දැන පලවා හරින්නෙමි යි සිතා මෙසේ කීය. පින්වත් ධූර්තයනි, රජු වෙත යන විට සුරා පානය සුදුසු නො වේ. රජු බැහැ දැක එන විට බලමු. තොපි මෙහි ම හිඳුව යි කියා රාජ්‍යය සේවය අවසන්කොට ආපසු ආවේය.

ධූර්තයෝ සිටුතුමනි, එනු මැනවැ යි අවවිලි කළහ. සිටු ද එහි ගොස් බෙහෙත් යොදන ලද සුරා සැළ බලා ධූර්තයනි, තොපගේ ක්‍රියාපටිපාටිය මට රුචි නො වේ. තොපගේ සුරා සැළ පුරවන ලද පරිදි ම තිබේ. තොපි සුරාව අගය කරනවා පමණයි. නො බොන්නහුය. සුරා මෙතරම් මිහිරි නම් තොප ද බොවූ. ඒකාන්තයෙන් මේ සුරා විෂ මිශ්‍ර විය යුතුයැ යි සුරා සොඬුන්ගේ මනදොළ සිඳිමින් මේ ගාථාව කීහ.

"තථෙව පුණ්ණාපාතියො අඤ්ඤායං වත්තතෙ කථා
ආකාරකෙන ජානාමි න චායං භද්දිකා සුරාති"

"සුරා බඳුන් පිරී පවතී. සුරා අගයන වෙනත් කථා පවතී. පවතින ආකාරයෙන් මේ යහපත් සුරා නො වන බව දනිමි."

එහි, "තථෙව" මා පැමිණෙන කාලයෙහි දුටු පරිදි දනුදු ඒ පාත්‍ර එලෙස ම පිරී පවතී. "අඤ්ඤායං වත්තතෙ කථා" තොපගේ යම් සුරා අගයන කථා බොරුවකි. සත්‍යයයෙන් තොරය. ඉදින්, මේ සුරා මිහිරි නම් තොප ද බිය යුතුයි. එ සේ නම් ඉතිරි වන්නේ අඩක් පිරිණු සුරා බඳුන්ය. තොපගෙන් එකකු විසින් හෝ මේ සුරා පානය නො කරන ලදී. "ආකාරකෙන ජානාමි" එම නිසා මේ ආකාරයෙන් දනිමි. "න චායං භද්දිකා සුරාති" මේ සුරා යහපත් නො වන්නේය. මේවා විෂ යෙදූ සුරා විය යුතුයි. මෙසේ ධූර්තයන් අල්ලාගෙන නැවත එවැන්නක් නො කරන ලෙස තර්ජනයකොට අත්හළහ. ඔහු දිවි හිමියෙන් දානාදී පිං කොට කම් වූ පරිදි මිය ගියේය.

බුදුරජහු මේ ජාතක දේශනාව ගෙනහැර දක්වා ජාතකය නිම කළහ. එදා සුරා සොඬහු දැන් ධූර්තයෝ ම වූහ. බරණැස් සිටු මම ම වීමි.

## 1. 6. 4.

# ඵල ජාතකය

"නායං රුක්ඛො දූරාරුහොති" යන මේ ජාතකය බුදු රජහු දෙව්රම් වෙහෙර වසන සේක්, ගෙඩි වර්ග දැනීමෙන් දක්‍ෂ උපාසකයකු අරබයා දෙසූහ. සැවැත් නුවර වැසි කෙළෙඹියෙක් බුදුපාමොක් මහ සඟන තම උයනෙහි වඩා හිඳුවා කැඳ කැවිලි පිළිගන්වා උයන්පල්ලාට භික්‍ෂූන් සමග උයනෙහි හැසිර සංඝයාට අඹ ආදී නොයෙක් ගෙඩි ලබා දෙන ලෙස අණ කළේය. ඔහු ද මැනවැ යි පිළිගෙන භික්‍ෂූහු රැගෙන උයනෙහි හැසිරෙන්නේ, ගස දෙස බලා ම මේ ගෙඩිය අමුය. මෙය පැසුණේය. මේ මැනවින් පැසුණේයැ යි දනි. යමක් ඔහු කියයි ද ඒ එ සේ මය. මෙකරුණ භික්‍ෂූහු ගොස් බුදුරජුන්ට සැල කළහ. ස්වාමීනි, මේ උයන්පල්ලා ගෙඩි ගැන දක්‍ෂයෙකි. බිම සිටි සේ ම ගස දෙස බලා මේ ගෙඩිය අමුය. මෙය මැනවින් නො පැසුණේය. මෙය මැනවින් පැසුනේයැ යි දනී. යමක් ඔහු කියා ද එය එ සේ ම වෙයි. මහණෙනි, මේ උයන්පල්ලා ගෙඩි වර්ග පිළිබඳ දක්‍ෂයකු වූයේ දැන් පමණ නො වේ. පෙර ද නුවණැත්තෝ ගෙඩි ගැන දක්‍ෂයෝ වූහ. ඉකුත් වත ගෙන හැර දක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු සිටු කුලයෙහි ඉපිද වැඩිවිය පත්ව පන්සියයක් ගැල් යොදා වෙළඳාම් කරන්නෝ, එක් කලෙක බෝසත්හු මහමග වනයට පැමිණ වන මුව දොර සිට සියලු මිනිසුන් රැස්කැරවා මේ වනයෙහි විෂ ගස් තිබේ. එ සේ ම විෂ කොළ, මල්, ගෙඩි, මී ඇත. එම නිසා තොප විසින් පෙර පරිභෝග නො කරන ලද කොළයක්, මලක්, ගෙඩියක් මා නො විචාරා නො කෑ යුතුයැ යි කීහ. ඔවුහු ද ඒ මැනවැ යි පිළිගෙන වනයට පිවිසියහ. එක් වනය අද්දර ගම් දොරක කිම්ඵල නම් ගසක් ඇත. ඒ ගසෙහි කඳ, අතුරිති, මල්, ගෙඩි සියල්ලම අඹ ගසට සමානය. වර්ණයෙන් පමණක් නොව පැසුණු නො පැසුණු ගෙඩි ගඳ, රසයෙන් ද අඹ ගෙඩි සමාන විය. කෑ කල්හි හලාහල විෂයක් මෙන් එකෙණෙහි ම දිවි තොර කරයි. පෙරටුව ගිය සමහර කෑදර පුරුෂයෝ මේ අඹ ගසක්යැ හැඟීමෙන් කිම්ඵල කෑහ. සමහරු ගෙඩි ගෙන සාත්තු නායකයා විචාරා කමු යි අතින් ගෙන සිටියහ. ඔවුහු

සාත්තු නායකයා පැමිණි කල ආර්යයෙනි, මේ අඹ ඵල කන්නෙමු යි විචාළහ. බෝසත්හු ඔවුන් අමතා දරුවනි, මේ අඹ නො වේ. නො කවු, ඔවුන් වළකා, යම් කෙනකු කෑ ද ඔවුන් වමනය කැරවීමෙන් චතුමධුර පොවා සුවපත් කළහ. පෙර ද මිනිස්සු මේ ගස මුල නවාතැන් ගෙන අඹ ගෙඩියැ යි සිතා මේ විෂ ගෙඩි කා මරණයට පැමිණෙති. ගම් වාසීහු පසු දින නික්ම ඒ මළ මිනිසුන් දැක පාදයෙන් ගෙන මළ සිරුරු කැලයට ඇද දමා ගැල් සමග ඔවුන් සන්තක දේ රැගෙන යති.

මෙදින ද ඒ මිනිස්සු අරුණු නැගෙන වේලෙහිම අවුත් ගොනුන් මටය. ගැල මටය. මේ මේ භාණ්ඩ මටයැ යි කියමින් ගස ළඟට පැමිණ නිරෝගී ව සිටි මිනිසුන් දැක ඔබ මේ ගස අඹ නො වන බව කෙසේ දැන ගත්තහු ද ? අපි නො දනිමු. අපේ ගැල් දෙටු නායකයා දැන ගත්හ යි කීහ. මිනිස්සු බෝසතුන් වෙත පැමිණ නුවණැත්තෙනි, ඔබ මේ ගස අඹ නො වන බව කෙසේ දත්තහු ද ? මම කරුණු දෙකකින් ඒ දැන ගතිමි යි කියා මේ ගාථාව කීහ.

"නායං රුක්ඛො දුරාරුහො නපි ගාමතො ආරකා
ආකාරකෙන ජානාමි නායං සාදුඵලො දුමොති"

"මේ ගසට නැඟීමට අපහසු නො වේ. ගමින් දුර වූයේ ද නො වෙයි. එ සේ වුවත් රසවත් ගෙඩි පිරී ඇති ගසකි. මෙකරුණින් මේ ගස යහපත් ගෙඩි ඇති ගසක් නො වන බව දනිමි."

එහි "නායං රුක්ඛො දුරාරුහො" මේ විෂ ගසට සුව සේ නැඟිය හැකිය. ඔසවා තබන ලද හිනි මඟක් මෙන් ලෙහෙසියෙන් නැඟිය හැකි බව කියයි. "නපි ගාමතො ආරකා" ගමින් ඉතා බැහැර නො වේ. ගම් දොර පිහිටියේමැ යි කියයි. "ආකාරකෙන ජානාමි" ඉදින්, මේ ගස මිහිරි ගෙඩි ඇති අඹ ගසක් වූයේ නම්, ගම් දොර පිහිටි සුව සේ නැඟිය හැකි මේ ගසෙහි එක ගෙඩියක්වත් ඉතිරි නො වන්නේය. ගෙඩි කන මිනිසුන් විසින් නිතර පිරිවරන ලද්දේ ම වන්නේය. මෙසේ මම මගේ ම ඥානයෙන් මේ විෂ ගසක් බව

දන්නෙමි. මෙසේ බෝසත්හු මහජනයාට දම් දෙසා යහපත් ගමනක් ගියහ.

බුදු රජහු මහණෙනි, පෙර පඬිවරු ද ගෙඩි වර්ග දැනීමෙහි දක්‍ෂයෝ වූහ යි මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා වදාරා ජාතකය නිමා කළහ. එකල පිරිස බුදුපිරිස වූහ. ගැල් නායකයා මම ම වීමි.

## 1. 6. 5.

## පඤ්චාවුධ ජාතකය

**"යො අලීනෙන චිත්තෙන"** යන මේ ජාතකය බුදුරජහු දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, හළ වීර්යය ඇති භික්‍ෂුවක් අරබයා වදාළහ. උන්වහන්සේ ඒ භික්‍ෂුව අමතා මහණ, ඔබ වීර්යය අත්හළේ සත්‍යයද යි විමසා සත්‍යයැ යි භාග්‍යවතුන් වහන්ස, කී කල්හි, පෙර නුවණැත්තෝ වීර්යය කිරීමට සුදුසු තැනදී වීරියකොට රජ සැපතට පත්වූහ යි වදාරා ඉකුත් වත දක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කරන කල්හි බෝසතාණන් ඒ රජුගේ අග මෙහෙසිය කුස උපන්හ. ඔහුට නම් තබන දිනයෙහි අටතුරා සියක් බමුණන් කැමැති සියලු දෙයින් සතප්පවා කුමරුගේ ලකුණු විචාළහ. ලකුණු සතරෙහි දක්‍ෂ වූ බමුණෝ ලකුණු සම්පත් පිරික්සා මහරජ, කුමරා පින්වත්ය. ඔබගේ ඇවෑමෙන් රජ වන්නේය. පංච ආයුධ කර්මයෙහි කැපී පෙනෙන්නේ ප්‍රකට ව දඹදිව ශ්‍රේෂ්ඨ පුරුෂයා වන්නේයැ යි ප්‍රකාශ කළහ. බමුණන්ගේ වදන් ඇසූ කුමරුට නම් තබන්නාහු, පඤ්චායුධ කුමාරයා යි නම් තැබූහ. පිය රජු සොළොස් වියෙහි සිටි ඔහු අමතා දරුව, ශිල්ප උගනුව යි කීය. පියාණෙනි, කවුරු ළඟ උගනිම් ද ? දරුව, ගන්ධාර රට තක්සලා නුවරට යව. එහි දිසාපාමොක් ඇදුරුගේ ළඟ ශිල්ප උගනිවු යි ඔහුට ගුරු දීමනා වශයෙන් දෙන්නැ යි දහසක් දී පිටත් කළේය.

කුමරා එහි ගොස් සිප්සතර හදාරා ගුරුන් විසින් දෙන ලද පංචායුධය ගෙන ගුරුන් වැඳ තක්සලා නුවරින් නික්ම පාංචායුධයෙන් සැරසී බරණැස් නුවර මඟට පිවිසියේය. එතුමෝ අතරමඟ සිලෙසලෝම නම් යකකු විසින් අරක් ගන්නා ලද වනයකට පැමිණියහ. වන මුවෙහි සිටි මිනිස්සු එතුමන් දැක පින්වත් තරුණය, මේ වනයට නො පිවිසෙනු මැනව. මෙහි ඇලෙන ලොම් ඇති යකකු ඇත. ඔහු දුටු දුටු මිනිසුන් මරතැ යි වැළකූහ.

එහෙත් බෝසත්හු තමා ම තර්ක කරමින් නිර්භීත කේසර සිංහයකු සෙයින් වනයට පිවිසියෝ මය. බෝසතුන් වන මැදට පැමිණි කල්හි ඒ යක්‍ෂයා තල් ගසක් පමණ මැවී, කුළු ගෙයක් පමණ හිස හා පාත්‍රයක් පමණ ඇස් ඇතිව නෙළුම් අල මෙන් දළ දෙකක් මවා සුදු මුහුණින් හා ලප ඇති කුසින් යුතුව නිල්වන් අත් පා ඇත්තේ, බෝසතුන්ට තමා දැක්වීය. සිටුව, කොහි යන්නෙහි ද ? මගේ භෝජනය වෙහි යි කීය. එවිට බෝසත්හු, යක්‍ෂය, මම මගේ පමණ දැන මෙහි පිවිසියෙමි. ඔබ අප්‍රමාද ව මා වෙත ආ යුතුය. විෂ පොවන ලද මේ ඊයෙන් විද ඔබ මෙතැන ම හෙළමි යි තැති ගන්වා හලාහල විෂ පෙවූ ඊයක් මුදා හැරියේය. ඊය යකුගේ ලොම්වල ඇලිණි. මෙසේ නැවත විදින්නාහු, ඊ පණසක් මුදාහළහ. ඒ සියල්ල ලොම්වල ඇලිණි. එවිට යක්‍ෂයා ඇඟ කිළිපොලා සියලු ම ඊ පාමුල හෙළා බෝසතුන් වෙත පැමිණියේය.

බෝසත්හු නැවතත් යකු බිය ගන්වා කඩුව ගෙන පහරක් ගැසීය. තෙතිස් අඟලක් දික් වූ කඩුව යකුගේ ලොම්වල ම ඇලිණි. ඊළඟට බෝසත්හු උලෙන් පහර දුන්හ. එය ද යකුගේ ලොම්වල ම ගැළිණි. මුගුරෙන් පහර දුනි. එය ද ලොම්වල ඇලිණි. ඔහු ඇලෙන බව දැන බෝසත්හු යකු අමතා යක්‍ෂය, මම පඤ්චායුධ කුමාරයා බව ඔබ නො ඇසූ විරූ ද ? මා ඔබ අරක්ගත් මේ අඩවියට පැමිණියේ දුනු ආදී ආයුධ තකාගෙන නො වේ. තමා ගැන ම විශ්වාසය තබා පැමිණියෙමි. අද මම ඔබ අතින් තල සුණුවිසුණු කරන්නෙමි යි අධිෂ්ඨාන බව දක්වා ඝෝෂා කොට දකුණතින් පහරක් දුන්හ. අත ලොම්වල ඇලී ගියේය. මෙසේ වම් අතින් පහර දුන්හ. එය ද ඇලිණි. දකුණු පය ද වම් පය ද යක්‍ෂයාගේ ලොම්වල ඇලිණි. හිසින් යකු සුණුවිසුණු කරමි යි හිසින් පහර දුන්නේය. හිස ද ලෝම්වල ඇලිණි.

ඒ බෝසත්හු මෙසේ පස් තැනකින් ඔසවාගෙන පස් තැනකින් බැඳී යකුගේ සිරුරෙහි එල්ලෙමින් සිටිය ද අභීත ව අදීන ව සිටියහ. යක්ෂයා මෙසේ සිතීය. මොහු වනාහි නාම මාත්‍රයෙන් පුරුෂයකු නො වේ. පුරුෂ සිංහයෙකි. ශ්‍රේෂ්ඨ පුරුෂයෙකි. මා වැනි යකකු විසින් අල්ලාගත් කළ පවා තැති ගැස්මක් නැත්තේය. මේ මඟෙහි දී මරන ලද පුරුෂයන් අතර මෙවැනි එක් පුරුෂයකුවත් නො දුටු විරූය. මොහු බය නො වන්නේ කුමක් නිසාදැ යි ඇසීය. මානවකය, ඔබ බය නො වීමට හේතුව කුමක් ද ? යක්ෂය, මා බය වන්නේ කුමක් නිසා ද ? එක් අත් බවක් තුළ එක් මරණයක් නියතමැ යි. ඒ හැරත් මගේ කුස තුළ වජිර (දියමන්ති) ආයුධයක් ඇත. ඉදින්, මා අනුභව කරන්නෙහි නම් එම ආයුධය දිරවන්න නො හැකි වන්නෙහිය. ඔබගේ අතුනු බහන් කඩ කඩ වී මරණයට පත් කරන්නේය. එ සේ වත් ම අපි දෙදෙනා ම නසින්නෙමු. මම මෙකරුණින් බය නො වෙමි යි, මෙහි දී බෝසත්හු තම අභ්‍යන්තරයෙහි ඇති ඥානය නැමැති ආයුධය සඳහා කීහ.

ඒ අසා යක්ෂයා මෙසේ සිතී. මේ මානවකයා ඇත්තක් ම කියයි. මේ උතුම් පුරුෂාගේ සිරුරින් මුං පියල්ලක් පමණ වූ හෝ මස් කැබැල්ලක. මගේ කුස තුළ දිරවන්න නො හැකි වන්නේය. මොහු මුදා හරිමි යි, මරණ බයින් තැති ගත්තේ, බෝසතුන් මුදා හැර මානවකය, ඔබ උතුම් පුරුෂයෙකි. ඔබගේ මාංශ මම නුබුදිමි. ඔබ අද රාහු මුවින් මිඳුණු සඳ මෙන් මගේ අතින් මිදී නෑ මිතුර මඩුල්ල සතුටු කරමින් යව යි කීය.

ඉක්බිති, බෝසත්හු යක්ෂයාට කියන්නාහු, යක්ෂය, මම යමි. ඔබ පෙරත් අකුසල්කොට මෙරමා මස්, ලේ බුදින පරුෂ යකකු වී උපන්නෙහිය. දැනුත් ඔබ අකුසල් ම කරන්නෙහිය. අඳුරෙන් අඳුරට ම යන්නෙහිය. මා හමුවූ මේ මොහොතේ සිට ඔබට පව් කළ නො හැකිය. පර පණ නැසීම නම් අපාය, තිරිසන් භවය, ප්‍රේත භවය, අසුර කාය යන සිව් දුගතියෙහි උපදවයි. මිනිසුන් අතර උපන් තන්හි මඳ ආයු ඇත්තකු වේ. මේ ආදී ක්‍රමයෙන් ප්‍රාණඝාතාදී පස් දුසිරිතෙහි ආදීනව ද පන්සිල්හි අනුසස් ද දක්වා නොයෙක් කරණු ගෙනහැර දක්වා යකු බිය ගන්වා දම් දෙසා දමනයකොට පන්සිල්හි පිහිටුවා එම වන පියසෙහි ම පූජාවන් පිළිගන්නා දෙවියකු කොට සිහිනුවණින් වෙසෙන ලෙස අවවාදකොට වනයෙන් නික්මෙන්නාහු,

වන මුවෙහි සිටි මිනිසුන්ට තතු පහදා දී පඤ්චායුධයෙන් සැරසී බරණැස් නුවරට ගොස් මව්පියන් දැක පසු කාලයෙහි රාජ්‍යයෙහි පිහිටා දැහැමින් රාජ්‍යය කරන්නාහු, දානාදී පිං කම්කොට කම් වූ පරිදි මිය ගියහ. බුදුරජහු ද මේ ජාතක ධර්ම දේශනාව ගෙනහැර දක්වා සම්බුදු වූ සේක්, මේ ගාථාව වදාළහ.

"යො අලීනෙන චිත්තෙන අලීනමනසෝ නරො
භාවෙති කුසලං ධම්මං යොගක්ඛෙමස්ස පත්තියා
පාපුණෙ අනුපුබ්බෙන සබ්බ සංයොජනක්ඛයන්ති"

"නිවන සඳහා යොමු වූ උදාර අදහස් ඇති යම් මිනිසෙක් නොපසුබට සිතින් යොගක්ඛෙම නම් වූ නිවනට පැමිණීම සඳහා කුසල ධර්ම වඩයි ද, හෙතෙම පිළිවෙළින් සියලු සසර බැම් නැති කරන රහත් ඵලයට පැමිණෙයි."

එහි පිණ්ඩාර්ථය කැටිකොට ගත් අර්ථය නම් "යො" යම් පුරුෂයෙක්, "අලීනෙන" නො පසුබට, "චිත්තෙනති" ස්වභාවයෙන් ම වීර්යයවත් වූ සිත් ඇත්තේ, උදාර අදහස් ඇත්තේ වී නිවැරදි යන අරුතින් "කුසලං" කුසල නම් වූ සත් තිස් බෝධිපාක්ෂික නම් "ධම්මං භාවෙති" දහම් වඩයි ද නො හැකුලුණු සිතින් විදසුන් වඩයි ද සිව් වැදෑරුම් යෝගයෙන් නිර්බය වූ නිවනට පැමිණීම සඳහා ඔහු සියලු සංඛාරයන් අනිච්ච, දුක්ඛ, අනත්ත යන ත්‍රිලක්ෂණයට නඟා ශක්තිමත් විදසුනෙහි පටන් අත්වන බෝධිපාක්ෂික ධර්ම වඩා, "අනුපුබ්බෙන" පිළිවෙළින් එක සංයෝජනකුදු ඉතිරි නො කොට නැති කරන සිව් වැනි මාර්ග ඥානය කෙළවර උපන් බැවින් "සබ්බ සංයොජනක්ඛයන්ති" සියලු සංස්කාර බන්ධන කෙළවර කිරීම නම් වූ රහත් බවට පැමිණෙන්නේය.

මෙසේ බුදුරජහු රහත් බවෙන් දේශනාව කෙළවරකොට සිව්සස් දෙසූහ. සිව්සස් කෙළවර ඒ භික්ෂුව රහත් බවට පත්විය. මෙසේ උන්වහන්සේ අනුසන්ධි ගළපා ජාතකය නිම කළහ. එදා යක්ෂයා අංගුලිමාල විය. පංචායුධ කුමාරයා මම ම වීමි.

1. 6. 6.

## කඤ්චනක්ඛන්ධ ජාතකය

"යො පහටෙඨන චිතෙතනා" මේ ජාතක දේශනාව බුදුරජහු දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, එක්තරා භික්ෂුවක් අරබයා දෙසූහ. සැවැත් නුවර වැසි කුල පුත්‍රයෙක් බුදුරජුන්ගේ දහම් අසා බුදුසසුනට බැතිමත්ව පැවිදි විය. ඔහුගේ ආචාරිය උපාධ්‍යාය වරු ශීලය හඳුන්වා දෙන්නාහු, අවැත්නි, ඒකාකාර ශීලය, දෙයාකාර ශීලය, තෙයාකාර ශීලය, සිව්, පස්, සය, සත්, අට, නව, දශාකාර ශීලය වශයෙන් ශීල බේද බොහෝ වේ. එ සේ ම මේ චුල්ල ශීලයය, මේ මජ්ඣිම ශීලයයි, මේ මහා ශීලයයි, මේ ප්‍රාතිමොක්ඛ සංවර ශීලයයි, මේ ඉන්ද්‍රිය සංවර ශීලයයි, මේ ආජීව පාරිශුද්ධි ශීලයයි, මේ පච්ච පටිසේවන ශීලයයි, ශීලය කියා දෙති. භික්ෂුව සිතන්නේ, මේ ශීලය ඉතා වැඩිය. මේ සියලු ශීල සමාදන්ව රැකීමට මම අසමත් වෙමි. ශීලය පුරන්න නො හැක්කෙමි. පැවිදි ව කවර ඵලයක් ද ? මම ගිහි වී දානාදී පිං කරන්නෙමි. අඹුදරුවන් පෝෂණය කරන්නෙමි. මම මෙසේ සිතා ස්වාමීනි, මම සිල් රකින්ට නො හැකි වෙමි. නො හැකිවන්නට පැවිද්දෙන් කවර අර්ථයක් ද ? ගිහි වෙමි. ඔබගේ පාසිවුරු ගනු මැනවැ යි කීය.

එසේ නම් ඇවැත්නි, බුදුරජුන් වැඳ යන්නැ යි ඔහු රැගෙන බුදුරජුන් හමුවෙහි දම් සබාවට ගියහ. බුදුරජහු දුරදී ම දැක මහණෙනි, අකැමැති භික්ෂුවක් බලයෙන් රැගෙන ආවහුදැ යි වදාළහ. ඔහු පිළිබඳ ස්වාමීනි, මේ භික්ෂුව මම සිල් රැකීමට නො හැකිවන්නෙමි යි සිවුරු පවරා දෙයි. එවිට අපි ඔහු රැගෙන ආමු. මහණෙනි, ඔබ කුමක් නිසා මේ භික්ෂුවට බොහෝ සිල් කියා දෙන්නාහු ද ? යම් පමණක් මේ භික්ෂුව රකින්න හැක්කේ ද එපමණක් ම රකින්නේය. මෙතැන් පටන් ඔබ කිසිවත් නො කියන්න. මම මෙහි දී කළයුත්ත දන්නෙමි. එව මහණ, ඔබට බොහෝ සිල් අවශ්‍යය නැත. සිල් තුනක් පමණක් රකින්න හැකි ද ? හැකිය ස්වාමීනි., එ සේ නම් ඔබ මෙතැන් පටන් කාය ද්වාරය, වචී ද්වාරය, මනෝ ද්වාරය යන ද්වාර තුන රැක ගන්න. කයින් පව් නො කරන්න. වචනයෙන් මනසින් නො කරන්න. දූත් යන්න. සිවුරු නො හරිනු. මෙම සිල් තුන පමණක් ම රක්ව.

ඒ භික්ෂුව තුටු සිත් ඇත්තේව මැනවි ස්වාමීනි, මේ තුන් සිල් රකින්නෙමි යි බුදුරජුන් වැඳ ආචාර්ය උපාධ්‍යායන් සමග ම ගියේය.

ඒ භික්ෂුව මේ තුන් ශීලය පුරන්නේ ම අවබෝධ විය. මගේ ආචාර්ය උපාධ්‍යායන් මට කියා දුන් ශීලය ද මෙපමණයැ යි ඔවුහු බුදු නො වූ නිසා මට අවබෝධ කැරවීමට අසමත් වූහ. බුදුරජහු තමා උත්තරීතර ධර්ම රාජ වන බැවින් බුදු නුවණින් ඒ විවිධ වූ ශීලය තුන් දොරට ඇතුළත්කොට නියම කැරවූහ. බුදුරජහු ඒකාන්තයෙන් මට පිහිට වූහ යි විදසුන් වඩා කිහිප දිනක් ඇවෑමෙන් රහත් බවෙහි පිහිටියේය.

මේ පුවත දැන දම් සබාවෙහි රැස් වූ භික්ෂූහු ඇවැත්නි, ඒ භික්ෂුව බොහෝ සිල් රකින්න නො හැකිමි යි ගිහි වීමට සැරසුණු කල්හි සියලු ම සිල් තුන් කොටසකට ඇතුළත්කොට ගන්වා බුදුරජහු රහත් බවට පත් කළහ. අහෝ බුදුවරු නම් මහත් අසිරිමත් මනුෂ්‍යයෝයැ යි බුදුගුණ කියමින් හුන්හ. බුදුරජහු වැඩ මහණෙනි, දැන් කවර කථාවෙකින් හුන්නහුද යි විමසූහ. මෙබඳු කථාවෙනු යි කී කල්හි, විශාල ම බරක් වුව ද කොටස් වශයෙන් බෙදා දුන් විට සැහැල්ලු මෙන් දැනේ. පෙර ද නුවණැත්තෝ මහා රන් කඳක් එසවීමට නො හැකි කීහ. කොටස්කොට පහසුවෙන් ඔසවා ගියහ යි වදාරා ඉකුත් කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු එක් කුඩා ගමක ගොවියෙක් වූයේය. ඔහු දිනක් අත්හළ කුඩා කුඹුරක් සී සෑය. පෙර ඒ ගමෙහි ධනවත් සිටුවරයෙක් කළවා පමණ මහත් සිව් රියනක් දිග රන් කඳක් කුඹුරෙහි නිදන්කොට කලුරිය කළේය. එහි බෝසතුන්ගේ නගුල පැටළුණේය. බෝසත්හු ඒ මුල් ගොඩක් විය යුතුයැ යි සිතා පස් ඉවත් කරන්නේ, එය දැක පසින් වසා දවස ම සී සා හිරු බැස ගිය කල්හි ගොන් නගුල් ආදිය පසෙකින් තබා රන් කඳ ගෙන යන්නෙමි යි එසවීමට අසමත්ව පසෙක හිඳ සිතූහ. මෙපමණක් ජීවන වියදම් සඳහාය. මෙපමණක් නිදන්කොට තබමි. මෙපමණක් කර්මාන්ත සඳහා යොදමි. මෙපමණක් දානාදී පිං කම් සඳහා වන්නේයැ යි සතර කොටසට බෙදූහ. මෙසේ බෙදූ කල්හි රන් කඳ සැහැල්ලු විය. බෝසත්හු එය ඔසවා ගෙට

ගෙන ගොස් කොටස් හතරකට බෙදා දානාදී පිං කම්කොට කම් වූ පරිදි මිය ගියහැ යි. බුදුරජහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා සම්බුදු වූ සේක් ම, මේ ගාථාව වදාළහ.

**"යො පහටෙඨන චිත්තෙන පහට්ඨමනසො නරො**
**භාවෙති කුසලං ධම්මං යොගක්ඛෙමස්ස පත්තියා**
**පාපුණෙ අනුපුබ්බෙන සබ්බ සංයොජනක්ඛයන්ති"**

"යෝගක්ෂේමයට හෙවත් නිවනට පැමිණෙනු සඳහා දුරුකළ නීවරණයන් ඇති සිතින් (එහෙයින් ම) නිර්මල වූ සිත් ඇති යම් මනුෂ්‍යයෙක් කුශල ධර්මයන් වඩා ද හෙතෙමේ සියලු සංයෝජනයන්ගේ ක්‍ෂයයට හෙවත් රහත් ඵලයට පිළිවෙළින් පැමිණෙයි."

එහි, **"පහටෙඨනාති"** විවෘත වූ, **"පහට්ඨමනසොති"** එම විවෘත වූ සතුටු වූ සිත් ඇත්තේ ස්වර්ණයක් මෙන් පැහැද දිදුලන ප්‍රභා සම්පන්න සිත් ඇත්තකු වී යන අර්ථයි.

මෙසේ බුදුරජහු රහත් බවෙන් කුළු ගන්වා මේ දේශනාව නිමවා අනුසන්ධි ගළපා ජාතකය නිම වූ සේක. එකල රන් කඳ ලැබූ පුරුෂයා නම් මම ම වීමි.

## 1. 6. 7.

## වානරින්ද ජාතකය

**"යස්සෙතෙ චතුරො ධම්මාති"** යන මේ ජාතක දේශනාව බුදුරජහු වේළුවනාරාමයේ වැඩ වාසය කරන සේක්, දෙව්දත් තෙරුන්ගේ ඝාතන ප්‍රයත්නයක් අරබයා දෙසූහ. එසමයෙහි බුදු රජහු

දෙව්දත් තමා මැරීමට උත්සාහ කරතැ යි අසා මහණෙනි, දෙව්දත් මා මැරීමට උත්සාහ කළේ දැන් පමණක් නො වෙයි. පෙරත් උත්සාහ කෙළේ මය. එහෙත් තැති ගැන්වීම් පමණකුදු කිරීමට ඔහු අසමත් වීයැ යි වදාරා ඉකුත් වත දෙසූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කරවන කල්හි බෝසත් තෙම වඳුරු යෝනියේ ඉපදී වැඩිවියට පත්ව අශ්ව පෝතකයකුගේ ප්‍රමාණ ශක්ති සම්පන්න වූයේ ඒකචාරී ව ගංතෙර වාසය කරයි. ඒ ගඟෙහි මැද කුඩා දූපතක් නොයෙක් ආකාර අඹ, කොස් ආදී ගෙඩි සහිත ගස්වලින් යුක්ත වූයේය. බෝසත් තෙම ඇත් බල ඇත්තේ ශක්ති සම්පන්න වූයේ ගඟේ මෙගොඩ සිට උඩ පැන ගඟ මැද එක් ගල් තලාවක් මතට එක්වර ම පනී. එතැනින් උඩ පැන ඒ දූපතට පනියි. එහි නොයෙක් ආකාර පලතුරු කා සවස ඒ ක්‍රමයට ම ආපසු ඇවිත් තමාගේ වාස ස්ථානයේ වාසයකොට දෙවැනි දවසෙත් එ සේ ම කරයි. මේ ක්‍රමයට එහි වාසය කරයි.

එකල එක් කිඹුලෙක් තම අඹුව සමග ඒ ගඟෙහි වාසය කරයි. ඔහුගේ ඒ බිරිඳ එහා මෙහා යන බෝසතුන් දැක බෝසත්හුගේ හෘදය මාංශය ගැන දොළ දුකක් උපදවාගෙන කිඹුළාට කීවාය. හිමියනි, මට වනාහි, මේ වඳුරාගේ හෘදය මාංශය පිළිබඳ දොළක් උපන්නේය. කිඹුලා යහපත සොඳුරිය, ලබන්නීයැ යි කියා අද සවස ඌ කුඩා දූපතෙන් එන ගමන් ම අල්ලා ගන්නෙමි යි ගොස් ගල් තලාව මත හොත්තේය.

බෝසත් තෙම, දවසේ සැරිසරා සවස් කාලයෙහි කුඩා දූපතේ සිටිමින් ගල්තලාව බලා මේ ගල දැන් උස්ව පෙනෙයි. කුමන කාරණයක් නිසාදැ යි සිතුවේය. එහි වනාහි ජලය ප්‍රමාණය ද ගල් තලාවේ ප්‍රමාණය ද මනාව පිහිටි පරිදි ම වෙයි. ඒ නිසා මොහුට මෙබඳු අදහස් විය. අද මේ ගඟෙහි ජලය අඩු නො වෙයි. වැඩෙන්නේ ද නැත. එ සේ නමුත් මේ ගල් තලාව ලොකු වී පෙනෙයි. කෙසේ හෝ මෙහි මා අල්ලා ගැනීමට කිඹුලෙක් හොත්තේ වෙයි. ඔහු විමසන්නෙමි යි එහි ම සිට ගල සමග කථා කරන්නාක් මෙන් එම්බා ගල, කියා පිළිතුරක් නො ලබන්නේ තුන් වරක් දක්වා ගලයැ යි කීවේය. කිම, ගල පිළිතුරක් දෙයි ද ? නැවතත් ගලට

වදාරා කිම, එම්බා ගල, අද මට පිළිතුරක් නො දෙන්නේද යි කීවේය.

කිඹුලා අන් දිනවල ඒකාන්තයෙන් මේ ගල වඳුරාට පිළිතුරු දුන්නේය. දැන් මොහුට පිළිතුරක් දෙන්නෙමි යි සිතා කිම, පින්වත් වඳුර රජ යි කීවේය. නුඹ කවරෙක් ද ? මම කිඹුලෙක්මි. කුමක් සඳහා මෙහි හුන්නේද යි නුඹේ හදවත බලාපොරොත්තුවෙනි. බෝසත් තෙමෙ සිතුවේය. මට වෙන ගමන් මාර්ගයක් නැත. අද මා විසින් මේ කිඹුලා වංචා කළ යුතුයැ යි, ඉක්බිති, ඌට මෙසේ කීවේය. යහළු කිඹුලාණෙනි, මම ආත්මය නුඹට පරිත්‍යාග කරන්නෙමි. නුඹ කට දල්වාගෙන (විවරකොට) මා නුඹ සමීපයට ආ කල්හි ගන්නැ යි කිඹුලා කට විවර කළ කල්හි ඇස් පියවෙයි. හෙතෙම ඒ කාරණය නො සලකා කට විවර කෙළේය. ඉක්බිති, ඌගේ ඇස් වැසුණේය. හෙතෙම කට විවරකොට ඇස් පියාගෙන වැතුරුණේය. බෝසත් තෙමෙ එ සේ කළ බව දැන දූපතෙන් පැන ගොස් කිඹුලාගේ හිස පාගා එතැනින් පැන විදුලියක් මෙන් බබලන්නේ පර තෙර සිටියේය. කිඹුලා ඒ අසිරිය දැක මේ වඳුරු රජු විසින් ඉතා පුදුම ක්‍රියාවක් කරන ලද්‍ද යි සිතා එම්බා වඳුරු රජ, මේ ලෝකයෙහි කරුණු සතරකින් යුක්ත වූ පුද්ගලයා පස මිතුරන් මැඩලයි. ඒ කරුණු සියල්ල ඔබ තුළ ඇතැ යි සිතමි යි කියා මේ ගාථාව කීවේය.

**"යස්සෙතෙ චතුරො ධම්මා වානරින්ද! යථා තව,**
**සච්චං ධම්මො ධිතී චාගො දිට්ඨං සො අතිවත්තතීති"**

"වානරේන්ද්‍රය, වාක් සත්‍යය, පරීක්ෂා ඥානය, ධෛර්යය, ත්‍යාගය යන මේ සතර ධර්මයෝ (සතර ගුණයෝ) තට මෙන් යමකුට විද්‍යාමාන වෙද්ද හෙතෙමේ සතුරා ඉක්මවා යේ. (සතුරා මැඩ පවත්වයි.)"

එහි, "**යස්සෙතෙ**" යම්කිසි පුද්ගලයකුට, "**එතෙ**" දැන් කියයුතු දෙය ප්‍රත්‍යක්ෂ වශයෙන් දක්වයි, **චතුරො ධම්මා**" ගුණ ධර්මයෝ සතරකි, "**සච්චං**" වාක් සත්‍යය, මගේ ළඟට එමි යි බොරු නො කියා ආවේ වෙමි යි, මෙය ඔබගේ වාග් සත්‍යයයි. "**ධම්මො**" විමසුම් නුවණයි. මෙසේ කළ කල්හි මෙනම් ප්‍රතිඵලයක් වන්නේයැ යි, එය ඔබගේ

විමසුම් නුවණ වන්නේය. "ධිතී" නො සිඳුණු වීර්යයැ කියනු ලැබේ. මේ ගුණය ද ඔබට ඇත්තේය. "චාගො" ආත්ම පරිත්‍යාගයයි. ඔබ ආත්මය පරිත්‍යාගකොට මා ළඟට ආවෙහිය. එහෙත් මම ඔබ අල්ලා ගැනීමට නො සමත් වීමි. ඒ මගේ ම දෝෂයයි. "දිට්ඨන්ති" පස මිතුරාය. "සො අතිවත්තතීති" යම් පුද්ගලයකුට ඔබට මෙන් මේ ගුණ ධර්ම සතර ඇත්තේ ද හෙතෙම ඔබ මා ඉක්ම වූවාක් මෙන් තමාගේ පස මිතුරා ඉක්මයි. මැඩ පවත්වයි.

මෙසේ කිඹුලා බෝසතුන්ට ප්‍රසංසාකොට තමාගේ වාස ස්ථානයට ම ගියේය. බුදුරජහු මහණෙනි, දෙව්දත් මා නැසීමට උත්සාහ කළේ දැන් පමණක් නො වේ. පෙර ද උත්සාහ කළේ මයැ යි මේ දම් දෙසුම ගෙන හැර දක්වා අනුසන්ධි ගළපා ජාතකය නිමවූහ. එකල කිඹුලා නම් දෙව්දත්ය. ඔහුගේ බිරිඳ චිඤ්චා මානවිකාව වූවාය. වඳුරු රජ වනාහි මම ම වීමි.

## 1. 6. 8.

## තයෝධම්ම ජාතකය

"යස්ස එතෙති" යන මේ දේශනාව ද බුදු රජහු වේළුවනාරාමයෙහි වැඩ වසන සේක්, ඝාතන ප්‍රයත්නයක් ම අරබයා වදාළ සේක.

පෙර බරණැස නුවර බඹදත් රජු රජ කරද්දී දෙව්දත් වඳුරු යෝනියෙහි ඉපදී හිමවත් පෙදෙසෙහි වඳුරු රැළක් පරිහරණය කරන්නේ තමන් නිසා උපන් වඳුරු පොව්වන්ගෙන් වැඩිවියට පත් වූවෝ වඳුරු රැළ පරිහරණය කරති යි බියෙන් දතින් සපා ඔවුන්ගේ අණ්ඩ කෝෂ උපුටා දමයි. එකල බෝධි සත්ත්වයෝ ද එම වඳුරු නායකයා නිසා ම එක් වැඳිරිය කුසෙහි පිළිසිඳ ගත්හ. එකල්හි ඒ වැඳිරිය ගැබ පිහිටි බව දැන ගැබ රැක ගන්නී, වෙනත් පර්වත

පාදයකට ගියාය. පිරිපුන් ගැබ් ඇති ඇය බෝසතුන් වැදූවාය. හෙතෙම වැඩිවියට පැමිණ නුවණ ඇති වූයේ ශක්ති සම්පන්න වූයේය. බෝසත්හු එක් දවසක් මවගෙන් මෙසේ විචාළහ. මෑණියනි, මගේ පියා කොහි ද ? දරුව, අසවල් පර්වත පාදයෙහි වඳුරු රැළ පාලනය කරමින් වාසය කරයි. මෑණියනි, එ සේ නම් මා ඔහු වෙත පමුණුවනු මැනවි. දරුව, පියා වෙත පැමිණිවිය නො හැකිය. එහි ගිය විට ඔබගේ පියා තමා නිසා උපන් වානර පොව්වන් රළ පාලනය කරති යි බියෙන් දතින් සපා අණ්ඩ කෝෂ කඩා දමයි. මෑණියනි, මා ඔහු වෙත පමුණුවනු මැනවි. මම කළ යුත්ත දනිමි.

වැදිරිය පුත්‍රයා රැගෙන ඔහු වෙත ගියාය. ඒ වඳුරු නායකයා තමාගේ පුතා දැක මොහු වැඩිවිය පත් කල්හි මට වඳුරු රැළ පාලනය කිරීමට ඉඩ නො දෙයි. දැම්ම ඔහු බැහැර කළ යුතුයැ යි ඔහු, පුත්‍රයා වැළඳ ගන්නාක් මෙන් දැඩි සේ ගෙන දිවි තොර කරමි යි සිතා දරුව, එන්න, මෙතෙක් කල් කොහි ගියේ දැ යි බෝසතුන් වැළඳ ගන්නා මුවාවෙන් තෙරපීය. බෝසත්හු වනාහි ඇතකුගේ ශක්ති ඇත්තාහ. ඔහු ද වඳුරු නායකයා තෙරපීය. වඳුරාගේ ඇට බිඳෙනා ආකාරයට පත්විය. අනතුරුව ඔහුට මෙසේ සිතුණි. මොහු වැඩුණේ නම් මා මරන්නේය. ඊට පෙරාතුව ම කෙසේ හෝ මොහු මරන්නෙමි. ඔහුට මෙසේ සිතුණි. මේ ළඟ රාක්ෂයා අධිගෘහිත විලක් ඇත. එහි රකුසා ලවා මොහු විනාශ කරමි. ඉක්බිති, පුත්‍රයාට මෙසේ කීවේය. දරුව, මම දැන් මහල්ලෙක්මි. මේ වඳුරු රැළ ඔබට පවරා දෙමි. අද ම ඔබ රජ කරවමි. අසවල් තැන විලක් ඇත. එහි කුමුදු මල් දෙකක් ද උපුල් මල් තුනක් ද පියුම් මල් පහක් ද පිපේ. දරුව, එව. එයින් මල් ගෙන එව. පියාණෙනි, මැනවි. ගෙන එන්නෙමි. බෝසත්හු එහි ගොස් වහා විලට නො බැස අවට පිය සටහන් විමසන්නේ විලට බට පියවර ම දුටහ. ගොඩනැඟි පියවර නො දුටහ. ඔහු මේ විල රකුසකු විසින් අරක් ගත් විලක් විය යුතුයි. මගේ පියා මා මැරීමට නො හැකි වූ නිසා රකුසාට මා බිළි දෙනු කැමැත්තේ වන්නේය.

මම මේ විලට ද නො බසිමි. මල් ද ගනිමි යි වතුර නැති තැනකට ගොස් වේග ගන්වා උඩට පැන එතරට යන්ගේ දිය නැති අහසෙහි පිහිටියා වූ මල් දෙකක් ගෙන එතරට පැන්නේය. එතර සිට

මෙතරට එන්නේ ඒ අයුරෙන් ම මල් දෙකක් ගත්තේය. මෙසේ දෙපසෙහි රැස් කරන්නේ මල් ද ගත්තේය. රකුසාගේ අණසකට යටත් වූ ප්‍රදේශයට නො බැස්සේය. ඉක්බිති, ඒ මල් ගෙන එක් තැනකට රැස් කරන කල්හි ඒ රකුසා මම මෙතෙක් කලකට මෙබඳු වූ නැණවත් අසිරිමත් පුරුෂයකු නුදුටු විරුය. ඔහු විසින් මල් ද කැමති තාක් ගන්නා ලදී. මගේ අණ පවතින අඩවියට ද නො බැස්සේයැ යි ජලය දෙබෑකොට ජලයෙන් උඩට අවුත් බෝසතුන් වෙත එළඹ වඳුරු රජතුමනි, මේ ලෝකයෙහි යමකුට ධර්ම තුනක් ඇත්තේ ද ඔහු සියලු සතුරන් මැඩ පවත්වයි. ඔබගේ ඇතුළත මේ සියලු ගුණ ධර්ම ඇතැ යි සිතමි යි, කියා බෝසතුන්ට ස්තුති කරමින් මේ ගාථාව කීවේය.

"යස්ස එතෙ තයො ධම්මා වානරින්ද යථා තව
දක්ඛියං සූරියං පඤ්ඤා දිට්ඨං සො අතිවත්තතීති"

"වානරය, දක්ෂතාවය ද නිර්බය භාවය ද උපාය
කෞශල්‍යය ඥානය ද යන මේ ත්‍රිවිධ ධර්මයෝ තමාට
මෙන් යමකුට ඇත් ද හෙතෙම සතුරා ඉක්මවා යේ."

එහි, "දක්ඛියන්ති" හැකි බව, පැමිණි බව, නැති කිරීමට දන්නා වූ නුවණින් යුක්ත ඇත්තාට මේ නමකි. "සූරියන්ති" ශූර භාවය, බිය නැති භාවයට මේ නමකි. "පඤ්ඤාය" කටයුතු පනවන්න නිසි වූ තැනට සුදුසු වූ නුවණට මේ නමකි.

මෙසේ ඒ දිය රකුසා මේ ගාථාවෙන් බෝසතුන්ට ස්තුතිකොට මේ මල් කුමක් සඳහා ගෙන යන්නෙහිදැ යි විචාළේය. මගේ පියා මා රජ කැරවනු කැමැත්තේහි, මේ මල් ඒ සඳහා ගෙන යමි. ඔබ වැනි වූ උතුම් පුරුෂයකු විසින් මල් ගෙන යාම සුදුසු නො වෙයි. මම ගනිමි යි මල් ඔසවා ගෙන ඔහුගේ පසු පස ගියේය. ඉක්බිති, ඔහුගේ පියා දුර දී ම ඔහු දැක මම මොහු රකුසාට ගොදුරු වන්නේයැ යි යැවීමි. හේ දැන් රකුසා ලවා මල් ගෙන්වා ගෙන එයි. දැන් මම නටුරෙමි වෙමි යි සිතත් ම හදවත හත් කඩකට පැලී එහි ම මරණයට පත්විය. සෙසු වඳුරෝ රැස්ව බෝසතුන් රජ කළහ.

බුදු රජහු මේ දම් දෙසුම ගෙන හැර දක්වා අනුසන්ධි ගළපා නිමවූහ. එදා වඳුරු නායකයා දෙව්දත් විය. ඔහුගේ පුත්‍රයා මම ම වීමි.

## 1. 6. 9.

## භේරිවාද ජාතකය

"ධමෙ ධමෙති" යන මේ දේශනාව බුදු රජාණන් වහන්සේ දෙව්රම් වෙහෙරෙහි වැඩ වෙසෙන්නේ, එක්තරා අකීකරු භික්ෂුවක් අරබයා වදාළ සේක. ඒ භික්ෂුවගෙන් බුදුරජහු ඇත්ත ද ? මහණ, නුඹ අකීකරුද්ද යි විමසා, ස්වාමීනි, ඇත්තැ යි කී කල්හි මහණ, නුඹ දැන් පමණක් නොව අකීකරු වූයේ පෙරත් අකීකරු වූයේයැ යි වදාරා අතීතය ගෙනහැර දක්වූ සේක.

යටගිය දවස බරණැස් නුවර බඹදත් රජු රජ කරද්දී බෝසත්හු බෙර වයන කුලයෙහි ඉපදී කුඩා ගමක වසයි. හෙතෙම බරණැස් නුවර නැකත් සැණකෙළියට සෝෂා කළායැ යි අසා රඟහලේ දී බෙර වයා ධනය ගෙන එන්නෙමි යි පුතා රැගෙන එහි ගොස් බෙර වයා බොහෝ ධනය ලැබීය. එය රැගෙන තමන්ගේ ගමට යන්නේ සොරුන් ගැවසෙන වනයකට පැමිණ නිතර බෙර වයන පුත්‍රයා වැළක්වීය. දරුව, නිරතුරු වාදනය නො කොට මඟට පිළිපන් ඉසුරුමතුන් වෙනුවෙන් වයන බෙරයක් මෙන් වරින් වර වාදනය කැරව. පියා විසින් වළක්වනු ලබද්දීත් බෙර හඬින් ම සොරුන් පලවා හරිමි යි කියා නිරතුරුව ම වාදනය කළේය. සොරු පළමුකොට ම බෙර හඬ අසා ඉසුරුමතුන් සඳහා වයන බෙරයක්යැ යි සලකා පලා ගොස් මේ බෙර ශබ්දය නිරතුරුව ම අසා ඉසුරුමතුන්ගේ බෙර හඬ නො වේයැ යි අවුත් විමසා දෙදෙනකු පමණක් දැක ඔවුන් පෙලා ධනය පැහැර ගත්හ. බෝසත්හු අප මේ ධනය ලද්දේ මහත් ආයාසයෙනි. නිරතුරුව බෙර වාදනය නිසා ධනය විනාශ කළේයැ යි කියා මේ ගාථාව කීහ.

"ධමෙ ධමෙ නාතිධමෙ අතිධන්තං හි පාපකං
ධන්තෙන සතං ලද්ධං අතිධන්තෙන නාසිතන්ති"

"බෙර වයන්න. බෙර වයන්න. (ප්‍රමාණය ඉක්මවා) අතිසයින් නො වයන්න. නිරන්තරයෙන් බෙර වැයීම ලාමකය. (අනර්ථය) බෙර වයන්නහු විසින් කහවණු සියයක් ලබන ලද ද (කාලය නො බලා) නිරන්තරයෙන් බෙර වයන්නාහු විසින් නසන ලදී."

එහි, "ධමෙ ධමෙති" වාදනය කරන්නෙහිය, වාදනය නො කොට නො සිටින්නේය, යන අර්ථයි. "නාතිධමෙති" පමණ ඉක්මවා නිරතුරුව ම වාදනය නො කරන්නේය. කුමක් නිසා ද යත්, " අතිධන්තං හි පාපකං" නිරතුරු බෙර වාදනය දූන් අපට පව්වු විය. "ධන්තෙන සතං ලද්ධං" නගරයෙහි බෙර වැයීම නිසා කහවණු සියයක් ලබන ලදී. "අතිධන්තෙන නාසිතන්ති" දූන් වනාහි මගේ පුත්‍රයා විසින් මගේ වචන නො අසා වනයෙහි නො කඩවා වාදනය කරන ලදී. ඒ නිරතුරු වාදනය නිසා සියල්ල නසන ලදීය. බුදුරජහු මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා ජාතක දේශනාව නිම කළහ. එකල පුත්‍රයා අකීකරු භික්‍ෂුව විය. පියා වනාහි මම ම වීමි.

## 1. 6. 10.

## සඞ්ඛධමන ජාතකය

"ධමෙ ධමෙති" යන මේ දේශනාව බුදු රජහු ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, අකීකරු වූ භික්‍ෂුවක් අරබයා වදාළ සේක.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කරද්දී බෝසත්හු සක් පිඹින කුලයෙහි ඉපදී බරණැස් නුවර නැකත් සැණකෙළිය ප්‍රචාරය

වූ කල්හි පියා රැගෙන සක් පිඹීමේ ක්‍රියාවෙන් ධනය ලැබ එන කල්හි සොරු ගැවසෙන කැලයෙහි දී පියා විසින් නිරතුරුව සක් පිඹීම වළක්වන ලදී. හෙතෙම සක් හඬින් සොරුන් පලවා හරින්නෙමි යි නිරතුරුව ම පිම්බේය. සොරු පෙර පරිදි ම අවුත් ධනය පැහැර ගත්හ. බෝසත්හු පෙර පරිදි ම ගාථාව කීහ.

"ධමෙ ධමෙ නාතිධමෙ අතිධන්තඤ්හි පාපකං
ධන්තේනාධිගතා භොගා තෙ තාතො විධමී ධමන්තී"

"සක් පිඹින්නේය. සක් පිඹින්නේය. (කල් නො බලා) අධිකකොට නො පිඹින්නේය. අධිකකොට පිඹීම ලාමකය. (අනර්ථය) සක් පිඹින්නාහු විසින් භෝගයෝ ලබන ලදහ. (අපගේ) පියා නැවත සක් පිඹින්නේ ඒ භෝගය විනාශ කෙළේය."

එහි, "තෙ තතො විධමී ධමන්තී" ඔවුන් සක් පිඹ ලබන ලද ධනය මගේ පියා නැවත නැවත පිඹින්නේ, "විධමීති" පිඹී විනාශ කළේය. බුදුරජහු මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා අනු සන්ධි ගළපා ජාතකය නිමවා වදාළ සේක. එදා පියා අකීකරු භික්ෂුවයි. පුතා වනාහි මම ම වෙමි.

සවැනි ආශංසන වර්ගයයි.

## 1. 7. 1

## අසාතමන්ත ජාතකය

"අසා ලොකිත්ථියො නාමාති" යන යන මේ දේශනාව බුදුරජනු ජේතවනාරාමයෙහි වැඩ වසන සේක්, උකටලී භික්ෂුවක් අරබයා වදාළහ. එහි කථාව උම්මදන්ති ජාතකයෙහි මතු සඳහන් වන්නේය. ඒ භික්ෂුවගෙන් බුදුරජනු මහණ, ස්ත්‍රීහු නම් වංක ගති ඇත්තෝය. ඔවුන්ගෙන් සැප නැත්තෝය. කෙළවර සිටින්නෝය. තුඹ මෙවැනි පහත් ගති ඇති ස්ත්‍රියක නිසා කුමකට කලකිරුණේද යි වදාරා අතීත කථාව ගෙනහැර දක්වූ සේක.

යටගිය දවස බරණැස් නුවර බඹදත් රජු රජ කරද්දී බෝසත්හු ගන්ධාර රට තක්ෂලාවෙහි බමුණු කුලයක ඉපද වැඩිවියට පත්වූවෝ, තුන් වේදයෙහි ද සියලු ශිල්පයන්හි ද කෙළවරට පැමිණියාහු, දිසාපාමොක් ඇදුරු වූහ. එකල බරණැස් නුවර බමුණු කුලයක පුතකු උපන් දිනයෙහි ගිනි දල්වා නො නිවෙන සේ තැබූහ. ඉන්පසු ඒ බමුණු කුමරා සොළොස් වියට පැමිණි කල්හි මව්පියෝ මෙසේ කීහ. පුත්‍රය, අපි ඔබ උපන් දිනයේ ගිනි දල්වා තැබුවෙමු. ඉදින්, ඔබ බඹලොව යනු කැමැති නම් ඒ ගිනි ගෙන වනයට පිවිස ගිනි දෙවියන් නමදිමින් බඹලොවට යව. ඉදින්, ගිහි ගෙයි වසනු කැමැති නම් තක්සලාවට ගොස් දිසාපාමොක් ඇදුරුතුමා ළඟ ශිල්ප හදාරා පවුල් ජීවිතය සකසනු මැනවි. මානවකයා මට වනයෙහි ගිනි පිදීමට නො හැක්කෙමි. ගෘහ ජීවිතය ම සකස් කැර ගනිමි යි මව් පියන් වැඳ ගුරු පඬුරු වශයෙන් දහසක් ගෙන තක්සලාවට ගොස් සිප් සතර හදාරා ආපසු ආවේය. මව්පියෝ ඔහුට ගිහි ගෙයින් වැඩක් නැත. වනයෙහි ගිනි දෙවියන් පුදවනු කැමැත්තෝ වූහ. ඉක්බිති, ඔහුගේ මව ස්ත්‍රීන්ගේ දොස් දක්වා වනයට යවනු කැමැත්තී, ඒ ඇදුරුතුමා නැණවත්ය, දක්ෂය, මගේ පුතුට ස්ත්‍රීන්ගේ දොස් දක්වීමට සමත් වන්නේයැ යි සිතා මෙසේ කීවාය. දරුව, ඔබ විසින් ශිල්ප හදාරන ලද්දේ ද ? මෑණියනි, එ සේය. දරුව, ඔබ විසින් අසාත මන්ත්‍රය හදාරන ලද්දේ ද ? නැත මෑණියනි, දරුව, ඔබ අසාත මන්ත්‍රය නො හදාළේ නම් කවර ශිල්පයක් හදාළේ ද ? යව, එය හදාරා එවයි. මානවකයා ද මැනවැ යි පිළිගෙන නැවත තක්සලා දිශාවට

ගියේය.

ඒ දිසාපාමොක් ඇදුරුතුමාගේ මව, මැහැළියකි. එකසිය විසි වයස් ඇත්තීය. ඒ ඇදුරුතුමා ඇය සියතින් නාවා කවමින් පොවමින් පිළිදගුම් කරයි. අනිත් මිනිස්සු මෙසේ කරන ඔහු පිළිකුල් කරත්. ඔහු මෙසේ සිතීය. මම වනයට පිවිස එහි දී මගේ මවට පිළිදහැම් කරමින් වසන්නේ නම් මැනවි. ඉක්බිති, ඔහු හුදෙකලා ජල පහසුව ඇති වන පියසක පන්සලක් කැරවා ගිතෙල් සහල් ආදිය ගෙන්වා මව ඔසවාගෙන එහි ගොස් මවට පිළිදගුම් කැරෙමින් වාසය කෙළේය.

ඒ මානවකයා ද තක්සලාවට ගොස් ගුරුතුමන් නො දක්නේ එතුමා කොහිද යි විචාරා එපවත් අසා, ඔහු වෙසෙන වන පියසට ගොස් වැඳ සිටියේය. එවිට ඇදුරු, දරුව, කුමක් නිසා ඉතා ඉක්මනින් ආපසු ආයෙහි ද ? ගුරුතුමනි, ඔබතුමා මට අසාත මන්ත්‍රය නො ඉගැන්නුවෙහිය. දරුව, අසාත මන්ත්‍ර ඉගෙන ගත යුත්තක්කොට ඔබට කියන ලද්දේ කවරෙක් ද ? ඇදුරුතුමනි, මගේ මවය. බෝසත්හු මෙසේ සිතුහ. ආසාත මන්ත්‍රයයැ යි දෙයක් නැත. මොහුගේ මව ස්ත්‍රී දෝෂයන් මොහුට දන්වනු කැමැති වූවා වන්නීය.

දරුව, මැනවි. මම ඔබට අසාත මන්ත්‍රයත් දෙමි. ඔබ අද සිට මගේ තැන සිට මගේ මව සියතින් නහවමින් කවමින් පොවමින් උවටැන් කැරව. ඇගේ අත්, පා, හිස, පිට පිරිමැදීම් ආදිය කරන කල්හි, ආර්යාවනි, වයස්ගත වූ පසුත් ඔබගේ මේ රූපය මෙසේ නම්තරුණ කාලයේ දී කෙබඳු වී ද ? එසේ ම අත් පා මෙහෙවර කරන කල්හි අත් පා ආදිය වර්‍ණනා කැරව. තව ද, ඒ අතර මගේ මව් යමක් කියන්නේ ද එය ද ලජ්ජා නො වී නො සඟවමින් මට කියව. මෙසේ කළ කල්හි අසාත මන්ත්‍ර ලබන්නෙහිය. එ සේ නො කළහොත් නො ලබන්නෙහියැ යි කීවේය. මානවකයා ඇදුරුතුමනි, මැනවැ යි ඔහුගේ වචනය පිළිගෙන එතැන් පටන් කියන ලද පරිදි ඒ සියල්ල කෙළේය.

ඉක්බිති, ඒ මානවකයා ඇය වර්ණනා කරනු ලබන කල්හි, මොහු මා සමග අභිරමණය කිරීමට කැමැති වන්නේය. අඳ වූ මහලු වූ ඇගේ සිත තුළ කෙලෙස් උපන්නේය. දිනක් ඕ තුමූ තමාගේ සිරුර

වණ්ණනා කරන මානවකයාගෙන් මෙසේ ඇසුවාය. ඔබ මා සමග රමණය කරන්න කැමැත්තෙහි ද ? ආර්යාවනි, මම නම් කැමැත්තෙමි. එහෙත් ගුරුතුමා වනාහි ගරු කළ යුත්තේය. ඉදින්, මා කැමැත්තේ නම් මගේ පුත්‍රයා මරව. මම ගුරුතුමා ළඟ මෙපමණ සිප්සතර හදාරා කෙලෙස් මාත්‍රයක් නිසා කෙසේ නම් ගුරුතුමා මරම් ද ? එ සේ නම් ඉදින්, ඔබ මා අත් නො හරින්නේ නම් මම ම ඔහු මරන්නෙමි.

මෙසේ ස්ත්‍රීහු නම් වංකය, පහත්ය, අන්තිමය, මෙබඳු වයසෙහි සිටියදීත් රාග සිත් උපදවා කෙළෙස් ගැතිව මෙබඳු උපකාරක පුත්‍රයා මරනු කැමැති වූවාය. මානවකයා ඒ සියලු පුවත් බෝසතුන්ට සැලකළේය. බෝසත්හු මානවකය, මට මෙම කරුණ දැන්වීම ඉතා යහපති යි කියා මවගේ ආයු ප්‍රමාණය බලන්නේ අද ම මියයන බව දැන මානවකය එනු මැනවි. ඇය විමසන්නේම් යි දිඹුල් ගසක් කපා තමාගේ ප්‍රමාණයට දැව රුවක්කොට හිසෙහි සිට පොරවා තමාගේ නිදන තැන උඩු බැල්ලෙන් තබවා රැහනකින් බැඳ අතවැසියාට මෙසේ කීහ. දරුව, පොරවක් ගෙන මගේ මවට ඉඟියක් දෙන්න. මානවකයා ගොස් ආර්ය මුනිතුමා පන්සලෙහි තමාගේ වසන ස්ථානයෙහි නිදා සිටීයි. රැහැන් සලකුණක් යොදා ඇත. මේ පොරව ගෙන ගොස් හැකි නම් ඔහු මරව යි කීවේය. එවිට මැහැලිය ඔබ මා අත් නො හරින්නෙහි ද ? මම කුමකට නුඹ අත් හරින්න ද ? ඕ පොරව ගෙන වෙවුලමින් නැගිට රැහන් සලකුනෙන් ගොස් අතින් පිරිමැද මේ මගේ පුත්‍රයා යන හැඟීමෙන් දැව රූපයේ මුහුණෙන් සළුව ඉවත්කොට පොරොවෙන් එක පහරින් ම මරන්නෙමි යි ගෙලට ම පහර දී 'ටං' යන ශබ්දය නිකුත් වූ කල්හි ලීයක් බව දැන ගත්තාය.

ඉක්බිති, බෝසත්හු මෑණියනි, කුමක් කරන්නෙහිදැ යි කී කල්හි රැවටෙන ලද්දී වෙමි යි එතැන ම මැරී වැටුණාය. එදින ඇය තමාගේ පන්සලෙහි නිදා සිටිය ද එකෙනෙහි මරණය සිදුවිය යුතුමය. බෝසත්හු ඇය මළ බව දැන මළ සිරුර පිළිබඳ ව කටයුතු කැර දර සෑය නිවා වන මලින් පුදා මානවකයා රැගෙන පන්සල් දොරටුවෙහි හිඳ, දරුව, වෙන ම අසාත මන්ත්‍රයක් නැත. අසාත නම් ස්ත්‍රීහුය. නුඹගේ මව අසාත මන්ත්‍ර ඉගෙනීම පිණිස මා වෙත එවන ලද්දේ ස්ත්‍රීන්ගේ දොස් දැන ගැනීම සඳහාය. දැන් වනාහි මගේ මවගේ මරණින් ඒ අසාත මන්ත්‍රයත් ප්‍රත්‍යක්ෂය වශයෙන් දක්නා ලදී.

මෙකරුණෙන් ස්ත්‍රීන් නම් වංකය පහත්යැ යි දැන ගනුව යි ඔහුට අවවාද දී පිටත්කොට හැරියේය. මානවකයා ද ගුරුතුමා වැද මව්පියන් සමීපයට ගියේය. ඉක්බිති, මව, දරුව, ඔබ අසාත මන්ත්‍ර ඉගෙන ගත්තෙහි ද ? එ සේය, මෑණියනි, දැන් ඔබ කුමක් කරන්නෙහි ද ? පැවිදි වී ගිනි පුදන්නෙහි ද ? නැතිනම් ගිහිගෙයි වසන්නෙහි ද ? එවිට මානවකයා, මෑණියනි, මා විසින් ප්‍රත්‍යක්‍ෂ වශයෙන් ස්ත්‍රීන්ගේ දොස් දක්නා ලදී. ගිහි ගෙයින් මට වැඩක් නැත. මම පැවිදි වන්නෙමි ය,. තමාගේ අදහස ප්‍රකාශ කරමින් මේ ගාථාව කීහ.

**"අසා ලොකිත්ථියො නාම වෙලා තාසං න විජ්ජති**
**සාරත්තා ච පගබ්භා ච සිඛී සබ්බඝසො යථා**
**තා හිත්වා පබ්බජිස්සාමි විවෙකමනුබ්‍රෑහයන්ති"**

"ලෝකයෙහි ස්ත්‍රීන් නම් ලාමකය. නොහොත් තමන් කෙරෙහි ඇලුණවුන්ට දුක් දෙන්නාහුය. ඔවුන්ට සීමාවක් නැත. සංරත්තයහ. ප්‍රගල්භයහ. සියල්ල කා දමන ගින්න මෙන් පුරුෂයන් විශේෂයෙන් සෙවුණාහ. ඔවුන් හැර විවේකය වඩන්නෙ මි පැවිදි වෙමි."

එහි, "අසාති" සැප නැත්තෝය, පහත් ගති ඇත්තෝය, නොහොත් "සාති" යන්නෙන් සැපය කියනු ලැබේ. ඒ සැපය ඔවුන් කෙරෙහි නැත. තමා පිළිබඳ සිත් ඇත්තවුන්ට දුක ම දෙන්නේහු, "අසාත" නම්. දුකය, දුකට හේතු වූවෝය යන අර්ථයි. මේ කාරණය තහවුරු කිරීමට මේ සූත්‍රය ගෙනහැර දැක්විය යුතුයි.

**"මායා චෙ සා මරීචීච සොකො රොගො චුපද්දවො**
**ඛරා ච බන්ධනා චෙතා මච්චුපාසො ගුහාසයො**
**තාසු යො විස්සසෙ පොසො සො නරෙසු නරාධමොති"**

"මේ ස්ත්‍රීන් මායාවකි. මිරිඟුවකි. ශෝකයකි. රෝගයකි. උවදුරකි. කෘෘර බන්ධනයකි. මොවුන් ගුහාවක වාසය කරන මළ පුඩුවකි. යම් කෙනෙක් ඔවුන් විශ්වාස කැරෙත් ද ඔවුහු මිනිසුන් අතර අධම මිනිස්සුය."

"ලොකිත්ථියොති" ලොවෙහි ස්ත්‍රීන්, "වෙලා තාසං න විජ්ජතීති" ඒ ස්ත්‍රීන්ට කෙලෙස් ඉපදීමක් වූ කල්හි වේලාවක් හෝ සංයමයක් හො සීමාවක් හෝ ප්‍රමාණයක් හෝ යන මේවා නැත. "සාරත්තා ච පගබ්භා චාති" ඔවුන්ට වේලාවක් නැත. පඤ්ච කාම සම්පතෙහි ඇලුනාහු, ගැලුනාහු, එ සේ ම කාය, වාක්, මනෝ යන ත්‍රිවිධ අසංවරයෙන් යුක්ත බැවින් මොවුහු "පගබ්භ" නම් වෙති. මොවුන් කෙරෙහි කාය ද්වාරාදියට පැමිණි සංවරයක් නම් නැත. කැඳර කපුටකුට සමානකොට දක්වයි. "සිඛී සබ්බඝසො යථාති" මැණියනි, යම් සේ ගිනි ජාලාවෙහි සිඛී නම් ගණයට ගියා වූ ගිනි සිළුව ද අසූචි ආදී වශයෙන් ප්‍රභේද වූ අපිරිසිදු දෙය ද ගිතෙල්, මී පැණි ආදී භේද වූ පිරිසිදු දෙය ද කැමැති දෙය ද අකැමැති දෙය ද යම් යම් දෙයක් ලබයි ද ඒ සියල්ල කා දමයි. එම නිසා "සබ්බඝථ" යැයි කියනු ලැබේ. එ සේ ම ඒ ස්ත්‍රීහු ඇත්, ගොවු, ගොපලු ආදීහු වේත්වා, හීන කුල ඇත්තෝ හෝ වේත්වා, හීන ක්‍රියා ඇත්තෝ හෝ වෙත්වා, රජ ආදීහු හෝ වෙත්වා, උසස් ක්‍රියා ඇත්තෝ හෝ වෙත්වා, උසස් පහත් බවක් නො සලකා කාමාශ්වාද වශයෙන් කෙලෙස් හැඟීම් ඇති වූ කල්හි යම් යම් අයකු ලබත් ද ඒ සියල්ලක්ම සේවනය කරත්. සියල්ල කා දමන ගිනි සිළුව මෙන් වෙත්. එහෙයින් මෙය ද ගිනි සිළුව යම් සේ ද එ සේයැ යි දත යුතුයි. "තා හිත්වා පබ්බජිස්සාමීති" මම ඒ පහත් වූ දුකට හේතු භූත වූ ස්ත්‍රීන් අත්හැර වනයට පිවිස තවුස් පැවිද්දෙන් පැවිදි වන්නෙමි. " විවෙකමනුබ්‍රෑහයන්ති" කාය, චිත්ත, උපධි වශයෙන් වෙන්වීම් තුනකි. එයින් මෙහි කාය විවේකය ද සුදුසුය. චිත්ත විවේකය ද සුදුසුය. මෙයින් කියන ලද්දේ, මැණියනි, මම පැවිදි ව තියුණු පිරිකම්කොට සමවත් අට උපදවා පස් අභිඥා උපදවා ගණයා කෙරෙන් කය ද ක්ලේශයන් කෙරෙන් සිත ද වෙන්කොට මේ ත්‍රිවිධ විවේකයන් වඩමින් බඹලොව බලා යන්නෙමි. මේ ගිහි ගෙයින් මට වැඩක් නැත. මෙසේ ස්ත්‍රීන්ට ගරහා මව්පියන් වැඳ පැවිදි ව කියන ලද ආකාරයෙන් විවේකය වඩන්නේ බඹලොව පිහිටකොට ඇත්තෙක් වූයේය.

බුදුරජහු ද මහණ, ස්ත්‍රීන් නම් වංකය, පහත්ය, දුක්ගෙන දෙන්නෝය. ගැහැනුන්ගේ අගුණ වදාරා සිව්සස් වදාළහ. සත්‍යය කෙළවර ඒ භික්ෂුව සෝවාන් ඵලයෙහි පිහිටියේය. මෙසේ බුදුරජහු අනුසන්ධි ගළපා ජාතකය නිමවා වදාළහ. එකල මව නම් කාපිලානී

චූවාය. පියා මහා කාශ්‍යප විය. අතවැසියා ආනන්දය. ගුරුහු වනාහි මම ම වීමි.

1. 7. 2.

## අණ්ඩභූත ජාතකය

"යං බ්‍රාහ්මණො ති" යන මේ දේශනාව බුදුරජහු දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන සේක්, කළකිරුණු භික්ෂුවක් අරබයා වදාළහ. බුදුරජහු එම භික්ෂුවගෙන් මහණ, ඔබ උකටලී වූයේද යි විචාරා සත්‍යයැ යි කී කල්හි, මහණ, ස්ත්‍රීහු නම් නො රැකිය හැක්කෝය. පෙර පඬිවරු ස්ත්‍රියක ගැබෙහි පටන් ආරක්ෂා කරන්නාහු, නමුදු රැකීමට නො හැකි වූහැ යි කියා ඉකුත් වත දක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කරන කල්හි බෝසත්හු ඔහුගේ අග මෙහෙසියගේ කුසෙහි පිළිසිඳ ගෙන නිසි වයසට පැමිණ සියලු ශිල්පයන්හි කෙළවරට පැමිණ පියාගේ ඇවෑමෙන් රාජ්‍යයෙහි පිහිටා දැහැමින් රාජ්‍යය කැරවූහ. හෙතෙම පුරෝහිතයා සමග දූ කෙළියෙහි යෙදෙයි. ක්‍රීඩා කරන විට,

**"සබ්බා නදී වංකගතා සබ්බේ කට්ඨමයා වනා**
**සබ්බිත්ථියො කරෙ පාපං ලභමානා නිවාතකෙති"**

"සියලු ගංගා ඇදේට ගලයි. සියලු වනයන් දැව මය.
සියලු ස්ත්‍රීහු ආවරණ ස්ථානයක් ලබන්නාහු, වරදෙහි
බැඳෙති."

මේ දූ කෙළි ගීය ගයමින් රිදී පුවරුවෙහි රන් පස කැට දමයි. මෙසේ ක්‍රීඩා කරන කල්හි රජතුමා හැම විට ම දිනයි. පුරෝහිතයා පරදියි. ඔහු ක්‍රමයෙන් ගෙදර සියලු ධනය වැය වී යන කල්හි මෙසේ

සිතීය. මෙසේ ගියහොත් මගේ ගෙදර සියලු ධනය වැය වන්නේය. පුරුෂයකු කරා නො ගිය මාගමක් සොයා මගේ නිවසෙහි රඳවා ගනිමි. මේ අතර ඔහුට මෙසේ සිතුණි. අන් පුරුෂයකු දුටු විරූ ස්ත්‍රියක රැකීමට නො හැක්කෙමි. මව් කුසෙහි පටන් එක් මාගමක් රැක ඇය නිසි වයසට පැමිණි කල්හි තම වසඟයට ගෙන එක් පුරුෂයකු පමණක් ඇත්තියක කරන්නේය. ඒ පුරෝහිතයා ශරීර වි|ාවෙහි දක්‍ෂයෙකි. ඉක්බිති, එක් දුප්පත් ගැබිනි ස්ත්‍රියක දැක ඇය දුවක වදන්නීයැ යි දැන ඇය වැදූ කල්හි ධනය දී පිටත් කැර යවා ඒ කුමරිය කිසි ම පුරුෂයකුට දැකීමට නො දී ගැහැනුන් අතට ම දී ඇති දැඩිකොට නිසි වයසට පත් කල්හි ඇය තමාගේ වසඟෙහි තැබීය. නිසි වයසට පත්වෙන තුරු රජු සමග දූ කෙළියෙහි නො යෙදුණේය. තමාගේ වසඟයට පත් කල්හි මහරජ, දූ කෙළියෙහි යෙදෙමු යි කීවේය. රජු මැනවැ යි පෙර මෙන් ම ක්‍රීඩා කෙළේය. රජු ගායනාකොට පසැට දමන කල්හි පුරෝහිතයා මගේ මෙනවිය හැරයැ යි කීය. එතැන් පටන් පුරෝහිතයා දිනයි. රජ පරදියි.

බෝසත්හු මොහුගේ නිවසෙහි එක් පුරුෂයකු ඇති එක ස්ත්‍රියක් විය යුතුයැ යි පරීක්‍ෂා කැරවා බලන්නේ, ඇති බැව් දැන ඇගේ ශීලය බිඳින්නෙමි යි එක් ධූර්තයකු කැඳවා පුරෝහිත බමුණාගේ බිරිඳගේ ශීලය බිඳ දැමීමට හැකිදැ යි ඇසීහ. හැකිවන්නෙමි යි දේවයන් වහන්ස, ඉක්බිති, ධනය දී එ සේ නම් වහා නිමවා පියව යි ඔහු යැවීය.

ඔහු රජුගෙන් ධනය රැගෙන සුවඳ, සුවඳ දුම්, වත්සුණු, කපුරු ආදිය ගෙන ඔහුගේ නිවස සමීපයෙහි සියලු සුවඳ වර්ගවලින් යුත් කඩයක් ඇරඹීය. පුරෝහිත බමුණාගේ ගෙය ද මහල් හතකි. දොරටු කොටු හතකින් යුක්ත වෙයි. සියලු ම දොරටු කොටුවල ස්ත්‍රීන් විසින් ම ආරක්‍ෂා කරන ලදී. පුරෝහිත බමුණා හැර වෙනත් පුරුෂයකුට ගෙට පිවිසීමට ලැබෙන්නේ නැත. කසල ඉවත දමන පැස පවා පරීක්‍ෂාකොට ම ගෙට ගනිති. පුරෝහිතයා ම ඒ මානවිකාව දැකීම ලබයි. ඇයට එක් මෙහෙකාර ස්ත්‍රියක් සිටියාය. ඉක්බිති, ඇයගේ ඒ මෙහෙකාර ස්ත්‍රිය සුවඳමල්, මුල් ගෙන යන්නේ එම ධූර්ථයාගේ අවන්හල ළඟින් යන්නීය. ඔහු ඇගේ සේවිකාවයැ යි නියම වශයෙන් දැන එක් දිනක් ඇය එනු දැක ම අවන්හලින් නැගිට ගොස් ඇගේ

පා මුල වැටී අත් දෙකින් ම පාගෙන මෑණියනි, මෙතෙක් කල් කොහි ගියාද යි හැඬීය.

ඉක්බිති, සෙසු පිරිවර ධූර්තයෝ ද එකක් පසක සිට අත්පා මුව සටහන් අනුව ද හැසිරීම් අනුව ද මව් හා පුතු එක සමානයැ යි කීවාහුය. ඒ ස්ත්‍රිය ද මෙසේ ඔවුන් කියන කල්හි තමන් නො අදහා මොහු මගේ පුතා වන්නේයැ යි අඬන්න පටන් ගත්තාය. ඒ දෙදෙනා ම හඬා වැළප ඔවුනොවුන් වැළඳගෙන සිටියහ. අනතුරුව ඒ ධූර්ථයා මෙසේ කීය. මෑණියනි, කොහි වසන්නෙහි ද ? දරුව, පුරෝහිතයාගේ කිඳුරි ලීලාවෙන් වසන්නා වූ රූපින් අගතැන් පත් ළාබාල ස්ත්‍රියට උවටැන් කරමින් වසමි. මෑණියනි, දැන් කොහි යන්නෙහි ද ? ඇයට සුවඳ මල් ආදිය ගෙන ඒමට යමි. මෑණියනි, අන් තැනකට යාමෙන් කවර ඵලයක් ද ? මෙතැන් පටන් මා වෙතින් ම ගෙන යනු මැනවි. මුදල් නො ගෙන ම බොහෝ බුලත්, කිතුල් ආදිය ද විවිධ මල් ද දුන්නේය.

මානවිකාව බොහෝ සුවඳ මල් ආදිය රැගෙන එනු දැක කිම, මෑණියනි, අද අපගේ බමුණා පැහැදුණේද යි කීවාය. කුමක් නිසා මෙසේ කියන්නෙහි ද ? මේ ද්‍රව්‍ය වැඩිපුරබව දැකය. බමුණා වැඩිපුර මුදල් නො දුන්නේය. මා විසින් වනාහි මේවා මගේ පුතා සමීපයෙන් ගෙනෙන ලදී. එතැන් පටන් බමුණා විසින් දෙන ලද මුදල් තමා ම ගෙන ධූර්තයාගේ සමීපයෙහි සුවඳ මල් ආදිය ගෙන එන්නීය. ධූර්තයා කීප දිනක් ගිය තැන ගිලන් බවක් ආරූඪ කැරගෙන හොත්තේය. ඈ ඔහුගේ ආපන අවන්හලෙහි දොරටුව ළඟට ගොස් ඔහු නො දැක මගේ පුතා කොහිද යි විචාළාය. නුඹේ පුතාට අපහසු බවක් ඇතිවිය. ඈ ඔහු වැතිර හුන් තැනට ගොස් හිඳගෙන පිට පිරිමදින්නී, දරුව, නුඹට ඇති අපහසුව කුමක්ද යි විචාළාය. ඔහු නිහඬ විය. දරුව, නො කියන්නේ ඇයි ? මෑණියනි, මරුණත් නුඹට නම් කියන්න නො හැකියි. මට නො කියා කාට කියන්න ද ? දරුව, මෑණියනි, මට වෙන අපහසුවක් නැත. ඒ මානවිකාවගේ රූසපුව අසා ඈ පිළිබඳ සිත් ඇත්තේ වෙමි. ඇය ලබන්නේ නම් ජීවත් වන්නෙමි. නො ලබන්නේ නම් මෙහි ම මැරෙන්නෙමි. දරුව, මට එය බාරයි. නුඹ ඒ ගැන නො සිතව යි ඔහු අස්වසා බොහෝ සුවඳ මල් ආදිය රැගෙන මානවිකාවගේ ළඟට ගොස් දරුව, මගේ පුත්‍රයා මා වෙතින්

නුඹේ රූ සපුව අසා ඔබ හා බැඳුණු සිත් ඇත්තෙක් වූයේය. කුමක් කටයුතු ද ? ඉදින්, ඔහු රැගෙන එන්න හැක්කේ නම් මගෙන් බාධාවක් නැත.

සේවිකාව ඇගේ වචනය අසා එතැන් පටන් ඒ ගෙහි මුළුවල බොහෝ කසල එකතුකොට මල් පැසෙහි දමාගෙන යන්නේ පැස පරීක්ෂා කරන කල ආරක්ෂක ස්ත්‍රීන්ගේ මතුයෙහි දැමුවාය. එයින් ලජ්ජාවට පත් ඇය ඉවත් වූවාය. සේවිකාව ඒ ආකාරයෙන් ම යම් යම් ස්ත්‍රියක කිසිවක් කියත 'ද ඔවුන්ගේ මතුවෙහි කසල දමයි. එතැන් පටන් ඇය යමක් ගෙන එයි ද බැහැරට ගෙන යයි ද කිසි ස්ත්‍රියක් එය පරීක්ෂා කිරීමට උත්සාහ නො කරයි. එකල්හි ඕ තුමූ ඒ ධූර්තයා මල් පැසෙහි හොවා මානවිකාවගේ සමීපයට ගෙනාවාය. ධූර්තයා මානවිකාවගේ සිල් බිඳ දවසක් දෙකක් එහි ම රැඳුණේය. පුරෝහිතයා බැහැර ගිය කල්හි දෙදෙනා රමණය කරත්. ඔහු ආ කල්හි ධූර්තයා සැඟවෙයි. ඉක්බිති, මානවිකාව ඔහුට මෙසේ කීවාය. හිමියනි, දැන් ඔබට යන්නට සුදුසු වෙයි. මම බමුණාට පහර දී යන්නට කැමැත්තෙමි. ඕ තුමූ එ සේ වේවා යි ධූර්තයා සඟවා බමුණා ආකල්හි මෙසේ කීවාය. හිමියනි, මම වීණාව වාදනය කළේය. ඔබ බලා සිටිය දී නටන්න ලජ්ජා වෙමි. ඔබගේ මුහුණ සළුවකින් බැඳ නටන්නෙමි. ඉදින්, ඔබ ලජ්ජා වන්නෙහි නම් එ සේ කරව. මානවිකාව දළ සළුවක් ගෙන ඔහුගේ ඇස් වැසෙන පරිදි මුහුණ බැන්දාය. බමුණා මුහුණ බන්දවා ගෙන වීණාව වාදනය කළේය. ඈ මොහොතක් නටා ස්වාමීනි, මම නුඹට එක් වරක් හිසට පහර දෙනු කැමැත්තෙමි යි කීවාය. ස්ත්‍රී ලෝල බමුණා කිසි කරුණක් ගැන නො දන්නේ පහර දෙව යි කීවේය. මානවිකාව ධූර්තයාට ඉඟියක් කළාය.

ඔහු හිමින් අවුත් බමුණාගේ පිටුපස සිට හිසට වැල මිටින් පහර දුන්නේය. ඇස් ගැළවී වැටෙන ආකාරයක් විය. හිසෙහි ගෙඩියක් මතුවිය. ඔහු වේදනාවට පත්ව ඔබේ අත ගෙනව යි කීවේය. මානවිකාව තමාගේ අත උසවා ඔහුගේ අතෙහි තැබුවාය. බමුණා අත නම් මොළොක්ය. පහර නම් තදයැ යි කීවේය. ධූර්තයා බමුණාට පහර දී සැඟවුණේය. මානවිකාව ඔහු සැඟවුණු කල්හි බමුණාගේ මුහුණෙන් සාටකය මුදා තෙල් ගෙන හිසෙහි පහර දුන් තැන පිරිමැද්දාය. බමුණා බැහැර නික්මුණු කල්හි නැවත ඒ ස්ත්‍රිය

ධූර්තයා පැසෙහි හිඳුවා බැහැර කළාය. ඔහු රජු සමීපයට ගොස් ඒ සියලු පුවත් සැලකළේය.

රජතුමා තමාගේ සේවය සඳහා පැමිණි බමුණාට කීය. බමුණ, දූ කෙළමු. මහරජ, මැනවි. රජ දූ කෙළි මණ්ඩපයක් සකසා පෙර මෙන් ම දූ කෙළි ගී ගායනයකොට පසැට දමයි. බමුණා මානවිකාව පතිවත බිඳුණු බව නො දැන මගේ මානවිකාව හැර යයි, කීය. එ සේ කීවත් පරාජය වූයේ මය. රජතුමා කාරණය දැන, බමුණ, කුමක් නිසා දා කෙළිය නැවැත්තුවෙහි ද ? ඔබගේ මානවිකාවගේ පතිවත බිඳුණේය. ඔබ ස්ත්‍රියක කුසෙහි පටන් ආරක්‍ෂා කරමින් සත් ස්ථානයක ආරක්‍ෂා කරමින් රකින්න හැකි වෙමි යි හිතන්නෙහි ද ? ස්ත්‍රීහු නම් කුසෙහි දමා හැසිරෙන්නාහු, නමුදු ආරක්‍ෂා කරන්න නො හැකිය. එක ම පුරුෂයකු ඇති ස්ත්‍රියක නම් නැත. ඔබගේ මානවිකාව නටනු කැමැත්තෙමි යි කියා වීණා වාදනය කරන ඔබගේ මුහුණ සළුවකින් බැඳ තමාගේ සොර සැමියා ලවා ඔබගේ හිසට වැලමිටෙන් ගස්සවා පිටත් කැර හැරියාය. දැන් ඔබ කුමක් නිසා දූ කෙළිය නවත්තන්නෙහි ද, කියා මේ ගාථාව කීවේය.

**"යං බ්‍රහමණො අවාදෙසී වීණං සමුඛවෙඨිතො**
**අණ්ඩභූතා භතා භරියා තාසු කො ජාතු විස්සසෙති"**

"බමුණ තෙමේ යම් කාරණයකින් වීණාව වයයි ද මව් කුස හොත් කල්හි ම ආරක්‍ෂාකොට පෝෂණය කළා වූ භාර්යාවය. එබඳු භාර්යාවන් කෙරෙහි කවර නම් නුවණැත්තෙක් ඒකාන්තයෙන් විශ්වාස තබන්නේ ද ?"

එහි, **"යං බ්‍රහමණො අවාදෙසී වීණං සමුඛවෙඨිතොති"** යම් කාරණයකින් බමුණා දළ සළුවෙන් මුහුණ වෙළන ලද්දකු වී වීණාව වාදනය කළේ ද ඒ කාරණය නො දනී යන අර්ථයි. එය ද ඕ තුමූ වංචා කරනු කැමැත්තී, එ සේ කළාය. බමුණා, ඒ ස්ත්‍රියගේ බොහෝ මායම්බව නො දැන ස්ත්‍රිය අදහා මැය මා නිසා ලජ්ජාවන්තීයැ යි යන හැඟීම වූවේය. ඒ නිසා ඔහුගේ අනුවණ බව ප්‍රකාශ කරමින් රජ මෙසේ කීවේය. මෙය එහි අදහසයි. **"අණ්ඩභූතා භතා භරියාති"** අණ්ඩ නම් බීජයයි. බීජ නම් වූ මව් කුසින් නික්මීමට පෙර සිට ම

ගෙනෙන ලද ඕ පෝෂණය කරන ලද යන අර්ථයි. ඒ කවරහු ද ? භාර්යාව, පජාපති, පාද පරිචාරිකාවයි. ඕ වනාහි ආහාර, වස්ත්‍රාදියෙන් පෝෂණය කළ යුතු බැවින් ද සිඳුණු සංවර ඇති බැවින් ද ලෝ දහමෙන් ආරක්ෂා කළ යුතු බැවින් ද භාර්යාවයැ යි කියනු ලැබේ. "තාසු කො ජාතු විස්සසෙති" ජාතු යනු ඒකාන්ත යන අර්ථයයි. ඒ ස්ත්‍රීන් කුසින් උපන් දින පටන් ආරක්ෂා කරන්නේ නමුදු මෙවැනි වරදට පැමිණෙන්නා වූ භාර්යාවන් කෙරෙහි කවර නම් නුවණ ඇති පුරුෂයෙක් ඒකාන්තයෙන් විශ්වාස කරන්නේ ද, මැය මට වෙනසක් නැතැ යි කවරෙක් නම් අදහන්නේ ද, යන අර්ථයි. කාම චාර වශයෙන් අමතන කල්හි ද කැඳවන කල්හි ද මාගම්මුන් රැකීමට නො හැකිය.

මෙසේ බෝසත්හු බමුණාට දම් දෙසූහ. බමුණා බෝසතුන්ගේ ධර්ම දේශනාව අසා නිවසට ගොස් ඒ මානවිකාවට මෙසේ කීවේය.

නුඹ විසින් වනාහි මෙබඳු පාප ක්‍රියාවක් කරන ලද්දී ද ? ස්වාමීනය, කවරෙක් මෙසේ කීවේ ද ? නො කරමි. මම ම පහර දුනිමි. අනිකෙක් නො වේ. ඉදින්, නො අදහන්නේ නම් මම ඔබ හැර අන් පුරුෂයකුගේ අත් පහසක් නො දනිමි යි සත්‍යය ක්‍රියාකොට ගින්නට පිවිස ඔබ විශ්වාස කැරවන්නෙමි. බමුණා, එ සේ වේවා යි මහත් දර රැසක් රැස්කොට ගිනි තබා ඇය ගෙන්වා තමාට තමා විශ්වාස නම් ගින්නට පිවිසව යි කීවේය.

මානවිකාව තමාගේ සේවිකාව පළමුකොට දූනුවත් කළාය. මෑණියනි, ඔබගේ පුත්‍රයා වෙත ගොස් මම ගින්නට පිවිසෙන කල අතින් අල්ලා ගන්නට කියව. ඇය ද ගොස් එසේ කීවාය. ධූර්තයා අවුත් පිරිස් මැද සිටියේය. ඒ මානවිකාව බමුණා රවටනු කැමැත්තී, මහජනයා මැද සිට බමුණ, ඔබ හැර අන් පුරුෂයකුගේ අත් පහසක් නම් නො දනිමි. මේ සත්‍යය බලයෙන් ගින්න මා නො දවාවා යි ගින්නට පිවිසීමට සූදානම් වූවාය.

එකෙණෙහි ධූර්තයා පුරෝහිත බමුණාගේ ක්‍රියාව බලවු. මෙබඳු මානවිකාවක ගින්න ප්‍රවේශ කරයි, ගොස් ඒ මානවිකාවගේ අතින්

අල්ලා ගත්තේය. ඕ තුමූ අත හරවා ගෙන පුරෝහිතයාට මෙසේ කීවාය. ස්වාමීනි, මගේ සත්‍යය ක්‍රියාව බිඳුණේ ය. දැන් ගින්නට පිවිසීමට නො හැකිය. මක් නිසා ද ? මම මගේ සැමියාට අන් පුරුෂයකුගේ අත්පහස නො දනිමි යි සත්‍ය ක්‍රියා කළෙමි. දැන් මේ පුරුෂයා විසින් මගේ අත් අල්ලා ගන්නා ලදී. එවිට බමුණා මැය විසින් මා රවටන ලද්දෙමි යි දැන ඇයට තලා පෙලා නිවසින් බැහැර කැරවීය. මෙසේ ස්ත්‍රීහු අදහමින් යුක්ත වූවෝ වෙති. කොතරම් මහත් වරදක්කොට ද සැමියා රැවටීම පිණිස මම එවැන්නක් නො කළෙමි යි දවසක් වුව ද දිවුරමින් වෙනත් අතකට ගිය සිත් ඇත්තෝ වෙති. එහෙයින් කියන ලදි.

"චොරීනං බහුබුද්ධීනං යාසු සච්චං සුදුල්ලභං
ථීනං භාවො දුරාජානො මච්ඡස්සෙවොදකෙ ගතං

මුසා තාසං යථා සච්චං සච්චං තාසං යථා මුසා
ගාවො බහුතිණස්සෙව ඔමසන්ති වරං වරං

චොරියො කඨිනා හෙතා වළා ච පලසක්ඛරා
න තා කිඤ්චි න ජානන්ති යං මනුස්සෙසු වඤ්චනන්ති"

"යම් ඒ ස්ත්‍රීන් කෙරෙහි සත්‍යය දුර්ලභාදී සොර සිත් ඇති කපටි නුවණ ඇති ස්ත්‍රීන්ගේ ස්වභාවය දත නො හැකිය. කෙසේ ද යත්, දියෙහි මත්ස්‍යයන්ගේ ගමන් මඟ මෙනි."

"සත්‍යය ඔවුන්ට බොරුවකි. බොරුව ඔවුන්ට සත්‍යයකි. බොහෝ තණ ඇති ස්ථානයක වඩ වඩා උතුම් තණ සොයා යන ගවයන් මෙනි."

"මේ ස්ත්‍රීන් සොරය. සැඩය. දැඩිය. චපලය. මිහිරි සතුරු වැන්නාහ. මිනිසුන් අතර යම් වංචා විඳ ඇත්තේ ද ඒවා ඔවුහු නො දනිති."

බුදුරජහු මෙසේ ස්ත්‍රීහු නො රැකිය හැක්කෝය‍ැ යි මේ දම් දෙසුම ගෙනහැර දක්වා සිව්සස් ප්‍රකාශ කළහ. සත්‍යය දේශනාව කෙළවර කළකිරුණු භික්ෂුව සෝවාන් ඵලයෙහි පිහිටියේය. බුදුරජහු ද අනුසන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළහ. එකල බරණැස් රජ මම ම වූවෙමි.

1. 7. 3.

## තක්ක ජාතකය

"කොධනා අකතඤ්ඤූචාති" යන මෙය බුදු රජහු ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, කළකිරුණු භික්ෂුවක් අරබයා වදාළහ. බුදුරජහු ඔහුගෙන් ඔබ උකටලී වූවෙහිද යි විචාරා සත්‍යයැ යි කී කල්හි ස්ත්‍රීහු නම් කෙළෙහි ගුණ නො දන්නෝය. මිතුරන්ට අවැඩ කරන්නෝය. ඔබ කුමක් නිසා ඔවුන් වෙනුවෙන් කළකරුණෙහිද යි වදාරා අතීත කථාව ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කරන සමයෙහි බෝසත්හු තවුස් පැවිද්දෙන් පැවිදි ව ගං තෙර අසපුවක්කොට සමාපත්ති ද අභිඥා ද උපදවා ධ්‍යාන ගෙන ඇලීම් සැපයෙන් වාසය කරති. එසමයෙහි බරණැස් සිටුහුගේ දියණිය දුෂ්ඨ කුමාරි නම් වූවාය. ඕ ඉතා දරුණුය. දැසි දස් කම්කරුවන්ට බැණ වදියි. පහර දෙයි. දිනක් ඇය රැගෙන ජල ක්‍රීඩා කරන්නෙමැ යි ගඟට ගියහ. ඔවුන් ක්‍රීඩා කරද්දී ම හිරු බැස යන වේලාව පැමිණියේය. වැහි වලාගැසිණි. මිනිස්සු වැහි වලා දැක වේගයෙන් ඔබ්මොබ පලා ගියහ. සිටු දුවගේ දැසි කම්කරුවෝ අද අප මැය පිටු දැකීමට සුදුසුයැ යි ඇය ජලයෙහි සිටිය දී ම අත්හැර ගොඩ ආහ. වෂීාව වසින්න පටන් ගත්තේය. හිරු ද අවරට ගියේය. අන්ධකාරය විය. ඒ මිනිස්සු ඇය හැර ගෙට ගොස් සිටු දුව කොහිද යි ඇසූ කල්හි ඇය ගඟින් ගොඩට ආවාය. ඉන් පසු අපි නො දනිමු. ඇගේ නෑයෝ සොයා ද නො දුටහ.

සිටු දුව මහත් සේ විලාප දෙන්නී, ජලයෙන් ගසාගෙන යනු ලබන්නී, මැදියම් රැයෙහි බෝසතුන්ගේ පන්සල සමීපයට පැමිණියාය. බෝසත්හු ඇගේ ශබ්දය අසා මේ ස්ත්‍රියකගේ ශබ්දයෙකි. ඇයට ආරක්ෂාවක් කරන්නෙමි යි තණ හුලක් ගෙන ගංතෙරට ගොස් ඇය දැක බය නො වන්න, බය නො වන්නයැ යි අස්වසා ඇතෙක්ගේ බල ඇති ශක්තිමත් තවුසාණෝ ගඟ තරණය කරමින් ගොස් ඇය ඔසවා තම අසපුවට ගෙනවුත් ගිනි දල්වා දුන්නේය. සීතල පහ වූ කල්හි මිහිරි එලවැල දුන්හ. ඒවා අනුභවකොට සිටි ඇයගෙන් ඔබ කොහි වසන්නියක් වෙහි ද ? කෙසේ නම් ගංගාවට වැටුණේදැ යි විචාළහ. එ සේ නම් ඔබ මෙහි ම වසන්නැ යි පන්සලෙහි රඳවා ගෙන දෙතුන් දිනක් තමා එළිමහනෙහි වැස දැන් යව යි කීහ. එවිට සිටු දුව මම මේ තවුසා ශීල භේදයට පමුණුවා ඔහු රැගෙන ම යමි යි නො ගියාය. මෙසේ කල්යත් ම සිටු දුව ස්ත්‍රීන්ගේ ආකල්ප ස්ත්‍රීන්ගේ මායම් දක්වා ඔහුගේ ශීල භේදයකොට ධ්‍යානයන් අතුරුදහන් කැර වූවාය. තවුසාණෝ ඇය පාවාගෙන වනයෙහි ම වසති. අනතුරුව ඕ තවුසාට හිමියනි, මේ වන වාසයෙන් කවර එලක් ද ? මිනිස් පියසට යමු යි කීවාය. ඔහු ද ඇය රැගෙන එක්තරා කුඩා පසල් ගමකට අවුත් මෝරු, මී කිරි විකුණා ජීවිකාව කොට ඇය ද පෝෂණය කළහ. මෝරු විකුණා ජීවත් වන නිසා ඔවුන්ට තක්ක පණ්ඩිතයැ යි නම් කළහ. ඒ ගම් වාසීහු ඔහුට අපට යුතු අයුතු කම් කියමින් මෙහි ම වාසය කරනු මැනවැ යි වියදම් දී ගම් දොර කුටියක්කොට වාසය කැරවූහ.

එසමයෙහි සොරු පර්වතයෙන් බැස අවුත් පසල් දනව්වට පහර දෙත්. ඔවුහු එක් දිනක් ඒ ගමට පහර දී ගම් වාසීන් ලවා ම බඩු පොදි ඔසවවා යන්නාහු, එම සිටු දියණිය ද ගෙන තමන් වසන තැනට ගොස් සෙසු ජනයා හැර යැවූහ. සොර දෙටුවා ඇගේ රූපයෙහි බැඳී ඇය තමාගේ බිරිඳ කළේය. බෝසත්හු මෙනම් ඇත්තී, කොහිදැ යි විචාළහ. සොර දෙටුවා විසින් ඇය ගෙන තමාගේ බිරිය කරන ලදැ යි ඇසුව ද ඕ මා හැර එහි නො වසන්නීය. එයින් පලා යන්නීයැ යි ඇගේ නැවත පැමිණීම බලමින් එහි ම විසූහ. සිටු දුව ද මෙසේ සිතුවාය. මොහු මෙහි අවුත් මෙතනින් මා රැගෙන යන්නේය. එවිට මම මේ සැපතින් පිරිහෙන්නෙමි. එම නිසා මම සෙනහසින් මෙන් ඔහු මෙහි කැඳවා මරවන්නේ නම් මැනවි. ඕ තුමූ එක් මිනිසකු කැඳවා මම මෙහි දුක සේ වෙසෙමි. පණ්ඩිතයෝ අවුත්

මා රැගෙන යත්වා යි හසුනක් යැව්වාය.

හෙතෙම ඒ හසුන අසා අදහා එහි ගොස් ගම් දෙර සිට හසුනක් යැව්වේය. ඈ නික්මී ඔහු දැක ස්වාමීනි, ඉදින්, අපි දැන් යන්නෙමු නම් සොර දෙටුවා ලුහුබැඳ අපි දෙදෙනා ම ඝාතනය කරන්නේය. රාත්‍රී කාලයේ යන්නෙමු යි. ඔහු කැඳවා කවා කාමරයක හිඳුවා සවස සොර දෙටුවා අවුත් සුරා මත් වූ කල්හි ස්වාමීනි, මේ වේලාවෙහි ඔබගේ සතුරකු දකින්නේ නම් ඔහුට ඔබ කුමක් කරන්නේද යි ඇසුවාය. මේ මේ දේ කරමි යි කී කල්හි ඒ සතුරා දුර සිටින්නකු නැත. කොටුවෙහි හිඳින්නේය. සොර දෙටුවා ගිනි හුළක් ගෙන එහි ගොස් ඔහු දැක ගෙන ගේ මැද හෙළා වැලමිට ආදියෙන් කැමැති පරිදි ගැසුවේය. තවුසාණෝ එ සේ පහර දෙනු ලබද්දීත් අන් කිසිවක් නො කියා ස්ත්‍රීහු ක්‍රෝධ ඇත්තෝය, කෙළෙහි ගුණ නො දන්නෝය, කේලම් කියන්නෝය, මිතුරන්ට අහිත කරන්නෝය, මෙපමණක් කියති.

සොරා ඔහුට ගසා බැඳ හොවා රාත්‍රී භෝජනය අනුභවකොට සයනය කළේය. පිබිදුණු ඔහු සුරා මදය නැති වූ කල්හි නැවතත් ඔහුට ගසන්න පටන් ගත්තේය.

එවිට ද ඒ තවුසාණෝ ඒ සතර පද ම කියති. සොරා මෙසේ සිතීය. මේ තෙමේ මෙසේ පහර දෙනු ලබන කල්හි වෙන කිසිවක් නො කියා මේ සතර පද ම කියයි. ඔහුගෙන් මේ ගැන විචාරමි. ඇය නිදි බව දැන ඔහුගෙන් මෙසේ විචාළේය. පින්වත, ඔබ මෙසේ ගසනු ලබන කල්හිත් මේ සතර පදය ම කියන්නෙහි. එවිට තක්ක පණ්ඩිතයෝ, එ සේ නම් අසනු මැනවි යි ඒ කාරණය මුල පටන් කීහ. මම පෙර අරණ්‍යය වාසී වූ එක් තාපසයෙක්මි. ධ්‍යාන ලාභී වීමි. ඒ මම ගංගාවෙහි ගසා ගෙන යන මේ ස්ත්‍රිය ගොඩට ගෙන පෝෂණය කළෙමි. මැය මා පොළඹවා ධ්‍යානයෙන් ද පහ කළාය. ඒ මම වන වාසය අත්හැර මැය පෝෂණය කරමින් කුඩා පසල් ගමක වාස කරමි. ඉක්බිති, මැය සොරුන් විසින් මෙහි ගෙනෙන ලදී. මම දූක සේ වසමි. අවුත් මා ගෙන යන්නැ යි මට හසුනක් එවා දැන් නුඹේ අතට පත් කළේය. මේ කරුණ නිසා මම මෙසේ කියමි. සොරා සිතුවේය. යම් බඳු ස්ත්‍රියක මෙබඳු ගුණවත්, උදව් උපකාර කළ කෙනකුටත් මෙසේ විරුද්ධ ව පිළිපැද්දා නම් ඈ මට

කොයි ආකාර උවදුරක් නො කරන්නී ද ? මැ පන්නා හැරිය යුතුයි.

හෙතෙම තක්ක පඬිතුමා අස්වසා ඔහු සතුටු කැරවා කඩුව ගෙන නික්මී මේ පුරුෂයා ගම් දොර දී ඝාතනය කරන්නෙමි යි කියා ඇය සමග ගමින් බැහැරට ගොස් මොහු අතින් ගනිවු යි ඔහු ලවා ඇගේ අතින් අල්ලවා ගෙන කඩුව ගෙන තක්ක පඬිතුමාට පහර දෙන්නාක් මෙන් ඇය දෙපළුකොට හිස් සෝදා නා තක්ක පඬිතුමාට කීප දිනක් ප්‍රණීත ආහාරයෙන් සංග්‍රහ කරන්නේ, දැන් කොහි යන්නෙහිද යි කීවේය. තක්ක පඬිතුමා ගිහි ගෙයි විසීමෙන් මට කාරියක් නැත. තවුස් පැවිද්දෙන් පැවිදි ව ඒ අරණ්‍යයෙහි ම වසන්නෙමි යි කීවේය. එ සේ නම් මම ද පැවිදි වන්නෙමි යි දෙදෙනා ම පැවිදි වී ඒ අරණ්‍යායතනයට ගොස් අභිඥා පහ ද සමාපත්ති අට ද උපදවා ගෙන දිවි කෙළවර බඹලොව උපන්නාහ. බුදුරජහු මේ කථා වස්තු දෙක වදාරා පූර්වාපර සන්ධි ගළපා අභිසම්බුදු ව මේ ගාථාව වදාළහ.

"කොධනා අකතඤ්ඤූ ච පිසුණා ච විභෙදිකා
බ්‍රහමචරියං චර භික්ඛු සො සුඛං න විහාහිසීති"

"ස්ත්‍රීහු නම් කිපෙන්නාහ. කළ ගුණ නො දන්නෝ ද වෙති. මිත්‍රයන් බේද කරන්නා වූ කථා ස්වභාව ඇත්තාහුය. මහණ, බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙව. බඹසර හැසිරෙන තෝ සුවයෙන් නො පිරිහෙන්නෙහිය."

මේ එහි පිඩු කරන ලද අරුතයි. මහණ, මේ ස්ත්‍රීහු නම් "**කොධනා**" උපන්නා වූ ක්‍රෝධය වළක්වා ගන්න නො හැකි වෙත්. "**අකතඤ්ඤූ ච**" ඉතා මහත් උපකාරයක් කළත් නො දනිත්. "**පිසුණා ච**" ප්‍රිය භාවය ශූන්‍යය කරන්නා වූ කථා කියත්. "**විභෙදිකා**" මිත්‍රයන් බිඳවත්. මිත්‍රයන් බේද කැර වන කථා කියන ස්වභාවය ඇත්තෝය. මෙබඳු වූ පව් කම්වලින් යුක්තාහුය. මොවුන්ගෙන් ඔබට ඇති ඵලය කුමක් ද ? "**බ්‍රහමචරියං චර භික්ඛු**" මෙය වනාහි මෙවුන් දම් සෙවුමෙන් වළකින නිසා පිරිසිදු අර්ථයෙන් බ්‍රහ්ම චරියා වාසය නම් වෙයි. එහි හැසිරෙව. "**සො සුඛං න විහාහිසීති**" ඒ නුඹ මේ බඹසර

වසන්නේ, ධ්‍යාන සැපය ද මාර්ග සැපය ද ඵල සැපය ද නො පිරිහෙළන්නෙහිය. මේ සැපය අත් නො හරින්නෙහිය. මේ සැපයෙන් නො පිරිහෙන්නෙහිය, යන අර්ථයි. "**න පරිහාහිසිති**" යනු පාඨයි. මෙය එහි අර්ථයයි.

බුදුරජහු මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා සත්‍යය දෙසූහ. සත්‍යය දේශනාව කෙළවර කළකිරුණු භික්ෂුව සෝවාන් ඵලයෙහි පිහිටියේය. බුදුරජහු ද ජාතකය නිමවා වදාළහ. එකල සොර දෙටුවා ආනන්ද තෙරුණුවෝය. තක්ක පණ්ඩිතයා වනාහි මම ම වෙමි.

## 1. 7. 4.

## දුරාජාන ජාතකය

"මාසු නන්දි ඉච්ඡති මන්ති" යන මේ ජාතකය බුදු රජහු ජේතවනයෙහි වසන සේක්, එක් උපාසකයකු අරබයා දෙසූහ. සැවත් නුවර වැසි උපාසකයකු තිසරණ පන්සිල්හි පිහිටියේ බුද්ධ මාමක, ධම්ම මාමක, සංඝ මාමක වූයේ විය. ඔහු ඔහුගේ බිරිය සිල් නැත්තී, පව්ටු දම් ඇත්තී වූවාය. යම් දවසක මේ කාමයෙහි වරදවා හැසිරෙයි ද එදින සියයකට මිලට ගත් දාසියක මෙන් වෙයි. මිථ්‍යාචාර නො කළ දිනයෙහි ගෘහපතිනිය කමෙන් වන්නීය. සැඩය, පරුෂය, උපාසක තෙම ඇගේ ස්වභාවය දැනගන්න නො හැක්කේය. ඇය විසින් බිය ගන්වන ලද ඔහු බුදු රජුන් බැහැ දැකීමට නො යයි. දිනක් සුවඳ මල් ආදිය ගෙන බුදුරජුන් වෙත ගොස් වැඳ හුන් ඔහුගෙන් බුදුරජහු මෙසේ ඇසූහ. උපාසකය, ඔබ සත් අට දිනක් බුද්ධෝපස්ථානයට මක් නිසා නො පැමිණියෙහි ද ? ස්වාමීනි, මගේ භාර්යාව එක දවසක සියයකට මිලට ගත් දාසියක මෙනි. තවත් දිනක ගෘහපතිනික මෙන් සැඩය. පරුෂය. මම ඇගේ ස්වභාවය දැනීමට අසමත් වෙමි. ඇය විසින් බය කරන ලද මම බුද්ධෝපස්ථානයට නො පැමිණෙමි. එවදන් ඇසූ බුදුරජහු, උපාසකය, මාගමුන්ගේ හැඟීම්, දැනීම පහසු නො වේයැ යි පෙර පඬුවෝ ද කීහ. ඔහු විසින් අයදනා ලද

බුදුරජහු ඉකුත් වත ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කැරවන කල්හි බෝසතාණෝ දිසාපාමොක් ඇදුරව පන්සියක් මානවකයන්ට ශිල්ප උගන්වති. එකල අසල් රටවැසි බ්‍රාහ්මණ මානවකයෙක් අවුත් ඔවුන් ළඟ ශීලය උගන්නේ එක් ස්ත්‍රියක සමග බැඳුණු සිත් ඇත්තේ, ඇය බිරියකොට ගෙන එම බරණැස් නුවර ම වසන්නේ, දෙතුන් වරක් ගුරු උවටැනට යයි. ඒ ඔහුගේ බිරිය දුසිල්ය. පව්ටු දම් ඇත්තීය. මිථ්‍යාචාරයෙහි හැසුරුණු දිනයෙහි දාසියක වෙයි. නොද දින ගෘහපතිනිය මෙන් සැඬය. පරුෂය. ඔහු ඇයගේ ස්වභාවය දැනගන්න නො හැක්කේ, බිය ගන්වනු ලබන්නේ, ආකුල සිත් ඇති ඇත්තේ, ගුරු උවටැනට නො යයි. හත් අට දවසකට පසු ගුරු වෙත පැමිණි මානවකයා අමතා මානවකය, කිම, මෙතෙක් දවස් ඔබ නො දක්මි යි කීහ. ගුරුතුමනි, ඒ මගේ බිරිය එක් දිනක් මා කැමැති වන්නීය. මා පතන්නීය. දාසයක මෙන් නිහතමානී වන්නීය. එක දවසක් ගෘහපතිනිය මෙන් තදය. සැඬය. පරුෂය. මම ඇගේ හිතැඟි දැනීමට අසමත් වෙමි. ඇය විසින් බියට පත් කරනු ලබන මම අවුල් සිත් ඇත්තේ, ගුරු උවැටැන් සඳහා නො ආමි යි කීය. එවිට ගුරුතුමා, මානවකය, ඒ එ සේ මැයි. ස්ත්‍රීන් නො සිරිතෙහි හැසුරුණු දිනයෙහි ස්වාමියාට කීකරු ව සිටී. දාසියක් මෙන් නිහතමානී වෙයි. නො හැසුරුණු දිනයෙහි උඩඟු ව ස්වාමියා නො තකන්නීය. මේ අයුරින් මෙසේ කීහ. සුසිරිත් නැත්තේය. සිල් නැත්තේය. ඔවුන්ගේ හැඟීම් දැනීමට අසීරුය. ඔවුන් කැමැති වන කල්හිත් නො කැමැති වන කල්හිත් මැදහත් ව සිටිය යුතුයැ යි කියා ඔහුට අවවාද වශයෙන් මේ ගාථාව කීහ.

**"මා සු නන්දි ඉච්ඡති මං මා සු සොචි න ඉච්ඡති**
**ථීනං භාවො දුරාජානො මච්ඡස්සෙවොදකෙ ගතන්ති"**

"මේ ස්ත්‍රිය මා කැමැති වෙයි කියා හෝ මා නො කැමැති වෙයි කියා හෝ ශෝක නො වන්න. ස්ත්‍රීන්ගේ ස්වභාවය දත නො හැකිය. ජලයෙහි මත්ස්‍යයාගේ ගමන මෙනි."

"මා සු නන්දි ඉච්ඡති මං" මෙහි 'සු' යනු නිපාතයි. මේ ස්ත්‍රිය මා කැමැති වෙයි. මා පතයි. මට ආදරය කරයි යනුවෙන් සතුටු නො වන්නේය. "මා සු සොචි න ඉච්ඡති" මේ ස්ත්‍රිය මා නො කැමැති වෙතැ යි ශෝක නො කැරව. ඇය කැමැති වන කල්හි සතුටක්, නො කැමති වන කල්හි අසතුටක් නො කොට මැදහත්ව සිටුව යි, දක්වයි. "ථීනං භාවො දුරාජානො" ස්ත්‍රීන්, හැඟීම් නම් ස්ත්‍රී මායම්වලින් වැසී ඇති බැවින් දත නො හැකිය. යම් සේ මත්ස්‍යයන්ගේ ගමන ජලයෙන් සැඟවී ඇති බැවින් දැනීමට අපහසුය. එම නිසා ම මත්ස්‍යයෝ කෙවුලන් ආ කල්හි, ජලයෙන් ගමන් මඟ වසා පලා යති. තමන් ගැනීමට ඉඩ නොදෙති. එමෙන් ස්ත්‍රීහු මහත් දුසිරිතක්කොට අපි ඔවැනි ක්‍රියා නො කරමු යි තමා කළ ක්‍රියාව ස්ත්‍රී මායමින් වසා හිමියන් රවටත්. එම නිසා මේ ස්ත්‍රීහු නම් පාප ක්‍රියා, දුසිරිත් ඇත්තාහු ම වෙත්. ඔවුන් කෙරෙහි මැදහත් වූයේ ම සැපවත් වේය.

මෙසේ බෝසත්හු අතවැසියට ඔවදන් දුන්හ. එතැන් පටන් ඔහු බිරිය කෙරෙහි. මැදහත් වූයේය. ඔහුගේ බිරිය ද මගේ නො සිරිත් ගුරුතුමන් විසින් දන්නා ලද්දේයැ යි එතැන් පටන් මිථ්‍යාචාරයෙහි නො හැසුරුණාය. ඒ උපාසකයාගේ බිරිය ද බුදුරජුන් විසින් මගේ නො සිරිත්බව දන්නා ලදැ යි එතැන් පටන් පව් කම් නො කළාය.

බුදුරජහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා සිව්සස් වදාළහ. සිව්සස් කෙළවර උපාසක සෝවාන් පෙළෙහි පිහිටියේය. බුදුරජහු අනුසන්ධි ගළපා ජාතකය නිම කළහ. එදා අඹුසැමියෝ නම් දැන් අඹුසැමියෝ මය. ඇදුරුතුමාණෝ මම ම වීමි.

## 1. 7. 5.

## අනභිරති ජාතකය

"යථා නදී ච පන්ථො චාති" යන මේ ජාතක දේශනය බුදු රජහු දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, එබඳු ම උපාසකයකු අරබයා

දේශනා කළහ. ඔහු තම බිරිය පරීක්ෂා කරන්නේ, ඇගේ දුසිල්බව දැන කලහ කරන ලද්දේ, අවුල් වියවුල් වූ සිත් ඇතිව සත් අට දිනක් බුදුරජුන් බැහැ දැකීමට නො ගියේය. දිනක් ඔහු වෙහෙරට ගොස් බුදුරජුන් වැඳ හුන්නේ, කුමක් නිසා සත් අට දිනක් නො ආවෙහිදැ යි ඇසූ කල්හි, ස්වාමීනි, මගේ බිරිය සිල් නැත්තීය. ඇය කෙරෙහි අවුල් සිත් ඇති හෙයිනි. නො ආවෙමි යි කීය. බුදුරජහු, උපාසකය, ස්ත්‍රීන් කෙරෙහි මොවුන් අනචාරීයැ යි කෝප නො කොට මැදහත් වීම සුදුසුය. පෙරත් පඬිවරු ඒ කීහ. ඔබ භවාන්තරයෙන් වැසී ගිය බැවින් එකරුණ නො සලකතැ යි වදාරා ඔහු විසින් අයදනා ලද බුදුරජහු ඉකුත් වත ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කැර වන කල්හි බෝසත්හු පෙර මෙන් දිසාපාමොක් ඇදුරු වූහ. ඔහුගේ අතවැසියා බිරියගේ දොස් දැක අවුල් සිතින් දින කීපයක් ඇදුරන් වෙත නො ගොස් එක් දවසක් ඇදුරන් විසින් විචාරණ ලද ඔහු, එකරුණ සැල කළේය. ඉක්බිති, ආචාර්යවරයා, දරුව, ස්ත්‍රීන් සියල්ලන්ට සාධාරණය. ඔවුන් කෙරෙහි මොවුන් සිල් නැතැ යි, පඬිවරු කෝප නො කරතැ යි වදාරා අවවාද වශයෙන් මේ ගාථාව කීහ.

**"යථා නදී ච පන්‍ථො ච පාණාගාරං සභා පපා**
**එවං ලොකිත්‍ථියො නාම නාසං කුජ්ඣන්ති පණ්ඩිතාති"**

"යම් සේ ගංගාව මහමග, සූරා හල, ඉසුඹු හල,
පින්තාලිය සියල්ලකට ම සාධාරණ ද ලෝකයෙහි ස්ත්‍රීන්
ද එසේ මැයි. නුවණැත්තෝ ඔවුන්ට නො කිපෙත්."

එහි, **"යථා නදී"** නොයෙක් තොට ඇති ගඟ නෑම සඳහා පැමිණි සැඩොල් රජු ආදීන්ට ද සාධාරණය. එහි කිසිවකු නෑම නො ලබන්නෝ නො වේ. **"පන්‍ථො"** මාර්ගාදියෙහි ද මහමඟ සියල්ලන්ට ම සාධාරණය. කිසිවෙක් එහි ගමන් කිරීමට නො ලබන්නේ නො වෙයි. සුරා ගෘහය ද සියල්ලන්ට ම සාධාරණය. බොනු කැමැති සියල්ලෝ එහි පැමිණෙත්. පින් කැමැත්තන් විසින් මිනිසුන්ට විසීම සඳහා ඒ ඒ තැන කළ ශාලා ද සාධාරණය. සියල්ලෝම එහි පිවිසීම ලබන්නෝය. **"එවං ලොකිත්‍ථියො නාම"** දරුව, මානවකය, මේ

ලෝකයෙහි ස්ත්‍රීන් ද සියල්ලන්ට ම සාධාරණය. මේ සාධාරණ යන අරුතින් ගංගා, මාර්ග, අවන්හල්, ශාලා, පැන්තාලි සමානය. එහෙයින් "නාසං කුජ්ඣන්ති පණ්ඩිතා" මේ ස්ත්‍රීන්ගේ පහත් බව, නො සිරිත් බව, දුසිල් බව සියල්ලන්ට සාධාරණ බව සිතා නුවණැත්තෝ, දක්‍ෂයෝ නො කිපෙත්.

මෙසේ බෝසත්හු අතවැසියාට අවවාද දුන්හ. ඔහු ඒ අවවාද අසා මැදහත් විය. ඔහුගේ භාර්යාව ද ගුරුතුමන් විසින් දක්නා ලද්දේ වෙමි යි එතැන් සිට පව් කම් නො කළාය.

බුදුරජහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා සිව්සස් වදාළහ. උපාසක සෝවාන් ඵලයෙහි පිහිටියේය. බුදුරජහු අනුසන්ධි ගළපා ජාතකය නිම කළහ. එදින අඹු සැමියෝ දැන් අඹුසැමියෝ වූහ. ඇදුරු බමුණාහු මම ම වීමි.

## 1. 7. 6.

## මුදුලක්ඛණ ජාතකය

"එකා ඉච්ඡා පූරේ ආසීති" යන මේ ජාතක දේශනාව බුදුරජහු දෙව්රම් වෙහෙර වැඩ වසන සේක් භික්‍ෂුවක් තුළ ඇති වූ කෙළෙස් සිතුවිල්ලක් අරබයා දේශනා කළහ.

සැවැත්නුවර වැසි කුල පුත්‍රයෙක් බුදු රජුන්ගේ ධර්ම දේශනාව අසා සම්බුදු සසුනට දිවිපුදා පැවිදි පිළිවෙතින් සරුව භාවනාවේ යෙදුණේ කමටහන් අත් නොහැර දිනක් සැවැත් නුවර පිණ්ඩපාතයෙහි හැසිරෙන්නේ මනාව හැදපැළඳගත් ස්ත්‍රියක් දැක ඉඳුරන් බිඳ සුබ වශයෙන් බැලුවේය. ඔහු සිතෙහි කෙළෙස් සැලිණි. පොරොවෙන් ගැසූ කිරි ගසක් මෙන් විය. ඔහු එතැන් සිට කෙළෙස් වසඟ ව, කායික හෝ මානසික සුවයක් නො ලබයි. නැතිගත් මුවකු සමාන විය.

සසුනෙහි කළකිරී වැඩුණු කෙස් නියලොම් ඇතිව කිළිටි සිවුර ධාරීව සිටියේය. ඔහුගේ මේ ඉඳුරන්ගේ වෙනස්වීම දුටු යහළු භික්ෂූහු ඇවැත්නි, ඔබගේ ඉන්ද්‍රිය ප්‍රසන්නතාවය දැන් නැත. හේතුව කුමක්දැයි ඇසූහ. ඇවැත්නි සසුනෙහි සිත් නො අලුණෙවෙමි. ඉක්බිති, භික්ෂූහු ඔහු රැගෙන බුදුරදුන් වෙත ගියහ. මහණෙනි, කිම අකැමැති භික්ෂුවක් ගෙන ආවහුදැ යි වදාළහ. ස්වාමීනි, මේ භික්ෂුව සසුනෙහි නො ඇලෙන්නේය. මහණ, ඇත්ත ද ? එසේය, ස්වාමීනි. ඔබ උකටලී බවට පත් කළේ කවරෙක් ද ? ස්වාමීනි, මම පිඬු පිණිස හැසිරෙන්නෙමි. ඉන්ද්‍රිය සංවරය බිඳ ස්ත්‍රියක දෙස බැලීමි. එවිට මගේ සිත තුළ කෙළෙස් සැළිණි. එම නිසා මම උකටලී වීමි. ඉක්බිති, බුදුරදහු, මහණ, ඔබ අසංවර ඉඳුරන් ඇති ව විරුද්ධ ලිංගික අරමුණක් ශුභ වශයෙන් බලා කෙළෙසුන්ගෙන් කම්පා වීම අසිරියක් නො වේ. පෙර පඤ්ච අභිඥා අෂ්ට සමාපත්තිලාභී, ධ්‍යාන බලයෙන් කෙළෙස් යටපත්කොට පිරිසිදු සිත් ඇති ආකාශගාමී බෝසත්හු පවා ඉන්ද්‍රිය සංවරය බිඳ විරුද්ධ ලිංගික අරමුණක් දැක ධ්‍යානයෙන් පිරිහී කෙළෙස් වසඟ ව මහත් දුකක් වින්දාහ. මහමෙර පෙරළන සුළඟ ඇතකු පමණ කුඩා පර්වතයක් පැකිළීයේ ද ? මහදඹ රුකක් ඉදිරීමට සමත් සුළඟ බිඳී ගිය ඉවුරක හටගත් කුඩා ගසක පැකිළීයේ ද ? මහමුහුද වියලීමට සමත් සුළඟ වැද ගොන්නක දිය වියලා නො යාවි ද ? එමෙන් උසස් බුද්ධික ප්‍රභා ඇති පිරිසිදු සිත් ඇති බෝසතුන් අඥාණ අන්ධයන් කරන්නා වූ ක්ලේශයෙන් ඔබ කෙරෙහි කුමක් පිණිස ලජ්ජා වෙයි ද ? ඒ පිරිසිදු සත්ත්වයෝ පවා කිලිටි වෙත්. උසස් කීර්තියෙන් යුක්ත වූවෝ ද නින්දාවට පත් වෙති යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු කසී රට මහත් සම්පත් ඇති එක් බමුණු කුලයක ඉපිද නැණවත් බවට පැමිණියාහු, සියලු සිප්සතර පරතෙරට ගොස් පඤ්ච කාමයන් හැර ඍෂි පැවිද්දෙන් පැවිදි ව කිසිණු පිරියම් කොට පංච අභිඥා සමග අෂ්ට සමාපත්ති උපදවා ධ්‍යාන සැපයෙන් හිමවත් පෙදෙසෙහි වාසය කළහ. ලුණු ඇඹුල් ලබාගැනීම සඳහා හිමවතින් බැස බරණැස් නුවරට පැමිණ රජ උයනෙහි වැසූ දෙවැනි දවස් සිරුර පිළිදැගුම් කොට රත් වැහැරියෙන් කළ හඳන සිවුරු හැඳ පොරවා අලුත් දිවි සම එක උරයක කොට ජටා මඬුල්ල බැඳ තවුස් කද ගෙන බරණැස් නුවර පිඬු පිණිස හැසිරෙන්නාහු, රජ මැදුරට

පැමිණියහ. රජ ද බෝසතුන්ගේ හැසිරීම් විහරණයෙහි පැහැද කැඳවා මාහැඟි අසුනක වඩා හිඳුවා මිහිරි ආහාර පානයෙන් සතපවා අනුමෙවෙනි බණ අවසානයෙහි උයනෙහි වසන පිණිස ඉල්ලීය.

එතුමෝ ද පිළිගෙන රජ මැඳුරෙහි දී වළඳා රජ කුලයට උපදෙස් දෙමින් එම උයනෙහි සොළොස් මසක් විසූහ. බඹදත් රජු කිපුණු පසල් දනව්වක් සංසිඳවීමට යන්නේ, මුදුලක්ඛණා නම් අග මෙහෙසියට තවුස් උතුමාණන්ට උවටැන් කරන්නැ යි කියා ගියේය. බෝසත්හු රජු ගිය කාලයෙහි පටන් තමන්ට කැමැති කැමැති වේලාවල ගෙට යයි. දිනක් මුදුලක්ඛණ බිසව බෝසතුන්ට ආහාර පිළියෙල කොට අද තවුසා පමාවෙතැ යි දැන සුවඳ දියෙන් නා සිව්බරණින් සැරසී උඩු මහලෙහි කුඩා සයනයක් පනවා බෝසතුන්ගේ පැමිණීම බලාපොරොත්තුවෙන් වැද හොත්තෙහිය.

බෝසත්හු ද තමන්ගේ වේලාව සලකා දැහැනින් නැඟී අහසින් ම රජ නිවසට ගියහ. බිසව වැහැරී සිවුරු හඬ අසා ම තවුසාණන් වැඩියහ යි සිතා, වහා නැඟී සිටියාය. ඇය නැඟිටිත් ම සිනිඳු සළුව ඇද වැටිණි. තවුසාණෝ සිහ මැඳුරු කවුළුවෙන් පිවිසෙන්නේ දේවියගේ නිරුවත් රූපාරම්මණය, ඉන්ද්‍රිය සංවරය බිඳ ශුභ වශයෙන් බැලූහ. ඔහු ඇතුළත කෙළෙස් සැළිණි. කිරි ගසකට පහර දුන්නාක් මෙනි. එකෙණෙහි ම ඔහුන්ගේ දැහැන් අතුරුදහන් විය. සිඳුණු පියා ඇති කපුටකු මෙන් විය. හේ සිටියේ ම අහාර පිළිගෙන අනුභව නො කොට කෙළසින් සැලී පහයෙන් බැස උයනට ගොස් පන්සලට පැමිණියේය. කෙළෙස් ගින්නෙන් දැවෙමින් අහර නැති බැවින් වියලෙමින් පුවරු ඇඳෙහි වැතිරී සත් දවසක් හොත්තේය.

සත් වැනි දවස රජ පසල් ගම සංසිඳවා පැමිණියේ නගරය පැදකුණු කොට මැඳුරට නො ගොස් ම තවුසාණන් දකිනු පිණිස උයනට ගොස් පන්සලට පිවිස වැදහොත් තවුසාණන් දැක රෝගයක් උපන්නේදැ යි සිතීය. පන්සල පිවිතුරු කොට පා පිරිමදිමින් ස්වාමීනි, රෝගී වූවෙහිදැ යි විචාළේය. මහරජ, මට වෙනත් රෝගයක් නැත. කෙළෙස් වසඟ වීමෙන් බැඳුණු සිතක් ඇත්තකු විය. උතුමාණෙනි, කවරකු පිළිබඳ ඔබ සිත් බැඳුණේ ද ? මහරජ, මුදුලක්ඛණා දේවිය කෙරෙහිය. මැනවි උතුමාණනි, මම මුදුලක්ඛණ ඔබට දෙමි යි තවුසා රැගෙන ඇතුළු ගෙට පිවිස ඇය සිව්බරණින් සරසා තවුසාට

පාවාදුන්නේය. ඒ සමග ම තමාගේ උපාය ඥානයෙන් තවුසා රැක ගන්ට වෑයම් කළ යුතුයැ යි මුදුලක්ඛණා වෙත රජු සංඥාවක් කළේය. එසේය. දේවයිනි, මම තවුසා රැක ගනිමි. තවුසා දේවිය සමග පහයෙන් බටුයේය.

ඔහු දෙදෙන මහ වාසලින් නික්මුණු කල්හි හිමියනි, අපට ගෙයක් අවශ්‍යය වේ. යව, රජුගෙන් ඉල්ලව යි තවුසාට කීවාය. තවුසා ද රජු වෙත ගොස් ගෙයක් ඉල්ලීය. රජු ද මිනිසුන් විසින් වැසිකිළි කැර අත්හරින ලද ගෙයක් දෙවීය. ඔහු ද දේවිය සමග එහි ගියේය. දේවිය ගෙට පිවිසීමට නො කැමැතිය. තවුසා, නො පිවිසීමට හේතු කිම ? අපිරිසිදු හෙයිනි. දැන් කුමක් කරම් ද ? ගෙය පිරිසිදු කරනු. යව. රජු වෙත යවා උදැල්ලක් සහ පැසක් ඉල්ලා ගෙන එනු. දේවිය තවුසා ලවා අසූචි ද කසල ද බැහැර කැරවා ගොම ගාන්නයැ යි ගෙය ගොම ආලේප කොට නැවතත් ඇඳක් ගෙන එව. පහනක් ගෙන එව. ඇතිරිල්ලක් ගෙන එව. සැළියක් ගෙන එව. කළයක් ගෙන එව, ආදී වශයෙන් වෙන වෙන ම ගෙන්වා නැවත දිය ආදිය ගෙන ඒමට අණ කළාය. තවුසා ද කළය ගෙන දිය ඇද සැළිය පුරවා නහන දිය සකසා සයනය ඇතුරුවේය.

ඉක්බිති, යහනෙහි එකට හිඳගත් තවුසාණන්ගේ රවුළු දැතින් මිරිකා අල්ලාගෙන ඔබගේ මහණ බව හෝ බමුණු බව නො දන්නෙහිදැ යි තමා වෙතට ඇද්දාය. තවුසාණන්ට එවේලෙහි සිහිය ලැබිණි. මෙතෙක් කල් මුළා වී සිටියහ. ක්ලේශයෝ මෙසේ මුළා කරන්නාහුය. මහණෙනි, කාමාශාව නැමැති නීවරණය නොහොත් සිතෙහි වැස්ම, නැණැස අඳ කිරීමකි. මුළා කිරීමකි ආදිය මෙහි දී කිය යුතුය. ඔහු සිහිය ලැබ මෙසේ සිතීය. මසිතෙහි වැඩෙන මේ කාමාශාව සිව් අපායෙන් හිස එසවීමට ඉඩ නො දෙයි. අද ම මම මේ දේවිය නැවත රජුට ම පාවා දී හිමවතට යන්ට සුදුසු වන්නේය. එතුමෝ ඇය රැගෙන රජු වෙත ගොස් මහරජ ඔබගේ දේවියගෙන් මට වැඩක් නැත. සිදුවූයේ මැය නිසා මා තුළ තණ්හාව වැඩීම පමණකැ යි ප්‍රකාශ කොට මේ ගාථාව කීහ.

"එකා ඉච්ඡා පුරෙ ආසි අලද්ධා මුදුලක්ඛණං
යතො ලද්ධා අළාරක්ඛී ඉච්ඡා ඉච්ඡං විජායථාති"

"පෙර එක ම ආශාවක් (මුදුලක්ඛණා ලැබීම) විය. විශාල
ඇස් ඇති ඇය යම් දිනක ලැබුවා ද එතැන් පටන්
ආශාවෙන් ආශාව ඉපද වීය."

එහි කෙටි අදහස මෙසේ ය. මහරජ මේ ඔබගේ "**මුදුලක්ඛණං**", එනම් දේවිය නො ලැබ, "**පුරෙ**", අහෝ, ඇය ලැබෙන්නේ නම් යන, "**එකා ඉච්ඡා ආසි**" එක ම තෘෂ්ණාවක් උපණ. "**යතො**" යම්හෙයකින් "**අළාරක්ඛී**" විශාල ඇස් ඇති, මනහර ඇස් ඇති මේ දේවිය "**ලද්ධා**" ලබන ලද ද, එවිට ඒ පෙර පැවැති "**ඉච්ඡා**" ගෘහ ආශාව, උපකරණ ආශාව, පරිභෝග කටයුතු පිළිබඳ ආශාව මතු මත්තෙහි එක එක බැගින් ආශා ඉපදවීය. ඒ මගේ වැඩෙමින් පවතින ආශාව අපායෙන් හිස එසවීමට නො දෙයි. මැය ගෙන් මට ප්‍රයෝජනයක් නැත. ඔබ ම ඔබේ බිරිය ගනු මැනව. මම හිමවතට ම යමි.

එකෙණෙහි ම නැති වී ගිය දහැන් උපදවා, අහසෙහි හුන්නේ, දම් දෙසා රජුට අවවාද දී අහසින් ම හිමවතට ගොස් ඉන් පසු යම් දිනක මිනිස් පියසට නො පැමිණියහ. බඹ විහරණ වඩා නො පිරිහුණු ධ්‍යාන ඇත්තාහු, බඹලොව උපන්හ.

බුදු රජහු මෙම දම් දෙසුම ගෙනහැර දක්වා සිව්සස් වදාළහ. සිව්සස් කෙළවර ඒ භික්ෂුව රහත් ඵලයෙහි පිහිටියේය. බුදුහු අනුසන්ධි ගළපා ජාතකය නිමවූහ. එකල රජ ආනන්ද තෙරුණුවෝය. මුදුලක්ඛණාව උප්පලවණ්ණාවෝය. තවුසාණෝ මම ම වීමි.

1. 7. 7.

## උච්ඡඞ්ග ජාතකය

"**උච්ඡඞ්ගෙ දෙව, මෙ පුත්තොති**" යන මේ ජාතක දේශනය බුදු රජහු දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, එක්තරා දනව් වැසි ස්ත්‍රියක

අරබයා දේශනා කළහ.

කොසොල් වැසි තිදෙනෙක් එක්කලෙක වනයක් අසල සී සාත්. එකල කැලෑවෙහි සිටි සොරු මිනිසුන්ගේ වස්තුව පැහැරගෙන පළා ගියහ. ඔවුහු සොරුන් සොයා නො දැක සී සාන ස්ථානයට පැමිණ තොපි වස්තු පැහැරගෙන දූන් ගොවියෝ මෙන් වන්නහුදැ යි මේ සොරුයැ යි බැඳගෙන අවුත් කොසොල් රජුට දුන්හ. ඉක්බිති, ස්ත්‍රියක අවුත් මට හඳිනා වස්ත්‍රයක් දෙනු මැනව, මට හඳිනා වස්ත්‍රයක් දෙනු මැනව යි මහත් සේ හඬමින් නැවත නැවත රජ මැදුර අබියෙස හැසිරෙයි. රජ ඇගේ හැඬීම අසා මැයට හඳනා වස්ත්‍රයක් දෙව යි කීය. ඇයට වස්ත්‍රයක් ගෙන ආහ. ඈ ඒ දැක මම මෙවැනි වස්ත්‍රයක් නො ඉල්ලමි. මම ස්වාමි වස්ත්‍රය ඉල්ලමි යි කීවාය. මිනිස්සු මැය ඉල්ලන්නී මේ වස්ත්‍රය නො වේ. රජුට සැලකළහ. ඉක්බිති, රජ ඇය ගෙන්වා තී ස්වාමි වස්ත්‍රයක් ඉල්ලන්නීදැ යි ඇසීය. එසේය, දේවයයිනි. හිමියා ගැහැනියගේ වස්ත්‍රය වේ. හිමියා නැති කල්හි දහසක් වටිනා වස්ත්‍රයක් ඇන්දත් ස්ත්‍රිය නිරුවත් වන්නීය. මෙකරුණ සනාථ කරනු සඳහා,

"නග්ගා නදී අනොදිකා නග්ගං රට්ඨං අරාජිකං
ඉත්ථීපි විධවා නග්ගා යස්සාපි දසභාතරොති"

දිය නැති ගඟ හෙළුය. රජකු නැති රට හෙළුය. යම්
ස්ත්‍රියකට සොහොයුරු දශ දෙනකු සිටිය ද හෙළු වූවාය.

මේ ගාථාව ගෙනහැර දක්වීය. කොසොල් රජ ඇයට පැහැදී මේ තිදෙනා තිගේ කවුරු ද ? දේවයිනි, එකකු මගේ සැමියාය. එකකු සොහොයුරුය. අනිකා මගේ පුත්‍රයාය. මම තිට පැහැදුනෙමි. මේ තිදෙනාගෙන් එකකු දෙමි. තී කවරකු කැමැත්තීදැ යි ඇසීය. දේවයිනි, මම ජීවත් වුවහොත් තවත් සැමියකු ලැබිය හැක. පුතකු ද ලැබිය හැක. එහෙත් මව්පියන් මළ බැවින් සොහොයුරකු ලැබිය නො හැකිය. එම නිසා මට සොහොයුරා දෙනු මැනවැ යි කීවාය. රජ සතුටු ව තිදෙනා ම නිදහස් කළේය. මෙසේ එක කතක් නිසා තිදෙනෙක් දුකින් මිදුණාහ. මෙකරුණ භික්ෂූන් අතර ප්‍රකට විය. දිනක් දම් සබාවෙහි රැස්වූ භික්ෂූහු, ඇවැත්නි, එක් කාන්තාවක නිසා

තිදෙනෙක් දුකින් මිදුණාහුයැ යි ඇගේ ගුණ කියමින් හුන්නාහුය. බුදුහු වැඩ මහණෙනි, දැන් කිනම් කථාවකින් සිටියාහුදැ යි විචාරා, මෙනම් කථාවක්යැ යි කී කල්හි, මහණෙනි, මේ කත මේ තිදෙනා දුකින් මිදුවා දැන් පමණක් නො වේ. පෙර ද දුකින් මිදුවායැ යී වදාරා ඉකුත් වත ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කැරවන කල්හි තිදෙනෙක් වන අබියෙස සී සාත්, සියල්ල පෙර මෙනි. එදා රජු තිදෙනාගෙන් කවරකු කැමැතිදැ යි ඇසූ කල්හි ඒ ස්ත්‍රිය දේවයිනි, තිදෙනා ම දිය හැකිදැ යි කී කල්හි දේවයිනි, තිදෙනා ම දිය නො හැකිදැ යි ඇසුවාය. එසේය, නො හැක්කෙමි. ඉදින්, තිදෙනා ම දෙන්ට නො හැකි නම් මගේ සොහොයුරා දෙනු මැනවි. නැත. පුත්‍රයා හෝ හිමියා ගනුව. සොහොයුරාගෙන් ඇති ඵලය කුමක්දැ යි කියන ලද්දේ, දේවයිනි, මේ දෙදෙනා පහසුවෙන් ලබාගත හැකිය. සොහොයුරා එසේ ලබාගත නො හැකියැ යි කියා මේ ගාථාව කීවාය.

"උච්ඡඞ්ගෙ දෙව මෙ පුත්තො පථෙ ධාවන්තියා පති
තඤ්ච දෙසං න පස්සාමි යතො සොදරියමානයෙති"

"දේවයිනි, පුත්‍රයා මගේ ඇකයෙහිය. මහමඟ යන මට හිමියන් සුලභය. එහෙත් සහෝදරයකු ගෙනෙන ස්ථානය වූ මව් කුස නො දකිමි."

එහි, "උච්ඡඞ්ගෙ දෙව මෙ පුත්තො" දේවයිනි, මගේ පුත්‍රයා ඇකයෙහි මය. යම් සේ වනයට ගොස් පළා නෙලා ඉණෙහි ලාගන්නා මට ඉණට පළා සැළවේය. එමෙන් ස්ත්‍රියට දරුවන් ද ඉණට පළා මෙන් සුලභය. එම නිසා දේවයිනි, මගේ පුත්‍රයා ඉණෙහි යි කීවාය. "පථෙ ධාවන්තියා පති" මඟට බැස හුදකළාව ගමන් කරන ස්ත්‍රියට ද හිමියෝ සුලබය. දුටු දුටු පුරුෂයා හිමියා වෙයි. ඒ නිසා මඟ යනවිට පුරුෂයන් සුලභයැ යි කියන ලදී. "තඤ්ච දෙසං න පස්සාමි යතො සොදරියමානයෙති" යම් හෙයකින් මගේ මව්පියන් නැද්ද, එම නිසා ඒ මව් කුස නම් වූ ඇන් තැනක් නො දකිමි. යම් හෙයකින් මා හා එක කුසෙහි උපන් බැවින් සමාන කුස ඇති

සොහොයුරා ගෙන්වා ගනිමි. එම නිසා මට සොහොයුරාව දෙනු මැනවි. රජ මැය ඇත්තක් ම කියතැ යි සතුටු ව මිනිසුන් තිදෙනා ම සිර ගෙයින් ගෙන්වා දුන්නේය. ඈ ඒ තිදෙනා ම රැගෙන ගියාය.

බුදු රජහු ද මහණෙනි, මේ ස්ත්‍රිය දැන් පමණක් නොව පෙර ද මේ තිදෙනා දුකින් මුදාගත්තායැ යි මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා ජාතකය නිමවූහ. පෙර සතර දෙනා මේ දවස ද ඒ සතර දෙනා මය. එ සමයෙහි රජ වනාහි මම ම වීමි.

## 1. 7. 8.

## සාකේත ජාතකය

**"යස්මිං මනො නිවිසතී"** යන මේ ජාතක දේශනාව බුදු රජහු සාකේත නුවර ඇසුරු කොට අඳුන් වනයෙහි වැඩවසන සේක්, එක්තරා බමුණකු අරබයා දෙසූහ. බුදු රජහු මහසඟන පිරිවරා සාකේත නුවර ඇසුරු කොට අඳුන් වනයට පිවිසෙන කල්හි, සාකේත නුවර වැසි එක්තරා මහළු බමුණෙක් නුවරින් බැහැරට යන්නේ, දොරටුව අබියෙස බුදු රජුන් දැක පාමුල වැටී ගොප්මස දැඩි ව අල්ලාගෙන දරුව මව්පියන් මහළු දුබල වූ කල්හි පුතුන් විසින් බලාගත යුත්තේ නො වේ ද ? කුමක් නිසා මෙතෙක් කලක් අපට තමන් නො දක්වූයෙහි ද ? මා විසින් නම් අද ඔබ දන්නා ලද්දෙහිය. ඔබ මව්තුමිය දැකීමට එනු මැනවැ යි බුදු රජුන් රැගෙන තම ගෙදරට ගොස් බුදු රජහු එහි පැනවූ අසුනෙහි වැඩ හුන්හ. බැමිණිය ද පැමිණ බුදුන් පාමුල වැටී දරුව, මෙතෙක් කල් කොහි ගියෙහි ද ? මහළු මව්පියෝ උවටැන් කළ යුත්තෝ නො වෙත්දැ යි වැළපුණාය. දූදරුවන් ලවා ද එව්, සොහොයුරා වඳින්නැ යි බුදුන් වැන්දවූහ. දෙදෙනා ම සතුටු ව මහදන් දුන්හ. බුදු රජුහු මෙත්සිත නිමවා ඒ දෙදෙනාටම ජරා සූත්‍රය දෙසූහ. දේශනා සූත්‍රය අවසානයෙහි ඒ දෙදෙනා ම අනාගාමී ඵලයෙහි පිහිටියහ. බුදු රජහු ද වැඩසිටි අසුනින් නැගිට අඳුන් වනයට වැඩියහ. භික්ෂූහු දම්

සබාවෙහි රැස්ව කථාවක් ඉපදවූහ. ඇවැත්නි, බමුණා බුදු රජුන්ගේ මව්පියන් සුද්ධෝන, මහා මායා දෙදෙන බව දනී. එසේ දන දනත් බැමිණිය සමග බුදු රජුන් අපගේ පුත්‍රයා යි කියයි. බුදුහු ද ඒ ඉවසති. හේතුව කිම ද ? මේ කථාව ඇසූ බුදුහු, මහණෙනි, ඒ දෙදෙනා ම තමන්ගේ පුත්‍රයාට ම පුත්‍රයා යි කියති යි ඉකුත් වත ගෙනහැර දක්වූහ.

මහණෙනි, මේ බමුණා අතීතයෙහි අතරක් නැති ව පන්සියයක් අත් බැව්හි එසේ පියා වූයේය. පන්සියයක් අත්බැව්හි සුළු පියා විය. පන්සියයක් අත්බැව්හි මහපියා විය. මේ බැමිණිය ද අතරක් නැති ව පන්සියයක් අත්බැව්හි මව වූවාය. පන්සියයක් අත්බැව්හි සුළු මව වූවාය. පන්සියයක් අත්බැව්හි මහමව වූවාය. මෙසේ මම එක්දහස් පන්සියයක් අත්බැව්හි මේ බමුණා අතෙහි වැඩුණෙමි. එක් දහස් පන්සියයක් බැමිණිය අතෙහි වැඩුණෙමි. තුන්දහසක් ඇත්තෙමි යි වදාරා මේ ගාථාව වදාළහ.

**"යස්මිං මනො නිවිසති චිත්තං වාපි පසීදති,**
**අදිට්ඨපුබ්බකෙ පොසෙ කාමං තස්මිම්පි විස්සසෙති"**

"යමකු කෙරෙහි සිත පිහිටා ද සිත පහදී ද පෙර
නුදුටුවිරූ ඒ පුරුෂයා කෙරෙහි ඒකාන්තයෙන් විශ්වාසය
තබන්නේය."

එහි, "**යස්මිං මනො නිවිසති**" යම් පුද්ගලයකු දුටුමතින් ම සිත පිහිටයි ද "**චිත්තං වාපි පසීදති**" යමකු දුටුමතින් සිත පහදී ද මෘදු වේ ද "**අදිට්ඨපුබ්බකෙ පොසෙ**" සාමාන්‍යයෙන් එම අත්බැව්හි දී පෙර නුදුටු පුද්ගලයා කෙරෙහි, "**කාමං තස්මිම්පි විස්සසෙ**" පෙර පුරුදු සෙනෙහසින් ම ඒ පුද්ගලයා කෙරෙහි ද විශ්වාසය තබන්නේය. හිතවත් බවට පත්වන්නේය, යන අර්ථයි.

මෙසේ බුදු රජහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා ජාතකය නිමවූහ. එකල බමුණා සහ බැමිණිය මේ දෙදෙනා ම වූහ. පුත්‍රයා මම ම වීමි.

## 1. 7. 9.

## විසවන්ත ජාතකය

"ධිරත්‍ථුතං විසංවන්තං" යන මේ ජාතක දේශනාව බුදු රජහු දෙව්රම් වෙහෙර වසන්නාහු, දම් සෙනෙවි සැරියුත් තෙරණුවන් අරබයා දෙසූහ.

සැරියුත් තෙරණුවන් පිටිකැවිලි වළඳන කාලයෙහි මිනිස්සු සංඝයා උදෙසා බොහෝ පිටිකැවිලි ගෙන විහාරයට ගියාහුය. මහසඟන පිළිගත් පසු බොහෝ ඉතිරිවිය. මිනිස්සු, ස්වාමීනී, ඇතුළු ගමට ගිය භික්‍ෂු සංඝයා උදෙසා ද පිළිගන්නැ යි කීවාහුය. එවෙලාවෙහි තෙරුණුවන්ගේ ශිෂ්‍යය ළදරු භික්‍ෂුවක් ඇතුළු ගමෙහි වෙයි. ඔහුගේ කොටස ගෙන ඔහු නො පැමිණි නිසා වේලාව ඉක්මෙතැ යි සිතා තෙරණුවන්ට දුන්හ. තෙරණුවෝ ඒ වැළඳූ කල්හි ළදරු භික්‍ෂුව පැමිණියේය. තෙරණුවෝ ඔහුට ඇවැත්නි, අපි ඔබ සඳහා තැබූ කොටස වැළඳුවෙමු යි කීහ. එවිට ළදරු භික්‍ෂුව, ස්වාමීනි, ඉතා මිහිරි ද ? කවරකුට මිහිරි දෙය අප්‍රිය වේද යි කීය. තෙරුණුවන්ට සංවේගය ඇතිවිය. තෙරණුවෝ එතැන් සිට පිටි ආහාර වර්ග නො වළඳමි යි ඉටා ගත්හ. එතැන් සිට තෙරණුවන් විසින් පිටිකැවිලි නො වැළඳන වීරීය. උන් වහන්සේ පිටි කැවිලි නො වළඳන බව භික්‍ෂූන් අතර ප්‍රකට විය. ඔවුහු දම් සබාවෙහි ද මේ පිළිබඳ ව කථා කැරෙමින් හුන්හ. බුදු රජහු මහණෙනි, කවර කථාවකින් දැන් හුන්නාහුදැ යි විචාරා, මෙනම් කථාවකින්යැ යි කී කල්හි, මහණෙනි, සැරියුත්හු එක්වරක් හළදෙය ජීවිතය අත්හළ ද නැවත නො ගනිතැ යි වදාරා ඉකුත් කථාව ගෙන හැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු විෂ වෛද්‍ය කුලයක ඉපිද වෙදකමින් දිවි ගෙවූහ. එකල සර්පයෙක් පිටිසර වැසියකුට දෂ්ඨ කළේය. ඔහුගේ ඤාතීහු ඔහු නො පමා ව වෛද්‍යවරයා වෙත ගෙන ගියහ. වෛද්‍යවරයා කිම, බෙහෙත් උපයෝගී කොට විෂ හරීම් ද, නැතිනම් සපාකෑ සර්පයා මෙහි ගෙන්වා ඌ ලවා විෂ උරා ඉවත් කැරවන්නේදැ යි සිතන්නේ, ඔහු

සර්පයා ගෙන්වා තා විසින් මොහු දෂ්ඨ කරන ලද්දේදැ යි ඇසීය. එසේය, මා විසිනි. තෝ ඩැහැගත් තැනින් මුව තබා විෂ උරව. එවිට සර්පයා මවිසින් බැහැර කළ විෂ නැවත නො ඉරූ විය. නැවත වෛද්‍යවරයා විසින් ගෙන්වන ලදුව, දර ගිනි දල්වා මෙසේ කීය. ඉදින්, තෝ විෂ බැහැර නො කරන්නේ නම් ගින්නට පිවිසෙව. සර්පයා ද මම හළ විෂ නො උරමි. තමා එක් වරක් හළ විෂ පසු ව වමනය නො කරමි යි කියා මේ ගාථාව කීය.

**"ධිරත්‍ථු තං විසං වන්තං යමහං ජීවිතකාරණා,**
**වන්තං පච්චාවමිස්සාමි මතමෙම ජීවිතා වරන්ති"**

"යම් විෂ යක් අත්හරන ලද්දේ ද, වමනය කළ ඒ විෂ ජීවිත පැවැත්ම සඳහාවත් නැවත හැරගැනීම් වේ ද ඒ විෂට නින්දා වේවා."

එහි, **"ධිරත්‍ථු"** යනු ගැරහීම අර්ථයෙහි නිපාතයි. **"තං විසන්ති යමහං ජීවිතකාරණා"**, ඒ විෂ ජීවිතයේ පැවැත්ම සඳහා වමනය කළ විෂ, **"පච්චාවමිස්සාමි"** ඒ වමනය කළ විෂට නින්දා වේවා. **"මතමෙම ජීවිතා වරන්ති"** ඒ විෂ පසු ව වමනය නො කිරීම හේතුවෙන් ගින්නට පිවිස මරණයක් වේ ද, ඒ මරණය ජීවත් වීමට වඩා උතුම් වේ යන අර්ථයි. මෙසේ ද කියා සර්පයා ගින්නට පිවිසීමට ගියේය. එවිට වෛද්‍යවරයා වළකා දෂ්ඨ කරන ලද මිනිසා බෙහෙත් මන්ත්‍ර විධිවලින් විෂ රහිත කොට නීරෝගී කොට සර්පයාට සිල් දී මින්පසු කිසිවකුට දෂ්ඨ නො කරවයි අත් හළේය.

මහණෙනි, සැරියුත් වරක් අත්හළ දෙය දිවිය තතත් නැවත නො ගන්නේයැ යි ධර්ම දේශනය ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා ජාතකය නිම කළහ. එදා සර්පයා සැරියුත් තෙරණුවෝ වූහ. වෛද්‍යවරයා මම ම වීමි.

## 1. 7. 10.

## කුද්දාල ජාතකය

"න තං ජිතං සාධු ජිතන්ති" යන මේ ජාතක දේශනාව බුදු රජහු දෙව්රම් වෙහෙරෙහි වසන්නාහු, චිත්තහත්ථ සාරිපුත්ත තෙරුණුවන් අරබයා වදාළහ.

ඔහු වනාහි සැවැත් නුවර එක් කුල දරුවෙකි. එක් දවසක් ඔහු සී සා එන්නේ විහාරයට ගොස් එක් තෙර නමකගේ පාත්‍රයෙන් සිනිඳු, මියුරු, ප්‍රණීත අහර ලැබ මෙසේ සිතීය. අපි, රෑ දවල් සියතින් නොයෙක් කර්මාන්ත කරන නමුදු මෙවැනි මිහිරි ආහාරයක් නො ලබමු. මා ද පැවිද්දකු විය යුතුය. පැවිදි ව එක මසක් ඇවෑමෙන් නුනුවණින් සිතන්නේ, ක්ලේශයන්ට වසඟ වූවෙක් වී සිවුරු හැර නැවත ආහාරයෙන් ක්ලාන්ත වන්නේ, අවුත් පැවිදි ව අභිධර්මය උගත්තේය. මේ ආකාරයෙන් සය වරක් උපැවිදි ව පැවිදි වූයේය. ඉක්බිති, සත් වැනි භික්‍ෂු භාවයෙහි සිට සප්ත ප්‍රකරණය ප්‍රගුණ කරන්නෙක් වී බොහෝ භික්‍ෂූන්ට ධර්මය උගන්වමින් විදසුන් වඩා රහත් ඵලයට පැමිණියේය. එකල්හි ඔහුගේ යහළු භික්‍ෂූහු ඇවත්නි චිත්තය, කිම, ඔබ පෙර මෙන් ගිහි වීමට සුදුසු නො වෙයි. මෙසේ මේ තෙරණුවන් රහත් බවට පැමිණි කල්හි දම් සබාවෙහි මේ කථාව මතුවිය. ඇවැත්නි, මෙබඳු රහත් වීමට හේතු සම්පත් ඇති කල්හිත් චිත්තහත්ථ සාරිපුත්ත තෙරණුවෝ සයවරක් උපැවිදි වූහ. අනේ! පුහුදුන් බව මහත් දෝෂයකි. බුදු රජහු වැඩමවා මහණෙනි, දැන් මෙහි කවර කථාවකින් හුන්නාහුද යි විචාරා මෙනම් කථාවකින්යැ යි කී කල්හි මහණෙනි, පුහුදුන් සිත නම් වහා වෙනස් වන්නේය. පාලනය කැර ගැනීම අපහසුය. අරමුණු වශයෙන් ගොස් ඇලෙයි. එක වරක් ඇලුණු දෙය අත් හැරීමට අපහසු වන්නේය. මෙබඳු සිත දමනය කැරගැනීම යහපත් වන්නේය. දමනය කැරගත් ඒ සිත සැප එළවයි.

"දුන්නිග්ගහස්ස ලහුනො යත්ථ කාමනිපාතිනො,
චිත්තස්ස දමථො සාධු චිත්තං දන්තං සුඛාවහං"

"පාලනය කිරීමට අපහසු වූ ඉක්මන් ගමන් ඇත්තා වූ කැමැති තැනක එල්බ ගන්නා වූ සිත දමනය කිරීම යහපති. දමනය කළ සිත සැප එළවන්නේය."

මේ සිතෙහි පාලනය කිරීම අපහසු නිසා පෙර පඬිවරු එක් උදල්ලක් නිසා එය අත් හැරීමට නො හැකි ව එහි ආශාව නිසා සයවරක් උපැවිදි ව සත් වැනි වර පැවිදි වූ කල්හි ධ්‍යාන උපදවා ඒ ලෝභයට නිග්‍රහ කළහ යි වදාරා අතීත කථාව ගෙනහැර දක්වූහ.

අතීතයෙහි බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරද්දී බෝසතාණන් වහන්සේ පලා විකුණන කුලයෙහි ඉපදී වැඩිවියට පැමිණියේය. කුද්දාල පණ්ඩිතයා යි මොහුට නමක් විය. උදල්ලෙන් පොළොව සකස්කොට පලා, ලබු, කොමඩු, පුහුල්, කැකිරි ආදිය වපුරා ඒවා විකිණීමෙන් දුගී ජීවිතයක් ගෙවීය. ඔහුට උදල්ල හැර වෙන ධනයක් නොවීය. ඔහු එක් දිනක් මෙසේ සිතීය. මට ගිහි ගෙයි විසීමෙන් කවර ප්‍රයෝජනයක් ද ? ගිහි ගෙයින් නික්මී පැවිදි වන්නෙමි. ඉක්බිති, එක් දවසක් උදල්ල සැඟවුණු තැනක තබා තාපස පැවිද්දෙන් පැවිදි ව ඒ උදල්ල නැවත සිහිකොට ආශාව සිඳීමට නො හැකි ව වකුටු උදල්ල නිසා උපැවිදි විය. මෙසේ දෙවැනි තෙවැනි වාර වශයෙන් හය වරක් ඒ උදල්ල සඟවා තබා පැවිදි වූයේ ද උපැවිදි වූයේ ද විය. සත් වැනි වර මෙසේ සිතීය. මම මේ වකුටු උදල්ල නිසා නැවත නැවත උපැවිදි වීමි. දැන් මම උදල්ල ගඟට දමා පැවිදි වන්නෙමි. ගංතෙරට ගොස් ඉදින් ඒ උදල්ල වැටුණු තැන දකින්නේ නම් නැවත අවුත් ගොඩ ගනු කැමැති බවක් වන්නේය. ඒ උදල්ල මිටෙන් ගෙන ඇතකුගේ ශක්තිය ඇති ඔහු හිස වටා තුන්වරක් කරකවා ඇස් වසා ගඟ මැදට විසිකොට මා විසින් දිනන ලද්දේයැ යි තුන් වරක් සිංහ නාද කෙළේය. එකෙණෙහි බරණැස් රජ පසල් දනව්වක් සංසිඳුවා පැමිණියේ ගඟෙන් දිය නා සියලු ආභරණයෙන් සැරසී ඇතුපිටින් යන්නේ, ඒ බෝසතුන්ගේ ශබ්දය අසා මේ පුරුෂයා මා විසින් දිනන ලදැ යි කියයි. මොහු විසින් දිනන ලද්දේ කුමක් ද ? ඔහු කැඳවනු. ඔහු කැඳවා පින්වත් පුරුෂය, මම වනාහි දිනන ලද සංග්‍රාම ඇති ව දැන් ජය ගෙන එමි. නුඹ විසින් කුමක් දිනන ලදදැ යි විචාළේය. බෝසතාණන් වහන්සේ, මහරජ, නුඹ විසින් යුද්ධ දහසක්, ලක්ෂයක් දිනුවත් එය දිනන ලද්දක් නො වේ.

කෙලෙස් නො දිනන ලද බැවිනි. මම වනාහි මගේ ඇතුළත (සිතෙහි, ලෝභය යටපත් කරමින් කෙලෙස් දිනුවෙමි යි කියමින් ම ගඟ දෙස බලා ආපෝ කසිණය අරමුණු කොටගෙන ධ්‍යාන උපදවා ලබන ලද ආනුභාව ඇත්තේ, අහසෙහි හිඳ රජුට දහම් දෙසමින් මේ ගාථාව කීවේය.

**"න තං ජිතං සාධු ජිතං යං ජිතං අවජීයති,**

**තං බො ජිතං සාධු ජිතං යං ජිතං නාවජීයතී"**

"යම් ජයක් (සතුරන් පරදවනු ලැබ) ලැබේ ද, ඒ දිනුම මනාකොට දිනුවා නම් නො වේ. යම් ජයක් (සතුරන් විසින්) පරදවනු නො ලැබේ ද, ඒ දිනුම ම මනාකොට දිනුවා නම් වේ."

එහි, "**න තං ජිතං සාධු ජිතං යං ජිතං අවජීයති**" යි සතුරන් පරාජය කොට දිනන ලද රට නැවත පරාජය වූ සතුරන් විසින් පරාජය කරනු ලැබේ. ඒ දිනීම යහපත් දිනීමක් නො වේ. මක්නිසා ද, නැවත පරාජය කරනු ලබන හෙයිනි. වෙනත් ක්‍රමයකින් "**ජිත**" යන්නෙන් ජය කියනු ලැබේ. යමකු සතුරන් සමග යුද්ධ කොට ලබන ලද ජය නැවත ඒ සතුරන් අතින් පරාජය වේ. එම නිසා ඒ ජය යහපත් නො වේ. නො මැනවි. කුමක් නිසා ද, නැවත පරාජය වන හෙයිනි. "**තං බො ජිතං සාධු ජිතං යං ජිතං නාවජීයතී**" පසමිතුරන් මැඩ පවත්වා යමක් දිනන ලද ද, නැවත ඔවුන් විසින් පරාජය කරනු නො ලැබේ ද ? යම් ඒ එක වරක් ලැබූ ජය නැවත පරාජය නො වේ ද ? ඒ දිනීම යහපත් දිනීමකි. සාර්ථක දිනීමකි. ඒ ජය යහපත්ය. සාර්ථකය. මක්නිසා ද යත්, නැවත පරාජය කරනු නො ලබන හෙයිනි. එහෙයින් මහරජ, ඔබ දහස්වරක් සූතිස් වරක් යුද්ධයක් දිනුව ද සංග්‍රාම යෝධයකු නො වේ. මක් නිසා ද, තමාගේ කෙලෙස් සතුරන් නො දිනූ බැවිනි. යමෙක් එකි වරක් මෙන් තමාගේ සිතෙහි වූ ක්ලේශයන් දිනත් ද ඔහු උසස් සංග්‍රාම යෝධයෙකැ යි අහසෙහි ම හුන්නේ, බුදු රජුන්ගේ ආකාරයෙන් රජුට දම් දෙසූහ. මෙහි උසස් රණ ශූරත්වය වනාහි,

"යො සහස්සං සහස්සෙන සඞ්ගාමෙ මානුසෙ ජිණෙ,
එකං ච ජෙය්‍ය අත්තානං ස වෙ සඞ්ගාමජුත්තමො"

"යමකු යුද්ධයක දී දහසින් ගුණකළ දහසක් මිනිසුන් ජය ගනී ද, යමක තමාගේ එක ම ආත්මය ජය ගනී ද ඒ පුද්ගලයා සංග්‍රාමයෙන් උපන් උත්තම පුරුෂයා වෙයි."

මේ සූත්‍රය උදාහරණයි. රජු දහම් අසමින් සිටිය දී ම තදඞ්ග වශයෙන් හොත් තාවකාලික කෙළෙස් ප්‍රහීණ වී පැවිද්දට සිත නැමුණේය. එසේ ම බල සේනාවගේ කෙළෙස් තදඞ්ග වශයෙන් ප්‍රහීණ විය.

රජ, දූත් ඔබ කොහි යන්නෙහිදැ යි බෝසතුන්ගෙන් විචාළේය. මහරජ, මම හිමවතට ගොස් තවුස් පැවිද්දෙන් පැවිදි වන්නෙමි. එසේ නම් මම ද පැවිදි වන්නෙමි යි බෝසතුන් සමඟ නික්මුණේය. බල සෙනඟ ද බමුණු ගැහැවියෝ ද වෙනත් සිටු ආදී ශ්‍රේණිහු ද සියලු එහි රැස්වූ ජන සමූහයෝ ද රජු සමග ම නික්මුණහ. බරණැස් වැසියෝ ද, අපගේ රජ කුද්දාල පණ්ඩිතයන්ගේ දම් දෙසුම අසා පැවිද්දට නැඹුරු වී බල සෙනඟ සමග ම නික්මුණහ. අපි මෙහි කුමක් කරමුදැ යි දොළොස් යොදුනක් වූ බරණැස් නුවර සියලු වැසියෝ ද නික්මුණහ. සියලු පිරිස දොළොස් යොදුනක් විය. බෝසත්හු ඒ සියලු පිරිස ගෙන හිමවතට පිවිසියහ. එකෙණෙහි සක් දෙවිඳු හුන් අසුන උණුසුම් බවක් දැක්වීය.

ඔහු මෙනෙහි කරන්නේ, කුද්දාල පණ්ඩිතයන් ගිහි ගෙයින් නික්මුණු බව දැක එහි මහත් ජන සමූහයක් වන්නේය. වසන ස්ථානයක් ලැබීමට වටී යි, විස්කම් දෙව්පුත් අමතා දරුව, කුද්දාල පණ්ඩිතයෝ ගිහි ගෙයින් නික්මුණහ. ඔහුට විසීමට තැනක් ලැබීමට වටියි. ඔබ හිමවත් පෙදෙසට ගොස් සමබිම් කොටසක දිගින් තිස් යොදුනක් ද පළලින් පසළොස් යොදුනක් පමණ වූ ද පන්සලක් මවනු යි කීය. ඔහු ද දේවයිනි, මැනව යි පිළිවදන් දී ගොස් එසේ කෙළේය. මේ මෙහි සැකවින් දැක්වීමකි. විස්තර වනාහි හත්ථිපාල

ජාතකයේ මතු සඳහන් වන්නේය. එද මෙද එක පරිච්ඡේදයක් ම වේ.

විශ්ව කර්මයා ද ආශ්‍රමයෙහි පන්සලක් මවා අසුභ ශබ්ද ඇති සිව්පාවුන් හා පක්ෂීන් ද අමනුෂ්‍යයන් ද බැහැර කැරවා ඒ ඒ දිශාවලින් යාහැකි අඩිපාරක් වෙන්කැරවා තමන්ගේ වසන තැනට ම ගියේය. කුද්දාල පඬිතුමා ද ඒ පිරිස ගෙන හිමාල වනයට පිවිස ශක්‍රයා විසින් දෙන ලද අසපුවට ගොස් විශ්ව කර්මයා විසින් මවන ලද පැවිදි පිරිකර ගෙන පළමු ව තමා පැවිදි ව පසුව පිරිස පැවිදි කැරවා අසපුව බෙදා දුන්නේය. රාජ්‍යය හතක් අත්හැරියහ. තිස් යොදුන් අසපුව පිරුණේය. කුද්දාල පඬිතුමා ද සෙසු කසිණයන් පිරියම් කොට බ්‍රහ්මවිහාරයන් වඩා පිරිසට කමටහන් කියා දුන්නේය. සියල්ලෝ සමාපත්ති ලාභීන් වී බ්‍රහ්මවිහාරයන් වඩා බඹ ලොව උපන්නාහුය. යමෙක් ඔවුන්ගේ ආවතේව කළාහු ද ඔවුහු ද දෙව්ලොව උප්නාහුය.

බුදු රජහු මෙසේ මහණෙනි, මේ සිත වනාහි කෙළෙස් වශයෙන් ඇලීමට, මුදාහැරීමට නො හැකි වෙයි. උපන්නා වූ ලෝභා ධර්මයන් දුරුකිරීමට අපහසුය. මෙබඳු වූ පණ්ඩිත පුරුෂයන් ද අනුවණයන් කරත්යැ යි, මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා සිව්සස් දේශනා කළ සේක. සත්‍යය දේශනාව කෙළවර සමහරෙක් සෝවාන් වූහ. සමහරෙක් සකෘදාගාමී වූහ. සමහරෙක් අනාගාමී වූහ. සමහරෙක් රහත් භාවයට පැමිණියාහුය. බුදු රජහු ද පූර්වාපර සන්ධීන් ගළපා ජාතක කථාව නිමවා වදාළ සේක. එකල රජ ආනන්ද විය. පිරිස බුදු පිරිසයි. කුද්දාල පඬිතුමා වනාහි මම ම වෙමි.

## සත් වැනි ස්ත්‍රී වර්ගයයි.

## 1. 8. 1.

## වාරුණ ජාතකය

"යො පුබ්බෙ කරණීයානි" යන යන මේ දේශනාව බුදු රජාණන් වහන්සේ දෙව්රම් වෙහෙරෙහි වැඩ වාසය කරන සේක්, කුටිම්බියපුත්ත තිස්ස තෙරුන් අරබයා වදාළහ.

එක් දවසක සැවැත් නුවර වාසීහු ඔවුනොවුන් හා යහළු වූ කුල පුත්‍රයෝ තිස් දෙනෙක් සුවඳ මල් වස්ත්‍රාදිය ගෙන බුදු රජාණන් වහන්සේගේ ධර්මය අසන්නෙමු යි මහ ජනයා පිරිවරා දෙව්රමට ගොස් නා මළුවල හා සල් මළුවල මඳ වේලාවක් හිඳ සවස් කාලයෙහි බුදු රජුන් සුවඳ ගල්වන ලද ගඳ කිළියෙන් නික්ම දම් සබාවට වැඩමවා අලංකාර කළ බුද්ධාසනයෙහි වැඩ හුන් කල්හි, පිරිවර සහිත ව දම් සබාවට ගොස් බුදු රජුන් සුවඳ මලින් පුදා සක් ලකුණෙන් විසුතුරු වූ පිපුණු නෙළුම් මලක් බඳු පාදයන් වැඳ එකත් පසෙක හිඳ දහම් ඇසූහ. ඉක්බිති, ඔවුන්ට මෙබඳු සිතක් ඇති විය. බුදු රජුන් දෙසූ දහම යම් සේ අපි අවබෝධ කැර ගතිමු. ඒ නිසා අපි පැවිදි වෙමු. ඔවුහු බුදු රජුන් දම් සබාවෙන් නික්ම වැඩි කල්හි බුදු රජුන් වෙත එළැඹ වැඳ පැවිද්ද ඉල්ලූහ. බුදු රජහු ඔවුන්ට පැවිද්ද දුන්හ.

ඔවුහු භික්ෂූහු ආචාර්ය උපාධ්‍යායයන්ගේ සිත් ගෙන උපසම්පදාව ලැබ පස් වසක් ආචාර්ය උපාධ්‍යයන් සමීපයෙහි වැස උභය ප්‍රාතිමෝක්ෂය ප්‍රගුණ කොට කැප අකැප දේ දූන ත්‍රිවිධ අනුමෝදනා බණ ඉගෙන සිවුරු මසා පඬු පොවා මහණ දම් පුරන්නෙමු යි ආචාර්ය උපාධ්‍යායයන් විචාරා බුදු රජුන් වෙත එළැඹ වැඳ එකත් පසෙක හිඳ ස්වාමීනි, අපි සසරෙහි කළකිරුණෝ වෙමු. ජාති, ජරා, ව්‍යාධි, මරණ බියෙන් බියපත් වූවෝ වෙමු. ඒ අපට සසරින් මිදීම සඳහා කමටහනක් කියාදෙනු මැනවැ යි ඉල්ලූහ. බුදු රජහු ඔවුන්ට අටතිස් කර්ම ස්ථාන අතුරෙන් සුදුසු කර්ම ස්ථානයක් තෝරා ප්‍රකාශ කළහ.

ඒ භික්ෂූහු බුදුන් වෙතින් කර්ම ස්ථාන ගෙන බුදු රජුන් වැඳ පැදකුණු කොට පිරිවෙනට ගොස් ආචාර්ය උපාධ්‍යායයන් බලා පාසිවුරු ගෙන මහණ දම් පුරන්නෙමු යි නික්මුණහ.

ඉක්බිති, ඔවුනතුරෙන් නමින් කෙළඹිපුත් තිස්ස තෙර නම් භික්ෂුව කුසීතය. වීර්යයෙන් තොරය. රසෙහි ගිජු වූයේය. ඔහු මෙසේ සිතීය. මම වනයෙහි විසීමට හෝ මහා වීර්යය කිරීමට හෝ පිඬු සිඟීමෙන් යැපීමට හෝ නො හැක්කෙමි. මේ ගමනින් මට කවර ප්‍රයෝජනයක් ද ? නවතිමි යි, ඔහු වීර්යය අත්හැර ඒ භික්ෂූන්ට පසුගමන් කොට නැවතුණේය. ඒ භික්ෂූහු ද කොසොල් දනව්වෙහි චාරිකාවෙහි හැසිරෙමින් එක්තරා පසල් ගමකට ගොස් එගම ඇසුරු කොට වන සෙනසුනක වස් එළැඹ තෙමස ඇතුළත උත්සාහයෙන් කමටහන් වඩන්නාහු, විදර්ශනාව ගැබ්ගන්වා පොළොව නාද කැරෙමින් රහත් බවට පත් ව එළැඹි වස් ඇත්තාහු, පවාරණය කොට තමා ලැබූ නැණ විශේෂය බුදු රජුන්ට සැල කරන්නෙමුයි එයින් නික්ම පිළිවෙළින් දෙව්රමට වැඩ පාසිවුරු තැන්පත් කොට ආචාර්ය උපාධ්‍යායන් දැක බුදු රජුන් දකිනු කැමැති ව බුදු රජුන් වෙත ගොස් වැඳ හිඳ ගත්හ. බුදු රජහු ඔවුන් සමඟ මිහිරි පිළිසඳර කළහ. කළ පිළිසඳර ඇත්තාහු, තමන් විසින් ලබන ලද ගුණය බුදු රජුන්ට සැල කළහ. බුදු රජහු ඒ භික්ෂූන් පැසසූහ.

කෙළඹි පුත් තිස්ස තෙර බුදු රජුන් ඔවුන්ගේ ගුණ කථා කරනු දැක තෙමේ ද මහණ දම් පුරනු කැමැත්තේ වූයේය. ඒ රහත් භික්ෂූහු ද ස්වාමීනි, අපි ද එම අරණ්‍යය වාසයට ම ගොස් වසන්නෙමි යි බුදු රජුන් විචාළහ. බුදු රජහු මැනවැ යි අවසර දුන්හ. උන් වහන්සේලා බුදුන් වැඳ පිරිවෙණට ගියහ. ඉක්බිති, ඒ කෙළඹි පුත් තිස්ස තෙර ද මුළු රාත්‍රී කාලයෙහි ම පටන් ගන්නා ලද දැඩි වීර්යය ඇත්තෙක් වී, ඉතා වේගයෙන් මහණ දම් පුරන්නේ, මධ්‍යම යාමයේ එළැඹෙන පුවරුව නිසා හිටගෙන නින්දට පැමිණියේ, පෙරළී වැටී උකුල් ඇටය බිඳුණේය. දැඩි වේදනා ඇති විය. ඔහුට උපස්ථාන කළ ඒ භික්ෂූන්ගේ ගමන ද සඵල නො වීය.

බුදු රජහු උපස්ථාන ශාලාවට පැමිණි ඒ භික්ෂූන්ගෙන්, මහණෙනි, තෙපි හෙට යමු යි ඊයේ මාගෙන් අවසර ගත්තා නො වේදැ යි විචාළහ. එසේය, ස්වාමීනි, එසේ වුවත් අපගේ මේ යහළු

කෙළඹිපුත් තිස්ස තෙර නුසුදුසු වේලාවෙහි ඉතා වේගයෙන් මහණ දම් පුරන්නේ, නින්දෙන් මඩනා ලද්දේ, පෙරළී වැටිණේ, උකුල් ඇටය බිඳුණේය. ඔහු නිසා අපගේ ගමන සිදු නො වීය. මහණෙනි, හෙතෙම තමාගේ හීන වීර්යය ඇති බව නිසා නුසුදුසු වෙලාවෙහි පමණ ඉක්මවා වීර්යය කරන්නේ, තොපගේ ගමනට බාධා කරනුයේ දැන් පමණක් නො වේ. පෙර ද තොපගේ ගමනට අනතුරු කළේයැ යි වදාරා ඔවුන් විසින් අයදනා ලදුව අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර ගාන්ධාර රටේ තක්සලා නුවර බෝසත් තෙමේ දිසාපාමොක් ඇදුරු ව පන්සියයක් මානවකයන්ට ශිල්ප උගන්වයි. ඉක්බිති, ඔහුගේ ඒ මානවකයෝ එක් දිනක් දර ගෙන ඒම සඳහා වනයට ගොස් දර ඉදුරූහ. ඔවුන් කෙරෙහි එක් කම්මැලි මානවකයෙක් ලොකු ලුනුවරණ ගසක් දැක මේ වියලි ගසක්යැ යි හැඟීමෙන් මොහොතක් වැතිර හිඳ පසු ව ගසට නැඟ දර පහත හෙළා රැගෙන යන්නෙමි යි උතුරු සළුව අතුරා මැදහොවා දත්කමින් නින්දට බටුයේය. අනිත් මානවකයෝ දර මිටි බැඳගෙන යන්නේ, ඔහුගේ පිටට පයින් පහර දී අවදි කොට ගියාහුය. කම්මැලි මානවයා නැඟිට ඇස් පිසමින් පහ නො වූ නිදිමත ඇතිව ම ඒ ගසට නැඟී අත්තක් ගෙන තමා දෙසට ඇද කඩන්නේ, නැගුණු කෙළවරින් තම ඇස බිඳවාගෙන එක අතකින් ඒ ඇස වසාගෙන එක් අතකින් තෙත් දර බිඳ ගසින් බැස දර මිටිය බැඳ ඔසවා වේගයෙන් ගොස් ඔවුන් දැමූ දර මත්තෙහි හෙළීය. එදවස ම පිටිසර කුඩා ගමක එක් කුලයක් හෙට බමුණු ඇදුරන්ට පූජාවක් කරන්නෙමු යි ගුරුවරයාට ආරාධනා කළහ. ගුරුවරයා මානවකයන්ට මෙසේ කීය. දරුවනි, හෙට එක් ගමකට යා යුතුයි. තොපි නිරාහාර ව යා නො හැක්කහු, උදෙන් ම කැඳ පිසවා එහි ගොස් තම තමන් ලැබූ කොටස් ද අපගේ කොටස ද රැගෙන එවු.

ඔවුහූ අළුයම කැඳ පිසීම සඳහා දාසිය නැගිටුවා වහා අපට කැඳ පිසව යි කීවාහුය. ඕ දර ගන්නී, මත්තෙහි තිබුණා වූ තෙත දර ගෙන නැවත නැවත කටින් පිඹින්නී, හිරු උදාවන තුරු ම ගිනි දැල්වීමට නො හැකි වූවාය. මානවකයෝ දැන් ඉතා දවල් විය. දැන් යන්නට නො හැකියැ යි ගුරුවරයාගේ සමීපයට ගියහ. ගුරුවරයා කිම දරුවනි, නො ගියහු ද ? එසේය ගුරුතුමනි, නො ගියෙමු.

මක්නිසා ද ? අසවල් කම්මැලි මානවකයා අප සමග දර කැලයට ගොස් ලුනුවරණ ගස මුල නිදා පසුව වේගයෙන් ගසට නැග ඇස ද බිඳගෙන තෙත ලුනුවරණ දර ගෙනවුත් අප ගෙන ආ දර මත්තෙහි දමුවේය. කැඳ පිසින දාසිය වියලි දර යන හැඟීමෙන් ඒවා ගෙන හිරු උදාවන තුරු ම ගිනි දල්වන්නට නො හැකි වූවාය. මෙකරුණෙන් අපගේ ගමනට බාධා විය. ගුරුවරයා මානවකයා විසින් කරන ලද ක්‍රියාව අසා නුවණ නැත්තන්ගේ ක්‍රියා නිසා මෙවැනි පිරිහීම් වේයැ යි කියා මේ ගාථාව ඉදිරිපත් කළේය.

**"යො පුබ්බෙ කරණීයානි පච්ඡා සො කාතුමිච්ඡති,**
**වරණකට්ඨභඤ්ජොව සපච්ඡා මනුතප්පතීති"**

"යමෙක් පළමුකොට යුතු දෑ පසුව කරන්නට කැමැති
වේ ද, හෙතෙමේ ලුනුවරණ දඬු බිඳි මානවකයා මෙන්
පසුතැවෙයි. (ශෝක කරයි.)"

එහි, "**සපච්ඡා මනුතප්පතීති**", යම්කිසි පුද්ගලයකු මෙය පළමු ව කළ යුතුයි. මෙය පසු ව කළ යුතුයැ යි නො විමසා, "**පුබ්බෙ කරණීයානි**", පළමු ව කළයුතු දෙය, "**පච්ඡා**", පසු ව කරයි ද, "**වරණකට්ඨභඤ්ජො**", මේ ලුනුවරණ දර කැඩුවා වූ අපගේ මානවකයා මෙන්, "**සො**", ඒ බාල පුද්ගල තෙම, "**පච්ඡා අනුතප්පති**" පසු ව තැවෙයි. ශෝක කරයි. හඬයි යන අර්ථයි. මෙසේ ඒ බෝධි සත්ත්වයෝ අතවැසියන්ට මේ කාරණය කියා දානාදී පිංකොට දිවි කෙළවර කම් වූ පරිදි මිය ගියෝය.

බුදු රජහු මහණෙනි, මෙතෙම ඔබට බාධා කැරනුයේ දැන් පමණක් නොව පෙර ද කළේමැ යි වදාරා මේ දම් දෙසුම ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා ජාතකය නිමා කළහ. එදින ඇස් බිඳ ගත් මානවකයා උකුල් ඇටය බිඳගත් භික්ෂුව ම වූයේය. සෙසු මානවකයෝ බුදු පිරිස වූහ. ගුරු වූ බ්‍රාහ්මණයා නම් මම ම වූයෙමි.

## 1. 8. 2.

## සීලව නාගරාජ ජාතකය

"අකතඤ්ඤුස්ස පොසස්ස" යන මේ ජාතක දේශනාව බුදු රජහු වේළුවනයෙහි වැඩ වසන සේක්, දෙව්දත් අරබයා දේශනා කළහ. දම් සබාවෙහි භික්ෂූහු, ඇවැත්නි, දෙව්දත් තෙර කෙළෙහි ගුණ නො දත්තේය. බුදු රජුන්ගේ ගුණ නො දනිතැ යි කියමින් හුන්නාහුය. බුදු රජුන් වැඩ මහණෙනි, දැන් කවර කථාවකින් හුන්නාහුද යි විචාරා මෙනම් කථාවකින් සිටියෙමු යි කී කල්හි, මහණෙනි, දෙව්දත් කෙළෙහි ගුණ නො දත්තේ දැන් පමණක් නොව පෙර ද කෙළෙහි ගුණ නො දත්තේමය. ඔහු කිසිකලෙක මගේ ගුණ නො දනිතැ යි වදාරා ඔවුන් විසින් අයදනා ලදුව අතීතය ගෙන හැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කරද්දී බෝසත් තෙම හිමාල වන ප්‍රදේශයේ ඇත් යෝනියේ උපන්නේය. ඔහු මව් කුසින් නික්මෙන්නේ, මුළු සිරුර ම සුදු වූයේය. රිදී ගොඩක් මෙන් විය. ඔහුගේ ඇස් මැණික් බෝල මෙන් විය. පැහැදිලි ව පෙනෙන පසිඳුරෝ වූහ. මුහුණ රත් පලසක් මෙන් විය. සොඬ රන්වන් බින්දුවලින් යුත් රිදී දමක් මෙන් විය. පා හතර ලාපිරියම් කළාක් මෙන් විය. මෙසේ ඔහුට දශ පාරමී බලයෙන් අලංකාර කළ රුවින් අගතැන් පත් ආත්ම භාවයක් විය. මුළු හිමවතෙහි ම ඇත්තු රැස්ව නැණවත් බවට පත් ඔහුට උවටැන් කැරෙමින් හැසුරුණහ. මෙසේ ඔහු අසූ දහසක් ඇතුන් පිරිවර කොට හිම්වත් පෙදෙසේ වසන්නේ, පසු කාලයේ ඔහු සමූහ වාසයෙහි දොස් දැක සමූහයා කෙරෙන් වෙන්වීමේ අනුසස් ද දැක හුදකලා ව අරණ්‍යයෙහි වාසය කෙළේය. සිල්වත් බැවින් ඔහුට සීලව නාග රාජ නම් නමක් විය. එකල්හි එක් බරණැස් වැසි වනයෙහි හැසිරෙන්නෙක් හිමවතට පිවිස තමාට ජීවත්වීමට වස්තුවක් සොයමින් දිශාවන් තීරණය කිරීමට නො හැකිවන්නේ, මංමුළා වී මරණ බයින් තැති ගෙන හිස, අත් බැඳගෙන හඬමින් හැසිරෙයි.

බෝසත්හු ඔහුගේ ඒ බලවත් වැළපීම අසා තෙමේ පුරුෂයා දුකින් මුදවමි යි කරුණාවෙන් මෙහෙයවන ලදුව ඔහු සමීපයට

ගියේය. ඒ පුරුෂයා බෝසතුන් දැක ම බියපත් ව පලා ගියේය. බෝසත්හු පලායන්නා වූ ඔහු දැක එතැන ම සිටියේය. ඒ පුරුෂයා බෝසතුන් නැවතුණු බව දැක ඔහු ද සිටියේය. බෝසත්හු නැවත ඔහු වෙත ගියහ. නැවතත් දුවමින් ඇතු සිටි කල්හි තමා ද නැවතී. මෙසේ සිතුවේය. මේ ඇතා මා පලායන කල්හි නැවතී සිටී. මා නැවතුණු කල ළඟට එයි. මොහු මට අනතුරක් කරනු කැමැත්තේ නො වන්නේය. මොහු මා මේ දුකින් මුදවනු කැමැත්තෙක් ම වන්නේයැ යි එඩිතර ව සිටියේය. බෝසත්හු ඔහු වෙත ගොස් පින්වත, කුමක් නිසා ඔබ හඬමින් හැසිරෙන්නෙහිදැ යි විචාළේය. ස්වාමීනි, දිශාවන් තීරණය කිරීමට නො හැකිව මංමුළා වී මරණ බය නිසායැ යි කීවේය.

ඉක්බිති, බෝසත්හු පුරුෂයා තමා වසන තැනට ගෙන ගොස් දින කීපයක් එල වැලින් සතපවා පින්වත් පුරුෂය, බය නොවව්. මම ඔබ මිනිස් පියසට පමුණුවන්නෙමි යි තමාගේ පිටෙහි හිඳුවා මිනිස් පියසට ගියේය. ඉක්බිති, ඒ මිත්‍රද්‍රෝහී පුරුෂයා ඉදින් කිසිවෙක් මාර්ගය විචාරන්නේ නම් කිව යුතුයි. බෝසතුන්ගේ පිටෙහි හුන්නේ, ගස් නිමිති, පර්වත නිමිති සලකමින් ම යයි. ඉක්බිති, බෝධි සත්ත්වයෝ ඒ පුරුෂයා වනයෙන් පිටතට ගෙනවුත් බරණැස් නුවරට යන මහ මඟ සිටුවා පින්වත් පුරුෂය, මේ මඟින් යව. මා වසන තැන කිසිවකු ඇසුවත් නො ඇසුවත් නො කියවයි. ඔහු යවා තමාගේ වසන ස්ථානයට ම ගියේය.

ඉක්බිති, ඒ පුරුෂයා බරණැස් නුවරට ගොස් හැසිරෙන්නේ, ඇත්දළ කරුවන්ගේ වීථියට පැමිණ ඇත් දළින් විසිතුරු කැටයම් කරන්නන් දැක පින්වත්නි, කිම, ජීවදත්ත හෙවත් ජීවත්ව සිටිය දී ගන්නා ලද දළ ගන්නහුදැ යි ඇසීය. පින්වත, කුමක් කියහි ද ? ජීවදත්ත නම් මළ දළට වඩා ඉතා වටිනේය. එසේ නම් මම ඔබට ජීවදත්ත ගෙන එන්නෙමි යි මාර්ග උපකරණ ගෙන තියුණු කියතක් ගෙන බෝසතුන් වසන ස්ථානයට ගියේය. බෝසත්හු ඔහු දැක කුමක් නිසා ආවේදැ යි විචාළහ. ස්වාමීනි, මම ධනය නැති දිළින්දෙක් වෙමි. ජීවත්වීමට නො හැකි ව ඔබතුමන්ගෙන් දත් කැබැල්ලක් ඉල්ලමි. ඉදින්, එය දෙන්නේ නම් එය ගෙන ගොස් විකුණා ඒ මුදලින් ජීවත් වන්නෙමි යි සිතා ආවෙමි. පින්වත, එසේ වේවා. ඔබට දළ දෙමි. ඉදින්, දළ කැපීම සඳහා කියතක් තිබේ ද ? ස්වාමීනි, කියතක් ගෙන

ආවේ වෙමි. එසේ වී නම් දළ කියතින් කපා රැගෙන යව යි බෝසත්හු පා හකුළුවා ගවයන් ලගින්නාක් මෙන් සිටියේය. ඔහු ඇතුගේ ප්‍රධාන දළ දෙක සිඳීය. බෝසත්හු ඒ දත් සොඬින් ගෙන පින්වත් පුරුෂය, මම මේ දළ නො කැමැති නිසා හෝ අනවශ්‍යය නිසා හෝ නො දෙමි. මේ දළ දෙකට වඩා දහස් ගුණයකින් ලක්‍ෂ ගුණයකින් සියලු ධර්ම අවබෝධ කිරීමට සමත් වූ සර්වඥතා ඥාන නැමැති දළ ම වඩා ප්‍රිය වෙයි. ඒ මගේ දළ දානය, සර්වඥතා ඥානය අවබෝධ කිරීම සඳහා ම වේවා යි සර්වඥතා ඥානය මෙනෙහි කොට දළ යුවළ දුන්හ.

ඒ පුරුෂයා දළ යුවල ගෙනගොස් විකුණා ඒ මුදල අවසන් වූ කල්හි නැවත බෝසතුන් වෙත ගොස් ස්වාමීනි, ඔබගේ දළ විකිණීමෙන් ලත් මුදල මගේ ණය ගෙවීම සඳහා පමණක් ම වූයේය. ඉතිරි දළ ද දෙනු මැනවැ යි ඉල්ලීය. බෝසත්හු මැනවැ යි පිළිවදන් දී පෙර පරිදි ම කප්පවා ඉතිරි දත් ද දුන්හ. පුරුෂයා ඒ දළ ද විකුණා නැවතත් අවුත් ස්වාමීනි, ජීවත්වීමට නො හැක්කෙමි. දළ මුල් ද දෙනු මැනවැ යි කියා පෙර පරිදි ම හිඳ ගත්තේය. බෝසත්හුගේ රිදී වැළක් ඒ පවිටු මිනිසා සමාන සොඬ වඩිමින් කෛලාසය හා සමාන වූ කුඹට නැඟී දළ කෙළවර විලුඹෙන් පහර දෙමින් මස් ඉවත්කොට කුඹට නැඟී තියුණු කියතින් දළ මුල් කපාගෙන ගියේය.

බෝසතුන්ගේ පේනතෙක් මානයේ ඉක්මෙන කල්හි දෙලක්‍ෂ හතලිස් දහසක් යොදුන් ඝණ වූ මහ පොළොව මහමෙර යුගන්ධර පර්වත ආදී මහා භාරයන් ද දුගඳ වූ පිළිකුල් වූ මළ මූත්‍රාදිය ද දරා සිටීමට සමත් වුවද ඒ පාප පුරුෂයාගේ අගුණ රාශිය දරා සිටීමට නො හැකි වූවාක් මෙන් සිදුරු විය. එකෙණෙහි අවීචි මහා නිරයෙන් ගිනි ජාලා නික්ම ඒ මිත්‍රද්‍රෝහී පුරුෂයා කුල සන්තක පොරෝණයකින් පොරවන්නාක් මෙන් වටකොට ගත්තේය. මෙසේ ඒ පාපී පුද්ගලයා පොළොවට පිවිසි කල්හි, එම වන ලැහැබෙහි අධිගෘහිත රුක් දෙවියා කෙළෙහි ගුණ නො දත් මිත්‍රද්‍රෝහී වූ පුද්ගලයා සක්විති රාජ්‍යය දුන්නේ වී නමුත් සතුටු කරන්නට නො හැකියැ යි මුළු වනය නාද කරමින් දම් දෙසන්නේ, මේ ගාථාව කීය.

"**අකතඤ්ඤුස්ස පොසස්ස නිච්චං විවරදස්සිනො,**
**සබ්බං චෙ පඨවිං දජ්ජා නෙව නං අභිරාධයෙති"**

"කළගුණ නො දන්නා වූ තොරතුරු (අනුන්ගේ) සිදුරු දක්නා වූ පුරුෂයාට ඉදින් මුළු පොළොව හෙවත් සක්විති රජකම දුන්නේ වී නමුදු ඔහු සතුටට පමුණුවනු නො හැක්කේය."

එහි, "**අකතඤ්ඤුස්ස**", තමාට කළගුණ නො දන්නාහට, "**පොසස්ස**" පුරුෂයාට, "**විවරදස්සිනො**" සිදුර ම අවකාශය ම බලන්නා හට, "**සබ්බං චෙ පඨවිං දජ්ජා**" ඉදින් එබඳු වූ පුද්ගලයාට සියලු සක්විති රාජ්‍යය හෝ මේ මහා පොළොව පෙරළා පොළොවෙහි රස දෙන්නේ නමුදු, "**නෙව නං අභිරාධයෙති**" එසේ කරන්නේ නමුදු මෙබඳු කළගුණ නසන කිසිවකු සතුටු කිරීමට හෝ පැහැදවීමට හෝ නො හැකි වන්නේය, යන අර්ථයි. මෙසේ ඒ දේවතාවා ඒ වනය නාද කරමින් දම් දෙසීය. බෝසත්හු ආයු ඇතිතාක් සිට කම් වූ පරිදි මිය ගියේය.

බුදු රජහු, මහණෙනි, දෙව්දත් කෙළෙහි ගුණ නො දන්නේ දැන් පමණක් නොව පෙර ද කෙළෙහි ගුණ නො දත්තේයැ යි වදාරා මේ දම් දෙසුම ගෙනහැර දක්වා ජාතකය නිම කළහ. එකල්හි මිත්‍ර ද්‍රෝහී පුද්ගලයා දෙව්දත් විය. රුක් දෙවියා සැරියුත් තෙරණුවෝය. සීලව ඇත් රාජයා වනාහි මම ම වෙමි.

1. 8. 3.

## සච්චංකිර ජාතකය

"**සච්චං කිරෙවමාහංසූති**" යන මේ ජාතකය බුදු රජහු වේළුවනයෙහි වසන සේක්, බුදු රජුන් ඝාතනයට ගත් උත්සාහයක්

අරබයා දේශනා කළහ. භික්ෂූන් දම් සබාවෙහි හිඳ ඇවැත්නි, දෙව්දත් බුදු ගුණ නො දනී. වධය පිණිස ම උත්සාහ කරයි යනුවෙන් දෙව්දත්ගේ අගුණ කියමින් සිටි කල්හි බුදු රජහු මහණෙනි, දැන් කවර කථාවක් කැරෙමින් හුන්නාහුද යි විචාරා, මෙනම් කථාවකින් හුන්නෙමු යි කී කල්හි මහණෙනි, දෙව්දත් මා ඝාතනයට උත්සාහ කරන්නේ දැන් පමණක් නො වෙයි. පෙරත් උත්සාහ කළේමැ යි වදාරා ඉකුත් කථාව ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරන කල්හි ඒ රජුට දුෂ්ඨ කුමාර නම් පුතකු විය. ඔහු රළුය. පරුෂය. පහර කෑ සර්පයකු මෙනි. අපහාස නො කොට හෝ පහර නො දී කිසිවකු සමග කථා නො කරයි. ඔහු ඇතුළත ජනයාගේ හා පිටත ජනයාගේ ඇසෙහි වැටුණු දූවිල්ලක් මෙන් ද තමා කෑමට ආ පිසාචයකු මෙන් ද නො කැමති වූවකු විය. බය ජනක කෙනකු විය. ඔහු එක් දවසක් ක්‍රීඩා දිය කෙළි කෙළිනු කැමැත්තෝ, මහත් පිරිවරින් ගංතෙරට ගියෝය. එකෙණෙහි ම මහත් වැසි වලාකුළක් නැඟිණි. සියලු දිශාවෝ අන්ධකාර වූහ. ඔහු දාස දූත ජනයන්ට මෙසේ කීය. එම්බා සේවකයිනි, මා ගඟ මැදට ගෙන ගොස් නහවා ගෙන එවු. ඒ සේවකයෝ ද කුමරා එහි ගෙනගොස් රජ අපට කුමක් කරන්නේ ද ? මේ පව්ටු පුරුෂයා මෙහි දී ම මරා දමමු යි කුමන්ත්‍රණ කොට කාලකණ්ණිය, මෙතනින් යවයි. දියෙහි ගිල්වා එතැර වී ගං ඉවුරෙහි සිටියහ. කුමාරයා කොහිදැ යි ඇසූ කල්හි අපි ඔහු නො දකිමු. වැසි වලාව නැඟෙනු දැක කුමරා දියෙහි ගිලී පළමු කොට ආවේ වන්නේය. ඇමැතියෝ රජුගේ සමීපයට ගියාහුය. රජ, මගේ පුත්‍රයා කොහිදැ යි ඇසීය. දේවයිනි, නො දනිමු. වැසි වලාව නැඟි කල්හි පළමු ව ආවෝයැ යි සිතා අපි ආවෙමු. රජ නුවර දොර හරවා ගංතෙරට ගොස් සොයවු. ඒ ඒ තැන සොයා කිසිවෙක් කුමරා නො දැක්කෝය. ඒ කුමරා ද වලාකුළින් අඳුරු ව වැස්ස වසින කල්හි ගසාගෙන යද්දී එක් ලී කොටයක් දැක එහි හිඳ මරණ බයින් බිය පත්ව හඬමින් යයි.

එකල එක් බරණැස් වැසි සිටුවරයෙක් ගං තෙරෙහි හතලිස් කෙළක් ධනය නිදන්කොට ධනාශාවෙන් එහි ම සර්පයෙක් වී උපන්නේය. තවත් සිටුවරයෙක් එම ප්‍රදේශයෙහි ම තිස් කෙළක් ධනය නිදන්කොට ධනාශවෙන් එහි ම මීයෙක් වී උපන්නේය. ඔවුන් වසන තැනට ද ජලය ගලා ආවේය. ඒ දෙදෙනා ද ජලය ආ මඟින් ම

නික්මී සැඩ පහර මඬිමින් ගොස් පැමිණ ඒ රජකුමරා සිටි ලී කොටයට නැඟ එකෙක් එක් කෙළවරක ද අනිකා අනිත් කෙළවරට ද නැඟ ලී කොටය මත හොත්තාහ. එම ගං ඉවුරෙහි ම ඉඹුල් ගසක් ඇත. එහි එක් ගිරා පැටවෙක් වසයි. එම ගස ද දිය පහරින් මුල් සේදී යාම නිසා ගඟ මතට ඇද වැටිණි. ගිරා පැටවා ද වැසි වස්නා කල්හි ඉගිලී යන්නට නො හැකි ව ගොස් එම ලී කඳෙහි එක් පසෙක සැඟ වුණේය. මෙසේ මේ සතර දෙනා එකට පාවෙමින් යත්.

බෝධි සත්ත්වයන් වහන්සේ ද වනාහි ඒ කාලයේ කසී රට උසස් බමුණු කුලයක ඉපිදී වැඩිවියට පත්වූයේ, තවුස් පැවිද්දෙන් පැවිදි ව එක්තරා ගඟේ නැම්මක (වක්කලමක) පන්සලක් කොට වසන සේක. හෙතෙම මැදියම් රැයෙහි සක්මන් කරන්නේ, ඒ රාජ කුමාරයාගේ බලවත් සේ වැළපෙන ශබ්දය අසා සිතීය. මාවැනි මෛත්‍රී අනුකම්පාවෙන් යුත් තාපසකයකු බලාසිටිද්දී මේ පුරුෂයාට මැරෙන්නට හැරීම යුතු නැත. දියෙන් ගොඩට ගෙන ඔහුට ජීවිතය දෙන්නෙමි යි හෙතෙම ඔහුට බිය නො වන්න. බිය නොවන්නැ යි සනසා දිය පාර කපාගෙන ගොස් ඒ දර කඳ එක් කොණකින් ගෙන අදින්නේ, ඇත්බල ඇත්තේ, ශක්තිමත් වූයේ, එක් පහරින් ම ගං තෙරට පැමිණ කුමාරයා ඔසවා ඉවුරෙහි තැබුවේය. ඒ සර්ප ආදීන් ද දැක ඔසවා ගෙන අසපුවට පමුණුවා ගිනි දල්වා මොවුන් වඩා දුර්වලයැ යි පළමු ව සර්ප ආදීන්ගේ සිරුර තෙත සිඳුවා පසු ව රජ කුමරාගේ සිරුර තෙත සිඳුවා ඔහු ද නිරෝගී කොට ආහාර දෙන්නේ ද පළමු ව සර්ප ආදීන්ට ම දී පසුව ඔහුට පිරිනැමීය.

රජකුමරා මේ කපටි තවුසා රාජ කුමාරයකු වන මා ගණන් නො ගෙන තිරිසනුන්ට ගරු කරන්නේයැ යි බෝසතුන් කෙරෙහි වෛර බැන්දේය. එයින් දින කීපයකට පසු ඒ සියල්ලන්ම ශක්ති සම්පන්න බවට පැමිණි කල්හි, ගඟෙහි සැඩ පහර සිඳුණු කල්හි, සර්පයා තාපසයන් වැඳ මෙසේ කීය. ස්වාමීනි, ඔබතුමා විසින් මට මහත් උපකාර කරන ලද්දේය. මම දුගියෙක් නො වෙමි. අසවල් තැන හතලිස් කෙළක් කහවණු නිදන්කොට තබන ලද්දේය. ඔබතුමාට ධනය අවශ්‍යය වූ කල්හි මේ සියලු ධනය ඔබතුමාට දෙන්නට හැක්කේ වෙමි. ඒ ස්ථානයට ගොස් 'දීඝ' යි කැඳවනු මැනවි. මෙසේ කියා ගියේය. මීයා ද එසේ ම තාපසයාට ආරාධනා කොට අසවල් තැන සිට 'උන්දූර' කියා කැඳවවයි කියා ගියේය. ගිරවා වනාහි තාපසාට

වැඳ ස්වාමීනි, මට ධනයක් නැත. රත් ඇල් හාල් තොපට අවශ්‍යය වූ විටක අසවල් නම් මගේ වාසස්ථානයයි. එහි ගොස් 'සුව' යි කැඳවනු මැනවි. මම නෑයන්ට කියා නොයෙක් ගැල් පුරවන ලද රත් ඇල් හාල් ගෙන්වා දෙන්නට හැකි වන්නෙමි යි කියා ගියේය. අනික් මිත්‍ර ද්‍රෝහියා සිත ඇති සැටියේ කිසිවක් නො කියා ම ඔහු තමා සමීපයට ආකල්හි මරන්නෙමි යි සිතා ස්වාමීනි, මා රාජ්‍යයෙහි පිහිටි කල්හි එනු මැනවි. මම තොපට සිව්පසයෙන් උපස්ථාන කරන්නෙමි යි කියා ගියේය.

ඔහු ගොස් නොබෝ දවසකින් ම රාජ්‍යයෙහි පිහිටියේය. බෝසත්හු ඔවුන් විමසන්නෙමි යි පළමු ව සර්පයාගේ සමීපයට ගොස් නුදුරෙහි සිට 'දීඝ' යි කැඳවීය. ඌ එක වචනයෙන් ම නික්මී බෝසතාණන් වහන්සේට වැඳ ස්වාමීනී, මේ ස්ථානයේ හතලිස් කෙළක් අමු රන් ඇත. ඒ සියල්ල බැහැරට ගෙන ගනු මැනවැ යි කීවේය. බෝසත්හු මෙසේ අවස්ථාවක් එළැඹි කල්හි කටයුතු දනින්නෙමි. එය නවතා මීයා සමීපයට ගොස් ශබ්ද කළහ. ඔහු ද එසේ ම පිළිපැද්දේය. බෝසත්හු එය ද නවතා ගිරවා සමීපයට ගොස් සුවයයි කැඳවීය. ඔහු ද එක වචනයෙන් ම ගස මුදුනෙන් බැස බෝසතාණන් වැද කිම, ස්වාමීනී, මගේ නෑයන්ට කියා හිමාල වන පියසෙන් නුඹ වහන්සේට ඉබේ හටගත් ඇල් වී ගෙනෙන්නදෑ යි විචාළේය. බෝසත්හු අවශ්‍යය වූ විටක දන්වන්නෙමි යි එය ද නවතා දූන් රජතුමා පරීක්ෂා කරන්නෙමි යි ගොස් රජ උයනෙහි වැස දෙවැනි දින ඉරියව් සැපත්කොට පිඬුසිඟා යන ව්‍රතයෙන් නගරයට පිවිසියේය.

ඒ අවස්ථාවෙහි ඒ මිත්‍රද්‍රෝහී රජ සරසන ලද උතුම් ඇතු පිට නැඟී මහත් පිරිවරින් නගරය පැදකුණු කරයි. හෙතෙම බෝධි සත්ත්වයන් දුර දී ම දැක මේ කපටි තවුසා මගේ සමීපයෙහි බත් කකා වසනු කැමැති ව ආවේය. මේ තාක් පිරිස් මැද ඔහු විසින් මට කළගුණ ප්‍රකාශ නො කරයි ද එකෙණෙහි ම මොහු හිස සිඳින්නෙමි යි පුරුෂයන් දෙස බැලුවේය. දේවයන් වහන්ස, කුමක් කරමුදෑ යි කී කල්හි මේ කපටි තාපසයා මගෙන් කිසිවක් ඉල්ලනු කැමැත්තේ ආයේ වනැ යි සිතමි. මේ කාලකණ්ණි තවුසාට මා දකින්නට නො දී ම මොහු ගෙන ගොස් පිටිතලය බැඳ හතර මං සන්ධිවල දී පහර දෙමින් නගරයෙන් බැහැර කැරවා දං ගෙඩියෙහි

දී මොහුගේ හිස සිඳ සිරුර උළ හිඳුවව් යි කීවේය. ඔවුහු යහපතැයි පිළිගෙන ගොස් අපරාධයක් නැති මහ සත්ත්වයන් බැඳ සතර මංසන්ධියක් ගානේ පහර දෙමින් වධක ස්ථානයට ගෙන යාමට පටන් ගත්තාහුය. බෝසත්හු පහර දුන් දුන් තැන දී නො හඬා විපිළිසර නො වී මේ ගාථාව කීය.

"සච්චං කිරෙවමාහංසු නරා එකච්චියා ඉධ,
කට්ඨං විප්ලාවිතං සෙය්‍යො නත්වෙවෙකච්චියා නරොති"

"ගඟ දියෙහි පාවෙන දරදඬු (නඟා ගොඩ තබන ලද්දේ) උතුම් වේ. (කළගුණ නො දන්නා) ඇතැම් පුරුෂයන් (නඟා ගොඩ තබන ලද්දේ) උතුම් නො වේමැ යි. මේ ලොව ඇතැම් පණ්ඩිත කෙනෙක් සැබැවක් ම කීවහුය."

එහි, **"සච්චං කිරෙවමාහංසු"**, (ඔවුහු) මෙසේ ඇත්තක් ම කියති. **"නරා එකච්චියා ඉධ"**, මේ ලෝකයෙහි සමහර පණ්ඩිත පුරුෂයෝ, **"කට්ඨං විප්ලාවිතං සෙය්‍යො"**, ගඟෙහි ගසාගෙන යන වියලි දර කඩක් ගොඩට ගෙන ගොඩ බිම තබන ලද්දේ උසස්ය. වඩාත් යහපත්ය. මෙසේ කියන්නා වූ ඒ පුරුෂයෝ ඇත්තක් ම කියති. ඊට හේතු කිම? එසේ තබන ලද දරකඩ කැඳ, බත් ආදිය පිසීම සඳහා ද ශීතලෙන් පීඩිත වූවන්ට ගිනි තැපීම සඳහා ද අනෙක් සමරුන්ට උවදුරු නැති කැර ගැනීම සඳහා ද උපකාර වේ. **"නත්වෙවෙකච්චියා නරොති"**, සමහර මිත්‍රද්‍රෝහී කෙළෙහි ගුණ නො දත් පාපී පුරුෂයකු සැඩ පහරින් ගසාගෙන යන කල්හි අතින් ගෙන ගොඩට ගැනීම උතුම් නො වේ. ඒ එසේමැ යි. මම මේ පාපී පුරුෂයා ගොඩට ගෙන මේ මහා දුක ලබා ගතිමි. මෙසේ ගැසූ ගැසූ තැනේ දී ම මේ ගාථාව කීහ.

ඒ අසා එහි යම් පණ්ඩිත පුරුෂයෝ වූවාහු ද ඔවුහු මෙසේ කීහ. පින්වත් පැවිදිතුමනි, ඔබ විසින් අපගේ රජතුමාට කිසියම් උපකාරයක් කරන ලද්දේ ද ? බෝසත්හු ඒ සියලු පුවත් සැලකොට මම මොහු සැඩ පහරින් උඩට ගත්තෙමි. මේ සියලු දුක් මම ම ළඟා කැර ගතිමි. පැරණි පඬිවරුන්ගේ වචන නම් නො කරන ලදැ යි

සීමා කොට මෙසේ කියමි යි කීහ. මේ අසා බමුණු ආදීහු ද නගර වාසීහු ද මේ මිත්‍රද්‍රෝහී රජ මෙසේ ගුණවත් වූ තමාගේ ජීවිත දානය දුන් තවුසාගේ සුළු වූ ද ගුණයක් නො දනී. ඔහු නිසා අපට යහපතක් කෙසේ වේදැ යි කිපිණු මහජනයා හාත්පසින් වටකොට ඊතල, අඩියටි, කල්, මුගුරු ආදී ප්‍රහාරවලින් ඇත් කඳ මත සිටිය දී ම ඔහු ඝාතනය කොට පයින් ඇද දමා දිය අගල මත දමා බෝසතුන් අභිෂේක කොට රාජ්‍යයෙහි පිහිටවූහ.

බෝසත්හු දැහැමින් රාජ්‍යය කරන්නාහු, නැවත එක් දවසක් සර්පාදීන් පරීක්ෂා කරනු කැමැති ව මහත් පිරිවරින් සර්පයා වසන තැනට ගොස් 'දීඝ' කියා කැඳවූහ. සර්පයා අවුත් වැඳ ස්වාමීනි" මේ ඔබගේ ධනය ගනු මැනවි යි කීවේය. බෝසත් රජහු හතලිස් කෙළක් අමු රන් ඇමැතියන්ට පවරා දී මීයා සිටි තැනට ගොස් 'උන්දුර' යි කැඳවූහ. ඔහු ද අවුත් වැඳ තිස් කෙළක් ධනය පාවා දුන්නේය. රජහු එය ද ඇමැතියන්ට පවරා ගිරවා හුන් තැනට ගොස් 'සුව' යි කැඳවූහ. ඔහු ද අවුත් පා වැඳ ස්වාමීනී" කිම, ඇල් සහල් ගෙන එව්දැ යි ඇසීය. රජහු ඇල් හාලින් ප්‍රයෝජනයක් ඇති කල්හි ගෙන ආ හැකිය. එව. මා සමග යමු යි සැත්තෑ කෝටියක් ධනය සමග ඔවුන් තිදෙනා ගෙන නගරයට ගොස් උතුම් පහයෙහි උඩුමහල් තලයට නැග ඒ සියලු ධනය සඟවා සර්පයාට විසීම සඳහා රන් තළයක් ද මීයාට පළිඟු ගුහාවක් ද ගිරවාට රන් කූඩුවක් ද කැරවා සර්පයාට ද ගිරවාට ද අනුභව කිරීම පිණිස දිනපතා රන් තැටියක මී හා විළඳ ද මීයාට සුවඳ ඇල් සහල් ද දෙවීය. දානාදී පිංකම් ද කරති. මෙසේ ඒ සතර දෙන දිවි ඇතිතාක් සමගි ව සතුටුවෙමින් වාසය කොට දිවි කෙළවර කම් වූ පරිදි මිය ගියහ.

බුදු රජහු මහණෙනි" දෙව්දත් මා ඝාතනය සඳහා දැන් පමණක් උත්සාහ නො කරයි. පෙර ද උත්සාහ කළේයැ යි වදාරා මේ ධර්ම දේශනාව ගෙන හැර දක්වා අනුසන්ධි ගළපා ජාතකය නිම කළහ. එදා පවිටු රජ දෙව්දත් විය. සර්පයා සැරියුත්ය. මීයා මහා මුගලන්ය. ගිරවා ආනන්ද විය. රජ පැමිණි දැහැමි රජ වනාහි මම ම වීමි.

## 1. 8. 4.

# රුක්ඛධම්ම ජාතකය

"සාධු සම්බහුලා ඤාතීති" යන මේ ජාතක දේශනාව බුදු රජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, ජලය බෙදා ගැනීමේ කලහයෙහි තමන්ගේ නෑයන්ට මහා විනාශයක් එළැඹී බව දැන අහසින් වැඩමවා රෝහිණී ගංගාවෙහි මත්තෙහි පලක් බැඳ වැඩ හිඳ නිල් රැස් විහිදුවා නෑයන් සංවේගයට පමුණුවා අහසින් බැස ගංතෙරෙහි වැඩසිටි සේක. ඒ කලහය අරබයා මේ ජාතකය දේශනා කළහ. මේ එහි සැකවින් දැක්වීමයි. මෙහි විස්තර කථාව කුණාල ජාතකයෙහි ප්‍රකට වන්නේය. එකල්හි බුදු රජහු නෑයන් අමතා මහරජවරුනි, ඔබ හැම නෑයෝය. නෑයෝ නම් සමගි ව සතුටින් සිටිය යුත්තෝය. නෑයන්ගේ සමගිය ඇති කල්හි සතුරෝ ඉඩක් නො ලබති. මිනිස්සු සිටිත්වා' සිත් පිත් නැති ගස්වලට පවා සමගිය ලැබීම වටී. පෙර හිමවත් පෙදෙසෙහි මහා සුළඟක් සල් වනයට ම පහර ගැසීය. ඒ සල් වනය ඔවුනොවුන් ගස්, වැල්, ලැහැබ් එකට සම්බන්ධ ව පැවැති බැවින් එක් ගසක් හෝ හෙළන්නට නො හැකි ව ගස් මතු මත්තෙන් හමා ගියේය. හිස් භූමියක පිහිටි එක් ගසක් අතු රිකිලිවලින් යුක්ත වූ මහා ගසක් වුව ද අනිත් ගස් හා සම්බන්ධ නැති බැවින් සහමුලින් ඉදිරී බිම හෙළීය. මෙකරුණෙන් ඔබලා ද සමගි ව සතුටු ව විසිය යුතුයැ යි වදාරා ඔවුන් විසින් අයදනා ලද බුදු රජහු අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කැරවන කල්හි උපන් වෙසමුණි මහරජ චුත වූයේය. සක් දෙවිඳු අනිකකු වෛශ්‍රවණ පදවියෙහි පිහිටුවීය. මේ වෛශ්‍රවණයන් මාරු වනවිට පසු ව උපන් වෛශ්‍රවණ රූක්ෂ ගස්, වන, ලැහැබ්, ලියවැල්වලට අරක් ගත් දෙවියන් තම තමන් කැමැති ස්ථානවල විමාන ගන්නා ලෙස පණිවිඩ යැවූහ. එකල්හි බෝසත්හු හිමවත් පෙදෙසෙහි එක් සල් වනයක රුක් දෙවියෙක් වී උපන්නහ. එතුමෝ නෑයන් අමතා මෙසේ කීහ. ඔබ විමාන ගන්නා කල්හි හිස් භූමිවල පිහිටි ගස්වල නො ගනිවු. මේ සල් වනයෙහි මා ගත් විමානය පිරිවර කොට ම ගනිවු. එහි දී බෝසතුන්ගේ වචන පිළිගත්තා වූ නුවණ ඇති දෙවියෝ බෝසතුන්ගේ

විමන පිරිවරා ම විමාන ගත්හ. නුවණ නැති දෙවියෝ අපට මහී වනයෙහි විමානවලින් කවර වැඩක් ද ? අපි මිනිස් පියසෙහි ගම්, නියම් ගම්, රාජධානි දොරටුවල විමාන ගන්නෙමු. ගම් ආදිය ඇසුරුකොට වසන දෙවියෝ ලාභයෙන් හා කීර්තියෙන් අග තැන්පත් වෙති. මිනිස් පියසෙහි හිස් භූමිවල වැඩුණු මහා ගස්වල විමාන ගත්තාහුය. එක් දවසක් මහා වැස්සක් වට. සුළඟ වේගවත් බැවින් දැඩි මුල් ඇති වන දෙටු ගස් පවා බිඳුණු අතුරිකිලි ඇති ව සහමුලින් ම ඇද වැටිණි. එම මහා සුළඟ ඔවුනොවුන් සම්බන්ධ වී ඇති සල් වනයට පැමිණ ඔබිමොබ පහර දුන්න ද එක ගසක්වත් හෙළන්නට නො හැකි විය. සිඳී ගිය විමන් ඇති දෙවියෝ පිළිසරණක් නැති ව දරුවන් අතින් ගෙන හිමවතට ගොස් තමන් පිළිබඳ පුවත සල් වනයෙහි දෙවියන්ට කීවාහුය. සල් වන වැසි දෙවියෝ සෙසු දෙවියන් මෙසේ ආ බව බෝසතුන්ට සැලකළහ. බෝසත්හු නුවණ ඇත්තන්ගේ වචන නො ගෙන පිහිටක් නැති තැනට ගියාහු, මෙබඳු ම වෙත්යැයි කියා දම් දෙසමින් මේ ගාථාව කීහ.

"සාධු සම්බහුලා ඤාතී අපි රුක්ඛා අරඤ්ඤජා,
වාතො වහති එකට්ඨං බ්‍රහන්තම්පි වනස්පතින්ති"

"බොහෝ වූ නෑයෝ (සමග ව වෙසන්නාහු) සෝභමාන වෙති. ආරණ්‍යයෙහි හටගත් වෘක්ෂයෝ පවා (සනව සිටියාහු) සෝභමාන වෙත්. වාතය එකලා ව සිටියා වූ අතුපතර ඇති මහත් වූ වන දෙටු රුක ද මුලිනුපුටා හෙළයි."

එහි, "සම්බහුලා ඤාතී", හතරේ සිට ලක්ෂය දක්වා සම්බහුලා නම්. මෙසේ බොහෝ දෙනෙක් ඔවුනොවුන් ඇසුරු කොට වසන්නාහු, නෑයෝය. "සාධූති", සෝභමාන, පැසසිය යුතු, අනුන් විසින් නො නැසිය හැක්කේය යන අර්ථයි. "අපි රුක්ඛා අරඤ්ඤජා", මිනිසුන් තිබේවා. වනයෙහි හටගත් ගස්පවා බහුල ව ඔවුනොවුන්ට පිහිටවෙමින් තිබුණේ නම් යහපත්ය. ගස්වලට ද පිහිට ඇති බව ම ලැබීමට සුදුසුයි. "වාතො වහති එකට්ඨං", පෙර දිශාව ආදී වශයෙන් හමන සුළඟ හිස් බිමක එකලා ව සිටි, "බ්‍රහන්තම්පි වනස්පතින්ති", අතුරිකිලි ආදියෙන් සම්පූර්ණ වූ මහා ගසක් පවා මැඩ පවත්වයි.

සහමුලින් හෙළයි, යන අර්ථයි.

මෙසේ බෝසත්හු මේ කාරණය කියා ආයු කෙළවර කම් වූ පරිදි මිය ගියහුය. බුදු රජහු ද මහරජවරුනි, ඒ එසේ මය. ඥාතීන්ගේ සමගි බව ම තිබිය යුතුය. එම නිසා සමගි ව සතුටු වෙමින් සුහද ව වාසය කරවු. මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා ජාතකය නිම කළහ. එදා දෙවියෝ බුදු පිරිස වූහ. නුවණ ඇති දෙවියා නම් මම ම වීමි.

## 1. 8. 5.

## මච්ඡ ජාතකය

**"අභිත්ථනය පජ්ජුන්නාති"** යන මේ ජාතක දේශනාව බුදු රජහු ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, තමන් විසින් වස්සවන ලද වර්ෂාවක් අරබයා වදාළ සේක.

එක් සමයෙක්හි කොසොල් රටට වැසි නො වස්නේය. ගස් ද මැලවේ. ඒ ඒ තැන්වල ජලාශ, පොකුණු, විල් වියලේ. ජේතවන දොරටුව අසල ජේතවන පොකුණෙහි ද දිය සිඳුණේය. මඩ ගොඩෙහි ගිලී සිටි මසුන්, ඉබ්බන්, කපුටු, උකුසු ආදීහු අණින උල් ආයුධ හා සමාන හොටවලින් ඇන බැහැර කැර දඟලද්දී කති. බුදු රජාණන් වහන්සේ මසුන්ගේ හා ඉබ්බන්ගේ ඒ විපත දැක මහා කරුණාවෙන් උත්සාහවත් කරන ලද සිත් ඇත්තේ, අද මා විසින් වැසි වස්සවන්නට වටීයැ යි රෑ පහන් වූ කල්හි සිරුර පිළිදැගුම් කොට පිඬු සිඟා වඩින වේලාව සලකා මහා භික්ෂු සංඝයා පිරිවරන ලද්දේ, බුද්ධ ලීලාවෙන් සැවැත් නුවරට පිඬු පිණිස පිවිස බතින් පසු පිණ්ඩපාතයෙන් වැළකුණේ සැවැත් නුවර සිට විහාරයට වඩින්නේ, ජේතවන පොකුණේ පඩි පෙළේ සිට ආනන්ද තෙරුන් ඇමතූහ. ආනන්දය" වැසි සළුව ගෙන එව, ජේතවන පොකුණෙන් නාන්නෙමි. ස්වාමීනි" ජේතවන පොකුණේ ජලය සිඳී මඩ පමණක් ඉතිරි ව

ඇත්තේ නො වේ ද ? ආනන්ද, බුද්ධ බලය නම් විශාලයි. නුඹ දිය සළුව ගෙන එව. තෙරුන් වහන්සේ ගෙනවිත් දුන් සේක. බුදු රජහු එක් කොණකින් දිය සළුව හැඳ එක් කොණකින් සිරුර පොරවා ජේතවන පොකුණෙන් නාන්නෙමි යි පඩි පෙළෙහි සිටියහ.

ඒ මොහොතේ ම ශක්‍රයාගේ පඬුපුල් ගල් අසුන උණුසුම් ආකාරයෙන් දක්වීය. හෙතෙම මේ කුමක්දැ යි මෙනෙහි කරන්නේ, ඒ කරුණ දැන වැස්සවලාහක දිව්‍යය පුත්‍රයා කැඳවා දරුව, බුදු රජහු දෙව්රම පොකුණෙහි නාන්නෙමි යි පියගැට පෙළේ මුල් පඩියෙහි සිටින සේක. වහා සියලු කොසොල් රට එක ම ජල ධාරාවක් කොට වැස්ස වනු. හෙතෙම යහපතැ යි පිළිගෙන එක් වලාකුළක් හැඳගෙන එකක් පොරවා ගෙන මේඝ ගීතිකා ගයමින් පෙරදිග ලෝක ධාතුව අභිමුඛ ව පැන්නේය. පූර්ව දිශා භාගයෙන් කලවිටක් පමණ වූ එක් වැසි වලාවක් පැන නැඟී සිය දහස් වලාවන් වී ගර්ජන කැරෙමින් විදුලිය විහිදුවන්නේ, යටිකුරු කොට තබන ලද දිය කළයක ආකාරයෙන් වසිමින් මුළු කොසොල් රට මහා සැඩ පහරක් මෙන් යට කෙළේය. වැස්ස නො කඩවා වසින්නේ, මොහොතකින් ම දෙව්රම් පොකුණ පිරවීය. උඩ ම පියගැටයෙහි හැපී ජලය සිටියේය.

බුදු රජහු පොකුණෙන් නා රතු දුහුල් සිවුරුක් හැඳ පටිය බැඳ සුගත් මහා සිවුර සකස් කොට බහාලා භික්ෂු සංඝයා පිරිවරා ගොස් ගඳකිළි පිරිවෙන්හි පනවන ලද උතුම් බුද්ධාසනයෙහි වැඩ හිඳ භික්ෂු සංඝයා විසින් වත් දක්වූ කල්හි නැඟිට මැණික් ඔබා කරන ලද පියගැට පුවරුවෙහි වැඩ සිට භික්ෂු සංඝයාට අවවාද දී පිටත්කැර යවා සුගන්ධවත් ගඳකිළියට පිවිස දකුණු ඇලයෙන් සිංහ සෙය්‍යාවෙන් සැතපී සවස් කාලයෙහි දම් සබාවෙහි රැස් වූ භික්ෂූන්ට මහණෙනි, දශ බලධාරීන් වහන්සේගේ කරුණා, මෛත්‍රී, අනුකම්පා සම්පත්ති බලවු. විවිධ ශස්‍යය වර්ග මැලවී යන කල්හි, නොයෙක් ජලාශ සිඳී යද්දී මසුන්, ඉබ්බන් මහා දුක් අනුභව කරද්දී, කරුණාව නිසා මහජනයා දුකින් මුදවන්නෙමි යි ජල සාටකය ඇද ජේතවනාරාමයේ පොකුණේ මුල් පඩියේ සිට මොහොතින් මුළු කොසොල් රට ම මහා වැස්සෙන් පා කරන්නාක් මෙන් වර්ෂාව වස්සවා මහජනයා කායික, චෛතසික දුකින් මුදවා වෙහෙරට පිවිසියහ යි කථාව පවත්නා කල්හි ගඳකිළියෙන් නික්ම දම් සබාවට වැඩ මහණෙනි, දැන් කවර කථාවකින්

හුන්නහුද යි විචාරා මෙනම් කථාවකින් හුන්නාහු යි කී කල්හි මහණෙනි, බුදුහු විඩාවට පත් මහජනයාට වර්ෂාව වස්වා දුකින් මුදවූයේ දැන් පමණක් නොව, පෙර තිරිසන් යෝනියෙහි ඉපිද මත්ස්‍යය රාජ කාලයෙහි ද වැසි වැස්ස වූයේමැ යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර මෙම කොසොල් රටෙහි ම මෙම සැවැත් නුවර ම මෙම දෙව්රම් වෙහෙර පොකුණ පිහිටි තැන ම වන ලැහිබින් වට වූ දිය කඳුරක් විය. එදවස බෝසත්හු මත්ස්‍යය යෝනියෙහි ඉපිද මත්ස්‍යය ගණයා විසින් පිරිවරණ ලදුව එහි වාසය කරති. මෙදවස යම් සේ වී ද එදවස ද ඒ රටෙහි වැසි නො වැස්සේය. මිනිසුන්ගේ ශස්‍යය මැළවිණි. වැව් ආදියෙහි දිය සිඳී ගියේය. මත්ස්‍යය, කැස්බෑ ආදීහු මඩෙහි සැඟවුණහ. කවුඩු ආදීහු තුඩින් කොටා බැහැරට ගෙන කෑවාහුය.

බෝසත්හු නෑ සමූහයාගේ ඒ විනාශය දැක මොවුන් මේ දුකෙන් මිදීමට සමතකු මා හැර නැත. සත්‍යය ක්‍රියා කොට වැසි වස්සවා නෑයන් මරණ දුකින් මුදවම් යි කළුවන් මඩ දෙපසට කොට නික්මී කළුවර අරටුවක වර්ණය ඇති මහා මත්ස්‍යයා ඔප දමන ලද පද්මරාග මාණික්‍යය වැනි ඇස් හැර අහස දෙස බලා වස්ස වලාහක දෙවියන්ට කථා කොට පුදසුම්න දෙව් රජුගේ ශබ්දය දී පින්වත් වස්ස වලාහකය, මම නෑයන් නිසා දුකට පත්වූයේ වෙමි. ශීලවන්ත වූ මා මෙසේ වෙහෙසෙන කල්හි ඔබ කුමක් නිසා වර්ෂාව නො වස්සන්නෙහි ද ? මා විසින් තමා හා සමාන ජාතිකයන් අනුභව කරන තැනක ඉපදී සහල් ඇටයක් පමණ වූ ද මසෙක් ආදී කොට කිසි සතකු නො කෑ විරුවෙමි. අන් සතකු ද මා විසින් කිසි දිනක දිවි තොර නො කරන ලදී. මේ සත්‍යයෙන් වර්ෂාව වස්සවා මගේ ඥාති සමූහයා දුකින් මුදවනු මැනවැ යි කියා ළඟ හැසිරෙන සේවකයකුට අණ කරන්නාක් මෙන් වැස්ස වලාහක දිව්‍යය රාජයා අමතමින් මේ ගාථාව කීය.

"අභිත්ථනය පජ්ජුන්න නිධිං කාකස්ස නාසය,
කාකං සොකාය රන්ධෙහි මඤ්ච සොකා පමොචයාති"

"මේඝය, ගර්ජන කැරව. කාක සමූහයාගේ (මත්ස්‍යය)
නිදානය නසව. කපුටු මුළු ව ශෝකයට පමුණුවව.
නෑයන් හා මා ද ශෝකයෙන් මුදව."

එහි, "අභිත්ථනය පජ්ජුන්නාති" හි "පජ්ජුන්න", යනු මේඝයට නමකි. මෙසේ වර්ෂාව වශයෙන් ලැබූ නාමයෙන් වැස්ස වලාහක දෙවියන්ට අමතයි. මෙහි අදහස නම් මෙයයි. වර්ෂාව ඝෝෂා නො කැරෙමින් විදුලිය නිකුත් නො කැරෙමින් වසින්නේ, නො හොඹි. එහෙයින් ඔබ ඝෝෂා කැරෙමින් විදුලිය නිකුත් කැරෙමින් වස්සවයි. "නිධිං කාකස්ස නාසය", කවුඩෝ මඩ යට සිටි මසුන් තුඩින් කොටා බැහැරට ගෙන කත්. එමනිසා ඒ කවුඩන්ට මඩෙහි ගැළී සිටි මත්ස්‍යයන් නිදානයකැ යි කියනු ලැබේ. ඒ කවුඩන්ගේ නිදානය වර්ෂාව වස්සවමින් ජලයෙන් වසා නසයි. "කාකං සොකාය රන්ධෙහි", කවුඩෝ මේ පොකුණ ජලයෙන් පිරුණු කල්හි මසුන් නො ලැබීමෙන් ශෝක කරන්නාහ. ඒ කාක සමූහයා මේ පොකුණ පිරවීමෙන් ශෝකයෙහි රඳවා ශෝක බවට පමුණුව. යම් සේ ඇතුළත දවන ස්වභාව වූ ශෝකයට පැමිණෙයි ද එසේ කරව, යන අර්ථයි. "මඤ්ච සොකා පමොචයාති" මෙය 'ච' කාරය කැටි කිරීමේ අර්ථයි. මෙසේ මා ද මගේ ඤාතීන් ද සියල්ලන් ම මේ මරණ ශෝකයෙන් මුදවයි. මෙසේ බෝසත්හු ළඟ හැසිරෙන සේවකයකුට අණ කරන්නාක් මෙන් වැස්ස වලාහක දෙවියන් අමතා මුළු කොසොල් රටෙහි ම මහා වර්ෂාවක් වස්සවා මහජනයා මරණ දුකින් මුදවා දිවි කෙළවර කම් වූ පරිදි මිය ගියහ.

මහණෙනි, තථාගතයෝ දැන් පමණක් ම වර්ෂාව නො වස්සවති. පෙර ද මත්ස්‍යය යෝනියෙහි උපන්නා වූ ද වැස්සවූවෝ මයැ යි වදාරා මේ ධර්ම දේශනාව ගෙන හැර දක්වා අනුසන්ධි ගළපා ජාතකය නිමවූහ. එදවස මත්ස්‍යය ගණයා නම් බුදු පිරිස ම වූහ. වස්ස වලාහක දෙව් රජ ආනන්ද විය. මත්ස්‍යය රාජයා නම් මම ම වීමි.

## 1. 8. 6.

# අසඞ්කිය ජාතකය

"**අසඞ්කියොම්හි ගාමම්හි**" යන මේ ජාතක දේශනාව බුදු රජහු ජේතවනාරාමයේ වැඩ වාසය කරන සේක්, සැවැත් නුවර වාසී උපාසකයෙකු අරබයා දෙසූහ. ඔහු සෝවාන් වූ ආර්යය ශ්‍රාවකයෙකි. කිසියම් කටයුත්තක් සඳහා එක් ගැල් නායකයකු සමග මහමඟට පිවිස එක් අරණ්‍යායතනයක ගැල් මුදවා කඳවුරු බැඳගත් කල්හි, ඒ ගැල් නායකයාට නුදුරින් ගසක් මුලක සක්මන් කරයි. ඉක්බිති, පන්සියයක් සොරු තමා හට සුදුසු කාලය සලකා කඳවුර පැහැර ගන්නෙමැ යි දුනු, මුගුරු ආදිය ගත් අත් ඇති ව එම ස්ථානය වට කළහ. උපාසකයා ද සක්මන් කළේමය. සොරු ඔහු දැක ඒකාන්තයෙන් මෙතෙම කඳවුර රකින්නා වන්නේයැ යි සිතා මොහු නිදිගත් කල්හි පැහැර ගන්නෙමු යි කඩාපැනීමට නො හැකි ව ඒ ඒ තැන සිටියහ. ඒ උපාසක ද පළමු යාමෙහි ද මැදියම්හි ද පැසුළුයාමෙහි ද සක්මණෙහි ම නියලී සිටියේය. ඉතා අළුයම් වේලෙහි සොරු ඉඩක් නො ලැබ ගන්නා ලද ගල්, මුගුරු ආදිය දමා පලා ගියහ. උපාසක ද තම කිස නිමවා නැවත සැවැත් නුවරට අවුත් බුදු රජුන් වෙත එළැඹ ස්වාමීනි, තමා රකින්නට මෙරමාගේ ආරක්‍ෂකයන් විය හැකිදැ යි විචාළේය. උපාසක, එසේය, තමා ආරක්‍ෂා කරන්නා මෙරමා ද රකී. මෙරමා රකින්නා තමා ද රකියි. ස්වාමීනි, බුදු රජුන් විසින් කරන ලද ප්‍රකාශය සුභාෂිතයකි. මම එක්තරා ගැල් නායකයකු සමග මහමඟට පිවිස ගසක් මුල සක්මන් කැරෙමින් මා රකිම් යි මුළු ගැල් සාත්තුව ම ආරක්‍ෂා කළෙමි යි කීවේය. බුදු රජහු උපාසකය, පෙර නුවණ ඇත්තෝ ද තමා රකිමින් මෙරමා ද රැක්කාහ යි වදාරා ඔහු විසින් අයදනා ලදුව අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු බ්‍රාහ්මණ කුලයෙහි ඉපිද තිසි වයසට පැමිණ කාමයන්හි ආදීන ව දැක තවුස් පැවිද්දෙන් පැවිදි ව හිමවතෙහි ම වසන්නාහු, ලුණු ඇඹුල් සෙවිනා පිණිස මිනිස් පියසට අවුත් ඒ ජනපදයෙහි හැසිරෙන්නෝ, එක්තරා ගැල් නායකයකු සමග මහමඟට පිවිස එක් අරණ්‍යායතනයක ගැල් නැවතුම් ගත් කල්හි ඊට නුදුරින් දැහැන්

සුවයෙන් කල්ගත කරන්නාහු, එක්තරා ගසක් මුලක සක්මනෙහි යෙදුණාහ. ගැල් කරුවන් රාත්‍රී භෝජනය අනුභව කළ කල්හි පන්සියයක් සොරු ඒ ගැල් සාත්තුව පැහැර ගන්නෙමු යි අවුත් වට කළහ. ඔවුහු ඒ තාපසයන් දැක ඉදින් මොහු අප දකිත් නම්, ගැල් සාත්තුවෙහි සිටින්නන්ට කියන්නේය. මොහු නිදිගත් කල්හි පැහැර ගන්නෙමු යි එහි ම සිටියාහුය. තවුසා ද මුළු රාත්‍රිය ම සක්මන් කළේමය. සොරු අවකාශයක් නො ලැබ ගන්නා ලද මුගුරු, ගල් හැර දමා ගැල් සාත්තුවෙහි සිටින්නන්ට ශබ්ද නඟා පින්වත් ගැල් කරුවනි, ඉදින්, මේ ගස මුල සක්මන් කරන තාපසයා අද නො සිටියේ නම්, ඔබ හැම මහත් විනාශයකට පත්වන්නට තිබුණේය. හෙට තවුසාට මහත් සත්කාර කරවු යි කියා ගියාහුය. ඔවුහු රාත්‍රිය ඉක්ම ගිය කල්හි සොරුන් විසින් අත්හරින ලද මුගුරු, ගල් ආදිය දැක බිය පත් ව බෝසතුන් වෙත ගොස් වැඳ ස්වාමීනි, ඔබ විසින් සොරු දක්නා ලද්දෝදැ යි ඇසූහ. සගයිනි, එසේය, දක්නා ලද්දේය, ස්වාමීනි, මෙපමණ සොරුන් දැක ඔබතුමන්ට බියක් හෝ තැති ගැන්මක් හෝ නූපන්නේ ද ? එවිට බෝසත්හු, සගයිනි, සොරුන් දැක බය උපදින්නේ ධනවතුන් හටය. මම ධන නැත්තෙක්මි යි. ඒ මම කුමකට බිය වන්නෙම් ද ? මට ගමෙහි හෝ වනයෙහි විසුවත් බයක් හෝ තැති ගැන්මක් නැතැ යි කියා ඔවුනට දහම් දෙසමි යි මේ ගාථාව කීහ.

"අසඞ්කියොම්හි ගාමම්හි අරඤ්ඤෙ නත්ථි මෙ භයං,
උජුමග්ගං සමාරූළ්හො මෙත්තාය කරුණාය චාති"

"ගමෙහි ද සැක නැත්තේ වෙමි. අරණ්‍යයෙහි මට බියක් නැත. මෛත්‍රීයෙන් ද කරුණාවෙන් ද සෘජු වූ (බ්‍රහ්ම ලෝක හා දිව්‍යය ලෝකගාමී) මාර්ගයට නැංගෙමි."

එහි, "**අසඞ්කියොම්හි ගාමම්හිති**", සැකයෙහි නියුතු වූයේ - පිහිටියේ "**සඞ්කිය**" නමි. සංකිය නො වූයේ "**අසඞ්කිය**" යි. මම ගමෙහි වසන්නේ නමුදු සැකයෙහි නො පිහිටි බැවින් සැක නැත්තේ වෙමි. නිර්භය වෙමි. සැක නැති බව මෙයින් දක්වයි. "**අරඤ්ඤෙ**", ගම හා ගාමෝප චාරයෙන් මිදුණේ, මිදුණු ස්ථානයයි. "**උජුමග්ගං සමාරූළ්හො මෙත්තාය කරුණාය චාති**", මම තුන් වැනි සතර වැනි ධ්‍යානවලින් ද මෙත්තා, කරුණා, කායිකාදී වැරදිවලින් ද මිදුණා වූ ඇද නැති

බඹ ලොව යන මඟට පැමිණියෙහි යි කියයි. නොහොත් පිරිසිදු සිල් ඇති බැවින් කය, වචන, හිත යන තුන් දොරින් වැරදි රහිත වූ ඇද නැති දෙව් ලොව මඟට නැයෝ වෙමි. මෙසේ දක්වා එයින් මත්තෙහි මෙත්, කරුණා පිහිටි බැවින් ඍජුව ම බ්‍රහ්ම ලෝක මඟට නැංගේ වෙමි යි දක්වයි. නො පිරිහුණු ධ්‍යාන ඇත්තා ඒකාන්තයෙන් බඹ ලොව උපදින බැවින් මෙත්තා, කරුණා ආදිය ඍජු මාර්ග නමි.

මෙසේ බෝසත්හු මේ ගාථාවෙන් දම් දෙසන්නේ, සතුටු සිත් ඇති ඒ මිනිසුන් විසින් පුදන ලද්දාහු, සතර බ්‍රහ්ම විහරණ වඩා බඹ ලොව උපන්හ. බුදු රජහු මේ ධර්ම දේශනාව ගෙන හැර දක්වා අනුසන්ධි ගළපා ජාතකය නිම කළහ. එදවස ගැල් සාත්තු වැසියෝ බුදු පිරිස වූහ. තාපසයාණෝ වනාහි මම ම වීමි ය.

## 1. 8. 7.

## මහා සුපින ජාතකය

**"ලාපූනි සීදන්තීති"** යන මේ ජාතක දේශනාව බුදු රජහු ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, සොළොස් මහා සිහිනයන් අරබයා වදාළහ. එක් දවසක් කොසොල් මහරජතුමා රාත්‍රියේ නිදිගත වූයේ, පැසුළු යාමයෙහි සොළොස් මහා සිහිනයක් දැක බියෙන් තැති ගත්තේ, පිබිදී මේ සිහිනයන් දුටු බැවින් මට කුමක් වන්නේදැ යි මරණ බියෙන් තැතිගෙන යහනේ වැතුරුණේ ම කල්ගත කළේය. ඉක්බිති, රාත්‍රිය ඉක්මගිය කල්හි පුරෝහිත බමුණෝ රජු වෙත පැමිණ මහරජ, සැප සේ සැතපුණේදැ යි විචාළහ. ගුරුතුමනි, මට සැපයක් නම් කොයින්ද ? අද මම අළුයම් කාලයෙහි සොළොස් මහසුපිනයක් දුටහැ යි බමුණන්ට කියා, කිමෙක් දැ යි ඇසූ කල්හි, දුටු සිහින පවසා මේ සිහින දුටු බැවින් මට කුමක් වන්නේදැ යි විචාළේය. බමුණෝ අත් සැලූහ. කුමක් නිසා අත් සලන්නහුදැ යි විචාළ කල්හි මහරජ, සිහින නම් ඉතා නපුරුය. එහි ප්‍රතිඵලය කුමක් වන්නේ ද ? රජයට අනතුරක්, ජීවිතයට අනතුරක්, ධනයට අනතුරක් යන

මේ තුන් අනතුරෙන් එක්තරා අනතුරක් වන්නේය. එයට පිළියම් ඇත්තේ ද ? නැත්තේ ද ? මේ සිහින ඉතාමත් අසුභ බැවින් පිළියම් රහිතය. එහෙත් අපි ඒ සිහිනයන් පිළියම් සහිත බවට පැමිණවීමට නො හැක්කේ නම් අප උගත් ශිල්පයෙන් කවර වැඩක් ද ගුරුතුමනි, කුමක් කොට පිළියම් රහිත කරන්නහු ද ? මහරජ, සබ්බ චතුක්ක යාගය කරන්නෙමු. (සියල්ල හතර බැගින් ගෙන කරන යාගය) රජතුමා බියෙන් තැති ගත්තේ, එසේ නම් ගුරුතුමනි, මගේ ජීවිතය ඔබතුමන්ගේ අතෙහිය. මට වහා යහපත කරනු මැනවැ යි කීයේය. බමුණෝ අපි බොහෝ ධනය ලබන්නෙමු. බොහෝ කන බොන දෑ ගෙන්වා ගන්නෙමු යි, තුටු පහටු ව, මහරජ, සැකයක් නො සිතනු. මැනවි. රජු සනසා රජ මැදුරෙන් නික්ම නගරයෙන් පිටත යාග වළක් සාරා බොහෝ සිව්පා වර්ගයන් කණු ළහට ගෙන්වා පක්ෂි වර්ග එකතු කොට මේ මේ දේ ලැබිය යුතුයැ යි නැවත නැවත සිහි කරවත්. එකල්හි මල්ලිකා දේවි තොමෝ මේ කාරණය දැන රජු වෙත එළැඹ මෙසේ ඇසුවාය. මහරජතුමනි, බමුණෝ පුන පුනා සිහිකැඳවන්නේ කුමක් නිසාදැ ? එවිට රජතුමා ඔබ අපගේ කණ මුල සර්පයකු හැසිරෙන බව නො දන්නීය. මහරජතුමනි, ඒ කිමෙක් ද ? මා විසින් මෙබඳු වූ නපුරු සිහිනයක් දක්නා ලදී. තුන් ආකාර අනතුරුවලින් එකක් පෙනේයැ යි කියා අපල නැති කිරීම සඳහා යාගයක් කරමු යි කියා නැවත නැවත සිහි කැඳවත්.

මහරජතුමනි, දෙවියන් සහිත ලෝකයෙහි අග බමුණන්ගෙන් සිහින ප්‍රතිකර්ම පිළිබඳ විමසන ලද්දේ ද ? සොඳුර, දෙවියන් සහිත ලෝකයෙහි අග බමුණු තෙමේ කවරෙක් ද ? දෙවියන් සහිත ලෝකයෙහි අග්‍ර පුද්ගල වූ සියල්ල දක්නා වූ පිරිසිදු වූ මහා බමුණු නො දන්නෙහි ද ? ඒ භාග්‍යවත් බුදු රජහු සිහින පිළිබඳ විවිධත්වය දන්නාහ. යනු මැන. මහරජතුමනි, එතුමන්ගෙන් විචාරන්න. රජ ඉතා යහපති යි විහාරයට ගොස් බුදු රජුන් වැඳ හුන්නේය.

බුදු රජහු මිහිරි හඬ නිකුත්කොට මහරජ, උදෑසන ම කුමක් නිසා ආවෙහිදැ යි වදාළහ. ස්වාමීනි, මම ඉතා අළුයම් වේලෙහි සොළොස් මහා සිහින දැක බිය වූයේ, බමුණන්ට දැන්වීමි. බමුණෝ, මහරජ, මේ සිහින ඉතා නපුරුය. මෙහි උවදුරු නැති කිරීම සඳහා සබ්බ චතුක්ක යාගය කරන්නෙමු යි යාගයට සැරසෙත්. බොහෝ ප්‍රාණීහු මරණ බයින් තැති ගත්තාහ. ඔබ වහන්සේ ද දෙවියන් සහිත

ලෝකයෙහි අග්‍ර පුද්ගලයෝය. අතීත, අනාගත, වර්තමානයෙහි ඔබ වහන්සේගේ ඥාණයට හමු නො වන කිසි ම දතයුතු දෙයක් නැත්තේය. මට මේ සිහිනවල වැඩ අවැඩ කියනු මැනව.

මහරජ, එසේ මයි, දෙවියන් සහිත ලෝකයේ මා හැර මේ සිහිනවල විවිධත්වය හා වැඩ අවැඩ දැනීමට අන් සමතෙක් නැත්තේය. මම ඔබට කියා දෙන්නෙමි දැන් ඔබ දුටු ආකාරයෙන් ම සිහින කියන්න.

ස්වාමීනි, මැනවි. රජතුමා දුටු ආකාරයෙන් ම සිහින සඳහන් කරන්නේ,

**"උසභා රුක්ඛා ගාවියො ගාවා ච**
**අස්සො කංසො සිගාලී ච කුම්භො,**
**පොක්ඛරණී ච අපාක චන්දනං**

**ලාපූනි සීදන්ති සිලා පලවන්ති**
**මණ්ඩූකියො කණ්හසප්පෙ ගිලන්ති,**
**කාකං සුවණ්ණා පරිවාරයන්ති**
**තසාවකා එළකානං භයාහීති"**

"(යුද නො කොට ගිය) වෘෂභයෝය, (මල්ඵල ගත් කුඩා) වෘක්ෂයෝය, (එදවස උපන් වස්සන්ගේ කිරි බොන) දෙන්නුය. (වියෙහි යොදන නහඹු) ගවයෝය, (දෙපස මුඛ ඇති) අශ්වයෝය. (පෙර සිවලකුට මෙහි වූ කැරව යි පෑ සිය දහසක් අගනා) රන්තැලිය, (අඹරන රැහන කාදමන) සිවලී, (හිස් කළ අතුරෙහි තුබූ දිය පිරුණු) කළය, (ගැඹුරු තැන දිය කැළඹුණු) පොකුණු. (එක් ම සැලෙහි නිසි සේ) නො පැසුණු බතය, (කුණු මෝරුවලට විකුණන සිය දහසක් අගනා) සත් සඳුන් හරය."

"හිස් ලබු කබල් දියෙහි ගැටෙයි. ඝන පාෂාණයෝ (නැවි

මෙන්) දියෙහි පාවෙති. මැඩි පැටියෝ කෘෂ්ණ සර්පයන් ගිලිති. ස්වර්ණ හංසයෝ කවුඩුවකු පිරිවරති. ව්‍යාඝ්‍රයෝ එළුවන්ට බියෙන් තැති ගනිත්. මෙසේ විපර්යාසයක් පවතී. වැලිත් මේ පුරුෂ යුගයෙහි (මේ සිහිනයන්ගේ) විපාක දීමෙක් නැතියි."

මේ සිහින මාතෘකා තබා ප්‍රකාශ කෙළේය. ස්වාමීනි, කෙසේ ද ? මම එක් සිහිනයක් මෙසේ දුටුවෙමි. අඳුන්වන් කළු ගොන්නු සිව් දෙනෙක් යුද්ධ කරමු යි සතර දිශාවෙන් පැමිණියහ. ගොන් යුද්ධය බලමු යි මහජනයා රැස්වූ කල්හි යුද්ධ කරන ආකාරය පමණක් දක්වා නාද කොට ගර්ජන කොට යුද්ධ නො කොට ම පැන ගියහ. මම මේ පළමු වැනි සිහිනය මෙසේ දුටුවෙමි. මේ සිහිනයේ විපාක කවරේ ද ? මහරජ, මේ සිහිනයේ විපාක ඔබගේ කාලයේ හෝ මගේ කාලයේ නො වන්නේය. අනාගතයෙහි නො දැහැමි දිළිඳු රජුන්ගේ කාලයෙහි හා නො දැහැමි මිනිසුන්ගේ කාලයෙහි ලෝකය වෙනස් වන කල්හි කුසල් යටපත් ව අකුසල් මතු ව ලෝකය පිරිහෙන කල්හි වර්ෂාව නිසි ලෙස නො වසී. වැසි වලාකුළු සිඳී යන්නේය. ඒ මැළවෙන්නේය. ආහාර හිඟයක් වන්නේය. වැසි වසින්නාක් මෙන් සතර දිශාවෙන් වලාපටල නැඟී ස්ත්‍රී අඳුන් අවුවෙහි වැනූ වී ආදිය තෙමේය යන බියෙන් ගෙය තුළට ගන්නා කල්හි, පුරුෂයන් උදලු, කුඩ අතැති ව නියර බැඳීමට නික්මුණු කල්හි, වසින ආකාරය දක්වා ගර්ජනා කොට විදුලිය පතුරුවා ඒ ගොනුන් යුද්ධ නො කොට ගියාක් මෙන් වැසි නො වැස ම පලා යයි. මේ එහි විපාකයයි. ඔබට මේ නිසා කිසි අනතුරක් නැත. මේ සිහිනය අනාගත කාලය සඳහා දුටු සිහිනයකි. බමුණෝ තමන්ගේ දිවි පැවැත්ම සඳහා එසේ කීහ.

මෙසේ බුදු රජහු සිහිනෙහි විපාක වදාරා මහරජ, දෙවැනි සිහිනය කියව යි වදාළහ.

ස්වාමීනී, මම දෙවැනි හීනය මෙසේ දුටුවෙමි. කුඩා ගස් ද පැළ ගස් ද පොළොව පලා වියතක් පමණ රියනක් පමණ පැන නැඟී මල් පිපේ. එල දරයි. මේ දෙවැනි සිහිනය දුටුවෙමි. මෙහි විපාක කවරේ ද ? මහරජ, මේ හීනයේ විපාක ලොව පිරිහෙන කල්හි මිනිසුන්ගේ ආයු ප්‍රමාණය අඩු වන කල්හි වන්නේය. අනාගතේ

සත්ත්වයෝ තියුණු රාගය ඇත්තෝ වන්නාහුය. නිසි වයසට නො පැමිණි කුමරියෝ පුරුෂයන් අතරට ගොස් ඔසප් ඇත්තියෝ ද ගැබිණියෝ ද වී දූපුතුන් සමග වැඩෙන්නාහ. කුඩා ගස්වල මල් මෙන් ඔවුන්ගේ ඔසප් භාවය ද ඵල මෙන් දූ දරුවෝ ද වන්නෝය. මේ හේතු කොට ගෙන තොපට බියක් නැත. මහරජ, මේ හේතුවෙනි. මහරජ, තුන් වැනි සිහිනය කියව.

ස්වාමීනී, දෙනුන් එදවස උපන් වසු පැටවුන්ගෙන් කිරි බොනු දිටිමි. මේ මගේ තුන්වැනි සිහිනයයි. මෙහි විපාක කුමක් ද ? මෙහි විපාක ද අනාගතයෙහි ම මිනිසුන් අතර කුල දෙටුවන් පිදීමේ සිරිත අභාවයට ගිය කල්හි වන්නේය. අනාගතයෙහි සත්ත්වයෝ මව්පියන් කෙරෙහි හෝ නැදි මයිලන් කෙරෙහි හෝ ලජ්ජා නූඋපදවා තුමූ ම ආවාහ විවාහ ආදී හවුලේ කටයුතු සංවිධාන කරන්නාහු, ආහාර පාන, වස්ත්‍ර පමණකුදු දෙනු කැමැත්තෝ දෙත්. නො දෙනු කැමැත්තෝ නො දෙත්. මහල්ලෝ අසරණ ව ස්වාධීන ව විසිය නො හැකි ව දරුවන් සතුටුකොට ජීවත්වෙත්. එදවස උපන් වසු පැටවුන්ගෙන් කිරි බොන දෙනුන් මෙනි. මහරජ, මේ හේතුකොට ඔබට බයක් නැත. සතර වැනි හීනය කියව.

ගැල ඉසිලීමට සමත් උස මහතින් යුත් ගොනුන් විය ගසෙහි නො යොදා තරුණ වූ නුපුහුණු ගොනුන් ගැල්හි යොදනු දුටිමි. උන් ගැල ඉසිලීමට නො හැකි ව අතහැර සිටියහ. ගැල් ගමන් නො කළේය. මේ මගේ සිව් වැනි සිහිනයයි. මේ සිහිනයෙහි විපාක කුමක් ද ?

මේ සිහිනයේ විපාක ද අනාගතයෙහි නො දැහැමි රජුන්ගේ කාලයෙහි ම වන්නේය. අනාගත කාලයෙහි නො දැහැමි දිළිඳු රජවරු නුවණැති පරම්පරා වශයෙන් කටයුතු දැනීමෙහි දක්ෂ යුක්තිය පසිඳලීමෙහි සමත් මහඇමැතියන්ට තනතුරු නො දෙත්. දම් සබාවෙහි ද විනිසුරු මඬුල්ලෙහි ද නැණවත් වෙළඳ ව්‍යාපාරයෙහිත් දක්ෂ වැඩිහිටි ඇමැතියන් නො පිහිටුවත්. මීට හාත්පසින් විරුද්ධ වූ නව යෞවනයන්ට පදවි දෙත්. එවැනි අය ම විනිසුරු මඬුල්ලෙහි පිහිටුවත්. ඔවුහු රජයේ කාර්යය මෙන් ම යුතු අයුතු ද නො දන්නාහු, එම පදවිය දරන්ට නො හැකි වෙත්. රාජ්‍යය කාර්යය ද තීරණය

කිරීමට නො හැක්කාහු, කාර්යය භාරය බැහැර කරත්. වැඩිහිටි නුවණැති ඇමැතියන් තනතුරු නො ලබන්නාහු, කටයුතු පසිඳලීමට සමත් වුව ද මොවුන්ගෙන් අපට කිම ? අපි පිටත වූවෝ වෙමු. ඇතුළත සිටින තරුණ දරුවෝ ඒ දැනගනිතැ යි පැමිණි කාර්යය නො කරත්. මේ ආකාරයෙන් ඒ රජුන්ට පිරිහීමක් ම වන්නේය. පදවිය ඉසිලීමට අසමතුන් තනතුරුවල යෙදවීම, නුපුහුණු තරුණ ගොනුන් ගැලෙහි යෙදීම මෙනි. හීය ඉසිලීමට සමත් ශක්තිමත් ගොනුන් ගැලෙහි නො යෙදූ කාලය මෙන් වන්නේය. මේ නිසා ද ඔබට බයක් නො වන්නේය. පස් වැනි හීනය කියව.

ස්වාමීනි, මම දෙපසින්ම මුව ඇති අශ්වයකු දුටිමි. ඌට දෙපසින් ම ගව ආහාර දෙති. ඌ මුව දෙකින් ම කයි. මේ මගේ පස් වැනි සිහිනයයි. මෙහි විපාක කවරේ ද ? මෙහි විපාක ද අනාගතයෙහි නො දැහැමි රජුන්ගේ කාලයෙහි ම වන්නේය. එකල නො දැහැමි අඥබාල රජවරු නො දැහැමි චපල මිනිසුන් විනිසුරුවන් ලෙස තබත්. ඔවුහු පින්පව් නො සලකන, නුවණ නැති ඔවුහු විනිසු මඬුල්ලෙහි හිඳ තීරණ දෙන්නාහු, විත්ති පැමිණිලි දෙපසින් ම අල්ලස් ගෙන කත්. දෙපසින් ම ගව තණ කන අශ්වයා මෙනි. මේ හේතු කොටගෙන ඔබට බියක් නැත. සවැනි හීනය කියව.

ස්වාමීනි, මහජනතාව එක්ව ලක්‍ෂයක් අගනා රන් තැලියක් පිරිමැද මෙහි මූත්‍ර කැරවයි, එක් මහලු හිවලකුට දුන්හ. එහි මූත්‍ර කරන මහලු හිවලා ද දුටුවෙමි. මේ මගේ සවැනි සීනයයි. මෙහි විපාක කවරේ ද ? මෙහි විපාක ද අනාගත කාලයෙහි ම වන්නේය. අනාගතයෙහි අසමජාති රජවරු කුලවතුන්ගේ පුතුන්ට සලකා තනතුරු නො දෙන්නාහ. කුලහීනයෝ උසස් කරන්නාහ. මෙම නිසා කුලවත්හු දුගී වෙත්. ලාමක කුලිකයෝ අධිපති වෙත්. එවිට ඒ කුලවත්හු දිවිරැකීමට නො හැකිව , මොවුන් නිසා ජීවත්වන්නේය. කුලහීනයන්ට තම දියණියන් පාවා දෙන්නාහ. මෙසේ ඒ කුලකතුන් කුලහීනයන් සමග විවාහ වීම, මහලු සිවලා රන් තලියෙහි මූත්‍ර කිරීමට සමාන වන්නේය. මෙයින් ද ඔබට බයක් නො වේ. සත් වැනි සීනය කියව.

ස්වාමීනී, පුරුෂයෙක් රැහැනක් අඹර අඹරා පාමුල තබයි. ඔහු

හිඳ සිටි පුටුව යට ලැග සිටි බඩසයින් පීඩිත සිවලියක් පුරුෂයාට නො දැනෙන්නට එය කා දමයි. මම මෙසේ දිටිමි. මේ සත් වැනි සීනයයි. මෙහි විපාක කවරේ ද ? මෙහි විපාක ද අනාගතයෙහි වන්නේය. අනාගතයෙහි ස්ත්‍රීහු පුරුෂයන් කෙරෙහි තදින් ඇලුනෝ, වෙත්. එසේ ම සුරාවෙහි ඇලුනෙන් අලංකාරයට ඇලුනෝ, වීථි සංචාරයෙහි ඇලුනෝ, පස්කම්හි ඇලුනෝ වන්නෝය. දුස්සීලය පහත් හැසිරීම් ඇත්තා ඇත්තෝ වෙත්. ඒ ස්ත්‍රීහු ඔවුන්ගේ හිමියන් විසින් වගා කිරීම්, ගවයන් රැකීම් ආදී රැකියාවලින් දුක සේ ඉතා අමාරුවෙන් රැස්කරන ලද ධනය තම සොර සැමියන් සමග සුරා බොමින් මල්, ගඳ විලවුන් දරමින් සිය ගෙදර ඉතා අවැසිය පවා නො සොයා ගෙබිත්තියෙහි උඩ සිදුරෙන් ද සොර සැමියන් හා සබඳතා පවත්වමින් හෙට දිනයෙහි වැපිරිය යුතුව තිබුණු ධාන්‍යය හෝ කොටා කැඳබත් කැවිලි පිස කමින් සිය හිමියා වනසන්නේය. පුටුව යට සිටි සිවලිය අඹර අඹරා පාමුල ඇට රැහැන කන්නාක් මෙනි. මේ හේතුවෙන් ද ඔබට බියක් නැත. අට වැනි සිහිනය කියව.

ස්වාමීනි, රජ මිදුලෙහි හිස් භාජන මැද තැබූ ජලය පිරි මහසැළියක් දුටුවෙමි. රජ ආදී සතර කුලයට අයත් මිනිස්සු සතර දිශාවෙන් හා සතර අනුදිශාවෙන් කළවලින් දිය ගෙනවුත් පිරුණු භාජනය ම පුරවත්. එසේ පුරවනු ලබන ජලය උතුරා ගලා යයි. එහෙත් නැවත නැවතත් ජලය පුරවති. හිස් භාජන දෙස බලන්නෙක් ද නැත. මේ මාගේ අට වැනි සිහිනයයි. මෙහි විපාක කවරේ ද ? මේ සිහිනයෙහි විපාක ද අනාගතයෙහි ම වන්නේය. අනාගතයෙහි මේ ලෝකය පිරිහෙන්නේය. එට අභාග්‍යය වන්නේය. රජවරු නිර්ධන දිළින්දෝ වන්නාහ. යමෙක් උපොහොසත් වෙත් ද, ඔහුගේ භාණ්ඩාගාරයේ කහවණු ලක්ෂයක් පමණ වේ. මෙසේ ධනහීන වූ ඔවුහු සියලු ජනපදියන් ලවා තම තමන්ගේ කාර්යය කැරවත්. මෙයින් පීඩාවට පත් මිනිස්සු සිය රැකියා කටයුතු අතහැර රජු සඳහා ම යල මහ වපුරමින් මුං, උඳු ආදී ධාන්‍යය වගා කැරෙමින් ඒ රකිමින් කපමින් මඩිමින් තැන්පත් කරමින් උක්වතු වවමින්, රකිමින් යන්ත්‍ර මඟින් මඩිමින් පෙරමින් පැණි ආදිය පිසමින් මල් උයන් එල උයන් සදමින් එහි හටගත් පළමු ගෙඩි ආදිය ගෙන අවුත් රජුගේ ගබඩා ආදිය පුරවන්නාහ. තම තමන්ගේ ගෙවල හිස්කොටු බලන්නේ ද නො වෙත්. හිස් භාජන නො බලා පිරුණු සැළිය ම පුරවන්නාක් මෙන් වන්නේය. මෙයින් ඔබට බියක් නැත. නව වැනි හීනය කියව.

ස්වාමීනි, පස් පියුමින් ගැවසුණු හැම පැත්තෙන් ම තොට ඇති පොකුණක් දුටිමි. දෙපා, සිව්පා සත්තු වටෙන් ම පොකුණට බැස පැන් බොති. ඒ පොකුණෙහි මැද ගැඹුරු නැත. ජලය කැළැඹී ඇත. දෙපා, සිව්පා වැනි පා තුබූ පෙදෙසෙහි ඉතා පැහැදිලිය. නිශ්චලය ඉතා පිරිසිදුය. මේ මගේ නව වැනි සිහිනයයි. මෙහි විපාක කවරේ ද ? මෙහි විපාක ද අනාගතයෙහි ම වන්නේය. මතු කළ රජවරු අධාර්මික වන්නාහුය. ඡන්දා ආදියෙන් නො මඟට ගොස් රාජ්‍යය කරන්නාහුය. දැහැමින් විසඳුමක් නො දෙන්නාහ. අල්ලසට ධනය කොට ඇත්තෝ ධනයෙහි ගිජුවූවෝ වෙන්නාහුය. රට වැසියන් කෙරෙහි ඉවසීමක්, මෛත්‍රීයක්, අනුකම්පාවක් නම් නැත. ඉතා සැර පරුෂය. උක් යන්ත්‍රයක මිරිකෙන උක් පුරුකක් මෙන් රට වැසියන් පෙළ පෙළා නොයෙක් විධියෙන් අයබදු පනවා ධනය ගන්නාහුය. රට වැසියෝ බදු බරින් පීඩිත ව ඒ ගෙවාගත නො හැකිව ගම්, නියම්ගම් අතහැර පිටිසරට ගොස් ජීවත් වන්නේය. මධ්‍යම ජනපදය හිස් වන්නේය. පිටිසර පෙදෙස් ඝන ජනාවාස වේ. යම් සේ පොකුණු මැද ජලය කැළඹී අවට ජලය ප්‍රසන්න වූයේ ද, එමෙනි. මේ හේතුකොට ඔබට බයක් නැත. දශ වැනි හීනය කියව.

ස්වාමීනි, එක ම සැළියෙහි පිසෙන බත නො පිසෙනු දුටිමි. නො ාපිසුණේ වුව ද බෙදා වෙන් කළාක් මෙන් තුන් අකාරයකින් පැසෙමින් එක් කොටසක් ඉතා තෙත් විය. එක් කොටසක් සහල් ගතිය ඉක්මුණා පමණි. එක් කොටසක් මනාව පිසී තිබිණි. මේ මගේ දශ වැනි හීනයයි. මෙහි විපාක කවරේ ද ? මෙහි විපාක ද අනාගතයෙහි වන්නේය. මතු කාලයෙහි රජවරු අධාර්මික වන්නේය. ඔවුන් අධාර්මික වූ කල්හි රාජකාරියෙහි යෙදුණෝ ද, බමුණු ගැහැවියෝ ද ගම්, නියම්ගම් දනව් වැසියෝ ද මහණ බමුණන් ඇතුළු සියල්ලෝ ද අධාර්මික වන්නාහුය. ඉක්බිති, ඔවුන්ට අරක්ගත් දෙවියෝ ද බලි පිළිගත්ත. දෙවියෝ ද රුක් දෙවියෝ ද අහසෙහි වසනා දෙවියෝ ද අධාර්මික වන්නාහුය. එම රාජ්‍යයෙහි සුළඟට සිතිඳු ව නොව විෂම ලෙස දරුණු ව හමන්නේය. මේ විෂම වායුව අහසෙහි වෙසෙන දෙවියන්ගේ විමාන සොළවන්නේය. මේ නිසා කිපුණු දෙවියෝ වැසි නො වස්වන්නාහුය. වැසි වැස්ස ද රටපුරා එකවර නො වසන්නේය. එම වැස්ස හැම තැන කෘෂිකර්මයට හෝ ධාන්‍යය වැපිරීමට සුදුසු සේ නො වසින්නේය. දනව්වලද, ගම්වල ද වැව් පොකුණු ආදියට ද එකවර ජලය නො ලැබෙන්නේය. වැව් ආදියෙහි

ඉහත්තාවේ වැසි වසින කල්හි යට කොටසට නො වසින්නේය. යට කොටසට වසින කල්හි මතු කොටසට නො වසින්නේය. මේ නිසා එක් කොටසක සශ්‍යය අධික වර්ෂාව නිසා නැසෙන්නේය. අනික් කොටස වර්ෂාව නැති නිසා වියලෙන්නේය. සම ව වැසි වට කොටස මනාව පැසෙන්නේය. මෙසේ එක ම රජුගේ රාජ්‍යය තුළ සශ්‍යය ත්‍රිවිධාකාර වන්නේය. එක් සැළියෙහි පිසුණු බත් මෙනි. මේ නිසා ද ඔබට බයක් නො වන්නේය. එකොළොස් වැනි හීනය කියව.

ස්වාමීනි, ලක්‍ෂ්‍යක් වටිනා සඳුන් අරටුවක් කුණු වූ මෝරුවලට විකුණනු දුටිමි. මගේ මේ එකොළොස් වැනි සීනයයි. මෙහි විපාක කවරේ ද ? මෙහි විපාක ද මගේ ශාසනය පිරිහෙන කල්හි වන්නේය. මතුකල සිව්පසයෙහි ලොල් වූ විළි නැති භික්‍ෂූ බොහෝ වන්නේය. මවිසින් සිව්පස ලෝලත්වය පහත්කොට දෙසන ලද ධර්මය, සිවුරු ආදී සිව්පසය ලබාගැනීම සඳහා අනුන්ට දේශනා කරන්නේය. සිව්පස ලාභය හැර සසරින් එතැරවීමේ කොටසෙහි සිට නිවන අරමුණුකොට දෙසීමට නො හැකි වන්නෝය. මගේ වචන මාලාවත් මිහිරි හඬත් අසා වටිනා සිවුරු ආදිය දෙන්නාහ. එසේ ම දෙනු කැමැත්තෝ ද වෙති යි දේශනා කරන්නාහුය. සමහරු නුවර ඇතුළත, සතර මංසන්ධි, රජ දොරටු ආශ්‍රිත ව හිඳ කහවණු, අඩ කහවණු, මසු ආදී මුදල් නිසා දේශනා කරන්නාහ. මෙසේ මා නිවන අගය කොට දෙසන ලද ධර්මය සිව්පස ලැබීම, කහවණු, අඩ කහවණු පිණිස විකුණා දම් දෙසීම ලක්‍ෂයක් වටිනා හඳුන් හර කුණු මෝරු සඳහා විකිණීමක් වැනි වන්නේය. මේ නිසා ද ඔබට බයක් නැත. දොළොස් වැනි හීනය කියව.

ස්වාමීනි, ලබු කබල් දියෙහි ගිලෙනු දුටිමි. මෙහි විපාකය කිමෙක් ද ? අනාගතයේ නො දැහැමි රජුන්ගේ කල කාලයෙහි පරිවර්තනය වනවිට වන්නේය. කුල පුත්‍රයන්ට තනතුරු නො දෙන්නාහ. කුල හීනයන්ට ම දෙන්නාහ. ඔවුහු ප්‍රධානියෝ වන්නාහුය. දිළිඳු කුලවත්හු රජු ඉදිරියෙහි හෝ රජ දොරටුවෙහි හෝ ඇමැතියන් ඉදිරියෙහි විනිසුරු මඬුල්ලෙහි, කුල හීනයන්ගේ කථාවෙහි ගිලී යන්නාක් මෙන් නිසොල්මන් වූවෝ වන්නාහ. සතුන් එකතුවන ද තැන්හි ගණ කර්ම කරන තැන්වල ද පාසිවුරු විහාරාරා ම පිළිබඳ විශේෂත්වය දෙන තැන්වල ද දුසිල් පව්ටු පුද්ගලයන්ගේ කථා පරම සත්‍යය වන්නේය. සුපේක්ශල භික්‍ෂූන්ගේ නො වේ. මෙසේ හැම

අයුරින්ම හිස් ලබු කබලක ගිලීයන කාලය මෙනි. මේ නිසා ද ඔබට බයක් නැත. තෙළෙස් වැනි හීනය කියව.

ස්වාමීනි, මහත් මහත් කළුගෙවල් පමණ කළුග ල් නැවක් මෙන් ජලයෙහි පාවෙනු දුටිමි. මෙහි විපාක කෙසේ ද ? මෙහි විපාක ද කියන ලද කාලයට සමාන කාලයෙහි ම වන්නේය. එකල නො දැහැමි රජවරු කුලහීනයන්ට පදවි දෙත්. ඔවුහු අධිපතියෝ වෙත්. කුලවත්හු දිළිඳු වෙත්. කිසිවෙක් ඔවුන්ට හරසර නො දකින්නාහුය. කුලහීනයන්ට ම හරසර දක්වන්නෝය. කුලහීනයන්ට ම ගරු බුහුමන් කරත්. රජු ඉදිරියෙහි හෝ ඇමැතියන් ඉදිරියෙහි හෝ යුක්තිය පසිඳන ස්ථානයෙහි හෝ යුක්ති පසිඳලීමෙහි දක්‍ෂ වූ ගල් පර්වත වැනි කුලපුතුන්ගේ කථා සැලකිය යුතුලෙස නො පිහිටන්නේය. ඔවුන් කථා කරන කල්හි මේ කුමන කථාදැ යි උපහාස කරන්නේය. සංඝ රැස්වීම් වල දී ද ඉහත කී ආකාර ස්ථානවල දී සුපේක්ශල භික්‍ෂූන් ගරු කළ යුත්තන් සේ නො හඟිත්. ඔවුන්ගේ කථා සිතට වැදී නො සිටිත්. කළු ගල් පර්වත කාලය මෙන් වෙයි. මේ හේතුකොට ඔබට බියක් නැත. තුදුස් වැනි හීනය කියව.

ස්වාමීනි, කුඩා මීපුප් පමණ වූ ගෙඹි දෙන්නු වේගයෙන් ලුහුබැඳ නාගයන් අල්ලා උපුල් මෙන් කඩ කඩා මස් බුදිනු දිටිමි. මෙහි විපාක කවරේ ද ? මෙහි විපාක ද ලෝකය පිරිහෙන කල්හි මතු කාලයේ ම වන්නේය. එකල්හි මිනිස්සු තීව්‍ර කාමාශාවෙන් පෙළුනහු කෙළෙස් වසඟ ව නව යොවුන් තම බිරියන්හි වසඟයෙහි පවතින්නෝය. ගෙදර දැසි දස් කම්කරුවෝ ද ගව මීගව ආදී සතුන් ද රන් රිදී ආදී ධනය ද ඒ බිරියන්ට ම අයත් දේ වෙති. රන්රිදී හෝ වෙනයම් උපකරණයක් හෝ කොහිදැ යි ඇසූ කල්හි එය එතැන තිබුණත් මෙතැන තිබුණත් තට මොකද ? මේ මගේ ගෙදර ඇති නැති දේ දැන ගැනීමට තට අයිතිය කුමක්දැ යි කියා නොයෙක් අයුරින් පරිබ්‍රව කොට මුව අවියෙන් කොටා දැසිදස් කම්කරුවන් මෙන් තම යටතට ගෙන තම ආධිපත්‍යය පවත්වයි මෙසේ මීපුප් පමණ වූ මැඩි දෙනුන් නාගයන් ගිල දමන කල මෙන් වන්නේය. මෙයින් ඔබට බියක් නො වේ. පසළොස් වැනි හීනය කියව.

ස්වාමීනි, අගුණාංග දහයකින් යුත් ගම ගොදුරු කොට ඇති

කවුඩන් රන්වන් පැහැ ඇති බැවින් සුවණ්ණ හංස නාමය ලැබූ හංසයන් පිරිවරා සිටිනු දුටිමි. මෙහි විපාක කෙසේ ද ? මෙහි විපාක ද අනාගතයෙහි රජවරු හස්ති ශිල්පාදියෙහි අදක්‍ෂ ව යුද්ධයන්හි එඩිතර නො වූවෝ වන්නෝය. ඒ රජවරු තම රාජ්‍යයට විපතක් වේය යන සැකයෙන් ජාති වශයෙන් තමා හා සම නො වූ කුලපුතුන්ට යස ඉසුරු නො දී පාද දෙවීම, නැහැවීම, කෙස් රැවුල් කපන සේවකාදීන්ට දෙන්නෝය. උසස් කුලගොත් ඇති පුරුෂයෝ රජුගෙන් පිහිටත් නො ලැබ දිවිරැක ගැනීමට නො හැකි ව, නො ඉසුරුමත් ව, කුලගොතින් හීන වූවන්ට උවටැන් කරන්නාහ. රන් හසුන් විසින් කවුඩා පරිවරණ ලද කාලය මෙනි. මේ නිසා ද ඔබට බියක් නැත. සෙළොස් වැනි හීනය කියව.

ස්වාමීනී, පෙර සිට කොටි, එළුවන් කති. එහෙත් මම කොටින් ලුහුබැඳ මුරුමුර හඬ නඟා කන එළුවන් දුටිමි. ඉක්බිති, බියට පත් ව්‍යාඝ්‍රයෝ එළුවන් දුර දීම දැක පලා ගොස් වන ලැහැබට පිවිස සැඟවන්නාහ. (ගාථාවෙහි හි යනු නිපාතයක් පමණි) මම මෙසේ සොළොස් වැනි සිහිනය දුටිමි. මෙහි විපාක කවරේ ද ? මෙහි විපාක ද අනාගතයෙහි නොදැහැමි රජවරුන්ගේ කාලයෙහිම වන්නේය. එකල කුලහීනයෝ රජු හා විශ්වාස ව තම කථාව රජුන්ට ඒත්තු ගන්වා විනිසුරු මඬුලු ආදියෙහි බලවත් වී පරම්පරාගත කුලවතුන්ගේ කෙත්වතු ආදිය මේවා අප සතු යි අභියෝග කොට මේ කෙත්වතු අපටයැ, තොපට නො වේ යි විනිශ්චය ශාලාවල විවාදකොට වේවැල් ආදියෙන් පහර දී ගෙලෙන් ගෙන අප සමග වාද කරන්නහු තම පමණ දැන ගනිවු. නැතිනම් රජු ලවා අත්පා කිලිටි කරවන්නෙමු යි තර්ජනය කරන්නාහ. කුලවත්හු ද ඔවුන්ට බයින් තමා සතු වස්තුව, මේවා ඔබලා සතුමය. ගනු මැනවැ යි ඔවුන්ට ම පවා දී තම ගෙවලට ගොස් බයින් නිදන්නාහුය. මේ අයුරින් සසුනෙහි දුස්ශීල මහණහු සුපේක්ශල භික්‍ෂූන් කැමැති පරිදි වෙහෙසන්නාහ. සුපේක්ශල භික්‍ෂූහු පිළිසරණක් නො ලැබ වනයෙහි සැඟවෙන්නාහ. මෙසේ හීන කුලිකයන් විසිනුත් පව්ටු මහණුන් විසිනුත් පීඩා කරන ලද උසස් කුලවතුන් ද සුපේක්ශල භික්‍ෂූන් ද එළුවන්ට බියෙන් ව්‍යාඝ්‍රයන් පලායන කාලයට සමානය. මේ සිහිනය ද අනාගත කාලය සඳහා ම දක්නා ලද්දකි. බමුණෝ වනාහි තම හිතැති පරිදි ඔබට ආදරයෙන් කීවාහු නො වෙත්. ධනයෙහි බැඳුණු ඇස් ඇති බැවින් බොහෝ ධනය ලබා තම දිවි පැවත්ම සඳහා ම කීවාහුය.

මෙසේ බුදු රජහු සොළොස් මහා සිහිනයන්ගේ විපාක දක්වා මහරජ, දැන් ඔබ ම මේ සිහින දුටුවේ නො වේ. පෙර රජවරු ද දුටුවාහුය. එදින ද බමුණෝ මේ සිහින ගෙන යාග මතුයෙහි ම තැබූහ. එහෙත් නුවණැත්තන් විසින් දෙන ලද උපදෙස් අනුව බෝසතුන්ගෙන් ඇසූහ. බෝසත්හු ද මේ අයුරින් ම සිහින තෝරා දුන්හ යි වදාරා කොසල් රජු විසින් අයදනා ලදුව ඉකුත් කථාව ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු උසස් බමුණු කුලයෙහි ඉපිද වැඩිවිය පත් ව තාපස පැවිද්දෙන් පැවිදි ව අභිඥා සමාපත්ති උපදවා හිමවත් පෙදෙසෙහි ධ්‍යාන සැප විඳිමින් වෙසෙති. එදවස බරණැස් රජ මේ අයුරින් ම සිහින දැක බමුණන්ගෙන් විචාළේය. බමුණෝ පෙර මෙන් ම යාග ඇරඹූහ. ඔවුනතුරින් පුරෝහිත බමුණුගේ අතවැසි මානවක නැණවත්ය. දක්‍ෂය. ඔහු බමුණාට මෙසේ කීය. ගුරුතුමනි, ඔබතුමන් විසින් අපි තුන් වේදය උගන්වන ලද්දෝ වෙමු. එකකු මරා අයකුටයෙත් ශාන්ති කිරීමක් එම වේදයන්හි නැත්තේ නො වේ ද ? දරුව, මේ උපායෙන් අපට බොහෝ ධනය ලැබෙන්නේය. ඔබ රජුගේ ධනය රකිනු කැමැත්තේ ද ? එවිට මානවකයා ගුරුතුමනි, ඔබ ඔබගේ කාර්යය කරනු මැනවි. ඔබ ළඟ සිටීමෙන් මට වැඩක් නැතැ යි ඒ මේ තැන ඇවිදිමින් රජුගේ උයනට ගියේය.

එදවස ම බෝසත්හු ඒ කාරණය දැන අද මා මිනිස් පියසට ගියකල්හි මහජනයාට බන්ධනයෙන් මිදීම වන්නේය. අහසින් ගොස් උයනෙහි බැස රන් පිළිමයක් මෙන් මඟුල් ගල් තලාවෙහි වැඩ උන්හ. මානවකයා බෝසතුන් වෙත ගොස් වැඳ එකත්පසෙක හිඳ පිළිසඳර කථා කළේය. බෝසත්හු ද ඔහු සමග ප්‍රිය තෙපුල් බෙණෙමින් මානවකය, කිම, රජ දැහැමින් රාජ්‍යය කැරවයිදැ යි විචාළහ. ස්වාමීනි, රජ නම් දැහැමිය. එසේ වුවත් බමුණන් ඔහු නො මඟ යොමුකරති. රජ සොළොස් මහා සිහිනයන් දැක බමුණන්ට දැන්වීය. බමුණෝ ඒ සඳහා යාගයක් කරන්නෙමු යි මහා යාගයක් පටන් ගත්හ. ස්වාමීනි, මේ සිහින විපාක වේයැ යි රජු දැනුවත් කොට මහජනයා බියෙන් මුදවන්ට ඔබතුමන්ට සුදුසු නො වන්නේ ද ? මානවකය, අපි රජු නො හඳුනමු. රජ අප ද නො දනී. ඉදින්, ඔහු

මෙහි අවුත් අපගෙන් විචාරන්නේ නම් ඔහුට හීන ප්‍රතිඵල කියමු. ස්වාමීනි, මම රජු මෙහි ගෙන එන්නෙමි. ඔබතුමා මගේ පැමිණීම බලාපොරොත්තුවෙන් මඳ වේලාවක් සිටිනු මැනවි. බෝසතුන්ගෙන් ප්‍රතිඥා ගෙන, රජු වෙත ගොස්, මහරජතුමනි, එක්තරා අහසින් ගමන් කරන තවුසෙක් ඔබතුමාගේ උයනෙහි වැස ඔබතුමා දුටු සිහිනවල ප්‍රතිඵල කියන්නෙමි යි ඔබතුමන් කැඳවති යි කීය.

මානවකයාගේ වදන් ඇසූ රජ එකණෙහි ම උයනට ගොස් තවුසාණන් වැඳ එකත්පසෙක සිට ස්වාමීනී, මා දුටු සිහිනයන්ගේ විපාක ඔබතුමා දන්නහුද යි විමසීය. එසේය. මහරජ, දනිමි. ස්වාමීනි, එසේ නම් කියනු මැනවි. පළමු කොට ඔබ දුටු පිළිවෙලින් සිහින කියනු. දෙවනු ව මම විපාක කියමි.

"උසභා රුක්ඛා ගාවියො ගවා ච
අස්සො කංසො සිගාලී ච කුම්භො,
පොක්ඛරණී ච අපාක චන්දනං

ලාපූනි සීදන්ති සිලා පලවන්ති
මණ්ඩූකියො කණ්හසප්පෙ ගිලන්ති,
කාකං සවුණ්ණා පරිවාරයන්ති
තසාවකා එළකානං භයා හීති"

"යුද නො කොට ගිය ගවයෝ, මල්එල හටගත් කුඩා ගස්, වස්සන්ගෙන් කිරි බොන දෙන්නු, ගැලෙහි සාදන නහඹු ගවයෝ, දෙපස මුව ඇති අශ්වයෝ, මහලු සිවල් දෙනක් මූත්‍ර කරන රන් තලිය, රැහැන කා දමන හිවල් දෙන, හිස් කළ ගෙඩි පිරුවරා පිරුණු කළය, ගැඹුරු තැන දිය කැළඹුණු පොකුණු, නො පැසුණු බත, රත් හඳුන්, හර හිස් ලබු කබලි දියෙහි ගිලෙයි, කළු ගල් දියෙහි පාවෙයි. මැඩි දෙන නාගයන් ගිලිති. කවුඩුවන් විසින් පරිවරන ලද සුවර්ණ හංසයෙක්, එළුවන්ට බියෙන් දුවන ව්‍යාඝ්‍රයෝය."

මෙසේ කොසොල් රජ බුදු රජුන්ට කියන ලද අයුරින් සිහින ප්‍රකාශ කළේය. බෝසත්හු සිහින එල බුදු රජුන් දේශනා කරන ලද අයුරින් ම ප්‍රකාශ කොට අවසන මෙසේත් ප්‍රකාශ කළහ. පෙරළියක් ඇත. එහෙත් ඒ මේ යුගයෙහි නො වේ.

මෙහි අදහස මෙසේය. මහරජතුමනි, මේ සිහිනවල දුර්විපාකය ඇත. එය වැළකීම සඳහා යම් ආකාරයක යාග කර්මයක් පවතී ද එය "විපරියාසො" වන්නකි. පෙරළියකි. විපරීතයකි. වෙනස් ආකාරයකින් පවතී යි කියන ලදී. කුමක් නිසා ද ? මේ සිහින විපාක ලෝකය පරිණාමය වන කල්හි හෙවත් අයුක්තිය යුක්තියයැ යි ගන්නා කාලයෙහි, යුක්තිය අයුක්තියයැ යි බැහැර කරන කාලයෙහි, අසත්‍යය සත්‍යයැ යි ගන්නා කාලයෙහි, සත්‍යය අසත්‍යයැ යී අත්හරින කාලයෙහි, අලජ්ජීන් බලවත් කල්හි, ලජ්ජීන්ගේ බලය පිරිහෙන කාලයෙහි වන්නේය. "නයිධමත්ථි" දූන් හෝ මගේ හෝ ඔබගේ කාලයෙහි, මේ පුරුෂ යුගයෙහි පවත්නා කල්හි මේ සිහිනයන්ගේ විපාක නො වන්නේය. එම නිසා දුර්විපාක නැති කිරීම සඳහා පවත්වන යාග කර්ම පෙරළියක් සේ පවතී. එහි ප්‍රයෝජනයක් නැත. මෙයින් බියක් හෝ තැති ගැන්මක් නැතැ යි, මෙසේ බෝසත්හු රජු සනසා බන්ධනගත සත්ත්වයන් මුදාහැර නැවත අහසෙහි සිට රජුට අවවාද කොට පන්සිල්හි පිහිටුවා මහරජ, මෙතැන් සිට බමුණන් හා එකතු ව සත්ත්ව ඝාතන යාග නො කැරෙවයි, දහම් දෙසා අහසින් ම තමන් වසන තැනට ගියහ

රජ ද බෝසතුන්ගේ අවවාදයෙහි සිට දානාදී පින්කොට කම් වූ පරිදි මිය ගියේය. බුදුහු ධර්ම දේශනාව ගෙනහැර දක්වා සිහින හේතුවෙන් රජුට බියක් නැත. එම නිසා මේ යාගය නවත්වනු යි, යාගය නවත්වා මහජනයාට දානය දී අනුසඳි ගළපා ජාතකය නිම කළහ. එදා රජ ආනන්ද තෙරණුවෝය. මානවකයා සැරියුත් තෙරණුවෝය. තාපසයාණෝ මම ම වීමි.

බුදු රජුන් පිරිනිවි කල්හි සංගීත් කාරක මහා තෙරවරු "රුක්ඛ" ආදී එකොළොස් පද අටුවාවට නඟා "ලාබූනි" ආදි පද පස එක ගාථාවක් වශයෙන් ගෙන ජාතක ඒකක නිපාත පාළියට ඇතුළත් කළහ.

1. 8. 8.

## ඉල්ලීස ජාතකය

"උභො ඛඤ්ජාති" යන මේ දේශනාව බුදු රජහු ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, මසුරු කෝසිය සිටාණන් අරබයා වදාළහ. රජගහ නුවර අබියස සක්ඛර නම් නියම් ගමක් වෙයි. එහි අසූ කෙළක් ධනය ඇති කෝසිය නම් මසුරු සිටුවරයෙක් වසයි. හෙතෙම තණ අගින් තෙල් බිඳක්වත් අනුන්ට නො දෙයි. තමා ද පරිභෝග නො කරයි. මෙසේ ඔහුගේ ඒ මහා ධනස්කන්ධය දූදරුවන්ට ප්‍රයෝජනයක් නො වෙයි. මහණ බමුණන්ට ද ප්‍රයෝජනයක් නො වෙයි. රකුසන් විසින් අරක් ගන්නා ලද පොකුණක් මෙන් ප්‍රයෝජනයට ගත නො හැකි ව තිබේ.

බුදු රජහු එක් දවසක් අළුයම් වේලෙහි මහා කරුණා සමවතින් නැඟිට සියලු ලොව ම ධර්මාවබෝධ කළ හැකි බන්ධූන් බලන්නාහු, පන්සාළිස් යොදුනක් දුර වසන්නා වූ භාර්යාව සහිත ඒ සිටුවරයාගේ සෝවාන් ඵලය පසක් කිරීමට හේතු සම්පත් දුටහ. මීට පෙර දිනක ඒ සිටුවරයා රාජ සේවයට රජ ගෙදරට ගොස් රාජ සේවය කොට ආපසු එන්නේ, බඩසයින් පීඩිත වූ එක් ජනපද වැසි මිනිසකු කොමුපිඩු පිරවූ තැටි කැවුම් කනු දැක ඒ පිළිබඳ ආසා උපදවා තමාගේ ගෙට ගොස් මෙසේ සිතීය. ඉදින් මම තැටි කැවුම් කනු කැමති වෙමි යි කීවේ නම් බොහෝ දෙනා මා සමග කනු කැමැත්තෝ වන්නාහ. එසේ වූ කල්හි මගේ බොහෝ සහල්, ගිතෙල්, පැනි ආදිය වැයවීමට යන්නේය. එම නිසා කිසිවකුට නො කියන්නෙමි යි ආසාව ඉවසාගෙන සිටී. මෙසේ කල්යත් ම පඬුවන් පැහැ ඇත්තේ නහර වැල් පතළ සිරුරු ඇත්තේ විය. තව දුරටත් ආසාව ඉවසා සිටීමට නො හැක්කේ ගේ තුළට පිවිස ඇඳ වැළඳ ගෙන හොත්තේය. මෙසේ වුව ද ධන හානි බයින් කිසිවකුට නො කීවේය.

ඉක්බිති, ඔහුගේ බිරිය ඔහු වෙත එළැඹ පිට පිරිමැද ස්වාමීනි, ඔබට කිම, අපහසුවක්ද යි විචාළාය. මට කිසි අපහසුවක් නැත. එසේ

නම් රජතුමා ඔබට කිපුණේ ද ? නැත. මට රජතුමා කිපෙන්නේ නැත. එසේ නම් කිම. ඔබගේ දූපුතුන් විසින් හෝ, දස් කම්කරුවන් විසින් හෝ කිසියම් නො මනා දෙයක් කරන ලද්දේ ද ? එවැන්නක් ද නැත. කිසියම් දෙයක් පිළිබඳ ඔබට ආශාවක් ඇත්තේ ද ? මෙසේ කී කල්හි ද ධන හානි බයින් කිසිවක් නො කියා නිහඬ ව හොත්තේය. එවිට ඔහුගේ භාර්යාව හිමියනි, කියනු මැනවි. ඔබට කිසියම් ආසාවක් ඇත්තේ ද ? ඒ වචනය ඇසූ සිටු වචන ගිලින්නාක් මෙන් මට එක් ආශාවක් ඇත්තේය. හිමියනි, කිනම් ආශාවක් ද ? තැටි කැවුම් කනු කැමැත්තේ වෙමි. එසේ නම් කුමක් නිසා නොකීවෙහි ද ? කිම, ඔබ දිළින්දෙක් ද ? දූන් සියලු සක්ඛර ගම් වාසීන්ට පොහොනා පරිදි තැටි කැවුම් දෙමු ඔවුන්ට දීමෙන් ඇති ඵලය කුමක් ද ? ඔවුහු තමන්ගේ කටයුතු කැරගෙන කන්නාහ. එසේ නම් එක වීථියක වසන ජනයාට පොහෝනා පරිදි පිසමි. මම ඔබගේ ධන මහත බව දනිමි. එසේ නම් මේ ගෙහි වසන සැමට ප්‍රමාණවත් වනසේ පිසමි. තිගේ සිතේ මහත් බව මම දනිමි. එසේ නම් ඔබගේ අඹුදරුවන් සඳහා පමණක් පිසමි. ඔවුන්ගෙන් ඇති ඵලය කුමක් ද? එසේ නම් ඔබටත් මටත් ප්‍රමාණවත් වන සේ පිසමි. තිගෙන් මට ඇති ඵලය කිම. එසේ නම් ඔබට පමණක් පිසමි. මේ ගෙහි පිසන කල බොහෝ දෙනා බලාපොරොත්තු වෙති. නො ාබිඳුණු සහල් ඉවත් කර සුන් සහල් පමණක් ගෙන ලිපි සහ භාජන ද රැගෙන ස්වල්ප වශයෙන් කිරි, ගිතෙල්, මී පැණි ද ගෙන සත් මහල් ප්‍රාසාදයෙහි උඩුමහල් තලයට නැඟ පිසව. මම එහි සිට එකලා ව හිඳ තැටි කැවුම් කන්නෙමි. ඇය ද මැනවැ යි පිළිවදන් දී ගතයුතු දේ ගෙන්වාගෙන පහයට නැඟ දාසියන් බැහැර යවා සිටුවරයා කැඳවූවාය. ඔහු ද මුලපටන් දොරවල් වසමින් සියලු දොරවල් අගුළු දමා සත් වැනි මහලට නැඟ එහි ද දොර වසා හුන්නේය. ඔහුගේ බිරිය ද ලිපෙහි ගිනි මොළවා බඳුන තබා කැවුම් පිසීමට ආරම්භ කළාය.

ඉක්බිති, බුදු රජහු අළුයම් වේලෙහි මහා මුගලන් තෙරුන් ඇමතූහ. මොග්ගල්ලාන, රජගහ නුවර අබියස සක්ඛර නම් නියම් ගමෙහි කෝසිය නම් මසුරු සිටු තැටි කැවුම් කම් යි මෙරමා දකිතැ යි යන බියෙන් සත්මහල් ප්‍රාසාදයෙහි තැටි කැවුම් පිසවයි. ඔබ එහි ගොස් ඒ සිටු දමනය කොට ඔද බිඳ අඹු සැමි දෙදෙනා ම ද කැවුම් ද කිරි, ගිතෙල්, මීපැණි ආදිය ද ඔවුන් ලවා ගෙන්වා ගෙන තමාගේ

බලයෙන් ජේතවනයට ම රැගෙන එන්න, මම ද අද පන්සියයක් භික්ෂූන් සමග වෙහෙරෙහි රැඳෙන්නෙමි. අද තැටි කැවුම්වලින් ම බත් කිසි කරන්නෙමි යි වදාළහ. තෙරහු ද ස්වාමීනි, යහපතැ යි බුදු රජුන්ගේ වචනය පිළිගෙන එකෙණෙහි ම ඍද්ධියෙන් ඒ නියම් ගමට වඩමවා එම ප්‍රාසාදයෙහි සිහිමැදුරු දොරටුව අබියස මනාව හැඳ පොරවා අහසෙහි ම මිණි රුවක් මෙන් සිටියහ.

තෙරුන් දකිත් ම මහා සිටුගේ හදවත සැළිණි. සිටුවරයා මම මෙවැනි අයට ම බියෙන් මෙතැනට පැමිණියෙමි. මොහු ද අවුත් වා කවුළු දොරෙහි ම සිටියේය. වෙන කළ යුතු දෙයක් නොමැති ව ගින්නෙහි ලූ ලුණු කැට සේ කෝපයෙන් සැළෙමින් මෙසේ කීය. ශ්‍රමණය, අහසෙහි සිට කුමක් ලබන්නෙහි ද ? පියවර නො පිහිටන අහසෙහි පියවර දක්වා සක්මන් කළේ වී නමුත් නො ලබන්නෙහිය යි කීවේය. තෙරහු ද එම ස්ථානයෙහි ම ඔබිමොබ සක්මන් කළහ. එවිට සිටු සක්මන් කිරීමෙන් කුමක් ලබන්නෙහි ද ? අහසෙහි පළඟින් සිටියේ ද නො ලබන්නෝමැ යි කීවේය. තෙරහු පළක් බැඳ අහසෙහි වැඩ හුන්හ. එවිට සිටු ඉඳීමෙන් කුමක් ලබන්නෙහි ද ? අවුත් වා කවුළුවෙහි එළිපත්තෙහි සිටිය ද නො ලබන්නේයැ යි කීවේය. ඉක්බිති, තෙරහු එළිපත්තෙහි වැඩ සිටියහ. ඉක්බිති, සිටු එළිපත්තෙහි සිට කුමක් ලබන්නෙහි ද ? දුම පිඹිමින් සිටියේ ද, නො ලබන්නේ මය. එවිට තෙරහු දුම් පිට කළහ. සියලු ප්‍රසාදය දුමින් පිරී ගියේය. එහෙත් ගෙය දැවෙතැ යි යන බියෙන්, දල්වුණත් නො ලබන්නෙහියැ යි නො කියා මෙසේ සිතීය. මේ ශ්‍රමණයා ලැගගෙන ම සිටී. තැටි කැවුම් නො ලැබ නො යන්නේය. එම නිසා මොහුට එක් කැවුමක් දෙවන්නෙමි යි බිරිය අමතා මෙසේ කීය. සොඳුර, එක් කුඩා කැවුමක් පිස ශ්‍රමණයාට දී ඔහු පිටත් කැර හරිනු.

බිරිය ද පිටි ස්වල්පයක් තැටියට දැම්මාය. ඒ සමගම මහා කැවුමක් වී මුළු තැටිය ම පිරී පිපී සිටියේය. සිටු ඒ දැක තී වැඩිපුර පිටි ගත්තා විය යුතුය යි. තෙමේ ම හැඳි කොණකින් පිටි ස්වල්පයක් ගෙන තැටියට දැම්මේය. එවිට පෙර කැවුමටත් වඩා විශාල වූයේය. මෙසේ පිසින පිසින කැවුම පෙරට වඩා විශාල ම වෙයි. එවිට සිටු කළකිරී භාර්යාව අමතා සොඳුර, මෙයින් එක කැවුමක් දෙව යි කීවේය. කැවුම් පැසින් එක කැවුමක් ගනිත් ම සියලු ම කැවුම් එකට ඇලී තිබුණේය. ඈ සිටුවරයාට මෙසේ කීවාය. හිමියනි, සියලු ම

කැවුම් එකටම ඇලී තිබේ. වෙන්කළ නො හැක්කෙමි. සිටු ද මම වෙන් කරන්නෙමි යි උත්සාහ කළ ද නො හැකි විය. දෙදෙනා ම දෙකෙළවරින් ගෙන අදිමින් උත්සාහ කළ ද වෙන් කිරීමට නො හැකි වූවාහුය. මෙසේ දෙදෙනා කැවුම් වෙන් කිරීමට උත්සාහ කරත් ම සිරුරෙන් දහදිය පිටවිය. කැවුම් ආසාව ද සිඳී ගියේය.

ඉක්බිති, බිරියට මෙසේ කීවේය. සොඳුර, මට කැවුමෙන් වැඩක් නැත. පැස සමග ම භික්ෂුවට දෙව. ඇය ද ගෙන තෙරුන් වෙත පැමිණියාය. තෙරහු දෙදෙනාට ම දම් දෙසූහ. තෙරුවන් ගුණ වදාළහ. දීමෙහි විපාක ඇත. පූජාවෙහි විපාක ඇත ආදී වශයෙන් දානයෙහි ආනිශංස අහසෙහි සඳ මඬල මෙන් දක්වූහ. ඒ අසා පහන් සිත් ඇති සිටුවරයා ස්වාමීනි, පැමිණ මේ අසුනෙහි වැඩ හිඳ කැවුම් වළඳනු මැනවැ යි ඉල්ලා සිටියේය.

තෙරණුවෝ, මහා සිටුවරය, බුදු රජහු කැවුම් වළඳමි යි පන්සියයක් භික්ෂූන් සමග විහාරයෙහි ම වැඩ සිටිති. බුදු රජහු කොහි වෙසෙත් ද ? සිටුවරය, පන්සාළිස් යොදුනක් දුරින් පිහිටි දෙව්රම් වෙහෙරෙහි වැඩ සිටිති. ස්වාමීනි, කාලය නොයික්මෙයි. ඔබගේ කැමැත්ත තිබේ නම් මම ඔබ හැම දෙන තම ඍද්ධි බලයෙන් ගෙන යන්නෙමි. තොපගේ පහයෙහි ඉණිමන් මුල තිබූ ස්ථානයෙහි ම වන්නේය. ඉණිමන් කෙළවර දෙව්රම් වෙහෙර දොරටුවෙහි වන්නේය. පහයේ උඩුමහලේ සිට පහත මහලට බසින කාල ප්‍රමාණයෙන් තොප දෙව්රම් වෙහෙරට පමුණුවන්නෙමි. හෙතෙම ස්වාමීනි, මැනවැ යි පිළිගත්තේය. තෙරණුවෝ හිණිමං හිස එහි ම සිටින සේ කොට හිණිමං මුල දෙව්රම් වෙහෙර දොරටුවෙහි වේවා යි අධිෂ්ඨාන කළහ. ඒ එසේ ම විය.

මෙසේ තෙරණුවෝ සිටු ද සිටු බිරිය ද මතු මහළෙහි සිටි යට මහළට බසින කාලයට වඩා ඉක්මනින් ජේතවන විහාරයට පැමිණ වූහ. ඒ දෙදෙනා ම බුදු රජුන් වෙත එළැඹ දානයට කල් දැන්වූහ. බුදු රජහු දන්හලට වඩමවා පනවන ලද උතුම් බුද්ධාසනයෙහි මහභික් සඟන සමග වැඩ සිටියහ. සිටු, බුදු පාමොක් මහ සඟනට පැන් පිළිගැන්වීය. සිටු බිරිය බුදු රජුන්ගේ පාත්‍රයට කැවුම් පිළිගැන්වූවාය. බුදු රජහු තමාට යැපීමට ප්‍රමානවත් සේ කැවුම් පිළිගත්හ. පන්සියයක් භික්ෂූහු ද එසේ ම තම තමන්ට ප්‍රමාණවත්

සේ පිළිගත්හ. සිටු, කිරි, ගිතෙල්, මී හකුරු ආදිය පිළිගන්වමින් ගියේය. බුදු රජහු පන්සියයක් භික්ෂූන් සමග බත් කිස නිමවූහ. මහා සිටු ද බිරිය සමග කැමැතිතාක් කැවුම් අනුභව කළේය. කැවුම්වල නිමාවක් නො පෙනේ. විහාරයේ සියලු භික්ෂූන්ට ද යාචකාදීන්ට ද දුන් කල්හි ද නිමාවක් නො පෙනේ. ස්වාමීනි, කැවුම් නිමාවක් නැතැ යි බුදු රජුන්ට සැලකළහ. එසේ නම් ජේතවන විහාර දොරටුව අබියස දමනු. ඉක්බිති, ඔවුහු දොරටුව අබියස බැවුම් ස්ථානයෙහි දැමූහ. අද ද ඒ ස්ථානය තැටි කැවුම් බෑවුම නමින් හැඳින්වනු ලැබේ. මහසිටු බිරිය සමග බුදුන් වෙත එළැඹ එකත් පසක සිටියේය. බුදු රජහු අනුමෝදනා කළහ. අනුමෝදනා කෙළවර දෙදෙනා ම සෝවාන් ඵලයෙහි පිහිටියහ. අනතුරු ව බුදුන් වැඳ දොරටුව අසල දී හිණිමඟට නැඟ තමාගේ ප්‍රාසාදයට ම පැමිණියහ.

එතැන් පටන් මහසිටු අසූ කළක් ධනය බුදු සසුනෙහි විසුරුවේය. දෙවැනි දවස්හි බුදු රජුන් සැවැත් නුවර පිඬු පිණිස හැසිර භික්ෂූන්ට සුගතෝවාදය දී ගඳ කිළියට පිවිස විවේකීව වැඩ සිට සවස් භාගයෙහි දම් සබාවෙහි රැස්වූ භික්ෂූහු ඇවැත්නි, බලනු මැනවි. මහා මුගලන් තෙරණුවන්ගේ සෘද්ධි ආනුභාවය බලනු මැනවි. මසුරු සිටාණන් සුළු කාලයක දී දමනය කොට හික්මවා තැටි කවුම් ඔහු ලවා ම ගෙන්වා දෙව්රම් වෙහෙරට ගෙනවුත් බුදු රජුන්ට හඳුන්වා දී සෝවාන් ඵලයෙහි පිහිටවූහ. අනේ! මුගලන් තෙරුන්ගේ බල මහිමයැ යි තෙරුන්ගේ ගුණ කථා කරමින් සිටියාහ. බුදු රජුන් එතැනට වැඩමවා මහණෙනි, දැන් කවර කථාවකින් යුතු හුන්නාහුදැ යි විචාරා, මෙනම් කථාවකින්යැ යි කී කල්හි මහණෙනි, කුලයන් පහදවන්නා වූ භික්ෂුව විසින් කුලය නො වෙහෙසා පීඩා නො කොට මලකින් රොන් ගන්නා වූ බඹරකු මෙන් කුලයන් වෙත එළැඹ බුදු ගුණ අවබෝධ කැරවිය යුතු යි වදාරා තෙරණුවන් පසසමින්,

**"යථාපි භමරො පුප්ඵං වණ්ණගන්ධං අහෙඨයං,**
**පලෙති රසමාදාය එවං ගාමෙ මුනී චරෙ"**

**"යම් සේ බඹරෙක් මලෙහි පැහැය හා සුවඳ නො නසා**
**මල් පැණි ගෙන ඉගිලේ ද ? එමෙන් බුදු සව් තෙම**
**කුලයෙහි හැසිරෙන්නේය."**

ධම්ම පදයෙහි මේ ගාථාව වදාරා තව දුරටත් තෙරුන්ගේ ගුණ පවසමින් මහණෙනි, මොග්ගල්ලාන විසින් මසුරු සිටු දමනය කරනු ලැබුවේ දැන් පමණක් නොව, පෙර ද ඔහු දමනය කොට කම් ඵල දැනවූයේයැ යි වදාරා අතීත කථාව ගෙන හැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කරන සමයෙහි ඉල්ලීස නම් සිටු කෙනෙක් වූහ. අසූ කෙළක් ධනයට හිමි වූ ඔහු පුරුෂ දෝෂයන්ගෙන් යුක්ත වූයේය. කොරය, වපරය, ඇස් මඬල සමව නො පිහිටියේය. සැදැහැ නැත්තේය. අප්‍රසන්නය, මසුරුය, අනිකකුට කිසිවක් නො දෙයි. තමා ද පරිභෝග නො කරයි. ඔහුගේ ගෘහය රකුසන් අරක් ගත් පොකුණක් මෙන් විය. ඔහුගේ මව්පියෝ වනාහි සත් මුතු පරම්පරාව දක්වා දායකයෝය. මහා දන් පවත්වන්නෝය. හෙතෙම සිටු තනතුර ලැබ ම කුලසිරිත් වනසා දන් හල් ගිනි තබා යාචකයන් තලාපෙළා බැහැර කොට ධනය ම රැස් කළේය. දිනක් හෙතෙම රාජ්‍යය සේවයට ගොස් තමාගේ ගෙදරට එන්නේ, අතර මඟ ක්ලාන්ත වූ ජනපද වැසියෙක් සුරා සැළියක් ගෙන පුටුවක හිඳ පැසුණු සුරා සරළුවක් පුරවා කුණුමස් කටගැස්මක් සමග බොනු දැක තමා ද සුරා බොනු කැමැත්තේ වී මෙසේ සිතීය.

ඉදින් මම සුරා බොන්නේ නම් බොහෝ දෙනා බොනු කැමැත්තෝ වන්නාහුය. එවිට මගේ ධනය ක්ෂයවීමට යන්නේය. හෙතෙම ආසාව ඉවසමින් සිටිය ද, කල් යත්යත් ම ඉවසීමට නො හැකි ව පෙළන ලද පුළුන් රොදක් මෙන් පඬුවන් සිරුර ඇත්තේ විය. නහරවලින් වෙළුණු ශරීර ඇත්තෙක් වූයෝය. එක් දවසක් ඔහු යහන් ගැබට පිවිස ඇද වැළඳ ගෙන හොත්තේය. ඔහුගේ බිරිය ළඟට අවුත් පිට පිරිමැද ස්වාමීනි, කිම අපහසුවක්දැ යි විචාළාය. සියල්ල යට කියන ලද ආකාරයෙන් ම දත යුතුයි. එසේ වී නම් හුදකළා ඔබට පමණක් ප්‍රමාණවත් වන සේ සුරා කැනන්නෙමි යි කී කල්හි ගෙය තුළ සුරාව පිළියෙල කරන කල්හි බොහෝ දෙනා බලාපොරොත්තු වන බැවින් සුරා සැලකින් සුරා බඳුනක් සේවකයකු ලවා ගෙන්වා ගෙන මෙහි සිට බොන්නට නො හැකිය. මස්සක් පමණ මුදල් දී සුරා සැලකින් සුරා ගොටුවක් ගෙන්වා සේවකයකු මඟින් නගරයෙන් නික්ම ගං තෙරට ගොස් මහ මඟ සමීපයෙහි එක් ලැහැබකට පිවිස සුරා ගොටුව තබවා හේ යවයි. සේවකයා ඇතින්

හිඳුවා සරළුවක් පුරවා සුරා බොන්නට පටන් ගත්තේය.

ඔහුගේ පියා වනාහි දානාදී පිං කළ බැවින් දෙව්ලොව ශක්‍රයා වී උපන්නේය. ඔහු එකෙණෙහි මගේ දන් වැට පවත්නේ ද, නො පවත්නේද යි සලකා බලන්නේ, එය නො පවතිනා බවත් ඔහුගේ පුත්‍රයා කුලසිරිත් නසා දන් හල ගිනිතබා යාචකයන් බැහැර කොට මසුරු බවෙහි පිහිටා අනිකකුට දිය යුතු වන්නේයැ යි බයින් ලැහැබකට පිවිස එකලා ව සුරා බොන බව දැක මම යමි. ඔහු කැඳවා දමනය කොට කම් ඵල සබඳතා අවබෝධ කොට දන් දෙවා දෙව්ලොව ඉපදීමට සුදුස්සකු කරමි යි මිනිස් පියසට බැස ඉල්ලීස සිටු හා කිසි ම වෙනසක් නැති කොර වූ, වපර වූ සමව නො පිහිටි ඇස් මඬල ඇති ශරීරයක් මවා රජගහ නුවරට පිවිස රජ නිවස දොරටුවෙහි සිට තමා ආ බව දන්වා පිවිසෙන්නයැ යි කී කල්හි, පිවිස රජු වැඳ සිටියේය.

රජ, මහා සිටුතුමනි, කුමක් නිසා අවේලාවෙහි පැමිණියේද යි ඇසුවේය. දේවයිනි, මම ආවේ වෙමි. මගේ ගෘහයෙහි අසූ කෙළක් පමණ ධනය ඇත්තේය. ඔබතුමා ඒ ධනය ගෙන්වා තමාගේ භාණ්ඩාගාරය පුරවනු මැනවි. මහා සිටුවරය, මට එයින් වැඩක් නැත. ඔබගේ ධනයට වඩා මගේ ගෘහයෙහි බොහෝ ධනය ඇත්තේය. දේවයිනි, ඔබතුමාට මේ ධනයෙන් වැඩක් නැති නම් මම කැමැති පරිදි ඒ ධනය ගෙන දන් දෙමි. මහසිටුවරය, දන් දෙව. හෙතෙම දේවයිනි, මැනවැ යි රජුන් වැඳ නික්ම ඉල්ලීස සිටුහුගේ ගෙට ගියේය. සියලු සේවක ජනයෝ ඔහු පිරිවරා ගත්හ. කිසිවකු මේ ඉල්ලීස සිටු නො වේයැ යි දැනීමට සමතකු නො වීය. හෙතෙම ගෙට පිවිස එළිපත්තෙන් ඇතුළත සිට දොරටුපාලයා කැඳවා මා සමාන රුව ඇති අනිකෙක් අවුත් මේ මගේ ගෙයයැ යි පිවිසීමට එයි ද ඔහු පිටට පහර දී බැහැර කරවු යි කියා පහයට නැඟ මාහැඟි ආසනයේ හිඳ බිරිය කැඳවා සිනා ආකාරයක් දක්වා සොඳුර, දන් දෙමු යි කීවේය. ඔහුගේ ඒ වදනය අසා සිටු බිරිය ද දූ පුත්හු ද දැසි දස් කම්කරුවෝ ද සිටුතුමාට මෙතෙක් කල් දන් දීමට සිතක් පවා නො වීය. අද වනාහි සුරා බී මෘදු සිත් ඇති වී දන් දෙනු කැමැත්තෙක් වූයේයැ යි කීවාහුය.

ඉක්බිති, සිටු බිරිය ස්වාමීනි, කැමැති පරිදි දන් දෙනු මැනවි යි ඔහුට කීවාය. එසේ වී නම් බෙර වාදකයකු ගෙන්වා රන්, රිදී, මුතු, මැණික් ආදිය කැමැත්තෝ ඉල්ලීස සිටුහුගේ ගෙදර යත්වා යි මුළු නගරයෙහි බෙර හසුරුවනු. ඕ එසේ කළාය. මහජනයා පැසි, මලු, පසිම්බු ආදිය ගෙන දොරටුවෙහි රැස්විය. ශක්‍රයා සත් රුවන් පිරවූ ගබඩා අරවා මේවා ඔබලාට දෙමි. කැමැතිතාක් රැගෙන යනු යි කීවේය. මහජනයා ගබඩාවලින් ධනය බැහැරකොට මිදුලෙහි ගොඩ ගසා ගෙන ආ භාජන පුරවා ගෙන යයි.

එක්තරා ජනපද වැසි මිනිසෙක් ඉල්ලීස සිටාණන්ගේ ගොනුන් ඔහුගේ ම රථයෙහි යොදා සත් රුවනින් පුරවා නුවරින් නික්මී මහමඟට පිවිස ඔහු සිටි ලැහැබ අසලින් රථය පදවමින් ස්වාමීනි, ඉල්ලීසි සිටුතුමනි, අවුරුදු සියයක් ජීවත් වනු මැනවි. ඔබ නිසා දූන් මට දිවි ඇති තෙක් කර්මාන්ත නොකට ජීවත් වීමට මඟක් උපන්නේය. ඔබේ ම රථය, ඔබේ ම ගොන්නු, ඔබේ ම ගෙයි සත්රුවන්, මව් විසින් දෙන ලද්දක් නො වේ. පියා විසින් දෙන ලද්දක් ද නො වේ. ඔබ නිසා ම ලබන ලද්දෙමි යි සිටුතුමාගේ ගුණ කථාව කියමින් යයි. හෙතෙම ඒ ශබ්දය අසා බියෙන් තැතිගෙන සිතුවේය. මේ තෙම මගේ නම ගෙන මේ මේ දේ කියයි. කිම, රජතුමා විසින් මගේ ධනය ලෝකයාට දෙන ලද්දේ ද ? ලැහැබින් නික්මී ගොනුන් ද රථය ද හැඳින ගෙන එම්බා සේවකය, මගේ ගොන්නු, මගේ රථයැ යි කියා ගොස් ගොනුන් නාසි ලණුවෙන් අල්ලා ගත්තේය. ගෘහපතියා රථයෙන් බැස එම්බා දුෂ්ට සේවකය, ඉල්ලීස මහ සිටු මුළු නගරය ම දන් දෙයි. ඔබ කවරෙක්ද යි පැන කඳට පහර දී රථය ගෙන ගියේය.

හෙතෙම නැවත වෙවුලමින් නැඟිට පස් පිස දමා වේගයෙන් ගොස් රථය අල්ලා ගත්තේය. ගෘහපතියා බැස කෙස්වලින් අල්ලා ගෙන නවා වැලමිටි පහරින් ඇන තලා බෙල්ලෙන් අල්ලා ගෙන ආ මඟට අභිමුඛ ව දමා ගියේය. එපමණකින් ඔහුගේ සුරා මදය සිඳී ගියේය.

ඔහු වෙවුලමින් වේගයෙන් ගෙදර දොරටුව ළඟට ගොස් ධනය රැගෙන යන්නවුන් ගෙන් එම්බල, මේ කුමක් ද ? රජු මගේ ධනය

පැහැර ගන්වතැ යි, ගොස් ඒ ඒ අය අල්වා ගනිමු යි ගත් ගත් අයට පහර දී පා මුලෙහි ම හෙළත්. හෙතෙම වේදනාවෙන් පීඩිත වූයේ ගෙට පිවිසීමට පටන් ගත්තේය. දොරටු පාලයෝ එම්බල දුෂ්ට ගෘහපතිය, කොහි ඇතුළු වන්නෙහිද්ද යි හුණ පතුරුවලින් තලා බෙල්ලෙන් ගෙන බැහැර කළහ.

සිටු, මට දැන් රජු හැර වෙන පිළිසරණක් නැතැ යි රජු වෙත ගොස්, දේවයිනි, මගේ ගෙය ඔබතුමා පැහැර ගන්නහු ද ? සිටුවරය, මම පැහැර ගන්නෙම් නො වෙමි. ඔබ ම මා වෙත අවුත් ඉදින්, ඔබ නො ගන්නහු නම් මම ධනය දන් දෙමි යි නගරයෙහි බෙර හසුරුවා දන් දුන්නේ නො වේ ද ? දේවයිනි, මම ඔබ වෙත නො ආමි. කිම, ඔබතුමා මගේ මසුරු බව නො දන්නහු ද ? මම තණඟින් තෙල් බිංදුවක් පමණකුදු කිසිවකුට නො දෙමි. යමෙක් දන් දෙයි ද, ඔහු මෙතනට කැඳවා විමසනු මැනවි.

රජතුමා ශක්‍රයා කැඳවීය. දෙදෙනාගේ වෙනස රජ නො දනී. ඇමැතියෝ ද නො දකිති. මසුරු සිටු දේවයිනි, කිමෙක් ද ? මේ සිටුවරයා මම සිටු වෙමි යි කීය. අපි නො හඳුනමු. කිසියම් හඳුනන කෙනෙක් ඔබට ඇත්තේ ද ? ස්වාමීනි, මගේ භාර්යාව සිටින්නීය. එවිට රජු භාර්යාව කැඳවා තිගේ ස්වාමියා කවරෙක්ද්ද යි ඇසීය. ඕ තොමෝ මේ මගේ හිමියායැ යි ශක්‍රයාගේ සමීපයෙහි ම සිටියාය. දූ දරුවන් ද දැසි දස් කම්කරු ආදීන් ද එතැනට කැඳවා ඔවුන්ගෙන් ද විචාළේය. ඒ සියල්ලෝ ම ශක්‍රයාගේ සමීපයෙහි ම සිටිති.

නැවත සිටුවරයා මෙසේ සිතීය. මගේ හිසෙහි පිලිකාවක් ඇත. එය කෙස්වලින් වැසී තිබේ. එය දන්නේ කපුවා පමණය. ඔහු කැඳවමි යි දේවයිනි, කපුවා මා හඳුනයි. ඔහු කැඳවනු මැනවැ යි කීය. ඒ කාලයෙහි බෝසත්හු ඔහුගේ කපුවා වෙයි. රජ ඔහු කැඳවා ඉල්ලීස සිටුවරයා දන්නෙහිද්ද යි විචාළේය. දේවයිනි, හිස බලා හැඳින ගනිමි. එසේ නම් දෙදෙනාගේ ම හිස් බලව. එකෙණෙහි ශක්‍රයා හිසෙහි පිළිකාවක් මැවීය. බෝසත්හු දෙදෙනාගේ ම හිස් බලා පිළිකා දැක මහරජ, දෙදෙනාගේ ම හිසෙහි පිළිකා ඇත. එම නිසා එක් අයකුගේවත් ඉල්ලීස සිටු බව දැන ගන්නට නො හැක්කෙමියි කියා මේ ගාථාව කීහ.

"උභො ඛඤ්ජා උභො කුණී උභො විසමචක්ඛුලා,
උභින්නං පිළකා ජාතා නාහං පස්සාමි ඉලිස්සන්ති"

"දෙදෙනා ම පිළුය. දෙදෙනා ම කොරුය. දෙදෙනා ම වපරය. දෙදෙනාගේ ම හිස පිළිකාවෝ ඇතියහ. මම ඉල්ලීස නො දකිමි."

එහි, "උභොපි", දෙදෙනා ම, "ඛඤ්ජාති", කොර වූ පා ඇත්තෝ, "කුණී", කොරය. "විසමචක්ඛුලා", සම ව නො පිහිටි ඇස් ගුලි ඇත්තෝ, වපර ඇස් ඇත්තෝය "පිළකා ජාතා", දෙදෙනාගේ ම එක ම හිස් ප්‍රදේශයක එක ම ආකාර වූ පිළිකා හට ගත්තේය. "නාහං පස්සාමි", මම මොවුනතුරෙන් මොහු ඉල්ලීසයැ යි නො දකිමි. එක් අයකුගේවත් ඉල්ලීස සිටු බව නො දිනිමි යි කීවේය.

බෝසතාණන් වහන්සේගේ වචනය අසා සිටු කම්පා වෙමින් ධන ශෝකයෙන් සිහිය එළවා ගැනීමට නො හැකි වන්නේ එහි ම වැටුණේය. ඒ අවස්ථාවෙහි ශක්‍රයා මහරජ, මම ඉල්ලීස නො වෙමි. මම ශක්‍රයා වෙමි යි මහත් ශක්‍ර ලීලාවෙන් අහසෙහි සිටියේය. ඉල්ලීසගේ මුහුණ පිනිදිය ඉස්සේය. ඔහු නැඟිට සක් දෙවිඳුන් වැඳ සිටියේය. ඉක්බිති, ශක්‍රයා ඔහුට මෙසේ කීවේය. ඉල්ලීසය, මේ ධනය මා සතුය. ඔබ සතු නො වේ. මම ඔබගේ පියා වෙමි. ඔබ මගේ පුත්‍රයාය. මම දානාදී පිංකොට ශක්‍ර බවට පැමිණියෙමි. ඔබ මගේ කුල සිරිත් සිඳ නො දෙන ස්වභාව ඇත්තෙක් ව මසුරු බවෙහි පිහිටා දන් හල දවා යාචකයන් පිටමං කොට ධනය ම තර කළෙහිය. ඒ ධනය ඔබ ද පරිභෝග නො කරන්නෙහිය. මෙරමා හට ද නො දෙන්නෙහිය. රකුසන් අරක් ගත්තාක් මෙන් පවතී. ඉදින්, ඔබ මගේ දාන ශාලා යථා තත්ත්වයට පමුණුවා දන් දෙන්නෙහි නම් ඒ ඉතා මැනවි. ඉදින් නො දෙන්නෙහි නම් ඒ සියලු ධනය අතුරුදන් කොට මේ වජිරායුධයෙන් හිස සිඳ මරණයට පත් කරන්නෙමි යි කීවේය.

ඉල්ලීස සිටු මරණ බයෙන් බිය පත් ව මෙතැන් පටන් දන් දෙමි යි ප්‍රතිඥා දුන්නේය. ශක්‍රයා ඔහුගෙන් ප්‍රතිඥාගෙන අහසෙහි සිට ම දම් දෙසා ඔහු ශීලයෙහි පිහිටුවා ස්වකීය ස්ථානයට ම

ගියේය. ඉල්ලීස සිටු ද දානාදී පිංකම් කොට ස්වර්ගය පිහිට කොට ඇත්තකු විය.

බුදු රජනු මහණෙනි, මුගලන් මසුරු සිටාණන් දමනය කැරනුයේ දැන් පමණක් නොව, මෙතෙම මුගලන් විසින් පෙර ද දමනය කරන ලද්දේ මයැ යි වදාරා මේ ධර්ම දේශනාව ගෙන හැර දක්වා අනුසන්‍ධි ගළපා ජාතකය නිමවූහ. එකල්හි ඉල්ලීස සිටු මෙකල්හි කෝසිය මසුරු සිටු විය. සක් දෙව් රජ මහා මුගලන් විය. රජ ආනන්දය. කපුවා නම් මම වීමි.

## 1. 8. 9.

## බරස්සර ජාතකය

**"යතො විලුත්තා ච හතා ච ගාවොති"** යන යන මේ දේශනාව බුදු රජනු දේ ාවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, එක්තරා ඇමැතියෙකු අරබයා වදාළහ. කොසොල් රජුගේ වනාහි එක් ඇමැතියෙක් රජතුමාගේ හිත් දිනාගෙන පසල් ගමක අයබදු ලැබ සොරුන් සමග එක් වී මම මිනිසුන් රැගෙන කැලයට පිවිසෙන්නෙමි. තෙපි ගම් පැහැර ගෙන ඉන් බාගයක් මට දෙන්නේ නම් මැනවැ යි කියා කල් ඇති ව මිනිසුන් රැස් කැරවා වනයට ගොස් සොරුන් අවුත් ගවයන් මරා මස් කා ගම් පැහැර ගෙන ගිය කල්හි සවස් කාලයෙහි මහජනයා විසින් පිරිවරන ලද්දේ එයි. ඔහුගේ ඒ ක්‍රියාව නොබෝ දිනකින් ප්‍රකට විය. මිනිස්සු රජුට සැලකළාහුය. රජතුමා ද ඔහු කැඳවා දොස් පමුණුවා තදින් නිග්‍රහ කොට වෙනත් ගම්මුලාදෑනියකු යවා, දෙව්රමට ගොස් භාග්‍යවතුන් වහන්සේට ඒ කරුණ සැලකළේය. බුදු රජනු, මහරජ, මෙතෙම මෙබඳු ස්වභාව ඇත්තේ දැන් පමණක් නොව, පෙරත් මෙබඳු ස්වභාව ඇත්තේයැ යි වදාරා ඔහු විසින් අයැදින ලද්දේ අතීතය ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කැරද්දී රජතුමා එක්

ඇමැතියකු හට පසල් ගමක් දුන්නේය. සියල්ල පෙර පරිදි ම විය. එකල්හි වනාහි බෝසත්හු වෙළඳාම් පිණිස පසල් ගමෙහි හැසිරෙන්නේ, එහි කුඩා ගමක නවාතැන් ගත්තේය. හෙතෙමේ ඒ ගම්මුලාදෑනියා සවස් කාලයෙහි මහජනයා පිරිවරා බෙර හසුරුවමින් එන කල්හි මේ දුෂ්ඨ ගම්මුලාදෑනියා සොරුන් හා එක්ව ගම පහරවා සොරුන් පලා ගොස් කැලයට පිවිසි කල්හි දැන් උපශාන්තයකු මෙන් බෙර වයමින් එන්නේයැ යි මේ ගාථාව කීවේය.

**"යතො විලුත්තා ච හතා ච ගාවො**
**දඩ්ඪානි ගෙහානි ජනො ච නීතො,**
**අථාගමා පුත්තහතාය පුත්තො**
**ඛරස්සරං දෙණ්ඩිමං වාදයන්තොති"**

"යම් කලෙක්හි ගවයෝ පැහැර ගන්නා ලද්දාහු ද (මස් පිණිස) නසනු ලද්දාහු ද ගෘහයෝ දවන ලද්දාහු ද ජනයෝ ද බැඳ ගෙන යන ලද්දාහු ද එකල්හි නැසුණු දරුවන් ඇති මවගේ නිර්ලජ්ජ වූ පුත්‍රයා, අමධුර වූ ශබ්ද ඇති, පටහ බෙරය වාදනය කැරෙමින් ආවේය."

එහි, "**යතො**" යනු යම් කලෙක, "**විලුත්තා ච හාතා චාති**", පැහැරගෙන එන ලද, මස් කෑම පිණිස නසන ලද, "**ගාවොති**", ගවයන්, "**දඩ්ඪානිති**", ගිනි දල්වා දවන ලද, "**ජනො ච නීතොති**", බලහත්කාරයෙන් ගෙන යන ලද්දේ, "**පුත්තහතාය පුත්තොති**", නසන ලද පුත්‍රයන් ඇත්තියගේ පුතා, ලජ්ජා නැති යන අර්ථයි. විලිබිය නැත්තහුට මවක නැත. එම නිසා ඔහු මව ජීවත් ව සිටිය ද නැසුණු පුත්‍රයන් ඇත්තීයැ යි කියන ලදී. එම නිසා මොහු නැසුණු පුත්‍රයන් ඇත්තියගේ පුතා නම් වේ. "**ඛරස්සරං**", යනු නො මිහිරි ශබ්දයයි. "**දෙණ්ඩිමං**", යනු පටහ නම් බෙර විශේෂයකි.

මෙසේ බෝසත්හු මේ ගාථාවෙන් ඔහුට උපහාස කළහ. ටික දිනකින් ම ඔහුගේ ඒ ක්‍රියාව ප්‍රකට විය. ඉක්බිති, රජු ඔහුගේ වරදට සමාන වූ දඬුවම් කළේය. බුදු රජහු, මහරජ, මොහු මෙබඳු ස්වභාව ඇත්තකු වනුයේ දැන් පමණක් නොව පෙර ද එසේ ම වීයැ යි වදාරා

මේ දම් දෙසුම ගෙන හැර දක්වා අනුසන්ධි ගළපා ජාතකය නිමා කළහ. එදා ඇමැතියා නම් දැන් ඇමැතියා මය. ගාථාව ගෙනහැර දැක්වූ නුවණ ඇති පුරුෂයා නම් මම ම වීමි.

## 1. 8. 10.

## භීමසේන ජාතකය

"යං තෙ පවිකත්ථිතං පුරෙති" යන මේ ජාතක දේශනාව බුදුහු ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, එක්තරා ආත්ම වර්ණනාවකට ගිජු භික්ෂුවක් අරබයා වදාළහ. එක් භික්ෂුවක් ඇවැත්නි, අපගේ ජාතියට සමාන ජාතියකුත් ගෝත්‍රයට සමාන ගෝත්‍රයකුත් නැත. අපි මෙබඳු වූ මහතැන් කුලයෙහි උපන්නෝ වෙමු. ගෝත්‍රයෙන් හෝ කුල තත්ත්වයෙන් අප හා සම වූවකු නැත. අපට රන් රිදී ආදියෙහි කෙළවරක් නැත. අපගේ දැසි දස් කම්කරුවෝ ද ඇල් හාලේ බත් අනුභව කරත්. කසී සළු අඳිත්. කසී රටෙහි වූ සුවඳ විලවුන් ගල්වත්. අපි දැන් පැවිදි වූ බැවින් මෙබඳු රළු බොජුන් වළඳමු. රළු සිවුරු දරමු යි තෙරුන් හා නවක, මධ්‍යම භික්ෂූන් අතර තමා ගුණ කියමින් මෙරමා ජාති ආදියෙන් අවමන් කැරෙමින් මුලා කැරෙමින් හැසිරෙයි.

ඉක්බිති, එක් භික්ෂුවක් ඔහුගේ කුලය පිළිබඳ තොරතුරු පරීක්ෂා කොට ඔහුගේ ආත්ම වර්ණනයක් බව ප්‍රකාශ කෙළේය. භික්ෂූහු දම් සබාවෙහි රැස්ව අවැත්නි, අසවල් භික්ෂුව මෙබඳු නිර්වාණ ගාමී සසුනෙහි පැවිදි ව තමා ගුණ ගයමින් මෙරරා ගරහමින් වංචා කැරෙමින් හැසිරෙතැ යි ඔහුගේ අගුණ කියමින් සිටියහ. බුදු රජහු වැඩමවා මහණෙනි, කවර නම් කථාවකින් මෙහි හුන්නාහුද යි විචාරා මෙනම් කථාවකින් හුන්නාහුයැ යි කී කල්හි, මහණෙනි, මේ භික්ෂුව දැන් පමණක් තමා ගුණ ගයමින් මෙරමා ගරහමින් වංචා කැරෙමින් හැසිරෙන්නේ නො වෙයි. පෙරත් එසේ ම හැසිරෙන්නේ යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

යටගිය දවස බරණැස් නුවර බඹදත් රජු රජ කරද්දී බෝසත්හු එක්තරා නියම් ගමෙක උසස් බමුණු කුලයෙහි ඉපදී වැඩිවියට පත්වූයේ තක්සලා නුවර දිසාපාමොක් ඇදුරුතුමාගේ සමීපයෙහි ත්‍රිවේදය ද අටළොස් විද්‍යාවන් ද සියලු ශිල්පයන්හි නිමාවට පත්ව චුල්ල ධනුග්ගහ පණ්ඩිත නම් විය. ඔහු තක්සලාවෙන් නික්ම සියලු ශිල්ප ශාස්ත්‍රයන් සොයමින් මහිංසක රටට ගියේය. මේ ජාතකයෙහි බෝසත්හු මදක් මිටි නැමුණු සිරුරු ඇත්තෙක් වූහ. ඔහු මෙසේ සිතීය. ඉදින් මම කිසියම් රජකු වෙත යන්නෙම් නම් ඒ රජු මෙබඳු මිටි ශරීර ඇති ඔබ අපට කිනම් සේවයක් කරන්නෙහිදැ යි කියන්නේ, මම උස මහතින් යුත් දැකුම්කළු එක් පුරුෂයෙකි. පළිහක් කොට ඔහුගේ පිටිපස සිට ජීවිකාව කරන්නේ නම් මැනවි.

හෙතෙම එවැනි පුරුෂයකු සොයමින් භීමසේන නම් එක් නූල් කටින්නකුගේ නූල් වියන තැනට ගොස් ඔහු සමග පිළිසඳර කොට යහළුව, ඔබගේ නම කුමක්දැ යි විචාළේය. මම භීමසේන නම් වෙමි. ඔබ මෙබඳු මනා රූ සපුවකින් යුක්ත වී මෙවැනි ලාමක ක්‍රියා කැරෙමින් ජීවත් වන්නේ මක් නිසා ද ? යහළුව, ජීවත්වීමට මඟක් නැති හෙයිනි. මේ ක්‍රියාව නො කරනු. මේ මුළු දඹදිව මා සමාන දුනුවායෙක් නැත්තේය. ඉදින්, මම යම්කිසි රජකු බැහැ දකින්නේ නම් ඔහු මට මෙසේ කියන්නේය. මෙවැනි මිටි අයකු අපට කවර නම් සේවයක් කරන්නේදැ යි අසන්නේය. එවිට ධනුර්ධර කියන්නේ ඔබ රජුන් බැහැ දැක තමා ධනුර්ධරයකු යි කියව. රජ ඔබට ජීවන වියදම් දී නිබඳ රැකියාවක් දෙන්නේය. මම ඔබට පැවරුණු කාරිය කැරෙමින් ඔබ පිටිපසෙහි සිට ජීවිකාව කරමි. එවිට අපි දෙදෙනා ම සැපවත් වන්නෙමු. ඔහු මගේ වචනය මැනවැ යි පිළිගත්තේය.

ඉක්බිති, ධනුර්ධර ඔහු සමග බරණැසට ගොස් තෙමේ ධනුර්ධරගේ සේවකයා වශයෙන් සිට ඔහු පෙරටු කොට රජ දොරටුවෙහි සිට රජුට දැන්වූයේය. එත්වා යි කී කල්හි දෙදෙනා ම පිවිස රජුන් වැඳ සිටියහ. කුමක් නිසා පැමිණියාහුදැ යි ඇසූ කල්හි භීමසේන මෙසේ කීය. මම දුනුවායෙක් වෙමි. මුළු දඹදිව ම මා හා සමාන වෙනත් දුනුවායෙක් නැත. එවිට රජ කොපමණ ලබන්නේ නම් මට සේවය කරන්නෙහිද ? දේවයිනි, අඩ මසකට දහසක් ලබන්නේ නම් සේවය කරමි. රජ එවිට මේ ඔහුගේ අනිත් පුරුෂයා කවරෙක් ද ? දේවයිනි, ඔහු මගේ සේවකයාය. එසේ නම් මැනවි.

සේවය කරව. එතැන් පටන් භීමසේන රජුට සේවය කරයි. පැමිණෙන කාර්යය බෝසත්හු ම නිමවයි.

එසමයෙහි කසී රට වනයක බොහෝ මිනිසුන් යන එන මාර්ගය ව්‍යාඝ්‍රයෙක් අහුරා ගෙන සිටියේය. ඒ ව්‍යාඝ්‍රයා බොහෝ මිනිසුන් අල්ලාගෙන කයි. එපුවත රජුට සැලකළහ. රජ භීමසේන කැඳවා දරුව, ඒ ව්‍යාඝ්‍රයා අල්ලා ගැනීමට හැකිදැ යි ඇසීය. දේවයිනි, ඉදින් ව්‍යාඝ්‍රයෙකු අල්ලා ගැනීමට නො හැකි නම් දුනු දරන්නම් ද? රජ ඔහුට වියදම් දී පිටත් කෙළේය. ඔහු ගෙට ගොස් බෝසතුන්ට කාරණය කීවේය. බෝසත්හු යහළුව, මැනවි. යව යි කීවේය. ඔබ නො යන්නේ ද? එසේය. මම නො යමි. ඔබට ව්‍යාඝ්‍රයා අල්ලා ගන්නා උපායක් කියමි. එසේ නම් යහළුව, කියනු මැනවි. යහළුව, ඔබ ව්‍යාඝ්‍රයා වසන තැනට තනිය ම වහා නො යනු. දනව් වැසි මිනිසුන් රැස් කැරවා දුනු එක් දහසක් හෝ දෙදහසක් ගෙන්වා ඔවුන් සමග එහි ගොස් ව්‍යාඝ්‍රයා හැසිරෙන බව දැන පලා ගොස් එක් ලැහැබකට පිවිස යටිකුරු ව වැතිරෙව්. එවිට දනව් වැසියෝ ම ව්‍යාඝ්‍රයා තලා පෙළා අල්ලා ගන්නේය. ඔවුන් ව්‍යාඝ්‍රයා අල්ලා ගත් කල්හි ඔබ දත්වලින් එක් වැලක් සිඳ කෙළවර ගෙන මළ ව්‍යාඝ්‍රයා ළගට ගොස් පින්වත්නි, මේ ව්‍යාඝ්‍රයා කවුරුන් විසින් මරණ ලද්දේ ද ? මම මේ ව්‍යාඝ්‍රයා ගොනකු මෙන් වැලෙන් බැඳ රජු සමීපයට ගෙන යන්නෙමි. වැලක් කැඩීම සඳහා ලැහැබට පිවිසියෙමි. මා වැල ගෙන ඒමට පෙර ම, මොහු කවරකු විසින් මරණ ලද්දේදැ යි කියමු. ඉක්බිති, ඒ දනව් වැසියෝ බියෙන් තැතිගෙන ස්වාමීනි, රජුට නො කියනු මැනවි. බොහෝ ධනය දෙන්නෝය. ව්‍යාඝ්‍රයා ඔබ විසින් අල්ලා ගන්නා ලද්දේයැ යි රජු සමීපයෙන් ද බොහෝ ධනය ලබන්නෙහිය. භීමසේන ද මැනවැ යි පිළිගෙන බෝසතුන් විසින් කියන ලද ක්‍රමයෙන් ම ව්‍යාඝ්‍රයා ගෙන වන මාර්ගය නිර්ණය කොට මහජනයා විසින් පිරිවරන ලදුව බරණැසට අවුත් රජු බැහැදැක දේවයිනි, මවිසින් ව්‍යාඝ්‍රයා අල්ලා ගන්නා ලද්දේය. වන මඟ බිය රහිත කළෙමි. රජ සතුටු ව බොහෝ ධන දුන්නේය.

නැවත එක් දිනක් එක් මඟක් මීමකු විසින් අත්හරවන ලදැ යි රජුට සැලකළහ. රජ පෙර මෙන් ම භීමසේන යැවීය. ඔහු ද බෝසතුන් විසින් දෙන ලද උපදෙස් අනුව ව්‍යාඝ්‍රයා මෙන් මීමා ද අල්වා ගෙන ආවේය. රජ නැවත ද ඔහුම බොහෝ ධනය දුන්නේය.

මෙසේ භීමසේන ධනයෙන් ආඪ්‍යය විය. ධන මදයෙන් මත් වූ ඔහු බෝසතුන්ට අවඥා කොට ඔවුන්ගේ වචනය නො පිළිගනී. මම ඔබ නිසා ජීවත් නො වෙමි. පුරුෂයා ඔබ පමණක් ද ? ආදී රළු වචන කියයි.

ඉක්බිති, කීප දවසක් ඇවෑමෙන් එක් සතුරු රජකු අවුත් බරණැස් නුවර වටකොට රාජ්‍යය හෝ දෙනු. යුද්ධය හෝ කරනු යි රජුට හසුනක් යැවීය. රජ යුද්ධ කැරව යි භීමසේන යැවීය. ඔහු සිය යුද ඇඳුමෙන් සැරසී යුද භටයෙකු සේ වෙස් ගෙන මනාව සරසන ලද ඇතුගේ පිටෙහි හිඳ ගත්තේය. බෝසත්හු ද ඔහු මිය යතැ යි යන බයෙන් සියලු යුද ඇඳුමෙන් සැරසී භීමසේනගේ පසු අසුනෙහි හුන්නේය. ඇතු මහජනයා පිරිවරණ ලදුව නුවර දොරින් නික්ම යුද බිමට පැමිණියේය. යුද බෙර හඬ අසා ම භීමසේන සැලෙන්නට විය. බෝසත්හු දැන්ම ම මොහු ඇතු පිටින් වැටී මිය යතැ යි නො වැටීම සඳහා භීමසේන යොතකින් බැඳ ගත්තේය. භීමසේන යුද කෙරෙන තැන දැක මරණ බයෙන් බිය පත් ව තමාගේ මළයෙන් ඇතු පිට දූෂණය කළේය. ඉක්බිති, බෝසත්හු භීමසේන අමතා ඔබගේ පෙර වදන් හා පසු වදන් සම නො වේ. ඔබ පෙර යුද්ධ දක්‍ෂයකු මෙන් වූයේය. දැන් ඇත් පිට මළයෙන් දූෂිත කරන්නෙහි යි කියා මේ ගාථාව කීහ.

"යං තෙ පවිකත්ථිතං පුරෙ
අථ තෙ පූතිසරා සජන්ති පච්ඡා,
උභායං නසමෙති භීමසෙනා
යුද්ධකථා ච ඉදඤ්ච තෙ විහඤ්ඤදන්ති"

"භීමසේනය, තොප විසින් පෙර සංග්‍රාමයෙහි යමක් කියන ලද ද නැවත පසුව හෙවත් යුද්ධයෙහි දී තාගේ පූතිසර නම් සිරුරුවල වැගිරෙයි. තොපගේ යුද්ධ (පිළිබඳ ඔද වැඩි) කථා ද මේ පීඩාව ද යන දෙකරුණ සම නො වේ."

එහි, "යං තෙ පවිකත්ථිතං පුරෙ", පෙර දී ඔබ විසින් ඔබ

පමණක් ද පුරුෂයා මම යුද්ධ දක්‍ෂයෙක් නො වෙම්ද යි යම් ආත්ම වර්ණනයක්, අවමන් වචනයක් කියන ලද ද, මේ එක් අවස්ථාවකි. **"අථ තෙ පූතිසරා සජන්ති පච්ඡාති"**, මේ අපිරිසිදු ස්වභාවය නිසාත් වැගිරෙන ස්වභාවය නිසාත් පූතිසර නාමය ලැබුවා වූ සිරුරු මළ දහර පිට වෙයි. වැගිරෙයි. **"පච්ඡාති"**, පෙර දී කළ ආත්ම වර්ණනයට පසු කාලයෙහි හෙවත් දූන් මේ යුද බිමෙහි යන අර්ථයි. **"උභයං නසමෙති භීමසෙන!"** භීමසේනය, මේ අවස්ථා දෙක සම නො වේ. ඒ කුමක් ද ? **"යුද්ධකථා ච ඉදඤ්ච තෙ විහඤ්ඤන්ති"**, යම් ඒ පෙර කළ යුද්ධ කථාව ද දූන් ඔබගේ පෙළීම ද ක්ලාන්තය ද ඇත් පිට දූෂණය කිරීම ආදිය ද, පීඩාව යන අර්ථයි.

මෙසේ බෝසත්හු ඔහු බිය ගන්වා යහළුව, මා සිටින කල්හි ඔබ වෙහෙසෙන්නේ කුමටදැ යී භීමසේන ඇතු පිටෙන් බස්සවා ස්නානය කොට ගෙට ම යවයි. පිටත් කොට මම අද ප්‍රකට වන්නට සුදුසුයැ යි යුද බිමට පිවිස මහහඬින් නාදකොට සතුරු රජු පණ පිටින්ගෙන බරණැස් රජු සමීපයට ගියේය. රජ සතුටු ව බෝසතුන්ට මහත් සම්පත් දුන්නේය. එතැන් පටන් චුල්ල ධනුග්ගහ පණ්ඩිත නමින් මුළු දඹදිව ප්‍රකට විය. හෙතෙම භීමසේනට ජීවන වියදම් දී ස්වකීය ස්ථානයට ම යවා දානාදී පිංකම් කොට කම් වූ පරිදි මිය ගියේය.

මහණෙනි, මේ භික්‍ෂුව ආත්ම වර්ණනය කැරනුයේ දූන් පමණක් නොව, පෙරත් ආත්ම වර්ණනය කළේ මයැ යි වදාරා බුදුහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා ජාතකය නිමවූහ. එකල භීමසේන මේ භික්‍ෂුව විය. චුල්ලධනුග්ගහ පණ්ඩිත නම් මම ම වෙමි.

## අට වැනි වරණ වර්ගයයි.

## 1. 9. 1.

## පුරාපාන ජාතකය

"අපායිමහ අනිච්චිමහාති" යන මේ දේශනාව බුදු රජහු කොසඹෑ නුවර ඇසුරු කොට ඝෝෂිතාරාමයේ වැඩ වසන්නේ, සාගත තෙරුන් මුල්කැර ගෙන දේශනා කළහ. බුදු රජහු සැවැත් නුවර වස් වැස චාරිකාවෙහි වඩින අතර භද්දවතික නම් නියම් ගමට පැමිණි කල්හි ගොපල්ලෝ ද පසු පල්ලෝ ද ගොවියෝ ද මඟියෝ ද බුදු රජුන් දැක වැඳ ස්වාමීනි, භගවත්හු අම්බතිත්ථියට නො වඩීත්වා. අම්බතිත්ථයෙහි ජටිලයාගේ අසපුවෙහි අම්බතිත්ථක නම් ඝෝර විෂ ඇති වහා පැතිරෙන විෂ ඇති නාගයෙක් වෙසෙයි. ඔහු බුදු රජුන්ට නපුරක් කැරෙති යන බියෙන් මෙසේ වැළකුහ. බුදු රජහු ඔවුන්ගේ කථාව නො ඇසුනාක් මෙන් ඔවුන් තුන් වරක් වළක්වත්දීත් වැඩියාහුය.

එහි දී බුදු රජහු භද්දවතිකා නියම් ගම අබියස එක්තරා වන ලැහැබක වැඩ වසන කල්හි සාගත තෙරුණුවෝ බුදු රජුන්ට උපස්ථාන කැරෙති. තෙරණුවෝ පුහුදුන් ඉද්ධියෙන් යුක්ත වූවෝය. එසමයෙහි තෙරුණුවෝ ඒ අසපුවට එළැඹ ඒ නා රජු වසන ස්ථානයේ තණ ඇතිරියක් පනවා පළක් බැඳ වැඩ හුන්හ. නාගයා ක්‍රෝධය මැඩ පවත්වාගත නො හැකි ව දුම් පිට කෙළේය. තෙරහු ද දුම්පිට කළාහය. නාගයා ගිනි පිට කෙළේය. තෙරහු ද ගිනි පිට කළහ. නාගයාගේ තෙද තෙරුන්ට බාධා නො කළේය. එහෙත් තෙරුන්ගේ තෙද නාගයාට පීඩාවක් විය. මෙසේ ඒ තෙරණුවෝ සුළු කාලයකින් නා රජු දමනය කොට සරණ සිල්හි පිහිටුවා බුදු රජුන් වෙත ගියහ.

බුදු රජහු ද භද්දවතිකාවෙහි කැමැති පරිදි වාසය කොට කොසඹෑ නුවරට වැඩියහ. සාගත තෙරුන් නාගයා දමනය කළ බව මුළු ජනපදය පුරා පැතිරිණ. කොසඹෑ නුවර වාසීහු බුදු රජුන්ට පසු ගමන් කොට වැඳ සාගත තෙරුන් වෙත එළැඹ එකක් පසක සිටියාහු, මෙසේ කිවාහුය. ස්වාමීනි, යමක් ඔබ වහන්සේලාට දුර්ලභ නම් ඒ කියනු මැනවි. එයට අපි සපයා දෙන්නෙමු. තෙරුණුවෝ නිශ්ශබ්ද වූහ. එහෙත් ඡබ්බග්ගිය භික්ෂූහු මෙසේ කීවාහුය. ඇවැත්නි, පැවිද්දන්ට

කාපෝතිකා නම් සුරාව දුලබ ද වෙයි. මනාප ද වෙයි. ඉදින් ඔබලා තෙරණුවන්ට පැහැදුනාහු නම් කාපොතිකා නම් සුරාව සපයා දෙනු මැනව. ඔවුහු ද මැනවැ යි පිළිගෙන සෙට දවස පිණිස බුදු රජුන්ට ආරාධනා කොට නගරයට පිවිස තම තමන්ගේ ගෙවල තෙරුණුවන්ට දෙනු පිණිස කාපෝතිකා සුරාව යහපත් ලෙස පිළියෙල කොට තෙරුන්ට ආරාධනා කොට ගෙයක් පාසා මිහිරි කාපෝතිකා සුරාව පිළිගැන්වූහ. තෙරහු ද සුරාව පානය කොට මත් වූවාහු, නගරයෙන් නික්මෙන අතර දොරටුව අභියස දී වැටී දොඩවමින් හොත්තාහ.

බුදු රජහු බත් කිස නිමවා නගරයෙන් නික්මෙන්නාහු, ඒ අයුරින් වැතිරී සිටින සාගත තෙරණුවන් දැක මහණෙනි, සාගත ඔසවා ගන්න යි භික්ෂූන් ලවා ඔසවාගෙන ආරාමයට වැඩියහ. භික්ෂූහු තෙරුණුවන්ගේ හිස බුදු රජුන්ගේ පාමුල සිටින සේ කොට වැතිර වූහ. තෙරණුවෝ පාදයන් බුදු රජුන්ට අභිමුඛ වන සේ වැතුරුණාහ. බුදු රජහු භික්ෂූන්ගෙන් විචාළහ. මහණෙනි, කිම, සාගතයන්ට මා කෙරෙහි යම් ගෞරවයක් පෙර පැවතියේ ද දැන් එය තිබේ ද ? ස්වාමීනි, නැත. මහණෙනි, අම්බතිත්ථික නාග රාජයා කවරෙක් දමනය කළේ ද ? ස්වාමීනි, සාගත තෙරණුවෝය. කිම මහණෙනි, දැන් සාගතයන්ට දිය බරියෙකු හෝ දමනය කිරීමට ශක්තියක් තිබේ ද ? ස්වාමීනි, නැත. මහණෙනි, යමක් පානය කොට සිහි විකල් වේ ද, එවැනි දෙයක් පානය කරන්නට සුදුසු ද ? ස්වාමීනි, සුදුසු නැත.

ඉක්බිති බුදුරදහු තෙරණුවන්ට දොස් පවරා භික්ෂූන් අමතා රහමෙර පානය කිරීමේ දී පචිති ඇවැත් වේයැ යි ශික්ෂා පද පනවා හුනස්නෙන් නැගී ගඳකිළියට වැඩියහ. දම් සබාවෙහි රැස්වූ භික්ෂූහු රහමෙර පානය කිරීමෙහි දොස් කියූහ. ඇවැත්නි, මේ රහමෙර පානය නම් මහා දොස් සහිතය. මේ සේ නැණවතා, සෘද්ධිමතා සාගත තෙරණුවන් පවා බුදු රජුන්ගේ ගුණ මාත්‍රයක් හෝ නො දනී ද ? බුදු රජහු දම් සබාවට වඩමවා මහණෙනි, කවර කථාවකින් යුක්ත ව මෙහි හුන්නාහුදැ යි විචාරා මෙනම් කථාවකින්යැ යි කී කල්හි මහණෙනි, පැවිද්දෝ සුරා පානය කොට සිහි විකල් වූවෝ දැන් පමණක් නොව පෙ රද වූයේයැ යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

යටගිය දවස බරණැස් නුවර බඹදත් රජු රජ කැරද්දී බෝසත්හු

කසී රට උසස් බමුණු කුලයක ඉපද වැඩි වියට පැමිණියේ, තවුස් පැවිද්දෙන් පැවිදි ව අභිඥා ද සමාපත්තීන් ද උපදවා ධ්‍යාන සුවයෙන් කල්ගත කරන්නේ, හිමාල වන පියසෙහි පන්සියයක් අතවැසියන් විසින් පිරිවරන ලදුව වාසය කරති. ඉක්බිති, ඔහුට වැසි කාලය පැමිණි කල්හි අතවැසියෝ කීවාහුය. ඇදුරුතුමනි, මිනිස් පියසට ගොස් ලුණු ඇඹුල් සොයාගෙන එන්නෙමු. ඇවැත්නි, මම මෙහි ම වාසය කරන්නෙමි. තොපි ගොස් සිරුර සතපවා ගෙන වැසි කාලය ගතකොට එව්. ඔවුහු යහපතැ යි ගුරුතුමා වැඳ බරණැස් නුවරට ගොස් රජ උයනේ වාසය කොට දෙවැනි දවසේ නුවරින් පිටත දොරටු ගම පිඬු පිණිස හැසිර තෘප්තිමත් වී දෙවැනි දවසේ නගරයට පිවිසියහ. මිනිස්සු සෙනහසින් භික්‍ෂාව දුන්හ. කීප දිනක් ගියවිට රජුට ද සැලකළාහුය. දේවයන් වහන්ස, හිමාල වනයෙන් පන්සියයක් ඍෂිවරු අවුත් උයනෙහි වාසය කරති. උග්‍ර තපස් ඇත්තෝය. සන්සිඳුවන ලද චක්‍ෂුරාදී ඉන්ද්‍රියන් ඇත්තාහ. සිල්වත්හුය. රජතුමා ඔවුන්ගේ ගුණ අසා උයනට ගොස් වැඳ කරන ලද පිළිසඳර ඇත්තේ, වැසි සාර මස එහි ම වාසය පිණිස ප්‍රතිඥා ගෙන ආරාධනා කළේය. ඔවුන් එතැන් පටන් රජ ගෙදර ම වළඳා උයනෙහි වසත්.

ඉක්බිති, එක් දිනක් නගරයෙහි සුරා නැකත් නම් උත්සවයක් විය. රජතුමා පැවිද්දන්ට සුරාව දුර්ලභයැ යි බොහෝ ඉහළට සුරාව දෙවීය. තාපසවරු සුරා පානය කොට උයනට ගොස් සුරා මදයෙන් මත්වී නැඟිට නැටූහ. සමහරු ගැයූහ. නටා, ගයා තවුස් පිරිකර අතුරා නිදා සුරා මදය සිඳුණු කල්හි පිබිදී ඒ තමාගේ විකාර දැක අප විසින් පැවිද්දන්ට නො ගැළපෙන දෙයක් කරන ලදැ යි හඬා වැළප අපි ගුරුතුමාගෙන් වෙන් වූ බැවින් මෙබඳු පාප ක්‍රියාවක් කළෙමු යි, එකෙණෙහි ම උයන අත්හැර හිමවතට ගොස් තවුස් පිරිකර ආදිය තැන්පත් කොට ගුරුන් වැඳ සිටි කල්හි කිම, දරුවනි, මිනිස් පියසෙහි ආහාරයෙන් ක්ලාන්ත නොව සුව සේ විසුවෝහු ද ? සමගින් විසුවෝහුදැ යි විචාළේය. ගුරුතුමනි, අපි සුව සේ විසුවෝ වෙමු. එසේ වුවත් අපි පානය නො කළ යුත්තක් පානය කොට එහි සුන්වූවාහු, සිහි එළවාගත නො හැකි ව නැටුවෙමු. ගායනා කළෙමු යි එම කරුණ සැලකරනු වස් මේ ගාථාව ඉදිරිපත් කොට කීවාහුය.

"අපායිම්හ අනච්චිම්හ අගායිම්හ රුදිම්හ ච,
විසඤ්ඤකරණිං පීත්වා දිට්ඨා නාහුම්හ වානරාති"

"සුරා පීම්හ. (අත් ලෙළවමින්) නැටුම්හ. මහ හඬින් ගී කීම්හ. (සුරා පානය නපුරුයැ යි පසුව) හැඬූම්හ. සිහිසන් නැති කරන රා බී (යම් හෙයකින්) වඳුරෝ නො වුවවෝ ද එය ම මැනවි යි තමාගේ නුගුණ කීහ."

එහි, "අපායිම්හති", සුරා බීවෙමු. "අනච්චිම්හාති", ඒ සුරා පානය කොට අත්පා ලෙළවමින් නැටුවෙමු. "අගායිම්හාති", මුඛය විවෘත කොට දික්වූ හඬින් ගායනා කළෙමු. "රුදිම්හ චාති", නැවත විපිළිසර බවට පත්ව මෙබඳු දෙයක් අප විසින් කරන ලදැ යි හැඬීමු. "දිට්ඨා නාහුම්හ වානරාති", මෙසේ සිහිය නසන හෙයින්, "විසඤ්ඤීකරණිං", නම් වූ සුරාව පානය කොට යම් හෙයකින් වානරයෝ නො වූවෝ වෙමු.

මෙසේ ඔවුහු තමන්ගේ අගුණ කීවාහුය. බෝසත්හු ගුරු ආශ්‍රය නැත්තවුන්ට මෙබඳු දේ වේමැ යි, ඒ තවුසන්ට දොස් පවරා නැවත මෙවැන්නක් නො කැරව යි ඔවුන්ට අවවාද දී නො පිරිහුණු ධ්‍යාන ඇත්තේ, බඹ ලොව පිහිට කොට ඇත්තකු විය.

බුදු රජහු මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා අනුසන්ධි ගළපා ජාතකය නිමා කළහ. එදින තවුස් සමූහයා බුදු පිරිස වූහ. නායක තවුසා මම වීමි.

1. 9. 2.

## මිත්තවින්ද ජාතකය

"අතික්කම්ම රමණකන්ති" යන මේ ජාතකය බුදු රජහු ජේතවනරාමයෙහි වැඩ වාසය කරන සේක්, එක් අකීකරු භික්ෂුවක් අරබයා වදාළහ. මේ ජාතකයේ වනාහි කාශ්‍යප සම්බුදු කාලයට අයත් කථා වස්තු දහවන නිපාතයෙහි මහා මිත්තවින්ද ජාතකයේ මතු සඳහන්

වන්නේය. එකල්හි වනාහි බෝසත්තු මේ ගාථාව කීහ.

"අතික්කමම රමණකං සදාමත්තං ච දූභකං
ස්වාසි පාසාණමාසීනො යස්මා ජීවං න මොක්ඛසීති"

"පළිඟු පහය ද රිදී පහය ද මැණික් පහය ද ඉක්ම
තෙපි (පාපක්ෂය වන තෙක්) ජීවත් වන්නහු, (යම්
උරචක්‍රයකින්) නො මිදෙන්නහු ද එබඳු පාෂාණ
උරචක්‍රයකින් මඩනා ලද්දාහුය."

එහි, "රමණකං", ඒ කාලයේ පළිඟුවට නමකි. පළිඟු ප්‍රාසාදය ද ඉක්ම වූ බව දක්වයි. "සදාමත්තං චාති", රිදියට නමකි. රිදී ප්‍රාසාදය ද ඉක්ම වූ බව පෙන්වයි. "දූභකන්ති", මැණික්වලට නමකි. මැණික් ප්‍රාසාදය ද ඉක්ම වූ බව පෙන්වයි. "ස්වාසීති", ඒ ඔබ වෙහි. " පාසාණමාසීනො" උරචක්‍රය වනාහි පාසාණමය හෝ වෙයි. රිදීමය හෝ වෙයි. මැණික්මය හෝ වෙයි. ඔහු ද එහි හුන්නේ එහෙයින් පාසාණයෙහි හුන් බැවින් "පාසාණසීන" යැයි කිව යුතු තැන ව්‍යඤ්ජන සන්ධි වශයෙන් 'ම' කාරය ගෙන "පාසාණමාසීන" යැයි කියන ලදී. පාෂාණය හෝ එහි හුන්නේ, ඒ උරචක්‍රය පැමිණ සිටියේ යන අර්ථයි. "යස්මා ජීවං න මොක්ඛසීති", යම් හෙයකින් උරචක්‍රය යම්තාක් ඔබේ පාප කර්මය ක්ෂය වේ ද ඒතාක් ජීවත් වෙමින් නො මදින්නේ වෙයි.

මේ ගාථාව කියා බෝසත්හු තමාගේ දේවස්ථානයට ම ගියහ. මිත්තවින්දක උරචක්‍රය ඔසවාගෙන මහා දුක් අනුභව කැරෙමින් පව්කම් ක්ෂය වූ කල්හි කම් වූ පරිදි ගියේය.

බුදු රජහු මේ ධර්ම දේශනාව ගෙන හැර දක්වා ජාතකය නිමා කළහ. එකල මිත්තවින්දක අකීකරු භික්ෂුව විය. දේවරාජයා වනාහි මම ම වීමි.

## 1. 9. 3.

## කාළකණ්ණි ජාතකය

"මිත්තො හවෙ සත්තපදෙන හොතීති" යන මේ ජාතකය බුදු රජහු දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, අනේපිඬු මහා සිටුහුගේ යහළුවකු අරබයා දේශනා කළහ. ඔහු වනාහි මහසිටුහු සමග වැලිකෙළියේ පටන් එක ම ඇඳුරකු ළඟ සිප්සතර හදාළ නමින් කාළකණ්ණි නම් විය. කල්යත් ම ඔහු දුගී බවට පත්ව දිවි රැකුමට නො හැකි ව මහසිටු වෙත ගියේය. මහසිටු ඔහු අස්වසා ජීවන වියදම් දී ආරක්ෂාව සඳහා තම ධනය ද පැවරුවේය. ඔහු මහසිටු හට උපකාරකයෙක් වී සියලු කටයුතු කරයි. මහසිටු ළඟට ඔහු පැමිණි කල්හි කාළකණ්ණිය සිටුව. කාළකණ්ණිය හිඳුව. කාළකණ්ණිය කව යි කියත්. එක් දවසක් සිටුහුගේ යහළු මිත්‍රයෝ ඔහු වෙත පැමිණ මෙසේ කීහ. සිටුතුමනි, මොහු ඔබ ළඟ සිටුවා නො ගත යුතුය. කාළකණ්ණිය, සිටුව. හිඳුව. කව, ආදී වශයෙන් නිතර නිතර කියන කල්හි යක්ෂයා පවා පලා යන්නේය. තව ද ඔහු ඔබ හා සමත් නො වේ. දුගීය. විරූපය. ඔහුගෙන් ඔබට ඇති ඵලය කිම. එවිට මහසිටුහු, නම වනාහි ව්‍යවහාර මාත්‍රයකි. නුවණැත්තෝ නම ම ප්‍රමාණ නො කරත්. ඇසූ දෙය සුබ වශයෙන් ගත්හ. සුබ මංගලයකු විය යුතු නො වේ. වැලිකෙළියෙහි පටන් යහළුවකු වූ මොහු නම නිසා අත්හරින්ට නො හැකිය. ඔවුන්ගේ වදන් නො පිළිගෙන දිනක් තමාගේ නුදුරු ගමකට යන්නේ කාළකණ්ණියා ගෙයි ආරක්ෂකයා කොට ගියේය.

සොරු සිටුතුමා වෙනත් ගමකට ගියේය. ඔහුගේ ගෙය පහරන්නමැ යි නොයෙක් ආයුධ ගත් අතැති ව රාත්‍රී කාලයෙහි අවුත් ගෙය වැටලූහ. කාළණ්ණි ද සොරුන්ගේ පැමිණීම බලාපොරොත්තුවෙන් නො නිදා ම සිටියේය. ඔහු සොරුන් ආ බව දැන මිනිසුන් පුබුදුවා, ඔබ සක පිඹින්න. ඔබ මිහිගු බෙර වයන්න, ආදීන් වශයෙන් මහා සැණකෙළියක් කරන්නාක් මෙන් මුළු නිවස ම නින්නාද කළේය. එවිට සොරු සිටු ගෙය හිස්යැ යි සිතූ අප වැරදි වෙමු. මහසිටු මෙහි ම සිටිතැ යි ගල්, මුගුරු ආදිය එහි ම දමා පලා ගියහ.

දෙවැනි දවස්හි මිනිස්සු ඒ ඒ තැන දමන ලද ගල්, මුගුරු ආදිය දැක සංවේගයට පත්ව ඉදින් අද මෙබඳු වූ නැණවත් ගෘහ ආරක්ෂකයෙක් නො සිටියේ නම් සොරුන් විසින් කැමැති පරිදි ගෙට පිවිස මුළු ගෙය පහරන්නට තිබිණ. මේ හිතවත් මිත්‍රයා නිසා සිටුතුමාට අභිවෘද්ධියක් ම වූයේයැ යි ඔහුට ප්‍රසංසා කොට සිටුතුමා ගොදුරු ගමින් ආ විට ඒ සියලු පුවත් සැල කළහ.

ඉක්බිති, ඒ සිටු මෙසේ කීවේය. ඔබලා මෙබඳු ගෘහාරක්ෂක මිතුරා බැහැර කළාහු නම් අද මගේ ධනය කිසිවක් ඉතිරි නො වන්නේය. නම වනාහි සැලකිය යුතු නො වේ. හිතවත් බව ම ප්‍රමාණ වෙයි. ඔහුට වඩ වඩාත් ජීවන වියදම් දී අද මම පුවත් පඬුරක් ඇතැ යි බුදු රජුන් වෙත එළැඹ මුලපටන් ඒ පුවත සැල කළේය. ගෘහපතිය, මේ කාලකණ්ණි නම් මිත්‍රයා තමාගේ මිතුරාගේ ගෘහය ආරක්ෂා කරනුයේ දැන් පමණක් නොව, පෙර ද ආරක්ෂා කළේයැ යි වදාරා ඔහු විසින් අයදනා ලදුව අතීතය ගෙන හැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කරන කල්හි බෝසත්හු මහත් සම්පත් ඇති සිටුවරයෙක් වූහ. ඔහුට කාලකණ්ණි නම් මිත්‍රයකු විය. සෙසු සියල්ල වර්තමානය හා සමානය. බෝසත්හු ගොදුරු ගමින් අවුත් ඒ පුවත අසා ඉදින් ඔබගේ වචනයෙන් මා විසින් මෙබඳු වූ මිත්‍රයා බැහැර කරනු ලැබුණේ නම් අද මගේ සම්පත් කිසිවක් නො වන්නේ යි කියා මේ ගාථාව කීහ.

"මිත්තො හවෙ සත්තපදෙන හොති
සහායො පන ද්වාදසකෙන හොති,
මාසඪමාසෙන ච ඤාති හොති
තතුත්තරිං අත්තසමොපි හොති

සොහං කථං අත්තසුඛස්ස හෙතු,
චිරසන්ථුතං කාළකණ්ණිං ජහෙය්‍යන්ති"

"එක්ව සත් පියවරක් යැමෙන් මිත්‍රයෙක් වන්නේය.
දොළොස් දිනක් එක්ව විසීමෙන් යහළුවෙක් වන්නේය.

මසකින් ද අඩ මසකින් ද නෑයෙක් හා සම වන්නේය. එයින් අධි කාලයක් එක්ව විසීමෙන් ප්‍රාණසමයෙක් ද වන්නේය. ඒ මම තමාගේ සුවය කරණ කොටගෙන බොහෝ කාලයක් එක්ව වාසයකොට පුරුදු වූ කාළකණ්ණි නම් යහළුවා කෙසේ හරනෙම් ද ?"

එහි, "**භවෙති**", නිපාත මාත්‍රයකි. මෙත් කැරේනු යි මිත්‍ර නම්. මෛත්‍රිය සිතෙහි එළවාගෙන සෙනෙහස කළැ යි යන අර්ථයි. මේ මිත්‍රයා වනාහි, "**සත්තපදෙන හොතීති**", එකතු ව සත් පියවරක් ගමන් කළ පමණකින් වේ, යන අර්ථයි. "**සහායො පන ද්වාදසකෙන හොති**", සියලු කටයුතු එකට කිරීමෙන් හා සියලු ඉරියව්වල සමග සිටින්නේ, "**සහාය**" නම්. මේ සහායකයා දොළොස් දිනක් එකට විසීමෙන් වේ, යන අර්ථයි. "**මාසද්ධමාසෙන චාති**", මසකින් හෝ අඩ මසකින්, " **ඤාති හොති**", නෑයෙක් සමාන වන්නේය. "**තතුත්තරින්ති**", ඉන් මත්තෙහි එකට විසුවෙහි, "**අත්තසමොපි හොති**", ප්‍රාණ සමයෙක් වන්නේය. "**ජහෙය්‍යන්ති**", මෙබඳු යහළුවකු කෙසේ නම් අත් හරින්නේ ද ? මිතුරු බවේ අගය ප්‍රකාශ කළේය. එතැන් පටන් නැවත කිසිවෙක් මේ පිළිබඳව කථා නො කළෝය. බුදු රජහු මේ ජාතක ගෙනහැර දක්වා මේ ජාතකය නිමවා වදාළහ. එදා කාළකණ්ණි නම් මිතුරා අනන්ද විය. බරණැස් සිටු නම් මම ම වීමි.

## 1. 9. 4.

## අත්ථස්සද්වාර ජාතකය

"**අරොග්‍යමිච්ඡෙ පරමං ච ලාභන්ති**" යන මේ දේශනාව බුදු රජහු දෙව්රමෙහි වැඩ වාසය කරන සේක්, එක් අභිවෘද්ධියෙහි දක්ෂ පුත්‍රයකු අරබයා වදාළහ. සැවැත් නුවර එක් මහා ධනය ඇති සිටුවරයකුගේ පුත්‍රයකු විය. උපතින් සත් හැවිරිදි වියේ දී ම නුවණ ඇත්තේ, දියුණුවේ දක්ෂ වූයේය. හෙතෙම එක් දිනක් පියා වෙත එළැඹ දියුණුවේ දොරටු පිළිබඳ ප්‍රශ්න දෙකක් විචාළේය. පියා එය

නො දනියි. ඉක්බිති, ඔහුට මෙබඳු අදහසක් ඇතිවිය. මේ ප්‍රශ්නය ඉතා සියුම්ය. සර්වඥ බුදු රජුන් හැර අනිකකු මතු භවාග්‍රය දක්වා ද යට අවීචිය පරිච්ඡේදකොට ඇති ලෝකය තුළ මේ ප්‍රශ්නය කියන්නට සමර්ථයකු නම් නැත. ඔහු පුතා රැගෙන බොහෝ මල්, සුවඳ විලවුන් ගෙන්වා ගෙන දෙව්රමට ගොස් බුදු රජුන් පුදා වැඳ එකත් පසෙක හුන්නේ, භාග්‍යවතුන් වහන්සේට මෙය කීවේය.

ස්වාමීනි, මේ දරුවා නුවණ ඇත්තේය. අභිවෘද්ධියෙහි දක්‍ෂය. මගෙන් දියුණුවේ දොරටු පිළිබඳ ප්‍රශ්නය විචාළේය. මම ඒ ප්‍රශ්නය නො දන්නා බැවින් නුඹ වහන්සේ සමීපයට ආවෙමි. භාග්‍යවතුන් වහන්සේ මට ඒ ප්‍රශ්නය කියා දෙන සේක් නම් යහපති. බුදු රජනු උපාසකය, පෙර ද මම මේ කුමාරයා විසින් විචාරන ලද මේ ප්‍රශ්නය විසඳා දුනිමි. මේ කුමාරයා එදා එය දැන ගත්තේය. භවයෙන් වැසී ගිය බැවින් දැන් එය නො පැහැදිලියැ යි වදාරා ඔහු විසින් අයදනා ලදුව ඉකුත් කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කැරවන කල්හි බෝසත්හු මහත් සම්පත් ඇති සිටු කෙනෙක් වූහ. ඉක්බිති, ඔහුගේ උපතින් සත් හැවිරිදි පුත්‍රයා නැණ ඇත්තේ, දියුණුවෙහි දක්‍ෂ වූයේ දිනක් පියා වෙත එළැඹ පියාණනි, අභිවෘද්ධියට දොරටු කෙතෙක්ද යි " අත්ථස්සද්වාර පුච්ඡායි" විචාළේය. එවිට ඔහුගේ පියා මේ ප්‍රශ්නය විසඳමින් මේ ගාථාව කීය.

"ආරොග්‍යමිච්ඡෙ පරමං ච ලාභං
සීලං ච වුද්ධානුමතං සුතං ච,
ධම්මානුවත්තී ච අලීනතා ච
අත්ථස්ස ද්වාරා පමුඛා ඡළෙතෙති"

"ආරෝග්‍යය නම් වූ උතුම් ලාභය කැමැති වන්නේය. ආචාර ශීලය ද (ගුණයෙන්) වැඩිහිටියන්ගේ අනුමතය ද බහුශ්‍රැත බව ද ධර්මය අනුව පැවැත්ම ද චිත්තයාගේ නො හැකුළුණු බව ද යන මේ සදෙන දියුණුවට ප්‍රධාන වූ ද්වාරයෝය."

එහි, "ආරොගාය මිච්ඡෙ පරමං ච ලාභනති" යනු නිපාත මාත්‍රයකි. දරුව, පළමු කොට ම නිරෝගිකම නැමැති උසස් ම ලාභය කැමැති විය යුතුයැ යි යන මේ අර්ථය දක්වනු සඳහා මෙසේ කීය. එහි ද ආරෝග්‍යය නම් ශරීරයෙහි ද සිතෙහි ද නිරෝගී බව, ලෙඩ නැති බවය. ශරීරයෙහි රෝග හටගත් විට නො ලැබූ ධනය උපදවීමට නො හැක්කේය. ලැබූ ධනය පරිභෝග කිරීමට ද නො හැක්කේය. නීරෝග බව ඇති කල්හි මේ උභය සම්පත්තිය ම ලබා ගැනීමට හැකි වෙයි. සිත කෙළෙස්වලින් ගිලන් වූ කල්හි නො ලැබූ ධ්‍යානාදී ලාභ උපදවීමට නො හැක්කේය. ලැබුවා වූ ධ්‍යානය ද නැවත සමාපත්ති වශයෙන් පරිභෝග කරන්නට ද නො හැක්කේය. මේ ගිලන් බව ඇති කල්හි නො ලැබූ ලාභය ද නො ලබයි. ලැබුවා වූ ධ්‍යානය ද අර්ථ රහිත වෙයි. මේ ගිලන් බව නැති කල්හි නො ලැබුවා වූ ලාභය ලබයි. ලැබුවා වූ ලාභය සාර්ථක වෙයි. මේ නිසා නිරෝගී බව උසස් ම ලාභය වෙයි. එය පළමුවෙන් ම කැමැති විය යුතුයි. මේ දියුණුවට එක් මඟකි යන අර්ථයි. "සීලං චාති", මෙහි ආචාර ශීලයයි. මෙයින් ලෝක චාරිත්‍ර දක්වයි. "වුද්ධානුමතනති", ගුණයෙන් වැඩිහිටියන්ගේ ද නුවණ ඇත්තන්ගේ ද අනුදැනීමයි. මෙයින් ගුණවත් ගුරුවරුන්ගේ අවවාද දක්වයි. "සුතං චාති", හේතු කාරණා සහිත දැනීමයි. මෙයින් මේ ලෝකයෙහි දියුණුවට හේතු වූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති බවයි. "ධම්මානුවත්තී චාති", ත්‍රිවිධ වූ සුචරිත ධර්මයට අනුගත වීමයි. මෙයින් දුසිරිත් කම් හැර සුචරිත ධර්මයෙහි යෙදෙන බව දක්වයි. "අලීනතා චාති", සිතෙහි නො මැළි බව, උසස් බවයි. "අත්ථස්ස ද්වාරා පමුඛා ඡළෙතෙති", හි, "අත්ථ", යනු දියුණුවයි. ඒ වැඩීම් සංඛ්‍යාත වූ ලෞකික ලෝකොත්තර අභිවෘද්ධියට ප්‍රමුඛය. යහපත්ය. එම නිසා මේ දොරටු සය දියුණුව ලබා ගැනීමේ උපාය නම් වේ.

මෙසේ බෝසත්හු පුත්‍රයාට දියුණුවේ දොරටු ප්‍රශ්නය ප්‍රකාශ කළහ. ඔහු එතැන් පටන් ඒ සය ධර්මයන්හි අනුව ක්‍රියා කළේය. බෝසත්හු ද දානාදී පිංකම් කොට කම් වූ පරිදි මිය ගියහ. බුදු රජහු මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා ජාතකය නිමා කළහ. එදා පුත්‍රයා දැන් පුත්‍රයා මය. මහ සිටුහු මම ම වීමි.

## 1. 9. 5.

## කිම්පක්ක ජාතකය

"ආයතිදොසං නාඤ්ඤායාති" යන මේ ධර්ම දේශනාව බුදු රජහු දෙව්රමෙහි වැඩ වසන සේක්, එක් උකටලී භික්ෂුවක් අරබයා දේශනා කළහ. එක්තරා කුල පුත්‍රයෙක් බුදු සසුනෙහි උරදී පැවිදි ව එක් දවසක් සැවැත් නුවර පිඬු පිණිස හැසිරෙන්නේ, මනා රුසපුවෙන් යුත් ස්ත්‍රියක දැක කළකිරුණේය. ඉක්බිති, ආචාර්ය උපාධ්‍යායයෝ ඔහු රැගෙන බුදු රජුන් වෙත ගියහ. බුදු රජහු මහණ, ඔබ උකටලී වූයේ සැබෑද යි විචාරා ස්වාමීනි, සත්‍යයැ යි කී කල්හි, මහණ, මේ පඤ්ච කාම සම්පත් විඳින කල්හි මනහරය. එහෙත් ඒ විඳීමෙන් නිරය ආදියෙහි ඉපදීමට හේතුවන බැවින් කිම්පක්ක නම් ගෙඩි අනුභව කිරීම හා සමාන වේ. කිම්පක්ක ඵල වනාහි පැහැයෙන්, සුවඳින්, රසයෙන් යුක්තය. එහෙත් අනුභව කළ පසු බඩවැල් කඩ කඩ කොට මරණයට පමුණුවයි. පෙර බොහෝ මිනිස්සු මෙහි දොස් නො දැක පැහැයට, සුවඳට, රසයට ආසා කොට ඒ ඵල අනුභව කොට මරණයට පැමිණියහැ යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු සාත්තු නායකයෙක් ව ඉපිද ගැල් පන්සියයක් ගෙන පෙරදිගින් අපර දිගට යන්නාහු, වන දොරටුවට පැමිණ මිනිසුන් රැස් කැරවා මේ වනයෙහි විෂ ගස් ඇත. පෙර අනුභවකොට නුපුරුදු ගෙඩි මගෙන් නො විචාරා නො කවු යි අවවාද කළහ. මිනිස්සු වනය ඉක්මවා වන දොරටුවට පැමිණි කල්හි ඵල බරින් නැමුණු අතු ඇති කිම්පක්ක ගසක් දුටහ. එහි කඳ, අතු, කොළ, ගෙඩි ආදිය හැඩයෙන්, වර්ණයෙන්, රසයෙන්, ගඳින් අඹ ඵල සමාන විය. ඔවුන්ගෙන් සමහරු පැහැය සුවඳ රස නිසා ආසා කොට අඹ ඵල යන හැඟීමෙන් ඒ ගෙසෙහි ගෙඩි කෑහ. සමහරු ගැල් නායකයන්ගෙන් විමසා කමු යි ගෙඩි, කොළ ආදිය ගෙන බෝසතුන් වෙත ගියහ. බෝසත්හු එතැනට පැමිණ නෙලන ලද ගෙඩි බැහැරට දමා යමෙක් ගෙඩි කමින් සිටියේ ද ඔවුන් වමනය කැරවා ඔවුන්ට බෙහෙත් දෙවූහ. එයින් සමහරු නීරෝග වූහ. පළමු ව ගෙඩි කෑ මිනිස්සු මරණයට පත්වූහ. බෝසත්හු ද තමා කැමැති ස්ථානයට සුව සේ

ගොස් ලාභ ලැබ නැවත තමන්ගේ ස්ථානවලට ම පැමිණ දානාදී පිංකම් කොට කම් වූ පරිදි මිය ගියේය. බුදු රජහු මේ කථා පුවත ගෙනහැර දක්වා මේ ගාථාව දේශනා කළහ.

"ආයතිදොසං නාඤ්ඤාය යො කාමෙ පතිසෙවති,
විපාකන්තෙ හනන්ති නං කිම්පක්කමිව භාක්ඛිතන්ති"

"මතුවන්නා වූ දෝෂය නො දැන යමෙක් කාමයෙන් සෙවුණේ ද කන ලද කිම්පක්ක නම් විෂ ඵලය මෙන් (ඒ කාමයෙන්) ඒ පුරුෂයා විපාක සංඛ්‍යාත අන්තයෙහි නිරයෙහි නොයෙක් දුක්දී නසත්."

එහි, "ආයතිදොසං නාඤ්ඤායති", මතු ඇතිවන දෝෂ නො දැන - දන්නේ නැතුව යන අර්ථයි. "යො කාමෙ පතිසෙවති", යමෙක් වස්තු කාම, ක්ලේශ කාමයන් සේවනය කරයි ද, "විපාකන්තෙ හනන්ති නං", ඒ කාමයෝ, ඒ පුරුෂයෝ තමාගේ විපාක සංඛ්‍යාත කෙළවර දී නිරයාදියෙහි උපදවමින් නොයෙක් විවිධ දුක් ගෙන දෙමින් නසත්. කෙසේද ?, "කිම්පක්කමිව භාක්ඛිතන්ති", යම් සේ අනුභව කරන කාලයෙහි පැහැය, සුවඳ, රස නිසා ප්‍රිය වූ කිම්පක්ක ගෙඩිය අනාගත දොස් නො දැක අනුභව කරන ලද්දේ අතුනු මහත් ව මරණයට පමුණුවයි. මෙසේ අනුභව කරන කාලයෙහි මිහිරි වුව ද කාමයෝ විපාක දෙන කාලයේ නසත්. මෙසේ මේ දේශනාව සන්ධි ගළපා සිව්සස් ප්‍රකාශ කෙළේය. සත්‍යය දේශනාව කෙළවර කළකිරුණු භික්ෂුව සෝවාන් ඵලයට පැමිණියේය. සෙසු පිරිසෙන් සමහරෙක් සෝවාන් වූහ. සමහරෙක් සකෘදාගාමී වූහ. සමහරෙක් අනාගාමී වූහ. ඇතැමෙක් රහත් වූහ. බුදුහු ද මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා ජාතක කථාව නිමවා වදාළහ. එකල පිරිස බුදු පිරිස විය. සත්ථුවාහකයා වනාහි මම ම වෙමි.

## 1. 9. 6.

## සීලවිමංස ජාතකය

"සීලං කිරෙව කල්‍යාණන්ති" යන මේ ජාතක දේශනාව බුදුහු ජේතවනාරාමයෙහි වැඩ වසන සේක්, එක් සිල් විමසන බමුණකු අරබයා වදාළහ.

හෙතෙම වනාහි කොසොල් රජතුමා නිසා ජීවත් වෙයි. තෙරුවන් සරණ ගියේ නො කඩවා පන්සිල් රකින්නේ, වේදයෙහි පරතෙරට ගියේය. රජතුමා මේ තෙමේ සිල්වත්යැ යි අමතර ව ගරු කරයි. හෙතෙමේ මෙසේ සිතුවේය. මේ රජ තෙමේ මට අනිත් බමුණන්ට වඩා අමතර සම්මානයක් කරයි. අතිසයින් මා ගරුකොට සිතයි. කිම, මොහු මගේ ජාතිය, ගෝත්‍රය, කුල ප්‍රදේශය හා දූන උගත්කම් නිසා මේ සම්මාන කරන්නේ ද, නැති නම් සිල්වත් කම විමසන්නෙමි යි සිතුහ.

හෙතෙම එක් දවසක් රාජ්‍යය සේවයට ගොස් ගෙට එන්නේ, එක් රන්කරුවකුගේ පුවරුවකින් නො දන්වා එක් කහවණුවක් ගෙන ගියේය. රන්කරුවා බමුණා කෙරෙහි ගෞරවයෙන් කිසිවක් නො කියා හුන්නේය. දෙවැනි දවසෙහි කහවණු දෙකක් ගත්තේය. රන්කරුවා එසේ ම ඉවසා සිටියේය. තෙවැනි දිනයේ මිටක් පමණ කහවණු ගත්තේය. ඉක්බිති, රන්කරුවා අද ඔබගේ තෙවැනි දවසයි. රාජ භාණ්ඩාගාරය පහරන සොරා මා විසින් අල්ලා ගන්නා ලද්දේය. තෙවරක් හඬ ගැසීය. එවිට මිනිස්සු වටින් පිටින් අවුත් ඔහුට, ඔබ මෙතෙක් කල් සිල්වතකු මෙන් හැසුරුණෙහිය. පහර දෙක තුනක් දී බැඳ රජුට දූන්වූහ. රජතුමා විපිළිසර වී බමුණ, ඔබ මෙබඳු පව්ටු ක්‍රියාවක් කුමක් නිසා කළෙහිදැ යි කියා මොහුට රාජඥාව පනව යි කීය. බමුණා මහරජ, මම සොරෙක් නො වෙමි යි කීය. එසේ නම් කුමක් නිසා පුවරුවෙන් කහවණු ගත්තෙහි ද ? ඔබ මා කෙරෙහි ඉතා මහත් ගෞරවයක් කරන්නෙහිය. කිමෙක් ද ? රජ මාගේ කුල ගෝත්‍ර ආදිය නිසා මහත් සම්මාන කරයි ද ? නැතිනම් ශීලය නිසාදැ යි විමසනු පිණිස කරන ලදී. දූන් මවිසින් නිත්‍යය වශයෙන් දූන

ගන්නා ලදී. ශීලය නිසා ම ඔබ විසින් මට සම්මාන කරන ලද්දේය. ජාත්‍යාදිය නිසා නො වෙයි. ඒ එසේ මැයි. දැන් මට රාජාඥාව පනවනු මැනව. ඒ මම මේ කාරණයෙන් මේ ලෝකයෙහි ශීලය ම උතුම්ය. ශීලය ම ශ්‍රේෂ්ඨ මයැ යි තීරණය කළෙමි. මේ ශීලයට සුදුසු ලෙස හැසිරීමට නම් ගිහි ගෙයි සිට කාම සම්පත් විඳිමින් නො හැක්කෙමි. අද ම දෙව්රම් වෙහෙරට ගොස් බුදුන් සමීපයේ පැවිදි වන්නෙමි. දේවයිනි, මට පැවිදිවීමට ඉඩ දෙනු මැනවි යි කීහ. රජුගෙන් අනුමැතිය ලබා දෙව්රම් වෙහෙර දෙසට ගියේය.

ඉක්බිති, ඔහුගේ ඥාති මිත්‍රාදීහු රැස්ව ඔහු නැවැත්වීමට නො හැකි ව නැවතුණහ. ඔහු බුදු රජුන් වෙත එළැඹ පැවිදි බව ඉල්ලා පැවිදි උපසම්පදා ලැබ දැඩි උත්සාහ ඇත්තේ, විදසුන් වඩා රහත් බවට පැමිණ බුදු රජුන් වෙත එළැඹ ස්වාමීනි, මගේ පැවිද්ද සාර්ථක බවට පැමිණියේයැ යි රහත් බව ප්‍රකාශ කෙළේය. ඔහුගේ ඒ රහත් බව ප්‍රකාශ කිරීම මහසඟන අතර ප්‍රකට විය. ඉක්බිති, එක් දවසක් දම් සබාවෙහි රැස්වූ භික්ෂූහු ඇවැත්නි, අසවල් නම් ඇති රාජ උපස්ථායක බමුණා තමාගේ සිල් විමසා රජුන් අනු දන්වා පැවිදි ව රහත් බවෙහි පිහිටියේයැ යි, ඔහු පිළිබඳ ගුණය කියමින් හුන්නාහුය. බුදු රජහු වැඩමවා මහණෙනි, දැන් මෙහි කවර කථාවකින් යුතුව හුන්නාහුදැ යි විචාරා මෙනම් කථාවකින් හුන්නෙමු යි කී කල්හි මහණෙනි, මේ බමුණු තෙම තමාගේ ශීලය විමසවා පැවිදි ව තමාට පිහිටක් කළේ දැන් පමණක් නො වේ. පෙර ද නුවණ ඇත්තෝ තමාගේ ශීලය විමසවා පැවිදි ව තමා හට පිහිටක් කළාහුමැ යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

යටගිය දවස බරණැස් නුවර බඹදත් රජු රජ කැරද්දී බෝසත්හු ඒ රජුගේ පුරෝහිත බමුණා විය. හේ දන්දීමෙහි ඇලුණේය. ශීලයෙන් සපිරුණේය. නො කැඩුණු පන්සිල් ඇත්තාහ. රජ සෙසු බමුණන්ට වඩා වැඩියෙන් ඔහුට සම්මාන කරයි. සෙසු සියල්ල පෙර කථාව මෙනි. බෝසතුන් බැඳ රජු ළඟට ගෙන යනු ලබන කල්හි ඇතුළු වීදියෙහි අහිගුණ්ඨකයෝ නාගයකු ලවා ක්‍රීඩා කැරවමින් ඔහුගේ වලිගයෙන් ගනිති. ගෙලෙන් ගනිත්. තමාගේ ගෙලෙහි වෙලි ගනිත්. බෝසත්හු ඔවුන් දැක දරුවනි, මේ නාගයා නගුටෙන් නො ගනිවු. බෙල්ලෙන් නො ගනිවු. බෙල්ලෙහි වෙලා නො ගනිවු. මේ නාගයා

තොපට දෂ්ඨ කොට මරණයට පමුණු වන්නේය. එවිට අහිගුණ්ඨකයෝ බමණ, මේ නාගයා සිල්වත්ය. සිරිත් විරිත් දන්නේය. තොප මෙන් දුස්ශීලයෙක් නො වෙයි. තොප වනාහි තමාගේ දුසිල් බව නිසාත් නො සිරිත් බව නිසාත් රාජ භාණ්ඩාගාරය පහරා සොරකු ලෙස බැඳගෙන යනු ලබතැ යි කීවාහ. බෝසත්හු මෙසේ සිතූහ. නාගයෝ ද දෂ්ඨ නො කරන කල්හි අනුන්ට හිංසා නො කරන කල්හි සිල්වත් නාමය ලබයි. මනුෂ්‍යයන් ගැන කියනු කිම ? ශීලය ම ලොව උතුම් වේ. ඊට වඩා උසස් දෙයක් ලොව නැත. ඉක්බිති, මිනිස්සු ඔවුන් ගෙන ගොස් රජුට දැක්වූහ.

රජ, දරුවනි, මේ කවරෙක්දැ යි විචාළේය. දේවයිනි, මොහු රාජ වස්තුව සොරකම් කරන්නෙකි. එසේ නම් මොහුට රජ අණ පනවමු. බමුණා, මහරජ, මම සොරෙක් නො වෙමි. එසේ නම් කුමක් නිසා කහවණු ගත්තෙහි ද ? මෙතැන් සිට පෙර මෙන් සියල්ල ප්‍රකාශ කළහ. ඒ මම මේ කාරණයෙන් මේ ලෝකයෙහි සිල් ම උසස් බවත් ශීලය ම පෙරටුව සිටින බවත් නිගමනය කළෙමි යි කියා මේ නාගයා පවා දෂ්ඨ නො කරන්නේ, අනුන් නො වෙහෙසන්නේ, සිල්වත්යැ යි කිවයුතු බව ලබයි. මේ කාරණයෙන් ද ශීලය ම උසස් වේ. ශීලය ම ශ්‍රේෂ්ඨ වේ. ශීලය වර්ණනා කරන්නාහු, මේ ගාථාව කීහ.

**"සීලං කිරෙව කල්‍යාණං සීලං ලොකෙ අනුත්තරං**
**පස්ස ඝොරවිසො නාගො සීලවාති න හඤ්ඤතීති"**

"ආචාර ශීලය ම යහපත්ය. ලෝකයෙහි ශීලය ශ්‍රේෂ්ඨය.
බලව. නපුරු විෂ ඇති සර්ප තෙමේ සිල්වත් වෙමි යි
(අන්‍යන්ට) හිංසාවක් නො කැරේ."

එහි, **"සීලං කිරෙවාති"**, කය, වචන, හිත යන තුන් දොර නො ඉක්මවීම නම් වූ ආධාර ශීලය මයි. **"කිරාති"**, සුති සූචනාර්ථය කියයි. **"කල්‍යාණන්ති"**, යනු වඩාත් යහපත් යනුයි. **"අනුත්තරන්ති"**, සියලු ගුණයෙන් හෙබි ප්‍රධානියා, **"පස්සාති"**, තමා විසින් දක්නා ලද පුවත පෙරටු කොට කීවේය. **"සීලවාති න හඤ්ඤතීති"**, ඝෝර විෂ ඇති සර්පයකු වුව ද දෂ්ඨ නො කරන නො වෙහෙසන පමණකින්

සිල්වත්නම් පැසසුම් ද ලබයි. නො නසයි. නො වෙහෙසයි, යන මේ කාරණයෙන් ශීලය උතුම් වේ.

මෙසේ බෝසත්හු මේ ගාථාවෙන් රජුට දහම් දෙසා පස්කම් සැප හැර තවුස් පැවිද්දෙන් පැවිදි ව හිමවතට ගොස් පඤ්ච අභිඥා, අෂ්ඨ සමාපත්තීන් උපදවා බඹ ලොව පිහිටකොට ඇත්තෙක් වූහ. බුදුහු මේ ජාතක දේශනාව ගෙනහැර දක්වා ජාතකය නිමවා වදාළහ. එදා රජ පිරිස මෙකල බුදු පිරිස විය. බමුණා මම ම වීමි.

## 1. 9. 7.

## මඞ්ගල ජාතකය

"**යසස මඞගලා සමූහතාති**" යන මේ දේශනාව බුදුහු වේළුවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, එක් සාටක ලක්ඛණ නම් බමුණකු අරබයා වදාළහ.

ශුභ නිමිති මංගල වශයෙන් ගත් රජගහ නුවර වැසි එක් බමුණෙක් තුණුරුවන් කෙරෙහි නො පැහැදුණු මිසදුටුවෙක් විය. ඔහුට මහත් ධන ඇත්තේය. මහත් බෝග ඇත්තේය. ඔහුගේ පසුම්බියෙහි තබන ලද සළු යුවල මීයෝ කෑහ. ඔහු ස්නානය කොට සළු ගෙනෙනා ලෙස කී කල්හි මීයන් විසින් කන ලද බව කීවාහුය. ඔහු මෙසේ සිතීය. ඉදින්, මේ මීයන් විසින් කන ලද සළු යුවල මේ ගෘහයෙහි තබන්නේ නම් මහත් විනාශයක් වන්නේය. මෙය අවමඟුලකි. කාළකණ්ණියකු සමානය. දූදරු ආදීන්ට ද දස්කම්කරු ආදීන්ට ද දීමට නො හැකිය. යමෙක් මෙය ගන්නේ නම් මහත් විනාශයක් වන්නේය. එය අමු සොහොනෙහි දමන්නෙමි. එහෙත් දාසාදීන්ගේ අත එය යැවීමට නො හැකිය. ඔවුන් එහි ලෝභ උපදවා එය ගත්තේ නම් විනාශයකට පැමිණෙන්නේය. එම නිසා තම පුතුගේ අතින් එය අමු සොහොනට යවමි යි පුතා කැඳවා මෙකරුණ

පැහැදිලි කොට අතින් ස්පර්ෂ නො කොට දඬුවකින් ගෙන අමු සොහොනෙහි දමා ස්නානය කොට එව යි යැවීය.

බුදු රජහු ද එදවස අළුයම වේලෙහි විනේය ජනයන් බලන්නාහු, මේ පිය පුතුන්ගේ සෝවාන් වීමට ඇති හේතු සම්පත් දක මුවා යන එන මඟෙහි මුව වැද්දෙක් මෙන් ගොස් අමු සොහොන් දොරටුව අභියස සවනක් රැස් විහිදුවමින් වැඩ සිටියහ. මානවකයා පියාගේ වචනය පිළිගෙන ගේ තුළ සිටි සර්පයකු මෙන් ඒ සළු යුගලය දඬු කෙළවරින් ගෙන අමු සොහොන දොරටුව අසලට පැමිණියේය. ඉක්බිති, බුදුහු, මානවය, ඔබ කුමක් කරන්නේද යි වදාළහ. භවත් ගෞතමයෙනි, මේ සළු යුගල මීයන් විසින් කන ලදී. කාළකණ්ණියකු සමානය. හද විෂක් හා සමානය. මගේ පියා අතිකකු මෙය ඉවත දමන්නේ නම් ලෝභ උපදවා මෙය ගන්නේය යන බියෙන් මා එවන ලදී. මම මෙය ඉවත දමා ස්නානය කරන්නෙමි. භවත් ගෞතමයෙනි, ඒ සඳහා ආවේ වෙමි. එසේ නම් ඉවත දමව. මානවකයා ඉවත දැමීය. බුදු රජහු අපට දැන් වටීයැ යි ඔහුගේ ඉදිරියේ දී ම සළු යුගල ගන්නේ, භවත් ගෞතමයනි, මේ කාළකණ්ණි සමානය. නො ගන්න නො ගන්නැ යි ඔහු විසින් වළක්වනු ලබද්දී ම රැගෙන වේළුවනාරාමය දෙසට වැඩම කළහ. මානවකයා වේගයෙන් ගොස් පියාට දැන්වීය. පියාණෙනි, මා විසින් අමු සොහොනෙහි ඉවත දමන ලද සාටක යුගලය ශ්‍රමණ භවත් ගෞතමයෝ අපට වටීයැ යි මා විසින් වළක්වද්දී ම ගෙන වේළුවනාරාමයට ගියහ.

බමුණා මෙසේ සිතුවේය. ඒ සළු යුගල අවමඟුලකි. කාළකණ්ණි සමානය. එය පරිහරණය කිරීමෙන් ශ්‍රමණ භවත් ගෞතමයෝ ද නැසෙන්නේය. විහාරය ද නැසෙන්නේය. එයින් අපට නින්දාවක් වන්නේය. ශ්‍රමණ භවත් ගෞතමයන්ට වෙනත් බොහෝ සළු දී එය බැහැර කැරවන්නෙමි. හෙතෙම බොහෝ සළු ගෙන්වාගෙන පුතා සමග වේළුවනයට ගොස් බුදු රජුන් දැක එකත්පසෙක සිටියේ, මෙසේ කීවේය. ඇත්ත ද භවත් ගෞතමයෙනි, ඔබ වහන්සේ විසින් අමු සොහොනෙන් සළු යුගලක් ගන්නා ලද්දේ ද ? බමුණ, ඇත්තයි. භවත් ගෞතමයෙනි, ඒ සළු යුගල අවමංගල්‍යයකි. නුඹ වහන්සේ එය පරිභෝග කිරීමෙන් නැසෙන්නහුය. මුළු විහාරය ම නැසෙන්නේය. ඉදින්, නුඹ වහන්සේට ඇඳුමක් හෝ පොරෝණයක් හෝ ප්‍රමාණවත්

නො වේ නම් මේ සළු ගෙන එය ඉවත දමනු මැනවි. ඉක්බිති, ඔහුට බුදුහු බමුණ, අපි පැවිද්දෝ වෙමු. අපට අමු සොහොනෙහි හෝ ඇතුල් වීදියෙහි හෝ කසල ගොඩෙහි හෝ නාන තොටෙහි හෝ මහමඟෙහි හෝ මෙබඳු ස්ථානවල ඉවත දමන ලද හෝ වැටුණු හෝ වස්ත්‍ර (රෙදි) වටියි. නුඹ වනාහි දැන් පමණක් නොව පෙරත් මෙබඳු පිළිගැනීම් ඇත්තකු යි වදාරා ඔහු විසින් අයැදින ලද්දාහු, අතීතය ගෙනහැර දැක්වූහ.

යටගිය දවස මගධ රටේ රජගහ නුවර දැහැමි මගධ රජෙක් රාජ්‍යය කළේය. එකල බෝසත්හු එක්තරා උසස් බමුණු කුලයක ඉපදී නුවණ මුහුකුරා යාමට පැමිණියේ තවුස් පැවිද්දෙන් පැවිදි ව අභිඥා ද සමාපත්තීන් ද උපදවා ගෙන හිමවතෙහි වෙසෙමින් එක් කලෙක හිමවතෙන් නික්මී රජගහ නුවර රජ උයනට පැමිණ එහි වාසය කොට දෙවැනි දවසේ පිඬු පිණිස නගරයට පිවිසියේය. රජතුමා ඒ තවුසා දැක කැඳවා ප්‍රාසාදයෙහි හිඳුවා වළඳවා උයනෙහි ම විසීම පිණිස ප්‍රතිඥා ගත්තේය. බෝසත්හු රජ නිවසින් වළඳා උයනෙහි වසති.

ඒ කාලයෙහි රජගහ නුවර දුස්ස ලක්ඛණ නම් බමුණකු විය. ඔහුගේ සුමුගුවෙන් තබන ලද සළු යුගල සියල්ල පෙර පරදි මය. මානවකයන් වනාහි සොහොනට යන කල්හි බෝසත්හු පෙරාතුව ගොස් සොහොන් දොරටුවෙහි හිඳගෙන ඔහු විසින් ඉවත ලන ලද සළු යුවල ගෙන උයනට ගියහ. මානවකයා ගොස් පියාට සැලකළේය. පියා රජතුමාගේ හිතවත් තාපසයා නසින්නේයැ යි බෝසතාණන්ගේ ළඟට ගොස් තාපසතුමනි, නුඹ වහන්සේ විසින් ගන්නා ලද සළු ඉවතලන්න. නො නැසෙන්නයැ යි කීවේය. තාපසයා, අපට සොහොනෙහි ඉවත ලන ලද රෙදි වටියි. අපි කෝතුහල මංගලික නො වෙමු. මේ කෝතුහල මංගලය, බුදු, පසේ බුදු, බෝධි සත්ත්වයන් විසින් වර්ණනා නො කරන ලද්දකි. ඒ නිසා නුවණ ඇත්තා විසින් කොතුහල මංගලිකයකු නො විය යුතුයැ යි බමුණාට දහම් දෙසීය. බමුණා දහම් අසා දෘෂ්ටිය අත්හැර බෝසතුන් සරණ ගියේය. බෝසත් තෙමේ ද නො පිරිහුණු ධ්‍යාන ඇත්තේ, බඹ ලොව පිහිටකොට ඇත්තකු විය. බුදු රජහු ද මේ අතීතය ගෙනහැර දක්වා බමුණාට දහම් දේශනා කැරෙමින් මේ ගාථාව වදාළහ.

"යස්ස මඞ්ගලා සමූහතා
උප්පාතා සුපිනා ච ලක්ඛණා ච,
ස මඞ්ගලදොසවීතිවත්තො
යුගයොගාධිගතො න ජාතු මෙතීති"

"යම් රහත් කෙනකුගේ (දිට්ඨ, සුත, මුත ආදී) මංගලයෝ ද (සූර්යය ග්‍රහණාදී) උප්පාතයෝ ද ස්වප්නයෝ ද ලක්‍ෂණයෝ ද මනාකොට නසන ලද්දාහු ද මංගල දෝෂයන් ඉක්ම සිටියේ ද යුග ධර්මයන් ද යෝග ධර්මයන් ද යටපත් කොට සිටියේ ද ඒ රහත් උතුමා ඒකාන්තයෙන් (ප්‍රතිසන්ධි වශයෙන් මේ ලෝකයට) නො එන්නේය."

එහි, "යස්ස මඞ්ගලා සමූහතාති", යම් අරහත් වූ ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේ නමක් දිට්ඨ මංගල, සුත මංගල, මුත මංගල යන මේ මංගලයෝ මුලින් ම උපුටා හරින ලද්දේය. "උප්පාතා සුපිනා ච ලක්ඛණා චාති", මෙබඳු චන්ද්‍ර ග්‍රහණයක් වන්නේය. මෙබඳු සූර්යය ග්‍රහණයක්, මෙබඳු නැකත් ග්‍රහණයක්, මෙබඳු උල්කාපාතයක්, මෙබඳු ලැව් ගින්නක්, මේ පස් මහා පහළවීම්, නොයෙක් ආකාර සිහින, ඉටු ලකුණු හා අනිටු ලකුණු, ස්ත්‍රී ලක්‍ෂණ, පුරුෂ ලක්‍ෂණ, දාසයන්ගේ ලක්‍ෂණ, දාසීන්ගේ ලක්‍ෂණ, කඩු ලක්‍ෂණ, ගොන් ලක්‍ෂණ, වස්ත්‍ර පිළිබඳ ලක්‍ෂණ මේ ආදී වූ ලක්‍ෂණ ද මේ දෘෂ්ටි පිහිටන ස්ථාන ද යමකු විසින් නසන ලද්දේ ද මේ පහළවීම් ආදියෙන් තමන්ගේ මඟුල් අවමඟුල් දෙක ම නො සලකයි. "ස මඞ්ගලදොසවීතිවත්තොති", ඒ ක්‍ෂීණාශ්‍රව තෙමේ සියලු මංගල දෝෂයන් ඉක්මවා සිටියේ, පැන සිටියේ, අත්හැර සිටියේ, "යුගයොගාධිගතො න ජාතු මෙතීති", ක්‍රෝධය, වෛරය, ගුණමකු බව, ගුණවතුන් සම ව සිතීම ආදී වශයෙන් යුගල වශයෙන් පවතින එකට ආවා වූ කෙලෙස් යුවල නම්. කාම යෝගය නම් කාම, භව, දිට්ඨි, අවිජ්ජා යන මේවාය. සත්ත්වයා සසර බැඳ තබන බැවින් මේවා සතර යෝග නම්. ඒ යුග ක්ලේශ හා යෝග ක්ලේශයන් ඉක්මවා ගිය හැම ආකාරයෙන් ම අතහැර ගිය රහත් භික්‍ෂුව කිසි කලෙක ප්‍රතිසන්ධි වශයෙන් මේ ලෝකයට නො එයි. නො පැමිණෙයි.

මෙසේ බුදුහු මේ ගාථාවෙන් බමුණාට දම් දෙසා නැවත සත්‍යය ප්‍රකාශ කළහ. සත්‍යය දේශනාවගේ කෙළවර පුතා සමග බමුණා සෝවාන් ඵලයෙහි පිහිටියේය. බුදුහු ජාතකය නිමා කළහ. එකල මෙදෙදෙනා ම පිය පුත් වූහ. තාපසයා වනාහි මම ම වීමි.

## 1. 9. 8.

## සාරම්භ ජාතකය

"කල්‍යාණිමෙව මුඤ්චෙය්‍යාති" යන මේ ජාතක දේශනාව බුදුහු සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, ඕමසවාද ශික්ෂා පදය අරබයා වදාළහ. කථාව වස්තු දෙක ම යට නන්දිවිසාල ජාතකයෙහි කියන ලද පරිදි ම වේ. මේ ජාතකයෙහි වනාහි බෝසත්හු ගන්ධාර රටෙහි තක්සලා නුවර එක්තරා බමුණකුට සාරම්භ නම් ගොනකු වූහ. බුදු රජහු මේ අතීත කථාව වදාරා මේ ගාථාව වදාළහ.

"කල්‍යාණිමෙව මුඤ්චෙය්‍ය නහි මුඤ්චෙය්‍ය පාපිකං,
මොක්ඛෝ කල්‍යාණියා සාධු මුත්වා තපති පාපිකන්ති"

"යහපත් වූ වචන ම මුවින් පිට කරන්නේය. ලාමක වචනයක් නොම නිකුත් කරන්නේය. යහපත් වචනයාගේ (කීම) යහපති. ලාමක තෙපුල් බැණ (දෙලොව) තැවෙන්නේය."

එහි, "කල්‍යාණිමෙව මුඤ්චෙය්‍යාති", සිව් දෝෂයන්ගෙන් මිදුණු යහපත් සුන්දර නිවැරදි වචන ම පිටකරන්නේය. විහිදු වන්නේය. කියන්නේය. "නහි මුඤ්චෙය්‍ය පාපිකන්ති", පවිටු පහත් අනුන්ට අප්‍රිය වූ අමනාප වූ වචන නො මුදන්නේය. නො කියන්නේය. "මොක්ඛෝ කල්‍යාණියා සාධූති", යහපත් වචන පිට කිරීම ම මෙලොව මැනවි. සුන්දරය. යහපත්ය. "මුත්වා තපති පාපිකන්ති", පවිටු, රළු වචන

පිටකොට, විසුරුවා, කියා ඒ පුද්ගලයා තැවෙයි. ශෝක කරයි. වැළපෙයි.

මෙසේ බුදුහු මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා ජාතකය නිමා කළහ. එකල බමුණා ආනන්ද විය. බැමිණිය උප්පලවණ්ණාවයි. සාරම්භ වනාහි මම ම වීමි.

## 1. 9. 9.

## කුහක ජාතකය

"වාචාව කිර තෙ ආසිති" යන මේ ජාතක දේශනාව බුදුහු දෙව්රම වැඩ වසන සේක්, එක් නැති ගුණ පෙන්වන භික්ෂුවක් අරබයා වදාළහ. මෙහි කථා පුවත උද්දාළ ජාතකයෙහි මතු සඳහන් වන්නේය.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කැරද්දී එක් කුඩා ගමක් ඇසුරුකොට එක් කපටි ජටිල තවුසෙක් වාසය කරයි. එක් කෙළඹි පුත්‍රයෙක් ඔහුට කැලයෙහි පන්සලක් කැරවා එහි ඔහු වාසය කැරවා තමාගේ ගෙයි ප්‍රණීත ආහාරයෙන් පෝෂණය කරයි. හෙතෙම ඒ කපටි ජටිලයා, මොහු සිල්වත් කෙනකු යි අදහා සොර බියෙන් රන් නික සියයක් (රන් කලන් 1500ක්) ඔහුගේ පන්සලට ගෙනවුත් නිදන් කොට පොළොවෙහි සඟවා මෙය රැකබලා ගන්නැ යි ස්වාමීන්ට කීවේය. ඉක්බිති, තාපසයා මිතුරු පැවිද්දන්ට නම් මෙසේ කියන්නට නො වටී. අපට අනුන්ගේ ධනය කෙරෙහි ලෝභයක් නැතැ යි ඔහුට කීවේය. ඔහු යහපතැ යි ඔහුගේ වදන අදහා ගියේය. දුෂ්ට තාපසයා මෙපමණකින් මට ජීවත් වීමට හැකිය. දින කීපයක් ඉක්මවා ඒ රන් ගෙන අතර මඟ එක් ස්ථානයක තබා ආපසු අවුත් පන්සලෙහි ම වැස දෙවැනි දිනයෙහි ඔහුගේ ගෙදර බත් කිස කොට මෙසේ කීය. සගය, අපි ඔබ ඇසුරුකොට කලක් මෙහි විසීමු. එක් තැනක දිගු කලක් වසන විට මිනිසුන් සමග ඇල්මක් ඇති වෙයි. බැඳීම වනාහි

පැවිද්දන්ට කිලුටකි. එම නිසා අපි යමු යි කියා කෙළඹියා නැවත නැවතත් ආයාචනා කළ නමුදු නැවතීමට කැමැති නො වීය. ඉක්බිති, ඒ කෙළඹියා එසේ නම් ස්වාමීනි, යනු මැනව යි ගම් දොරටුව දක්වා පසුගමන් කොට නැවතුණේය. තවුසා ටික දුරක් ගොස් මේ කෙළඹියා වංචා කළ යුතුයැ යි සිතා දළ මඬුල්ල අතරෙහි තණ ගහක් තබා ආපසු හැරුණේය. කෙළඹියා ස්වාමීනි, කුමක් නිසා ආපසු වැඩියේදැ යි විචාළේය. සගය, ඔබගේ ගෙපියස්සෙහි තණ ගසක් මගේ ජටාවෙහි රැඳුණේය. නුදුන් දේ ගැනීම පැවිද්දන්ට සුදුසු නො වේ. එම තණ ගස රැගෙන ආවෙමි. කෙළඹියා, ස්වාමීනි, එසේ නම් ඒ මෙහි දමා යන මැනවි. කියා අන්සතු වූ තණ ගසක් වුව ද මේ තවුසා නො ගනී. අහෝ, මගේ තාපසතුමා අතිසයින් කුකුස් ඇත්තෙකි යි වඩාත් පැහැදී වැඳ පිටත් කළේය.

එකල බෝසතුන් භාණ්ඩ සඳහා පසල් දනව්වකට යන කල්හි එම නිවසෙහි නවාතැන් ගන්නා ලද්දේ වෙයි. ඔහු තාපසයාගේ වචන අසා මේ පව්ටු තාපසයා විසින් මේ කෙළඹියාගේ යම්කිසි දෙයක් පැහැර ගන්නා ලද්දේය. කෙළඹියාගෙන් විචාළේය. යහළුව, මේ තවුසා ළඟ යම්කිසි දෙයක් තබන ලද්දේ ද ? එසේය, යහළුව. රන් නික සියයක් ඔහු ළඟ තබන ලද්දෙමි. එසේ නම් යව. එය සොයා බලනු. කෙළඹියා පන්සලට ගොස් ඒ රන් නික සියය නො දැක වහා ආපසු අවුත් යහළුව, නැතැ යි කීය. ඒ රන් රැස අනිකකු විසින් ගන්නා ලද්දේ නො වෙයි. ඒ පව්ටු තවුසා විසින් ගන්නා ලද්දේය. එව, තාපසයා ලුහුබැඳ එය ලබා ගනිමු. වේගයෙන් ගොස් පව්ටු තාපසයා අල්ලාගෙන අත් පාවලින් ගසා රන් නික සියය ලබා ගත්තේය. බෝසත්හු රන් රැස දැක මේ පව්ටු තවුසා රන් නික සියය පැහැර ගන්නේ එහි ඇල්මක් නො කොට තණ කොළ ගසෙහි ඇලෙන්නෙහි යි කියා ගර්හා කරමින් මේ ගාථාව කීවේය.

**"වාචාව කිර තෙ ආසි සණ්හා සඛිලභාණිනො,**
**තිණමත්තෙ අසජ්ජිත්ථො නො ච නික්ඛසතං හරන්ති"**

"මෘදු වූ තෙපුල් කියන්නා වූ තොපගේ වචන ම මටසිළිටි වී, තණ කෙන්දක් පමණක නො ඇලුණෙහි ය. (එහෙත්) නිෂ්ක සියයක් හැර ගෙන යන්නේ නො වෙහි ද ?"

එහි, "**වාචාව කිර තෙ ආසි සණ්හා සඛිලභාණිනොති**", පැවිද්දන්ට තණ ගහක් පමණකුදු නුදුන් දෙය ගැනීමට නො වටී. මෙසේ මිහිරි මෘදු වචන කියන ඔබගේ වචන මාත්‍රයට මටසිලිටු වූයේය යන අර්ථයි "**තිණමත්තෙ අසජ්ජිත්ථො**", කුළු තවුස, තණ පතක් පිළිබඳ සැක කරන්නේ, එහි ඇළුණේය. "**නො ච නික්ඛසතං හරන්ති**", රන් නික සියයක් පැහැර ගන්නා ඔබ නො ඇළුණේ, ආශා නො කළේ වෙහිය.

මෙසේ බෝසත්හු ඔහුට දොස් පවරා හොර තාපසය, මින්මතු මෙවැන්නක් නො කැරව යි, අවවාද කොට කම් වූ පරිදි මිය ගියේය. බුදුහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා මහණෙනි, මේ මහණ කුහක වූයේ දැන් පමණක් නො වේ. පෙර ද කුහකයකු වූයේයැ යි වදාරා ජාතකය නිමවූහ. එදා කුහක ජටිල තාපසයා දැන් කුහක භික්ෂුව විය. නුවණැති පුරුෂයා මම ම වීමි.

## 1. 9. 10.

## අකතඤ්ඤු ජාතකය

"**යො පුබ්බෙ කතකල්‍යාණොති**", යන මේ ජාතක දේශනාව බුදු රජහු ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, අනේපිඬු සිටුතුමා අරබයා වදාළහ. ඔහුට වනාහි පසල් දනව්වක වැසි එක් සිටුවරයකු නො දුටු මිත්‍රයකු විය. හෙතෙම එක් දිනක් පසල් ගමක උපදනා භාණ්ඩවලින් ගැල් පන්සියයක් පුරවාගෙන කර්මාන්තයෙහි නියුක්ත මිනිසුන්ට කීවේය. භවතුනි, යවු. මේ බඩු සැවැත් නුවරට ගෙනගොස් අපගේ යහළු අනේපිඬු මහා සිටුහුගේ අධීක්ෂණයෙන් විකුණා වෙනත් බඩු ගෙන එවු. ඔවුහු යහපතැ යි ඔහුගේ වචනය පිළිගෙන සැවැත් නුවරට ගොස් මහසිටුතුමා දැක පඬුරු, තෑගි බෝග දී ඒ පුවත සැල කළාහුය. මහසිටුතුමා තොපගේ පැමිණීම යහපතැ යි ඔවුන්ට නවාතැන් ද මඟ වියදම් ද දෙවා යහළුවාගේ සැපදුක් විචාරා බඩු විකුණා වෙනත් බඩු දෙවීය. ඔවුන් පිටිසර ගමට ගොස් ඒ බව

තමන්ගේ සිටුතුමාට සැල කළාහුය.

ඉක්බිති, පසු කලෙක අනේපිඬු සිටුතුමා ද එසේ ම පන්සියයක් ගැල් එහි යැවීය. මිනිස්සු එහි ගොස් පුද පඬුරු ගෙන පසල් ගම් වැසි සිටුතුමා බැහැ දැක්කාහ. හෙතෙම කොහි සිට ආවාහුද යි විචාරා සැවැත් නුවර සිට නුඹ වහන්සේගේ යහළු අනාථ පිණ්ඩික සිටුතුමාගේ සමීපයේ සිටයැ යි කී කල්හි, අනේපිඬු සිටු යනු කිසියම් පුරුෂයකුගේ නමක් විය යුතු වන්නේයැ යි අපහාස කොට තෑගිබෝග ගෙන නුඹලා යවුයැ යි පිටත් කළේය. නවාතැන් නුදුන්නේය. මඟ වියදම් නො දෙවීය. ඔවුන් තෙමේ ම බඩු විකුණා පෙරළා බඩු ගෙන සැවැත් නුවරට ගොස් සිටුතුමාට ඒ ප්‍රවෘත්තිය සැලකළාහුය.

ඉක්බිති, ඒ පසල් දනව් වැසියා නැවත එක්වරක් එසේ ම ගැල් පන්සියයක් සැවැත් නුවරට යැවීය. මිනිස්සු පඬුරු ගැල් පන්සියයක් සැවැත් නුවරට යැවීය. මිනිස්සු පඬුරු ආදිය ගෙන මහසිටුහු බැහැ දුටහ. ඔවුන් දැක අනේපිඬු සිටුහුගේ ගෙයි මිනිස්සු ස්වාමීනි, අපි මොවුන්ට නවාතැන් ද බත් ද මඟ වියදම් ද දෙන්නෙමු යි කියා ඔවුන්ගේ ගැල් නගරයෙන් පිට තැනක මුදවා තෙපි මෙහි ම වසවු. අපගේ ගෙයි තොපට කැඳ ද බත් ද මඟ වියදම් ද වන්නේයැ යි ගොස් දාස කම්කරුවන් රැස්කැරවා මැදුම් යමට ඉතා ආසන්නයේ පන්සියයක් ගැල් පහරා ඇඳ පෙරවූ දේ ද ඔවුන්ට අහිමිකැරවා ගොනුන් පලවා හැර ගැලින් වෙන්කොට බිම තබා රෝද ද රැගෙන ම ගියාහුය. පිටිසර ගැමි වැස්සෝ ද ඇඳිවතට පවා අහිමි ව බියෙන් වේගයෙන් පලාගොස් පසල් දනව්වට ම ගියහ. සිටුතුමාගේ මිනිස්සු ද එපවත් අසා ඔහුට සැලකළහ. හෙතෙම මට දැන් කථා පඬුරක් ඇතැ යි බුදු රජුන් වෙතට එළැඹ මුලු පටන් ඒ පුවත සැල කළේය. එවිට බුදු රජහු ගෘහපතිය, මේ පිටිසර වැසියා මෙබඳු පැවතුම් ඇත්තෙක් වනුයේ දැන් පමණක් නොව, පෙරත් මෙබඳු පැවතුම් ඇත්තෙක්යැ යි වදාරා, ඔහු විසින් අයදනා ලද බුදු රජහු අතීත කථාව ගෙනහැර දැක්වූහ.

යටගිය දවස බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු බරණැස් නුවර මහත් සම්පත් ඇති සිටු කෙනෙක් වූහ. ඔහුට එක නුදුටු යහළුවකු වූ පසල් දනවු වාසී සිටුවරයකු විය.

මෙතැන් පටන් අතීත කථා පුවත ද වත්මන් කථා පුවත හා සමාන මය. බෝසත්හු වනාහි තමාගේ මිනිසුන් විසින් අද අප විසින් මේ මේ දේ කරන ලද්‍ද යි කියන ලද කල්හි පළමු කොට තමාට කරන ලද උපකාරය නො දන්න අදත් මෙබඳු උදව් ලැබෙතැ යි වදාරා පැමිණි පිරිසට දම් දෙසනු, මේ ගාථාව වදාළහ.

"යො පුබ්බෙ කතකල්‍යාණො කතත්‍ථො නාවබුජ්ඣති
පච්ඡා කිච්චෙ සමුප්පන්නෙ කත්තාරං නාධිගච්ඡතීති"

"යමෙක් පෙර කරන ලද යහපත් උපකාර ඇත්තෝ කරන ලද යහපත නො දනී ද පසු ව කටයුත්තක් පැමිණි කල්හි (ඔහුට) එය කරන්නා අවබෝධ කැර නො ගනිත්."

මේ එහි කැටිකළ අරුතයි. ක්‍ෂත්‍රිය ආදීන් අතුරෙහි, "යො", යම්කිසි පුරුෂයෙක්, "පුබ්බෙ", පළමු කොට අනෙකකු විසින්, "කතකල්‍යාණො", කරන ලද උපකාර ඇත්තකු, "කතත්‍ථො", කරන ලද යහපත ඇත්තකු වී එය අනුන් විසින් තමාට කරන ලද යහපතක් ද උපකාරයක්ද්‍ද යි නො දනී ඔහු, "කිච්චෙ සමුප්පන්නෙ", ඒ කාර්යයට, "කත්තාරං නාධිගච්ඡති", කරන්නා අවබෝධ කැර නො ගනී.

මෙසේ බෝසත්හු මේ ගාථාවෙන් දම් දෙසා දානාදී පිංකම් කොට කම් වූ පරිදි මිය ගියේය. බුදු රජහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා ජාතකය නිම කළහ. එදා පසල් දනව් වැසියා නම් දැන් පසල් දනව් වැසියා මය. බරණැස් සිටුතුමා වනාහි මම ම වෙමි.

## නව වැනි අපායිම්හ වර්ගයයි.

## 1. 10. 1.

# ලිත්ත ජාතකය

"ලිත්තං පරමෙන තෙජසා'ති" යන මේ ජාතක දේශනාව බුදුහු ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, ප්‍රත්‍යවේක්‍ෂා නො කොට කළ පරිභෝගයක් අරබයා වදාළහ.

එකල්හි වනාහි භික්‍ෂූහු සිවුරු ආදිය ලැබ බොහෝ සෙයින් ප්‍රත්‍යවේක්‍ෂා නො කොට පරිභෝග කරත්. ඒ සිව්පසයෙහි ප්‍රත්‍යවේක්‍ෂා නොකොට පරිභෝග කරන ලබන්නාහු, බොහෝ සෙයින් නිරය, තිරිසන් යෝනියෙන් නො මිදෙත්. බුදුහු ඒ කාරණය දැන භික්‍ෂූන්ට නොයෙක් ආකාරයෙන් ධර්ම කථා කියා ප්‍රත්‍යවේක්‍ෂා නො කොට පරිභෝග කිරීමෙහි ආදීන ව දක්වා, මහණෙනි, භික්‍ෂූන් විසින් සිව්පසය ලැබ ප්‍රත්‍යවේක්‍ෂා නො කොට පරිභෝග කරන්නට නො වටියි. ඒ නිසා මෙතැන් පටන් ප්‍රත්‍යවේක්‍ෂා කොට පරිභෝජනය කළ යුතුයැ යි ප්‍රත්‍යවේක්‍ෂා විදි දක්වන්නේ, මහණෙනි, මෙහි භික්‍ෂුව නුවණින් මෙනෙහි කොට සිවුරු පරිභෝග කරන්නේ ශීත නැසීම සඳහායි, ආදී නයින් පරියාප්තිය තබා මහණෙනි, සිව්පසෙහි මෙසේ ප්‍රත්‍යවේක්‍ෂා කොට පරිභෝග කරන්නට වටියි. ප්‍රත්‍යවේක්‍ෂා නො කොට පරිභෝගය නම් හලාහල විෂ පරිභෝග කිරීමට සමාන වේ. පැරැන්නෙක් ප්‍රත්‍යවේක්‍ෂා නො කොට එහි දොස් නො දැන විෂ පරිභෝග කොට විපාක දෙන කල්හි මහ දුක් අනුභව කළාහුයැ යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

යටගිය දවස බරණැස් නුවර බඹදත් රජු රජ කැරද්දී බෝසත්හු එක්තරා මහා භෝග සම්පත් ඇති කුලයක ඉපදී වැඩි වියට පත්ව අක්‍ෂ ධූර්තයකු විය. ඉක්බිති, වෙනත් කපටි අක්‍ෂ ධූර්තයෙක් බෝසතුන් සමග ක්‍රීඩා කරන්නේ, තමන්ට ජය ලැබෙන විට කෙළිමඬල නො බිඳියි. පැරදුණු කල්හි වනාහි පසැට කටේ දමාගෙන දාදු කෙළිය නැසුනේයැ යි කෙළිමඬල බිඳ යයි. බෝසත්හු ඔහුගේ ඒ කරුණා දැන මෙහි කළ යුතු සුදුසු දෙය දනිමු යි පසැට රැගෙන තමාගේ ගෙට ගොස් හලාහල විෂ ආලෝප කොට නැවත නැවත වියළුවා ඒ රැගෙන ඔහු වෙත ගොස් යහළුව, එව. පසැට ක්‍රීඩා කරමු

යි කීය. ඔහු ද මැනවැ යි පිළිගෙන කෙළිමඬල සකසා ඔහු සමග ක්‍රීඩා කරන කල්හි තමාට පරාජය පැමිණෙන කල එක් අතක් මුවෙහි දැමිය. බෝසත්හු එසේ කරනු දැක පසැට ගිලදැමූ පසුව තට වන දේ දැන ගන්නෙහියැ යි චෝදනා කිරීම සඳහා මේ ගාථාව කීහ.

"ලිත්තං පරමෙන තෙජසා
ගිලමක්ඛං පුරිසො න බුජ්ඣති,
ගිලරෙ, ගිල පාපධුත්තක,
පච්ඡා තෙ කටුකං භවිස්සතීති"

"මහා තේජස් ඇති හලාහල විෂයෙන් රැඳුණු පස ඇට ගිලින්නා වූ පුරුෂ තෙමේ (එහි විෂ රැඳුණු බව) නො දනී. නීචය, (පස ඇට) ගිල, පාපධූර්තය ගිල පසුව හෙවත් මෙය ගිල දැමූ කල තට කටුක විපාකයෙක් වන්නේය."

එහි, "ලිත්තන්ති", ගාන ලද, රංජනය කරන ලද, "පරමෙන තෙජසාති", උතුම් තේජසින් යුක්ත වූ හලාහල විෂ, "ගිලන්ති", ගිලින්නේ, "අක්ඛන්ති", පස ඇට, "න බුජ්ඣති", මේ පසැටය. ගිලුණු විට මෙනම් දෙයක් වන්නේයැ යි නො දනීම්. "ගිලරෙති", එම්බල, ගිල දමව. "ගිලාති", නැවතත් චෝදනා කැරෙමින් කියයි. "පච්ඡා තෙ කටුකං භවිස්සතීති", මේ පසැට ගිලනු කල්හි පසු ව මේ විෂ තියුණු වන්නේය යන අර්ථයි.

හෙතෙම බෝසතුන් මෙසේ කියද්දී ම විෂ වේගයෙන් මුසපත් වී ඇස් පෙරළී සිරුර නැමී වැටුණේය. බෝසත්හු දැන් මොහුට ජීවිත දානය කළ යුතුයැ යි ඖෂධ යෙදූ වමන කාරකයක් දී වමනය කැරවා ගිතෙල්, මී පැණි, හකුරු ආදිය කවා සුවපත් කැරවා නැවත මෙබඳු දෙයක් නො කැරව යි අවවාද කොට දානාදී පිංකම් කොට කම් වූ පරිදි මිය ගියේය. බුදු රජහු මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා ප්‍රත්‍යවේක්ෂා නො කොට කළ පරිභෝගය නම් නුවණින් නො විමසා කළ විෂ පරිභෝගය සමාන වෙයි, වදාරා ජාතක කථාව නිමවූහ. එදින නුවණ ඇති ධූර්ථයා නම් මම ම වෙමි යි. කපටි

ධූර්තයා ගැන මෙහි නො කියැ වේ. මෙපරිද්දෙන් සියලු තන්හි ම ගත යුතුයි. යමකු වර්තමාන කථාවෙහි නො පෙනේ ද, ඔහු ගැන නො කියනු ලැබේ.

## 1. 10. 2.

## මහාසාර ජාතකය

"උක්කට්ඨෙ සූරමිච්ඡන්තීති" යන මේ ජාතක දේශනාව බුදුහු ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, ආයුෂ්මත් ආනන්ද තෙරුන් අරබයා වදාළහ. එක් කලක කොසොල් රජුගේ ස්ත්‍රීහු මෙසේ සිතුවාහුය. බුද්ධෝත්පාදය දුර්ලභය. මිනිස් බවක් ලැබීම ද පිරිපුන් ඇස්, කන් ආදී ආයතන ඇති බව ද එසේ මය. අපි මේ දුර්ලභ අවස්ථා ලැබුව ද අපේ කැමැත්ත පරිදි විහාරයට ගොස් බණ අසන්නට හෝ පූජාවක් කරන්නට හෝ දානයක් දෙන්නට හෝ නො ලබමු. පෙට්ටියක දමන ලද්දෝ මෙන් වසමු. රජතුමාට කියා අපට දම් දෙසන්නට සුදුසු එක් භික්ෂුවක් කැඳවා උන් වහන්සේගේ සමීපයෙහි බණ අසන්නෙමු. එයින් යමක් ගත හැකිවන්නේ නම් එය ගන්නෙමු. දානාදී පිං කරන්නෙමු. මෙසේ අපට මේ ක්ෂණ සම්පත ලැබීම (මිනිසත් බව ලැබීම) සඵල වන්නේය. ඒ සියලු ස්ත්‍රීහු රජු වෙත එළැඹ තමන් සිතූ කරුණ කීවාහුය. රජතුමා යහපතැ යි පිළිගත්තේය.

ඉක්බිති, එක් දිනක් රජතුමා උයන් කෙළි කෙළිනු කැමැත්තේ, උයන්පල්ලා කැඳවා උයන ශුද්ධ කරන්නැ යි කීවේය. උයන්පල්ලා උයන ශුද්ධ කරන්නේ, බුදු රජුන් එක් ගසක් මුල වැඩ සිටිනු දැක රජු සමීපයට ගොස් දේවයන් වහන්ස, ශුද්ධ කළෙමි. උයනෙහි එක් ගසක් මුල බුදු රජහු වැඩ සිටිතැ යි කීවේය. රජතුමා, යහළුව, යහපති. බුදු රජුන් සමීපයෙහි ධර්මය ද අසන්නෙමු යි අලංකාර රථයකට නැඟී උයනට ගොස් බුදුන් වෙතට ගියේය. ඒ අවස්ථාවෙහි ඡත්තපාණී නම් එක් අනාගාමී උපාසකයෙක් බුදු රජුන් සමීපයෙහි බණ අසමින් හුන්නේ වෙයි. රජතුමා ඔහු දැක සැක කැරෙමින්

මොහොතක් සිට නැවත ඉදින්, මේ තෙමේ පව්ටෙක් වන්නේ නම් බුදු රජුන් සමීපයේ සිට බණ නො අසන්නේය. මොහු පව්ටකු නො විය යුතුයැ යි සිතා බුදු රජුන් වෙත එළැඹ වැඳ එකත්පසෙක හුන්නේය. උපාසකයා බුදුන් කෙරෙහි ගෞරවයෙන් රජුට පෙර ගමන් කිරීමක් හෝ වැඳීමක් හෝ නො කළේය. ඒ නිසා ඔහු කෙරෙහි රජතුමා නො සතුටු විය.

බුදු රජහු, ඔහු අමනාප වූ බව දැන උපාසකයාගේ ගුණ කීවේය. මහරජ, මේ උපාසක තෙම බොහෝ ඇසූපිරූ තැන් ඇති, ධර්මය උගත්, කාමයන්හි නො ඇලුණේ වෙයි. රජ, බුදු රජ යමකුගේ ගුණ කියයි ද, මොහු ලාමක කෙනකු නො විය යුතුයැ යි සිතා උපාසකය, ඔබට යම් කිසි අවශ්‍යතාවක් ඇත්නම් කියන්න. උපාසකයා යහපතැ යි පිළිගත්තේය. රජ, බුදුන් සමීපයෙහි බණ අසා ශාස්තෘන් වහන්සේ පැදකුණු කොට ගියේය.

රජ එක් දිනක් ප්‍රාසාදයෙහි මතු මහලෙහි මහා වා කවුළු විවර කොට සිටියේ, ඒ උපාසකයා ගන්නා ලද උදේ ආහාර ඇත්තේ, කුඩය රැගෙන ජේතවනයට යනු දැක කැඳවා මෙසේ කීවේය. උපාසකය, නුඹ වනාහි උගතෙක් වෙහි. අපගේ ස්ත්‍රීහු බණ අසනු කැමැත්තෝ ද ඉගෙන ගනු කැමැත්තෝ ද වෙති. ඉදින්, ඔවුන්ට ධර්මය කියා දෙන්නේ නම් යහපතකි. දේවයන් වහන්ස, රජ ගෙදර අන්තඃපුරයෙහි බණ කීමට හෝ ඉගැන්වීමට ගිහියන්ට සුදුසු නො වේ. පැවිදි භික්ෂූහු ම සුදුස්සෝ වෙති. රජතුමා ඔහු කියන්නේ සත්‍යයකැ යි ඔහු යවා ස්ත්‍රීන් කැඳවා සොඳුරියනි, මම තොපට බණ කීමට ද ඉගැන්වීමට ද බුදුන් වෙත ගොස් එක් භික්ෂුවක් ඉල්ලමි. අසූ මහා ශ්‍රාවකයන් අතුරෙන් කවරකු නම් ඉල්ලන්නදැ යි ඇසීය. ඒ ස්ත්‍රීහු සියලු දෙන සාකච්ඡා කොට ධම්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරුන් ම කැමැති වූහ. රජ, බුදුන් වෙත ගොස් වැඳ එකත් පසෙක හුන්නේ, මෙසේ කීවේය. ස්වාමීනි, අපගේ ගෙදර ස්ත්‍රීහු ආනන්ද තෙරුන්ගේ සමීපයෙහි බණ අසන්නට ද ඉගෙන ගන්නට ද කැමැති වෙත්. ඉදින්, තෙරුන් අපගේ ගෙයි බණ කීම හා ඉගැන්වීම කරන්නේ නම් ඒකාන්තයෙන් යහපති. බුදුහු යහපතැ යි පිළිගෙන තෙරුන්ට අණ කළහ.

එතැන් පටන් රජුගේ ස්ත්‍රීහු තෙරුන් සමීපයෙහි බණ අසත්. උගනිත්. එක් දවසක් රජුගේ සිළුමිණ නැති විය. රජු එය නැති වූ බව අසා ඇමැතියන්ට මෙසේ අණ කළේය. සියලු රජ මැඳුර ඇතුළත පරිහරණය කරන ජනයා ගෙන සිළුමිණ සොයවු. ඇමැතියෝ ගැහැනුන් ආදීකොට සිළුමිණ ගැන විචාරන්නාහු, නො දුක මහජනයාට හිංසා කළහ. එදවස අනඳ තෙරණුවෝ රජ නිවසට වැඩියහ. පෙර ඒ ස්ත්‍රීහු තෙරුන් දුක සතුටු සිතින් දහම් අසත්. උගනිත්. මෙදින එසේ නෙ කොට සියලු ස්ත්‍රීහු දොම්නසට පත්වූවෝ වූහ. ඉක්බිති, අනඳ තෙරුන් විසින් කුමක් නිසා අද තොපි මෙසේ වූවාහුද්‍ද යි විචාරණ ලද්දාහු, මෙසේ කීහ. ස්වාමීනි, රජුගේ සිළුමිණ සොයන්නෙමු. ඇමැතියෝ මාගමුන් පටන් රජගේ ඇතුළත සිටිනවුන් වෙහෙසත්. මේ නිසා කවරකුට කුමක් වේදෝ යි අපි නො දනිමු. ඒ නිසා දොම්නසට පැමිණියාහු වෙමු. එවිට තෙරණුවෝ ඒ ගැන ශෝක නො කැරනු යි, ඔවුන් සනසා රජු වෙතට ගොස් පනවන ලද ආසනයෙහි වැඩ හිඳ මහරජ, ඔබගේ මැණික නටුවේද්‍ද යි විචාළහ. එසේය, ස්වාමීනි. එය ගෙන්වා ගැනීමට නො හැකි වූයෙහි ද ? ස්වාමීනි, සියලු ඇතුළත ජනයා තැති ගැන්වුව ද මැණික ගෙන්වා ගැනීමට නො හැකි වූයේය. මහරජ, මැණික ගෙන්වා ගැනීමේ උපායක් ඇත. ස්වාමීනි, ඒ කවර උපායක් ද ? මැටි පිඬු දීමයි. ස්වාමීනි, කුමන පිඬු දීමක් ද ? ඔවුන් ගණන්කොට එක එකාට පිදුරු පිඩක් හෝ මැටි පිඩක් දී මෙය ඉතා අලුයම් කාලෙහි ගෙනවුත් අසවල් තැන දැමිය යුතුයැ යි කිය යුතුයි. යමකු විසින් මැණික ගන්නා ලද්දේ නම් වී නම් හෙතෙම ඒ පිඩ තුළ මැණික ඇතුළත් කොට ගෙන එන්නේය. ඉදින්, පළමු වැනි දවසේ ම එහි දමයි, නම් ඒ ඉතා මැනවි. එසේ නො දැමුවේ නම් දෙවැනි, තුන් වැනි දිනවල ද එසේ කළ යුතුයි. මෙසේ කළ කල්හි මහජනයාට පීඩා නො වන්නේය. මැණික ද ලබන්නේය. මෙසේ වදාරා තෙරණුවෝ වැඩියහ.

රජතුමා කියන ලද ක්‍රමයෙන් ම තුන් දවසක් දෙවීය. එහෙත් මැණික නො ගෙනාවාහුය. තෙරණුවෝ තුන් වැනි දවසේ අවුත් මහරජ, මැණික හෙළන ලද්දේද්‍ද යි විචාළහ. නැත, ස්වාමීනි. එසේ නම් මහරජ, උඩුමහල් තලයෙහි ආවරණ වූ තැනක මහා සැළියක් තබවා ජලය පුරවා තිරයකින් වටකොට සියලු ඇතුළත වෙසෙන මිනිස්සු ද ස්ත්‍රීහු ද උතුරු සළුවෙන් වසාගෙන හුදකලා ව තිරයෙන්

ඇතුළතට පිවිස අත් සෝදා ගෙන එනුව යි කියව. තෙරණුවෝ මේ උපාය ප්‍රකාශ කොට වැඩියහ. රජතුමා ද එසේ කැරවීය. මැණික් සොරා මෙසේ සිතීය. ධම්ම භාණ්ඩාගාරික අනඳ තෙරණුවෝ මේ මැණික් අවුල තමා අතට ගෙන මැණික නො පෙන්නා පසු බසින්නේය. යන මේ කාරණය සිදු නොවන්නකි. එමනිසා මැණික ජලයෙහි දමන්නට සුදුසුයැ යි සිතා මැණික සඟවාගෙන ගොස් සැළියෙහි හෙළා නික්මුණේය. සියල්ලෝම නික්ම ගිය කල්හි ජලය බැහැර කොට මැණික දක්කාහ.

රජතුමා තෙරහු නිසා මහජනයාට පීඩා නො කොට මේ මැණික ලබන ලද්දේයැ යි සතුටු විය. ඇතුළත වසන මිනිස්සු ද තෙරුන් නිසා මහ දුකකින් මිදුණේ වෙමු යි සතුටු වූහ. තෙරුන්ගේ ආනුභාවයෙන් රජුගේ සිළුමිණ ලබන ලද්දේයැ යි තෙරුන්ගේ ආනුභාවය මුළු නගරයෙහි ද භික්‍ෂූන් අතර ද ප්‍රකට විය. දම් සබාවෙහි වැඩහුන් භික්‍ෂූහු ඇවැත්නි, අනඳ තෙරණුවෝ බහුශ්‍රැත බැවින් ද නුවණ ඇති බැවින් ද උපායෙහි දක්‍ෂ බැවින් ද මහජනයාට පීඩා නො කොට උපායෙන් ම රජුට මැණික ලබා දුන්හ. බුදු රජහු වැඩමවා මහණෙනි, දැන් මෙහි කවර කථාවකින් හුන්නාහුදැ යි විචාරා මෙනම් කථාවකින් හුන්නෙමු යි කී කල්හි මහණෙනි, ආනන්ද අනුන් අතට ගියා වූ භාණ්ඩය දක්වූවාහු, දැන් පමණක් නො වෙයි. පෙර ද පණ්ඩිතයෝ මහජනයා නො පෙළා උපායෙන් තිරිසනුන් අතට පත්වූ භාණ්ඩය දක්වූහැ යි වදාරා අතීත කථාව ගෙනහැර දක්වූහ.

යටගිය දවස බරණැස් නුවර බඹදත් රජු රජ කරද්දී බෝසත්හු සියලු ශිල්පයන්හි නිමාවට පැමිණියාහු, ඔහුගේ ම ඇමැතියා වූහ. ඉක්බිති, එක් දිනක් රජතුමා මහත් පිරිවරින් උයනට ගොස් වනය අතරින් ඇවිද දිය කෙළි කෙළනු කැමැත්තේ, මඟුල් පොකුණට බැස අන්තඃපුරය ද කැඳවීය. ස්ත්‍රීහු තම තමන්ගේ හිස් පළඳනා හා ගෙල පළඳනාවන් (ආභරණ) ගළවා උතුරු සළුවල බහා මංජුසා පිට තබා දාසියන්ට පවරා දී පොකුණට බැස්සාහ.

ඉක්බිති, ඒ උයනේ වැඳිරියක් අතු අතරෙහි හුන්නී, දේවිය ආභරණ ගළවා උතුරු සළුවෙහි දමා සුමුග මතුයෙහි තබනු දැක ඇගේ මුතුහර පැළඳ ගනු කැමැති වී දාසියගේ ප්‍රමාදයක් බලමින්

හුන්නාය. දාසිය ද එය රකිමින් ඒ මේ අත බලමින් හිඳිද්දී ම නිදි කිරන්නට පටන් ගත්තාය. වැඳිරිය ඇගේ ප්‍රමාද බව දැන වාත වේගයෙන් (වහා) ගසෙන් බැස මහමුතුහර බෙල්ලෙහි පැළඳගෙන වහා ගසට නැග අතු අතරෙහි හිඳ අනිත් වැඳිරියන්ට පෙනේය යන බියෙන් එක්තරා ගස් බෙනයක තබා තැන්පත් වූවෙක් සේ එය රකිමින් හුන්නාය.

ඒ දාසිය වනාහි පිබිදී මුතුහර නො දකින්නී, වෙවුලමින් වෙනත් උපයක් නො දැක පුරුෂයකු දේවියගේ මිතුහර ගෙන පලා ගියේයැ යි මහත් සේ ශබ්ද කළාය. ආරක්ෂක මිනිස්සු ඒ ඒ තැනින් රැස්වී ඇගේ වචන අසා රජුට සැලකළාහුය. රජ සොරා ගනිවු යි කීවේය. මිනිස්සු උයනෙන් නික්මී සොරා ගනිවු, ගනිවුයැ යි ඒ මේ අත සොයා බලත්.

ඉක්බිති, එක් ජනපද වැසි බඳු එකතු කරන මිනිසෙක් ඒ ශබ්දය අසා වෙවුලමින් පලා ගියේය. ඒ දැක රාජ පුරුෂයෝ මේ තෙමේ සොරකු වන්නේයැ යි ලුහුබැඳ ඔහු ගෙන තලා එම්බල දුෂ්ට සොර, මෙසේ මහාසාර නම් පළඳනාව පැහැර ගෙන යන්නේයැයි පරිභව කළාහුය. හෙතෙම මෙසේ සිතීය. ඉදින්, මම නො ගත්තෙමි යි කීවොත් මගේ ජීවිතය නැත. තලා පොඩි කිරීමෙන් ම මා මරන්නේය. එය පිළිගනිමි යි, හෙතෙම එසේය, ස්වාමීනි. මා විසින් ගන්නා ලද්දැ යි කීවේය. ඉක්බිති, ඔහු බැඳ රජු සමීපයට පැමිණවූහ. රජතුමා ද ඔහු විචාළේය. නුඹ විසින් මහාසාර පළඳනාව ගන්නා ලද්දේ ද ? එසේය, දෙවයන් වහන්ස. දැන් එය කොහි ද ? දේවයන් වහන්ස, මා විසින් මහාසාර නම් ඇඳ, පුටුවක්ද පෙර නුදුටු විරූය. සිටුතුමා මා ලවා මහාසාර පළඳනාව අරගත්තේය. ඒ මම ගෙන ඔහුට දුන්නෙමි. හෙතෙම එය දනියි.

රජතුමා, සිටුතුමා කැඳවා මොහු අතින් මහාසාර පළඳනාව ගන්නා ලදද්දැ යි විචාළේය. එසේය, දේවයන් වහන්ස. දැන් එය කොහි ද ? පුරෝහිතයාට දෙන ලද්දේය. පුරෝහිතයා ද කැඳවා එසේ ම විචාළේය. ඔහු ද පිළිගෙන මා විසින් එය ගාන්ධර්වයාට දෙන ලද්දේ යි කීය. ඔහු ද කැඳවා පුරෝහිතයාගේ අතින් නුඹ මහාසාර පළඳනාව ගත්තා ලදද්දැ යි විචාළේය. එසේය, දෙවයන් වහන්ස. දැන්

එය කොහි ද ? ආසාවට වෙසඟනට දෙන ලදී. ඇය ද කැඳවා විචාළේය. ඈ නො ගත්තෙමි යි කීවාය. ඒ පස් දෙනා විමසද්දී ම හිරු අවරට ගියේය.

රජතුමා දූන් අවේලාව පැමිණියේය. හෙට දූනගන්නෙමු යි ඒ පස් දෙනා ඇමැතියන්ට පවරා නගරයට පිවිසියේය. බෝසත්හු මෙසේ සිතූහ. මේ පළඳනාව ඇතුළත පිරිවර ජනයාගෙන් නටුවේ විය. මේ ගෘහපති තෙම පිටත කෙනෙකි. දොරටුවෙහි ද ආරක්‍ෂාව දැඩිය. ඒ නිසා ඇතුළත පිරිවර ජනයාට එය ගෙන පලා යන්නට නො හැකිය. පිටත හැසිරෙන ජනයාට ඇතුළට පැමිණීමට නො හැකිය. උයනෙහි හැසිරෙන උන්ට ගතහැකි උපායක් පෙනෙයි. මේ දුගී මිනිසා විසින් මවිසින් සිටුවරයාට දෙන ලදූ යි කියන ලද්දේ තමාට වරදින් මිදීම සඳහා විය යුතුය. සිටුවරයා විසින් ද මවිසින් පුරෝහිතයට දෙන ලදූ යි කියන ලද්දේ දෙදෙනා එකතු වී වරදින් එතැර වන්නෙමි යි සිතා විය යුතුය. පුරෝහිතයා විසින් ද මවිසින් ගඳබයාට දෙන ලදූ යි කියන ලද්දේ සිර ගෙදර දී ගඳබයා ඇසුරු කොට සුව සේ වෙමි යි සිතා විය යුතුයි. ගඳබයා විසින් ද මවිසින් වෙසඟනට දෙන ලදූ යි කියන ලද්දේ උකටලී නො වී වෙසෙමි යි සිතා විය යුතුය. එම නිසා මේ පස් දෙනා ම සොරුන් නො විය යුතුයි. උයනෙහි වඳුරෝ බොහෝය. එක් වැඳිරියකගේ අතෙහි මේ පළඳනාව රැඳුණා විය යුතුය.

බෝසත්හු රජු වෙත එළැඹ මහරජ, සොරුන් අපට පාවා දෙනු මැනවි. අපි එම කාර්යය විසඳන්නෙමු යි කීහ. රජතුමා පණ්ඩිතයිනි, මැනවි. විසඳව යි සොරුන් ඔහුට පාවා දුන්නේය. බෝසත්හු තමාගේ අතවැසි පුරුෂයන් කැඳවා ඒ මිනිසුන් පස් දෙනා එක ම ස්ථානයක රඳවා, අවට ආරක්‍ෂාව යොදා කන්යොමා සිට ඔවුනොවුන් කථා කරන දෙය මට කියව යි දාසයින්ට කියා ගියහ. ඔවුහු ද එසේ ම කළහ.

ඉක්බිති, මිනිසුන් එකට හිඳින වේලාවෙහි සිටු තෙම ඒ ගෘහපතියා ගෙන් මෙසේ ඇසීය. එම්බල දුෂ්ට ගෘහපතිය, තා විසින් මා හෝ මා විසින් තා හෝ කොතනක දී හෝ පෙර දුටු විරූ ද? පළඳනාව මට කවදා දෙන ලද්දේ ද ? හිමියනි, මහසිටුතුමනි, මම

මහාසාර පළඳනාව තබා රුක් හරයෙන් කළ පා ඇති ඇද පුටුවක්වත් නො දනිමි. ඔබ නිසා මේ වරදින් මිදීම ලබමි යි, එසේ කීමි. ස්වාමීනි, මට නො කිපෙනු මැනවි. පුරෝහිතයා ද සිටුවරයාට මෙසේ කීය. මහසිටුවරය, මොහු විසින් තමාට නො දෙන ලද පළඳනාව කෙසේ නම් මට දුන්නේ ද ? එවිට සිටුවරයා අපි දෙදෙනා ම අධිපතියෝ වෙමු. අප එකතුව සිටි කල්හි මේ කාර්යය වහා විසඳන්නේයැ යි, එසේ කීමි. ගඳබයා ද පුරෝහිතයාට මෙසේ කීය. බමුණ, ඔබ විසින් ඒ පළඳනාව මට කවදා දෙනු ලැබී ද ? මම ඒ නිසා ඔබ වසන තැන සුවසේ වෙසෙමි යි, එසේ කීමි. වෙසඟන ද ගන්ධබ්බයාට මෙසේ කීවාය. එම්බල පව්ටු ගඳබය, මම කවදා තා ළඟට ගියෙමි ද ? තෝ හෝ මා වෙත කවදා ආවේ ද ? කවදා මට ඒ පළඳනාව දෙන ලද්දේ ද ? නැගනියනි, කුමකට කිපෙන්නෙහි ද ? අප පස් දෙනා එකතුව වසන කල්හි ගෘහ වාසයක් හා සමාන වන්නේය. උකටලී නො වී අපි පස් දෙනා සුවසේ වෙසෙමු යි, එසේ කීවෙමි.

බෝසත්හු තමා විසින් යොදන ලද ඒ මිනිසුන්ගෙන් මේ කථාව අසා ඒ පස් දෙනා ඇත්ත වශයෙන් ම සොරුන් නො වන බව දැන වැඳිරිය විසින් ගන්නා ලද ඒ පළඳනාව උපායෙන් හෙළන්නෙමි යි ඇටවලින් තැනූ බොහෝ පළඳනාවන් කැරවා උයනෙහි වැඳිරියන් අල්ලා අත් පා ගෙල ආදියෙහි ඇටමාල පළඳවා අතහැරියේය. අනෙක් වැඳිරිය රන් පළඳනාව රකිමින් උයනෙහි ම සිටියාය.

බෝසත්හු මිනිසුන්ට අණ කළහ. තෙපි යව්. උයනෙහි සියලු වැඳිරියන් පරීක්ෂා කරවු. යම් වැඳිරියක ළඟ ඒ පළඳනාව දකිවු ද, ඇය බසවා පළඳනාව ගතිවු. ඒ වැඳිරියෝ ද අපි පළඳනාවක් ලබත්යැ යි තුටු පහටු ව උයනෙහි හැසිරෙන්නාහු, ඇගේ සමීපයට ගොස් බලමු. අපගේ පළඳනාවයැ යි කීහ. ඈ ඊර්ෂ්‍යාවෙන් (ගුණමකු ව) නො ඉවසන්නී, මේ ඇට පළඳනාවෙන් ඇති ඵලය කුමක්ද යි මුතුහර පැළඳ නික්මුණාය.

ඉක්බිති, ඒ මිනිස්සු ඇගේ පළඳනාව දැක ගෙනවුත් බෝසතුන්ට දුන්නාහුය. හෙතෙම එය රැගෙන රජුට පෙන්වා දේවයන් වහන්ස,

මේ ඒ පළඳනාවයි. ඒ පස් දෙනා ම සොරු නො වෙති. මේ උයනෙහි වැඳිරිය විසින් ගෙන එන ලද්ද යි කීවේය. පඬිතුමනි, ඒ පළඳනාව වැඳිරියගේ අතට පැමිණියේ කෙසේ ද ? ඔබ එය දැනගත්තේ කෙසේ ද ? හෙතෙම සියල්ල ප්‍රකාශ කළේය. රජතුමා සතුටු සිත් ඇත්තේ, ශූරපාදීන් අපේක්ෂා කළ යුත්තේ යුද බිමේ දීය. බෝසතුන්ට ස්තුති කරන්නේ, මේ ගාථාව කීවේය.

"උක්කට්ඨෙ සූරමිච්ඡන්ති මන්තීසු අකුතූහලං,
පියඤ්ච අන්නපාණම්හි අත්ථෙ ජාතෙ ච පණ්ඩිතන්ති"

"එළැඹ සිටි යුද්ධයෙහි හෙවත් යුද්ධයක් පැමිණි කල්හි ශූරයා ද (නිර්භය පුරුෂයා ද) මන්ත්‍රණය කරන කල්හි (රහස් හෙළි නො කරන හෙයින්) අකුතුහල පුරුෂයා ද මධුරාහාරාදීන් එළැවූ කල්හි (එක්ව වළඳනා) ප්‍රියයා ද (ප්‍රශ්න විසර්ජනා දී) අර්ථයක් උපන් කල්හි පණ්ඩිතයා ද කැමැති වෙති. පැතිය යුත්තෝය."

එහි, "උක්කට්ඨෙති", ළඟට පැමිණි දෙපසින් වැඩී ගිය යුද්ධයක් පවත්නා කල්හි යන අර්ථයි. "සූරමිච්ඡන්ති", හිස පිට හෙණ වැටෙන කල්හිදු පලා නො යන්නා ශූරයැ යි කියනු ලැබේ. ඒ අවස්ථාවෙහි මෙබඳු යුද්ධ දක්ෂයකු බලාපොරොත්තු විය යුතුයි. "මන්තීසු අකුතූහලන්ති", කටයුතු, නො කටයුතු පිළිබඳ සාකච්ඡා පැමිණි කල්හි මන්ත්‍රීන් අතුරෙන් යමකු සත්‍යය වචන ඇත්තේ ද සාකච්ඡාව නො බිඳී ද එබඳු පුද්ගලයා කැමැති වේ. ඔහු ඒ ඒ තන්හි පැතිය යුතු වෙයි. "පියඤ්ච අන්නපාණම්හි", මිහිරි ආහාරපාන ඇති කල්හි තමා හා එකට අනුභවය සඳහා ප්‍රිය වූ පුද්ගලයකු පතත්. එබඳු වූ පුද්ගලයා ඒ මොහොතේ පැතිය යුතු වෙයි. "අත්ථෙ ජාතෙ ච පණ්ඩිතන්ති", අර්ථ වශයෙන් ගැඹුරු වූ ද ධර්ම වශයෙන් ගැඹුරු වූ ද කරුණු හෝ එවැනි ප්‍රශ්නයක් හෝ උපන් කල්හි නැණවත්හු බුද්ධිමත් වූවකු කැමති වෙත්. එබඳු වූ පුද්ගලයා ඒ ඒ අවස්ථාවෙහි කැමැති විය යුත්තේ වෙයි.

මෙසේ රජතුමා බෝසතුන් වර්ණනා කොට ස්තුති කොට මහා වැස්සක් වස්සන මහා මේඝයක් මෙන් සත් රුවනින් පුදා ඔහුගේ අවවාදයේ පිහිටා දානාදී පිංකොට කම් වූ පරිදි මිය ගියේය.

බෝසත්හු ද කම් වූ පරිදි මිය ගියහ. බුදුහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා තෙරුන්ගේ ගුණ කියා ජාතකය නිම කළහ. එකල රජ ආනන්ද තෙරුන් විය. නුවණැති ඇමැතියා වනාහි මම ම වෙමි.

## 1. 10. 3.

## විස්සාසභෝජන ජාතකය

**"න විස්සසෙ අවිස්සත්ථෙති"** යන මේ දේශනාව බුදුහු දෙව්රම් වෙහෙරෙහි වැඩ වාසය කරන සේක්, විශ්වාස භෝජනයක් අරබයා වදාළහ. එසමයෙහි වනාහි බොහෝ සෙයින් භික්ෂූන්ට මව විසින් දෙන ලදී. පියා විසින් දෙන ලදී. සහෝදරයා, සහෝදරිය, සුළු පියා, සුළු මව, මාමා, නැන්දා ආදීන් විසින් දෙන ලදී. අපගේ ගිහි කාලයෙහි ද පැවිදි කාලයෙහි ද මොවුහු දෙන්නට සුදුසුයැ යි නෑයන් විසින් දෙන ලද සිව්පසෙහි විශ්වාස වී ප්‍රත්‍යවේක්ෂා නැති ව වළඳත්. බුදුහු ඒ කරුණ දැන භික්ෂූන්ට මා විසින් ධර්ම දේශනා කිරීමට වටීයැ යි භික්ෂූන් රැස් කැරවා, මහණෙනි, භික්ෂුව විසින් තම නෑයන් විසින් හෝ නො වන අය විසින් හෝ දෙන ලද සිව්පසය ප්‍රත්‍යවේක්ෂයා කොට ම පරිභෝග කළ යුතුයි. ප්‍රත්‍යවේක්ෂා නො කොට පරිභෝග කොට කලුරිය කරන භික්ෂුව යක්ෂ, ප්‍රේත ආත්ම භාවවලින් නො මිදෙයි. ප්‍රත්‍යවේක්ෂා නො කොට පරිභෝගය විෂ පරිභෝගයක් සමානය. විෂ වනාහි විශ්වාසවන්තයා දුන්නත් අවිශ්වාසවන්තයා දුන්නත් මරන්නේ මය. පෙර ද විශ්වාසවන්තයා විසින් දෙන ලද විෂ පරිභෝග කොට මරණයට පත් විණැ යි කියා ඔවුන් විසින් අයදනා ලද්දේ, අතීතය ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කරන කල්හි බෝසත්හු මහා ධනවත් සිටුවරයකු විය. ඔහුගේ එක් ගොපල්ලෙක් ගොයම් හකුල් ඇති කල්හි ගවයන් ගෙන කැලයට පිවිස එහි ගාලක් කොට රකිමින් වාසය කරයි. සිටුතුමාට ද කලින් කලට ගොන් රසය (පස්ගෝ රසය) ගෙන එයි. ඉක්බිති, ඔහුගේ ගව ගාලට නුදුරෙහි සිංහයෙක්

වාසය කළේය. දෙනුන්ට සිංහයා කෙරෙන් ඇති වන තැති ගැනීම නිසා මළානික වී කිරි මද විය. ඉක්බිති, එක් දිනක් ගිතෙල් රැගෙන ආවා වූ ඔහුගෙන් සිටුතුමා විචාළේය. යහළු ගවපාලකය, ගිතෙල් අඩු වූයේ කුමක් නිසා ද ? හෙතෙම ඒ කරුණ කීවේය. යහළුව, ඒ සිංහයාගේ කිසියම් තැනක් පිළිබඳ සිත් ඇත්තේ ද ? ඔහුට ඇත, ස්වාමීනි. එක් මුව දෙනක සමග සංසර්ගයක් ඇත. ඒ මුවැත්තිය ගෙන්වා ගන්නට හැකි ද ? හැකිය, ස්වාමීනි. එසේ නම් ඒ මුවැත්තිය ගෙන ඇගේ නළලේ පටන් සිරුරෙහි ලොම්, විශේෂයෙන් නැවත නැවතත් රංජනය කැරවා වියළවා දෙතුන් දිනක් ඉක්මවා ඒ මුවැත්තිය මුදා හරිවු. සිංහයා ඇය කෙරෙහි ස්නේහයෙන් සිරුර ලොවා මරණයට පැමිණෙන්නේය. ඉක්බිති, සිංහයාගේ හම, නිය, දළ මෙන් ම වසා තෙල් ද රැගෙන එන්නැ යි හලාහළ විෂ දී පිටත් කළේය. ඒ ගොපල්ලා දූලක් දමා උපායෙන් ඒ මුවැත්තිය ගෙන එසේ කළේය. සිංහයා ඈ දුක ම බලවත් ස්නේහයෙන් ඇගේ සිරුර ලොවා මරණයට පත්විය. ගොපල්ලා ද සම් ආදිය ගෙන බෝසතාණන් සමීපයට ගියේය. බෝසත්හු ඒ කැරුණ දූන අනුන්ට ස්නේහය නම් නො කළ යුතුයි. මෙසේ බලවත් මෘගරාජ සිංහයා කෙලෙස් වශයෙන් සංසර්ගය නිසා මුවැත්තියගේ සිරුර ලෙවකමින් විෂ පරිභෝග කොට මරණයට පත්වීයැ යි කියා පැමිණියා වූ පිරිසට දහම් දෙසන්නේ, මේ ගාථාව කීහ.

**"න විස්සසෙ අවිස්සත්ථෙ විස්සත්ථෙපි න විස්සසෙ,**
**විස්සාසා භයමන්වෙති සීහං ච මිගමාතුකාති"**

"(පෙර විශ්වාසයෙන් සිට පසු ව) අවිශ්වාස වූවහු කෙරෙහි විශ්වාසය නො කරන්නේය. (පෙර අවිශ්වාස ව සිට) විශ්වාස වූවහු කෙරෙහි විශ්වාස නො කරන්නේය. එබඳු විශ්වාසයෙන් මුව දෙනගෙන් සිංහයාට මෙන් බය පැමිණේ."

මේ එහි කෙටි අරුතයි. යමෙක් පෙර යහළුව සිට පසු ව තමා කෙරෙහි අවිශ්වාස වූයේ ද, ඒ "**අවිස්සත්ථෙ**", අවිශ්වාසියා කෙරෙහි ද යමෙක් පෙර අවිශ්වාසී වී දූන් විශ්වාසවන්ත වූයේ ද, ඒ විශ්වාසවන්තයා කෙරෙහි ද විශ්වාස නො කරන්නේය. "**විස්සත්ථෙපි**

**න විස්සසෙ**", ඔහු කෙරෙහි ද විශ්වාස නො කරන්නෝය. මක්නිසා ද "**විස්සාසා භයමන්වෙති**", යමකු වනාහි මිත්‍රයා කෙරෙහි ද සතුරා කෙරෙහි ද විශ්වාස කළේ ද එයින් බය ම හට ගනී. කෙසේ ද " **සීහං ච මිගමාතුකායි**", යම් සේ මිතුරු දම් වශයෙන් විශ්වාස කළ මුව දෙන නිසා සිංහයාට බය පැමිණියේය. බය තමා කරා ආයේය, යන අර්ථයි. යම් සේ මී දෙන විශ්වාස වශයෙන් සිංහයා අනුව ගියාය, යන අර්ථයි.

මෙසේ බෝසත්හු පැමිණි පිරිසට දහම් දෙසා දානාදී පිංකොට කම් වූ පරිදි මිය ගියේය. බුදු රජහු මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා ජාතකය නිමවා වදාළහ. එදා මහසිටු මම ම වූයෙමි.

## 1. 10. 4.

## ලෝමහංස ජාතකය

"**සො තත්තො සො සීතොති**" යන මේ ධර්ම දේශනාව බුදුහු විශාලා මහනුවර වාළිකාරාමයේ වැඩ වාසය කරන සේක්, සුනක්ඛත්ත අරබයා දේශනා කළහ.

එක් කලෙක සුනක්ඛත්ත බුදු රජුන්ගේ උපස්ථායක වූයේ, පා සිවුරු ගෙන හැසිරෙන්නේ, කෝරක්ඛත්තිය නම් ජටිලයාගේ ධර්මය රුචි කරන්නේ, බුදු රජුන්ගේ පා සිවුරු උන් වහන්සේට ම බාර දී කෝරක්ඛත්තිය ඇසුරු කොට වාසය කොට ඒ ජටිලයා කාලකඤ්ජක නම් අසුරු යෝනියෙහි උපත් කල්හි ගිහි බවට පැමිණ ශ්‍රමණ භවත් ගෞතමයාට උතුම් මිනිස් දහම් නැත. ආර්යයන්ට සුදුසු වූ නැණ විශේෂයක් ද නැත. තර්කයෙන් ගොනු කොට නුවණින් මෙහෙයවා තම වැටහීම අනුව ශ්‍රමණ භවත් ගෞතමයෝ ධර්ම දේශනා කරති. යමකු සඳහා ඔහු දහම් දෙසුවේ ද එය කරන්නා හට මනා දුක් කෙළවර කිරීමකට නො පමුණුවයි යි, විශාලා මහනුවර තුන් පවුරු අතර හැසිරෙමින් බුදු රජුන්ගේ නුගුණ ප්‍රකාශ කරයි. ඉක්බිති,

සැරියුත් තෙරණුවෝ පිඩු පිණිස හැසිරෙන්නාහු, සුනක්ඛත්තගේ නුගුණ කථාව අසා පිණ්ඩපාතයෙන් පසු එකරුණ බුදු රජුන්ට සැල කළහ. සාරිපුත්‍රය, සුනක්ඛත්ත නම් හිස් පුරුෂයා ක්‍රෝධ බහුලය. ක්‍රෝධ වශයෙන් මෙසේ කීවේය. ක්‍රෝධ වශයෙන් ම ඔහු ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ධර්මය එය කරන්නා හට මනාකොට දුක් නැති කිරීමකට නො පමුණුවයි කියන්නේ, මගේ ගුණ ම කියයි. සාරිපුත්‍රය, සුනක්ඛත්ත මගේ ගුණ නො දනී. සාරිපුත්‍රය, මට ජලභිඥඥා ඇත. ඒ උතුරු මිනිස් දහමකි. දශ බල ඇත. සතර විශාරද ඥාන ඇත. සිව් සත්ත්ව යෝනි පිරිසිඳ දන්නා නුවණ ඇත. පඤ්ච ගති පිරිසිඳ දන්නා නුවණ ඇත. මෙය ද මගේ උතුරු මිනිස් දහම්ය. මෙසේ උතුරු මිනිස් දහම්වලින් යුත් මට යමකු ශ්‍රමණ ගෞතමයන් හට උතුරු මිනිස් දහම් නැතැ යි කියන්නේ නම් ඔහු ඒ වචනය අත්නොහැර ඒ සිතුවිල්ල අත්නොහැර, ඒ දෘෂ්ටිය අත් නොහැර ගෙනෙන ලද බරක් බිම තබන්නාක් මෙන් නිරයෙහි උපදින්නේය. මෙසේ තමන්ගේ ඇත්තා වූ ම උතුරු මිනිස් දම් ගුණය ප්‍රකාශ කොට සාරිපුත්‍රය, සුනක්ඛත්ත කෝරක්ඛත්තියගේ දුෂ්කර ක්‍රියා නම් මිථ්‍යා තපසෙහි පැහැදුණේය. සාරිපුත්‍රය, යමකු මිථ්‍යා තපසෙහි පහදින්නේ නම් මා කෙරෙහි ම පැහැදිය යුතුයි. සාරිපුත්‍රය, මම මෙයින් එක් අනූ කල්පයකට පෙර මෙහි සාරයක් ඇත්තේද යි බාහිර වූ මිථ්‍යා-තපස් විමසමින් සිව් අඟකින් යුක්ත වූ බඹසර වාසයක් විසුවෙමි. මම තපසුන් අතර උසස් ම තපසෙක් වීමි. රළු ප්‍රතිපත්ති ඇත්තවුන් අතරින් මම උසස් ම රළු ප්‍රතිපත්ති ඇත්තෙක් වීමි. පාපය පිළිකුල් කරන්නවුන් අතරින් මම උසස් ම පාපය පිළිකුල් කරන්නෙක් වීමි. විවේක වූවන් අතුරෙන් පරම විවේක වූවෙක් වීමි යි වදාරා තෙරුන් විසින් අයදනා ලද බුදු රජහු අතීත කථාව දෙසූහ.

පෙර මෙයින් අනූඑක් වැනි කල්පයෙහි බෝසත්හු බාහිර තපස් ක්‍රම විමසන්නෙමි යි ආජීවක පැවිද්දෙන් පැවිදි ව අචේලකයෙක් හෙවත් වස්ත්‍ර නැත්තෙක් වීමි. සිරුරෙහි දූලි තැවරී පැවතුණි. එසේ ම එකලාව විහරණ ඇති ජනයාගෙන් වෙන්වූවෙක් වූයේය. මිනිසුන් දුටුවිට මුවෙක් මෙන් පලා ගියේය. මිනිස් මළ ම ආහාර කොට ගත්තේය. වසු පැටියන්ගේ ගොම ද අනුභව කළේය. නො පමා විහරණය සඳහා බිහිසුණු වන ලැහැබක වාසය කළේය. එහි වසනුයේ, හිම වැටෙන කාලයෙහි නවම් මැදින් අතර අට දිනයෙහි රැය වන ලැහැබින් නික්ම එළිමහනෙහි වාසය කොට හිරු උදාවූ

කල්හි වන ලැහැබට පිවිසෙයි. ඔහු රාත්‍රියෙහි එළිමහනෙහි යම් සේ හිම දියෙන් තෙමේ ද එසේ ම දවල් කාලයෙහි වන ලැහැබින් වැගිරෙන්නා වූ දිය බිඳුවලින් තෙමෙයි. මෙසේ රෑ දාවල් ශීතලින් එන දුක් අනුභව කරයි. ගිම්හාන ඍතුවෙහි අන්තිම මාසයෙහි එළිමහනෙහි වැස රාත්‍රියෙහි වන ලැහැබට පිවිසෙයි. හෙතෙම යම් සේ දවල් කාලයෙහි එළිමහනෙහි සූර්යය තාපයෙන් තැවුණේ ද, එසේ ම රාත්‍රී කාලයෙහි සුළඟ නැති වන ලැහැබෙහි තැවීමට පත්වෙයි. සිරුරින් දහදිය වැල් වැගිරෙයි. ඉක්බිති, ඔහුට පෙර නො ඇසූ විරූ මේ ගාථා සිහියට නැඟුණි.

**"සොතත්තො සොසීතො එකො හිංසණකෙ වනෙ,**
**නග්ගො නචග්ගිමාසීනො එසනාපසුතො මුනීති"**

"(හිරු රැසින්) විශේෂයෙන් තැවුණෙමි. (හිම දියෙන්) විශේෂයෙන් තෙත් වූයෙමි. බියකරු වනෙහි හුදකලා වූයෙමි. නග්න වූයේ, ගිනි සමීපයෙහි නො හිඳිනෙමි. (බ්‍රහ්මචාර්ය) සෙවීමෙහි යෙදුණෙමි, (මුනි භාවය පිණිස පිළිපන්නෙකැ යි) ලෝකයාගේ සැලකුම් ලැබීමි."

එහි, "**සොතත්තොති**", සූර්යය තාපයෙන් වඩාත් තැවුණේ "**සොසීතොති**", හිම දියෙන් වඩාත් ශීත වූයේ, වඩාත් තෙත් වූයේ, "**එකො හිංසණකෙ වනෙ**", යම් තැනකට පිවිසියවුන්ට බෙහෙවින් ලොම් ඩැහැ ගැනේ ද එබඳු වූ බිය ජනක වූ වන ලැහැබ, දෙවැන්නකු නැති ව එකලාව විසුවෙමි යි දක්වයි. "**නග්ගො නචග්ගිමාසීනොති**", නග්න ව එහෙත් ගිනි ඇසුරු නො කරන්නේ එසේ ම ශීතෙන් පීඩා වුව ද හැඳීම් පෙරවීම් නො ගත්තෙමි. ගිනි සමීපයෙහි නො සිටියෙමි යි දක්වයි. "**එසනාපසුතොති**", බඹසර නො වුව ද බඹසර යන හැඟීම් ඇත්තෙක් වී මෙය බ්‍රහ්මචරියයි. බ්‍රහ්මලෝකය සඳහා උපාය යි ද සිතා මේ බ්‍රහ්මචරිය සෙවීමෙහි යෙදුණේ, උත්සාහවත් වූයේ වෙමි යි දක්වයි. "**මුනීති**", මේ බ්‍රහ්මචරිය වාසය තිදොර සංවරය සඳහා පිළිපන්නෙක්යැ යි ලෝකයා විසින් පිළිගත් අයෙක් වූයේ වෙමි යි දක්වයි.

මෙසේ සිව් අඟකින් යුත් බඹසරෙහි වැස බෝසත්හු මරණ

මොහොතෙහි නිරය නිමිත්ත දැක මේ ව්‍රත සමාදානය නිෂ්ඵලයැ යි දැන එකෙණෙහි ම ඒ දෘෂ්ටිය බිඳ දමා සම්මා දිට්ඨිය ගෙන දෙව්ලොව උපන්හ. බුදු රජහු මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා ජාතකය නිමවා වදාළහ. මම එසමයෙහි ඒ ආජීවකයා වූයෙමි.

## 1. 10. 5.

## මහා සුදස්සන ජාතකය

"අනිච්චා වත සඞ්ඛාරාති" යන මේ දේශනාව බුදුහු පිරිනිවන් මඤ්චකයේ සැතපුණාහු, ආනන්ද තෙරුන්, ස්වාමීනි, මේ කුඩා නගරයේ ආදී වචන අරබයා වදාළහ. බුදුරදුන් දෙව්රමෙහි වැඩ වසන කල්හි සැරියුත් තෙරණුවෝ ඉල් මස පුණු පොහෝ දින නාලක ගමෙහි උපන් ගෘහයේ දී ම පිරිනිවියහ. මහා මුගලන් තෙරණුවෝ එම ඉල් මසෙහි ම අමාවක් දිනයෙහි පිරිනිවියහ. මෙසේ අගසව් දෙතෙරණුවන් පිරිනිවි කල්හි බුදු රජහු ද මමත් කුසිනාරාවෙහි පිරිනිවෙන්නෙමි යි පිළිවෙළින් චාරිකාවෙහි හැසිරෙමින් කුසිනාරාවට වැඩමවා සල් ගස් දෙක අතරේ උතුරට හිසලා පැනවූ මඤ්චකයෙහි නො නැඟිටින සෙයයාවෙන් සැතපුනහ.

ඉක්බිති, අනඳ මහා තෙරණුවෝ බුදු රජුන්ට ස්වාමීනි, බුදු රජහු මේ විෂම වූ රළු වූ කුඩා නගරයක වූ අතුරු නගරයක පිරිනිවන් නො පාතු මැනව. වෙනත් චම්පා, රාජගහ ආදී මහා නගරයක පිරිනිවා යි ඇයද සිටියහ. ආනන්දය, මෙය කුඩා නගරයකැ යි, රළු නගරයකැ යි, අතුරු නගරයකැ යි නො කියව. මම පෙර සුදස්සන නම් සක්විති රජ කාලයේ මේ නගරයෙහි විසුවෙමි. එකල්හි මේ නගරය දොළොස් යොදුනක් වූ රන් පවුරකින් වට වූ මහා නගරයක් වීයැ යි වදාරා තෙරුන් විසින් අයදනා ලදුව අතීත කථාව ගෙන හැර දක්වමින් මහා සුදස්සන සූත්‍රය දෙසූහ.

එකල්හි මහා සුදස්සන සුධම්ම ප්‍රාසාදයෙන් බැස නුවරෙන් පිහිටි

සත් රුවන් මය තල් වනයෙහි පනවන ලද කුඩා ඇඳෙහි දකුණු පසින් නො නැඟිටින සෙය්‍යාවෙන් හොත්තාවූ මහා සුදස්සන සක්විති රජු දැක, සුභද්‍ර නම් දේවිය විසින් දේවයිනි, ඔබගේ මේ කුසාවතී රාජධානිය ප්‍රමුඛ වූ අසූහාර දහසක් නගර වෙයි ද ඒවාට ආසා කරනු මැනවැ යි කියන ලද කල්හි සුදස්සන මහරජහු දේවිය, එසේ නො කියව. ඒ වෙනුවට මෙසේ අවවාද කරනු මැනවි. දේවයිනි, මේ කුසාවතී ආදී සම්පත් කෙරෙහි ආශා නො කරනු මැනවි. ඒ පිළිබඳ ආශා අපේක්‍ෂා සිඳලනු මැනවි. දේවයිනි, එසේ කියන්නේ මක්නිසා ද ? අද මම කලුරිය කරන්නෙමි. ඉක්බිති, දේවිය ඉතා දුක සේ දෑස පිස අපහසුවෙන් එසේ කියා හඬන්නට වූවාය. වැළපුණාය. අසූහාර දහසක් ස්ත්‍රීහු ද හඬන්ට වූහ. වැළපුණහ. ඇමැති ආදී කිසිවකුටත් ඉවසීමට නො හැකි ව සියල්ලෝ ම හැඬූහ. එවිට බෝසත්හු සගයිනි, ශබ්ද නො කරවු යි, සියල්ලන් වළකා දේවිය අමතා දේවිය, නො හඬනු, නො වැළපෙනු. තලටැක් පමණ වූ ද හේතු ප්‍රත්‍යයෙන් හටගත් දෙයක් නිත්‍යය නො වේ. බිඳීමේ ස්වභාව කොට ඇත්තේයැ යි කියා දේවියට ඔවදන් වශයෙන් මේ ගාථාව කීහ.

"අනිච්චා වත සඞ්ඛාරා උප්පාදවයධම්මිනො,
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමො සුඛො"ති"

"සංස්කාරයෝ ඒකාන්තයෙන් අනිත්‍යයි. ඉපදීම, නැතිවීම
ස්වභාව කොට ඇත්තාහ. ඉපිද නැති වෙත්. ඔවුන්ගේ
සංසිඳීම සැපයයි."

එහි, "**අනිච්චා වත සඞ්ඛාරා**", ප්‍රිය සුභද්‍ර දේවියනි, යම්කිසි හේතූන් එකතුව නිපයුණු ඛන්ධ, ආයතන ආදී යම් පමණ සංඛාරයෝ වෙත් ද ඒ සියල්ල අනිත්‍යය වේ. මේ අනුව රූපය නැසෙන සුළුය. ඇස ද නැසෙන සුළුය. එසේ ම විඤ්ඤාණය ද ධර්ම ද අනිත්‍යය. යම්කිසි සිත් ඇතිනැති සියලු රුවන් ද නැසෙන සුළුය. මේ නිසා හේතු ධර්ම සමවායෙන් හටගත් සියලු සංඛාර ඒකාන්තයෙන් අනිත්‍යය වේ. මක්නිසා ද ? "**උප්පාදවයධම්මිනො**" යි ඉහත කී සියලු ධර්ම ඇතිවීම හා නැතිවීම ස්වභාව කොට පවතී. යම් හෙයකින් ඒවා ඉපදීම, බිඳීම ස්වභාව ඇත්තේ ද එම නිසා අනිත්‍යයැ යි දතයුතුයි.

"උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති", ඉපදී පැවැතී නැති වේ. මේ සියලු ධර්ම ඉපදීම ඇති කල්හි ම පැවැතීම හෙවත් 'ඨිතිය' වේ. මේ පැවැත්ම ම නැතිවීම වේ. මෙසේ සියලු ධර්ම ඉපදීම, පැවැත්ම, නැතිවීම යන අවස්ථා තුනට පත්වන නිසා අනිත්‍යය. ක්‍ෂනිකය. ස්ථිර නැත. කෙටි කාලයක් පවතී. නැසෙන සුළුය. සැලෙන සුළුය. කල් නො පවතී. තාවකාලිකය. හරයක් නැත. තාවකාලික නිසා ම මායාව, මිරිඟු පෙන පිඬු සමාන වේ. ප්‍රිය සුභද්‍රා දේවිය කුමක් නිසා සැප හැඟීම් උපදවන්නෙහි ද ? මෙය පිළිගන්න, "තෙසං වූපසමො සුඛොති", සියලු සසර දුක් සංසිඳුවන හෙයින් ඒ සංඛාර සංසිඳීම වූ නිවන ඒකාන්තයෙන් සැපයැ යි සලකත්.

මෙසේ මහා සුදස්සන රජ අමාමහ නිවනින් දේශනය මුදුන් පමුණුවා, සෙසු ජනයාට ද දන් දෙවු. සිල් රකිවු, පෙහෙවස් රකිවු යි අවවාද කොට දෙව්ලොව බලා ගියේය. බුදු රජහු මේ දම්දෙසුම ගෙනහැර දක්වා ජාතකය නිමවූහ. එකල සුභද්‍රා දේවිය නම් රාහුල මාතාවෝ වූහ. පුත්‍ර රත්නය රාහුලය. සෙසු පිරිස බුදු පිරිසය. මහා සුදස්සන රජු වනාහි· මම ම වීමි.

## 1. 10 .6.

## තෙලපත්ත ජාතකය

"සමතිත්තිකං අනවසෙසකන්ති" යන මේ දේශනාව බුදු රජහු දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, සුම්භ රට සේනක නම් නියම් ගම ඇසුරු කොට වන ලැහැබක වසන්නාහු, ජනපදකල්‍යාණී සූත්‍රය අරබයා දේශනා කළහ. එහිදී බුදුරදහු මහණෙනි, රූ රැජිනක, රූ රැජිනකැ යි මහජනයා රැස්වන්නේය. ඒ රූ රැජින වනාහි නැටීමෙහි ඉතා දක්‍ෂය. ගායනයෙහි ද එසේ මය. මහජනයා රූ රැජින නටතැ යි, ගයතැ යි වඩ වඩාත් රැස් වන්නේය. මේ අතර ජීවත් වීමට කැමැති මරණයට අකැමැති සැප කැමැති දුක් පිළිකුල් කරන පුරුෂයෙක් එන්නේය. ඔහුට මෙසේ කියන්නාහ. පින්වත් පුරුෂය,

පාමුව දක්වා පිරුණු මේ තෙල් පාත්‍රය මහජන සමාගමටත් රූ රැජිනටත් අතරින් ගෙන යා යුතුය. ඔබ පිටුපසින් කඩුවක් ඔසවාගත් පුරුෂයෙක් එයි. ඉදින්, ඔබ මඳක් හෝ තෙල් පිටතට වැගුරුවේ නම් එතැන දී ම තගේ හිස හෙළන්නෙමි. මහණෙනි, කුමක් සිතන්නහු ද ? ඒ පුරුෂයා තෙල් පාත්‍රයෙන් සිත බැහැර කරන්නේ ද ? සිත මුළා කරන්නේ ද ? ස්වාමීනි, එසේ නො වන්නේය. මහණෙනි, මෙහි අර්ථය නම්, පාමුව දක්වා පිරුණු තෙල් බඳුන නම් තම සිරුරු පිළිබඳ මෙහෙය වූ සිහියට නමකි. මහණෙනි, ඔබලා මෙසේ හික්මිය යුතුය. අපගේ කායගතා සතිය මනාව ආරම්භ කොට වැඩුණේ වන්නේය. මහණෙනි, ඔබලා විසින් මෙසේ හික්මිය යුතුයැ යි, මේ ජනපදකල්‍යාණී සූත්‍රය අර්ථ සහිත ව මනා පදයෙන් යුක්ත කොට දෙසූහ.

මේ එහි සංක්ෂිප්ත අදහසයි. ජනපදකල්‍යාණී නම් ජනපදයෙහි ම සුන්දරියයි. සිරුරු දොස් සයෙන් විනිර්මුක්ත වූ යහපත් අංග පහකින් යුත් ඕ වඩාත් උස නො වූ, වඩාත් මිටි නො වූ, වඩාත් සිහින් නො වූ, වඩාත් මහත නො වූ, වඩාත් කලු නො වූ, වඩාත් සුදු නො වූ, මිනිස් පැහැය ඉක්ම වූ දිව්‍යය පැහැයට නො පැමිණි මෙකී සවැදෑරුම් සිරුරු දොසින් මිදුණා වූවාය. ඡවි, මාංශ නහර, අට්ඨි, වයෝ යන පඤ්ච කල්‍යාණයෙන් යුක්ත වූවාය. ඇයට අමුතුවෙන් ආලෝකයක් අවශ්‍ය නො වේ. තම සිරුරේ ආලෝකයෙන් දොළොස් රියනක් ප්‍රභාවත් කැරේ. පියගුමල් වන්නෝ රන්වන් හෝ වෙයි. මේ ඇගේ ඡවි කල්‍යාණයයි. ඇගේ අත්පා සතර, මුහුණ, දෙතොල කෙළවර කොට ලහසෙන් පිරිකම් කළාක් මෙන් ද රන් පබලු පළසක් වැනිය. මේ ඇගේ මංශ කල්‍යාණියයි. ඇගේ නිය පෙළ මසින් නො මිදුණු තන්හි ලහ රසයෙන් පිරුණාක් මෙන් ද මසින් සම්බන්ධ නැති තන්හි කිරිදහට මෙනි. මේ ඇගේ නහර (නිය) කල්‍යාණයයි. ඇගේ දෙතිස දත් පෙළ එකට එකක් සම්බන්ධ ව ඔප කළ දියමන්ති පෙළක් මෙන් පෙනේ. මේ ඇගේ අට්ඨි කල්‍යාණියයි. සියවස් වුව ද සොළොස් විය ඇත්තියක මෙන් පෙනේ. ඇඟ රැලි හෝ පැසුණු කෙස් නො වේ. මේ ඇගේ වය කල්‍යාණියයි. "**පරමපාසාවිනී**", මෙහි පැවැත්ව - 'පසාව' නම් පවතී යන අර්ථයි. පසව ම, පාසාව නම් උතුම් පැවැත්ම, පරම පාසාව නම්. ඇයට එය ඇත්තේ, "**පරමපාසාවිනී**", නම්. නැටීමෙහි හා ගැසීමෙහි මනහර පැවැත්ම ශ්‍රේෂ්ඨ පැවැත්මයි. මනහර ලෙස නටයි. ගී කියයි. "අථ

පුරිසො ආගච්ඡෙය්‍යාති" යනු සිය කැමැත්තෙන් එන්නේ වෙයි. මෙහි අදහස මෙයයි, මහජනයා මැද රූ රැජින නටන කල්හි, සාධු නාදය පවත්වද්දී අසුරු ගැසීම්, සළුවැනීම් පවතිද්දී රජ එපවත් අසා දඟ ගෙයින් එක් පුරුෂයකු කැඳවා බන්ධන ඉවත් කොට මුවවිට දක්වා පිරුණු තෙල් පාත්‍රයක් ඔහු අත තබා දෙඅතින් එය දැඩිකොට ගන්වා එක් කඩු ගත් අත් ඇති පුරුෂයකුට අණ කළේය. මේ කඩුව ගෙන රූ රැජිනගේ නෘත්‍යය භූමියට යන අතර සිත වෙනස් ව එක් තෙල් බිඳක් හෝ පිටතට ගියහොත් එහි දී ම ඔහුගේ හිස සිඳුව. ඒ වධකයා ද කඩුව ඔසවාගෙන තැති ගනිවමින් ඔහු ගෙන ගියේය. ඒ පුරුෂයා ද මරණ බියෙන් බියපත් ව ජීවත්වීමට ඇති කැමැත්ත නිසා සිත වෙනතකට නො යොමා ඇස ඇර ඒ රූ රැජින දෙස නො බැලීය. මේ කථා පුවත පෙර සිදුවූවකි. සූත්‍රයෙහි සිතින් පරිකල්පනය කළ පුවතක් මෙන් දක්වා ඇතිබව දත යුතුයි. **"උපමා ඛො ම්‍යායන්ති"**, මෙහි දී තෙල් පාත්‍රය කායගතා සති භාවනාව හා උපමා සැසඳීමක් කරන ලදී. මෙහි රජ මෙන් කර්මය දත යුතුයි. කෙළෙස් කඩුව මෙනි. කඩුගත් පුරුෂයා මාරයාය. තෙල් පාත්‍රය ගත් පුරුෂයා මෙන් කායගතා සති විදුසුන් වඩනා යෝගාවචරයා දත යුතුයි. මෙහි දී බුදු රජහු කායගතාසති විදර්ශනා වචන භික්ෂුව විසින් තෙල් පාත්‍රය ගත් ඒ පුරුෂයා මෙන් සිහිය අත්නොහැර මනා නුවණින් භාවනාව කළ යුතු යි, මේ සූත්‍රය දක්වා වදාළහ. භික්ෂූහු මේ සූත්‍රයත් එහි අර්ථයත් අසා මෙසේ කීවාහුය. ස්වාමීනි, එදෙස නො බලා තෙල් පාත්‍රය ගෙන යන ඒ පුරුෂයා විසින් කරන ලද්දේ මහත් දුෂ්කර කාර්යයකි. මහණෙනි, ඔහු කළේ අමාරු කාර්යයක් නො වේ. ඉතා පහසු කාර්යයකි. මක්නිසා ද ? කඩුගත් පුරුෂයා විසින් ඔහු බිය ගන්වා ගමනට මෙහෙය වූ බැවිනි. මහණෙනි, පෙර පණ්ඩිතයෝ නුවණින් සිහිය අත්නොහැර මවන ලද දිව්‍යය ස්ත්‍රී රූප ද ඉන්ද්‍රියන් බිඳ එදෙස නො බලා ගොස් රාජ්‍යයට ද පැමිණියහ. ඒ පහසු කාර්යක් නොවෙති යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු ඒ රජුගේ පුතුන් සිය දෙනා අතුරින් කනිටු පුතු වී ඉපිද පිළිවෙළින් දැනුවත් බවට පැමිණියේය. එකල්හි ඒ රජ මැඳුරෙහි පන්සියයක් පසේ බුදුවරු දන් වළඳත්. බෝසත්හු ඔවුන්ට වතාවත් කරත්. බෝසත්හු දිනක් මෙසේ සිතූහ. මට බොහෝ සොහොයුරෝ සිටිති. පියා සතු රාජ්‍යය මට ලැබේ ද, නො ලැබේ දැ යි පසේ

බුදුවරුන්ගෙන් අසා දැන ගනිමි යි දෙවැනි දවස්හි රජ මැදුරට ඔවුන් වැඩි කල්හි, ඩබරාව ගෙන පැන් පෙරහා පා සෝදා තෙල් ආලේප කොට අතුරුපස වළඳා සිටි කල්හි, වැඳ එකත් පසෙක හිඳ එකරුණ සැළකළහ. ඔවුහු බෝසතුන්ට මෙසේ කීහ. කුමාරය, ඔබ මෙම නුවර රාජ්‍යය නො ලබන්නෙහිය. මෙහි සිට එක්සියවිසි යොදුනකින් ඈත ගන්ධාර රට තක්සලා නම් නුවරක් ඇත. එහි යන්ට හැකි නම් මෙයින් සත් වැනි දින එහි රාජ්‍යය ලබන්නේය. වන මඟ අතරෙහි උවදුරු ඇත. ඒ වන මඟ අතහැර යන්නේ නම් සියක් යොදුන් මඟ වෙයි. ඍජුව යන්නේ නම් පණස් යොදුනකි. ඒ අමනුෂ්‍යය කාන්තාරයකි. එහි යකින්ණියෝ ගම් ද ශාලා ද මවා උඩට රන් තරුයෙන් විසිතුරු මා හැඟි වියන් ඇති ශයනයන් පනවා විවිධ වර්ණ පට වස්ත්‍ර තිරවලින් වටකොට දිව අබරණයෙන් තමන් සැරසී ශාලාවල හිඳ යන එන මිනිසුන්ට මිහිරි වචනයෙන් සංග්‍රහ කොට ඔබලා මාර්ග ක්ලාන්ත වූ බව පෙනේ. මෙහි අවුත් හිඳ පැන් බී විඩාහැර යනු මැනවැ යි කැඳවා පැමිණි අයට අසුන් දී රූ සපුවෙන් පොළඹවා කාමයෙන් වසඟ කොට තමා සමග සමහම් කළ කල්හි ඒ යක්‍ෂණියෝ ඔවුන් ලේ ධාරා වගුරුවමින් කා දමා මරනයට පත් කරත්. රූපයට ගොදුරු වූ පුරුෂයා රූපයෙන් ද අල්ලා ගනිති. ශබ්දයට ගොදුරු වනු මිහිරි ගී වැයුම් හඬින් ද සුවඳට ගොදුරු වනු දිව ගඳින් ද රසයට ගිජු වූවන් නොයෙක් රස ඇති දිව බොජුනෙන් ද පහසට ගොදුරු වූවන් හිස්දොර පාමුල රන් කහවසින් ඇති දිව්‍යය පානින් ද අල්ලා ගනිති. ඉදින්, ඉඳුරන් පුබුදුවා ඔවුන් දෙස නො බලා සිහිය පෙරටු කොට ඔබ යන්නෙහි නම් මෙයින් සත් වැනි දින එනුවර රාජ්‍යය ලබන්නේය. එවිට බෝසත්හු, ස්වාමීනි, එසේ ම වේවා. ඔබතුමන්ගෙන් අවවාද ලබා මා කෙසේ නම් ඔවුන් දෙස බලම් ද ? පසේ බුදුවරුන්ගෙන් පිරිත් කැරවා පිරිත් වැලි ද පිරිත් ජලය ද පිරිත් හුය ද ගෙන පසේ බුදුවරුන් ද මව්පියන් ද වැඳ තම නිවහනට ගොස් තමාගේ පුරුෂයන්ට මෙසේ කීහ. මම තක්සලා නුවර රාජ්‍යය ගැනීමට එමි. ඔබලා මෙහි ම සිටිනු. ඉක්බිති, පුරුෂයෝ පස් දෙනෙක් කීහ. අපි ද එන්නෙමු. තොපට එහි යා නො හැකිය. අතරමඟ යකින්ණියෝ රූපාදියෙහි ගිජු වූ මිනිසුන් විවිධ වූ රූපාදියෙන් පොළඹවා තම ග්‍රහණයට ගනිත්. මහමඟ උවදුරු බොහෝය. මම වනාහි තමා ගැන විශ්වාසය තබා යන්නෙමි. දේවයිනි, අපි ඔබතුමන් සමග යන කල්හි කෙසේ නම් ප්‍රිය රූපාදිය බලන්නෙමු ද ? අපි ද ඔබතුමන් සමග ම එන්නෙමු. එසේ නම් සිහි නුවණින් එනු යි බෝසත්හු ඒ පුරුෂයන් පස් දෙනා සමග ම

මහමඟට පිළිපන්හ. යක්ෂණියෝ ද ගම් ආදිය මවා හුන්හ. ඔවුනතර සිටි රූපයට ගිජු පුරුෂයා ඒ යක්ෂණියන් දැක රූපයෙහි ඇලී මදක් පසුබසින්ට විය. බෝසත්හු ඔහුගෙන් කරුණු විමසූහ. දේවයිනි, මං පාරදෙයි. මේ ශාලාවෙහි මද වේලාවක් හිඳ එමි යි කීය. යහළුව, මොවුහු යක්ෂණියෝ වෙති. ඔවුන් නො පතනු. දේවයිනි, මේවා තබා එන්ට නො හැක්කෙමි. එසේ නම් ප්‍රතිවිපාක පෙනෙයි යි, ඉතිරි සිව් දෙනා සමග ගියහ. ඒ රූපයට ගිජු පුරුෂයා යක්ෂණියන් වෙත ගියේය. ඔවුන් ඔහු සමග නො දහම් හැසිරීම කළ කල්හි ඔහු එතැන ම මරා පෙරටුව ගොස් වෙනත් ශාලාවක් මවා නොයෙක් තූර්යය භාණ්ඩ ගෙන ගයමින් සිටියාහ. එහි දී ශබ්දයට ගිජු පුරුෂයා ද පසු බැස්සේය. පෙර සේ ම ඔහු ද කා දමා පෙරටුව ගොස් විවිධාකාර සුවඳ විලවුන් භාජන පුරවා අවන්හලක් විවෘත කොට හුන්හ. එහි දී සුවඳට ගිජු පුරුෂයා නැවතුණේය. ඔහු ද මරා දමූ යක්ෂණියෝ පෙරටුව ගොස් නොයෙක් රස ඇති දිව බොජුන් හලක් පෙන්වා හුන්හ. රසයට ගිජු පුරුෂයා එහි රැඳුණේය. පෙර මෙන් ඔහු ද කා දමූ යක්ෂණියෝ දිව්‍යය ශයනාසන පනවාගෙන හුන්හ. පහසට ගිජු පුරුෂයා එයට ගොදුරු විය. බෝසත්හු හුදකලා වූහ. එවිට එක් යැකින්ණියක් මේ පුරුෂයා දැඩි සිත් ඇත්තෙකි. ඔහු නො නවතියි බෝසතුන් පසුපස ගියාය. වනයෙහි පසු භාගයෙහි වනයෙහි හැසිරෙන්නෝ, යකිණිය දැක පින්වතිය, පෙරටුව යන පුරුෂයා ඔබගේ කවරෙක්දැ යි විමසූහ. මහතුනි, ඔහු මගේ බාල කල සිට ම හිමියා වන්නේය. එවිට වනකැමියෝ බෝසතුන්ට පින්වත, මේ සිව්මැලි මල් දමක් සමාන රන්වන් කුමරිය කුල ගෙදර අතහැර ඔබ ම තකා එන්නීය. ඇය වෙහෙසවා ඇය මඟහැර යන්නේ මක්නිසා ද ? මහතුනි, මැය මගේ බිරිය නො වේ. ඇය යකින්ණියකි. මැය විසින් මගේ පුරුෂයන් පස් දෙනක් කා දමන ලදහ. එවිට යකින්න, මහතුනි, පුරුෂයෝ කිපුණු කල තම බිරියන් යකින්ණියන් කෙරෙති. ප්‍රේතියන් ද කෙරෙත්. මෙසේ යන අතර යකිණිය ගැබිණි වෙසක් ගෙන නැවත වරක් වැදූ ගැහැනියක මෙන් දරුවා කයෙන් ගෙන බෝසතුන් ලුහුබැන්දාය. දුටු දුටුවෝ පෙර මෙන් ම විචාරත්. බෝසත්හු පෙර මෙන් පිළිතුරු දෙමින් තක්සලා නුවරට ගියහ. ඇය ද පුතු අතුරුදන් කොට එකලා ව ලුහුබැන්දාය. බෝසත්හු නුවර දොරටුව ළඟ ශාලාවකට පිවිසියහ. යකිණිය බෝසතුන්ගේ තෙදින් පිවිසීමට නො හැකි ව දිව්‍යය ශරීරයක් මවාගෙන ශාලා දොරටුවෙහි සිටියාය. එවෙලාවෙහි රජ, නුවර සිට උයනට යන්නේ, ඇය දැක ඇළුණු සිතැත්තේ, ඇයට හිමියකු ඇති නැති බව දැන ගැනීම සඳහා මිනිසකු

යැවීය. ඔහු ඇය ළඟට ගොස් හිමියකු ඇති නැති බව විචාළේය. මම හිමියකු ඇත්තියක වෙමි. මේ ශාලාවෙහි සිටින්නේ මගේ හිමියාය. එවිට බෝසත්හු ඇය මගේ බිරිය නො වෙයි ඇය විසින් මගේ යහළුවන් පස් දෙනෙක් කන ලද්දාහැ යි කීහ. මහතාණෙනි, හිමියෝ කිපුණු කල කැමැති කැමැති දේ කියත්. රාජ පුරුෂයා ඒ දෙදෙනාගේ ම කථා පුවත් රජුට සැළ කළේය. රජ අයිතිකරුවකු නැති භාණ්ඩය රාජ සන්තක වෙතැ යි යකිණිය කැඳවා අසු පිටෙහි තබා නුවර පැදකුණු කොට පහසට නැඟී ඇය අග මෙහෙසි තනතුරෙහි තැබියු. අනතුරු ව රජ නා සුවඳ ආලේප කොට රාත්‍රී භෝජනය වළඳා සිරියහනට නැංගේය. ඒ යකින්න ද තමාට ගැළපෙන අහරක් ගෙන සව්බරණින් සැරසී සිරියහනෙහි රජු සමග නිදන්නී, රජු කාම සුවපහසින් සිටින කල්හි එක් පසකට නැඟී හඬන්ට වූවාය. ඉක්බිති, රජ, සොඳුර, මක්නිසා හඬන්නෙහි ද ? දේවයිනි, මම ඔබ විසින් මඟ දී දැක ගෙනෙන ලද්දී වෙමි. ඔබතුමාගේ මැදුරෙහි බොහෝ ස්ත්‍රීහු සිටිති. ඒ මට සපත්නීන් හෙවත් බහු භාර්යාවන් අතර ජීවත් වෙමින් සිටින්නී, ඔවුනතර මෙබඳු කථා ඇතිවිය හැක. තිගේ මව්පියෝ කවරහු ද ? තිගේ කුලගොත් කෙසේ දනිමු ද ? අතරමඟ දී දැක රැගෙන ආ බව දනිමු. මගේ හිසින් ගෙන පෙළන්නාක් මෙන් වූ කල්හි මම ලජ්ජා වන්නෙමි. ඉදින් ඔබතුමා සියලු නුවර ආධිපත්‍යය හා ආඥාදායකත්වයන් මට දෙන්නේ නම් කිසිවකුට මගේ හිත රිදවා කථා කැරන්ට නො හැකි වන්නේය. සොඳුරිය, රට වැසියන්ගෙන් මට කිසිවක් නැත. මම රට වැසියන්ගේ ස්වාමියා නො වෙයි. යමෙක් රජ අණ නො තකා වරද කරත් ද මම ඔවුන්ගේ ස්වාමියා වෙමි. මෙකරුණ නිසා මුළු රටෙහි අධිපති බව හෝ අණ කිරීමේ බලය දීමට නො හැකිය. එසේ නම් දේවයිනි, මුළු රටෙහි හෝ නුවරෙහි ආධිපත්‍යය හා ආඥාබලය දීමට නො හැකි නම් රජ මැදුර ඇතුළත් රජ මැදුර ඇසුරු කරන ජනයා කෙරෙහිත් මගේ අණසක පැවැත්වීමට අණ දෙනු මැනවි. දිවපහසින් බැඳුණු රජ ඇගේ ඉල්ලීම ඉවත දැමීමට නො හැකි ව මැනවි, සොඳුරිය. රජ මැදුර ඇතුළත සහ අභ්‍යන්තර ජනයා තම වසයෙහි පවත්වනු යි කීය. ඇය ද සතුටින් පිළිගෙන රජු නිද්‍රෝපගත වූ කල්හි යක්ෂ පුරයට ගොස් යකුන් කැඳවාගෙන අවුත් යකිණිය විසින් ම රජු මරනු ලැබ ඇට පමණක් ඉතිරි කොට නහර, සම්, මස්, ලේ සියල්ලම කෑවාය. ඉතිරි යක්ෂයෝ මහදොරටුවෙහි පටන් රජ මැදුර ඇතුළත කුකුල්, බලු ආදී සියල්ලෝම කා දමා ඇට පමණක් ඉතිරි කළහ දෙවැනි දවස්හි දොරවල් වැසූ පරිදි ම තිබෙනු දුටු මිනිස්සු පොරව

ආදියෙන් දොර ජනෙල් විවෘතකොට ඇතුළට පිවිස ඇටවලින් පිරුණු ගෙය දැක ඇය මගේ බිරිය නො වෙයි. ඇය යක්ෂණියකැ යි ඒ පුරුෂයා කී කථාව ඇත්තකි. රජතුමා කිසිවක් නො දැන ඇය තම මෙහෙසිය කළේය. ඇය යකුන් කැඳවා සියලු දෙනා කා දමා ගියා විය යුතු යි කීවාහුය. බෝසත්හු ද එදවස එම ශාලාවෙහි ම පිරිත් වැලි හිසෙහි විසුරුවාගෙන පිරිත් හුයෙන් වටකොට කඩුව ගෙන නිදි වර්ජිතව අරුණ නැංවූහ. නුවර වැසියෝ රැස්ව රජ මැඳුර පිරිසිදු කොට පිරිබඩ කොට මත්තෙහි සුවඳ විලවුන් උළා මල් විසුරුවා මල් දම් එල්වා සුවඳ දුම් දී අලුත් මල් දම් එල්වා සාකච්ඡා කළහ. පින්වත්නි, දෙවඟනක් සේ පෙන්වා පසුපසින් එන යකිණිය දෙස ඇස ඇර බැලීම් පමණකුදු නො කළ ඒ පුරුෂයා මහාත්මයකි. ධෛර්යය සම්පන්න සිටි නැණවතෙකි. එවැනි උතුමකු රාජ්‍යය අනුශාසනා කරන කල්හි සියලු රට සුඛිත වන්නේය. එවුන් රාජ්‍යාභිෂේක කරමු යි සියලු ඇමැතිවරු ද නුවර වැසියෝ ද ඒකමතික ව බෝසතුන් වෙත එළැඹ දේවයිනි, ඔබතුමා රාජ්‍යය කැරවනු මැනවැ යි නගරයට කැඳවා රුවන් රැසක් මත හිඳවා අභිෂේක කොට තක්සලා නුවර රජ කැරවීය. ඔහු සිව් අගතියෙන් තොරව දශ රාජ ධර්ම නො ඉක්මවා දැහැමින් රාජ්‍යය කැරවමින් දානාදී පින් කොට කම් වූ පරිදි මිය ගියේය. බුදු රජහු මේ ඉකුත්වත ගෙනහැර දක්වා මේ ගාථාව වදාළහ.

**"සමතිත්තිකං අනවසෙසකං තෙලපත්තං යථා පරිහරෙය්‍ය,**
**එවං සචිත්තමනුරක්ඛෙ පත්ථයානො දිසං අගතපුබ්බන්ති"**

"මුවවිට දක්වා පිරුණු තෙල් පාත්‍රය නො වැගිරෙන සේ ගෙන යන්නේ ද පෙර නො ගිය දිශාවට (නිවනට) යනු කැමැත්තේ, ස්වකීය සිත විසිර යා නො දී ආරක්‍ෂා කරන්නේය."

එහි, **"සමතිත්තිකං"**, ඇතුළත මුවවිට දක්වා පිරුණු "අනවසෙසකං", නො වැගිරෙන සේ, නො පෙරී යන සේ කොට, "**තෙලපත්තං**", තෙල් පිරුණු පාත්‍රය **"පරිහරෙය්‍ය"**, ගෙන යන්නේය, රැගෙන යන්නේය. **"එවං සචිත්තමනුරක්ඛෙ"**, තෙල් පිරුණු බඳුන මෙන්

තමාගේ සිතත් තම කයත් අරමුණු කොට ගත් සිහිය ද යන දෙඅතර තබා මොහොතක් වත් බැහැර අරමුණු නො ගෙන නුවණැති යෝගාවචරයා ආරක්‍ෂා කරන්නේ, සඟවන්නේ, මක්නිසා ද ?

මේ සිත වනාහි,

**"දුන්නිග්ගහස්ස ලහුනො යත්ථ කාමනිපාතිනො,**
**චිත්තස්ස දමථො සාධු චිත්තං දන්තං සුඛාවහං"**

"මැඩ පැවැත්වීමට අපහසු වූ, ඉක්මන් කමක් ඇති කුමන හෝ අරමුණක එල්බගන්නා වූ සිත දමනය කිරීම - යහපති. දමනය කිරීම සැප එළවන්නේය."

එසේ ම,

**"සුදුද්දසං සුනිපුණං යත්ථ කාමනිපාතිනං,**
**චිත්තං රක්ඛෙථ මෙධාවී චිත්තං ගුත්තං සුඛාවහං"**

"දැකීමට ඉතා අපහසු වූ, ඉතා සියුම් වූ, කැමැති අරමුණක වැටෙන්නා වූ සිත නුවණැත්තා ආරක්‍ෂා කරන්නේය. එසේ රැක ගත් සිත සැප එළවන්නේය."

තව ද මේ සිත වනාහි,

**"දූරඞ්ගමං එකචරං අසරීරං ගුහාසයං,**
**යෙ චිත්තං සඤ්ඤමෙස්සන්ති මොක්ඛන්ති මාරබන්ධනා"**

"දුර ගමන් කරන, එකලාව හැසිරෙන, පෙනෙන රූපයක් නැති, හෘදය නැමැති ගුහාවෙහි වසන්නා වූ සිත යම් කෙනෙක් සංවර කරත් ද ඔහු මාරයාගේ බැමිවලින් මිදෙති."

ආදීන ව වශයෙන් සිත සලකන විට,

"අනවට්ඨිතචිත්තස්ස සද්ධම්මං අවිජානතො,
පරිප්ලවපසාදස්ස පඤ්ඤා න පරිපූරති"

"එක අරමුණක නො සිටියා වූ, සත්‍යය ධර්මය නො දන්නා වූ, සැලෙන සැදැහැ ඇත්තාහුගේ නුවණ නො වැඩේ."

ස්ථිර කමටහන් ඇත්තහුගේ සිත වනාහි,

"අනවස්සුතචිත්තස්ස අනන්වාහතචෙතසො,
පුඤ්ඤපාපපහීනස්ස නත්ථි ජාගරතො භයං"

"රාගයෙන් තෙත් නො වූ සිත් ඇති, ද්වේශයෙන් දළ නො වූ සිත් ඇති, පින්පව් දුරු කළ කෙළෙස් නිධි නැති පුද්ගලයාට බයක් නැත."

මෙය ද දක්විය හැක,

"ඵන්දනං චපලං චිත්තං දුරක්ඛං දුන්නිවාරයං,
උජුං කරොති මෙධාවී උසුකාරොව තෙජනං"

"ඒ මේ අත පනින, එක් තැනක නො සිටින, රැකීමට අපහසු, වැළැක්වීමට දුෂ්කර වූ (සිත) නුවණැත්තා සෘජු කරයි. කෙසේ ද යත්, ඊ වඩුවා ලීයෙහි ඇද හරින්නාක් මෙනි."

මෙසේ ඇද හරිමින් තම සිත ආරක්‍ෂා කරන්නේය. "පත්ථයානො දිසං අගතපුබ්බන්ති", මේ කය අනුව නිසා කමටහන අරඹා මේ අක්මුල නැති සසරෙහි පෙර නො ගියා වූ දිශාව ප්‍රාර්ථනා

කැරෙමින් බලාපොරොත්තු වෙමින් තම සිත එකගත යුතුය යන අර්ථයි. මෙහි මේ දිශාව නම් කුමක් ද ?

"මාතා පිතා දිසාපුබ්බා ආචරියා දක්ඛිණා දිසා
පුත්තදාරා දිසා පච්ඡා මිත්තාමච්චා ච උත්තරා
දාසකම්මකරා හෙට්ඨා උද්ධං සමණබ්‍රාහ්මණා
එතා දිසා නමස්සෙය්‍ය අලමත්තො කුලෙ ගිහීති"

"මව්පියෝ පෙර දිගය. ගුරුවරු දකුණු දිශාය. අඹුදරුවෝ යට දිශාය. යහළු මිතුරන් උතුරු දිශාය. මහණ බමුණෝ උඩ දිශාය. දැසිදස් ආදීහු යට දිශාය, යන මේ සදිශාවන් ගිහි ගෙහි වසන, දියුණුව කැමැත්තහු විසින් නමස්කාර කළ යුතුය."

මෙහි දී ඒ ඒ පුද්ගලයන් දිශා වශයෙන් කියන ලදී.

"දිසා චතස්සො විදිසා චතස්සො
උද්ධං අධො දසදිසා ඉමායො
කතමං දිසං තිට්ඨති නාගරාජා
යමද්දසා සුපිනෙ ඡබ්බිසාණන්ති"

"සිහිනෙන් දුටු දළ සයක් ඇති ඒ ඇත් රාජයා සිව් දිශා, සිව් අනුදිශා, උඩ, යට යන මේ දශ දිශාවන්ගෙන් කවර දිශාවක සිටී ද ?"

මෙහි දී පෙරදිග ආදී සාමාන්‍යය දිශාවන් පිළිබඳ ව කියන ලදී.

"අගාරිනො අන්නදපාණවත්ථදා
අව්හායිකා නම්පි දිසං වදන්ති
එසා දිසා පරමා සෙතකෙතු
යං පත්වා දුක්ඛී සුඛිනො භවන්ති"

"පින්වත් සේත කේතු, ගිහි ගෙයි වෙසෙමින් ආහාර පාණ වස්ත්‍ර දෙන්නෝ ද සුගති ලෝකවලට කැඳවන හෙයින් මහණ, බමුණෝ ද ඒ දිශාවයැ යි කියති. යම් දිශාවකට පැමිණ දුකට පත්වූවෝ සැපවත් වෙත් ද ? ඒ දිශාව ඉතා උසස්ය.

මෙහි නිවන දිශා වශයෙන් කියන ලදී. මෙහි දී දිශා වශයෙන් නිවන දක්වන ලදී. එහි රාගය නැසීම ආදී ලක්‍ෂණ දක්නා ලැබේ. එම නිසා දිශා යි කියති. අක් මුල් නැති සසරෙහි කිසිම බාල පුහුදුන් අයකු විසින් සිහිනෙන් හෝ නො ගිය විරූ බැවින් "**අගතපුබ්බා දිසා**" නැමැයි කියන ලදී. එය පතන්නහු විසින් කය පිළිබඳ සිහිය කටයුතුය. මෙසේ බුදු රජහු නිවන කුළුගන්වා ජාතකය නිමවූහ. එදා රජ පිරිස බුදු පිරිස විය. රජ පැමිණි කුමරු මම ම වීමි.

## 1. 10. 7.

## නාමසිද්ධි ජාතකය

"**ජීවකඤ්ච මතං දිසවාති**" යන මේ දේශනාව බුදුහු ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, එක් නමින්ම වැඩ කැමැති එක් භික්‍ෂුවක් අරබයා වදාළහ.

එක් කුල පුත්‍රයෙක් නමින් පාපක නම්. හෙතෙම සසුනෙහි ළය දී පැවිදි වූයේ භික්‍ෂූන් විසින් ඇවැත්නි පාපක, එව. ඇවැත්නි පාපක, සිටු යි කියනු ලබන්නේ මෙසේ සිතුවේය. ලොවෙහි පාපක නම ලාමකය. කාලකණ්ණි වූවක්යැ යි කියයි. වෙනත් මංගල සම්මත නමක් ගෙන එන්නෙමි. හෙතෙම ගුරුවර උපාධ්‍යායන් වෙත එළැඹ ස්වාමීනි, මගේ නම අවමංගලයකි. මට වෙනත් නමක් තබනු මැනවැ යි කීවේය. ඉක්බිති, ඔහුට මෙසේ කීවාහුය. ඇවැත්නි, නාමය නම්

පැනවීම් මාත්‍රයකි. නමින් කිසියම් ප්‍රයෝජනයක් නම් නැත. තමන්ගේ නමින් ම සතුටු වෙනු. ඔහු නැවත නැවතත් ඉල්ලුවේය. ඔහුගේ මේ නමින් කාර්යය සිද්ධිය අපේක්ෂා කරන්නෙක් බව භික්ෂු සංඝයා අතර ප්‍රකට විය. ඉක්බිති, එක් දිනක් දම් සබාවෙහි හුන් භික්ෂූහු මේ කථාව ඉපද වූහ. ඇවැත්නි, අසවල් භික්ෂුව නමින් කාර්යය සිද්ධිය අපේක්ෂා කරන්නෙකි. යහපත් නමක් ආරෝපණය කැර ගැනීමට කැමැති වේ. ඉක්බිති, බුදුහු දම් සබාවට වඩමවා මහණෙනි, කවර කථාවකින් හුන්නාහුද යි විචාරා මෙනම් කථාවක් කරමින් හුන්නෙහු යි කී කල්හි මහණෙනි, ඒ භික්ෂුව නමින් කාර්යය සිද්ධිය බලාපොරොත්තු වූයේ දැන් පමණක් නො වෙයි. මෙතෙම පෙර ද නමින් කාර්යය සිද්ධිය බලාපොරොත්තු වූයේ මයැයි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර තක්සලාවෙහි බෝසත්හු දිසාපාමොක් ඇදුරු ව පන්සියයක් මානවකයන්ට මන්ත්‍ර ඉගැන්වීය. ඔහුගේ එක් මානවකයෙක් නමින් පාපක නම් විය. හෙතෙම එව පාපක, යව පාපක යි කියනු ලබන්නේ, මෙසේ සිතුවේය. මගේ නම අශුභයි. වෙනත් නමක් ලබා ගන්නෙමි. හෙතෙම ගුරුතුමා වෙත එළැඹ ගුරුතුමනි, මගේ නම අශුභයි. මට වෙනත් නමක් තබන්නැ යි කීවේය. ඉක්බිති, ඔහුට ඇදුරුතුමා මෙසේ කීවේය. දරුව! යව. ජනපදයෙහි සැරිසරා තමන්ට මනාප එක් ශුභ නමක් ගෙන එව. ආවිට ඒ නම වෙනස් කොට වෙනත් නමක් කරන්නෙමි. හෙතෙම යහපතැ යි මඟ වියදම් රැගෙන නික්මුණේ, ගමින් ගම හැසිරෙන්නේ, එක් නගරයකට පැමිණියේය.

එහි එක් පුරුෂයෙක් කලුරිය කළේය. නමින් ජීවක නම් විය. හෙතෙම ඔහු නෑ ජනයා විසින් මිනී දමන තැනට ගෙන යනු දැක මේ පුරුෂයා කුමන නමකින් යුතුදැ යි විචාළේය. මොහු ජීවක නම් විය. ජීවක ද මැරෙයි ද ? ජීවකයා ද මැරෙයි. අජීවකයාත් මැරෙයි. නම නම් පැනවීම් මාත්‍රයක් පමණි. නුඹ මෝඩයකුයැ යි හැඟෙයි. ඔහු ඒ කථාව අසා නම ගැන මැදහත් වී ඇතුල් නගරයට පිවිසියේය. ඉක්බිති, එක් දාසියකට කුලිය නො දෙන ස්වාමිවරු දොරටුවෙහි ඇය හිඳුවා ලණුවෙන් පහර දෙත්. ඇයට ද ධනපාලී යි නමක් විය. හෙතෙම ඇතුල් වීථියෙහි යන්නේ, ඇයට තලනු දැක කුමක් නිසා ඇයට පහර දෙන්නේදැ යි විචාළේය. කුලිය දෙන්නට නො හැක්කේය. මැගේ නම කුමක් ද ? ධනපාලී නම් වෙයි. නමින් ධනය පාලනය කරන්නියක් වුව ද කුලිය පමණවත් දෙන්නට නො හැක්කේ ද ?

ධනපාලියෝ ද අධනපාලියෝ මෙන් දුප්පත් වෙත්. නාමය නම් පැනවීම් මාත්‍රයක් පමණි. නුඹ වනාහි බාලයකුයැ යි හඟී. ඔහු නාමයෙහි මධ්‍යස්ථතර වී නුවරින් නික්මී මඟට පිළිපන්නේ, අතරමඟ දී මංමුළා වූ පුරුෂයකු දැක එම්බා, කුමක් කැරෙමින් හැසිරෙන්නේදැ යි විචාළේය. මංමුළා වූයෙමි, ස්වාමීනි. ඔබගේ නම කුමක් ද ? පන්ථක නම් විය. පන්ථකටත් මඟ වරදින්නේ ද ? (පන්ථක - මඟෙහි උපන්) පන්ථක වුවත් අපන්ථක වුවත් මංමුළා වෙයි. නාමය නම් පැනවීම් මාත්‍රයකි. නුඹ බාලයකුයැ යි හඟිමි. හෙතෙම බෝසතුන් වෙතට ගොස් කිම දරුව, නමට රුචි කොට ආවේදැ යි කී කල්හි ගුරුතුමනි, ජීවකයෝත් මැරෙති. අජීවකයෝත් මැරෙති. ධනපාලියෝත් දුප්පත් වෙති. අධනපාලියෝත් දුප්පත් වෙති. පන්ථකයොත් අපන්ථකයෝත් මංමුළා වෙති. නාමය නම් පැනවීම් මාත්‍රයකි. නාමයෙන් විශේෂ අභිවෘද්ධියක් නැත. ක්‍රියාවෙන් ම අභිවෘද්ධියක් වෙන්නේය. මට වෙනත් නමකින් ඵලක් නැත. ඒ නම ම මට වේවා යි කීවේය. බෝසත්හු ඔහු දුටු දේත් කළ දේත් සසඳා මේ ගාථාව කීහ.

"ජීවකඤ්ච මතං දිස්වා ධනපාලිඤ්ච දුග්ගතං,
පන්ථකඤ්ච වනෙ මූළ්හං පාපකො පුනරාගතොති"

"ජීවකයා ද මළ වූවා දැක ධනපාලී ද දුගී වූවා දැක
පන්ථකයා ද මඟෙහි මංමුළා වූවා දැක පාපක නැමැත්තා
(ආපසු) ආවේය."

එහි, "පුනරාගතො", මේ කාරණා තුන දැක නැවත ආවේය. 'ර' කාරය සන්ධි වශයෙන් කියන ලදී.

බුදුහු මේ අතීත කථාව ගෙනහැර දක්වා මහණෙනි, මොහු නාමයෙන් කාර්යය සිද්ධිය අපේක්ෂා කරන්නකු වූයේ දැන් පමණක් නො වේ. පෙරත් නාම සිද්ධියකු වූයේයැ යි කියා ජාතක කථාව නිම කළහ. එකල නාම සිද්ධිකයා දැනුත් නාම සිද්ධික විය. ඇදුරු පිරිස බුදු පිරිස වූහ. ඇදුරුතුමා වනාහි මම ම වීමි.

## 1. 10. 8.

# කූටවාණිජ ජාතකය

"සාධු බො පණ්ඩිතො නාමාති" යන මේ දේශනාව බුදුහු ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, එක් කපටි වෙළෙන්දකු අරබයා වදාළහ.

සැවැත්නුවර වැසි දෙදෙනෙක් එකට වෙළඳාම් කරන්නාහු, බඩු ගෙන ජනපදයට ගොස් අලෙවි කොට ලබන ලද ලාභ ඇත්තාහු, ආපසු ආවාහුය. ඔවුන් දෙදෙනාගෙන් කපටි වෙළෙන්දා මෙසේ සිතීය. මේ තෙම බොහෝ දිනක් නිසියාකාර ආහාරයක් හෝ හරි නින්දක් ද නැතිකමින් ක්ලාන්ත වූයේ, දැන් තමාගේ නිවසෙහි නොයෙක් රසයෙන් යුක්ත වූ ආහාර ඇති තරම් අනුභව කොට නො දිරවීමෙන් මැරෙන්නේය. ඉක්බිති, මම මේ සියලු බඩු කොටස් තුනකට බෙදා එක් කොටසක් ඔහුගේ අඹු දරුවන්ට දෙන්නෙමි. කොටස් දෙකක් මා සඳහා ගන්නෙමි. හෙතෙම අද බෙදන්නෙමි. හෙට බෙදන්නෙමි යි බඩු බෙදන්නට කැමැති නො වීය. ඉත්බිති, ඔහු අකැමැති ව සිටිය දී ම නුවණැති වෙළෙන්දා ඔහුට බල කොට බෙදවා විහාරයට ගොස් බුදුන් වැඳ කරන ලද පිළිසඳර ඇත්තේ, බොහෝ ප්‍රමාද ව කොහි සිට මෙහි අවුත් කලකින් බුද්ධෝපස්ථානයවට ආවාදැ යි කී කල්හි ඒ පුවත බුදු රජුන්ට සැලකළහ. බුදු රජහු ඔහු කපටි වෙළෙන්දකු වූයේ දැන් පමණක් නොව පෙරත් කපටි වෙළෙන්දෙක් වූයේමැ යි දැන් වනාහි අනුන් රවටනු කෙනකු ම වූයේය. පෙර ද පණ්ඩිතයන් වංචා කරන්නට උත්සාහ කළේයැ යි වදාරා ඔහු විසින් අයදනා ලද බුදු රජහු අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු බරණැස් නුවර වෙළඳ කුලයක උපන්හ. නම් තබන දවසෙහි ඔහුට පණ්ඩිත යි නම් කළහ. වැඩිවියපත් වූ ඔහු දිනක් වෙළෙන්දකු සමග එකතු වී වෙළඳාම් කරයි. ඔහුගේ නම අතිපන්ඩිත නම්. ඒ දෙදෙනා බරණැසින් ගැල් පන්සියයකින් භාණ්ඩ ගෙන පසල් දනව්වලට ගොස් වෙළඳාම් කොට ලබන ලද ලාභ ඇත්තෝ, නැවත බරණැසට ම ආවාහුය. ඉක්බිති, ඔවුන් භාණ්ඩ බෙදන කල්හි

අතිපන්ඩිත, මා විසින් කොටස් දෙකක් ලැබිය යුතුයැ යි කීවේය. ඊට හේතු කවරේ ද ? ඔබ පණ්ඩිතය. මම අතිපන්ඩිත වෙමි. පණ්ඩිතයා එක් කොටසක් ලැබීමට සුදුසුය. එවිට පණ්ඩිතයා, යහළුව, අපි දෙදෙනාගේ භාණ්ඩ මිල සමානය. එසේ ම ගොන් ගැල් ආදිය ද සම සමය. එසේ තිබිය දී ඔබ කොටස් දෙකක් ලැබීමට සුදුසු වන්නේ කෙසේ ද ? මා අතිපන්ඩිත බැවිනි. මෙසේ ඔවුන් වාදවිවාද කොට කෝලාහල කළහ. මෙහි දී අතිපන්ඩිත එක්තරා උපායක් ඇතැ යි සිතා තමන්ගේ පියා වෙතට ගොස් ඔහු එක් ගස් සිදුරක සඟවා මෙසේ කීය. ඔබ අප අවුත් විමසූ කල්හි අතිපන්ඩිතට දෙකොටසක් හා පණ්ඩිතට එක් කොටසක් ලැබීමට සුදුසුයැ යි කියන්නැ යි කියා බෝසතුන් වෙත එළැඹ යහළුව, මට කොටස් දෙකක් ලැබීමට යුතු බව හෝ අයුතු බව හෝ මේ රුක් දෙවියා දනීය. එව. ඔහු විචාරන්නෙමි යි ඔහු එහි පමුණුවා ආර්යය රුක් දෙවියාණෙනි, අපගේ නඩුව පසිඳනු මැනවැ යි කීවේය. ඉක්බිති, ඔහුගේ පියා ස්වරය වෙනස් කොට එසේ නම් කියව යි කීවේය. ආර්යයෙනි, මොහු පණ්ඩිතය. මම අතිපන්ඩිතය. අප විසින් එකට වෙළඳාම් කරන ලදී. එහි දී කවරකු කොපමණක් ලැබිය යුතු ද ? පණ්ඩිතයා එක් කොටසක් ද අතිපන්ඩිතයා කොටස් දෙකක් ද ලැබිය යුතුයි. බෝසත්හු මෙසේ විසඳන ලද නඩුව අසා ඔහු දෙවියකු වන්නේ ද දෙවියකු නො වන්නේ ද යන්න දැන ගන්නෙමි යි පිදුරු ගෙනවුත් සිදුර පුරවා ගිනි දැල්වීය. අතිපන්ඩිතයාගේ පියා ගිනි දැල් ලත් කල්හි අඩක් දැවීමෙන් සිදුරෙන් උඩට නැඟී අත්තක් ගෙන එල්ලෙන්නේ, බිමට වැටී මේ ගාථා කීවේය.

**"සාධුඛො පණ්ඩිතො නාම නත්වෙව අතිපණ්ඩිතො,**
**අතිපණ්ඩිතෙන පුත්තෙන මනම්හි උපකූලිතොති"**

"පණ්ඩිතයා යහපති. අතිපන්ඩිතයා උතුම් නො වේ.
අතිපන්ඩිත පුත්‍රයා නිසා අඩක් දැවුණේ වෙමි."

එහි, **"සාධුඛො පණ්ඩිතො නාම"**, ලෝකයෙහි දැනඋගත් කාරණ අකාරණ දන්නා මැනවි. හොබනේය. **"අතිපණ්ඩිතො"**, නාම මාත්‍රයෙන් අතිපන්ඩිත වූ කපටි පුරුෂයා උතුම් නො වේ. **"මනම්හි උපකූලිතො"**, අඩක් දැවී මිදුනෙමි යි යන අර්ථයි. පසු ව ඒ දෙදෙනා සම සේ

කොටස් බෙදා ගත්හ. මරණින් පසු කම් වූ පරිදි ගියහ. බුදු රජහු මොහු පෙරත් සොර වෙළෙන්දකු වූයේමැ යි ජාතක කථාව නිමවූහ. එදින සොර වෙළෙන්දා දැන් සොර වෙළෙන්දා ම විය. පණ්ඩිත වෙළෙන්දා මම ම වීමි.

## 1. 10. 9.

## පරෝසහස්ස ජාතකය

"**පරොසහස්සම්පි සමාගතානං**" යන මේ ජාතක දේශනාව බුදුහු දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, පුහුදුන් පැන විචාරීමක් අරබයා දෙසූහ. මෙහි කථා පුවත සරභංග ජාතකයෙහි මතු වන්නේය. එක් සමයෙක්හි භික්ෂූහු දම් සබාවෙහි රැස්ව ඇවැත්නි, බුදු රජුන් විසින් ලුහුඬින් දෙසන ලද ධර්මය දම් සෙනෙවි සැරියුත් තෙරණුවෝ සවිස්තර ව දෙසූහැ යි තෙරුන්ගේ ගුණ කියමින් හුන්නාහුය. බුදු රජහු වැඩම්වා මහණෙනි, දැන් මෙහි කවර කථාවකින් හුන්නාහුද යි වදාරා ස්වාමීනි, මෙනම් කථාවකින් හුන්නෙමු යි කී කල්හි මහණෙනි, සාරිපුත්ත මා විසින් ලුහුඬින් දෙසූ දහම් විස්තර වශයෙන් දේශනා කළේ දැන් පමණක් නො වේ. පෙර ද ප්‍රකාශ කළේමැ යි වදාරා ඉකුත් වත ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කැරන කල්හි බෝසත්හු උසස් බමුණු කුලයෙහි ඉපිද තක්සලාවෙන් සියලු ශිල්ප උගෙන කාමයන් අත්හැර තවුස් පැවිද්දෙන් පැවිදි ව පඤ්ච අභිඥා සහ අෂ්ට සමාපත්ති උපදවා හිමවතෙහි විසූහ. ඔහුට පන්සියයක් තවුස් පිරිවර වූහ. දෙටු අතවැසි තවුසා වැසි කාලයෙහි අඩක් තවුස් පිරිවර ගෙන ලුණුඇඹුල් සොයනු සඳහා මිනිස් පියසට ගියේය. එකල්හි බෝසතුන්ගේ කලුරිය කරන කාලය පැමිණියේය. ඉක්බිති, අතවැසි තවුසෝ ඔබතුමන් ලැබූ විශේෂ ගුණය කුමක්ද යි විමසූහ. බෝසත්හු ද කිසිවක් නැතැ යි ප්‍රකාශ කොට මිය ගොස් ආභස්සර බඹ ලොව උපන්හ. බෝසත්හු අරූපධ්‍යාන ලාභී වුව ද බෝසතුන්ට

නුසුදුසු ලොවක් බැවින් අරූප බඹ ලොව නූපන්හ. අතවැස්සෝ ගුරුතුමන් ලබාගත් විශේෂ ගුණයක් නැතැ යි ශරීරය ආදාහනය කිරීමේ දී සත්කාර සම්මාන නො කළහ. දෙටු අතවැසි තවුසා ආපසු අවුත් ගුරුතුමා කොහිද යි විචාළහ. මියගිය බව දැන ගත් පසු ඇවැත්නි, ගුරුතුමා ලබාගත් විශේෂ ගුණ පිළිබඳ ව ඔබලා එතුමන්ගෙන් විමසුවහුද යි ඇසීය. එසේය, අපි ඇසීමු. එතුමන් විසින් කිසිවක් නැතැ යි කියන ලදී. එම නිසා අපි එතුමන්ට කිසි සත්කාරයක් නො කළෙමු යි කීහ. ඔබලා ගුරුතුමන්ගේ වචනෙහි අරුත නො දන්නහුය. ගුරුතුමාණෝ අකිඤ්චඤ්ඤායතන තෙවැනි අරූප ධ්‍යාන ලාභියෙකි. එහෙත් අතවැසි තවුසෝ දෙටු තවුසාගේ වචනය නො ඇදවූහ. බෝසත්හු බඹ ලොව සිට මෙකරුණ දැන, මේ අඳබාල තවුසෝ මගේ දෙටු තවුසාගේ වචනය නො අදහති. මම ඔවුන් දැනුවත් කැරවමි යි බඹ ලොවින් අවුත් අසපුව මත අහසෙහි මහත් තෙදින් පෙනී සිට තම දෙටු තවුසාගේ නැණවත් බව වණමින් මේ ගාථාව කීහ.

**"පරොසහස්සම්පි සමාගතානං**
**කන්දෙය්‍යුං තෙ වස්සසතං අපඤ්ඤා,**
**එකොච සෙය්‍යො පුරිසො සපඤ්ඤො**
**යො භාසිතස්ස විජානාති අත්ථන්ති"**

"එකට රැස්වූවන් අතුරින් දහසකට අධික වූ නුවණනැති ඔවුහු සියවසක් හැඬුව ද වචනාර්ථය නො දනිති. යමකු ප්‍රකාශිතයෙහි අර්ථය දනී ද ඒ එක ම පුරුෂයා උතුම්ය."

එහි, "**පරොසහස්සම්පි**", දහසකට වැඩි වුව ද "**සමාගතානං**", රැස්වූවන් භාෂිතයෙහි අර්ථය අවබෝධ කිරීමට අසමත් වූවන්ය. බාලයන්ය. "**කන්දෙය්‍යුං තෙ වස්සසතං අපඤ්ඤා**", මෙසේ රැස්වූ නුවණනැති මේ බාල ජනයා අතවැසි තවුසන් මෙන් වසර සියයක් වසර දහසක් හැඬුව ද අර්ථය හෙවත් කාරණය අවබෝධ නො කරතැ යි දක්වයි. "**එකොච සෙය්‍යො පුරිසො සපඤ්ඤො**", එවැනි බාලයන් දහසකට වඩා එක් නුවණැති පුරුෂයා ම ඉතා උතුම් යන අර්ථයි. කෙබඳු නුවණැත්තෙක් ද ? "**යො භාසිතස්ස විජානාති**

අතථන්ති", යමෙක් ප්‍රකාශිත වචනයෙහි අදහස දනිත් ද, ඔහු දෙටු අතවැසියා මෙනි.

මෙසේ බෝසත්හු අහසෙහි වැඩ සිට ම දම් දෙසා තාපස සමූහය දනුවත් කොට බඹ ලොවට ම වැඩියහ. ඒ තවුස් සමුහයා ද දිවි කෙළවර බඹ ලොව පිහිට කොට ගියහ. බුදු රජහු මේ දම් දෙසුම වදාරා ජාතකය නිමවූහ. එදා දෙටු අතවැසියා සැරියුත් තෙරණුවෝ වූහ. මහා බ්‍රහ්මයා වනාහි මම ම වීමි.

## 1. 10. 10.

## අසාතරූප ජාතකය

"අසාතං සාතරූපෙනාති" යන මේ ජාතකය බුදු රජහු කුණ්ඩිය නම් නුවර ඇසුරු කොට කුණ්ඩධාන වනයෙහි වසන සේක්, කෝලිය රජ දියණිය වූ සුප්පවාසා උපාසිකාව අරබයා දේශනා කළහ. ඈ ඒ කල්හි සත් වසක් දරු ගැබ කුසින් දරා ප්‍රසව වේදනාවෙන් දරුවා බිහිකළ නො හැකි ව සිටියාය. මෙසේ මහත් වේදනා උපන. මෙසේ මහත් වේදනාවෙන් පීඩිත ව සිටිය ද සම්මා සම්බුදු වූ ඒ භගවත්හු මෙබඳු දුක් වේදනා දුරු කිරීම පිණිස දම් දෙසත්. ඒ බුදු රජුන්ගේ සුපිලිසන් ශ්‍රාවකයෝ ද මෙබඳු දුක් වේදනා දුරු කිරීමට පිළිපන්හ. යම් තැනක මෙබඳු දුක් නැද්ද ඒ නිවන ඒකාන්තයෙන් සැපය යන මේ තුන් සිතුවිලිවලින් ඒ දුක් වේදනා ඉවසා සිටියාය. ඇය තම සැමියා කැඳවා තමාගේ තත්ත්වයත් තම වේදනාවත් බුදු රජුන්ට සැල කරනු පිණිස බුදු රජුන් වෙත යැව්වාය. බුදුහු පුවත අසා සුප්පවාසා කෝලිය රජ දියණියට නිදුක් නිරෝගී ව නීරෝගී පුතකු බිහිවේවා යි වදාළහ. බුදු රජුන්ගේ ඒ වචනය සමග ම ඇය තමා ද නිරෝගී ව නීරෝගී පුතකු බිහි කළාය. ඇගේ සැමියා ගෙදරට පැමිණෙන කල්හි ම ඇය දරුවා බිහි කළ බව දක බුදු රජුන්ගේ මහිමය පිළිබඳ ව පුදුම වූයේය. සුප්පවාසා ද දරු ප්‍රසූතිය කොට සත් දිනක් බුදුපාමොක් මහසඟනට දන් දෙනු කැමැති ව ආරාධනය

සඳහා නැවත හිමියා වෙහෙරට යැව්වාය.

ඒ වනවිට මහා මුගලන් තෙරණුවන්ගේ දායකයකු විසින් බුදුපාමොක් මහසඟන ආරාධනා කරන ලද්දේ වෙයි. බුදුහු සුප්පවාසාවගේ දානයට ඉඩ ලබා දෙනු සඳහා ඔහු තෙරුන් වෙත යවා සත් දවසක් තුළ ඇගේ දානය භික්ෂු සංඝයා සමග පිළිගත්හ. සත් වැනි දින සුප්පාවාස සීවලී කුමරු සරසා බුදු රජුන්ට ද මහසඟනට ද වැන්දවූවාය. පිළිවෙළින් සැරියුත් තෙරුන් වෙත ගෙන එනු ලැබූ කල්හි, සීවලී කුමරුනි, සැපදුක් කෙසේදැ යි පිළිසඳර කථා කළහ. එවිට කුමරු ස්වාමීනි, සැපයක් නම් කොයින් ද ? සත් වසක් ලොහො සැළියක විසුවෙමි. තෙරුන් සමග මෙබඳු කථා කළේය. සුප්පවාසා මෙවදන් අසා සත් දිනකට පෙර උපන් මගේ පුත්‍රයා දම් සබාවෙහි සැරියුත් තෙරණුවන් සමග කථා කරතැ යි සතුටු වූවාය. ඉක්බිති, බුදු රජහු, සුප්පවාසාවෙනි, මෙබඳු තවත් පුතුන් කැමැත්තෙහිදැ යි ඇසූහ. ස්වාමීනි, මම මෙබඳු පුතුන් තවත් සත් දෙනකු කැමැත්තෙමි යි කීවාය. බුදු රජහු සතුට ප්‍රකාශ කොට අනුමෙවෙන් දම් දෙසා වැඩියහ. සීවලී කුමරු ද සත් වස් කල්හි ම සසුනට ලැදි ව පැවිදි ව උපසපන් ව ප්‍රත්‍යලාභයෙන් අගතැන් පත්ව පොළොව කම්පා කැරවමින් රහත් බවට පැමිණ පුණ්‍යවන්තයන් අතරෙහි අග්‍ර ස්ථානගත ව පැමිණියේය. ඉක්බිති, එක් දවසක් භික්ෂූහු දම් සබාවෙහි රැස්ව ඇවැත්නි, මේ සීවලී තෙරණුවෝ මෙබඳු මහා පිනැත්තෝය. කරන ලද සසර ප්‍රාර්ථනා ඇතියහ. මේ අන්තිම අත්බැව්හි සිටියෝය. එහෙත් සත් වසක් ලොහො සැළියක සිටියෝය. සත් දවසක් ගර්භ මුර්ජාවට පැමිණියහ. අහෝ! මව සහ පුතා මහත් දුකක් වින්දහ. ඔවුහු කිනම් පවක් කළෝදැ යි කථාවක් ඉපද වූහ. බුදු රජහු දම් සබාවට වැඩමවා මහණෙනි, කිනම් කථාවකින් හුන්නාහුදැ යි විචාරා මෙනම් කථාවකිනැ යි කී කල්හි මහණෙනි, මහපිනැති වුව ද සීවලී සත් වසක් ලොහො සැළියක විසීම ද සත් දවසක් ගර්භ මුර්ඡාවෙන් විසීම ද පෙර කළ කර්මයක් මුල්කොට ඇත්තකි. සුප්පවාසාව ද සත් වසක් කුස දරු ගැබ දැරීමේ දුක ද සත් දවසක් ගර්භ මුර්ඡා දුක ද තම කර්මයක් මුල්කොට වූ බව වදාරා ඔවුන් විසින් අයදනා ලද ව අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු ඔහුගේ අග මෙහෙසියගේ කුසෙහි පිළිසිඳ ගෙන වැඩිවියට

පැමිණියාහු, තක්සලා නුවර දී සියලු ශිල්ප උගෙන පිය රජු ඇවෑමෙන් රාජ්‍යයට පැමිණ දැහැමින් රාජ්‍යය කළේය. එකල්හි, කොසොල් රජ මහත් සේනාවක් සමග අවුත් බරණැස් නුවර ගෙන රජු මරා ඔහුගේ ම අග මෙහෙසිය තමාගේ අග මෙහෙසිය කළේය. බරණැස් රජුගේ පුත්‍රයා පිය රජු මියයන කාලයේ දී දුම් කවුළුවෙන් නික්ම සෙනඟ රැස්කොට නගරයට නුදුරින් හිඳ ඒ රජුට හසුන් යැවීය. රාජ්‍යය දෙනු. නැතිනම් යුද්ධය වේවා. ඔහු යුද්ධය දෙමි යි පිළිහසුන් යැවීය. රජ කුමරුගේ මව ඒ හසුන අසා යුද්ධයෙන් කම් නැත. සියලු දිශාවන්හි සංචාරය නවත්වා බරණැස් නුවර වටලනු. ඉන්පසු දර දිය ආහාර නැතිවීමෙන් වෙහෙසට පත් මිනිසුන් ඇති නුවර යුද්ධයකින් තොරව අල්ලාගත හැකි වේ යි හසුන් යැව්වාය. ඔහු ද මවගේ හසුන අසා සත් දිනක් නුවර අවහිර කොට නගරය වැසීය. නුවර වැසියෝ ගමන් බිමන් නො ලබන්නාහු, සත් වැනි දින ඒ රජුගේ හිස ගෙන කුමරුට දුන්නාහ. කුමරු ද නුවරට පැමිණ රාජ්‍යය ගෙන ආයු කෙළවර කම් වූ පරිදි ගියේය. ඔහු සත් දිනක් මිනිස් හසර නවත්වා නගරය අවහිර කොට අල්ලාගත් කර්මයෙහි විපාක වශයෙන් මෙ අත් බැව්හි සත් වසක් ලොහෝ සැලියක වැස සත් දවසක් ගර්භ මූර්ඡා බවට පැමිණියේය. යම් දවසක හෙතෙම පියුමතුරා බුදුන් කල ලාභීන්ගෙන් අග තැන්පත් වෙමි යි ප්‍රාර්ථනාවක් කළේ ද විපස්සී බුදුන් කල උක් හකුරු හා වෙඬරු දන් දී යම් ප්‍රාර්ථනාවක් කළේ ද එහි විපාක වශයෙන් ලාභීන්ගෙන් අග්‍ර වූහ. සුප්පවාසාව ද, දරුව, නගරය අවහිර කොට ගනුව යි හසුන් යැවූ බැවින් සත් වසක් කුසින් දරු ගැබ දැරීමටත් සත් දවසක් ප්‍රසව වේදනා විඳීමටත් සිදුවූවාය. බුදුහු මේ ජාතක කථාව ගෙන හැර දක්වා මේ ගාථාව වදාළහ.

"අසාතං සාතරූපෙන පියරූපෙන අප්පියං,
දුක්ඛං සුඛස්සරූපෙන පමත්තමතිවත්තතීති"

"අමිහිරි දෙය මිහිරි ආකාරයෙන් ද අප්‍රිය දෙය ප්‍රිය වශයෙන් ද දුක සැප ආකාරයෙන් ද මුළා වූ පුද්ගලයා යටපත් කරයි."

එහි, **"අසාතං සාතරූපෙන"**, අමිහිරි දෙය මිහිරි ස්වරූපයෙන් ද **"පමත්තමතිවත්තතීති"**, අමිහිරි, නො කැමැති, දුක් යන මේ ත්‍රිවිධ

අවස්ථාව මිහිරි, කැමැති, සැප (සාත, පිය, සුඛ) වශයෙන් නුවණින් තොර වූ ප්‍රමාදී පුද්ගලයා ඉක්මවා යයි, මැඩ පවත්වයි, යටපත් කරයි, යන අර්ථයි.

මෙහි දී මව්පුත් දෙදෙන සත් වසක් ගැබ් දැරීම, ගැබ තුළ විසීම් සංඛ්‍යාත අමිහිරි දෙයින් පෙර නගරය අවහිර කිරීම නම්වූ මිහිරියෙන් යටපත් කරණ ලද්දේය. දැන් ඒ සුප්පවාසා උවැසිය, තවත් සත් වරක් මෙබඳු අමිහිරි, අප්‍රිය වූ, දුක් සමග ම මධුරප්‍රති රූපකයෙන් වැසී යන ලද්දී ව මේ ආකාරයෙන් කීවාය. මේ සියල්ල සඳහා බුදු රජහු මෙසේ වදාරණ ලද යි දතයුතුයි. බුදුහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා ජාතකය නිමවූහ. එදා නගරය අවුරා රජ පැමිණි කුමරා සීවලී විය. මව සුප්පවාසා වූවාය. පියා වූ බරණැස් රජු මම ම වීමි.

## දස වැනි ලිත්ත වර්ගයයි

## මැදුම් පණස නිමියේය.

1. 11. 1.

## පරෝස ජාතකය

**"පරොසතඤ්චෙපි සමාගතානං**
**ඣායෙය්‍යුං තෙ වස්සසතං අපඤ්ඤා,**
**එකොව සෙය්‍යො පුරිසො සපඤ්ඤො**
**යො භාසිතස්ස විජානාති අත්ථන්ති"**

"රැස්වූවන් අතර සියයකට අධික වූ ද නුවණ නැති ඔවුන් අවුරුදු සියයක් පරීක්ෂා කොට බලමින් සිටිය ද උතුම් නො වේ. යමෙක් ප්‍රකාශිත වචනයේ අර්ථය දනී ද ඒ නැණවත් එක ම පුරුෂයා උතුම් වේ."

මේ ජාතක කථාවෙහි කථා පුවත වශයෙන් ද විස්තර කථාව අනුව ද නිමා කිරීම අනුව ද පරෝසහස්ස ජාතකය හා සමාන වේ. මෙහි ඣායෙය්‍යු යි පදය පමණක් වෙනස් වේ. එහි අර්ථය නම් වස් සියයක් නුවණ නැති ව බලා සිටී. අවධානය යොමු කොට සිටී. මෙසේ සිටිය ද අර්ථය හෝ හේතුව නො දකිත්. එම නිසා යමෙක් අර්ථය දනී ද ඔහු ම නැණවතා වෙත්. ශ්‍රේෂ්ඨයා වෙත්.

1. 11. 2.

## පණ්ණික ජාතකය

**"යො දුක්ඛඵුට්ඨාය භවෙය්‍ය තාණන්ති"** යන මේ ජාතක දේශනාව බුදු රජහු දෙව්රම් වෙහෙර වසන සේක්, පළා වෙළඳාම් කරන උපාසකයකු අරබයා දෙසූහ. සැවත්නුවර වැසි ඒ උපාසකයා විවිධ මුල්, කොළ වර්ග ද ලබු, කොමඩු ආදිය ද විකුණා ජීවිකාව

කළේය. ඔහුට පැහැපත්, රූපත්, ආචාර ශීලයෙන් යුත්, ලජ්ජා බය ඇති දුවක් වූවාය. ඕ නිරතුරු සිනහ මුහුණින් යුතු වූවාය. මැයට සම කුලයන්හි විවාහය සඳහා කැඳවීමක් පැමිණි කල්හි උපාසකයා මෙසේ සිතීය. මැයට විවාහ කැඳවීමක් ඇත. මැය නිතර ම සිනා මුහුණින් සිටින්නීය. කුමරියකට කුමරියක් නැති කල්හි වෙනත් කුලයකට ගිය කල්හි මව්පියන්ට නින්දා වන්නේය. ඇයට කුමාරි ධර්ම ඇත්ද නැද්ද යි විමසමි යි දියණිය ලවා පැස ගෙන්වා ගෙන පළා නෙලණු සඳහා වනයට ගොස් විමසීම් වශයෙන් කාමයෙන් ආකුල වූවකු මෙන් රහස්‍යය කථා කියමින් ඇය අතින් ගති. එකණෙහි ඕ අඬමින් වැළපෙමින් පියාණෙනි, මේ නුසුදුසුය. දියෙහි ගිනි දූල් මතුවූවාක් වැනිය. මෙවන් දෙයක් නො කරනු මැනවැ යි කීවාය. දියණිය, මා ඔබ විමසනු සඳහා මෙසේ අතින් ගතිමි. දැන් මට කියනු ඇත්ත වශයෙන් ම ඔබට කුමාරිකා ධර්ම තිබේ ද ? එසේය, පියාණෙනි. මවිසින් රාගික සිතින් කිසියම් පුරුෂයකු නො බලන ලද්දාය. ඉක්බිති, උපාසකයා දියණිය අස්වසා ගෙට ගොස් විවාහ මංගලය සිදුකොට ඇය හිමියන් සමග යවා බුදු රජුන් මල්, තෙල්, ගඳමල් අතැති ව දෙවුරට ම ගොස් බුදු රජුන් වැඳපුදා එකත් පසෙක සිටි කල්හි, බොහෝ කලකින් පැමිණියේ නො වේදැ යි බුදුහු වදාළහ. උපාසකයා ඒ සියලු පුවත් සැල කළේය. බුදු රජහු, උපාසකය, කුමරිය බොහෝ කලක පටන් ආචාර ශීල ඇත්තීය. ඔබ ඇය විමසනුයේ දැන් පමණක් නො වේ. පෙරත් විමසුවේ ම වීයැ යි වදාරා ඔහු විසින් අයදින ලද බුදුහු ඉකුත් වත ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු වනයක රුක් දෙවියෙක් වී උපන්හ. එකල්හි බරණැස් නුවර පළා වෙළෙන්දෙක් විය. මෙහි සියලු කථාව වර්තමාන කථාව හා සමානයි. එදවස පියා විසින් දියණියගේ අත ගත් කල්හි ඈ වැළපෙමින් මේ ගාථාව කීවාය.

**"යො දුක්ඛඵුට්ඨාය භවෙය්‍ය තාණං**

**සො මෙ පිතා දූභි වනෙ කරෝති,**

**සා කස්ස කන්දාමි වනස්ස මජ්ඣෙ**

**යො තායිතා සො සහසා කරොතීති"**

"යමෙක් දුකට පත් මා හට පිහිට වන්නේ ද ඒ මගේ පියා වනයෙහි දී සතුරු කම් කරයි. වන මැද ඒ මම කවරකුගේ පිහිට පතා හඬම් ද යමෙක් මගේ ආරක්ෂකයා වෙයි ද ඔහු ම සැහැසි කම් කරයි."

එහි, "**යො දුක්ඛඵුට්ඨාය භවෙය්‍ය තාණං**", කායික හෝ මානසික වශයෙන් දුකකින් පීඩාවට පත් කල්හි යමෙක් ආරක්ෂක වෙයි ද පිහිට වන්නා වෙයි ද "**සො මෙ පිතා දූභී වනෙ කරෝති**", ඒ මගේ දුකෙහි දී ආරක්ෂකයා වූ පියා ම මෙතැන දී මෙවැනි මිත්‍රද්‍රෝහී ක්‍රියාවක් කරයි. තමා නිසා උපන් දියණියට සිරිත් ඉක්මවීමක් කිරීමට සිතයි. "**සා කස්ස කන්දාමි**", මම කවරකුට හඬා කියම් ද ? කවරෙක් මට පිහිට වන්නේද යි දක්වයි. "**යො තායිතා සො සහසා කරොතීති**", යමෙක් මගේ ආරක්ෂකයා - පිහිටවන්නා වීමට සුදුසු ද ඒ පියා ම සැහැසි කම් කරයි යන අර්ථයි.

ඉක්බිති, පියා ඇය සනසා දියණිය ඔබ රැකුණු තැනැත්තියක් වේවාද යි විචාළේය. එසේය, පියාණෙනි. මගේ ආත්මය රැකුණේය. පියා දියණිය ගෙට ගෙන ගොස් මංගල විධි පවත්වා හිමියකුට සරණපාවා දුන්නේය. බුදුහු මේ ජාතකය වදාරා සිව්සස් දක්වූහ. උපාසකයා සෝවාන් විය. එකල්හි පියා දූන් පියා ම විය. දියණිය දූන් දියණිය ම වූවාය. මේ කාරණය සියසින් දුටු රුක් දෙවියා මම ම වීමි.

## 1. 11. 3.

## වේරි ජාතකය

"**යත්ථ වෙරී නිවසති**" යන මේ ජාතකය බුදු රජහු දෙවුරම් වෙහෙර වෙසෙන සේක්, අනේපිඬු මහසිටු අරබයා දෙසූහ. අනේපිඬු මහසිටු දිනක් තම භුක්ති ඇති ගමකට ගොස් ආපසු එන්නේ, අතරමඟ සොරුන් දක අතරමග වසන්ට නුසුදුසුය. සැවත් නුවරට

ම යන්නෙමි යි ගොනුන් වේගයෙන් මෙහෙයවා සැවැත් නුවරට ම අවුත් දෙවැනි දවස් වෙහෙරට ගියේ, බුදුන්ට එම කරුණ සැල කළේය. බුදුහු, ගෘහපතිය, පෙර ද පඬිවරු අතරමඟ සොරුන් දැක අතර නො රැඳී තමන් වසන ස්ථානයට පැමිණියහැ යි වදාරා ඉකුත් කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු මහත් සම්පත් ඇති සිටුවරයකු ව එක් කුඩා ගමකට ආරාධිත භෝජන අනුභවය සඳහා යන්නේ, අතරමඟ සොරුන් දැක අතරමඟ නො සිට වේගයෙන් ගොනුන් මෙහෙයවන්නේ තම ගෙදරට ම අවුත් නොයෙක් රසවත් අහර අනුභව කොට සිරියහනෙහි වැතිරී සිටියේ, සොරුන්ගේ අතින් මිදී නිර්බය ස්ථානය ම වූ තම ගෙදරට ම පැමිණියේ වෙමි යි ප්‍රීතිය ප්‍රකාශ කිරීම් වශයෙන් මේ ගාථාව කීය.

"යත්ථ වෙරී නිවසති න වසෙ තත්ථ පණ්ඩිතො,
එකරත්තං ඞිරත්තං වා දුක්ඛං වසති වෙරිසූති"

"යම් තැනක වෛරී කෙනෙක් වසත් ද නුවණැත්තේ එහි
නො වසන්නේය. මක්නිසා ද යත්, වෛරීන් අතර එක්
දවසක් හෝ දෙදවසක් වසන්නේ දුක සේ වෙසෙයි."

එහි, "වෙරීති", ද්වේෂ සහගත සිතිවිලිවලින් යුක්ත පුද්ගලයාය. "නිවසති", වෙසෙයි. "න වසෙ තත්ථ පණ්ඩිතො", වෛරී පුද්ගලයා යම් ස්ථානයක නිත්‍යය වාසී ව වසයි ද පාණ්ඩිත්‍යයෙන් යුත් පණ්ඩිතයන් වාසය නො කරන්නේය. මක් නිසා ද, "එකරත්තං ඞිරත්තං වා දුක්ඛං වසති වෙරිසූති", විරුද්ධවාදීන් සමග වසන්නා එක් දවසක් දෙදවසක් හෝ දුක සේ ම වසයි යන අර්ථයි.

මෙසේ බෝසත්හු ප්‍රීතිය ප්‍රකාශ කොට දානාදී පිංකම් කොට කම් වූ පරිදි ගියේය. බුදුහු මෙම දම් දෙසුම ගෙනහැර දක්වා ජාතකය නිමවූහ. බරණැස් සිටු එදින මම ම වීමි.

## 1. 11. 4.

# මිත්තවින්ද ජාතකය

"චතුබ්භි අට්ඨජ්ඣගමාති" යන මේ ජාතක දේශනා බුදු රජනු දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, අකීකරු භික්ෂුවක් අරබයා දේශනා කළහ. මෙහි කථා පුවත යට මිත්තවින්ද ජාතකයෙහි කී අයුරින් විස්තර කළ යුතුය. මේ ජාතකය කස්සප බුදු රජුන්ගේ කාලයට අයත් වේ. එකල අපාගත සත්ත්වයෙක් උරචක්‍රය ඔසවාගෙන නිරයෙහි පැසෙන්නේ, ස්වාමීනි, මම කිනම් පවක් කළේ වෙම්ද යි බෝසතුන්ගෙන් විචාළේය. එවිට බෝසත්හු තා විසින් මේ මේ පව්කම් කරන ලද යි, මේ ගාථාව කීහ.

"චතුබ්භි අට්ඨජ්ඣගමා අට්ඨාහිපි ච සොළස,
සොළසාහි ච බත්තිංස අත්‍රිච්ඡං චක්කමාසදො
ඉච්ඡාහතස්ස පොසස්ස චක්කං භමති මත්ථකෙති"

"සතර දෙනාගෙන් නො සතුටු ව අට දෙනකු වෙත ගියේය. අට දෙනාගෙන් නො සතුටු ව සොළොස් දෙනකු කරා ගියේය. සොළෙස් දෙනාගෙන් නො සතුටු ව දෙතිස් දෙනකු කරා ගියේය. එයින් නො සතුටු ව වැඩියෙන් පතන්නේ, උරචක්‍රයට ගියේය. ආශාවෙන් පහර ලැබූ පුරුෂයාගේ හිස මුදුනෙහි උරචක්‍රය කැරකෙයි."

එහි, "චතුබ්භි අට්ඨජ්ඣගමාති", මුහුදු මැද විමාන ප්‍රේතයන් සිව් දෙනකු ලැබ ඔවුන්ගෙන් සතුටු නො වී වැඩි ආශාව නිසා ඉදිරියට ගොස් විමාන ප්‍රේතියන් අට දෙනකුන් ලැබීය යන අර්ථයි. සෙසු පද දෙකෙහි ද මේ ක්‍රමය මැයි. "අත්‍රිච්ඡං චක්කමාසදො", මෙසේ ලද දෙයින් නො සතුටු ව මහත් ආශාව නිසා තව තවත් පතමින් දූන් උරචක්‍රය ලැබීය. මේ උරචක්‍රයට පැමිණියෙහි. මෙසේ වූ ඔහුට, "ඉච්ඡාහතස්ස පොසස්ස", තෘෂ්ණාවෙන් පීඩා වූ පහර ලැබූ ඒ ඔබගේ, "චක්කං භමති මත්ථකෙති", ගලින් කළ චක්‍රය යකඩින් කළ චක්‍රය යන

ද්විධ වූ මුවහත් ඇති යකඩ චක්‍රය ඒ පුරුෂයාගේ හිස මුදුනෙහි භ්‍රමණය වෙමින් වැටෙනු දක මෙසේ කීය.

මෙසේ ද කියා තමන්ගේ දෙව් ලොවට ම ගියේය. ඒ නිරි සතා ද තම පව් ගෙවුණු පසු කම් වූ පරිදි ගියේය. බුදු රජහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා ජාතකය නිමවූහ. එදින මිත්තවින්දක දූන් අකීකරු භික්ෂුව විය. දෙව් පුත් වනාහි මම ම වීමි.

1. 11. 5.

## දුබ්බලකට්ඨ ජාතකය

"බහුමෙපතං වනෙ කට්ඨන්ති" යන මේ ජාතක දේශනය බුදු රජහු දෙව්රම් වෙහෙර වැඩ වාසය කරන සේක්, එක් තැතිගත් භික්ෂුවක් අරබයා දෙසූහ.

ඔහු වනාහි සැවැත් නුවර වැසි කුල පුත්‍රයකි. බුදු රජුන්ගෙන් බණ අසා පැවිදි විය. ඔහු මරණ බයින් තැති ගත්තකු විය. රෑ වසන තැන හා දවල් වසන තැන්වල දී සුළං හඬ, වියළි දඬු වැටෙන හඬ, කුරුළු සිව්පා ආදීන්ගේ හඬ අසා මරණ බයින් තැතිගෙන මහහඬ නංවමින් පැන යයි. තමා මැරෙන අයකු බවට හැඟීම් මාත්‍රයක්වත් නො වීය. ඉදින්, හේ මම කවදා හෝ මරණයට පත්වෙමි යි දූන සිටියේ නම් මරණයට බිය නො වන්නේය. මරණානුස්සති කමටහන නො වැඩූ බැවින් ම එසේ බය වෙයි. ඒ භික්ෂුවගේ මේ මරණයට බිය වීමේ ස්වභාවය භික්ෂූන් අතර ප්‍රකට විය. භික්ෂූහු දිනක් දම් සබාවෙහි දී මේ කථාව මතු කළහ. ඇවැත්නි, අසවල් භික්ෂුව මරණයට බිය වූවෙකි. භික්ෂුව අවශ්‍යතාක් මා මිය යා යුතුයැ යි නිරතුරු මරණ සති භාවනාව වැඩිය යුතුය. බුදු රජහු දම් සබාවට ම වැඩි කල්හි, භික්ෂූහු එම කාරණය සැලකැර සිටියහ. බුදුහු ඒ භික්ෂුව කැඳවා මහණ, ඔබ මරණ බියෙන් තැතිගෙන සිටින්නෙහි ද ? එසේය, ස්වාමීනි. ඉක්බිති, බුදුහු, මහණෙනි, මේ භික්ෂුව පිළිබඳ ව අමනාප

නො වෙනු. මොහු මරණ භීරුක වනුයේ දැන් පමණක් නො වේ. පෙර ද මරණයට බිය වූයේයැ යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු හිමවත් පෙදෙසෙහි රුක් දෙවියෙක් වී උපන්හ. එකල බරණැස් රජ තම මඟුළැතු යුද්ධයේ දී නො සැලී සිටින සේ හික්මවීමට ඇත් ගුරුන්ට දුන්නේය. ඔවුහු ඇතු වැටෙහි බැඳ තෝමර ගත් අත් ඇති මිනිස්සු පිරිවරා යුදට වන් විට බිය ව පලා නො යනු සඳහා ආලනයෙහි බැඳ හික්මීම කරත්. මිනිස්සු ඒ කාර්යය කරන කල්හි අධික වේදනාව ඉවසීමට නො හැකි ඇතු ටැඹ බිඳ දමා මිනිසුන් එළවා හිමවතට ම පැන ගියේය. මිනිස්සු ඇතු අල්ලාගැනීමට නො හැක්කාහු, නැවතුණහ. ඌ එහි මරණයෙහි බියපත් විය. ඇතා සුළං හඬට පවා සැළෙමින් මරණ බියෙන් බියපත් ව සොඬ වනමින් වේගයෙන් පැන යයි. එහි දී ද ඇතුට ටැඹෙහි බැඳ නො සැලී සිටින හික්මවීම කරන්නාක් මෙන් දැනෙයි. කයට හෝ සිතට අස්වැසිල්ලක් නො ලැබ වෙවුලමින් ඒ මේ අත හැසිරෙයි. ඒ දුටු රුක් දෙවියා ගසෙහි කඳ අත්තක සිට මේ ගාථාව කීය.

**"බහුමෙපතං වනෙ කට්ඨං වාතො භඤ්ජති දුබ්බලං,**
**තස්ස චෙ භායසි නාග, කිසො නූන භවිස්සසීති"**

"වනයෙහි දුර්වල යම් කාෂ්ඨයක් සුළඟ විසින් බිඳී ද
ඇතුන් ඉදින්, එයට බිය වන්නේ නම් ඒකාන්තයෙන්
කෘෂ වූවෙක් වන්නෙහිය."

එහි, මේ ලුහුඬු අර්ථයයි. යම් ඒ දුබල දර කඩක් පෙරදිග ආදී දිශාවලින් හමන වාතය විසින් සිඳී ද ඒ මේ වනයෙහි සුලබ දෙයකි. තැන්තැන්වල එවැනි දේ පවතී. ඔබ ඊට බය වන්නේ නම් ඒකාන්තයෙන් කෘෂ වූවෙක් වන්නේය.

මේ වනයෙහි ඔබට බියක් නැත. එම නිසා මෙතැන් සිට බිය නො වෙමි.

මෙසේ දෙවියා ඔහුට ඔවදන් දුන්නේය. ඇතු ද එතැන් සිට බිය නො වූයේය. බුදුහු මේ ජාතක දේශනය නිමකොට සිව්සස් වදාළහ. ඒ භික්ෂුව ද සෝවාන් විය. එදින ඇතා මේ භික්ෂුව විය. රුක් දෙවියා මම ම වීමි.

## 1. 11. 6.

## උදඤ්චනි ජාතකය

"සුඛං වත මං ජීවන්තන්ති" යන මෙම ජාතකය බුදු රජුන් දෙවුරම් වෙහෙර වසන සේක්, පතිකුලයට නො ගොස් කල් ඉක්ම වූ කුමරියකගේ පෙළැඹවීමක් අරබයා දෙසූහ. මෙහි කථා පුවත තෙළෙස් වැනි නිපාතයේ චුල්ලනාරද කස්සප ජාතකයෙහි එන්නේය. බුදුහු ඒ භික්ෂුවගෙන් මහණ, ඔබ කළකිරුණේ සැබෑද යි විමසීය. ස්වාමීනි, එසේය, කී කල්හි මහණ, ඔබ සිත බැඳුණේ කවර අරමුණක ද ? ස්වාමීනි, එක්තරා චුල්ල කුමාරිකාවක කෙරෙහි බැඳුණේය. මහණ, මැය ඔබගේ සැතිරියකි. පෙර මැය නිසා ඔබ ශීලයෙන් පිරිහී කම්පාවෙමින් සිටි කල්හි නුවණැත්තන් නිසා සැප ලැබීයැ යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර රාජ්‍යය කැරවන කල්හි, අතීත කථාව ද චුල්ලනාරද කස්සප ජාතකයෙහි ම එන්නේය. එදින සවස් කාලයෙහි බෝසත්හු පලවැල ගෙන අවුත් පන්සලට පිවිස දොර විවෘත කොට පුත් වූ චුල්ල තාපසට මෙසේ කීය. දරුව, ඔබ වෙන දිනවල දරදිය ගෙනෙන්නෙහිය. ගිනි දල්වන්නෙහිය. අද ඒ කිසිවක් නො කොට දුක් මුහුණින් කල්පනා කැරෙමින් සිටින්නේ මක්නිසා ද ? පියාණෙනි, ඔබතුමා පලවැල පිණිස ගිය කල්හි එක් ස්ත්‍රියක් අවුත් මා පොළඹයා මා ගෙනයන්නට තැත් කළාය. ඔබතුමා මා නිදහස් කරන්නේ නම් යන්නෙමි යි නො ගියෙමි. අසවල් තැන ඇය හිඳුවා ආවෙමි. පියාණෙනි, මම දැන් ඇය වෙත යමි. බෝසත්හු ඔහු නැවත්වීමට නො හැකි බව දැන එසේ නම් දරුව, යව. ඔබ මැය රැගෙන ගොස්

යම් දවසක මැය මස්, මාංශ කෑමට ආශා වන්නේ ද ගිතෙල්, ලුණු, සහල් ආදිය ඇයව අවශ්‍යය වන්නේ ද එදාට මේ මේ දේ ගෙන එව යි ඔබ වෙහෙස කරන්නීය. එදින ඔබ මගේ ගුණ සිහිකොට එයින් පිටවී මෙහි ම එව යි ඔහු නිදහස් කළේය. චුල්ල තාපස ද ඇය සමග මිනිස් පියසට ගියේය. ඉක්බිති, ඕ ඔහු තම වසඟයට ගෙන මස් ගෙන එව. මාළු ගෙන එව, ආදී වශයෙන් යමක් ඇයට අවශ්‍යය ද ඒ ඒ දෙය ගෙන්වා ගනී. එවිට තවුසා මෙසේ සිතීය. මෑ ඇගේ දාසයකු - කම්කරුවකු ලෙස සිතා මට වඩාත් පීඩා කරතැ යි පලා අවුත් පියා වෙත ම පැමිණ පියා වැඳ සිටියේ, මේ ගාථාව කීය.

"සුඛං වත මං ජීවන්තං පචමානා උදඤ්චනී
චොරී ජායපපවාදෙන තෙලං ලොණඤ්ච යාචතීති"

"ඒකාන්තයෙන් සුව සේ වෙසෙන මා පෙළමින් දිය
ඉස්නා යන්ත්‍රයක් (සටිකාවක්) මෙන් භාර්යා නමින්
සිටිමින් සෙරක් තෙල් ලුණු ආදිය ඉල්ලයි."

එහි, "සුඛං වත මං ජීවන්තන්ති", පියාණෙනි, ඔබතුමන් සමීපයෙහි සුව සේ ජීවත් වූ මා "පචමානා", පීඩා හා සිත් තැවීම් කැරෙමින් යමක් කනු කැමැත්තී වන්නී ද ඒ ඒ දේ පිසන්නේය. යමකින් දිය ඉසිනු ලැබේද ඒ, "උදඤ්චනී", සැළියෙන් හෝ ළිඳකින් ජලය උඩට අදින යන්ත්‍රයයි. එයින් ජලය අදින්නාක් මෙන් ඇය යමක් කැමැති වන්නී ද ඒ ඒ දෙය ඇද ගනී, යන අර්ථයි. "චොරී ජායපපවාදෙන", භාර්යා නමින් එක් සෙරක් මා මිහිරි වචනයෙන් පොළඹවා එතැනට ගොස් තෙල් හා ලුණු ද වෙනත් කැමැති සියලු දේ ද ඉල්ලයි. මා දාසයකු මෙන් සලකා ගෙන්වා ගනිතැ යි ඇගේ අගුණ කීවේය.

ඉක්බිති, බෝසත්හු පුතු සනසා දරුව, එනු මැනවි. ඔබ මෙත් වඩන්න. කරුණාව වඩන්න යි සතර බ්‍රහ්ම විහරණ ඉගැන්වූහ. කසිණ පිරිකම් ද කීහ. ඔහු ද ටික දිනකින් ම අභිඥා සමාපත්ති උපදවා බඹ විහරණ වඩා පියා සමග බඹ ලොව උපන්නේය. බුදුහු ද මේ

දම් දෙසුම ගෙනහැර දක්වා සිව්සස් වදාළහ. ඒ භික්ෂුව සෝවාන් විය. එදා චූල්ල කුමරිකාව දැන් චූල්ල කුමාරිකාව වූවාය. චූල්ල තාපස කළකිරුණු භික්ෂුව විය. පියා වනාහි මම ම වීමි.

## 1. 11. 7.

## සාලිත්ත ජාතකය

"සාධු ඛො සිප්පකං නාමති" යන මේ ජාතකය බුදු රජහු දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, හංසයකුට පහරදුන් භික්ෂුවක් අරබයා දේශනා කළහ. එක්තරා සැවැත් නුවර එක්තරා වැසියෙක් සාලිත්ත ශිල්පයෙහි කෙළවරට පැමිණ සිටියේය. සාලිත්ත ශිල්පය නම් ගල් කැට විදීමේ ශිල්පයයැ යි කියනු ලැබේ. හෙතෙම එක් දවසක් දහම් අසා බුදු සසුනෙහි පැවිදි ව උපසම්පදාව ලැබීය. ඔහු ශික්ෂාකාමී නො විය. පිළිවෙතින් ද සරු වූවෙක් නො වූයේය. දිනක් ඔහු ළදරු භික්ෂුවක් සමග අචිරවතී නදියට ගොස් නා ගං ඉවුරෙහි සිටියේය. එවේලෙහි සුදු හංසයෝ දෙදෙනෙක් අහසින් යමින් සිටියහ. එවිට ඔහු ළදරු භික්ෂුව අමතා මම මේ පසු ව යන හංසයා කැටකින් ඇසට පහර දී පාමුල හෙළමි. ඔබට එය කළ නො හැකියි. හංසයාගේ මෙපස ඇස තිබේවා. එපිට ඇසට ගසා හෙළමි. ඔබට නො හැකි දෙයක් කියන්නෙහිය. එසේ නම් බලා සිටිනු. එක් තුන්හුලස් කැටයක් ගෙන ඇඟිල්ලෙහි පටලවා හංසයාගේ පසුපසට විද්දේය. කැටය රූං ශබ්දය නගිමින් අහසට නැගිණි. හංසයා උවදුරක් විය යුතුයැ යි නැවතී හඬ අසන්නේ, එවිට කැටය ඇස විදගෙන ගියේය. එවිට ම හංසයා විලාප නගමින් පාමුල වැටුණේය. එවිට භික්ෂූන් රැස්ව ඔහු ගර්හා කොට නුසුදුසු ක්‍රියාවක් කළේයැ යි බුදු රජුන් වෙත ගෙන ගොස් මෙකරුණ සැලකළහ. බුදු රජහු ඔහුගේ ක්‍රියාව හෙළා දකිමින් මහණෙනි, මේ භික්ෂුව මේ ශිල්පයෙහි දක්ෂ වනුයේ දැන් පමණක් නො වේ. පෙරත් දක්ෂ වූයේමැ යි වදාරා ඉකුත් වත දක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු ඒ රජුගේ ඇමැතියෙක් වූහ. එකල රජුගේ පුරෝහිත බමුණා වාචාලයකු විය. බොහෝ කථා කරන්නේය. පුරෝහිත කථා කරන කල අනිකකුට ඉඩ නො ලැබේ. කවදා මොහුගේ වචන පැවැත්මක් වන්නේද යි සිතමින් සිටියේය. එකල එක කොර මිනිසකු කැට විදීමේ ශිල්පයෙහි කෙළ පැමිණියකු විය. ගම් දරුවෝ ඔහු රියක නංවා ඇදගෙන බරණැස් නුවර දොර අබියස වූ අතු විහිදුණ නුග රැක මුලට ගෙනගොස් ඔහු පිරිවරාගෙන පනම්, කහවණු ආදිය දී ඇත් රුවක් දක්වව්, අස් රුවක් දක්වව් කියත්. කොරු ද කැට විද නුග පත්වල විවිධ රූ සටහන් දක්වයි. මේ අයුරින් සියලු නුග කොළ සිදුරු විය. දිනක් බරණැස් රජු උයනට යන්නේ, එතැනට පැමිණියේය. සියලු ගම් දරුවෝ හඹා පියතැ යි යන බයින් බැහැර වූහ. කොරු එතැන ම වැතිරී සිටියේය. රජු නුග මුලට පැමිණ රියෙහි සිටියේ ම නුග පත් සිදුරුවීම නිසා වැටෙන සෙවණැල්ල ද සිදුරු වී තිබෙනු දැක උඩ බලනුයේ සියලු පත් සිදුරු වී තිබෙනු දැක මේ කරන ලද්දේ කවුරුන් විසින්ද යි විචාළේය. දේවයිනි, කොරා විසින් විය යුතු යි අවට සිටියෝ කීහ. එවිට රජ මොහු උපයෝගී කොටගෙන පුරෝහිත බමුණාගේ වාචාල බව සිඳලන්ට හැකි වන්නේයැ යි සිතා කොරා කොහිද්ද යි විමසීය. ගස මුල වැතිරී සිටි ඔහු දැක දේවයිනි, ඔහු මෙහි සිටී යි කීහ. රජු ඔහු ගෙන්වා පිරිස බැහැර කොට අප ළඟ එක් වාචාල බමුණකු සිටී. ඔහු නිහඬ කරන්ට හැකිද්ද යි, කොරාගෙන් ඇසීය. දේවයිනි, නැළියක් පමණ එළු බෙටි ලැබෙන්නේ නම් හැකිවෙමි යි කීවේය. රජු කොරා රජ මැදුරට ගෙන ගොස් තිරයකින් පිටුපස හිඳුවා තිරයෙහි සිදුරක් කොට පුරෝහිත බමුණාට සිදුර එල්ලකොට අසුනක් පණවා නැළියක් පමණ වියළි එළු බෙටි කොරු ළඟ තබවා පුරෝහිත රාජ සේවයට පැමිණි කල්හි එම අසුනෙහි හිඳුවා කථා ඇරඹීය. බමුණා කිසිවකුට අවකාශ නො දී රජු සමග කථාව පටන් ගත්තේය. එවිට කොරු තිර සිදුරෙන් එක එක එළු බෙටිටක් බැගින් මැස්සකු ප්‍රවේශ කරන්නාක් මෙන් මුව තොල් මත හෙළීය. පුරෝහිත ද එන එන එළු බෙටි නලයට තෙල් පුරවන්නාක් මෙන් ගිල දැම්මේය. සියලු එළු බෙටි අවසන් විය. ඒ එළු බෙටි කුසගත වූ කල්හි අඩලාහක් පමණ විය. රජු සියලු එළු බෙටි අවසන් බව දැන මෙසේ කීය. ගුරුතුමනි, ඔබගේ මුඛරි බව නිසා නැළියක් බෙටි ගිලුණ ද ඒ කිසිත් නො දන්නහුය. මීට වඩා එළු බෙටි දිරවාගත හැකි නො වේ. දැන් යනු මැනවි. පුවඟු ජලය බී වමාරවා සුවපත් වනු මැනවි. පුරෝහිත එතැන් සිට සංවර මුව

ඇත්තකු වී තමා හා කථා කරන්නකු සමග ද කථා නො කරන ස්වභාව ඇත්තකු විය. ඉක්බිති, රජ කොරු විසින් මගේ කණට සුවයක් ලබාදෙන ලද යි සතර දිශාවෙන් ලක්‍ෂය බැගින් උපදනා ගම් සතරක් දුන්නේය. බෝසත්හු රජු වෙත එළැඹ දේවයිනි, නුවණැත්තන් විසින් ශිල්ප උගත යුතුයැ යි කොරු විසින් ගල් විදීමේ ශිල්ප මාත්‍රයෙන් මේ මහත් සැපත ලබන ලදී යි මේ ගාථාව කීහ.

"සාධුඛො සිප්පකං නාම අපි යාදිසකීදිසං,
පස්ස ඛඤ්ජප්පහාරෙන ලද්ධා ගාම චතුද්දිසාති"

"යම්තම් ශිල්පයක් වුව ද යහපත්මැ යි බලව. කොරාගේ
එළු බෙටි ගැසීමෙන් සතර දිගින් ගම් සතරක් ලදහ."

එහි "පස්ස ඛඤ්ජප්පහාරෙන", මහරජ බලනු මැනවි. මේ කොරාගේ එළු බෙටි ගැසීමෙන් සතර දිශාවෙන් ගම් සතරක් ලබන ලදී. අනෙක් ශිල්පයන්ගේ යහපත් ප්‍රතිඵල කෙළවරක් නො වේ යි, ශිල්පයෙහි ගුණ ප්‍රකාශ කළහ.

බුදු රජහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා ජාතකය නිමකළහ. එදින කොර මිනිසා වනාහි මේ භික්‍ෂුව විය. රජ අනඳ තෙරණුවෝය. පණ්ඩිත ඇමැතියා මම ම වීමි.

## 1. 11. 8.

## බාහිය ජාතකය

"සික්ඛෙය්‍ය සික්ඛිතබ්බානීති" යන මේ ජාතක දේශනාව බුදුහු විශාලාව ඇසුරු කොට මහා වනයෙහි කූටාගාර ශාලාවක වසන සේක්, ලිච්ඡවි කුමරකු අරබයා වදාළහ. ඒ ලිච්ඡවි රජ බුදු සසුනෙහි

පහන් සිත් ඇත්තේ, බුදුපාමොක් මහා සඟනට ආරාධනා කොට නිවසෙහි මහදන් පැවත්වීය. ඔහුගේ බිරිය වනාහි ස්ථුල අඟපසඟ ඇත්තීය. ඉදිමී ගිය මළ මිනියක ස්වරූපය ඇත්තී, ආචාරශීලී නො වූවාය. බුදු රජහු බත් කිස අවසානයෙහි අනුමෙවෙන් බණ දේශනා කොට විහාරයට වැඩමවා භික්ෂූන්ට අවවාද දී ගඳකිළියට වැඩියහ. දම් සබාවෙහි රැස්වූ භික්ෂූහු, ඇවැත්නි, එවැනි රූසපුවෙන් හෙබි ලිච්ඡවි රජුගේ බිරිය ස්ථුල අඟපසඟ ඇත්තීය. නො මනා පැවතුම් ඇත්තීය. ඒ රජු කෙසේ නම් ඇයට සිත් අලවා වසන්නේ ද ? දම් සබාවට වැඩි බුදු රජහු මහණෙනි, මෙතැන කිනම් කථාවකින් හුන්නාහුද යි විචාරා මෙනම් කථාවකින් හුන්නාහුයැ කී කල්හි, මහණෙනි, මේ රජ දැන් පමණක් නොව පෙරත් ඉමහත් සිරුරැති ස්ත්‍රියක සමග සිත් අලවා විසීයැ යි වදාරා ඔවුන් විසින් අයදනා ලද බුදු රජහු ඉකුත් වත ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජ රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු ඒ රජුගේ ඇමැති වූහ. ඉක්බිති, දනව් වැසි මහත් සිරුරු ඇති, මනාව නො පිහිටි අඟපසඟ ඇති ස්ත්‍රියක් කුලීවැඩ කැරෙමින් රජ මිදුල අබියසින් යන්නී, සිරුරු කිස කිරීමේ අවශ්‍යතාවයෙන් පීඩාවට පත්වූවා, හැඳිවතින් සිරුර පිළිසන් කොට හිඳ සිරුරු කිස කොට වහා නැඟී සිටියාය. එකෙණෙහි බරණැස් රජු වා කවුළුවෙන් රාජාංගනය දෙස බලන්නේ, ඇය දැක මෙසේ සිතීය. මෙවැනි එළිමහන් භූමියක සිරුර කිස කරන මේ ස්ත්‍රිය හිරිඔතප් රැකෙන සේ හැඳිවතින් ආවරණය වී සිරුරු මළ පහකොට වහා ම නැඟී සිටියාය. එම නිසා මැය නිරෝගී විය යුතුය. මැගේ ගර්භාෂය ද නිදොස් සමනයෙන් නිර්මළ විය යුතුය. එවැනි කුසක පුතකු උපදින විට ඔහු ද නිරෝගී පින්වත් පුතකු වන්නේය. මවිසින් මැය අග මෙහෙසිය කළ යුතු වන්නේය. ඉක්බිති, රජු ඇය අස්වාමික බව දැන රජ අණින් ඇය ගෙන්වා අග මෙහෙසිය කළේය. ඕ රජුට ප්‍රිය මනාප වූවාය. නොබෝ කලකින් ම ඕ පුතකු ප්‍රසූත කළාය. ඒ පුත්‍රයා ද සක්විති රජෙක් වූයේය. බෝසත්හු ඇගේ ඒ මහත් සම්පත් දැක කථා කිරීමට සුදුසු අවස්ථාවක් බලා දේවයිනි, කුඩා වුව ද හික්මිය යුතු කාර්යයෙහි හික්මිය යුතුය. කෙසේ ද යත්, මහා පිනැති එතුමිය හිරිඔතප් රැකෙන සේ ආවරණය වී ශරීර මළ බැහැර කිරීම කරන්නී, ඔබගේ සිත් ගෙන මෙබඳු මහත් සැපතක් ලැබුවාය යි කියා සංවර භාවයෙහි ගුණ ප්‍රකාශ කරන්නාහු, මේ ගාථාව කීහ.

"සික්ඛෙය්‍ය සික්ඛිතබ්බානි සන්ති සච්ඡන්දිනො ජනා,
බාහියාපි සුහන්නෙන රාජානමභිරාධයීති"

"හික්මිය යුතු ශ්ලපයන් හික්මෙන්නේය. ඒ ශිල්පයන්හි
කැමැති ජනයෝ ඇත්තාහ. ජනපද වැසියක වූ ඒ ස්ත්‍රිය
සංවරව කළ පුරීෂන් සර්ගය නිසා රජුගේ සිත් ගත්තීය."

එහි, "සන්ති සච්ඡන්දිනො", ඒ ඒ ශිල්පයන්හි කැමැති ජනයෝ ඇත්තාහ. "බාහියා", (නගරයෙන්) පිට දනව්වක ඉපදී වැඩුණු ස්ත්‍රිය, "සුහන්නන", හිරිඔතප් අත් නො හැර පිළිසන් ආකාරයෙන් සිරුරු මළ බැහැර කිරීම "සුහන්න" නම්. "රාජානමභිරාධයී", රජුගේ සිත් ගෙන මේ සැපත ලැබුවාය.

මේ අයුරින් බෝසත්හු හික්මිය යුතු ශිල්පයන්ගේ ගුණ ප්‍රකාශ කළහ.

බුදුහු මේ ජාතකය ගෙනහැර දක්වා ජාතකය නිම කළහ. එදින අඹුසැමි යුවල මෙදින අඹුසැමි යුවළ මැයි. පණ්ඩිත ඇමැතියෝ මම ම- වීමි.

## 1. 11. 9.

## කුණ්ඩකපූව ජාතකය

"යථන්නො පුරිසො හොති", යන මේ ජාතක දේශනාව බුදු රජහු සැවැත් නුවර දෙව්රම් වෙහෙර වසන සේක්, මඟ දුගියකු අරබයා දෙසූහ. සැවැත් නුවර සමහර දිනවල එක ම කුලයක් බුදුපාමොක් මහසඟනට දන් දෙති. තවත් දිනවල තුන් හතර දෙන එකතුව ද සමූහ වශයෙන් ද වීථී වශයෙන් ද මුළු නගරයෙහි කැමැත්ත ගෙන ද දන් දෙත්. එදින වීථී වශයෙන් පිරිනැමෙන දානයකි. එහි දී මිනිස්සු බුදුන්

ප්‍රමුඛ සංඝයාට කැඳ පිළිගන්වා කැවිලි ගෙන එවු යි කීවාහ. එකල්හි එම වීථියෙහි වෙසෙන අනුන්ට බැල මෙහෙවර කොට ජීවත් වන දුගී මිනිසෙක් මෙසේ සිතීය. මට කැඳ දෙන්ට නො හැකිය. කැවිලි දෙමි යි සියුම් සහල් කුඩු දියෙන් තෙමා වටකොට වරා කොළයෙහි ඔතා උණු අළුයෙහි පිස මේ බුදු රජුන්ට පුදමි යි එය රැගෙන බුදු රජුන් ඉදිරියෙහි සිට කැවිලි ගෙන එව යි කී මොහොතෙහි ම සියල්ලන්ට ම පෙරටු ව ගොස් බුදු රජුන්ගේ පාත්‍රයෙහි ම තැබීය. බුදුහු අන් අය විසින් දෙන ලද කැවිලි නො පිළිගෙන එම කැවුම් වැළඳූහ. එකණෙහි ම සම්මා සම්බුදුහු මඟ දුගියාගේ කුඩු කැවිලි පිළිකුල් නො කොට වැළඳූහැ යි මුළු නගරය ම එක ම කෝලාහලයක් බවට පත්විය. රාජ රාජමහා මාත්‍යයෝ ද අන් පිරිසෙන් දොරටුපාලයන් දක්වා සියල්ලෝ ම බුදුරදුන් වැඳ මඟ දුගියා වෙත එළැඹ අහෝ පින්වත, සියයක් ගෙන දෙසියයක් ගෙන පන්සියයක් ගෙන අපට පින් දෙව යි කීවාහුය. මඟ දුගියා ද බුදු රජුන්ගෙන් විමසා දැනගන්නෙමි යි බුදු රජුන්ට මෙකරුණ සැල කළේය. එවිට බුදුහු ධනය ගෙන හෝ නො ගෙන සියලු සත්ත්වයන්ට පින් දෙව යි වදාළහ. ඔහු ධනය ගන්ට ඇරඹීය. මිනිස්සු දෙගුණ, සිව්ගුණ, අටගුණ ආදී වශයෙන් දුන්නා වූ ධනය රන් නව කෙළක් විය. ඉක්බිති, බුදුහු අනුමෙවෙන් බණ දෙසා විහාරයට වැඩ භික්ෂූන් විසින් වත් දක්වනු ලැබූ කල්හි බුද්ධාවවාදය කොට ගඳකිළියට වැඩියහ.

රජ සවස් භාගයෙහි මඟ දුගියා කැඳවා සිටු තනතුරෙන් පිදීය. භික්ෂූහු දම් සබාවෙහි දී මේ කථාව උපදවා ඇවැත්නි, බුදුහු මඟ දුගියා විසින් පිරිනමන ලද කුඩු කැවුම පිළිකුල් නො කොට අමාවක් මෙන් වැළඳූහ. මඟ දුගියා ද බොහෝ ධනය ද සිටු තනතුර ද ලැබ මහත් සැපතකට පැමිණියේය. බුදුහු දම් සබාවට වැඩ මහණෙනි, දැන් කිනම් කථාවකින් හුන්නාහුදැ යි විචාළහ. මෙනම් කථාවකිනැ යි කී කල්හි මහණෙනි, මා විසින් මොහු පිදූ කුඩු කැවුම් වළඳන ලදුයේ දැන් පමණක් නො වේ. පෙර රුක් දේතාවකු ව සිටිය දී ද වැළඳන ලද්දේයැ යි ද එදා ද මොහු සිටු තනතුර ලැබුවේයැ යි ද වදාරා ඉකුත් වත ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු එරඬු ගසක රුක් දෙවියෙක් වී උපන්නහ. එකල්හි එගම

මිනිස්සු දෙවියන් අදහන්නෝ වෙත්. ඉක්බිති, එක් උත්සවයක් පැමිණි කල්හි මිනිස්සු තමතමන්ගේ රුක් දෙවියන්ට බලිපූජා කළහ. එකල්හි එක්තරා දුගී මිනිසෙක් අනෙක් මිනිසුන් තමතමන්ගේ දෙවියන්ට උපහාර දක්වනු දැක ඔහු ද එරඬු ගසකට උපහාර දැක්වීය. මිනිස්සු තම තමන්ගේ දෙවියන් සඳහා විවිධ මල්, සුවඳ විලවුන්, ආහාරපාන ගෙන ගියහ. දුගී මිනිසා කුඩු කැවුමක් ද සරථ මෙන් දිය ද ගෙන එරඬු ගස අබියස සිට මෙසේ සිතී. දෙවියෝ වනාහි දිව්‍යය ආහාරපාන බුදිත්. මගේ දෙවියා ද කුඩු කැවුම් නො බුදියි. මෙය නිකරුණේ විනාශ වීමෙන් ඇති ඵලය කිම? මම ම එය කමි යි එතැනින් ම නැවැත්තේය. එකෙණෙහි බෝසත්හු රුක් දෙබලක සිට පින්වත, ඉදින්, ඔබ පොහොසත් නම් මට මිහිරි කැවිලි දෙන්නෙහිය. ඔබ වනාහි දුගියෙකි. මම ඔබගේ කැවුම් නො පිළිගෙන වෙන කිනම් දෙයක් බුදින්නෙම් ද ? මට වෙන් වූ කොටස නො නසන්නැ යි කියා මේ ගාථාව කීහ.

"යථන්නො පුරිසො හොති තථන්නා තස්ස දෙවතා,
අහරෙතං කණං පූවං මා මෙ භාගං විනාසයාති"

"පුරුෂයා යම්බඳු ආහාරයක් ඇත්තේ වේ ද, ඔහුගේ
දෙවියා ද එබඳු ආහාර ඇත්තකු වේ. මේ කුඩු කැවුම
ගෙන එව. මගේ කොටස නො නසත්වා."

එහි, "යථන්නො", යම්බඳු භෝජනයක් ඇත්තේ වේ ද, " තථන්නො", ඒ පුරුෂයාගේ දෙවියා ද එබඳු භෝජන ඇත්තකු ම වේ. "ආහරෙතං කණං පූවං", මේ (සහල්) කුඩුවලින් පිසූ කැවුම ගෙන එව. මගේ කොටස නො නසව.

ඒ දුගී මිනිසා නැවතී බෝසතුන් දැක බලි පූජාව කළේය. බෝසත්හු ද එහි රසය වළඳා පින්වත පුරුෂය, කුමක් නිසා මට උපහාර දක්වන්නේහිදැ යි විචාළේය. දේවයිනි, මම දුගියෙක් වෙමි. ඔබ පිහිටෙන් දුගී බවෙන් මිදීම සඳහා උපහාර දක්වමි යි කීය. පින්වත් පුරුෂය, ඔබ නො තැවෙනු. ඔබ විසින් පූජා කරනු ලැබුවේ හොඳින් කෙළෙහි ගුණ දන්නා දෙවියකුට ය. මේ එරඬු ගස වටකොට මුවපිටින් මුවවිට හැපෙන සේ නිදන් සැළි ඇත. ඔබ රජුට

දන්වා ගැලින් ඒ ධනය ගෙනගොස් රජ මිදුලෙහි එක් රැස් කැරව. රජු ඔබට සතුටු ව සිටු තනතුර දෙන්නේය කියා බෝසත්හු අතුරුදන් වූය. දුගී මිනිසා ද දෙවියා කී ලෙස කළේය. රජ ද ඔහුට සිටු තනතුර දුන්නේය. මෙසේ දුගී මිනිසා බෝසතුන් නිසා මහත් සම්පතට පැමිණ කම් වූ පරිදි ගියේය. බුදුහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා ජාතකය නිමවූහ. එකල දුගියා මේ දුගියා මය. එරඬු රුක් දෙවියා නම් මම ම වීමි.

## 1. 11. 10.

## සබ්බසංහාරක ප්‍රශ්නය

**"සබ්බසංහාරකො නත්ථීති"**, යන මේ සර්ව සංහාරක ප්‍රශ්නය සියලු ආකාරයෙන් උම්මග්ග ජාතකයේ දී ප්‍රකට වන්නේය.

## එකළොස් වැනි පරෝසත වර්ගයයි.

## 1. 12. 1.

## ගද්‍රභ ප්‍රශ්නය

"හංසි තුවං මඤ්ඤසීති" යන මේ ගද්‍රභ ප්‍රශ්නය ද උම්මග්ග ජාතකයෙහි දී ම ප්‍රකට වන්නේය.

## 1. 12. 2.

## අමරා දේවි ප්‍රශ්නය

"යෙන සත්තුබිලඞ්ගා" යන මේ අමරා දේවි ප්‍රශ්නය ද එම උම්මග්ග ජාතකයෙහි දී ම ප්‍රකට වන්නේය.

## 1. 12. 3.

## සිඟාල ජාතකය

"සද්දහාසි සිඟාලස්සාති" යන මේ ජාතකය බුදු රජහු වේළුවනයෙහි වසන සේක්, දෙව්දත් අරබයා දෙසූහ. එකල්හි භික්ෂූහු ඇවැත්නි, දෙව්දත් විසින් පන්සියක් භික්ෂූන් ගෙන ගයා සීසයට ගොස් මා කරන දේ ධර්මය වේ. මහණ ගොයම්හු කරන දේ ධර්මය නො වේ යි ඒ භික්ෂූන්ට තලබ්ධිය ගන්වා බොරුව මුදුන්පත් කොට මහසඟන භේද කොට එක් සීමාවක් තුළ උපෝසථ දෙකක් කරන ලද්දැ යි, දෙව්දත්ගේ අගුණ කථා කියමින් හුන්නාහුය. බුදු රජුන් දම් සබාවට වැඩමවා මහණෙනි, දැන් කවර කථාවක් කැරෙමින් හුන්නාහුද

යි විචාරා මෙනම් කථාවකින්යැ යි කී කල්හි මහණෙනි, දෙව්දත් මුසාවාදී වූයේ දැන් පමණක් නො වේ. පෙර ද වූයේමැ යි අතීත කථාව ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු සොහොනක් අසල වනයක රුක් දෙවියෙක් වී උපන්හ. එදවස බරණැස් නුවර නැකැත් කෙළිය දන්වන ලදී. මිනිස්සු සක්බලියක් කරමු යි කුඩාවේ, මහවේ ආදී තැන්වල මත්ස්‍යය මාංශ විසුරුවා මිනී හිස් කබල්වල බොහෝ සුරා තැබූහ. එකල්හි සිවලෙක් මධ්‍යම රාත්‍රියෙහි ජල මාර්ගයක් නගරයට පිවිස මස් මාංශ කා සුරා බී දොඹ ගස් පඳුරක් අතර විසීය. පහන්වන තුරු නිදි ගත්තේය. සිවලා එළිය දැක පිබිදී දැන් පිටත යා නො හැකියත මඟ ළඟට ගොස් සැඟවී සිට මිනිසුන් දැක ද කිසිවක් නො කියා මුව දෙවීම සඳහා යන එක් බමුණකු දැක මෙසේ සිතීය. බමුණෝ වනාහි ධන ලෝභියෝ වෙති. මොහු ධනයෙන් පොළඹවා, යම් සේ මොහු මා උතුරු සළුවෙන් පිළිසන් කොට කිසිළි අතුරෙහි තබා ගෙන යයි ද එසේ කරන්නෙමි යි සිවලා මිනිස් බසින්, 'බමුණා' යි කීහ. ඔහු ද ආපසු හැරී මා කැඳවන්නේ කවරෙක්දැ යි ඇසීය. බමුණාණෙනි, මම වෙමි. කාරණය කුමක් ද ? බමුණාණෙනි, මට කහවණු දෙසීයක් තිබේ. ඉදින්, ඔබ මා කිසිලි අතරෙහි තබා උතුරු සළුවෙන් වසා කිසිවකුට නො පෙනෙන සේ නගරයෙන් පිටතට ගෙනයන්ට හැක්කේ නම් මම ඒ කහවණු ඔබට දෙමි. බමුණා ද ධන ලෝභයෙන් මැනවැ යි පිළිගෙන සිවලා කී පරිදි නුවරින් නික්ම මද දුරක් ගියේය. සිවලා බමුණා, දැන් කොහිදැ යි ඇසීය. අසවල් නම් ඇති තැනයි. තවත් මද දුරක් යනු මෙසේ නැවත නැවත කියමින් මහසොහොන් බිමට පැමිණ සිවලා දැන් මා මෙහි තබනු කීය. ඔහු ද එසේ කළේය. එසේ නම් බමුණ, උතුරු සළුව මෙහි එළනු. ධන ලෝභයෙන් බමුණා ද මැනවැ යි පිළිගෙන සළුව දිගහැරීය. දැන් බමුණ, මේ ගස මුල සාරනු. බමුණා පොළොව සෑරීමෙහි යොදවා සිවලා සළුවට නැඟ සිව්කොණ හා මැද යන පස් තැනක සිරුර මළ පහකොට අසූචි තවරා මූත්‍රකොට තෙමා සොහොන් වනයට ම වැදුණේය. බෝසත්හු ගස් දෙබලෙහි සිට මේ ගාථාව කීහ.

"සද්දහාසි සිඟාලස්ස සුරාපීතස්ස බ්‍රාහ්මණ,
සිප්පිකානං සතං නත්ථි කුතො කංසසතා දුවෙති"

"බ්‍රාහ්මණය, සුරා බී සිවලුගේ වචනය අදහන්නෙහි ද?
ඔහු ළඟ බෙල්ලන් සියයකුදු නැත. කහවණු දෙසීයක්
කොයින් ද ?"

එහි, "සද්දහාසි", අදහන්නෙහි ද ? "සද්දහෙසි" යනු ද කැමැති වන්නෙහි ද යන අර්ථයි "සිප්පිකානං සතං නත්ථි", මොහුට බෙල්ලන් සියයකුදු නැත. "කුතො කංසසතා ද්වෙ", ඔහුට කහවණු දෙසීයක් කොයින් ද ?

බෝසත්හු මේ ගාථාව කියා බමුණ, යව. ඔබගේ සළුව සොයා ස්නානය කොට තමාගේ කාර්යයක් කරනු යි කියා අතුරුදන් වූහ. බමුණා ද එසේ කොට ඒකාන්තයෙන් මම රැවටුණෙමි යි නො සතුටට පත්ව ගියේය.

බුදුහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා ජාතකය නිමවූහ. එදා සිවලා දෙව්දත් විය. රුක් දෙවියා නම් මම ම වීමි.

## 1. 12. 4.

## මිතචින්තී ජාතකය

"බහුචින්තී අප්පචින්තී චාති" යන මේ ජාතකය බුදු රජහු දෙව්රම් වෙහෙර වසන සේක්, මහළු තෙරුන් දෙදෙනකුන් වහන්සේ අරබයා දෙසූහ. ඔවුහු වනාහි එක්තරා දනව්වක වනායතනයක වස් වැස බුදු රජුන් දකීමට යන්නෙමු යි මාර්ගෝපකරණ පිළියෙළ කොට අද යමු හෙට යමු යි මසක් ඉක්මවා නැවතත් මාර්ගෝපකරණ සකසා මාසයක් ද මේ අයුරින් නැවතත් මාසයක් ද වශයෙන් තමන්ගේ කුසීත බව නිසාත් සෙනසුන පිළිබඳ ආශාව නිසාත් තුන් මසක් ඉක්මවා එයින් නික්ම දෙව්රම් වෙහෙරට අවුත් තමන්ට ගැළපෙන තැනක පා සිවුරු තැන්පත් කොට බුදු රජුන් දුටහ. අනතුරු ව භික්ෂූහු

ඔවුන්ගෙන් ඇවැත්නි, බුද්ධොපස්ථානය සඳහා මෙපමණ කලක් අතපසු කළේ මන්ද යි විචාළහ. ඔවුහු එකරුණ කීහ. මේ අයුරින් ඔවුන්ගේ කුසීත බව ප්‍රකට විය. දම් සබාවෙහි ද ඔවුන්ගේ කුසීත භාවය පිළිබඳ ව ම කථා මතු කළාහුය. බුදු රජුන් වැඩමවා මහණෙනි, මා එන්නට පළමු ව කවර කථාවකින් හුන්නාහුද යි විචාර මෙනම් කථාවකින්යැ යි කී කල්හි මහණෙනි, මොවුන් අලස වූවෝ, සෙනසුනහි ඇළුණෝ, දැන් පමණක් නොව, පෙර ද එසේ ම වූවෝ යි වදාරා අතීත කථාව දැක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කැරවන කල්හි බරණැස් ගඟෙහි මත්ස්‍යයෝ තිදෙනෙක් වූහ. බහුචින්ති, (වැඩියෙන් සිතන්නා) අප්පචින්ති, (අඩුවෙන් සිතන්නා) මිතචින්තී (පමණට සිතන්නා) උන්ගේ නම් විය. ඔවුහු වන පෙදෙසේ සිට මිනිස් පියසට ආහ. මෙයින් මිතචින්ති මත්ස්‍යයා අනෙක් දෙන්නාට, මේ මිනිස් පියස බිය ජනකය. සැක සහිතය. මසුන් මරන්නෝ විවිධ දැල් කෙමිණ දමා මසුන් අල්ලා ගණිත්. අපි වන පෙදෙසෙට ම යමු යි කීය. අනෙක් මසුන් දෙදෙනා අලස බැවින් හා ගොදුරු ලොල් බව නිසාත් අද යමු, හෙට යමු යි තුන් මසක් ඉක්මවූහ. දිනක් මසුන් මරන්නෝ දැල ගඟට දැමූහ. එවේලෙහි බහුචිත්තී, අප්පචිත්තී දෙදෙනා ගොදුරු සොයමින් ඉදිරියෙන් යති. එහෙත් දෙදෙනාගේ නො දැනීම නිසා දැලේ ඉව නො දැන දැල තුළට ගියහ. මිතචිත්තී මත්ස්‍යයා පසුපසින් එන්නේ, දැල් ගඳ ඉව කොට අනෙක් දෙදෙනා දැලට පිවිස බවත් දැන මේ කම්මැලි මෝඩ දෙදෙනාගේ ජීවිතය රැක දෙමි යි සිතා පිටුපසින් දැල් කුසට ගොස් දැල් කුස පලා නික්මුණාක් මෙන් හඟවා දිය කළඹා නැවත දැල ඉදිරියට පැන දැල කුසට ගොස් පසු භාගය පලා නික්මී ගියාක් මෙන් හඟවා දිය කළඹා පසු භාගයට වැටුණේය. එවිට කෙවුලෝ මසුන් දැල පලා ගියෝ යි සිතා දැල් කෙළවරින් ගෙන එසවූහ. එවිට ඒ මසුන් දෙදෙනා ම දැලින් මිදී දියෙහි වැටුණහ. මේ අනුව මිතචින්තී නිසා දෙදෙනාගේ ජීවිත රැකුණි. බුදු රජහු මේ ඉකුත් වත ගෙනහැර දක්වා මේ ගාථාව වදාළහ.

"බහුචින්තී අප්පචින්තී ච උභො ජාලෙ අබජ්ඣරෙ,
මිතචින්තී අමොචෙසි උභො තත්ථ සමඟතාති"

"මිතචින්ති, අප්පචින්ති මසුන් දෙදෙනා ම දැලෙහි බැඳුණහ. මිතචින්තී මත්ස්‍යයා ඔවුන් දැලෙන් මිදවීය. ඔවුන් දෙදෙනා ද මිතචින්ති සමග එක් වූවෝය."

එහි, "බහුචින්තී", බොහෝ කොට සිතන බැවින් ද සැක බහුල බැවින් ද ලබන ලද නමයි. අනෙක් දෙපදයෙහි ද මේ ක්‍රමයමැ යි. "උභොතත්‍ථ සමගතා", මිතචින්ති නිසා යළි පණ ලැබුවා වූ ඒ දෙදෙන නැවත දියෙහි ද මිතචින්තී සමග එක්වූහ, යන අර්ථයි.

මෙසේ බුදුහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා සිව්සස් ප්‍රකාශ කළහ. ඒ මහළු භික්ෂූහු ද සෝවාන් ඵලයෙහි පිහිටියහ. එදින බහුචින්ති, අප්පචින්ති මසුන් දෙදෙන මේ භික්ෂු දෙන ම වූහ. මිතචින්තී මත්ස්‍යයා වනාහි මම ම වීමි.

## 1. 12. 5.

## අනුශාසික ජාතකය

"යායඤ්ඤමනුසාසති" යන මේ ජාතකය බුදු රජහු දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, එක්තරා අනුශාසනා කරන මෙහෙණක් අරබයා දෙසූහ. එතුමිය සැවැත් නුවර වැසි එක් කුල දුවක් වූවාය. පැවැදි ව උපසපන් කාලයෙහි පටන් මහණකමෙහි නො යෙදුනී, ආමීෂයෙහි ගිජු වී අන් මෙහෙණක වූ යම් පෙදෙසකට නො යයි ද එවැනි නගරයෙහි එක් පෙදෙසක පිඬු පිණිස හැසිරෙයි. මිනිස්සු ද ප්‍රණීත පිණ්ඩපාත දෙති. රස තෘෂ්ණාවෙන් බැඳී ඉදින්, මේ පෙදෙසෙහි අන් මෙහෙණහු පිඬු පිණිස හසිරෙද් ද, එවිට මගේ ලාභ පිරිහෙන්නේය. යම් අයුරකින් මෙපෙදෙසට අන් මෙහෙණියෝ නො එන්නෝ ද, එසේ කළ යුතු යි සිතා ආර්යාවනි, අසවල් තැන සැඬ ඇතකු සිටී. සැඬ අයෙක් සැඬ බල්ලෙක් සිටී. අසවල් තැන උවදුරු සහිතය. එහි පිඬු පිණිස නො ඇසිරෙනු යි අවවාද දෙයි. මෙහෙණගේ අවවාද අසා මෙහෙණියෝ එදෙසෙට ගෙල හරවා බැලීම් පමණකුදු

නො කළෝය. අනුශාසිකා මෙහෙණ දිනක් එපෙදෙසෙහි පිඬුපිණිස හැසිරෙන්නී, එක් ගෙයකට වේගයෙන් පිවිසෙන කල්හි සැඬ බූරුවෙක් පහර දී කලවා ඇටය බින්දේය. මිනිස්සු වේගයෙන් අවුත් දෙකට කැඩුණු කලවා ඇටය එකට තබා බැඳ ඇඳක හොවා මෙහෙණෙවරට ගෙන ගියහ. අනෙක් භික්ෂුණීහු, මැය අනුන්ට අවවාද කොට එම පෙදෙසෙහි හැසිර තමා ම කලවා ඇටය බිඳගත්තී අපවාද කීහ. මෙසේ අනුශාසිකා භික්ෂුණිය කළ ක්‍රියාව කල් නො ගොස් භික්ෂූන් අතර ප්‍රකට විය. දිනක් දම් සබාවෙහි රැස් වූ භික්ෂූහු, ඇවැත්නි, අනුශාසිකා භික්ෂුණිය අනුන්ට අවවාද කොට තමා ම එම පෙදෙසේ හැසිර සැඬ බූරුවකුගෙන් පහර ලැබ කලවා ඇටය බිඳගත්තී ඇගේ අගුණ කථාව කීවාහුය. බුදු රජුන් දම් සබාවට වැඩ මහණෙනි, දැන් කවර කථාවෙකින් හුන්නාහුදැ යි අසා මේ කථාවකින්යැ යි කී කල්හි මහණෙනි, මේ මෙහෙණ අනුන්ට අනුශාසිකා වූයේ දැන් පමණක් නො වේ. පෙරත් එසේ ම වූවායැ යි වදාරා යමකු තමා දෙන අවවාදයෙහි නො පිහිටයි ද ඔහු නිරතුරු ව දුකට ම පත් වේයැ යි මේ අතීත කථාව ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු වනයක කුරුළු යෝනියෙහි ඉපිද වැඩිවියට පත්ව කුරුළු නායකයෙක් වී නොයෙක් සියගණන් කුරුල්ලන් පිරිවරා හිමවතට ගියහ. එහි වසන කළ එහි සිටි සැඬ කිරිල්ලක් මහමඟට අවුත් ගොදුරු ගන්නීය. ගැල්වලින් වැටුණු වී, මුං ආදි බීජ ලැබ එහි ආශා කොට අනෙක් කුරුල්ලන් එහි පැමිණීම වැළැක්විය යුතු යි සිතා ඔවුන්ට අවවාද දෙමින් කුරුල්ලන්ට මේ මහා මාර්ගය වනාහි බිය ජනකය. නපුරු ගොනුන් යෙදූ ගැල් නිතර පවතී. වහා අහසට නැඟීමට අපහසුය. එම නිසා එහි නො යා යුතුයි. කුරුල්ලෝ ඇයට අනුශාසිකා නම දුන්හ. දිනක් ඇය මහමඟ හැසිරෙන්නී, මහමඟ වේගයෙන් පැමිණි යානයක හඬ අසා, රථය තවත් දුරයැ යි සිතා ඔබ්මොබ හැසිරෙමින් සිටියාය. යානය ද වාත වේගයෙන් පැමිණියේය. කිරිල්ලට උඩ නැඟීමට නො හැකි විය. රිය සකට අසුවීමෙන් දෙපලු වූවාය. කුරුළු නායක කුරුල්ලන් ගණන් ගන්නා විට, අනුශාසිකා කිරිල්ල නැත. ඇය සොයමු යි කීවේය. සෙසු කුරුල්ලලෝ ද සොයන කල්හි, ඇය දෙපළු වී සිටින බව කීහ. කුරුලු නායක, ඇය අනෙක් කුරුල්ලන්ගේ ගමන වළකා තමා එහි හැසිරෙන්නී, දෙකට සිඳී මරණයට පත්වූවාය යි කියා මේ ගාථාව කීය.

"යායඤ්ඤමනුසාසති සයං ලොලුප්පචාරිණී,
සායං විපක්ඛිකා සෙති හතා චක්කෙන සාළිකාති"

"ලොල්ව හැසිරෙන යම් කිරිල්ලක් අනුන්ට අවවාද කරන්නී ද, ඒ සැළලිහිණි කිරිල්ල රිය සකින් නැසී පියාපත් සිඳී මහමඟ හොත්තීය."

එහි, "යායඤ්ඤමනුසාසති", මෙහි 'ය' කාරය පද සන්ධි පිණිසයි. යම් කිරිල්ලක් අනුන්ට අනුශාසනා කරති යි, යන අර්ථයි. "සයං ලෝලුප්පචාරිණී", තමා ලොල්ව හැසිරෙන්නී ම, "සායං විපක්ඛිකා සෙති", ඕ පියාපත් ඇතිව මහමඟ වැතිර සිටී. "හතා චක්කෙන සාළිකාති", රිය සකින් නැසුණු සැළලිහිණි කිරිල්ලියයි.

බුදු රජහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා ජාතකය නිමවූහ. එදා අනුශාසික කිරිල්ල දූන් අනුශාසික භික්ෂුබණීය වූවාය. කුරුළු රජ මම ම වීමි.

## 1. 12. 6.

## දුබ්බච ජාතකය

"අතිකරමකරාචරියාති" යන යන දේශනාව බුදු රජහු ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, එක් අකීකරු භික්ෂුවක් අරබයා වදාළහ. ඒ කථා පුවත නව වැනි නිපාතයෙහි ගිජ්ඣ ජාතකයෙහි ප්‍රකට වන්නේය. බුදුහු වනාහි ඒ භික්ෂුව අමතා, මහණ, නුඹ දූන් පමණක් අකීකරු වූයේ නොව, පෙරත් අකීකරු වූයේය. අකීකරු කම නිසා ම නුවණ ඇත්තන්ගේ අවවාදය නො සලකන්නේ, අඩයටි පහරින් මරණයට පැමිණියේයැ යි වදාරා අතීත කථාව ගෙනහැර දූක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කැරෙද්දී බෝසත් තෙම අඩයටි පනින ශිල්ප දත් කුලයක පිළිසිඳ ගෙන වැඩිවියට පැමිණියේ, නුවණ ඇත්තේ, උපායශීලී විය. හෙතෙම එක් නළුවකුගේ සමීපයෙහි අඩයටි පනින ශිල්පය පුහුණු වී ගුරුවරයා සමග ශිල්ප දක්වමින් හැසිරෙයි. මොහුගේ ගුරුවරයා වනාහි සිව් අඩයටියකින් පැන යන ශිල්පය දනිතත් පසකින් පැන යන ශිල්ප නො දනී. හෙතෙම එක් දිනක් කුඩා ගමක ශිල්ප දක්වන්නේ, සුරා මදයෙන් මත් ව පස් අඩයටියකින් පනින්නෙමි යි පිළිවෙළින් අඩයටි තැබීය. ඉක්බිති, එහුට බොසත්හු කීහ. ගුරුතුමනි, නුඹ පස් අඩයටි ශිල්පය නො දන්නෙහිය. එක් අඩයටියක් බැහැර කරව. එසේ නො කළ හොත් පස් වැනි අඩයටියෙහි ඇණී මරණයට පැමිණෙන්නෙහිය. හෙතෙම අධික ලෙස මත් වී සිටි බැවින් ඔබ මගේ තරම නො දන්නෙහි යි, ඔහුගේ කීම නො පිළිගෙන අඩයටි සතරක් පැන පස් වැනි අඩයටියෙහි රිටක ඇමුණු මී මලක් මෙන් ඇමිණී වැළපෙමින් හොත්තේය. ඉක්බිති, ඔහුට බෝසත්හු නුවණ ඇත්තන්ගේ කීම නො කොට මේ විපතට පැමිණියේයැ යි මේ ගාථාව කීහ.

"අතිකරමකරාචරිය, මය්හමෙපතං න රුච්චති,
චතුත්ථෙ ලඞ්ඝයිත්වාන පඤ්චමියස්මිං ආවුතොති"

"ඇදුරුතුමනි, තොපට නො පිළිවන් වූ අධික වූ ක්‍රියාවක් කළෙහිය. මට ඒ කාරණය නුරුස්සයි. සතර වැනි ශස්ත්‍රයෙහි (නො වැටී සිරුර) පන්වා පස් වැන්නෙහි ඇවිණී ගියෙහිය."

එහි, "**අතිකරමකරාචරියාති**", ගුරුතුමනි, අද ඔබ නො කළ යුතු දෙය කළෙහිය. තමාගේ දැනුමට වඩා වැඩි දෙයක් කළේය, යන අර්ථයි. "**මය්හමෙපතං න රුච්චති**", අතවැසියකු වූ මට ද මෙකරුණ රුචි නො වේ. එම නිසා පළමු කොට ම මා ඔබට මෙකරුණ කීවෙමි යි දක්වයි. "**චතුත්ථෙ ලඞ්ඝයිත්වානති**", අඩයටි සතරක් පැන "**පඤ්චමියස්මිං ආවුතොති**", නුවණ ඇත්තන්ගේ වචන නො පිළිගෙන දූන් පස් වැනි අඩයටියෙහි ඇමිණියෙහිය.

මෙය කියා ගුරුතුමා අඩයටියෙන් වෙන් කොට කළ යුතු දේ කළහ. බුදු රජහු මේ කථාව ගෙනහැර දක්වා ජාතකය නිම කළහ. එදින ගුරුතුමා මේ අකීකරු භික්ෂුව විය. අතවැසියා වනාහි මම ම වීමි.

## 1. 12. 7.

## තිත්තිර ජාතකය

"අච්චුග්ගතා අතිබලතාති" යන යන දේශනාව බුදු රජහු දෙව්රම් වෙහෙරෙහි වැඩ වාසය කරන සේක්, කෝකාලික භික්ෂුව අරබයා වදාළහ. එහි කථා පුවත දහතුන් වැනි නිපාතයෙහි තක්කාරිය ජාතකයෙහි මතු සඳහන් වන්නේය. බුදු රජහු වනාහි මහණෙනි, කෝකාලික භික්ෂුව තමාගේ වචනය නිසා නැසුණේ දැන් පමණක් නොව, පෙරත් නැසුණේමැ යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කැරද්දී බෝසත්හු (නැගෙනහිර) උසස් බමුණු කුලයෙහි ඉපදී වැඩිවියට පත්ව තක්ෂලාවෙහි සියලු ශිල්ප ඉගෙන කම් සැප හැර දමා තවුස් පැවිද්දෙන් පැවිදි ව පඤ්ච අභිඥා හා සමාපත්ති අට ද උපදවා ගත්හ. හිමවත් පෙදෙසෙහි සියලු තාපස පිරිස රැස් වී ඔහු අවවාද දායක ගුරුවරයා කොට පිරිවරා ගත්හ. හෙතෙම පන්සියයක් තාපසවරුන්ගේ අවවාද දායක ගුරුවරයා වී ධ්‍යාන සුවයෙන් යුක්ත ව හිමාල වනයෙහි විසීය. එකල එක් පාණ්ඩු රෝගී තාපසයෙක් පොරොව ගෙන දර පලයි. ඉක්බිති, එක් දොඩමළු තාපසයෙක් ඔහුගේ සමීපයෙහි හිඳ මෙතෙන්ට පහර දෙව. මෙතෙන්ට පහර දෙව යි ඒ තාපසයා තරහ ගැන්වීය. හෙතෙම කිපී දැන් නුඹ මගේ දර පලන ශිල්පය උගන්වන ගුරුවරයා නො වෙයි. මුවාත් පොරොව ඔසවා එක් පහරින් ම මරණයට පත් කළේය. බෝසත්හු ඔහුගේ අවසන් කටයුතු කැරවීය.

එකල අසපුවට නුදුරෙහි එක් තුඹසක් ළඟ තිත් වටුවෙක් වසයි. හෙතෙම උදේ සවස තුඹස මත සිට මහත් සේ හඬලෑවේය. ඒ අසා එක් වැද්දෙක් තිත් වටුවකු විය යුතුයැ යි හඬ අනුව ගොස් ඌ මරා ගෙන ගියේය. බෝසත් තෙම උගේ ශබ්දය නො අසන්නේ අසවල් තැන තිත් වටුවෙක් වසයි. කුමක් නිසා උගේ හඬ නො ඇසෙන්නේදැ යි තවුසන්ගෙන් විචාළේය. ඔවුහු ඒ කරුණ සැලකළාහුය. හෙතෙම දෙදෙනාගේ ම ඒ කාරණා සසඳා මේ ගාථාව කීවේය.

"අච්චුග්ගතා අතිබලතා අතිවෙලං පභාසිතා,
වාචාහනති දුම්මෙධං තිත්තිරං වාතිවස්සිතන්ති"

"ඉතා උස් වූ, (ඉතා මහත් කොට කියන ලද්දා වූ) ඉතා බලවත් වූ, ප්‍රමාණය ඉක්මවා ප්‍රකාශිත වචනය ප්‍රමාණය ඉක්මවා හැඬූ වටුවා මෙන් නුවණ නැත්තහු නසයි."

එහි, "අච්චුග්ගතාති", ඉතා මහත් කොට කියන ලද, "අතිබලතාති", නැවත නැවත කීමෙන් ඉතා බලවත් වූ ස්වභාවයෙන්, "අතිවෙලං පභාසිතාති", වේලාව ඉමක්වා, පමණ ඉක්මවා කියන ලදී. "තිත්තිරං වාතිවස්සිතන්ති", යම්සේ තිත් වටුවා අධික ව හඬලන්නේ, නැසුණේය. එසේ ම එබඳු වචනය නුවණ නැති බාල පුද්ගලයා නසයි.

මෙසේ බෝසත්හු තාපය පිරිසට අවවාද දී සිව් බඹ විහරණ වඩා බඹ ලොව පිහිට කොට ගියේ විය. බුදුහු, මහණෙනි, කෝකාලික දැන් පමණක් තමාගේ වචනය නිසා නැසුණේ නො වේ. පෙරත් නැසුණේයැ යි මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා ජාතකය නිමාවට පත්කළහ. එකල අකීකරු තාපසයා මේ කෝකාලික විය. තාපස පිරිස බුදු පිරිසයි. නායක තාපසයා වනාහි මම ම වෙමි යි වදාළහ.

## 1. 12. 8.

## වට්ටක ජාතකය

"නවිත්තයනෙතා පුරිසොති" යන දේශනාව බුදු රජනු ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, උත්තර නම් සිටු පුත්‍රයා අරබයා වදාළහ. සැවැත් නුවර මහත් ධනයක් ඇති උත්තර නම් සිටුවරයකු විය. ඔහුගේ බිරිඳගේ කුසෙහි එක් පින් ඇති සත්ත්වයකු බඹ ලොවින් චුත වී පිළිසිඳ ගෙන වැඩිවියට පැමිණියේ, උතුම් පැහැයෙන් මනා රූ ඇත්තේ විය. ඉක්බිති, එක් දිනක් සැවැත් නුවර කැති නැකැත් සැණකෙළිය - නැකත් ක්‍රීඩාව ප්‍රකාශයට පත් කළ කල්හි සියලු රටවැසියා නැකත් කෙළියේ යෙදුණේ විය. ඒ සිටු පුත්‍රයාගේ අනිත් යහළු සිටු පුත්‍රයෝ භාර්යාවන් සහිත වූහ. උත්තර සිටු පුත්‍රයා බොහෝ කලක් බඹ ලොව විසූ හෙයින් කාමයන්හි නො ඇලේ. ඉක්බිති, ඔහුගේ යහළුවෝ උත්තර සිටු පුත්‍රයාට ද එක් ස්ත්‍රියක් ගෙනවුත් නැකත් කෙළි කෙළිමු යි මන්ත්‍රණය කොට ඔහු වෙත එළැඹ යහළුව, මේ නගරයෙහි කැති නැකත් සැණකෙළියයැ යි ඝෝෂා කරන ලද්දේ වෙයි. ඔබට ද එක් ස්ත්‍රියක ගෙන අවුත් නැකත් කෙළි කෙළෙමු යි කීවාහුය. එවිට සිටු පුත් මට ස්ත්‍රියකගෙන් වැඩක් නැතැ යි කී කල්හි ද නැවත නැවත ඇවිටිලි කිරීමෙන් මැනවැ යි පිළිගන්වා එක් වෙසඟනක් සියලු අලංකාරයන්ගෙන් සරසවා ඔහුගේ ගෙදරට ගෙන ගොස් සිටු පුත්‍රයාගේ ගෙදරට යවයි. ඔහු නිදන ගෙයට යවා නික්ම ගියහ. සිටු පුත්‍රයා ඇය නිදන ගෙට පිවිසිය ද ඇය දෙස නො බලයි. කථා නො කරයි. ඇය මෙසේ සිතුවාය. මෙතෙම සුවෙන් අග තැන්පත් ස්ත්‍රී විලාශයන්ගෙන් යුක්ත වූ මා නො බලයි. කථා නො කරයි. දැන් තමාගේ ස්ත්‍රී විලාශයන්ගෙන් ඔහු බලවමි යි, ස්ත්‍රී ලීලා දක්වන්නී, සතුටු වූ ආකාරයෙන් අග දත් පෙන්වා සිනාසුණාය. එවිට සිටු පුත් දත් දෙස බලා ඇට යන සංඥාව උපදවා ගත්තේය. ඇගේ සියලු සිරුර ඇට සැකිල්ලක් මෙන් පෙනුණේය. සිටු පුත් ඇයට වියදම් දී යව යි පිටත් කළේය.

ඇය සිටු පුත්ගේ ගෙදරින් පිටත් ව යන විට එක්තරා ධනවතෙක් වීථිය අතර දී ඇයට වියදම් දී තමාගේ ගෙදරට ගෙන ගියේය. හත් දවසක් ඉක්ම ගිය කල්හි නැකත් කෙළිය අවසන් විය.

වෙසඟනගේ මව දුවගේ පැමිණීම නො දැක සිටු පුත්‍රයා වෙත ගොස් ඇය කොහිදැ යි විචාළාය. ඔවුහු උත්තර සිටු පුත්‍රයාගේ ගෙට ගොස් ඈ කොහිදැ යි විචාළාහ. ඒ අවස්ථාවෙහි ම ඇගේ වියදම් දී පිටත් කළේයැ යි කීවේය. ඉක්බිති, ඇගේ මව හඬන්නී, මගේ දුව නො දකිමි. මගේ දුව ගෙනෙව යි උත්තර සිටු පුත්‍රයා ද රැගෙන රජු සමීපයට ගියාය. රජතුමා ද නඩුව විනිශ්චය කරන්නේ, මේ සිටු පුත්‍රයෝ වෙසඟනක් ගෙනවුත් දුන්නාහුදැ යි විචාළේය. දේවයන් වහන්ස, එසේය. දූන් ඇය කොහි ද ? නො දනිමි. එකෙණෙහි ම ඇයව පිටත් කළෙමි. දූන් ඈ කැඳවාගෙන එන්නට හැකි වෙයි ද? දේවයන් වහන්ස, නො හැක්කෙමි. රජතුමා, ඉදින්, කැඳවාගෙන එන්නට නො හැකි වන්නේ නම් ඔහුට රජ අණ ක්‍රියාත්මක කළ යුතුයැ යි කීවේය. ඉක්බිති, එහු අත් පිටිපසට කැර බැඳ රජ අණ ක්‍රියාත්මක කරන්නෙමැ යි ගෙන ගියාහුය. සිටු පුත්‍රයා වනාහි වෙසඟන කැඳවා ගෙන එන්නට නො හැකි වන්නේ, රජතුමා රජ අණ කැරව යි කී විට මුළු නගරය ම කැළඹෙන්නට විය. මහජනයා ළයෙහි අත් තබාගෙන මේ කුමක් ද ස්වාමීනි, ඔබට නුසුදුසු දඬුවමක් ලැබුණේයැ යි වැළපෙයි. සිටුතුමා ද පුත්‍රයාගේ පසුපස වැළපෙමින් යයි. සිටු පුත්‍රයා මෙසේ සිතුවේය. මේ මට මෙබඳු දුකක් ගිහි ගෙයි වසන නිසා උපන්නේය. ඉදින්, මෙයින් මිදින්නෙම් නම් මහා ගෞතම සම්මා සම්බුදුන්ගේ සමීපයෙහි පැවිදි වන්නෙමි. ඒ වෙසඟන ද වනාහි ඒ කැළඹිලි හඬ අසා මේ කිනම් ශබ්දයක්දැ යි විචාරා ඒ පුවත අසා වේගයෙන් බැස පහවන්න, පහවන්න ස්වාමීනි, මා රාජ පුරුෂයන්ට දකින්නට දෙව තමා පෙනී සිටියාය. රාජ පුරුෂයෝ ඇය දැක මව කැඳවා සිටු පුත්‍රයා නිදහස් කැරවා ගියාහුය. හෙතෙම සහායකයන් පිරිවරා ගඟට ගොස් ජල ස්නානය කොට ගෙට ගොස් හීල ආහාරය ගෙන මව පියන්ගෙන් පැවිද්දට අවසර ලබාගෙන සිවුරු සළුගෙන මහ පිරිවරින් බුදු රජුන් වෙත ගොස් වැඳ පැවිද්ද ඉල්ලා පැවිද්ද හා උපසම්පදාව ලැබ නො හළ කමටහන් ඇත්තේ, විදසුන් වඩා නොබෝ දිනකින් රහත් බැව්හි පිහිටියේය.

ඉක්බිති, එක් දිනක් දම් සබාවෙහි රැස්වූ භික්ෂූහු ඇවැත්නි, උත්තර සිටු පුත්‍රයා තමන්ට බයක් උපන් කල්හි ශාසනයෙහි අගය දැන මේ දුකින් මිදෙන්නේ, පැවිදි වන්නෙමි යි සිතා ඔහු විසින් මනා කොට සිතීමෙන් මිදුණේ මෙන් ම පැවිදි අග්‍ර ඵලයෙහි පිහිටියේයැ යි ඔහුගේ ගුණ කථාව කීවාහුය. බුදු රජහු අවුත් මහණෙනි, මෙහි

කවර කථාවකින් යුක්තව සිටියාහුදැ යි විචාරා මෙනම් කථාවකින්යැ යි කී කල්හි මහණෙනි, උත්තර සිටු පුත්‍රයා මෙන් තමාට බය උපන් කල්හි මේ ක්‍රමයෙන් මේ දුකින් මිදෙන්නෙමි යි සිතන්නේ, මරණ බයින් මිදුණේ, පෙර නුවණ ඇත්තෝ ද තමන්ට බය උපන් කල්හි මේ ක්‍රමයෙන් මේ දුකින් මිදෙන්නෙමු යි සිතා මරණ බය දුකින් මිදුණාහුයැ යි කියා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කැරද්දී බෝසත්හු චුත වීම හා පිළිසිඳ ගැනීම් වශයෙන් පෙරළෙන්නේ, වටු යෝනියෙහි උපන්හ. එකල එක් වටු වැද්දෙක් කුලයෙහි බොහෝ වටුවන් ගෙනවුත් ගෙයි තබා ගොදුරු දී මුදල් ගෙන ආවවුන්ගේ අතෙහි වටුවන් විකුණන්නේ, දිවි ගෙවයි. ඔහු එක් දිනක් බොහෝ වටුවන් සමග බෝසතුන් ද ගෙන ආවේය. බෝසත්හු මෙසේ සිතූහ. ඉදින්, මම මොහු විසින් දෙන ලද ගොදුරු ද පැන් ද පරිභෝග කරන්නෙමි නම් මෙතෙම මා අල්ලාගෙන ආ මිනිසුන්ට දෙන්නේය. ඉදින්, පරිභෝග නො කළෙම් නම් මම මැළවෙන්නෙමි. මා මළාණික වූ කල්හි මා නො ගන්නේය. එයින් මගේ මිදීම වන්නේය. මෙය උපාය කරන්නෙමි යි සිතා එසේ කරමින් තමා මළානික කොට ඇට සම් පමණක් ඇත්තෙක් වූයේය. මිනිස්සු ඌ දැක නො ගත්තාහුය. වැද්දා බෝසතුන් හැර සෙසු වටුවන් අවසන් වූ පසු පැස ගෙන අවුත් දොරටුව අබියස තබා බෝසතුන් තම අල්ලට ගෙන මෙතෙම කුමක් කරන ලද්දේදැ යි විමසීමට පටන් ගත්තේය. බෝසත්හු වැද්දාගේ ප්‍රමාදය දැක පියාපත් විදහා උඩට නැඟ වනයට ම ගියේය. වටුවෝ ඔහු දැක කිමෙක් ද ? මෙතෙක් කල් කොහි ගියේදැ යි විචාරා වැද්දකු විසින් අල්ලා ගන්නා ලදිමි යි කී කල්හි කෙසේ නම් මිදුණේදැ යි ඇසූහ. එවිට බෝසත්හු මම ඔහු විසින් දෙන ලද ගොදුරු නො ගෙන පැන් නො බී කළ උපායෙන් මිදුණේ වෙමි යි කියා මේ ගාථාව කීවේය.

**"නචින්තයන්තො පුරිසො විසෙසමධිගච්ඡති,**
**චින්තිතස්ස ඵලං පස්ස මුත්තොස්මි වධබන්ධනාති"**

"පුරුෂ තෙමේ (පැමිණි දුකින් මිදීමට උපාය) නො සිතන්නේ දුකින් මිදීම නම් විශේෂයට නො පැමිණේ.

(එසේ) චින්තිත කර්මයාගේ ප්‍රයෝජනය බලව. මම මරණයෙන් ද බන්ධනයෙන් ද මිදුණෙමි."

එහි පිණ්ඩාර්ථයයි. "**පුරිසො**", පුරුෂයා දුකට පැමිණ මෙනම් උපායෙන් මිදෙමි යි, "**නාචින්තයන්තො**", නො සිතන්නේ, තමා පැමිණි දුකින් මිදීම නම් වූ, "**විසෙසංමධිගච්ඡති**", විශේෂයකට නො පැමිණේ. දුන් වනාහි මා විසින් සිතන ලද කර්මයාගේ ඵලය බලව. එම උපායෙන් ම, "**මුත්තොසම්හි වධබන්ධනාති**", මරණයෙන් ද බන්ධනයෙන් ද මම මිදුණේ වෙමි.

මෙසේ බෝසත්හු තමා විසින් කැරන ලද උපාය කීහ. බුදු රජහු මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා ජාතකය නිමා කළහ. එදා මරණයෙන් මිදුණු වටුවා නම් මම ම වීමි.

## 1. 12. 9.

## අකාලරාවී ජාතකය

"**අමාතාපිතරි සංවද්ධොති**" යන මේ ජාතක දේශනා බුදු රජහු දෙව්රම් වෙහෙර වසන සේක්, දොඩමළු භික්ෂුවක් අරබයා දේශනා කළහ. සැවැත් නුවර වැසි කුල පුතෙක් වූ ඔහු සසුනෙහි පැවිදි ව වත් පිළිවෙත හෝ ශික්ෂා හෝ නො උගත්තේය. ඒ භික්ෂුව, මා මේ වේලාවෙහි වත් කළ යුතුය. මේ වේලාවේ උවටැන් කළ යුතුය. මේ වේලාවෙහි ඉගනීම කළ යුතුයැ යි නො දනී. ප්‍රථම, මැදි, පැසුළු යන කාලත්‍රයෙහි පිබිදුණු කවර වේලාවක හෝ මහත් ශබ්ද කරයි. අනෙක් භික්ෂූහු මේ නිසා නිදි නො ලබත්. දම් සබාවෙහි රැස්වූ භික්ෂූහු, ඇවැත්නි, අසවල් භික්ෂුව මෙවැනි රුවන් වැනි සසුනක පැවිදි ව වතක් හෝ ශික්ෂාවක් හෝ කළ හෝ නො කළ දෙය නො දනිතැ යි ඔහුගේ අගුණ කථා කැරෙමින් හුන්නාහුය. බුදු රජහු සම් සබාවට වැඩමවා මහණෙනි, කවර කථාවකින් යුතුව හුන්නාහුදැ යි විචාරා ස්වාමීනි, මෙනම් කථාවකින් හුන්නෙමුයැ යි කී කල්හි, මේ කල් නො

දූන රැව්දෙන භික්ෂුව පෙරත් එසේ ම විය. කල් නො කල් නො දන්නා බැවින් ගෙල ඇඹරී මරණයට පත් වූයේයැ යි වදාරා අතීත කථාව ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු උසස් බමුණු කුලයක ඉපිද වැඩි වියට ව සියලු ශිල්පයන්හි පරතෙරට ගොස් බරණැස් නුවර දිසාපාමොක් ඇදුරු වී පන්සියයක් මානවකයන්ට ශිල්ප ඉගැන්වූහ. ඒ මානවකයන්ට නියම වේලාවට හඬලන කුකුලෙක් සිටියේය. මානවකයෝ කුකුළා හැඬලූ හඬින් නැඟිට අධ්‍යයන කටයුතු කරති. කුකුළා මළේය. මානවකයෙක් දර කඩමින් සොහොන් බිමෙහියන්නේ, කුකුළකු දැක ගෙනැවුත් කුඩුවක තබා ඇතිදැඩි කළේය. සොහොනෙහි වැඩුණු බැවින් අසවල් වේලෙහි හඬලිය යුතුයැ යි නො දන්නේ, සමහර දිනක මහරාත්‍රියේ ද හඬලයි. තවත් දිනක අරුණ නැඟෙත් ම හඬළයි. මහා රාත්‍රියෙහි හැඬලූ කල්හි ශිල්ප හදාරන්නාහු අරුණ නැඟීම දක්වා හැදෑරිය නො හැකි වෙත්. නිද්‍රෝපගත වීම නිසා පටන්ගත් තැන් ද නො දනිත්. ඉතා අළුය ම හැඬූ කල්හි ඉගෙනීමට කාලය මද වේ. එවිට මානවකයෝ මේ කුකුළා මහා රෑ හෝ අළුයම හඬළයි. මේ නිසා අපගේ ඉගනීම් කාර්යයන් අවසන් නො වේ. මෙසේ සිතූ මාණවකයෝ කුකුළා ගෙන ගෙල අඹරවා මරණයට පත්කොට නො කල්හි හඬලන කුකුළා අප විසින් මරණ ලද්දේ යි ගුරුතුමාට දන්වූහ. එවිට ගුරුතුමා ඔවදන් ලබා නො වැඩුණු බැවින් මරණයට පැමිණියේ යි කියා මේ ගාථාව කීය.

"අමාතාපිතරි සංවඩ්ඪො අනාචරියකුලෙ වසං,
නායං කාලං අකාලං වා අභිජානාති කුක්කුටොති"

"මව්පියන් සමීපයෙහි නො වැඩුණු, ඇදුරු කුලයක නො
විසූ මේ කුකුළා හැඬිය යුතු කාලය හෝ නො හැඬිය
යුතු කාලය නො දනී."

එහි, "අමාතාපිතරි සංවඩ්ඪො", මව්පියන් ඇසුරු කොට ඔවුන්ගේ අවවාද ගෙන නො වැඩුණු තෙමේ, "අනාචරිය කුලෙ වසං", ඇදුරු කුලයක නො වැස, සිරිත් උගන්වන්නකු ඇසුරු කොට නො විසූ

බැවින් යන අර්ථයි. "කාලං අකාලං වා", මෙවෙලාවෙහි හැඬලිය යුතුය. මෙවෙලාවෙහි නො හැඬලිය යුතුයැ යි මේ කුකුළා නො දනී. ඒ නො දන්නා නිසා ම මරණයට පැමිණියේය.

මේ කරුණු දක්වා බෝසත්හු දිවි ඇතිතාක් සිට කම් වූ පරිදි ගියේය. බුදුහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා ජාතකය නිමවූහ. එදා නො කල්හි හැඬූ කුකුළා මේ භික්ෂුව වූයේය. අතවැසියෝ බුදුපිරිස වූහ. ගුරුතුමා මම ම වීමි.

## 1. 12. 10.

## බන්ධනමොක්ඛ ජාතකය

"අබද්ධා තත්ථ බජ්ඣන්ති" යන මේ දේශනාව බුදු රජහු ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, චිඤ්චි මානවිකාව අරබයා වදාළහ. ඇගේ කථා පුවත දොළොස් වැනි නිපාතයෙහි මහා පදුම ජාතකයෙහි මතු සඳහන් වන්නේය. එකල්හි වනාහි බුදු රජහු, මහණෙනි, චිඤ්චි මානවිකාව මට අභූත චෝදනා කළේ දැන් පමණක් නොව, පෙරත් බොරු චෝදනා කළේයැ යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කැරද්දී බෝසත්හු පුරෝහිත බමුණාගේ ගෙදර ඉපදී වැඩිවියට පත් කල්හි පියාගේ ඇවෑමෙන් ඔහුගේ ම පුරෝහිතයා වූහ. රජතුමා විසින් අග මෙහෙසියට වරයක් දෙන ලද්දේ වෙයි. සොඳුරිය, යමක් කැමැති ද එය කියව. ඈ මෙසේ කීවාය. මට වෙනත් වරයක් නම් දුර්ලභ නො වේ. මෙතැන් පටන් ඔබතුමා වෙනත් ස්ත්‍රියක් කෙලෙස් වශයෙන් නො බැලිය යුතුයි. රජතුමා එය ප්‍රතික්ෂේප කොට නැවත නැවතත් ඇවිටිලි කරන නිසා ඇගේ වචනය ඉක්මවා සිටීමට නො හැකි වන්නේ, පිළිගෙන එතැන් පටන් සොළොස් දහසක් පමණ වූ නාටක ස්ත්‍රීන් අතරින් කෙලෙස් වශයෙන් එක් ස්ත්‍රියක් දෙසවත් නො

බැලුවේය. ඉක්බිති, ඔහුගේ පසල් දනව්වක් කිපුණේය. පසල් දනව්වෙහි සිටි යෝධයෝ සොරුන් සමග දෙන්නා තුන් දෙනා වශයෙන් යුදකොට එයින් මත්තෙහි අපට නො හැක්කේයැ යි හසුන් යැවූහ. රජතුමා එහි යනු කැමැත්තේ, බල සෙනග රැස් කැරවා අග බිසව කැඳවා සොඳුරිය, මම පසල් දන්ව්වට යමි. එහි නොයෙක් ආකාර යුද්ධ ඇති වේ. ජය පරාජය ද අස්ථිරය. එබඳු තැනක ස්ත්‍රියකගේ රැකවරණය දුෂ්කරය. ඒ නිසා නුඹ මෙහි ම නවතින්නැ යි කීවේය. ඇ නවතින්න නො හැකි යි කීවාය. රජතුමා විසින් නැවත නැවතත් ප්‍රතික්ෂේප කරනු ලබන විට ඇ මෙසේ කීවාය. එසේ නම් එක් එක් යොදුනක් ගොස් මට සැප දුක් දැන ගැනීම පිණිස එක් එක් මිනිසා එවන්නේ නම් මැනවි. රජතුමා යහපතැ යි පිළිගෙන බෝසතුන් නුවර තබා මහත් බල සෙනගින් යුතුව නික්මී යන්නේ, යොදුනෙන් යොදුන එක් එක් පුරුෂයා අපගේ සුවදුක් දන්වා දේවියගේ සුවදුක් ද දැනගෙන එව යි යැවීය. ඇ ආ ආ පුරුෂයා රජතුමා නුඹ කුමක් සඳහා එව්වේදැ යි විමසා නුඹ වහන්සේගේ සුවදුක් දැන ගැනීම පිණිසයැ යි කී කල්හි එසේ නම් එව යි ඔහු සමග අසත් ධර්මය (අනාචාර) සේවනය කරයි.

රජතුමා දෙතිස් යොදුන් මග යන්නේ, තිස් දෙකක් ජනයා යැවීය. ඇ ඒ සියලු දෙනා සමග ම එසේ කළාය. රජතුමා පසල් දනව්ව සංසිඳුවා ජනපදය අස්වසා නැවත එන්නේ ද, එසේ ම තිස් දෙදෙනකු යැවීය. ඇ ඔවුන් සමග ද එසේ ම අනාචාරයේ හැසුරුණේය. රජතුමා අවුත් ජය වැඹ දොරටුව ළඟ සිට නගරය සරසා පිළියෙළ කැරවයි බෝසතාණන් වහන්සේට තල්පතක් යැවීය. බෝසත්හු සියලු නගරය සරසවා රජ ගෙදර ද සරසා පිළියෙල කැරවන්නෙ දේවිය වසන තැනට ගියහ. ඇ බෝසතාණන් වහන්සේගේ රූපයෙන් අග තැන්පත් සිරුර දැක ඉවසා දරා ගැනීමට නො හැකි වන්නී, එව බමුණ, ඇඳට නඟින්නැ යි කීවාය. බෝසත්හු එසේ නො කියන්න. රජතුමාට ගරු කරමි. පවට ද බිය වෙමි. මා විසින් මෙසේ කරන්නට නො හැකිය යි කීහ. හැට හතරක් සේවක ජනයන්ට රජතුමාට ගරු කිරීමක් නැත. අකුසලයට බිය වීමක් ද නැත. රජතුමාට ගරු කරන්නේ නුඹ විතර ද ? අකුසලයට බිය වන්නේ ඔබ විතර ද ? එසේය. ඉදින්, ඔවුන්ටත් එසේ වූයේ නම් මෙසේ නො කරන්නේය. මම වනාහි දන්නා නිසා මෙබඳු සැහැසි ක්‍රියාවක් නො කරන්නෙමි. වැඩිපුර කථා කුමට ද ? ඉදින්, මගේ කීම

නො කරන්නේ නම් නුඹේ හිස සිඳ වන්නෙමි. සිටීවා. එක් ආත්ම භාවයක හිස තබා ආත්ම භාව දහසක හිස් ගසා දැම්මත් මා විසින් මෙබන්දක් කරන්නට නො හැකිය. ඈ, වේවා. කළ යුත්ත දනිමි යි බෝසතුන්ට තර්ජනය කොට තමන්ගේ කාමරයට ගොස් සිරුරෙහි නිය පහරවල් දක්වා තෙලින් සිරුර ගල්වා කිලිටි කඩක් ඇඳ ගිලන් ස්වභාවයක් ඇති කොට දාසියන්ට අණ කළාය. රජතුමා, දේවිය කොහිදැ යි ඇසූවිට අසනීප බව කියවු. බෝසත්හු ද රජු ඉදිරියට ගියහ. රජතුමා නගරය පැදකුණු කොට ප්‍රාසාදයට නැඟී දේවිය නො දකින්නේ, දේවිය කොහිදැ යි විචාළේය. දේවයන් වහන්ස, ඇය ගිලන් වී ඇත. රජතුමා සිරියහන් ගැබට පිවිසී ඇගේ පිට පිරි මදිමින් සොඳුරිය, ඇති අපහසුතාව කුමක්දැ යි විචාළේය. ඈ නිහඬ වූවාය. තුන් වැනි වර රජු දෙස බලා මහරජ, ඔබ ද ජීවත්ව සිටිය දී මා වැනි ස්ත්‍රියක් ස්වාමික නම් වේ. ඒ කුමක් ද සොඳුරිය, නුඹ වහන්සේ විසින් නගරය ආරක්‍ෂා කිරීම පිණිස පත්කළ පෙරවි බමුණා නිවස පිළියෙළ කරමි යි මෙහි අවුත් තමාගේ වචනය නො කරන්නා වූ මට පහර දී තමාගේ අදහස (පුරවා) ඉටු කැරගෙන ගියේය. රජතුමා ගින්නෙහි දමන ලද ලුණු කැට මෙන් කෝපයෙන් පුපුරමින් සිරි යහනින් නික්මී දොරටුපාල සේවකාදීන් කැඳවා බොලව්, යවු. පෙරවි බමුණාගේ දෑත් පිටිපසට තබා බැඳ වධයට සුදුස්සකු කොට නගරයෙන් බැහැර කොට වදක ස්ථානයට පමුණුවා මොහුගේ හිස සිඳුවු. ඔවුන් වේගයෙන් ගොස් ඔහුගේ දෑත් පිටිපසට තබා බැඳ වද බෙරය වාදනය කැරවූහ. බෝසත්හු මෙසේ සිතූහ. ඒකාන්තයෙන් ඒ දුෂ්ඨ දේවිය විසින් රජතුමා කල්තියා ම බිඳවන ලදී. අද දැන් මම තමන්ගේ බලයෙන් ම මිදෙන්නෙමි යි හෙතෙම ඒ පුරුෂයන්ට කීවේය. පින්වත්නි, තොප මාව මරන්නේ නම් රජතුමාට පළමු ව පෙන්වා මරවු. කුමක් නිසා ද ? මම රාජ්‍යය සේවකයෙකි. මා විසින් බොහෝ කටයුතු කරන ලදී. බොහෝ මහා නිධානයන් දනිමි. මා විසින් ඒවා පාලනය කරන ලදී. ඉදින්, මා රජතුමාට නො පෙන්වන්නේ නම් බොහෝ ධනය විනාශ වන්නේය. මා රජතුමාට ධනය ගැන කී කල්හි පසුව කළ යුත්තක් කරවු. ඔවුහු ඒ බව රජතුමාට දැක්වූහ. රජතුමා ඔහු දැක ම එම්බා බමුණ, කුමක් නිසා මට ලජ්ජා කළෙහි ද ? කුමක් නිසා නුඹ මෙබඳු පාප ක්‍රියාවක් කළේදැ යි කීවේය. මහරජතුමනි, මම සොත්‍රීය නම් බමුණු කුලයේ උපන්නෙමි. මා විසින් කුඩා කුඹියකු පමණවත් ප්‍රාණ ඝාතයක් පෙර නො කළවිරූය. තණකොළ ගහක දෙයක් සොරා නො ගත්තෙමි. කාමුක හැඟීමෙන් අනුන්ගේ ස්ත්‍රියක දෙස ඇස ඇරවත් නො බැලූ

විරූය. විහිලුවටවත් බොරුවක් පෙර නො කියන ලද්දෙමි. කුස තණ අගතින් තරම්වත් මත්පැන් පෙර නො බොන ලද්දෙමි.

මම නුඹ වහන්සේ කෙරෙහි අපරාධ නැත්තෙක්මි. ඈ වනාහි මෝඩය. ලේහ වශයෙන් මගේ අතින් ගෙන මා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූවි ට මට තර්ජනය කොට තමා විසින් කරන ලද පාපය මතුකොට මට කියා ඇතුල් කාමරයට පිවිසි මම අපරාධ නැත්තෙක්මි. පත් (ලියුම්) ගෙන ආවා වූ හැට හතරක් ජනයා අපරාධ කළහ. ඔවුන් කැඳවා දේවයිනි, ඇගේ වචනය කරන ලද ද නො කරන ලදද යි විචාරනු මැනවි. රජතුමා ඒ හැට හතර දෙනා ගෙන්නවා දේවිය කැඳවා තී මොවුන් සමග පාපයක් කාළා ද ? නො කළාද යි විචාළේය. දේවයන් වහන්ස, කරන ලද්දෙමි යි කී කල්හි ඔවුන් අත් පිටිපසට තබා බන්දවා මේ හැට හතර දෙනාගේ සිස් සිඳව යි අණ කෙළේය. ඉක්බිති, ඔහුට බෝසත්හු කීහ. මහරජතුමනි, මොවුන් අත දෝෂයක් නැත. දේවිය තමාගේ කැමැත්ත කැරවූවාය. මොවුන් නිරපරාධියි. ඒ නිසා මොවුන්ට සමාව දෙනු. ඇගේ ද දෝෂයක් නැත. ස්ත්‍රීහු නම් මෙවුන් දම් සෙවීමෙහි සෑහීමක් නැත. මෙය ඔවුන්ගේ ස්වභාව දහමකි. ඔවුන් තුළ මෙය විය යුතු දෙයක් මය. ඒ නිසා ඇයටත් සමාව දෙනු මැනවැ යි නොයෙක් ආකාරයෙන් රජුට කරුණු අවබෝධ කැරවා ඒ හැට හතර දෙනා ද ඒ බාල තැනැත්තිය ද මුදවා සියල්ලන්ට ම යම් සේ සිය පැරණි තනතුරු දෙවීය. මෙසේ ඒ සියලු දෙනා ම නිදහස් කැරවා ස්වකීය ස්ථානවල පිහිටුවා බෝසත්හු රජු වෙත එළැඹ මහරජතුමනි, අඥ බාලයන්ගේ නිරර්ථක වචනයෙන් නො බැඳිය යුතු නුවණ ඇත්තේ, දෑත් පිටුපසට කොට බඳින ලදී. නුවණ ඇත්තන්ගේ සහේතුක වචනයෙන් පිටුපසට කොට බැඳි දෑත් මුදන ලදී. මෙසේ බාලයෝ නම් නො බැඳිය යුත්තන් බන්දවත්. නුවණ ඇත්තෝ බැන්දත් මුදා හරිත්යැ යි කියා මේ ගාථාව කීහ.

"අබද්ධා තත්ථ බජ්ඣන්ති යත්ථ බාලා පභාසරෙ,
බද්ධාපි තත්ථ මුච්චන්ති යත්ථ ධීරා පභාසරෙති"

"යම් තැනෙක්හි අඥානයෝ බෙනෙත් ද, එතැන්හි
බන්ධනයට නුසුදුස්සෝ ද බැඳෙති. යම් තැනෙක්හි

නුවණැත්තෝ බෙනෙත් ද එතැන්හි බන්ධනයට සුදුස්සෝ ද මිදෙති."

එහි, "අබඥාති", නො බැඳිය යුත්තෝ, "පභාසරෙති", කියත්. තෙපලත්.

මෙසේ මහසත්හු මේ ගාථාවෙන් රජුට දම් දෙසා මා විසින් මේ දුක ගිහි ගෙහි වසන නිසා ලබන ලද්දකි. දූන් මට ගිහි ගෙයින් කාරියක් නැත. දේවයන් වහන්ස, මට පැවිද්ද අනුදූන වදාළ මැනවි. පැවිද්ද අනුමත කැරවා කඳුළු මුහුණ ඇති ඤාති ජනයා ද මහත් වූ සම්පත් ද හැර දමා තාපස පැවිද්දෙන් පැවිදි ව හිමාලය වනයෙහි වාසය කරන්නේ, පඤ්ච අභිඥා ද සමාපත්ති අට ද උපදවා බඹ ලොව උපන්නේය. බුදු රජහු මේ ධර්ම දේශනාව ගෙන හැර දක්වා ජාතකය නිමාකළහ. එදා දුෂ්ඨ දේවිය චිඤ්චි මානවිකාව වූවාය. රජ ආනන්ද තෙරුණුය. පෙරෙවි බමුණා වනාහි මම ම වෙමි.

දොළොස් වැනි හංසී වර්ගයයි.

## 1. 13. 1.

## කුසනාළි ජාතකය

"කරෙ සරික්ඛොති" යන මේ ජාතක දේශනාව බුදුහු දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, අනේපිඬු මහා සිටුහුගේ දිළිඳු මිතුරකු අරබයා දෙසූහ. සිටාණන්ගේ මතු යහළු නෑසියෝ එක්ව ඔහු වෙත එළැඹ සිටුතුමනි, මේ දිළිඳු මිතුරා ජාත, ගෝත්‍ර, ධනධාන්‍ය ආදියෙන් සමාන නො වේ. ඔබට වඩා උසස් ද නො වේ. මක්නිසා ඔබ ඔහු සමග මිතු දම් පවත්වන්නෙහි ද ? එසේ නො කැරව යි නැවත නැවත වැළකූහ. සිටුහු, මිතු දම් වනාහි තමාට වඩා අඩු, තමා හා සම, තමාට වඩා වැඩි හැමදෙනා සමග කළ යුතුයැ යි ඔවුන් වචනය නො පිළිගෙන තම අයබදු ගමකට යන විට ඒ දිළිඳු මිතුරා ධනය ආරක්‍ෂකයා ලෙස යොදවා ගියේය. මෙහි විස්තර සියල්ල කාලකණ්ණි කථා පුවතෙහි කී ලෙසින් දත යුතුයි. මෙහි අනේපිඬු සිටු විසින් තම ගෘහ ප්‍රවෘත්ති දන්වා සිටි කල්හි බුදු රජහු, ගැහැවිය, මිත්‍රයා නම් හීන නො වේ. මිතුරු දම රැකීමට හැකි බව ම ප්‍රමාණ වේ. මිත්‍රයා තමා හා සම වුව ද හීන වුව ද උසස් වුව ද පිළිගත යුතුය. ඒ සියලු මිතුරෝ ම තමා හට පැමිණි කාර්යය භාරය ඉටු කරත් මය. දූන් වනාහි ඔබගේ දිළිඳු මිතුරා නිසා ගෘහ අයිතිකරුවෙක් වූයේය. පැරණියෝ දිළිඳු මිතුරා නිසා විමනක හිමිකරුවෙක් වූයේ යි වදාරා ඔහු විසින් අයදිනා ලද බුදුහු අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජ රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු රජුගේ උයනෙහි කුසනාළි පඳුරක දෙවියෙක් වී උපන්හ. එම උයනෙහි ම මඟුල් ගල් තලාව ඇසුරු කොට ඍජු ව වැඩුණු කඳින් හා ශාඛා, අනුශාඛාවලින් වට වූ රජුගෙන් පවා පූජා ලැබූ බුරුත රැකක් වෙයි. තෙළඹු ගසයැ යි ද කියයි. එහි මහානුභාව ඇති දෙවියෙක් සිටියේය. බෝසත් දෙවි ඔහු සමග මිතුරු දම් පැවැත්වීය. එකල රජු එක්ටැම් මාලිගයක විසීය. ඒ ටැඹ සෙළවිණි. ටැඹ සෙළවුණු බව රජුට දැන්වූහ.

රජු වඩුවා ගෙන්වා දරුව, මගේ එක්ටැම් මඟුල් පහය සෙලවේ. හර ඇති ටැඹක් ගෙනවුත් එය නිසල කැරව. ඔහු ද

දේවයිනි, මැනවැ යි පිළිවදන් දී ඒ සඳහා සුදුසු රුකක් සොයන්නෝ, වෙනත් තැනක නො දැක උයනෙහි තෙළඹු ගස දැක රජු වෙත ගොස් දරුව, ඔබ විසින් සුදුසු එකක් දක්නා ලද්දේ ද ? දේවයිනි, උයනෙහි ඒ සඳහා සුදුසු ගසක් දක්නා ලදී. එහෙත් එය කැපීමට අපි අපොහොසත් වෙමු. මක්නිසා ද ඒ රජුගේ මංගල වෘක්ෂයයි. එවිට රජු යවු. ඒ ගස කපා පහය නිසල කැරවු. වෙනත් මංගල වෘක්ෂයක් කරමු. වඩුවෝ ගස මුල බලි පූජා කොට හෙට දිනයෙහි ගස සිඳිමු යි නික්ම ගියහ. රුක් දෙවි මෙකරුණ දැන මගේ විමන හෙට නසින්නේය. දරුවන් ගෙන මම කොහි යම්දැ යි යා යුතු තැනක් නො දැක කුඩා දරුවන් ගෙළෙහි එල්ලා ගෙන හැඬීය. දෙවියාගේ යහළු වූ රුක් දෙවියෝ වන දෙවියෝ අවුත් කාරණය කිම්දැ යි විචාරා කරුණ දැන ඔවුහු ද වඩුවන් වළක්වන උපායක් නො දැන හඬන්ට පටන් ගත්හ.

එකල බෝසත්හු රුක් දෙවියා බලන්නෙමු යි එහි අවුත් කාරණය අසා එසේ වේවා. මම වඩුවන්ට ගස සිඳීමට ඉඩ නො දෙමි. හෙට වඩුවන් ආ කල මා කරන ක්‍රියාව බලවු යි, ඒ දෙවියා අස්වසා දෙවැනි දවසෙහි ගස කැපීමට වඩුවන් ආ කල කටුසු වේශයක් ගෙන ඔවුන් ඉදිරියෙන් ම ගොස් මංගල වෘක්ෂයේ මුල් අතරට ගොස් ඒ ගස කඳ තුළ සිදුරක් මෙන් පෙන්වා කඳ මැදින් ගොස් ගස් කඳ මුදුනින් නික්ම හිස සොලවමින් සිටියේය. මහවඩුවා ඒ කටුස්සා දැක අතින් ගසට ගසා මේ සිදුරු සහිත ගසකි. හරයක් නැත. ඊට අපි තතු නො දැන බලිපූජා කළෙමු යි හරවත් මහගසට නින්දා කොට ගියහ. මෙසේ රුක් දෙවියා බෝසතුන් නිසා විමානයට හිමිකරු විය. ඔහු ඇසුරු කළ යහළුවෝ රුක් දෙවියාගේ තොරතුරු විමසීම සඳහා රැස්වුහ. රුක් දෙවියා තමාගේ විමානය ලැබීම නිසා සතුටු ව ඒ දේව සබාවෙහි බෝසතුන්ගේ ගුණ ගයමින් පින්වත්නි, අපි තෙදැති දෙවියන් වී උපන් නමුත් නුවණ නැති බැවින් මේ උපාය නො දැන සිටියෙමු. දිය බෙරලිය රුක් දෙවියා තමාගේ නුවණ වැඩි බැවින් අප විමාන හිමියන් කළේය. තමාට වඩා අඩු වූ ද තමා සමාන වූ ද තමාට වඩා උසස් වූ ද මිතුරා ඇසුරු කළ යුතු මය. ඔවුහු සිය ශක්තියෙන් යහළුවන්ට ඇති වූ දුක් නිවා සැප ලබාදෙන්නාහු මයැ යි මිතුරු දහම වර්ණනා කොට මේ ගාථා කීහ.

"කරෙ සරික්ඛො අථවාපි සෙට්ඨං
නිහීනකො චාපි කරෙය්‍ය එකො,
කරෙය්‍යුං තෙ ව්‍යසනෙ උත්තමත්ථං
යථා අයං කුසනාළී රුචායන්ති"

"ජාති ආදියෙන් සමාන වූයේ ද උසස් වූයේ ද හීන වූයේ ද ඔහු සමග මිතුරු දම් කරන්නේය. එකල ඔහු විපතේ දී යහපතක් ම කරන්නේය. බුරුත ගසෙහි උපන් මා ද දිය බෙරළිය ගස උපන් කුසනාළී ද මෙනි."

එහි, "කරෙසරික්ඛො", ජාති ආදියෙන් සම වූවහු මිතුදම් කරන්නේය. "අථවාපි සෙට්ඨං", ජාති ආදිය උසස් වූවහු, අධික වූවහු මිතුදම් කරන්නේය. ඒ සියල්ලෝ ම මිත්‍රයෝ කළ යුත්තෝය යි දක්වයි. මක්නිසා ද, "කරෙය්‍යුං තෙ ව්‍යසනෙ", මේ සියල්ලෝ ම මිතුරාට විපතක් පැමිණි කල්හි තම තමන්ට පැමිණි බර උසුලමින් යහපතක් කරන්නාහුය. සිරුර පිළිබඳ වූ, මනස පිළිබඳ වූ දුක්වලින් මිතුරා මුදවන්නාහුය යන අර්ථය එම නිසා හීනයා ද මිතුරු කළ යුත්තේය. අනෙක් දෙදෙනා පිළිබඳ කියනු ම කිම ? ඒ ගැන මේ උපමාවයි. "යථා අයං කුසනාළී රුචායන්ති", මම බුරත ගසෙහි උපන් දෙවියා වෙමි. මොහු දිය බෙරලිය ගසෙහි උපන් තෙද අඩු දෙවියෙකි. අපි මිතුරු දම් රැකීමු. එහි දී ම තෙදැති වුව ද මට උපන් දුක නුවණ අඩු බැවින්, උපායෙහි දක්‍ෂ නො වූ බැවින් ඉවත් කිරීමට නොහැකි වීමි. මොහු වනාහි අඩු තෙද ඇති වුව ද නුවණැති දෙවියා නිසා දුකින් මිදුණේ වෙමි. එහෙයින් අන්‍යය වූ දුකින් මිදෙනු කැමැත්තන් විසින් සම උසස් බව නො සලකා නුවණැති හීනයා ද මිතුර කළ යුත්තේය. බුරුත රුක් දෙවියා මේ ගාථාවෙන් දේව සමූහයාට දම් දෙසා ආයු ඇතිතාක් සිට දිය බෙරලිය රුක් දෙවියා සමග කම් වූ පරිදි ගියේය.

බුදුහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා ජාතකය නිම කළහ. බුරුත රුක් දෙවියා ආනන්ද තෙරණුවෝ වූහ. කුසනාළී හෙවත් දිය බෙරලිය රුක් දෙවියා මම ම වීමි.

## 1. 13. 2.

## දුම්මේධ ජාතකය

යසං ලද්ධාන දුම්මෙධො’ති යන මේ දේශනාව බුදු රජහු වේළුවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, දෙව්දත් තෙරුන් අරබයා වදාළහ. දම් සබාවෙහි භික්ෂූහු ඇවැත්නි, දෙව්දත් තෙර තථාගතයන් වහන්සේගේ පුන්සඳ මඬල මෙන් ශෝභාවෙන් යුත් මුහුණ ඇති අසූවක් අනු ලක්ෂණ හා දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් සැරසුණා වූ බඹයක් පමණ ප්‍රභාවෙන් වට කරන ලද ඇඹරි ඇඹරී යුගල වශයෙන් හටගත් ඝන බුදුරැස් විහිදුවන්නා වූ අතිසය ශෝභාවෙන් අග තැන්පත් ශරීරය දෙස බලා සිත පහදවා ගන්නට නො හැකි වෙයි. ඊෂ්‍යාව ම කරයි. බුදුවරයෝ නම් මෙබඳු වූ ශීලයෙන් ද සමාධියෙන් ද ප්‍රඥාවෙන් ද විමුක්තියෙන් ද විමුක්ති ඥාණ දර්ශනයෙන් ද යුක්තයැ යි කියනු ලබන්නේ, කීර්තිය ඉවසීමට නො හැකි වෙයි. ඊර්ෂ්‍යාව ම කරයි යනුවෙන් දෙව්දත් තෙරුන්ගේ අගුණ කථාව ම කීහ.

බුදු රජහු වැඩමවා මහණෙනි, මෙහි කවර කථාවකින් යුක්තව හුන්නාහුද යි විචාරා මෙනම් කථාවෙන්යැ යි කී කල්හි මහණෙනි, දෙව්දත් තෙර දැන් පමණක් නොව, මගේ කීර්තිය ද කියනු ලබද්දී ඊර්ෂ්‍යා කළේ පෙරත් එසේ කළේයැ යි වදාරා අතීත කථාව ගෙනහැර දක්වූහ.

පෙර මගධ රටේ රජගහ නුවර එක් මගධ රජකු රාජ්‍යය කැරද්දී බෝසත්හු ඇත් යෝනියෙහි ඉපදී සියලු අයරින් සුදු වූයේ විය. යට වර්ණනා කළ පරිදි රූප සම්පත්තියෙන් යුක්ත විය. ඉක්බිති, ඒ ඇතා ලක්ෂණ සම්පත්තියෙන් මේ තෙමේ යුක්තයැ යි ඒ රජ මංගල ඇතා බවට පත් කළේය. ඉක්බිති, එක් උත්සව දිනයක මුළු නගරය ම දිව්‍යය නගරයක් මෙන් සරසා සියලු අලංකාරයෙන් සරසන ලද මංගල හස්තියා පිට නැඟී මහත් වූ රාජානුභාවයෙන් නගරය පැදකුණු කළේය. මහජනයා ඒ ඒ තැන සිට මගුල් ඇතාගේ රූපයෙන් අග තැන්පත් සිරුර දැක අනේ රූපය, අනේ ගමන, අනේ

ලීලාව ලකුණු සම්පත්තිය මෙබඳුය. සියලු අයුරින් සුදු වූ උතුම් ඇතා සක්විති රජ කෙනකුට සුදුසුයැ යි මඟුල් ඇතා ම වර්ණනා කරයි.

රජතුමා මඟුල් ඇතාගේ වර්ණනාව ආසා ඉවසීමට නො හැකි වන්නේ ඊර්ෂ්‍යාව උපදවා අධම වූ පර්වත ප්‍රපාතයේ හෙළා මරණයට පත් කරවන්නෙමි යි ඇත් ගොව්වා කැඳවා කුමක් කොට නුඹ විසින් මේ ඇතා හික්මවන ලද්දේද යි කීවේය. දේවයන් වහන්ස, මනාව හික්මවන ලදී. නරකට හික්මවන ලද්දේ නො වේ. නරකට හික්මවන ලද්දේ ද ? දේවයන් වහන්ස, මනාව හික්මවන ලද්දේය. ඉදින්, මනාව හික්මවන ලද්දේ නම් ඒ ඇතා වේපුල්ල පර්වතය මුදුනට නැංගවීමට හැකි වන්නෙහි ද ? දේවයන් වහන්ස, එසේය. එසේ නම් එව යි තමා බැස ඇත් ගොව්වා ඇතුපිට නංවා පර්වත පාදයට ගොස් ඇත් ආචාරිවරයා ඇතුපිට සිටිය දී ම ඇතු වේපුල්ල පර්වතය මුදුනට නැඟි කල්හි තෙමේත් ඇමැති ගණයා විසින් පිරිවරණ ලද්දේ, පර්වතය මුදුනට නැඟ ඇතා ප්‍රපාතයට අභිමුඛ කොට නුඹ මා විසින් මේ ඇතා මනාව හික්මවන ලද යි කිවේය. එසේ නම් තුන් පාදයෙන් තබව යි කීවේය. ඇත් ගොව්වා පිටෙහි හිඳගෙන ම, එම්බා හස්තිය, තුන් පාදයෙන් සිටව යි ඇතාට විලුබෙන් සංඥා දුන්නේය. හෙතෙම තුන් පාදයෙන් සිටියේය. නැවත රජතුමා ඉදිරිපස දෙපයින් තබව යි කීවේය. මහා සත්ත්වයා පසු පස දෙපස උස්සා පෙර දෙපසින් සිටියේය. පසු පස දෙපයින් සිටුව යි සිටියේය. තනි පයින් තබව යි කී කල්හි පා තුනක් ඔසවා තනි පයින් සිටියේය. ඉක්බිති, ඇතා නො වැටෙන බව දැන ඉදින්, පුළුවන් නම් අහසෙහි උඟ තබව යි කීවේය.

ඇත් ගොව්වා මෙසේ සිතුවේය. මුළු දඹදිවට මේ ඇතා හා සමාන මනාව හික්මවන ලද ඇතකු නම් නැත. නිසැකයෙන් ම මොහු මේ ඇතා ප්‍රපාතයට හෙළා මරනු කැමැත්තේ වන්නේ ය, ඇත් ගොව්වා ඇතාගේ කණමුලට කථාකොට, දරුව, මේ රජ නුඹ ප්‍රපාතයෙහි හෙළා මරනු කැමැත්තේය. නුඹ මේ රජුට සුදුසු නො වෙයි. ඉදින්, නුඹට අහසින් යන්නට බලය ඇත. මා රැගෙන අහසට පැන නැඟී බරණැසට යව යි කීවේය. පුණ්‍යය ඍද්ධියෙන් යුක්ත වූ මහා බෝධි සත්ත්වයෝ ඒ මොහොතෙහි ම අහසෙහි සිටියේය. ඇත් ගොව්වා මහරජතුමනි, මේ ඇතා පුණ්‍යය ඍද්ධියෙන් යුතුය.

නුඹ වැනි මද පින් ඇති දුර්වල බුද්ධියක් ඇත්තකුට නුසුදුසුය. මද පින් ඇත්තා මෙබඳු වාහනයක් ලබා (එහි) ඒ ඇතාගේ ගුණ නො දන්නාහු, ඒ වාහනය ද සෙසු කීර්ති සම්පත්තිය ද නසා ගන්නාහුයැ යි කියා ඇතු පිට හිඳගෙන ම මේ ගාථාව කීවේය.

**"යසං ලද්ධාන දුම්මෙධො අනත්ථං චරති අත්තනො,**
**අත්තනො ච පරෙසං ච හිංසාය පටිපජ්ජතීති"**

"නුවණ නැත්තේ, යම් (පිරිවර සම්පත්) ලැබ තමනට
අනර්ථය පිණිස හැසිරෙයි ද තමා හට ද මෙරමා හට
ද හිංසා පිණිස පිළිපදී."

මේ එහි කෙටි අර්ථයයි. මහරජ, නුඹ වැනි, "**දුම්මෙධො**", ප්‍රඥාව නැති පුද්ගලයා පිරිවර සම්පත් ලැබ, "**අත්තනො අනත්ථං චරති**", කුමක් නිසා ද, හෙතෙම කීර්තියෙන් මත් වූයේ කළ යුත්ත නො දන්නා බැවිනි. "**අත්තනො ච පරෙසං ච හිංසාය පටිපජ්ජතීති**", අනුන්ට පීඩා කිරීම හිංසාවයැ යි කියයි. දුක් උපදවන්නක් ඒ සඳහා ම පිළිපදියි.

මෙසේ මේ ගාථාවෙන් රජුට දම් දෙසා නුඹ සිටිනු යි අහසට නැඟී බරණැස් නුවරට ගොස් රජ මිදුලේ අහසෙහි සිටියේය. මුළු නුවර කැළැඹී අපගේ රජතුමාට අහසින් සුදු උතුම් ඇතකු අවුත් රජ මිදුලෙහි (අහසෙහි) සිටියේයැ යි එක ම කැළැඹීමක් විය. වහා රජුට ද සැලකළාහුය.

රජතුමා නික්මී ඉදින්, මට පරිහරණය පිණිස ආවේ නම් බිමට බසින්නැ යි කීවේය. බෝසත්හු බිමට බැස්සාහ. ඇත් ගොව්වා බැස රජුට වැඳ දරුව, කොහි සිට ආවේදැ යි කී කල්හි රජගහ නුවරින්යැ යි කියා සියලු පුවත සැල කළේය. රජතුමා දරුව, නුඹ මෙහි පැමිණීමෙන් හොඳ දෙයක් කරන ලදී යි තුටු පහටු ව නගරය සකස් කැරවා ඇතා මඟුල් ඇතු රඳවන තැන රඳවා මුළු රාජ්‍යය කොටස් තුනකට බෙදා එක් කොටසක් බෝසතුන්ට දුන්නේය. එක් කොටසක් ඇත් ගොව්වාට ද එක් කොටසක් තමන් ද තබා ගත්තේය. බෝධි

සත්ත්වයන් පැමිණි කාලයේ සිට ම වනාහි රජුගේ මුළු දඹදිව රාජ්‍යය ම අතට පත් වූවක් මෙන් විය. හෙතෙම දඹදිව අග රජු වී දානාදී පිං කොට කම් වූ පරිදි මිය ගියේය. බුදු රජහු මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා ජාතකය නිමාවට පත් කළහ.

එකල මගධ රජ දෙව්දත් විය. බරණැස් රජ සැරියුත් මහා තෙරුන් වහන්සේය. ඇත් ගොව්වා ආනන්ද තෙරුන්ය. ඇතා වනාහි මම ම වීමි.

## 1. 13. 3.

## නඞ්ගලීස ජාතකය

"සබ්බත්‍ථ ගාමිං වාචං" යන මේ ජාතක දේශනාව බුදු රජහු දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, ලාළුදායි තෙරුන් අරබයා දේශනා කළහ. ඒ තෙරණුවෝ වනාහි දම් දෙසන්නාහු, මෙතැන මෙය කිය යුතුය. මෙතැන මෙය කිය යුතුය යි සුදුසු නුසුදුසු බව නො දනියි. මංගල අවස්ථාවන්හි තිරොකුඩ්ඩ සූත්‍රයෙහි, භිත්තීන් පිටත සිටියි. සතර මංසන්ධි, තුන් මංසන්ධිවල සිටින්නේ, අවමංගලයට සුදුසු බණ කියත්. අවමංගල අවස්ථාවල දී අනුමෙවෙන් බණ දෙසන්නාහු, මංගල සූත්‍රයෙහි බොහෝ දෙවි මිනිස්සු මංගල කරුණු සිතුහැ යි කියා මෙබඳු මංගල කරුණු සියයක් දහසක් කිරීමට සමර්ථ වවු යි කියයි. ඉක්බිති, එක් දවසක් දම් සබාවෙහි භික්ෂූහු ඇවැත්නි, ලාළුදායි තෙරණුවෝ යුතු අයුතු විධි නො දනියි. සැම තැන නො කිය යුතු වදන් සැම තැන දී කියයියැ යි කථාවක් ඉපදවූහ. බුදුහු දම් සබාවට වැඩමවා මහණෙනි, දැන් කවර කථාවකින් හුන්නාහුද යි විචාරා මෙනම් කථාවකින් හුන්නෙහි යි කී කල්හි මහණෙනි, ලාළුදායි කථාවෙහි යුතු අයුතු නො දන්නාහු, දැන් පමණක් නො වේ. පෙර ද එවැනි අයෙක් වූහ. මොහු හැමදා ම දොඩමළු වූවෙක් ම වූයේයැ යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රජ කරන කල්හි බෝසත්හු බමුණු මහසල් කුලයෙහි ඉපදී වැඩිවියට පැමිණියාහු, තක්ශලාවෙන් සියලු ශිල්ප උගෙන බරණැස් නුවර දිසාපාමොක් ඇදුරු ව පන්සියයක් මානවකයන්ට ශිල්ප උගන්වති. මෙවුනතුරින් එක් මද උත්සහ ඇති නුවණ මද මානවකයෙක් ධර්මාන්තේවාසික ව පිනට උගන්නා ශිෂ්‍යයකු වශයෙන් ශිල්ප උගනී. නුවණ මද බැවින් ඉගනීමෙහි දක්ෂ නො වේ. බෝසතුන්ට උපකාරීය. දාසයකු මෙන් සියලු කෘත්‍යය කරයි. දිනක් බෝසත්හු රාත්‍රී භෝජනය වළඳා සයනගත ව සිටියාහු, අත්පා පිට සම්භහනය කොට යන්නා වූ අතවැසි අමතා දරුව, ඇඳ පාදයන්හි ආධාරක තබා යන්නැ යි කීහ. මානවකයා එක පාදයකට ආධාරකයක් නො ලැබ ඒ වෙනුවට තම කලවය ආධාරකය වෙනුවට තබා මුළු රාත්‍රිය ගෙවීය. බෝසත්හු අළුයම් කාලයෙහි නැඟිට ඔහු දැක දරුව, මෙහි හිඳින්නේ ඇයිදැ යි ඇසුවේය. ගුරුතුමනි, ඇඳපාදයට ආධාරයක් නො ලබන්නේ, කලවයෙහි තබා හුන්නෙමි. බෝසත්හු සංවේගයට පත්ව, මේ මානවකයා මට මහත් උපකාරීය. මෙපමණ අතවැසියන් අතරෙහි මොහු ම ඉගනීමෙහි අදක්ෂය. එම නිසා ශිල්ප ඉගනීමට නො හැකිය, මම කෙසේ නම් මොහු උගතකු කරම්දැ යි සිතීය. ඔහුට මෙසේ සිතිණි. ඒ සඳහා උපායක් ඇත. මේ මානවකයා දර හා කොළ ගෙන ඒමට වනයට ගොස් ආපසු ආ කල්හි, මෙසේ විචාරමි. අද ඔබ කිනම් දෙයක් දුටුවෙහි ද ? කිනම් දෙසක් කළෙහි ද ? යි එවිට ඔහු අද මම මේ මේ දේ දුටිමි. මේ මේ දේ කළෙමි යි කියන්නේය. එවිට මම ඔබ දුටු කළ දේ කෙබඳුදැ යි අසන්නෙමි. එවිට ඔබ දුටු කළ දේ මෙබඳුයැ යි උපමා හා හේතු දක්වමින් කියන්නේය. මේ අනුව පඬිවරයකු කරන්නෙමි. ඉක්බිති, ගුරුතුමා ඔහු කැඳවා දරුව, මෙතැන් පටන් ඔබ දර පිණිස හෝ කොළ පිණිස ගිය තන්හි යමක් ඔබ අසන ලද ද දකින ලද ද බුදින ලද ද බොන ලද ද කන ලද ද ඒ සියල්ල මට දන්වන්නැ යි කීය. අතවැසි ද මැනවැ යි පිළිගෙන, දිනක් දර කොළ සඳහා අනෙක් මානවයන් සමග වනයට ගියේ, සර්පයකු දැක ආපසු අවුත් ගුරුතුමන් හමුවී ගුරුතුමනි, මම සර්පයකු දුටිමි යි දැන්වීය. දරුව, සර්පයා කෙබඳු ද ? ගුරුතුමනි, සර්පයා නගුලිසක් වැනිය. දරුව, ඉතා මැනවි. ඔබ ගෙනහැර දැක්වූයේ මනහර උපමාවකි. සර්පයෝ නගුළිස සමාන වෙත් මැයි. ඉක්බිති, බෝසත්හු සිතන්නාහු, මානවකයා දැක්වූයේ ගැළපෙන උපමාවකි. මොහු පණ්ඩිතයකු කිරීමට හැකියැ යි මානවකයා නැවත එක් දවසක්

වනයෙහි දී ඇතකු දක ගුරුතුමනි, මම ඇතකු දුටුවෙමි යි කීය. දරුව, ඇතා කෙබඳු වේ ද ? නගුලිසක් වැනිය. දළ ආදිය ද මෙබඳු මෙබඳු වෙයි. මොහු මෝඩ බැවින් වෙන් වෙන් කොට කියන්ට නො හැකිව සොඬ සඳහා මෙසේ කීවා විය හැකියැ යි සිතා නිශ්ශබ්ද විය. නැවත එක දවසක් ආරාධනා ලැබ ගිය තැනක දී උක් ලැබ ගුරුතුමනි, අපි අද උක් කෑවෙමු. උක් කුමක් වැනිද්‍ද යි ඇසූ කල්හි නගුලිසක් වැනියැ යි කීය. ගුරුතුමා තරමක් ගැළපෙන සේ කීවේයැ යි නිශ්ශබ්ද විය. නැවත එක් දවසක් නිමන්ත්‍රණ භෝජනයක දී උක් හකුරු සමග වැළඳූහ. සමහරු කිරි සමග වැළඳූහ. ඔහු ගුරුන් වෙත අවුත් ගුරුතුමනි, මම අද දී සහ කිරි වැළඳුවෙමි යි කීය. දී සහ කිරි කෙබඳුද්‍ද යි ඇසූ කල්හි නගුලිසක් හා සමානයැ යි කීය. එවිට ගුරුතුමා මෙසේ සිතීය. මේ මානවකයා පළමු ව සර්පයා නගුලිස වැනියැ යි කීම සුදුසුය. දෙවැනි ව ඇතා නගුලිස වැනි යි කීම සොඬය සඳහා ගැළපේ. තෙවැනි ව උක් ගස නගුලිසට සමාන කිරීම ලේෂ මාත්‍රයකින් සමානය. එහෙත් දී හා කිරි සුදුය. දමූ භාජනය හා සමාන ව පවතී. සියලු ආකාරයෙන් උපමාව නො ගැළපේ. මේ මෝඩ අතවැසියාට ඉගැන්වීමට නො කළ හැකියැ යි කියා මේ ගාථාව කීය.

"අසබ්බත්ථ ගාමිං වාචං
බාලො සබ්බත්ථ භාසති
නායං දධිං වෙදි න නඞ්ගලීසං
දධිප්පයං මඤ්ඤති නඞ්ගලීසන්ති"

"බාලයා හැම තැනට ම නුසුදුසු වචන හැම තැන දී ම බෙනෙයි. මේ තෙම දී කිරි ද නගුලිය ද නො දන්නේය. යම් හෙයකින් දී කිරි නගුලියයැ යි සිතා ද එහෙයිනි."

එහි, මේ සංක්‍ෂෙප අර්ථයයි. යම් වචනයක් උපමා වශයෙන් හැමතැනම නොගැළපේද ඒ, "අසබ්බත්ථ ගාමිං වාචං බාලො", බාලයා, "සබ්බත්ථ භාසති", හැම තැන දී ම කියයි. දී කෙබඳුද්‍ද යි විචාළ කල්හි නගුලිය වැනියැ යි කියයි. එසේ කියන විට, "නායං දධිං වෙදි න

**නඞගලීසං**", මේ තෙම දී හෝ නගුලිය නො දනී. මක්නිසා ද ? " **දධිමපයං මඤ්ඤති නඞගලීසන්ති**", මේ තෙම දී ද නගුලිය මෙන් යැයි සිතන හෙයිනි. වෙනත් ක්‍රමයකින් "දධි" නම් දීය. "පය" නම් කිරිය. ඒ "**ඨිප්පයි**", නමි. යම් හෙයකින් දී හා කිරි නගුලිය වශයෙන් මොහු දකී ද, එබඳු මෝඩයකි. මොහුගෙන් ඇති ඵලය කිම යි අතවැසියන්ට ගාථාව කියා බාල අතවැසියාට මඟ වියදම් දී ඔහු පිටත් කළේය.

බුදු රජහු මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා ජාතකය නිම කළහ. එදින බාල මානවකයා ලාළුදායි විය. දිසාපාමොක් ඇදුරු වනාහි මම ම වීමි.

## 1. 13. 4.

## අම්බර ජාතකය

"**වායමෙථෙව පුරිසොති**" යන මේ දේශනාව බුදු රජහු දෙව්රම වැඩ වාසය කරන කල්හි එක්තරා සිරිත් විරිත් ගරු කරන බමුණකු අරබයා වදාළහ. හෙතෙම වනාහි සැවැත් නුවර වැසි කුල පුත්‍රයෙක් සසුනට ළය දී (හිතැති ව) පැවිදි වූයේ වත පිළිවෙළින් සම්පූර්ණ වූයේ විය. ආචාර්ය උපාධ්‍යාය වත් ද බොන පැන්, පරිභෝග කරන පැන්, පොහොය ගෙයි ගිනිහල් ගෙයි වත් ද මනාව ඉටු කරයි. දහ හතරක් මහා වත් ද අසූවක් ඛන්ධක වත් ද සම්පූර්ණ කරන්නේ විය. විහාරය අමදියි. පන්සල, භික්ෂූහු සිඟන්නට යා යුතු තැන් තීරණය කරන, මළුව හා විහාර මාර්ගය ද අමදියි. මිනිසුන්ට පැන් දෙයි. මිනිස්සු උන් වහන්සේගේ වත් පිළිවෙත් කෙරෙහි පැහැදී පන්සියයක් පමණ වූ ධුර (වාර) බත් දුන්හ. මහත් ලාභා සත්කාර උපන්නේය. ඒ නිසා බොහෝ දෙනකුට පහසුකම් හට ගත්තේය. ඉක්බිති, එක් දිනක් දම් සබාවෙහි භික්ෂූහු කථාවක් ඉපදවූහ. මහණෙනි, අසවල් නම් භික්ෂුව තමන්ගේ වත් පිළිවෙත් නිසා මහත් ලාභ සත්කාර ඉපදවීය. මේ එක ම පුද්ගලයා නිසා බොහෝ අයට පහසුකම්

ඇතිවිය.

බුදු රජහු වැඩමවා මහණෙනි, මෙහි කවර කථාවකින් යුක්ත ව හුන්නාහුදැ යි විචාරා මෙනම් කථාවකින්යැ යි කී කල්හි මහණෙනි, දැන් පමණක් නොව, පෙරත් මේ භික්‍ෂුව වත් පිළිවෙත් සපුරන්නෙකි. පෙරත් මෙසේය. එක ම පුද්ගලයා නිසා පන්සියයක් තාපසවරු පළාඵල සඳහා අවුත් මොහු විසින් ම ගෙනෙන ලද ඵලවැලින් ම යැපුණාහුයැ යි වදාරා අතීත කථාව ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කරද්දී බෝසත්හු නැගෙනහිර උසස් බමුණු කුලයෙහි ඉපදී වැඩිවියට පැමිණියෝ, තවුස් පැවිද්දෙන් පැවිදි ව පස්සියයක් තාපසවරුන් විසින් පිරිවරන ලද්දෝ, පර්වත බෑවුමක විසූහ. එකල හිමාලය වනයෙහි දරුණු නියඟයක් ඇතිවිය. ඒ ඒ තැන දිය සිඳී ගියේය. තිරිසන්ගත සත්තු පැන් නො ලබා ක්ලාන්ත වෙත්. ඉක්බිති, ඒ තාපසයන් අතුරෙන් එක් තාපසයෙක් ඔවුන්ගේ පිපාස දුක දැක එක් ගසක් කපා ඔරුවක් කොට පැන් ඉස ඔරුව පුරවා ඔවුන්ට පැන් දුන්නේය. බොහෝ දෙනා එක් රැස්වී පැන් බොන කල්හි තාපසයාට පළාඵල පිණිස යන්නට ඉඩක් නො වීය. ඔහු නිරාහාරව ම පැන් දෙන්නේ මය. මෘග සමූහයා මෙසේ සිතූහ. මේ තෙමේ අපට පැන් දෙන්නේ, පළාඵල පිණිස යන්නට අවකාශයක් නො ලබයි. ආහාර නොමැතිකමින් අතිසයින් ක්ලාන්ත වෙයි. අපි ගිවිසුමක් කරමු නම් යහපති. ඔවුහු කතිකාවක් කළහ. මෙතැන් පටන් පැන් බීමට එන්නවුන් විසින් තමන්ගේ හැකියාවට ගැළපෙන පරිදි පළාඵල රැගෙන ආයුත්තාහ. එතැන් පටන් එක් එක් තිරිසන්ගත සත්ත්වයන් තමාගේ බලයට ගැළපෙන පරිදි මිහිරි අඹ, ජම්බු, කොස් ආදිය රැගෙන ම එයි. එකකු සඳහා ගෙනඑ න ලද පලතුරු ප්‍රමාණය ගැල් එක හමාරක් පුරවන්නට තරම් සෑහෙයි. තාපසවරු පන්සියය ම ඒවා අනුභව කරත්. වැඩි කොටස් ඉවතලූහ. බෝසත්හු එය දැක එක් පුරන්නකු නිසා මෙපමණක් තවුසන්ට පළාඵල සඳහා නො ගොස් යැපීම් උපන්නේය. වීර්යය නම් කළ යුතු මයැ යි කියා මේ ගාථාව කීහ.

"වායමෙථෙව පුරිසො න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො,
වායමස්ස ඵලං පස්ස භුත්තා අම්බා අනීතිහන්ති"

"නුවණ ඇති පුරුෂ තෙමේ වෑයම් කෙරේ මය. නො කළ කිරෙන්නේය. වෑයම් කිරීමේ ප්‍රයෝජනය බලව. (රස) මෙසේ ද වීයැ යි, මෙසේ ද වීයැ යි ඇසීම් මාත්‍රයෙන් නොවැ (ප්‍රත්‍යක්ෂනේම) අඹ අනුභව කරන ලද්දහුය."

මේ එහි කෙටි අර්ථයයි. "**පණ්ඩිතො**", තමන්ගේ වත් පිරිම් ආදී ක්‍රියාවන්හි, "වායමෙථෙව", උත්සාහ කරන්නේමය. නො කළකිරෙන්නේ මක්නිසා ද ? උත්සාහයේ නිෂ්ඵල බවක් නැති හෙයිනි. මෙසේ මහා සත්හු උත්සාහය නම් සඵල වීමයැ යි තවුස් සමූහයා අමතමින්, "**වායමසස ඵලං පසසාති**", උත්සාහයේ ඵලය බලවයි කීහ. කෙබඳු ද ? "**භුත්තා අම්බා අනීතිහත්ති**", ප්‍රත්‍යක්ෂයෙන් අඹ අනුභව කරන ලද්දහුය. මෙහි අඹ යනු දේශනා ක්‍රමයයි. ඒ වඳුරන් විසින් විවිධ වූ කුඩා මහත් ඵල ගෙනෙන ලද්දේ වෙයි එහෙත් රසයෙන් වඩාත් රස වූ හෙයින් අඹ ම මෙහි දී කියන ලදී. මේ පන්සියයක් තාපසයන් විසින් තම තමන් වනයට නො ගොස් එකකු සඳහා ගෙනෙන ලද අඹ යම් කෙනෙක් අනුභව කළෝ ද මේ උත්සාහයේ ඵලයයි. එය වනාහි මෙසේ වීලු. මෙසේ වීලු ආදී වශයෙන් නො ගෙන ප්‍රත්‍යක්ෂයෙන් ම එහි ඵලය බලව යි, බෝසත්හු තවුස් සමූහයට අවවාද දුන්හ.

බුදුහු මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා ජාතක කථාව නිමවා වදාළහ. එකල වත් පිරූ තාපසයා මේ භික්ෂුව විය. තාපස නායකයා වනාහි මම ම වීමි.

## 1. 13. 5.

## කටාහක ජාතකය

"**බහුම්පි සො විකත්ථෙය්‍යාති**" යන මේ ජාතකය බඳ රජහ

දෙව්රම් වෙහෙර වසන සේක්, එක තමා ගුණ වණන භික්ෂුවකු අරබයා දෙසූහ. මෙහි කථා පුවත යට කියන ලද පරිදි ම වේ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු මහත් සම්පත් ඇති සිටු කෙනෙක් වූහ. ඔහුගේ බිරිය පුතකු වැදුවාය. ඔහුගේ දාසිය ද එදින ම පුතකු වැදුවාය. සිටු පුත් අකුර කරන විට ම දාස පුතු ද පුවරුවක් ඔසවාගෙන ගොස් ඔහු සමග ම අකුරු ඉගෙන ගනී. ගණිතය ද උගත්තේය. දෙක, තුන ආදී වශයෙන් ගනුදෙනු කළේය. ඔහු ක්‍රමයෙන් වචන ව්‍යවහාරයෙහි දක්‍ෂ ව වෙළඳාමෙහි ද දක්‍ෂ විය. එසේ ම තරුණ වූ කල මනා රූ ඇත්තකු ද විය. නමින් කටාහක විය. ඔහු සිටු ගෘහයෙහි භාණ්ඩාගාරික තනතුර ද කැරෙමින් මෙසේ සිතී. මොවුහු හැමදා මෙගෙදර භාණ්ඩාගාරික කාර්යය නො කැරවන්නේය. කිසියම් දොසක් පෙන්වා තලාපෙළා බැඳ ඇඟ ලකුණු ඔබ්බවා දාසයකු ලෙස ම තබා ගන්නේය. පසල් දනව්වක මේ සිටුගේ යහළු සිටුවරයෙක් සිටී. මම සිටුතුමාගේ වචනය ලෙස හැගෙන පරිදි හසුනක් ගෙන එහි ගොස් මම සිටුතුමාගේ පුත්‍රයා වෙමි යි කියා ඒ සිටු රවටා ඔහුගේ දියණිය පාවා ගෙන සුව සේ වසන්නේ නම් මැනවි යි සිතී. ඔහු තමා ම හසුනක් සකසා මෙම අසවල් නම් ඇති මගේ පුතු ඔබ වෙත එවමි. ආවාහ විවාහ සම්බන්ධය මා ඔබ සමග ද ඔබ මා සමග ද සුදුසුය. එම නිසා මේ පුතුට තමාගේ දියණිය පාවා දී මොහු ඔබ ම වස්වා ගනු මැනවි. මම ද අවකාශයක් ලැබුණු විට එන්නෙමි යි ලියා සිටුගේ මුද්දෙන් හස් තබා කැමැති පරිදි මඟ වියදම් හා සුවඳ වස්ත්‍රාදිය ද ගෙන පසල් රට ගොස් සිටුතුමා දැක වැඳ සිටියේය.

ඉක්බිති, සිටු, දරුව, කොහි සිට ආවෙහිදැ යි ඇසීය. බරණැස සිට ආවෙමි. කාගේ පුත්‍රයෙක් වෙහි ද ? බරණැස් සිටුහුගේ පුත වෙමි. කුමක් නිසා ආවෙහි ද ? එකෙණෙහි කටාහක මේ බලා දනු මැනවැ යි හසුන දුන්නේය. සිටු හසුන කියවා, දැන් මම පණ ලද්දේ වෙමි යි සතුටු ව දියණිය පාවා දී නැවතීමට සැලැස්වීය. ඔහුගේ පිරිවර ද මහත් විය. කැඳ, කැවිලි ආදිය හෝ වස්ත්‍ර, සුවඳ විලවුන් ආදිය එළවූ කල්හි, කැඳ පිසන්නේ මෙසේ ද ? කැවිලි බත් පිසන්නේ මෙසේ ද ? අහෝ පිටිසර වැසියන්ගේ හැටි යි නින්දා කරයි. පිටිසර වැසියන් නිසා සළුපිළි හකුළා හඳින්ට නො දනිති. සුවඳ විළවුන් ඉලීමට හෝ මල්මාලා ගෙතීමට නො දනිති යි පෙහෙකම්

කරන්නවුන්ට ගරහයි. ඉක්බිති, බෝසත්හු ද දාසයා නො දක කටාහක පෙනෙන්ට නැත. කොහි ගියේ ද ? ඔහු සොයව්. හාත්පස මිනිසුන් යෙදවූහ. ඔවුන්ගෙන් එකෙක් එහි ගොස් කටාහක දක හැඳින තමා නො දන්වා අවුත් බෝසතුන්ට සැලකළේය. බෝසත්හු ද එපවත් අසා දාසයා කළේ අයුත්තකි. ඔහු ද රැගෙන ආපසු එමි යි රජුන් විචාරා මහත් පිරිවරින් නික්මුණහ. සිටුතුමා පසල් දනව්වට යතැ යි හැමතැන පතළ විය. කටාහක සිටුතුමන් එතැ යි අසා සිතන්ට විය. සිටුතුමා පැමිණෙන්නේ අන් කරුණක් නිසා නො වේ. ඔහුගේ පැමිණීම මා නිසා ම විය යුතුයි. ඉදින්, මම පලා ගියේ නම් නැවත පැමිණීමට නො හැකිය. දන් එක්තරා උපායක් ඇත. සිටුතුමාට පෙර ගමන් කොට දාසයකු කළ යුතු දේ කොට ඔහු සිත් ගනිමි.

එතැන් පටන් තම පිරිස් මැද මෙසේ කියයි. සමහර නුවණ මද මිනිස්සු තමන්ගේ නො දනීම නිසා මව්පියන්ගේ ගුණ නො දන ඔවුන් ආහාර අනුභව කරන වේලාවෙහි ගෞරවාදර නො කොට ඔවුන් සමග ම අනුභව කරති. අපි වනාහි මව්පියන් අනුභව කරන වේලාවෙහි අත් දෝනා භාජනය එළවමු. කෙළ පඩික්කම භාජන එළවා තබමි. පැන් හා විජනිපත ගෙන එළැඹ සිටිමු. ශරීර කෘත්‍යය කරන කල දිය බඳුන ගෙන පිළිසන් තැනට යෑම දක්වා දාසයකු තම ස්වාමියාට කළයුතු සියලු කටයුතු ප්‍රකාශ කළේය. හෙතෙම මෙසේ ඒ පිරිස දනුවත් කොට බෝසතුන් ගම් දොරට පැමිණි කළ මයිලණුවන්ට මෙසේ කීය. පියාණෙනි, මගේ පියා ඔබතුමන් දකීම පිණිස එන්නේය. කන බොන දෑ පිළියෙල කරනු මැනවි. මම පඬුරු ගෙන පෙර මඟට යන්නෙමි. සිටු ද දරුව, මැනවැ යි පිළිගත්තේය. කටාහක ද බොහෝ පඬුරු ගෙන මහත් පිරිවරින් ගොස් බෝසතුන් වැඳ පඬුරු පිළිගැන්වීය. පඬුරු පිළිගත් බෝසත්හු ඔහු සමග පිළිසඳර කථා කොට උදය භෝජන කාලයෙහි කඳවුරෙහි වැස ශරීර කෘත්‍යය සඳහා පිළිසන් පෙදෙසකට ගියහ. කටාහක එවිට තම පිරිවර නවතා දිය බඳුන ගෙන බෝසතුන් වෙත ගොස් දිය කිස අවසානයෙහි පාමුල වැටී ස්වාමීනි, ඔබතුමා යම් පමණ ධනය කැමැත්තේ ද එපමණ දෙන්නෙමි. මගේ කීර්තිය ගෙන නො යනු මැනවැ යි කීය. බෝසත්හු ද ඔහුගේ ගති පැවතුම් පිළිබඳ පැහැදී බිය නො වන්න. මා නිසා ඔබට බියක් හෝ අනතුරක් නො වන්නේ යි පවසා පසල් ගමට පිවිසියේය. ඔහුට මහත් සත්කාර විය. කටාහක ද සිටුතුමන්ට කළයුතු සියලු දේ දාසයකු මෙන් කරයි.

ඉක්බිති එක් වේලාවක බරණැස සිටු හා පසල් ගම් වැසි සිටු සතුටු සාමීචියේ යෙදී සිටින විට පසල් දනම් වැසි සිටු මහසිටුතුමනි, මම ඔබගේ හසුන දැක ඔබ පුතුට මගේ දියණිය දුනිමි. එවිට බෝසත් සිටු, කටාහක තමාගේ ම පුතෙකු කොට ඊට සුදුසු වන්සේ පිය තෙපුල් කියා සන්තෝෂ කළේය. එතැන් සිට කටාහකගේ මුහුණ ඍජු ව බැලීමට පවා සමතකු නො වීය. දිනක් බෝසත් සිටු, සිටු දියණිය කැඳවා, දියණිය එන්න, මගේ හිසෙහි උකුණන් ඉවත් කරන්නැ යි කියා ඇය උකුණන් ඇහිඳින අතර සිටුතුමා, දියණිය, කියන්න මගේ පුතු තී සමග සැපදුක් දෙකෙහි සම ව දෙදෙනා සතුටු ව සමගියෙන් වසන්නහුද යි විචාළේය. පියාණෙනි, සිටු පුතුගේ වෙන දොසක් නැත. ආහාර පිළිකුල් කරතැ යි කීවාය. කවදත් ඔහු අසුභවාදී අයෙකි. එසේ වුවත් මම තිට මුව නිහඬ කරන මන්ත්‍රයක් දෙමි. ඔබ එය මනා කොට ඉගෙන මගේ පුතු ආහාර ගන්නා කාලයෙහි ආහාරයට අවමන් කරන විට මා ඉගැන්වූ ආකාරයෙන් ම ඉදිරියෙහි සිට කියව යි ගාථාව උගන්වා කීප දිනක් එහි වැස බරණැස් නුවරට ම ගියේය. කටාහක ද බොහෝ ආහාර පාන රැගෙන පසු ගමන් කොට බොහෝ ධනය ද දී වැඳ නැවත්තේය. ඔහු බෝසත් සිටු ගිය කල පටන් වඩාත් උඩඟු විය. ඔහු එක් දිනක් සිටු දියණිය විසින් නෙක රසයෙන් යුත් බෝජුන් ගෙනවුත් හැන්දෙන් බෙදමින් වළඳවන ලද කල්හි අහර අවමන් කරන්ට වූයේය. එවිට සිටු දියණිය බෝසතුන්ගෙන් උගත් අයුරින් ම මේ ගාථාව කීවාය.

**"බහුම්පි සො විකත්ථෙය්‍ය අඤ්ඤං ජනපදං ගතො,**
**අන්වාගන්ත්වාන දූසෙය්‍ය භුඤ්ජ භොගෙ කටාහකාති"**

"ඒ පුරුෂ තෙමේ අනෙක් ජනපදයකට ගියේ බොහෝ
කොට පරිභව වචන කියන්නේය. තමාගේ ස්වාමීනි,
නැවත ඇවිත් දූෂණය කරන්නේය. එම නිසා කටාහකය,
සම්පත් අනුභව කරව."

එහි, **"බහුම්පි සො විකත්ථෙය්‍ය අඤ්ඤං ජනපදං ගතො"**, යමෙක් තමන් උපන් බිමෙන් අන් ජනපදයකට ගියේ වේ ද එහි දී ඔහුගේ ජාතිය ආදිය නො දනිද්ද හෙතෙම බොහෝ කොට ආත්ම වර්ණනය

කරන්නේය. අනුන්ට නින්දා කරන්නේය. රැවටිලි කථා කියන්නේය. "**අත්වා ගනත්වාන දූසෙය්‍ය**", මොහු තම හිමියාගේ පෙර මඟට ගොස් දාසයකු කළ යුතු දේ කළ බැවින් කසයෙන් පහර දී පිටහම උපුටා සලකුණු තැබීමෙන් මිදුණේ වෙමි. ඉදින්, ඔබ නො සිරිත් කරන්නෙහි නම් නැවත එන වාරයේ දී ඔබ ස්වාමියා දූෂණය කරන්නේය. කසයෙහි තැලීමෙන් හා ඇඟ ලකුණු කෙටීමෙන් ජාතිය පළ කිරීමෙන් ද ඔබට හිංසා කරන්නේය. එහෙයින් දුසිරිත් අතහැර "**භුඤ්ජ භොගෙ කටාහකාති**", පසු ව තමාගේ දාස බව ප්‍රකට කැරවා විපිළිසර නො වෙව. මේ සිටුතුමාගේ අදහසයි.

සිටු දූ මෙහි අදහස නො දන්නී, ඉගනගත් අයුරින් ම අකුරු පමණක් බැහැර විය. කටාහක සිතන්නේ, සිටුතුමා විසින් සියලු පුවත් ඇයට කියන ලද්දේ වන්නේ යි නැවත අහරට අවමන් කරන්ට පොහොසත් නො වීය. උඩඟු බව නැතිව ම ලැබුණු දෙය අනුභව කොට කම් වූ පරිදි ගියේය.

බුදු රජහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා ජාතක කථාව නිම කළහ. එකල කටාහක ආත්ම වර්ණනා කළ භික්ෂුව විය. බරණැස් සිටු වනාහි මම ම වීමි.

## 1. 13. 6.

## අසිලක්ඛණ ජාතකය

"**තථෙවෙකස්ස කල්‍යාණන්ති**" යන මේ දේශනාව බුදුහු ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, කොසොල් රජුගේ කඩු ලකුණු දන්නා වූ බමුණකු අරබයා වදාළහ. ඔහු වනාහි කම්මල්කරුවන් විසින් රජු වෙත කඩු ගෙනා කල්හි කඩුව සිඹ කඩු ලකුණු හඳුන්වයි. ඔහු යමකුගේ අතින් ලාභයක් ලබයි ද ඔහුගේ කඩුව ලක්ෂණ සම්පන්න මංගල කරුණුවලින් යුක්තයැ යි කියයි. යමකුගේ අතින් ලාභය නො ලබයි නම් ඔහුගේ කඩුව අවලක්ෂණයැ

යි ගරහයි. ඉක්බිති, එක් කම්මල්කරුවෙක් කඩුවක් තනා කොපුවෙහි සියුම් මිරිස් කුඩු දමා රජු වෙත කඩුවක් ගෙනාවේය. රජතුමා බමුණා කැඳවා කඩුව විමසව යි කීවේය. කඩුව කොපුවෙන් ඇද සිඹින්නහුගේ නාසයට මිරිස් කුඩු පිවිස කිඹිසීමට කැමැත්ත ඇති විය. ඔහුට කිඹිසනු ගමන් නාසය කඩු මුහහතින් පහරන ලද්දේ දෙකට බිඳුණේය. ඔහුගේ මෙසේ නාසය බිඳුණු බව භික්ෂු සංඝයා අතර ප්‍රකට විය. ඉක්බිති, එක් දිනක් දම් සබාවෙහි භික්ෂූහු කථාවක් මතු කළහ. ඇවැත්නි, රජතුමාගේ කඩු ලක්‍ෂණ ශාස්ත්‍රය කියන්නා කඩු ලකුණු කියන්නේ, නාසය කපා ගත්තේය. බුදුහු වැඩමවා මහණෙනි, මෙහි කවර කථාවකින් යුත්තව හුන්නහුද යි විචාරා මෙනම් කථාවකින්යැ යි කී කල්හි, මහණෙනි, මේ බමුණා කඩු සිඹ නාසය කපා ගත්තේ දැන් පමණක් නොව, පෙරත් මේ විපතට පත් වූයේයැ යි වදාරා අතීතය ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කැරෙද්දී ඔහුගේ කඩු ලකුණු කියන බමුණකු විය. සියල්ල වර්තමාන කථාවේ දැක්වූ ක්‍රමයට සමානය. රජ වනාහි ඔහුට වෙදෙකු දී නාස් කෙළවර සුවපත් කැරවා ලාකඩවලින් බොරු නාසයක් කැරවා නැවත නැවත ඔහු මෙහෙකරුවකු බවට පත් කළේය. බරණැස් රජුට පුතකු නැත. එක් දුවක් හා බෑණා කෙනකු ද විය. ඒ දෙදෙනා ම තමන්ගේ සමීපයෙහි ම ඇතිදැඩි කෙළේය. ඔවුන් එකට වැඩෙද්දී ඔවුනොවුන් අතර පිළිබඳ සිතක් විය. රජතුමා ද ඇමැතියන් කැඳවා මගේ බෑණා මේ රාජ්‍යයයේ ස්වාමියා කොට දුවණිය ඔහුට ම දී ඔහුගේ අභිෂේකය කරමි යි කියා නැවත සිතුවේය. මගේ බෑණා හැම ආකාරයෙන් ම නෑයෙකි. ඔහුට වෙනත් රජ දුවක් ගෙන දී අභිෂේක කොට දුව වෙනත් රජ කෙනකුට දෙන්නෙමි. මෙසේ අපට බොහෝ නෑයෝ වන්නාහුය. රාජ්‍යය දෙකේ ම අපි ම. ස්වාමිවරු වන්නෙමු. හෙතෙම ඇමැතියන් සමග සාකච්ඡා කොට ඒ දෙදෙනා ම වෙන් කරන්නට වටීයැ යි බෑණා අන් ගෙයක ද දුව වෙනත් ගෙයක ද වාසය කැරවීය. ඔවුන් සොළොස් වස් පිරුණු බවට පත්ව අතිසයින් ඔවුනොවුන් පිළිබඳ සිත් ඇති විය.

රාජ කුමාරයා කුමන හෝ උපායකින් මාමාගේ දියණිය රජ ගෙදරින් බැහැර කිරීමට හැකි වන්නේයැ යි සිතන්නේ, එක් උපායක්

ඇතැ යි මහා යක් දෙස්සිසක් කැඳවා ඇයට දහසින් බැඳි මල්ලක් දී මා විසින් කුමක් කළ යුතුදැ යි කී කල්හි, මෑණියනි, තී විසින් කරන ලද්දෙහි ප්‍රතිඵල රහිත බවක් නම් නැත. කිසියම් කරුණක් කියා යම් සේ මගේ මාමා රජදුව රජ ගෙදරින් බැහැර කරයි ද එසේ කැරව යි කීවේය. ස්වාමීනි, යහපති. මම රජු වෙත එළැඹ මෙසේ කියමි. දේවයන් වහන්ස, රජදුවගේ මතුයෙහි වැසුණු එක් කාලකණ්ණි යක්‍ෂයකු ඇත. මෙපමණ කලක් නැවතී බලන්නෙක් ද නැත. මම රජදුව අසවල් අසවල් දවසේ රථයකට නංවා ගෙන බොහෝ ආයුධ ගත් අත් ඇති පුරුෂයන් රැගෙන මහත් පිරිවරින් සොහොනට ගොස් නාවන්නට බඳින ලද පිලෙහි යට සොහොන් ඇඳෙහි මළ මිනියක් හොවා ඇඳ උඩ රජ දුව තබා සුවඳ දිය කළ එකසිය අටකින් නහවා කාලකණ්ණි අමනුෂ්‍යයා පළවා හරින්නෙමි යි, මෙසේ කියා රජදුව සොහොනට පමුණු වන්නෙමි. නුඹ අප එහි යන දවසේ අපට කල් ඇතිව මිරිස් කුඩු ටිකක් රැගෙන ආයුධ ගත් අත් ඇතිව තමන්ගේ මිනිසුන් විසින් පිරිවරන ලද්දේ, රථයට නැඟී සොහොනට ගොස් රථය සොහොනේ දොරටුවෙහි එක් දෙසක තබා ආයුධ ගත් අත් ඇති අය සොහොන් වනයට යවා තමා සොහොනෙහි නහන්නට හළ පිළිට ගොස් මළ කෙනකු මෙන් යටිකුරු ව හිඳ ගනුව. මම එහි අවුත් නුඹේ මතුයෙහි ඇඳක් අතුරුවා රජ දුව ඔසවා ඇඳෙහි නිදි කැරවන්නෙමි. නුඹ ඒ අවස්ථාවෙහි මිරිස් කුඩු ටිකක් නාසයට දමා දෙතුන් වරක් කිඹිසෙව්. නුඹ කිඹිසූ කල්හි අපි රජ දුව හැර දමා පලා යන්නෙමු. ඉක්බිති, අවුත් රජ දුවගේ හිසේ සිට නහවා තමාත් හිස පටන් නා ඈ රැගෙන තමාගේ නිවාසයට යන්නෙහි. හෙතෙම යහපති. සුන්දර උපායක්යැ යි පිළිගත්තේය.

ඈ ගොස් රජුට ඒ කරුණ සැල කළාය. රජතුමා එය පිළිගත්තේය. රජ දියණියට ද ඒ අතර කීවාය. ඈ ද පිළිගත්තාය. ඈ නික්මෙනු දවසේ කුමාරයාට සංඥාවක් දී මහත් පිරිවරින් සොහොනට යන්නී, ආරක්‍ෂක මිනිසුන්ට බය ඉපදවීමට කීවාය. මා රජ දුව ඇඳෙහි තබන කාලයෙහි ඇඳයට මළ මිනිසා කිඹිසියි. කිඹිස ද ඇඳ යටින් නික්මී යමකු පළමු ව දකින්නේ ද ඔහු ම ගන්නේය. නො පමා විය යුත්තාහ. රජ කුමරා පළමු ව ගොස් කියන ලද ක්‍රමයට එහි වැතුරුණේය. මහා යක්දෙස්සිය රජ දියණිය ඔසවාගෙන නාවන්නට බඳින ලද පිළට යන්නී, බය නො වන්නැ යි සංඥා දී ඇඳෙහි තැබුවාය. ඒ අවස්ථාවෙහි කුමාරයා මිරිස් කුඩු නාසයෙහි

දමා කිඹිසියේය. ඔහු විසින් කිඹි පමණින් ම මහා යක්දෙස්සිය රජ දුව හැර මහත් නාද කැරෙමින් සියල්ලන්ට පළමු ව පබා ගියාය. ඇගේ පබායාමත් සමග එකකුදු සිටීමට සමත් කෙනකු නම් නො වීය. ගත් ගත් ආයුධ ඉවත දමා සියල්ලෝ ම පලා ගියාහ.

කුමාරයා කථා කැරගත් පරිදි සියල්ල කොට රජ දුවණිය ගෙන තමාගේ නිවසට ගියේය. යක්දෙස්සිය ගොස් ඒ කරුණ රජුට සැළකළාය. රජතුමා ස්වභාව වශයෙන්ම ඇය ඔහුට දී ම සඳහා ම මා විසින් පෝෂණය කරන ලද්දීයි. කිරිබතට දමන ලද ගිතෙල් මෙන් උපන්නේයැ යි ගැළපුණේයැ යි පිළිගෙන පසුකලෙක බෑණාට රාජ්‍යය දී දුව මහා දේවිය කළේය. ඒ කඩු ලකුණු කියන තැනැත්තා ඔහුගේ ම උපස්ථායකයා විය. ඔහුට එක් දිනක් රාජ උපස්ථානයට අවුත් හිරු බලා සිට උපස්ථාන කරන්නහුගේ ලාකඩ දියවී බොරු නාසය බිම වැටුණේය. හෙතෙම ලජ්ජාවෙන් බිම බලාගෙන (අධෝමුඛ ව) සිටියේය. ඉක්බිති, ඔහුට රජතුමා සිනාසෙමින් (උපහාසයෙන්) ඇදුරුතුමනි, නො සිතව. කිඹිහීම නම් එකකුට යහපත් වෙයි. එකකුට අයහපත් වෙයි. තොප විසින් කිඹිසීමෙන් නාසය සිඳ ගන්නා ලද්දේය. අපි වනාහි බෑණා, දුව ලබා රාජ්‍යයට පැමිණියෙමු යි කියා මේ ගාථාව කීවේය.

**"තථෙවෙකස්ස කල්‍යාණං තථෙවෙකස්ස පාපකං,**
**තාස්මා සබ්බං න කල්‍යාණං සබ්බංචාපි න පාපකන්ති"**

"එකෙකුට (එය ම) කල්‍යාණය, (යහපත්ය) තවකකු හට ලාමකය. එහෙයින් සියල්ල කල්‍යාණ නො වේ. සියල්ල ලාමක ද නො වේ."

එහි, **"තථෙවෙකස්සාති, තදෙවෙකස්ස"**, මෙය තවත් පාඨයකි. දෙවැනි පදයේත් ඒ ක්‍රමය මැයි.

මෙසේ හෙතෙම මේ ගාථාවෙන් ඒ කරුණ ගෙනහැර දක්වා දානාදී පිංකොට කම් වූ පරිදි පරලොව ගියේය. බුදුහු මේ දේශනාවෙන් ලෝක සම්මතය පරිදි යහපත හා පාපය ඒකාන්ත නො

වන බව ප්‍රකාශ කොට ජාතකය නිමවා වදාළහ. එකල කඩු ලකුණු දන්නා, දැන් කඩු ලකුණු දන්නා ම විය. බෑණා වූ රජ වනාහි මම ම වෙමි.

1. 13. 7.

## කලණ්ඩුක ජාතකය

"තෙ දෙසා තානි වත්‍ථූනීති" යන මේ දේශනාව බුදුහු ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, එක් ආත්ම වර්ණනා කරන භික්‍ෂුවක් අරබයා වදාළහ.

එහි කථා පුවත් දෙක ම කටාහක ජාතකයට සමානය. මෙහි වනාහි මේ තෙම බරණැස් සිටුතුමාගේ දාසයකු වූ කලණ්ඩක නම් විය. ඔහු පලා ගොස් පසල් දනව්වක සිටුවරයකුගේ දූවක ගෙන මහත් පිරිවරින් වසන කල්හි බරණැස් සිටුතුමා සොයා බලන්නේ, ඔහු ගිය තැනක් නො දන්නේ, යව. කලණ්ඩුක සොයා බලව යි තමා විසින් පෝෂණය කරන ලද ගිරා පෝතකයෙකු යැවීය. ගිරා පෝතකයා ඔබ්මොබ හැසිරෙන්නේ, ඒ නගරයට පැමිණියේය.

ඒ කාලයෙහි කලණ්ඩුක දිය කෙළි කෙළිනු කැමැත්තේ, බොහෝ මල්ගඳ විලවුන් ද කන බොන දෑ ද ගෙන්වාගෙන ගඟට ගොස් සිටු දූව සමග නැවකට නැඟී ජලයෙහි සෙල්ලම් කරයි. ඒ දේශයෙහි දිය කෙළි කෙළිනාහු, ඉසුරුමත්හු කැකෑරූ බෙහෙත් මුසුකරන ලද කිරි බොත්. ඒ නිසා ඔවුන්ට වරුවක් වුවත් දියෙහි ක්‍රීඩා කරන්නට ශීතලෙන් බාධා නො වේ. මේ කලණ්ඩුකයා වනාහි කිරි උගුරක් ගෙන මුඛයෙහි කළඹා ඒ කිරි දමයි. බිම දමන්නේ ද දියෙහි නො හළා සිටු දූවණියගේ හිසෙහි දමයි. ගිරා පෝතකයා ද ගං තෙරට ගොස් එක් තිඹිරි ගසක අත්තක හිඳ බලන්නේ, කලණ්ඩුකයා හැඳින ගෙන සිටු දූවණියගේ හිසෙහි දමන බව දැක

එම්බල කලණ්ඩුකය, දාසය, තමාගේ ජාතිය ද වසන තැන ද සිහි කැරව. කිරි උගුරක් ගෙන මුඛය කළඹා ජාති සම්පන්න වූ සැප සේ වැඩුණු සිටු දුවණියගේ හිසෙහි නො දමව. තමාගේ ප්‍රමාණය නො දන්නෙහිද්‍ද යි කියා මේ ගාථාව කීවේය.

"තෙ දෙසා තානි වත්‍ථූනි අහඤ්ච වනගොචරො,
අනුවිච්ච ඛො තං ගණ්හෙය්‍යුං පිප ඛීරං කලණ්ඩුකාති"

"(තා උපන් මව් කුස නම් වූ) දේශය ද (මව් ගැබ නම් වූ) වස්තුව ද වන ගෝචර වූ (තිරිසන් වූ) මම ද දනිමි. (ස්වාමිවරු) තා දූන හැරගන්නාහ. කලකණ්ඩුකය කිරි බොව."

එහි, "තෙ දෙසා තානි වත්‍ථූනීති", මව් කුස සඳහා කියයි. මේ මෙහි අදහසයි. යම් තැනක ඔවුන් විසුවේ නම් එතැන රජ දියණියන්ට සුදුසු කුසක් නො වේ. යම් තැනක ඔහු විසුවේ ද ඒවා රජ දියණියන්ට සුදුසු කුස ප්‍රදේශ නො වේ. එසේ වුව ද ඔබ දාසියකගේ කුස විසුවෙහිය. පිහිටියේය. "අහඤ්ච වන ගොචරො", තිරිසන්හු පවා මෙකරුණ දනිති යි දක්වයි. "අනුවිච්ච ඛො තං ගණ්හෙය්‍යුං", මෙසේ නො සිරිතෙහි හැසිරෙන, මා විසින් ගොස් සැලකරන ලද කල්හි පරීක්ෂා කොට දූන ඔබගේ සැමියෝ තලා සලකුණු ඔබ්බවා ඔබ ගන්නාහුය. ගෙන යන්නාහුය. එනිසා තමාගේ පමණ දූන සිටු දියණියගේ හිසට කෙළ නො ගසා, "පිප ඛීරං කලණ්ඩුකාති", ඔහු නාමයෙන් අමතයි.

කලණ්ඩුකයා ද ගිරා පෝතකයා හැඳිනගෙන මා ප්‍රසිද්ධ කරාවිය යන බියෙන් ස්වාමීනි, එන්න, කවදා ආවේද්‍ද යි කීවේය. ගිරවා මොහු මා හිතවත්කමින් නො කැඳවයි. මගේ ගෙළ අඹරවා මරනු කැමැත්තේයැ යි දූන මට නුඹෙන් ප්‍රයෝජනයක් නැතැ යි එතැනින් උඩට පැන බරණැස් නුවරට ගොස් දුටුවේ යම් සේ ද සිටුතුමාට විස්තර වශයෙන් කීවේය. සිටුතුමා ඔහු විසින් අයුත්තක් කරන ලද්‍ද යි කියා ඔහුට අණ කැරවා බරණැස් නුවරට ම ඔහු ගෙනවුත් දාසයකු ලෙසින් වැඩ ගත්තේය. බුදුහු මේ ධර්ම දේශනාව

ගෙනහැර දක්වා ජාතකය නිමවා වදාළහ. එකල කලකණ්ඩුකයා මේ හික්ෂුව විය. බරණැස් සිටු වනාහි මම ම වෙමි.

## 1. 13. 8.

## බිළාරවත ජාතකය

"යො වෙ ධම්ම ධජං කත්වාති" යන මේ දේශනාව බුදුහු දෙව්රම් වෙහෙරෙහි වැඩ වාසය කරන සේක්, එක් කුහක (නැති ගුණ ,පෙන්වන) හික්ෂුවක් අරබයා වදාළහ. එකල්හි බුදුහු ඔහුගේ කුහක බව සැළ කළ කල්හි මහණෙනි, දැන් පමණක් නොව, පෙරත් මේ තෙම කුහකයෙකැ යි වදාරා අතීතය ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කැරෙද්දී බෝසත්හු මී යෝනියෙහි පිළිසිඳ ගෙන වැඩිවියට පැමිණ මහත් සිරුර ඇත්තේ, ඌරු පැටියකු සමාන වී නොයෙක් සිය ගණන් මීයන් විසින් පිරිවරන ලද්දේ, වනයෙහි වාසය කරයි. ඉක්බිති, එක් හිවලෙක් ඔබිමොබ හැසිරෙන්නේ, ඒ මී රැළ දැක මේ මීයන් රවටා කන්නෙමි යි සිතා මීයන්ගේ බිලයට නුදුරෙහි හිරුට මුහුණලා හුළං බොමින් තනි පයින් සිටියේය. බෝසත්හු ගොදුරු සොයා හැසිරෙන්නේ, ඌ දැක මොහු සිල්වතෙක් වන්නේයැ යි ඌ ළඟට ගොස් ස්වාමීනි, නුඹේ නම කුමක්ද යි විචාළේය. ධම්මික නම් යි කීය. පා හතර ම බිම නො තබා කුමක් නිසා එක කකුලකින් සිටියෙහි ද ? මගේ පා හතර ම පොළොවේ තබන කල්හි පොළොවට ඔසවා සිටිය නො හැකියි. ඒ නිසා තනි කකුලෙන් සිටියෙමි. මුව විවර කැරගෙන කුමක් නිසා සිටියෙහි ද ? අපි අන් කිසිවක් අනුභව නො කරමු. හුළඟ පමණක් අනුභව කරමු. ඉක්බිති, ඉරට මුහුණලා සිටියේ කුමක් නිසා ද ? සූර්යයා වඳින්නෙමි. බෝසත්හු ඔහුගේ වචන අසා මේ තෙමේ සිල්වතෙක් වන්නේයැ යි එතැන් පටන් මී සමූහයා සමග උදේ හවස ඔහුට උපස්ථාන පිණිස යයි. හිවලා සියල්ලන්ට පසුව යන මීයා ගෙන මස් කා ගිල මුඛය පිසදා සිටියි. අනු පිළිවෙලින් මී සමූහයා තුනී

විය. මීයෝ පෙර අපට මේ ගුල ඉඩ මදි විය. ප්‍රමාණවත් නො වීය. අතරක් නැති ව සිටියෙමු. දැන් ලිහිල්ය. මේ ගුහාව පෙර මෙන් නො වීය. මේ කුමක් නිසාදැ යි බෝසතුන්ට ඒ පුවත සැලකළාහුය. බෝසත්හු කුමන කාරණයකින් හෝ මීයෝ නැතිව ගියෝයැ යි සිතන්නේ, හිවලා ගැන සැකය ඇති ව ඔහු විමසන්නෙමි යි උපස්ථාන කරන කල්හි සෙසු මීයන් පෙරටු කොට තමා පස්සට විය. හිවලා උගේ මතුවට පැන්නේය. බෝසත්හු තමන් අල්ලා ගැනීම පිණිස පනින බව දැක නැවතී එම්බා සිගාලය, මේ නුඹේ ව්‍රත සමාදානය ද ? කල්‍යාණ ධර්මයාගේ සුන්දර ස්වභාවය ධර්මයෙහි නො පිහිටි බවයි. අනුන්ගේ හිංසනය පිණිස ධර්මය කොඩියක් කැරගෙන හැසිරෙන්නේදැ යි කියා මේ ගාථාව කීය.

"යො වෙ ධම්මං ධජං කත්‍වා නිගුළ්හො පාපමාචරෙ,
විස්සාසයිත්‍වා භූතානි බිළාරං නාම තං වතන්ති"

"යමකු ඒකාන්තයෙන් (දශ කුශල) ධර්මයන් ධජයක් කොට (මතු කොට පෙන්වා) සත්ත්වයන් (ලවා මේ සිල්වතෙකැ යි) විශ්වාස ඇති කැරවා ගෙන තමන් තත්ත්වය සඟවා ගත්තේ, පව් සිදු කෙරේ ද ඔහුගේ ඒ පැවැත්ම බිළාර නම් ව්‍රතයයි."

එහි, "යො වෙති", ක්ෂත්‍රිය ආදී යම් කිසි කෙනකු, "ධම්මං ධජං කත්‍වාති", දශ කුසල කර්ම පථ ධර්මයන් කොඩියක් මෙන් කොට එය කරන්නේ, උත්සාහවත් කරන්නේ, දක්වන්නේ යන අර්ථයි. "විස්සාසයිත්‍වාති", මේ තෙමේ සිල්වත්යැ යන හැඟීමෙන් හටගත් විශ්වාසයන් කොට "බිළාරං නාම තං වතන්ති", ඔහු මෙසේ ධර්මය කොඩියක් මෙන් කොට රහසිගත ව පව් කරන්නේ ම ඒකාන්තයෙන් ම කෛරාටික ව්‍රතයක් වේ යන අර්ථයි.

මී රජා කියත් කියත් ම උඩ පැන උගේ බෙල්ලට පැන යටි හනුවෙහි ඇතුල් ගලනාලය හපා බොටුව පලා මරණයට පත් කළේය. මී සමූහයා නැවතී හිවලා මුරු මුරු යන අනු කරණයෙන් කා ගියහ. පළමුවෙන් ආවාහු මූගේ මස් ලැබූහ. පසුව ආවාහු නො ලැබූහ. එතැන් පටන් මී සමූහයා බය නැත්තෝ වූහ. බුදුහු මේ ධර්ම

දේශනාව ගෙනහැර දක්වා ජාතකය නිමවා වදාළහ. එකල හිවලා කුහක භික්ෂුව විය. මී රජ වනාහි මම ම වීමි.

1. 13. 9.

## අග්ගික ජාතකය

"නායං සිඛා පුඤ්ඤහෙතූති" යන මේ දේශනාව බුදුහු ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්, කුහක භික්ෂුවක් ම අරබයා වදාළහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කැරෙද්දී බෝසත්හු මී රජෙක් ව වනයෙහි වසයි. ඉක්බිති, එක් හිවලෙක් ලැව් ගිනි හටගත් කල්හි පලා යාමට නො හැකි වන්නේ, එක් ගසෙක හිස ඇන ගෙන සිටියේය. නරියාගේ මුළු සිරුරේ ම ලෝම දැවුණේය. ගසෙහි හිස ඇන ගෙන සිටි තැන මුදුනෙහි සිපවක් මෙන් ලොම් ටිකක් තිබුණේය. හෙතෙම එක් දිනක් පොකුණෙන් පැන් බොන්නේ, සෙවනැල්ල බලන්නේ, සිළුව (මුදුන) දැක, මට දැන් තත්ත්වයක් ලැබුණේයැ යි වනයෙහි හැසිරෙන්නේ, ඒ මී ලෙන ද දැක මේ මීයන් වංචා කොට කන්නෙමි යි යට කියන ලද ක්‍රමයට ම නුදුරෙහි සිටියේය. ඉක්බිති, බෝසත්හු ගොදුරු සඳහා හැසිරෙන්නේ, නරියා දැක සිල්වතෙක්යැ යි හැඟීමෙන් එළැඹ නුඹ කිනම් නම් ඇත්තෙක්දැ යි විචාළේය. මම අග්ගික භාරද්වාජ නැමත්තාය. ඉක්බිති, කුමක් සඳහා ආවෙහි ද ? නුඹලා රක්ෂා කිරීම පිණිසයි. කුමක් කොට අප රකින්නෙහි ද ? මම අඟිලිවලින් ගණන් කිරීම දනිමි. තොප උදෙන් ම නික්මී ගොදුරු පිණිස යන කාලයේ මෙපමණයැ යි ගණන්කොට ආපසු එන කාලයේ දීත් ගණින්නෙමි. මෙසේ සවස උදෑසන ගණිමින් රකින්නෙමි. එසේ නම් මාමණ්ඩිය රකින්න. නරියා යහපතැ යි පිළිගෙන නික්මෙන කල්හි එකා දෙන්නා තුන් දෙනායැ යි ගණන් කොට එන කල්හි ද එසේ ම ගණන් කොට හැමට පසු ව එන මීයා ගෙන කයි. සෙස්ස පෙර පරිදි මය. මෙහි මී රජ නැවතී සිටියේ

එම්බා අග්ගික භාරද්වාජ, මේ නුඹේ ධර්මතාවයක් නිසා හිසෙහි කෙස් රොදක් තැබුවේ නොව, හුදෙක් බඩ වඩා ගැනීම පිණිස තබන ලද්දකැ යි කියා මේ ගාථාව කීවේය.

"නායං සිඛා පුඤ්ඤහෙතු සාසහෙතු අයං සිඛා,
නඞ්ගුට්ඨගණනං යාති අලං තෙ හොතු අග්ගිකාති"

"මේ සිඛාව (හිස මුදුනෙහි බැඳි කෙස් රොද) හිත් පිණිස නො වේ. මේ සිඛාව අනුන් කනු සඳහාය. (මේ මූසික සමූහයා) ඇඟිලි ගණනට නො ආයේය. අග්ගිකය, තාගේ (මීයන් ගිණීම) මේ පමණ වේවා."

එහි, "නඞ්ගුට්ඨ ගණනං යාතීති", නඞ්ගුට්ඨ ගණන නම් ඇඟිලි ගැනීමයැ යි කියනු ලැබේ. මේ මී සමූහයා ඇඟළි ගැනීමට නො යයි. නො එළැඹෙයි. නො පුරවයි. ක්‍ෂයවීමකට නො යයි, යන අර්ථයි. "අලං තෙ හොතු අග්ගිකාති", හිවලා නමින් අමතමින් කීවේය. මෙපමණකින් ඔබට සෑහේවා. මින්පසු මීයන් නො කන්නෙහිය. අප සමග හෝ තොප සමග හෝ ආශ්‍රයක් නො වේවා. අපි දූන් නුඹ සමග නො වසන්නෙමු යි යන අර්ථයි. සෙස්ස පෙර පරිදි මය. බුදුහු මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා ජාතකය නිමා කළහ. එකල හිවලා ද මේ භික්‍ෂුව විය. මී රජා වනාහි මම ම වෙමි.

1. 13. 10.

## කෝසිය ජාතකය

"යථාවාචාව භුඤ්ජස්සු" යන මේ ජාතකය බුදු රජහු දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, සැවැත් නුවර වැසි එක් ගැහැනියක අරබයා දේශනා කළහ. මේ වනාහි එක් සැදැහැවත් බුදු සසුනෙහි පැහැදුණු උවසු බමුණකුගේ බිරිය වූවාය. ඕ දුසිල් පට්ටුකම් ඇත්තී,

රාත්‍රීයෙහි අනාචාරයෙහි හැසිර දවල් කිසි වැඩක් නො කොට ගිලන් බවක් පෙන්වා තතනමින් නිදන්නීය. ඉක්බිති, බමුණා සොඳුරිය, කිම ද ? යම්කිසි අපහසුවක් ඇත්තීදැ යි විචාරා, එසේය. මගේ සිරුර වාතයෝ පීඩා කරතැ යි කීවාය. එසේ නම් කිනම් දෙයක් අවශ්‍යයදැ යි අසා මිහිරි ප්‍රණීත කැඳ, බත්, තෙල් ආදී යමක් ඇය කැමැති වන්නී ද, ඒ ඒ දෙය ගෙනවුත් දෙයි. දාසයකු මෙන් සියලු කටයුතු කරයි. බමුණා ගෙටවන් කල ඕ නිදන්නීය. බැහැර ගිය කල සොර සැමියන් සමග සතුටු වන්නීය. දිනක් බමුණා, මැගේ සිරුර පීඩාකරන වාතයන්ගේ කෙළවරක් නො පෙනේ යි සිතා සුවඳ මල් ගත් අතැති ව දෙව්රම් වෙහෙරට ගොස් බුදුන් පුදා වැඳ එකත් පසෙක හුන් කල්හි බුදුහු, කිම බමුණ, මෙතෙක් දවස් නො පෙනී සිටියෙහි යි ඇසූ කල්හි, ස්වාමීනි, මගේ බැමිණියගේ සිරුරෙහි වාත රෝගයක් ඇත. ඒ නිසා මම ඇයට ගිතෙල් ද ප්‍රණීත භෝජන ද සොයමි. ඇගේ සිරුර සවිමත්ය. සම පැහැපත්ය. එහෙත් වාත රෝගයෙහි කෙළවරක් නො පෙනේ. මා ඇය රැකබලා ගැනීම නිසා මෙහි ඒමට අවකාශයක් නො ලැබුණි. බුදු රජහු බැමිණියගේ අනාචාර බව දැන බමුණු ස්ත්‍රියගේ රෝගය සුව නො වන කල්හි මේ මේ බෙහෙත් කටයුතු යි පෙර නුවණැත්තන් විසින් කියන ලදී. භවයෙන් වැසී ගිය නිසා දැන් ඒ නො සලකන්නෙහි යි වදාරා ඔහු විසින් අයදනා ලද්දාහු, ඉකුත් කථාව වදාළහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු උසස් බමුණු කුලයක ඉපිද වැඩිවියට පත්ව තක්ෂලාවෙන් සියලු ශිල්ප උගෙන බරණැස් නුවර දිසාපාමොක් ඇදුරු වූහ. සියයක් රජදහන්වල රජ බමුණු කුමරුවෝ මොවුන් ළඟ ම ශිල්ප උගනිත්. එකල පසල් දනව් වැසි බමුණෙක් බෝසතුන්ගෙන් තුන් වේදය හා අටළොස් විද්‍යා උගෙන බරණැස් නුවරට පවුල් සංවිධානය කොටගෙන වෙසෙමින් දිනපතා දෙතුන් වරක් බෝසතුන් වෙත එයි. ඔහුගේ බිරිය දුසිල් පාප කාරිනියක් වූවාය. මෙහි සියලු කථා පුවත වත්මන් කථාව හා සමාන වේ. මේ කරුණ නිසා ඔවදන් ලැබීමට ඉඩක් නො ලැබුණු බව කීවේය. බෝසත්හු, මේ ස්ත්‍රිය මොහු රවටා නිදන බව දැන රෝගයට සුදුසු බෙහෙතක් කියන්නෙමි යි සිතා දරුව, ඔබ මෙතැන් සිට ඇයට කිරි, ගිතෙල් ආදී රසවත් දේ නො දෙනු. පස්පළා, ත්‍රිඵල, ගෝ මූත්‍රයෙහි බහා කකාරා අළුත් තඹ භාජනයක දමා තඹගඳ ගන්වා රැහැනක් හෝ යොතක් හෝ වැලක් ගෙන මේ තිගේ රෝගයට සුදුසු

බෙහෙතයැ යි මෙය බොව. නැතිනම් නැඟිටුව. අනුභව කළ ආහාරයට සුදුසු සේ වැඩ කැරව යි මේ ගාථාව කියව. ඉදින්, බෙහෙත නො බොන්නී නම් රැහැණින් හෝ යොතින් හෝ වැලෙන් හෝ පහර කීපයක් දී කෙසින් ගෙන ඇද වැලමිටින් තලන්නේය. එවිට වහා නැඟිට වැඩපල කරන්නීය. ඔහු ද මැනවැ යි පිළිගෙන කී ආකාරයෙන් බෙහෙත සකස් කොට, සොඳුරිය, මේ බෙහෙත බොව යි කීය. එවිට බිරිය මේ බෙහෙත කවුරුන් විසින් කියන ලද ද ? සොඳුරිය, ගුරුතුමන් විසින් කියන ලද්දේය. ඒ බෙහෙත ඉවත ලනු. මම නො බොමි. එවිට මානවකයා ඉදින්, තී කැමැත්තෙන් නො බොන්නී නම් මේ රැහැන ගෙන තමාගේ රෝගයට සුදුසු බෙහෙත බොව හෝ තමා කන බොන කැඳ බත් ආදියට සුදුසු වැඩපල හෝ කැරව යි කියා මේ ගාථාව කීය.

**"යථාවාචාව භුඤ්ජස්සු යථාභුත්තඤ්ච ව්‍යාහර,**
**උභයං තෙ න සමෙති වාචා භුත්තංඤ්ච කොසියෙති"**

"කොසියාවෙනි, කියන වචනයට අනුව අනුභව කරව.
අනුභව කළ දෙයට අනුව වැඩ කරව. තිගේ කීම ද
අනුභව කිරීම ද සම නො වේ."

එහි, **"යථාවාචාව භුඤ්ජස්සු"**, තිගේ වචනය අනුව අනුභව කරව. වාතයෙන් මට පීඩා කරතැ යි කියන වචනයට සුදුසු වන සේ අනුභව කරව යන අර්ථයි. **"යථාවාචං වා"**, යන පාඨය ද ගැළපේ. **"යථාවාචායාති"**, කියා ද පාඨයකි. මෙම අර්ථ මැයි. **"යථාභුත්තඤ්ච ව්‍යහරාති"**, තී අනුභව කරන ආහාරයට අනුව මෙහෙ කරව. නීරෝගී වෙමි යා කියා ගෘහයෙහි කළයුතු දේ කරව යන අර්ථයි. **"යථාභුතඤ්ච"**, ද පාඨයකි. නොහොත් නීරෝගී වෙමි යි ඇති තත්ත්වයට ප්‍රකාශ කොට මෙහෙ කරව යන අර්ථයි. **"උභයං තෙ න සමෙති වාචා භුත්තඤ්ච කොසියෙති"**, වාතයෝ මා පෙළතැ යි තිගේ යම් වචනයක් වේ ද එය ද ප්‍රණීත ආහාර පාන බුදීම ද යන මේ දෙකරුණ සම නො වේ. එහෙයින් නැඟිට වැඩ කරව. **"කොසියෙ"**, ගෝත්‍රයෙන් ඇය අමතයි.

මෙසේ කී කල්හි කෝසිය බැමිණිය බියපත් ව ගුරුතුමන් විසින් උත්සාහවත් වූ කල පටන්, මොහු රැවටීමට නො හැකියැ යි නැඟිට මෙහෙ කළාය. ගුරුතුමන් විසින් මගේ දුසිල් බව දැනගන්නා ලද්දේය. මෙතැන් පටන් නැවත මෙබන්දක් නො කැරමි යි ගුරු ගෞරවයෙන් පවෙහි වෙන් ව සිල්වතියක් වූවාය.

ඒ බැමිණිය ද බුදු රදුන් විසින් මා දක්නා ලදිමි යි බුද්ධ ගෞරවයෙන් පව්කමින් වෙන්වූවාය. බුදු රජහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා ජාතකය නිමවූහ. එදා අඹු සැමියෝ දැන් අඹු සැමියෝ ම වූහ. ගුරුතුමා වනාහි මම ම වීමි.

## තෙළෙස් වැනි කුසනාළි වර්ගයයි.

## 1. 14. 1.

# අසම්පදාන ජාතකය

"අසමපදානෙනිතරීතරසසාති" යන මේ දේශනාව බුදුහු ජේතවනරාමයෙහි වැඩ වාසය කරන සේක්, දෙව්දත් තෙරුන් අරබයා වදාළහ. එකල්හි භික්ෂූහු දම් සබාවෙහි කථාවක් ඉපද වූහ. ඇවැත්නි, දෙව්දත් තෙර කළගුණ නො දනී. තථාගතයන් වහන්සේගේ ගුණ නො දනියි. බුදුහු වැඩමවා මහණෙනි, මෙහි කවර කථාවකින් යුක්ත ව දැන් හුන්නාහුදැ යි විචාරා මෙ නම් කථාවකින්යැ යි කී කල්හි මහණෙනි, දෙව්දත් තෙර කළගුණ නො දත්තේ දැන් පමණක් නොව, පෙරත් කළගුණ නො දත්තේමැ යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර මගධ රට රජගහ නුවර එක් මගධ රජ කෙනකු රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු ඔහුගේ ම සිටුතුමා විය. අසූ කෝටියක් ධනය ඇති සඞ්ඛ යන නමිනි. බරණැස් නුවර ද පිළිය සිටුතුමා නමින් අසූ කෝටියක් ධනය ඇති සිටුවරයකු විය. ඔවුහු ඔවුනොවුන් සහායකයෝ වූහ. ඔවුන් අතුරෙන් බරණැස් නුවර පිළිය සිටුතුමාට කිසියම් කාරණාවක් නිසා මහත් බියක් උපන්නේය. සියලු වස්තුව පිරිහිණ. හෙතෙම දිළිඳු වූයේ, පිළිසරණක් නැතිව බිරිඳ රැගෙන සඞ්ඛ සිටුතුමා බලාපොරොත්තුවෙන් බරණැස් නුවරින් නික්මී පයින් ම රජගහ නුවරට පැමිණ සඞ්ඛ සිටුතුමාගේ නිවසට ගියේය. හෙතෙම ඔහු දැක ම මගේ සහායකයා ආවේයැ යි පිළිගෙන සත්කාර සම්මාන කොට කීප දිනක් ගතකොට එක් දිනක් කිම යහළුව, කුමක් සඳහා ආවේදැ යි විචාළේය. යහළුව, මට බයක් උපන්නේය. සියලු ධනය විනාශ විය. (පිරිහුණේ) මට පිහිට වන්නැ යි කීය. යහපති. යහළුව, බිය නො වන්න. භාණ්ඩාගාරිකයා විචාරවා හතලිස් කෙළක් අමු රන් දෙවා සෙසු උපකරණ හා පිරිවර ද තමා සන්තක පණ ඇති නැති දේ සියල්ල දෙකට බෙදා බාගයක් ම දුන්නේය. ඔහු ඒ ධනය ගෙන නැවත බරණැසට ගොස් වාසය කෙළේය.

අපර භාගයෙහි සඞ්ඛ සිටුතුමාට ද එබඳු ම බයක් උපන්නේය. හෙතෙම තමාට පිළිසරණක් සොයන්නේ, මගේ සහායකයාට ලොකු

උපකාරයක් කළෙමි. වස්තුවෙන් බාගයක් දුනිමි. ඔහු මා දැක බැහැර නො කරන්නේය. ඔහු සමීපයට යන්නෙමි යි සිතා භාර්යාව රැගෙන පයින් ම බරණැස් නුවරට ගොස් බිරිඳට කීවේය. සොඳුරිය, නුඹට මා සමග ඇතුල් වීදියෙහි යාම නම් යුතු නැත. මා විසින් එවන ලද යානයට නැඟී මහත් පිරිවරින් පසුව එන්නෙහි. යානාව එවන්නේ යම් විටක ද එතෙක් මෙහි ම හිඳුව යි කියා ඇ ශාලාවෙහි තබා තෙමේ නුවරට පිවිස සිටුතුමාගේ ගෙට ගොස් රජගහ නගරයෙන් නුඹගේ සහායක සඞ්ඛ සිටුතුමා ආවේයැ යි දැනුම් දුන්නේය. හෙතෙම එව යි කැඳවා ඔහු දැක අසුනෙන් නො නැඟිට්ටේය. පිළිසඳර කථා නො කළේය. හුදෙක් ආවේ ඇයිදැ යි විචාළේය. නුඹ බැහැදැකීමට ආවෙමි යි කීවේය. නවාතැන් පොළක් නුඹ කොහෙන් ගත්තෙහි ද ? තව ම නවාතැන් පොළක් නැත. සිටු භාර්යාව ද ශාලාවේ නවතා ආවේ වෙමි. තොපට මෙහි නවාතැන් නැත. නවාතැන් පොළක් සොයාගෙන එක් තැනක පිස අනුභව කොට යවු. නැවත අප නො බලවයි කියා මගේ සහායකයාගේ රෙදි පොටෙහි බැඳ එක් බොල් බහුල වී (තිඹක්) ස්වල්පයක් දෙව යි දාසයාට අණ කෙළේය. එදවස වනාහි සිටුතුමා රත් ඇල්වලින් ගැල් දහසක් පමණ පොළවා ගබඩාව පිරවීය. සතලිස් කෝටියක් ධනය ගෙන ආවෙහිය. අකෘතඥ මහා සොරෙකි. යාළුවාට තිඹක් පමණ බොල් සහිත වී දෙවීය. දාසයා පසිම්බුවකට එක් බොල් වී තිඹක් දමා බෝසතාණන් ළඟට ගියේය.

බෝසත්හු මෙසේ සිතූහ. මේ අසත් පුරුෂයා මගේ සමීපයෙන් සතලිස් කෙළක් ධනය ලබා දැන් බොල් තිඹක් දෙවීය. ගනිම් ද ? නො ගනිම්ද ? ඉක්බිති, මොහුට මෙබඳු අදහසක් විය. යම්තාක් මේ අකෘතඥ මිත්‍රද්‍රෝහියා කළගුණ නො සැලකූ බැවින් මා සමග මිත්‍ර භාවය බින්දේය. ඉදින්, මම මොහු විසින් දෙන ලද බොල් වී තිඹ ලාමක බැවින් නො ගත්තෙමි යි මිත්‍ර භාවය බිඳින්නෙමි. ටිකක් ලද අන්ධ බාලයා එය නො ගන්නේ, මිතුරු බව විනාශ කරයි. මම වනාහි මොහු විසින් දෙන ලද බොල් සහිත වී තිඹ ගෙන මගේ ළඟ මිත්‍ර භාවය පිහිටුවන්නෙමි. හෙතෙම බොල් වී තිඹ රෙදි පොටෙහි බැඳගෙන ප්‍රාසාදයෙන් බැස ශාලාවට ගියේය. ඉක්බිති, ඔහුගෙන් බිරිඳ ආර්යයෙනි, කිම ලැබුණදැ යි විචාළාය. සොඳුරිය, අපගේ සහායක පිළිය සිටුතුමා බොල් වී තිඹක් දී අප අද ම බැහැර කළේය. ආර්යයෙනි, කුමකට ගත්තෙහි ද ? කිම, මෙය හතළිස් දහසකට සුදුසුදැ යි අඬන්නට පටන් ගත්තාය. බෝසත්හු සොඳුරිය, නො හඬව.

මම ඔහු සමග මිතුරු භාවය බිඳෙන බියෙන් මගේ ළඟ මිත්‍ර භාවය තබා ගන්නට ගත්තෙමි. නුඹ කුමක් නිසා ශෝක කරන්නේදැ යි කියා මේ ගාථාව කීවේය.

"අසම්පදානෙනිතරීතරස්ස
බාලස්ස මිත්තානි කලීභවන්ති
තාස්මා හරාමි භුසං අඩ්ඪමානං
මා මෙ මිත්ති ජීයිත්ථ සස්සතායන්ති"

"කිසියම් හීන වූ ද උතුම් වූ ද වස්තුවක් නො ගැනීම නිසා අනුවණයාගේ මිතුරෝ කිලිටු වෙත්. (හෙවත් බිඳෙත්) එහෙයින් (මිත්‍රත්වය රකිනු පිණිස) මිතුරා දෙන ලද බොල් කුරුණි සතර ගත්මි. මගේ මිත්‍රත්වය නො පිරිහේවා. මිත්‍රත්වය සදා පවතීවා."

එහි, "අසම්පදානෙනාති", යනු ස්වර ලෝපයෙන් වූ සන්ධියකි. නො ගැනීම යන අර්ථයි. "ඉතරීතරස්සාති", යම්කිසි ලාමක ආලාමකයකුට, "බාලස්ස මිත්තානිකලී භවන්ති", මෝඩයාගේ - අඥානයාගේ මිත්‍රයෝ වෙත් යන අර්ථයි. "තාස්මා හරාමි භුසං අඩ්ඪමානං", මේ කාරණයෙන් මම යහළුවා විසින් දෙන ලද තුඹක් පමණ බෝල ගෙන යමි යි දක්වයි. "මාන", නම් අටු නැලියට නමකි. නැලි හතරක් තුම්බ නම් වේ. එහෙයින් තුඹක් පමණ බොල්යැ යි කියන ලදී. "මා මෙ මිත්ති ජීයිත්ථ සස්සතාය", මගේ යහළුවා සමග පවතින මිත්‍රත්වය නො බිඳේවා. එය හැමදා පවතීවා යන අර්ථයි.

මෙසේ කී කල්හි ද සිටු බිරිඳ හැඬුවා මය. ඒ අවස්ථාවෙහි සඩ්බ සිටු විසින් පිළීය සිටුතුමාට දෙන ලද කර්මාන්ත ගැත්තෙක් ශාලාව දොරටුව අසලින් එන්නේ, සිටු බිරිඳගේ හඬන ශබ්දය අසා ශාලාවට පිවිස තමාගේ ස්වාමියා දැක පාළඟ වැටී හඬා වැළප කුමක් සඳහා මෙහි අවුදැ යි විචාළේය. සිටුතුමා සියල්ල සැල කළේය. කර්මාන්ත දාසයා එසේ වේවා. ස්වාමීනි, නො සිතව යි දෙදෙනා ම සනසා අනුභව කැරවා අපේ ස්වාමියා ආවේයැ යි සෙසු දාසයන් රැස් කැරවා දක්වා කීප දිනක් ගතකොට සියලු දාසයන් රැගෙන රජ

මිදුලට ගොස් මහත් කොට හැඬුවේය. රජතුමා කැඳවා මේ කිමෙක්දැ යි විචාළේය. ඔවුහු ඒ සියලු පුවත් රජුට සැළකළහ. රජතුමා ඔවුන්ගේ කීම අසා සිටුවරුන් දෙදෙනා ම කැඳවා සඞ්ඛ සිටාණන්ගෙන් විචාළේය. ඇත්තද ? මහසිටුතුමනි, නුඹ විසින් පිළිය සිටුතුමාට සතළිස් කෙළක් ධනය දෙන ලද ද ? මහරජතුමනි, මගේ යහළුවාට මා සලකා රජගහ නුවරට ආ විට ධනය පමණක් නොව සියලු ද්‍රව්‍යය පණ ඇති නැති වශයෙන් කොටස් දෙකකට බෙදා සමාන ව බාගයක් දුන්නෙමි. රජතුමා මෙය ඇත්දැ යි පිළිය සිටුගෙන් විචාළේය. එසේය, දේවයන් වහන්ස. නුඹ විසින් තමා ම සලකා ආ මොහුට කිසියම් සත්කාරයක් හෝ සම්මානයක් කැර තිබේ ද ? ඔහු නිහඬ විය. තව ද නුඹ මොහුට බොල් වී තුඹක් රෙදි පොටට දමා දී තිබේ ද ? එය ද අසා නිශ්ශබ්ද විය. රජතුමා කුමක් කළයුතුදැ යි ඇමැතියන් සමග සාකච්ඡා කොට ඔහුට පරිභව කොට යවූ. පිළිය සිටාණන්ගේ ගෙයි සියලු ධනය සඞ්ඛ සිටුතුමාට දෙවූ යි කීවේය. බෝසත්හු මහරජ, මට අනුන් සන්තක දෙයින් අර්ථයක් නැත. මා විසින් දෙන ලද ප්‍රමාණය පමණක් දෙවනු මැනවි. රජතුමා බෝසතාණන් වහන්සේට අයිති කොටස දෙවීය. බෝසත්හු තමා විසින් දෙන ලද සියලු ධනය ආපසු ලබා දාස පිරිස පිරිවරා රජගහ නුවරට ම ගොස් පවුල් ජීවිතය පිහිටුවා දානාදී පිං කොට කම් වූ පරිදි මිය පරලොව ගියෝය.

බුදුහු මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා ජාතක කථාව නිමවා වදාළහ. එකල පිළිය සිටුතුමා දෙව්දත් තෙරු විය. සඞ්ඛ සිටුතුමා වනාහි මම ම වෙමි.

## 1. 14. 2.

## පඤ්චගරුක ජාතකය

"කුසලූපදෙසෙ ධිතියා දළ්හාය චාති" යන මේ ජාතක දේශනාව බුදුහු දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, අජපල් නුග රැක

මුල මාර දූවරුන්ගේ පෙළඹවීම් සූත්‍රය අරබයා දෙසූහ. බුදු රජහු මුල පටන්,

"දද්දල්ලමානා ආගඤ්ඡුං තණ්හා ච අරතී රගා,
තා තත්ථපනුදී සත්ථා තූලංභට්ඨං ච මාලුතොති"

"තණ්හා, අරති, රගා යන මාර දූහු දිළිසෙමින් පැමිණියහ. බුදුහු ඔවුන් මහා සුළඟින් පුළුන් රොදක් මෙන් පලවා හැරියහ."

මෙසේ කෙළවර දක්වා සූත්‍රය දෙසූ කල්හි, දිනක් දම් සබාවේ රැස්වූ භික්ෂූහු කථාවක් ඉපදවූහ. ඇවැත්නි, බුදු රජහු මාර දූන් නොයෙක් සිය ගණන් දිව්‍යය රූප මවා පොළඹවනු සඳහා එළැඹ සිටි කල්හි ඇස් ඇර බැලීම් පමණකුදු නො කළහ. අහෝ ! බුද්ධ බලය මහත් පුදුමය. බුදු රජහු දම් සබාවට වැඩමවා මහණෙනි, දූන් කවර කථාවකින් හුන්නාහුද්ද යි විචාරා, මෙනම් කථාවකින් හුන්නෙමු යි කී කල්හි, මහණෙනි, දූන් මම සියලු ආශ්‍රව ක්ෂය කොට සව්නේ දත් නුවණ ලබා මරඟනන් නො බැලීම පුදුමයක් නො වේ. පෙර සම්බෝධිය සොයමින් කෙලෙස් සහිත ව සිටි කල මවන ලද දෙවඟනන් රූප අසංවර ව ලෝභ සහගත සිතින් නො බලා ගොස් මහා රාජ්‍යයට පැමිණියෙමි යි වදාරා අතීත කථාව වදාළහ.

පෙර බරණැස් නුවර බෝසත්හු සොහොයුරන් සියයකට කනිටු වී උපන්හ. සියලු කථා පුවත යට තක්කසිලා ජාතකයෙහි කී අයුරින් විස්තර කළ යුතුය. එදා වනාහි තක්ශලා වාසීහු නගරයෙන් පිට ශාලාවක සිටි බෝසතුන් වෙත එළැඹ රාජ්‍යය පිළිගන්වා රාජ්‍යයෙන් අභිෂේක කොට එදින නගරය දිව්‍යය නගරයක් මෙන් ද රාජ භවනය ශක්‍ර භවනය මෙන් ද අලංකාර කොට ඔසවන ලද සේසත් ඇති උතුම් රුවන් පළඟෙහි සක්දෙවිඳු මෙන් වැඩ හුන්හ. ඇමැතියෝ ද බමුණු ගැහැවි ආදීහු ද කුමරුවෝ ද සව්බරණින් සැදී පිරිවරා සිටියහ. දෙවඟනන් වැනි සොළොස් දහසක් නළු ස්ත්‍රීහු ද නන් බරණින් සැරසී නෘත්‍යය ගීත වාදිතයෙහි යෙදුණහ. රජ භවන මේඝ නාදයෙන් පිරුණු මුහුද කුස මෙන් ඒකානාද විය. බෝසත්හු තමාගේ

සෞභාග්‍යය බලමින් මෙසේ සිතූහ. ඉදින්, මම ඒ යකින්නන් මැවූ දිව්‍යය රූපයන් බැලුවේ නම් මරණයට පත් වන්නෙමි. එවිට මේ සෞභාග්‍යවත් ජීවිතය නො ලබන්නෙමි. පසේ බුදුවරුන්ගේ අවවාදයෙහි සිටි බැවින් මම මේ සැපතට පැමිණියෙමි. මෙසේ ද සිතා ප්‍රීති වාක්‍යය පහළ කිරීම් වශයෙන් මේ ගාථාව කීහ.

**"කුසලූපදෙස ධිතියා දළ්හාය ච**
**අනිවත්තිතත්තාභයභීරුතාය ච**
**න රක්ඛසීනං වසමාගමිම්හා**
**ස සොත්ථිභාවො මහතා භයෙන මෙති"**

"දක්ෂ වූ පසේ බුදු රජුන්ගේ උපදේශයන්හි දැඩි ව ඤාණයෙන් යුතුව පිහිටි හෙයින් ද අකුශලයට බිය නිසා ද යකින්නන්ගේ වසඟයට නො ගියෙමු. මට ඒ බියෙහි ම සුවපත් බව විය."

එහි, **"කුසලූපදෙසේ"**, දක්ෂයන්ගේ උපදේශයන් - පසේ බුදු රජුන්ගේ අවවාද යන අර්ථයි. **"ධිතියා දළ්හාය චාති"**, දැඩි බවින් හා ස්ථිර බවින් නො සිඳුණු නිරතුරු වීර්යයෙන් යන අර්ථයි. " **අනිවත්තිතත්තා භය භීරුතාය චාති"**, බයින් නො නැවතුණු හෙයින් ද මෙහි **"භාය"**, නම් සිතෙහි තැතිගැනීම් මාත්‍රයකි. **"භීරුතා"**, නම් සිරුර කම්පා කරන මහා බයයි. මේ දෙයාකාර බිය ම බෝසතුන්ට නො වීය. යකින්නෝ මිනිසුන් කන්නෝ යි බිය ජනක අරමුණක් දැක ද බියක් නො වීය. එම නිසා **"භය භීරුතා"** නිසා නො නැවතී ඉදිරියට ගියේ යි කීවේ එහෙයිනි. **"භය භීරුතා"** නැති නිසා බිය ජනක අරමුණක් දැක ද නො නවතින බැවින් යන අර්ථයි. එම නිසා රකුසියන්ගේ වසඟයට නො ගියෙමු යි කියන ලදී. **"ස සොත්ථිභාවො මහතා භයෙන මෙති"**, ඒ මම අද මහත් බියෙන් රකුසියන්ගෙන් පැමිණිය හැකි දුක් දොම්නසින් සුවපත් බව, නිර්භය බව, සතුටු සොම්නස් බව ඇත්තෙක් වීමි.

මෙසේ බෝසත්හු මේ ගාථාවෙන් දම් දෙසා දැහැමින් රාජ්‍යය කොට පින්කම් කොට කම් වූ පරිදි ගියේය. බුදුහු මේ ධර්ම දේශනාව

ගෙනහැර දක්වා ජාතකය නිම වූහ. එකල තක්ශලාවට ගොස් රාජ්‍යයට පැමිණි කුමරා මම වූවෙමි.

## 1. 14. 3.

## සතාසන ජාතකය

"බෙමං යහින්ති" යන මේ ජාතක දේශනාව බුදු රජහු දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, එක්තරා භික්‍ෂුවක් අරබයා දේශනා කළහ.

බුදු රජුන්ගෙන් කමටහන් ලබාගත් භික්‍ෂුවක් පසල් දනව්වක කුඩා ගමක් ඇසුරු කොට වන සෙනසුනක වස් එළැඹ විසුවේය. පළමු මාසයේ ම පිඬු පිණිස වැඩි කල පන්සල දැවී ගියේය. සෙනසුන නැතිවීමෙන් පීඩාවට පත් භික්‍ෂුව දායක ජනයාට එකරුණ කීවේය. ස්වාමීනි, ඉවසන්න. පන්සල තනා දෙන්නෙමු. දැන් සී සෑම් ආදී ගොවිතැන් කටයුතු ඇතැ යි කියමින් මිනිස්සු තුන් මසට කල්ගත කළහ. භික්‍ෂුවට සුදුසු සෙනසුන් පහසුකම් නැති බැවින් කමටහන් සඵල කැර ගන්ට නො හැකි විය. එතෙම භාවනාවෙන් නිමිති මාත්‍රයක්වත් උපදවන්ට නො හැකි ව වස් වැස නිමවා දෙව්රම් වෙහෙරට ගොස් බුදු රජුන් වැඳ එකත් පසෙක හුන්නේය. බුදුහු ඔහු සමග පිළිසඳර කථා කොට එකල්හි බුදු රජහු මහණ, කෙසේ ද ? කමටහන සඵල වීදැ යි විමසූහ. භික්‍ෂුව මුලපටන් කමටහන සඵල නො වූ පරිදි කීය. එවිට බුදු රජහු මහණ, පෙර තිරිසන් සත්තු පවා සුදුසු නුසුදුසු බව දැන විසීමට සුදුසු කල්හි වැස නුසුදුසු කල්හි විසූ ස්ථානය අත්හැර වෙනත් තැනකට ගියහ. මහණ, ඔබ කුමක් නිසා සුදුසු නුසුදුසු බව නො දන්නෙහිදැ යි වදාරා ඔහු විසින් අයදනා ලද බුදුහු අතීත කථාව ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු කුරුලු යෝනියෙහි ඉපිද වැඩිවියට පත්ව දැකුම්කළු කුරුලු රජකු වී එක් වනබද විල් තෙරක අතු රිකිලි කොළ ගහණ වූ මහා

ගසක් ඇසුරු කොට පිරිවර සහිත ව වාසය කළේය. බොහෝ කුරුල්ලෝ ඒ ගසෙහි දිය මතුපිට පැතිරී ගිය අතුවල වසන්නාහු, සිරුරු මළ හෙළති. එම විලෙන් සැඩ නා රජෙක් වසයි. මේ කුරුල්ලෝ, මගේ නිවහන වූ විලෙහි සිරුරු මළ හෙලතැ යි කිපී දියන් ගිනි මතුකොට ගස දවා කුරුල්ලන් පලවා පියමි යි සිතී. ඉක්බිති, රාත්‍රී කාලයෙහි සියලු කුරුල්ලන් එකතු වී ගස් අතුවල නිදිගත් කල්හි, පළමු කොට සියලු ජලය ලිප තැබුවාක් මෙන් පැසුණු කල්හි දෙවැනි වර දුම් දමා තෙවැනි වර නලකඳක් පමණ ගිනි ජාලාවක් උඩට නැංවීය. බෝසත්හු දියෙන් ගිනිදැල් නැගෙනු දැක යහළු කුරුල්ලනි, ඇවුළුණු ගිනි දියෙන් නිවෙයි. දැන් ජලය ම ගිනිදැල් විය. අපට මෙහි විසීමට නො හැකිය. වෙනත් තැනකට යමු යි කියා මේ ගාථාව කීහ.

**"බෙමං යහිං තත්ථ අරී උදීරිතො**
**උදකස්ස මජ්ඣෙ ජලතෙ ඝතාසනො**
**න අජ්ජ වාසො මහියා මහීරුහෙ**
**දිසා භජව්හො සරණජ්ජ නො භයන්ති"**

"යම් තැනක නිර්බය ද එතැන සතුරා නැඟී සිටියේය. දිය මැද ගිනි දිළිසෙහි. පොළෙවෙහි ගසක අද විසීමක් නැත. කුරුල්ලනි, අන් තැනකට යව්. අපට පිහිට වූ තැනින් බය උපන."

එහි, "**බෙමං යහිං තත්ථ අරී උදීරිතො**", යම් දිය තලයක නිර්බය බව වී ද එහි සතුරෙක් පැමිණියේය. පැන නැංගේය. "**උදකස්ස**", ජලයෙහි, "**ඝතාසනො**", ගින්නයි. ගින්න ගිතෙල් අනුභව කරන නිසා "**ඝතාසනො**", යි කියනු ලැබේ. "**න අජ්ජ වාසො**", අද අපට වාසය නැත. "**මහියා මහීරුහො**", මහීරුවා නමින් ගස කියනු ලැබේ. ගසෙහි - මේ මහපෙළොවෙහි උපන් ගසෙහි යන අර්ථයි. "**දිසා භජව්හො**", දිශාවන් ඇසුරු කරවු. යවු. "**සරණජ්ජ නො භයන්ති**", අද අපට පිහිටි ස්ථානයෙන් ම බය ඇතිවිය. තදින් ම බිය උපන්නේය යන අර්ථයි.

බෝසත්හු මෙසේ කියා තමාගේ වචනය පිළිගන්නා කුරුල්ලන් රැගෙන උඩට නැඟී අන් තැනකට ගියහ. බෝසතුන්ගේ වචනය නො පිළිගෙන සිටි කුරුල්ලෝ මළහ. බුදුහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා සිව්සස් වදාරා ජාතකය නිමවූහ. සත්‍යය දේශනාව කෙළවර ඒ භික්ෂුව රහත් ඵලයෙහි පිහිටියේය. එදා බෝසතුන්ගේ වචනය පිළිගත් කුරුල්ලෝ බුදු පිරිසය. කුරුලු රජ වනාහි මම ම වීමි.

## 1. 14. 4.

## ඣානසෝධන ජාතකය

"යෙසඤ්ඤිතො" යන මේ ජාතක දේශනාව බුදු රජහු දෙව්රම් වෙහෙර වසන සේක්, සංකස්ස නුවර දොරටුවෙහි දී තමන් වහන්සේ විසින් ලුහුඬින් අසන ලද ප්‍රශ්නයට දම් සෙනෙවි සැරියුත් තෙරණුවන් විසින් විස්තර වශයෙන් කළ පැන විසඳුම අරබයා වදාළහ. මේ ඒ පිළිබඳ අතීත කථාවයි.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු අරණ්‍යායතනයක කළුරිය කරන කල්හි අතවැසියන් විසින් විශේෂාධිගම විචාරණ ලද්දේ, නෙවසඤ්ඤානාසඤ්ඤා විඤ්ඤාණය - ඇත්තෙත් නැත. නැත්තෙත් නැතැ යි කීහ. - පෙ - අතවැසියෝ දෙටු අතවැසි තවුසාගේ වචනය නෙ ාපිළිගත්හ. එවිට බෝසත්හු ආභස්සර බඹ ලොවින් අවුත් අහසෙහි සිට මේ ගාථාව කීහ.

"යෙ සඤ්ඤිනො තෙපි දුග්ගතා
යෙපි අසඤ්ඤිනො තෙපි දුග්ගතා,
එතං උභයං විවජ්ජය
තං සමාපත්තිසුඛං අනඞ්ගණන්ති"

"සිත ඇති යම් සත්ත්ව කෙනෙක් වෙත් ද ඔහු දිළිඳු වෙති. සිත් නැති යම් සත්ත්ව කෙනෙක් වෙත් ද ඔහු ද දිළිඳු වෙති. සිත ඇති සිත නැති භවයන් දුරු කොට ඒ අරූප සමවත් සුවය නිදොස්ය."

එහි, "**යෙ සඤ්ඤිනො**", යන්නෙන් නේවසඤ්ඤානාසඤ්ඤා යන්න අරූප ධ්‍යානලාභීන් හැර සෙසු සිත සහිත සත්ත්වයන් දක්වයි. "**තෙපි දුග්ගතා**", එම සමවත නො ලැබීම නිසා ඔහු දුගී මෙන්, "**යෙපි අසඤ්ඤිනො**", අසඤ්ඤ භවයෙහි උපන්නෝ සිත් නැති බැවින් දක්වයි. "**තෙපි දුග්ගතා**", ඔහු ද මේ සමපත්තිය නො ලැබීම නිසා දුගියෝ වෙති. "**එතං උභයං විවජ්ජය**", මේ සඤ්ඤාදී අසඤ්ඤාදී බව අත්හරව යි අතවැසියාට අවවාද කළේය. "**තං සමාපත්තිසුඛං අනඞ්ගණන්ති**", නේවසඤ්ඤානාසඤ්ඤායතන සමවත් ශාන්ත බැවින් සැප ගණයට ගියේය. ධ්‍යාන සැපය නිදෝසීය. බලවත් සිතෙහි එකග්‍ර භාවය නිසා ද එය "**අනඞ්ගණ**" නම් විය.

මෙසේ බෝසත්හු ධර්ම දේශනා කොට දෙටු අතවැසිගේ ගුණ කියා බඹ ලොවට ම ගියේය. එකල්හි සෙසු තාපසයෝ දෙටු අතවැසි පිළිගත්හ. බුදු රජහු මේ කථාව ගෙනහැර දක්වා ජාතකය නිම කළහ. එදා දෙටු අතවැසියා සැරියුත් තෙරුණුවෝ වූහ. මහා බ්‍රහ්මයෝ මම ම වීමි.

## 1. 14. 5.

## චන්දාභ ජාතකය

"**චන්දාභන්ති**" යන මේ ජාතක දේශනාව බුදු රජහු දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, සංකස්ස නගර දොරටුවෙහි සැරියුත් තෙරුණුවන්ගේ ම පැන විසඳීමක් අරබයා දෙසූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු අරණ්‍යායතනයක කළුරිය කරන්නාහු, අතවැස්සන් විසින් විචාරණ ලද්දාහු, සඳ එළිය, හිරු එළිය යි කියා ආභස්සර බඹ ලොවෙහි උපන්නේය. තාපසයෝ දෙටු අතවැසියාගේ වචන නො පිළිගත්හ. බෝසත්හු පැමිණ අහසෙහි සිට මේ ගාථාව කීහ.

**"චන්‍දාභං සූරියාභඤ්ච යොධ පඤ්ඤාය ගාධති,**

**අවිතක්කෙන ඣානෙන හොති ආභස්සරූපගොති"**

"යමෙක් මෙලොව චන්‍ද්‍ර, සූරිය ආලෝකය යම්තාක් පැතිර සිටී ද ඒ තාක් නුවණින් ධ්‍යාන අරමුණ පතුරුවයි. විතරක් නැති එම දෙවැනි ධ්‍යානයෙන් ආභස්සර බඹ ලොව පැමිණියෙමි."

එහි, **"චන්‍දාභන්ති"**, ඔදාත (සුදු පැහැය) කසිනය දක්වයි. **"සූරියාභන්ති"**, පීත (කහ) කසිනය දක්වයි. **"යොධ පඤ්ඤාය ගාධති"**, යම් කෙනෙක් මේ සත්ත්ව ලෝකයෙහි මේ කසින භාවනා දෙක නුවණින් වඩත් ද අරමුණු වශයෙන් පිවිසෙත් ද එහි පිහිටත් ද නොහොත් **"චන්‍දාභං, සූරියාභඤ්ච යොච පඤ්ඤාය භාවතීති"**, යම් තරම් ප්‍රමාණයක් සඳහිරු එළිය පැතිරෙයි ද එපමණ දුර ප්‍රතිභාග කසින අරමුණ වඩා ඒ අරමුණු කොට ධ්‍යාන උපදවන්නේ, මේ දෙඑළිය නුවණින් වැඩීම නම් වේ. එම නිසා මේ මෙහි අර්ථය වේ. **"අවිතක්කෙන ඣානෙන හොති ආභස්සරූපගොති"**, අභස්සර බඹ ලොව උපදින්නෙක් වේ.

මෙසේ බෝසත්හු තාපසයන් දැනුවත් කොට දෙටු අතවැසියාගේ ගුණ කියා බඹ ලොවට ම ගියේය. බුදු රජහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා ජාතකය නිම කළහ. එදා දෙටු අතවැසි සැරියුත් තෙරණුවෝය. මහබඹු වනාහි මම ම වීමි.

1. 14. 6.

## සුවණ්ණහංස ජාතකය

"යං ලද්ධං තෙන තුට්ඨබ්බන්ති" යන මේ ජාතකය බුදුහු දෙව්රම් වෙහෙර වසන සේක්, ථුල්ලනන්‍දා මෙහෙණ අරබයා දෙසූහ. සැවැත් නුවර එක්තරා උපාසකයෙක් ලූනුණු දෙමි යි පවසා මෙහෙණි සඟුන පවරා, එක් මෙහෙණියක් පැමිණියහොත් මෙහෙණකට ලූනුණු බික් දෙක තුනක් දෙන ලෙස කෙත් පල්ලාට අණ කළේය. ඉන්පසු ඔහු මෙහෙණෝ ලූනුණු පිණිස කෙතට ද ගෘහයට ද යති. එක් උත්සව දිනයක ඔහුගේ ගෙදර ලූනුණු අවසන් විය. ථුල්ල නම් භික්ෂුණිය පිරිවර සමග ගෙදරට ගොස් පින්වත, ලූනුණු අවශ්‍යයැ යි කියා ආර්යාවන් ගෙනෙන ලද ලූනුණු අවසනය. කෙතට යන්නැ යි කීය. ඇය කෙතට ගොස් පමණ නො දැන ලූනුණු ගෙන්වා ගත්තාය. කෙත් පාලකයා දොස් කීය. මෙහෙණියෝ පමණ නො දැන ලූනුණු ගෙන්වා ගන්නාහුය. ඒ ඇසූ අල්පේච්ඡ භික්ෂුණීහු ද මෙපුවත දැනගත් භික්ෂූහු ද දොස් කීහ. බුදු රජුන්ට ද මෙකරුණ සැලකළහ. බුදු රජහු ථුල්ලනන්‍ද භික්ෂුණියට දොස් පවරා මහණෙනි, අධික ආශා ඇති පුද්ගලයා වැදූ මවට ද ප්‍රිය නො වේ. එසේ ම අප හුදුණවුන් පැහැදීමට හෝ පැහැදුණවුන් වඩවඩාත් පැහැදීමට හෝ නැති ලාභ ලැබීමට හෝ නො ලැබුණු ලාභ ලැබීමට හෝ උපන් ලාභ තහවුරු කිරීමට හෝ සමත් නොවී අල්පේච්ඡ පුද්ගලයා වනාහි නො පහන් අය පැහැදවීමටත් පහන් අය වඩාත් පහන් කිරීම සඳහාත් නො ලැබුණු ලාභ ලැබීමටත් ලැබුණු ලාභ වැඩිවීමටත් උපන් ලාභ තහවුරු වීමටත් සමත් වෙයි. මේ ආදී වශයෙන් භික්ෂූන්ට අවස්ථානෝචිත දැහැමි කථා කොට මහණෙනි, ථුල්ලනන්‍දා අතෘපති ආශා ඇත්තී, දැන් පමණක් නො වේ. පෙර ද එසේ වූවාය යි වදාරා ඉකුත් ක,ාව ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු එක්තරා බමුණු කුලයක උපන්හ. ඔහු වැඩිවියපත් වූ කල්හි සමජාතික කුලයකින් බිරියක පාවාගත්හ. ඇයට නන්දා, නන්දාවතී, සුන්දරනන්දා යි දියණියෝ තිදෙනෙක් වූහ. ඔවුන් පතිකුලයට යන්නට පෙර ම බෝසත්හු කළුරිය කොට රන් හස් යෝනියෙහි උපන්හ.

ඔවුන්ට පෙර කඳපිළිවෙළ දන්නා නුවණ ද උපන්නේය. ඔහු වැඩිවිය පත්වෙත් ම රන්වන් පියාපතින් ගැවසුණු ශෝභාමත් මහත් සිරුර දැක මම කොහි සිට මෙහි උපන්නෙම්දැ යි බලන්නහු, මනුෂ්‍යය ලෝකයෙහි සිට බව දැන නැවතත් බලන්නහු, බැමිණිය හා දියණියන් කෙසේ ජීවත් වන්නෝදැ යි විමන කල්හි අනුන්ට බැලමෙහෙ කොට දුකින් ජීවත් වෙති යි දැන මෙසේ සිතීහ. මගේ සිරුරෙහි රන් පියාපත් කෙටීම් ගැටීම්වලට සුදුසුය. මම එක එක පියාපතක් දෙන්නෙම් නම් එයින් මගේ බිරිඳත් දියණියෝත් සැප සේ ජීවත් වන්නාහ. මෙසේ සිතූ බෝසත්හු ගෙදරට ගොස් ගෙයි පිටිපස කෙළවර සැඟවී සිටියහ. බැමිණිය හා දියණියෝ බෝසතුන් දැක හිමියනි, කොහි සිට ආවෙහිදැ යි විචාළහ. මම ඔබගේ පියා වෙමි. මරණින් පසු රණ හංසයෙක් වී උපන්නෙමි. ඔබ දැකීම සඳහා මෙහි පැමිණියෙමි. මෙතැන් පටන් අනුන්ට බැලමෙහෙ කොට දුක සේ ජීවත් වීම අවශ්‍යය නො වේ. මම ඔබට එක එක පියාපතක් දෙමි. එය විකුණා සුව සේ ජීවත් වනු යි කියා එක් පියාපතක් දී ගියේය. බෝසත්හු මේ ක්‍රමයෙන් අතරතුර අවුත් එක එක පියාපතක් දී යති. බැමිණිය හා දියණියෝ ධනයෙන් සම්පූර්ණ ව සැපවත් වූහ. ඉක්බිති, එක් දවසක් බැමිණිය සිය දියණියන් අමතා දරුවනි, තිරසනුන්ගේ හිත් දැනීම අමාරුය. සමහරවිට ඔහු නැවත මෙහි නො එන්ට හැකිය. දැන් ඔහු ආ කල සියලු පියාපත් සිඳ ලබාගනිමු. එවිට දියණියෝ අපගේ පියා පීඩාවට පත් වන්නේ යි නො පිළිගත්හ. බැමිණිය අධික ලෝභකම නිසා නැවත දිනක රන් හසු පැමිණි කල්හි, හිමියනි, මෙහි එන්නැ යි ආදරයෙන් කැඳවා ළඟට පැමිණි රන් හසු දෙඅතින් අල්ලා සියලු පියාපත් සිඳ ගත්තාය. එහෙත් බෝසතුන්ගේ කැමැත්තෙන් තොරව ගත් නිසා ඒ සියලු පියාපත් කොකුන්ගේ පියාපත් සමාන විය. බෝසත්හු පියා විහිදා යන්ට අසමත් වූහ. ඉක්බිති, ඕ රන් හසු මඳු සැළියක බහා පෝෂණය කළාය. එහෙත් රන් හසුගේ නැවත වැඩුණු පියපත් සුදුපාට විය. බෝසත්හු වැඩුණු පියාපත් ඇත්තේ, ඉගිලී තමා වසන ස්ථානයට ගියහ. නැවත එහි නො පැමිණියහ.

බුදුහු මේ අතීත කථාව ගෙනහැර දක්වා, මහණෙනි, ථුල්ලනන්දා භික්ෂූණිය අධික ලෝභී වූවා දැන් පමණක් නො වේ. පෙරත් අධික ලෝභී වූවාය. ඒ මහත් ආශාව නිසා ම රනින් පිරිහුණාය. දැන් ඒ අශාව නිසා ම ලුහුණු ලාභයෙන් පිරිහෙන්නීය. මෙතන් පටන් ලුහුණු අනුභවය නො ලබනවා පමණක් නොව අනිත්

භික්ෂුණීහු ද ලුනුණු නො ලබන්නෝය. එම නිසා බොහෝ ලැබුණ ද පමණ දත යුතුය. ස්වල්පයක් ලැබුණ ද ලැබුණු පමණින් සතුටු විය යුතුය. වඩවඩා නොාපැතිය යුතුයැ යි වදාරා මේ ගාථාව වදාළහ.

"යං ලද්ධං තෙන තුට්ඨබ්බං අතිලෝභො හි පාපකො
හංස රාජං ගහෙත්වාන සුවණ්ණා පරිහායථාති"

"යමක් ලැබුණ ද එයින් සතුටු විය යුතුය. අධික ලෝභය ලාමකය. රන් ලෝභයෙන් රාජ හංසයා අල්ලා ගෙන රනින් පිරිහුණාක් මෙනි."

එහි, "තුට්ඨබ්බං", සතුටු විය යුතුය. බුදුහු මෙසේ වදාරා නොයෙක් ආකාරයෙන් දොස් පවරා යම් භික්ෂුණියක් ලුණු අනුභව කරන්නී නම් පචිත් ඇවැතක් වේයැ යි සිකපදය පණවා ජාතකය නිම කළහ. එදා බැමිණිය ථුල්ලනන්‍ද භික්ෂුණිය වූවාය. දියණියන් තිදෙනා දූන් නැගෙණියන් තිදෙනාය. සුවණ්ණ රාජ හංසයා මම ම වීමි.

1. 14. 7.

## බබ්බු ජාතකය

"යත්ථෙකො ලභතෙ බබ්බුති" යන මේ ජාතකය බුදු රජහු දෙව්රම් වෙහෙර වසන සේක්, කාණමාතු සිකපදය අරබයා දෙසූහ. සැවැත් නුවර කාණමාතාගේ දියණිය නමින් ප්‍රකට උවැසියක් වූවාය. සෝවාන් වූ ආර්යය ශ්‍රාවිකාවක් වූවාය. ඕ කාණා නම් දියණිය පසල් ගමක කුලගොත් සම පුරුෂයකුට පාවා දුන්නාය. කාණා දිනක් කිසියම් කාර්යයක් සඳහා මව් ගෙදරට පැමිණියාය.

ඉක්බිති, ඇගේ හිමියා දින කීපයකට පසුව කාණාවගේ පැමිණීම රිසියෙමි යි දූතයකු යැවීය. කාණා ව දූත වචනය අසා තම හිමි වෙත යාම සඳහා මවගෙන් විචාළාය. දියණිය මෙතෙක් කල් මෙහි සිට හිස් අතින් යවනු නො කැමැති ව ගමන සඳහා කැවුම් පිසුවාය. එකෙණෙහි පිඬු සිඟා වඩිමින් සිටි භික්ෂුවක් නිවසට වැඩියේය. කාණ මාතාව භික්ෂුව වඩා හිඳුවා පාත්‍රය පුරා කැවුම් පිළිගැන්වූවාය. භික්ෂුව තවත් භික්ෂුවකට ද කීවේය. මාතාව ඔහුට පාත්‍රය පුරා කැවුම් පිළිගැන්වූවාය. මෙසේ සිව් නමකට පිළිගැන්වීමෙන් පසු පිළියෙල කළ සියලු කැවුම් අවසන් විය. මේ නිසා කාණාවගේ ගමන නැවතිනි. ඇගේ හිමියා දෙවැනි වරටත් තෙවැනි වරටත් දූතයන් යැවීය. තෙවැනි දූතයා යවන විට ඉදින්, කාණා නො එන්නී නම් වෙනත් බිරියක් ගෙන එන බව කියා යැවීය. එවර ද කාණාවගේ ගමන වැළකිනි. ඇගේ ස්වාමියා වෙනත් බිරියක ගෙන ආවේය. මේ පුවත ඇසූ කාණා හඬමින් සිටියාය.

බුදු රජහු මෙකරුණ දැන පෙරවරු හැඳ පොරවා පාසිවුරු ගෙන කාණ මාතාවගේ ගෘහයට වැඩමවා පැනවූ අසුනෙහි වැඩහිඳ කාණාව කුමක් නිසා හඬන්නීද යි විමසූහ. කාරණය දැනගත් බුදු රජහු දහම් දෙසා ඔවුන් සනසා හුනස්නෙන් නැඟිට විහාරයට වැඩියහ. භික්ෂූන් සිව් නමක් කාණාවගේ ගමන සඳහා පිළියෙල කළ කැවුම් තුන්වරක් ම පිළිගෙන ඇගේ ගමන වැළකුණු බව මහසඟන අතර ප්‍රකට විය. දිනක් භික්ෂූහු දම් සබාවෙහි මෙකරුණ මතු කළහ. ඇවැත්නි, භික්ෂූන් සතර නමක් තුන්වරක් කාණාවගේ ගමන සඳහා පිසූ කැවුම් අනුභව කොට ඇගේ ගමනට බාධා කිරීම නිසා ඇගේ සැමියා අත්හළ දියණිය නිසා කාණ මාතාවට මහත් දොම්නසක් ඉපදවීය. බුදුහු මේ සබාවට වැඩමවා මහණෙනි, දැන් කවර කථාවකින් හුන්නාහුද යි විචාරා මෙනම් කථාවකින් හුන්නාහු යි කී කල්හි මහණෙනි, ඒ භික්ෂූන් සතර නම කාණ මාතාවට අයිති දේ අනුභව කොට ඇය දොම්නස් කළෝ දැන් පමණක් නො වෙයි. පෙර ද එසේ ම වූහැ යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු ගල් කඩන කුලයක ඉපිද වැඩිවිය පත්ව ශිල්පය ඉගෙන ගත්හ. එකල කාසී රට එක් නියම් ගමක මහත් සම්පත් ඇති සිටු කෙනෙක් වූහ. ඔහුට නිධානගත ධනය රන් සතලිස් කෙළක් විය.

ඉක්බිති, ඔහුගේ බිරිය කළුරිය කොට ධනාශාව නිසා ධන නිධාන මතුපිට මී දෙනක් වී උපන්නාය. ක්‍රමයෙන් ඒ සිටු කුලය ද අභාවයට ගියේය. පෙළපත ද සිඳීගියේය. ගම ද අතහැර දමන ලදී. නම පවා මැකී ගියේය. එදවස බෝසත්හු පැරණි ගම පිහිටි තැන ගල මතුකොට කඩත් මීදෙන එතැනින් ගොදුරු පිණිස යන්නී, බෝසතුන් නැවත නැවත දැකීම නිසා හටගත් කුළුපග කම් ඇත්තී මෙසේ සිතුවාය. මගේ විශාල ධනය නිකරුණේ විනාශ වෙයි. මොහු සමග එකතුව මේ ධනය පරිභෝග කරමි. දිනක් එක් කහවණුවක් මුවින් ඩැහැගෙන බෝසතුන් වෙතට ගියේය. බෝසත්හු ඒ දැක මැණියනි, කහවණුවක් රැගෙන ආවෙහිදැ යි විචාළහ. දරුව, මෙය ගෙන තමා ද පරිභෝග කොට මට මස් ගෙන එව යි කීවාය. බෝසත්හු ද මැනවැ යි පිළිගෙන කහවණුව ගෙන ගෙට ගොස් එක් මස්සකින් මස් මිල දී ගෙන අවුත් මී දෙනට දුන්හ. ඇය ද එය තමා වසන තැනට ගෙන ගොස් කැමැති පරිදි කෑවාය. එතැන් පටන් මේ අයුරින් දිනපතා කහවණුව බැගින් බෝසතුන්ට දෙන්නීය. බෝසත්හු ද ඇයට මස් ගෙන අවුත් දෙයි. දිනක් බළලෙක් මූෂික ධේනුව අල්ලා ගත්තේය. එවිට ඇය ස්වාමීනි, මා නො මරන්න. මක්නිසා ද ? මා බඩගිනි වේදනාවෙන් සිටිමි. එම නිසා ති නො මරා සිටිය නො හැකියි. කිම ? ඔබ එක දවසක් පමණක් මස් කනු කැමැත්තේ ද ? නැති නම් හැමදා ම මස් කනු කැමැත්තේ ද ? ලැබෙන්නේ නම් හැමදා ම කනු කැමැත්තෙමි. එසේ නම් මම ඔබට හැමදා මස් දෙමි. මා අතහරිනු මැනවි. ඉක්බිති, බළලා කලහකාරී වනු යි පවසා මූෂික ධේනුව අත හැරියේය. එතැන් පටන් මූෂික ධේනුව තමාට ගෙන ආ මස් කොටස දෙකොටසක් කොට එක් කොටසක් බළලාට දෙයි. අනෙක් කොටස තමා කයි. තවත් දිනක වෙනත් බළලෙක් මූෂික ධේනුව අල්ලා ගත්තේය. මීව්චිය ඒ බළලාත් සනසා අතහරවා ගත්තාය. තුන්වෙනුව ඇය තවත් බළලෙක් අල්ලා ගත්තේය. ඔහු ද සනසා අතහරවා ගත්තේය. එතැන් පටන් තමාට ලැබෙන මස් කොටස තුන් කොටසක් කොට තිදෙනා ම කති. අනතුරු ව තවත් බළලෙක් ඇය ඩැහැ ගනී. පෙර මෙන් ඔහු ද සනසා තමා මුදවා ගත්තීය. එතැන් පටන් සතර කොටසක් කොට කති. තවත් දවසක ඇය වෙනත් බළලෙකුට ගොදුරු වූවාය. පෙර මෙන් ම උගෙන් මිදී පස් කොටසක් කොට කති. පස් වැනි කොටසට පත් වූ කල්හි ඇය අහර අඩු බවක් නිසා කෘෂ වී දුර්වල වූවාය. මස් ලේ අඩු විය. බෝසත්හු ඒ දැක මැණියනි, කුමක් නිසා මෙසේ වූවෙහිදැ යි අසා

කාරණය කී කල්හි මට කාරණය නො කියන ලද්දේ මක් නිසා ද? මම මෙයට කළ යුතු දේ දුනිමි යි ඇය අස්වසා පිරිසිදු පළිඟු මෙන් ගුහාවක් කොට ගෙනවුත් මැණියෙනි, ගුහාවට පිවිස වැතිරී පැමිණි පැමිණියන්ට නො සරුප් වචනයෙන් තර්ජනය කැරව යි කීහ. ඉක්බිති, එක බළලෙක් පැමිණ, මගේ මස් කොටස් දෙව යි කීය. එවිට මීච්චිය, එම්බල දුෂ්ඨ බළල, මම තොගේ මස් ගෙන යන්නියක් ද ? තමාගේ ම පුතුන්ගේ මස් කව යි බිය ගැන්වූවාය. බළලා පළිඟු ගුහාවෙහි සිටින බව නො දන නො ඉවසිල්ලෙන් මීච්චිය ඩැහැගනු සඳහා වහා පනිත් ම හදවත ගුහාවෙහි හැපී පැළිණි. ඇස් පිට පැන්නාක් මෙන් විය. එකණෙහිම බළලා මරණයට පත්ව එහි ම නො පෙනෙන තැනකට වැටිණි. මේ අයුරින්ම අනෙක් බළලුන් සිව් දෙනා ම මරණයට පැමිණියහ. එතැන් පටන් මී දෙන බිය නැති ව බෝසතුන්ට කහවණු දෙකක් තුනක් ගෙනවුත් දෙන්නීය. මේ අයුරින් ඒ සියලු ධනය බෝසතුන්ට දුන්නීය. ඒ දෙදෙනා දිවි ඇතිතෙක් ම මිතුරු බව නො බිඳී මරණින් මතු කම් වූ පරිදි ගියහ. බුදුහු කථා පුවත ගෙනහැර දක්වා මේ ගාථාව වදාළහ.

"යත්ථෙකො ලබතෙ බබ්බු දුතියො තත්ථ ජායති,
තතියො ච චතුත්ථො ච ඉදන්තෙ බබ්බුකා බිළන්ති"

"යම් තැනක බළලකු ගොදුරු ලබා ද එතැන දෙවැනි
බළලකු ද උපදී. තෙවැන්නකු ද සිව්වැන්නකු ද උපදී.
මේ තිගේ පළිඟු ගුහාවකි."

එහි, "යත්ථ", යම් තැනක, "බබ්බු", බළලාය. "දුතියො තත්ථ ජායති", යම් තැනක මියකු හෝ මාංශ ලබා ද එතැන දෙවැනි බළලකු ද ඇති වේ. එසේ ම "තතියො ච චතුත්ථො ච", එදා එහි බළලුන් පස් දෙනෙක් ඇති වූහ. උන් එසේ දිනපතා මස් කමින් " බබ්බුකා", ඒ බළල්ලු පළිඟු ගුහාවට ලයින් පහර දී මරණයට පත්වූහ.

මෙසේ බුදුහු දම් දෙසුම ගෙනහැර දක්වා ජාතකය නිම කළහ. එදින බළලුන් සතර දෙන ඒ භික්ෂූන් සතර දෙන වූහ. මී දෙන කාණ මාතාව වූවාය. ගල් වඩුවා වනාහි මම ම වීමි.

## 1. 14. 8.

# ගෝධ ජාතකය

"**කිං තෙ ජටාහි දුම්මෙධාති**" යන මේ ජාතක දේශනාව බුදු රජහු දෙව්රම් වෙහෙර වසන සේක්, කුහක හෙවත් නැති ගුණ පෙන්වන භික්ෂුවක් අරබයා දෙසූහ. මෙහි වත්මන් කථාව යට කියන ලද කථා හා සමාන වේ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු තලගොයි යෝනියෙහි පිළිසිඳ ගත්හ. එකල්හි අභිඥ්ඥාණ පස උපදවා ගත් උසස් සිල් ගුණ ඇති තවුසෙක් පසල් ගමක් ඇසුරු කොට වන පෙදෙසක පන්සලක වෙසෙයි. ගම් වැසියෝ තවුසාට සැලකිළිමත් ව උවටැන් කරති. බෝසත්හු සක්මන් මඟ කෙළවර තුඹසක වෙසෙති. ඒ අතර දිනපතා ද දෙතුන් වරක් තවුසන් වෙත අවුත් අර්ථ ධර්ම යුත් කථා අසා වැඳ තුඹසට ම යයි. පසුකලෙක තවුසා ගම් වැසියන් විචාරා බැහැර ගියේය. ඒ සිල්වතින් පිරිපුන් තවුසා බැහැර වූ කල්හි වෙනත් දුසිල් තවුසෙක් එම අසපුවට අවුත් වාසය කළේය. බෝසත්හු මොහු ද සිල්වත් තවුසෙකැ යි සිතා පෙර මෙන් ම ඔහු වෙතට ද ගියහ. නියම් කලෙක එක් දවසක් නො කල් වරුෂාවක් වට කල්හි තුඹසෙන් වේයෝ නික්මුණහ. උන් කෑම සඳහා තලගොයි එහි ආහ. ගම් වැසියෝ අවුත් බොහෝ තලගොයින් මරා රසවත් ලෙස ලුණු ඇඹුල් යොදා තලගොයි මස් පිස තවුසාට දුන්හ. තවුසා තලගොයි මස් අනුභව කොට රසයෙන් බැඳී මේ මස් ඉතා රසයි. කවර සතකුගේ මස්දැ යි තවුසා ඇසීය. තලගොයි මස් යි අසා මා ළඟට ද මහත් තලගොයෙක් එයි. උඹ මරා මස් කම් යි සිතා පිසන බඳුනක් ද ගිතෙල් ලුණු ඇඹුල් ආදිය ද ගෙන්වාගෙන පසෙක තබා මුගුරක් කසාවතින් වසා ගෙන පන්සල දොරටුව බෝසතුන්ගේ පැමිණීම බලමින් වෙනදාටත් වඩා ශාන්තව හුන්නේය. බෝසත්හු සවස් කාලයෙහි තවුසා වෙත යම් යි නික්මී යන අතර ඔහුගේ ඉඳුරන්ගේ වෙනස් බවක් දැක මෙසේ සිතූහ. මේ තවුසා හිඳිනා ආකාරය වෙනදා මෙන් නො වේ. අද මා දෙස බලන්නේ ද පවිටු ඇසිනි. ඔහු පරීක්ෂා කරම් යි බෝසත්හු තවුසාට යට වාතයෙහි සිට තලගොයි මස් ගඳ ආඝ්‍රාහණය කොට අද මොහු තලගොයි මස් කන

ලද්දේ විය යුතුය. එම නිසා මොහු රස තෘෂ්ණාවෙන් බැඳී මුගුරෙන් ගසා මා මරා කනු කැමැත්තේ වන්නේය යි ඔහු ළඟට නො ගොස් ආපසු හැරී හැසුරුණහ. තවුසා බෝසතුන්ගේ නො පැමිණීම දැන මොහු විසින් තමා මැරීමට සූදානම් බව දැන ගත්තා විය යුතුය. එම නිසා ළඟට නො එන්නේය. නො පැමිණිය ද අද මාගෙන් මිදීමක් කොයින්ද යි මුගුර ගෙන ගැසීය. මුගුර තලගොයාගේ නගුට අග පමණක් රිදවීය. බෝසත්හු ඉතා වේගයෙන් තුඹස තුළට ගොස් වෙනත් සිදුරකින් හිස ඔසවා, එම්බල හොර තවුස, මා තා වෙත පැමිණියේ සිල්වත් තවුසෙකැ යි යන හැඟීමෙනි. දැන් මම තාගේ හොර තවුස් බව දනිමි. තා වැනි මහා හොරකු හට මේ පැවිදි ආකල්පයෙන් ඇති ප්‍රයෝජනය කිමැ යි කියා ඔහුට ගරහමින් මේ ගාථාව කීහ.

"කිංතෙ ජටාහි දුම්මෙධ, කිංතෙ අජිනසාටියා,
අබ්භන්තරංතෙ ගහණං බාහිරං පරිමජ්ජසීති"

"මෝඩය, තට තවුස් ජටාවෙන් කවර ඵලයක් ද ? අඳුන් දිවි සමෙන් කවර වැඩක් ද ? තාගේ සිත පව්න් පිරී ඇත. බාහිර පෙනුම පමණක් තවුස් පිරිකරින් පිරිමැද තිබේ."

එහි, "කිංතෙ ජටාහි දුම්මෙධ", එම්බා මෝඩය, බාලය, මේ පැවිද්දකු විසින් දැරිය යුතු ජටාව තවුස් ගුණයක් නැති තට කවර ඵලයක් ද යන අර්ථයි. "කිංතෙ අජිනසාටියා", අඳුන් දිවි සමට සුදුසු සංවරයක් නැති බැවින් ඉන් තට කවර වැඩක් ද ? "අබ්භන්තරංතෙ ගහණං", තාගේ සිත රාග, දෝෂ, මෝහ අකුශලින් වැසී ඇත. " බාහිරං පරිමජ්ජසීති", ඒ තා සිත අවුල් ව ඇති කල්හි, ස්ථානාදියෙන් ද ශ්‍රමණාකල්පය ගැනීමෙන් ද පිටත පිරිමදින්නෙහිය. පිරිසිදු කරන්නෙහිය. එසේ පිරිමැදීම කැඳ පිරවූ ලබු කබලක් මෙන් ද විෂ පිරවූ සැළියක් මෙන් ද සර්පයන් පිරුණු තුඹසක් මෙන් ද අසූචි පිරවූ විසිතුරු කළයක් මෙන් ද පිටත සිනිඳු ය. තා වැනි සොරකු මෙහි විසීමෙන් කවර වැඩක් ද ? වහාම මෙතනින් පලා යව. පලා නො යන්නෙහි නම් තාගේ ස්වරූපය ගම් වැසියන්ට කියා ගර්හා කැරවන්නෙමි.

මෙසේ බෝසත්හු පව්ටු තවුසා බිය ගන්වා තුඹසට ම පිවිසියහ. තවුසා ද එතැනින් පලා ගියේය.

බුදුහු මේ කථාව ගෙනහැර දක්වා ජාතකය නිම කළහ. එදා පව්ටු තවුසා කුහක භික්ෂුව විය. පළමු සිටි සිල්වත් තවුසා සැරියුත් තෙරුණුවෝය. ගෝධ පණ්ඩිතයෝ මම ම වීමි.

## 1. 14. 9.

## උභතෝභට්ඨ ජාතකය

**"අක්ඛි භින්නා පටො නට්ඨො'ති"** යන මේ ජාතක දේශනාව බුදු රජහු වේළුවනයෙහි වැඩ වසන සේක්, දෙව්දතුන් අරබයා දේශනා කළහ. එදින දම් සබාවෙහි භික්ෂූහු ඇවැත්නි, යම් සේ දෙපැත්තෙන් ගිනිගත් මැද අසූචි තැවරුණු ජවාලාභය (සොහොන් පෙනෙල්ලා) වනයෙහි දූව කාර්යය නො කෙරෙයි. ගමෙහි දර කාර්යය ද නො කෙරෙයි. දෙව්දත් මෙවැනි නිවනට පමුණුවන සසුනෙහි පැවිදි ව ගිහි සැපතින් ද ශ්‍රමණ ගුණයෙන් ද යන දෙපසින් ම ගිළිහුණේය. බැහැරවූවෙක් වූයේය. බුදු රජහු වැඩමවා මහණෙනි, දැන් කවර කථාවකින් හුන්නාහුදැ යි විචාරා මෙනම් කථාවකින් හුන්නෙමු යි කී කල්හි, මහණෙනි, දෙව්දත් දෙපසින් ම පිරිහුණේ දැන් පමණක් නො වේ. පෙරත් එසේ ම පිරිහිණැ යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු රුක් දෙවියෙක් වී උපන්හ. එකල එක් ගමක බිලී වැද්දෝ වෙසෙති. එක් බිලී වැද්දෙක් බිලි රැහැන ගෙන තම කුඩා පුතු සමග කවදත් මිනිසුන් බිලී බානා දිය හෙබට ගොස් බිලී රැහැන දැමීය. එය දියෙන් වැසුණු කණුවක රැඳුණි. බිලී වැද්දා තැත් කළ නමුත් බිලී රැහැන ඇදීමට නො හැකි ව මෙසේ සිතීය. මේ බිලී රැහැන කිසියම් මහා මත්ස්‍යයකු විසින් ගිල්වන ලද්දේ වන. පුතු යවා අසල් වැසියන්

සමග කළහ කැරවමි. එවිට කොටස් බලාපොරොත්තු නො වෙති යි පුතුට, දරුව, අපට මහා මත්‍ස්‍යයකු ලද බවත් අසල් වැසියන් සමග කළහ කළ යුතු බවත් කියව යි පුතු මව් වෙත යවා බිලි රැහැන ඇදීමට නො හැකි බැවින් රැහැන සිඳේය යන බියෙන් හැඳිවත ගොඩ තබා දියට බැස මත්ස්‍යය ලෝභයෙන් ඒ මේ අත සොයන්නේ, කණුවෙහි වැදී දෙඇසම කණ විණි. ගොඩ තුබූ හැඳිවත ද සොරෙක් ගෙන ගියේය. හෙතෙම මහත් වේදනාවෙන් උමතුව අතින් ඇස් වසාගෙන දියෙන් ගොඩ අවුත් සැලෙමින් ඇඳිවත සොයන්ට විය. ඔහුගේ බිරිය ද අසල් වැසියන් සමග කලහ කොට බලාපොරොත්තු නො වන්නෙමි නම් කැරෙන්නෙමි සිතා එක් කනක තල්පතක් පැළඳ එක් ඇසක් වළන් දූලියෙහි තබරා බලු පැටියකු අතෙහි තබාගෙන අසල් වැසි ගෙයකට ගියාය. ඉක්බිති, එක් යෙහෙළියක් මෙසේ කීවාය. එක් කනෙක තල්පතක් පැළඳ ඇසේ දූළි තවරා පුතකු මෙන් බලු පැටවකු අතින් ගෙන ගෙන්ගෙට යන්නෙහිය. තී උමතු වූවෙහි ද ? මම උමතු වූ තැනැත්තියක් නො වෙමි. මට නිකරුණේ පරිභව කරන්නෙහිය. මම දූන් ගම් දෙටුවාට කියා කහවණු අටක් දඩ ගෙවීමට සළස්වමි. මෙසේ දෙදෙනා ම ඔවුනොවුන් කළහ කොට ගම් දෙටු වෙත ගිහය. කලහය පිළිබඳ විනිශ්චය කරන කල්හි ඇය මත ම දඩ වැටිණි. අනතුරු ව ඇය බැඳ දඩ ගෙවන සේ බල කැරෙමින් තලන්ට පටන් ගත්හ. රුක් දෙවියා ගමෙහි ඇය පිළිබඳ පුවතත් වනයෙහි ඇගේ හිමියාගේ ව්‍යසනයත් දැක කඳතුර සිට එම්බා පුරුෂය, විලයෙහි තගේ ක්‍රියාත් නිෂ්ඵල විය. ගොඩ ක්‍රියාත් එසේ මය. දෙපසින් ම පිරිහී ගියේ යි කියා මේ ගාථාව කීහ.

**"අක්ඛි භින්නා පටො නට්ඨො සඛීගෙහෙ ච භණ්ඩනං**
**උභතො පදුට්ඨකම්මන්තො උදකම්හි ථලම්හි චාති"**

"ඇස් නැසුණේය. ඇඳිවත නටුයේය. තාගේ බිරිය යෙහෙළිය හා ගෙහි කළහය. දිය ගොඩ දෙක්හි ම අධික ක්‍රියා විය."

එහි, "**සඛීගෙහෙ ච භණ්ඩනං**", සඛී නම් යෙහෙළියයි. ඇගේ. ගෙදර තාගේ බිරිය විසින් කළහ කරන ලද්දේය. දබර කිරීම නිසා ඇය බැඳ තලා දඩ ගෙවීමට සලස්වා ඇත. "උභතො

පදුට්ඨකම්මන්තො", මෙසේ දෙතන්හි ම ක්‍රියා දූෂණය විය. නැසුණේය. කවර නම් දෙතන්හි ද, "ඵලමහි", ඇස් අඳ වීමෙන් ද වස්ත්‍රය නැති වීමෙන් ද දියෙහි ක්‍රියා නටුවේය. යෙහෙළි ගෙහි කළහයෙන් ගොඩ ක්‍රියා ද නටුයේය.

බුදුහු මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා ජාතක කථාව නිමවූහ. එදා බිලි වැද්දා නම් දෙව්දත් විය. රුක් දෙවියා වනාහි මම ම වීමි.

## 1. 14. 10.

## කාක ජාතකය

"නිච්චං උබ්බිග්ගහදයාති" යන මේ ජාතක දේශනාව බුදු රජහු දෙව්රම් වෙහෙර වසන සේක්, ඤාති සංග්‍රහය අරබයා දෙසූහ. මෙහි වත්මන් කථාව දොළොස් වැනි නිපාතයෙහි භද්දසාල ජාතකයෙහි එන්නේය.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු කවුඩු යෝනියෙහි උපන්හ. දිනක් රජුගේ පුරෝහිත බමුණා නගරයෙන් බැහැර ගඟක නා සුවඳ විලවුන් ඇඟ ගල්වා මල්මාලා පැළඳ මාහැඟි වස්ත්‍ර හැඳ නගරයට පිවිසියේය. නගර දොරටු තොරණෙහි කවුඩෝ දෙදෙනෙක් සිටියාහ. එයින් එකෙක් අනිකාට, යහළුව, මේ බමුණාගේ හිසට සිරුරු මළ හෙළන්නෙමි යි කීවේය. ඔබට එසේ කිරීමට සිත් නො වේවා. මේ බමුණා අධිපතියෙකි. ඔවුන් සමග ගැටී ඉදින්, ඔහු කිපියේ නම් සියලු කවුඩන් විනාශ කළ හැකි වන්නේය යි අනිකා වැළකීය. එහෙත් මට එය නො කැර සිටිය නො හැකිය. එසේ නම් එම කාර්යයෙන් ඔබ ම ප්‍රවක වන්නේය යි කියා අනෙක් කවුඩා පලා ගියේය. ඉක්බිති, පුරෝහිත බමුණා තොරණ යටට පැමිණෙත් ම ලඹය බහන්නකු සෙයින් බමුණුගේ හිස මත වසුරු හෙළීය. බමුණා මෙයින් කිපී කපුටන් කෙරෙහි වෛර බැන්දේය.

මේ කාලයෙහි බැලයට වී කොටන මෙහෙකාරියක් ගෙය ඉදිරියට වී අව්වෙහි අතුරා රකින්නී, හිඳගෙන ම නිදිගත වූවාය. ඇගේ ප්‍රමාදය දුක දික් ලොම් ඇති එළුවෙක් පැමිණ වී කෑවේය. ඕ නින්දෙන් නැඟිට එළුවා අඬවාපීය. මෙසේ මෙහෙකාරිය තුන්වර දක්වා එළවා මෙසේ සිතුවාය. මෙසේ එළුවා නැවත නැවත ඇය නිදන කල්හි පැමිණ වී කෑවේය. වී කන්නේ නම් අඩක් ම වැය වන්නේය. එවිට මට බොහෝ දොස් වන්නේය. දැන් මම ඉදිරියට නො එන ආකාරයෙන් කරන්නෙමි යි සිතා ගිනි පෙනෙල්ලක් ගෙන නිදන්නාක් මෙන් හිඳ වී කැම සඳහා එළුවා පැමිණි කල්හි නැඟිට ගිනි පෙනෙල්ලෙන් එළුවාට ගැහැව්වාය. ලොම් වලට ගිනි ඇවිලිණි. එළුවා ගින්න නිවා ගැනිම සඳහා දුවගොස් ඇත්හළ ම අබියෙස තණ කුටියක සිරුර අතුල්ලන්ට වූවාය. එය ද ගිනි ගති. එයින් ඇති වූ ගින්නෙන් ඇත්හළ ම ඇවිළිණි. ඇත්හල් ගිනි ගනිත් ම ඇතුන්ගේ පිට දැවී ගියේය. බොහෝ ඇත්තු තුවාල ඇත්තෝ වූහ. වෙද්දු, ඔවුන් සුව කළ නො හැකි බව රජුට සැලකළහ. රජ පුරෝහිතගෙන් විමසීය. ගුරුතුමනි, ඇතුන් සුව කළ නොහැකි බව වෙද්දු කියති. ඔබ, ඔවුන් සුව කළ හැකි බෙහෙතක් දන්නේ ද ? එසේය. මහරජ, දනිමි. එයට අවශ්‍යය කුමක් ද ? මහරජතුමනි, කාක තෙල් අවශ්‍ය වේ. එසේ නම් කපුටන් මරා තෙල් ගෙන එවු යි රජ අණ කළේය. එතැන් පටන් මිනිස්සු කපුටන් මරා තෙල් නැති බැවින් ඒ ඒ තැන රැස් කරත්. කවුඩන්ට මහත් බියක් ඇති විය. එදවස බෝසත්හු අසූ දහසක් කවුඩන් පිරිවරා සොහොන් බිම වනයෙහි වෙසෙත්. එක් කවුඩෙක් ඔවුන්ට ඇති වී තිබෙන මහා විනාශය බෝසතුන්ට සැල කළේය. බෝසත්හු මෙසේ සිතුහ. පැමිණි මේ බය හරින්ට අන් සමතකු නම් නැත. දශ පෙරුම් දම් සිහි කොට මෛත්‍රී පාරමිතාව පෙරටු කොට ඉතා වේගයෙන් පැන හැර තිබුණු වා කවුළුවෙන් රජුගේ අසුන යටට පිවිසියහ. මිනිස්සු ඔහු එළවා දමන්ට තැත් කළෝය. පිහිට පතා මෙහි පැමිණි කපුටා අල්ලා ගැනීම සුදුසු නො වෙතැ යි රජ ඔහු වැළකීය. බෝසත්හු මදක් විඩාහැර මෛත්‍රී පාරමිතාව සිහි කොට යට අසුනින් නික්ම මහරජ, රජු වනාහි ලෝභාදී වශයෙන් නො මඟ නො ගොස් රාජ්‍යය කැරන්ට වටනේය. යමක් කළයුතු නම් එය ඉතා හොඳික් විමසා බලා කටයුතුය. යමක් කළ කල්හි සඵල වේ ද එය ම කටයුතුයි. ඉදින්, රජවරුන් කරනු ලබන යමක් සඵල නො වේ ද එය ම කරත් ද එවිට මහජනයාට මරණය කෙළවර කොට මහත් බිය උපදී. පුරෝහිත බමුණා වෛරයෙන් මුළාව බොරු කීවේය. කපුටන් හට තෙල් නැතැ යි කීය. ඒ අසා රජ සතුටු ව බෝසතුන්ට

රන් පුටුවක් දෙවා එහි හුන් කල්හි පියාපත් අතර සියක්වර දහස්වර සිදන ලද තෙල් ආලේප කොට රන් තැටියක රජුට සුදුසු මිහිරි ආහාර දෙවා පැන් පොවා සුවපත් බවට පැමිණි බෝසතුන්ගෙන් මෙසේ ඇසීය. පණ්ඩිතුමා, කපුටන් ගේ තෙල් නැතැ යි ඔබ කියන්නෙහිය. කවර හේතුවකින් ඔවුන්ට තෙල් නැත්තේ ද ? එවිට බෝසත්හු මේ මේ කාරණයෙන්යැ යි රජ මැදුර සෝෂා පතුරුවමින් දහම් දෙසමින් මේ ගාථාව කීහ.

"නිච්චං උබ්බිග්ගහදයා සබ්බලොකවිහෙසකා,
තස්මා තෙසං වසා නත්ථි කාකානස්මාකඤාතිනන්ති"

"හැමවිට ම තැති ගත් සිත් ඇතියහ. සියලු ලෝ
වැස්සන් වෙහෙසන්නාහ. එහෙයින් අපගේ ඤාතීන් වූ
කපුටන් හට වුරුණු තෙල් නැත්තේය."

මේ ගාථාවේ සංක්ෂේප අදහසයි. මහරජ, කවුඩෝ නම් නිතර ම තැතිගත් සිතින් බියවූවාහු ම වෙත්. සියලු ලෝකයාට ම වෙහෙස ගෙන දෙන්නේය. රජ ආදී මිනිසුන් ද ගැහැනුන් ද පිරිමින් ද කුමර කුමරි ආදීන් ද වෙහෙසමින් පීඩා කැරෙමින් හැසිරෙති. මේ දෙකරුණ නිසා ඒ අපගේ ඤාතීන් වූ කපුටන්ට වුරුණු තෙල් නම් නැත. පෙර ද නො වීය. මතු ද නො වන්නේය.

බෝසත්හු මෙකරුණ මතුකොට පෙන්වා මහරජ, රජු නො විචාරා නො විමසා ක්‍රියා නො කළ යුතුයැ යි රජුට අවබෝධ කළහ. රජ සතුටු ව බෝසතුන් රාජ්‍යයෙන් පිදීය. බෝසත්හු රාජ්‍යය නැවත පවරා පන්සිල්හි පිහිටුවා සියලු සතුන්ට ජීවන දානය ඉල්ලූහ. රජු ද සියලු සතුන්ට අභය දානය දී කපුටන් උදෙසා නිබඳ දන් ඇරඹීය. දිනපතා අමුණක සහල් පිස නොයෙක් රසයෙන් මුසු කොට කපුටු දානය දෙවීය. බෝසතුන්ට රාජ භෝජනය ම දෙනු ලැබීය.

බුදු රජහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා ජාතකය නිම කළහ. එදා බරණැස් රජ ආනන්ද තෙරණුවෝ වූහ. කවුඩු රජ මම ම වීමි.

## තුදුස් වැනි අසම්පදාන වර්ගයයි.

## 1. 15. 1.

## ගෝධ ජාතකය

"න පාපජනසංසෙවිති" යන මේ ජාතක දේශනය බුදු රජනු වේළුවන විහාරයෙහි වසන සේක්, ප්‍රතිපක්‍ෂ සෙවුනා භික්‍ෂුවක් අරබයා මේ ජාතකය දේශනා කළහ. මෙහි වත්මන් කථාව මහිලාමුඛ ජාතකයෙහි කථාව හා සමානය.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු තලගොයි යෝනියෙහි පිළිසිඳ ගත්හ. ඔහු වියට පැමිණ ගංතෙර මහත් ගුහාවක නොයෙක් සියගණන් තලගොයින් පිරිවරා වාසය කළේය. ඔහුගේ පුත් තලගොයි පෝතකයා එක් කටුස්සකු සමග මිත්‍රව ඔහු සමග සතුටුවෙමින් වසන්නේ කටුස්සා වැළඳ ගනිමි යි ඇඟ වැතිරෙයි. මේ දෙදෙනා අතර විශ්වාසය ගෝධ රජුට සැළවිය. ගෝධ රජු කුඩා පුතු කැඳවා දරුව, ඔබ නුසුදුසු තැනක විශ්වාසය තැබූවෙහි. කටුස්සෝ හීන ජාතියකි. ඔවුන් සමග විශ්වාසය නො කළ යුතුය. ඉදින්, ඔබ ඔහු විශ්වාස කරන්නේ නම් ඒ කටුස්සා නිසා මේ සියලු තලගොයි සමූහය විනාශ වන්නේය. මෙතැන් පටන් කටුස්සා සමග විශ්වාස නො කරව යි කීහ. එහෙත් පුත්‍රයා මිත්‍රත්වය පැවැත්වීය. බෝසත්හු නැවත නැවත කීව ද මේ මිත්‍රබව වැළැක්වීමට නො හැකි විය. මේ අතර බෝසත්හු මේ කටුස්සා නිසා අපට බියක් වන්නේ නම් පැන යා හැකි මඟක් තනන්ට වටනේ යි සිතා එක් පසෙකින් සුළං වදනා සිදුරක් කැරවීය. බෝසතුන්ගේ පුත්‍රයා ද මහා සිරුර ඇත්තේ විය. කටුස්සා නම් එපමණ ම විය. ගෝධ පුත් කටුස්සා වැළඳ ගනිමි යි අතරතුර ඇග වැතිරේමය. කටුස්සාට පර්වතයක් වැතිරෙන්නාක් මෙන් දූනේ. ඌ පීඩාවට පත්ව මෙසේ සිතී. මේ තලගොයා මේ අයුරින් මා ඇඟ වැතුරණහොත් මගේ ජීවිත නැත. එක් වැද්දකු සමග යහළුව මේ තලගොයි රංචුව වනසා දමන්නෙමි යි එක් දවසක් නියං වැසි වට කල්හි තුඹසින් මෙරු නැංගාහ. තලගොයි ඒ ඒ තැනින් නික්ම මෙරුන් කෑහ. එක් තලගොයි වැද්දෙක් තලගොයි ගුහාව බඳිනා පිණිස උදැල්ලක් ගෙන වනයට පිවිසියේය. කටුස්සා ඔහු දැක අද මම මගේ මනදොළ පුරවා ගනිමි යි ඔහු වෙත එළැඹ බිම වැතිර පින්වත් පුරුෂය, වනයෙහි

හැසිරෙන්නේ මක් නිසාදැ යි ඇසීය. තලගොයින් සඳහායැ යි කීය. මම සියගණන් ගෝධයින් සිටිනා බිලක් දනිමි. ගිනි ද පිදුරු ද ගෙන එව යි ඔහු ලවා ගෙන්වා ගෙන වැද්දා තලගොයි නිවාසයට පමුණුවා මෙතනින් පිදුරු දමා ගිනි දල්වා හාත්පස බල්ලන් තබවා තමා මහා මුගුරක් ගෙන නික්මෙන සෑම තලගොයෙක් ම තලා මරා එක්රැස් කැරව යි කියා අද මම මගේ සතුරා පිටු දකිමි යි එක් තැනක හිස ඔසවා වැතිර සිටියේය. වැද්දා ද පිදුරු දුම් දුන්නේය. දුම බිල තුළට වන් කල්හි දුමින් අඳ වූ තලගොයි මරණ බයෙන් තැතිගෙන නික්මී පලායන්ට පටන් ගත්හ. වැද්දා නික්මුණු නික්මුණු එකා ගසා මරා දැමූහ. ඔහුගෙන් මිදුණු තලගොයි බල්ලෝ ඩැහැගත්හ. ගෝධයින්ට මහත් විනාශයක් විය. බෝසත්හු මේ මහා විනාශය කටුස්සා නිසා උපන් බව දැන පවිටු පුද්ගලයන් හා මිත්‍රබව නො කළ යුතුය. පවිටුන් නිසා සැපයක් නම් නැත. එක පවිටු කටුස්සකු නිසා මේසා විනාශයක් වූයේයැ යි වාත බිලයෙන් නික්මී පලායමින් මේ ගාථාව කීහ.

"න පාපජන සංසෙවී අච්චන්තසුඛමෙධති,
ගොධාකුලං කකණ්ටාව කලිං පාපෙති අත්තානන්ති"

"පාප ජනයන් සෙවුනා පුද්ගලයා ඒකාන්තයෙන් සුව
නොලබයි. කටුස්සා තලගොයි සමූහයා නැසුවක් මෙන්
තමාද එක් වූවන්ද විනාශය පමුණුවයි."

මේ මෙහි ලුහුඬු අර්ථයයි. **"පාප ජනසංසෙවී"**, පවිටු ජනය අසුරු කරන පුද්ගලයා, **"අච්චන්තසුඛං"**, ඒකාන්ත සැපය නිරතුරු සැපය නම්, **"න එධති"**, නො ලබයි. කෙසේ ද යත්, **"ගොධාකුලං කකණ්ටාව"**, යම් සේ තලගොයි සමූහය කටුස්සාගෙන් සැප නො ලැබුවේ ද, එමෙන් පවිට ජනයන් සේවනය කරන්නා ඒකාන්තයෙන් **"කලිං පාපෙති අත්තානංන්ති"**, මෙහි **"කලි"** නම් විනාශයයි. පාප සේවී පුද්ගලයා තමා ද අන්‍යයා ද තමා සමග ම විනාශයට පමුණුවයි.

පාළියෙහි වනාහි **"එලංපාපෙතීති"** යනුවෙන් ද ලියයි. ඒ ව්‍යඤ්ජනය අටුවාවෙහි නැත. අර්ථය ද මෙතැනට නො ගැළපේ. එම නිසා කියන ලද අයුරින් ම ගත යුතුයි.

. බුදු රජහු මෙම දහම් දෙසුම ගෙනහැර දක්වා ජාතකය නිම කළහ. එදා කටුස්සා නම් දෙව්දත් විය. බෝධි සත්ත්ව පුත්‍රයා ප්‍රතිපක්ෂයේ වූ භික්ෂුව විය. ගෝධ රාජයා මම ම වීමි.

## 1. 15. 2.

## සිඟාල ජාතකය

"එතං හි තෙ දුරාජානන්ති" යන මේ ජාතකය බුදු රජහු වේළුවන වෙහෙරෙහි වසන සේක්, දෙව්දත් බුදු රජුන් නැසීමට ගත් උත්සාහය අරබයා දේශනා කළහ. දම් සබාවෙහි භික්ෂූන්ගේ කථාව අසා මහණෙනි, දෙව්දත් මා නැසීමට තැත් කළේ දැන් පමණක් නො වේ. පෙරත් මා නසනු පිණිස තැත් කළේ මැයි. එහෙත් මා නැසීමට නො හැකි විය. තෙමේ ම පීඩාවට පැමිණියේ යි වදාරා අතීත කථාව වදාළහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු සිවල් යෝනියෙහි ඉපිද සිවල් රජෙක් වී සිවල් සමූහය පිරිවරාගෙන සොහොන් වනයෙහි වාසය කළහ. එකල්හි රජගහ නුවර උත්සවයක් විය. මේ උත්සවයේ දී මිනිස්සු බෙහෙවින් සුරා පානය කරත්. එය සුරා උත්සවය නම් විය. එකල එහි බොහෝ ධූර්ත (සලෙළු) ජනයා බොහෝ සුරා ද මස් ද ගෙන්වා සැදී පැහැදී ගී ගයමින් සුරා පානය කරත්. මස් ද කති. රාත්‍රියෙහි පළමු යම අවසානයෙහි මස් අවසන් විය. සුරා බොහෝ ඉතිරි විය. එහි දී එක් සලෙළුවෙක් මස් දෙව යි කී කල්හි මස් අවසන් බව කීහ. එවිට ධූර්තයා මා සිටින තාක් මස ක්ෂය වීමක් නම් නැතැ යි කියා අමු සොහොනට ගොස් මළ මිනී කෑමට පැමිණි සිවළුන් මරා මස් ගෙනෙමි යි මුගුරක් ගෙන දිය බැස යන මඟින් නුවරින් නික්ම සොහොනට ගොස් මළ අයකු මෙන් උඩුකුරු ව හොත්තේය. එකල්හි බෝසත්හු සිවල් රැළ පිරිවරාගෙන එහි ගියාහු, සලෙළුවා දැක මේ මළ මිනියක් නො වන බව දැක වඬාත් විමසිමි යි යටි සුළඟින්

ගොස් සිරුරෙහි ජීව ගඳ ඉව කොට එපමණකින් ම ඔහු නො මළ බව දැන ලජ්ජා කොට ඔහු පලවා හරිමි යි සිතා ළඟට ගොස් මුගුරු කෙළවර කටින් ඩැහැ ඇද්දාහ. ධූර්තයා මුගුර අත නො හැරියේය. ඔහු වඩවඩාත් දැඩි කොට අල්ලාගත් බෝසත්හු පැත්තක පැන එම්බා. පුරුෂය, ඉදින්, තා මැරුණෙහි නම් මා මුගුර අදිත් ම ඉතා දැඩි කොට අල්ලා නො ගත්තෙහිය. මේ කාරණයෙන් තා මළ නො මළ බව දැන ගැනීම පහසු වී යි කියා මේ ගාථාව කීහ.

**"එතං හි තෙ දුරාජානං යං සෙසි මතසායිකං,**
**යස්ස තෙ කඩ්ඪමානස්ස හත්ථා දණ්ඩො න මුච්චතීති"**

"යම් හෙයකින් මළ එකක්හු සේ හොත්තෙහි ද, මුගුර
අදනා කල්හි අතින් නො මිදේ ද එයින් තා මළ නො
මළ බව දැනීම දුෂ්කරය."

එහි, **"එතං හි තෙ දුරාජානං"**, තාගේ කාරණය දැනීමට අපහසු නො වේ. **"යං සෙසි මතාසායිකං"**, යම් කාරණයික් තා මෘතශ්‍යයාවෙන් හෝනේ ද, මළ මිනියක සේ නිදන්නෙහි ද, **"යස්ස තෙ කඩ්ඪමානස්ස"**, තාගේ මුගුරු කෙළවරින් අදින කල්හි අතින් නො මිදේ ද එහෙයින් තා ඇත්ත වශයෙන් මළ මිනියක් නො වේ.

මෙසේ කී කල්හි ඒ ධූර්තයා ඔහු මා නො මළ බව දනිතැ යි නැඟිට මුගුරින් දමා ගැසීය. එහෙත් මුගුර වැරදිණි. යව. පහර වැරදුනා යි කීය. එවිට බෝසත්හු නැවත බලා එම්බල පුරුෂය, මා වැරදුන හට අට මහා නිරය, සොළොස් කුඩා නිරය නම් නො වරදින්නේ යි ගියහ. ධූර්තයා කිසිවක් නො ලැබ සොහොනෙන් නික්ම කාණුවෙන් නහා ආ මඟින් ම නුවරට පිවිසියේය.

බුදු රජහු මේ දම් දෙසුම පවත්වා ජාතකය නිමා කළහ. එදා ධූර්තයා දෙව්දත් විය. සිවල් රජු මම ම වීමි.

## 1. 15. 3.

## විරෝචන ජාතකය

"ලසී ච තෙ නිප්ඵලිතාති" යන මේ ජාතක දේශනාව බුදුහු වේළුවනයෙහි වැඩ වසන සේක්, ගයා ශීසයෙ දී දෙව්දත්ගේ බුද්ධ ආකල්පය දක්වීම අරබයා දෙසූහ.

දෙව්දත් වනාහි ධ්‍යානයෙන් හා ලාභයෙන් හා ගරු බුහුමනින් පිරිහී ගියේ, තවත් උපායක් ඇතැ යි සිතා වරපස ඉල්ලා නො ලැබ දෙඅගසව් තෙරණුවන්ගේ අතවැසි නවක පැවිදි වූ ධර්ම විනය නො හසළ පන්සියක් භික්ෂූන් ගෙන ගයා ශීසයට ගොස් භික්සඟන බිඳ එක සීමාවක් තුළ වෙන වෙන ම සංඝ කර්ම කළේය. බුදු රජහු, ඒ භික්ෂූන්ගේ නැණ නුවණ මුහුකුරා යන කාලය දැන දෙඅගසව් තෙරුණුවන් එහි යැවූහ. දෙව්දත් ඔවුන් දැක සතුටු සිතින් රාත්‍රියෙහි දම් දෙසමින්, බුදු රජුන් අනුකරණය කැරෙමි යි බුද්ධාකල්පය පෙන්වමින් සැරියුත් තෙරණුවන් අමතා ඇවැත්නි, සාරිපුත්‍රය, මෙහි සිටින සඟ පිරිස සිත, කය අලස බැවින් දුරුය. ඔවුන්ට සුදුසු දැහැමි කථාවක් ඔබට වැටහේවා. මගේ පිට රිදෙයි. මම මදක් විඩා හරිමි යි කියා නින්දට ගියේය. දෙඅගසව්වෝ ඒ භික්ෂූනට දම් දෙසා මඟඵලයෙන් නැණවත් කොට ඒ සියල්ලන්ම රැගෙන වේළුවනයට ම පෙරළා පැමිණියහ. මේ අතර කෝකාලික භික්ෂුව හිස් වෙහෙර දැක දෙව්දත් ළඟට ගොස් ඇවැත්නි දේවදත්තය, දෙඅගසව්වෝ පිරිස බිඳ විහාරය හිස් කොට පිරිස රැගෙන ගියාහුය. ඔබ තවමත් නිදන්නෙහිදැ යි කියා ඔහු සිවුර ඉවත් කොට බිත්තියට තබා පිටිකටුව ඇණ ගසන්නාක් මෙන් විලුඹින් ළයට පහරක් ගැසුවිය. එකණෙහි ම ඔහුගේ මුවින් ලේ වැතිරිණි. එතැන් පටන් ඔහු ගිලන් විය. බුදු රජහු සැරියුත් තෙරුන්ගෙන් ම විචාළහ. සාරිපුත්‍රය, තොප යන කළ දෙව්දත් හැසුරුණේ කෙසේ ද ? ස්වාමීනි, දෙව්දත් මා දැක බුදු රජුන්ට අනුව ක්‍රියා කරන බව පෙන්වා මහත් විනාශයකට පැමිණියේය. සාරිපුත්‍රය, දෙව්දත් මා අනුකරණය කොට විනාශයට පැමිණියේ දැන් පමණක් නො වේ. පෙර ද පැමිණයේ යි වදාරා තෙරුන් විසින් අයදනා ලද්දාහු, ඉකුත් කථාව ගෙනහැර දක්වූහ:

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු කෝෂර සිංහ රාජයකු වී හිමවත් පෙදෙසෙහි රන් ගුහාවක වාසය කළහ. එක් දවසක් සිහ රජු ගුහාවෙන් නික්ම ඇඟමැලි හැර සිව් දිශාව බලා සිංහ නාද කොට ගොදුරු පිණිස යන්නහු, මහමීමෙකු මරා රසවත් මස අනුභව කොට එක් විලකට බැස මිණිවන් ජලයෙන් කුස පුරවා ගුහාව දෙස යමින් සිටියහ. එකල සිවලෙක් ගොදුරු පිණිස යන්නේ, හදිසියේ ම සිංහයා දැක පලායන්ට නො හැකි ව සිංහයා ඉදිරියේ පාමුල වැටී වැතිරී සිටියේය. කෙසේ ද සිවල යි සිංහයා කීය. ස්වාමීනි, මා ඔබට උවටැන් කරනු කැමැත්තෙමි. එවු. මැනවි. මට උවටැන් කැරව. තට මස් දෙන්නෙමි යි සිවලා ද ගෙන ගුහාවට ගියහ. එතැන් පටන් සිවලා සිංහයා ඉඳුල් කළ මස් කයි. ටික දිනකින් ම සිවලාගේ සිරුර මහත් විය. දිනක් ගුහාවේ වැතිරී සිටි සිංහයා මෙසේ කීය. සිවල, යව. මේ කඳු මුදුනෙහි හෝ කඳු පාමුල හැසිරෙන ඇත්, අස්, මී ආදී යමකුගේ මස් කනු කැමැත්තෙහි නම් උඹ බලා අවුත් අසවල් මස කනු කැමැති වෙමි යි කියා මා වැඳ ස්වාමීනි, බබලනු මැනවි යි කියව. මම උඹ මරා මස් අනුභව කොට තට ද දෙමියි. සිවලා ද කඳු ශිකර පාදයෙහි හැසිර විවිධ සිව්පාවුන් බලා යමකුගේ මස් කනු කැමැත්තේ වේ ද රන් ගුහාවට ගොස් සිංහයාට උඹ හඳුන්වා පාමුල වැටී බබළනු මැනවැ යි කියති. සිංහයා ද වහා පැන ගොස් මහැතතු වුව ද එතැන දී ම ඔහු මරා ප්‍රණීත මාංශ අනුභව කොට සිවලාට ද දෙයි. හිවලා බඩපුරා මස් කා ගුහාවට පිවිස නිදයි.

කල්යත් ම උගේ මානය වැඩිනි. මම ද සිව්පාවෙක් වෙමි. දිනපතා කුමක් නිසා මම අනුන් විසින් පෝෂණය කරනු ලබමින් වෙසෙම් ද ? මෙතැන් පටන් මම ද ඇත් ආදීන් මරා මස් කමි යි සිංහ රාජයා ද ස්වාමීනි, බබළනු මැනවැ යි කී කල්හි ඒ වචන බලයෙන් ඇතුන් මරයි. මම ද සිංහයා ලවා හිවලා, බබළනු මැනවැ යි කියවා ගෙන මතැතතු මරා මස් කමි යි සිතා සිංහයා වෙත ගොස් කීය. ස්වාමීනි, මම දිගු කලක් ඔබ විසින් මරන ලද ඇතුන්ගේ මස් කෑවෙමි. මම ඇතකු මරා මස් කනු කැමැත්තේ වෙමි. ගුහාවෙහි ඔබ හොත්නා තැන මම වැතිරී සිටිමි. ඔබ පර්වත පාදයෙහි හැසිරෙන ඇතකු බලා මා වෙත අවුත් සිවලානෙනි, බබළනු මැනවැ යි කියන්න. ඔබතුමා මෙපමණකට මසුරු නො වන්න. ඉක්බිති, සිංහයා

සිවලාට, සිවල, ඇතුන් මැරීමට සමතුන් සිවල් කුලයෙහි උපන්නේ නැත. තෝ ද සිවල් කුලයෙහි උපන්නෙකි. ඇතුන් මරා මස් කෑමට සමත් සිවලකු ලෝකයේ ම නැත. එම නිසා තගේ අදහස අත් හරිනු. මා මරනා ඇතුන්ගේ මස් කා වසව යි සිංහයා මෙසේ කීව ද හිවලා එයින් මිදෙන්ට කැමැති නො වීය. නැවත නැවත ඉල්ලීය. සිංහයා ඔහු වැළැක්වීමට නො හැකි නිසා පිළිගෙන එසේ නම් යහළුව, මා වැතිර සිටි තැනට ගොස් වැතිරී සිටිනු යි සිවලා රන් ගුහාවෙහි හිඳුවා කඳුපාමුල ඇතකු බලා ගුහා දොරටුවට අවුත් සිවලාණෙනි, බබළනු මැනවැ යි කීය. හිවලා රන් ගුහාවෙන් නික්මී ඇඟමැලි ඇර සිව් දිශාව බලා තුන් වරක් නාද කොට මතැතකුගේ කුඹයට පනිමි යි පාමුල වැටුණේය. ඇතු දකුණු පය ඔසවා හිස තැලීය. හිසෙහි ඇටකටු සුණු විසුණු විය. ඉක්බිති, ඇතා හිවලාගේ ශරීර කොටස් පයින් එකතු කොට ඒ මත්තෙහි ඇත් බෙටි හෙළා කුඤ්ච නාද කැරෙමින් වනයට ගියේය.

බෝසත්හු මෙපුවත් දැක දූන් හිවල බබළනු මැනවැ යි කියා මේ ගාථාව කීහ.

"ලසී ච තෙ නිප්ඵලිතා මත්ථකො ච විදාළිකො,
සබ්බාතෙ ඵාසුකා භග්ග අජ්ජ ඛො ත්වං විරෝචසීති"

"තගේ හිස් මුල් ද පිටතට නික්මුණේය. හිස ද පලන ලද්දේය. සියලු ඉළ ඇට බිඳුණේය. අද තෝ බබළන්නෙහිය."

එහි, "ලසී", හිස් මුල්ය. "නිප්ඵලිතා", නික්මුණේය.

බෝසත්හු මේ ගාථාව කියා දිවි ඇතිතාක් සිට කම් වූ පරිදි ගියේය. බුදුහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා ජාතකය නිමවූහ.

## 1. 15. 4.

## නඞ්ගුට්ඨ ජාතකය

"බහුම්පෙතං අසබ්භිජාතවෙදාති" යන මේ ජාතක දේශනාව බුදු රජහු දෙව්රම් වෙහෙර වසන සේක්, මිසදිටු තපස් ක්‍රම අරබයා දෙසූහ. එකල ආජීවකයෝ දෙව්රම පිටුපස විවිධාකාර මිසදිටු තපස්හි හැසිරෙත්. භික්ෂූහු ඔවුන්ගේ උක්කුටිකයෙන් සිටීම නැමැති තපස, වවුල් ව්‍රතය, කටු යහනහි හෙවීම, ගිනි පසකින් සිරුර තැවීම ආදී නානාප්‍රකාර මිසදිටු තපස් ක්‍රම දැක බුදු රජුන්ගෙන් විමසූහ. ස්වාමීනි, මේ තපස් ක්‍රම නිසා මොවුන්ට වැඩීමක් ඇත්තේ ද ? මහණෙනි, මේ මිථ්‍යා තපස් නිසා කුසලයක් හෝ වැඩීමක් නො වන්නේය. පෙර නුවණැත්තෝ මේ තපස් නිසා කුසල් වැඩීමක් ඇතැ යි සිතා උපන් දින ගිනි රැගෙන වනයට ගොස් ගිනි පිදීම් ආදියෙන් කිසි ම වැඩීමක් නො දැක ගින්න ජලයෙන් නිවා කිසුණු පිරියම් කොට අභිඥා හා අට සමවත් උපදවා බඹ ලොව ගියාහුයැ යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු උසස් බමුණු කුලයෙහි උපන්හ. ඔහුගේ මව්පියෝ ඔහු උපන් දිනයෙහි ගිනි දල්වා තැබූහ. ඔහු සොළොස් වස් කල මෙසේ කීහ. පුත, මේ ඔබ උපන් දිනයෙහි ගින්නයි. ඉදින්, ඔබ ගිහි ගෙයි වසනු කැමැත්තේ නම් ත්‍රිවේදය උගෙන ගනුව. බඹ ලොව යනු කැමැති නම් මේ ගින්න රැගෙන වනයට ගොස් ගින්න පුදමින් මහබඹුන් සිත් ගෙන බඹ ලොවට සුදුස්සෙක් වෙව යි කීහ. කුමරා, මට ගිහි ගෙයින් කම් නැතැ යි උපන් දින ගින්න ගෙන මහා වනයට පිවිස අසපුවක් තනා ගෙන ගිනි පුදමින් වනයෙහි විසී. ඔහු දිනක් පසල් ගමකින් දාන වශයෙන් ගවයකු ලැබ අසපුවට ගෙන ගොස් මෙසේ සිතී. ගිනි දෙවියන්ට ගව මස් කවමි යි සිතත් ම මෙහි ලුණු නැත. ලුණු නැති මස් ගිනි දෙවියාට නම් බුදිනු නො හැක්කේය. එම නිසා ගම් පියසට ගොස් ලුණු ගෙනවුත් ලුණු සහිත මස් ගිනි දෙවියන්ට පුදමි යි ගවයා එතැන ම බැඳ තබා ලුණු පිණිස ගමට ගියේය. ඒ අතර වැදි රංචුවක් එතැනට පැමිණ ගවයා දැක උඟු මරා

මස් පිස අනුභව කොට නගුට, කෙන්ඩා, හම පමණක් ඉතිරි කොට ඉතිරි සියලු මස් රැගෙන ගියහ. බමුණා අවුත් නගුට ආදිය පමණක් ඉතිරි ව තිබෙනු දැක මෙසේ සිතී. මේ ගිනි දෙවියා තමාට අයිති දේ පවා රැකීමට අසමත්ය. ඒ දෙවියා කෙසේ නම් මා රකී ද ? මේ ගිනි පිදුම නිෂ්ඵලය. මෙයින් කුසලයක් හෝ වැඩීමක් නො වන්නේය. ඔහු ගිනි දෙවි පිදීමේ අදහස අතහැර එම්බා දෙවියනි, ඔබ තමා සතු දෙය පවා රැකීමට අසමත්ය. කෙසේ නම් මා රකින්නේ ද ? මාංශ නැත. මෙපමණකින් සතුටු වව යි නගුට ආදිය ගින්නෙහි දමමින් මේ ගාථාව කීහ.

"බහුමෙපතං අසබ්භි, ජාතවෙද, යං තං වාලධිනාභිපූජයාම්
මංසාරහස්ස නත්ථජ්ජ මාසං නඞ්ගුට්ඨම්පි භවං පටිග්ගහාතූති"

"අසත් පුරුෂ වූ ගිනි දෙවියනි, තමා සතු දේ රැකීමට නො හැකි ඔබට නගුට ද වැඩිය. නැගුටෙන් ගිනි දෙවි පුදමු. මාංශානුභවයට සුදුසු තට අද මස් නැත. නගුට පමණක් පිළිගනු."

එහි, "බහුමෙපතං", මෙපමණක් ද වැඩිය. "අසබ්භි", අසත් පුරුෂය, යහපත් නැත්ත, "ජාතවෙද", මෙයින් ගින්නට අමතයි. ගින්න උපන් කෙණෙහි ම පෙනේනු යි, ප්‍රකට වේනු යි "ජාතවෙද", යි කියයි. "යං තං වාලධිනාභිපූජයාම්", අපි අද, තමා සතු දෙය පවා රැකීමට අසමත් දෙවියන් වලිගයෙන් පූදමු. එයත් ඔබට වැඩි දෙයකි. " මංසාරහස්ස", මස් අනුභවයට සුදුසු ඔබට අද මස් නැත. "නඞ්ගුට්ඨම්පි භවං පටිග්ගහාතූති", තමා සතු දේ රැකීමට අසමත් පින්වත් දෙවියා කුර සහිත කෙණ්ඩා, සම හා වලිගය පිළිගනිත්වා.

මෙසේ බෝසත්හු ගින්න ජලයෙන් නිවා ඍෂි පැවිද්දෙහි පැවිදි ව අභිඥා සමාපත්ති උපදවා බඹ ලොව උපන්නේය. බුදුහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා ජාතකය නිම කළහ. ගිනි නිවි තවුසාණෝ මම ම වීමි.

## 1. 15. 5.

## රාධ ජාතකය

"න ත්‍වං රාධ, විජානාසිති" යන මේ ජාතක දේශනාව බුදු රජහු දෙව්රම් වෙහෙර වසන සේක්, ගිහිකල භාර්යාවගේ පෙළඹවීමක් අරබයා දෙසූහ. මෙහි වත්මන් කථාව ඉන්‍ද්‍රිය ජාතකයෙහි එන්නේය. බුදු රජහු එම භික්‍ෂුව අමතා මහණ, මාගමුන් නො රැකිය හැකිය. ඔබ පෙර මාගමක ආරක්‍ෂකයන් තබා රැක්මට තැත් කළ ද නො හැකි විය. දැන් කෙසේ නම් රකින්නෙහි ද ? වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරන කල්හි බෝසත්හු ගිරා යෝනියෙහි පිළිසිඳ ගත්හ. එක්රා බමුණෙක් බෝසතුන් ද කනිටු සොහොයුරා ද පුත්‍ර ස්ථානයෙහි තබා ඇතිදැඩි කළේය. බෝසතුන්ගේ නම පොට්ඨපාද නම් විය. කනිටු සොහොයුරු රාධ නම් විය. බමුණුගේ බිරිය ආචාරශීලී නො වූවාය. බමුණා වෙළඳාම පිණිස යන්නේ, දෙසොහොයුරන් අමතා දරුවනි, තොපගේ මව් බැමිණිය අනාචාරයෙහි හැසිරෙන්නී නම් ඇය එයින් වළක්වනු. එවිට බෝසත්හු පියාණෙනි, මැනවි. ඉදින්, හැකිනම් වළක්වමි. නො හැකි නම් නිශ්ශබ්ද වෙමි. මෙසේ බමුණා බැමිණිය ගිරවුන්ට පවරා දී වෙළඳාම පිණිස ගියේය. ඔහු ගිය තැන් පටන් බැමිණිය පිළිසාචාරයෙහි හැසිරීමට පටන් ගත්තීය. ගෙට ඇතුළුවන්නන්ගේත් පිටවන්නන්ගේත් කෙළවරක් නො වීය. ඇගේ ක්‍රියා පිළිවෙළ දුටු රාධ බෝසතුන්ට සොහොයුර, අප පියා, ඉදින් තොප මව අශීලාචාර වන්නී නම් වළක්වන ලෙස කියා ගියේ නො වේ ද ? දැන් ඇය නො සිරිතෙහි යෙදෙයි. ඇය ඉන් වළක්වමු. එවිට බෝසත්, සොහොයුර, ඔබ අවියත් බව නිසාත් මුහුකුරා නො ගිය නිසාත් මෙසේ කියන්නෙහිය. මාගමුන් වනාහි කරතබා හැසුරුණා ද රැකියා නො හැක්කේ මය. මේ ක්‍රියාවක් නො කළ හැකි නම් එය කරන්ට නො වටනේයැ යි කියා මේ ගාථාව කීහ.

"න ත්‍වං රාධ, විජානාසි අඩ්ඪරත්තෙ අනාගතෙ,
අව්‍යායතං විලපසි විරත්තා කොසියායනෙති"

"රාධය, මධ්‍යම රාත්‍රිය එන්ට පෙර ම කොතෙක් පුරුෂයෝ පැමිණියාහුදැ යි නො දන්නෙහිය. ඔබ අරුත් නැති වචන කියන්නෙහිය. බැමිණිය බමුණා කෙරෙහි නො අමණාය."

එහි, "විරත්තා කොසියායනෙති", අපගේ මව වූ කොසියායනී බැමිණිය අප පියට නො ඇළුණිය. ආදරයක් නැත. ඉදින්, ඇයට පියා කෙරෙහි ආදරයක් - ආලයක් ඇත්තී නම් මෙසේ අනාචාරයෙහි නො හැසිරෙන්නීය. මේ වචනවලින් මේ අදහස ප්‍රකාශ කළේය.

මෙසේ ප්‍රකාශකොට රාධට බැමිණිය සමග කීමට අවකාශ නුදුන්නේය. ඒ බැමිණිය ද බමුණා නො එන තුරු සිත් පරිදි හැසිරුණිය. බමුණා අවුත් දරුව, මවගේ හැසිරීම කෙසේ වීදැ යි පොට්ඨපාදගෙන් විමසීය. බෝසත්හු සියලු පුවත් කියා පියාටණනි, මෙබඳු දුසිල් ස්ත්‍රියක් කුමටදැ යි කියා පියාණෙනි, අප මවගේ දොස් කී තැන් පටන් මෙහි විසීමට නො හැකිය. බමුණාගේ පා වැඳ රාධ සමග ඉගිලී වනයට ම ගියේය.

බුදු රජහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා සිව්සස් වදාළහ. කලකිරුණු භික්ෂුව සෝවාන් විය. එදා බමුණා හා බැමිණිය මේ දෙදෙනා ම වූහ. රාධ ආනන්ද තෙරුණුවෝ වූහ. පොට්ඨපාද මම ම වීමි.

## 1. 15. 6.

## කාක ජාතකය

"අපි නු හනුකා සන්තා" යන මේ ජාතක දේශනාව බුදු රජහු දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, මහළු තෙරුන් සමූහයක් අරබයා දෙසූහ. ඔවුහු ගිහිකල සැවැත් නුවර මහත් සම්පත් ඇති ඔවුනොවුන්

යහළු වූ කෙළඹි පුත්‍රයෝය. ඔවුහු එකතුව පින් කරන්නාහු, බුදු රජුගෙන් දහම් අසා මහළු වූ අපට ගිහි ගෙයින් කවර වැඩක්දැ යි පරම සත්‍යය වූ සසුනෙහි පැවිදි වී දුක් කෙළවර කරමු යි සිතා සියලු ධනය දූ පුතුන්ට දී හඬා වැටෙන ඤාතීන් අත්හැර පැවිදි වූහ. පැවිදි වුව ද පැවිද්දට අනුරූපව මහණ දම් නො පිරූහ. මහළු වී පැවිදි වූ හෙයින් ධර්මය ද නො හැදෑරූහ. ගිහි කල මෙන් පැවිදි කල ද විහාරය කෙළවර සෙනසුනක් කැරවා එක තැන ම විසූහ. පිඬු පිණිස හැසිරෙන්නාහු, වෙනත් තැනකට නො ගොස් බෙහෙවින් තමාගේ අඹු දරුවන්ගේ ගෙට ගොස් වැළඳූහ. එයින් එක් මහළු භික්ෂුවකගේ ගිහි කල භාර්යාවක් සියලු මහළු තෙරුන්ට ම උපකාර වූවාය. එම නිසා සෙස්සෝ ද තමා ලද අහර ඇගේ ගෙදර ම හිඳ වැළඳූහ. ඇය ද ඔවුන්ට ඇය විසින් පිළියෙල කරන ලද සූපව්‍යඤ්ජන දෙන්නීය. ඇය හටගත් රෝගයකින් කළුරිය කළාය. ඉක්බිති, ඒ මහළු තෙරවරු ඔවුනොවුන්ගේ ගෙළ බදාගෙන මිහිරි රස ඇති උපාසිකාව මළා යි විහාරය කෙළවර හඬමින් හැසුරුණාය. හඬන ශබ්දය අසා භික්ෂූන් එහෙන් මෙහෙන් රැස්ව ඇවැත්නි, කුමක් නිසා හඬන්නාහුදැ යි විමසූහ. අප යහළු භික්ෂුවකගේ මිහිරි අතිරස ඇති ගිහි කල භාර්යාව කළුරිය කළාය. අපට මහත් සේ උපකාර කළාය. දැන් එවැනි අයෙක් කෙසේ ලබන්නනේදැ යි, මේ කරුණ නිසා හඬන්නෙමු යි කීහ. මොවුන්ගේ මේ නුසුදුසු ක්‍රියාව දැක භික්ෂූහු දම් සබාවේ දී මෙ පුවත මතු කළහ. ඇවැත්නි, ඒ මහළු තෙරවරු මෙසේ හැසිරෙති යි කථා ඉපදුවෝය. බුදුහු දම් සබාවට වැඩම කොට මහණෙනි, දැන් කවර කථාවකින් හුන්නාහුදැ යි විචාරා මෙවන් කථාවකින් හුන්නෙමු යි කී කල්හි, මහණෙනි, ඒ භික්ෂූහූ ඇගේ මරණය නිසා හැඬුවෝ, දැන් පමණක් නො වේ. මහණෙනි, පෙර ද මොවුහු කාක යෝනියෙහි ඉපිද මුහුදේ දී මළ මැය නිසා මුහුදෙහි ජලය හිස්කොට මැය ගොඩගනිමු යි උත්සාහ කළාහු, පණ්ඩිතයන් අසා ජීවිතය ලැබුවාහු යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු මුහුදු දෙවියෙක් වී උපන්හ. එකල කවුඩෙක් තම බිරිය වූ කැවිඩිය රැගෙන ගොදුරු සොයමින් මුහුද තෙරට ගියේය. එදවස මිනිස්සු මුහුදු තෙර කිරිබත්, මස් මාංශ, සුරා ආදියෙන් නාගයන් සඳහා බිලි පූජාකොට ගියාහුය. කවුඩා බිලිපූජා ස්ථානයට ගොස්

කිරිබත්, මස් මාංශාදිය අනුභව කොට සුරා ද බීවේය. ඒ දෙදෙනාම සුරාවෙන් මත්ව මුහුදු කෙළි කෙළනා පිණිස මුහුදු වෙරළ කෙළවර සිට නහන්ට පටන් ගත්හ. ඒ සමග ම මහත් මුහුදු රැළක් අවුත් කවුඩු දෙන රැගෙන මුහුට ගියේය. එවිට ම එක මසෙක් කවුඩු දෙන ගිල දැම්මේය. කවුඩා තම බිරිය මළා යි හැඬුවේය. කවුඩාගේ හැඬීම් අසා බොහෝ කවුඩෝ එතැනට රැස්වූහ. හැඬීමට කරුණු විමසූහ. ඔබගේ යෙහෙළිය නාමින් සිටිය දී රැළට අසුවී මුහුදට ගියා යි කීය. එවිට ඒ හැමදෙන ම මහහඬින් කෑගසන්ට වූහ. පසු ව ඔහු සැම එකතුව මේ මුහුද අපට එතරම් දෙයක් නො වේ. මුහුද ඉස හිස් කොට යෙහෙළිය ලබාගනිමු. එක එකා මුහුදු වතුරින් මුව පුරවා ගොඩ හෙළූහ. ලුණු දියෙන් ගෙළ තෙමෙත්ම උගුර වියලෙන කල්හි ගොඩට අවුත් ගිමන් හරිත්. මෙසේ හකු සහ මුව වියලෙන කල්හි, ඇස් රතු වූ කල්හි, ගිලන් බවට පත්ව ඔවුනොවුන් අමතා පින්වත්නි, අපි මුහුදෙන් දිය ගෙන ගොඩ හෙළමු. ගත් ගත් තැන් ජලයෙන් පිරෙයි. මුහුද හිස් කරන්ට බැරිය කියා මේ ගාථාව කීහ.

"අපිනු හනුකා සන්තා මුඛඤ්ච පරිසුස්සති,
ඔරමාම න පාරෙම පූරතේව මහොදධීති"

"අපගේ හකු විඩාවට පත් විය. මුඛය ද වියැළෙන්නේය.
මුහුද හිස් කරන්ට තැත් කරමු. එහෙත් කළ නො හැකිය.
මුහුද පිරේ මය."

එහි, "අපිනු හනුකා සන්තා", අපගේ හකු විඩාවට පත්විය. " ඔරමාම න පාරෙම", අපි තම තමන්ගේ බලයෙන් මුහුද දිය ගොඩලීමු. එහෙත් හිස් කරන්ට නො හැකි වෙමු. "පූරතේව මහොදයි", මේ මහමුහුද පිරෙයි.

මෙසේ කියා සියලු ම කවුඩෝ ඒ මළ කැවිඩියගේ රුව වණන්නෝ, ඇගේ තුඩ මෙසේ විය, වට ඇස් මෙබඳුය, හම මෙවැනිය, ඇගේ මිහිරි හඬ මෙසේය, මෙබඳු කැවිඩිය නො දැමුණු මුහුද නිසා නටුවාය යි කියමින් වැළපුණහ. මෙසේ කවුඩන් වැළපෙත් ම මුහුදු දෙවියා බියකරු රූ පෙන්වා ඔවුන් පලවා හැරියේය. ඒ නිසා

ඔවුන්ට සෙතක් ම විය.

බුදුහු මේ ජාතක දේශනාව ගෙනහැර දක්වා ජාතකය නිම කළහ. එදා කැවිඩිය පෙර බිරිය වූවාය. මුහුදු දෙවියා මම ම වීමි.

## 1. 15. 7.

## පුප්ඵරතන ජාතකය

"නයිදං දුක්ඛං අදුං දුක්ඛං" යන මේ ජාතක දේශනාව බුදු රජහු දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන සේක්, කලකිරුණු භික්ෂුවක් අරබයා දෙසූහ.

බුදු රජහු ඒ භික්ෂුව අමතා මහණ, ඔබ උකටලී වූයේ සත්‍යයද යි විමසූ කල්හි ස්වාමීනි, සත්‍යයි. කුමක් නිසා උකටලී වූයේ ද ? ස්වාමීනි, මගේ ගිහි කල භාර්යාව නිසා උකටලී වීමි. ඇය මිහිරි අන්රස ඇත්තීය. ඇයගෙන් වෙන් ම සිටීමට මට නො හැක්කෙමි. මහණ, ඇය ඔබට හිතෛෂී නො වේ. පෙර ඔබ ඇය නිසා හුලෙහි තබන ලද්දේ ඇය නිසා ම වැළපෙමින් මැරී ගොස් අපායෙහි උපන්නේය. දැන් කුමක් නිසා ඇය පතන්නෙහිදැ යි වදාරා කිතුන් වත ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු අහසෙහි වසන දෙවියෙක් වූහ. කැති නැකත් ළඳී. ඉල්මස මැදි පෝදින රැයෙහි සැණකෙළිය පැමිණි කල්හි නගරය දෙව් පුරයක් මෙන් අලංකාර කළහ. සියලු ජනයෝ සැණකෙළියෙහි යෙදුණෝ වූහ. එක් දුගී මිනිසකුට එක ම රළු සළු යුවළක් විය. ඔහු එය මනාව සෝදා නමා සිය දහස් රැළි සිටින සේ කොට තැබීය. ඔහුගේ බිරිය, මම වණක් මල් සුවඳ කැවූ වස්ත්‍රයක් හැඳ පොරවා ඔබගේ ගෙළ වැළඳගෙන නැකත්කෙළි කෙළිනු කැමැත්තෙමි. සොඳුර, අප වැනි

දිළින්දන්ට වණුක් මල් කෙසේ ලබමු ද ? පිරිසුදු වතක් හැඳ ක්‍රීඩා කැරව. වණුක් මල රැඳ වූ වස්ත්‍රයක් නො ලබන්නේ නම් සැණකෙළි නො පවත්වමි. ඔබ අන් ළඳක් ගෙන ක්‍රීඩා කැරව. සොඳුර, මා පෙළන්නේ මන් ද ? අපට වණුක් මල් කොයින් ද ? හිමියනි, පුරුෂයකුට කැමැත්ත තිබේ නම් නැති දෙයක් නැත. රජතුමාගේ වණුක් උයනෙහි බොහෝ වණුක් ඇත. සොඳුර, එම උයන යකුන් අරක් ගත් පොකුණක් මෙන් බලවත් ආරක්ෂාවලින් යුක්තය. එහි ඇතුළුවීමට ඇති තිගේ රුචිය දුරු වේවා. ලද දෙයින් සතුටු වීම මැනවි. හිමියනි, රාත්‍රී භාගයෙහි අඳුරෙහි පුරුෂයින්ට ගමන් නො කළ හැකි තැනක් නම් නැත. මෙසේ නැවත නැවත අච්චිලි කරන කල්හි කෙළෙස් ගති නිසා ඇයගේ වචනය පිළිගෙන සොඳුර, ඉවසන්න. ඉටු කරමි යි ඇය සනසා රාත්‍රියෙහි දිවි පරදුවට තබා නුවරින් නික්ම රජුගේ වණුක් උයනට ගොස් වැට බිඳ දමා උයනට තුළට පිවිසියේය. පාලක පුරුෂයෝ වැට බිඳෙන හඬ අසා සොරකුයැ යි වටකොට ඔහු අල්ලාගෙන පරිභව කොට තලාපෙළා රාත්‍රිය පහ වූ කල රජුට දක්වූහ. රජ මොහු ගෙනගොස් හුලෙහි හිඳවිය. රජ අණ නියම කළේය. ඉක්බිති, රාජ පුරුෂයෝ ඔහු පිටි අත්බැඳ වද බෙර වයද්දී ගෙන ගොස් හුලෙහි හිඳවූහ. ඔහුට බලවත් වේදනා ඇතිවිය. කවුඩෝ උල් වැනි තුඩින් ඇස් උපුටා දැමූහ. ඔහු මෙබඳු මහා දුක මෙනෙහි නො කොට සිය බිරිය සිහි කොට මල් රැඳවූ වස්ත්‍ර ඇඳගෙන තම ගෙළෙහි රැඳවූ අත් යුවලෙන් යුතුව නැකත් කෙළ කෙළීම් වාරයෙන් පිරිහුණෙමි යි මේ ගාථාව කීය.

"නයිදං දුක්ඛං අදුං දුක්ඛං යං මං තුදති වායසො,
යං සාමා පුප්ඵරත්තෙන කත්තිකං නානුභොස්සතී"

"කවුඩා හුල සිටින මා විඳින යම් දුකක් ඇද්ද, ඒ මට
දුකක් නො වේ. වණුක් මලින් රැඳවූ සාමා තොමෝ කැති
නැකැත් කෙළිය නො විඳී ද එය ම මට දුක් වේ."

එහි, "නයිදං දුක්ඛං අදුං දුක්ඛං යං මං තුදති වායසො", හුලෙහි ලැගීම නිසා යම් කායික වූ ද මානසික වූ ද යම් ලොහෝ හුල් වැනි තුඩින් සිදුරු කැරෙමින් පීඩා කරයි ද, ඒ සියල්ල මට දුක් නො වේ. මෙයම මට දුකයි. ඒ කුමක් ද යත්, "යං සාමා පුප්ඵරත්තෙන කත්තිකං

නානුභොසසති", යම් ඒ ප්‍රිය සාමා නම් වූ මගේ බිරිය වණුක් මල් රැඳවූ එක් වතක් හැඳ එකක් පොරවා මෙසේ මල් සුවඳ කැවූ වස්ත්‍ර යුගළයෙන් මගේ ගෙළ අල්ලාගෙන කැති නැකත් කෙළිය නො විඳී ද, එය මට පීඩාවකි. බාධකයකි.

ඔහු මෙසේ ස්ත්‍රියක අරබයා නත්දොඩවද්දී ම කළුරිය කොට නිරයෙහි උපන්නේය. බුදුහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා ජාතකය නිමවූහ. එදින අඹුසැමි යුවළ නම් දැන් මේ යුවළ මැයි. මෙකරුණ සියැසින් දුටු අහස් වැසි දෙවියා මම ම වීමි.

## 1. 15. 8.

## සිඟාල ජාතකය

"නාහං පුනං නච පුනන්ති" යන මේ ජාතක දේශනාව බුදු රජහු දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, කෙළෙස් සංසිඳීමත් අරබයා දෙසූහ.

සැවැත් නුවර මහත් ධන සම්පත් ඇති ඔවුනොවුන් යහළු වූ පන්සියක් පමණ සිටු පුත්‍රයෝ බුදු දහම අසා සසුනට ලැදි ව පැවිදි ව දෙව්රම් වෙහෙර කෙළක් කහවණු අතිරූ බිම් පෙදෙස ඇතුළත වාසය කළහ. දිනක් ඔවුන්ට මධ්‍යම රාත්‍රියෙහි පමණ කෙළෙස් සිතුවිලි උපන්නේය. ඔවුහු කලකිරී තමන් විසින් අත්හළ කෙළෙස් නැවත දෙසීමට සිතූහ. බුදුහු ද එම වේලාවෙහි සර්වඥ ඥාන නැමැති පහන් ටැඹ ඔසවා දෙව්රම් වෙහෙර තුළ භික්ෂූහු කවරක ඇලී සිටිත්දැ යි ඔවුන්ගේ අදහස් බලන්නාහු, එම භික්ෂූන් අතර කාමරාග සහගත සිතිවිලි උපන් බව දැන ගත්හ. බුදු රජහු වනාහි එක පුත්‍රයකු ඇති ස්ත්‍රිය ඒ පුත්‍රයා රකින්නාක් මෙන් ද එක් ඇසත් ඇති පුරුෂයකු ඇස රකින්නාක් මෙන් ද තම සව්වන් රකිත්. පෙරයම් ආදී යම් යම් වේලාවක ඔවුන්ට කෙළෙස් උපදී ද එම කෙළෙස් වැඩීමට ඉඩ නො දී ඒ ඒ වේලාවහි ම සංසිඳුවයි. බුදු රජුන්ට මෙබඳු සිතක් උපණ.

සක්විති රජුගේ නගරය ඇතුළත ම සොරුන් පැමිණි කැලක් විය. දැන් මම ඔවුන්ට දම් දෙසා කෙලෙස් නැති කොට රහත් බව දෙමි යි බුදුහු ගඳකිළියෙන් නික්ම මිහිරි ස්වරය විහිදුවා ධම්ම භාණ්ඩාගාරික අනඳ තෙරුන් ඇමතූහ. තෙරණුවෝ ද, කිම ? ස්වාමීනි යි වහා අවුත් වැඳ සිටියහ. ආනන්ද, යම් පමණ භික්ෂූහු දෙව්රම් වෙහෙර භූමිය තුළ වෙසෙත් ද ඒ සියල්ලෝම ගඳකිළි හාත්පස රැස්කැරවනු. අනඳ තෙරුණුවන්ට මෙබඳු සිතක් පහළ විය. ඉදින්, මම ඒ භික්ෂූන් පන්සිය පමණක් රැස් කරන්නේ නම්, බුදු රජුන් විසින් අප සිත් කෙලෙස් වසඟ වූ බව දන්නා ලද යි සිත් තැවුලක් ඇතිවූයේ නම් ධර්මාවබෝධයට බාධාවක් වන්නේය. එම නිසා සියලු භික්ෂූන් රැස් කැරවන ලෙස වදාළිය යුතු යි, තෙරණුවෝ බුදු රජුන්ගේ වචනය පිළිගෙන කෙස්ස හෙවත් යතුර ගෙන කුටියෙන් කුටියට ගොස් සියලු භික්ෂූන් ගඳකිළි අංගනයට රැස්කැරවා බුද්ධාසනය පැණවූහ. බුදු රජහු පළඟ බැඳ බුදු සිරුර ඍජු ව තබා ගල් පොළොවෙහි පිහිටි මහමෙර මෙන් පණවන ලද බුද්ධාසනයෙහි අග්බඹරු වී යුගල ව සවණක් ගණ බුදු රැස් විහිදුවමින් වැඩ සිටියහ. ඒ බුදු රැස් ද අල්ලක් පමණව ද සතක් පමණව ද කුළු ගෙයක් පමණව ද සිඳි සිඳී අහසෙහි විදුලිය මෙන් හැසුරුණේය. අහස් කුස කළඹා උද්දස්ත්‍ර හිරු උදාවන කලක් මෙන් විය. භික්ෂූ සංඝයා ද බුදු රජුන් වැඳ ගුරු සිත පෙරදැරි ව රන් කම්බල තිරයකින් වර කරන්නාක් මෙන් බුදු රජුන් පිරිවරා වැඩ සිටියහ. ඉක්බිති, බුදු රජහු බඹගොස් පතුරුවා භික්ෂූන් අමතා මහණෙනි, භික්ෂුව විසින් කාමුක සිතිවිලි, ද්වේෂ සිතිවිලි, හිංසා සිතිවිලි මේ තුන් අකුසල සිතිවිලි සිතන්ට නො වටී. සිතෙහි ඇතිවන කෙලෙස් සුළුයැ යි සිතන්ට නො වටී. කෙලෙස් වනාහි සතුරකු සමානය. සුළු වූ සතුරකු නැත. ඉඩක් ලැබුණු වහා ම විනාශයට පමුණුවයි. එමෙන් සුළු වූ ද ක්ලේශය වැඩෙන විට මහා විනාශයකට පමුණුවයි. මේ ක්ලේෂයෝ මහා විෂක් බඳුය. ඉවත් කළ සිවිය හා ලොම් ඇති ගඩුවක් බඳුය. සර්පයකු හා සමානය. හෙණගින්නක් සමානය. ඇලෙන්ට නුසුදුසුය. සැක කටයුතුය. උපන් උපන් කෙණෙහි ම ප්‍රත්‍යවේක්ෂා බලයෙන් හා භාවනා බලයෙන් මොහොතක් හෝ සිතෙහි නො තබා නෙළුම් පතක දිය බිඳක් යම් සේ පෙරළී යයි ද එමෙන් අත්හැරිය යුතුය. පෙර පඬිවරු සුළු වූ ද ක්ලේෂය පහත් කොට සලකා යම් සේ දුරලී ද, යම් අයුරකින් සිතෙහි නූපවද් ද, එමෙන් සංසිඳවූහ යි වදාරා ඉකුත් වත ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු සිවල් යෝනියෙහි පිළිසිඳ ගෙන වනයෙහි ගං තෙරක වාසය කළහ. එකල මහළු ඇතෙක් ගං තෙර මරණයට පත්විය. සිවලා ගොදුරු සොයා ඇවිදින අතර ඇත් සිරුර දැක මට මහත් ගොදුරක් ලැබුණේ යි සිතා සොඬ සැපීය. එවිට නගුලිසක් සැපූ කලක් මෙන් විය. එහි කෑ යුතු දෙයක් නො දැක දළ සැපීය. ටැඹක් හැපූ කලක් මෙන් විය. ඊළඟට කන් හැපීය. කුල්ලක් සැපුවා වැනි විය. බඩ සැපීය. ධාන්‍යය කොටුවක් සැපූ කල මෙනි. පා සැපීය. වංගෙඩියක් සැපුවා වැනි විය. නගුට සැපීය. මෝල් ගස මෙනි. මේ කිසි තැනක කෑ යුත්තක් රස විඳිය යුත්තක් නො ලැබූ සිවලා වස මඟ සැපීය. මෘදු කැවුමක් මුවට ගත් කල මෙන් දැනිණි. එවිට සිවලා මේ සිරුරෙහි කෑ හැකි කොටසක් ලැබුවෙමි යි සතුටු ව එතැන් සිට කමින් කුස තුළට ම පිවිස වකුගඩු, හෘදය මාංශාදිය කමින් පිපාස වූ කල ලේ බොමින් නිදීමට අවශ්‍යය වූ විට බඩතුර වැතිර නිදයි. සිවලා නැවතත් සිතනුයේ, මේ ඇත් සිරුර විසීමට පහසු ව ඇති බැවින් ගෙයක් වැනිය. ආහාර අවශ්‍යය වූ විට බොහෝ මස් තිබේ. දැන් මට වෙනත් තැනක් හෝ වැඩක් අවශ්‍යය නො වේ.

ඌ එහි ම වෙසෙමින් මස් කා ජීවත් වෙයි. කල්යත් ම නියංවාත හැමීමෙන් හා සූර්යය රශ්මියෙන් තැවීමෙන් ඇත් කුණ වියළී රැලි වැටිණි. සිවලා පිවිසි මඟ ද වැසී ගියේය. කුස තුළ අන්ධකාර විය. සිවලාට දැන් ලෝකන්තරික නම් අපාය මෙන් දැනුණි. ඇත් කුණ වියළී යත් ම මස ද වියළිණි. ලේ ද සිඳී ගියේය. ඌට දැන් නික්මෙන දොරටුවක් නැති ව බියට පත්ව ඔබමොබ දුවමින් පහර දෙමින් නික්මෙන දොරටුවක් සොයමින් හැසිරෙන්ට විය. මෙසේ සිවලා සැළියක පිටි පිඬක් මෙන් කුස තුළ පැසෙන කල්හි කීප දවසකින් මහ වැස්සෙක් වට. එවිට ඇත් කුණ පෙඟී දිගහැරී ප්‍රකෘති ස්වභාවයෙන් ම පැවැතිණි. එමඟ විවෘත වූ තරුවක් වෙන් පෙනිණි. සිවලා ඒ සිදුර දැක, දැන් දිවි ලදිමි යි හිසෙහි සිට ආපසු හැරී වසමඟ හිසෙන් පළල් කොට නික්මුණේය. ඌගේ සිරුර තෙත්වී තිබුණු හෙයින් සිය ලෝම වස මඟේ ඇලුණේය. එවිට සිවලා තල් කඳක් මෙන් ලොම් නැති සිරුරෙන් බියටපත් සිත් ඇත්තේ, දුවමින් ටික දුරක් ගොස් නැවතී සිට තම සිරුර බලා මේ දුක මා විසින් ම කැරගත් දෙයකි. අනිකකු කළ දෙයක් නො වේ. ආශාව හේතුකොට,

ලෝභය කරණ කොටගෙන මේ දුක ලබාගතිමි. මෙතැන් පටන් මම ආශාවන් මුළාවූවෙක් නො වෙමි. නැවත ඇත් සිරුරකට නම් නො පිවිසෙමියි කලකිරුණු සිතින් මේ ගාථාව කීය.

"නාහං පුනං නච පුනං නචාපි අපුනප්පුනං,
හත්ථිබොන්දිං පවෙක්ඛාමි තථා හි භයතජ්ජිතොති"

"මම ඇත් කඳ තුළට නැවත නො යමි. නැවත ද නො යමි. නැවද ද නො යමි. නැවත නැවත ද නො යමි. එපමණ බයින් තැති ගත්තෙමි."

එහි, "නචාපි අපුනප්පුනං", මෙහි 'අ' කාරය නිපාත මාත්‍රයකි. මේ ගාථාවෙහි මේ අදහසයි. මම මෙයින් නැවත, එයිනුත් නැවත මෙකී වාරයෙහි පටන් තවත් නැවත, එයිනුත් නැවත නැවත ඇත් සිරුරට නො වදිමි, "හත්ථිබොන්දිං පවෙක්ඛාමි", මක්නිසා ද, "තථා හි බයතජ්ජිතො", මම මේ පිවිසීම නිසා මරණා බියෙන් තැතිගෙන තැවීමට, කලකිරීමට පත්වීමි.

මෙසේ කියා එයින් පලාගොස් නැවත එය හෝ වෙනත් ඇත් සිරුරක් නැවතී නො බැලුවේය. එතැන් පටන් හිවලා ආශාවෙන් මුළා නො වූවේය.

බුදු රජහු මේ ජාතකය ගෙනහැර දක්වා මහණෙනි, සිතෙහි උපන් කෙළෙස් වැඩෙන්ට නො දී ඒ ඒ අවස්ථාවේදී ම සංසිඳුවා ගැනීමට වටනේයැ යි වදාරා සිව්සස් ප්‍රකාශ කොට ජාතකය නිමවූහ. පන්සියයක් ඒ භික්ෂූහු රහත් වූහ. එහි දී සමහරු සෝවාන්, සකදාගාමී, අනාගාමී වූහ. එකල සිවලා වනාහි මම ම වීමි.

## 1. 15. 9.

## ඒකපණ්ණ ජාතකය

"එකපණෙණා අයං රුකෙඛා" යන මේ ජාතකය බුදු රජහු විශාලා නුවර කූටාලාර ශාලාවෙහි වැඩ වසන සේක්, සැහැසි ලිච්ඡවී කුමරකු අරබයා වදාළහ.

ඒ කාලයෙහි විශාලා නුවර ගව්වෙන් ගව්වට තැනුණු පවුරු තුනකින් යුක්තය. තුන් තැනක දොරටු, අටලු කොටු, ගේ ආදියෙන් යුත් ඉතාමත් පොහොසත් නගරයක් විය. එහි හැමදා රජ කැරෙමින් සිටින රජවරු සත්දහස් සත්සිය සත්දෙනෙක් වූහ. යුව රජ, සෙන්පති, අයකැමි ආදීහු ද එපමණ ම වූහ. මොවුනතර එක් සැහැසි ලිච්ඡවි කුමරකු විය. දණ්ඩකින් ගැසූ සර්පයකු මෙන් නිරතුරුව ම ක්‍රෝධයෙන්, ද්වේශයෙන් දූෂිත ව කල් ගත කළේය. ඔහු ඉදිරියේ වචන දෙක තුනක් කථා කිරීමට සමතකු නො විය. එසේ ම ඔහු හික්මවීමට මව්පියෝ, නෑ හිතවත්හු සමත් නො වූහ. මව්පියෝ මෙසේ සිතූහ. තම පුතුගේ සැහැසි කම් අත්හැරවීමට ලොව්තුරා බුදු රජුන් හැර වෙන සමතකු නැත. මොහු බුදු රජුන් විසින් ම දමනය කළයුතු අයකු විය යුතු යි බුදුන් වෙත ගෙනගොස් ස්වාමීනි, මේ කුමරාගේ සැහැසි ගත් නැති කරනු මැනවැ යි අයැද සිටියහ. ඉක්බිති, බුදු රජහු කුමරාට ඔවදන් දුන්හ. කුමාරය, මිනිසකු සැඩ පරුෂ නො විය යුතු මෙන් ම මෙරමා පෙළන්නකු නො විය යුතුය. නො සරුප් වචන වැදූ මවට මෙන් ම පියාට ද සහෝදර සහෝදරියන්ට ද භාර්යාවට ද නෑ මිතුරන්ට ද අප්‍රිය වේ. නො සතුටට හේතු වේ. තමා ඩැසීමට ආ සර්පයකු, වනයෙන් පැමිණි සොරකු, තමා කෑමට යකකු මෙන් බිය ජනක වේ. එපමණක් නොව මේ ජීවිතයේ චුත ව අනතුරු ව අපායෙහි උපදී. මෙලොව දී ම සැහැසි පුද්ගලයා කොතරම් ශරීරය සැරසුව ද විරූප වේ. පුන් සඳ මඬලක් වැනි මුහුණක් තිබුණ ද ගින්නෙන් දැවී ගිය නෙළුම් මලක් මෙන් ද මළ බැඳුණු රන් කැඩපතක් මෙන් ද දැකුම්කළු නො වේ. තරහ නිසා මිනිස්සු ආවුධ ගෙන තමා ම මරා ගනිත්. වස විෂ කත්. ගෙල වැළලා ගනිති. කඳු මුදුනින් පනිත්. ඒ ක්‍රෝධ සිත නිසා ම මරණින් පසු නිරයෙහි උපදියි. මෙරමා පෙළන්නෝ මෙලොව අපහාස ලැබෙති. නැවත මිනිසත් බවක්

ලැබුව ද උපන් කල පටන් රෝගීහු වෙති. ඇස් රෝග, කන් රෝග ආදිය සමූහ වශයෙන් පැමිණේ. නිරතුරු ව රෝගපීඩාදියෙන් දුක් විඳිති. මේ සියලු සත්ත්වයන් කෙරෙහි මෙත් සිත, මුදු සිත, හිත් පිත් ඇත්තකු විය යුතුය. එසේ නො වන්නේ, නිරය ආදී බයෙන් නො මිදේ.

ඒ කුමරා බුද්ධාවවාද ලැබ එකවරිකින් ම නිහතමානීව දමුණේ, සංසිඳුණු හිතැත්තේ, මෙත් සිත්, මුදු සිත් ඇත්තකු විය. පරිභව කළ ද ගැසුව ද නැවත බැලීම් පමණක්වත් නො කළේය. විෂ දළ ඉවත් කළ සර්පයකු මෙන් ද අඬු ගැළවී ගිය කකුළුවකු මෙන් ද අං සිඳුණු වෘෂභයකු මෙන් ද විය.

දිනක් භික්ෂූහු දම් සබාවෙහි මෙම පුවත මතු කළහ. ඇවැත්නි, මේ කුමරු බොහෝ කලක් අවවාද කළ ද හික්මවීමට මව්පිය ආදීහු අසමත් වූහ. බුදුහු එකවර අවවාදයෙන් ම මතැතකු උගත් හත්ථි ශිල්පය අනුව හික්ම වන්නාක් මෙන් හික්මවූහ. මේ සුභාෂිතය සත්‍යය මය. මහණෙනි, ඇතුන් හික්මවන සාරථියා හික්මවන ලද ඇතා පෙර දිශා, අපර දිශා, උතුරු දිශා, දකුණු දිශාවන්ගෙන් එක දිශාවකට ම මෙහෙයවයි. එසේ වෘෂභයන් හික්මවා සාරථියා හික්ම වූ ගවයා පෙර අපර උතුරු දකුණු දිශාවලින් එක දිශාවකට ම මෙහෙයවයි. පුරුෂයන් හික්මවන සම්මා සම්බුද්ධ තථාගතයන් විසින් හික්මවන ලද පුරුෂයා අට දිශාවකට මෙයෙවයි. තමා රූප ධ්‍යාන ලාභී ව බාහිර රූපයන් දකී. මේ දිශාවක. -පෙ- නිරෝධ සමවතට සමවදී. මේ අට වැනි දිශාවයි. ඒ බුදු රජහු සතුන් හික්මවන ගුරුන් අතුරින් උසස් ම පුද්ගලයා යි කියනු ලැබෙති. එනම් පුරිසධම්මසාරථී වූ බුදුහුයැ යි ද බුදු රජුන් වැනි පුරුෂයන් හික්මවන උතුමකු නැතැ යි ද කථා ඉපැද්දීය.

බුදුහු දම් සබාවට වැඩමවා මහණෙනි, දැන් කවර කථාවකින් යුතුව හුන්නාහුද යි විචාරා මෙනම් කථාවකින් හුන්නාහුමැ යි කී කල්හි මහණෙනි, මම මොහු එක ම අවවාදයකින් හික්ම වූයේ දැන් පමණක් නො වේ. පෙර ද මොහු එක්වර අවවාදයෙන්ම හික්මවීමි යි වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කැරවන කල්හි බෝසත්හු උසස් බමුණු කුලයෙහි ඉපිද වැඩිවියට පත්ව තක්ශලාවෙහි ත්‍රිවේදය සහිත සියලු ශිල්ප හදාරා ටික කලක් ගිහි ගෙයි වැස මව්පියන්ගේ ඇවෑමෙන් සෘෂි පැවිද්දෙන් පැවිදි ව අභිඥ්ඥා සහිත සමවත් උපදවා හිමවතෙහි ම වාසය කළහ. කලක් එහි වැස ලුණු ඇඹුල් සෙවුනා පිණිස ගම් පියසට පැමිණ බරණැස් රජුගේ උයනෙහි වැඩ දෙවැනි දවස්හි මනාව හැඳ පෙරව සන්සුන් ව පිඬු පිණිස නගරයට පැමිණ රජ මැදුරට පැමිණියහ. රජ සිව්මැදුරු කවුළුවෙන් බලන්නේ, තවුසාණන් දැක ඉරියව් පැවැත්මෙහි පැහැද මේ තවුසා සන්සුන් ඉඳුරන් ඇත්තේය. හිත සන්සුන්ය. විය දණ්ඩක් පමණ බලන්නේය. පියවරක් පාසා දහසින් බැඳි පියල්ලක් තබන්නාක් මෙන් සිංහයකු මෙන් අභීත ව එන්නේය. ශාන්ත දහමක් ඇත්තේ නම් එය මේ තාපසයාණන්ගේ හිත තුළ වන්නේයැ යි සිතා ඇමැතියකු අමතා මේ තවුසාණන් කැඳවාගෙන එව යි කීය. ඔහු තවුසාණන් වෙත ගොස් වැඳ අතින් භික්ෂා භාජනත් ගෙන සිටි කල්හි කිම මහපිනැත්තෙහි යි ඇසූ කල්හි, රජ ඔබතුමන් කැඳවතැ යි කී කල්හි, රජු හා අප අතර කුලුපග බවක් නැත. අපි හිමවතට අයත් වූවෝ වෙමු යි කීහ. ඇමැතියා මේකරුණ රජුට සැළකළහ. එවිට, ඇමැතිය, අපට වෙනත් කුළුපග කෙනෙක් නැත. ඔහු ම කැඳවාගෙන එන්නැ යි කීය. ඇමැති ද නැවත ගොස් බෝසතුන් වැඳ රජ හසුන පවසා තවුසාණන් රජ ගෙදරට පැමිණ වීය. රජ ඔවුන් වැඳ සේසත එසවූ රන් පළඟෙහි වඩා හිඳුවා තමා සඳහා පිළියෙළ කළ රාජ භෝජනය වළඳවා ස්වාමීනි, කොහි වසන්නහුදැ යි ඇසීය. මහරජ, අපි හිමවතට අයත් තවුසෝ වෙමු. දැන් කොහි යන්නහු ද ? මහරජ, වැසි කාලයට සුදුසු සෙනසුනක් සොයමි යි කීහ. එසේ නම් ස්වාමීනි, අපගේ උයනෙහි වසනු මැනවැ යි ප්‍රතිඥා ගෙන තමාත් අනුභව කොට බෝසතුන් ගෙන පන්සලක් සාදා දිවා රාත්‍රී වසන තැන් කැරවා තවුස් පිරිකර දී උයන් පාලකයාට පවරා නගරයට ගියේය. එතැන් පටන් බෝසත්හු උයනෙහි වසති. රජු ද දවසට දෙවරක් උවැටැන් සඳහා යයි. ඒ රජුට සැහැසි කුමාරයෙක් සිටියේය. ඔහු පරුෂය. රජු ඔහු සන්සුන් කැරවීමට සමත් නො වීය. සෙසු ඤාතීහු ද සමත් නො වූහ. ඇමැතියෝ ද බමුණු ගැහැවියෝ ද එකතුව කුමාරය, මෙසේ නො කැරව යි බලවත් ලෙස කීව ද කුමරා හික්මවීමට නො හැකි වූහ. ඉක්බිති රජ, මගේ සිල්වත්, ගුණවත් තවුසාණන් හැර අන් කිසිවකු මේ කුමරා දැමීමට නො සමත්ය. මොහු මෙකුමරා දමනය

කරතැ යි සිතිය. රජ, කුමරා ගෙන තවුසන් වෙත ගොස් ස්වාමීනි, මේ කුමරා ඉතා සැඬපරුෂය. අපට ඔහු හික්මවිය හැකි නො වේ. ඔබතුමා කවර උපායකින් හෝ මොහු හික්මවනු මැනවැ යි කුමරා බෝසතුන්ට පවරාදී ගියේය. තවුසාණෝ කුමරුන් රැගෙන උයනෙහි හැසිරෙන්නාහු, දෙදිශාවට විහිදුණු පත්‍ර දෙකක් ඇති කොහොඹ පැළයක් දැක කුමාරය, මේ කොසඹ පැළයෙහි එක කොළයක් විකා රස කියව යි කීහ. ඔහු එසේ කොට තිත්ත රස දැන කෙළ සමග බිම හෙළුවේය. රස කෙසේද යි තවුසාණන් විමසූ කල්හි, ස්වාමීනි, දැනට ම මේ පැළය මහා විෂ සහිතය. මේ පැළය වැඩුණු පසු මිනිසුන් මරන්නේයැ යි කොහොඹ පැළය උගුරා අතින් පිරිමැද මේ ගාථාව කීය.

"එකපණ්ණො අයං රුක්ඛො න භූම්‍යා චතුරඞ්ගුලො,
ඵලෙන විසකප්පෙන මහායං කිං භවිස්සතීති"

"දෙපසෙහි එක එක පත්‍ර ඇති, බිම සිට සතරඟුලක් වත්
නො වැඩුණු, හළාහල විෂ සමාන වූ, තිත්ත වූ
පත්‍රයෙන් යුක්ත මේ ගස උස් මහත් වී නම් එදාට
ඒකාන්තයෙන් මිනිසුන් මරන්නෙක් වන්නේය."

එහි, "එකපණ්ණො", දෙපසෙහි එක එක පත්‍ර ඇත්තේය. "න භූම්‍යා චතුරඞ්ගුලො", බිම සිට සතරඟුලක් වත් නො වැඩුණේය. "ඵලෙන", පත්‍රයෙන්, "විසකප්පෙන", හළාහල විෂ සමාන වූ ද කුඩා කල ද මෙවැනි තිත්ත වූ පත්‍රයෙන් යුක්ත වූයේය, යන අර්ථයි. "මහායං කිං භවිස්සති", යම් කලෙක මේ ගස උස් මහත් වී නම් එදාට ඒකාන්තයෙන් මිනිසුන් මරන්නෙක් වන්නේය. එම නිසා මේ ගස උපුරා ඉවත් කළෙමි යි කීය.

ඉක්බිති, බෝසත්හු මෙසේ කීහ. කුමාරය, ඔබ මේ කොහොඹ පැළය උදුරා දැමීමේ දැනට මෙසේ තිත්ත නම් වැඩුණු පසු කෙසේ වන්නේ ද සිතාය. මේ අනුව ඔබ ගැන ද සිතා බැලිය යුතුය. රට වැසියෝ ද මෙසේ සිතත්. මේ කුමරා ළදරු කල ම මෙසේ සැඬ පරුෂ නො හික්මුණු කෙනකු නම් වැඩිවියට පැමිණ රාජාභිෂේකය

ලැබූ කල්හි කුමක් කරයි ද ? මොහු නිසා අපට යහපතක් නො වන්නේයැ යි සිතා පියා සතු රාජ්‍යය ඔබට නො දී කොහොඹ පැළය උදුරා දැම්මාක් මෙන් ඔබ රටින් පිටුවහල් කරන්නාහුය. එම නිසා කොහොඹ පැළයේ ස්වරූපය අතහැර මෙතැන් පටන් ඉවසීම, මෛත්‍රීය, කරුණාව ඇත්තකු වේවා යි තාපසයාණෝ අවවාද කළහ.

එතැන් පටන් කුමරා මානය අතහැර රළු නො වී ඉවසීම ආදී ගුණදම් වඩා බෝසතුන්ගේ අවවාදයෙහි පිහිටා පියාගේ ඇවෑමෙන් රාජ්‍යය ලැබ දානාදී පින්කම් කොට කම් වූ පරිදි ගියේය.

බුදු රජහු මේ දම් දෙසුම ගෙනහැර දක්වා මහණෙනි, මේ සැහැසි ලිච්ඡවි කුමරා මවිසින් දමනය කරන ලද්දේ දැන් පමණක් නො වේ. පෙර ද මම ඔහු දමන කළෙමි යි වදාරා ජාතකය නිමවූහ. එදා සැහැසි කුමරා දැන මේ ලිච්ඡවි කුමරා ම විය. රජු ආනන්ද තෙරණුවෝය. අවවාදය දුන් තාපසයා මම ම වීමි.

## 1. 15. 10.

## සංජීව ජාතකය

"අසන්තං යො පගණ්හාතීති" යන මේ දේශනාව බුදුහු වේළුවනාරාමයෙහි වැඩ වසන සේක්, අජාසත් රජුගේ අසත්පුරුෂයන්ට අනුග්‍රහය අරබයා වදාළහ.

හෙතෙම බුදු රජුන්ට විරුද්ධ වූ දුසිල් වූ පවිටු ස්වභාව ඇති දේවදත්තයන් කෙරෙහි පැහැදී ඒ අශාන්ත වූ අසත් පුරුෂයාට අනුග්‍රහ කොට ඔහුට සත්කාර කරන්නෙමි යි බොහෝ ධනය වියදම් කොට ගයා ශීර්ෂයේ විහාරයක් කැරවා ඔහුගේ ම කීම අසා පියා වූ දැහැමි රජ වූ සෝවාන් ඵලයට පත් ආර්යය ශ්‍රාවකයා ඝාතනය කොට තමන්ගේ සෝවාන් වීමට තිබූ හේතු සම්පත් බිඳ මහත් විනාශයකට

පැමිණියේය. ඒ දේවදත්ත පොළව පලාගෙන ගියේයැ යි ආසා කිම මමත් පොළොවෙහි ගිලෙයිදැ යි බියෙන් තැති ගෙන රජ, සැප නො ලබයි. ඇඳෙහි නිදි සුවයක් නො ලබයි. තියුණු දුක් කම්කටොලුවලින් පෙළෙන ලද්දා වූ ඇත් පොව්වෙකු මෙන් කම්පාවෙමින් හැසිරෙයි. හෙතෙම පොළොව පැලෙන්නාක් මෙන් ද අවීචියෙන් ගිනිදැල් නික්මෙන්නාක් මෙන් ද තමා පොළොවට ගිලී යන්නාක් මෙන් ද දිලිසෙන යකඩ පොළොවෙහි උඩකුරු ව සයනය කැරවා යකඩ උල්වලින් කොටන්නාක් මෙන් ද පෙනුණේය. ඒ නිසා ඔහු ගසන ලද කුකුලෙකුට මෙන් කම්පා විය. කිසි ම මොහොතක්වත් සැනසීමක් නම් නො වීය. හෙතෙම බුදු රජුන් දකිනු කැමැත්තේ, සමාකැරගනු කැමැත්තේ, ප්‍රශ්න අසනු කැමැත්තේ විය. තමාගේ අපරාධය මහත් බැවින් එළැඹෙන්නට නො හැකි වෙයි.

ඉක්බිති, ඔහුගේ රජගහ නුවර කාර්තික රාත්‍රී පැමිණි කල්හි දේව නගරයක් මෙන් නගරය අලංකාර කළ කල්හි මතු මහලේ ඇමැති සමූහයා විසින් පිරිවරන ලද්දේ, රන් අසුනේ හුන්නේ, ජීවක කෝමාරභච්ච නුදුරෙහි සිටිනු දැක මෙසේ සිත් විය. ජීවක ගෙන සම්බුදුන් දකින්නෙමි. කෙළින් ම කථා කිරීමට මම නො හැක්කෙමි. යහළු ජීවකය, මම, තෙමේ ම යන්නට නො හැක්කෙමි. එව. මා ශාස්තෲන් සමීපයට පමුණුවනු. ඍජු ව නො කියා එදින රාත්‍රිය වර්ණනා කොට අද මම කවර නම් ශ්‍රමණ බ්‍රාහ්මණයකු ඇසුරු කරයි ද ? යමකු ඇසුරු කිරීමෙන් මගේ සිත පැහැදෙයි ද ? එවැනි උතුමකු ඇසුරු කරන්නෙමි. එවිට ඇමැතිවරු තම තමන්ගේ ශාස්තෲන්වරුන් වර්ණනා කරන්නේය. එවිට ඔහු බුදු රජුන් වෙත යන්නෙමි යි පද පහකින් රාත්‍රිය වර්ණනා කෙළේය. මේ රාත්‍රිය දොසින් මිදුණේය. ඉතාමත් සිත්කළුය. මේ රාත්‍රිය දැකුම්කළුය. මේ රාත්‍රිය මනහරය. මේ රාත්‍රිය හැම අයරින් ම සිත් ගන්නේය. මේ රාත්‍රිය මනහරය. අද මම යම් මහජන බමුණකු ඇසුරු කිරීමෙන් මගේ සිත පහදින්නේ ද එවැනි කවර නම් මහණ බමුණකු ඇසුරු කරන්නෙම් ද ?

එවිට ඇමැතියෙක් පූර්ණ කස්සපගේ ගුණ වර්ණනා කළේය. එකෙක් මක්ඛලිසෝෂාලගේ ද එකෙක් අජිත කේසකම්බිලිගේ ද එකෙක් පකුධකච්චායනගේ ද තව එකෙක් සඤ්ජය බෙල්ලට්ඨිපුත්‍රගේ ද එකෙක් නිගණ්ඨ නාථපුත්‍රගේ ද ගුණ කථා කළේය. එහෙත් රජතුමා

ජීවකයන්ගේ කථාව ම බලාපොරොත්තුවෙන් සිටියේය. ජීවක ද රජතුමා මාගෙන් ඉල්ලූ විට ම කියමි යි නිහඬ ව නුදුරෙන් සිටියේය. ඉක්බිති, රජතුමා ජීවක අමතා යහළු ජීවකය, ඔබ මක්නිසා නිහඬ ව සිටින්නෙහි ද ? එකෙණෙහි ජීවකයා හුනස්නෙන් නැගී බුදු රජුන් දෙසට ඇඳිලි බැඳ, දේවයිනි, ඒ භාග්‍යවත් බුදු රජහු අපගේ අඹ වනයෙහි එක් දහස් දෙසිය පණසක් භික්ෂූන් වහන්සේ සමග වාසය කරති. ඒ බුදු රජුන්ගේ යහපත් කීර්ති ඝෝෂාව පැතිර පවතින්නේ යි නව අරහාදී බුදු ගුණ කියා බුදු රජුන්ගේ උපතෙහි පටන් සිදුවූ පෙර නිමිති ආදිය ද බුදු රජුන්ගේ ආනුභාවද ප්‍රකාශ කොට ඒ බුදු රජුන් ඇසුරු කෙරේවා. ධර්මය අසාවා. ප්‍රශ්න විචාරාවා යි කීවේය.

රජ පිරිපුන් මනදොළ ඇත්තේ වී, එසේ නම් යහළුව ජීවකය, ඇත් යානාදිය සූදානම් කැරව. යානා සූදානම් කැරවා මහත් රාජ ආනුභාවයෙන් ජීවක අඹ වනයට ගොස් සුවඳවත් කළ මැද මාලෙහි භික්ෂු සංඝයා විසින් පිරිවරන ලද බුදු රජුන් දක සන්සුන් රළ මැද මහා නැවක් මෙන් නො සැලෙන භික්ෂු සංඝයා ද ඒ මේ අත විමසා බලා මෙබඳු පිරිසක් පෙර නො දක්නා ලදිමි යි ඉරියව් පැවැත්මෙහි ම පැහැදී සංඝයාට ඇඳිලි බැඳ ස්තුති කොට භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසෙක හුන්නේ, සාමඤ්ඤඵල පිළිබඳ ප්‍රශ්න විචාළේය. ඉක්බිති, ඔහුට බුදුහු බණ වර දෙකකින් යුක්තව සාමඤ්ඤඵල සූත්‍රය දෙසූහ. හෙතෙම සූත්‍ර දේශනාවගේ කෙළවර සතුටු සිත් ඇත්තේ, බුදුන් ක්ෂමා කැරවා අසුනෙන් නැඟිට පැදකුණු කොට ගියේය.

බුදුහු රජු ගිය නොබෝ වේලාවකින් භික්ෂූන් අමතා මහණෙනි, භාරා දමන ලද්දේය. රජතුමා විසින් නසන ලද්දේය. ඉදින් මහණෙනි, මේ රජ තෙම රජ සම්පත් හේතුකොට ගෙන දැහැමි ධාර්මික රජ වූ පියා නො මැරුවේ නම් මේ ආසනයේ දී ම ඔහුට රජස් නැති මළ නැති දහම් ඇස පහළ වන්නේය. දෙව්දත් නිසා අදාන්ත පුද්ගලයන්ට අනුග්‍රහ කිරිම හේතුවෙන් සෝවාන් ඵලයෙන් පිරිහුණේයැ යි කීහ.

දෙවැනි දින භික්ෂූහු දම් සබාවෙහි කථාවක් මතු කළාහුය. ඇවැත්නි, අජාසත් වනාහි නො දමුණු පුද්ගලයන්ට අනුග්‍රහ කොට දුසිල් පවිටු දෙව්දත් නිසා පිතෘ ඝාතක කර්මය කළ බැවින් සෝවාන් ඵලයෙන් පිරිහුණේ, දෙව්දත් විසින් රජ නසන ලද්දේය. බුදුහු වැඩමවා

මහණෙනි, මෙහි කවර කථාවකින් යුක්තව හුන්නාහුද යි විචාරා මෙනම් කථාවකින්යැ යි කී කල්හි මහණෙනි, අජාසත් දූන් පමණක් නො දමුණු අයට අනුග්‍රහ කොට මහත් විනාශයට පැමිණියේ නො වේ. පෙරත් නො දමුණු අයට අනුග්‍රහ කිරීමෙන් ම තමා ම නසා ගත්තේයැ යි වදාරා අතීතය ගෙනහැර දක්වූහ.

පෙර බරණැස් නුවර බඹදත් රජ කරන කල්හි බෝසත්හු මහා දනවත් බමුණු කුලයක ඉපදී වැඩිවියට පත්ව තක්ශලාවට ගොස් සියලු ශිල්ප ඉගෙන බරණැස දිසාපාමොක් ඇදුරු ව පන්සියයක් මානවකයන්ට ශිල්ප උගන්වයි. ඒ මානවකයන් අතුරෙන් සංජීව නම් එක් මානවකයකු ඇත. බෝසත් තෙම ඔහුට මළවුන් දිවි ඇත්තන් සේ නඟා සිටුවන මන්ත්‍රය දුන්නේය. හෙතෙම නඟා සිටුවන මන්ත්‍රය පමණක් ගෙන නැවත ප්‍රකෘතිමත් කරන මන්ත්‍රය නො ගෙන එක් දිනක් මානවකයන් සමග දර පිණිස කැලයට ගොස් එක් මළ ව්‍යාඝ්‍රයකු දැක මානවකයන්ට කීවේය. සගයිනි, මේ මළ ව්‍යාඝ්‍රයා පණ ගන්වන්නෙමි. මානවකයෝ නො හැකියැ යි කීවාහුය. තොපට පෙනෙන්න ම පණ දෙන්නෙමි. ඉදින් මානවය, හැකි නම් පණ දෙවන්න. එසේ ද කියා ඒ මානවකයෝ ගසකට නැංගාහුය. සංජීව මන්ත්‍රය ජපකොට මළ ව්‍යාඝ්‍රයාට ගල් කැටවලින් පහර දුන්නේය. ව්‍යාඝ්‍රයා නැඟිට වේගයෙන් අවුත් සංජීවගේ ගල නාලය සපා මරණයට පමුණුවා එහි ම වැටුණේය. සංජීව ද එහි ම වැටුණේය. දෙදෙනා ම එක තැන ම මැරී වැටුණහ. මානවකයෝ දර ආදිය ගෙන අවුත් ඒ පුවත ගුරුතුමාට සැලකළාහුය. ගුරුතුමා මානවකයන් අමතා දරුවනි, නො දමුණු අයට අනුග්‍රහ කිරීම නම් නුසුදුසු ස්ථානයේ සත්කාර සම්මාන කරන්නෝ මෙබඳු දුක් ලබන්නේයැ යි කියා මේ ගාථාව කීවේය.

**"අසන්තං යො පග්ගණ්හාති අසන්තඤ්චූපසෙවති,**
**තමෙව ඝාසං කුරුතෙ ව්‍යග්ඝො සඤ්ජීවිකො යථාති"**

"යමකු අසත් පුරුෂයාට සත්කාර සම්මාන කෙරේ ද
අසත් පුරුෂයා සේවනය කෙරේ ද, (ඒ අසත් පුරුෂයා)
ඔහු ම ගිල ගනී. (විනාශයට පත් කෙරේ.) ව්‍යාඝ්‍ර සංජීව
දෙදෙනා මෙනි."

එහි, "**අසන්තන්ති**", ත්‍රිවිධ දුශ්චරිතයෙන් යුත් දුස්ශීල වූ පවිටු ස්වභාව ඇත්තේ, "**යො පග්ගණ්හාතීති**", ක්ෂත්‍රිය ආදීන් අතුරෙහි යම් කිසිවකු මෙබඳු දුස්ශීල වූ පැවිද්දකු චීවරාදිය ප්‍රදානය කිරීමෙන් හෝ යුවරජ, සෙනවි තනතුරු ආදිය දීමෙන් අනුග්‍රහ දක්වයි ද සත්කාර සම්මාන කෙරේ ද, යන අර්ථයි. "**අසන්තඤ්චුපසෙවතීති**", යමකු මෙබඳු වූ නො හික්මුණු දුස්ශීලයකු සේවනය කරයි ද භජනය කරයි ද ළඟ ඇසුරු කරයි ද, "**තමෙව සාසං කුරුතෙති**", ඒ නො දමුණු පුද්ගලයාට සංග්‍රහ කරන්නා ඒ දුස්ශීල පුද්ගලයා කා දමයි. විනාශයට පමුණුවයි. කෙසේ ද යත්, "**ව්‍යග්ඝො සඤ්ජීවකො යථාති**", යම් සේ සංජීවක මානවකයා විසින් මන්ත්‍ර භාවිත කොට මළ ව්‍යාඝ්‍රයාට ජීවිතය ලබා දීමෙන් අනුග්‍රහ දක්වන ලද්දේ ද, තමන්ගේ ජීවිතය ලබා දුන්නා වූ සංජීවකයා ම දිවි තොර කොට එතැන ම හෙළුවේය. මෙසේ අනිකකු හෝ අසත් පුරුෂයන්ට අනුග්‍රහ කරයි ද ඒ දුස්ශීලයා තමන් ම අනුග්‍රහ කළා වූ ඔහු ම විනාශයට පමුණුවයි. මේ ආකාරයෙන් අසත් පුරුෂයන්ට අනුග්‍රහ දක්වන්නේ, විනාශයට පැමිණෙත්.

බෝසත්හු මේ ගාථාවෙන් මානවකයන්ට දම් දෙසා දානාදී පිංකම් කොට කම් වූ පරිදි ගියහ. බුදු රජහු ද මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා ජාතකය නිමවූහ. එදින මළ ව්‍යාඝ්‍රයා දිවි ගැන්වූ මානවකයා අජාසසත්තු විය. දිසාපාමොක් ඇදුරහු මම ම වීමි.

## පසළොස් වැනි කකණ්ටක වර්ගයයි.

## උපරිම පණ්ණාසකය නිමියේය.

# ඒකක නිපාත වර්ණනාව නිමි.



THE BO-TREE AT ANARAJAPOORA.

ටෙනන්ට් 1859

හදන්ත බුද්ධඝොෂාචාය්‍ය්‍යීපාදයන් අනුරාධපුර
ශ්‍රී මහා බෝධිය අසල ප්‍රදේශයෙහි වැඩවසමින්
සිහළට්ඨකථා පාලියට පරිවර්තනය කළ බව
බොහෝදෙනාගේ විශ්වාසයයි


බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234
ෆැක්ස්: 2736737
විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk
www.buddhistcc.com

ISBN 978-955-1604-19-6